බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 21.

සූත්‍රාන්තපිටකයෙහි

15 වන ග්‍රන්ථය

# අඞ්ගුත්තරනිකාය

චතුර්ථ භාගය

## ඡක්ක – සත්තක නිපාත

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්
ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි

අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය
විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 21

The Fifteenth Book in the

**Suttanta-Pitaka**

**15**

# ANGUTTARANIKĀYA (IV)

With the Sinhala translation by

**The Anguttaranikāya Editorial Board**

**of**

**The Tripitaka Translation Committee**

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
## පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ
## මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්ඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙමෙ ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !
බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !
ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**
( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්ඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

චතුත්ථො භාගො

සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරනිකාය

සිවුවන භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය - තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:12 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරකනිවේදනය | IX |
| පාළිහෝඩිය — PĀLI ALPHABET | XI |
| සංකේත නිරූපණය — ABBREVIATIONS | XIII |
| විනයසූචි | XV-XXII |
| පෙළ හා පරිවර්තනය | 2-503 |
| ගාථාදිපාදානුක්කමණිකා | 507 |
| සද්දනාමානුක්කමණිකා | 510 |
| විසෙසපදානුක්කමණිකා | 512 |

# සංස්කාරක නිවේදනය

අඞ්ගුත්තරනිකායෙහි ඡක්ක-සත්තකනිපාතයන්ගේ සිංහලපරිවර්තනය ද ගම්පහ විද්‍යාරවින්දපරිවෙණාධිපති **හල්ගස්තොට ශ්‍රී දේවානන්ද නායකස්ථවිරයන්වහන්සේ** විසින් කරණ ලදී. ඒ පරිවර්තනය බොහෝ සෙයින් නිවරද වුවත් එලෙසින් මුද්‍රණයට පැමිණවීම පර්‍යාප්ත නොවූයෙන් ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ අඞ්ගුත්තර නිකාය සංශෝධක ස්ථවිරවරුන් විසින් මුද්‍රණයට යෝග්‍ය සේ සකස් කරණ ලදී.

අඞ්ගුත්තර ඡක්ක - සත්තක නිපාතයන්ගෙන් යුක්ත මේ අඞ්ගුත්තර චතුර්ථභාගය වශයෙන් ද ත්‍රිපිටක පොත් පෙළේ පසළොස්වන ග්‍රන්ථය වශයෙන් ද ත්‍රිපිටක බුද්ධජයන්ති ග්‍රන්ථමාලාවේ 41 වන ග්‍රන්ථය වශයෙන් ද සම්මත විය.

මේ ග්‍රන්ථය සංස්කරණය කිරීමෙහි ධර්මාර්ථාවබෝධය පිණිස ද සිංහල සාහිත්‍යයේ ආරක්ෂාව පිණිස ද විශේෂයෙන් උත්සාහ කරණ ලදී.

මේ ධර්මග්‍රන්ථය මුද්‍රණාගාරයෙන් ප්‍රසිද්ධියට පැමිණවීමෙන් ලත් පුණ්‍ය සම්භාරය සියල්ලෝම අනුමෝදන් වෙත්වා.

**පරවාහැර වජිරඤාණ**
ත්‍රිපිටක පරිවර්තන සභාවෙහිද
ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයෙහිද
සම්පාදක

ත්‍රිපිටක කාර්යාලය,
174, සිරිවජිරඤාණ මාවත,
කොළඹ 9.

Free Distribution www.aathaapi.org

# THE PALI ALPHABET

IN SINHALA CHARACTERS.

## VOWELS

අa ආā ඉi ඊī උu ඌū එe ඔō

## CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කka | ඛkha | ගga | ඝgha | ඞṅa | | |
| | චca | ඡcha | ජja | ඣjha | ඤña | | |
| | ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa | | |
| | තta | ථtha | දda | ධdha | නna | | |
| | පpa | ඵpha | බba | භbha | මma | | |
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | කාkā | කිki | කීkī | කුku | කූkū | කෙke | කොkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛෙkhe | ඛොkhō |
| ගga | ගාgā | ගිgi | ගීgī | ගුgu | ගූgū | ගෙge | ගොgō |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| කක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| කඛ kkha | ඤ්හ ñha | ද්ද dda | ම්බ, mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ñja | ද්ව, dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

ා ā ි i ී ī ු ූ u ු ූ ū ෙ e ො ō

# සඞ්කෙතනිරූපණය

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| සී. 1. | — | 'පැල්මඩුල්ල' මහාවිහාර - සිහල තාලපණ්ණ පොත්ථකං |
| සී. 2. | — | 'ගාල්ල' පරමානන්දවිහාර – සිහල තාලපණ්ණ පොත්ථකං |
| සීමු. 1. | — | බෙන්තරමුල්ලේ අමරසීහථෙර සංසොධිත - සිහලක්ඛර මුද්දිත පොත්ථකං |
| සීමු. 2. | — | බෝරුග්ගමුවේ සිරිරේවත සංසොධිත - සිහලක්ඛර මුද්දිත පොත්ථකං |
| සා. | — | සාමක්ඛර - මුද්දිත පොත්ථකං |
| මජසං. | — | මරම්මඡට්ඨසඞ්ගීති පිටක පොත්ථකං |
| PTS. | — | Pali Text Society - Aṅguttara Nikaya |

# අඞ්ගුත්තරනිකායො

## චතුර්ථභාග - විෂයසූචි

## ඡක්කනිපාතො


| විෂයං | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| | ආහුනෙය්‍යවග්ගො | | | 2–16 |
| 1. පඨමාහුනෙය්‍ය | සුත්තං | ... | ... | 2– 4 |
| 2. දුතියාහුනෙය්‍ය | ,, | ... | ... | 4– 6 |
| 3. ඉන්ද්‍රිය | ,, | ... | ... | 6– |
| 4. බල | ,, | ... | ... | 6– |
| 5. පඨමාජානීය | ,, | ... | ... | 8– |
| 6. දුතියාජානීය | ,, | ... | ... | 8– |
| 7. තතියාජානීය | ,, | ... | ... | 10– |
| 8. අනුත්තරිය | ,, | ... | ... | 10– |
| 9. අනුස්සතිට්ඨාන | ,, | ... | ... | 10– |
| 10 මහානාම | ,, | ... | ... | 12–16 |
| | ආහුනෙය්‍යවග්ගො නිට්ඨිතො. | | | |
| | සාරාණීයවග්ගො | | | 18–48 |
| 1 පඨමසාරාණීය | සුත්තං | ... | ... | 18– |
| 2. දුතියසාරාණීය | ,, | ... | ... | 18–20 |
| 3. නිස්සාරණීය | ,, | ... | ... | 20–22 |
| 4. භද්දක | ,, | ... | ... | 24–26 |
| 5. අනුතප්ප | ,, | ... | ... | 26–28 |
| 6. නකුලපිතු | ,, | .. | ... | 28–32 |
| 7. කුසල | ,, | ... | ... | 34–36 |
| 8. මච්ඡික | ,, | ... | ... | 38–40 |
| 9. පඨම මරණස්සති | ,, | ... | ... | 40-44 |
| 10. දුතිය මරණස්සති | ,, | ... | ... | 46–48 |
| | සාරාණීයවග්ගො නිට්ඨිතො. | | | |
| | අනුත්තරියවග්ගො | | | 50–80 |
| 1. සාමගාමක | සුත්තං | ... | ... | 50– |
| 2. අපරිහානියධම්ම | ,, | ... | ... | 52– |
| 3. භය | ,, | ... | ... | 52– |
| 4. හිමවන්ත | ,, | ... | ... | 54– |
| 5. අනුස්සතිට්ඨාන | ,, | ... | ... | 54–56 |
| 6. මහාකච්චාන | ,, | ... | ... | 58-62 |
| 7. පඨමසමය | ,, | ... | ... | 62–64 |
| 8. දුතියසමය | ,, | ... | ... | 66–68 |
| 9. උදායී | ,, | ... | ... | 68–72 |
| 10. අනුත්තරිය | ,, | ... | ... | 72–80 |
| | අනුත්තරියවග්ගො නිට්ඨිතො. | | | |

| විෂයා | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| | දෙවතාවග්ගො | | | 82-104 |
| 1. සෙඛ | සුත්තං | | ... | 82- |
| 2. පඨම අපරිහාන | ,, | ... | ... | 82- 84 |
| 3. දුතිය අපරිහාන | ,, | ... | ... | 84- |
| 4. මොග්ගල්ලාන | ,, | ... | ... | 84- 88 |
| 5. විජ්ජාභාගිය | ,, | ... | ... | 88- |
| 6. විවාදමූල | ,, | ... | ... | 90- |
| 7. ඡළඞ්ගදාන | ,, | ... | ... | 92- 94 |
| 8. අත්තකාර | ,, | ... | ... | 94- 96 |
| 9. කම්මනිදාන | ,, | .. | ... | 96- 98 |
| 10. කිම්බිල | ,, | .... | ... | 98-100 |
| 11. දාරුක්ඛන්ධ | ,, | ... | ... | 100- |
| 12. නාගිත | ,, | ... | ... | 100-104 |
| | දෙවතාවග්ගො චතුත්ථො. | | | |
| | ධම්මිකවග්ගො | | | 106-150 |
| 1. නාග | සුත්තං | ... | ... | 106-110 |
| 2. මිගසාලා | ,, | ... | ... | 110-116 |
| 3. ඉණ | ,, | ... | ... | 118-122 |
| 4. මහාචුන්ද | ,, | ... | ... | 122-124 |
| 5. පඨම සන්දිට්ඨික | ,, | ... | ... | 124-126 |
| 6. දුතිය සන්දිට්ඨික | ,, | ... | ... | 126-128 |
| 7. ඛෙම | ,, | ... | ... | 128-130 |
| 8. ඉන්ද්‍රියසංවර | ,, | ... | ... | 130-132 |
| 9. ආනන්ද | ,, | ... | ... | 132-134 |
| 10. ඛත්තිය | ,, | ... | ... | 134-136 |
| 11. අප්පමාද | ,, | ... | ... | 136-138 |
| 12. ධම්මික | ,, | ... | ... | 140-150 |
| | ධම්මිකවග්ගො පඤ්චමො. | | | |
| | දුතියො පණ්ණාසකො | | | |
| | මහාවග්ගො | | | 152-216 |
| 1. සොණ | සුත්තං | ... | ... | 152-158 |
| 2. ඵග්ගුණ | ,, | ... | ... | 158-164 |
| 3. ඡළාභිජාති | ,, | ... | ... | 164-168 |
| 4. ආසව | ,, | ... | ... | 170-174 |
| 5. දාරුකම්මික | ,, | ... | ... | 174-176 |
| 6. හත්ථිසාරිපුත්ත | ,, | ... | ... | 176-184 |
| 7. මජ්ඣෙ | ,, | .. | ... | 186-188 |
| 8. පුරිසින්ද්‍රියඤාණ | ,, | ... | ... | 190-200 |
| 9. නිබ්බෙධික | ,, | ... | ... | 200=210 |
| 10. සීහනාද | ,, | ... | ... | 210-216 |
| | මහාවග්ගො පඨමො. | | | |

| විෂයා | | පිට්ඨඞ්කානි |
|---|---|---|
| | **අනාගාමිවග්ගො** | **218-230** |
| 1. අනාගාමිඵල | සුත්තං ... ... | 218- |
| 2. අරහත්තඵල | ,, ... ... | 218- |
| 3. මිත්ත | ,, ... ... | 218-220 |
| 4. සඞ්ඝණිකාරාම | ,, ... ... | 220- |
| 5. දෙවතා | ,, ... ... | 220-224 |
| 6. සමාධි | ,, ... ... | 224-226 |
| 7. සක්ඛිභබ්බ | ,, ... ... | 226- |
| 8. බල | ,, ... ... | 228- |
| 9. පඨමජ්ඣාන | ,, ... ... | 228- |
| 10 දුතිය පඨමජ්ඣාන | ,, ... ... | 230- |

අනාගාමිවග්ගො දුතියො.

| | | |
|---|---|---|
| | **අරහත්තවග්ගො** | **232-240** |
| 1. දුක්ඛ | සුත්තං ... ... | 232- |
| 2. අරහත්ත | ,, ... ... | 232- |
| 3. උත්තරිමනුස්සධම්ම | ,, ... ... | 234- |
| 4. සුඛසොමනස්ස | ,, ... ... | 236- |
| 5. අධිගම | ,, ... ... | 234-236 |
| 6. මහන්තත්ත | ,, ... ... | 236- |
| 7. පඨම නිරය | ,, ... ... | 236-238 |
| 8. දුතිය නිරය | ,, ... ... | 238- |
| 9. අග්ගධම්ම | ,, ... ... | 238-240 |
| 10. රත්තිදිවස | ,, ... ... | 240- |

අරහත්තවග්ගො තතියො.

| | | |
|---|---|---|
| | **සීතිවග්ගො** | **242-250** |
| 1. සීතිභාව | සුත්තං ... ... | 242- |
| 2. ආවරණ | ,, ... ... | 242-244 |
| 3. වොරොපිත | ,, ... ... | 244- |
| 4. සුස්සූසති | ,, ... ... | 246- |
| 5. අප්පහාය | ,, ... ... | 246- |
| 6. පහීණ | ,, ... ... | 248- |
| 7. අභබ්බ | ,, ... ... | 248- |
| 8. අභබ්බට්ඨාන | ,, ... ... | 248- |
| 9. දුතිය අභබ්බට්ඨාන | ,, ... ... | 248- |
| 10. තතිය අභබ්බට්ඨාන | ,, ... ... | 250- |
| 11. චතුත්ථ අභබ්බට්ඨාන | ,, ... ... | 250- |

සීතිවග්ගො චතුත්ථො.

| විෂයො | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| | **ආනිසංසවග්ගො** | | | **252-258** |
| 1. පාතුභාව | සුත්තං | ... | ... | 252- |
| 2. ආනිසංස | ,, | ... | ... | 252- |
| 3. අනිච්ච | ,, | ... | ... | 252- |
| 4. දුක්ඛ | ,, | .. | ... | 254- |
| 5. අනත්ත | ,, | ... | ... | 254- |
| 6. නිබ්බාන | ,, | ... | ... | 254- |
| 7. අනවත්ථිත | ,, | ... | ... | 254- |
| 8. උක්ඛිත්තාසික | ,, | ... | ... | 256- |
| 9. අතම්මය | ,, | ... | ... | 256- |
| 10. භව | ,, | ... | ... | 256-258 |
| 11. තණ්හා | ,, | ... | ... | 258- |

**ආනිසංසවග්ගො පඨමො.**

| | | | | |
|---|---|---|---|---|
| | **තිකවග්ගො** | | | **260-266** |
| 1. රාග | සුත්තං | ... | ... | 260- |
| 2. දුච්චරිත | ,, | ... | ... | 260- |
| 3 විතක්ක | ,, | ... | ... | 260-262 |
| 4. සඤ්ඤා | ,, | ... | ... | 262- |
| 5. ධාතු | ,, | ... | ... | 262- |
| 6. අස්සාද | ,, | ... | ... | 264- |
| 7. අරති | ,, | ... | .. | 264- |
| 8. අසන්තුට්ඨි | ,, | ... | ... | 294- |
| 9 දොවචස්සතා | ,, | ... | ... | 266- |
| 10. උද්ධච්ච | ,, | ... | ... | 266- |

**තිකවග්ගො නිට්ඨිතො.**

| | | | | |
|---|---|---|---|---|
| | **සාමඤ්ඤවග්ගො** | | | **268-274** |
| 1. කායානුපස්සී | සුත්තං | ... | ... | 268- |
| 2. අජ්ඣත්තකායානුපස්සී—ආදිපඤ්චදස සුත්තානි | | | ... | 268- |
| 3. තපුස්ස | සුත්තං | ... | ... | 270- |
| 4 භල්ලිකාදි වීසති | සුත්තානි | ... | ... | 270- |

**සාමඤ්ඤවග්ගො නිට්ඨිතො.**

| | | |
|---|---|---|
| ඡක්කනිපාතෙ රාගාදිපෙය්‍යාල සුත්තානි | ... | 272-274 |


**රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං.**

**ඡක්කනිපාතො සමත්තො.**

# සත්තකනිපාතො

## පඨමො පණ්ණාසකො


| විසයො | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| | ධනවග්ගො | | | 278–290 |
| 1. පඨම පියභික්ඛු | සුත්තං | ... | ... | 278– |
| 2. දුතිය පියභික්ඛු | ,, | ... | ... | 280– |
| 3. සඞ්ඛිත්තසත්තබල | ,, | ... | ... | 280– |
| 4. විත්ථතසත්තබල | ,, | ... | ... | 282–284 |
| 5. සඞ්ඛිත්තධන | ,, | ... | ... | 284– |
| 6. විත්ථතධන | ,, | ... | ... | 284–286 |
| 7. උග්ගමහාමත්ත | ,, | ... | ... | 288– |
| 8. සත්තසංයොජන | ,, | ... | ... | 288– |
| 9. සංයොජනප්පහාන | ,, | ... | ... | 290– |
| 10. මච්ඡරියසංයොජන | ,, | ... | ... | 290– |
| | ධනවග්ගො පඨමො. | | | |
| | අනුසයවග්ගො | | | 292–302 |
| 1. අනුසය | සුත්තං | ... | ... | 292– |
| 2. අනුසයප්පහාන | ,, | ... | ... | 292– |
| 3. කුලූපගමන | ,, | ... | .. | 292–294 |
| 4. ආහුනෙය්‍යපුග්ගල | ,, | ... | ... | 294– |
| 5. උදකූපමපුග්ගල | ,, | ... | ... | 294–296 |
| 6. අනිච්චානුපස්සී | ,, | ... | ... | 298– |
| 7. දුක්ඛානුපස්සී | ,, | ... | ... | 298– |
| 8. අනත්තානුපස්සී | ,, | ... | ... | 300– |
| 9. සුඛානුපස්සී | ,, | ... | ... | 300– |
| 10. නිද්දසවත්ථු | ,, | ... | ... | 302– |
| | අනුසයවග්ගො දුතියො. | | | |
| | වජ්ජිසත්තකවග්ගො | | | 304–322 |
| 1. සාරන්දද | සුත්තං | ... | ... | 304–306 |
| 2. වස්සකාර | ,, | ... | ... | 306–312 |
| 3. භික්ඛු අපරිහානිය | ,, | ... | ... | 312–314 |
| 4. දුතිය භික්ඛු අපරිහානිය | ,, | ... | ... | 314– |
| 5. තතිය භික්ඛු අපරිහානිය | ,, | ... | .. | 314–316 |
| 6. චතුත්ථ භික්ඛු අපරිහානිය | ,, | ... | | 316– |
| 7. පඤ්චම භික්ඛු අපරිහානිය | ,, | ... | ... | 316– |
| 8. සෙඛ පරිහානිය | ,, | ... | ... | 318– |
| 9. උපාසක පරිහානිය | ,, | ... | ... | 318–320 |
| 10. උපාසක විපත්ති | ,, | ... | ... | 320– |
| 11. උපාසක පරාභව | ,, | ... | ... | 322– |
| | වජ්ජිසත්තකවග්ගො තතියො. | | | |

| විසයො | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| | දෙවතාවග්ගො | | | 324–340 |
| 1. අප්පමාදගාරව | සුත්තං | ... | ... | 324– |
| 2. හිරිගාරව | ,, | ... | ... | 326– |
| 3. පඨම සොවචස්සතා | ,, | ... | ... | 326– |
| 4. දුතිය සොවචස්සතා | ,, | ... | ... | 328–330 |
| 5. මිත්තසුත්තං | ,, | ... | ... | 330– |
| 6. භික්ඛුමිත්ත | ,, | ... | ... | 330–332 |
| 7. පඨම පටිසම්භිදා | ,, | ... | ... | 332– |
| 8. දුතිය පටිසම්භිදා | ,, | ... | ... | 332–334 |
| 9. පඨම චිත්තවසවත්තන | ,, | ... | ... | 334– |
| 10. දුතිය චිත්තවසවත්තන | ,, | ... | ... | 334– |
| 11. පඨම නිද්දසවත්ථු | ,, | ... | ... | 336–338 |
| 12. දුතිය නිද්දසවත්ථු | ,, | ... | ... | 338–340 |

දෙවතාවග්ගො චතුත්ථො.

| | | | | |
|---|---|---|---|---|
| | මහායඤ්ඤවග්ගො | | | 342–378 |
| 1. විඤ්ඤාණට්ඨිති | සුත්තං | ... | ... | 342– |
| 2. සමාධිපරික්ඛාර | ,, | ... | ... | 342– |
| 3. පඨම අග්ගි | ,, | ... | ... | 344– |
| 4. මහායඤ්ඤ | ,, | ... | ... | 344–350 |
| 5. සඞ්ඛිත්තසත්තසඤ්ඤා | ,, | ... | ... | 350– |
| 6. විත්ථතසත්තසඤ්ඤා | ,, | ... | ... | 350–360 |
| 7. මෙථුන | ,, | ... | ... | 362–364 |
| 8. සංයොගවිසංයොගධම්මපරියාය සුත්තං | | | ... | 364–366 |
| 9. දානමහප්ඵල | සුත්තං | ... | ... | 368–370 |
| 10. නන්දමාතු | ,, | ... | ... | 372–378 |

මහායඤ්ඤවග්ගො පඤ්චමො.

| | | | | |
|---|---|---|---|---|
| | අබ්‍යාකතවග්ගො | | | 380–424 |
| 1. අබ්‍යාකතවත්ථු | සුත්තං | ... | ... | 380–382 |
| 2. පුරිසගති | ,, | ... | ... | 382–388 |
| 3. තිස්සබ්‍රහ්ම | ,, | ... | ... | 390–396 |
| 4. සීහසෙනාපති | ,, | ... | ... | 396–400 |
| 5. අරක්ඛෙය්‍ය | ,, | ... | ... | 402–404 |
| 6. කිම්බිල | ,, | ... | ... | 404–406 |
| 7. සත්තධම්ම | ,, | ... | ... | 406– |
| 8. පචලායන | ,, | ... | ... | 406–412 |
| 9. මාපුඤ්ඤභායී | ,, | ... | ... | 412–414 |
| 10. සත්තභරියා | ,, | ... | ... | 414–418 |
| 11. කොධන | ,, | ... | ... | 418–424 |


අබ්‍යාකතවග්ගො නිට්ඨිතො.

| විසයො | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|
| | **මහාවග්ගො** | | | **426–480** |
| 1. හිරොත්තප්ප | සුත්තං | ... | ... | 426– |
| 2. සත්තසූරියුග්ගමන | ,, | ... | ... | 426–431 |
| 3. නගරූපම | ,, | ... | ... | 431–442 |
| 4. ධම්මඤ්ඤූ | ,, | ... | ... | 442–448 |
| 5. පාරිච්ඡත්තක | ,, | ... | ... | 448–452 |
| 6. සක්කාරගරුකාර | ,, | ... | ... | 452–460 |
| 7. භාවනානුයුත්ත | ,, | ... | ... | 462–464 |
| 8. අග්ගික්ඛන්ධොපම | ,, | ... | ... | 464–474 |
| 9. සුනෙත්ත | ,, | ... | ... | 474–476 |
| 10. අරක | ,, | ... | ... | 476–480 |
| | මහාවග්ගො දුතියො. | | | |
| | **විනයවග්ගො** | | | **482–488** |
| 1. පඨම විනයධර | සුත්තං | ... | ... | 482– |
| 2. දුතිය විනයධර | ,, | ... | ... | 482– |
| 3. තතිය විනයධර | ,, | ... | ... | 482– |
| 4. චතුත්ථ විනයධර | ,, | ... | ... | 484– |
| 5. පඨම විනයධර සොභන | ,, | ... | ... | 484– |
| 6. දුතිය විනයධර සොභන | ,, | ... | ... | 484– |
| 7. තතිය විනයධර සොභන | ,, | ... | ... | 486– |
| 8. චතුත්ථ විනයධර සොභන | ,, | ... | ... | 486– |
| 9. සත්ථුසාසන | ,, | ... | ... | 486–488 |
| 10. අධිකරණසමථ | ,, | ... | ... | 488– |
| | විනයවග්ගො තතියො. | | | |
| | **සමණවග්ගො** | | | **490–492** |
| 1. භික්ඛුධම්ම | සුත්තං | ... | ... | 490– |
| 2. සමණධම්ම | ,, | ... | ... | 490– |
| 3. බ්‍රාහ්මණධම්ම | ,, | ... | ... | 490– |
| 4. සොත්ථියධම්ම | ,, | ... | ... | 490– |
| 5. නහාතකධම්ම | ,, | ... | ... | 490– |
| 6. වෙදගුධම්ම | ,, | ... | ... | 490– |
| 7. අරියධම්ම | ,, | ... | ... | 492– |
| 8. අරහන්තධම්ම | ,, | ... | ... | 492– |
| 9. අසද්ධම්ම | ,, | ... | ... | 492– |
| 10. සද්ධම්ම | ,, | ... | ... | 492– |
| | සමණවග්ගො චතුත්ථො. | | | |

| විසයො | | පිට්ඨඞ්කානි |
|---|---|---|
| | **ආහුනෙය්‍යවග්ගො** | 494–498 |
| 1. | චක්ඛුඅනිච්චානුපස්සී සුත්තං ... | 494- |
| 2-8. | චක්ඛුදුක්ඛානුපස්සී සුත්තාදීනි ... | 494- |
| 9 | සොතඅනිච්චානුපස්සී ,, ... | 496-498 |

ආහුනෙය්‍යවග්ගො නිට්ඨිතො.

| | | |
|---|---|---|
| | රාගාදිපෙය්‍යාල සුත්තාදීනි ... | 500–502 |

රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං.


සත්තකනිපාතො සමත්තො.

## සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## චතුත්ථො භාගො

# ඡක්කනිපාතො

Free Distribution www.aathaapi.org

# සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## චතුත්ථො භාගො

---

## ඡක්කනිපාතො

# 1. පඨමො පණ්ණාසකො

## 1. ආහුනෙය්‍යවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

### 6. 1. 1. 1.

### [පඨමාහුනෙය්‍යසුත්තං]

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො. උපෙක්ඛකො විහරති සතො සම්පජානො.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො. උපෙක්ඛකො විහරති සතො සම්පජානො.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

# සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරනිකාය

## චතුර්ථභාගය

---

## ඡක්කනිපාතය

# 1. ප්‍රථම පණ්ණාසකය

## 1. ආහුනෙය්‍යවග්ගය

### ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

6. 1. 1. 1.

[පඨමාහුනෙය්‍ය සූත්‍රය]

1. **මා** විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූසේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය සූත්‍රය වදාළසේක:

මහණෙනි, දහම් සයෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි, පාහුනෙය්‍ය වෙයි, දක්ඛිණෙය්‍ය වෙයි, අඤ්ජලිකරණීය වෙයි, ලෝකයාගේ අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මේ සස්නෙහි මහණ චක්ෂුසින් රූපාලම්බනයක් දැක (රාගානුගත සොම්නස් විසින්) සුමනස්ක නො මැ වෙයි. (දේෂානුගත දොම්නස් විසින්) දුර්මනස්ක නො මැ වෙයි සිහි ඇතියේ සම්‍යක්ප්‍රඥ ඇතියේ උපේක්ෂක ව වාස කෙරෙයි.

ශ්‍රොත්‍රයෙන් ශබ්දාලම්බනයක් අසා ... ඝ්‍රාණයෙන් ගන්ධාලම්බනයක් ආඝ්‍රාණ කොට ... ජිහ්වායෙන් රසාලම්බනයක් විඳ ... කායයෙන් ස්ප්‍රෂ්ට-ව්‍යාලම්බනයක් පැහැස ... මනසින් ධර්මාලම්බනයක් දැන නො මැ සුමනස්ක වෙයි. දුර්මනස්ක නො මැ වෙයි. සිහි ඇතියේ සම්‍යක්ප්‍රඥ ඇතියේ උපේක්ෂක ව වාසය කෙරෙයි.

මහණෙනි, මේ සදහමින් සමන්වාගත රහත් මහණ ආහුනෙය්‍ය හා පාහුනෙය්‍ය හා දක්ඛිණෙය්‍ය හා අඤ්ජලිකරණීය හා ලෝකයාගේ අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර හා වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිතැති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

## 6. 1. 1. 2.

## [දුතියආහුනෙය්‍යසුත්තං]

[සාවත්ථිනිදානං]

2. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි ඡහි:

(1) ඉධ භික්ඛවෙ භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති, බහුධා'පි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභෙජ්ජමානො[1] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං[2]. ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛිසකුණො. ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති[3] පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකා'පි කායෙන වසං වත්තෙති.

(2) දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

(3) පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: "සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං -පෙ- සදොසං වා චිත්තං -පෙ- වීතදොසං වා චිත්තං -පෙ- සමොහං වා චිත්තං -පෙ- වීතමොහං වා චිත්තං -පෙ- සඞ්ඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

(4) අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාලීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො, ජාති සතම්පි ජාති සහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ, අනෙකෙපි විවට්ටකප්පෙ, අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ: 'අමුත්‍රාසිං එවංනාමො] එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

---

1. අභිජ්ජමානො - මජසං  2. පඨවියා - මජසං  3. පරිමසති - සිමු.

Free Distribution www.aathaapi.org

## 6. 1. 1. 2.

## [දුතියාහුණෙය්‍ය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

2. මහණෙනි, කරුණු සයෙකින් සමන්නාගත මහණ ආහුණෙය්‍ය වෙයි ... ලෝකයාගේ අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර සයෙකින යත්:

(1) මහණෙනි, මෙ සස්නෙහි මහණ අනේකවිධ ඍද්ධි ප්‍රභෙද විඳුනේය: පියෙවින් එකක් ව සිට (ශතසහස්‍රාදීන්) බහුප්‍රකාර වෙයි. බහු-ප්‍රකාරව එකෙක් ම වෙයි: ආවිර්භාව කෙරෙයි. තිරෝභාව කෙරෙයි. භිත්තියෙන් පරභාගයට පවුරින් පරභාගයට පර්වතයෙන් පරභාගයට අහස්හි සේ නො ලැගෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහිදු නැගීම් හා ගැලීම් කෙරෙයි. පොළොවෙහි සෙයින් නො බිඳුනාදියෙහි දු යෙයි. පක්ෂි-ශකුනයකු සෙයින් අහස්හිදු පලඟින් යෙයි. එසා මහත් ඉර්ධි ඇති එසා මහත් අනුභාව ඇති මෙ සඳහිරුනුදු අත්ලෙන් පරාමර්ශ කෙරෙයි. පිරිමැදීම කෙරෙයි. බඹලොව ද හිම්කොට කයින් වසිය පවත්වයි.

(2) පරිශුද්ධ වූ මිනිසැස් ඉක්මගිය දිව සෝතයින් දිව්‍යවූත් මානුෂ වූත් දුරු වූත් හමුයෙහි වූත් යම් ශබ්දකෙනෙක් වෙත් නම්, ඒ උභය ශබ්දයන් අසයි.

(3) පරසත්ත්ව පරපුද්ගලයන්ගේ සිත් සිය සිතින් පිරිසිඳ නානාප්‍රකාර-යෙන් දන්නේය: (අෂ්ටවිධ) සරාගචිත්තය හෝ සරාගචිත්තය'යි දන්නේ ය. (අවශෙෂකුශලාව්‍යාකෘත) වීතරාග චිත්තය හෝ වීතරාගචිත්ත ය යි දන්නේ ය. (ද්විවිධදෞර්මනස්‍යසහගත) සදෙස චිත්තය හෝ ... (චාතුභූමක-කුසලාබ්‍යාකෘත) වීතදෙස චිත්තය හෝ ... (විචිකිච්ඡා උද්ධච්ච සංගත) සමොහචිත්තය හෝ ... වීතමොහ වූ හෝ චිත්තය ... (ථීන මිද්ධානුගත) සඞ්ඛිත්තචිත්තය හෝ ... (උද්ධච්චානුගත) වික්ඛිත්ත චිත්තය හෝ ... (රූපාවචරාරූපාවචර) මහද්ගතචිත්තය හෝ ... (අවශෙෂ) අමහද්ගත චිත්තය හෝ... (සකලත්‍රෛභූමක) සඋත්තර චිත්තය හෝ... (ලොකොත්තර) අනුත්තර චිත්තය හෝ ... (උපචාරාර්පණාප්‍රාප්ත) සමාහිත වූ හෝ චිත්තය ... (එදෙකට නො පත්) අසමාහිත වූ හෝ චිත්තය ... (පඤ්චවිධ විමුක්තියෙන්) විමුක්ත වූ හෝ චිත්තය .... (එයින් විමුක්ත නොවූ) අවිමුක්ත වූ හෝ චිත්තය අවිමුක්ත චිත්ත ය යි දන්නේ ය.

(4) අනේකවිධ වූ පූර්වනිවාස සිහිකෙරෙයි. එ කෙසේ ය යත්: එක් දූයකුදු ජාති දෙකකුදු ජාති තුණකුදු ජාති සතරකුදු ජාති පසකුදු දශජාතියකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු සතලිස් ජාතියකුදු ජාති පණසකුදු, ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සියදහසකුදු, නොයෙක් සංවර්තකල්පයනුදු නොයෙක් විවර්තකල්පයනුදු නොයෙක් සංවර්ත විවර්ත-කල්පයනුදු සිහිකරයි: 'අසෝ තන්හි මෙබඳු නම් ඇතියෙම්, මෙබඳු ගොත් ඇතියෙම්, මෙබඳු පැහැතියෙම්, මෙබඳු අහරැතියෙම්, මෙබඳු සුවදුක් විඳුනා-සුල්ලෙම්, මෙබඳු ආයුෂ හිම් කොට ඇති යෙම්' විමි. එ මම එයින් සැව අසෝ තන්හි උපන්මි. එහිදු මෙබඳු නැමැති යෙම්, මෙ බඳු ගොත් ඇති යෙම්, මෙබඳු සිරුරු පැහැ ඇතියෙම්, මෙබඳු අහර ඇතියෙම්, මෙබඳු සුවදුක් විඳිනාසුල්ලෙම්, මෙබඳු ආයුෂ හිම් කොට ඇතියෙම් විමි. ඒ මම එතැනින් සැව මෙහි උපන්මි'යි මෙසේ පැහැසටහන් ඈ විසින් ආකාර සහිත, (නාමගොත්‍රාදි විසින්) උද්දෙස සහිත වූ අනේක විධ පූර්ව-නිවාසය අනුස්මරණ කරයි.

(5) දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ‘ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ‘ඉමෙ වා පන භොන්තො සත්තා කාය-සුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති’- ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

(6) ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහු-නෙය්‍යො හොති, පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

6. 1. 1. 3.

[ඉන්ද්‍රියසුත්තං]

[සාවත්ථිනිදානං]

3. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ ඡහි:

සද්ධින්ද්‍රියෙන විරියින්ද්‍රියෙන සතින්ද්‍රියෙන සමාධින්ද්‍රියෙන පඤ්ඤින්ද්‍රියෙන, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

6. 1. 1. 4.

[බලසුත්තං]

[සාවත්ථිනිදානං]

4. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි ඡහි:

සද්ධාබලෙන විරියබලෙන සතිබලෙන සමාධිබලෙන පඤ්ඤාබලෙන, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

(5) පරිශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිව්‍යසින් ච්‍යවමාන උපපද්‍යමාන හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ ශොභනගති ඇති දුර්ගති ඇති කර්මවූ පරිදි මියයන සත්ත්වයන් දක්නේය: 'මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්වාගත වූවාහු වාග්දුශ්චරිතයෙන් සමන්වාගත වූවාහු මනොදුශ්චරිතයෙන් සමන්වාගත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද කරන්නාහු විපරීත දෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන ඇත්තාහු වෙත්; ඔහු කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට උපත් විසින් පැමිණියහ. 'මේ භවත් සත්ත්වයෝ ද කාය සුචරිතයෙන් සමන්වාගත වූවාහු වාක් සුචරිතයෙන් සමන්වාගත වූවාහු මනඃසුචරිතයෙන් සමන්වාගත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද නොකරන්නාහු සම්‍යග්දෘෂ්ටිගත්තාහු සම්‍යග්දෘෂ්ටි කර්මසමාදාන ඇත්තාහු වෙත්; ඔහු කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට උපත් විසින් පැමිණියාහුය'යි - මෙසේ පරිශුද්ධ වූ මිනිසැස ඉක්ම පවත්නා දිව්‍යයින් ච්‍යවමාන උපපද්‍යමාන හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගති ඇති දුර්ගති ඇති කර්මවූ පරිදි යන සත්ත්වයන් දක්නේ ය.

(6) ආශ්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ට ඥානයෙන් දැන සාක්ෂාත් කොට වාස කෙරෙයි.

මහණෙනි, මේ දහම් සයෙන් සමන්වාගත රහත් මහණ ආහුණෙය්‍ය ද පාහුණෙය්‍ය ද දක්ඛිණෙය්‍ය ද අඤ්ජලිකරණීය ද ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර ද වෙයි.

## 6. 1. 1. 3.

## [ඉන්ද්‍රිය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

3. මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ ආහුණෙය්‍ය හා ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර හා වෙයි. කවර සයෙකින යත්:

සද්ධින්ද්‍රියයෙන විරියින්ද්‍රියයෙන සතින්ද්‍රියයෙන සමාධින්ද්‍රියයෙන පඤ්ඤින්ද්‍රියයෙන, ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඉහාත්මයෙහිම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට උපයාගෙන වාස කෙරෙයි.

මහණෙනි, මේ කරුණු සයින් සමන්වාගත මහණ ආහුණෙය්‍ය හා .. ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර හා වෙයි.

## 6. 1. 1. 4.

## [බල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

4. මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ ආහුණෙය්‍ය හා ... ලෝකයාහට අනුත්තර පුණ්‍යක්ෂෙක්ෂෙත්‍ර හා වෙයි. කවර සයෙකින යත්:

සද්ධාබලයෙන විරියබලයෙන සතිබලයෙන සමාධිබලයෙන පඤ්ඤාබලයෙන, ආශ්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ටඥානයෙන් සාක්ෂාත් කොට උපයාගෙන වෙසෙයි.

මහණෙනි, මේ දහම් සයින් සමන්වාගත මහණ ආහුණෙය්‍ය හා ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර හා වේ.

## 6. 1. 1. 5.

## [පඨමාජානීයසුත්තං]

[සාවත්ථිනිදානං]

5. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො ඛමො හොති රූපානං, ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං, වණ්ණසම්පන්නො ච හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ඛමො හොති රූපානං, ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං, ඛමො ධම්මානං.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 6. 1. 1. 6.

## [දුතියාජානීයසුත්තං]

[සාවත්ථිනිදානං]

6. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො ඛමො හොති රූපානං, ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං, බලසම්පන්නො ච හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ඛමො හොති රූපානං, ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං, ඛමො ධම්මානං.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

6. 1. 1. 5.

[පඨමාජානීය සුත්‍රය]

[සැවැත්නිදාන යි]

5. මහණෙනි, කරුණු සයෙකින් සමන්නාගත රජුගේ භද්‍ර අශ්වාජානීයයා රාජාර්‍හ හා රාජ භෝග්‍ය හා වෙයි. 'රාජාඞ්ගයෙක' යන සඞ්ඛ්‍යාවට යෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි රජුගේ භද්‍ර අශ්වජානීයයා රූප සහනු වෙයි. ශබ්ද සහනු වෙයි. ගන්ධ සහනු වෙයි. රස සහනු වෙයි. ස්‍රෂ්ටව්‍ය සහනු වෙයි. වර්‍ණ සම්පන්න (ශරීර වර්‍ණ ඇත්තේ) ද වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්නාගත රජුගේ භද්‍ර අශ්වාජානීයයා රාජාර්‍හ ද රාජභෝග්‍ය ද වෙයි රජුගේ 'අඞ්ගයෙකැ'යි ම සඞ්ඛ්‍යාවට යෙයි.

මහණෙනි, එ පරිද්දෙන් ම කරුණු සයෙකින් සමන්නාගත මහණ ආහු-නෙය්‍ය...හා ලොකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර හා වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූප සහනු වෙයි. ශබ්ද සහනු වෙයි. ගන්ධ සහනු වෙයි. රස සහනු වෙයි. ස්‍රෂ්ටව්‍ය සහනු වෙයි. ධර්‍ම සහනු වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්නාගත මහණ ආහුනෙය්‍ය හා ... ලොකයාහට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර හා වෙයි.

6. 1. 1. 6.

[ද්‍විතීයාජානීය සුත්‍රය]

[සැවැත්නිදාන යි]

6. මහණෙනි, අඞ්ගසයෙකින් සමන්නාගත රජුගේ භද්‍ර අශ්වාජානීයයා රාජාර්‍හ හා රාජභෝග්‍ය හා වෙයි. රජුගේ 'අඞ්ගයෙකැ'යි ම සඞ්ඛ්‍යාවට යෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, රජුගේ භද්‍ර අශ්වාජානීයයා රූපයනට ක්‍ෂම වෙයි. ශබ්දයනට ක්‍ෂම වෙයි. රසයනට ක්‍ෂම වෙයි. ස්‍රෂ්ටව්‍යයනට ක්‍ෂම වෙයි. බල සම්පන්න (කායබල ඇත්තේ) ද වෙයි.

මහණෙනි, මෙ අඞ්ග සයෙන් සමන්නාගත රජුගේ භද්‍ර අශ්වාජානෙයයා රාජාර්‍හ හා රාජභෝග්‍ය හා වෙයි. රජුගේ 'අඞ්ගයෙකැ'යි ම සඞ්ඛ්‍යාවට යෙයි

මහණෙනි, එපරිද්දෙන් ම ධර්‍ම සයෙකින් සමන්නාගත මහණ ආහුනෙය්‍ය හා ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර හා වෙයි. කවර සයෙකින යත්·

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපයනට ක්‍ෂම වෙයි. ශබ්දයනට ක්‍ෂම වෙයි. ගන්ධයනට ක්‍ෂම වෙයි. රසයනට ක්‍ෂම වෙයි. ස්‍රෂ්ටව්‍යයනට ක්‍ෂම වෙයි. ධර්‍මයනට ක්‍ෂම වෙයි.

මහණෙනි, මෙ කරුණු සයින් සමන්නාගත මහණ ආහුනෙය්‍ය හා ... ලෝකයාහට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර හා වේ යයි.

## 6. 1. 1. 7.

### [තතියාජානීයසුත්තං]

[සාවත්ථිනිදානං]

7. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො ඛමො හොති රූපානං, ඛමො සද්දානං, ඛමො ගන්ධානං, ඛමො රසානං, ඛමො ඵොට්ඨබ්බානං, ජවසම්පන්නො ච හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ඛමො හොති රූපානං -පෙ- ඛමො ධම්මානං.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 6. 1. 1. 8.

### [අනුත්තරියසුත්තං]

[සාවත්ථිනිදානං]

8. ඡයිමානි භික්ඛවෙ අනුත්තරියානි. කතමානි ඡ:

දස්සනානුත්තරියං, සවණානුත්තරියං, ලාභානුත්තරියං, සික්ඛානුත්තරියං, පාරිචරියානුත්තරියං, අනුස්සතානුත්තරියං.

ඉමානි ඛො භික්ඛවෙ ඡ අනුත්තරියානීති.

## 6. 1. 1. 9.

### [අනුස්සතිට්ඨානසුත්තං]

[සාවත්ථිනිදානං]

9. ඡයිමානි භික්ඛවෙ අනුස්සතිට්ඨානානි. කතමානි ඡ:

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති.

ඉමානි ඛො භික්ඛවෙ ඡ අනුස්සතිට්ඨානානී'ති.

6. 1. 1. 7.

[තතියාජානීය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

7. මහණෙනි, අඞ්ග සයෙකින් සමන්නාගත රජුගේ භද්‍ර අශ්වා-ජානෙයයා රාජාර්හ වෙයි. රාජ භෝග්‍ය වෙයි. රජුගේ 'අඞ්ගයෙකැ'යි ම සංඛ්‍යාවට යෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මේ ලොව්හි රජුගේ භද්‍ර අශ්වාජානෙයයා රූපයනට ක්‍ෂම වෙයි. ශබ්දයනට ක්‍ෂම වෙයි. ගන්ධයනට ක්‍ෂම වෙයි. රසයනට ක්‍ෂම වෙයි. ස්ප්‍රෂ්ටව්‍යයනට ක්‍ෂම වෙයි. ජවනසම්පන්න (සැදජව ඇත්තේ) ද වෙයි.

මහණෙනි, මේ අඞ්ග සයින් සමන්නාගත රජුගේ භද්‍ර අශ්වාජානෙයයා රාජාර්හ වෙයි. රාජ භොග්‍ය ද වෙයි. රජුගේ 'අඞ්ගයෙකැයි'ම සංඛ්‍යාවට යෙයි.

මහණෙනි, එ පරිද්දෙන් ම කරුණු සයෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපයනට ක්‍ෂම වෙයි ... ධර්මයනට ක්‍ෂම වෙයි.

මහණෙනි, මෙ කරුණු සයින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි.

6. 1. 1. 8.

[අනුත්තරිය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

8. මහණෙනි, මේ අනුත්තරයෝ සදෙනකි. කවර සදෙනෙක යත්:

දර්ශනානුත්තරය, ශ්‍රවණානුත්තරය, ලාභානුත්තරය, ශික්‍ෂානුත්තරය, පාරිචර්‍යානුත්තරය, අනුස්සතානුත්තර යි.

මහණෙනි, මෙ අනුත්තරධර්ම සදෙන යි.

6. 1. 1. 9.

[අනුස්සතිට්ඨාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

9. මහණෙනි, අනුස්මෘතිස්ථාන සදෙනෙකි. කවර සදෙනක යත්:

බුද්ධානුස්මෘති ය, ධර්මානුස්මෘති ය, සඞ්ඝානුස්මෘති ය, ශීලානුස්මෘති ය, ත්‍යාගානුස්මෘති ය, දෙවතානුස්මෘති ය යි.

මහණෙනි, මෙ අනුස්මෘතිස්ථාන සදෙන යි.

## 6 1. 1 10.

## [මහානාමසුත්තං]

10. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච:

“යො සො භන්තෙ අරියසාවකො ආගතඵලො විඤ්ඤාතසාසනො, සො කතමෙන විහාරෙන බහුලං විහරතී”ති.

යො සො මහානාම අරියසාවකො ආගතඵලො විඤ්ඤාතසාසනො, සො ඉමිනා විහාරෙන බහුලං විහරති:

(1) ඉධ මහානාම අරියසාවකො තථාගතං අනුස්සරති: “ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා”ති. යස්මිං මහානාම සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති තථාගතං ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති. සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති. ධම්මසොතං සමාපන්නො බුද්ධානුස්සතිං භාවෙති.

(2) පුන ච පරං මහානාම අරියසාවකො ධම්මං අනුස්සරති: “ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[1] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී”ති. යස්මිං මහානාම සමයෙ අරියසාවකො ධම්මං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති ධම්මං ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං.[2] පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති. සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති. ධම්මසොතං සමාපන්නො ධම්මානුස්සතිං භාවෙති.

1. ඔපනෙය්‍යිකො - මජ්ඣං   2. පාමොජ්ජං - මජ්ඣං

## 6. 1. 1. 10.

### [මහානාම සූත්‍රය]

10. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කපිලවස්තු පුරාසන්නයෙහි වූ නිග්‍රෝධාරාමයෙහි වසන සේක. එකල්හි මහානාම ශාක්‍ය භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හිඳ. එකත්පස්ව හුන් මහානාම ශාක්‍ය භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය:

වහන්ස, "යම් අරිසවුයෙක් ප්‍රාප්ත ආර්‍ය්‍යඵල ඇතියේ (සෝවාන් වූයේ) දැනගත් ශික්ෂාත්‍රය ශාසන ඇතියේ වේ නම්, හෙ කවර විහාරයෙකින් බහුල කොට වාස කෙරේ ද?"යි.

මහානාමයෙනි, යම් ආර්‍ය්‍යශ්‍රාවකයෙක් ප්‍රාප්ත ආර්‍ය්‍යඵල ඇතියේ (සෝවාන් වූයේ) විඥාත ශාසන ඇතියේ වේ නම්, හෙ මේ විහාරයෙන් බහුල කොට වාස කරන්නේ ය:

(1) මහානාමයෙනි, මෙ සස්නෙහි අරිසවු "මෙ මෙ කරුණෙන් ඒ භාග්‍යවත්හු අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ. විද්‍යාචරණ සම්පන්නයහ. සුගත්හ. ලොකවිද්හ. අනුත්තර පුරුෂදම්‍ය සාරථිහ. දෙවමනුෂ්‍යයනට ශාස්තෘහ. චතුස්සත්‍ය ප්‍රතිබුද්ධයහ. භගවත්හ"යි තථාගතයන් අනුස්මරණ කෙරෙයි. මහානාමයෙනි, යම් කලෙක අරිසවු තථාගතයන් අනුස්මරණ කෙරේද, එසමයෙහි ඔහට රාගයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො ම වන්නේ ය. ද්වේෂයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො ම වන්නේ ය. මෝහයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො ම වන්නේ ය. එ සමයෙහි ඔහුගේ චිත්තය තථාගතයන් ඇරැබැ සෘජුගත ම වෙයි. මහානාමයෙනි, සෘජුගත චිත්තයෙන් යුත් අරිසවු අර්ථගත (අටුවාකථා නිසා උපන්) ප්‍රීතිප්‍රමොද්‍යය ලබන්නේ ය. පාළිධර්මය පිළිබඳ ප්‍රීතිප්‍රාමොද්‍යය ලබන්නේ ය. පාල්‍යර්ථකථා නිසා උපන් ප්‍රාමොද්‍යය ලබන්නේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතිමනස්කයාහට නාමකාය හා කරජකාය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය සුව ඇතියහුගේ චිත්තය එකාග්‍ර වෙයි. මහානාමයෙනි, මේ අරිසවු රාග ද්වෙෂ මෝහ විසින් විෂමගත ප්‍රජාව කෙරෙහි සමප්‍රාප්ත ව වෙසේ යයි ද, දුක් සහිත ප්‍රජාව කෙරෙහි නිදුක්ව වෙසේ යයි ද, විදර්ශනා සඞ්ඛ්‍යාත ධර්මස්‍රොතසට සපැමිණියේ බුද්ධානුස්මෘති කර්මස්ථානය වඩන්නේ යයි ද කියනු ලැබේ.

(2) තවද මහානාමයෙනි, අරිසවු "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාතය, සාන්දෘෂ්ටිකය, අකාලිකය, එහිපස්‍ය විධියට නිසිය, උපනයනීය, විඥයන් විසින් තමන් කෙරෙහි එළවා දතයුතු"යයි ධර්මය සිහි කෙරෙයි. මහානාමයෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම යම් කලෙක ධර්මය සිහිකෙරේ නම්, එසමයෙහි ඔහට රාගයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. ද්වේෂයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මෝහයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. එසමයෙහි ඔහුගේ චිත්තය ධර්මය ඇරැබ සෘජුගත මැ වෙයි. මහානාමයෙනි, සෘජුගත චිත්තයෙන් යුත් ආර්‍ය්‍යශ්‍රාවක අර්ථවෙදය ලබන්නේ ය. ධර්මවෙදය ලබන්නේ ය. පෙළදම් හා අරුත් නිසා උපන් ප්‍රාමොද්‍යය ලබන්නේය. ප්‍රමුදිතයාහට (පඤ්චවිධ) ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතියෙන් යුත් සිතැතියහුගේ (උභය) කායය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ කායික චෛතසික සුඛය විඳුනේ ය. සුව ඇතියහුගේ චිත්තය සමාධියට යෙයි. මහානාමයෙනි, මේ අරිසවු (රාග ද්වෙෂ මොහයෙන්) විෂමත්වයට ගිය සත්ත්වාඛ්‍ය ප්‍රජායෙහි සමත්වයට පැමිණියේ වෙසේ යයි ද, දුක් සහිත ප්‍රජායෙහි නිදුක්වූයේ වෙසේ යයි ද, විදර්ශනා සඞ්ඛ්‍යාත ධර්මස්‍රොතසට පැමිණියේ ධර්මානුස්මෘතිය වඩන්නේ ය යි ද කියනු ලැබේ.

(3) පුන ච පරං මහානාම අරියසාවකො සඞ්ඝං අනුස්සරති: "සුපටිපන්නො[1] භගවතො සාවකසඞ්ඝො, උජ්ජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. යස්මිං මහානාම සමයෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජ්ජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති සඞ්ඝං ආරබ්භ. උජ්ජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතං සමාපන්නො සඞ්ඝානුස්සතිං භාවෙති.

(4) පුන ච පරං මහානාම අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති: අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි. යස්මිං මහානාම සමයෙ අරියසාවකො සීලං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජ්ජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති සීලං ආරබ්භ. උජ්ජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතං සමාපන්නො සීලානුස්සතිං භාවෙති.

(5) පුන ච පරං මහානාම අරියසාවකො අත්තනො චාගං අනුස්සරති: "ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යොහං මච්ඡෙරමලපරියුට්ඨිතාය පජාය විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසාමි මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො"ති. යස්මිං මහානාම සමයෙ අරියසාවකො චාගං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජ්ජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති චාගං ආරබ්භ. උජ්ජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතං සමාපන්නො චාගානුස්සතිං භාවෙති.

---

1. සුපටිපන්නො - මජ්ඣං.

(3) තවද මහානාමයෙනි, අරිසවු "භාග්‍යවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ සුප්‍රතිපන්න ය, භාග්‍යවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ ඍජුප්‍රතිපන්න ය, භාග්‍යවත්-හුගේ ශ්‍රාවක සඞ්ඝ න්‍යායප්‍රතිපන්න ය. භාග්‍යවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ සාමීචිප්‍රතිපන්න ය. යම් ඒ සතර පුරුෂ යුගළ කෙනෙක්, අෂ්ටාර්‍ය පුරුෂ පුද්ගල කෙනෙක් වෙත් නම්, භාග්‍යවත්හුගේ තෙල ශ්‍රාවක සඞ්ඝ ආහුනාර්හ වෙයි. ප්‍රාහුණාර්හ වෙයි. දක්ෂිණාර්හ වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වේ" යයි සඟුන් සිහිකෙරෙයි. මහානාමයෙනි, යම් කලෙක්හි අරිසවු සඞ්ඝයා සිහිකෙරේ නම්, ඔහට එකල්හි රාගයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. ද්වෙෂයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මොහයෙන් පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. එ සමයෙහි ඔහුගේ සිත සඞ්ඝයා ඇරැබ ඍජුගත මැ වෙයි. මහානාමයෙනි, ඍජුගත චිත්තයෙන් යුත් අරිසවු අර්ථවෙදය ලබන්නේ ය. ධර්මවෙදය ලබන්නේ ය. ධර්මොපසංහිත ප්‍රාමොද්‍යය ලබන්නේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතිමනස්කයාගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය. සුව ඇත්තහුගේ චිත්තය සමාධිගත වෙයි. මහානාමයෙනි, මෙ අරිසවු විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්තව වාස කෙරේ යයි ද, සව්‍යාබාධප්‍රජායෙහි අව්‍යාබාධ ඇතිව වාස කෙරේ යයි ද, ධර්මස්‍රොතසට පැමිණියේ සඞ්ඝානුස්මෘතිය වඩන්නේ යයි ද කියනු ලැබේ.

(4) තවද මහානාමයෙනි, අරිසවු අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ තෘෂ්ණාදාසත්වයෙන් නිදහස් වූ විඥ ප්‍රශස්ත වූ තෘෂ්ණා මාන දෘෂ්ටීන් විසින් පරාමෘෂ්ට නො වූ සමාධියට හිතව වැටෙන තමාගේ ශීලයන් සිහිකරයි. මහානාමයෙනි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවකයා ශීලය සිහිකෙරේ නම්, එකල්හි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන්නේ ය. ද්වෙෂ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන්නේ ය. මොහ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන්නේ ය. එකල්හි ඔහුගේ චිත්තය ශීලය ඇරැබ ඍජුගත මැ වන්නේ ය. මහානාමයෙනි, ඍජුගත චිත්ත ඇති ආර්‍ය්‍ය ශ්‍රාවක අර්ථවේදය ලබන්නේ ය. ධර්මවේදය ලබන්නේ ය. ධර්මොපසංහිත ප්‍රාමොද්‍යය ලබන්නේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතියෙන් යුත් සිත් ඇතියහුගේ කය සංහිඳෙන්නේ ය. සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය. සුව ඇතියහුගේ චිත්තය සමාධියට වැටෙයි. මහානාමයෙනි, මේ ආර්‍ය්‍යශ්‍රාවක විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්තව වාස කෙරේ යයි ද, සව්‍යාබාධ ප්‍රජායෙහි අව්‍යාබාධව වාසය කෙරේ යයි ද, ධර්මස්‍රොතසට පැමිණියේ ශීලානුස්මෘතිය වඩනේ යයි ද කියනු ලැබේ.

(5) තවද මහානාමයෙනි, අරිසවු "ඒකාන්තයෙන් මට ලාභයෙක, යම්බඳු මම මාත්සර්‍ය්‍ය මලයෙන් පර්‍ය්‍යුත්ථිත ප්‍රජායෙහි විගත මල මාත්සර්‍ය්‍ය සිතින්, මුහුටු වන්හි බැලුම් නැතියෙම්, පවිත්‍ර අත් ඇතියෙම්, දීමෙහි ඇලුනෙම්, යැදුමට නිස්සෙම්, දානසංවිභාගයෙහි ඇලුනෙම් ගෙහි වෙසෙම්. (එය) මට ඒකාන්තයෙන් සුලබ්ධය" යි තමාගේ ත්‍යාගය සිහි කරයි. මහානාමයෙනි, යම් කලෙක අරිසවු ත්‍යාගය සිහි කෙරේ ද, එකල්හි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන්නේ ය. ද්වෙෂ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන්නේය. මොහපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන් නේ ය. එකල්හි ඔහුගේ සිත ත්‍යාගය ඇරැබ ඍජුගත ම වන්නේ ය. මහානාමයෙනි, ඍජුගත චිත්තය ඇති අරිසවු අර්ථවේදය ලබන්නේ ය. ධර්මවේදය ලබන්නේ ය. ධර්මොපසංහිත ප්‍රාමොද්‍යය ලබන්නේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතියෙන් යුත් සිත් ඇතියහුගේ කය සන්හිඳෙන්නේ ය. සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය. සුව ඇතියහුගේ චිත්තය සමාධිගත වෙයි. මහානාමයෙනි, මේ අරිසවු විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්තව වාස කෙරේ යයි ද, සව්‍යාබාධ ප්‍රජායෙහි අව්‍යාබාධව වෙසේයයි ද, ධර්මස්‍රොතසට පැමිණියේ ත්‍යාගානුස්මෘතිය වඩන්නේ යයි ද කියනු ලැබේ.

(6) පුන ච පරං මහානාම අරියසාවකො දෙවතානුස්සතිං භාවෙති: "සන්ති දෙවා චාතුම්මහාරාජිකා, සන්ති දෙවා තාවතිංසා, සන්ති දෙවා යාමා, සන්ති දෙවා තුසිතා, සන්ති දෙවා නිම්මානරතිනො, සන්ති දෙවා පරනිම්මිතවසවත්තිනො, සන්ති දෙවා බ්‍රහ්මකායිකා, සන්ති දෙවා තදුත්තරිං. යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා,[1] මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති, යථාරූපෙන සීලෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා,[2] මය්හම්පි තථාරූපං සීලං සංවිජ්ජති. යථාරූපෙන සුතෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපං සුතං සංවිජ්ජති. යථාරූපෙන චාගෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපො චාගො සංවිජ්ජති. යථාරූපාය පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතී"ති. යස්මිං මහානාම සමයෙ අරියසාවකො අත්තනො ච තාසං ච දෙවතානං සද්ධං ච සීලං ච සුතං ච චාගං ච පඤ්ඤං ච අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති තා දෙවතා ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතං සමාපන්නො දෙවතානුස්සතිං භාවෙති

යො සො මහානාම අරියසාවකො ආගතඵලො විඤ්ඤාතසාසනො, සො ඉමිනා විහාරෙන බහුලං විහරතී'ති.

### ආහුනෙය්‍යවග්ගො පඨමො.

**තස්සුද්දානං:**

ද්වෙ ආහුනෙය්‍යා ඉන්ද්‍රියබලා තයො ආජානීයා[3]
අනුත්තරියං අනුස්සති[4] මහානාමෙන තෙ දසාති.

1. තත්ථ උප්පන්නා - මජසං 2. තත්ථ උප්පන්නා - මජසං
3. ද්වෙ ආහුණෙය්‍යා ඉන්ද්‍රියබලාති තයො අජානීයා - මජසං 4. අනුත්තරිය අනුස්සති - මජසං

(6) තවද මහානාමයෙනි, ආර්යශ්‍රාවක "සිවුමහරද වැසි දෙවියෝ ඇත. තව්තිසා වැසි දෙවියෝ ඇත. යාම දෙවියෝ ඇත. තුසිත දෙවියෝ ඇත නිර්මාණරතී දෙවියෝ ඇත. පරනිර්මිත වශවර්තී දෙවියෝ ඇත. බ්‍රහ්මකායික දෙවියෝ ඇත. ඔවුනට මත්තෙහි දෙවියෝ ඇත. යම්බඳු ශ්‍රද්ධායෙකින් සමන්‍වාගත ඒ දෙවියෝ එහි මින් නැවගොස් උපන්නු නම්, මටද එබඳු ශ්‍රද්ධා ඇත. යම්බඳු ශීලයෙකින් සමන්‍වාගත ඒ දෙවියෝ මෙ අත්බැවින් චුතව එහි උපන්නු නම්, මට ද එබඳු ශීලය විද්‍යමාන වෙයි. යම්බඳු ශ්‍රැතයෙකින් සමන්‍වාගත ඒ දෙවියෝ මෙයින් නැව එහි උපන්නු නම්, මට ද එබඳු ශ්‍රැතයෙක් ඇත. යම්බඳු ත්‍යාගයෙකින් සමන්‍වාගත ඒ දෙවියෝ මෙයින් සැව එහි උපන්නු නම්, මට ද එබඳු ත්‍යාගය ඇත. යම්බඳු ප්‍රඥායෙකින් සමන්‍වාගත ඒ දෙවියෝ මෙයින් සැව එහි උපන්නු නම්, මට ද එබඳු ප්‍රඥාව ඇතැ"යි දේවතානුස්මෘතිය වඩන්නේ ය. මහානාම-යෙනි, යම් කලෙක ආර්යශ්‍රාවක තමාගේ ද ඒ දෙවියන් ගේ ද ශ්‍රද්ධාවත් ශීලයත් ශ්‍රැතයත් ත්‍යාගයත් ප්‍රඥාවත් සිහිකෙරේ නම්, ඒ කල්හි ඔහට රාග පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වැ වන්නේ ය. ද්වෙෂ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නොවන්නේ ය. මෝහ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නොවන්නේ ය. දේවතානුස්මෘතිය ඇරැබ එසමයෙහි ඔහුගේ සිත ඍජුගතම වන්නේ ය. මහානාමයෙනි, ඍජුගත චිත්ත ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකයා අර්ථවේදය ලබන්නේ ය. ධර්මවේදය ලබන්නේ ය. ධර්මෝපසංහිත ප්‍රමෝදය ලබන්නේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතිමනස්කයාගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය. සුව ඇතියහුගේ සිත සමාහිත වෙයි. මහානාමයෙනි, මෙ ආර්යශ්‍රාවක විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්තව වෙසේ යයි ද, සව්‍යාබාධ ප්‍රජායෙහි අව්‍යාබාධව වෙසේ යයි ද, ධර්මස්‍රොතසට පැමිණියේ දේවතානුස්මෘතිය වඩන්නේ යයි ද කියනු ලැබේ.

මහානාමයෙනි, යම්බඳු ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් ආගත ආර්‍ය්‍යඵල ඇතියේ විඥාත ශාසන ඇතියේ වේ නම්, හේ මේ විහාරයෙන් බහුල කොට වාස කෙරේ යයි.

**මහානාම සූත්‍රය දසවැනි යි.**

**ප්‍රථම ආහුනෙය්‍ය වර්ගය යි.**

**එහි උද්දානය:**

ආහුණෙය්‍ය සූත්‍ර දෙකය, ඉන්ද්‍රිය සූත්‍රය, බල සූත්‍රය, ආජානීය සූත්‍ර තුණය, අනුත්තරිය සූත්‍රය, අනුස්සති සූත්‍රය, මහානාම සූත්‍රය සමග ඒ සූත්‍ර දශයෙකි.

## 2. සාරාණීයවග්ගො

### 6. 1. 2. 1

### [පඨම සාරාණීයසුත්තං]

[සාවත්ථිනිදානං]

11. ඡයිමෙ භික්ඛවෙ ධම්මා සාරාණීයා.[1] කතමෙ ඡ:

(1) ඉධ භික්ඛවෙ භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරිසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො.[2]

(2) පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරිසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො.

(3) පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො.

(4) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි, තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී හොති, සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී. අයම්පි ධම්මො සාරාණීයො.

(5) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙහි සීලෙහි සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො.

(6) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යායං දිට්ඨි අරියා නීය්‍යාණිකා නීයාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මා සාරාණීයාති.

### 6. 1. 2. 2.

### [දුතිය සාරාණීයසුත්තං]

[සාවත්ථිනිදානං]

12. ඡයිමෙ භික්ඛවෙ ධම්මා සාරාණීයා පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තන්ති. කතමෙ ඡ:

(1) ඉධ භික්ඛවෙ භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

---

1. සාරණීයා - මජ්සං 2. සාරණීයො - මජ්සං 3 සබ්‍රහ්මචාරීහි - මජ්සං

## 2. සාරාණීය වග්ගය.

### 6. 1. 2. 1.

### [පඨමසාරාණීය සුත්තය]

[සැවැත්නිදාන යි]

**11**. මහණෙනි, මේ සාරාණීය (සිහිකටයුතු) ධර්ම සයෙකි. කවර සයෙක යත්:

(1) මහණෙනි, මේ සස්නෙහි මහණහට මෛත්‍රියෙන් යුත් කාය කර්මය සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිදු නො හමුයෙහිදු එළඹ සිටියේ වේ ද මේ ධර්මය ද සාරාණීය වේ.

(2) තවද මහණෙනි, භික්ෂුහට මෛත්‍රියෙන් යුත් වාක් කර්මය සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිදු නො හමුයෙහිදු එළඹ සිටියේ වේ ද මේ ධර්මය ද සාරාණීය වේ.

(3) තවද මහණෙනි, භික්ෂුහට මෛත්‍රියෙන් යුත් මනඃකර්මය සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිදු නො හමුයෙහිදු එළඹ සිටියේ වේ ද මේ ධර්මය ද සාරාණීය වේ.

(4) තවද මහණෙනි, මහණ දැහැමි වූ ධර්මයෙන් ලබනලද යටත් පිරිසෙයින් පාත්‍රපර්යාපන්න (භික්ෂා) මාත්‍ර වූ ද යම්ම ලාභ කෙනෙක් වෙත් නම්, එබඳු සිවුපසලාභයෙන් වෙන වෙන (මෙපමණ දෙමි- මොහුට දෙමි- ආදීන් සිතින්) නො බෙදුවා (තමාගේ බෙදා) වළඳන සුලුව, සිල්වත් සබ්‍රහ්මචාරීන් හා සමග සාධාරණ කොට වළඳන සුලුයේ වේ ද මේ ද සාරාණීය ධර්මයෙකි.

(5) තවද මහණෙනි, මහණ අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ භුජිෂ්‍ය වූ විඥප්‍රශස්ත වූ අපරාමෘෂ්ට වූ සමාධිය සඳහා පවත්නා යම්බඳු ශීලයෝ වෙත් නම්, එබඳු ශීලයෙන් සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිත් නො හමුයෙහිත් ශීලසාමාන්‍යයට (ශීලයෙන් සමබවට) ගියේ වාසය කෙරේ ද මේ ද සාරාණීය ධර්මයෙකි.

(6) තවද මහණෙනි, මහණ නෛර්යාණික වූ යම්ම ආර්ය දෘෂ්ටියෙක් එ වූ පරිදි කරන පුද්ගලයාගේ මොනවට දුඃඛක්ෂයය පිණිස යේ නම්, එ බඳු දෘෂ්ටියෙන් සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිත් නො හමුයෙහිත් දෘෂ්ටි සාමාන්‍යයට ගියේ වාස කෙරේ ද මේ ධර්මය ද සාරාණීය වේ.

මහණෙනි, මේ සාරාණීයධර්ම සයයි

### 6. 1. 2. 2.

### [දුතියසාරාණීය සුත්තය]

[සැවැත්නිදාන යි]

**12**. මහණෙනි, සබ්‍රහ්මචාරීනට ප්‍රිය කරණ ගරු කරණ, සංග්‍රහ සඳහා අවිවාද සඳහා සමගි බැව් සඳහා එකීභාවය සඳහා පවත්නා මේ සාරාණීය ධර්ම සයෙකි. කවර සයෙක යත්:

(1) මහණෙනි, මේ සස්නෙහි භික්ෂුහුගේ මෛත්‍රියෙන් යුත් කාය කර්මය සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිත් නො හමුයෙහිත් එළඹ සිටියේ වේ ද, සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය කරණ ගරු කරණ, මේ සාරාණීය ධර්මය ද සංග්‍ර පිණිස, අවිවාද පිණිස, සමඟිය පිණිස, එකීභාවය පිණිස පවතී,

(2) පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං හොති -පෙ-

(3) [පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො] මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

(4) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී හොති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

(5) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙහි සීලෙහි සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

(6) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මා සාරාණීයා පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තන්තීති.

## 6. 1. 2. 3.

## [නිස්සාරණීයසුත්තං]

[සාවත්ථිනිදානං]

**13.** ඡයිමා භික්ඛවෙ නිස්සාරණීයා ධාතුයො. කතමා ඡ:

(1) ඉධ භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: ''මෙත්තා හි ඛො මෙ චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ බ්‍යාපාදො චිත්තං පරියාදාය තිට්ඨතී''ති. සො මා හෙවන්තිස්ස වචනීයො: ''මායස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි. න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං මෙත්තාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස බ්‍යාපාදො චිත්තං පරියාදාය ඨස්සතීති නෙතං ඨානං විජ්ජති, නිස්සරණං හෙතං ආවුසො බ්‍යාපාදස්ස යදිදං මෙත්තාචෙතොවිමුත්තී''ති.

(2) තවද මහණෙනි, භික්ෂුහුගේ මෛත්‍රියෙන් යුත් වාක්කර්මය ... එළඹ සිටියේ වෙයි ...

(3) [තවද මහණෙනි, භික්ෂුහුගේ] මෛත්‍රියෙන් යුත් මනඃකර්මය සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිත් නො හමුයෙහිත් එළඹසිටියේ වෙයි. ප්‍රිය කරණ ගරු කරණ මෙ සාරාණීය ධර්මය ද සංග්‍රහ පිණිස, අවිවාදය පිණිස, සමගිය පිණිස, එකී භාවය පිණිස වැටෙයි.

(4) තවද මහණෙනි, මහණ දැහැමි වූ ධර්මයෙන් ලද යම් පිරිසෙයින් පාත්‍රපර්‍යාපන්නමාත්‍ර වූ ද යම් ඒ ලාභයෝ වෙත් නම්, එබඳු ලාභයෙන් අප්‍රතිවිභක්තභෝගී වෙයි, සිල්වත් සබ්‍රහ්මචාරීන් හා සාධාරණ භෝගී වෙයි. ප්‍රිය කරණ ගරු කරණ මෙ සාරාණීය ධර්මය ද සංග්‍රහ පිණිස අවිවාදය පිණිස සමගිය පිණිස එකී භාවය පිණිස වැටෙයි.

(5) තවද මහණෙනි, මහණ අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ භුජිස්‍ය වූ විඥප්‍රශස්ත වූ අපරාමෘෂ්ට වූ සමාධියට වැටෙන යම් ඒ ශීලයෝ වෙත් නම් එබඳු මාර්ගශීලයෙන් සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහි හා නො හමුයෙහි හා ශීලසාම්‍යයට ගියේ වසයි. ප්‍රිය කරණ ගරු කරණ මෙ සාරාණීය ධර්මය ද සංග්‍රහය පිණිස අවිවාදය පිණිස සමගිය පිණිස එකී භාවය පිණිස වැටෙයි.

(6) තවද මහණෙනි, මහණ නෛර්‍යාණික වූ යම් ඒ ආර්‍ය දෘෂ්ටියෙක් එය කරන්නහුවහට මනාකොට දුඃඛක්ෂය පිණිස යේ නම්, එබඳු දෘෂ්ටියෙන් සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහි හා නො හමුයෙහි හා දෘෂ්ටිසාම්‍යයට ගියේ වසයි. ප්‍රියකරණ ගරු කරණ මෙ සාරාණීය ධර්මය ද සංග්‍රහ පිණිස අවිවාදය පිණිස සමගිය පිණිස එකීභාවය පිණිස වැටෙයි.

මහණෙනි, ප්‍රිය කරණ ගරු කරණ මෙ සාරාණීය ධර්ම සදෙන සංග්‍රහ පිණිස අවිවාදය පිණිස සමගිය පිණිස එකීභාවය පිණිස වැටෙත් යයි.

### 6. 1. 2. 3.

### [නිස්සාරණීය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

13. මහණෙනි, මෙ නිස්සාරණීය ධාතු සයෙකි. කවර සයෙක යත්:

(1) මහණෙනි, මෙ සස්නෙහි මහණ "මා විසින් (ත්‍රිකචතුෂ්ක ධ්‍යානික) මෛත්‍රී චිත්තවිමුක්තිය භාවිත ය. පුන පුනා කරණලද්ද. යුක්තයානසදෘශ කරණලද්ද. පිහිට කරණලද්ද. ඉටනලද්ද. පුරුදුකරණලද්ද. මොනොවට ප්‍රගුණ කරණ ලද්ද. එතෙකුදු වුව ව්‍යාපාදය මාගේ චිත්තය වටාගෙණ සිටුනේය"යි මෙසේ කියා නම්, හේ 'තගමන් එසේ කියව'යි කියැයුතු වන්නේ ය: "ආයුෂ්මත් තගමන් මෙසේ කියව, භාග්‍යවතුන් වහන්සේට තගමක් අභ්‍යාඛ්‍යාන කරව, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන කරන්නු නොමනා ය. ඇවැත්නි, මෛත්‍රී චිත්තවිමුක්ති භාවිත බහුලීකෘත යානීකෘත වස්තුකෘත අනුෂ්ඨිත පරිචිත සුසමාරබ්ධ කල්හිදු ව්‍යාපාදය ඔහුගේ සිත මැඩැගෙණ සිටුනේ ය යන යමක් වේ නම්, තෙල කරුණ අස්ථාන ය, වන්නට අවකාශ නැත, මෙ කරුණ විද්‍යමාන නො වේ. ඇවැත්නි, යම්බඳු මේ මෛත්‍රී චෙතො විමුක්තියෙක් වේ නම්, තෙල කරුණ ව්‍යාපාදයාගේ ම නිස්සරණ යි."

(2) ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "කරුණා හි ඛො මෙ චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ විහෙසා චිත්තං පරියාදාය තිට්ඨතී"ති. සො මා හෙවන්තිස්ස වචනීයො: "මා ආයස්මා එවං අවච. මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං කරුණාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස විහෙසා චිත්තං පරියාදාය ඨස්සතී'ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො විහෙසා, යදිදං කරුණා චෙතොවිමුත්ති"ති.

(3) ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "මුදිතා හි ඛො මෙ චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ අරති චිත්තං පරියාදාය තිට්ඨතී"ති. සො මා හෙවන්තිස්ස වචනීයො: "මා ආයස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං මුදිතාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස අරති චිත්තං පරියාදාය ඨස්සතී'ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො අරතියා යදිදං මුදිතා චෙතොවිමුත්ති"ති.

(4) ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "උපෙක්ඛා හි ඛො මෙ චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ රාගො චිත්තං පරියාදාය තිට්ඨතී"ති. සො මා හෙවන්තිස්ස වචනීයො: "මා ආයස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං උපෙක්ඛාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස රාගො චිත්තං පරියාදාය ඨස්සතී'ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො රාගස්ස යදිදං උපෙක්ඛාචෙතොවිමුත්ති"ති.

(2) මහණෙනි, මේ සස්නෙහි මහණ "මා විසින් කරුණා චේතෝ විමුක්තිය වඩනලද්ද, නැවත නැවත කරණලද්ද, බහුලීකෘත ය, යානීකෘත ය, වස්තුකෘත ය, අනුෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරබ්ධ ය, එතෙකුදුවත් මාගේ සිත විහෙසා තොමෝ වටාගෙණ සිටුනීය"යි මෙසේ කියා නම්, හේ "ඇවැත්නි, නහමක් එසේ කියව"යි මෙසේ කිවයුතු වන්නේ ය: "ආයුෂ්මත් නහමක් මෙසේ කියව, භාග්‍යවතුන් වහන්සේට නහමක් අභ්‍යාඛ්‍යාන කරව, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන කරණු නො මැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො කියන්නාහ. ඇවැත්නි, කරුණාචේතෝවිමුක්තිය භාවිත බහුලීකෘත යානීකෘත වස්තුකෘත අනුෂ්ඨිත පරිචිත සුසමාරබ්ධ කල්හිදු විහෙසා තොමෝ ඔහුගේ සිත මැඩගෙණ සිටුනීය යන තෙල කරුණ නො වෙයි. අනවකාශ ය. තෙල කරුණ විද්‍යමාන නො වේ. ඇවැත්නි, යම් මේ කරුණාචේතෝ විමුක්තියෙක් වේ නම්, තෙල විහෙසාවගේ නිස්සරණය මැ"යි.

(3) මහණෙනි, මේ සස්නෙහි මහණ "මා විසින් මුදිතා චේතෝවිමුක්තිය භාවිත ය, බහුලීකෘත ය, යානීකෘත ය, වස්තුකෘත ය, අනුෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරබ්ධ ය, එතෙකුදුවුව අරතිය මාගේ චිත්තය වටාගෙණ සිටුනී ය"යි මෙසේ කියා නම්, හේ "නහමක් එසේ කියව"යි කියයුතු වන්නේ ය: "ආයුෂ්මත් නහමක් මෙසේ කියව, භාග්‍යවතුන් වහන්සේට නහමක් අභ්‍යාඛ්‍යාන කරව, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නො මනා ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොම වදාරන්නාහ. ඇවැත්නි, මුදිතා චේතෝවිමුක්තිය භාවිත බහුලීකෘත යානීකෘත වස්තුකෘත අනුෂ්ඨිත පරිචිත සුසමාරබ්ධ කල්හිදු අරතිය ඔහුගේ සිත වටා ගෙණ සිටුනේ ය යන යමක් වේ නම්, තෙල කරුණ අස්ථාන ය, වන්නට අනවකාශ ය. තෙල කරුණ විද්‍යමාන නො වේ. ඇවැත්නි, යම් මේ මුදිතා චේතෝ විමුක්තියෙක් වේ නම් තෙල අරතිහුගේ නිඃසරණය මැ"යි.

(4) මහණෙනි, මේ සස්නෙහි මහණ "මා විසින් උපේක්ෂා චේතෝ-විමුක්තිය භාවිත ය, බහුලීකෘත ය, යානීකෘත ය, වස්තුකෘත ය, අනුෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරබ්ධ ය, එතෙකුදු වුව රාගය මාගේ චිත්තය වටාගෙණ සිටුනේ ය"යි මෙසේ කියා නම්, හේ නහමක් එසේ කියවයි කිවයුතු වන්නේ ය: "ආයුෂ්මත්, නහමක් එසේ කියව, භාග්‍යවතුන් වහන්සේට නහමක් අභිබවා කියව, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නොමනා ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදාරන්නාහ. ඇවැත්නි, උපේක්ෂා චේතෝවිමුක්තිය වඩත්ම බහුලකරත්ම යුක්තයානයක් මෙන් කරත්ම පිහිට කරත්ම අධිෂ්ඨිතවත්ම පරිචිතවත්ම මොනොවට ප්‍රගුණ කරත්ම වැලිත් රාගය ඔහුගේ චිත්තය වටාගෙණ සිටුනේ ය යන යමක් වේ නම් තෙල කරුණ අස්ථාන ය, වන්නට අනවකාශ ය. තෙල කරුණ විද්‍යමාන නො වේ. ඇවැත්නි, යම් මේ උපේක්ෂා චේතෝවිමුක්තියෙක් වේ නම්, තෙල රාගයාගේ මැ නිඃසරණ වේ ය"යි.

(5) ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අනිමිත්තා හි ඛො මෙ චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ නිමිත්තානුසාරි විඤ්ඤාණං හොතී"ති. සො මා හෙවන්තිස්ස වචනීයො: "මා ආයස්මා එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි. න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං අනිමිත්තාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස නිමිත්තානුසාරි විඤ්ඤාණං භවිස්සතී'ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො සබ්බනිමිත්තානං යදිදං අනිමිත්තා චෙතො-විමුත්තී"ති.

(6) ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "අස්මීති ඛො මෙ විගතං, අයමහමස්මීති ච න සමනුපස්සාමි, අථ ච පන මෙ විචිකිච්ඡාකථංකථාසල්ලං චිත්තං පරියාදාය තිට්ඨතී"ති. සො මා හෙවන්තිස්ස වචනීයො: "මා ආයස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං අස්මීති විගතෙ අයමහමස්මීති ච න සමනුපස්සතො, අථ ච පනස්ස විචිකිච්ඡාකථං-කථාසල්ලං චිත්තං පරියාදාය ඨස්සතී'ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො විචිකිච්ඡාකථංකථාසල්ලස්ස යදිදං අස්මීතිමානසමුග්ඝා-තො"ති.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ නිස්සාරණීයා ධාතුයො'ති.

## 6. 1. 2. 4.

## [භද්දක සුත්තං]

**[සංඛෙපනිද්දෙසං]**

**14.** තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි, "ආවුසො භික්ඛවො"ති. "ආවුසො"ති, ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

තථා තථා ආවුසො භික්ඛු විහාරං කප්පෙති, යථා යථාස්ස විහාරං කප්පයතො න භද්දකං මරණං හොති න භද්දිකා කාලකිරියා.[1] කථඤ්චාවුසො. භික්ඛු තථා තථා විහාරං කප්පෙති යථා යථාස්ස විහාරං කප්පයතො න භද්දකං මරණං හොති න භද්දිකා කාලකිරියා[1].

ඉධාවුසො භික්ඛු කම්මාරාමො හොති කම්මරතො කම්මාරාමතං අනු-යුත්තො, භස්සාරාමො හොති භස්සරතො භස්සාරාමතං අනුයුත්තො, නිද්දා-රාමො හොති නිද්දාරතො නිද්දාරාමතං අනුයුත්තො, සඞ්ගණිකාරාමො හොති සඞ්ගණිකාරතො සඞ්ගණිකාරාමතං අනුයුත්තො, සංසග්ගාරාමො හොති සංසග්ගරතො සංසග්ගාරාමතං අනුයුත්තො, පපඤ්චාරාමො හොති පපඤ්චරතො පපඤ්චාරාමතං අනුයුත්තො.

---

1 කාලංකිරියා - මජසං

(5) මහණෙනි, මෙ සස්නෙහි මහණ "(බලවත් විදර්ශනා සඞ්ඛ්‍යාත) අනිමිත්ත චෙතොවිමුක්තිය මා විසින් භාවිත ය, බහුලීකෘත ය, යානීකෘත ය, වස්තුකෘත ය, අධිෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරබ්ධ ය, එතෙකුදු වුව මාගේ විඥානය (රාගාදි) නිමිත්තානුසාරී ම වේ"යයි මෙසේ කියා නම්, හේ 'නැහැමක් එසේ කියව'යි කිවයුතු වන්නේ ය: "ආයුෂ්මත් නැහැමක් එසේ කියව, භාග්‍යවත්හට නැහැමක් අභ්‍යාඛ්‍යාන කියව, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නොමනා ය. භාග්‍යවත්හු මෙසේ නො ම වදාරන්නාහ. ඇවැත්නි, අනිමිත්ත චෙතොවිමුක්තිය භාවිත වුව බහුලීකෘත වුව වස්තුකෘත වුව අධිෂ්ඨිත වුව පරිචිත වුව සුසමාරබ්ධ වුව, ඔහුගේ විඥානය නිමිත්තානුසාරීම වේ යන යමෙක් වේ නම් තෙල අස්ථාන ය, වන්නට අනවකාශ ය. තෙල කරුණ විද්‍යමාන නො වේ. ඇවැත්නි, යම්බඳු මේ අනිමිත්ත චෙතොවිමුක්තියෙක් වේ නම්, තෙල සර්ව නිමිත්තයන්ගේ ම නිඃසරණය වේ"ය යි.

(6) මහණෙනි, මෙ සස්නෙහි මහණ මට 'මම් වෙමි' යන මානය දුරුවිය. 'මෙ මම් වෙමි' යන්න ද නො දක්මි. එතෙකුදු වුව විචිකිච්ඡා සඞ්ඛ්‍යාත කථංකථාශල්‍යය මාගේ චිත්තය වටාගෙණ සිටුනේ යයි මෙසේ කියා නම්, හේ 'නැහැමක් එසේ කියව'යි කියයුතු වන්නේය: "ආයුෂ්මත් නැහැමක් එසේ කියව, භාග්‍යවත්හට නැහැමක් අභ්‍යාඛ්‍යාන කරව, භාග්‍යවත්හට අභ්‍යාඛ්‍යානය නො මනා ය භාග්‍යවත්හු මෙසේ නො ම වදාරන්නාහ. ඇවැත්නි, 'මම වෙමි' යන මානය දුරුවූව ද විචිකිච්ඡා කථංකථාශල්‍යය 'මෙ මම් වෙමි' යන්න නොදක්නහුගේ පවා චිත්තය වටාගෙණ සිටුනේ ය යන යමක් වේ නම්, තෙල අස්ථාන යි. වන්නට අනවකාශ යි. තෙල කරුණ විද්‍යමාන නො වේ. ඇවැත්නි, අස්මි යන මාන සමුද්ඝාත (අර්හත්මාර්ග)ය යන යමක් වේ නම්, තෙල විචිකිච්ඡා කථංකථාශල්‍යයාගේ ම නිඃසරණ ය"යි.

මහණෙනි, මෙ නිස්සාරණීය ධර්ම සය යි.

## 6. 1. 2. 4.

## [භද්‍රක සූත්‍රය]

### [සැවැත්නිදාන යි]

14. එකල්හි ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ "ඇවැත් මහණෙනි"යි මහණුන් ඇමතූහ. "ඇවැත්නි"යි ඒ භික්ෂූහු ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවන්ට පිළිවදන් ඇස්සූහ. ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ තෙල කරුණ දෙසූහ:

ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් වාසය කරණ ඒ මහණහුට භද්‍ර වූ මරණයෙක් නො වේ නම්, භද්‍ර වූ කාලක්‍රියායෙක් නො වේ නම්, මහණ ඒ ඒ පරිද්දෙන් වාස කරන්නේ ය. ඇවැත්නි, යම් යම් මැ පරිද්දෙකින් වාස කරණ ඒ මහණහුට භද්‍ර මරණයෙක් නො වේ නම්, භද්‍ර කාලක්‍රියායෙක් නො වේ නම්, මහණ ඒ ඒ පරිදියෙන් කෙසේ වෙසේය යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කර්මාරාම වූයේ කර්මනිරත වූයේ කර්මාරාමත්වයෙහි පුන පුනා යෙදුනේ (ග්‍රන්ථධුරාදියෙහි නොයෙදුනේ) වෙයි. භාෂ්‍යාරාම (දෙඩමලු බවෙහි ඇලුම්) ඇතියේ භාෂ්‍යයෙහි නිරත වූයේ භාෂ්‍යාරාමත්වයෙහි නැවැත නැවැත යෙදුනේ වෙයි. නිද්‍රාරාම වූයේ නිද්‍රායෙහි නිරත වූයේ නිද්‍රාරාමත්වයෙහි අනුයුක්ත වූයේ වෙයි. ගණ-සඞ්ගණිකාරාම වූයේ ගණසඞ්ගණිකායෙහි නිරත වූයේ සඞ්ගණිකාරාමත්ව-යෙහි (පිරිස් පිරිවරා ගැණීමෙහි) අනුයුක්ත වූයේ වෙයි. සංසර්ගාරාම (ගිහියන් හා හැනී විසීමෙහි ආසා) ඇතියේ සංසර්ගයෙහි නිරත වූයේ සංසර්ගාරාමත්ව-යෙහි අනුයුක්ත වූයේ වෙයි. (තෘෂ්ණා මාන දිට්ඨි යන) කෙලෙස ප්‍රපඤ්චාරාම වූයේ ප්‍රපඤ්චයෙහි නිරත වූයේ ප්‍රපඤ්චාරාමත්වයෙහි අනුයුක්ත වූයේ වෙයි.

එවං ඛො ආවුසො භික්ඛු තථා තථා විහාරං කප්පෙති, යථා යථා'ස්ස විහාරං කප්පයතො න භද්දකං මරණං හොති න භද්දිකා කාලකිරියා. අයං වුච්චතාවුසො භික්ඛු සක්කායාභිරතො න පහාසි[1] සක්කායං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය.

තථා තථාවුසො භික්ඛු විහාරං කප්පෙති යථා යථාස්ස විහාරං කප්පයතො භද්දකං මරණං හොති, භද්දිකා කාලකිරියා. කථඤ්චාවුසො භික්ඛු තථා තථා විහාරං කප්පෙති, යථා යථාස්ස විහාරං කප්පයතො භද්දකං මරණං හොති භද්දිකා කාලකිරියා.

ඉධාවුසො භික්ඛු න කම්මාරාමො හොති න කම්මරතො න කම්මාරාමතං අනුයුත්තො, න භස්සාරාමො හොති න භස්සරතො න භස්සාරාමතං අනුයුත්තො, න නිද්දාරාමො හොති, න නිද්දාරතො න නිද්දාරාමතං අනුයුත්තො, න සඞ්ගණිකාරාමො හොති න සඞ්ගණිකාරතො න සඞ්ගණිකාරාමතං අනුයුත්තො, න සංසග්ගාරාමො හොති න සංසග්ගරතො න සංසග්ගාරාමතං අනුයුත්තො, න පපඤ්චාරාමො හොති න පපඤ්චරතො න පපඤ්චාරාමතං අනුයුත්තො.

එවං ඛො ආවුසො භික්ඛු තථා තථාස්ස විහාරං කප්පෙති යථා යථාස්ස විහාරං කප්පයතො භද්දකං මරණං හොති භද්දිකා කාලකිරියා. අයං වුච්චතාවුසො භික්ඛු නිබ්බානාභිරතො පහාසි[2] සක්කායං සම්මාදුක්ඛස්ස අන්තකිරියායාති.

1. යො පපඤ්චමනුයුත්තො පපඤ්චාභිරතො මගො
   විරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං.

2. යො ච පපඤ්චං හිත්වාන නිප්පපඤ්චපදෙ රතො
   ආරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං.

## 6. 1. 2. 5.

## [අනුතප්පසුත්තං]

**[සාවත්ථිනිදානං]**

**16**. තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි. [-පෙ-]
තථා තථා ආවුසො භික්ඛු විහාරං කප්පෙති යථා යථාස්ස විහාරං කප්පයතො කාලකිරියා අනුතප්පා හොති.

කථඤ්චාවුසො භික්ඛු තථා තථා විහාරං කප්පෙති, යථා යථාස්ස විහාරං කප්පයතො කාලකිරියා අනුතප්පා හොති.

ඉධාවුසො භික්ඛු කම්මාරාමො හොති කම්මරතො කම්මාරාමතං අනුයුත්තො, භස්සාරාමො හොති -පෙ- නිද්දාරාමො හොති -පෙ- සඞ්ගණිකාරාමො හොති -පෙ- සංසග්ගාරාමො හොති -පෙ- පපඤ්චාරාමො හොති පපඤ්චරතො පපඤ්චාරාමතං අනුයුත්තො.

---

1. නප්පජහාසි - මජසං.
2. පජහාසි - මජසං.

ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් වාසය කරණ ඔහට භද්‍ර මරණයෙක් නොවේ නම්, භද්‍ර කාලක්‍රියායෙක් නොවේ නම්, මෙලෙසින් මහණ එ එ පරිද්දෙන් වාසය කෙරෙයි. ඇවැත්නි, මේ මහණ (තෙබුමුවට නාමැති) සත්කායයෙහි අභිරත වූයේ මනාහෙතුයෙන් වෘතනදුඃඛයාගේ අනතකරණය පිණිස සත්කායය නො හළේ යයි කියනු ලැබේ.

ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් වාසය කරණ ඔහුට භද්‍ර මරණයෙක් වේ නම්, භද්‍ර කාලක්‍රියායෙක් වේ නම්, මහණ එ එ පරිදියෙන් විහාර කරයි. ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් වාසය කරණ ඔහුට භද්‍ර මරණයෙක් භද්‍ර කාලක්‍රියායෙක් වේ නම් මහණ කෙසේ නම් එ එ පරිදියෙන් වෙසේද යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කර්මාරාම නැතියේ කර්මයෙහි නිරත නො වූයේ කර්මාරාමත්වයෙහි අනුයුක්ත නො වූයේ වෙයි. භාෂ්‍යාරාම නැතියේ භාෂ්‍යරත නො වූයේ භාෂ්‍යාරාමත්වයෙහි අනුයුක්ත නො වූයේ වෙයි. නිද්‍රාරාම නැතියේ නිද්‍රාරත නොවූයේ නිද්‍රාරාමත්වයෙහි අනුයුක්ත නො වූයේ වෙයි. සඞ්ගණිකාරාම නොවූයේ සඞ්ගණිකාරත නො වූයේ සඞ්ගණිකාරාමත්වයෙහි නො යෙදුනේ වෙයි. සංසර්ගාරාම නො වූයේ සංසර්ගරත නො වූයේ සංසර්ගාරාමත්වයෙහි නො යෙදුනේ වෙයි. ප්‍රපඤ්චාරාම නො වූයේ ප්‍රපඤ්චරත නො වූයේ ප්‍රපඤ්චාරාමත්වයෙහි නො යෙදුනේ වෙයි.

ඇවැත්නි, මෙසේ මහණ යම් යම් පරිද්දෙකින් වාස කරණ ඔහුට භද්‍ර මරණ වේ නම්, භද්‍ර කාලක්‍රියායෙක් වේ නම්, ඒ ඒ පරිද්දෙන් වාසය කෙරේ. ඇවැත්නි, මේ මහණ නිර්වාණයෙහි අභිරත වූයේ මනා හේතුයෙන් වෘතන දුඃඛක්‍ෂය කරණු සඳහා සත්කාය හළේ යයි කියනු ලැබේ.

(1) තුවණ නැති යමෙක් ප්‍රපඤ්චයෙහි අනුයුක්ත වූයේ ප්‍රපඤ්චයෙහි අභිරති ඇතියේ වේ නම්, හේ යොගක්‍ෂෙම නම් අනුත්තර නිර්වාණය නො ඇරැයී.

(2) යමෙකුත් ප්‍රපඤ්චය දුරලා නිෂ්ප්‍රපඤ්ච (නිර්වාණ) පදයෙහි රැඳුනේ වේ ද, හේ යොගක්‍ෂෙම් නම් වූ අනුත්තර නිර්වාණය ඇරැයී.

### 6. 1. 2. 5.

### [අනුතාප සූත්‍රය]

[සැවැත්නිදාන යි]

15. එකල්හි ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ භික්‍ෂූන් ඇමතූහ: ඇවැත්නි, යම් යම් මැ පරිද්දෙකින් වාස කරණ ඔහට කාලක්‍රියාව අනුශොචනා කටයුතු වේ නම්, මහණ එ එ පරිද්දෙන් වාස කරන්නේ ය.

ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් වාස කරණ ඔහට කාලක්‍රියාව අනුතාප කෙරේ නම්, කෙසේ මහණ ඒ ඒ පරිද්දෙන් වාස කෙරේය යත්:

ඇවැත්නි, මේ සස්නෙහි මහණ කර්මාරාම වූයේ කර්මයෙහි අභිරත වූයේ කර්මාරාමත්වයෙහි යෙදුනේ වෙයි. භාෂ්‍යාරාම ඇතියේ .... වෙයි. නිද්‍රාරාමතා ඇතියේ .... සඞ්ගණිකාරාමතා ඇතියේ .... සංසර්ගාරාමතා ඇතියේ ... වෙයි. ප්‍රපඤ්චාරාමතා ඇතියේ ප්‍රපඤ්චරත වූයේ ප්‍රපඤ්චාරාමත්වයෙහි යෙදුනේ වෙයි. ....

එවං ඛො ආවුසො භික්ඛු තථා තථා විහාරං කප්පෙති, යථා යථාස්ස විහාරං කප්පයතො කාලකිරියා අනුතප්පා හොති. අයං වුච්චතාවුසො භික්ඛු සක්කායාභිරතො න පහාසි සක්කායං සම්මාදුක්ඛස්ස අන්තකිරියාය.

තථා තථා ආවුසො භික්ඛු විහාරං කප්පෙති යථා යථාස්ස විහාරං කප්පයතො කාලකිරියා අනනුතප්පා හොති.

කථඤ්චාවුසො භික්ඛු තථා තථා විහාරං කප්පෙති යථා යථාස්ස විහාර කප්පයතො කාලකිරියා අනනුතප්පා හොති:

ඉධාවුසො භික්ඛු න කම්මාරාමො හොති න කම්මරතො න කම්මාරාමතං අනුයුත්තො -පෙ- න භස්සාරාමො හොති -පෙ- න නිද්දාරාමො හොති -පෙ- න සංගණිකාරාමො හොති -පෙ- න සංසග්ගාරාමො හොති -පෙ- න පපඤ්චාරාමො හොති න පපඤ්චරතො න පපඤ්චාරාමතං අනුයුත්තො.

එවං ඛො ආවුසො භික්ඛු තථා තථා විහාරං කප්පෙති යථා යථාස්ස විහාරං කප්පයතො කාලකිරියා අනනුතප්පා හොති. අයං වුච්චතාවුසො භික්ඛු නිබ්බානාභිරතො පහාසි සක්කායං සම්මාදුක්ඛස්ස අන්තකිරියායාති.

3. යො පපඤ්චමනුයුත්තො පපඤ්චාභිරතො මගො
විරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං.

4. යො ච පපඤ්චං හිත්වාන නිප්පපඤ්චපදෙ රතො
ආරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරන්ති.

## 6. 1. 2. 6.

## [නකුලපිතුසුත්තං]

**16.** එකං සමයං භගවා **භග්ගෙසු** විහරති **සුංසුමාරගිරෙ** භෙසකලාවනෙ **මිගදායෙ**. තෙන ඛො පන සමයෙන **නකුලපිතා** ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො **නකුලමාතා** ගහපතානී නකුලපිතරං ගහපතිං එතදවොච:

(1) මා ඛො ත්වං ගහපති සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා ගහපති සාපෙක්ඛස්ස කාලකිරියා.[1] ගරහිතා ච භගවතා සාපෙක්ඛස්ස කාලකිරියා. සියා ඛො පන තෙ ගහපති එවමස්ස. "න නකුලමාතා ගහපතානී මමච්චයෙන සක්ඛිස්සති දාරකෙ පොසෙතුං ඝරාවාසං සන්ථරිතුන්ති"[2] න ඛො පනෙතං ගහපති එවං දට්ඨබ්බං. කුසලාහං ගහපති කප්පාසං කන්තිතුං, වෙණිං ඔලිඛිතුං. සක්කොමහං ගහපති තවච්චයෙන දාරකෙ පොසෙතුං ඝරාවාසං සන්ථරිතුං.[3] තස්මාතිහ ත්වං ගහපති මා සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා ගහපති සාපෙක්ඛස්ස කාලකිරියා. ගරහිතා ච භගවතා සාපෙක්ඛස්ස කාලකිරියා.[1]

---

1 කාලංකිරියා - මජසං 2 සණ්ඨරිතුන්ති - මජසං 3 සණ්ඨරිතුං - මජසං

ඇවැත්නි, මහණ මෙ සෙයින් යම් යම් පරිද්දෙකින් වාසය කරණ ඔහට කාලක්‍රියාව අනුතාප කටයුතු වේ නම්, ඒ ඒ පරිද්දියෙන් විහරණ කරන්නේ ය. ඇවැත්නි, සත්කායයෙහි අභිරත මෙ මහණ මනා හේතුයෙන් වෘත්තදුඃඛයාගේ ක්ෂය කිරීම සඳහා සත්කාය ප්‍රහීණ නො කෙළේ ය යි කියනු ලැබේ

ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් වාසය කරණ ඔහට කාලක්‍රියාව අනුතාපකර නො වේ නම්, භික්ෂු ඒ ඒ පරිද්දෙන් වාස කරන්නේ ය.
ඇවැත්නි, යම් යම් පරිද්දෙකින් වාසය කරණ ඔහට කාලක්‍රියාව අනුතාපකර නො වේ නම්, මහණ කෙසෙයින් එ එ පරිද්දෙන් වාස කරන්නේ ද යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කර්මාරාමතා නැතියේ කර්මරත නො වූයේ කර්මාරාමතායෙහි අනුයුක්ත නො වෙයි. .... භාෂ්‍යාරාම නො වෙයි. .... නිද්‍රාරාම නො වෙයි. .... සඞ්ගණිකාරාම නො වෙයි. .... සංසග්ගාරාම නො වෙයි. ... ප්‍රපඤ්චාරාම නො වූයේ ප්‍රපඤ්ච රත නො වූයේ ප්‍රපඤ්චාරාමත්වයෙහි අනුයුක්ත නො වූයේ වෙයි.

ඇවැත්නි, යම් යම් අයුරෙකින් වෙසෙන ඔහට කාලක්‍රියාව අනුතාප නො වේ නම්, භික්ෂු මෙ සෙයින් එ එ පරිදි වාසය කරන්නේ ය. ඇවැත්නි, නිර්වාණයෙහි අභිරත වූ මෙ මහණ මැනැවින් දුඃඛක්ෂය කරනු සඳහා සත්කාය ය ප්‍රහීණ කෙළේ යයි කියනු ලැබේ.

3 යමෙක් මෘග සදෘශ වූයේ ප්‍රපඤ්චයෙහි අනුයුක්ත වූයේ වේ නම්, අනුත්තර යොගක්ෂෙම නිර්වාණය වැරැදූ විය.

4. යමෙක් ප්‍රපඤ්චය හැරදමා නිෂ්ප්‍රපඤ්ච (නිර්වාණ) පදයෙහි ඇලුනේ ද, හේ අනුත්තර යොගක්ෂෙම නිර්වාණ පදය ඇරැයී යයි.

## 6. 1. 2. 6

## [නකුලපිතු සූත්‍රය]

**16.** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භග්ග ජනපදයෙහි සුංසුමාරගිර නගරය සමීපයෙහි භෙසකලාවන නම් මෘගදාවයෙහි වැඩ වසන සේක. එ කල්හි නකුල පිතෘ ගෘහපති රොගී වූයේ හටගත් දුක් ඇතියේ දල ගිලන්බව ඇතියේ වෙයි. එක්බිති නකුල මාතෘ ගැහැවිඳු නකුල පිතෘගෘහපතිහට තෙල කරුණ සැලකළා ය:

(1) ගෘහපතියෙනි, මුඹ සාපෙක්ෂව (තෘෂ්ණාසහිතව) නහමක් කලුරිය කරව. ගෘහපතියෙනි, සාපෙක්ෂහට කලුරිය කිරීම දුක් වෙයි. සාපෙක්ෂයාගේ කාලක්‍රියාව භාග්‍යවතුන් වහන්සේ විසිනුදු ගරහන ලදු ය. ගෘහපතියෙනි, "මාගේ ඇවෑමෙන් නකුලමාතෘ ගෙහි දරුවන් පුස්නට ගෘහවාසය පවත්වනුවට නො හැකිවන්නීය" යන මෙබඳු සිතෙක් මුඹට වනු හැකි. ගෘහපතියෙනි, තෙල කරුණ එසෙයින් නො දක්ක යුතු. ගෘහපතියෙනි, මම කපු කටිනට, එළ ලොම් වෙළ නෙළනට කුසලයෙමි. ගෘහපතියෙනි, මුඹගේ ඇවෑමෙන් මම දරුවන් පුස්නට හා ගෘහවාසය පවත්වනුවට පොහොසත්මි. ගෘහපතියෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා මුඹ සාපෙක්ෂව නහමක් කලුරිය කරව. ගෘහපතියෙනි, සාපෙක්ෂයාහට කාලක්‍රියාව දුකෙක. සාපෙක්ෂයාගේ කාලක්‍රියාව භාග්‍යවතුන්වහන්සේ විසිනුදු ගරහන ලදු ය.

(2) සියා ඛො පන තෙ ගහපති එවමස්ස: "නකුලමාතා ගහපතානී මමච්චයෙන අඤ්ඤං වරං[1] ගමිස්සතී"ති. න ඛො පනෙතං ගහපති එවං දට්ඨබ්බං. ත්වං චෙව ඛො ගහපති ජානාසි අහං ච, යද නො[2] සොළස වස්සානි ගහට්ඨකං බ්‍රහ්මචරියං සමාදින්නං. තස්මාතිහ ත්වං ගහපති මා සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා ගහපති සාපෙක්ඛස්ස කාලකිරියා. ගරහිතා ච භගවතා සාපෙක්ඛස්ස කාලකිරියා.

(3) සියා ඛො පන තෙ ගහපති එවමස්ස: "නකුලමාතා ගහපතානී මමච්චයෙන න දස්සනකාමා භවිස්සති භගවතො, න දස්සනකාමා භික්ඛු-සඞ්ඝස්සා"ති. න ඛො පනෙතං ගහපති එවං දට්ඨබ්බං. අහං හි ගහපති තවච්චයෙන දස්සනකාමතරා චෙව භවිස්සාමි භගවතො, දස්සනකාමතරා ච භික්ඛුසඞ්ඝස්ස. තස්මාතිහ ත්වං ගහපති මා සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා ගහපති සාපෙක්ඛස්ස කාලකිරියා. ගරහිතා ච භගවතා සාපෙක්ඛස්ස කාලකිරියා.

(4) සියා ඛො පන තෙ ගහපති එවමස්ස: "න නකුලමාතා ගහපතානී මමච්චයෙන සීලෙසු පරිපූරකාරිනී"ති. න ඛො පනෙතං ගහපති එවං දට්ඨබ්බං. යාවතා ඛො ගහපති තස්ස භගවතො සාවිකා ගිහී ඕදාතවසනා සීලෙසු පරිපූරකාරිනියො, අහං තාසං අඤ්ඤතරා. යස්ස ඛො පනස්ස කඞ්ඛා වා විමති වා, අයං සො භගවා අරහං සම්මාසම්බුද්ධො භග්ගෙසු විහරති සුංසුමාරගිරේ භෙසකලාවනෙ මිගදායෙ, තං භගවන්තං උපසඞ්කමිත්වා පුච්ඡතු. තස්මාතිහ ත්වං ගහපති මා සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා ගහපති සාපෙක්ඛස්ස කාලකිරියා. ගරහිතා ච භගවතා සාපෙක්ඛස්ස කාලකිරියා.

(5) සියා ඛො පන තෙ ගහපති එවමස්ස: "න නකුලමාතා ගහපතානී ලාභිනී අජ්ඣත්තං චෙතොසමථස්සා"ති. න ඛො පනෙතං ගහපති එවං දට්ඨබ්බං. යාවතා ඛො ගහපති තස්ස භගවතො සාවිකා ගිහී ඕදාතවසනා ලාභිනියො අජ්ඣත්තං චෙතොසමථස්ස, අහං තාසං අඤ්ඤතරා. යස්ස ඛො පනස්ස කඞ්ඛා වා විමති වා, අයං සො භගවා අරහං සම්මාසම්බුද්ධො භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. තං භගවන්තං උපසඞ්කමිත්වා පුච්ඡතු. තස්මාතිහ ත්වං ගහපති මා සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා ගහපති සාපෙක්ඛස්ස කාලකිරියා. ගරහිතා ච භගවතා සාපෙක්ඛස්ස කාලකිරියා.

---

1. ඝරං - මජ්ඣං, වරං - සීමු, අට්ඨා. 2 යං නො - මජ්ඣං, සදනෙ - සීමු,

(2) ගැහැවියෙනි, ''මාගේ ඇවෑමෙන් නකුලමාතෘ ගෘහපතානී අන් වරයකු (සැමියකු) වෙත යන්නී ය''. මේ බඳු සිතෙක් තුබට විය හෙන්නේ ය. ගැහැවියෙනි, තෙල එසේ නො දක්ක යුතු. ගැහැවියෙනි, යම් කලෙක අප විසින් සොළොස්වසක් ගෘහස්ථ බ්‍රහ්මචර්‍ය්‍යය සමාදන් වන ලද නම් එ බව තුබ ද දන්ව, මම ද දන්මි. ගෘහපතියෙනි, එහෙයින් මේ කරුණෙහි ලා තුබ සාපෙක්ෂව නහමක් කලුරිය කරව. ගෘහපතියෙනි, සාපේක්ෂකයාගේ කාලක්‍රියාව දුකෙක. භාග්‍යවතුන් වහන්සේ විසිනුදු සාපේක්ෂයාගේ කාලක්‍රියාව ගරහන ලදී.

(3) ගෘහපතියෙනි, ''නකුලමාතා ගෘහපතනිය මගේ ඇවෑමෙන් භාග්‍ය-වතුන් වහන්සේ දක්නට, භික්ෂු සඞ්ඝයා දක්නට නො කැමැති වේ''යයි යන මෙ බඳු සිතෙක් තුබට වනු හෙයි. ගෘහපතියෙනි, තෙල මෙසේ නො දක්කයුතු. මම තුබගේ ඇවෑමෙන් භාග්‍යවතුන් වැඩියක් ම දක්නා කැමැතියෙමි. භික්සඟුන් වැඩියක් ම දකිනු කැමැතියෙමි. ගෘහපතියෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා තුබ සාපේක්ෂකව නහමක් කලුරිය කරව. ගෘහපතියෙනි, සාපේක්ෂයාගේ කාලක්‍රියාව දුකෙක. සාපේක්ෂයාගේ කාලක්‍රියාව භාග්‍යවතුන් වහන්සේ විසිනුදු ගරහන ලදී.

(4) ගැහැවියෙනි, ''නකුලමාතෘගෘහපතනී මාගේ ඇවෑමෙන් සීලයෙහි පරිපූරකාරිණී නො වන්නීය යන මෙ බඳු සිතෙක් තොපට ඇතිවිය හෙයි. ගෘහපතියෙනි' තෙල එසේ නො දක්කයුතු. ගෘහපතියෙනි, එ භගවත්හුගේ සුදුවත් හඳනා ගෙහි වසන සිල්හි පරිපූරකාරිණී වූ යම් පමණ ශ්‍රාවිකාවෝ වෙත් නම් මම උන් අතුරෙහි අන්‍යතරයක්මි. යමකුට මෙය පිළිබඳ කාඞ්ක්‍ෂායෙක් හෝ විමතියෙක් හෝ වේ නම්, එ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ භග්ගජනපදයෙහි සුංසුමාරගිර අසල භේසකලා වන නම් මිගදායෙහි වසන සේක. ඒ භගවතුන් කරා ගොස් පුළුවුස්වා. ගැහැවියෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා තුබ නහමක් සාපේක්ෂව කලුරිය කරව. ගැහැවියෙනි, සාපේක්ෂයාගේ කලුරිය දුකෙක. සාපේක්ෂයාගේ කාලක්‍රියාව භගවත්හු විසිනුදු ගර්හිත ය.

(5) ගෘහපතියෙනි, ''නකුලමාතෘගෘහපතනී අධ්‍යාත්මයෙහි චිත්තශමථය නො ලබන්නීය'' යන මෙ බඳු සිතෙක් තට විය හෙයි. ගැහැවියෙනි, තෙල කරුණ එසේ නො දක්ක යුතු. ගැහැවියෙනි, ගිහිගෙහි වසන සුදුවත් හැඳි අධ්‍යාත්මයෙහි චිත්තශමථය ලබනසුලු යම් පමණ ශ්‍රාවිකාවෝ ඒ භගවත්හට වෙත් නම්, මම උන් අතර අන්‍යතරයක්මි. යමකුට මෙය පිළිබඳ කාඞ්ක්‍ෂායෙක් හෝ විමතියෙක් හෝ වේ නම් මෙ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ භග්ගජනපදයෙහි සුංසුමාරගිර අසල භේස-කලාවන නම් මිගදායෙහි වෙසෙති. ඒ භගවත්හු කරා එළඹ පුළුවුස්වා. ගැහැවියෙනි, එහෙයින් තුබ සාපෙක්ෂව නහමක් කලුරිය කරව. ගෘහ-පතියෙනි, සාපෙක්ෂයාහට කාලක්‍රියාව දුකෙක. සාපෙක්ෂයාගේ කාලක්‍රියාව භාග්‍යවතුන් වහන්සේ විසිනුදු ගර්හිත ය.

Free Distribution www.aathaapi.org

(6) සියා ඛො පන තෙ ගහපති එවමස්ස: "න නකුලමාතා ගහපතානී ඉමස්මිං ධම්මවිනයෙ ඔගාධප්පත්තා පතිගාධප්පත්තා අස්සාසප්පත්තා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විහරතී"ති. න ඛො පනෙතං ගහපති එවං දට්ඨබ්බං. යාවතා ඛො ගහපති තස්ස භගවතො සාවිකා ගිහී ඔදාතවසනා ඉමස්මිං ධම්මවිනයෙ ඔගාධප්පත්තා පතිගාධප්පත්තා අස්සාසප්පත්තා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විහරන්ති, අහං තාසං අඤ්ඤතරා. යස්ස ඛො පනස්ස කඞ්ඛා වා විමති වා, අයං සො භගවා අරහං සම්මාසම්බුද්ධො භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. තං භගවන්තං උපසඞ්කමිත්වා පුච්ඡතු. තස්මාතිහ ත්වං ගහපති මා සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා ගහපති සාපෙක්ඛස්ස කාලකිරියා. ගරහිතා ච භගවතා සාපෙක්ඛස්ස කාලකිරියාති.

අථ ඛො නකුලපිතුනො ගහපතිස්ස නකුලමාතාය ගහපතානියා ඉමිනා ඔවාදෙන ඔවදියමානස්ස සො ආබාධො ඨානසො පටිප්පස්සම්භි. වුට්ඨාහි ච නකුලපිතා ගහපති තම්හා ආබාධා, තථා පහීනො ච පන නකුලපිතුනො ගහපතිස්ස සො ආබාධො අහොසි.

අථ ඛො නකුලපිතා ගහපති ගිලානා වුට්ඨිතො අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා, දණ්ඩමොලුබ්භ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො නකුලපිතරං ගහපතිං භගවා එතදවොච:

ලාභා තෙ ගහපති, සුලද්ධං තෙ ගහපති, යස්ස තෙ නකුලමාතා ගහපතානී අනුකම්පිකා අත්ථකාමා ඔවාදිකා අනුසාසිකා.

යාවතා ඛො ගහපති මම සාවිකා ගිහී ඔදාතවසනා සීලෙසු පරිපූරකාරිණියො, නකුලමාතා ගහපතානී තාසං අඤ්ඤතරා. යාවතා ඛො ගහපති මම සාවිකා ගිහි ඔදාතවසනා ලාභිනියො අජ්ඣත්තං චෙතොසමථස්ස, නකුලමාතා ගහපතානි තාසං අඤ්ඤතරා. යාවතා ඛො ගහපති මම සාවිකා ගිහී ඔදාතවසනා ඉමස්මිං ධම්මවිනයෙ ඔගාධප්පත්තා පතිගාධප්පත්තා අස්සාසප්පත්තා. තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විහරන්තියො, නකුලමාතා ගහපතානී තාසං අඤ්ඤතරා.

ලාභා තෙ ගහපති, සුලද්ධං තෙ ගහපති, යස්ස තෙ නකුලමාතා ගහපතානී අනුකම්පිකා අත්ථකාමා ඔවාදිකා අනුසාසිකාති.

ගෘහපතියෙනි, "නකුලමාතෘගෘහපතනී මේ ධර්ම විනයෙහි අනුප්‍රවේශයට පැමිණියා, ප්‍රතිෂ්ඨාවට පැමිණියා, ආස්වාදයට පැමිණියා, තරණය කළ විචිකිච්ඡා ඇත්තී, ප්‍රහීණ කළ වෛමතිකභාවය ඇත්තී, සොම්නස් සහගිය නුවණට පැමිණියා, ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය නැත්තී නො වසන්නීය" යන මෙබඳු සිතෙක් තට විය හෙන්නේ ය. ගෘහපතියෙනි, තොප එසේ නො දක්කයුතු. ගෘහපතියෙනි, ගිහිගෙයි වසන සුදුවත් හඳනා යම් පමණ සෙදගැමි කෙනෙක් ඒ භාග්‍යවතුන් වහන්සේගේ මේ ධර්ම විනයෙහි අනුප්‍රවේශයට පැමිණියාහු ප්‍රතිෂ්ඨාවට පැමිණියාහු ආස්වාදයට පැමිණියාහු සෞමනස්‍යඥානයට පැමිණියාහු ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යයරහිත වූවාහු වෙසෙත් නම්, මම ඔවුන් අතුරෙහි අන්‍යතරයක්මි. යමෙක් පිළිබඳ කාංක්ෂායෙක් වේවයි විමතියෙක් වේවයි වේ නම්, මේ එ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ භග්ගජනපදයෙහි සුංසුමාරගිර නගරය අසල භෙසකලාවන නම් මෘගදාවයෙහි වැඩවසනසේක. එ භාග්‍යවතුන් කරා එළඹ පුළුවුස්ව. ගෘහපතියෙනි, එහෙයින් මේකරුණෙහි ලා මුඹ සාපෙක්ෂ ව නහමක් කලුරිය කරව. ගෘහපතියෙනි, සාපෙක්ෂයාහට කාලක්‍රියාව දුකෙක. භාග්‍යවතුන්වහන්සේ විසිනු දු සාපෙක්ෂයාගේ කාල-ක්‍රියාව ගර්හිතය යි.

ඉක්බිති නකුලමාතෘගෘහපතනිය විසින් මේ අවවාදයෙන් ඔවදන් කරුණු ලබන නකුලපිතෘගෘහපතිහුගේ ඒ ආබාධය ප්‍රත්‍යය විසින් සන්හින. නකුලපිතෘගෘහපති එ රෝගයෙන් නැගී සිටියේ ය. නකුලපිතෘගෘහපතිහුගේ එ ආබාධය එසෙයින් ම ප්‍රහීණ විය.

ඉක්බිති ගිලන් බැවින් නැගී සිටි නකුලපිතෘගෘහපති ගිලනින් නැඟිසිටි නොබෝකල් ඇතියේ සරයටියෙහි එල්බගෙන බුදුන් කරා එළැඹියේ ය. එළඹ බුදුන් වැඳ එකත්පස්වැ හින. බුදුහු පසෙක හුන් නකුලපිතෘගෘහපති හට තෙල කරුණ වදාළහ:

ගෘහපතිය, තට මහාලාභයෙක. ගෘහපතිය, යම්බඳු තොපට නකුල-මාතෘගහපතනිය, අනුකම්පා ඇත්තී අරුත් කැමැත්තී, ඔවා දෙන සුලු වූවා අනුශාසනා කරන්නී වේ ද, ඒ තොපට මහා ලාභයෙක.

ගෘහපතිය, ගිහිගෙයි වසන සුදුවත් හඳනා යම්පමණ මාගේ සැවිනු සීලයෙහි පරිපූරකාරිණීහු වෙත් නම්, නකුලමාතෘගෘහපතනී ඔවුනතුරෙන් අන්‍යතරයක. ගෘහපතිය, ගෙහි වසන සුදුවත් හඳනා යම් පමණ මාගේ සැවිහු අධ්‍යාත්මයෙහි සමාධිකම්ස්ථාන ලබන්නාහු වෙත් නම්, නකුල මාතෘගෘහපතනීඔවුනතුරෙන් අන්‍යතර වෙයි. ගෘහපතිය, ගෙහි වසන සුදුවත් හඳනා යම් පමණ මාගේ සැවිහු මේ ධර්මවිනයෙහි අනුප්‍රවේශයට පැමිණියාහු ප්‍රතිෂ්ඨාවට පැමිණියාහු ආශ්වාදයට පැමිණියාහු තරණය කළ විචිකිච්ඡා ඇතියාහු වෛසාරද්‍ය බවට පැමිණියාහු ශාස්තෘශාසනයෙහි පර-ප්‍රත්‍යය රහිතව වසන්නාහු වෙත් නම්, නකුලමාතෘගෘහපතනී ඔවුනතුරෙහි අන්‍යතර වෙයි.

ගෘහපතිය, තොපට ලාභයෙක. ගෘහපතිය යම්බඳු තොපට නකුලමාතෘ ගෘහපතනිය අනුකම්පා ඇත්තී අර්ථ කැමැත්තී අවවාද කරන්නී අනුශාසනා කරන්නී වේ ද, තොපට එය මහා ලාභයෙකැයි.

2

## 6. 1. 2. 7.

## [කුසලසුත්තං]

**17.** එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

ආයස්මාපි ඛො **සාරිපුත්තො** සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. ආයස්මාපි ඛො **මහාමොග්ගල්ලානො** -පෙ- ආයස්මාපි ඛො **මහාකස්සපො** -පෙ- ආයස්මාපි ඛො **මහාකච්චායනො** -පෙ- ආයස්මාපි ඛො **මහාකොට්ඨිතො** -පෙ- ආයස්මාපි ඛො **මහාචුන්දො** -පෙ- ආයස්මාපි ඛො **මහාකප්පිනො** -පෙ- ආයස්මාපි ඛො **අනුරුද්ධො** -පෙ- ආයස්මාපි ඛො **රෙවතො** -පෙ- ආයස්මාපි ඛො **ආනන්දො** සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

අථ ඛො භගවා බහුදෙව රත්තිං නිසජ්ජාය වීතිනාමෙත්වා උට්ඨායාසනා විහාරං පාවිසි. තෙපි ඛො ආයස්මන්තො අචිරපක්කන්තස්ස භගවතො උට්ඨායාසනා යථාවිහාරං අගමංසු.

යෙ පන තත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙ යාව සූරියුග්ගමනා කාකච්ඡමානා සුපිංසු. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන තෙ භික්ඛූ යාව සූරියුග්ගමනා කාකච්ඡමානෙ සුපන්තෙ. දිස්වා යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා තෙ භික්ඛූ ආමන්තෙසි:

කහං නු ඛො භික්ඛවෙ සාරිපුත්තො, කහං මහාමොග්ගල්ලානො, කහං මහාකස්සපො, කහං මහාකච්චායනො, කහං මහාකොට්ඨිතො, කහං මහාචුන්දො, කහං මහාකප්පිනො, කහං අනුරුද්ධො, කහං රෙවතො, කහං ආනන්දො, කහං නු ඛො තෙ භික්ඛවෙ ථෙරා සාවකා ගතාති?

තෙපි ඛො භන්තෙ ආයස්මන්තො අචිරපක්කන්තස්ස භගවතො උට්ඨායාසනා යථාවිහාරං අගමංසූති.

කෙන නො තුම්හෙ භික්ඛවෙ ථෙරා භික්ඛූ ගතා'ති නවා[1] යාව සූරියස්සුග්ගමනා[2] කාකච්ඡමානා සුපථ.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු තුම්හෙහි දිට්ඨං වා සුතං වා "රාජා ඛත්තියො මුද්ධාවසිත්තො යාවදත්ථං සෙය්‍යසුඛං පස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරන්තො යාවජීවං රජ්ජං කාරෙන්තො ජනපදස්ස වා පියො මනාපො"ති.

නො හෙතං භන්තෙ.

---

1 කාකච්ඡාති - මජ්සං 2 යාව සූරියුග්ගමනා - මජ්සං

6. 1. 2. 7.

[කුසල සූත්‍රය]

17 එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර **අනේපිඬු-සිටුහුගේ ජේතවන** නම් ආරාමයෙහි වසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කල්හි පිළිසලතින් නැගී සිටිසේක් උපස්ථානශාලාව කරා එළඹියහ. එළඹ පැන්වූ අස්නෙහි හුන්හ.

**ආයුෂ්මත් සාරිපුත්ත** තෙරණුවෝ ද සවස්වරුයෙහි පිළිසලතින් නැගී සිටියාහු උපස්ථානහල කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වැඳ එකත්පස්ව හුන්හ. ආයුෂ්මත් **මහාමොග්ගල්ලාන** තෙරණුවෝ ද ... ආයුෂ්මත් **මහා-කස්සප** තෙරණුවෝ ද ... ආයුෂ්මත් **මහාකච්චායන** තෙරණුවෝ ද ... ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවෝ ද .... ආයුෂ්මත් **මහාචුන්ද** තෙරණු-වෝ ද ... ආයුෂ්මත් **මහාකප්පින** තෙරණුවෝ ද ... ආයුෂ්මත් **අනුරුද්ධ** තෙරණුවෝ ද ... ආයුෂ්මත් **රේවත** තෙරණුවෝ ද ... ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ ද සවස්වරුයෙහි පිළිසලතින් නැගී සිටියාහු උපස්ථානහල් කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝකල් නිෂද්‍යායෙන් ගෙවා හුනස්නෙන් නැගී විහාරයට පිවිස වදාළහ. එ ආයුෂ්මත්හු ද භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි නොබෝකල් වත්ම හුනස්නෙන් නැගී තමන් තමන්ගේ වෙහෙරට වැඩියහ.

එහි පැවිදිවූ නොබෝකල් ඇති මේ ධර්මවිනයට අලුත්‍ආගත වූ යම් නවක භික්ෂුහු වූහු නම්, ඔහු සූර්‍ය්‍යොදගමය තෙක් කස්මින් නිදිගත්හ. භාග්‍යවතුන් වහන්සේ මිනිසැස් ඉක්ම පවත්නා විශුද්ධ වූ දිව්‍ය චක්ෂුසින් සූර්‍ය්‍යොදගමය තෙක් කස්මින් හෝනා එ මහණුන් දුටු සේක. දැක වදුරා උපස්ථාන ශාලාව වෙත එළඹියහ. එළඹ පැන්වූ අස්නෙහි වැඩහුන් සේක. හිඳ භාග්‍යවතුන් වහන්සේ එ මහණුන් අමතා වදාළසේක:

මහණෙනි, **සැරියුත්හු** කොහි ද? **මහමුගලන්හු** කොහි ද? **මහකසුබුහු** කොහි ද? **මහකසයින්හු** කොහි ද? **මහාකොට්ඨිතයෝ** කොහි ද? **මහාචුන්දයෝ** කොහි ද? **මහාකප්පිනයෝ** කොහි ද? **අනුරුද්ධයෝ** කොහි ද? **රේවතයෝ** කොහි ද? **ආනන්දයෝ** කොහි ද? මහණෙනි, එ ස්ථවිර ශ්‍රාවක භික්ෂුහු කොහි ගියාහු දැ?යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි නොබෝකල් වත්ම එ ආයුෂ්මත්හු ද හුනස්නෙන් නැගී තමන් තමන්ගේ වෙහෙරට ගියහයි.

මහණෙනි, කවරහෙයෙකින් ''ස්ථවිර භික්ෂුහු ගියහ''යි නවක වූ තෙපි කස්මින් සූර්‍ය්‍යොදගමය තෙක් හෝනහු ද?

මහණෙනි, ඒ කිමැයි හඟිවූ ද? කිම: මූර්ධාභිෂික්ත ක්‍ෂත්‍රිය රජ කැමැති තාක් යහන් සුවයෙහි පහස් සුවයෙහි නිදිසුවයෙහි යෙදී වාස කරණුයේ යම්දිවි රජකරණුයේ ජනපදයට ප්‍රිය මනාප වේය' යන තෙල තොප විසින් දක්නා ලද ද? නැතහොත් අසන ලද දැ?යි.

වහන්ස, තෙල කරුණ නැත් මැයි.

සාධු භික්ඛවෙ, මයා පි ඛො එතං භික්ඛවෙ නෙව දිට්ඨං න සුතං "රාජා ඛත්තියො මුද්ධාවසිත්තො යාවදත්ථං සෙය්‍යසුඛං ඵස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරන්තො යාවජීවං රජ්ජං කාරෙන්තො ජනපදස්ස වා පියො මනාපො"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු තුම්හෙහි දිට්ඨං වා සුතං වා "රට්ඨිකො -පෙ- පෙත්තනිකො -පෙ- සෙනාපතිකො -පෙ- ගාමගාමණිකො -පෙ- පූගගාමණිකො යාවදත්ථං සෙය්‍යසුඛං ඵස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරන්තො යාවජීවං පූගගාමණිකත්තං කාරෙන්තො පූගස්ස වා පියො මනාපො?"ති.

නො හෙතං භන්තෙ.

සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ නෙව දිට්ඨං න සුතං "[-පෙ-] පූගගාමණිකො යාවදත්ථං සෙය්‍යසුඛං ඵස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරන්තො යාවජීවං පූගගාමණිකත්තං කාරෙන්තො පූගස්ස වා පියො මනාපො"ති

තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු තුම්හෙහි දිට්ඨං වා සුතං වා "සමණො වා බ්‍රාහ්මණො වා යාවදත්ථං සෙය්‍යසුඛං ඵස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො භොජනෙ අමත්තඤ්ඤූ ජාගරියං අනනුයුත්තො අවිපස්සකො කුසලානං ධම්මානං පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං[1] ධම්මානං භාවනානුයොගං අනනුයුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තො?"ති.

නො හෙතං භන්තෙ.

සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ නෙව දිට්ඨං න සුතං "සමණො වා බ්‍රාහ්මණො වා යාවදත්ථං සෙය්‍යසුඛං ඵස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො භොජනෙ අමත්තඤ්ඤූ ජාගරියං අනනුයුත්තො අවිපස්සකො කුසලානං ධම්මානං පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං[1] ධම්මානං භාවනානුයොගං අනනුයුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තො"ති.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: "ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භවිස්සාම භොජනෙ මත්තඤ්ඤුනො ජාගරියං අනුයුත්තා විපස්සකා කුසලානං ධම්මානං පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං[1] ධම්මානං භාවනානුයොගං අනුයුත්තා විහරිස්සාමා"ති.

එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

---

1 බොධිපක්ඛිකානං - මජසං. සං.

මහණෙනි, මැනැව. මහණෙනි, මා විසිනුදු ‘මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය රජෙක් කැමැති තාක් යහන් සුවයෙහි පහස්සුවයෙහි නිදිසුවයෙහි යෙදී වෙසෙමින් යව්දිවි රජය කරණුයේ ජනපදයට ප්‍රිය මනාප වේය’ යන තෙල නො මැ දක්නා ලදි. නො අසන ලදි.

මහණෙනි, එ කවරැයි හඟිවු ද? කිම! තොප විසින් ‘රැටියෙක් වේව’යි... පියාසතු දායාද්‍ය ඇතියෙක් වේවයි ... සෙන්පතියෙක් වේවයි ... ග්‍රාම භොජකයෙක් වේවයි ... ගණදෙට්ටුයෙක් වේවයි කැමැති තාක් යහන් සුව-යෙහි පහස් සුවයෙහි නිදිසුවයෙහි යෙදී වාස කරමින් යව්දිවි පූගනායකත්වය කරන්නේ පූගයහට (ගණයාහට) ප්‍රිය මනාප වේය යන තෙල දක්නා ලද හෝ අසන ලද දැයි?

වහන්ස, තෙල නැත් මැයි.

මහණෙනි, මැනැව. මහණෙනි, මා විසිනුදු [පෙ] පූග ග්‍රාමණිකයෙක් කැමැතිතාක් යහන් සුවයෙහි පහස් සුවයෙහි නිදි සුවයෙහි යෙදී වෙසෙනුයේ යව්දිවි පූගග්‍රාමණිකත්වය හෝ කරන්නේය, පූගයට හෝ ප්‍රිය මනාප වන්නේය යන තෙල කරුණ නො මැ දක්නා ලදි. නො අසන ලදි.

මහණෙනි, එ කවරැයි හඟිවු ද? තොප විසින් ශ්‍රමණයෙක් වේවයි බ්‍රාහ්මණයෙක් වේවයි කැමැති තාක් ශය්‍යාසුඛයෙහි, ස්පර්ශසුඛයෙහි නිද්‍රා සුඛයෙහි යෙදුනේ ඉන්ද්‍රිය යන්හි නො පියූ දොර ඇතියේ භෝජනයෙහි අමාත්‍රඥ වූයේ ජාගර්යායෙහි නො යෙදුනේ කුශල ධර්මයන් නො සොයනු-යේ පූර්වරාත්‍රාපරරාත්‍රයෙහි (රෑ පෙරයම-පැසුළුයම) බොධිපාක්ෂික ධර්මයන්ගේ භාවනානුයොගයෙහි නොයෙදුනේ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව චිත්ත විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ට ඥානයෙන් දැන සාක්ෂාත් කොටඑයට එළඹ වාස කරන්නේය’’යි දක්නා ලද හෝ අසන ලද දැ?යි

වහන්ස, තෙල කරුණ නැත් මැයි.

මහණෙනි, මැනැව, මහණෙනි, මාවිසිනුදු ‘මහණෙක් වේවයි බමුණෙක් වේවයි කැමැති තාක් ශය්‍යාසුඛයෙහි, ස්පර්ශසුඛයෙහි, මිද්ධසුඛයෙහි යෙදුනේ ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාර ඇතියේ භෝජනයෙහි අමාත්‍රඥ වූයේ ජාගර්යායෙහි නොයෙදුනේ කුශලධර්මයන් නොසොයනුයේ පූර්වරාත්‍රාපර රාත්‍රයෙහි බෝපැකිදම් වැඩුමෙහි නොයෙදුනේ ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ට ඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වාසය කරන්නේය යන තෙල කරුණ නො මැ දක්නා ලදි නො අසන ලදි.

මහණෙනි, එකරුණින් මෙහි ලා ‘‘ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර වම්හ, භෝජනයෙහි මාත්‍රඥ වම්හ., ජාගර්යායෙහි අනුයුක්ත වම්හ, කුශලධර්ම-යන්ගේ විදර්ශක වම්හ, පූර්වරාත්‍රාපරරාත්‍රයෙහි බොධිපාක්ෂික ධර්මයන් වැඩුමෙහි යෙදුනමෝ වසම්හ’’යි මෙසේ හික්මිය යුතුයි.

මහණෙනි, මෙ සෙයින් ම තොප විසින් හික්මිය යුතුයි.

6. 1. 2. 8.

[මච්ඡික සුත්තං]

18. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. අද්දසා ඛො භගවා අද්ධාන මග්ගපටිපන්නො අඤ්ඤතරස්මිං පදෙසෙ මච්ඡිකං මච්ඡබන්ධං මච්ඡෙ වධිත්වා වධිත්වා වික්කිණමානං. දිස්වා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි:

"පස්සථ, නො තුම්හෙ භික්ඛවෙ අමුං මච්ඡිකං මච්ඡබන්ධං මච්ඡෙ වධිත්වා වධිත්වා වික්කිණමානන්ති"

එවං භන්තෙ.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපිනු තුම්හෙහි දිට්ඨං වා සුතංවා "මච්ඡිකො මච්ඡබන්ධො මච්ඡෙ වධිත්වා වධිත්වා වික්කිණමානො තෙන කම්මෙන තෙන ආජීවෙන හත්ථියායී වා අස්සයායී වා රථයායී වා යානයායී වා භොගභොගී වා මහන්තං වා භොගක්ඛන්ධං අජ්ඣාවසන්තො?"ති.

නො හෙතං භන්තෙ.

සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ නෙව දිට්ඨං, න සුතං: "මච්ඡිකො මච්ඡබන්ධො මච්ඡෙ වධිත්වා වධිත්වා වික්කිණමානො තෙන කම්මෙන තෙන ආජීවෙන හත්ථියායී වා අස්සයායී වා රථයායී වා යානයායී වා භොගභොගී වා මහන්තං වා භොගක්ඛන්ධං අජ්ඣාවසන්තො"ති.

තං කිස්ස හෙතු:

තෙ හි සො භික්ඛවෙ මච්ඡෙ වජ්ඣෙ වධායොපනීතෙ[1] පාපකෙන මනසානුපෙක්ඛති. තස්මා සො නෙව හත්ථියායී හොති, න අස්සයායී, න රථයායී, න යානයායී, න භොගභොගී, න මහන්තං භොගක්ඛන්ධං අජ්ඣාවසති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපිනු තුම්හෙහි දිට්ඨං වා සුතං වා "ගොඝාතකො ගාවො වධිත්වා වධිත්වා වික්කිණමානො තෙන කම්මෙන තෙන ආජීවෙන හත්ථියායී වා අස්සයායී වා රථයායී වා යානයායී වා භොගභොගී වා මහන්තං වා භොගක්ඛන්ධං අජ්ඣාවසන්තො?"ති

නො හෙතං භන්තෙ.

සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ නෙව දිට්ඨං, න සුතං: "ගොඝාතකො ගාවො වධිත්වා වධිත්වා වික්කිණමානො තෙන කම්මෙන තෙන ආජීවෙන හත්ථියායී වා අස්සයායී වා රථයායී වා යානයායී වා භොගභොගී වා, මහන්තං භොගක්ඛන්ධං අජ්ඣාවසන්තො"ති.

තං කිස්ස හෙතු:

1. වධායුපනීතෙ - සීමු. වධායනීතෙ-සතා, වධායනීතෙ ... වධායනුනීතෙ - කම්බො

## 6. 1. 2. 8.

## [මච්ඡික සූත්‍රය]

18. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහභික් සඟුන් සමග කොශල ජනපදයෙහි සැරිසරණසේක. භාග්‍යවතුන් වහන්සේ දදන්මගට පිළිපන් සේක්, අන්‍යතර ප්‍රදෙශයෙක්හි මසුන් බඳනා මසුන් මරමරා විකුණන මත්ස්‍යඝාතකයකු දුටුසේක. දැක මඳුරා මාර්ගයෙන් ඉවත්ව එක්තරා වෘක්ෂ මූලයෙක්හි පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක:

මහණෙනි, තෙපි තෙල මසුන් බඳනා, මසුන් මරමරා විකුණන, මත්ස්‍යඝාතකයා දක්නාහුදැයි.

වහන්ස, එසේ ය.

මහණෙනි, ඒ කිමැයි හඟනාහු දැ? තොප විසින් මසුන් බඳනා මසුන් මරමරා විකුණන මත්ස්‍යඝාතකයෙක් ඒ කර්මයෙන් ඒ ආජීවයෙන් හස්තියානයෙන් යන සුලුයේ හෝ අශ්වයානයෙන් යන සුලුයේ හෝ රථයෙන් යන සුල්ලේ හෝ යානයෙන් යන සුල්ලේ හෝ භොගයන් බුදිනා සුල්ලේ හෝ මහත් භොගස්කන්ධයක් ලැබ වසන්නේ හෝයි දක්නා ලද හෝ අසන ලද දැයි.

වහන්ස, තෙල කරුණ නැත් මැයි.

මහණෙනි, මැනැව, මහණෙනි, මා විසිනුදු මසුන් බඳනා මසුන් මර මරා විකුණන මත්ස්‍යඝාතකයෙක් එ කර්මයෙන් එ ආජීවයෙන් ඇතු පිටින් යන සුලුයේ වේවයි, අසුපිටින් යන සුලුයේ වේවයි, රියෙන් යන සුලුයේ වේවයි, යානයෙන් යන සුලුයේ වේවයි, භොග වළඳන සුලුයේ වේවයි, මහත් වූ භොග ස්කන්ධය ලබා වසන්නේ වේවයි යන තෙල කරුණ නො ම දක්නා ලදය, නො අසන ලදය.

එයට කවර හේතුය යත්:

මහණෙනි, හේ වධයට එළවන ලද එ මසුන් ලාමක වධක චිත්තයෙන් ම නගමයි. එහෙයින් හේ හස්තියායී නො ම වෙයි, අශ්වයායී නො ම වෙයි, රථයායී නො ම වෙයි, නො ම යානයායී වෙයි, නො ම භොගභොගී වෙයි, මහත් භොග ස්කන්ධය ලැබ වසන්නේ නො වෙයි.

මහණෙනි, ඒ කිමැයි හඟනාහු දැ? ගවයන් මරමරා විකුණන ගෝඝාතකයෙක් ඒ කර්මයෙන් ඒ ආජීවයෙන් හස්තියායී හෝ අශ්වයායී හෝ රථයායී හෝ යානයායී හෝ භෝගභෝගී හෝ මහත් භෝගස්කන්ධය ලබා වෙසෙන්නේ හෝ යයි තොප විසින් දක්නාලද හෝ අසන ලද දැයි.

වහන්ස, තෙල නැත් මැයි.

මහණෙනි, මැනව, මා විසිනුදු ගවයන් මර මරා විකුණන ගෝඝාතකයෙක් ඒ කර්මයෙන් ඒ ආජීවයෙන් හස්තියායී හෝ අශ්වයායී හෝ රථයායී හෝ යානයායී හෝ භෝගභෝගී හෝ මහත් භෝගස්කන්ධය ලැබ වසන්නේ හෝ යයි යන තෙල කරුණ නො ම දක්නා ලදය, නො ම අසන ලදය.

ඒ කවර හෙයින යත්:

තෙ හි සො භික්ඛවෙ ගාවො වජ්ඣෙ වධායොපනීතෙ[1] පාපකෙන මනසානුපෙක්ඛති. තස්මා සො නෙව හත්ථියායී හොති න අස්සයායී න රථයායී න යානයායී න භොගභොගී න මහන්තං භොගක්ඛන්ධං අජ්ඣාවසති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු තුම්හෙහි දිට්ඨං වා සුතං වා "ඔරබ්භිකො -පෙ- සූකරිකො[2] -පෙ- සාකුන්තිකො -පෙ- මාගවිකො මගෙ[3] වධිත්වා වධිත්වා වික්කිණමානො තෙන කම්මෙන තෙන ආජීවෙන හත්ථියායී වා අස්සයායී වා රථයායී වා යානයායී වා භොගභොගී වා මහන්තං වා භොගක්ඛන්ධං අජ්ඣාවසන්තො?"ති.

නො හෙතං භන්තෙ.

සාධු භික්ඛවෙ, මයාපි ඛො එතං භික්ඛවෙ නෙව දිට්ඨං, න සුතං: "මාගවිකො මගෙ වධිත්වා වධිත්වා වික්කිණමානො තෙන කම්මෙන තෙන ආජීවෙන හත්ථියායී වා අස්සයායී වා රථයායී වා යානයායී වා භොගභොගී වා මහන්තං වා භොගක්ඛන්ධං අජ්ඣාවසන්තො"ති.

තං කිස්ස හෙතු:

තෙ හි සො භික්ඛවෙ මගෙ වජ්ඣෙ වධායොපනීතෙ[1] පාපකෙන මනසානුපෙක්ඛති. තස්මා සො නෙව හත්ථියායී හොති, න අස්සයායී, න රථයායී, න යානයායී, න භොගභොගී, න මහන්තං භොගක්ඛන්ධං අජ්ඣාවසති.

තෙ හි සො භික්ඛවෙ තිරච්ඡානගතෙ පාණෙ වජ්ඣෙ වධායොපනීතෙ[1] පාපකෙන මනසානුපෙක්ඛමානො නෙව හත්ථියායී භවිස්සති, න අස්සයායී, න රථයායී, න යානයායී, න භොගභොගී, න මහන්තං භොගක්ඛන්ධං අජ්ඣාවසිස්සති. කො පන වාදො යං මනුස්සභූතං වජ්ඣං වධායොපනීතං[4] පාපකෙන මනසානුපෙක්ඛති. තං හි තස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.[5]

## 6. 1. 2. 9.

## [පඨම මරණසති සුත්තං]

19. එකං සමයං භගවා නාදිකෙ[6] විහරති ගිඤ්ජකාවසථෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

මරණසති[7] භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. භාවෙථ නො තුම්හෙ භික්ඛවෙ මරණසතින්ති?[8]

1 වධායනීතෙ - සෳ. වධායනීතෙ - [සාච්] වධායුපනීතෙ - සීමු
2 සොකරිකො - සෳ. 3 මිගෙ - සෳ. 4 වධායුපනීතං - සීමු
5 උපපජ්ජති - සීමු 6 නාතිකෙ - මජසං 7 මරණස්සති - මජසං
8 මරණස්සතිං - මජසං.

මහණෙනි, හෙතෙම වධය පිණිස ගෙණෙන ලද ඒ ගවයන් පවිටු මනසින් නගමයි. එ හෙයින් හේ හස්තියායී හෝ නොවේ. අශ්වයායී හෝ නොවේ. රථයායී හෝ නොවේ. යානයායී හෝ නොවේ. භොගභොගී හෝ නොවේ. මහත් භොගස්කන්ධය හෝ ලබාගෙණ නො වසයි.

මහණෙනි, එ කවරයි හඟිව්වද? මහණෙනි, තොප විසින් "බැටළුවන් මරන්නෙක් ... හූරන් මරන්නෙක් ... ලිහිණි වැද්දෙක් ... මුවන් මරමරා විකුණන මුවවැද්දෙක් ඒ කර්‍මයෙන් ඒ ආජීවයෙන් ඇතුන් පිට යනුයේ හෝ අසුන් පිට යනුයේ හෝ රියෙන් යනුයේ හෝ යානයෙන් යනුයේ හෝ භොගවලඳ කරනුයේ හෝ මහත් භොගස්කන්ධය හෝ ලබාගෙණ වසනුයේ දක්නා ලද හෝ අසන ලද හෝ වේ දැ"යි.

වහන්ස, නෙල කරුණ නැත් මැයි.

මහණෙනි, මැනව, මහණෙනි මා විසිනුදු මුවවැද්දෙක් මුවන් මරමරා විකුණමින් ඒ කර්‍මයෙන් එ ආජීවයෙන් හස්තියායියෙක් හෝ අශ්වයායියෙක් හෝ රථයායියෙක් හෝ යානයායියෙක් හෝ භොගභොගියෙක් හෝ මහත් භොගස්කන්ධය ලැබ වසන්නේ යයි හෝ යන නෙල කරුණ නො ම දක්නා ලද, නො ම අසන ලදැයි.

ඒ කවර හෙයින යත්:

මහණෙනි, වධයට එළවන ලද එ මුවන් වධක සිතින් නගමයි. එහෙයින් හේ නො ම හස්තියායී වෙයි, අශ්වයායී නො වෙයි, රථයායී හෝ නො වෙයි, යානයායී හෝ නො වෙයි, භොගභොගී හෝ නො වෙයි, මහත් භොගස්කන්ධය ලබමින් නො වෙසෙයි.

මහණෙනි, හෙතෙම වධයට එළවන ලද එ තිරිසන්ගිය ප්‍රාණීන් ලමු සිතින් නගමනුයේ නො ම හස්තියායී වෙයි. නො ම අශ්වයායී වෙයි. නො ම රථයායී වෙයි. නො ම යානයායී වෙයි. භෝග-භෝගී නො ම වෙයි. මහත් භෝගස්කන්ධය ලබාගෙණ නො ම වසන්නේ ය. යම් හෙයෙකින් වධයට එළවන ලද මනුෂ්‍යයකු වධක සිතින් බලන්නේ ය යන්න ඇරැබ කවර කථායෙක. මහණෙනි, එය ඔහට දීර්‍ඝ කලක් අහිතයට දුකට වෙයි. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙයි.

## 6. 1. 2. 9.

## [ප්‍රථම මරණසති සූත්‍රය.]

19. එක් කාලෙක්හි භාග්‍යවතුන් වහන්සේ 'නාදික' නම් ගම්හි ගිඤ්ජකාවසථයෙහි (ගඩොලින් කළ පහයෙහි) වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්‍ෂූන් ඇමතූසේක. 'වහන්සැ'යි එ භික්‍ෂුහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණ වදාළසේක:

මහණෙනි, භාවිත, බහුලීකෘත, මරණසතිය මහත්ඵල මහානිශංස වෙයි, නිවන් පිහිට කොට ඇතියේ වෙයි. අමෘතපර්‍යවසාන කොට ඇතියේ වෙයි. මහණෙනි, තෙපි මරණ සති කමටහන් වඩන්නාහු නො? යි.

(1) එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: "අහං ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති."

යථා කථං පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති?

ඉධ මය්හං භන්තෙ එවං හොති: "අහො වතාහං රත්තින්දිවං ජීවෙය්‍යං, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා"ති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණසතින්ති.

(2) අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති.

යථා කථං පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති?

ඉධ මය්හං භන්තෙ එවං හොති: "අහො වතාහං දිවසං ජීවෙය්‍යං භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා"ති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණසතින්ති.

(3) අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති.

යථා කථම්පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති?

ඉධ මය්හං භන්තෙ එවං හොති: "අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං එකපිණ්ඩපාතං භුඤ්ජාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහු වත මෙ කතං අස්සා"ති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණ-සතින්ති

(4) අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති.

යථාකථං පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති?

ඉධ මය්හං භන්තෙ එවං හොති: "අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං චත්තාරො පඤ්ච ආලොපෙ සඞ්ඛාදිත්වා අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා"ති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණසතින්ති

(5) අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති.

යථා කථං පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති?

ඉධ මය්හං භන්තෙ එවං හොති: "අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං එකං ආලොපං සඞ්ඛාදිත්වා අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා"ති එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණසතින්ති

(1) මෙසේ වදාළ කල්හි අන්‍යතර මහණෙක් "වහන්ස, මම මරණසතිය වඩමි" යි" භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය.

මහණ, තෝ කිසෙයින් මරණ සතිය වඩහි දැ? යි.

වහන්ස, මෙ කාරණෙහි ලා මට මෙසිත වෙයි: "මම එක් රෑ දවාලක් ජීවත් වෙම් නම්, යෙහෙක. (එතෙක්කල්) භාග්‍යවතුන් වහන්සේගේ (ආර්‍ය්‍ය මාර්‍ග ප්‍රතිවේධාවහ වූ) ශාසනය මෙනෙහි කෙරෙම් නම්, මා විසින් ආත්මහිත වූ මහණකිස බෙහෙවක්ම කරණ ලද වන්නේය" යි. වහන්ස, මම මෙසෙයින් මරණ සති වඩමි යි.

(2) අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළෙය: "වහන්ස, මම ද මරණ සති වඩමි" යි.

මහණ, තෝ කිසෙයින් මරණ සති වඩහි දැ? යි.

වහන්ස, මට මෙ කාරණෙහි ලා මේ සිත වෙයි: "මම දවසක් ජීවත් වෙම් නම්, යෙහෙක. (එතෙක් කල්) භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කෙරෙම් නම්, මා විසින් බොහෝ ආත්මහිත වූ මහණකිස කරණ ලද වෙයි." වහන්ස, මෙසෙයින් මම මරණ සතිය වඩමි යි.

(3) අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය: 'වහන්ස, මම ද මරණ සතිය වඩමි' යි.

මහණ, තෝ කිසෙයින් මරණ සතිය වඩහි දැ? යි.

වහන්ස, මට මෙ කාරුණෙහි ලා මේ බඳු සිතෙක් වෙයි: "යම් පමණ කලෙකින් එක් දවසක් යපෙන පමණ වළඳම් නම්, ඒකාන්තයෙන් එතෙක් කල් ජීවත් වෙම් නම්, යෙහෙක. (එතෙක් කල්) භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කෙරෙම් නම්, ඒකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරණලද වේ ය" යි. වහන්ස, මම මෙසෙයින් මරණ සතිය වඩමි යි.

(4) අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, මම ද මරණ සතිය වඩමි' යි තෙල සැල කෙළේය.

මහණ, තෝ කිසෙයින් මරණ සතිය වඩහි දැ? යි.

වහන්ස, මෙ කාරුණෙහි ලා මට මේ බඳු සිතෙක් වෙයි: "මම යම් පමණ කලෙකින් සතර පස් පිඩක් සපා ගිලගනිම් ද, එතෙක් කල් ජීවත් වන්නෙම් නම්, යෙහෙක. (එතෙක් කල්) භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කෙරෙම් නම්, මා විසින් එකැතියෙන් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වේ ය යි.

(5) අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය: වහන්ස, මම ද මරණ සතිය වඩමි' යි.

මහණ, තො කෙසෙයින් මරණ සතිය වඩහි දැ? යි.

වහන්ස, මෙ විෂයෙහි ලා මට මේ බඳු සිතෙක් වෙයි: "මම යම් පමණ කලෙකින් එක් අහර පිඩක් සපා වළඳම් ද, එතෙක් කල් ජීවත් වන්නෙම් නම්, යෙහෙක. (එතෙක් කල්) භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කෙරෙම් නම්, මා විසින් බොහෝ කොට ආත්මහිත මහණකිස කරණ ලද වන්නේ ය" යි. වහන්ස, මම මෙසෙයින් මරණ සතිය වඩමි යි.

(6) අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණස්සතින්ති.

යථා කථං පන ත්වං භික්ඛු භාවෙසි මරණස්සතින්ති?

ඉධ මය්හං භන්තෙ එවං හොති: "අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං අස්සසිත්වා වා පස්සසාමි, පස්සසිත්වා වා අස්සසාමි. භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා''ති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණස්සතින්ති.

එවං වුත්තෙ භගවා තෙ භික්ඛූ එතදවොච:

(1) යො චායං භික්ඛවෙ භික්ඛු එවං මරණස්සතිං භාවෙති: අහො වතාහං රත්තින්දිවං ජීවෙය්‍යං, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා'ති-

(2) 'යො චායං භික්ඛවෙ භික්ඛු එවං මරණස්සතිං භාවෙති: අහො වතාහං දිවසං ජීවෙය්‍යං, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා'ති-

(3) 'යො චායං භික්ඛවෙ භික්ඛු එවං මරණස්සතිං භාවෙති: අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං එකං පිණ්ඩපාතං[1] භුඤ්ජාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා'ති-

(4) 'යො චායං භික්ඛවෙ භික්ඛු එවං මරණස්සතිං භාවෙති: අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං චත්තාරො පඤ්ච ආලොපෙ සඞ්ඛාදිත්වා අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා'ති -

(1,2,3,4) 'ඉමෙ වුච්චන්ති භික්ඛවෙ භික්ඛූ පමත්තා විහරන්ති, දන්ධං මරණස්සතිං භාවෙන්ති ආසවානං ඛයාය.

(5) 'යො චායං භික්ඛවෙ භික්ඛු එවං මරණස්සතිං භාවෙති: අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං එකං ආලොපං අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා'ති-

(6) 'යො චායං භික්ඛවෙ භික්ඛු එවං මරණස්සතිං භාවෙති: අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං අස්සසිත්වා වා පස්සසාමි, පස්සසිත්වා වා අස්සසාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සා'ති-

(5, 6) ඉමෙ වුච්චන්ති භික්ඛවෙ භික්ඛූ අප්පමත්තා විහරන්ති තික්ඛං මරණස්සතිං භාවෙන්ති ආසවානං ඛයාය.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: අප්පමත්තා විහරිස්සාම, තික්ඛං මරණස්සතිං භාවෙස්සාම ආසවානං ඛයායාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

(6) අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේය: වහන්ස, මම ද මරණ සතිය වඩමි' යි.

මහණ, තෝ කිසෙයින් මරණ සතිය වඩහි ද? යි.

වහන්ස, මට මෙ විෂයෙහි ලා මෙබඳු සිතෙක් වෙයි: "මම යම් පමණ කලෙකින් ආශ්වාස කොට (හුස්ම ඇතුළට ගෙණ) හෝ ප්‍රශ්වාස (හුස්ම බැහැර) කෙරෙම් ද, ප්‍රශ්වාස කොට හෝ ආශ්වාස කෙරෙම් ද, එතෙක් කල් ජීවත් වන්නෙම් නම්, යෙහෙක. (එතෙක් කල්) භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කරන්නෙම් නම්, එකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වේ ය යි. වහන්ස, මම මෙසෙයින් මරණ සතිය වඩමි යි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුන්ට තෙල වදාළසේක:

(1) "මහණෙනි, යම් මහණෙක් 'මම දවා රැයක් ජීවත් වන්නෙම් නම්, යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරම් නම්, මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වනැ"යි. මෙසේ මරණසිහි වඩා ද,-

(2) "මහණෙනි, යම් මහණෙක් මම දවාලක් ජීවත් වනුයෙම් නම්, යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කරන්නෙම් නම්, මා විසින් එකාන්තයෙන් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වනැ"යි මරණ සතිය වඩා ද-

(3) "මහණෙනි, යම් මහණෙක් 'මම යම් පමණ කලෙකින් එක් පිණ්ඩපාතයක් වළඳම් නම්' එතෙක් කල් ජීවත් වන්නෙම්, යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කෙරෙම නම්, මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වන්නේ ය, යි මෙසේ මරණ සතිය වඩා ද,-

(4) "මහණෙනි, යම් මහණෙක් "මම, යම් පමණ කලෙකින් සතර පස් පිඩක් සපා ගිලිම් ද, එතෙක් කල් ජීවත් වන්නෙම් නම්, යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කෙරෙම් නම්, මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වේ ය" යි මෙසේ මරණ සතිය වඩා ද,-

(1, 2, 3, 4) "මහණෙනි, මෙ මහණහු ප්‍රමත්ත ව වසන්නාහ යි ද ආශ්‍රවක්ෂය පිණිස ලැසිව (මඳව) මරණසී වඩන්නාහ යි ද කියනු ලබත්-

(5) "මහණෙනි, යම් මහණෙක් 'මම යම් පමණ කලෙකින් එක් ආලොපයක් සපා ගිලිම් ද, එතෙක් කල් ජීවත් වන්නෙම්, යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කරන්නෙම් නම්, ඒකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වන්නේ ය'යි මෙසේ මරණ සතිය වඩා ද-

(6) "මහණෙනි, යම් මහණෙක් මම යම් පමණ කලෙකින් ආශ්වාස කොට ප්‍රශ්වාස කෙරෙම් ද, ප්‍රශ්වාස කොට ආශ්වාස කෙරෙම් ද, එතෙක් කල් ජීවත්වන්නෙම් නම්, යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය මෙනෙහි කරන්නෙම් නම්, මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරණ ලද වන්නේය"යි මෙසේ මරණසතිය වඩා ද,-

(5, 6) මහණෙනි මෙ භික්ෂූහු අප්‍රමත්තව වාසය කරන්නාහ යි ද, ආශ්‍රවක්ෂය සඳහා තියුණු කොට මරණසතිය වඩන්නාහයි ද කියනු ලබත්.

මහණෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා "අප්‍රමත්ත ව වසන්නමෝ, ආශ්‍රවක්ෂය පිණිස තියුණු කොට මරණසතිය වඩම්හ"යි මෙසේ හික්මිය යුතු ය යි.

6. 1. 2. 10.

[දුතිය මරණසති සුත්තං]

**20.** එකං සමයං භගවා **නාදිකෙ** විහරති **ගිඤ්ජකාවසථෙ.** තත්‍ර ඛො භගවා භික්ඛු ආමන්තෙසි: මරණසති භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති.

කථං භාවිතා ච භික්ඛවෙ මරණසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානා?

(1) ඉධ භික්ඛවෙ භික්ඛු දිවසෙ නික්ඛන්තෙ රත්තියා පතිහිතාය[1] ඉති පටිසඤ්චික්ඛති: "බහුකා ඛො මෙ පච්චයා මරණස්ස: අහි වා මං ඩංසෙය්‍ය, විච්ඡිකො වා මං ඩංසෙය්‍ය, සතපදී වා මං ඩංසෙය්‍ය, තෙන මෙ අස්ස කාලකිරියා[2] සො මමස්ස අන්තරායො. උපක්ඛලිත්වා වා හං පපතෙය්‍ය, භත්තං වාපි මෙ[3] භුත්තං බ්‍යාපජ්ජෙය්‍ය, පිත්තං වා මෙ කුප්පෙය්‍ය, සෙම්හං වා මෙ කුප්පෙය්‍ය, සත්ථකා වා මෙ වාතා කුප්පෙය්‍යුං, තෙන මෙ අස්ස කාලකිරියා. සො මමස්ස අන්තරායො"ති.

(2) තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: "අත්ථි නු ඛො මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු රත්තිං කාලං කරොන්තස්ස අන්තරායායා"ති. සචෙ භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "අත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු රත්තිං. කාලංකරොන්තස්ස අන්තරායායා"ති, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයාව. සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තෙන භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයා.

(3) සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "නත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු රත්තිං කාලං කරොන්තස්ස අන්තරායායා"ති, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

(4) ඉධ පන භික්ඛවෙ භික්ඛු රත්තියා නික්ඛන්තාය දිවසෙ පතිහිතෙ[4] ඉති පටිසඤ්චික්ඛති: "බහුකා මෙ පච්චයා මරණස්ස: අහි වා මං ඩංසෙය්‍ය, විච්ඡිකො වා මං ඩංසෙය්‍ය, සතපදී වා මං ඩංසෙය්‍ය, තෙන මෙ අස්ස කාලකිරියා, සො මමස්ස අන්තරායො. උපක්ඛලිත්වා වා හං පපතෙය්‍යං භත්තං වා මෙ භුත්තං බ්‍යාපජ්ජෙය්‍ය, පිත්තං වා මෙ කුප්පෙය්‍ය, සෙම්හං වා මෙ කුප්පෙය්‍ය; සත්ථකා මෙ වාතා කුප්පෙය්‍යුං, තෙන මෙ අස්ස කාලකිරියා, සො මමස්ස අන්තරායො"

1 පතිගතාය - මජසං.
2 කාලංකිරියා - මජසං.
3 භත්තං වා මෙ - මජසං.
4 පතිගතෙ - මජසං.

Free Distribution www.aathaapi.org

## 6. 1. 2. 10.

## [ද්විතීය මරණසති සූත්‍රය]

20. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාදික ගම්හි ගිඤ්ජකාවසථයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, භාවිත බහුලීකෘත මරණසතිය මහත්ඵල මහානිසංස ඇත්තී අමෘත සඞ්ඛ්‍යාත නිවනට බැස ගැනුම් ඇත්තී අමෘතය පර්‍යවසාන කොට ඇත්තී වෙයි.

මහණෙනි, කිසෙයින් මරණසතිය භාවිත වූවා කිසෙයින් බහුලීකෘත වූවා මහත්ඵල මහානිසංස ඇත්තී නිවන් බැස ගැනුම් ඇත්තී අමෘතය පර්‍යවසාන කොට ඇත්තී ද යත්:

(1) මහණෙනි, මෙ සස්නෙහි මහණ දවකල් නික්ම යත්ම රෑය එළඹෙත් ම මෙසේ නුවණින් සලකයි: "මාගේ මරණයට ප්‍රත්‍යයයෝ බොහෝ වෙති: සර්පයෙක් හෝ මා ඩස්නේ ය. ගෝනුස්සෙක් හෝ මා ඩස්නේය. පත්වහයෙක් හෝ මා ඩස්නේය. එයින් මාගේ කාලක්‍රියාව වන්නේ ය. ඒ මට අන්තරායෙක් වෙයි. පැකිළී හෝ මම හෙනුයෙම් නම්, මා කෑ බත හෝ නො දිරා නම්, මාගේ පිත හෝ කිපේ නම්, මාගේ සෙම හෝ කිපේ නම්, මාගේ ශස්ත්‍රකවාතයෝ හෝ කිපෙත් නම්, එයින් මාගේ කාලක්‍රියාව වන්නේය. එ මට අන්තරායෙක් වේ"යි.

(2) මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු: "රාත්‍රියෙහි කලුරිය කරණ මා හට අන්තරාය කර වූ මාගේ අප්‍රහීණ වූ අකුශල ධර්මයෝ ඇත් ද?"යි. මහණෙනි, ඉදින් මහණ මෙසේ නුවණින් සලකනුයේ "රාත්‍රියෙහි කලුරිය කරණ මට අන්තරාය පිණිස වැටෙන මාගේ අප්‍රහීණ අකුශල ධර්මයෝ ඇතැයි", මහණෙනි, එ මහණහු විසින් එ ලාමු අකුසල දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයත් ව්‍යායාමයත් උත්සාහයත් සම්පාදන වීර්‍යයත් නොහැකිළෙන වැරත් සතියත් සමපජඤ්ඤයත් කටයුතු. මහණෙනි, ගිනි ඇවිළ ගත් පිළී ඇතියේ වේව යි, ගිනි ඇවිළ ගත් හිස ඇතියේ වේව යි, ඒ පිළි හෝ ඒ හිස නිවීම සඳහා ඡන්දයත් ව්‍යායාමයත් උත්සාහයත් උස්සොළ්හියත් අප්‍රතිවාතියත් සතියත් සම්ප්‍රජන්‍යයත් යම් පරිදි කෙරේ නම්, මහණෙනි, එ පරිදි ම මහණහු විසින් එ ලාමු අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දය හා ව්‍යායාමය හා උත්සාහය හා උස්සොළ්හිය හා අප්‍රතිවාතිය හා සමෘතිය හා සම්ප්‍රජන්‍යය හා කටයුතු.

(3) මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්‍ෂා කරණුයේ "රාත්‍රියෙහි කලුරිය කරණ මට අන්තරාය පිණිස පවත්නා අප්‍රහීණ වූ ලාමක අකුශල ධර්මයෝ නැතැ"යි මෙසේ දන්නේ නම්, මහණෙනි, ඒ මහණහු විසින් කුශලධර්මයන්හි අහොරාත්‍රයෙහි හික්මෙන්නහු විසින් එ ප්‍රීතිප්‍රමොදයෙන් විසිය යුතුය.

(4) මහණෙනි, මෙ සස්නෙහි මහණ රෑ ඉක්ම යත් ම දවහල් එළඹෙත් ම මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේය: "මාගේ මරණයට ප්‍රත්‍යයයෝ බොහෝහ. සර්පයෙක් වේව යි මා ඩස්නේ ය. වෘශ්චිකයෙක් වේව යි මා ඩස්නේ ය. ශතපදිකයෙක් වේව යි මා ඩස්නේ ය. එයින් මාගේ කාලක්‍රියාව වන්නේ ය. ඒ මට අන්තරාය වෙයි. මම පැකිල හෝ හෙම් නම්, මා විසින් කෑ බත හෝ නො පස්නේ වේ නම්, මාගේ පිත හෝ කුප්නේ නම්, මාගේ සෙම හෝ කුප්නේ නම්, මාගේ ශස්ත්‍රකවාතයෝ හෝ කිපෙත් නම්, එයින් මාගේ කාලක්‍රියාව වන්නේ ය ඒ මට අන්තරාය වේ"යි.

(5) තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: "අත්ථි නු ඛො මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු දිවා කාලංකරොන්තස්ස අන්තරායායා"ති.

සචෙ භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "අත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා, යෙ මෙ අස්සු දිවා කාලං කරොන්තස්ස අන්තරායායා"ති, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසඤ්ඤෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. සෙය්‍යථාපි භික්ඛවෙ අදිත්තචෙලො වා අදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තෙන භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

(6) සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "නත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු දිවා කාලං කරොන්තස්ස අන්තරායායා"ති, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

එවං භාවිතා ඛො භික්ඛවෙ මරණස්සති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා, අමතොගධා අමතපරියොසානාති.

සාරාණීය වග්ගො දුතියො.

තස්සුද්දානං

ද්වෙ සාරාණීය නිස්සාරණීයං[1] භද්දකං අනුතප්පියං
නකුලකුසලා මච්ඡං ද්වෙ ච හොන්ති මරණස්සතිනා දසාති.[2]

1. ද්වෙ සාරාණීයො මෙත්තං - සිමු.
2. නකුලං සොප්පමච්ඡා ච ද්වෙ හොන්ති මරණස්සතීහි - මජ්ස.

Free Distribution www.aathaapi.org

(ඊ) මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කටයුතු: "යම් ම අකුශල කෙනෙක් දුවල් කලුරිය කරණ මට අන්තරාය පිණිස වෙත්නම්, මට අප්‍රහීණ වූ එබඳු ලාමක අකුශලයෝ ඇද්ද"යි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවේක්‍ෂා කරණුයේ "දුවල් කලුරිය කරණ මට යම් අකුසල් කෙනෙක් අන්තරාය පිණිස වෙත් නම්, එබඳු අප්‍රහීණ ලාමක අකුශලධර්මයෝ මට ඇතැ"යි මෙසේ දන්නේ නම්, මහණෙනි, එ මහණහු විසින් එ ලමු අකුසල් දහමුන් ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දය හා ව්‍යායාමය හා උත්සාහය හා උත්සොළ්හිය හා අප්‍රතිවානිය හා සමෘතිය හා සම්ප්‍රජ්ඥනය හා කටයුතු. මහණෙනි, ගිනි ඇවිල ගත් පිළි ඇතියෙක් වේව යි, ගිනි ඇවිලගත් හිස් ඇතියෙක් වේව යි, එ පිළිය හෝ හිස නිවන්නට අධිමාත්‍ර ඡන්ද හා ව්‍යායාම හා උත්සාහය හා උත්සොළ්හිය හා අප්‍රතිවානිය හා සමෘතිය හා සම්ප්‍රජ්ඥනය හා කරන්නේ ය. මහණෙනි, එ පරිද්දෙන් ම එ මහණහු විසින් එ ලාමක අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයත් ව්‍යායාමයත් උත්සාහයත් උත්සොළ්හියත් අප්‍රතිවානියත් සමෘතියත් සම්ප්‍රජ්ඥනයත් කටයුතු.

(උ) මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවේක්‍ෂා කරණුයේ "යම් අකුශල කෙනෙක් දුවල් කලුරිය කරණ මට අන්තරාය සඳහා වැටෙත් නම් එ බඳු අප්‍රහීණ වූ ලාමක අකුශලධර්මයෝ මට නැතැ"යි මෙසේ දන්නේ නම් මහණෙනි, එ මහණහු විසින් අහොරාත්‍රයෙහි කුශලධර්මයන්හි හික්මෙන්නහු විසින් එ ප්‍රීතිප්‍රමෝදයෙන් වාස කටයුතු.

මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරණ ලද මරණසති තොමෝ මහත්ඵල මහානිසංස වෙයි. අමතෝගධ වෙයි. අමතපරියෝසාන වෙයි.

සාරාණීය වර්ගය දෙවැනි යි.

එහි උද්දානය:

සාරාණීයසූත්‍ර දෙකක, නිස්සාරණීයසූත්‍රය, භද්දකසූත්‍රය, අනුතප්පියසූත්‍රය, නකුලසූත්‍රය, කුශලසූත්‍රය, මච්ඡසූත්‍රය, මරණසතිසූත්‍ර දෙක දැ යි දසයෙකි.

# 3. අනුත්තරිය වග්ගො

## 6. 1. 3. 1.

### [සාමගාමක සුත්තං]

21. එකං සමයං භගවා සක්කෙසු විහරති සාමගාමකෙ පොක්ඛරණියායං.

අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං පොක්ඛරණියං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච:

තයොමෙ භන්තෙ ධම්මා භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ තයො:

කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා ඉමෙ ඛො භන්තෙ තයො ධම්මා භික්ඛුනො පරිහානාය සංවත්තන්තීති.

ඉදමවොච සා දෙවතා. සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො සා දෙවතා සමනුඤ්ඤො මෙ සත්ථාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං පොක්ඛරණියං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ සා දෙවතා මං එතදවොච:

"තයොමෙ භන්තෙ ධම්මා භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ තයො: කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා. ඉමෙ ඛො භන්තෙ තයො ධම්මා භික්ඛුනො පරිහානාය සංවත්තන්ති"ති.

ඉදමවොච භික්ඛවෙ සා දෙවතා. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

තෙසං වො භික්ඛවෙ අලාභා තෙසං වො දුල්ලද්ධා[1] යෙ වො දෙවතාපි ජානන්ති කුසලෙහි ධම්මෙහි පරිහායාය[2] සංවත්තමානෙ.

අපරෙපි භික්ඛවෙ තයො පරිහානියෙ ධම්මෙ දෙසිස්සාමි තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමෙ ච භික්ඛවෙ තයො පරිහානියා ධම්මා: සඞ්ගණිකාරාමතා, දොවචස්සතා, පාපමිත්තතා.

ඉමෙ ඛො භික්ඛවෙ තයො පරිහානියා ධම්මා.

යෙ හි කෙචි භික්ඛවෙ අතීතමද්ධානං පරිහායිංසු කුසලෙහි ධම්මෙහි, සබ්බෙ තෙ ඉමෙහෙව තීහි ධම්මෙහි පරිහායිංසු කුසලෙහි ධම්මෙහි. යෙ හි කෙචි භික්ඛවෙ අනාගතමද්ධානං පරිහායිස්සන්ති කුසලෙහි ධම්මෙහි, සබ්බෙ තෙ ඉමෙහෙව තීහි ධම්මෙහි පරිහායිස්සන්ති කුසලෙහි ධම්මෙහි. යෙ හි කෙචි භික්ඛවෙ එතරහි පරිහායන්ති කුසලෙහි ධම්මෙහි, සබ්බෙ තෙ ඉමෙහෙව තීහි ධම්මෙහි පරිහායන්ති කුසලෙහි ධම්මෙහීති.

---

1 තෙසං දුල්ලද්ධං - මජසං. 2 පරිහායමානෙ - මජසං.

# 3. අනුත්තරිය වර්ගය.

## 6. 1. 3. 1.

### [සාමගාමක සූත්‍රය]

21. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි සාමගාමකයෙහි පොක්ඛරණියා නම් වෙහෙරෙහි වැඩ වසන සේක.

එකල්හි අන්‍යතර දෙවියෙක් රාත්‍රි මධ්‍යමයාමයෙහි මනොහර ඡවිවර්ණ ඇතියේ සියලු පොක්ඛරණියා වෙහෙර බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දෙවි භාග්‍යවතුන් වහන්සේට මෙසේ කරුණු සැලකෙළේය:

"වහන්ස, මේ තුන් දහම් කෙනෙක් භික්ෂූහුගේ පරිහානිය සඳහා වැටෙත්. කවර තුන් දහම් කෙනෙක යත්:

කර්මාරාමතාය, භාෂ්‍යාරාමතාය, නිද්‍රාරාමතා යි. වහන්ස, මේ තුන් දහම්හු භික්ෂූහුගේ පරිහානිය සඳහා වැටෙති"යි.

ඒ දෙවි මෙය කී ය. භාග්‍යවතුන් වහන්සේ සමනුඥ වූසේක. ඉක්බිති ඒ දෙවි "මා බස භාග්‍යවතුන්සේ අනුදත්තේක් වනැ"යි භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණා කොට එතන්හි ම අතුරුදන් ව ගියේ ය

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රෑ ඇවෑමෙන් භික්ෂූන් ඇමතූසේක මහණෙනි, මේ රෑ හි ඉකුත් පළමු යම ඇතිවත් ම අන්‍යතර දෙවියෙක් මනොහර ඡවිවර්ණ ඇතියේ, සියලු පොක්ඛරණියා වෙහෙර එකලු කොට මා කරා එළැඹියේ ය එළැඹ සකස් කොට මා වැඳ එකත්පස්හි සිටියේ ය. එකත්පස්හි සිටි ඒ දෙවි මට මෙසේ කී ය:

"වහන්ස, මේ තුන් කරුණෙක් භික්ෂූහුගේ පරිහානියට වැටෙයි. කවර තුණෙක යත්: කර්මාරාමතා ය, භාෂ්‍යාරාමතා ය, නිද්‍රාරාමතා යි. වහන්ස, මේ දහම් තුණ භික්ෂූහුගේ පිරිහීමට වැටේය යි.

මහණෙනි, ඒ දෙවි මෙය කී ය. මෙය කියා මා පැදකුණු කොට එහි ම අතුරුදන්වී.

මහණෙනි, යම්බඳු තොප කුශලධර්මයන්ගෙන් පිරිහීමට වැටෙන්නවුන් දෙවියෝ දවා දනිත් නම්, ඒ තොපට අලාභ ය, ඒ තොපට නොමනා ලැබුමෙකි.

මහණෙනි, අනෙකුදු පරිහානීය ධර්ම තුණක් දෙසමි. ඒ අසවු මනා කොට මෙනෙහි කරවු. කියන්නෙමි යි. 'එසේ ය වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:

මහණෙනි, පරිහානීය ධර්ම තුන්දෙන කවරහ යත්: සඞ්ගණිකාරාමතා ය, දෞර්වචස්සතා ය, පාපමිත්‍රතා යි.

මහණෙනි, මේ පරිහානීය ධර්ම තුණ යි

මහණෙනි, යම් මැ කෙනෙක් අතීතකාලයෙහි කුශලධර්මයෙන් පිරිහුණුහු නම්, ඒ හැම මේ කරුණෙන් ම කුශලධර්මයෙන් පිරිහුණහ. මහණෙනි, යම් මැ කෙනෙක් අනාගතකාලයෙහි කුශලධර්මයෙන් පිරිහෙත් නම්, ඒ හැම මේ මැ තුන් කරුණු හෙයින් කුශලධර්මයෙන් පිරිහෙත්. මහණෙනි, මේ කල්හි යම් මැ කෙනෙක් කුශලධර්මයෙන් පිරිහෙත් නම්, ඒ හැම දෙන මේ කරුණු සයෙන් මැ කුශලධර්මයෙන් පිරිහෙත් යයි

## 6. 1. 3. 2.

### [අපරිහානියධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

22. ඡයිමෙ භික්ඛවෙ අපරිහානියෙ ධම්මෙ දෙසිස්සාමි, තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති, එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමෙ ච තෙ භික්ඛවෙ ඡ අපරිහානියා ධම්මා:

න කම්මාරාමතා, න භස්සාරාමතා, න නිද්දාරාමතා, න සඞ්ගණිකාරාමතා, සොවචස්සතා, කල්‍යාණමිත්තතා. ඉමෙ ඛො භික්ඛවෙ ඡ අපරිහානියා ධම්මා.

යෙ හි කෙචි භික්ඛවෙ අතීතමද්ධානං න පරිහායිංසු කුසලෙහි ධම්මෙහි, සබ්බෙ තෙ ඉමෙහෙව ඡහි ධම්මෙහි න පරිහායිංසු කුසලෙහි ධම්මෙහි, යෙ හි කෙචි භික්ඛවෙ අනාගතමද්ධානං න පරිහායිස්සන්ති කුසලෙහි ධම්මෙහි, සබ්බෙ තෙ ඉමෙහෙව ඡහි ධම්මෙහි න පරිහායිස්සන්ති. කුසලෙහි ධම්මෙහි, යෙ හි කෙචි භික්ඛවෙ එතරහි න පරිහායන්ති කුසලෙහි ධම්මෙහි, සබ්බෙ තෙ ඉමෙහෙව ඡහි ධම්මෙහි න පරිහායන්ති කුසලෙහි ධම්මෙහී'ති.

## 6. 1. 3. 3.

### [භය සුත්තං]

[සාවත්ථිනිදානං]

23. භයන්ති භික්ඛවෙ කාමානමෙතං අධිවචනං, දුක්ඛන්ති භික්ඛවෙ කාමානමෙතං අධිවචනං. රොගොති භික්ඛවෙ කාමානමෙතං අධිවචනං. ගණ්ඩොති භික්ඛවෙ කාමානමෙතං අධිවචනං. සඞ්ගොති භික්ඛවෙ කාමානමෙතං අධිවචනං. පඞ්කොති භික්ඛවෙ කාමානමෙතං අධිවචනං.

කස්මා ච භික්ඛවෙ භයන්ති කාමානමෙතං අධිවචනං? කාමරාගරත්තායං භික්ඛවෙ ඡන්දරාගවිනිබද්ධො දිට්ඨධම්මිකාපි භයා න පරිමුච්චති, සම්පරායිකාපි භයා න පරිමුච්චති. තස්මා භයන්ති කාමානමෙතං අධිවචනං. කස්මා ච භික්ඛවෙ දුක්ඛන්ති -පෙ- රොගොති -පෙ- ගණ්ඩොති -පෙ- සඞ්ගොති -පෙ- පඞ්කොති කාමානමෙතං අධිවචනං? කාමරාගරත්තායං භික්ඛවෙ ඡන්දරාගවිනිබද්ධො දිට්ඨධම්මිකාපි පඞ්කා න පරිමුච්චති, සම්පරායිකාපි පඞ්කා න පරිමුච්චති. තස්මා පඞ්කොති කාමානමෙතං අධිවචනන්ති.

5. භයං දුක්ඛං ච රොගො ච - ගණ්ඩො සඞ්ගො පඞ්කො ච උභයං
එතෙ කාමා පවුච්චන්ති යත්ථ සත්තො පුථුජ්ජනො.

6. උපාදානෙ භයං දිස්වා ජාතිමරණසම්භවෙ
අනුපාදා විමුච්චන්ති ජාතිමරණ සඞ්ඛයෙ.

7. තෙ ඛෙමප්පත්තා සුඛිනො දිට්ඨධම්මාභිනිබ්බුතා
සබ්බවෙරභයාතීතා[1] සබ්බදුක්ඛං උපච්චගුන්ති.

---
1 සබ්බ වෙර භයාතීතා - සතා.

## 6. 1. 3. 2.

## [අපරිහානියධම්ම සූත්‍රය]

[සැවැත් නිදාන යි]

22. මහණෙනි, මේ අපරිහානියධර්ම සයක් දෙසන්නෙමි. එ අසවු. මනා කොට මෙනෙහි කරවු. වදාරමි. "එසේ ය වහන්සැ"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

මහණෙනි, ඒ අපරිහානියධර්ම සය කවරේය යත්:

කර්මාරාමතා නොවනු ය. භාෂ්‍යාරාමතා නොවනු ය. නිද්‍රාරාමතා නොවනු ය. සඞ්ගණිකාරාමතා නොවනු ය. සුවචභාවය, කල්‍යාණමිත්‍රතා යි. මහණෙනි, මේ අපරිහානියධර්ම සය යි.

මහණෙනි, යම් මෑ කෙනෙක් අතීත කාලයෙහි කුශලධර්මයෙන් නො පිරිහුණාහු නම්, ඔහු හැම මේ සකරුණු හේතු කොටගෙණ කුශලධර්මයෙන් නො ම පිරිහුණාහ. මහණෙනි, යම් ම කෙනෙක් අනාගත කාලයෙහි කුශලධර්මයන්ගෙන් නො පිරිහෙන්නාහු නම්, ඒ හැම දෙන මේ දහම් සය හෙයින් ම කුශලධර්මයෙන් නොපිරිහෙන්නාහ. මහණෙනි, යම් මෑ කෙනෙක් වර්තමාන කාලයෙහි කුශලධර්මයන්ගෙන් නො පිරිහෙත් නම්, ඒ හැම දෙන මේ කරුණු සයින් මෑ කුශලධර්මයෙන් නො පිරිහෙත් ය යි.

## 6. 1. 3. 3.

## [භය සූත්‍රය]

[සැවැත් නිදාන යි]

23. මහණෙනි, 'භය' යන මෙය ශබ්දය කාමයනට නාමයෙකි. මහණෙනි, 'දුක්ඛ' යන මෙය ශබ්දය කාමයනට නාමයෙකි. මහණෙනි, 'රෝග' යන මෙය ශබ්දය කාමයනට නාමයෙකි. මහණෙනි, 'ගණ්ඩ - ගඩ' යන මෙය ශබ්දය කාමයනට නාමයෙකි: මහණෙනි, 'සඞ්ග - ඇලීම' යන මෙය ශබ්දය කාමයනට නාමයෙකි. මහණෙනි, 'පඞ්ක - මඩ' යන මෙය ශබ්දය කාමයනට නාමයෙකි.

මහණෙනි, කවර හෙයින් 'භය' යන මෙය කාමයනට නාම වේ ද යත්: මහණෙනි, කාමරාගයෙන් රක්ත වූ මේ පුහුල් ඡන්දරාගයෙන් විනිබද්ධ වූයේ දෘෂ්ටධාර්මික භයෙනුදු නො මිදෙයි. සාම්පරායිකභයෙනුදු නො මිදෙයි. එ හෙයින් 'භය' යන මෙය කාමයනට නාමයෙකි. මහණෙනි, කවර හෙයින් දුඃඛය යන ... 'රෝග' ය යන ... 'ගණ්ඩය' යන ... 'සඞ්ගය' යන ... 'පඞ්ක'ය යන මෙය කාමයනට නමෙක යත්: මහණෙනි, කාමරාගයෙන් රක්ත වූ මේ පුහුල් ඡන්දරාගයෙන් විනිබද්ධ වූයේ දෘෂ්ටධාර්මික පඞ්කයෙනුදු නො මිදෙයි. සාම්පරායික පඞ්කයෙනුදු නො මිදේ. එ හෙයින් 'පඞ්ක' යන මෙය කාමයනට නමෙකි.

5. යමෙක පුහුදුන් ප්‍රහුල් ආසක්ත වේ නම්, 'භය' හා 'දුක්ඛ' හා 'රෝග' හා 'ගණ්ඩ' හා 'සඞ්ග' පඞ්ක, යන දෙක හා මෙය කාමයන'යි කියනු ලැබෙත්.

6. ජාතිමරණයට ප්‍රත්‍යය වූ වතුරුපාදානයෙහි භය දැක ජාතිමරණ සංක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණාලම්බනයෙහි (සත්ත්වයෝ) මිදෙත්.

7. ක්ෂේමභාවයට පැමිණි ලෝකෝත්තර සුඛ ඇති දිට්ඨධර්මයෙහි ම කෙලෙසුන්ගෙන් පිරිනිවි සර්වවෛර භය ඉක්මවා ගිය ඔහු සර්වදුඃඛය ඉක්මවූහ යි.

## 6. 1. 3. 4

## [හිමවන්ත සුත්තං]

[සවත්ථිනිදානං]

**24.** ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු හිමවන්තං පබ්බතරාජං පදලෙය්‍ය, කො පන වාදෙ ඡවාය අවිජ්ජාය.

කතමෙහි ඡහි·

ඉධ භික්ඛවෙ භික්ඛු සමාධිස්ස සමාපත්තිකුසලො හොති. සමාධිස්ස ඨිතිකුසලො හොති. සමාධිස්ස වුට්ඨානකුසලො හොති. සමාධිස්ස කල්ලතාකුසලො[1] හොති. සමාධිස්ස ගොචරකුසලො හොති. සමාධිස්ස අභිනීහාරකුසලො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු හිමවන්තං පබ්බතරාජං පදලෙය්‍ය කො පන වාදෙ ඡවාය අවිජ්ජායාති.

## 6. 1. 3. 5.

## [අනුස්සතිට්ඨාන සුත්තං]

[සාවත්ථිනිදානං]

**25.** ඡයිමානි භික්ඛවෙ අනුස්සති ඨානානි.

කතමානි ඡ.

(1) ඉධ භික්ඛවෙ අරියසාවකො තථාගතං අනුස්සරති: "ඉතිපි සො භගවා අරහං -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති

යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති. න දොසපරියුට්ඨිතං චිත්තං හොති. න මොහපරියුට්ඨිතං චිත්ත හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති. නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. ගෙධොති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉදම්පි ඛො භික්ඛවෙ ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුජ්ඣන්ති.

(2) පුන ච පරං භික්ඛවෙ අරියසාවකො ධම්මං අනුස්සරති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති."

යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො ධම්මං අනුස්සරති. නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහ පරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති, නික්ඛ ං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. ගෙධොති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉදම්පි ඛො භික්ඛවෙ ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුජ්ඣන්ති.

---

1 කල්ලිත කුසලො හොති - සීමු.

## 6. 1. 3. 4.

## [හිමවන්ත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

24. මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ හිමවත් පර්වත රාජයා බිඳලන්නේය. ලාමක අවිද්‍යා පිළිබඳ කවර කථායෙක.

කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සමාධියට සමවැදුම්හි කුශල වෙයි. සමාධි ස්ථිතියෙහි කුශල වෙයි. සමාධියෙන් නැගී සිටුමෙහි කුශල වෙයි. සමාධි කල්‍යතායෙහි (සමාධිසිත පැහැදවීමෙහි) කුශල වෙයි. සමාධිගොචරයෙහි (කුශල අරමුණෙහි) කුශල වෙයි. සමාධි අභිනීහාරයෙහි (මතු මතු සමවත් සමවැදුම පිණිස ප්‍රථමධ්‍යානාදි සමවත් එළවීමෙහි) කුශල වෙයි. මහණෙනි, මෙ ස කරුණින් සමන්වාගත මහණ හිමවත් පර්වත රාජයා (වුව) බිඳලන්නේ ය. ලාමක අවිද්‍යාව පිළිබඳ කවර කථා ය යි.

## 6. 1. 3. 5.

## [අනුස්සතිට්ඨාන සූත්‍රය]

25. මහණෙනි, මෙ අනුස්මෘතිස්ථාන සයෙකි.

කවර සයෙක යත්:

(1) මහණෙනි, මෙ සස්නෙහි අරිසවු "මෙ සෙයිනුදු ඒ භගවත්හු අර්හත්හ ... දේව මනුෂ්‍යයනට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ" යි තථාගතයන් ගුණ විසින්) අනුස්මරණ කෙරෙයි.

මහණෙනි, යම් සමයෙක අරිසව් තථාගතයන් අනුස්මරණ කෙරේ ද, ඒ සමයෙහි ඔහට රාගපර්‍යුත්ථිත සිතෙක් නො මැ වෙයි. ද්වෙෂයෙන් පර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මොහ පර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි ඒ සමයෙහි ඔහුගේ සිත ගේධයෙන් නික්මියේ මිදුනේ නැගී සිටියේ ඍජුගත ම වෙයි. මහණෙනි, 'ගෙධ' යන තෙල ශබ්දය පස්වකාම ගුණයනට අධිවචනයෙකි. මහණෙනි, මෙ (බුද්ධානුස්මෘතිය) ද අරමුණු කොට මෙසේ මෙ ලොව්හි ඇතැම් සත්ත්වයෝ පිරිසිදු වෙත්.

(2) තවද මහණෙනි, අරිසවු "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාතය .. විඥයන් තමා කෙරෙහි ලා දතයුතුය" යි ධර්මය අනුස්මරණ කෙරෙයි.

මහණෙනි, යම් සමයෙක්හි අරිසවු ධර්මය අනුස්මරණ කෙරේ ද, ඒ සමයෙහි ඔහට රාගපර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි.. ද්වෙෂපර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මෝහපර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. ඒ සමයෙහි උහුගේ සිත කෙලෙසුන් කෙරෙන් නික්මියේ මුක්ත වූයේ ගේධයෙන් නැගී සිටියේ ඍජුගත ම වෙයි. මහණෙනි, 'ගෙධ' යන තෙල ශබ්දය පස්වකාම ගුණයනට අධිවචනයෙකි මහණෙනි, මෙ (ධර්මානුස්මෘතිය)ද අරමුණු කොට මෙ ලොව්හි ඇතැම් සත්ත්වයෝ පිරිසිදු වෙත්.

පුන ච පරං භික්ඛවෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති''. යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති. න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. ගෙධොති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉදම්පි ඛො භික්ඛවෙ ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුජ්ඣන්ති.

පුන ච පරං භික්ඛවෙ අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති: අඛණ්ඩානි -පෙ- සමාධිසංවත්තනිකානි. යස්මිං භික්ඛවෙ සමයෙ අරිය-සාවකො සීලං අනුස්සරති. නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති, නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා, ගෙධොති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉදම්පි ඛො භික්ඛවෙ ආරම්මණං කරිත්වා එවමිධෙ කච්චෙ සත්තා විසුජ්ඣන්ති.

පුන ච පරං භික්ඛවෙ අරියසාවකො අත්තනො චාගං අනුස්සරති: "ලාභා වත මෙ සුලද්ධං වත මෙ -පෙ- යාචයොගො දානසංවිභාගරතොති -පෙ- යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො චාගං අනුස්සරති. නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති. න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති, නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. ගෙධොති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉදම්පි ඛො භික්ඛවෙ ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුජ්ඣන්ති.

පුන ච පරං භික්ඛවෙ අරියසාවකො දෙවතා අනුස්සරති: සන්ති දෙවා චාතුම්මහාරාජිකා, සන්ති දෙවා තාවතිංසා, සන්ති දෙවා යාමා, සන්ති දෙවා තුසිතා, සන්ති දෙවා නිම්මාණරතිනො, සන්ති දෙවා පරනිම්මිතවසවත්තිනො, සන්ති දෙවා බ්‍රහ්මකායිකා, සන්ති දෙවා තතුත්තරිං, යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති, යථාරූපෙන සීලෙන-පෙ-සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථා රූපා පඤ්ඤා සංවිජ්ජතීති -පෙ- යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො අත්තනො ච තාසං ච දෙවතානං සද්ධඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති, නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. ගෙධොති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉදම්පි ඛො භික්ඛවෙ ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුජ්ඣන්ති. ඉමානි ඛො භික්ඛවෙ ඡ අනුස්සති ඨානානීති,

(3) තවද මහණෙනි, ආර්යශ්‍රාවක "භාග්‍යවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ සුපිළිපන් වෙයි... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රය" යි සඞ්ඝයා අනුස්මරණ කරයි. මහණෙනි, යම් කලෙක්හි ආර්යශ්‍රාවක සඞ්ඝයා මෙනෙහි කෙරේ නම්, එ කල්හි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වේ. ද්වෙෂපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මෝහපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. එ සමයෙහි ගේධයෙන් නික්මියේ මුක්ත වූයේ උත්ථිත වූයේ ඔහුගේ සිත ඍජුගත ම වෙයි. මහණෙනි, 'ගෙධ' යනු තෙල පස්කම් ගුණයනට නමෙකි. මහණෙනි, මෙ ද අරමුණු කොට මෙ ලොව්හි ඇතැම් සත්ත්වයෝ විශුද්ධ වත්නාහ.

(4) තවද මහණෙනි, අරිසවු අඛණ්ඩ වූ ... සමාධියට වැටෙන තමාගේ ශීලයන් මෙනෙහි කෙරෙයි. මහණෙනි, යම් කලෙක අරිසවු සිල් මෙනෙහි කෙරේ නම්, එ සමයෙහි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. ද්වෙෂපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මෝහපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. එ සමයෙහි ඔහුගේ චිත්තය ගේධයෙන් නික්මියේ මුක්ත වූයේ නැගී සිටියේ උජුගත ම වෙයි. මහණෙනි, 'ගේධ' යනු තෙල පඤ්චකාම ගුණයනට අධිවචනයෙකි. මහණෙනි, මෙ ද අරමුණු කොට මෙ ලොව්හි ඇතැම් සත්ත්ව කෙනෙක් විශුද්ධ වෙත්.

(5) තවද මහණෙනි, අරිසවු "ඒකාන්තයෙන් මට ලාභයෙකි. ඒකාන්තයෙන් මට මනා ලාභයෙක ... යදනට යොග්‍ය වූයෙම්, දානසං-විභාගයෙහි ඇලුණෙම් වෙමැ"යි තමාගේ ත්‍යාග ගුණය මෙනෙහි කෙරෙයි. මහණෙනි, යම් කලෙක අරිසවු ත්‍යාගය මෙනෙහි කෙරේ නම්, එ කල්හි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වත්නේ ය. ද්වෙෂපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො ම වත්නේ ය. මෝහපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වත්නේ ය. එසමයෙහි ඔහුගේ සිත ගෙධයෙන් නික්මියේ මුක්ත වූයේ නැගී සිටියේ ඍජුගත ම වෙයි මහණෙනි, 'ගේධ' යනු තෙල කාමගුණයනට අධිවචනයෙකි. මහණෙනි, මෙ ද අරමුණු කොට මෙ ලොව්හි ඇතැම් සත්ත්ව කෙනෙක් විරුද්ධ වෙත්.

(6) තවද මහණෙනි, අරිසවු "චාතුර්මහාරාජික දෙවියෝ ඇත. තාවතිංස දෙවයෝ ඇත යාම දෙවයෝ ඇත. තුසිත දෙවියෝ ඇත. නිම්මාණරති දෙවයෝ ඇත. පරනිම්මිතවසවත්ති දෙවයෝ ඇත. බ්‍රහ්මකායික දේවයෝ ඇත. ඔවුනට මත්තෙහිදු දේවයෝ ඇත. යම්බඳු ශ්‍රද්ධායෙකින් සමන්විතගත එ දෙවයෝ මෙයින් ච්‍යුත වූවාහු එහි උපන්හු නම්, මට ද එබඳු ශ්‍රද්ධාව විද්‍යමාන වෙයි. යම්බඳු ශීලයකින්...ශ්‍රැතයෙකින්...ත්‍යාගයෙකින්... ප්‍රඥායෙකින් සමන්විතගත එ දෙවියෝ මෙයින් ච්‍යුතව එහි උපන්හු නම්, මටද එබඳු ප්‍රඥා ඇතැ"යි දෙවියන් මෙනෙහි කරයි. මහණෙනි, යම් කලෙක අරිසවු තමාගේ ද එ දෙවියන්ගේ ද ශ්‍රද්ධාව ද ශීලය ද ශ්‍රැතය ද ත්‍යාගය ද ප්‍රඥාව ද මෙනෙහි කෙරේ නම්, එසමයෙහි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වත්නේ ය. ද්වෙෂපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වත්නේ ය, මෝහ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වත්නේ ය. එ සමයෙහි ඔහුගේ චිත්තය ගේධයෙන් නික්මියේ මුක්ත වූයේ උත්ථිත වූයේ ඍජුගත ම වේ. මහණෙනි, 'ගෙධ' යන ශබ්දය පඤ්චකාම ගුණයනට නාමෙකි.

මහණෙනි, මෙ ද අරමුණුකොට මෙලොව්හි ඇතැම් සත්ත්ව කෙනෙක් විශුද්ධියට යෙත්. මහණෙනි, මෙ අනුස්සතිට්ඨාන සයයි.

6. 1. 3. 6

## [මහාකච්චාන සුත්තං]

### [සාවත්ථිනිදානං]

26 තත්‍ර ඛො ආයස්මා මහාකච්චානො භික්ඛූ ආමන්තෙසි, ආවුසො භික්ඛවෙති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස පච්චස්සොසුං. ආයස්මා මහාකච්චානො එතදවොච:

අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො යාව සුභාසිතං චිදං[1] තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්බාධෙ ඔකාසාධිගමො අනුබුද්ධො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛ-දොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං ඡ අනුස්සතිට්ඨානානි කතමානි ඡ.

(1) ඉධාවුසො අරියසාවකො තථාගතං අනුස්සරති "ඉතිපි සො භගවා [අරහං] -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති, යස්මිං ආවුසො සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති, නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා 'ගෙධො'ති ඛො ආවුසො පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ස ඛො සො ආවුසො අරියසාවකො සබ්බසො ආකාසසමෙන චෙතසා විහරති විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන[2]. ඉදම්පි ඛො ආවුසො ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුද්ධිධම්මා භවන්ති.

(2) පුන ච පරං ආවුසො අරියසාවකො ධම්මං අනුස්සරති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. යස්මිං ආවුසො සමයෙ අරියසාවකො ධම්මං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති, නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. 'ගෙධො'ති ඛො ආවුසො පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ස ඛො සො ආවුසො අරියසාවකො සබ්බසො ආකාසසමෙන චෙතසා විහරති විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන. ඉදම්පි ඛො ආවුසො ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුද්ධිධම්මා භවන්ති.

1. යාවඤ්චිදං - මජසං   2. අව්‍යාපජ්ජෙන - සැළුවි,

## 6. 1. 3. 6.

## [මහා කච්චාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**26.** එකල්හි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ 'ඇවැත්නි මහණෙනි'යි භික්ෂූන් ඇමතූහ. 'ඇවැත්නි'යි ඒ මහණුහු ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන්ට ප්‍රතිවචන දුන්හ. ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ තෙල කීහ.

ඇවැත්නි, ආශ්චර්යය, ඇවැත්නි, අද්භූත ය.. සුභාෂිතයෙක්මය. සියල්ල දන්නා, සියල්ල දක්නා, අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස, ශෝකපරිදේවයන් ඉක්මවනු පිණිස, දුක් දොම්නස් අස්තයට යවනු පිණිස, (මාර්ග සඞ්ඛ්‍යාත) න්‍යායයාගේ අධිගමය පිණිස, නිර්වාණය සාක්ෂාත් කරණු පිණිස (පඤ්චකාමගුණ සඞ්ඛ්‍යාත) සම්බාධයෙහි (ෂඩ් අනුස්මෘති නම් වූ) අවකාශාධිගමය අවබෝධ කරණ ලදී. කවර සයෙක යත්:

(1) ඇවැත්නි, මෙ සස්නෙහි අරිසවූ "මේ මේකාරණෙනුදු ඒ භගවත්හු [අර්හත්හු].. දේවමනුෂ්‍යයනට ශාස්තෘහ. බුද්ධයහ, භගවත්හ"යි තථාගතයන් වහන්සේ සිහිකෙරෙයි. ඇවැත්නි, යම් කලෙක්හි අරිසවූ තථාගතයන් සිහි කෙරේ ද, එකල්හි ඔහට රාගපර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන්නේය. ද්වේෂපර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වන්නේය. මෝහපර්‍යුත්ථිත චිත්තයෙක් නො වන්නේ ය. එකල්හි ඔහුගේ චිත්තය ගේධයෙන් නික්මියේ මුක්තවූයේ නැගී සිටියේ ඍජුගත ම වන්නේ ය. ඇවැත්නි, 'ගේධ' යනු තෙල ශබ්දය පඤ්චකාම ගුණයනට නමෙකි. ඇවැත්නි, එ අරිසවූ සර්වප්‍රකාර යෙන් ආකාශ සම වූ විපුල වූ මහත් භාවයට ගිය (සඵරණවශයෙන්) අප්‍රමාණ වූ වෛර රහිත වූ (ක්‍රොධදුඃඛ සඞ්ඛ්‍යාත) ව්‍යාබාධයෙන් තොරවූ චිත්තයෙන් වාස කරන්නේ ය. ඇවැත්නි, මේ ද අරමුණු කොට මෙ සෙයින් මෙ ලෙව්හි ඇතැම් සත්ත්වයෝ විශුද්ධ ස්වභාව ඇතියාහු වෙත්.

(2) නවද ඇවැත්නි, යම් කලෙක අරිසවූ "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාක්ඛ්‍යාතය ... විඥයන් විසින් සිය සතන්හි එළවා දතයුතුය"යි ධර්මය සිහිකරන්නේ ය. ඇවැත්නි, යම් කලෙක අරිසවූ ධර්මය සිහිකෙරේ නම්, එකල්හි ඔහට රාගපර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වේ ද්වේෂ පර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මෝහ පර්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. එකල්හි ඔහුගේ චිත්තය ගේධයෙන් නික්මියේ මුක්තවූයේ ව්‍යුත්ථිත වූයේ ඍජුගත ම වෙයි. ඇවැත්නි, 'ගේධ' යන තෙල ශබ්දය පඤ්චකාම ගුණයනට නමෙකි. ඇවැත්නි, එ අරිසවූ සර්වප්‍රකාරයෙන් ආකාශ සමවූ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාබාධ (දුක්) රහිත වූ චිත්තයෙන් වාස කරන්නේ ය. ඇවැත්නි, මෙ ද අරමුණු කොට මෙ සෙයින් මෙලෙව්හි ඇතැම් සත්ත්වු විශුද්ධ ස්වභාව ඇති වෙත්.

(3) පුන ච පරං ආවුසො අරියසාවකො සඞ්ඝං අනුස්සරති. "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. යස්මිං ආවුසො සමයෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. 'ගෙධො'ති ඛො ආවුසො පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ස ඛො සො ආවුසො අරියසාවකො සබ්බසො ආකාසසමෙන චෙතසා විහරති විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන. ඉදම්පි ඛො ආවුසො ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුද්ධිධම්මා භවන්ති.

(4) පුන ච පරං ආවුසො අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති: අඛණ්ඩානි -පෙ- සමාධිසංවත්තනිකානි. යස්මිං ආවුසො සමයෙ අරියසාවකො අත්තනො සීලං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. 'ගෙධො'ති ඛො ආවුසො පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ස ඛො සො ආවුසො අරියසාවකො සබ්බසො ආකාසසමෙන චෙතසා විහරති විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන. ඉදම්පි ඛො ආවුසො ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුද්ධිධම්මා භවන්ති.

(5) පුන ච පරං ආවුසො අරියසාවකො අත්තනො චාගං අනුස්සරති: "ලාභා වත මෙ, සුලද්ධං වත මෙ -පෙ- යාචයොගො දානසංවිභාගරතො"ති. යස්මිං ආවුසො සමයෙ අරියසාවකො අත්තනො චාගං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති. නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. 'ගෙධො'ති ඛො ආවුසො පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ස ඛො සො ආවුසො අරියසාවකො සබ්බසො ආකාසසමෙන චෙතසා විහරති විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන. ඉදම්පි ඛො ආවුසො ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුද්ධිධම්මා භවන්ති.

(6) පුන ච පරං ආවුසො අරියසාවකො දෙවතා අනුස්සරති: "සන්ති දෙවා චාතුම්මහාරාජිකා -පෙ- සන්ති දෙවා තතුත්තරිං. යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති. යථාරූපෙන සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතී"ති. යස්මිං ආවුසො සමයෙ අරියසාවකො අත්තනො ච තාසඤ්ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති. නික්ඛන්තං මුත්තං වුට්ඨිතං ගෙධම්හා. 'ගෙධො'ති ඛො ආවුසො පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ස ඛො සො ආවුසො අරියසාවකො සබ්බසො ආකාසසමෙන චෙතසා විහරති විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන. ඉදම්පි ඛො ආවුසො ආරම්මණං කරිත්වා එවමිධෙකච්චෙ සත්තා විසුද්ධිධම්මා භවන්ති

(3) තවද මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවක "භාග්‍යවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ සුපිළිපන් වෙයි .. ලෝකයාට අනුත්තර පුණ්‍ය ක්ෂේත්‍රය"යි සඞ්ඝයා සිහිකරයි. ඇවැත්නි, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක සඞ්ඝයා සිහිකෙරේ ද, එකල්හි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. ද්වේෂපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වෙයි. මෝහපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. එකල්හි ඔහුගේ චිත්තය ගේධයෙන් නික්මියේ මුක්ත වූයේ ව්‍යුත්ථිත වූයේ ඍජුගත ම වෙයි. ඇවැත්නි, 'ගේධ' යන මෙල පස්කම් ගුණයනට නමෙකි. ඇවැත්නි, එ මැ අරිසවූ සර්වප්‍රකාරයෙන් ආකාශ සමවූ විපුල වූ මහත්ගත වූ අප්‍රමාණවූ අවෛර වූ අව්‍යාබාධ වූ (දුක් නැති) චිත්තයෙන් වෙසෙසි. ඇවැත්නි, මෙ ද අරමුණු කොට මෙසෙයින් ඇතැම් සත්ත්ව කෙනෙක් විශුද්ධ ස්වභාව ඇති වෙත්.

(4) තවද ඇවැත්නි, ආර්‍ය්‍යශ්‍රාවක අඛණ්ඩ වූ ... සමාධියට වැටෙන තමාගේ ශීලයන් අනුස්මරණ කරයි. ඇවැත්නි, අරිසවූ යම් කලෙක තමාගේ ශීලය අනුස්මරණ කෙරේ නම්, එසමයෙහි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වේ. ද්වේෂ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. මෝහ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො මැ වෙයි. එසමයෙහි ඔහුගේ චිත්තය ගේධයෙන් නික්මියේ මුක්ත වූයේ ව්‍යුත්ථිත වූයේ ඍජුගත ම වෙයි. ඇවැත්නි, 'ගේධ' යන මෙල පස්කම් ගුණයනට අධිවචනයෙකි. ඇවැත්නි, එම අරිසවූ සර්වප්‍රකාරයෙන් ආකාශ සම වූ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ (නිදුක්වූ) සිතින් වෙසෙයි. ඇවැත්නි, මෙ ද අරමුණු කොට මෙ සෙයින් මෙ ලෙව්හි ඇතැම් සත්ත්වයෝ විශුද්ධ ස්වභාව ඇති වෙත්.

(5) තවද ඇවැත්නි, අරිසවූ "මට ඒකාන්තයෙන් ලාභයෙකි. මට ඒකාන්තයෙන් මනාලාභයෙකි. .. යදනට නිසියෙම් දානසංවිභාගයෙහි රතයෙමි"යි තමාගේ ත්‍යාගය සිහිකෙරෙයි. ඇවැත්නි, යම් කලෙක අරිසවූ තමාගේ ත්‍යාගය සිහිකෙරේ නම්, එසමයෙහි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වෙයි. ද්වේෂපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වෙයි. මෝහ පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වෙයි. එකල්හි ඔහුගේ චිත්තය ගේධයෙන් නික්මියේ මුක්ත වූයේ ව්‍යුත්ථිත වූයේ ඍජුගත ම වෙයි. ඇවැත්නි, 'ගේධ' යන මෙල ශබ්දය පඤ්චකාම ගුණයනට නමෙකි. ඇවැත්නි, එම අරිසවූ සර්වප්‍රකාරයෙන් ආකාශ සම වූ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ සිතින් වෙසෙයි. ඇවැත්නි, මෙ ද අරමුණු කොට මෙසෙයින් මෙලොව්හි ඇතැම් සත්හු විශුද්ධ ස්වභාව ඇති වෙත්.

(6) තවද මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක "චාතුම්මහාරාජික දෙවියෝ ඇත ... ඔවුනට මතුයෙහි දෙවියෝ ද ඇත. යම්බඳු ශ්‍රද්ධායෙන් සමන්වාගත එ දෙවියෝ මෙයින් ව්‍යුත වූවාහු එහි උපන්නාහු නම්, මට ද එබඳු ශ්‍රද්ධා විද්‍යමාන ය. යම්බඳු ශීලයෙන් ... ශ්‍රැතයෙන් ... ත්‍යාගයෙන් ... ප්‍රඥයෙන් සමන්වාගත ඒ දේවතාවෝ මෙයින් ව්‍යුත වූවාහු එහි උපන්නාහු ද, මට ද එබඳු ප්‍රඥ ඇතැ"යි දේවතාවන් අනුස්මරණ කරයි. ඇවැත්නි, යම් කලෙක්හි අරිසවූ තමාගේත් ඒ දෙවියන්ගේත් ශ්‍රද්ධා හා ශීල හා ශ්‍රැත හා ත්‍යාග හා ප්‍රඥ හා සිහිකෙරේ නම්, එසමයෙහි ඔහට රාග පර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වේ. ද්වේෂපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වෙයි. මෝහපර්‍ය්‍යුත්ථිත චිත්තයෙක් නො වෙයි. එසමයෙහි ඔහුගේ චිත්තය ගේධයෙන් නිෂ්ක්‍රාන්ත වූයේ මුක්ත වූයේ ව්‍යුත්ථිත වූයේ ඍජුගත ම වෙයි. ඇවැත්නි, 'ගේධ' යන මෙල පස්කම් ගුණයනට නමෙකි. ඇවැත්නි, එම අරිසවූ සර්වප්‍රකාරයෙන් ආකාශ සම විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ චිත්තයෙන් වාසකරයි. ඇවැත්නි, මෙද අරමුණු කොට මෙසෙයින් මෙලොව් හි ඇතැම් සත්හු විශුද්ධ ස්වභාව ඇති වෙත්.

අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්බාධෙ ඔකාසාධිගමො අනුබුද්ධො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං ඉමානි ඡ අනුස්සති ඨානානීති.

## 6. 1. 3. 7.

### [පඨමසමය සුත්තං]

[සාවත්ථිනිදානං]

**27.** අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කති නු ඛො භන්තෙ සමයා මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

ඡයිමෙ භික්ඛු සමයා මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසංකමිතුං. කතමෙ ඡ:

(1) ඉධ භික්ඛු යස්මිං සමයෙ භික්ඛු කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති, කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "අහං ඛො ආවුසො කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරාමි කාමරාගපරෙතෙන. උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාමි. සාධු වත මෙ ආයස්මා කාමරාගස්ස පහානාය ධම්මං දෙසෙතූ"ති. තස්ස මනොභාවනීයො භික්ඛු කාමරාගස්ස පහානාය ධම්මං දෙසෙති. අයං භික්ඛු පඨමො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

(2) පුන ච පරං භික්ඛු, යස්මිං සමයෙ භික්ඛු ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති ව්‍යාපාදපරෙතෙන, උප්පන්නස්ස ච ව්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'අහං ඛො ආවුසො ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරාමි ව්‍යාපාදපරෙතෙන. උප්පන්නස්ස ච ව්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං නප්පජානාමි. සාධු වත මෙ ආයස්මා ව්‍යාපාදස්ස පහානාය ධම්මං දෙසෙතූ"ති. තස්ස මනොභාවනීයො භික්ඛු ව්‍යාපාදස්ස පහානාය ධම්මං දෙසෙති. අයං භික්ඛු දුතියො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

ඇවැත්නි, “ඒ භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝක-පරිදේවයන් ඉක්මවනු පිණිස දුක් දොම්නසුන් අස්තයට යවනු පිණිස, න්‍යායාධිගමය පිණිස, නිර්වාණය සාක්ෂාත් කරණු පිණිස, සම්බාධයෙහි අවකාශාධිගමයට කාරණු වන අනුස්මෘති ස්ථාන සය අවබෝධ කරණ ලද ය, යන මෙය ආශ්චර්යයෙක. ඇවැත්නි, අද්භූතයෙක.

## 6. 1. 3. 7.

## [පඨමසමය සුත්‍රය]

[සැවැත්නිදාන යි]

**37.** එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළේ ය:

“වහන්ස, මනොභාවනීය (වැඩූ සිත් ඇති) භික්ෂුවකු දක්නට එළැඹෙනු සඳහා සමය කොතෙක්දැ”යි.

මහණ, මනොභාවනීය මහණකු දක්නට එළැඹෙනු සඳහා මේකල් සයෙකි. කවර සයෙක යත්:

(1) මහණ, මෙ සස්නෙහි මහණ කාමරාගයෙන් පර්‍යුත්ථිත වූ කාම-රාගයෙන් මඩනා ලද සිතින් වාස කෙරේ නම්, උපන්නා වූ ද කාමරාග-යාගේ නිස්සරණය තත්වූ පරිදි නොදන්නේ නම්, එසමයෙහි එළැඹ මනොභාවනීය මහණ මෙසේ කියැයුතු වන්නේ ය: “ඇවැත්නි, මම වනාහි කාමරාගයෙන් පර්‍යුත්ථිත වූ කාමරාගයෙන් මඩනා ලද සිතින් වාසකරමි. උපන්නා වූත් කාමරාගයාගේ යථාභූත නිස්සරණය නො දනිමි. ආයුෂ්මත් මට කාමරාගයාගේ ප්‍රහාණය සඳහා ධර්මය දෙසා නම් මැනැවැ”යි. ඔහට මනොභාවනීය මහණ කාමරාගයාගේ ප්‍රහාණයට ධර්මදේශනා කෙරෙයි. මහණ, මේ වනාහි මනොභාවනීය මහණකු දක්නට එළැඹෙනු සඳහා ප්‍රථම කාලය වෙයි.

(2) තවද මහණ, යම් කලෙක්හි මහණ ව්‍යාපාද පර්‍යුත්ථිත, ව්‍යාපාදාභිභූත සිතින් වාසය කෙරේ නම්, උපන් ව්‍යාපාදයාගේ නිඃසරණය තත්වූ පරිදි නොදන්නේ නම්, එකල එළැඹ භාවනීය භික්ෂු මෙසේ කියැයුතු වන්නේ ය: “ඇවැත්නි, මම වනාහි ව්‍යාපාද පර්‍යුත්ථිත ව්‍යාපාදාභිභූත සිතින් වාස කරමි. උපන් ව්‍යාපාදයාගේ යථාභූත නිස්සරණය නො ම දනිමි. ආයුෂ්මත් මට ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස දහම් දෙසා නම්, මැනැවැ”යි ඔහට මනොභාවනීය මහණ ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස ධර්මය දෙසන්නේ ය. මහණ මෙ වනාහි මනොභාවනීය භික්ෂුහුගේ දර්ශනය සඳහා එළඹෙන්නට දෙවන කාලය වෙයි.

(3) පුන ච පරං භික්ඛු, යස්මිං සමයෙ භික්ඛු ථීනමිද්ධ පරියුට්ඨිතෙන චෙතසා විහරති ථීනමිද්ධපරෙතෙන, උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "අහං ඛො අවුසො ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරාමි ථීනමිද්ධ පරෙතෙන. උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං නප්පජානාමි. සාධු වත මෙ ආයස්මා ථීනමිද්ධස්ස පහානාය ධම්මං දෙසෙතූ"ති. තස්ස මනොභාවනීයො භික්ඛු ථීනමිද්ධස්ස පහානාය ධම්මං දෙසති. අයං භික්ඛු තතියො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

(4) පුන ච පරං භික්ඛු යස්මිං සමයෙ භික්ඛු උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති උද්ධච්චකුක්කුච්චපරෙතෙන, උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "අහං ඛො ආවුසො උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරාමි උද්ධච්චකුක්කුච්චපරෙතෙන. උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං නප්පජානාමි. සාධු වත මෙ ආයස්මා උද්ධච්චකුක්කුච්චස්ස පහානාය ධම්මං දෙසෙතූ"ති. තස්ස මනොභාවනීයො භික්ඛු උද්ධච්චකුක්කුච්චස්ස පහානාය ධම්මං දෙසෙති. අයං භික්ඛු චතුත්ථො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

(5) පුන ච පරං භික්ඛු, යස්මිං සමයෙ භික්ඛු විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති, විචිකිච්ඡාපරෙතෙන, උප්පන්නාය, විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "අහං ඛො ආවුසො විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරාමි, විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාමි. සාධු වත මෙ ආයස්මා විචිකිච්ඡාය පහානාය ධම්මං දෙසෙතූ"ති. තස්ස මනො භාවනීයො භික්ඛු විචිකිච්ඡාය පහානාය ධම්මං දෙසෙති. අයං භික්ඛු පඤ්චමො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

(6) පුන චපරං භික්ඛු, යස්මිං සමයෙ භික්ඛු යන්නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො අනන්තරා[1] ආසවානං ඛයො හොති, තං නිමිත්තං න ජානාති, න පස්සති, තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "අහං ඛො ආවුසො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො අනන්තරා ආසවානං ඛයො හොති, තං නිමිත්තං න ජානාමි, න පස්සාමි. සාධු වත මෙ ආයස්මා ආසවානං ඛයාය ධම්මං දෙසෙතූ"ති. තස්ස මනොභාවනීයො භික්ඛු ආසවානං ඛයාය ධම්මං දෙසෙති. අයං භික්ඛු ඡට්ඨො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං. ඉමෙ ඛො භික්ඛු ඡ සමයා මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුන්ති.

1. අනන්තරා - සීමු.

(3) තවද මහණ, යම් කලෙක්හි මහණ ථීනමිද්ධයෙන් මැඩුනු ථීනමිද්ධ පරෙතසිතින් වාසකෙරේ නම්, උපන් ථීනමිද්ධයාගේද නිඃසරණය යථාභූතයෙන් නොදන්නේ නම්, එකල්හි එලඹ මනොභාවනීය භික්ෂු මෙසේ කියයුතු වන්නේ ය: ''ඇවැත්නි, මම වනාහි ථීනමිද්ධයෙන් මැඩුනු, ථීනමිද්ධය අනුව ගිය සිතින් වෙසෙමි. උපන් ථීනමිද්ධයාගේත් නිඃසරණය යථාභූතයෙන් නොදත්මි. ආයුෂ්මත් තෙමේ මට ථීනමිද්ධයාගේ ප්‍රහාණය පිණිස නිසිදම් දෙසා නම් මැනැවැ''යි. ඔහට මනොභාවනීය මහණ ථීනමිද්ධයාගේ ප්‍රහාණය පිණිස දම් දෙසන්නේ ය මහණ, මනොභාවනීය මහණහුගේ දර්ශනය සඳහා මෙ තුන්වන කාලය වෙයි.

(4) තවද මහණ, යම් කලෙක මහණ උද්ධච්චකුක්කුච්චයෙන් මැඩුනු උද්ධච්චකුක්කුච්ච පරෙත සිතින් වාස කෙරේ නම්, උපන් උද්ධච්චකුක්කුච්චයාගේද නිඃසරණය යථාභූතයෙන් නොදන්නේ නම්, එසමයෙහි එලඹ මනොභාවනීය භික්ෂුතෙම මෙසේ කියයුතු වන්නේ ය. ''ඇවැත්නි, මම වනාහි උද්ධච්චකුක්කුච්චයෙන් මැඩුනු උද්ධච්චකුක්කුච්ච අනුව ගිය සිතින් වෙසෙමි. උපන් උද්ධච්චකුක්කුච්චයාගේද නිඃසරණය යථාභූතයෙන් නො ම දත්මි. ආයුෂ්මත් මට උද්ධච්චකුක්කුච්චයාගේ ප්‍රහාණය සඳහා නිසි දහම් දෙසා නම් මැනැවැ''යි. ඔහට මනොභාවනීය මහණ උද්ධච්චකුක්කුච්චයාගේ ප්‍රහාණය සඳහා ධර්මය දෙසන්නේ ය. මහණ, මනොභාවනීය භික්ෂුහුගේ දර්ශනය සඳහා එලඹෙන්නට මේ සතරවන කාලය වෙයි.

(5) තවද මහණ, යම් කලෙක්හි මහණ විචිකිච්ඡායෙන් මැඩුනු විචිකිච්ඡා පරෙත සිතින් වාස කෙරේ නම්, උපන් විචිකිච්ඡාවගේ නිඃසරණය යථාභූතයෙන් නොදන්නේ නම්, එසමයෙහි වෙත පැමිණ මනොභාවනීය මහණ මෙසේ කියයුතු වන්නේය: ''ඇවැත්නි, මම වනාහි විචිකිච්ඡායෙන් මැඩුනු විචිකිච්ඡාව අනුවගිය සිතින් වසමි. උපන් විචිකිච්ඡාවගේද නිඃසරණය යථාභූතයෙන් නො දත්මි. ආයුෂ්මත් මට විචිකිච්ඡාවගේ ප්‍රහාණය සඳහා ධර්මය දෙසා නම් මැනැවැ''යි. ඔහට මනොභාවනීය මහණ විචිකිච්ඡාවගේ ප්‍රහාණය සඳහා නිසි දහම් දෙසන්නේ ය. මහණ, මනොභාවනීය මහණහුගේ දර්ශනය සඳහා එලඹෙනුවච මෙ පස්වන කාලය වෙයි.

(6) තවද මහණ, යම් කලෙක මහණ යම් මැ නිමිත්තකට පැමිණ යම් මැ නිමිත්තක් මෙනෙහි කරන්නහුට අනන්තරායෙන් (බධා රහිත) ආස්‍රවක්‍ෂය වේ නම්, එ නිමිත්ත නො දත්තේ, නො දක්නේ නම්, එකල්හි එලඹ මනොභාවනීය මහණ මෙසේ කියයුතු වන්නේ ය: ''ඇවැත්නි, මම් වනාහි යම් නිමිත්තකට පැමිණ, යම් නිමිත්තක් මෙනෙහි කරණුවහට අනන්තරායෙන් ආස්‍රවක්‍ෂය වේ නම්, එ බඳු නිමිත්ත නො දත්මි. නො දක්මි. ආයුෂ්මත් මට ආස්‍රවයන්ගේ ක්‍ෂය සඳහා ධර්මය දෙසා නම් මැනැවැ''යි. ඔහට මනොභාවනීය මහණ ආස්‍රවයන්ගේ ක්‍ෂය සඳහා ධර්ම දෙසන්නේ ය. මහණ, මනොභාවනීය භික්ෂුහුගේ දර්ශනයට එලඹෙනුවට මේ සවන කාලය වෙයි.

## 6. 1. 3. 8.

## [දුතියසමය සුත්තං]

28. එකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො තෙසං ථෙරානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං මණ්ඩලමාළෙ සන්නිපතිතානං සන්නිසින්නානං අයමන්තරා කථා උදපාදි: "කො නු ඛො ආවුසො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුන්ති"

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු තෙ භික්ඛූ එතදවොච: යස්මිං ආවුසො සමයෙ මනොභාවනීයො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො පාදෙ පක්ඛාලෙත්වා නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුන්ති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු තං භික්ඛුං එතදවොච: න ඛො ආවුසො සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං. යස්මිං ආවුසො සමයෙ මනොභාවනීයො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො පාදෙ පක්ඛාලෙත්වා නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, වාරිත්තකිලමථොපිස්ස තස්මිං සමයෙ අප්පටිප්පස්සද්ධො හොති, භත්තකිලමථොපිස්ස තස්මිං සමයෙ අප්පටිප්පස්සද්ධො හොති. තස්මා න ඛො සො අසමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං. යස්මිං ආවුසො සමයෙ මනොභාවනීයො භික්ඛු සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො විහාරපච්ඡායායං නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුන්ති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු තං භික්ඛුං එතදවොච: න ඛො ආවුසො සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං. යස්මිං ආවුසො සමයෙ මනොභාවනීයො භික්ඛු සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො විහාරපච්ඡායායං නිසින්නො හොති පල්ලඞ්කං අභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛා සතිං උපට්ඨපෙත්වා, යදෙවස්ස දිවා සමාධිනිමිත්තං මනසිකතං හොති, තදෙවස්ස තස්මිං සමයෙ සමුදචරති. තස්මා න ඛො සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං. යස්මිං ආවුසො සමයෙ මනොභාවනීයො භික්ඛු රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුන්ති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු තං භික්ඛුං එතදවොච: න ඛො ආවුසො සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං. යස්මිං ආවුසො සමයෙ මනොභාවනීයො භික්ඛු රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, ඔජට්ඨායිස්ස තස්මිං සමයෙ කායො හොති. ඵාසුස්ස හොති බුද්ධානං සාසනං මනසිකාතුං. තස්මා සො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුන්ති.

## 6. 1. 3. 8.

## [ද්විතීය සමය සූත්‍රය]

29. එක් කලෙක්හි බොහෝ මහලු වහන්දෑ බරණැස් නුවර සමීපයෙහි වූ ඉසිපතන නම් මිගදායෙහි වසන්නාහ. ඉක්බිති පසුබත්හි පිඬුවායෙන් පෙරළා පැමිණි, මණ්ඩල මාලයෙහි (මඬුලු සටහනින් කළ භෝජන ශාලායෙහි) රැස්ව හුන් මහලු වහන්දෑ අතුරෙහි මේ අතුරු කථාව පහළ විය: “ඇවැත්නි, මනොභාවනීය (භාවනාවෙන් මනවඩන) මහණකු දැකීමට එළඹෙනුවට නිසිකල් කවරේද?”යි.

මෙසේ කී කල්හි අන්‍යතර භික්ෂුනමක් එ භික්ෂූන්ට තෙල කරුණ කී ය: “ඇවැත්නි, යම් කලෙක්හි මනොභාවනීය මහණ පසුබත්හි පිඬුවා-යෙන් පෙරළා පැමිණියේ පා දෙවා පලක් බැඳ (අසුරම්ණිය ගොතා) කය සෘජු කොට තබා සිහිය පරිමුඛ කොට (කමටහන්හි) එළවා හුන්නේ වේ ද, මනොභාවනීය මහණහු දැක්ම සඳහා එළැඹෙන්නට එ සමය වේය”යි.

මෙසේ කියත් ම, අන්‍යතර මහණෙක් එ භික්ෂූහට තෙල කී: “ඇවැත්නි, යම් කලෙක මනොභාවනීය භික්ෂු පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා පැමිණියේ පා දෙවා පලක් බැඳ කය සෘජු කොට තබා සිහිය පරිමුඛ කොට එළවා හුන්නේ වේ නම්, ඇවැත්නි, මනොභාවනීය භික්ෂුහු දක්නා සඳහා එළැඹෙන්නට එ කල් නො වේ. එ සමයෙහි ඔහුගේ පිණ්ඩපාත චර්‍යායෙන් උපන් කලමථය ද නො සන්හුන් වෙයි. එසමයෙහි ඔහුගේ භක්ත කලමථය ද නො සන්හුන් වෙයි. එහෙයින් මනොභාවනීය මහණහු දක්නට එළැඹෙන්නට එ නොකල. ඇවැත්නි, යම් කලෙක්හි මනො-භාවනීය මහණ සවස් කල්හි පිළිසලණින් නැගියේ, වෙහෙර පසුපසැ සෙවණෙක්හි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා සමාධිය කමටහන් අභිමුඛ කොට එළවා හුන්නේ ද, මනොභාවනීය මහණහු දැක්මට එළැඹෙන්නට එ කලැ”යි.

මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් එ භික්ෂූහට තෙල කී ය: “ඇවැත්නි, යම් කලෙක්හි මනොභාවනීය මහණ සවස් වරුයෙහි පිළිසලණින් නැගීසිටියේ වෙහෙර පසුපස සෙවණෙක්හි පලක් බැඳ කය ඍජු කොට තබා කමටහන් අභිමුඛ කොට සිහි එළවා හුන්නේ වේ නම්, එ මනොභාවනීය මහණහු දැක්මට එළැඹෙන්නට නොකල් වෙයි. ඔහු විසින් දහවල් යම් මැ සමාධි නිමිත්තයෙක් මෙනෙහි කරණ ලද වේ නම්, එසමයෙහි එය ම ඔහුගේ මනොද්වාරයෙහි ආපාථ වශයෙන් හැසිරෙයි. එහෙයින් මනොභාවනීය භික්ෂුහු දක්නට එළැඹෙන්-නට එ නොකල් වෙයි. ඇවැත්නි, යම් කලෙක්හි මනොභාවනීය භික්ෂු රෑ පැසුළුයම්හි නැගී පලක් බැඳ කය ඍජු කොට තබා සිහිය පරිමුඛ කොට එළවා හුන්නේ වේ ද, මනොභාවනීය භික්ෂූහු දක්නට එළැඹෙන්නට එ කලැ”යි.

එසෙයින් කී කල්හි අන්‍යතර මහණෙක් එ මහණහට තෙල කී ය: “ඇවැත්නි, යම් කලෙක්හි මනොභාවනීය භික්ෂු රෑ පැසුළුයමැ නැගිට පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා සමාධිය ඉදිරියෙහි එළවා හුන්නේ වේ ද, එසමයෙහි ඔහුගේ කය ඔජට්ඨායී (ඔජස් වැඩී සිටියේ) වෙයි ඔහුට බුදුන්ගේ සස්න මෙනෙහි කරන්නට පහසු වෙයි. එහෙයින් මනොභාවනීය භික්ෂුහු දක්නට එළඹෙන්නට එ කල් වේ ය”යි.

එවං වුත්තෙ ආයස්මා මහාකච්චානො ථෙරෙ භික්ඛූ එතදවොච: "සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං-"

"ඡයිමෙ භික්ඛු, සමයා මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං. කතමෙ ඡ:

(1) ඉධ භික්ඛු, යස්මිං සමයෙ භික්ඛු කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: අහං ඛො ආවුසො කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරාමි කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාමි. සාධු වත මෙ ආයස්මා කාමරාගස්ස පහානාය ධම්මං දෙසෙතූති. තස්ස මනොභාවනීයො භික්ඛු කාමරාගස්ස පහානාය ධම්මං දෙසෙති. අයං භික්ඛු, පඨමො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

(2) පුන ච පරං භික්ඛු, යස්මිං සමයෙ භික්ඛු ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති -පෙ- (3) ථිනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති -පෙ- (4) උද්ධච්චකුක්කුච්ච පරියුට්ඨිතෙන චෙතසා විහරති -පෙ- (5) විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති -පෙ- (6) යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො අනන්තරා ආසවානං ඛයො හොති, තං නිමිත්තං න ජානාති, න පස්සති. තස්මිං සමයෙ මනොභාවනීයො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: අහං ඛො ආවුසො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො අනන්තරා ආසවානං ඛයො හොති, තං නිමිත්තං න ජානාමි, න පස්සාමි. සාධු වත මෙ ආයස්මා ආසවානං ඛයාය ධම්මං දෙසෙතූති. තස්ස මනොභාවනීයො භික්ඛු ආසවානං ඛයාය ධම්මං දෙසෙති. අයං භික්ඛු ඡට්ඨො සමයො මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුං.

සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: ඉමෙ ඛො භික්ඛු, ඡ සමයා මනොභාවනීයස්ස භික්ඛුනො දස්සනාය උපසඞ්කමිතුන්ති.

6 1. 3. 9

[උදායී සුත්තං]

[සාවත්ථිනිදානං]

29. අථ ඛො භගවා ආයස්මන්තං **උදායිං** ආමන්තෙසි:

"කති නු ඛො උදායි, අනුස්සතිට්ඨානානී?"ති එවං වුත්තෙ ආයස්මා උදායි තුණ්හී අහොසි. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං උදායිං ආමන්තෙසි. "කති නු ඛො උදායි, අනුස්සතිට්ඨානානී?"ති. දුතියම්පි ඛො ආයස්මා උදායි තුණ්හී අහොසි. තතියම්පි ඛො භගවා ආයස්මන්තං උදායිං ආමන්තෙසි. "කති නු ඛො උදායි, අනුස්සතිට්ඨානානී?"ති. තතියම්පි ඛො ආයස්මා උදායි තුණ්හී අහොසි.

මෙසේ කී කල්හි ආයුෂ්මත් මහාකොට්ඨායන තෙරණුවෝ මහලු වහන්දූට මෙසේ කීය: ඇවැත්නි, මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් මෙය අසන ලද්දී. හමුයෙහි පිළිගන්නා ලද්දී:-

"මහණ, මනොභාවනීය මහණහු දක්නට එළැඹෙනුවට මෙකල් සයෙකි. කවර සයෙක යත්:

(1) මහණ, මෙසස්නෙහි මහණ යම් කලෙක කාමරාගයෙන් පර්‍ය්‍යවස්ථිත වූ කාමරාගයා විසින් මැඩුණු සිතින් වාස කෙරේ නම්, උපන් කාමරාගයාගේත් නිඃස්සරණයත් යථාභූතයෙන් නො දන්නේ නම්, එසමයෙහි මනොභාවනීය මහණ වෙත එළැඹ මෙ සෙයින් කියයුතු වන්නේය: "ඇවැත්නි, මම වනාහි කාමරාගයෙන් පර්‍ය්‍යවස්ථිත වූ කාමරාගයා විසින් මැඩුණු සිතින් වසමි. උපන් කාමරාගයාගේ නිඃසරණයත් යථාභූතයෙන් නො දනිමි. ආයුෂ්මත් කාමරාගයාගේ ප්‍රහාණය සඳහා මට දහම් දෙසා නම්, ඒකාන්තයෙන් මැනැවැ"යි ඔහට මනොභාවනීය මහණ කාමරාගයාගේ ප්‍රහාණය සඳහා (සුදුසු) දහම් දෙසන්නේ ය. මහණ, මනොභාවනීය මහණකු දක්නට එළැඹෙනුවට මේ ප්‍රථම සමය යි.

(2) නැවද මහණ, යම් කාලෙක්හි මහණ ව්‍යාපාදයෙන් පර්‍ය්‍යවස්ථිත වූ ව්‍යාපාදයා විසින් මැඩුණු සිතින් වෙසෙයි (3) ථීනමිද්ධයෙන් පර්‍ය්‍යවස්ථිත වූ ථීනමිද්ධයෙන් මැඩුණු චිත්තයෙන් වෙසෙයි ... (4) උද්ධච්චකුක්කුච්චයෙන් පර්‍ය්‍යවස්ථිත වූ උද්ධච්චකුක්කුච්චය විසින් මැඩුණු සිතින් වෙසෙයි ... (5) විචිකිච්ඡායෙන් පර්‍ය්‍යවස්ථිත වූ විචිකිච්ඡා විසින් මැඩුණු සිතින් වාස කරයි .. (6) යම් මැ නිමිත්තකට පැමිණ යම් මැ නිමිත්තක් මෙනෙහි කරන්නහුට අනන්තරායෙන් ම ආස්‍රවක්ෂය වේ නම්, එ නිමිත්ත නො දන්නේ නො දක්නේ නම්, එ සමයෙහි එළැඹ මනොභාවනීය මහණ මෙසෙයින් කිවයුතු වන්නේ ය: "ඇවැත්නි, මම වනාහි යම් මැ නිමිත්තකට පැමිණ යම් නිමිත්තක් මෙනෙහි කරන්නහුට අනන්තරායෙන් ආස්‍රවක්ෂය වේ නම්, එ නිමිත්ත නො දනිමි, නො දක්මි. ආයුෂ්මත් මට දහම් දෙසා නම් ඒකාන්තයෙන් මැනැවැ"යි. ඔහට මනොභාවනීය මහණ ආස්‍රවක්ෂය සඳහා දහම් දෙසන්නේ ය. මහණ මනොභාවනීය මහණහු දක්නට එළැඹෙන්නට මෙ සවන කලැ"යි.

ඇවැත්නි, "මහණ, මනොභාවනීය භික්ෂුහු දක්නට වෙත එළැඹෙන්නට මේ සය කල්ය"යි මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් හමුයෙහි අසන ලදී. හමුයෙහි පිළිගන්නා ලදී.

### 6. 1. 3. 9

### [උදායී සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**29.** එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් (ලාළු) **උදායී** තෙරුන් ඇමැතු සේක:

"උදායියෙනි, අනුස්සෘතිස්ථානයෝ කොතෙක් දැ?" යි. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් උදායි තෙරණුවෝ නිහඬ වූහ. දෙවන වට දු භාග්‍යවතුන් වහන්සේ "උදායීයෙනි, අනුස්සෘතිස්ථානයෝ කොතෙක් දැ?" යි ආයුෂ්මත් උදායී තෙරුන් ඇමැතු සේක. දෙවනවට දු ආයුෂ්මත් උදායි තෙරණුවෝ නිහඬ වූහ. තෙවනවට දු භාග්‍යවතුන් වහන්සේ "උදායියෙනි, අනුස්සෘතිස්ථානයෝ කොතෙක් දැ?" යි ආයුෂ්මත් උදායී තෙරුන් ඇමැතු සේක. තෙවනවට දු ආයුෂ්මත් උදායී තෙරණුවෝ නිහඬ වූහ.

අථ ඛො ආයස්මා ආනන්දො, ආයස්මන්තං උදායිං එතදවොච: “සත්ථා තං ආවුසො උදායි, ආමන්තෙතී”ති. පුණ්ණොමහං[1] ආවුසො ආනන්ද, භගවතො.

“ඉධ භන්තෙ භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. ඉදං භන්තෙ අනුස්සතිට්ඨානන්ති.”

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “අඤ්ඤාසිං ඛො අහං ආනන්ද, නෙවායං උදායි මොඝපුරිසො අධිචිත්තමනුයුත්තො විහරතී”ති.

කති නු ඛො, ආනන්ද, අනුස්සතිට්ඨානානී'ති.

පඤ්ච භන්තෙ අනුස්සතිට්ඨානානී'ති. කතමානි පඤ්ච:

(1) ඉධ භන්තෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- [පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ-] තතියං ඣානං උපසම්පජ්ජ විහරති.

ඉදං භන්තෙ අනුස්සතිට්ඨානං එවංභාවිතං එවංබහුලීකතං දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති.

(2) පුන චපරං භන්තෙ, භික්ඛු ආලොකසඤ්ඤං මනසිකරොති, දිවාසඤ්ඤං අධිට්ඨාති. යථා දිවා තථා රත්තිං, යථා රත්තිං තථා දිවා, ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

ඉදං භන්තෙ අනුස්සතිට්ඨානං එවංභාවිතං එවංබහුලීකතං ඤාණදස්සනපටිලාභාය සංවත්තති.

(3) පුන ච පරං භන්තෙ, භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජං[2] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති.

ඉදං භන්තෙ අනුස්සතිට්ඨානං එවංභාවිතං එවංබහුලීකතං කාමරාගස්ස පහානාය සංවත්තති.

(4) පුන ච පරං භන්තෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාතං. සො ඉමමෙව කායං එවං උපසංහරති: “අයම්පි ඛො කායො එවංධම්මො එවම්භාවී එතං අනතීතො”ති.[3]

1. පුණ්ණොම්හ - සීමු. 2. අට්ඨිමිඤ්ජා - මජසං, සතා 3. එවං අනතීතො - මජසං

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් උදායී තෙරුන්ට තෙල කීහ: "ඇවැත් උදායියෙනි, ශාස්තෘහු ඔබ අමතන්නාහ" යි. "ඇවැත් ආනන්දයෙනි, මම භාග්‍යවතුන් වහන්සේගේ තෙපුල අසමි" - (ප්‍රශ්නය ගැන කල්පනා කරමි) යි.

"වහන්ස, මෙ සස්නෙහි මහණ අනේකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙයි. එ කෙසෙයින යත්: එක් ජාතියකුදු ... ජාති දෙකෙකුදු ... මෙසෙයින් ආකාර සහිත කොට උදෙසීම් සහිත කොට අනේකවිධ පූර්වේනිවාසය අනුස්මරණ කරයි. වහන්ස, මෙ වනාහි අනුස්සතිට්ඨානයෙකැ" යි (උදායී තෙරණුවෝ කීහ.)

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්දතෙරුන් ඇමතූසේක: "ආනන්දයෙනි, මෙ උදායී මොඝපුරුෂ තෙම (සමාධි - විදර්ශනා සඞ්ඛ්‍යාත) අධිචිත්තයෙහි නො ම යෙදුනේ වාස කරන්නේය" යි මම දනගත්මි.

"ආනන්දයෙනි, අනුස්මෘතිස්ථානයෝ කොතෙක් දැ?" යි.

වහන්ස, අනුස්මෘතිස්ථානයෝ පස්දෙනෙක් වෙත්. කවර පස්දෙනෙක යත්:

(1) වහන්ස, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම ... [ප්‍රථමධ්‍යානයට .. ද්විතීයධ්‍යානයට ...] තෘතීයධ්‍යානයට එළඹ වාස කරයි.

වහන්ස, මෙ (ත්‍රිවිධධ්‍යාන) අනුස්මෘතිස්ථානය මෙසෙයින් වඩන ලදුයේ මෙසෙයින් බහුලකරණ ලදුයේ ඉහාත්මයෙහි සුඛවිහාර පිණිස වැටෙයි.

(2) තවද වහන්ස, මෙ සස්නෙහි මහණ (ථීනමිද්ධය දුරුකරණ) ආලෝකසංඥාව මෙනෙහි කෙරෙයි. දවහලැයි සංඥාව තබයි. දවහල් යම් සේ ආලෝක සංඥාව මෙනෙහි කෙරේ නම්, එසෙයින් රාත්‍රිය ද, රාත්‍රිය යම් සේ ආලෝක සංඥා මෙනෙහි කෙරේ නම් එසේ ම දවහල් ද මෙනෙහි කරයි. මෙසේ විවෘත වූ නීවරණයන්ගෙන් නො වැළඳි සිතින් සප්‍රභාසචිත්තය (දිවැස් නුවණ පිණිස ඔභාස සහිත සිත) වඩයි.

වහන්ස, මෙ (ආලෝකසංඥා) අනුස්මෘතිස්ථානය මෙ සෙයින් වඩනලදුයේ මෙ සෙයින් බහුලකරණ ලදුයේ ඥානදර්ශන ප්‍රතිලාභය (දිවැස් නුවණ ලැබීම) සඳහා වැටෙයි.

(3) තවද වහන්ස, මහණ පතුලෙන් උඩ, කෙශමස්තකයෙන් යට සිවිය හිමි කොට ඇති නානාප්‍රකාර අශුචියෙන් යුත් මෙ මැ (තමන්ගේ මැ) කය ප්‍රත්‍යවෙක්ෂා කරයි: මෙ කයෙහි කෙස් ඇත, ලොම් ඇත, නිය, දත්, සිවි, මස්, නහර, ඇට, ඇටමිදුලු, වකුගඩු, හදවත්, අක්මා, දලබු. බඩදිව, පෙණහලු, අතුණු, අතුණුබහන්, උදරයෙහි වූ නො පැසුණු අහර - පැසුණු අහර. පිත්, සෙම්, පූය, ලෙහෙ, ඩහ, මේදස්, කඳුළු, වුරුණු තෙල, සොටු, හිස්මිදුලු, මුත්‍ර ඇතැ" යි.

වහන්ස, මෙ (කාය) අනුස්මෘතිස්ථානය මෙ සෙයින් වඩනා ලදුයේ මෙ සෙයින් බහුලකරණ ලදුයේ කාමරාගයාගේ ප්‍රහාණය පිණිස වැටෙයි.

(4) තවද වහන්ස, මහණ. සොහොනෙහි දමූ මළ එක් දිනක් ඇති වේවයි, මළ දෙදිනක් ඇති වේවයි, මළ තෙදිනක් ඇති වේවයි, ඉදිමීගිය, නිල්වත් වූ වැගෙන පූය ඇති මළ සිරුරක් යම් පරිදි දක්නේ නම්, හේ (තමාගේ) මෙ මැ කය මෙසෙයින් නුවණින් එළවා බලන්නේ ය: "මෙ කය ද මෙබඳු සැහැවි ඇත්තේ ය. මෙබඳු වන සුල්ලේ ය. තෙල සැහැවි නො ඉක්ම වී ය" යි.

සෙය්‍යථාපි වා පන පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං කාකෙහි වා ඛජ්ජමානං කුලලෙහි වා ඛජ්ජමානං ගිජ්ඣෙහි වා ඛජ්ජමානං සුවානෙහි[1] වා ඛජ්ජමානං සිගාලෙහි වා ඛජ්ජමානං[2] විවිධෙහි වා පාණකජාතෙහි ඛජ්ජමානං, සො ඉමමෙව කායං එවං උපසංහරති: "අයම්පි ඛො කායො එවංධම්මො එවංභාවී එතං අනතීතො"ති.

සෙය්‍යථාපි වා පන පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකසඞ්ඛලිකං සමංසලොහිතං නහාරුසම්බන්ධං -පෙ- අට්ඨිකසඞ්ඛලිකං නිම්මංසලොහිත-මක්ඛිතං[3] නහාරුසම්බන්ධං -පෙ- අට්ඨිකසඞ්ඛලිකං අපගතමංසලොහිතං නහාරුසම්බන්ධං -පෙ- අට්ඨිකානි අපගතසම්බන්ධානි දිසාවිදිසාසු වික්ඛිත්තානි:[4] අඤ්ඤෙන හත්ථට්ඨිකං අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරට්ඨිකං අඤ්ඤෙන කටට්ඨිකං[5] අඤ්ඤෙන පිට්ඨිකණ්ටකං[6] අඤ්ඤෙන සීසකටාහං.[7] සො ඉමමෙව කායං එවං උපසංහරති: "අයම්පි ඛො කායො එවංධම්මො එවංභාවී එතං අනතීතො"ති.

සෙය්‍යථාපි වා පන පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං, අට්ඨිකානි සෙතානි සඞ්ඛවණ්ණූපනිභානි[8] -පෙ- අට්ඨිකානි පුඤ්ජකිතානි. තෙරො-වස්සිකානි[9] -පෙ- අට්ඨිකානි පූතීනි[10] චුණ්ණකජාතානි. සො ඉමමෙව කායං එවං උපසංහරති: 'අයම්පි ඛො කායො එවංධම්මො එවම්භාවී එතං අනතීතො"ති.

ඉදම්භන්තෙ අනුස්සතිට්ඨානං එවං භාවිතං එවං බහුලීකතං අස්මිමාන-සමුග්ඝාතාය සංවත්තති.

(5) පුන ච පරං භන්තෙ භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

ඉදං භන්තෙ අනුස්සතිට්ඨානං එවං භාවිතං එවං බහුලීකතං අනෙකධාතු පටිවෙධාය සංවත්තති.

ඉමානි ඛො භන්තෙ පඤ්ච අනුස්සතිට්ඨානානීති.

සාධු සාධු ආනන්ද, තෙන හි ත්වං ආනන්ද ඉදම්පි ඡට්ඨං අනුස්සතිට්ඨානං ධාරෙහි:

(6) ඉධානන්ද භික්ඛු සතොව අභික්කමති, සතොව පටික්කමති, සතොව තිට්ඨති, සතොව නිසීදති, සතොව සෙය්‍යං කප්පෙති, සතොව කම්මං අධිට්ඨාති.

ඉදං ආනන්ද අනුස්සතිට්ඨානං එවංභාවිතං එවං බහුලීකතං සතිසම්පජඤ්ඤාය සංවත්තතීති.

## 6. 1. 3. 10

## [අනුත්තරිය සුත්තං]

[සාවත්ථිනිදානං]

30. ඡ ඉමානි භික්ඛවෙ අනුත්තරියානි. කතමානි ඡ:

දස්සනානුත්තරියං සවණානුත්තරියං ලාභානුත්තරියං සික්ඛානුත්තරියං පාරිචරියානුත්තරියං අනුස්සතානුත්තරියං.

---

1. සුපානෙහි - සිමු. 2. ගිජ්ඣෙහි වා ඛජ්ජමානං කඞ්කෙහි වා ඛජ්ජමානං සුනඛෙහි වා ඛජ්ජමානං බ්‍යග්ඝෙහි වා ඛජ්ජමානං දීපීහි වා ඛජ්ජමානං සිගාලෙහි වා ඛජ්ජමානං - මජ්සං. 3. නිම්මංසලොහිතමක්ඛිතං - මජ්සං. PTS 4. දිසාවිදිසා-වික්ඛිත්තානි - මජ්සං. 5. කටිට්ඨිකං - මජ්සං. 6. පිට්ඨිට්ඨිකං - මජ්සං. 7. අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ගොප්ඵකට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරුට්ඨිකං අඤ්ඤෙන කටිට්ඨිකං අඤ්ඤෙන ඵාසුකට්ඨිකං අඤ්ඤෙන ඛන්ධට්ඨිකං අඤ්ඤෙන ගීවට්ඨිකං අඤ්ඤෙන හනුකට්ඨිකං අඤ්ඤෙන දන්තට්ඨිකං අඤ්ඤෙන සීසකටාහං - මජ්සං. 8. සඞ්ඛවණ්ණපටිභාගානි - මජ්සං 9 තෙරොවස්සිකානි -PTS අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරොවස්සිකානි-සිමු. 10 පූතීකානි - PTS.

සොහොන්හි දමනලද කවුඩන් විසින් හෝ කනු ලබන, උකුස්සන් විසින් හෝ කනු ලබන, ගිජුලිහිණියන් විසින් හෝ කනු ලබන, ශුනකයන් විසින් හෝ කනු ලබන, සිවලුන් විසින් හෝ කනු ලබන, විවිධ ප්‍රාණීන් විසින් හෝ කනු ලබන මළ සිරුරක් යම් සෙයින් දක්නේ නම්, හේ "මෙ කය ද මෙබඳු සැහැවි ඇත්තේ ය, මෙබඳු වන සුලු ය, මෙබඳු සැහැවි නො ඉක්මවීය"යි මේ මැ කය මෙසේ නුවණින් එළවා බලයි.

සොහොන්හි දමනලද මස් ලේ සහිත වූ නහරින් සම්බන්ධය ඇති ඇටසැකිලි සිරුරක් ... මස් නැති ලෙයින් වැකුනු නහර වැල් බැඳුම් ඇති ඇටසැකිලි සිරුරක් ... පහවගිය මස් ලේ ඇති, නහර වැල් බැඳුම් ඇති ඇටසැකිලි සිරුරක් ... එක් දිශායෙක්හි අත් ඇට ය, එක් දිශායෙක්හි පා ඇට ය, එක් දිශායෙක්හි කෙණ්ඩා ඇට ය, එක් දිගෙක කලවා ඇට ය, එක්දිගෙක හට් ඇට ය, එක්දිගෙක පිටිකටු ය, එක්දිගෙක්හි හිස් කබල ය යි, මෙසේ පහ වූ සම්බන්ධය ඇති දිසාවිදිසාවන්හි විසිරුණු ඇට ඇති මළසිරුරක් යම්සේ දක්නේ නම්, හේ "මේ සිරුරද මෙබඳු සැහැවි ඇත්තෙ ය, මෙබඳු වන සුලුය, මෙබව නො ඉක්මවීය"යි මෙ කය මෙසේ නුවණින් එළවා බලයි.

සොහොන්හි දැමූ සක් පැහැයේ සුදු වූ ඇට ඇති සිරුර ... බොහෝ හවුරුදු ඉක්මගිය මුළුදුන් (ගොඩගැසුනු) ඇට ඇති ... දිරාගිය සුණු වූ ඇට ඇති ... යම්සේ දක්නේ නම්, හේ "මේ කය ද මෙබඳු සැහැවි ඇත්තේ ය, මෙබඳු වනසුලු ය, මෙබව නො ඉක්මියේ යැ"යි මෙසෙයින් මෙ කය නුවණින් තුලනා කොට බලන්නේ ය.

වහන්ස, මෙසෙයින් වඩනාලද, මෙසෙයින් බහුලීකෘත මේ (අශුභ) අනුස්මෘතිස්ථානය අස්මිමාන සමුද්ඝාතය පිණිස වැඩේ ය යි.

(5) නැවද වහන්ස, මහණ සුඛප්‍රහාණයෙනුදු ... චතුර්ථධ්‍යානයට එළැඹ වෙසෙයි.

වහන්ස, මෙසේ වඩන ලද, මෙසේ බහුලීකෘත මෙ (චතුර්ථධ්‍යාන) අනුස්මෘතිස්ථානය අනේකධාතුප්‍රතිවේධය සඳහා වැඩේ ය යි.

වහන්ස, මොහු වනාහි පස් අනුස්මෘතිස්ථානයෝ යි.

ආනන්දයෙනි, මැනැව, මැනැව, ආනන්දයෙනි, එ සෙයින්ම තෝ මෙ සවන අනුස්මෘතිස්ථානය ද ධරව:

(6) ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ ස්මෘති ඇත්තේ ම ඉදිරියට යෙයි. ස්මෘති ඇත්තේ ම පෙරළා එයි. ස්මෘතිමත් ව ම සිටියි. ස්මෘතිමත් ව ම හිඳියි. ස්මෘතිමත් ව ම ශය්‍යා කෙරෙයි. ස්මෘතිමත් ව ම කර්මාන්ත ඉටයි.

ආනන්දයෙනි, මෙසේ වඩනලද, මෙසේ බහුල කරණලද මේ අනුස්මෘතිස්ථානය ස්මෘතිසම්ප්‍රජන්‍යය සඳහා වැඩේ යයි.

## 6. 1 3. 10.

## [අනුත්තරිය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

30. මහණෙනි, මේ අනුත්තරිය (ශ්‍රේෂ්ඨ) ධර්ම සයෙකි. කවර සයෙක යත්:

දර්ශනානුත්තරිය, ශ්‍රවණානුත්තරිය, ලාභානුත්තරිය, ශික්ෂානුත්තරිය, පාරිචර්යානුත්තරිය, අනුස්මරණානුත්තරිය යන සය යි.

(1) කතමඤ්ච භික්ඛවෙ දස්සනානුත්තරියං: ඉධ භික්ඛවෙ එකච්චො හත්ථිරතනම්පි දස්සනාය ගච්ඡති, අස්සරතනම්පි දස්සනාය ගච්ඡති, මණිරතනම්පි දස්සනාය ගච්ඡති, උච්චාවචං වා පන දස්සනාය ගච්ඡති. සමණං වා බ්‍රාහ්මණං වා මිච්ඡාදිට්ඨිකං මිච්ඡාපටිපන්නං දස්සනාය ගච්ඡති. අත්ථෙතං භික්ඛවෙ දස්සනං, නෙතං නත්ථීති වදාමි. තඤ්ච ඛො එතං භික්ඛවෙ දස්සනං හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. යො ච ඛො භික්ඛවෙ තථාගතං වා තථාගතසාවකං වා දස්සනාය ගච්ඡති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. එතදනුත්තරියං භික්ඛවෙ දස්සනානං- සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං තථාගතං වා තථාගතසාවකං වා දස්සනාය ගච්ඡති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. ඉදං වුච්චති භික්ඛවෙ දස්සනානුත්තරියං. ඉති දස්සනානුත්තරියං.

(2) සවණානුත්තරියඤ්ච කථං හොති: ඉධ භික්ඛවෙ එකච්චො භෙරිසද්දම්පි සවණාය ගච්ඡති, වීණාසද්දම්පි සවණාය ගච්ඡති, ගීතසද්දම්පි සවණාය ගච්ඡති, උච්චාවචං වා පන සවණාය ගච්ඡති. සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාපටිපන්නස්ස ධම්මසවණාය ගච්ඡති. අත්ථෙතං භික්ඛවෙ සවණං, නෙතං නත්ථීති වදාමි. තඤ්ච ඛො එතං භික්ඛවෙ සවණං හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. යො ච ඛො භික්ඛවෙ තථාගතස්ස වා තථාගතසාවකස්ස වා ධම්මසවණාය ගච්ඡති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. එතදනුත්තරියං භික්ඛවෙ සවණානං- සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය[1] ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං තථාගතස්ස වා තථාගතසාවකස්ස වා ධම්මසවණාය ගච්ඡති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. ඉදං වුච්චති භික්ඛවෙ සවණානුත්තරියං.

ඉති දස්සනානුත්තරියං, ඉති සවණානුත්තරියං.[2]

1 අත්ථංගමාය - මජසං.
2 සවණානුත්තරියං - මජසං.

Free Distribution www.aathaapi.org

(1) මහණෙනි, දස්සනානුත්තරිය කවරේ ය යත්: මහණෙනි, මෙලොව්හි එකෙක් හස්තිරත්න දක්නට ද යෙයි. අශ්වරත්න දක්නට ද යෙයි. මණිරත්න දක්නට ද යෙයි. කුඩාමහත් දෑය හෝ දක්නට ද යෙයි. මිසදිටුගත් වරදවා පිළිපන් මහණකු හෝ බමුණකු හෝ දක්නට ද යෙයි. මහණෙනි, තෙල දර්ශනය ඇත. තෙල නැතැයි නො කියමි. මහණෙනි, තෙල දර්ශනය හීන ය, ග්‍රාම්‍ය ය, පුහුදුන් සතු ය. අනාර්‍ය්‍යය. අනර්ථය සඳහා වැටෙයි. නිර්වේදයට නො ද වැටෙයි. විරාගයට නො ද වැටෙයි. නිරෝධයට නො ද වැටෙයි. කෙලශව්‍යපශමයට නො ද වැටෙයි. අභිඥානයට නො ද වැටෙයි. සම්බෝධියට නො ද වැටෙයි. නිර්වාණයට නො ද වැටෙයි. මහණෙනි, යමෙකුත් පිහිටි සැදැහැතියේ, පිහිටි ප්‍රේම ඇතියේ, ඒකාන්තයට (අචල ශ්‍රද්ධාවට) පැමිණියේ, අතිශයින් පහන් වූයේ, තථාගතයන් හෝ තථාගතශ්‍රාවකයකු හෝ දක්නට යේ නම්, මහණෙනි, සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස, ශොකපරිදෙවයන් ඉක්මවනු පිණිස, දුක්දොම්නස් දුරලනු පිණිස, න්‍යායාධිගමය පිණිස, නිවන් පසක් කරණු පිණිස පවත්නා හෙයින්, පිහිටි සැදැහැතියේ පිහිටි ප්‍රේම ඇතියේ ඒකාන්තගත වූයේ අභිප්‍රසන්න වූයේ තථාගතයන් හෝ තථාගතශ්‍රාවකයන් හෝ දක්නට යන්නේය යන තෙල කරුණ දර්ශනයන් අතුරෙන් අනුත්තරිය දර්ශන වේ. මහණෙනි, මෙ දස්සනානුත්තරිය යි කියනු ලැබේ. මෙසේයින් දර්ශනානුත්තරිය වෙයි.

(2) සවණානුත්තරිය කෙසේ වේ ය යත්: මහණෙනි, මෙලොව්හි එකෙක් භෙරීශබ්ද ඇසීමට යෙයි. වීණාශබ්ද ඇසීමට යෙයි. ගීතශබ්ද ඇසීමට යෙයි. කුඩා මහත් ශබ්ද හෝ ඇසීමට යෙයි. මිසදිටුගත් වරදවා පිළිපන් මහණකුගේ වේවයි, බමුණකුගේ වේවයි, ධර්මශ්‍රවණයට යෙයි. මහණෙනි තෙල ශ්‍රවණය ඇත් මැ යි. තෙල නැතැයි නො කියමි. මහණෙනි, තෙල ශ්‍රවණය හීන ය, ග්‍රාම්‍ය ය, පෘථග්ජනයන් සතු ය. අනාර්‍ය්‍ය ය. අනර්ථය ඇසුරු කෙළේ ය. නිර්වේදයට නො වැටෙයි. විරාගයට නො වැටෙයි. නිරෝධයට නො වැටෙයි. කෙලශව්‍යපශමයට නො වැටෙයි. අභිඥානයට නො වැටෙයි. සම්බෝධියට නො වැටෙයි. නිර්වාණයට නො වැටෙයි. මහණෙනි, පිහිටි සැදැහැති, පිහිටි ප්‍රේම ඇති අචලශ්‍රද්ධාවට පත් අභිප්‍රසන්න යමෙක් තථාගතයන් වහන්සේගේ හෝ තථාගතශ්‍රාවකයකුගේ හෝ ධර්මය ඇසීමට යේ නම්, මහණෙනි, පිහිටි ශ්‍රද්ධා ඇතියේ පිහිටි ප්‍රේම ඇතියේ ඒකාන්තගත වූයේ අභිප්‍රසන්න වූයේ තථාගතයන් වහන්සේගේ හෝ තථාගත ශ්‍රාවකයකුගේ හෝ ධර්මය ඇසීමට යන්නේය යන තෙල කරුණ - සත්ත්ව විශුද්ධිය පිණිස, ශෝකපරිදෙවයන්ගේ සමතික්‍රමණය පිණිස, දුක්දොම්නසුන්ගේ අස්තගමය පිණිස, න්‍යායාධිගමය පිණිස, නිවන් පසක් කරණු පිණිස පවත්නා හෙයින් ශ්‍රවණයන් අතුරෙහි අනුත්තරිය වෙයි. මහණෙනි, මේ සවණානුත්තරිය යි කියනු ලැබේ.

**මෙසේ දස්සනානුත්තරිය වෙයි. මෙසේ සවණානුත්තරිය වෙයි.**

(3) ලාභානුත්තරියංච කථං හොති: ඉධ භික්ඛවෙ එකච්චො පුත්තලාභම්පි ලභති, දාරලාභම්පි ලභති, ධනලාභම්පි ලභති. උච්චාවචං වා පන ලාභං ලභති. සමණෙ වා පන බ්‍රාහ්මණෙ වා මිච්ඡාදිට්ඨිකෙ මිච්ඡාපටිපන්නෙ සද්ධං පටිලභති. අත්ථෙසො භික්ඛවෙ ලාභො. න සො[1] නත්ථීති වදාමි. සො ච ඛො භික්ඛවෙ[2] ලාභො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, න නිබ්බිදාය -පෙ- න නිබ්බානාය සංවත්තති. යො ච ඛො භික්ඛවෙ තථාගතෙ වා තථාගතසාවකෙ වා සද්ධං පටිලභති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. එතදනුත්තරියං භික්ඛවෙ ලාභානං- සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං තථාගතෙ වා තථාගතසාවකෙ වා සද්ධං පටිලභති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. ඉදං වුච්චති භික්ඛවෙ ලාභානුත්තරියං.

ඉති දස්සනානුත්තරියං, සවණානුත්තරියං, ලාභානුත්තරියං.

(4) සික්ඛානුත්තරියං ච කථං හොති: ඉධ භික්ඛවෙ එකච්චො හත්ථිස්මිම්පි සික්ඛති, අස්සස්මිම්පි සික්ඛති, රථස්මිම්පි සික්ඛති, ධනුස්මිම්පි සික්ඛති, ථරුස්මිම්පි සික්ඛති, උච්චාවචං වා පන සික්ඛති. සමණස්ස වා පන බ්‍රාහ්මණස්ස වා මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාපටිපන්නස්ස සික්ඛති. අත්ථෙසා භික්ඛවෙ සික්ඛා, නෙසා නත්ථීති වදාමි. සා ච ඛො එසා භික්ඛවෙ සික්ඛා හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා, න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. යො ච ඛො භික්ඛවෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති, නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. එතදනුත්තරියං භික්ඛවෙ සික්ඛානං- සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති, නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. ඉදං වුච්චති භික්ඛවෙ සික්ඛානුත්තරියං.

ඉති දස්සනානුත්තරියං, සවණානුත්තරියං, ලාභානුත්තරියං, සික්ඛානුත්තරියං.

1 නෙසො - මජසං.

2 එසො භික්ඛවෙ - මජසං

(3) ලාභානුත්තරිය කෙසේ වේය යත්: මහණෙනි, මෙ ලොව්හි එකෙක් පුත්‍රලාභ ද ලබන්නේ ය. දාරලාභ ද ලබන්නේ ය. ධනලාභ ද ලබන්නේ ය. කුඩා මහත් ලාභ හෝ ලබන්නේ ය. මිසදිටුගත් වරදවා පිළිපන් මහණකු කෙරේ වේවයි බමුණකු කෙරේ වේවයි ශ්‍රද්ධාව ලබන්නේ ය. මහණෙනි, තෙල ලාභය ඇත්මැයි. එ නැතැයි නො කියමි. මහණෙනි, එ ලාභය ද හීන ය. ග්‍රාම්‍ය ය, පුහුදුන් සතු ය, අනාර්ය්‍ය ය, අනර්ථසංහිත ය. නිර්වේදයට නො වැටෙයි ... නිවන් පිණිස නො වැටෙයි. මහණෙනි, යමෙකුත් තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගතශ්‍රාවකයන් කෙරෙහි හෝ පිහිටි සැදැහැතියේ පිහිටි ප්‍රේම ඇතියේ අචලශ්‍රද්ධා ඇතියේ අභිප්‍රසන්න වූයේ සැදැහැ ලබන්නේ නම්, තථාගතයන් වහන්සේ කෙරේ වේවයි තථාගතශ්‍රාවකයන් කෙරේ වේවයි බැසගත් සැදැහැතියේ බැසගත් ප්‍රේම ඇතියේ ඒකාන්තයට ගියේ අභිප්‍රසන්න වූයේ, යම් මේ සත්ත්වවිශුද්ධිය පිණිස ශෝක පරිදේවයන්ගේ සමතික්‍රමණය පිණිස දුක් දොම්නස් දුරලනු පිණිස න්‍යායාධිගමය පිණිස නිවන් පසක් කරණු පිණිස පවත්නා ශ්‍රද්ධාව ලබන්නේ නම්, තෙල ශ්‍රද්ධාලාභය ලාභයන් අතුරෙහි අනුත්තරිය වේ ය යි. මහණෙනි, මෙ ලාභානුත්තරිය යි කියනු ලැබේ.

මෙසේ දර්ශනානුත්තරිය වෙයි, ශ්‍රවණානුත්තරිය වෙයි, ලාභානුත්තරිය වෙයි.

(4) සික්ඛානුත්තරිය කෙසේ වේ යත්: මහණෙනි, මෙලොව්හි එකෙක් හස්තිශිල්පයෙහි ද හික්මෙයි. අශ්වශිල්පයෙහි ද හික්මෙයි. ධනුශ්ශිල්පයෙහි ද හික්මෙයි. ඛඩ්ගශිල්පයෙහි ද හික්මෙයි. කුඩා මහත් ශිල්පයෙක්හි හෝ හික්මෙයි. මිථ්‍යාදෘෂ්ටික වූ මිථ්‍යාප්‍රතිපන්න වූ මහණකු හෝ බමුණකු අනුව හෝ හික්මෙයි. මහණෙනි, තෙල, ශික්ෂාව ඇත. තෙල නැතැයි නො කියමි මහණෙනි, තෙල ශික්ෂා හීන ය, ග්‍රාම්‍ය ය, පුහුදුන් සතු ය, අනාර්ය්‍ය ය, අනර්ථ සංහිත ය. නිර්වේදයට නො වැටෙයි. විරාගයට නො වැටෙයි. නිරෝධයට නො වැටෙයි. ව්‍යුපශමයට නො වැටෙයි. අභිඥාවට නො වැටෙයි. සම්බොධියට නො වැටෙයි. නිර්වාණයට නො වැටෙයි. මහණෙනි, යමෙක්හුත් තථාගතයන් වහන්සේ විසින් ප්‍රවිදිත වූ ධර්ම විනයෙහි අධිශීලයත් හික්මෙයි ද, අධිචිත්තයත් හික්මෙයි ද, අධිප්‍රඥාවත් හික්මේ ද, (ධර්මයෙහි) පිහිටි සැදැහැ ඇතියේ, පිහිටි ප්‍රේම ඇතියේ, අචල ශ්‍රද්ධා ඇතියේ, අභිප්‍රසන්න වේ ද, මහණෙනි, තථාගතධර්මවිනයෙහි බැසගත් සැදැහැතියේ බැසගත් ප්‍රේම ඇතියේ ඒකාන්තයට ගියේ අභිප්‍රසන්න වූයේ අධිශීලය ද හික්මෙයි, අධිචිත්තය ද හික්මෙයි, අධිප්‍රඥා ද හික්මෙයි යන යමක් වේ නම්, - සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස, ශෝකපරිදේවයන්ගේ සමතික්‍රමණය පිණිස දුඃඛදෞර්මනස්‍යයන්ගේ අස්තගමය පිණිස න්‍යායයාගේ අධිගමය පිණිස, නිර්වාණයාගේ සාක්ෂාත්කාරය පිණිස පවත්නා තෙල ශික්ෂාව ශික්ෂාවන් අතුරෙන් අනුත්තරිය වේ. මහණෙනි, මෙ සික්ඛානුත්තරිය යි කියනු ලැබේ.

මෙසේ දස්සනානුත්තරිය වෙ යි. සවණානුත්තරිය වෙ යි. ලාභානුත්තරිය වෙ යි. සික්ඛානුත්තරිය වෙ යි.

(5) පාරිචරියානුත්තරියං ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො ඛත්තියම්පි පරිචරති, බ්‍රාහ්මණම්පි පරිචරති, ගහපතිම්පි පරිචරති, උච්චාවචං වා පන පරිචරති. සමණං වා බ්‍රාහ්මණං වා මිච්ඡාදිට්ඨිකං මිච්ඡාපටිපන්නං පරිචරති. අත්ථෙසා භික්ඛවෙ පාරිචරියා. නෙසා නත්ථීති වදාමි. සා ච ඛො එසා භික්ඛවෙ පාරිචරියා හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා, න නිබ්බිදාය -පෙ- න නිබ්බානාය සංවත්තති. යො ච ඛො භික්ඛවෙ තථාගතං වා තථාගතසාවකං වා පරිචරති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. එතදනුත්තරියං භික්ඛවෙ පාරිචරියානං - සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං තථාගතං වා තථාගතසාවකං වා පරිචරති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. ඉදං වුච්චති භික්ඛවෙ පාරිචරියානුත්තරියං.

ඉති දස්සනානුත්තරියං, සවණානුත්තරියං, ලාභානුත්තරියං සික්ඛානුත්තරියං, පාරිචරියානුත්තරියං.

(6) අනුස්සතානුත්තරියං ච කථං හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුත්තලාභම්පි අනුස්සරති, දාරලාභම්පි අනුස්සරති, ධනලාභම්පි අනුස්සරති, උච්චාවචං වා ලාභං පන[1] අනුස්සරති. සමණං වා බ්‍රාහ්මණං වා මිච්ඡාදිට්ඨිකං වා මිච්ඡාපටිපන්නං අනුස්සරති. අත්ථෙසා භික්ඛවෙ අනුස්සති. නෙසා නත්ථීති වදාමි. සා ච ඛො එසා භික්ඛවෙ අනුස්සති හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා, න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. යො ච ඛො භික්ඛවෙ තථාගතං වා තථාගතසාවකං වා අනුස්සරති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. එතදනුත්තරියං භික්ඛවෙ අනුස්සතීනං - සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං තථාගතං වා තථාගතසාවකං වා අනුස්සරති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො. ඉදං වුච්චති භික්ඛවෙ අනුස්සතානුත්තරියං. [ඉති අනුස්සතානුත්තරියං.]

ඉමානි ඛො භික්ඛවෙ ඡ අනුත්තරියානී'ති.

---

1 පන ලාභං - මජසං

Free Distribution www.aathaapi.org

(5) පාරිචරියානුත්තරිය කෙසේ වේ ද යත්: මහණෙනි, මෙලොව්හි එකෙක් ක්‍ෂත්‍රියකුට ද මෙහෙ කෙරෙයි. බ්‍රාහ්මණයකුට ද මෙහෙ කෙරෙයි. ගැහැවියකුට ද මෙහෙ කෙරෙයි. කුදු මහත් පුගුලකුට හෝ මෙහෙ කෙරෙයි. මිථ්‍යාදෘෂ්ටික මිථ්‍යාප්‍රතිපන්න ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයකුට මෙහෙ කෙරෙයි. මහණෙනි, තෙල පාරිචරියාව ඇත. තෙල නැතැයි නො කියමි. මහණෙනි, තෙල පාරිචරියාව හීන ය, ග්‍රාම්‍ය ය, පුහුදුන් සතු ය, අනාර්‍ය්‍ය ය, අනර්ථයට වැටෙයි, නිර්වේදයට නො වැටෙයි ... නිර්වාණයට නො වැටෙයි. මහණෙනි, යමෙකුත් බැසගත් සැදැහැතියේ බැසගත් ප්‍රේම ඇතියේ එකාන්තයට ගියේ අභිප්‍රසන්න වූයේ තථාගතයන් වහන්සේට හෝ තථාගතශ්‍රාවකයකුට හෝ මෙහෙ කෙරේ නම්, මහණෙනි, බැසගත් ශ්‍රද්ධා ඇතියේ බැසගත් ප්‍රේම ඇතියේ එකාන්තගත වූයේ අභිප්‍රසන්න වූයේ තථාගතයන් වහන්සේට හෝ තථාගත ශ්‍රාවකයකුට හෝ මෙහෙ කෙරෙයි යන යමෙක් වේ නම්, එය සත්ත්ව විශුද්ධියට ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමයට දුක් දොම්නසුන්ගේ අස්තගමයට න්‍යායයාගේ අධිගමයට නිර්වාණයාගේ සාක්‍ෂාත්කාරයට හිත වන හෙයින් තෙල පාරිචරියාවන් අතුරෙහි අනුත්තරිය වෙයි. මහණෙනි, මෙ පාරිචරියානුත්තරියයි කියනු ලැබේ.

මෙසේ දස්සනානුත්තරිය වෙයි. සවණානුත්තරිය වෙයි. ලාභානුත්තරිය වෙයි. සික්ඛානුත්තරිය වෙයි. පාරිචරියානුත්තරිය වෙයි.

(6) අනුස්සතානුත්තරිය කෙසේ වේ ද යත්. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් පුත්‍රලාභය ද සිහිකෙරෙයි, භාර්‍ය්‍යාලාභය ද සිහිකෙරෙයි, ධනලාභය ද සිහිකෙරෙයි, කුදුමහත් ලාභයක් හෝ සිහිකෙරෙයි. මිසදිටු ඇති හෝ වරදවා පිළිපන් මහණකු හෝ බමුණකු හෝ සිහිකෙරෙයි. මහණෙනි, තෙල අනුස්මෘතිය ඇත. තෙල නැතැයි නොකියමි. මහණෙනි, තෙල හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුන් අයත් අනාර්‍ය්‍ය වූ අනර්ථය ඇසුරු කල අනුස්මෘතිය නිර්වේදයට නො වැටෙයි. විරාගයට නො වැටෙයි. නිරෝධයට නො වැටෙයි. ව්‍යපශමයට නො වැටෙයි. අභිඥාවට නො වැටෙයි. සම්බොධියට නො වැටෙයි නිර්වාණයට නො වැටෙයි. මහණෙනි, යමෙකුත් පිහිටි සැදැහැ ඇතියේ පිහිටි ප්‍රේම ඇතියේ අචල ශ්‍රද්ධා ඇතියේ අභිප්‍රසන්න වූයේ තථාගතයන් හෝ තථාගතශ්‍රාවකයකු හෝ සිහි කෙරේ නම්, මහණෙනි, සත්ත්ව විශුද්ධිය පිණිස ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමය පිණිස දුක්දොම්නසුන්ගේ අස්තගමය පිණිස න්‍යායාධිගමය පිණිස නිවන් පසක් කිරීම පිණිස (පවත්නා හෙයින්), මහණෙනි, පිහිටි සැදැහැ ඇතියේ පිහිටි පෙම් ඇතියේ අචල ශ්‍රද්ධාවට පැමිණියේ මැනැවින් පහන් වූයේ තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයකු හෝ සිහි කෙරේ ද යන යමෙක් වේ නම්, තෙල අනුස්මෘතීන් අතුරෙහි අනුත්තරිය වේ. මහණෙනි, මේ මෙය අනුස්සතානුත්තරිය යි කියනු ලැබේ. [අනුස්සතානුත්තරිය මෙසේ වෙයි.]

මහණෙනි, මේ අනුත්තරිය ධර්ම සය යි.

9. යෙ දස්සනවරං ලද්ධා[1] සවණඤ්ච අනුත්තරං
ලාභානුත්තරියං ලද්ධා සික්ඛානුත්තරියෙ රතා,

10. උපට්ඨිතා පාරිචරියෙ[2] භාවයන්ති අනුස්සතිං
විවෙකපටිසංයුත්තං ඛෙමං අමතගාමිනිං,

11. අප්පමාදෙ පමොදිතා[3] නිපකා සීලසංවුතා
තෙ වෙ කාලෙන පච්චෙන්ති යත්ථ දුක්ඛං නිරුජ්ඣතීති.

අනුත්තරියවග්ගො දුතියො.

තස්සුද්දානං:

සාමකො අපරිහානියො භයං හිමවානුස්සති
කච්චානො ද්වෙ ච සමයා උදයී අනුත්තරියෙනාති.

---

1 යෙ දස්සනානුත්තරියං ලද්ධා - මජ්සං   2 පාරිචරියා - මජ්සං
3 පමුදිතා - සිමු

9. යම් කෙනෙක් අනුත්තරදර්ශනය ද අනුත්තර ශ්‍රවණය ද ලැබ ලාභානුත්තරියට පැමිණ සික්ඛානුත්තරියෙහි ඇලුණාහු -

10. පරිචරියායෙහි එළැඹ සිටියාහු විවෙකප්‍රතිසංයුක්ත වූ ක්‍ෂෙම වූ අමෘතය කරා යන සුලු අනුස්මෘතිය වඩත් ද,

11. අප්‍රමාදයෙහි ප්‍රමුදිත, නිපක ප්‍රඥයෙන් යුක්ත, ශීලයෙන් සංවෘත වූ ඔහු, යම් තැනෙක්හි දුක නිරුද්ධ වේ නම් එකාන්තයෙන් එ නිවණට නිසිකල්හි පැමිණෙති.

තුන්වැනි අනුත්තරිය වර්ගය යි.

එහි උද්දානය.

සාවක සූත්‍රය, අපරිහානිය සූත්‍රය, භය සූත්‍රය, හිමවන්ත සූත්‍රය, අනුස්සතිට්ඨාන සූත්‍රය, කච්චාන සූත්‍රය, පඨමසමය සූත්‍රය, දුතියසමය සූත්‍රය, උදායී සූත්‍රය, අනුත්තරියසූත්‍රය දැ යි දශයෙකි.

## 4. දෙවතා වග්ගො.

### 6. 1. 4. 1

### [සෙඛ සුත්තං]

[සාවත්ථිනිදානං]

**81.** ඡයිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති:

කතමෙ ඡ: කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා, සඞ්ගණිකාරාමතා, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා, භොජනෙ අමත්තඤ්ඤුතා. ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

ඡයිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

කතමෙ ඡ: න කම්මාරාමතා, න භස්සාරාමතා න නිද්දාරාමතා, න සඞ්ගණිකාරාමතා, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා. ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති.

### 6. 1. 4. 2

### [පඨම අපරිහාන සුත්තං]

[සාවත්ථිනිදානං]

**82.** අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච:

"ඡයිමෙ භන්තෙ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

කතමෙ ඡ: සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, අප්පමාදගාරවතා, පටිසන්ථාරගාරවතා. ඉමෙ ඛො භන්තෙ ඡ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති."

ඉදමවොච සා දෙවතා. සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො සා දෙවතා, සමනුඤ්ඤො මෙ සත්ථා'ති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ සා දෙවතා මං එතදවොච:

# 4. දේවතා වර්ගය

## 6. 1 4. 1.

### [සෙඛ සූත්‍රය]

[සැවැත්නුවර දී]

81. මහණෙනි, මේ ධර්මයෝ සදෙනෙක් ශෛක්‍ෂ්‍ය භික්‍ෂුහුගේ පිරිහීම පිණිස වැටෙති.

කවර සදෙනෙක යත්: කර්මාරාමතා ය, භස්සාරාමතා ය, නිද්‍රාරාමතා ය, සඞ්ගණිකාරාමතා ය, ඉන්ද්‍රියෙහි අගුප්තද්වාරතා ය, භොජනයෙහි අමත්‍රඥතා යි. මහණෙනි, මේ ධර්මයෝ සදෙන ශෛක්‍ෂ්‍ය භික්‍ෂුහුගේ පිරිහීම පිණිස වැටෙත්.

මහණෙනි, මෙ ධර්මයෝ සදෙනෙක් ශෛක්‍ෂ්‍ය භික්‍ෂුහුගේ නො පිරිහීම පිණිස වැටෙත්.

කවර සයෙක යත්: කර්මාරාමතා නො වනු ය, භස්සාරාමතා නො වනු ය, නිද්‍රාරාමතා නො වනු ය, සඞ්ගණිකාරාමතා නො වනු ය, ඉන්ද්‍රියෙහි ගුප්තද්වාරතා ය, භොජනයෙහි මත්‍රඥතා යි. මහණෙනි, මෙ ධර්මයෝ සදෙන ශෛක්‍ෂ්‍ය භික්‍ෂුහුගේ නො පිරිහීම පිණිස වැටෙති යි.

## 6. 1. 4. 2.

### [ප්‍රථම අපරිහාන සූත්‍රය]

[සැවැත්නුවර දී]

82. එකල්හි එක්තරා දෙවියෙක් මැදුම්යම්හි අතික්‍රාන්තීය වර්ණ ඇතියේ මුළු දෙව්රම බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පස්ව සිටියේ ය. එකත්පස් ව සිටි එ දෙවි භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ ය:

"වහන්ස, මේ ධර්මයෝ සදෙනෙක් භික්‍ෂුහුගේ අපරිහානියට වැටෙත්.

කවර සයෙක යත්: ශාස්තෘගාරවතා ය, ධම්මගාරවතා ය, සඞ්ඝගාරවතා ය, සික්ඛාගාරවතා ය, අප්පමාදගාරවතා ය, පටිසන්ථාරගාරවතා යි. වහන්ස, මෙ දහම්හු සදෙන භික්‍ෂුහුගේ අපරිහානියට වැටෙත්."

ඒ දෙවි මෙය කීය. ශාස්තෘහු සමනුඥ (අනුමෝදන්) වූහ. එකල ඒ දෙවි "මට ශාස්තෘහු සමනුඥයහ" යි භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වී.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ එ රැය ඇවෑමෙන් මහණුන් ඇමතූහ: මහණෙනි, මෙ රැයි රෑ පෙරයම ඉක්ම යත් ම විශිෂ්ටවර්ණ ඇති අන්‍යතර දෙවපුත්‍රයෙක් මුළු දෙව්රම බබුළුවා මා වෙත එළැඹියේ ය. එළැඹ මා සකසා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පස් ව සිටි ඒ දෙවි මට මෙල සැළකෙළේ ය:

"ඡයිමෙ භන්තෙ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

කතමෙ ඡ: සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, අප්පමාදගාරවතා, පටිසන්ථාරගාරවතා. ඉමෙ ඛො භන්තෙ ඡ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති."

ඉදමවොච භික්ඛවෙ සා දෙවතා, ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

12. සත්ථු ගරු ධම්මගරු සඞ්ඝෙ ච තිබ්බගාරවො,
අප්පමාද ගරු භික්ඛු පටිසන්ථාරගාරවො,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙති.

## 6. 1. 4. 3.

## [දුතිය අපරිහාන සුත්තං]

[සාවත්ථිනිදානං]

**33.** ඉමං භික්ඛවෙ රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං **ජෙතවනං** ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ සා දෙවතා මං එතදවොච:

"ඡයිමෙ භන්තෙ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

කතමෙ ඡ: සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, හිරිගාරවතා, ඔත්තප්පගාරවතා. ඉමෙ ඛො භන්තෙ ඡ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති."

ඉදමවොච භික්ඛවෙ සා දෙවතා ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

13. සත්ථුගරු ධම්මගරු සඞ්ඝෙ ච තිබ්බගාරවො
හිරිඔත්තප්පසම්පන්නො සප්පතිස්සො සගාරවො
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙති.

## 6. 1. 4. 4.

## [මොග්ගල්ලාන සුත්තං]

**34.** එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මතො **මහාමොග්ගල්ලානස්ස** රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: කතමෙසානං දෙවානං එවං ඤාණං හොති "සොතාපන්නම්හා[1] අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති.

තෙන ඛො පන සමයෙන **තිස්සො** නාම භික්ඛු අධුනා කාලකතො අඤ්ඤතරං බ්‍රහ්මලොකං උපපන්නො හොති. තත්‍රපි නං එවං ජානන්ති: "**තිස්සො** බ්‍රහ්මා මහිද්ධිකො මහානුභාවො"ති.

1. සොතාපන්නා නාම. මජසං:

Free Distribution www.aathaapi.org

“වහන්ස, මේ ධර්මයෝ සදෙනෙක් භික්ෂුහුගේ අපරිහානිය පිණිස වැටෙත්.

කවර සයෙක යත්: සත්‍ථුගාරවතා ය, ධම්මගාරවතාය, සඞ්ඝගාරවතා ය, සික්ඛාගාරවතා ය, අප්පමාදගාරවතා ය, පටිසන්ථාරගාරවතා යි. වහන්ස, මේ සදහම්හු භික්ෂුහුගේ අපරිහානියට වැටෙති යි.”

මහණෙනි ඒ දෙව් මෙය කී ය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් හෙලේ ය.

12. ශාස්තෘගුරුක, ධර්ම ගුරුක, සඞ්ඝයා කෙරෙහිදු තීව්‍රගෞරව ඇති, අප්‍රමාද ගුරුක, ධර්මාමිස වශයෙන් (මහණදම්හි අප්‍රමාද වෙයි ද, ප්‍රත්‍යය ලාභ සුලබ ද ආදීන්) පිළිසඳර කිරීමෙහි ගෞරව ඇති මහණ පරිහානියට අභව්‍ය වෙයි. නිවන් වෙතැ ම වූයේ වෙයි.

6. 1. 4. 3.

## [ද්විතීය අපරිහාන සූත්‍රය]

[සැවැත් නිදාන යි]

33. මහණෙනි, මේ රැහි අන්‍යතර දේව පුත්‍රයෙක් රෑ පෙරයම් ඉක්ම-යත් ම මුළු දෙවුරම බබුළුවා මා වෙත එළැඹියේය. එළැඹ මා සකසා වැඳ එකත්පස් ව සිටියේ ය. එකත්පස්හි සිටි එ දෙව් මට තෙල කරුණ සැල කෙළේය:

“වහන්ස, මේ ධර්මයෝ සදෙනෙක් භික්ෂුහුගේ නො පිරිහීමට වැටෙත්.

කවර සයෙක යත්: සත්‍ථුගාරවතා හා ධම්මගාරවතා හා සඞ්ඝගාරවතා හා සික්ඛාගාරවතා හා හිරිගාරවතා හා ඔත්තප්පගාරවතා හා යි. වහන්ස, මේ ධර්මයෝ සදෙන භික්ෂුහුගේ අපරිහානියට වැටෙති.”

මහණෙනි, එ දෙව් මෙය කී ය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එතන්හි ම අතුරුදන් වී ය යි.

13. ශාස්තෘන් කෙරෙහි ගෞරව ඇති, ධර්මය කෙරෙහි ගෞරව ඇති, සඟුන් කෙරෙහිදු තීව්‍රගෞරව ඇති, හිරිඔතප් සපත්, ප්‍රතිශ්‍රය (මහල්ලන් කෙරෙහි යටත් පැවැතුම්) ඇති, ගෞරවසහිත මහණ පිරිහීමට අභව්‍ය වේ යි. නිවන් වෙතැ ම වූයේ ය.

6. 1. 4. 4.

## [මෝග්ගල්ලාන සූත්‍රය]

34. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේ-පිඩු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩ වසන සේක. එකල්හි එකාකී වූ පිළිසලෙනෙහි යෙදුනු ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ගේ සිත්හි මෙබඳු පරිවිතර්කයෙක් පහළවිය: “කවර නම් දෙවිකෙනකුන්ට “අපායට නොයෙන සැහැවිඇති, නිවණට නියත වූ, සත්‍යාවබොධය පරායණ කොටැති, සොවන් පුඟුලමෝ වම්හ”යි යන මෙබඳු ඥානයෙක් වේ දැයි”යි.

එ සමයෙහි කලුරිය කල තිස්ස නම් මහණ අන්‍යතර බ්‍රහ්ම ලෝකයෙක්හි උපන්නේ වෙයි. එහිදු “තිස්ස බ්‍රහ්ම මහ ඉර්‍ධි ඇත්තේය, මහ අනුභාව ඇත්තේය”යි වෙසෙසින් ඔහු හඳුනත්.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහොසි. අද්දසා ඛො තිස්සො බ්‍රහ්මා ආයස්මන්තං මහාමොග්ගල්ලානං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච:

“එහි ඛො මාරිස මොග්ගල්ලාන, ස්වාගතං මාරිස මොග්ගල්ලාන, චිරස්සං ඛො මාරිස මොග්ගල්ලාන, ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීද මාරිස, මොග්ගල්ලාන, ඉදමාසනං පඤ්ඤත්තන්ති.” නිසීදි ඛො ආයස්මා මහා මොග්ගල්ලානො පඤ්ඤත්තෙ ආසනෙ.

තිස්සොපි ඛො බ්‍රහ්මා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තිස්සං බ්‍රහ්මානං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

“කතමෙසානං ඛො තිස්ස, දෙවානං එවං ඤාණං හොති: සොතාපන්නම්හා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා?”ති.

චාතුම්මහාරාජිකානං ඛො මාරිස මොග්ගල්ලාන, දෙවානං එවං ඤාණං හොති: “සොතාපන්නම්හා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණාති.”

සබ්බෙසඤ්ඤෙව නු ඛො තිස්ස චාතුම්මහාරාජිකානං දෙවානං එවං ඤාණං හොති: “සොතාපන්නම්හා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා?”ති

න ඛො මාරිස මොග්ගල්ලාන, සබ්බෙසං චාතුම්මහාරාජිකානං දෙවානං එවං ඤාණං හොති: “සොතාපන්නම්හා අවිනිපාත ධම්මා නියතා සම්බොධිපරායණා”ති. යෙ ඛො තෙ මාරිස මොග්ගල්ලාන, චාතුම්මහාරාජිකා දෙවා බුද්ධෙ අවෙච්චප්පසාදෙන අසමන්නාගතා ධම්මෙ අවෙච්චප්පසාදෙන අසමන්නාගතා සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන අසමන්නාගතා අරියකන්තෙහි සීලෙහි අසමන්නාගතා, න තෙසං දෙවානං එවං ඤාණං හොති: “සොතාපන්නම්හා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා”ති. යෙ ච ඛො තෙ මාරිස මොග්ගල්ලාන, චාතුම්මහාරාජිකා දෙවා බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා, තෙසං එවං ඤාණං හොති: “සොතාපන්නම්හා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා”ති.

ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගුකරන්නේ හෝ දික්කළ අතක් හකුළන්නේ හෝ යම් සේ නම්, එ පරිද්දෙන් ම ජේතවනයෙහි අතුරුදන්වූවාහු එ බඹලොව්හි පහළ වූහ. තිස්ස බ්‍රහ්මයා වඩනා ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් දුරින් ම දුටුයේ ම ය. දැක ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්හට තෙල කීය:

“නිදුක, මුගලනෙනි, මොබැ එව, නිදුක, මුගලන, ස්වාගතය. නිදුක මෞද්ගල්‍යායනයෙනි, මෙහි ඊම සඳහා බොහෝ කලෙකින් මේ පර්‍යාය (වාරය) කෙළේ ය. නිදුක මුගලන, මේ අස්න පණවන ලද. හිඳිනු මැනැවැ”යි. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ පැන් වූ අස්නෙහි හිඳගත්හ.

තිස්සබ්‍රහ්ම ද ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් සකසා වැඳ එකත්-පස්හි හින. එකත්පස්හි හුන් තිස්සබ්‍රහ්මහට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ තෙල කීහ:

තිස්සයෙනි, “අපායට නො යෙන සැහැවි ඇති, නිවණට නියතවූ සත්‍යාවබොධය පරායණ කොට ඇති, සෝවත් පුගුලමෝ වම්හ” යන මේ අයුරින් කවර නම් දෙවිකෙනකුන්ට ඥානයෙක් වේ දැ?”යි.

නිදුක, මුගලනෙනි, “(අපි) අපායට නොයෙන සැහැවි ඇති, නිවණට නියතවූ, සම්බොධිය පරායණ කොට ඇති, සෝවත් පුගුලමෝ වම්හ” යන මෙබඳු ඥානයෙක් සිවුමහරජය වැසි දෙවියනට වන්නේ යි.

තිස්සයෙනි, “අපි අවිනිපාත ධර්ම වූ, නියත වූ සම්බොධිපරායණ වූ ස්‍රොතාපන්නයම්හ” යන මෙබඳු ඥානය සිවුමහ රජය වැසි හැම දෙවියනට වේ දැ?”යි.

නිදුක, මෞද්ගල්‍යායනයෙනි, “අපි අවිනිපාත වූ, නියත වූ, සම්බොධි පරායණ වූ ස්‍රොතාපන්නයම්හ” යන මේ ඥානය හැම චාතුර්මහාරාජික දෙවියනට නොවන්නේ ය. මෞද්ගල්‍යායනයෙනි, යම් ඒ චාතුම්මහාරාජික දෙවිකෙනෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් (අධිගත සෝවන්පල පැහැදීමෙන්) සමන්වාගත නොවෙත් නම්, ධර්මයෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත නොවෙත් නම්, සඟුරුවන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත නො වෙත් නම්, ආර්‍යකාන්ත (මාර්ගඵල) ශීලයෙන් සමන්වාගත නොවෙත් නම්, එ දෙවියනට “අපි අවිනිපාත ධර්ම වූ නියත වූ සම්බොධිපරායණ වූ ස්‍රොතාපන්නයම්හ” යන මෙබඳු ඥානය නොවන්නේ ය. නිදුක, මෞද්ගල්‍යායනයෙනි, යම් එ චාතුම්මහාරාජික දෙවිකෙනෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත වෙත් නම්, ධර්මයෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත වෙත් නම්, සඞ්ඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත වෙත් නම්, ආර්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙත් නම්, ඔවුනට “අපි අවිනිපාත වූ නියත වූ සම්බොධිපරායණ වූ ස්‍රොතාපන්නයම්හ” යන මෙබඳු ඥානය වන්නේ ය.

චාතුම්මහාරාජිකානඤ්ඤෙව නු ඛො තිස්ස, දෙවානං එවං ඤාණං හොති: "සොතාපන්නාමහා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති උදාහු තාවතිංසානම්පි දෙවානං -පෙ- යාමානම්පි දෙවානං -පෙ- තුසිතානම්පි දෙවානං -පෙ- නිම්මාණරතීනම්පි දෙවානං -පෙ- පරනිම්මිතවසවත්තීනම්පි දෙවානං එවං ඤාණං හොති: "සොතාපන්නාමහා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා?"ති. [-පෙ-]

පරනිම්මිතවසවත්තිනම්පි ඛො මාරිස, මොග්ගල්ලාන, දෙවානං එවං ඤාණං හොති: "සොතාපන්නාමහා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති.

සබ්බෙසඤ්ඤෙව නු ඛො තිස්ස, පරනිම්මිතවසවත්තීනං දෙවානං එවං ඤාණං හොති: "සොතාපන්නාමහා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා?"ති.

න ඛො මාරිස, මොග්ගල්ලාන, සබ්බෙසඤ්ඤෙව[1] පරනිම්මිතවසවත්තීනං දෙවානං එවං ඤාණං හොති: "සොතාපන්නාමහා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති. යෙ ඛො තෙ මාරිස, මොග්ගල්ලාන, පරනිම්මිතවසවත්තී දෙවා බුද්ධෙ අවෙච්චප්පසාදෙන අසමන්නාගතා ධම්මෙ අවෙච්චප්පසාදෙන අසමන්නාගතා සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන අසමන්නාගතා අරියකන්තෙහි සීලෙහි අසමන්නාගතා, න තෙසං දෙවානං එවං ඤාණං හොති: "සොතාපන්නාමහා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති. යෙ ච ඛො තෙ මාරිස මොග්ගල්ලාන, පරනිම්මිතවසවත්තී දෙවා බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා, තෙසං එවං ඤාණං හොති: "සොතාපන්නාමහා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා"ති.

අථ ඛො ආයස්මා මහා මොග්ගල්ලානො තිස්සස්ස බ්‍රහ්මුනො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො ජෙතවනෙ පාතුරහොසීති.

### 6. 1. 4. 5.

### [විජ්ජාභාගිය සුත්තං]

**[සාවත්ථිනිදානං]**

**35**. ඡයිමෙ භික්ඛවෙ ධම්මා විජ්ජාභාගියා. කතමෙ ඡ:

අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මා විජ්ජාභාගියාති.

---

1. සබ්බෙසං - මජ්ඣං.

තිස්සයෙනි, "අපි අවිනිපාත වූ නියත වූ සම්බෝධි පරායණ වූ සෝතාපන්නයම්හ" යන මෙබඳු ඥානය චාතුම්මහාරාජික දෙවියන්ට ම වේ ද? නොහොත් තාවතිංස දෙවියනට ද ... යාම දෙවියනට ද ... තුසිත දෙවියනට ද ... නිම්මාණරතී දෙවියනට ද ... පරනිම්මිත වසවත්තී දෙවියනට ද. "අවිනිපාතධර්ම වූ නියත වූ සම්බෝධි පරායණ වූ, ස්‍රොතාපන්නයම්හ"යි මෙබඳු ඥානය වේ ද? [...]

නිදුක, මුගලනයෙනි, පරනිම්මිත වසවත්තී දෙවියනට ද "අපි අවිනිපාත ධර්ම වූ නියත වූ සම්බෝධිපරායණ වූ ස්‍රොතාපන්නයම්හ" යන මෙබඳු ඥානය වන්නේ ය.

තිස්සයෙනි, හැම පරනිම්මිත වශවර්ති දෙවයනට ම "අපි අවිනිපාත ධර්ම වූ නියත වූ සම්බෝධිපරායණ වූ ස්‍රොතාපන්නයම්හ" යන මෙබඳු ඥානය වේ ද?යි

නිදුක, මෞද්ගල්‍යායනයෙනි, හැම පරනිම්මිත වසවත්තී දෙවයන්ට ම "අපි අවිනිපාත ධර්ම වූ නියත වූ සම්බෝධිපරායණ වූ ස්‍රොතාපන්නයම්හ" යන මෙබඳු ඥානය නො වෙයි. නිදුක, මුගලනයෙනි, යම් පරනිම්මිත වශවර්ති දෙවිකෙනෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්විත නොවෙත් නම්, ධර්මයෙහි අචල ප්‍රසාදයෙන් සමන්විත නො වෙත් නම්, සඞ්ඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්විත නො වෙත් නම්, ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්විත නො වෙත් නම්, එ දෙවියනට "අපි අවිනිපාත ධර්ම වූ නියත වූ සම්බෝධි පරායණවූ ස්‍රොතාපන්නයම්හ" යන මෙබඳු ඥානයෙක් නො වේ. නිදුක, මුගලනෙනි, යම් (පරනිර්මිත වශවර්ති) දෙවිකෙනෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්විත වෙත් නම්, ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්විත වෙත් නම්, සඞ්ඝයා කෙරෙහි අචල ප්‍රසාද-යෙන් සමන්විත වෙත් නම්, ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්විත වෙත් නම්, ඔවුනට "අපි අවිනිපාත ධර්මවූ නියත වූ සම්බෝධිපරායණ වූ ස්‍රොතාපන්නයම්හ" යන මෙබඳු ඥානය වන්නේ ය යි.

ඉක්බිති ආයුෂ්මත් මහ මුගලන් තෙරණුවෝ තිස්ස බ්‍රහ්මයාගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදනා කොට බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දික්කරණුයේ හෝ දික්කළ අතක් හකුළනුයේ යම් සේ වේ නම්, එසෙයින් ම බ්‍රහ්මලෝකයෙහි අතුරුදන්ව ජේතවනයෙහි පහළ වූහ.

### 6. 1. 4. 5.

### [විජ්ජාභාගීය සූත්‍රය]

[සැවැත් නිදාන යි]

35. මහණෙනි, මෙ විජ්ජාභාගිය (විද්‍යා කොටස් පිළිබඳ) ධර්ම සයෙකි. කවර සයෙක යත්:

අනිච්චසඤ්ඤා (අනිත්‍යානුදර්ශනයෙහි උපන් සංඥාව), අනිච්චෙ දුක්ඛ සඤ්ඤා (අනිත්‍යයෙහි දුඃඛානුදර්ශනයෙහි උපන් සංඥාව), දුක්ඛෙ අනත්තසඤ්ඤා (දුකෙහි අනාත්මානුදර්ශනයෙහි උපන් සංඥාව), පහාණ-සඤ්ඤා (ප්‍රහාණානු දර්ශනයෙහි උපන් සංඥාව), විරාගසඤ්ඤා, (විරාගානු දර්ශනයෙහි උපන් සංඥාව), නිරොධසඤ්ඤා (නිරෝධානුදර්ශනයෙහි උපන් සංඥාව) ද වෙත්.

මහණෙනි, මෙ විජ්ජාභාගිය ධර්ම සය යි.

## 6. 1. 4. 6.

## [විවාදමූල සුත්තං]

[සාවත්ථිනිදානං]

86. ඡයිමානි භික්ඛවෙ විවාදමූලානි. කතමානි ඡ:

(1) ඉධ භික්ඛවෙ භික්ඛු කොධනො හොති උපනාහී. යො සො භික්ඛවෙ භික්ඛු කොධනො හොති උපනාහී, සො සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛායපි න පරිපූරකාරී හොති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙ අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛාය න පරිපූරකාරී, සො සඞ්ඝෙ විවාදං ජනෙති, යො හොති විවාදො බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපං චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

(2) පුන චපරං භික්ඛවෙ භික්ඛු මක්ඛී හොති පළාසී -පෙ- (3) ඉස්සුකී හොති මච්ඡරී -පෙ- (4) සඨො හොති මායාවී -පෙ- (5) පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨී -පෙ- (6) සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී. යො සො භික්ඛවෙ භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී, සො සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛායපි න පරිපූරකාරී හොති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙ අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛාය න පරිපූරකාරී, සො සඞ්ඝෙ විවාදං ජනෙති, යො හොති විවාදො බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපං චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

ඉමානි ඛො භික්ඛවෙ ඡ විවාදමූලානී'ති.

## 6. 1. 4. 6.

## [විවාදමූල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**36**. මහණෙනි, මේ විවාදමූල සයෙකි. කවර සයෙක යත්:

(1) මහණෙනි, මේ සස්නෙහි මහණ කිපෙන සුළුයේ බද්ධවෛර ඇතියේ වෙයි. මහණෙනි, යම් මැ මහණෙක් ක්‍රෝධන උපනාහී වේ නම්, හේ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ප්‍රතිශ්‍රය නැතියේ, ගෞරව නැතියේ වෙසෙයි. ධර්මයෙහිදු ප්‍රතිශ්‍රය නැතියේ, ගෞරව නැතියේ වෙසෙයි. සඟුන් කෙරෙහි දු ප්‍රතිශ්‍රය නැතියේ ගෞරව නැතියේ වෙසෙයි. ශික්‍ෂාහිදු පරිපූරකාරී නො වෙසෙයි. මහණෙනි, යම් මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ප්‍රතිශ්‍රය (ගුරු පිහිට) නැතියේ, ගෞරව නැතියේ වෙසේ නම්, ධර්මයෙහි ප්‍රතිශ්‍රය නැතියේ, ගෞරව නැතියේ වෙසේ නම්, සඟුන් කෙරෙහි ප්‍රතිශ්‍රය නැතියේ ගෞරව නැතියේ වෙසේ නම්, ශික්‍ෂාහි පරිපූරකාරි නො වේ නම්, හෙ යම් විවාදයෙක් බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට අසුඛ පිණිස, බොහෝ දෙනාට අනර්ථ පිණිස, දෙව් මිනිස්නට අහිත පිණිස දුක් පිණිස වේ නම්, සඟුන් අතුරෙහි එබඳු විවාද උපදවයි. මහණෙනි, ඉදින් තෙපි මෙබඳු විවාද මූලයක් ආභ්‍යන්තරික පක්‍ෂයෙහි හෝ බාහිර පක්‍ෂයෙහි වේවයි දක්නහු නම්, එ ලමු වාදයාගේ ප්‍රහාණය පිණිස ම ව්‍යායාම කරව. මහණෙනි' මෙබඳු විවාද මූලයක් ඉදින් ආභ්‍යන්තරික පක්‍ෂයෙහි වේවයි, බාහිර පක්‍ෂයෙහි වේවයි, නොදක්නහු නම්, මහණෙනි, තෙපි එ කරුණෙහිලා මතුයෙහි එ මැ ලමු විවාද මූලයාගේ අනුත්පාදය පිණිස පිළිපදුව. මෙසෙයින් තෙල ලමු විවාදමූලයාගේ ප්‍රහාණය වෙයි. මෙසෙයින් මතුයෙහි තෙල ලමු විවාදමූලයාගේ අනුත්පාද වෙයි.

(2) නැවද මහණෙනි, මහණ මෙරමා ගුණ මකනා සැහැවි ඇතියේ යුග ග්‍රාහ (දෙදෙනා සමව ගැණිම්) ලක්‍ෂණ ප්‍රදාස ඇතියේ වෙයි... (3) ඊර්ෂ්‍යා ඇතියේ මාත්සර්‍ය්‍ය ඇතියේ වෙයි ... (4) ශඨ වූයේ මායා ඇතියේ වෙයි ... (5) ලාමක ඉච්ඡා ඇතියේ මිසදිටු (නාස්තික වාද, අහේතුක වාද, අක්‍රිය වාද) ඇතියේ වෙයි .. (6)සවදෘෂ්ටිය ම පරාමර්ශණ කරණ සුලුයේ දෘඪග්‍රාහී වූයේ ගත්මත නොහල හැකියේ වෙයි. මහණෙනි, යම් මහණෙක් සවදෘෂ්ටිය පරාමර්ශණ කරණ සුලුවූයේ දෘඪග්‍රාහීවූයේ ගත්මත නොහල හැකියේ වේ නම්, හේ ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇතියේ ප්‍රතිශ්‍රය නැතියේ වෙසෙයි. ධර්මය කෙරෙහි ගෞරව නැතියේ ප්‍රතිශ්‍රය නැතියේ වෙසෙයි. සඟුන් කෙරෙහි අගෞරව ඇතියේ ප්‍රතිශ්‍රය නැතියේ වෙසෙයි. ශික්‍ෂායෙහි අපරිපූර-කාරී වෙයි. හේ යම් විවාදයෙක් බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට අසුඛ පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස අහිත පිණිස දෙව් මිනිස්නට දුක් පිණිස වේ නම්, සඞ්ඝයා අතුරෙහි එබඳු විවාද උපදවයි මහණෙනි, ඉදින් තෙපි මෙබඳු විවාද මූලයක් අභ්‍යන්තර පක්‍ෂයෙහි වේවයි, බාහිර පක්‍ෂයෙහි වේවයි, දක්නහු නම්, මහණෙනි, එකරුණෙහි ලා එ මැ ලාමක විවාද මූලයාගේ ප්‍රහාණය පිණිස ව්‍යායාම කරව. මහණෙනි, ඉදින් තෙපි මෙබඳු විවාද මූලයක් අභ්‍යන්තර පක්‍ෂයෙහි හෝ බාහිර පක්‍ෂයෙහි හෝ නොදක්නාහු නම්, මහණෙනි, එකරුණෙහි ලා තෙපි එ මැ ලාමක විවාද මූලයාගේ මතුයෙහි අනුත්පාදය පිණිස පිළිපදුව. මෙසෙයින් තෙල ලාමක විවාද මූලයාගේ ප්‍රහාණය වෙයි. මෙසෙයින් මතුයෙහි තෙල ලාමක විවාද මූලයාගේ අනුත්පාදය වෙයි.

මහණෙනි, මේ විවාද මූල සය යි.

## 6. 1. 4. 7

## [ඡළඞ්ගදාන සුත්තං]

**37.** එකං සමයං භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන **වෙළුකණ්ටකී නන්දමාතා** උපාසිකා සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛෙ භික්ඛුසඞ්ඝෙ ඡළඞ්ගසමන්නාගතං දක්ඛිණං පතිට්ඨපෙති.

අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන වෙළුකණ්ටකිං නන්දමාතරං උපාසිකං සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛෙ භික්ඛුසඞ්ඝෙ ඡළඞ්ගසමන්නාගතං දක්ඛිණං පතිට්ඨාපෙන්තිං. දිස්වා භික්ඛූ ආමන්තෙසි:

"එසා භික්ඛවෙ වෙළුකණ්ටකී නන්දමාතා උපාසිකා සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛෙ භික්ඛුසඞ්ඝෙ ඡළඞ්ගසමන්නාගතං දක්ඛිණං පතිට්ඨාපෙති."

කථඤ්ච භික්ඛවෙ ඡළඞ්ගසමන්නාගතා දක්ඛිණා හොති:

ඉධ භික්ඛවෙ දායකස්ස තීණඞ්ගානි හොන්ති. පටිග්ගාහකානං තීණඞ්ගානි.

කතමානි දායකස්ස තීණඞ්ගානි?

ඉධ භික්ඛවෙ දායකො පුබ්බෙව දානා සුමනො හොති, දදං චිත්තං පසාදෙති, දත්වා අත්තමනො හොති. ඉමානි දායකස්ස තීණඞ්ගානි.

කතමානි පටිග්ගාහකානං තීණඞ්ගානි?

ඉධ භික්ඛවෙ පටිග්ගාහකා වීතරාගා වා හොන්ති රාගවිනයාය වා පටිපන්නා. වීතදොසා වා හොන්ති දොසවිනයාය වා පටිපන්නා. වීතමොහා වා හොන්ති මොහවිනයාය වා පටිපන්නා. ඉමානි පටිග්ගාහකානං තීණඞ්ගානි.

ඉති දායකස්ස තීණඞ්ගානි, පටිග්ගාහකානං තීණඞ්ගානි. එවං ඛො භික්ඛවෙ ඡළඞ්ගසමන්නාගතා දක්ඛිණා හොති.

එවං ඡළඞ්ගසමන්නාගතාය භික්ඛවෙ දක්ඛිණාය න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං "එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතී"ති. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡති.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දෙ න සුකරං උදකස්ස පමාණං ගහෙතුං. "එත්තකානි උදකාළ්හකානී"ති වා, "එත්තකානි උදකාළ්හකසතානී"ති වා, "එත්තකානි උදකාළ්හකසහස්සානී"ති වා "එත්තකානි උදකාළ්හකසතසහස්සානී"ති වා. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාඋදකක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡති.

## 6. 1. 4. 7.

## [ඡළඞ්ගදාන සූත්‍රය]

87. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩ වසන සේක. එ සමයෙහි වේළුකණ්ටක නුවරවැසි නන්දමාතා උපාසිකා ශාරීපුත්‍ර මෞද්ගල්‍යායන ප්‍රමුඛ භික් සඟුන් කෙරෙහි ෂඩඞ්ග සමන්වාගත දක්ෂිණා පිහිටුවයි.

භාග්‍යවතුන්වහන්සේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිව්‍ය චක්ෂුර්-ඥානයෙන් සැරියුත් මුගලන් පාමොක් භික්සඟුන් කෙරෙහි දන් පිහිටුවන වේළුකණ්ට කී නන්දමාතා උවැසිය දැක වදාළසේක්මැයි. දැකවදරා මහණුන් ඇමතූසේක:

මහණෙනි, තෙල වේළුකණ්ට කී නන්දමාතා උපාසිකා සැරියුත් මුගලන් පාමොක් භික්සඟුන් කෙරෙහි ෂඩඞ්ග සමන්වාගත දක්ෂිණා (දනක්) දෙයි

මහණෙනි, කී සෙයින් ෂඩඞ්ග සමන්වාගත දක්ෂිණා වේය යත්:

මහණෙනි, මෙ කරුණෙහි ලා දායකයාගේ අඞ්ග තුනෙක් වෙයි. පිළිගැවත්ගේ අඞ්ග තුනෙක් වෙයි.

දායකයාගේ කවර අඞ්ග තුනෙක යත්:

මහණෙනි, මෙ කරුණෙහි ලා දායකතෙම දානයෙන් පූර්වයෙහි මැ සොම්නස් ඇති වෙයි. දන්දෙනුයේ සිත් පහන් කෙරෙයි. දන් දී සතුටු සිතැති වෙයි. මෙ දායකයාගේ අඞ්ග තුණ ය.

ප්‍රතිග්‍රාහකයන්ගේ අඞ්ග තුණ කවරැ යත්:

මහණෙනි, මෙ කරුණෙහි ලා පිළිගාවෝ වීතරාග හෝ වෙත්, රාග විනයට පිළිපන්නාහු හෝ වෙත්. වීත දොෂ හෝ වෙත්, දොෂවිනයට පිළිපන්නාහු හෝ වෙත්. වීතමෝහ හෝ වෙත්, මෝහවිනයට පිළිපන්නාහු හෝ වෙත්. මේ ප්‍රතිග්‍රාහකයන්ගේ අඞ්ග තුණ යි.

මෙලෙස දායකයාගේ අඞ්ග තුනෙක. ප්‍රතිග්‍රාහකයින් ගේ අඞ්ග තුනෙක. මහණෙනි, මෙසේ ෂඩඞ්ගසමන්වාගත දක්ෂිණා වෙයි.

මහණෙනි, මෙසේ ෂඩඞ්ගසමන්වාගත දක්ෂිණාමය පුණ්‍යයාගේ "මෙතරම් පුණ්‍යප්‍රවාහයෙක, කුශලප්‍රවාහයෙක, සුව ගෙණ දෙන්නෙක, ස්වර්ගානුබද්ධයකය, සුඛවිපාක ඇත්තෙක, ස්වර්ගයට හිතව වැටෙන්නෙක. ඉෂ්ට කාන්ත මනාප හිත සුඛ සඳහා වැටෙන්නෙකැයි ප්‍රමාණය ගන්නට සුකර නො වෙයි. වැලිත් අසංඛ්‍යෙය අප්‍රමෙය මහා පුණ්‍යස්කන්ධයෙකැ යන සංඛ්‍යාවට ම යෙයි.

මහණෙනි, යම් පරිදි මහ සයුරෙහි "මෙතෙක් දියනැලි යි හෝ මෙතෙක් දියනැලිසියෙක හෝ, මෙතෙක් දියනැලි දහසෙකැයි හෝ, මෙතෙක් දිය නැලිසියදහසෙකැයි හෝ ජල ප්‍රමාණය ගන්නට නො හැකි වේ ද, වැලිත් අසංඛ්‍යෙය අප්‍රමෙය වූ මහදියකඳෙකැයි ම සංඛ්‍යාවට යේ.

එවමෙව ඛො භික්ඛවෙ එවං ඡළඞ්ගසමන්නාගතාය දක්ඛිණාය න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං: "එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතී"ති. අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡතීති.

14. පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයෙ,
දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා.

15. වීතරාගා වීතදොසා වීතමොහා අනාසවා,
ඛෙත්තං යඤ්ඤස්ස සම්පන්නං සඤ්ඤතා බ්‍රහ්මචාරිනො.[1]

16. සයං ආචමයිත්වාන දත්වා සකෙහි පාණිහි,
අත්තනො පරතො චෙසො යඤ්ඤො හොති මහප්ඵලො.

17. එවං යජිත්වා මෙධාවී සද්ධො මුත්තෙන චෙතසා
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතී'ති.

## 6. 1. 4. 8

## [අත්තකාර සුත්තං]

**[සංඛිත්තනිදානං]**

**38.** අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

"අහං හි භො ගොතම එවංවාදී එවංදිට්ඨී: "නත්ථි අත්තකාරො, නත්ථි පරකාරොති."

මාහං බ්‍රාහ්මණ, එවංවාදිං එවංදිට්ඨිං අද්දසං වා අස්සොසිං වා. කථං හි නාම සයං අභික්කමන්තො සයං පටික්කමන්තො එවං වක්ඛති: "නත්ථි අත්තකාරො, නත්ථි පරකාරො"ති.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, අත්ථි ආරම්භධාතූති?

එවං භො

ආරම්භධාතුයා සති ආරම්භවන්තො සත්තා පඤ්ඤායන්තී'ති.

එවං භො.

යං ඛො බ්‍රාහ්මණ ආරම්භධාතුයා සති ආරම්භවන්තො සත්තා පඤ්ඤායන්තී'ති අයං සත්තානං අත්තකාරො, අයං පරකාරොති.

1. බ්‍රහ්මචාරයො - මජසං.

මහණෙනි, එපරිදි ම මෙසේ ඡබ්බිගතමන්වාගත දක්ෂිණායෙහි මෙපමණ පුණ්‍යාපප්‍රාප්තියෙක, මෙපමණ කුශලොපප්‍රාප්තියෙක; සුවගෙණ දෙන්-නෙක, ස්වර්ගසුඛ දායකය, සුඛ විපාක ඇතියෙක, ස්වර්ගයට හිතව වැටෙන්-නේය, ඉෂට කාන්ත මනාප හිත සුව පිණිස වැටෙන්නේයයි පුණ්‍යයාගේ ප්‍රමාණය ගණුවට සුකර නො වේ. වැලිත් අසංඛ්‍යය අප්‍රමෙය මහා පුණ්‍යස්කන්ධයෙක ම යන සංඛ්‍යාවට යෙයි.

14. දෙනුවට පලමු මැ සොම්නස් සහගියා වන්නේය. දෙමින් සිත් පහදන්නේ ය. දන් දී (ඉක්බිති) සතුටු සිතැති වන්නේ ය. මෙල දනයාගේ පරිපූර්ණතා යි.

15. වීතරාග වූ වීත ද්වෙෂ වූ වීතමොහ වූ අනාශ්‍රව වූ ශීල සංයමයෙන් (කායිකවාචසිකසංවරයෙන්) සංයත වූ බ්‍රම්සැරිහු යඥ සංඛ්‍යාත දානයට සම්පන්න ක්ෂෙත්‍ර යි.

16. තමා ම අත්පා දෙවැ සියතින් දීමෙන් (දායක සංඛ්‍යාත) තමා-ගෙනුදු (ප්‍රතිග්‍රාහක සංඛ්‍යාත) පරාගෙනුදු මෙල යඥය මහත්ඵල වෙයි.

17. මෙසේ (රුවන් තියා කෙරෙහි) සැදැහැති ධාරණ ප්‍රඥ ඇති පණ්ඩිත තෙම (ලාභමාත්සර්යාදීන්) මුත් සිතින් දන්වැට පවත්වා නිදුක් සුව ඇති ස්වර්ගලොකයට එළැඹෙන්නේ යි.

6. 1. 4. 8.

[අත්තකාරසූත්‍රය]

[සැමැත්ඛිදන යි]

එකල්හි අන්‍යතර බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹි-යේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සමරණීය කථාව කොට නිමවා එකත්පසෙක හිඳ. එකත් පසෙක හුන් එ බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැල කෙළේ ය:

භවත් ගෞතමයන් වහන්ස, “මම වනාහි ආත්මකාරයෙක් (තමන් කරණ ක්‍රියා) නැත. පරකාරයෙක් (අනුන් කරණ ක්‍රියා) නැත යන මෙබඳු වාද ඇතියෙම්, මෙබඳු දෘෂ්ටි ඇතියෙම් වෙමි”යි.

බ්‍රාහ්මණය, මෙබඳු වාද ඇතියකු මෙබඳු දෘෂ්ටි ඇතියකු මම නහමක් දකිම්වා, (අසුවල් තැන වෙසෙතැයි) නහමක් අසම් ව යි. කිමෙයින් නම් තෙමේ අභික්‍රමණ කරණුයේ තෙමේ ප්‍රතික්‍රමණ කරණුයේ “ආත්මකාරයෙක් නැත, පරකාරයෙක් නැතැ”යි කියන්නේ ද?

බ්‍රාහ්මණය, ‘ආරම්භධාතුයෙක් (ක්‍රියා කිරීමෙහි පලමු උපදනා වීර්‍ය්‍යය) ඇත’ යන එය කිම හගිහිදු?යි

පින්වතුන් වහන්ස, එසේ ඇති යයි.

ආරම්භධාතු ඇතිවත්ම ප්‍රථමාරම්භවීර්‍ය්‍යවත් සත්ත්වයෝ පැණෙත් ද?

‘එ සේය’ පින්වතුන් වහන්සැයි.

බ්‍රාහ්මණය, ‘ප්‍රථමාරම්භවීර්‍ය්‍යය ඇතිවත් ම ප්‍රථමාරම්භවීර්‍ය්‍යවත් (ප්‍රථමාරම්භවීර්‍ය්‍යයෙන් ක්‍රියා කරණ) සත්ත්වයෝ පැණෙති’ යන යමෙක් වේ නම්, මේ සත්ත්වයන්ගේ ආත්මකාර යි, මේ සත්ත්වයන්ගේ පරකාර යි.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ අත්ථි නික්කමධාතු -පෙ- අත්ථි පරක්කමධාතු -පෙ- අත්ථි ථාමධාතු -පෙ- අත්ථි ඨිතිධාතු -පෙ- අත්ථි උපක්කමධාතූ?ති

එවම්භො.

උපක්කමධාතුයා සති උපක්කමවන්තො සත්තා පඤ්ඤායන්තී?ති.

එවං භො.

යං ඛො බ්‍රාහ්මණ, උපක්කමධාතුයා සති උපක්කමවන්තො සත්තා පඤ්ඤායන්ති'ති අයං සත්තානං අත්තකාරො, අයං පරකාරො'ති.

මාහං බ්‍රාහ්මණ, එවංවාදිං එවංදිට්ඨිං අද්දසං වා අස්සොසිං වා. කථං හි නාම සයං අභික්කමන්තො පටික්කමන්තො එවං වක්ඛති: ''නත්ථි අත්තකාරො, නත්ථි පරකාරො''ති.

අභික්කන්තං භො ගොතම -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 6. 1. 4 9

## [කම්මනිදාන සුත්තං]

### [සාවත්ථිනිදානං]

39. තීණිමානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය.

කතමානි තීණි:

ලොභො නිදානං කම්මානං සමුදයාය. දොසො නිදානං කම්මානං සමුදයාය. මොහො නිදානං කම්මානං සමුදයාය.

න භික්ඛවෙ ලොභා අලොභො සමුදෙති. අථ ඛො භික්ඛවෙ ලොභා ලොභොව සමුදෙති. න භික්ඛවෙ දොසා අදොසො සමුදෙති. අථ ඛො භික්ඛවෙ දොසා දොසොව සමුදෙති. න භික්ඛවෙ මොහා අමොහො සමුදෙති. අථ ඛො භික්ඛවෙ මොහා මොහොව සමුදෙති.

න භික්ඛවෙ ලොභජෙන කම්මෙන දොසජෙන කම්මෙන මොහජෙන කම්මෙන දෙවා පඤ්ඤායන්ති, න මනුස්සා පඤ්ඤායන්ති, යා වා පනඤ්ඤාපි කාචි සුගතියො.

අථ ඛො භික්ඛවෙ ලොභජෙන කම්මෙන දොසජෙන කම්මෙන මොහජෙන කම්මෙන නිරයො පඤ්ඤායති, තිරච්ඡානයොනි පඤ්ඤායති, පෙත්තිවිසයො පඤ්ඤායති, යා වා පනඤ්ඤාපි කාචි දුග්ගතියො.

ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයායාති.

බ්‍රාහ්මණය, (කුසීතභාවයෙන් නික්මෙන සැහැවි ඇති) නික්කමධාතු-යෙක් = වීර්‍ය්‍යයෙක් ඇත ... (පැරකුම් සැහැවි ඇති) පරක්කමධාතුයෙක් ඇත ... ස්ථාමධාතුයෙක් (බලවත් වීර්‍ය්‍යයෙක්) ඇත. .. ඨිතිධාතුයෙක් (පිහිටි වීර්‍ය්‍යයෙක්) ඇත .. උපක්‍රමධාතුයෙක් (උපක්‍රම ශක්තියෙක්) ඇත යන එය කිම හඟිහිද?යි. ✿

පින්වතුන් වහන්ස, එසේ යැයි.

උපක්‍රමධාතුව (උපක්‍රම ස්වභාවය) ඇති වත් ම උපක්‍රමවත් සත්ත්වයෝ පැණෙත් ද?යි.

පින්වතුන් වහන්ස, එසේ යැයි.

බ්‍රාහ්මණය, උපක්‍රමධාතුව ඇති වත් ම උපක්‍රමවත් සත්ත්වයෝ පැණෙති යන යමෙක් වේ නම්, මෙය සත්ත්වයන්ගේ ආත්මකාරයයි, මෙය පරකාර යි.

බ්‍රාහ්මණය, මෙබඳු වාද ඇතියකු මෙබඳු දෘෂ්ටි ඇතියකු මම නහමක් දකිම්වයි, අසම්වයි. කොසෙයින් නම් තෙමේ අභික්‍රමණ කරණුයේ තෙමේ ප්‍රතික්‍රමණ කරණුයේ "ආත්මකාරයෙක් නැත, පරකාරයෙක් නැතැ"යි මෙසේ කියන්නේ ද?

(බමුණු තෙම අත්තකාර පරකාර ගාථාවයෙන් දැන බුදුරදුන් සරණ ගොස් මෙසේ කීය:)

භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්තය ... මා අද පටන් කොට දිවිහිමියෙන් සරණ ගියකු කොට ධරණ සේක් වයි

6. 1. 4. 9.

[කම්මනිදාන සුත්‍රය]

[කැමැත්නිදාන යි]

39. මහණෙනි, (වර්තගාමී) කර්මයන්ගේ සමුදයට (රැස්වීමට) මේ නිදාන තුණෙක.

කවර තුණෙක යත්:

කර්මයන්ගේ සමුදයට ලෝභය නිදානයෙකි. කර්මයන්ගේ සමුදයට ද්වේෂය නිදානයෙකි. කර්මයන්ගේ සමුදයට මෝහය නිදානයෙකි.

මහණෙනි, ලෝභයෙන් අලෝභය නූපදනේ ය. වැලිත් මහණෙනි, ලෝභයෙන් ලෝභය මැ උපදනේ ය. මහණෙනි, ද්වේෂයෙන් අද්වේෂය නූපදනේ ය. වැලිත් මහණෙනි, ද්වේෂයෙන් ද්වේෂය ම උපදනේ ය. මහණෙනි, මෝහයෙන් අමෝහය නූපදනේ ය. මහණෙනි, වැලිත් මෝහයෙන් මෝහය ම උපදනේ ය.

මහණෙනි, ලෝභයෙන් උපන් කර්මයෙන්, ද්වේෂයෙන් උපන් කර්මයෙන්, මෝහයෙන් උපන් කර්මයෙන් දෙවියෝ නො පැණෙත්. මනුෂ්‍යයෝ නො පැණෙත්. යම්බඳු අනෙකුදු සුගතිහු නො පැණෙත්.

වැලිත් මහණෙනි, ලෝභජකර්මයෙන්, ද්වේෂජකර්මයෙන්, මෝහජ කර්මයෙන් නිරය පැණෙයි. තිරිසන් යොන් පැණෙයි. ප්‍රේත විෂය පැණෙයි. අනෙක් කිසි දුගතිහුදු පැණෙති.

මහණෙනි, කර්මයන්ගේ සමුදයට මේ නිදාන තුණ යි.

6

තීණිමානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි:

අලොභො නිදානං කම්මානං සමුදයාය. අදොසො නිදානං කම්මානං සමුදයාය. අමොහො නිදානං කම්මානං සමුදයාය.

න භික්ඛවෙ අලොභා ලොභො සමුදෙති, අථ ඛො භික්ඛවෙ අලොභා අලොභොව සමුදෙති. න භික්ඛවෙ අදොසා දොසො සමුදෙති, අථ ඛො භික්ඛවෙ අදොසා අදොසොව සමුදෙති. න භික්ඛවෙ අමොහා මොහො සමුදෙති, අථ ඛො භික්ඛවෙ අමොහා අමොහොව සමුදෙති.

න භික්ඛවෙ අලොභජෙන කම්මෙන අදොසජෙන කම්මෙන අමොහජෙන කම්මෙන නිරයො පඤ්ඤායති. තිරච්ඡානයොනි පඤ්ඤායති. පෙත්තිවිසයො පඤ්ඤායති යා වා පනඤ්ඤාපි කාචි දුග්ගතියො. අථ ඛො භික්ඛවෙ අලොභජෙන කම්මෙන අදොසජෙන කම්මෙන අමොහජෙන කම්මෙන දෙවා පඤ්ඤායන්ති, මනුස්සා පඤ්ඤායන්ති, යා වා පනඤ්ඤාපි කාචි සුගතියො.

ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයායාති.

## 6. 1. 4. 10.

## [කිම්බිල සුත්තං]

**40.** එවම්මෙ සුතං එකං සමයං භගවා කිම්බිලායං විහරති නිචුලවනෙ[1] අථ ඛො ආයස්මා කිම්බිලො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා කිම්බිලො භගවන්තං එතදවොච:

"කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති"ති?

ඉධ කිම්බිල, තථාගතෙ පරිනිබ්බුතෙ භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො සත්ථරි අගාරවා විහරන්ති අප්පතිස්සා. ධම්මෙ අගාරවා විහරන්ති අප්පතිස්සා. සඞ්ඝෙ අගාරවා විහරන්ති අප්පතිස්සා. සික්ඛාය අගාරවා විහරන්ති අප්පතිස්සා. අප්පමාදෙ අගාරවා විහරන්ති අප්පතිස්සා. පටිසන්ථාරෙ අගාරවා විහරන්ති අප්පතිස්සා.

අයං ඛො කිම්බිල හෙතු, අයං පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති.

කො පන භන්තෙ හෙතු, කො පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතීති?

---

1 වෙළුවනෙ - මජ්ඣං

මහණෙනි, කර්මයන්ගේ සමුදයට මෙ නිදාන තුනෙකි. කවර තුනෙක යත්:

කර්මයන්ගේ සමුදය සඳහා අලෝභය නිදානයෙක. කර්මයන්ගේ සමුදය සඳහා අද්වේෂය නිදානයෙක. කර්මයන්ගේ සමුදය සඳහා අමෝහය නිදානයෙක.

මහණෙනි, අලෝභයෙන් ලෝභය නූපදනේ ය. වැලිත් මහණෙනි, අලෝභයෙන් අලෝභය ම උපදනේ ය. මහණෙනි, අද්වේෂයෙන් ද්වේෂය නූපදනේ ය. වැලිත් අද්වේෂයෙන් අද්වේෂයම උපදනේ ය. මහණෙනි, අමෝහයෙන් මෝහය නූපදනේ ය. වැලිත් මහණෙනි, අමෝහයෙන් අමෝහය ම උපදනේ ය.

මහණෙනි, අලෝභජ කර්මයෙන්, අද්වේෂජ කර්මයෙන්, අමෝහජ කර්මයෙන් නිරය නො පැණෙයි. තිරිසන්යොන් නො පැමිණෙයි. ප්‍රේත විෂය නො පැණෙයි. අනෙක් යම් කිසි දුගතිහුදු නො පැණෙති. වැලිත් මහණෙනි, අලෝභජ කර්මයෙන්, අද්වේෂජකර්මයෙන්, අමෝහජ කර්මයෙන් දෙව්යෝ පැණෙත්. මනුෂ්‍යයෝ පැණෙත්. යම්බදු අනෙකුදු කිසියම් සුගතිහු පැණෙත්.

මහණෙනි, කර්මයන්ගේ සමුදය සඳහා මෙ නිදාන තුණ යි.

## 6. 1. 4. 10.

## [කිම්බිල සුත්‍රය]

**40.** මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **කිම්බිලා** නගර සමීපයෙහි වූ මිදෙල් වනයෙහි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **කිම්බිල** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැල කළහ:

වහන්ස, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි ශාසන සද්ධර්මය යම් හෙයෙකින් චිරස්ථායී නො වේ නම්, එ හේතු කවරේ ද? එ ප්‍රත්‍යය කවරේ ද? යි.

කිම්බිලයෙනි, මෙ සස්නෙහි තථාගතයන් වහන්සේ පිරිනිවිකල්හි මහණහු මෙහෙණහු උවසුහු උවැසියෝ ශාස්තෘන් කෙරෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නාහ. ධර්මයෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නාහ. සඟුන් කෙරෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නාහ. ශික්ෂායෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නාහ. අප්‍රමාදයෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නාහ. පිළිසඳරෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නාහ.

කිම්බිලයෙනි, යම් හෙයෙකින් තථාගතයන් පිරිනිවිකල්හි ශාසන සද්ධර්මය චිරස්ථායී නො වේ නම්, මෙ හේතුය, මෙ ප්‍රත්‍යය යි.

වහන්ස, යම් හෙයෙකින් තථාගතයන් වහන්සේ පිරිනිවිකල්හි ශාසන-සද්ධර්මය චිරස්ථායී වේ නම්, එ හේතු කවර, එ ප්‍රත්‍යය කවරයි.

ඉධ කිම්බිල තථාගතෙ පරිනිබ්බුතෙ භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො සත්ථරි සගාරවා විහරන්ති සප්පතිස්සා, ධම්මෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සඞ්ඝෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සික්ඛාය සගාරවා විහරන්ති සප්පතිස්සා, අප්පමාදෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, පටිසන්ථාරෙ සගාරවා විහරන්ති සප්පතිස්සා.

අයං ඛො කිම්බිල, හෙතු අයං පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතීති.

## 6. 1. 4. 11.

## [දාරුක්ඛන්ධ සුත්තං]

**41.** එවං මෙ සුතං එකං සමයං ආයස්මා **සාරිපුත්තො රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ** පබ්බතෙ.

අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දස අඤ්ඤතරස්මිං පදෙසෙ මහන්තං දාරුක්ඛන්ධං. දිස්වා භික්ඛූ ආමන්තෙසි: ''පස්සථ නො තුම්හෙ ආවුසො අමුං මහන්තං දාරුක්ඛන්ධන්ති''

එවමාවුසොති.

ආකඞ්ඛමානො ආවුසො භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො අමුං දාරුක්ඛන්ධං පථවීත්වෙව අධිමුච්චෙය්‍ය. තං කිස්ස හෙතු: අත්ථි ආවුසො අමුස්මිං දාරුක්ඛන්ධෙ පථවීධාතු, යං නිස්සාය භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො අමුං දාරුක්ඛන්ධං පථවීත්වෙව අධිමුච්චෙය්‍ය.

ආකඞ්ඛමානො ආවුසො භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො අමුං දාරුක්ඛන්ධං ආපොත්වෙව අධිමුච්චෙය්‍ය -පෙ- තෙජොත්වෙව අධිමුච්චෙය්‍ය -පෙ- වායොත්වෙව අධිමුච්චෙය්‍ය -පෙ- සුභන්තෙව අධිමුච්චෙය්‍ය -පෙ- අසුභන්තෙව අධිමුච්චෙය්‍ය. තං කිස්ස හෙතු. අත්ථි ආවුසො අමුස්මිං දාරුක්ඛන්ධෙ අසුභධාතු, යං නිස්සාය භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො අමුං දාරුක්ඛන්ධං අසුභන්තෙව අධිමුච්චෙය්‍යාති.

## 6. 1. 4. 12.

## [නාගිත සුත්තං]

**42.** එවං මෙ සුතං එකං සමයං භගවා **කොසලෙසු** චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන **ඉච්ඡානඞ්ගලං** නාම කොසලානං බ්‍රාහ්මණගාමො, තදවසරි. තත්‍ර සුදං භගවා ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ.

කිම්බිලයෙනි, මේ සස්නෙහි තථාගතයන් පිරිනිවීකල්හි මහණහු මෙහෙණහු උවසුහු උවැසිහු ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇති ව ප්‍රතිශ්‍රය ඇති ව වසත්නාහ. ධර්මය කෙරෙහි ගෞරව ඇති ව ප්‍රතිශ්‍රය ඇති ව වසත්නාහ. සඟුන් කෙරෙහි ගෞරව ඇති ව ප්‍රතිශ්‍රය ඇති ව වසත්නාහ. ශික්ෂාවෙහි ගෞරව ඇති ව ප්‍රතිශ්‍රය ඇති ව වසත්නාහ. අප්‍රමාදයෙහි ගෞරව ඇති ව ප්‍රතිශ්‍රය ඇති ව වසත්නාහ. පිළිසඳරෙහි ගෞරව ඇති ව ප්‍රතිශ්‍රය ඇති ව වසත්නාහ.

කිම්බිලයෙනි, යම් හෙයෙකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථායී වේ නම්, මෙ ඒ හේතු ය, මේ ඒ ප්‍රත්‍යය යි.

## 6. 1. 4. 11.

## [දාරුක්ඛන්ධ සූත්‍රය]

**41.** මා විසින් මෙසේ අසනලද. එක් සමයෙක්හි ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ රාජගහ සමීපයෙහි ගිජ්ඣකූට පර්වතයෙහි වාස කරත්.

එකල්හි ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ බොහෝ වහන්දෑ හා සමග ගිජුකුළුපව්වෙයෙන් බස්නාහු අන්‍යතරප්‍රදේශයෙක්හි මහ දුවකඳක් දුටහ. දැක භික්ෂූන් ඇමතූහ. "ඇවැත්නි, තෙපි තෙල මහදුවකඳ දක්නාහු දැයි"යි.

"එසේ ය ඇවැත්නි"යි.

ඇවැත්නි, චිත්තවශීභාවයට පත් සෘද්ධිමත් මහණෙක් කැමැතියේ නම්, අසු දුවකඳ පෘථිවීධාතු ම ය යි සලකන්නේ ය ඒ කවර හෙයින යත්: ඇවැත්නි, යම් පෘථිවීධාතුවක් නිසා චිත්තවශීභාවයට පත් සෘද්ධිමත් මහණෙක් "අසු දුව කඳ පෘථිවීධාතු ම ය"යි සලකා නම්, තෙල දුවකඳෙහි (එබඳු) පෘථිවීධාතුයෙක් ඇත.

ඇවැත්නි, චිත්තවශීභාවයට පත් සෘද්ධිමත් මහණෙක් කැමතියේ නම් අසු දුවකඳ අබ්ධාතු මය යි සලකන්නේ ය ... තේජෝධාතු ම ය යි සලකන්නේ ය ... වායෝධාතු ම ය යි සලකන්නේ ය ... ශුභධාතු ම ය යි සලකන්නේ ය ... අශුභධාතු ම ය යි සලකන්නේ ය. ඒ කවර හෙයින යත්: ඇවැත්නි, යම් අශුභධාතුවක් නිසා චිත්ත වශීභාවයට පත් සෘද්ධිමත් මහණ තෙල දුව කඳ අශුභධාතු ම ය යි සලකන්නේ නම්, අසු දුව කඳෙහි (ඒ) අශුභධාතුව ඇතැයි.

## 6. 1. 4. 12.

## [නාගිත සූත්‍රය]

**42.** මා විසින් මෙසේ අසනලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන්-වහන්සේ කොසොල් ජනපදයෙහි මහබික්සඟුන් හා සමග සැරි සරණ-සේක් කොසලයන්ගේ ඉච්ඡානඞ්ගල නම් බමුණුගමට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එ ඉච්ඡානඞ්ගලයෙහි ඉච්ඡානඞ්ගල වනලැහැබිහි වාස කරත්නාහ.

අස්සොසුං ඛො ඉච්ඡානඞ්ගලිකා බ්‍රාහ්මණගහපතිකා "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො ඉච්ඡානඞ්ගලං අනුප්පත්තො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො -පෙ- බුද්ධො භගවා''ති. සො ඉමං ලොකං සදෙවකං -පෙ- [සාධු ඛො පන තථාරූපානං] අරහතං දස්සනං හොතී''ති.

අථ ඛො ඉච්ඡානඞ්ගලිකා බ්‍රාහ්මණගහපතිකා තස්සා රත්තියා අච්චයෙන පහූතං ඛාදනීයං භොජනීයං ආදාය යෙන ඉච්ඡානඞ්ගලවනසණ්ඩො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා බහිද්වාරකොට්ඨකෙ අට්ඨංසු උච්චාසද්දා මහාසද්දා.

තෙන ඛො පන සමයෙන ආයස්මා නාගිතො භගවතො උපට්ඨාකො හොති. අථ ඛො භගවා ආයස්මන්තං නාගිතං ආමන්තෙසි: කෙ පන තෙ නාගිත උච්චාසද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙති.

එතෙ භන්තෙ ඉච්ඡානඞ්ගලිකා බ්‍රාහ්මණගහපතිකා පහූතං ඛාදනීයං භොජනීයං ආදාය බහිද්වාරකොට්ඨකෙ ඨිතා භගවන්තංයෙව උද්දිස්ස භික්ඛුසඞ්ඝං චාති.

මාහං නාගිත, යසෙන සමාගමං. මා ච මයා යසො. යො ඛො නාගිත, නයිමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්ස අකිච්ඡලාභී අකසිරලාභී, යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී, සො තං මීළ්හසුඛං මිද්ධසුඛං ලාභසක්කාරසිලොකසුඛං සාදියෙය්‍යාති.

අධිවාසෙතුදානි භන්තෙ භගවා, අධිවාසෙතු සුගතො. අධිවාසනකාලොදානි භන්තෙ භගවතො. යෙන යෙනෙවදානි භන්තෙ භගවා ගමිස්සති, තන්නින්නාව භවිස්සන්ති බ්‍රාහ්මණගහපතිකා, නෙගමා චෙව ජානපදා ච. සෙය්‍යථාපි භන්තෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ යථා-නින්නං උදකානි පවත්තන්ති, එවමෙව ඛො භන්තෙ යෙන යෙනෙවදානි භගවා ගමිස්සති, තන්නින්නාව භවිස්සන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපදා ච. තං කිස්ස හෙතු: තථා හි භන්තෙ භගවතො සීල-පඤ්ඤාණන්ති.

මාහං නාගිත, යසෙන සමාගමං. මා ච මයා යසො. යො ඛො නාගිත, නයිමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්ස අකිච්ඡලාභී අකසිරලාභී, යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාම-ලාභී අකිච්ඡලාභී අකසිරලාභී, සො තං මීළ්හසුඛං මිද්ධසුඛං ලාභසක්කාර-සිලොකසුඛං සාදියෙය්‍ය.

ඉච්ඡානඞ්ගලික බ්‍රාහ්මණ ගෘහපතීහු "ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූ ශාක්‍යපුත්‍ර ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ඉච්ඡානඞ්ගලයට වැඩියේක් ම ඉච්ඡානඞ්ගලයෙහි වූ ඉච්ඡානඞ්ගල වනලැහැබ්හි වසන්නාහ. 'ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ. විද්‍යාචරණ සම්පන්නයහ ... බුද්ධයහ, භගවත්හ'යි ඒ භගවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳු කල්‍යාණ කීර්තිඝෝෂයෙක් උස් ව නැඟියේ ය. උන්වහන්සේ දෙවියන් සහිත මෙ ලෝකය ... එබඳු රහතුන්ගේ දර්ශනය මනා වන්නේ ය"යි ඇසූහු ම ය.

ඉක්බිති ඉච්ඡානඞ්ගල වැසි බමුණු ගැහැවියෝ ඒ රෑ ඇවෑමෙන් ප්‍රභූත ඛාද්‍යභෝජ්‍යයන් රැගෙණ ඉච්ඡානඞ්ගලවනෂණ්ඩය කරා එළඹියහ. එළැඹ බිහි දොර කොට්ඨයෙහි උස්හඬ මහහඬ ඇති ව සිටියහ.

එ සමයෙහි ආයුෂ්මත් නාගිත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නාගිත තෙරුන් ඇමැතූසේක: නාගිතයෙනි, උස් හඬ ඇති, මහ හඬ ඇති මහු කවරහු ද? මත්ස්‍යවිලෝපයෙහි (මාළු කඩයක) කෙවුලන් වැනියහ"යි.

"වහන්ස, තෙල ඉච්ඡානඞ්ගලවැසි බමුණු ගැහැවිහු බොහෝ කෑයුතු බුදියයුතු ද ගෙණ භාග්‍යවතුන් වහන්සේ හා භික්ෂු සඞ්ඝයා උදෙසා මැ බිහිදොර කොට්ඨයෙහි සිටියහ"යි.

නාගිතයෙනි, මම නහමක් පිරිවර හා එක් වෙම්වා. පිරිවර ද මා හා නහමක් එක් වේවා. නාගිතයෙනි, යම් නෙක්ඛම්මසුඛයක්, පවිවෙක සුඛයක්, උපසම සුඛයක්, සම්බෝධ සුඛයක් මම කැමැති සේ ලබන සුලුයෙම්, නිදුකින් ලබන සුලුයෙම්, විපුල කොට ලබන සුලුයෙම් ද, යමෙක් වනාහි මේ නෙක්ඛම්මසුඛය, පවිවෙකසුඛ ය, උපසමසුඛය, සම්බෝධසුඛය කැමැතිසේ ලබන සුලුයේ නිදුකින් ලබන සුලුයේ විපුල කොට ලබන සුලුයේ නොවේ නම්, හේ, ඒ මීළ්හ (අසුචි) සුඛය, නිද්‍රාසුඛය, ලාභ සත්කාර වර්ණභණනය නිසා උපන් සුඛය ඉවසන්නේ ය.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් ඉවසන සේක් වා. සුගතයන් වහන්සේ ඉවසන සේක් වා. භාග්‍යවතුන් වහන්සේට ඉවසන කාලය වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් යම් දිගෙක්හි වඩනාසේක් නම්, නියම් ගම් වැසි වූ ද දනවුවැසි වූ ද බ්‍රාහ්මණ ගෘහපතීහු එදිගට නැමුනාහු මැ වන්නාහ. වහන්ස, යම්සේ මහපොද යුත් වැසි වසිත් ම නිම්න වූ පරිදි මැ (නැමුනු තැන් කරා ම) දියගලා යේ ද, වහන්ස, එසෙයින් මැ භාග්‍යවතුන් වහන්සේ දැන් යම් යම් දිගෙක්හි වඩනාසේක් නම්, නියම්ගම්වැසි වූ ද දනවුවැසි වූ ද බමුණු ගැහැවිහු එදිගට නැමුනාහු ම වන්නාහ. වහන්ස, එ කවර හෙයින යත්: වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ශීල – ප්‍රඥ එබඳු මැ යි.

නාගිතයෙනි, මම පිරිවර හා නහමක් එක් වෙම්වා. පිරිවර ද මා හා නහමක් එක් වේවා. නාගිතයෙනි, මම යම් නෙක්ඛම්මසුඛයක්, පවිවෙක සුඛයක්, උපසමසුඛයක්, සම්බෝධසුඛයක් කැමැති සේ ලබනා සුලුයෙම්, නිදුකින් ලබනසුලුයෙම්, විපුල කොට ලබන සුලුයෙම් ද, යමෙක් මෙ නෙක්ඛම්මසුඛය, පවිවෙකසුඛය, උපසමසුඛය, සම්බෝධසුඛය කැමැති සේ ලබනසුලුයේ, නිදුකින් ලබන සුලුයේ, විපුල කොට ලබන සුලුයේ නොවේ නම්, හේ එ මීළ්හසුඛය නිද්‍රාසුඛය ලාභසත්කාරවර්ණභණන සුඛය ඉවසන්නේ ය,

(1) ඉදාහං නාගිත, භික්ඛුං පස්සාමි ගාමන්තවිහාරිං සමාහිතං නිසින්නං. තස්ස මය්හං නාගිත, එවං හොති: "ඉදානිමං ආයස්මන්තං ආරාමිකො වා සමණුද්දෙසො වා සහධම්මිකො වා තම්හා සමාධිම්හා චාවෙස්සතී"ති තෙනාහං නාගිත, තස්ස භික්ඛුනො න අත්තමනො හොමි ගාමන්තවිහාරෙන.

(2) ඉධ පනාහං නාගිත, භික්ඛුං පස්සාමි ආරඤ්ඤිකං අරඤ්ඤෙ පචලායමානං නිසින්නං. තස්ස මය්හං නාගිත, එවං හොති: "ඉදානි අයමායස්මා ඉමං නිද්දාකිලමථං පටිවිනොදෙත්වා අරඤ්ඤසඤ්ඤං යෙව මනසි කරිස්සති එකත්තන්"ති. තෙනාහං නාගිත, තස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන.

(3) ඉධ පනාහං නාගිත භික්ඛුං පස්සාමි ආරඤ්ඤිකං අරඤ්ඤෙ අසමාහිතං නිසින්නං. තස්ස මය්හං නාගිත, එවං හොති: "ඉදානි අයමායස්මා අසමාහිතං වා චිත්තං සමාදහිස්සති සමාහිතං වා චිත්තං අනුරක්ඛිස්සතී"ති තෙනාහං නාගිත, තස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන.

(4) ඉධ පනාහං නාගිත, භික්ඛුං පස්සාමි ආරඤ්ඤිකං අරඤ්ඤෙ සමාහිතං නිසින්නං. තස්ස මය්හං නාගිත එවං හොති: ඉදානි අයමායස්මා අවිමුත්තං වා චිත්තං විමොචෙස්සති, විමුත්තං වා චිත්තං අනුරක්ඛිස්සතී"ති. තෙනාහං නාගිත තස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන.

(5) ඉධ පනාහං නාගිත, භික්ඛුං පස්සාමි ගාමන්තවිහාරිං ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. සො තං ලාභසක්කාරසිලොකං නිකාමයමානො රිඤ්චති පටිසල්ලානං, රිඤ්චති අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි, ගාමනිගමරාජධානිං ඔසරිත්වා වාසං කප්පෙති. තෙනාහං නාගිත, තස්ස භික්ඛුනො න අත්තමනො හොමි ගාමන්තවිහාරෙන.

(6) ඉධ පනාහං නාගිත, භික්ඛුං පස්සාමි ආරඤ්ඤිකං ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. සො තං ලාභසක්කාරසිලොකං පටිපණාමෙත්වා න රිඤ්චති පටිසල්ලානං, න රිඤ්චති අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි. තෙනාහං නාගිත තස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන.

යස්මාහං නාගිත, සමයෙ අද්ධානමග්ගපටිපන්නො න කඤ්චි පස්සාමි පුරතො වා පච්ඡතො වා, ඵාසු මෙ නාගිත, තස්මිං සමයෙ හොති අන්තමසො උච්චාරපස්සාවකම්මායාති.

දෙවතා වග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

සෙඛා ච අපරිහානි මොග්ගල්ලාන විජ්ජාභාගියා විවාද ද්වනත්තකාරී නිදානං කිම්බිලදාරුක්ඛන්ධෙන නාගිතෙනාති

(1) නාගිතයෙනි, මම මේ සස්නෙහි ග්‍රාමාන්ත විහාරී වූ සමාහිත ව හුන් මහණක්හු දක්මි. නාගිතයෙනි, මට මෙ බඳු සිතෙක් වෙයි: "දැන් ආරාමිකයෙක් වේවයි, හෙරණෙක් වේවයි, සහදම්මියෙක් වේවයි, මෙ ආයුෂ්මත්හු එ සමාධිනිමිත්තයෙන් ගලවන්නේය" යි. නාගිතයෙනි, මම එ මහණහුගේ එ ග්‍රාමාන්ත විහාරයෙන් තුටු සිතැතියෙම් නො වෙමි.

(2) නාගිතයෙනි, මම මෙ සස්නෙහි අරණෙහි නිදමින් හිඳිනා ආරණ්‍යක මහණකු දක්මි. නාගිතයෙනි, මට මෙ බඳු සිතෙක් වෙයි: "දැන් මෙ ආයුෂ්මත් මෙ නිද්‍රාකලම්ථය දුරු කොට එකාග්‍රතාභූත අරණ්‍යසංඥාව ම මෙනෙහි කෙරේ"යි. නාගිතයෙනි, මම එ භික්ෂුහුගේ එ අරණ්‍ය විහාරයෙන් සතුටු සිතැතියෙම් වෙමි.

(3) නාගිතයෙනි, මම මෙ සස්නෙහි අරණෙහි අසමාහිත ව හුන් ආරණ්‍යක මහණකු දක්මි. නාගිතයෙනි, මට මෙ බඳු සිතෙක් වෙයි: "දැන් මෙ ආයුෂ්මත් අසමාහිත වූ හෝ සිත සමාහිතකරන්නේය. සමාහිත වූ හෝ සිත රැකගන්නේ ය"යි. නාගිතයෙනි, එ භික්ෂුහුගේ එ අරණ්‍යවාසයෙන් මම සතුටු සිතැතියෙම් වන්නෙමි.

(4) නාගිතයෙනි, මම මෙ සස්නෙහි අරණෙහි සමාහිත ව හුන් ආරණ්‍යක මහණකු දක්මි. නාගිතයෙනි, එ මට මෙබඳු සිතෙක් වන්නේ ය: "දැන් මේ ආයුෂ්මත් අවිමුක්ත වූ හෝ චිත්තය විමුක්ත කරන්නේ ය. විමුක්ත වූ හෝ සිත රක්නේ ය"යි. නාගිතයෙනි, මම එ භික්ෂුහුගේ එ ආරණ්‍යක වාසයෙන් සතුටු සිතැතියෙම් වෙමි.

(5) නාගිතයෙනි, මම මෙ සස්නෙහි ග්‍රාමාන්ත විහාරී වූ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබනසුලු මහණකු දක්මි. හේ ඒ ලාභ සත්කාර ශ්ලෝකය පතමින් පිළිසලන හරණේ ය. අරණෙහි වානප්‍රස්ථ ප්‍රාන්තශයනාසනයන් හැර පියයි. ගම් නියම්ගම් රජදහනට වැද වාස කෙරෙයි. නාගිතයෙනි, මම ඒ භික්ෂුහුගේ ඒ ග්‍රාමාන්ත විහාරයෙන් සතුටු සිතැතියෙම් නො වෙමි.

(6) නාගිතයෙනි, මම මෙ සස්නෙහි සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබනසුලු ආරණ්‍යක මහණකු දක්මි. හේ ඒ ලාභ-සත්කාරශ්ලෝකය දුරු ලා පිළිසලන නො පියයි. අරණ වානප්‍රස්ථ ප්‍රාන්ත-ශයනාසනයන් නො පියයි. නාගිතයෙනි, මම එ භික්ෂුහුගේ එ අරණ්‍ය විහාරයෙන් සතුටු සිතැතියෙම් වෙමි.

නාගිතයෙනි, යම් කලෙක්හි මම් අදත් මගට පිළිපන්නෙම් ඉදිරිපස්හි හෝ පසුපස්හි හෝ කිසිවකු නො දක්නෙම් ද, නාගිතයෙනි, එ සමයෙහි මට යවත් පිරිසෙහිත් සුලුවටත් මහවටත් කරන්නට පමා පහසු වේ මැයි.

සිවුවැනි දේවතා වර්ග යි.

**වර්ග උද්දානය:**

සෙඛ සූත්‍රය, අපරිහානිය සූත්‍ර දෙකෙක, මොග්ගල්ලාන සූත්‍රය, විජ්ජා-භාගියසූත්‍රය විවාදමූල සූත්‍රය, දානසූත්‍රය, අත්තකාරිසූත්‍රය, නිදානසූත්‍රය, කිම්බිලසූත්‍රය, දාරුක්ඛන්ධ සූත්‍රය, නාගිතසූත්‍රය යි ද්වාදශ සූත්‍ර කෙනෙක්.

# 5. ධම්මික වග්ගො

## 6. 1. 5. 1.

### [නාග සුත්තං]

43 එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි:

“ආයාමානන්ද, යෙන පුබ්බාරාමො මිගාරමාතුපාසාදො තෙනුපසඞ්කමිස්සාම දිවාවිහාරායා”ති.

“එවං භන්තෙ”ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

අථ ඛො භගවා ආයස්මතා ආනන්දෙන සද්ධිං යෙන පුබ්බාරාමො මිගාරමාතුපාසාදො තෙනුපසඞ්කමි.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි:

“ආයාමානන්ද, යෙන පුබ්බකොට්ඨකො තෙනුපසඞ්කමිස්සාම ගත්තානි පරිසිඤ්චිතුං”ති.

“එවං භන්තෙ’ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි”

අථ ඛො භගවා ආයස්මතා ආනන්දෙන සද්ධිං යෙන පුබ්බකොට්ඨකො තෙනුපසඞ්කමි ගත්තානි පරිසිඤ්චිතුං. පුබ්බකොට්ඨකෙ ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසි ගත්තානි පුබ්බාපයමානො.

තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස ‘සෙතො’ නාම නාගො මහාතුරියතාළිතවාදිතෙන පුබ්බකොට්ඨකා පච්චුත්තරති. අපිස්සු තං ජනො දිස්වා එවමාහ:

“අභිරූපො වත භො[1] රඤ්ඤො නාගො, දස්සනීයො වත භො රඤ්ඤො නාගො, පාසාදිකො වත භො රඤ්ඤො නාගො, කායුපපන්නො වත භො රඤ්ඤො නාගො”ති.

එවං වුත්තෙ ආයස්මා උදායී භගවන්තං එතදවොච: “හත්ථිමෙව නු ඛො භන්තෙ මහන්තං බ්‍රහන්තං කායුපපන්නං ජනො දිස්වා එවමාහ: නාගො වත භො නාගොති: උදාහු අඤ්ඤම්පි කඤ්චි මහන්තං බ්‍රහන්තං කායුපපන්නං ජනො දිස්වා එවමාහ: නාගො වත භො නාගොති?”

---

1. අභිරූපො වත - සං - සිමු.

# 5. ධම්මික වග්ගය

## 6. 1. 5. 1.

### [නාග සූත්‍රය]

43 එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬුසිටුහු ගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳපෙරව පාසිවුරු ගෙණ සැවැත් නුවර පිඬු පිණිස වත්සේක. සැවැත්හි පිඬු පිණිස හැසිර පසුබත්හි පිඬුවායෙන් පෙරළා වැඩියාහු ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමැතූසේක:

ආනන්දයෙනි, දිවාවිහාර සඳහා යම්හ, පුබ්බාරාම නම් වූ මුවරමාපහය කරා එළැඹෙන්නමෝ'යි.

"එසේ ය වහන්සැ"යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් හා සමග පුබ්බාරාම නම් වූ මිගාරමාතුපාසාදය කරා එළැඹි සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස්කල්හි පිළිසලතින් නැගිසේක් ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමැතූහ:

"ආනන්දයෙනි, සිරිරු සිලිලින් සනහන්නට පූර්වකොෂ්ඨය ('පුබ්බකොට්ඨක' නම් නහනතොට) කරා යම්හ"යි.

'එසේය වහන්සැ'යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු ඇස්සූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් හා (පන්සියක් භික්ෂූන්) සමග පූර්වකොෂ්ඨකය කරා ගාත්‍රපරිෂෙකයට (නහන පිණිස) වැඩිසේක. පූර්වකොෂ්ඨකයෙහි සිරිරු නහවා ගොඩවී එකචීවර වූ සේක් (හඳනය පමණක් හැඳ) සිරිරු දියසිඳුවමින් සිටිසේක.

එසමයෙහි පසේනදි කොසොල් මහරජුගේ 'සෙත' නම් ඇත්රජ මහාතූර්‍යනාලම්-වාදයෙන් පූර්වකොෂ්ඨකයෙන් ගොඩඑත්තේ ය: එසේ වත් ම, ජනයා ඔහු දැක මෙසේ කියති:

භවත්නි, ඒකාන්තයෙන් මහරජුගේ මෙ මහානාගයා (ඇත්රජ) අභිරූප වෙයි. භවත්නි, ඒකාන්තයෙන් මහරජුගේ මෙ ඇත්රජ දර්ශනීයය. භවත්නි, මහරජුගේ මෙ ඇත්රජ ප්‍රාසාදික ය. භවත්නි, ඒකාන්තයෙන් මහරජුගේ මෙ ඇත්රජ තුනුසපුයෙන් යුතු (පිරිපුන් අඟපසඟ ඇතියේ) ය යි.

මෙසේ කී කල්හි ආයුෂ්මත් උදායී තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ: වහන්ස, ජනයා ආරෝහසම්පන්න වූ පරිණාහසම්පන්න වූ පිරිපුන් අඟපසඟ ඇති ඇතකුම දැක 'පින්වත්නි, ඒකාන්තයෙන් මහ නාගයෙකැයි කියාද? නැතහොත්, ජනයා ආරෝහසම්පන්න වූ පරිණාහසම්පන්න වූ පුරිපුන් අඟපසඟින් යුක්ත වූ අන්කිසිවකුදු දැක "පින්වත්නි, ඒකාන්තයෙන් මහානාගයෙකැයි කියා ද?" යි.

හත්ථිම්පි ඛො උදායි මහන්තං බ්‍රහන්තං කායූපපන්නං ජනො දිස්වා එවමාහ: "නාගො වත භො නාගො"ති. අස්සම්පි ඛො උදායි -පෙ- ගොණම්පි ඛො උදායි-පෙ-උරගම්පි ඛො උදායි-පෙ-රුක්ඛම්පි ඛො උදායි,-පෙ- මනුස්සම්පි ඛො උදායි, මහන්තං බ්‍රහන්තං[1] කායූපපන්නං ජනො දිස්වා එවමාහ: "නාගො වත භො නාගො"ති. අපි ච උදායි යො සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය "ආගුං න කරොති කායෙන වාචාය මනසා, තමහං නාගො"ති බ්‍රූමීති.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාව සුභාසිතමිදං භන්තෙ, භගවතා[2] "අපි ච උදායි, යො සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, ආගුං න කරොති කායෙන වාචාය මනසා, තමහං නාගොති බ්‍රූමී"ති.

ඉදඤ්ච පනාහං භන්තෙ, භගවතො සුභාසිතං ඉමාහි ගාථාහි අනුමොදාමි:

18. මනුස්සභූතං සම්බුද්ධං අත්තදන්තං සමාහිතං
ඉරියමානං බ්‍රහ්මපථෙ චිත්තස්සූපසමෙ රතං.

19. යං මනුස්සා නමස්සන්ති සබ්බධම්මාන පාරගුං,
දෙවාපි තං[3] නමස්සන්ති ඉති මෙ අරහතො සුතං.

20. සබ්බසංයොජනාතීතං වනා නිබ්බනමාගතං
කාමෙහි නෙක්ඛම්මරතං මුත්තං සෙලාව කඤ්චනං.

21. සබ්බෙ අච්චරුචී නාගො හිමවා වඤ්ඤෙ[4] සිලුච්චයෙ
සබ්බෙසං නාගනාමානං සච්චනාමො අනුත්තරො.

22. නාගං වො කිත්තයිස්සාමි නහි ආගුං කරොති සො
සොරච්චං අවිහිංසා ච පාදා නාගස්ස තෙ දුවෙ.

23. තපො ච බ්‍රහ්මචරියං චරණා නාගස්ස ත්‍යාපරෙ
සද්ධාහත්ථො මහානාගො උපෙක්ඛාසෙතදන්තවා.

24. සති ගීවා සිරො පඤ්ඤා වීමංසා ධම්මචින්තනා
ධම්මකුච්ඡිසමාවාපො[5] විවෙකො තස්ස වාලධි.

25. සො ඣායී අස්සාසරතො අජ්ඣත්තං සුසමාහිතො
ගච්ඡං සමාහිතො නාගො ඨිතො නාගො සමාහිතො.

1. මහන්තං - මජසං 2. භගවතාති - සිවු 3. තං - මජසං.
4. හිමවාඤ්ඤෙ - මජසං. 5. සමාපො - මජසං

උදායියෙනි, ජනයා ආරෝහසම්පන්න වූ පරිණාහසම්පන්න වූ පිරිපුන් අඟපසඟ ඇති ඇත්රජකු දැක "භවත්නි, එකාන්තයෙන් මහානාගයෙක" යනු කියයි. උදායියෙනි, අශ්වයකු ද ... උදායියෙනි, ගොනකු ... උදායියෙනි, උරගයකු ... උදායියෙනි, වෘක්ෂයකු ... උදායියෙනි, ආරෝහසම්පන්න වූ පරිණාහසම්පන්න වූ පිරිපුන් අඟපසඟ ඇති මනුෂ්‍යයකු ද දැක ජනයා "භවත්නි, එකාන්තයෙන් මහානාගයෙක" යනු කියයි. වැලිත් උදායියෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි, මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්ත්වාඛ්‍ය ප්‍රජායෙහි යමෙක් ආගු සඞ්ඛ්‍යාත ලමු අකුසල්-දම් කයින් වචසින් මනසින් නො කෙරේ නම්, මම ඔහු 'නාග' යයි කියමියි.

වහන්ස, අසිරි ය! වහන්ස අද්භූත ය!! වහන්ස භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය සුභාෂිත ම ය: "වැලිත් උදායියෙනි දෙව්බඹුන් සියෝ මරුන් සියෝ ලෝකයෙහි, මහණබමුණන් සියෝ දෙව්මිනිසුන් සියෝ ප්‍රජායෙහි යමෙක් කාවිසිමුනි තුන්දොරින් පව් නො කෙරේ ද, මම උහු නාගයෙකැයි කියමි"යි වදාළසේක.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ මේ සුභාෂිතය මේ ගාථායෙන් අනුමෝදන් වෙමි:

18. මනුෂ්‍ය වූ මැ තමා විසින් දැමුනු (අෂ්ටවිධ සමාධියෙන්) සමාහිත වූ නිර්වාණමාර්ගයෙහි වසන (ධ්‍යානයෙන්) චිත්තව්‍යුපශමයෙහි තියැලුනු,

19. සකන්ධාදි සර්වධර්මඥනයෙහි පාරප්‍රාප්තවූ යම් බුද්ධනාගයකු මනුෂ්‍යයෝ නමදිත් නම්, ඒ බුදුන් දෙවියෝ ද නමදිත් ය යනු අර්හත් වන ඔබ වෙත මා විසින් අසනලදී.

20. සර්වසංයෝජනයන් ඉක්මගිය (කෙලෙස්) වනයෙන් නිවනට පැමිණි, (ආර්යමාර්ග සඞ්ඛ්‍යාත) නෛෂ්ක්‍රම්‍යයෙහි අභිරත වූ ශෛලපර්වතයෙන් ගුළු රනක් සෙයින් කාමයෙන් මුක්ත වූ උන්වහන්සේ දෙවියෝ නමදිත්.

21. අන්‍ය පර්වතයන් ඉක්මවා දිලෙන හිමවත් පර්වතය සෙයින් බුද්ධනාග තෙම හැම නාගයන් මැඩැගෙණ වොරදනා රුචි (බැබැළුම්) ඇතියේ ය. හැම නාගනාම ඇතියන් අතුරෙහි (පව් නො කරන හෙයින්) සත්‍ය වූ නාගනාම ඇති බුදුතෙම අනුත්තර වෙයි.

22. තොපට නාගයා කීර්තනය කරමි: හෙ (අකුශලධර්මසඞ්ඛ්‍යාත) ආගු නො කෙරෙයි. (ශුචිසීලසඞ්ඛ්‍යාත) සුරතභාවය ද, (කාරුණ්‍ය හා කාරුණ්‍යපූර්වභාගසඞ්ඛ්‍යාත) අවිහිංසාව ද බුද්ධනාග වූ ඔබගේ (පෙර) දෙපා වෙයි.

23. (ධූතසමාදාන සඞ්ඛ්‍යාත) තපස ද, (ආර්යමාර්ගශීල සඞ්ඛ්‍යාත) බ්‍රහ්මචර්යය ද නාග වූ ඔබගේ අපර වූ චරණ (පසුපා) දෙක යි. මහාබුද්ධනාග තෙම ශ්‍රද්ධා නැමැති සොඬ ඇතියේ ෂඩඞ්ගොපෙක්ෂා සඞ්ඛ්‍යාත ශ්වේතදන්ත ඇතියේ ය.

24. එ බුද්ධනාගයාගේ ග්‍රීවාව ස්මෘති ය යි. ශීර්ෂය (සර්වඥතා නැමැති) ප්‍රඥ යි. ධර්මචින්තනාව (ධර්ම කොටස් පිරිසිඳ දත්නා ඥානය) මීමාංසා (සොඬ අග) යි. (චතුර්ථධ්‍යාන සඞ්ඛ්‍යාත) ධර්මය ම (ඍද්ධිවිධාදි අභිඥබලරාශිභූතස්ථාන හෙයින්) කුක්ෂිසමාවාප නම් (උදරය) වෙයි. ත්‍රිවිධ විවේකය උහුගේ වාලධි ය යි.

25. ධ්‍යාන කරණසුලු එ බුද්ධනාග ඵලසමාපත්ති සඞ්ඛ්‍යාත ආශ්වාසයෙහි (ප්‍රාණයෙහි) නියැලියේ අධ්‍යාත්මයෙහි මොනොවට සමාහිත ය. බුද්ධනාග යන්නේද සමාහිතම වෙයි. බුද්ධනාග සිටියේද සමාහිත ම වෙයි.

26. සෙය්‍යං සමාහිතො නාගො නිසින්නොපි සමාහිතො
සබ්බත්ථ සංවුතො නාගො එසා නාගස්ස සම්පදා

27. භුඤ්ජති අනවජ්ජානි සාවජ්ජානි න භුඤ්ජති
ඝාසං අච්ඡාදනං[1] ලද්ධා සන්නිධිං පරිවජ්ජයෙ[2].

28. සංයොජනං අණුං ථූලං සබ්බං ඡෙත්වාන බන්ධනං
යෙන යෙනෙව ගච්ඡති අනපෙක්ඛො'ව ගච්ඡති.

29. යථාපි උදකෙ ජාතං පුණ්ඩරීකං පවඩ්ඪති
නුපලිප්පති[3] තොයෙන සුචිගන්ධං මනොරමං.

30. තථෙව ලොකෙ සුජාතො බුද්ධො ලොකෙ විරජ්ජති[4]
නුපලිප්පති[3] ලොකෙන තොයෙන පදුමං යථා.

31. මහාග්ගිනී පජ්ජලිතො[5] අනාහාරූපසම්මති
සඞ්ඛාරෙසූපසන්තෙසු නිබ්බුතොති පවුච්චති.

32. අත්ථස්සායං විඤ්ඤාපනී උපමා විඤ්ඤූහි දෙසිතා
විඤ්ඤස්සන්ති මහානාගා නාගං නාගෙන දෙසිතං.

33. වීතරාගො වීතදොසො වීතමොහො අනාසවො
සරීරං විජහං නාගො පරිනිබ්බිස්සති අනාසවොති.

6. 1. 5. 2.

[මිගසාලාසුත්තං]

[සාවත්ථිනිදානං]

44. අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන **මිගසාලාය** උපාසිකාය නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො **මිගසාලා** උපාසිකා යෙනායස්මා ආනන්දො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො මිගසාලා උපාසිකා ආයස්මන්තං ආනන්දං එතදවොච:

කථං කථං නාමායං භන්තෙ ආනන්ද, භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරී ච[6] අබ්‍රහ්මචාරී ච උභො සමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායං?

පිතා මෙ භන්තෙ **පූරණො** බ්‍රහ්මචාරී අහොසි ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා, සො කාලකතො.[7] භගවතා ව්‍යාකතො. "සකදාගාමී සත්තො[8] තුසිතං කායං උපපන්නොති." පෙත්තෙය්‍යොපි[9] මෙ භන්තෙ **ඉසිදත්තො** අබ්‍රහ්මචාරී අහොසි සදාරසන්තුට්ඨො. සොපි කාලකතො.[7] භගවතා ව්‍යාකතො: "සකදාගාමී සත්තො[8] තුසිතං කායං උපපන්නො"ති

1. ඝාසමච්ඡාදනං - මජසං 2 පරිවජ්ජය - මජසං 3. නාවුපලිප්පති - සිමු
4. විහරති - මජසං 5 මහාග්ගිනිපජ්ජලිතො - මජසං. මහාගිනි පජ්ජලිතො - සතා
6. බ්‍රහ්මචාරී-සිමු 7 කාලංකතො-මජසං 8 සකදාගාමි පත්තො - මජසං.
9. පෙත්තෙය්‍යොපි මෙ - සිමු, PTS. පිතුපිතා - සතා, කා.

26. නාග තෙම හෝනේද සමාහිතම වෙයි. හිඳුනේ ද සමාහිතම වෙයි. හැම අවාරයෙහිම නාග තෙමේ සංවෘත ය. තෙල නාගයාගේ පරිපූර්ණත්වය යි.

27. (යේ සම්‍යගාජීවයෙන් ලත්) අනවද්‍ය ප්‍රත්‍යයන් වළඳ කරයි (මිථ්‍යාජීවයෙන් ලත්) සාවද්‍ය ප්‍රත්‍යයන් නො වළඳනේ ය. ආහාර වස්ත්‍ර ලැබ සන්නිධි කරණය (රැස්කොට තැබීම) දුරලන්නේ ය.

28. කුදු මහත් බන්ධන වූ හැම සංයෝජනයන් සිඳලා යම් මැ දිගෙකැ යේ නම් අපෙක්ෂා නැතියේ ම යෙයි.

29. දියෙහි උපන් හෙළ පියුම යම් සෙයින් වැඩේ ද, පිවිතුරු සුවඳැතියේ සිත්කලු වූයේ යම්සේ දියෙන් නො තැවරේ ද,

30. එසෙයින් ලොව්හි මොනොවට උපන් බුදුරජ ලොව්හි නො මැ ඇලෙයි. දියෙන් තවර නො ගන්නා පියුම සෙයින් ලෝභයෙන් නො මැ තැවැරෙයි.

31. දැල්වුනු මහගින්න අනාහාරයෙන් සන්හිඳෙයි. (එසෙයින්) සංස්කාරයන් සන්හුන් කල්හි (පුද්ගලයා) නිර්වෘත ය යි කියනු ලැබේ.

32. අර්ථය හඟුන්වන මේ උපමාව (පිළිසිඹියාපත්) විඥයන් විසින් දෙසන ලදු. (උදායිතේර) නාගයා විසින් දෙසනලද බුද්ධනාගයා සෙසු ක්ෂීණාස්‍රවනාගයෝ දන්නාහ.

33. වීතරාග වූ වීතද්වෙෂ වූ වීතමෝහ වූ ආස්‍රව නැති නාග තෙම (පඤ්චස්කන්ධ සංඛ්‍යාත) සිරුර හැරලමින්, අනාස්‍රව වූයේ (අනුපාදිශෙෂ පරිනිර්වාණයෙන්) පිරිනිවේ ය යි.

6. 1. 5. 2

[මිගසාලා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

45. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පෙරවරු වේලෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙණ මිගසාලා උපාසිකාවගේ නිවස කරා එළැඹියහ. එළැඹ පැනවූ අස්නෙහි හුන්හ. ඉක්බිති මිගසාලා උපාසිකා ආනන්ද තෙරුන් කරා එළැඹියා ය. එළැඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් සකසා වැඳ එකත්පසෙක හුනු. එකත්පසෙක හුන් මිගසාලා උපාසිකා ආයුෂ්මත් ආනන්ද තෙරුන්හට තෙල කරුණ සැලකලා:

වහන්ස ආනන්දයෙනි, යම් ධර්මයෙක්හි බ්‍රහ්මචාරී හා අබ්‍රහ්මචාරී හා දෙදෙන පරලොව්හි සමභාවයෙන් සමගති ඇති වූහු නම්, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද මේ ධර්මය කෙසේ කෙසේ නම් (කවර නම් කරුණෙකින් අප විසින්) දතයුතු වේ ද?

වහන්ස, මපියානෝ පූරාණයෝ ග්‍රාමධර්ම වූ මෛථුනයෙන් වැළකියාහු වෙන් වූවාහු බ්‍රහ්මචාරී වූහු. "උහු සකෘදාගාමී සත්ත්ව වූහු ය, කලුරිය කළාහු තුසිතදේවකායට එළැඹියාහු"යි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘතය. වහන්ස, මාගේ ඍෂිදත්ත නමැති පිතෘව්‍යයෙක් (=සුලු-පියෙක්) ද සවදාරයන් හා සතුටු වූයේ බ්‍රහ්මචාරී නො වී ය. හෙ ද සකෘදාගාමීසත්ත්ව වූයේ කලුරිය කළේ තුසිතකායට එළැඹියැයි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘත ය. (ප්‍රකාශිතය.)

කථං කථං නාමායං භන්තෙ ආනන්ද, භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරී ච අබ්‍රහ්මචාරී ච උභො සමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායන්ති?

එවං ඛො පනෙතං භගිනි භගවතා ව්‍යාකතන්ති.

අථ ඛො ආයස්මා ආනන්දො මිගසාලාය උපාසිකාය නිවෙසනෙ පිණ්ඩපාතං ගහෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො ආයස්මා ආනන්දො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන මිගසාලාය උපාසිකාය නිවෙසනං, තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිං. අථ ඛො භන්තෙ මිගසාලා උපාසිකා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො භන්තෙ මිගසාලා උපාසිකා මං එතදවොච:

කථං කථං නාමායං භන්තෙ ආනන්ද, භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරී ච අබ්‍රහ්මචාරී ච උභො සමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායං. පිතා මෙ භන්තෙ පූරාණො බ්‍රහ්මචාරී අහොසි ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. සො කාලකතො[1]. භගවතා ව්‍යාකතො: සකදාගාමී සත්තො[2] තුසිතං කායං උපපන්නොති. පෙත්තෙය්‍යොපි[3] මෙ භන්තෙ ඉසිදත්තො අබ්‍රහ්මචාරී අහොසි සදාරසන්තුට්ඨො. සොපි කාලකතො. භගවතා ව්‍යාකතො: සකදාගාමී සත්තො[2] තුසිතං කායං උපපන්නොති. කථං කථං නාමායං භන්තෙ ආනන්ද භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරීච අබ්‍රහ්මචාරී ච උභො සමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායන්ති?

එවං වුත්තෙ අහං භන්තෙ මිගසාලං උපාසිකං එතදවොචං: එවං ඛො පනෙතං භගිනි භගවතා බ්‍යාකතන්ති.

කා චානන්ද මිගසාලා උපාසිකා බාලා අබ්‍යත්තා අම්බකා අම්බකපඤ්ඤා?[4] කෙ ච පුරිසපුග්ගලපරොපරියඤ්ඤෙ?

ඡයිමෙ ආනන්ද පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ ඡ?

ඉධානන්ද එකච්චො පුග්ගලො සොරතො හොති සුඛසංවාසො. අභිනන්දන්ති සබ්‍රහ්මචාරී එකත්තවාසෙන. තස්ස සවණෙනපි අකතං හොති, බාහුසච්චෙනපි අකතං හොති, දිට්ඨියාපි අප්පටිවිද්ධං හොති, සාමායිකම්පි[5] විමුත්තිං න ලභති. සො කායස්ස භෙදා පරං මරණා හානාය පරෙති නො විසෙසාය, හානගාමීයෙව[6] හොති නො විසෙසගාමී. (1)

---

1 කාලංකතො - මජ්සං. 2 පත්තො - මජ්සං. 3 පෙත්තෙය්‍යොපිස්ස - සීමු.
4. අම්මකා, අම්මකසඤ්ඤා - මජ්සං, අම්බකා අම්බකසඤ්ඤා, සතා,
5 සාමායිකම්පි - මජ්සං, අට්ඨකථා. 6. හානගාමිංයෙව - අට්ඨකථා.

වහන්ස, ආනන්දයෙනි, යම් ධර්මයෙක්හි බ්‍රහ්මචාරී හා අබ්‍රහ්මචාරී හා දෙදෙන පරලොව්හි සම සම ගති ඇතිවූහු යන භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද මෙ ධර්මය කිසෙයින් කිසෙයින් දතයුත්තේ දැ'යි?

බුහුනතියනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසෙයින් ම තෙල ව්‍යාකෘත ය.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මිගසාලා උවැසියගේ නිවෙස්-නෙහි පිණ්ඩපාතය ගෙණ හුනස්නෙන් නැඟී වැඩියහ. එකල ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පසුබත්හි පිඬුවායෙන් වැලැකියාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ:

වහන්ස, මම පෙරවරුයෙහි හැඳපෙරව පාසිවුරු ගෙණ මෙ ගැවැත්හි මිගසාලා උවැසියගේ නිවෙස්නට එළඹියෙමි. එළඹ පැන වූ අස්නෙහි හුන්මි. වහන්ස, ඉක්බිති මිගසාලා උපාසිකා මා කරා එළඹියා. එළඹ මා වැඳ එකත්පසෙක හුනු. එකත්පසෙක හිඳ මිගසාලා උවැසි මට තෙල පැවැසූ:

වහන්ස, ආනන්දයෙනි, යම් ධර්මයෙක්හි බ්‍රහ්මචාරී හා අබ්‍රහ්මචාරී හා දෙදෙන පරලොව්හි සම සම ගති ඇත්තාහු වූහු යන භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද මෙ දහම් කිසෙයින් කිසෙයින් දතයුතු ද? වහන්ස, මපියාණෝ පුරාණයෝ ග්‍රාමධර්ම වූ මෛථුනයෙන් වැලැකියාහු දුරු වූවාහු බ්‍රහ්මචාරී වූහ. "සකෘදාගාමී පුද්ගල වූ උහු කාලක්‍රියා කළාහු තුසිතදේවකායට එළඹියහ"යි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘත ය. වහන්ස, මාගේ පිතෘව්‍යයෙක් (සුළුපියෙක්) වූ ඉසිදත්ත අබ්‍රහ්මචාරී වූයේ සවදාරයන් හා සන්තුෂ්ට වී ය. "හේ ද සකෘදාගාමී පුද්ගල වූයේ කළුරිය කොළේ තුසිතකායට එළඹියැ"යි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘත ය. වහන්ස, යම් ධර්මයෙක්හි බ්‍රහ්මචාරී හා අබ්‍රහ්මචාරී හා දෙදෙන පරලොව්හි සම සම ගති ඇති වූහු යන භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද මෙ ධර්මය කිසෙයින් කිසෙයින් දතයුතුදැ'යි?

වහන්ස, මෙසේ කී කල්හි මම මිගසාලා උවැසියට තෙල කීමි: "බුහුනනියනි, භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල මෙසෙයින් ම ව්‍යාකෘත ය"යි.

ආනන්දයෙනි, මාගම් වූ මාගම්නුවණින් සමන්වාගත වූ බාල වූ මිගසාලා උවැසි කවරි? පුරුෂපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරතාඥනයෙහි නො පැකිළ පවත්නා නුවණ ඇති තථාගතයෝ කවරහ?

ආනන්දයෙනි, මෙ පුගුලෝ සදෙනෙක් ලොව විද්‍යමානයහ. කවර සදෙනෙක යත්:

ආනන්දයෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් සුඛසංවාස ඇතියේ මැනැවින් සුරත වෙයි. සබ්‍රහ්මචාරිහු (උහු හා) එකතොවාසයෙන් තුස්නාහ. උහු විසින් කණින් ඇසියයුතු දැය ද නො අසනලද වෙයි. (වියෂ්ති සඞ්ඛ්‍යාත) බහුශ්‍රැතභාවයෙන් කළමනා දැය ද නො කරනලද වෙයි. සම්‍යක්දෘෂ්ටියෙන් පිළිවිදිය මනා දැය ද නො පිළිවිදිනාලද වෙයි. සාමයිකවිමුක්තිය (කලින්-කල ධර්මශ්‍රවණය නිසා ලබන ප්‍රීති ප්‍රාමොද්‍යය) ද නො ලබන්නේ වෙයි. හේ කාලුත් මරණින් මතු පරිහානියට ම යෙයි. විශේෂයට නො යෙයි. හානගාමියෙක් ම වෙයි. විශේෂගාමියෙක් නො වෙයි. (1)

ඉධානන්ද එකච්චො පුග්ගලො සොරතො හොති සුඛසංවාසො. අභිනන්දන්ති සබ්‍රහ්මචාරී එකත්තවාසෙන. තස්ස සවණෙනපි කතං හොති. බාහුසච්චෙනපි කතං හොති. දිට්ඨියාපි සුප්පටිවිද්ධං[1]. හොති. සාමයිකම්පි විමුත්තිං ලභති. සො කායස්ස භෙදා පරං මරණා විසෙසාය පරෙති නො හානාය. විසෙසගාමීයෙව[2] හොති නො හානගාමී. (2)

තත්‍රානන්ද පමාණිකා[3] පමිණන්ති: ඉමස්සපි තෙව ධම්මා, අපරස්සපි තෙව ධම්මා. කස්මා තෙසං එකො හීනො, එකො පණීතොති. තං හි තෙසං ආනන්ද හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය.

තත්‍රානන්ද ය්වායං පුග්ගලො සොරතො[4]. හොති සුඛසංවාසො. අභිනන්දන්ති සබ්‍රහ්මචාරී එකත්තවාසෙන. තස්ස සවණෙනපි කතං හොති. බාහුසච්චෙනපි කතං හොති. දිට්ඨියාපි සුප්පටිවිද්ධං[1] හොති. සාමයිකම්පි විමුත්තිං ලභති. අයම්පි ආනන්ද පුග්ගලො අමුනා පුරිමෙන පුග්ගලෙන අභික්කන්තතරො ච පණීතතරො ච. තං කිස්ස හෙතු? ඉමං හානන්ද පුග්ගලං ධම්මසොතො නිබ්බහති. තදන්තරං කො ජානෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන?

තස්මාතිහ ආනන්ද මා පුග්ගලෙසු පමාණිකා[3] අහුවත්ථ. මා පුග්ගලෙසු පමාණං ගණ්හිත්ථ. ඛඤ්ඤති හානන්ද පුග්ගලෙසු පමාණං ගණ්හන්තො.

අහං වා ආනන්ද පුග්ගලෙසු පමාණං ගණ්හෙය්‍යං යො වා පනස්ස මාදිසො.

ඉධ පනානන්ද එකච්චස්ස පුග්ගලස්ස කොධමානො අධිගතො හොති සමයෙන සමයඤ්චස්ස ලොභධම්මා උප්පජ්ජන්ති. තස්ස සවණෙනපි අකතං හොති. බාහුසච්චෙනපි අකතං හොති. දිට්ඨියාපි අප්පටිවිද්ධං හොති. සාමයිකම්පි විමුත්තිං න ලභති. සො කායස්ස භෙදා පරම්මරණා හානාය පරෙති, නො විසෙසාය, හානගාමීයෙව හොති, නො විසෙසගාමී. (3)

ඉධ පනානන්ද එකච්චස්ස පුග්ගලස්ස කොධමානො අධිගතො හොති. සමයෙන. සමයඤ්චස්ස ලොභධම්මා උප්පජ්ජන්ති. තස්ස සවණෙනපි කතං හොති -පෙ- නො හානගාමී. (4)

තත්‍රානන්ද පමාණිකා පමිණන්ති -පෙ- යො වා පනස්ස මාදිසො.

ඉධ පනානන්ද එකච්චස්ස පුග්ගලස්ස කොධමානො අධිගතො හොති. සමයෙන සමයඤ්චස්ස වචීසංඛාරා[5] උප්පජ්ජන්ති. තස්ස සවණෙනපි අකතං හොති. බාහුසච්චෙනපි අකතං හොති. දිට්ඨියාපි අප්පටිවිද්ධං හොති. සාමයිකම්පි විමුත්තිං න ලභති. සො කායස්සභෙදා පරම්මරණා හානාය පරෙති නො විසෙසාය, හානගාමීයෙව හොති නො විසෙසගාමී. (5)

1. පටිවිද්ධං - මජසං
2. විසෙසගාමීයෙව - සීමු.
3. පමාණිකා - මජසං - සීමු
4. සුරතො - සීමු.
5 වචීසඞ්ඛාරා - මජසං.

Free Distribution www.aathaapi.org

ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් සුඛසංවාස ඇතියේ සොරත වෙයි. සබ්‍රහ්මචාරීහු එකතෝවාසයෙන් ඔහු හා තුෂ්නාහ. උහු විසින් කණ්ණිහුදු අසා කලමනා කරන ලද වෙයි, වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත බහුශ්‍රුතභාවයෙනුදු කලමනා කරන ලද වෙයි, නුවණිනුදු පිළිවිදියයුතු දෑ මොනොවට පිළිවිදිනා ලද වෙයි, සාමයිකවිමුක්තිය ද ලබන්නේ ය. හේ කාලූත් මරණින් මතු විශේෂයට යෙයි, පරිහානියට නො යෙයි. විශෙෂගාමියෙක් ම වෙයි, හානගාමියෙක් නො වෙයි. (2)

ආනන්දයෙනි, එ කරුණෙහි ලා (පුද්ගලයන් කෙරෙහි) ප්‍රමාණග්‍රාහකයෝ පමණ කෙරෙත්: “මොහුගේ ද එම දහම්හු වෙති අනෙකාගේ ද එම දහම්හු වෙති. කවර හෙයින් උන් අතුරෙහි එකෙක් (ගුණයෙන්) හීන වේ ද, එකෙක් ප්‍රණීත වේ දැ”යි. ආනන්දයෙනි, ඔවුන්ගේ ඒ ප්‍රමාණකරණය දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වෙයි.

ආනන්දයෙනි, එ පුහුලන් අතුරෙහි යම් මෙ පුද්ගලයෙක් සුඛසංවාස ඇතියේ සුරත වේ ද, සබ්‍රහ්මචාරීහු එකතෝවාසයෙන් තුෂ්නාහු ද, ඔහු විසින් කණ්ණිහුදු කලමනා කරන ලද වෙයි. වීර්‍ය්‍යයෙනුදු කලමනා කරන ලද වෙයි. දෘෂ්ටියෙනුදු මොනොවට පිළිවිදිනා ලද වෙයි. සාමයිකවිමුක්තිය ද ලබන්නේය. ආනන්දයෙනි, මේ පුහුල් ද පෙල පළමු පුහුල්හුගෙන් සුන්දරතරත් වෙයි. ප්‍රණීතතරත් වෙයි. ඒ කවරහෙයින යත්: ආනන්දයෙනි, (විදර්ශනාඥාන සඞ්ඛ්‍යාත) ධර්මස්‍රෝතස මෙ පුහුල් ආර්‍ය්‍යභූමියට පමුණුවයි. තථාගතයන් මුත් අන් කවරෙක් එ අන්තරය (කරුණ) දන්නේ ද?

ආනන්දයෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා පුහුලන් කෙරෙහි නහමක් ප්‍රාමාණික වවු. පුහුලන් අතුරෙහි නහමක් ප්‍රමාණ ගණුව. ආනන්දයෙනි, පුහුලන් අතුරෙහි පමණ ගණුයේ ගුණ විසින් සෑරේ මැ යි.

ආනන්දයෙනි, මම ම හෝ අවශ්‍යයෙන් පුහුලන් අතුරෙහි පමණ ගන්නෙමි. මා බඳු යමෙක් (බුදුවරයෙක්) හෝ වේ නම්, හේ හෝ පමණ ගන්නේ ය

ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයකු විසින් ක්‍රෝධය හා මානය අධිගත (පැමිණෙන ලද) වෙයි කලින් කල ඔහට ලෝභධර්මයෝ උපදනාහ. ඔහු විසින් කණ්ණිහුදු කලමනා නො කරන ලද වෙයි. වැරයෙනුදු කලමනා නො කරන ලද වෙයි. දෘෂ්ටියෙනුදු නො පිළිවිදිනා ලද වෙයි. සාමයිකවිමුක්තිය ද නො ලබන්නේ ය. හේ කාලූත් මරණින් මතු පිරිහීමට යෙයි, විශේෂයට නො යෙයි. හානගාමී ම වෙයි. විශේෂගාමී නො වෙයි. (3)

ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලකු විසින් ක්‍රෝධය හා මානය අධිගත වෙයි. කලින් කල ඔහට ලෝභධර්මයෝ උපදනාහ. ඔහු විසින් කණ්ණිහුදු කලමනා කරන ලද වෙයි ... හානගාමී නො වේ. (4)

ආනන්දයෙනි, එහි ලා ප්‍රාමාණිකයෝ පමණ කෙරෙත් ... යමෙක් මා බඳු වේ නම් හේ හෝ පමණ ගන්නේ ය.

ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලකු විසින් ක්‍රෝධමානය අධිගත වෙයි. කලින් කල ඔහට වචීසංස්කාරයෝ (අලාපසල්ලාප වචන) උපදනාහ, ඔහු විසින් කණ්ණිහුදු කලමනා නො කරන ලද වෙයි, වැරයෙනුදු කලමනා නො කරන ලද වෙයි, නුවණිනුදු නො පිළිවිදිනා ලද වෙයි, සාමයිකවිමුක්තිය ද නො ලබන්නේ ය. හෙ කාලූත් මරණින් මතු පරිහානියට යෙයි, විශේෂයට නො යෙයි. හානගාමී ම වෙයි, විශේෂගාමී නො වෙයි. (5)

ඉධ පනානන්ද එකච්චස්ස පුග්ගලස්ස කොධමානො අධිගතො හොති. සමයෙන සමයඤ්චස්ස වචීසංඛාරා[1] උප්පජ්ජන්ති. තස්ස සවණෙනපි කතං හොති. බාහුසච්චෙනපි කතං හොති. දිට්ඨියාපි පටිවිද්ධං හොති. සාමයිකම්පි විමුත්තිං ලභති. සො කායස්ස භෙදා පරම්මරණා විසෙසාය පරෙති නො හානාය, විසෙසගාමීයෙව හොති, නො හානගාමී. (6)

තත්‍රානන්ද පමාණිකා පමිණන්ති: ඉමස්සපි තෙව ධම්මා, අපරස්සපි තෙව ධම්මා. කස්මා තෙසං එකො හීනො, එකො පණීතොති? තං හි තෙසං ආනන්ද හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය.

තත්‍රානන්ද යස්ස පුග්ගලස්ස කොධමානො අධිගතො හොති. සමයෙන සමයඤ්චස්ස වචීසංඛාරා උප්පජ්ජන්ති. තස්ස සවණෙනපි කතං හොති බාහුසච්චෙනපි කතං හොති. දිට්ඨියාපි සුප්පටිවිද්ධං හොති. සාමයිකම්පි විමුත්තිං ලභති. අයං ආනන්ද පුග්ගලො අමුනා පුරිමෙන පුග්ගලෙන අභික්කන්තතරො ච පණීතතරො ච. තං කිස්ස හෙතු: ඉමං හානන්ද පුග්ගලං ධම්මසොතො නිබ්බහති. තදන්තරං කො ජානෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන?

තස්මාතිහ ආනන්ද මා පුග්ගලෙසු පමාණිකා අහුවත්ථ, මා පුග්ගලෙසු පමාණං ගණ්හිත්ථ. ඛඤ්ඤති හානන්ද පුග්ගලෙසු පමාණං ගණ්හන්තො.

අහං වා ආනන්ද පුග්ගලෙසු පමාණං ගණ්හෙය්‍යං, යො වා පනස්ස මාදිසො.

කා චානන්ද මිගසාලා උපාසිකා බාලා අබ්‍යත්තා අම්බකා අම්බකපඤ්ඤා? කෙ ච පුරිසපුග්ගලපරොපරියඤාණෙ?

ඉමෙ ඛො ආනන්ද ඡ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

යථාරූපෙන ආනන්ද සීලෙන පුරාණො සමන්නාගතො අහොසි, තථාරූපෙන සීලෙන ඉසිදත්තො සමන්නාගතො අභවිස්ස, නයිධ පුරාණො ඉසිදත්තස්ස ගතිම්පි අඤ්ඤස්ස. යථාරූපාය ච ආනන්ද පඤ්ඤාය ඉසිදත්තො සමන්නාගතො අහොසි, තථාරූපාය පඤ්ඤාය පුරාණො සමන්නාගතො අභවිස්ස, නයිධ ඉසිදත්තො පුරාණස්ස ගතිම්පි අඤ්ඤස්ස. ඉති ඛො ආනන්ද ඉමෙ පුග්ගලා උභො එකඞ්ගහීනාති.

1 වචීසංඛාරා - ඡසං.

ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයකු විසින් ක්‍රෝධමානය අධිගත වෙයි. ඔහට කලින් කල වචීසංසාරයෝ උපදිත්. ඔහු විසින් ශ්‍රවණයෙහුදු කරන ලද වෙයි. බහුශ්‍රැතභාවයෙහුදු කරන ලද වෙයි. දෘෂ්ටියෙහුදු පිළිවිදිනා ලද වෙයි. සාමයික විමුක්තිය ද ලබයි. හෙ කාබුන් මරණින් මතු විශේෂයට යෙයි, පරිහානියට නො යෙයි. විශෙෂගාමී ම වෙයි, හානගාමී නො වෙයි. (6)

ආනන්දයෙනි, එහි ලා ප්‍රාමාණිකයෝ ප්‍රමාණ කරත්: මොහුගේ ද එ ම ධර්මයෝ ම වෙති, අනෙකාගේ ද එ ම ධර්මයෝ වෙති, කවර හෙයින් ඔවුනතුරෙන් එකෙක් හීන වේ ද, එකෙක් ප්‍රණීත වේ ද? යි. ආනන්දයෙනි, ඔවුන්ගේ එ ප්‍රමාණ කරණය දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වෙයි.

ආනන්දයෙනි, එහි ලා යම් පුහුලකු විසින් ක්‍රෝධමානය අධිගත වේ නම්, කලින් කල ද ඔහට වචීසංසාරයෝ උපදනාහු නම්, ශ්‍රවණයෙහුදු කරන ලද වේ නම්, බහුශ්‍රැත භාවයෙහුදු කරන ලද වේ නම්, දෘෂ්ටියෙහුදු පිළිවිදිනාලද වේ නම්, සාමයික විමුක්තිය ද ලබා නම්, ආනන්දයෙනි, මෙ පුහුල් අසු පළමු පුහුලාගෙන් විශිෂ්ටතර ද ප්‍රණීතතර ද වෙයි. ඒ කවර හෙයින යත්: ආනන්දයෙනි, (නිපුණ විදර්ශනාඥාන සඞ්ඛ්‍යාත) ධර්මස්‍රොතස මෙ පුහුල් ආර්‍යභූමියට පමුණුවයි. තථාගතයන් මුත් කවරෙක් ඒ කරුණ දන්නේ ද?

ආනන්දයෙනි, එහෙයින් ම මෙ කරුණෙහි ලා පුහුලන් කෙරෙහි ප්‍රාමාණික නො වව. පුහුලන් කෙරෙහි ප්‍රමාණය නහමක් ගණුව. ආනන්දයෙනි, පුහුලන් කෙරෙහි පමණ ගන්නේ (උන්) ගුණ සාරාලයි.

ආනන්දයෙනි, මම හෝ අවශ්‍යයෙන් පුහුලන් කෙරෙහි පමණ ගන්නෙමි. යමෙක් මා සේ බුදු වේ නම්, හේ හෝ පුහුලන් කෙරෙහි පමණ ගන්නේ ය.

ආනන්දයෙනි, බාල වූ අව්‍යක්ත මාගම් වූ මාගම්නුවණ ඇති මිගසාලා උමැයි කවර? පුරුෂපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරතාඥානයෙහි තථාගතවරයෝ කවරහ?

ආනන්දයෙනි, මෙ (සොරතයෝ දෙදෙන ය, අධිගත ක්‍රොධ මාන ලොභ ඇති දෙදෙන ය, අධිගත ක්‍රොධමාන වචීසංසාර ඇති දෙදෙන ය යන) පුද්ගලයෝ සදෙන ලොව්හි විද්‍යමානයහ.

ආනන්දයෙනි, පුරාණ යම්බඳු ශීලයෙකින් සමන්වාගත වී ද, ඉසිදත්ත එබඳු ශීලයෙන් සමන්වාගත වී නම්, මෙ කරුණෙහි ලා පුරාණ තෙමේ ඉසිදත්තයන්ගේ ඥානගතිය ද නො ම ද න්නේ ය. ආනන්දයෙනි, ඉසිදත්ත යම්බඳු ප්‍රඥායෙකින් සමන්වාගත වී ද, එබඳු වූ ප්‍රඥායෙන් පුරාණ සමන්වාගත වී නම්, මෙ කරුණෙහි ලා ඉසිදත්ත තෙමේ පුරාණයන්ගේ ඥානගතිය ද නො ම දන්නේ වෙයි. ආනන්දයෙනි, මෙසේ මෙ පුහුලෝ දෙදෙන එක් එක් අඞ්ගයෙකින් (ගුණයෙකින්) හීනයහ යි.

(පුරාණ, ශීලයෙන් ද, ඉසිදත්ත ප්‍රඥායෙන් ද විශෙෂි විය. පුරාණයන්ගේ ශීලය ඉසිදත්තයන්ගේ ප්‍රඥාස්ථානයෙහි ද, ඉසිදත්තයන්ගේ, ප්‍රඥාව පුරාණයන්ගේ ශීලස්ථානයෙහි ද විය. පුරාණ ශීලයෙන් ද ඉසිදත්ත ප්‍රඥායෙන් ද විශෙෂවීය – යනු භාවයි.)

## 6. 1. 5. 3

## [ඉණ සුත්තං]

### [කාමපටිනිද්දෙසං]

(1) 45. දාලිද්දියං භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාමභොගිනොති?

එවං භන්තෙ.

(2) යම්පි භික්ඛවෙ දලිද්දො අස්සකො අනාලහියො[1] ඉණං ආදියති. ඉණාදානම්පි භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාමභොගිනොති?

එවං භන්තෙ.

(3) යම්පි භික්ඛවෙ දලිද්දො අස්සකො අනාලහියො ඉණං ආදියිත්වා වඩ්ඪිං පටිසුණාති.[2] වඩ්ඪිපි භික්ඛවෙ දුක්ඛා ලොකස්මිං කාමභොගිනොති?

එවං භන්තෙ.

(4) යම්පි භික්ඛවෙ දලිද්දො අස්සකො අනාලහියො වඩ්ඪිං පටිසුණිත්වා කාලාභතං වඩ්ඪිං න දෙති. චොදෙන්තිපි නං. චොදනාපි භික්ඛවෙ දුක්ඛා ලොකස්මිං කාමභොගිනොති?

එවං භන්තෙ.

(5) යම්පි භික්ඛවෙ දලිද්දො අස්සකො අනාලහියො චොදියමානො න දෙති. අනුචරන්තිපි නං. අනුචරියාපි භික්ඛවෙ දුක්ඛා ලොකස්මිං කාම-භොගිනොති?

එවං භන්තෙ.

(6) යම්පි භික්ඛවෙ දලිද්දො අස්සකො අනාලහියො අනුචරියමානො න දෙති, බන්ධන්තිපි නං. බන්ධනම්පි භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාමභොගි-නොති?

එවං භන්තෙ.

ඉති ඛො භික්ඛවෙ දාලිද්දියම්පි දුක්ඛං ලොකස්මිං කාමභොගිනො. ඉණාදානම්පි දුක්ඛං ලොකස්මිං කාමභොගිනො. වඩ්ඪිපි දුක්ඛා ලොකස්මිං කාමභොගිනො. චොදනාපි දුක්ඛා ලොකස්මිං කාමභොගිනො. අනුචරියාපි දුක්ඛා ලොකස්මිං කාමභොගිනො. බන්ධනම්පි දුක්ඛං ලොකස්මිං කාමභොගිනො.

එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි කුසලෙසු ධම්මෙසු, ඔත්තප්පං නත්ථි කුසලෙසු ධම්මෙසු, විරියං නත්ථි කුසලෙසු ධම්මෙසු, පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු,[1] අයං වුච්චති භික්ඛවෙ අරියස්ස විනයෙ දලිද්දො අස්සකො අනාලහියො. ස ඛො සො භික්ඛවෙ දලිද්දො අස්සකො අනාලහියො, සද්ධාය අසති කුසලෙසු ධම්මෙසු, හිරියා අසති කුසලෙසු ධම්මෙසු, ඔත්තප්පෙ අසති කුසලෙසු ධම්මෙසු, විරියෙ අසති කුසලෙසු ධම්මෙසු, පඤ්ඤාය අසති කුසලෙසු ධම්මෙසු, කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති. මනසා දුච්චරිතං චරති. ඉදමස්ස ඉණාදානස්මිං වදාමි.

---

1 අනාලහිකො - මජසං, අනද්ධිකො - සයා, අනාල්හිකො - සීමු

2 පටිසුණාති - මජසං

## 6. 1. 5. 3

## [ඉණ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

(1) **45.** මහණෙනි, ලොව්හි කාමභෝගීහට දිළිඳුබව දුකෙක් දැ'යි?

වහන්ස, එසේ ය

(2) මහණෙනි, යම් හෙයෙකින් ස්වාපතෙය රහිත (තමන් අයත් ධනය නැති) අනාඪ්‍ය වූ (පොහොසත් නො වූ) දිළින්දෙක් (දිවි පැවැත්ම පිණිස) ණය ගන්නේ නම්, මහණෙනි, ලොව්හි එ කාමභොගිහට ණය ගැණුම ද දුකෙක් දැයි?

වහන්ස එසේ ය.

(3) මහණෙනි, යම් හෙයෙකින් ස්වධන රහිත අනාඪ්‍ය වූ දිළින්දෙක් ණය ගෙණ වෘද්ධිය (=පොලිය) පිළිණ කෙරේ. මහණෙනි වෘද්ධිය ද ලොව්හි ඒ කාමභොගිහට දුකෙක් ද?

වහන්ස, එසේ ය.

(4) මහණෙනි, යම් හෙයෙකින් අස්වක වූ (ධන නැති) අනාඪ්‍ය වූ (බැරි) දිළින්දෙක් වෘද්ධිය පිළිණ කොට නිසි කල්හි අල (දීමට පුහිදෙන) වෘද්ධිය නො දේ නම්, ඔහුට චෝදනා ද කෙරෙත්. මහණෙනි, ලොව්හි ඒ කාම-භොගීහට චෝදනාත් දුකෙක් ද?

වහන්ස, එසේ ය.

(5) මහණෙනි, යම් හෙයෙකින් අස්වක අනාඪ්‍ය දිළිඳු තෙමේ චෝදනා කරණු ලබන්නේ නො දෙයි. මහණෙනි, ඔහු (පිරිස් මැද තිගතිමින්) ලුහුබඳනාහ. මහණෙනි, ලොව්හි කාමභෝගීහට ලුහුබැඳුමුත් දුකෙක් ද?

වහන්ස, එසේ ය.

(6) මහණෙනි, යම්හෙයෙකින් අස්වක අනාඪ්‍ය දිළින්දෙක් ලුහුබඳනා ලබනුයේ නො දෙයි. ඔහු සොරගෙයි දු බඳනාහ. මහණෙනි, ලොව්හි කාමභොගීහට බන්ධනයත් දුකෙක් දැයි.

වහන්ස, එසේ ය.

මහණෙනි, මෙසෙයින් කාමභෝගීහට ලොව්හි දිළිඳුබවත් දුකෙක, ණය ගැණුමුත් ලොව්හි කාමභොගිහට දුකෙක. වෘද්ධියත් ලොව්හි කාම-භොගීහට දුකෙක, චෝදනාත් ලොව්හි කාමභෝගිහට දුකෙක, ලුහුබැඳුමුත් ලොව්හි කාමභොගිහට දුකෙක, බන්ධනයත් ලොව්හි කාමභොගීහට දුකෙක,

මහණෙනි, එපරිදි ම යම් කිසිවකුහට කුශලධර්මයෙහි ශ්‍රද්ධා නැද්ද කුශලධර්මයෙහි හිරි නැද්ද, කුශලධර්මයෙහි ඔතප් නැද්ද, කුශලධර්මයෙහි වීර්‍ය්‍ය නැද්ද, කුශලධර්මයෙහි ප්‍රඥා නැද්ද, මහණෙනි. මෙතෙමේ තමා සතු ගුණ නැතියේ ගුණයෙන් ආඪ්‍ය නො වූයේ දිළිඳු යයි ආර්‍ය්‍ය විනයෙහි කියනු ලැබේ. මහණෙනි, අස්වක වූ අනාඪ්‍ය වූ එ මෙ දිළිඳු තෙම කුශලධර්මයෙහි ශ්‍රද්ධා නැති වත් ම කුශලධර්මයෙහි හිරි නැතිවත් ම කුශලධර්මයෙහි ඔතප් නැතිවත් ම, කුශලධර්මයෙහි වීර්‍ය්‍ය නැති වත් ම, කුශලධර්මයෙහි ප්‍රඥා නැති වත් ම, කයින් දුශ්චරිත කරයි. වචනයෙන් දුශ්චරිත කරයි. මනසින් දුශ්චරිත කරයි. මෙ ඔහුගේ ණය ගැණුම යයි කියම්.

සො තස්ස කායදුච්චරිතස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති: මා මං ජඤ්ඤූති ඉච්ඡති, මා මං ජඤ්ඤූති සඞ්කප්පෙති, මා මං ජඤ්ඤූති වාචං භාසති, මා මං ජඤ්ඤූති කායෙන පරක්කමති. සො තස්ස වචීදුච්චරිතස්ස පටිච්ඡාදනහෙතු -පෙ- සො තස්ස මනොදුච්චරිතස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති: මා මං ජඤ්ඤූති ඉච්ඡති, මා මං ජඤ්ඤූති සඞ්කප්පෙති, මා මං ජඤ්ඤූති වාචං භාසති, මා මං ජඤ්ඤූති කායෙන පරක්කමති. ඉදමස්ස වඩ්ඪියා වදාමි.

තමෙනං පෙසලා සබ්‍රහ්මචාරී එවමාහංසු: “අයඤ්ච සො ආයස්මා එවංකාරී එවංසමාචාරො”ති. ඉදමස්ස චොදනාය වදාමි.

තමෙනං අරඤ්ඤගතං වා රුක්ඛමූලගතං වා සුඤ්ඤාගාරගතං වා විප්පටිසාරසහගතා පාපකා අකුසලවිතක්කා සමුදාචරන්ති. ඉදමස්ස අනුචරියාය වදාමි.

ස ඛො සො භික්ඛවෙ දලිද්දො අස්සකො අනාළ්හිකො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා නිරයබන්ධනෙ වා බජ්ඣති, තිරච්ඡානයොනිබන්ධනෙ වා.●

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි එවංදාරුණං එවංකටුකං එවංඅන්තරායකරං අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය යථයිදං භික්ඛවෙ නිරයබන්ධනං වා තිරච්ඡානයොනිබන්ධනං වා’ති.

34. දාලිද්දියං දුක්ඛං ලොකෙ ඉණාදානං ච වුච්චති,
දලිද්දො ඉණමාදාය භුඤ්ජමානො විහඤ්ඤති.

35. තතො අනුචරන්ති නං බන්ධනම්පි නිගච්ඡති.
එතං හි බන්ධනං දුක්ඛං කාමලාභාභිජප්පිනං.

36. තථෙව අරියවිනයෙ සද්ධා යස්ස න විජ්ජති,
අහිරීකො අනොත්තප්පී පාපකම්මවිනිච්ඡයො.[1]

37. කායදුච්චරිතං කත්වා වචීදුච්චරිතානි ච,
මනොදුච්චරිතං කත්වා මා මං ජඤ්ඤූති[2] ඉච්ඡති.

38. සො සංසප්පති කායෙන වාචාය උද චෙතසා,
පාපකම්මං පවඩ්ඪෙන්තො තහිං තහිං පුනප්පුනං.

39. සො පාපකම්මො දුම්මෙධො ජානං දුක්කටමත්තනො,
දලිද්දො ඉණමාදාය භුඤ්ජමානො විහඤ්ඤති,

40. තතො අනුචරන්ති නං සඞ්කප්පා මානසා දුඛා,
ගාමෙ වා යදි වා රඤ්ඤෙ යස්ස විප්පටිසාරජා.

1 පාපකම්මවිනිබ්බයො - මජ්සං, පාපකම්මවිනිච්ඡයො - සීමු, පාපකම්මං විනිබ්බයො - සභා.
2 ජඤ්ඤූති - මජ්සං
● එත්ථ “ඉදමස්ස බන්ධනස්මිං වදාමි” ඉති භවිතබ්බන්ති ඛායති. තථාපි තං පොත්ථකෙසු න දිස්සතෙ.

හේ ඒ කායදුශ්චරිතයාගේ ප්‍රතිච්ඡාදනහෙතුයෙන් ලාමක ඉච්ඡාව පිහිටුවයි. 'මා නහමින් දනීව'යි කැමැති වෙයි. 'මා නහමක් දනීව'යි සඞ්කල්පනා කෙරෙයි. 'මා නහමක් දනීව'යි වදන් බෙණෙයි 'මා නහමක් දනීවයි' කයින් පැරකුම් කෙරෙයි. හේ ඒ වාගදුශ්චරිතයාගේ ප්‍රතිච්ඡාදන හේතුයෙන් ... හේ ඒ මනොදුශ්චරිතයාගේ ප්‍රතිච්ඡාදන හේතුයෙන් ලමු ඉච්ඡා පිහිටුවයි. 'මා නහමක් දනීව'යි කැමැති වෙයි. 'මා නහමක් දනීව'යි සඞ්කල්පනා කෙරෙයි. 'මා නහමක් දනීව'යි වදන් බෙණෙයි. 'මා නහමක් දනීව'යි කයින් පැරකුම් කෙරෙයි. මේ ඔහුගේ වෘද්ධි යයි (පොලී-පිළිණ යයි) කියමි.

ඔහුට ප්‍රියශීල සබ්‍රහ්මචාරිහු මෙසේ කියත්: 'එ මෙ ආයුෂ්මත් මෙසේ කරණසුලු ය. මෙබඳු සමාචාර ඇතියෙකැ'යි. මෙ ඔහුට චොදනා යයි කියමි.

අරණ්‍යගත වේවයි වෘක්ෂමූලගත වේවයි ශූන්‍යාගාරගත වේවයි ඔහුට විපිළිසර සහගිය ලමු අකුශල විතර්කයෝ පහළ වෙත්. මෙ ඔහුට අනුචරියා යයි (ලුහුබැඳුම්) යයි කියමි.

මහණෙනි, අසවක වූ අනාඪ්‍ය වූ එ දිළිඳු තෙමේ කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට මනසින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු නිරැබැඳුම්හි හෝ බැඳෙයි. තිරිසන්යොන්බැඳුම්හි හෝ බැඳෙයි,

මහණෙනි, අනුත්තරයොගක්ෂෙමාධිගමය සඳහා යම් ම ධර්මයෙක් මෙසේ දරුණු වේ නම්, මෙසේ කටුක වේ නම්, මෙසේ අන්තරායකර වේ නම්, මහණෙනි, මේ නිරැබැඳුම හෝ මෙ තිරිසන්යොන්බැඳුම හෝ යම් පරිදි වේ නම්, එබඳු අන් එක ද දහමක් මම නුවණැසින් නො දක්මි.

34. ලොව්හි දිළිඳු බව ද ණය ගැණුම ද දුකැයි කියනු ලැබේ. දිළිඳු වූයේ ණය ගෙණ වළඳ කරණුයේ වැනසේ.

35 එහෙයින් ඔහු (ගැරහීම් විසින්) ලුහුබඳිත්. (නිරයාදියෙහි) බැඳුමට ද යෙයි. කාමලාභ පතනුවනට මෙල බැඳුම දුක් මැයි.

36 එසෙයින් ම ආර්‍යවිනයෙහි යමකුට ශ්‍රද්ධා නැද්ද, හිරි නැද්ද, ඔතප් නැද්ද, පව්කම්හි විතිශබය නැද්ද,

37. හේ කායදුශ්චරිත හා වාගදුශ්චරිත කොට, මනොදුශ්චරිත ද කොට 'මා නහමක් දනිම'යි කැමැති වේ.

38 හෙ එ් එ් තැන්හි දුන පුනා පව්කම් වඩනුයේ, කයින් වදනින් වැලිදු සිතින් සැලෙයි.

39. දුමේධ වූ පවුකම් ඇති හේ තමන්ගේ දුෂ්කෘත දන්මින්, දිළිඳු වූයේ ණය ගෙණ වළඳ කෙරෙම්න් වැනසෙයි.

40. එහෙයින් යමකුට විපිළිසරින් හටගත් දුක් වූ මානසිකසඞ්කල්පයෝ වෙත් නම්, ඔහු ගම්හි වේවයි, වැලින් වල්හි වේවයි ඒ පුඟුල් ලුහුබඳිත්.

41. සො පාපකම්මො දුම්මෙධො ජානං දුක්කටමත්තනො,
ගොත්තිමඤ්ඤතරං ගන්ත්වා නිරයෙ චාපි බජ්ඣති.
එතං හි බන්ධනං දුක්ඛං යම්හා ධීරො පමුච්චති.

42. ධම්මලද්ධෙහි භොගෙහි දදං චිත්තං පසාදයං
උභයත්ථ කටග්ගාහො සද්ධස්ස ඝරමෙසිනො.

43. දිට්ඨධම්මහිතත්ථාය සම්පරාය සුඛාය ච
එවමෙතං ගහට්ඨානං චාගො පුඤ්ඤං පවඩ්ඪති.

44. තථෙව අරියවිනයෙ සද්ධා යස්ස පතිට්ඨිතා
හිරිමනො ච ඔත්තප්පී පඤ්ඤවා සීලසංවුතො.

45. එසො ඛො අරියවිනයෙ සුඛංජීවීති[1] වුච්චති
නිරාමිසං සුඛං ලද්ධා උපෙඛං අධිතිට්ඨති.

46. පඤ්චනීවරණෙ හිත්වා නිච්චං ආරද්ධවීරියො
ඣානානි උපසම්පජ්ජ ඒකොදි නිපකො සතො.

47. එවං ඤත්වා යථාභූතං සබ්බසඤ්ඤොජනක්ඛයෙ
සබ්බසො අනුපාදාය සම්මාචිත්තං විමුච්චති.

48. තස්ස සම්මා විමුත්තස්ස ඤාණං ච හොති තාදිනො
අකුප්පා මෙ විමුත්තීති භවසඤ්ඤොජනක්ඛයෙ.

49. එතං ඛො පරමං ඤාණං එතං සුඛමනුත්තරං
අසොකං විරජං ඛෙමං එතමානණ්‍යමුත්තමන්ති.

## 6. 1. 5. 4.

## [මහාචුන්ද සුත්තං]

**46.** එවං මෙ සුතං එකං සමයං ආයස්මා **මහාචුන්දො චෙතීසු** විහරති **සහජාතියං**.[2] තත්‍ර ඛො ආයස්මා මහාචුන්දො භික්ඛූ ආමන්තෙසි: 'ආවුසො භික්ඛවො'ති[3] 'ආවුසො'ති' ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාචුන්දස්ස පච්චස්සොසුං. ආයස්මා මහාචුන්දො එතදවොච:

(1) ඉධාවුසො ධම්මයොගා භික්ඛූ ඣායීභික්ඛූ අපසාදෙන්ති: ඉමෙ පන "ඣායිනොම්හා ඣායිනොම්හා'ති ඣායන්ති, පජ්ඣායන්ති,[4] කිං හිමෙ ඣායන්ති,[5] කින්තිමෙ ඣායන්ති, කථං හිමෙ[6] ඣායන්තී"ති. තත්‍ර ධම්මයොගා ච භික්ඛූ නප්පසීදන්ති, ඣායී ච භික්ඛූ නප්පසීදන්ති, න ච බහුජනහිතාය පටිපන්නා හොන්ති බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

1. සුඛජීවිනී - මජ්සං.
2. සයංජාතියං - මජ්සං., සජ්ජාතියං - සතා
3. භික්ඛවෙති - මජ්සං.
4. නිජ්ඣායන්ති අවජ්ඣායන්ති - මජ්සං.
5. කිම්මෙඣායන්ති - මජ්සං.
6. කථං ඉමෙ - මජ්සං.

41. පව්කම් ඇති ඒ දුර්මේධ තෙමේ තමන්ගේ දුෂ්කෘත දත්තේ අන්‍යතර තිරිසන් යෝනියකට ගොස් හෝ නිරයෙහි හෝ බැඳේ. යම් බන්ධනයකින් ධීරතෙමේ මිදේ නම්, තෙල බන්ධනය දුක් මැයි.

42. දැහැමින් ලද භෝගයෙන් සිත්පහදමින් දෙන්නුයේ වේ ද, එබඳු සැදැහැති ගෘහපතින්නුගේ දෙලොවෙහි ජයග්‍රහණය වේ.

43. දිට්ඨධර්මයෙහි හිත පිණිස ද පරලොවෙහි සුව පිණිස ද මෙලෙසින් ගෘහස්ථයන්ගේ තෙල ත්‍යාග නම් පුණ්‍යය වැඩෙයි.

44. එසෙයින් ම යමෙක්හට ආර්‍යවිනයෙහි සැදැහැ පිහිටියේ ද, යේ හිරියෙන් යුත් සිත් ඇත්තේ, ඔතප් ඇත්තේ, ප්‍රාඥවත් වූයේ, ශීලයෙන් සංවෘත වේ ද,

45. තෙල පුහුල් අරිව්‍යයෙහි සුවසේ දිවි වටනේ යයි කියනුලැබේ. නිරාමිස සුඛය (තුන් දැහැන් නිසා උපදනා සුවය) ලැබ (චතුර්ථධ්‍යාන) උපේක්ෂාවත් ලබන්නේ ය.

46. නිරතුරු ඇරඹූ වැර ඇත්තේ පඤ්චනීවරණයන් හැරපියා ධ්‍යාන උපයා ගෙණ එකඟසිත් ඇත්තේ නුවණ ඇත්තේ සමාහිමත් වෙයි.

47. මෙසේ සර්වසංයෝජනක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි යථාභූතය දැන සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාදි විසින් නො ගැණීමෙන් සම්‍යග් හේතු විසින් මාර්ගවිත්තයග (කෙලෙසුන්ගෙන්) මිදෙයි.

48. මැනැවින් විමුක්ත සිත් ඇති මොනොවට එහි පිහිටි එ රහත්හට ඉදින් "මාගේ මාර්ගඵල විමුක්තිය අකොප්‍යය"යි භවසංයෝජන-ක්ෂයෙහි පස්විකුම්නැණ වේ නම්,

49. තෙල ඥානය ම පරම වෙයි. තෙල සුඛය ම අනුත්තර වෙයි. ශෝක රහිත රාගාදි රජස් රහිත තෙල අර්හත්ඵලය උත්තම අනණභාවය (ණය නැති බව) වෙයි.

## 1. 6. 5. 4.

## [මහාචුන්ද සූත්‍රය]

46. මා විසින් මෙසේ අසනලද. එක් සමයෙක්හි ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ චෙතිරට සහජාති නම් නියම්ගම්හි වෙසෙත්. එකල්හි ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ 'ඇවැත්නි, මහණෙනි'යි භික්ෂූන් ඇමතූහ. 'ඇවැත්නි'යි එ භික්ෂූහු ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවන්හට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ තෙල දෙසූහ:

(1) ඇවැත්නි, මෙ සස්නෙහි ධර්මකථික භික්ෂූහු භාවනානුයෝගී භික්ෂූන් සටා බෙණෙත්: "මොහු '(අපි) ධ්‍යාන වඩන්නමෝ'යි 'ධ්‍යාන වඩන්නමෝ'යි සිතත්. ප්‍රකාශියෙන් සිතත්. මොහු කුමක් නම් ධ්‍යාන කෙරෙත් ද, මොහු කුමක් පිණිස නම් ධ්‍යාන කෙරෙත් ද, මොහු කිනම් කරුණෙකින් ධ්‍යාන කෙරෙත් ද"යි. එකරුණෙහි ලා ධර්මකථික භික්ෂූහු ද නො පහදනාහ. ධ්‍යාන කරන භික්ෂූහු ද නො පහදනාහ. ඔහු බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට අර්ථ පිණිස හිත පිණිස දෙව් මිනිස්නට සුව පිණිස නො පිළිපන්නු ද වෙත්.

(2) ඉධ පනාවුසො ඣායී භික්ඛූ ධම්මයොගෙ භික්ඛූ අපසාදෙන්ති: ඉමෙ පන "ධම්මයොගම්හා ධම්මයොගම්හා"ති උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතී අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා. කිං හිමෙ ධම්මයොගා, කින්තිමෙ ධම්මයොගා, කථං හිමෙ[1] ධම්මයොගාති? තත්‍ථ ඣායී ච භික්ඛූ නප්පසීදන්ති, ධම්මයොගා ච භික්ඛූ නප්පසීදන්ති, න ච බහුජනහිතාය පටිපන්නා හොන්ති බහුජනසුඛාය බහුනො ජනස්ස අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

(3) ඉධ පනාවුසො ධම්මයොගා භික්ඛූ ධම්මයොගානංයෙව භික්ඛූනං වණ්ණං භාසන්ති, නො ඣායීනං භික්ඛූනං වණ්ණං භාසන්ති. තත්‍ථ ධම්මයොගා ච භික්ඛූ නප්පසීදන්ති, ඣායී ච භික්ඛූ නප්පසීදන්ති, න ච බහුජනහිතාය පටිපන්නා හොන්ති බහුජනසුඛාය බහුනො ජනස්ස අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

(4) ඉධ පනාවුසො ඣායී භික්ඛූ ඣායීනංයෙව භික්ඛූනං වණ්ණං භාසන්ති නො ධම්මයොගානං භික්ඛූනං වණ්ණං භාසන්ති. තත්‍ථ ඣායී ච භික්ඛූ නප්පසීදන්ති, ධම්මයොගා ච භික්ඛූ නප්පසීදන්ති, න ච බහුජනහිතාය පටිපන්නා හොන්ති බහුජනසුඛාය, බහුනො ජනස්ස අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

(5) තස්මාතිහාවුසො එවං සික්ඛිතබ්බං: ධම්මයොගා සමානා ඣායීනං භික්ඛූනං වණ්ණං භාසිස්සාමාති. එවං හි වො ආවුසො සික්ඛිතබ්බං. තං කිස්ස හෙතු. අච්ඡරියා හෙතෙ ආවුසො පුග්ගලා දුල්ලභා ලොකස්මිං, යෙ අමතං ධාතුං කායෙන ඵුසිත්වා[2] විහරන්ති.

(6) තස්මාතිහාවුසො එවං සික්ඛිතබ්බං: ඣායී සමානා ධම්මයොගානං භික්ඛූනං වණ්ණං භාසිස්සාමාති. එවං හි වො ආවුසො සික්ඛිතබ්බං. තං කිස්ස හෙතු: අච්ඡරියා හෙතෙ ආවුසො පුග්ගලා දුල්ලභා ලොකස්මිං, යෙ ගම්භීරං අත්‍ථපදං පඤ්ඤාය අතිවිජ්ඣ පස්සන්තීති.

### 6. 1. 5. 5.

### [පඨමසන්දිට්ඨික සුත්තං]

[සාවත්ථිනිදානං]

47. අථ ඛො මොළියසීවකො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මොළියසීවකො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

'සන්දිට්ඨිකො ධම්මො, සන්දිට්ඨිකො ධම්මො'ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සන්දිට්ඨිකො ධම්මො හොති, අකාලිකො එහිපස්සිකො ඔපනයිකො, පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති?

---

1. කථංඉමෙ - මජසං.
2. ඵස්සිත්වා - සතථි.

Free Distribution www.aathaapi.org

(2) ''ඇවැත්නි, මේ සස්නෙහි දහැන් වඩන මහණහු ධර්මකථිකභික්ෂූන් අපසාදනය කෙරෙති: මොහු වනාහි 'අපි ධර්මයොගීයමෝ' වම්හයි, අපි ධර්මයොගියමෝ වම්හ'යි උඩඟු වූවාහු උද්ගත මානනල ඇත්තාහු චපල වූවාහු දෙඩමලු වූවාහු විසුරුණු තෙපුල් ඇතියාහු නට සිහි ඇතියාහු මනා නුවණ නැතියාහු එකඟ සිත් නැතියාහු බමණ සිත් ඇතියාහු පිගව් (නො දමුනු) ඉඳුරන් ඇතියාහු වෙති. මොහු කුමන ධර්මයොගයක් ඇත්තාහු ද, මොහු කුමක් පිණිස ධර්මයෝග ඇත්තාහු ද, මොහු කිනම් කාරණයකින් ධර්මයෝග ඇත්තාහු ද''යි. එ කරුණෙහි ලා ධ්‍යාන කරණසුලු භික්ෂූහු ද නො පහදිති. ධර්මයොග භික්ෂූහු ද නො පහදිත්. බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට අර්ථ පිණිස දෙව්මිනිස්නට හිත පිණිස සුව පිණිස නො පිළිපත්හු ද වෙත්.

(3) ඇවැත්නි, මෙ සස්නෙහි ධර්මයෝග භික්ෂූහු ධර්මයෝග භික්ෂූන්ගේ ම ගුණ කියති. ධ්‍යායී භික්ෂූන්ගේ ගුණ නො කියත්. එකරුණෙහි ලා ධර්මයෝග භික්ෂූහු ද නො පහදිති, ධ්‍යායීභික්ෂූහු ද නො පහදිත්. බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට අර්ථ පිණිස දෙව්මිනිස්නට හිත පිණිස සුව පිණිස නො පිළිපත්හු වෙත්.

(4) ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ධ්‍යායී භික්ෂූන්ගේ ම ගුණ කියති. ධර්මයෝග භික්ෂූන්ගේ ගුණ නො කියත්. එකරුණෙහි ලා ධ්‍යායී භික්ෂූහු ද නො පහදිති. ධර්මයෝග භික්ෂූහු ද නො පහදිත්. බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට අර්ථ පිණිස දෙව්මිනිස්නට හිතසුව පිණිස නො පිළිපත්හු ද වෙත්.

(5) ඇවැත්නි, එහෙයින් මෙ කරුණෙහි ලා මෙසේ හික්මියයුතු: ධර්මයෝග වූ ම අපි ධ්‍යායී භික්ෂූන්ගේ ගුණ වනන්නම්හ'යි. ඇවැත්නි, මෙසේ ම තොප විසින් හික්මියයුතු යි. ඒ කවරහෙයින යත්: ඇවැත්නි, යම් කෙනෙක් අමෘත නිර්වාණධාතුව නාමකායින් පැහැසැ වෙසෙත් නම්, එ පුද්ගලයෝ දුලබ වෙත් මැ යි.

(6) ඇවැත්නි, එහෙයින් ම මෙ කරුණෙහි ලා මෙසේ හික්මිය යුතු යි. 'ධ්‍යායී වූ ම අපි ධර්මයෝග භික්ෂූන්ගේ ගුණ කියම්හ'යි. ඇවැත්නි, තොප විසින් මෙසේ ම හික්මියයුතු. එ කවර හෙයින යත්: ඇවැත්නි, ලොව්හි යම් කෙනෙක් ගැඹුරු ස්කන්ධධාතු ආදී අර්ථපද විදර්ශනා සහිත මාර්ගප්‍රඥයෙන් විනිවිද දක්නාහු නම් එ පුද්ගලයෝ දුර්ලභ වෙත් මැ යි.

### 6. 1. 5. 5.

### [ප්‍රථමසන්දිට්ඨික සූත්‍රය]

**47**. එකල්හි මොලියසීවක පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් මොලියසීවක පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකෙළේ ය:

''වහන්ස, ධර්මය සාන්දෘෂ්ටික ය, ධර්මය සාන්දෘෂ්ටික ය''යි කියනුලැබේ. වහන්ස,කවර කරුණෙකින් ධර්මය සාන්දෘෂ්ටිකත් අකාලිකත් එහිපස්සිකත් ඕපනයිකත් විඥයන් විසින් තමන් කෙරෙහි ලා දතයුතුත් වේ ද'යි.

තෙන හි සීවක තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි.[1] යථා තෙ ඛමෙය්‍ය තථා තං ව්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි සීවක සන්තං වා අජ්ඣත්තං ලොභං "අත්ථි මෙ අජ්ඣත්තං ලොභොති" පජානාසි, අසන්තං වා අජ්ඣත්තං ලොභං "නත්ථි මෙ අජ්ඣත්තං ලොභොති" පජානාසීති.

එවං භන්තෙ.

යං ඛො ත්වං සීවක සන්තං වා අජ්ඣත්තං ලොභං "අත්ථි මෙ අජ්ඣත්තං ලොභොති පජානාසි. අසන්තං වා අජ්ඣත්තං ලොභං "නත්ථි මෙ අජ්ඣත්තං ලොභොයි" පජානාසි.

එවං ඛො[2] සීවක සන්දිට්ඨිකො ධම්මො හොති -පෙ-

තං කිං මඤ්ඤසි සීවක සන්තං වා අජ්ඣත්තං දොසං -පෙ- සන්තං වා අජ්ඣත්තං මොහං -පෙ- සන්තං වා අජ්ඣත්තං ලොභධම්මං -පෙ- සන්තං වා අජ්ඣත්තං දොසධම්මං -පෙ- සන්තං වා අජ්ඣත්තං මොහ ධම්මං "අත්ථි මෙ අජ්ඣත්තං මොහධම්මොති" පජානාසි, අසන්තං වා අජ්ඣත්තං මොහධම්මං, "නත්ථි මෙ අජ්ඣත්තං මොහ ධම්මොති" පජානාසීති.

එවං භන්තෙ.

යං ඛො ත්වං සීවක සන්තං වා අජ්ඣත්තං මොහධම්මං "අත්ථි මෙ අජ්ඣත්තං මොහධම්මොති පජානාසි, අසන්තං වා අජ්ඣත්තං මොහධම්මං "නත්ථි මෙ අජ්ඣත්තං මොහධම්මොති" පජානාසි.

එවං ඛො සීවක සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

අභික්කන්තං -පෙ- උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 6. 1. 5. 6.

## [දුතියසන්දිට්ඨික සුත්තං]

**[සාවත්ථිනිදානං]**

**48.** අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

'සන්දිට්ඨිකො ධම්මො සන්දිට්ඨිකො ධම්මො'ති භො ගොතම වුච්චති. කිත්තාවතා නු ඛො භො ගොතම සන්දිට්ඨිකො ධම්මො හොති, අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති?

තෙන හි බ්‍රාහ්මණ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරොසි[3]. තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, සන්තං වා අජ්ඣත්තං රාගං 'අත්ථි මෙ අජ්ඣත්තං රාගොති' පජානාසි, අසන්තං වා අජ්ඣත්තං රාගං 'නත්ථි මෙ අජ්ඣත්තං රාගොති' පජානාසීති.

එවං භො.

---

1. පටිපුච්ඡාමි - මජසං, 2. එවම්පි ඛො - මජසං 3. ව්‍යාකරෙය්‍යාසි - මජසං

Free Distribution www.aathaapi.org

සීවකය, මෙ කරුණෙහිම මෙහි ලා තා මැ පුළුවුස්නෙමි. යම් පරිදි තට රුස්සේ නම්, එපරිදි එය ප්‍රකාශ කරව'යි. සීවකය, එ කිමැයි හඟිහි? අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූම ලොභය "මාගේ අධ්‍යාත්මයෙහි ලෝභය ඇතැ"යි දන්හි ද? අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ ම ලොභය "මාගේ අධ්‍යාත්මයෙහි ලොභය නැතැ"යි දන්හි දැ'යි.

වහන්ස, එසේ ය.

සීවකය, යම් හෙයෙකින් තෝ අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ලෝභය "මාගේ අධ්‍යාත්මයෙහි ලෝභය ඇතැ"යි දන්හි නම්, අවිද්‍යමාන වූම ලෝභය මාගේ අධ්‍යාත්මයෙහි ලෝභය නැතැයි දන්හි නම්,

සීවකය, මෙසේ ධර්මය සාන්දෘෂ්ටික (තමන් විසින් දතයුතු) වේ ...

සීවකය, එ කිමැයි හඟිහි ද? අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ද්වෙෂය ... අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ මෝහය .. අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ලෝභධර්මය ... අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ ම ද්වෙෂධර්මය ... අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ ම මෝහධර්මය "මාගේ අධ්‍යාත්මයෙහි මෝහධර්මය ඇතැ"යි දන්හි ද, අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ මෝහධර්මය මාගේ අධ්‍යාත්මයෙහි මෝහධර්මය නැතැ''යි දන්හි දැ''යි.

වහන්ස, එසේ ය.

සීවකය, යම් හෙයෙකින් අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ මෝහධර්මය මාගේ අධ්‍යාත්මයෙහි මෝහධර්මය ඇතැයි දන්හි නම්, අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ මෝහධර්මය "මාගේ අධ්‍යාත්මයෙහි මෝහධර්මය නැතැ"යි දන්හි නම්,

සීවකය, මෙසේ ම ධර්මය සන්දිට්ඨික හා අකාලික හා එහිපස්සික හා ඕපනයික හා විඥයන් විසින් තමන් කෙරෙහි ලා දතයුතුද වන්නේ ය යි.

ඉතා මැනැවැ ... භාග්‍යවතුන්වහන්සේ මා අද පටන් කොට දිවිහිම්-යෙන් සරණ ගිය උපාසකයකු කොට ධරණසේක්වා යි.

## 6. 1. 5. 6.

## [දුතියසන්දිට්ඨික සූත්‍රය]

[සැවැත්නිදානයි]

48. එකල්හි අන්‍යතර බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන්වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන්වහන්සේ සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට එකත්පසෙක සිට එකත්පසෙක හුන් එ බමුණු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකෙළේ:

'භවත් ගෞතමයන් වහන්ස, 'ධර්මය සන්දිට්ඨික ය, ධර්මය සන්දිට්ඨික ය'යි කියනු ලැබේ. භවත් ගෞතමයන්වහන්ස, කවර කරුණෙකින් ධර්මය සාන්දෘෂ්ටික හා අකාලික හා එහිපස්සික හා ඔපනයික හා විඥයන් විසින් ප්‍රත්‍යාත්මයෙහි ලා දතයුතුත් වේ දැයි?

බ්‍රාහ්මණය, එකරුණෙහි ම මෙහි ලා තා මැ පුළුවුස්නෙමි. තට යම් පරිදි රුස්සේ නම් එ පරිදි පාල කරව''යි. බ්‍රාහ්මණය, එ කිමැ'යි හඟිහි ද? අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ රාගය "මාගේ අධ්‍යාත්මයෙහි රාගය ඇතැ''යි දන්හි ද? අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ රාගය "මාගේ අධ්‍යාත්ම-යෙහි රාගය නැතැ'යි දන්නෙහි දැ'යි.

භවත්නි, එසේ ය.

යං ඛො ත්වං බ්‍රාහ්මණ සන්තං වා අජ්ඣත්තං රාගං 'අත්ථි මෙ අජ්ඣත්තං රාගොති' පජානාසි, අසන්තං වා අජ්ඣත්තං රාගං 'නත්ථි මෙ අජ්ඣත්තං රාගොති' පජානාසි.

එවං පි ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකො ධම්මො හොති -පෙ-

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ සන්තං වා අජ්ඣත්තං දොසං -පෙ- සන්තං වා අජ්ඣත්තං මොහං -පෙ- සන්තං වා අජ්ඣත්තං කායසන්දොසං -පෙ- සන්තං වා අජ්ඣත්තං වචීසන්දොසං -පෙ- සන්තං වා අජ්ඣත්තං මනොසන්දොසං 'අත්ථි මෙ අජ්ඣත්තං මනොසන්දොසොති' පජානාසි, අසන්තං වා අජ්ඣත්තං මනොසන්දොසං 'නත්ථි මෙ අජ්ඣත්තං මනොසන්දොසොති' පජානාසීති.

එවං භො.

යං ඛො ත්වං බ්‍රාහ්මණ සන්තං වා අජ්ඣත්තං මනොසන්දොසං 'අත්ථි මෙ අජ්ඣත්තං මනොසන්දොසොති' පජානාසි, අසන්තං වා අජ්ඣත්තං මනොසන්දොසං 'නත්ථි මෙ අජ්ඣත්තං මනොසන්දොසොති' පජානාසි.

එවං ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

[6. 1. 5. 7.]

## ඛෙම සුත්තං

49. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ච ඛෙමො ආයස්මා ච සුමනො සාවත්ථියං විහරන්ති අන්ධවනස්මිං. අථ ඛො ආයස්මා ච ඛෙමො ආයස්මා ච සුමනො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ඛෙමො භගවන්තං එතදවොච:

යො සො භන්තෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤාවිමුත්තො, තස්ස න එවං හොති ''අත්ථි මෙ සෙය්‍යොති වා අත්ථි මෙ සදිසොති වා අත්ථි මෙ හීනොති වා''ති.

ඉදමවොචායස්මා[1] ඛෙමො සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො ආයස්මා ඛෙමො සමනුඤ්ඤො මෙ සත්ථාති උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

1 ඉදමවොච ආයස්මා - සිමු.

බ්‍රාහ්මණය, යම් හෙයෙකින් තෝ අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ රාගය ''මාගේ අධ්‍යාත්මයෙහි රාගය ඇතැ''යි දන්හි නම්, අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ රාගය 'මාගේ අධ්‍යාත්මයෙහි රාගය නැතැ'යි දන්හි නම්,

බ්‍රාහ්මණය, මෙසෙයින් ධර්මය සන්දිට්ඨික වෙයි. ...

බ්‍රාහ්මණය, එ කිමැයි හඟිහි ද? අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ද්වේෂය .. අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ මෝහය ... අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ කායසන්දෝෂය (කායද්වාරය කිලිටි වන කරුණ) ... අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ වචීසන්දෝෂය ... අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ මනෝසන්දෝෂය 'මාගේ අධ්‍යාත්මයෙහි මනෝසන්දෝෂය ඇතැ'යි දන්හි ද? අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ මනෝසන්දෝෂය 'මාගේ අධ්‍යාත්ම-යෙහි මනෝසන්දෝෂය නැතැ'යි දන්හිද'යි?

භවත්නි, එසේ ය.

බ්‍රාහ්මණය, යම් හෙයෙකින් තෝ අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ [-පෙ-] මනෝසන්දෝෂය 'මාගේ අධ්‍යාත්මයෙහි මනෝසන්දෝෂය ඇතැ'යි දන්හි නම්, අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ මනෝසන්දෝෂය 'මාගේ අධ්‍යාත්මයෙහි මනෝසන්දෝෂය නැතැ'යි දන්හි නම්,

බ්‍රාහ්මණය, මෙලෙසින් ධර්මය සන්දිට්ඨික හා අකාලික හා එහිපස්සික හා ඕපනයික හා විඥයන් විසින් ප්‍රත්‍යාත්මයෙහි ලා දතයුතු වේ ය යි.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් කොට දිවිහිමි-යෙන් සරණගිය උපාසකයකු කොට ධරණ සේක්වා යි.

## 6. 1. 5. 7.

## [ඛෙම සූත්‍රය]

**49.** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඩු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි ආයුෂ්මත් ඛෙම තෙරණුවෝ ද ආයුෂ්මත් සුමන තෙරණුවෝ ද සැවැත් නුවර අන්ධවනයෙහි වසත්නාහ. එකල්හි ආයුෂ්මත් ඛෙම තෙරණුවෝ ද ආයුෂ්මත් සුමන තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්-පසෙක හුන් ආයුෂ්මත් ඛෙම තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ:

වහන්ස, අර්හත් වූ ක්ෂීණාශ්‍රව වූ, වැසූ නිම වූ බඹසර ඇති, සිදුමණින් කළ කිස ඇති, බහාතැබූ ත්‍රිවිධ භාර ඇති, පත් රහත් ඵල ඇති, පරික්ෂීණ භවසංයෝජන ඇති, සම්‍යග් හේතුයෙන් දැන අර්හත්ඵල විමුක්තියෙහි මිදුනු, යම් එ මහණෙක් වේ නම්, ඔහට ''මට ශ්‍රේෂ්ඨයෙක් ඇතැ''යි හෝ 'මට සදෘශයෙක් ඇතැ'යි හෝ 'මට හීනයෙක් ඇතැ'යි හෝ මෙබඳු (මාන) යෙක් නො වෙයි.

ආයුෂ්මත් ඛෙම තෙරණුවෝ මෙය කීහ. ශාස්තෲන් වහන්සේ අනුදත්හ. ඉක්බිති ආයුෂ්මත් ඛෙම තෙරණුවෝ ශාස්තෲහු මා වදන් අනුදත්හ'යි හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට නික්ම ගියහ.



Free Distribution www.aathaapi.org

අථ ඛො ආයස්මා සුමනො අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ඛෙමෙ භගවන්තං එතදවොච:

“යො සො භන්තෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, තස්ස න එවං හොති: ‘නත්ථි මෙ සෙය්‍යොති වා, නත්ථි මෙ සදිසොති වා, නත්ථි මෙ හීනොති වා’”ති.

ඉදමවොචායස්මා සුමනො සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො ආයස්මා සුමනො සමනුඤ්ඤො මෙ සත්ථාති උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ච ඛෙමෙ ආයස්මන්තෙ ච සුමනෙ භික්ඛූ ආමන්තෙසි: එවං ඛො භික්ඛවෙ කුලපුත්තා අඤ්ඤං ව්‍යාකරොන්ති, අත්ථො ච වුත්තො, අත්තා ච අනුපනීතො. අථ ච පන ඉධෙකච්චෙ මොඝපුරිසා හසමානකා මඤ්ඤෙ අඤ්ඤං ව්‍යාකරොන්ති. තෙ පච්ඡා විඝාතං ආපජ්ජන්තීති.

49. න උස්සෙසු න ඔමෙසු සමත්තෙ නොපනීයරෙ
ඛීණා සඤ්ජාති වුසිතං බ්‍රහ්මචරියං චරන්ති සංයොජනවිප්පමුත්තාති.

## 6. 1. 5. 8.

## [ඉන්ද්‍රිය සංවර සුත්තං]

[සාවත්ථිනිදානං]

**50** ඉන්ද්‍රියසංවරෙ භික්ඛවෙ අසති ඉන්ද්‍රියසංවරවිපන්නස්ස හතූපනිසං හොති සීලං. සීලෙ අසති සීලවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ අසති නිබ්බිදාවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසවිපන්නො, තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි න පාරිපූරිං ගච්ඡති, ඵෙග්ගුපි න පාරිපූරිං ගච්ඡති, සාරොපි න පාරිපූරිං ගච්ඡති, එවමෙව ඛො භික්ඛවෙ ඉන්ද්‍රියසංවරෙ අසති ඉන්ද්‍රියසංවරවිපන්නස්ස හතූපනිසං හොති සීලං -පෙ- [හතූපනිසං හොති] විමුත්තිඤාණදස්සනං,

ඉක්බිති ආයුෂ්මත් ඛෙම තෙරුන් නික්මගිය නොබෝ කල් වත් ම ආයුෂ්මත් සුමන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ:

"වහන්ස, අර්හත් ක්ෂීණාස්‍රව වූ වැස නිමකළ බඹසර ඇති, කළ සිවුමඟ කරණී ඇති, බහාතැබූ ත්‍රිවිධභාර ඇති, පිළිවෙළින් පත් රහත්බව් ඇති පරික්ෂීණභවසංයෝජන ඇති, මොනවට දැන විමුක්ත වූ යම් ඒ මහණෙක් වේ නම් 'මට ශ්‍රේෂ්ඨයෙක් නැතැ'යි හෝ 'මට සදෘශයෙක් නැතැ'යි හෝ 'මට හීනයෙක් නැතැ'යි හෝ යන මෙබඳු මානයෙක් ඔහට නැතැ"යි.

ආයුෂ්මත් සුමන තෙරණුවෝ මෙය සැලකළහ. ශාස්තෲන් වහන්සේ අනුදත්හ. ඉක්බිති ආයුෂ්මත් සුමන තෙරණුවෝ 'මා වදත් ශාස්තෲහු අනුදත්හ'යි හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට නික්ම ගියහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඛෙම තෙරුන් ද ආයුෂ්මත් සුමන තෙරුන් ද නික්මගිය නොබෝ කල් ඇතිවත් ම, භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, මෙසෙයින් ම කුලපුත්‍රයෝ අර්හත්ඵලය පළ කෙරෙති. අර්ථය ද කියනලද. තෙමේ ද අනුපනීත වෙයි. වැලිත් මෙ සස්නෙහි ඇතැම් තුච්ඡපුරුෂයෝ සිනාසෙන්නවුන් සෙයින් අර්හත්ඵලය පළ කෙරෙත්. උහු පසු දුකට පත් වන්නාහ යි.

49. ශ්‍රේෂ්ඨ පුද්ගලයන් කෙරෙහි දු හීන පුද්ගලයන් කෙරෙහි දු සම පුද්ගලයන් කෙරෙහි දු මානයෙන් නො එළඹෙත්. ජාතිය ක්ෂීණ ය. මඟබඹසර වැස නිමවනලද. ඒ රහත්හු සංයෝජනයන්ගෙන් විමුක්ත ව හැසිරෙත්.

## 6. 1. 5. 8

## [ඉන්ද්‍රියසංවර සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**50.** මහණෙනි, ඉන්ද්‍රියසංවර නැති වත් ම ඉන්ද්‍රියසංවර රහිතයාගේ ශීලය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සිල් නැති වත් ම ශීලවිපන්නයාගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සම්‍යක්සමාධිය නැති වත් ම සම්‍යක්සමාධිවිපන්නයාගේ තරුණවිදර්ශනාසඞ්ඛ්‍යාත යථාභූතඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි. යථාභූතඥානදර්ශනය නැති වත් ම යථාභූත-ඥානදර්ශනවිපන්නයාගේ (බලවත් විදර්ශනා සඞ්ඛ්‍යාත) නිර්වේදය හා ආර්යමාර්ග සඞ්ඛ්‍යාත විරාගය නට උපනිඃශ්‍රය ඇති වෙයි. නිර්වේදවිරාගය නැති වත් ම නිර්වේදවිරාගවිපන්නයාගේ (අර්හත්ඵල සඞ්ඛ්‍යාත) විමුක්තිය හා ප්‍රත්‍යවේක්ෂා-ඥාන සඞ්ඛ්‍යාත ඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි.

මහණෙනි, අතුපතර නැති රුකෙක් යම්බඳු වේ ද, එහි පතුරුත් පරිපූර්ණත්වයට නො යෙයි. සිවි දු පරිපූර්ණත්වයට නො යෙයි. බොරු දු පරිපූර්ණත්වයට නො යෙයි. හර දු පරිපූර්ණත්වයට නො යෙයි. මහණෙනි, එ පරිදි ම ඉන්ද්‍රියසංවර නැති වත් ම ඉන්ද්‍රියසංවරවිපන්නයාගේ ශීලය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි ... විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි.

ඉන්ද්‍රියසංවරෙ භික්ඛවෙ සති ඉන්ද්‍රියසංවරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සීලං. සීලෙ සති සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ සති නිබ්බිදාවිරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසසම්පන්නො, තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති, තචොපි පාරිපූරිං ගච්ඡති, ඵෙග්ගුපි පාරිපූරිං ගච්ඡති, සාරොපි පාරිපූරිං ගච්ඡති, එවමෙව ඛො භික්ඛවෙ ඉන්ද්‍රියසංවරෙ සති ඉන්ද්‍රියසංවරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සීලං -පෙ- [උපනිසසම්පන්නං හොති] විමුත්තිඤාණදස්සනන්ති.

6. 1. 5. 9.

[ආනන්ද සුත්තං]

[සාවජ්ජනිද්දෙසං]

**51.** අථ ඛො ආයස්මා **ආනන්දො**, යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

කිත්තාවතා නු ඛො ආවුසො සාරිපුත්ත භික්ඛු අස්සුතඤ්චෙව ධම්මං සුණාති, සුතා චස්ස ධම්මා න සම්මොසං ගච්ඡන්ති, යෙ චස්ස ධම්මා පුබ්බෙ චෙතසා සම්ඵුට්ඨපුබ්බා, තෙ ච සමුදාචරන්ති, අවිඤ්ඤාතඤ්ච විජානාතීති.

ආයස්මා ඛො ආනන්දො බහුස්සුතො, පටිභාතු ආයස්මන්තඤ්ඤෙව ආනන්දන්ති.

තෙනහාවුසො සාරිපුත්ත සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති. එවමාවුසොති ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. ආයස්මා ආනන්දො එතදවොච:

ඉධාවුසො සාරිපුත්ත භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. යථාසුතං[1] යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං වාචෙති. යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති. යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති, අනුවිචාරෙති, මනසානුපෙක්ඛති. යස්මිං ආවාසෙ ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තස්මිං ආවාසෙ වස්සං උපෙති. තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති පරිපඤ්හති: ඉදං භන්තෙ කථං? ඉමස්ස කො අත්ථො'ති? තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව විවරන්ති, අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති. අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානීයෙසු[2] ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති:

එත්තාවතා නු ඛො ආවුසො සාරිපුත්ත භික්ඛු අස්සුතඤ්චෙව ධම්මං සුණාති. සුතා චස්ස ධම්මා න සම්මොසං ගච්ඡන්ති. යෙ චස්ස ධම්මා පුබ්බෙ චෙතසා සම්ඵුට්ඨපුබ්බා තෙ ච සමුදාචරන්ති, අවිඤ්ඤාතඤ්ච විජානාතීති.

1 සො යථාසුතං - මජ්ඣං: 2 කඞ්ඛාට්ඨානීයෙසු - සඡවි

මහණෙනි, ඉන්ද්‍රියසංවරය ඇති වත් ම ඉන්ද්‍රියසංවරසම්පන්නයාගේ ශීලය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ශීලය ඇති වත් ම ශීලසම්පන්නයාගේ සම්‍යක්සමාධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇති වත් ම සම්‍යක්සමාධිසම්පන්නයාගේ යථාභූතඥානදර්ශනය (තරුණ විදර්ශනාව) උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූතඥානදර්ශනය ඇති වත් ම යථාභූතඥානදර්ශනසම්පන්නයාගේ නිබ්බිදාවිරාගය (බලවත් විදර්ශනාව) උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිබ්බිදාවිරාගය ඇති වත් ම නිබ්බිදාවිරාගසම්පන්නයාගේ විමුක්තිඥානදර්ශනය (අග්‍රඵල-ප්‍රත්‍යවෙක්ෂාඥානය) උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

මහණෙනි, අතුපතර සපන් රුක්ෂයක් යම්සේ වේ ද, එහි පතුරු ද පරිපූර්ණත්වයට යෙයි, සිවි ද පරිපූර්ණත්වයට යෙයි, ඵොරු ද පරිපූර්ණත්වයට යෙයි, හර ද පරිපූර්ණත්වයට යෙයි. මහණෙනි, එපරිදි ම ඉන්ද්‍රියසංවරය ඇති වත් ම ඉන්ද්‍රියසංවරසම්පන්නයාගේ ශීලය උපනිඃශ්‍රයසම්පන්න වෙයි .. විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ යයි.

## 6 1. 5. 9

## [ආනන්ද සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**51**. එකල්හි ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කීහ:

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, මහණ කෙනෙක් කරුණින් නො ඇසූ දහම්හු අසා ද? ඔහු විසින් ඇසූ දහමුත් වනසට නො යේ ද? ඔහු විසින් යම් ධර්මකෙනෙක් සිතින් පහස්නාලද විරූහු නම්, එ දහම්හු ද මනොද්වාරයෙහි හැසිරෙත් ද? නො දත් කරුණුත් යේ දත්තේ දැයි?

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බහුශ්‍රැතයහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට ම තෙල කරුණ වැටහේවයි.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, එ ගෙයින් ම අසනු මැනැව. මොනොවට මෙනෙහි කළ මැනැව. කියමි යි. ඇවැත්නි, එසේ යයි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් අනද තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ තෙල කීහ:

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, මෙ සස්නෙහි මහණ සූත්‍ර, ගෙය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අද්භූතධර්ම' වෙදල්ල යන ධර්මය පිරිවහයි. ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය විතර විසින් පරහට දෙසයි. ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය විතර විසින් පරහට කියවයි. ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය විතර විසින් සජ්ඣායනා කෙරෙයි. ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය සිතින් අනුවිතර්කණ කෙරෙයි, අනුවිචාර කෙරෙයි, සිතින් විමසා බලයි. යම් ආවාසයෙක්හි බහුශ්‍රැත වූ අධිගත (දීඝාදි) ආගම ඇති, ධම්ධර වූ විනයධර වූ මාතිකා (ප්‍රාතිමොක්ෂ) ධර වූ තෙර මහණහු වෙසෙත් නම්, ඒ ආවාසයෙහි වස් එළඹෙයි. කලින් කල ඔවුන් කරා එළඹ "වහන්ස, මෙ කිසේ ය, මෙ භාෂිතයාගේ අරුත් කවරැ"යි. පරිපෘච්ඡා කෙරෙයි. පරිතුලනා කෙරෙයි. ඔහට එ ආයුෂ්මත්හු අවිවෘත වූ දැය ද විවෘත කෙරෙත්. නො පළට දැය ද පළට කෙරෙත්. සැකාවට කරුණු වූ නාන්වැදෑරුම් ධර්මයෙහි සැක ද දුරු කෙරෙත්.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, මෙතෙක් කරුණින් මහණ අශ්‍රැත ධර්මයන් අසයි. ඔහු විසින් ශ්‍රැතධර්මයෝත් වනසට නො යෙත්. උහු විසින් යම් ධර්මකෙනෙක් පෙර සිතින් පහස්නාලදවිරූ නම් එ ධර්මයෝ ද මනොද්වාරයෙහි හැසිරෙත්. නො දත් කරුණු ද දත්තේ ය යි.

අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යාව සුභාසිතමිදං ආයස්මතා ආනන්දෙන. ඉමෙහි ච මයං ඡහි ධම්මෙහි සමන්නාගතං ආයස්මන්තං ආනන්දං ධාරෙම. (1) ආයස්මා හි ආනන්දො ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. (2) ආයස්මා ආනන්දො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. (3) ආයස්මා ආනන්දො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං වාචෙති. (4) ආයස්මා ආනන්දො යථාසුතං යථා-පරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති. (5) ආයස්මා ආනන්දො යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති, අනුවිචාරෙති, මනසානුපෙක්ඛති. (6) ආයස්මා ආනන්දො යස්මිං ආවාසෙ ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තස්මිං ආවාසෙ වස්සං උපෙති. තෙ ආයස්මා ආනන්දො, කාලෙන කාලං උපසඞ්ක-මිත්වා පරිපුච්ඡති, පරිපඤ්හති "ඉදං භන්තෙ කථං, ඉමස්ස කොඅත්ථො''ති. තෙ ආයස්මතො ආනන්දස්ස අවිවටඤ්චෙව විවරන්ති, අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති, අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානීයෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති'ති.

## 6. 1. 5. 10.

### [ඛත්තිය සුත්තං]

[සාමඤ්ඤනිදානං]

52. අථ ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා, එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

(1) ඛත්තියා භො ගොතම කිමධිප්පායා,[1] කිං උපවිචාරා, කිං අධිට්ඨානා, කිං අභිනිවෙසා, කිං පරියොසානාති?

ඛත්තියා ඛො බ්‍රාහ්මණ භොගාධිප්පායා, පඤ්ඤුපවිචාරා, බලාධිට්ඨානා, පඨවිභිනිවෙසා, ඉස්සරියපරියොසානාති.

(2) බ්‍රාහ්මණා පන භො ගොතම කිමධිප්පායා,[1] කිං උපවිචාරා, කිං අධිට්ඨානා, කිං අභිනිවෙසා, කිං පරියොසානාති?

බ්‍රාහ්මණා ඛො බ්‍රාහ්මණ භොගාධිප්පායා, පඤ්ඤුපවිචාරා, මන්තා-ධිට්ඨානා, යඤ්ඤාභිනිවෙසා, බ්‍රහ්මලොකපරියොසානාති.

(3) ගහපතිකා පන භො ගොතම කිමධිප්පායා[1] කිං උපවිචාරා, කිං අධිට්ඨානා, කිං අභිනිවෙසා, කිංපරියොසානාති?

1. කිං අධිප්පායා - මජසං.

ඇවැත්නි, ආශ්චර්‍ය්‍ය ය, ඇවැත්නි, අද්භූත ය. ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් විසින් මෙය සුභාෂිත මැ යි. ඇවැත්නි, අපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් මේ සදහම්හින් සමන්වාගතයකු කොට දරම්හ. (1) ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ සූත්‍ර ය, ගෙය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අද්භූතධර්ම ය, වෙදල්ල ය යන ධර්ම පිරිවහත් (2) ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ඇසූ පරිදි පිරිවැහූ පරිදි විස්තර විසින් ධර්මය පරනට දෙසත්. (3) ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ඇසූ පරිදි පිරිවැහූ පරිදි ධර්මය විස්තර විසින් මෙරමා කියවත්. (4) ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ඇසූ පරිදි පිරිවැහූ පරිදි ධර්මය විස්තර විසින් සජ්ඣායනා කෙරෙත්. (5) ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ඇසූ පරිදි පිරිවැහූ පරිදි ධර්මය සිතින් අනුවිතර්කණ කෙරෙත්, අනුවිචාරණ කෙරෙත්, මනසින් සිතා විමසා බලත්. (6) ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ යම් ආවාසයෙක බහුශ්‍රැත ආගතාගම ඇති ධර්මධර විනයධර මාතිකාධර තෙර මහණහු වෙසෙත් නම්, එ ආවාසයෙහි වස් එළඹෙත්. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ කලින් කල ඔවුන් කරා එළඹ පරිපෘච්ඡා කෙරෙත්. පරිප්‍රශ්න කෙරෙත්: "වහන්ස, මෙ කිසේ ය? මේ භාෂිතයාගේ අර්ථය කවරේ දැ"යි. එ ආයුෂ්මත්හු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට අවිවෘතය ද විවෘත කරත්. නො පැළ වූ දැය ද පැළ කෙරෙත්. සැකයට කරුණු වූ නන් වැදෑරුම් දහම්හි සැක ද දුරු කෙරෙත් ය යි.

## 6. 1. 5. 10

### [ඛත්තිය සූත්‍රය]

[සැවැත්නිදන යි]

**62.** එ කල්හි ජාණුස්සොණි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත් පසෙක හින. එකත්පසෙක හුන් ජාණුස්සොණි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළකෙළේ ය:

(1) භවත් ගෞතමයන් වහන්ස, ක්‍ෂත්‍රියයෝ කවර අභිප්‍රාය (අදහස්) ඇත්තාහු ද? කවර උපවිචාර (ආයා-සෙවීම්) ඇතියාහු ද? කවර අධිෂ්ඨාන (ප්‍රාර්ථනා) ඇතියාහු ද? කවර අභිනිවේශ (කුමක් සඳහා නැමුනු සිත්) ඇතියාහු ද? කවර පර්‍ය්‍යවසාන (අවසන් අපේක්‍ෂා) ඇතියාහු දැ යි.

බමුණ, ක්‍ෂත්‍රියයෝ භොගාධිප්‍රායයහ. පැණවත් වම්හ යන උපවිචාර ඇතියහ. බලකාය අධිෂ්ඨාන කොට ඇතියහ. පොළෝ (අධිපති බව) පිණිස අභිනිවේශ ඇතියහ. ඓශ්වර්‍ය්‍ය - රාජ්‍යාභිෂෙකය පර්‍ය්‍යවසාන කොට ඇතියහ යි.

(2) භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ කවර අභිප්‍රාය ඇතියාහු ද? කවර උපවිචාර ඇතියාහු ද? කවර අධිෂ්ඨාන ඇතියාහු ද? කවර අභිනිවේශ ඇතියාහු ද? කවර පර්‍ය්‍යවසාන ඇතියාහු දැයි?

බ්‍රාහ්මණය, බමුණෝ භොගාධිප්‍රාය ඇතියහ. ප්‍රඥොපවිචාර ඇතියහ. මන්ත්‍රාධිෂ්ඨාන ඇතියහ. යඥාභිනිවේශ (යාගකිරීමෙහි නැමුනු සිත්) ඇතියහ. බ්‍රහ්මලොක පර්‍ය්‍යවසාන ඇතියහ.

(3) භවත් ගෞතමයන් වහන්ස, ගැහැවිහු කවර අභිප්‍රාය ඇතියාහු ද? කවර උපවිචාර ඇතියාහු ද? කවර අධිෂ්ඨාන ඇතියාහු ද? කවර අභිනිවේශ ඇතියාහු ද? කවර පර්‍ය්‍යවසාන ඇතියාහු දැ යි?

ගහපතිකා බො බ්‍රාහ්මණ භොගාධිප්පායා, පඤ්ඤූපවිචාරා, සිප්පාධිට්ඨානා, කම්මන්තාභිනිවෙසා, නිට්ඨිතකම්මන්තපරියොසානාති.

(4) ඉත්ථී පන භො ගොතම කිමධිප්පායා[1] කිං උපවිචාරා, කිං අධිට්ඨානා කිංඅභිනිවෙසා, කිංපරියොසානාති.

ඉත්ථී බො බ්‍රාහ්මණ පුරිසාධිප්පායා, අලඞ්කාරූපවිචාරා, පුත්තාධිට්ඨානා, අසපත්තීභිනිවෙසා,[2] ඉස්සරියපරියොසානාති.

(5) චොරා පන භො ගොතම කිමධිප්පායා[1] කිං උපවිචාරා, කිං අධිට්ඨානා කිං අභිනිවෙසා කිං පරියොසානාති?

චොරා බො බ්‍රාහ්මණ ආදානාධිප්පායා, ගහනූපවිචාරා, සත්ථාධිට්ඨානා[3] අන්ධකාරාභිනිවෙසා,[4] අදස්සනපරියොසානාති.

(6) සමණා පන භො ගොතම කිමධිප්පායා, කිං උපවිචාරා, කිං අධිට්ඨානා, කිං අභිනිවෙසා කිං පරියොසානාති.

සමණා බො බ්‍රාහ්මණ ඛන්තිසොරච්චාධිප්පායා, පඤ්ඤූපවිචාරා, සීලාධිට්ඨානා, ආකිඤ්චඤ්ඤාභිනිවෙසා,[5] නිබ්බානපරියොසානාති.

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම. ඛත්තියානම්පි භවං ගොතමො ජානාති අධිප්පායඤ්ච, උපවිචාරඤ්ච, අධිට්ඨානඤ්ච, අභිනිවෙසඤ්ච, පරියොසානඤ්ච. බ්‍රාහ්මණානම්පි භවං ගොතමො ජානාති -පෙ- ගහපතිකානම්පි භවං ගොතමො ජානාති -පෙ- ඉත්ථීනම්පි භවං ගොතමො ජානාති -පෙ- චොරානම්පි භවං ගොතමො ජානාති -පෙ- සමණානම්පි භවං ගොතමො ජානාති අධිප්පායඤ්ච, උපවිචාරඤ්ච, අධිට්ඨානඤ්ච, අභිනිවෙසඤ්ච, පරියොසානඤ්ච.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 6. 1. 5. 11.

## [අප්පමාද සුත්තං]

[සාම්පරි සිද්ධනං]

59. අථ බො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

1 කිං අධිප්පායා - මජ්ඣං. 2 අසපත්තීභිනිවෙසා - අට්ඨකථා, පතිඅභිනිවෙසා - සං. 3 සත්ථාධිට්ඨානා - මජ්ඣං. 4 අන්ධකාරාභිනිවෙසා - අට්ඨකථා. 5 ආකිඤ්චඤ්ඤ-භිනිවෙසා - අට්ඨකථා, අකිඤ්චනාභිනිවෙසා - සං.

ගැහැවියෝ භෝගාභිප්‍රාය ඇතියහ, ප්‍රඥෙපවිචාර ඇතියහ, ශිල්පාධිෂ්ඨාන ඇතියහ, කර්මාන්තාභිනිවේශ ඇතියහ, නිෂ්ඨිත කර්මාන්ත (කර්මාන්තය නිමවීම) පර්‍ය්‍යවසාන කොට ඇතියහ යි.

(4) භවත් ගෞතමයන් වහන්ස, ස්ත්‍රීහු කවර අභිප්‍රාය ඇතියාහු ද? කවර උපවිචාර ඇතියාහු ද? කවර අධිෂ්ඨාන ඇතියාහු ද? කවර අභිනිවේශ ඇතියාහු ද? කවර පර්‍ය්‍යවසාන ඇතියාහු දැයි.

බ්‍රාහ්මණය, ස්ත්‍රීහු පුරුෂාභිප්‍රාය ඇතියහ, අලඞ්කාරොපවිචාර ඇතියහ, පුත්‍රාධිෂ්ඨාන ඇතියහ, අසපත්නී (ගෘහයෙහි දෙවැන්නියක් නැති තමන් පමණක් අධිපති භාවයෙහි) අභිනිවේශ ඇතියහ, ඓශ්වර්‍ය්‍ය (සම්පත්) පර්‍ය්‍යවසාන ඇතියහ යි.

(5) භවත් ගෞතමයන් වහන්ස, සොරු කවර අභිප්‍රාය ඇතියාහු ද? කවර උපවිචාර ඇතියාහු ද? කවර අධිෂ්ඨාන ඇතියාහු ද? කවර අභිනිවේශ ඇතියාහු ද? කවර පර්‍ය්‍යවසාන ඇතියාහු දැයි.

බ්‍රාහ්මණය, සොරු ආදානය අභිප්‍රාය කොට ඇතියහ, ගහනොපවිචාර (මුවහතැන් පිළිබඳ උපවිචාර) ඇතියහ, ශස්ත්‍රාධිෂ්ඨාන (සටබැව් අධිෂ්ඨාන කොට) ඇතියහ, අන්ධකාරාභිනිවේශ ඇතියහ, අදර්ශනය පර්‍ය්‍යවසාන කොට ඇතියහ යි.

(6) භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණයෝ කවර අභිප්‍රාය ඇතියාහු ද? කවර උපවිචාර ඇතියාහු ද? කවර අධිෂ්ඨාන ඇතියාහු ද? කවර අභිනිවේශ ඇතියාහු ද? කවර පර්‍ය්‍යවසාන ඇතියාහු දැයි.

බ්‍රාහ්මණය, ශ්‍රමණයෝ ක්ෂාන්තිය හා සුරතභාවය අභිප්‍රාය කොට ඇතියාහ, ප්‍රඥෙපවිචාර ඇතියාහ, ශීලාධිෂ්ඨාන ඇතියාහ, අකිඤ්චනභාවාභිනිවේශ (ග්‍රහණ නැති බව අභිනිවේශ කොට) ඇතියාහ, නිර්වාණපර්‍ය්‍යවසාන ඇතියාහ යි.

භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්‍ය්‍ය යි, භවත් ගෞතමයන් වහන්ස, අද්භූත යි. භවත් ගෞතමයන් වහන්සේ ක්ෂත්‍රියයන්ගේ ද අභිප්‍රාය හා උපවිචාර හා අධිෂ්ඨාන හා අභිනිවේශ හා පර්‍ය්‍යවසාන හා දන්නාහ. භවත් ගෞතමයන් වහන්සේ බ්‍රාහ්මණයන්ගේ ද ... දන්නාහ. භවත් ගෞතමයන් වහන්සේ ගැහැවියන්ගේ ද ... දන්නාහ. භවත් ගෞතමයන් වහන්සේ ස්ත්‍රීන්ගේ ද ... දන්නාහ. භවත් ගෞතයන් වහන්සේ සොරුන්ගේ ද ... දන්නාහ. භවත් ගෞතමයන් වහන්සේ ශ්‍රමණයන්ගේ ද අභිප්‍රාය හා උපවිචාර හා අධිෂ්ඨාන හා අභිනිවේශ හා පර්‍ය්‍යවසාන හා දන්නාහ.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවි ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට දිවි හිමියෙන් මා තෙරුවන් සරණ ගිය උවසුවකු කොට ධරන සේක්වා යි.

### 6. 1. 6. 11.

### [අප්පමාද සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**53.** එකල්හි අන්‍යතර බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටු විය යුතු සිහි එළවිය යුතු කථා කොට නිමවා එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් ඒ බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය:

අත්ථි නු බො භො ගොතම එකො ධම්මො භාවිතො බහුලීකතො යො උභො අත්ථෙ සමධිගය්හ[1] තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, යො ච අත්ථො සම්පරායිකොති.

අත්ථි බො බ්‍රාහ්මණ, එකො ධම්මො භාවිතො බහුලීකතො යො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, යො ච අත්ථො සම්පරායිකොති.

කතමො පන භො ගොතම එකො ධම්මො භාවිතො බහුලීකතො යො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, යො ච අත්ථො සම්පරායිකොති.

අප්පමාදො බො බ්‍රාහ්මණ, එකො ධම්මො භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, යො ච අත්ථො සම්පරායිකො.

(1) සෙය්‍යථාපි බ්‍රාහ්මණ, යානි කානිචි ජඞ්ගමානං[2] පාණානං පදජාතානි, සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති. හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තෙන.[3] එවමෙව බො බ්‍රාහ්මණ අප්පමාදො එකො ධම්මො භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, යො ච අත්ථො සම්පරායිකො.

(2) සෙය්‍යථාපි බ්‍රාහ්මණ, කූටාගාරස්ස යා කාචි ගොපානසියො සබ්බා තා කූටඞ්ගමා කූටනින්නා කූටසමොසරණා, කූටං තාසං අග්ගමක්ඛායති. එවමෙව බො බ්‍රාහ්මණ, [අප්පමාදො] -පෙ-

(3) සෙය්‍යථාපි බ්‍රාහ්මණ, බබ්බජලායකො[4] බබ්බජං ලායිත්වා අග්ගෙ ගහෙත්වා ඔධුනාති, නිද්ධුනාති,[5] නිච්ඡාදෙති. එවමෙව බො බ්‍රාහ්මණ [අප්පමාදො] -පෙ-

(4) සෙය්‍යථාපි බ්‍රාහ්මණ, අම්බපිණ්ඩියා වණ්ටච්ඡින්නාය යානි කානිචි අම්බානි වණ්ටූපනිබන්ධනානි, සබ්බානි තානි තදන්වයානි භවන්ති. එවමෙව බො බ්‍රාහ්මණ [අප්පමාදො] -පෙ-

(5) සෙය්‍යථාපි බ්‍රාහ්මණ, යෙ කෙචි කුඩ්ඩරාජානො[6] සබ්බෙ තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයුත්තා[7] භවන්ති, රාජා තෙසං චක්කවත්ති අග්ගමක්ඛායති. එවමෙව බො බ්‍රාහ්මණ [අප්පමාදො] -පෙ-

(6) සෙය්‍යථාපි බ්‍රාහ්මණ, යා කාචි තාරකරූපානං පභා, සබ්බා තා චන්දප්පභාය කලං නාග්ඝන්ති සොළසිං, චන්දප්පභා තාසං අග්ගමක්ඛායති. එවමෙව බො බ්‍රාහ්මණ, අප්පමාදො එකො ධම්මො භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, යො චත්ථො සම්පරායිකො.

අයං බො බ්‍රාහ්මණ, එකො ධම්මො භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං, යො චත්ථො සම්පරායිකොති.

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

---

1 සමධිග්ගය්හ - මජසං 2 ජඞ්ගලානං - සබ්බත්ථ 3. යදිදං මහන්තත්තෙන - මජසං.
4 පබ්බජලායකො - මජසං: 5. නිබ්බුනාති - මජසං: 6. කුද්දරාජානො - මජසං
7 අනුයන්තා - මජසං

භවත් ගෞතමයන් වහන්ස, භාවිත වූ බහුලීකෘත වූ යම් ධර්මයෙක් දෘෂ්ටධාර්මික අර්ථය හා යම් සාම්පරායික අර්ථයෙක් වේ නම්, ඒ උභයාර්ථය ම මැනැවින් ගෙණ සිටුනේ ද, එබඳු එක ධර්මයෙක් ඇද්ද යි?

බ්‍රාහ්මණය, භාවිත වූ බහුලීකෘත වූ යම් ධර්මයෙක් දිටුදැමි අර්ථ හා යම් සාම්පරායික අර්ථයෙක් වේ නම්, එ ද යන උභයාර්ථය ම මැනැවින් ගෙණ සිටුනේ වේ ද, එබඳු එක ධර්මයෙක් ඇත.

භවත් ගෞතමයන් වහන්ස, යම් ධර්මයෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ දිටු දැමි අර්ථ හා පරලෙව්හි අර්ථයෙක් වේ නම්, ඒ උභයාර්ථය ම මැනැවින් ලැබගෙණ සිටුනේ වේ ද, එබඳු එක ධර්මය කවරේ දැ යි?

බ්‍රාහ්මණය, යම් ධර්මයෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ දිටුදැමි අර්ථ හා සාම්පරායික අර්ථයෙක් වේ නම්, ඒ උභයාර්ථය ම මැනැවින් ලැබගෙණ සිටුනේ වේ ද, එබඳු එක ධර්මය අප්‍රමාදය මෙයි.

(1) බ්‍රාහ්මණය, යම් කිසි ජඞ්ගම (භූමියෙහි හැසිරෙන) ප්‍රාණීන්ගේ පාදයෝ වෙත් නම්, එ හැම යම්සේ ඇත්පියෙහි සමවධානයට (ඇතුළත් වීමට) යෙත් ද, ඇත්පිය මහත්ත්වයෙන් එ පදයනට අග්‍ර යයි කියනු ලැබේ ද, බ්‍රාහ්මණය, එ පරිදි ම අප්‍රමාද නම් වූ එක ම ධර්මය භාවිත වූයේ බහුලීකෘත වූයේ දිටුදැමි අරුත් හා යම් පරලොව්හි අරුතෙක් වේ නම්, ඒ උභයාර්ථය ම මැනැවින් ලැබගෙණ සිටුනේ වේ.

(2) බ්‍රාහ්මණය, යම් පරිදි කූටාගාරයක්හුගේ යම්කිසි ගොනැස්හු වෙත් නම්, එ හැම කූටය (මුදුන) ට ගියාහු කූටයට නැමුනාහු කූටය හා එක් වූවාහු වෙත් ද, කූටය ඔවුනට අග්‍ර යයි කියනුලැබේ ද, බ්‍රාහ්මණය, එසෙයින් ම [අප්‍රමාදය] ...

(3) බ්‍රාහ්මණය, යම් පරිදි බබුස්තණ තෙලනුයෙක් බබුස්තණ තෙලා අග්හි ගෙණ යටිහුරු කොට සලා නම් දෙපසින් සලා නම් අත්හි හෝ රුක්හි ගටා නම්, බ්‍රාහ්මණය, එ පරිදි [අප්‍රමාදය] ...

(4) බ්‍රාහ්මණය, යම් පරිදි නටුයෙන් සිඳී ගිය අඹකැනෙහි යම් ම අඹ නටුව හා බැඳුනේ නම් එ හැම එ අනුව ගියේ වේ ද, බමුණ, එ පරිදි [අප්‍රමාදය] ...

(5) බ්‍රාහ්මණය, යම් පරිදි යම්කිසි කුඩා රජහු වෙත් නම් එ හැම දෙන සක්විති රජු අනුව යත්නාහු වෙත් ද, සක්විති රජ උනට අග්‍ර යයි කියනු ලැබේ ද, බ්‍රාහ්මණය, එ පරිදි ම [අප්‍රමාදය] ...

(6) බ්‍රාහ්මණය, යම් පරිදි තාරකා රූපයන්ගේ යම් කිසි ප්‍රභාවෙක් වේ නම් එ හැම චන්‍ද්‍රප්‍රභාවගේ සොළොස්වන අංශුවකුත් නො අගනේ ය. සඳපහන් උනට අග්‍ර යයි කියනු ලැබේ ද, බ්‍රාහ්මණය, එපරි ම අප්‍රමාදය භාවිත වූයේ බහුලීකෘත වූයේ දිටුදැමි අරුත් හා යම් සම්පරායෙහි අරුතෙක් වේ නම් එ උභයාර්ථ ම මැනැවින් ගෙණ සිටුනේ වේ.

බ්‍රාහ්මණය, යම් එක ම ධර්මයෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ දිටුදැමි අර්ථ හා යම් සම්පරායෙහි අර්ථ වේ නම් ඒ උභයාර්ථයන් ම මැනැවින් ගෙණ සිටුනේ වේ යයි.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත ය, ඉතා කාන්තය. ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිමියෙන් සරණ ගිය උවසුවකු කොට මා ධරණ සේක්වා යි.

## 6. 1. 5. 12

## [ධම්මික සුත්තං]

54. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ධම්මිකො ජාතිභූමියං ආවාසිකො හොති සබ්බසො ජාතිභූමියං සත්තසු ආවාසෙසු.

තත්‍ර සුදං ආයස්මා ධම්මිකො ආගන්තුකෙ භික්ඛූ අක්කොසති, පරිභාසති, විහිංසති, විතුදති, රොසෙති වාචාය. තෙ ච ආගන්තුකා භික්ඛූ ආයස්මතා ධම්මිකෙන අක්කොසියමානා පරිභාසියමානා විහෙසියමානා විතුදියමානා රොසියමානා වාචාය, පක්කමන්ති, න සණ්ඨහන්ති[1] රිඤ්චන්ති ආවාසං.

අථ ඛො ජාතිභූමකානං[2] උපාසකානං එතදහොසි: මයං ඛො භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. අථ ච පන ආගන්තුකා භික්ඛූ පක්කමන්ති න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසං. කො නු ඛො හෙතු, කො පච්චයො යෙන ආගන්තුකා භික්ඛූ පක්කමන්ති, න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසන්ති?

අථ ඛො ජාතිභූමකානං උපාසකානං එතදහොසි: "අයං ඛො ආයස්මා ධම්මිකො ආගන්තුකෙ භික්ඛූ අක්කොසති, පරිභාසති, විහිංසති, විතුදති, රොසෙති වාචාය. තෙ ච ආගන්තුකා භික්ඛූ ආයස්මතා ධම්මිකෙන අක්කොසියමානා පරිභාසියමානා විහෙසියමානා විතුදියමානා රොසියමානා වාචාය, පක්කමන්ති, න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසං. යන්නූන මයං ආයස්මන්තං ධම්මිකං පබ්බාජෙය්‍යාමා"ති.

අථ ඛො ජාතිභූමකා උපාසකා යෙනායස්මා ධම්මිකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං ධම්මිකං එතදවොචුං: "පක්කමතු භන්තෙ ආයස්මා ධම්මිකො ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා"ති.

අථ ඛො ආයස්මා ධම්මිකො තම්හා ආවාසා අඤ්ඤං ආවාසං අගමාසි. තත්‍රපි සුදං ආයස්මා ධම්මිකො ආගන්තුකෙ භික්ඛූ අක්කොසති, පරිභාසති, විහිංසති, විතුදති, රොසෙති වාචාය. තෙ ච ආගන්තුකා භික්ඛූ ආයස්මතා ධම්මිකෙන අක්කොසියමානා පරිභාසියමානා විහෙසියමානා විතුදියමානා රොසියමානා වාචාය, පක්කමන්ති, න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසං.

අථ ඛො ජාතිභූමකානං උපාසකානං එතදහොසි. "මයං ඛො භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, අථ ච පන ආගන්තුකා භික්ඛූ පක්කමන්ති, න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසං, කො නු ඛො හෙතු, කො පච්චයො යෙන ආගන්තුකා භික්ඛූ පක්කමන්ති න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසන්ති."

---

1. සණ්ඨහන්ති මජ්ඣං.
2. ජාතභූමිකානං - සයා.

## 6. 1. 5. 12.

## [ධම්මික සූත්‍රය]

54. එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අසල ගිජ්ඣකූට පර්වතයෙහි වැඩවසන සේක. එ සමයෙහි ආයුෂ්මත් ධම්මික තෙරහු ජාතිභූමියෙහි වූ ජාතිභූමිගත හැම සපත ආවාසයෙහි ම ආවාසික වෙති.

එකල්හි ආයුෂ්මත් ධම්මික තෙරහු ආගන්තුක මහණුන්හට ආක්‍රොශ කෙරෙති, පරිභව කෙරෙති, වෙහෙසති, මුවසැතින් විදිති, බසින් ගටා බෙණෙති. එ ආගන්තුග භික්ෂූහු ද ආයුෂ්මත් ධම්මික තෙරුන් විසින් ආක්‍රොශ කරණු ලබන්නාහු, පරිභව කරණු ලබන්නාහු, වෙහෙසනු ලබන්නාහු, මුවසැතින් විදිනු ලබන්නාහු, වචනයෙන් ගටා බණනු ලබන්නාහු, නික්ම යෙති. නො සිටිති. ආවාසය පියායෙති.

ඉක්බිති ජාතිභූමියෙහි වැසි උවසුවනට මෙබඳු සිත් වී: "අපි භික්සඟුන් සිවුරු පිඬුවාසෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකරින් පස්වටම්හ. එසේ වුව ද ආගන්තුග භික්ෂූහු නික්ම යෙති. නො සිටිති, ආවාසය පියායෙත්. යම් හෙතුයෙකින් ආගන්තුක භික්ෂූහු නික්ම යෙත් නම්, නො සිටුනාහු නම්, ආවාසය පියායෙත් නම්, එයට හෙතු කවරැ? ප්‍රත්‍යය කවරැයි?"

ඉක්බිති ජාත්භූමක උපාසකයනට මෙබඳු සිත් වී: "මෙ ආයුෂ්මත් ධම්මික තෙරහු භික්ෂූන්ට ආක්‍රොශ කෙරෙත්. පරිභව බෙණෙත්. වෙහෙසත්. මුවසැතින් විදිත්. වචනයෙන් ගටා බෙණෙත්. එ ආගන්තුක භික්ෂූහු ද ආයුෂ්මත් ධම්මික තෙරුන් විසින් ආක්‍රොශ කරණු ලබන්නාහු පරිභව කරණු ලබන්නාහු වෙහෙසනු ලබන්නාහු මුවසැතින් විදිනු ලබන්නාහු වචනයෙන් ඝටනු ලබන්නාහු නික්ම යන්නාහ. නො සිටුනාහ. ආවාසය පියායන්නාහ. අපි ආයුෂ්මත් ධම්මික තෙරුන් නෙරන්නමෝ (බැහැර කරන්නමෝ) නම් මැනැවැයි.

ඉක්බිති ජාතිභූමක උපාසකයෝ ආයුෂ්මත් ධම්මික තෙරුන් වෙත එළඹියාහ. එළඹ ආයුෂ්මත් ධම්මික තෙරුන්ට මෙබඳු කීහ: වහන්ස, ආයුෂ්මත් ධම්මික තෙරහු මෙ ආවාසයෙන් නික්ම යෙත්වා. මුබගේ මෙහි විසුමෙන් කම් නැතැ"යි.

ඉක්බිති ආයුෂ්මත් ධම්මික තෙරහු අන්‍ය ආවාසයක් කරා ගියහ. එහි දු ආයුෂ්මත් ධම්මික තෙරහු ආගන්තුග මහණුන්ට ආක්‍රොශ කෙරෙති, පරිභව කෙරෙති. වෙහෙසති. මුවසැතින් විදුති. වචනයෙන් ගටා බෙණෙති. එ භික්ෂූහු ද ධම්මික තෙරුන් විසින් ආක්‍රොශ කරණු ලබන්නාහු, පරිභව කරණු ලබන්නාහු, වෙහෙසනු ලබන්නාහු මුවසැතින් විදිනු ලබන්නාහු, වචනයෙන් ගටා බණනු ලබන්නාහු නික්ම යෙති. නො සිටිති. ආවාසය පියායෙති.

එකල්හි ජාතිභූමක උවසුවනට මෙබඳු සිත් වී: අපි චීවරපිණ්ඩපාතශයනාසනගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙන් භික්සඟුන් උවටැන් කරම්හ. එසේ වුව ද, ආගන්තුග භික්ෂූහු නික්ම යෙති. නො සිටුනාහ. ආවාසය සිත් කරන්නාහ. යම් හෙයෙකින් ආගන්තුග භික්ෂූහු නික්ම යෙත් නම්, නො සිටිත් නම්, ආවාසය පියත් නම්, එයට හේතු කවරැ, ප්‍රත්‍යය කවරැයි.

අථ ඛො ජාතිභූමකානං උපාසකානං එතදහොසි: අයං ඛො ආයස්මා ධම්මිකො ආගන්තුකෙ භික්ඛූ අක්කොසති, පරිභාසති, විහිංසති, විතුදති, රොසෙති වාචාය. තෙ ච ආගන්තුකා භික්ඛූ ආයස්මතා ධම්මිකෙන අක්කොසියමානා, පරිභාසියමානා, විහෙසියමානා, විතුදියමානා, රොසියමානා වාචාය, පක්කමන්ති, න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසං. යන්නූන මයං ආයස්මන්තං ධම්මිකං පබ්බාජෙය්‍යාමාති.

අථ ඛො ජාතිභූමකා උපාසකා යෙනායස්මා ධම්මිකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං ධම්මිකං එතදවොචුං: “පක්කමතු භන්තෙ ආයස්මා ධම්මිකො ඉමම්හාපි ආවාසා, අලන්තෙ ඉධ වාසෙනාති.”

අථ ඛො ආයස්මා ධම්මිකො තම්හාපි ආවාසා අඤ්ඤං ආවාසං අගමාසි. තත්‍රපි සුදං ආයස්මා ධම්මිකො ආගන්තුකෙ භික්ඛූ අක්කොසති -පෙ- රොසෙති වාචාය. තෙ ච ආගන්තුකා භික්ඛූ ආයස්මතා ධම්මිකෙන අක්කොසියමානා පරිභාසියමානා විහෙසියමානා විතුදියමානා රොසියමානා වාචාය, පක්කමන්ති, න සණ්ඨහන්ති, රිඤ්චන්ති ආවාසං.

අථ ඛො ජාතිභූමකානං උපාසකානං එතදහොසි: මයං ඛො භික්ඛුසඞ්ඝං පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. අථ ඛො පන ආගන්තුකා භික්ඛූ පක්කමන්ති න සණ්ඨහන්ති රිඤ්චන්ති ආවාසං. කො නු ඛො හෙතු, කො පච්චයො යෙන ආගන්තුකා භික්ඛූ පක්කමන්ති න සණ්ඨහන්ති රිඤ්චන්ති ආවාසන්ති?

අථ ඛො ජාතිභූමකානං උපාසකානං එතදහොසි: “අයං ඛො ආයස්මා ධම්මිකො ආගන්තුකෙ භික්ඛූ අක්කොසති -පෙ- රොසෙති වාචාය. තෙ ච ආගන්තුකා භික්ඛූ ආයස්මතා ධම්මිකෙන අක්කොසියමානා පරිභාසියමානා විහෙසියමානා විතුදියමානා රොසියමානා වාචාය, පක්කමන්ති න සණ්ඨහන්ති රිඤ්චන්ති ආවාසං. යන්නූන මයං ආයස්මන්තං ධම්මිකං පබ්බාජෙය්‍යාම සබ්බසො ජාතිභූමියං සත්තහි ආවාසෙහී”ති.

අථ ඛො ජාතිභූමකා උපාසකා යෙනායස්මා ධම්මිකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං ධම්මිකං එතදවොචුං: ‘පක්කමතු භන්තෙ ආයස්මා ධම්මිකො සබ්බසො ජාතිභූමියං සත්තහි ආවාසෙහී”ති.

අථ ඛො ආයස්මතො ධම්මිකස්ස එතදහොසි: “පබ්බාජිතො ඛොම්හි ජාතිභූමකෙහි උපාසකෙහි සබ්බසො ජාතිභූමියං සත්තහි ආවාසෙහි, කහන්නු ඛො දානි ගච්ඡාමීති.” අථ ඛො ආයස්මතො ධම්මිකස්ස එතදහොසි: යන්නූනාහං යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යන්ති.

එකල්හි ජාතිභූමක උවසුවනට මෙසේ සිත් වී: මේ ආයුෂ්මත් ධම්මික තෙරහු ආගන්තුක මහණුන්ට ආක්‍රෝශ කෙරෙති. පරිභව කෙරෙති. හිංසා කෙරෙති. විතුදනය කෙරෙති. වචනයෙන් ගටති. එ ආගන්තුක භික්ෂූහු ද ආයුෂ්මත් ධම්මික තෙරුන් විසින් ආක්‍රෝශ කරණු ලබන්නාහු, පරිභව කරණු ලබන්නාහු, වෙහෙසනු ලබන්නාහු, විතුදනය කරණු ලබන්නාහු, වචනයෙන් කෝප දනවනු ලබන්නාහු, නික්මයෙති, නො සිටිති, ආවාසය පියායෙති. අපි ආයුෂ්මත් ධම්මික තෙරුන් නෙරමෝ නම් මැනැවැයි.

ඉක්බිති ජාතිභූමක උපාසකයෝ ආයුෂ්මත් ධම්මික තෙරුන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් ධම්මික තෙරුන්හට මෙසේ කීහ: "වහන්ස, ආයුෂ්මත් ධම්මික තෙරහු මේ ආවාසයෙන් නික්ම යෙත්වා. තුබගේ මෙහි විසුම්න් කම් නැතැ"යි.

ඉක්බිති ආයුෂ්මත් ධම්මික තෙරහු එ ආවාසයෙනුදු අන්‍ය අවාසයක් කරා ගියහ. එහි දු ආයුෂ්මත් ධම්මික තෙරහු මහණුන්ට ආක්‍රෝශ කෙරෙති, පරිභව කෙරෙති, හිංසා කෙරෙති, විතුදනය කෙරෙති, වචනයෙන් කෝප දනවති. එ ආගන්තුක භික්ෂූහු ද ආයුෂ්මත් ධම්මික තෙරුන් විසින් ආක්‍රෝශ කරණු ලබන්නාහු පරිභව කරණු ලබන්නාහු වෙහෙසනුලබන්නාහු විතුදනය කරණු ලබන්නාහු වචනයෙන් ගටනු ලබන්නාහු, බැහැර යෙති, නො සිටිති, ආවාසය පියත්.

එ කල්හි ජාතිභූමක උවසුවනට මෙසේ සිත් විය: 'අපි චීවර පිණ්ඩපාත ශයනාසනග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙන් භික්ෂූන් පස්වටම්හ. එසේ වුව ද, ආගන්තුක මහණහු නික්මයෙති, නො සිටිති, ආවාසය පියායෙති. යම් හෙයෙකින් ආගන්තුක භික්ෂූහු නික්ම යෙත් නම් නො සිටිත් නම් ආවාසය පියත් නම් එයට හෙතු කවරැ ප්‍රත්‍යය කවරැ"යි.

ඉක්බිති ජාතභූමක උවසුවනට මෙසේ සිත් වී: "මෙ ආයුෂ්මත් ධම්මික තෙරහු ආගන්තුක මහණුනට ආක්‍රොශ කෙරෙති .. වචනයෙන් ගටා බෙණෙති. එ ආගන්තුක භික්ෂූහු ද ආයුෂ්මත් ධම්මික තෙරුන් විසින් ආක්‍රොශ කරණු ලබන්නාහු පරිභව කරණු ලබන්නාහු වෙහෙසනු ලබන්නාහු විතුදනය කරණුලබන්නාහු වචනයෙන් ගටා බණිනු ලබන්නාහු, නික්මයෙත්, නො සිටිති, ආවාසය පියා යෙති. අපි ආයුෂ්මත් ධම්මික තෙරුන් ජාතිභූමියෙහි හැම සඞ්ඝාවාසයෙන් නෙරණමෝ නම් මැනැවැ"යි.

ඉක්බිති ජාතිභූමක උපාසකයෝ ආයුෂ්මත් ධම්මික තෙරුන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් ධම්මිකතෙරුන්ට මෙසේ කීහ: "වහන්ස ආයුෂ්මත් ධම්මික තෙරහු ජාතිභූමියෙහි හැම සඞ්ඝාවාසයෙන් නික්ම යෙත්වා"යි.

ඉක්බිති ආයුෂ්මත් ධම්මික තෙරහට මෙසේ සිත් වී: "මම ජාතිභූමියෙහි හැම සඞ්ඝාවාසයෙන් ජාතිභූමක උවසුවන් විසින් නෙරණලදයෙම් වෙමි. දැන් කොහි නම් යෙම්දැ"යි. ඉක්බිති ආයුෂ්මත් ධම්මික තෙරහට මෙසේ සිත් වී: "මම භාග්‍යවතුන් වහන්සේ කරා යෙම් නම්, යෙහෙකැ"යි.

අථ ඛො ආයස්මා ධම්මිකො පත්තචීවරමාදාය යෙන රාජගහං තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන රාජගහං යෙන ගිජ්ඣකූටො පබ්බතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ධම්මිකං භගවා එතදවොච: "හන්ද කුතො නු ත්වං බ්‍රාහ්මණ ධම්මික, ආගච්ඡසීති." පබ්බාජිතො අහං භන්තෙ ජාතිභූමකෙහි උපාසකෙහි සබ්බසො ජාතිභූමියං සත්තසු ආවාසෙසූති." අලං බ්‍රාහ්මණ ධම්මික, කිං තෙ ඉමිනා, යං ත්වං තතො තතො පබ්බාජෙන්ති, සො ත්වං තතො තතො පබ්බාජිතො මමෙව සන්තිකං[1] ආගච්ඡසි.

භූතපුබ්බං, බ්‍රාහ්මණ ධම්මික, සාමුද්දිකා වාණිජා තීරදස්සිං සකුණං ගහෙත්වා නාවාය සමුද්දං අජ්ඣොගාහන්ති. තෙ අතීරදක්ඛිණියා නාවාය තීරදස්සිං සකුණං මුඤ්චන්ති. සො ගච්ඡතෙව පුරත්ථිමං දිසං, ගච්ඡති පච්ඡිමං දිසං, ගච්ඡති උත්තරං දිසං, ගච්ඡති දක්ඛිණං දිසං, ගච්ඡති උද්ධං, ගච්ඡති අනුදිසං. සචෙ සො සමන්තා තීරං පස්සති, තථා ගතකොව හොති. සචෙ පන සො සමන්තා තීරං න පස්සති, තමෙව නාවං පච්චාගච්ඡති. එවමෙව ඛො බ්‍රාහ්මණ ධම්මික, යං ත්වං තතො තතො පබ්බාජෙන්ති, සො ත්වං තතො තතො පබ්බාජිතො මමෙව සන්තිකං[1] ආගච්ඡසි.

භූතපුබ්බං, බ්‍රාහ්මණ ධම්මික, රඤ්ඤො කොරබ්‍යස්ස සුප්පතිට්ඨො නාම නිග්‍රොධරාජා අහොසි පඤ්චසාඛො සීතච්ඡායො මනොරමො. සුප්පතිට්ඨො ඛො පන බ්‍රාහ්මණ ධම්මික, නිග්‍රොධරාජස්ස ද්වාදසයොජනානි අභිනිවෙසො අහොසි, පඤ්චයොජනානි මූලසන්තානකානං. සුප්පතිට්ඨස්ස ඛො පන බ්‍රාහ්මණ ධම්මික, නිග්‍රොධරාජස්ස තාව මහන්තානි ඵලානි අහෙසුං සෙය්‍යථාපි නාම ආළ්හකථාලිකා, එවමස්ස සාදූනි ඵලානි අහෙසුං සෙය්‍යථාපි නාම ඛුද්දමධුං අනෙලකං.[2] සුප්පතිට්ඨස්ස ඛො පන බ්‍රාහ්මණ ධම්මික, නිග්‍රොධරාජස්ස එකං ඛන්ධං රාජා පරිභුඤ්ජති සද්ධිං ඉත්ථාගාරෙන. එකං ඛන්ධං බලකායො පරිභුඤ්ජති. එකං ඛන්ධං නෙගමජානපදා පරිභුඤ්ජන්ති. එකං ඛන්ධං සමණබ්‍රාහ්මණා පරිභුඤ්ජන්ති. එකං ඛන්ධං මිගපක්ඛිනො[3] පරිභුඤ්ජන්ති. සුප්පතිට්ඨස්ස ඛො පන බ්‍රාහ්මණ ධම්මික නිග්‍රොධරාජස්ස න කොචි ඵලානි රක්ඛති. න ච සුදං අඤ්ඤමඤ්ඤස්ස ඵලානි හිංසන්ති.

අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, අඤ්ඤතරො පුරිසො සුප්පතිට්ඨස්ස නිග්‍රොධරාජස්ස යාවදත්ථං ඵලානි භක්ඛිත්වා සාඛං භඤ්ජිත්වා පක්කාමි. අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, සුප්පතිට්ඨෙ නිග්‍රොධරාජෙ අධිවත්ථාය දෙවතාය එතදහොසි: "අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, යාව පාපො මනුස්සො යත්‍ර හි නාම සුප්පතිට්ඨස්ස නිග්‍රොධරාජස්ස යාවදත්ථං ඵලානි භක්ඛිත්වා සාඛං භඤ්ජිත්වා පක්කමිස්සති, යන්නූන සුප්පතිට්ඨො නිග්‍රොධරාජා ආයතිං ඵලං න දදෙය්‍යා"ති. අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, සුප්පතිට්ඨො නිග්‍රොධරාජා ආයතිං ඵලං නාදාසි.

---

1. සන්තිකෙ - මජසං 2. සීලකං සිඛු,
3. මිගා පක්ඛිණො - මජසං,

ඉක්බිති ආයුෂ්මත් ධම්මික තෙරණුවෝ පාසිවුරු ගෙණ රජගහ නුවර බලා නික්මගියහ. පිළිවෙළින් රජගහ නුවර ගිජ්ඣකුළු පව්යෙහි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් ධම්මික තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක: ‘‘බ්‍රාහ්මණ ධම්මිකයෙනි, තෙපි දැන් කොහි සිට එවු ද’’යි. වහන්ස, ජාතභූමක උවසුවන් විසින් මම ජාතභූමියෙහි සත් වෙහෙරින් නෙරණාලද්දයෙමි. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, යම් හෙයෙකින් තා එ එ වෙහෙරින් නෙරත් නම් තට මෙ (ජාතිභූමියෙහි) වාසයෙන් කවර ඵලයෙක්? එ බඳු තෙපි එ එ වෙහෙරින් නෙරණා ලද්දව මා වෙත එන්නාහු යන තෙල කරුණ තිසි ය.

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, පෙර වූ දැයක් කියමි. සාමුද්‍රික වෙළෙණ්දෝ දිශාකාකයකු (තෙරදක්නා කවුඩකු) ගෙණ නැවෙන් සමුද්‍ර වන්හ. ඔහු නැව මුහුදුතෙර නො දකුත් ම තීරදර්ශිලිහිණී මුදත්. එ ලිහිණී පෙර-දිගට යේ මැ යි. පැදුම් දිගට යේ මැ යි. උතුරැදිගට යේ මැ යි. දකුණුදිගට යේ මැ යි. උඩු දෙසට යේ මැ යි. අනුදිගට යේ මැ යි. හෙ ඉදින් හුදුරැ මුහුදුතෙර දක්නේ නම් එ සෙයින් ම ගියේ ම වෙයි. ඉදින් හෙ අවට මුහුදු තොට නො දක්නේ නම් එ නැව කරා වටාලා එයි. බ්‍රාහ්මණ ධම්මිකය, එ පරිදි ම යම් හෙයෙකින් තා එ එ වෙහෙරින් නෙරත් නම්, එබඳු තෝ එ එ වෙහෙරින් නෙරණ ලද්දව මා කරා ම එන්නෙහි.

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, වූ විරි දැයෙකි. කොරව්‍ය රජුට සුප්පතිට්ඨ නම් අතුපසක් ඇති සිහිල් සෙවණැති මනරම් නුගරුකෙක් වී. බ්‍රාහ්මණ ධම්මික-යෙනි, සුප්පතිට්ඨ නම් නිග්‍රොධරාජයාගේ ශාඛාභිනිවේශය (අතුපතර) දොළොස් යොදුන් විය. මුල් අරළුත්ගේ අභිනිවේශය පස් යොදුන් විය. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, සුප්පතිට්ඨ න්‍යග්‍රොධරාජයාගේ සහල් නැළියක බත පිසනා තලි බඳු මහත්ඵල වී. නිදෙස් දඹුළුල්බැ මීහි බඳු රසවත් ඵල එ රුක්හි වී. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, සුප්පතිට්ඨ න්‍යග්‍රොධරාජයාගේ එක් කඳක් ඇතෙවුරන් සමඟ රජ වළඳ කෙරෙයි. බලකායය එක් කඳක් වළඳ කෙරෙයි. නියම්ගම්දනව් වැස්සෝ එක් කඳක් වළඳ කෙරෙති. මහණ බමුණෝ එක් කඳක් වළඳ කෙරෙති. මෘගපක්ෂීහු එක් කඳක් වළඳ කෙරෙති. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, සුප්පතිට්ඨ නම් න්‍යග්‍රොධරාජයාගේ ඵල කිසිවෙක් නො රක්නේ ය. උනුන්ගේ කොටසෙහි ඵලයෝ උනුන්ට හිංසා නො කෙරෙති.

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඉක්බිති අන්‍යතර පුරුෂයෙක් සුප්පතිට්ඨ න්‍යග්‍රොධරාජයාගේ ඵල කැමැති තාක් භක්ෂණය කොට අත්තක් බිඳ දමා නික්ම ගියේ ය. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඉක්බිති සුප්පතිට්ඨ නුගරුක අරක් ගෙණ විසූ දෙවියහට මෙ බඳු සිතෙක් වී: ‘‘යමෙක් සුප්පතිට්ඨ න්‍යග්‍රොධරාජයා-ගේ ඵල කැමැති සේ භක්ෂණය කොට අතු බිඳ දමා නික්ම ගියේ වේ ද, මෙ මිනිස් අත්‍යන්තයෙන් පව්ටු ය. භවත්නි, එ කැකියෙන් ආශ්චර්යයි යි, භවත්නි, එකැකියෙන් අද්භූතයි. සුප්පතිට්ඨ න්‍යග්‍රොධරාජයා මතුයෙහි ඵල නො දේ නම් මැනැවි’’යි. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඉක්බිති සුප්පතිට්ඨ න්‍යග්‍රොධරාජයා මතුයෙහි පල නො දින.

අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, රාජා කොරබ්‍යො යෙන සක්කො දෙවානමින්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සක්කං දෙවානමින්දං එතදවොච: “යග්ඝෙ මාරිස, ජානෙය්‍යාසි, සුප්පතිට්ඨො නිග්‍රොධරාජා ඵලං න දෙතී”ති.

අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, සක්කො දෙවානමින්දො තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි යථා භුසා වාතවුට්ඨී ආගන්ත්වා සුප්පතිට්ඨං නිග්‍රොධරාජං පවත්තෙසි[1] උම්මූලමකාසි.

අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, සුප්පතිට්ඨෙ නිග්‍රොධරාජෙ අධිවත්ථා දෙවතා දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා එකමන්තං අට්ඨාසි.

අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, සක්කො දෙවානමින්දො යෙන සුප්පතිට්ඨෙ නිග්‍රොධරාජෙ අධිවත්ථා දෙවතා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුප්පතිට්ඨෙ නිග්‍රොධරාජෙ අධිවත්ථං දෙවතං එතදවොච: “කිං නු ත්වං දෙවතෙ දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා එකමන්තං ඨිතා”ති.

තථා හි පන මෙ මාරිස, භුසා වාතවුට්ඨී ආගන්ත්වා භවනං පවත්තෙසි[1] උම්මූලමකාසීති.

අපි නු ත්වං දෙවතෙ, රුක්ඛධම්මෙ ඨිතාය භුසා වාතවුට්ඨී ආගන්ත්වා භවනං පවත්තෙසි[1] උම්මූලමකාසීති. කථං පන මාරිස රුක්ඛො රුක්ඛධම්මෙ ඨිතො හොතීති.

ඉධ දෙවතෙ, රුක්ඛස්ස මූලං මූලත්ථිකා හරන්ති, තචං තචත්ථිකා හරන්ති, පත්තං පත්තත්ථිකා හරන්ති, පුප්ඵං පුප්ඵත්ථිකා හරන්ති, ඵලං ඵලත්ථිකා හරන්ති. න ච තෙන දෙවතාය අනත්තමනතා වා අනභිරද්ධි වා[2] කරණීයා. එවං ඛො දෙවතෙ රුක්ඛො රුක්ඛධම්මෙ ඨිතො හොතීති.

අට්ඨිතායෙව ඛො මෙ මාරිස රුක්ඛධම්මෙ භුසා වාතවුට්ඨී ආගන්ත්වා භවනං පවත්තෙසි[3] උම්මූලමකාසීති. සචෙ ඛො ත්වං දෙවතෙ රුක්ඛධම්මෙ තිට්ඨෙය්‍යාසි, සියා තෙ භවනං යථාපුරෙති. ඨස්සාමහං මාරිස රුක්ඛධම්මෙ, හොතු මෙ භවනං යථාපුරෙති.

අථ ඛො බ්‍රාහ්මණ ධම්මික, සක්කො දෙවානමින්දො තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි, යථා භුසා වාතවුට්ඨී ආගන්ත්වා සුප්පතිට්ඨං නිග්‍රොධරාජං උස්සාපෙසි. සච්ඡවීනි මූලානි අහෙසුං.

එවමෙව ඛො බ්‍රාහ්මණ ධම්මික, අපි නු තං සමණධම්මෙ ඨිතං ජාතභූමකා උපාසකා පබ්බාජෙසුං සබ්බසො ජාතභූමියං සත්තාහි ආවාසෙහීති. කථං පන භන්තෙ සමණො සමණධම්මෙ ඨිතො හොතීති. ඉධ බ්‍රාහ්මණ ධම්මික, සමණො අක්කොසන්තං න පච්චක්කොසති. රොසෙන්තං[4] න පටිරොසෙති. භණ්ඩන්තං න පටිභණ්ඩති. එවං ඛො බ්‍රාහ්මණ ධම්මික, සමණො සමණධම්මෙ ඨිතො හොතීති.

අට්ඨිතංයෙව මං භන්තෙ සමණධම්මෙ ජාතිභූමකා උපාසකා පබ්බාජෙසුං සබ්බසො ජාතිභූමියං සත්තාහි ආවාසෙහීති.

---

1 පාතෙසි - සිමු  2 අනභිරද්ධි - මජසං
3 පාතෙසි - සිමු.  4 රොසන්තං - මජසං

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඉක්බිති කෝරව්‍ය රජ සක්දෙවිඳු කරා එළඹියෙ. එළඹ සක්දෙවිඳු හට මෙසේ කී: නිදුකාණෙනි, සුප්පතිට්ඨ නිග්‍රෝධවෘක්ෂය ඵල නො දෙන්නේ ය යන්න දන්නෙහි දැ යි?

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඉක්බිති සක්දෙවිඳු යම් පරිද්දෙකින් මහ වැසි-සුළඟෙක් අවුත් සුප්පතිට්ඨ න්‍යග්‍රෝධරාජයා පෙරළිය හේ නම්, මුලිනුදුරා ලිය හේ නම්, එබඳු ඍද්ධිප්‍රයෝගයක් කෙළේ ය.

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඉක්බිති සුප්පතිට්ඨ න්‍යග්‍රෝධවෘක්ෂයෙහි විසූ දෙවියා දුකට පත් වූයේ, දොම්නස් වූයේ, කඳුළු වැකී මුහුණු ඇතියේ, හඬමින් එකත් පසෙක සිටියේ ය.

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඉක්බිති සක්දෙවිඳු සුප්පතිට්ඨ න්‍යග්‍රෝධවෘක්ෂ-යෙහි විසූ දෙවියා වෙත එළඹියේ ය. එළඹ සුප්පතිට්ඨ න්‍යග්‍රෝධවෘක්ෂයෙහි වුසූ දෙවියහට මෙසේ කී: "දෙවතාවෙනි, කවර හෙයින් තෙපි දුකට පැමිණියහු දොම්නස් ඇතියහු කඳුළු වැකි මුහුණු ඇතියහු හඬමින් එකත් පසෙක සිටියහු දැ" යි.

"එසේ ම ය, නිදුකාණෙනි, මහ වාසුළඟෙක් අවුත් මාගේ භවන ඇද හෙළී ය. උපුලා මුල් ඇහි කෙළේ ය"යි

දෙවතාවෙනි, තොප වෘක්ෂධර්මයෙහි සිටුනේ ම, මහවාසුළඟෙක් අවුත් භවන හෙළී ද, උනමුල කෙළේ දැ යි? නිදුකාණෙනි, රුකෙක් රුක්දම්හි කෙසේ නම් සිටියේ වේ දැ යි?

දෙවතාවෙනි, මෙ ලොව්හි වෘක්ෂයාගේ මුල් කැමතියහු මුල් ගෙණ යත්. සිවි කැමැතියහු සිවි ගෙණ යත්. පත් කැමැතියහු පත් ගෙණ යත්. මල් කැමතියහු මල් ගෙණ යත්. ඵල කැමැතියහු ඵල ගෙන යත්. එහෙයින් දෙවතාවා විසින් නොසතුටු බවෙක් වේ ව යි, අනභිරද්ධියෙක් (කෝපයක්) වේ ව යි නො කළ යුතු ය. දෙවතාවෙනි, මෙසේ වනාහි රුක රුක් දහම්හි සිටියේ වෙයි.

නිදුකාණෙනි, මා වෘක්ෂධර්මයෙහි නො සිටුනේ ම, මහ වැසිසුළඟෙක් අවුත් භවනය හෙළී ය. උනමුල කෙළේ ය යි. දෙවතාවෙනි ඉදින් තෝ වෘක්ෂධර්මයෙහි සිටුහු නම්, තාගේ භවනය පෙර පරිද්දෙන් සිටියේ වේ යි. නිදුකාණෙනි, මම වෘක්ෂධර්මයෙහි පිහිටන්නෙමි. මාගේ භවනය පෙර පරිද්දෙන් වේවා'යි.

එකල්හි බ්‍රාහ්මණ ධම්මිකයෙනි, සක්දෙවිඳු යම් පරිදි මහ වැසි සුළඟෙක් අවුත් සුප්පතිට්ඨනිග්‍රෝධ වෘක්ෂය ඔසොවා ලී නම්, මුල්සිවි සහිත වී නම්, එ පරිදි ඍද්ධ්‍යභිසංස්කාරයක් කෙළේ ය.

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ජාතිභූමක උපාසකයෝ එ පරිද්දෙන් ම ශ්‍රමණධර්මයෙහි සිටියා වූ ම තා ජාතිභූමියෙහි ගැම් සත් වෙහෙරින් නෙරලූහු දැයි. වහන්ස, කිසෙයින් මහණෙක් මහණදම්හි සිටියේ වේ දැ? යි. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, මෙ සස්නෙහි මහණ ආක්‍රෝශ කරන්නහුට පෙරළා ආක්‍රෝශ නො කෙරෙයි. ක්‍රෝධ දක්වන්නහුට පෙරළා ක්‍රෝධ නො දක්වයි. ඩබර කරන්නහුට පෙරළා ඩබර නො කරයි. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, මෙසෙයින් ම මහණ මහණදම්හි සිටියේ වේ යයි.

වහන්ස, ශ්‍රමණධර්මයෙහි නො පිහිටියා වූ ම මා ජාතිභූමක උපාසකයෝ ජාතිභූමියෙහි ඇති ගැම් සත්වෙහෙරින් නෙරූහ යි.

(1) භූතපුබ්බං බ්‍රාහ්මණ ධම්මික, සුනෙත්තො නාම සත්ථා අහොසි තිත්ථකරො කාමෙසු වීතරාගො. සුනෙත්තස්ස ඛො පන බ්‍රාහ්මණ ධම්මික, සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං. සුනෙත්තො සත්ථා සාවකානං බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙති. යෙ ඛො පන බ්‍රාහ්මණ ධම්මික, සුනෙත්තස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස චිත්තානි න පසාදෙසුං, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිංසු. යෙ ඛො පන බ්‍රාහ්මණ ධම්මික, සුනෙත්තස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස චිත්තානි පසාදෙසුං, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිංසු.

(2) භූතපුබ්බං බ්‍රාහ්මණ ධම්මික, **මූගපක්ඛො** නාම සත්ථා අහොසි -පෙ- (3) **අරණෙමි** නාම සත්ථා අහොසි -පෙ- (4) **කුද්දාලකො** නාම සත්ථා අහොසි -පෙ- (5) **හත්ථිපාලො** නාම සත්ථා අහොසි -පෙ- (6) **ජොතිපාලො** නාම සත්ථා අහොසි තිත්ථකරො කාමෙසු වීතරාගො. ජොතිපාලස්ස ඛො පන බ්‍රාහ්මණ ධම්මික, සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං. ජොතිපාලො සත්ථා සාවකානං බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙසි. යෙ ඛො පන බ්‍රාහ්මණ ධම්මික, ජොතිපාලස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස චිත්තානි න පසාදෙසුං, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිංසු. යෙ ඛො පන බ්‍රාහ්මණ ධම්මික, ජොතිපාලස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස චිත්තානි පසාදෙසුං, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිංසු.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ ධම්මික, යො ඉමෙ ඡ සත්ථාරෙ තිත්ථකරෙ කාමෙසු වීතරාගෙ අනෙකසතපරිවාරෙ සසාවකසඞ්ඝෙ පදුට්ඨචිත්තො අක්කොසෙය්‍ය, පරිභාසෙය්‍ය, බහුං සො අපුඤ්ඤං පසවෙය්‍යාති. එවං භන්තෙ, යො ඛො බ්‍රාහ්මණ ධම්මික ඉමෙ ඡ සත්ථාරෙ තිත්ථකරෙ කාමෙසු වීතරාගෙ අනෙකසතපරිවාරෙ සසාවකසඞ්ඝෙ දුට්ඨචිත්තො අක්කොසෙය්‍ය පරිභාසෙය්‍ය, බහුං සො අපුඤ්ඤං පසවෙය්‍ය, යො එකං[1] දිට්ඨිසම්පන්නං පුග්ගලං පදුට්ඨචිත්තො අක්කොසති පරිභාසති, අයං තතො බහුතරං අපුඤ්ඤං පසවති. තං කිස්ස හෙතු?

නාහං බ්‍රාහ්මණ ධම්මික, ඉතො බහිද්ධා එවරූපිං ඛන්තිං වදාමි යථා මං සබ්‍රහ්මචාරිසු. තස්මාතිහ බ්‍රාහ්මණ ධම්මික, එවං සික්ඛිතබ්බං "න නො ආමසබ්‍රහ්මචාරිසු[2] චිත්තානි පදුට්ඨානි භවිස්සන්තී"ති. එවං හි තෙ බ්‍රාහ්මණ ධම්මික, සික්ඛිතබ්බන්ති.

50. සුනෙත්තො මූගපක්ඛො ච අරණෙමි ච බ්‍රාහ්මණො
කුද්දාලකො අහු සත්ථා හත්ථිපාලො ච මාණවො.

51. ජොතිපාලො ච ගොවින්දො අහු සත්ත පුරොහිතො
අහිංසන්තො[3] අතීතංසෙ ඡ සත්ථාරො යසස්සිනො,

52. නිරාමගන්ධා කරුණෙ විමුත්තා කාමසඤ්ඤොජනාතිගා
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගා අහු.[4]

---

1 එකං - සිමු.
2 සමසබ්‍රහ්මචාරීසු - මජසං. සකෙසු සබ්‍රහ්මචාරීසු - සිමු, PTS.
3 අහිංසකා - මජසං, සිමු, අහිංසන්තා - සං
4 අහුං - මජසං.

(1) බ්‍රාහ්මණ ධම්මිකයෙනි, භූතපූර්වයක් කියමි. කාමයෙහි විතෘෂ්ණා-වගයෙන් වීතරාග වූ තීර්ථකර වූ **සුනේත්‍ර** නම් ශාස්තෘවරයෙක් වී. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, සුනෙත්‍ර ශාස්තෘහට අනෙකශත ශ්‍රාවකයෝ වූහ. සුනෙත්‍ර ශාස්තෘ තෙමේ සවුවනට බ්‍රහ්මලොකසහව්‍යසයට දහම් දෙසයි. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, බ්‍රහ්මලොකසහව්‍යසයට දම් දෙසන සුනෙත්‍ර ශාස්තෘ කෙරෙහි යම් කෙනෙක් සිත් නොපැහැදූහු නම්, උහු කාබුත් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට එළඹියහ. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, බ්‍රාහ්මලොකසහභාවය පිණිස දම් දෙසන සුනෙත්‍ර ශාස්තෘහු කෙරෙහි යම් කෙනෙක් සිත් පැහැදූහු නම් ඔහු කාබුත් මරණින් මතු සුගති ස්වර්ගලොකයෙහි උපන්හ.

(2) බ්‍රාහ්මණ ධම්මිකයෙනි, වූ විරිදූයෙකි. **මූගපක්ඛ** නම් ශාස්තෘවර-යෙක් වී ... (3) **අරණේමි** නම් ශාස්තෘවරයෙක් වී ... (4) **කුද්දාලක** නම් ශාස්තෘවරයෙක් වී ... (5) **හත්ථිපාල** නම් ශාස්තෘවරයෙක් වී ... (6) **ජෝති-පාල** නම් කාමයන්හි වීතරාග වූ තීර්ථකර වූ ශාස්තෘවරයෙක් වී. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ජෝතිපාල ශාස්තෘහුගේ අනෙකශත ශ්‍රාවකයෝ වූහ. ජෝතිපාල ශාස්තෘ ශ්‍රාවකයනට බ්‍රහ්මලොකසහව්‍යසයට දම් දෙසී. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, බ්‍රහ්මලොකසහව්‍යසයට දම් දෙසන ජෝතිපාල ශාස්තෘහු කෙරෙහි යම් කෙනෙක් සිත් නො පැහැදූහු නම් ඔහු කාබුත් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයෙහි උපන්හ. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, බ්‍රහ්මලොකසහව්‍යයට දම් දෙසන ජෝතිපාල ශාස්තෘ කෙරෙහි යම් කෙනෙක් සිත් පැහැදූහු නම් උහු කාබුත් මරණින් මතු සුගති ස්වර්ගලොකයෙහි උපන්හ.

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, ඒ කිමැයි හඟිහි ද? යමෙක් කාමයෙහි වීතරාග වූ අනෙකශතපරිවාර ඇති ශ්‍රාවකසඞ්ඝයා සහිත තීර්ථකර වූ මේ ෂට්-ශාස්තෘනට දුෂ්ට සිත් ඇතියේ ආක්‍රොශ කෙරේ නම්, පරිභව කෙරේ නම් හෙතෙමේ බොහෝ පව් රැස් කෙරේදැයි? වහන්ස, එසේ ය. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, කාමයෙහි වීතරාග වූ අනෙකශත පරිවාර ඇති ශ්‍රාවක-සඞ්ඝයා සහිත තීර්ථකරවූ මේ ෂට්ශාස්තෘනට යමෙක් දුෂ්ට සිත් ඇතියේ ආක්‍රොශ කෙරේ නම්, පරිභව කෙරේ නම්, හෙතෙමේ බොහෝ පව් රැස් කරන්නේ ද, යමෙක් දෘෂ්ටිසම්පන්න වූ (සෝවන් වූ) එකද පුද්ගලයකුට ප්‍රදුෂ්ට සිත් ඇතියේ ආක්‍රොශ කෙරේ නම්, පරිභව කෙරේ නම්, මෙ තෙමේ එයට අධිකතර පව් රැස් කරන්නේ ය. එ කවර හෙයින යත්:

බ්‍රාහ්මණ ධම්මිකයෙනි, සබ්‍රම්සරුන් කෙරෙහි යම් බඳු මේ ගුණ කෑණීමෙක් වේ නම් එබඳු ගුණ කෑණීමෙක් මෙ සස්නෙන් බැහැර ඇතැයි මම නො කියමි. බ්‍රාහ්මණ ධම්මිකයෙනි, එ හෙයින් ම මෙ කරුණෙහිලා මෙසේ හික්මිය යුතු: ස්වකීය සබ්‍රම්සරුන් කෙරෙහි ප්‍රදුෂ්ට සිත් අපට නො වේවයි. බ්‍රාහ්මණ, ධම්මිකයෙනි, තා විසින් මෙසේ ම හික්මිය යුතු යයි.

50-51 සුනෙත්ත හා මූගපක්ඛ හා අරණේමි බ්‍රාහ්මණ හා කුද්දාලක හා හත්ථිපාල ශාස්තෘ හා, සත්රජුනට පුරෝහිත වූ මහාගොවිඳ නැත්පත් ජෝතිපාල මාණව දැයි අතීත කාලයෙහි අහිංසක වූ යශස්වී වූ එතෙල ෂට්ශාස්තෘ කෙනෙක් වූහ.

52 ක්‍රොධ සඞ්ඛ්‍යාත ආමගන්ධ නැති, කරුණාධ්‍යානයෙහි මිදුනු (කරුණා-යෙහි ද කරුණාපූර්වභාගයෙහි ද සිටි) කාමසංයොජන මැඩ ගිය එ ශාස්තෘහු කාමරාගය දුරු කොට බ්‍රහ්මලොකොපග වූහ. (බඹලොව උපන්හ.)

53. අහෙසුං සාවකා තෙසං අනෙකානි සතානිපි
නිරාමගන්ධා කරුණෙ විමුත්තා කාමසඤ්ඤොජනාතිගා
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගා අහු.[1]

54. යෙ තෙ ඉසී බාහිරකෙ වීතරාගෙ සමාහිතෙ
පදුට්ඨමනසඞ්කප්පො යො නරො පරිභාසති,

55. බහුඤ්ච සො පසවති අපුඤ්ඤං තාදිසො නරො.
යො චෙකං දිට්ඨිසම්පන්නං භික්ඛුං බුද්ධස්ස සාවකං,

56. පදුට්ඨමනසඞ්කප්පො යො නරො පරිභාසති,
අයං තතො බහුතරං අපුඤ්ඤං පසවෙ නරො.

57. න සාධුරූපං ආසීදෙ දිට්ඨිට්ඨානප්පහායිනං
සත්තමො පුග්ගලො එසො අරියසඞ්ඝස්ස වුච්චති.

58. අවීතරාගො කාමෙසු යස්ස පඤ්චින්ද්‍රියා මුදූ
සද්ධා සති ච විරියං සමථො ච විපස්සනා.

59. තාදිසං භික්ඛුමාසජ්ජ[2] පුබ්බෙව උපහඤ්ඤති
අත්තානං උපහන්ත්වාන පච්ඡා අඤ්ඤං විහිංසති.

60. යො ච රක්ඛති අත්තානං රක්ඛිතො තස්ස බාහිරො
තස්මා රක්ඛෙය්‍ය අත්තානං අක්ඛතො පණ්ඩිතො සදා.

ධම්මිකවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

නාග මිගසාලා ඉණං චුන්දං දෙව සන්දිට්ඨිකං[3]
ඛෙම ඉන්ද්‍රියා ආනන්ද ඛත්තියා අප්පමාදෙන ධම්මිකොති.

පඨමො පණ්ණාසකො.

---

1. අහුං - මජසං:
2. භික්ඛුං ආසජ්ජ - සීමු
3. චුන්දංදෙව සන්දිට්ඨිකා දුවෙ - මජසං.

53. ඔවුනට (සොළ සඞ්ඛ්‍යාත) ආමගන්ධරහිත වූ කරුණාධ්‍යානයෙහි විමුක්ත වූ කාම සංයෝජන ඉක්මගියා වූ අනේක ශත ශ්‍රාවකයෝ වූහ ඔහු ද කාමරාගය දුරු කොට බ්‍රහ්මලෝකෝපග වූහ.

54. ප්‍රදුෂ්ට චිත්තසංකල්ප ඇති යම් පුරුෂයෙක් බාහිර ශාසනයට අයත් වීතරාග වූ සමාහිත වූ තෙල ඍෂීනට පරිභව කෙරේ ද?

55. එබඳු එ පුරිස් බොහෝ පව් රැස් කෙරෙයි. යමෙක් බුද්ධශ්‍රාවක වූ දෘෂ්ටිසම්පන්න වූ එක ද භික්ෂුනමකට –

56. ප්‍රදුෂ්ට චිත්තසඞ්කල්ප ඇතියේ පරිභව කෙරේ නම්, මෙ පුරිස් ඔහට අධිකතර පව් රැස් කෙරෙයි.

57. ආශාවසිද්දෘෂ්ටිප්‍රහාණය කරණ පුළු ශ්‍රාවකයකු (පරිභව විසින්) නො ගටන්නේ ය. තෙල පුඟුල් (ස්‍රොතාපත්ති ඵලසථයා) අරිඝනට (රහතුන් පටන්) සප්තම පුඟුලැයි කියනු ලැබේ.

58. කාමයෙහි යම් පුඟුලෙක් අවීතරාග වේ ද, යම් පුඟුලකුහුගේ ශ්‍රද්ධා ය, ස්මෘතිය, වීර්‍ය ය, ශමථ සඞ්ඛ්‍යාත සමාධිය, සංස්කාරපරිග්‍රහණඥානය දැයි පස්වා විදර්ශනෙන්ද්‍රියයෝ මෘදු වෙත් නම්,

59. එබඳු මහණකු ගටා කැලැ මැ හැනෙයි. (පලමු ම) තමත් (ගුණ) නසා පැසුලු අනෙකා වෙහෙසත්නේ ය.

60. යමෙකුත් තමා (අධ්‍යාත්මය) රක්නේ ද, බැහැරි පුඟුල් උහු විසින් රක්නාලද වෙයි. එහෙයින් ගුණ විසින් නො පිරිහුනු පණ්ඩිත තෙමේ හැම කල් තමා රක්නේ යි.

ධම්මික වර්ගය පස්වැනි යි.

එහි උද්දානය:

නාග සූත්‍රය, මිගසාලා සූත්‍රය, ඉණ සූත්‍රය, චුන්ද සූත්‍රය, සන්දිට්ඨික සූත්‍ර දෙකය, ඛෙම සූත්‍රය, ඉන්ද්‍රිය සූත්‍රය, ආනන්ද සූත්‍රය, ඛත්තිය සූත්‍රය, අප්‍රමාද සූත්‍රය, ධම්මික සූත්‍රය යි දොළොසෙකි.

ප්‍රථම පණ්ණාසකය සමාප්ත යි.

# 2. දුතියො පණ්ණාසකො.

## මහාවග්ගො.

### 6. 2. 1. 1.

### [සොණ සුත්තං]

1. එවමෙම සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා සොණො රාජගහෙ විහරති සීතවනස්මිං.

අථ ඛො ආයස්මතො සොණස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "යෙ ඛො කෙචි භගවතො සාවකා ආරද්ධවිරියා විහරන්ති, අහං තෙසං අඤ්ඤතරො. අථ ච පන මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. සංවිජ්ජන්ති ඛො පන මෙ කුලෙ භොගා. සක්කා භොගෙ ච භුඤ්ජිතුං පුඤ්ඤානි ච කාතුං. යන්නූනාහං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජෙය්‍යං, පුඤ්ඤානි ච කරෙය්‍යන්ති.

අථ ඛො භගවා ආයස්මතො සොණස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එවමෙවං[1] ගිජ්ඣකූටෙ පබ්බතෙ අන්තරහිතො සීතවනෙ ආයස්මතො සොණස්ස පමුඛෙ පාතුරහොසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. ආයස්මාපි ඛො සොණො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සොණං භගවා එතදවොච:

නනු තෙ සොණ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "යෙ ඛො කෙචි භගවතො සාවකා ආරද්ධවිරියා විහරන්ති, අහං තෙසං අඤ්ඤතරො, අථ ච පන මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. සංවිජ්ජන්ති ඛො පන මෙ කුලෙ භොගා. සක්කා භොගෙ ච භුඤ්ජිතුං පුඤ්ඤානි ච කාතුං. යන්නූනාහං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජෙය්‍යං, පුඤ්ඤානි ච කරෙය්‍යන්ති"

එවං භන්තෙ.

තං කිං මඤ්ඤසි, සොණ කුසලො ත්වං පුබ්බෙ අගාරිකභූතො වීණාය තන්තිස්සරෙති.

එවං භන්තෙ.

තං කිං මඤ්ඤසි සොණ යදා තෙ වීණාය තන්තියො අච්චායතා හොන්ති, අපි නු තෙ වීණා තස්මිං සමයෙ සරවතී වා හොති, කම්මඤ්ඤා වාති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි සොණ යදා තෙ වීණාය තන්තියො අතිසිථිලා හොන්ති, අපි නු තෙ වීණා තස්මිං සමයෙ සරවතී වා හොති කම්මඤ්ඤා වාති නො හෙතං භන්තෙ.

---

1 එවමෙව ඛො - මජසං,

# 2. දෙවැනි පණ්ණාසකය.

## මහාවග්ගය

### 6. 2. 1. 1.

### [සෝණ සූත්‍රය]

1. මා විසින් මෙසේ අසනලද එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩවසනසේක. එ සමයෙහි ආයුෂ්මත් සෝණ තෙරණුවෝ රජගහනුවර සීතවනයෙහි වාස කෙරෙති.

එකල්හි රහොගත ව පිළිසලනට ගිය ආයුෂ්මත් සෝණ තෙරණුවන්ට මෙ බඳු විතක්කපරිවිතක්කයෙක් උපන: "භගවත්හුගේ ඇරඹූ වීර්‍යයී ඇති යම් කිසි ශ්‍රාවක කෙනෙක් වෙසෙත් නම්, මම ඔවුනතුරෙන් අන්‍යතරයෙක්මි. වැලිදු මාගේ සිත උපාදාන විසින් නො ගෙණ ආස්‍රවයෙන් නො මිදෙයි. මාගේ කුලයෙහි භොගයෝ ඇත් මැ යි. භොගයන් වළඳන්නට ද පින් කරන්නට ද හැකි වේ. මම් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන (උපසම්පදා පිළිකෙවි) කොට හුනු බවට (ගිහි බවට) පැමිණ භොගයනුදු වළඳ කෙරෙම් නම් පිණුදු කෙරෙම් නම් මැනැවැ"යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ (තමන් වහන්සේගේ) සිතින් ආයුෂ්මත් සෝණ තෙරුන්ගේ විතක්කපරිවිතක්කය දැන වදුරා බලවත් පුරුෂයෙක් හැකුළු අත හෝ දිගුකරන්නේ යම්සේ නම්, දිගු කළ අතක් හෝ හකුළන්නේ යම්සේ නම් එසෙයින් ම ගිජුකුළු පව්යෙහි අතුරුදන් වූසේක් සීතවනයෙහි ආයුෂ්මත් සෝණ තෙරණුවන්ගේ හමුයෙහි පැණී ගියසේක. භාග්‍යවතුන් වහන්සේ පැන් වූ අස්නෙහි හුන්සේක. ආයුෂ්මත් සෝණ තෙරහු ද භාග්‍යවතුන් සකසා වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් සෝණ තෙරුන්හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක:

සෝණයෙනි, රහෝගත ව එකලා ව හුන් තොපගේ සිත්හි මෙබඳු පරිවිතක්කයෙක් පහළ වූයේ නො වේ ද? "භාග්‍යවතුන් වහන්සේගේ යම් කිසි ශ්‍රාවක කෙනෙක් රැකුළු වැර ඇතියාහු වෙසෙත් නම්, මම ඔවුනතර අන්‍යතරයෙක්මි. වැලිත් මාගේ සිත උපාදාන විසින් නො ගෙණ, ආස්‍රවයන්ගෙන් නො මිදෙයි. මාගේ කුලයෙහි භොග ඇත් මැය. භොග වළඳ කරන්නට ද පින් කරන්නට ද හැකි වේ. මම ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීන භාවයට ගොස් භොගයනු ද වළඳ කෙරෙම් නම්, පිණුදු කෙරෙම් නම් මැනැවැ"යි.

වහන්ස එසේ ය.

සෝණයෙනි, එ කිමැයි හඟිහි. තෝ පෙර අගාරික වූයෙහි වීණාතන්ත්‍රිස්වරයෙහි (වෙණවැයීමෙහි) දක්ෂයෙහි?

වහන්ස, එසේ ය.

සෝණයෙනි, එ කිමැයි හඟිහි. යම් විටෙක තාගේ වීණායෙහි තන්ත්‍රිහු අත්‍යායත (ඉතා තද) වෙත් නම්, තාගේ වීණාව එ සමයෙහි සවරවත් වේ දැයි, කම්ණ්‍යත් වේ දැයි?

වහන්ස, තෙල නො වේ මැයි.

සෝණයෙනි, එ කිමැයි හඟිහි. යම් විටෙක තාගේ වීණායෙහි තන්ත්‍රිහු ඉතා ලිහිල් වෙත් නම්, එ සමයෙහි තාගේ වීණාව සවරවත් වේ දැයි. කම්ණ්‍ය හෝ වේ දැයි? වහන්ස, තෙල නො වේ මැයි.

යදා පන තෙ සොණ වීණාය තන්තියො න අච්චායතා හොන්ති න අතිසිථිලා, සමෙ ගුණෙ පතිට්ඨිතා, අපි නු තෙ වීණා තස්මිං සමයෙ සරවතී වා හොති කම්මඤ්ඤා වාති.

එවම්භන්තෙ.

එවමෙව බො සොණ අච්චාරද්ධං විරියං උද්ධච්චාය සංවත්තති. අතිලීනං විරියං[1] කොසජ්ජාය සංවත්තති. තස්මාතිහ ත්වං සොණ, විරියසමතං අධිට්ඨහ, ඉන්ද්‍රියානං ච සමතං පටිවිජ්ඣ, තත්ථ ච නිමිත්තං ගණ්හාහීති.

"එවම්භන්තෙ"ති ඛො ආයස්මා සොණො භගවතො පච්චස්සොසි.

අථ ඛො භගවා ආයස්මන්තං සොණං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බො සීතවනෙ අන්තරහිතො ගිජ්ඣකූටෙ පබ්බතෙ පාතුරහොසි.

අථ ඛො ආයස්මා සොණො අපරෙන සමයෙන විරියසමතං අධිට්ඨාසි- ඉන්ද්‍රියානඤ්ච සමතං පටිවිජ්ඣි. තත්ථ ච නිමිත්තං අග්ගහෙසි. අථ ඛො ආයස්මා සොණො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා"ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා සොණො අරහතං අහොසි.

අථ ඛො ආයස්මතො සොණස්ස අරහත්තප්පත්තස්ස එතදහොසි: "යන්නූනාහං යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යං, උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ අඤ්ඤං ව්‍යාකරෙය්‍යන්ති." අථ ඛො ආයස්මා සොණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො ආයස්මා සොණො භගවන්තං එතදවොච:

යො සො භන්තෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තො, සො ඡ ඨානානි අධිමුත්තො හොති: නෙක්ඛම්මාධිමුත්තො හොති. පවිවෙකාධිමුත්තො හොති. අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති. තණ්හක්ඛයාධිමුත්තො හොති. උපාදානක්ඛයාධිමුත්තො හොති. අසම්මොහාධිමුත්තො හොති.

(1) සියා ඛො පන භන්තෙ, ඉධෙකච්චස්ස ආයස්මතො එවමස්ස: 'කෙවලං සද්ධාමත්තකං නූන අයමායස්මා නිස්සාය නෙක්ඛම්මාධිමුත්තො'ති. න ඛො පනෙතං භන්තෙ එවං දට්ඨබ්බං. ඛීණාසවො භන්තෙ භික්ඛු වුසිතවා. කතකරණීයො, කරණීයං අත්තනො අසමනුපස්සන්තො කතස්සවා පතිචයං, ඛයා රාගස්ස වීතරාගත්තා නෙක්ඛම්මාධිමුත්තො හොති. ඛයා දොසස්ස වීතදොසත්තා නෙක්ඛම්මාධිමුත්තො හොති, ඛයා මොහස්ස වීතමොහත්තා නෙක්ඛම්මාධිමුත්තො හොති.

---

1· අතිසිථිලං විරියං, - මජසං,

සෝණයෙනි, යම් විටක තාගේ වීණායෙහි තන්ත්‍රීහු අත්‍යායත නො වෙත් නම්, අතිසිථිල නො වෙත් නම්, සමගුණයෙහි පිහිටියාහු නම්, එවිට තාගේ වීණාව සවරවත් හෝ වේද, කර්මණ්‍යත් හෝ වේ දැ'යි?

වහන්ස, එසේ ය.

සෝණයෙනි, එ පරිද්දෙ ම අත්‍යාරබ්ධ වීර්‍ය්‍යය උද්ධච්චය පිණිස වැටෙයි. අතිලීන වීර්‍ය්‍යය කුසීත භාවයට වැටෙයි. සෝණයෙනි, එ කරුණින් මෙහිලා තෝ වීර්‍ය්‍ය සමත්වය ඉටුව, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියසමත්වය පිළිවිදුව, එහි නිමිති ගණුව යි. (ශමථවිදර්‍ශනා මාර්ගඵල නිමිති නිපදව යන අර්‍ථයි.)

වහන්ස, එසේ ය යි ආයුෂ්මත් සෝණ තෙරණුවෝ භගවත්හට පිළිවදන් ඇස්වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සෝණ තෙරුන්ට මේ ඔවාදයෙන් ඔවා දී බලවත් පුරුෂයෙක් හැකුළු අතක් හෝ දිගු කරණුයේ යම් සේ නම්, දික්කළ අතක් හෝ හකුළනුයේ යම් සේ නම්, එ පරිද්දෙන් ම සීතවනයෙහි අතුරුදන් වූ සේක් ගිජුකුළුපව්වෙහි පැණී ගිය සේක.

එක්බිති ආයුෂ්මත් සෝණ තෙරහු පසුකාලයෙහි වීර්‍ය්‍යසමත්වය ඉටූහ. ඉන්ද්‍රියසමත්වය පිළිවිදියහ. එහි නිමිති ද ගත්හ. ඉක්බිති එකලා වූ කයින් ගණයා කෙරෙන් වෙන් වූ අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති කාය ජීවිතදෙක්හි නිරපෙක්ෂ වූ ආයුෂ්මත් සෝණ තෙරහු නො බෝ දිනෙකින් ම යමක් පිණිස කුලපුත්‍රයෝ මනා කොට ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණෙත් නම් එ බ්‍රහ්මචර්‍ය්‍ය පර්‍ය්‍යවසාන අනුත්තර අර්හත් ඵලය දිට්ඨධර්මයෙහි ම, තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට එළඹ වුසූහ. 'ජාති සඞ්ඛ්‍යාත පුනර්භවය ක්ෂීණ විය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය ද වැස නිමවනලද, සිවුමග කරණී කරණලද, නැවත මෙ බව පිණිස (මේ සොළොස් වැදෑරුම් කෘත්‍යය හෝ කෙලෙශක්ෂය පිණිස) අනෙකක් (අනෙක් මාර්ගභාවනාකෘත්‍යයෙක්) නැතැයි මොනොවට දත්හ. ආයුෂ්මත් සෝණ තෙරණුවෝ රහතුන් කෙරෙහි අන්‍යතර වූහ.

ඉක්බිති අර්හත්වයට පත් ආයුෂ්මත් සෝණ තෙරුන්හට තෙල සිත විය: "මම භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙම් නම්, එළඹ භගවත්හු හමියෙහි අර්හත්වය පාළ කෙරෙම් නම් මැනැවැ"යි. ඉක්බිති ආයුෂ්මත් සෝණ තෙරණුවෝ භාග්‍යවතුන් කරා ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් සෝණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළකළහ:

වහන්ස, යම් ඒ අර්හත් වූ ක්ෂීණාශ්‍රව වූ වැස නිම වූ කළ කරණී ඇති බහා තැබූ කෙලෙස් බර ඇති පැමිණි රහත්බව ඇති පරික්ෂීණ භවසංයෝජන ඇති මොනොවට දැන විමුක්ත වූ භික්ෂුනමෙක් වේ නම්, හෙ කරුණු සයක් අධිමුක්ත (පිළිවිද සිටියේ) වෙයි: නෛෂ්ක්‍රම්‍යාධිමුක්ත වෙයි, ප්‍රවිවෙකාධිමුක්ත වෙයි, අව්‍යාබාධාධිමුක්ත වෙයි, තෘෂ්ණාක්ෂයාධිමුක්ත වෙයි, උපාදානක්ෂයාධිමුක්ත වෙයි, අසම්මෝහාධිමුක්ත වෙයි.

(1) වහන්ස, මෙ සස්නෙහි කිසි ආයුෂ්මතක්හට මෙබඳු සිතෙක් වන්නේ ම ය: "හුදෙක් (ප්‍රතිවේදයෙන් තොර) ශ්‍රද්ධා මාත්‍රය ම නිසා මේ ආයුෂ්මත් ඒකාන්තයෙන් නෛෂ්ක්‍රම්‍යාධිමුක්ත වේ ය"යි. වහන්ස, තෙල කරුණ එසේ නො දැක්කයුතු වෙයි. වහන්ස, වැස නිම වූ කළ කරණී ඇති, ක්ෂීණාශ්‍රව මහණ තමාහට කටයුතු දෙයක් හෝ, කළදැය නැවත තිරීමෙන් වැඩීමක් හෝ නො දක්නේ, රාගක්ෂයෙන් වීතරාගී බැවින් නෛෂ්ක්‍රම්‍යාධිමුක්ත (නෛෂ්ක්‍රම්‍යසංඛ්‍යාත අර්හත්වය ප්‍රත්‍යක්ෂ කොට ඵලසමවත්හි සිටියේ) වෙයි. ද්වේෂක්ෂයෙන් විගතද්වේෂ ඇති බැවින් නෛෂ්ක්‍රම්‍යාධිමුක්ත වෙයි මෝහක්ෂයෙන් විගත මෝහ ඇති බැවින් නෛෂ්ක්‍රම්‍යාධිමුක්ත වෙයි.

(2) සියා ඛො පන භන්තෙ, ඉධෙකච්චස්ස ආයස්මතො එවමස්ස: "ලාභසක්කාරසිලොකං නූන අයමායස්මා නිකාමයමානො පවිවෙකාධිමුත්තො"ති. න ඛො පනෙතං භන්තෙ, එවං දට්ඨබ්බං. ඛීණාසවො භන්තෙ, භික්ඛු වුසිතවා කතකරණීයො, කරණීයං අත්තනො අසමනුපස්සන්තො කතස්ස වා පතිචයං, ඛයා රාගස්ස වීතරාගත්තා පවිවෙකාධිමුත්තො හොති, ඛයා දොසස්ස වීතදොසත්තා පවිවෙකාධිමුත්තො හොති, ඛයා මොහස්ස වීතමොහත්තා පවිවෙකාධිමුත්තො හොති.

(3) සියා ඛො පන භන්තෙ, ඉධෙකච්චස්ස ආයස්මතො එවමස්ස: සීලබ්බතපරාමාසං නූන අයමායස්මා සාරතො පච්චාගච්ඡන්තො අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති. න ඛො පනෙතං භන්තෙ, එවං දට්ඨබ්බං. ඛීණාසවො භන්තෙ, භික්ඛු වුසිතවා කතකරණීයො, කරණීයං අත්තනො අසමනුපස්සන්තො කතස්ස වා පතිචයං, ඛයා රාගස්ස වීතරාගත්තා අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති, ඛයා දොසස්ස වීතදොසත්තා, අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති, ඛයා මොහස්ස වීතමොහත්තා අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති. -පෙ-

(4) ඛයා රාගස්ස වීතරාගත්තා තණ්හක්ඛයාධිමුත්තො හොති, ඛයා දොසස්ස වීතදොසත්තා තණ්හක්ඛයාධිමුත්තො හොති, ඛයා මොහස්ස වීතමොහත්තා තණ්හක්ඛයාධිමුත්තො හොති -පෙ-

(5) ඛයා රාගස්ස වීතරාගත්තා උපාදානක්ඛයාධිමුත්තො හොති, ඛයා දොසස්ස වීතදොසත්තා උපාදානක්ඛයාධිමුත්තො හොති, ඛයා මොහස්ස වීතමොහත්තා උපාදානක්ඛයාධිමුත්තො හොති -පෙ-

(6) ඛයා රාගස්ස වීතරාගත්තා අසම්මොහාධිමුත්තො හොති, ඛයා දොසස්ස වීතදොසත්තා අසම්මොහාධිමුත්තො හොති, ඛයා මොහස්ස වීතමොහත්තා අසම්මොහාධිමුත්තො හොති.

එවං සම්මාවිමුත්තචිත්තස්ස, භන්තෙ, භික්ඛුනො භුසා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථමාගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති, අමිස්සීකතමෙවස්ස චිත්තං හොති, ඨිතං ආනෙඤ්ජප්පත්තං. වයඤ්චස්සානුපස්සති. භුසා චෙපි සොතවිඤ්ඤෙය්‍යා සද්දා [සොතස්ස ආපාථමාගච්ඡන්ති] -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා [ඝානස්ස ආපාථමාගච්ඡන්ති] -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා [ජිව්හාය ආපාථමාගච්ඡන්ති] -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා [කායස්ස ආපාථමාගච්ඡන්ති] -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථමාගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති, අමිස්සීකතමෙවස්ස චිත්තං හොති, ඨිතං ආනෙඤ්ජප්පත්තං, වයඤ්චස්සානුපස්සති.

සෙය්‍යථාපි භන්තෙ සෙලො පබ්බතො අච්ඡිද්දො අසුසිරො එකග්ඝනො. අථ පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි නෙව නං සඞ්කම්පෙය්‍ය, න සම්පකම්පෙය්‍ය, න සම්පවෙධෙය්‍ය, අථ පච්ඡිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි -පෙ- අථ උත්තරාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි -පෙ- අථ දක්ඛිණාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි නෙව නං සඞ්කම්පෙය්‍ය, න සම්පකම්පෙය්‍ය, න සම්පවෙධෙය්‍ය.

(2) වහන්ස, මෙ සස්නෙහි කිසි ආයුෂ්මතක් හට මෙබඳු සිතෙක් වන්නේ ය: ''මෙ ආයුෂ්මත් ඒකාන්තයෙන් ලාභසත්කාරයශස් පතනුයේ ප්‍රවිවෙකාධිමුක්ත වේ ය''යි. වහන්ස, තෙල කරුණ එසේ නො දතයුතු වෙයි. වහන්ස, වැස නිමි වූ, කළ කරණී ඇති ක්ෂිණාශ්‍රව මහණ තමහට කරණී හෝ කළ දෑ පිළිබඳ පුනපුනා රැස් කිරීමක් හෝ නො දක්නේ, රාග ක්‍ෂයෙන් ප්‍රහතරාග බැවින් ද්වේෂ ක්‍ෂයෙන් ප්‍රහතද්වේෂ බැවින් මෝහ ක්‍ෂයෙන් ප්‍රහතමෝහ බැවින් ප්‍රවිවෙකාධිමුක්ත වෙයි.

(3) වහන්ස, මෙ සස්නෙහි කිසි ආයුෂ්මතක් හට මෙ බඳු සිතෙක් වන්නේ ම ය '' මෙ ආයුෂ්මත් සීලබ්බත පරාමාසය ම සාර වසින් ගන්නේ අව්‍යාබාධාධිමුක්ත වෙයි, වහන්ස, තෙල කරුණ එසේ නො දැක්ක යුතු වෙයි. වහන්ස, වැස නිමි වූ කළ කරණී ඇති ක්ෂිණාශ්‍රව මහණ තමන්ගේ කරණී හෝ කෘතයාගේ පුන පුනා වෘද්ධියක් හෝ නො දක්නේ රාගක්‍ෂයෙන් විගතරාග බැවින් අව්‍යාබාධාධිමුක්ත වෙයි. ද්වේෂක්‍ෂයෙන් විගතද්වේෂ බැවින් අව්‍යාබාධාධිමුක්ත වෙයි. මෝහක්‍ෂයෙන් විගතමෝහ බැවින් අව්‍යාබාධාධිමුක්ත වෙයි. ...

(4) රාගක්‍ෂයෙන් විගතරාග බැවින් තෘෂ්ණාක්‍ෂයාධිමුක්ත වෙයි. ද්වේෂක්‍ෂයෙන් විගතද්වේෂ බැවින් තෘෂ්ණාක්‍ෂයාධිමුක්ත වෙයි. මෝහක්‍ෂයෙන් විගතමෝහ බැවින් තෘෂ්ණාක්‍ෂයාධිමුක්ත වෙයි ...

(5) රාගක්‍ෂයෙන් විගතරාග බැවින් උපාදානක්‍ෂයාධිමුක්ත වෙයි. ද්වේෂක්‍ෂයෙන් විගතද්වේෂ බැවින් උපාදානක්‍ෂයාධිමුක්ත වෙයි. මෝහක්‍ෂයෙන් විගතමෝහ බැවින් උපාදානක්‍ෂයාධිමුක්ත වෙයි ...

(6) රාගක්‍ෂයෙන් විගතරාග බැවින් අසම්මොහාධිමුක්ත වෙයි. ද්වේෂක්‍ෂයෙන් විගතද්වේෂ බැවින් අසම්මොහාධිමුක්ත වෙයි. මෝහක්‍ෂයෙන් විගතමෝහ බැවින් අසම්මොහාධිමුක්ත වෙයි.

වහන්ස, මෙසේ මොනොවට විමුක්තචිත්ත ඇති භික්‍ෂුහුගේ චක්‍ෂුර්විඥෙය වූ බොහෝ (දෙව්රූ වැනි) වූ ද රූපයෝ ඇස්හමුවට එත් ද, ඔහුගේ සිත නො ගණිත්. ඔහුගේ සිත අමිශ්‍රීකෘත ම වූයේ ස්ථිත වූයේ අචලප්‍රාප්ත වූයේ වෙයි. එ චිත්තයාගේ උදයව්‍යය ද දක්නේ ය. බලවත් වූ ද ශ්‍රොත්‍රවිඥෙයශබ්දාලම්බනයෝ ... ඝ්‍රාණවිඥෙය ගන්ධාලම්බනයෝ ... ජිව්හාවිඥෙය රසාලම්බනයෝ ... කායවිඥෙය ස්පෘෂ්ටව්‍යාලම්බනයෝ ... මනොවිඥෙයධර්මාලම්බනයෝ ඔහුගේ මනස හමුවට එත් නම්, ඔහුගේ සිත නො ම ගණිත්. ඔහුගේ සිත අමිශ්‍රීකෘත ම වූයේ ස්ථිත වූයේ අචලප්‍රාප්ත වෙයි. ඒ චිත්තයාගේ උදයව්‍යය ද දක්නේ ය.

වහන්ස, සිදුරු නැති බුහුරු නැති එකඝන වූ ශෛලපර්වතයෙක් යම් බඳු වේ ද, ඉක්බිති පැදුම් දිගින් බලවත් වැසිසුළඟෙක් ඒ නම් එය නො ම සලන්නේ ය. වෙසෙසින් නො සලන්නේ ය. නො වෙව්ළුවන්නේ ය. ඉක්බිති පැලදිගින් බලවත් වැසි සුළඟෙක් ඒ නම් උතුරු දිගින් බලවත් සුළඟෙක් ඒ නම් ... ඉක්බිති දකුණු දිගින් බලවත් වැසිසුළඟෙක් ඒ නම්, එය නො ම සලන්නේ ය. වෙසෙසින් නො ම සලන්නේ ය නො වෙව්ළුවන්නේ ය.

එවමෙව ඛො භන්තෙ, එවං සම්මාවිමුත්තචිත්තස්ස භික්ඛුනො භුසා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස අපාථමාගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං, වයං චස්සානුපස්සති. භුසා චෙපි සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථමාගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති, අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං, වයං චස්සානුපස්සතී'ති.

61. නෙක්ඛම්මං අධිමුත්තස්ස පවිවෙකඤ්ච චෙතසො
අබ්‍යාපජ්ඣාධිමුත්තස්ස උපාදානක්ඛයස්ස ච.

62. තණ්හක්ඛයාධිමුත්තස්ස අසම්මොහඤ්ච චෙතසො
දිස්වා ආයතනුප්පාදං සම්මාචිත්තං විමුච්චති.

63. තස්ස සම්මාවිමුත්තස්ස සන්තචිත්තස්ස භික්ඛුනො
කතස්ස පතිචයො නත්ථි කරණීයං න විජ්ජති.

64. සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං රූපා රසා සද්දා ගන්ධා ඵස්සා ච කෙවලා.

65. ඉට්ඨා ධම්මා අනිට්ඨා ච නප්පවෙධෙන්ති තාදිනො
ඨිතං චිත්තං විප්පමුත්තං වයං චස්සානුපස්සතී'ති.

6. 2. 1. 2.

[ඵග්ගුණසුත්තං]

[සංවණ්ණිනිද්දානං]

2. තෙන ඛො පන සමයෙන ආයස්මා ඵග්ගුණො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො ආයස්මා ආනන්දො, යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

"ආයස්මා භන්තෙ ඵග්ගුණො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සාධු භන්තෙ භගවා යෙනායස්මා ඵග්ගුණො තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා''ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා ඵග්ගුණො තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආයස්මා ඵග්ගුණො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන මඤ්චකෙ සමඤ්ඤොචාසි[1] අථ ඛො භගවා ආයස්මන්තං ඵග්ගුණං එතදවොච: අලං ඵග්ගුණ, මා ත්වං මඤ්චකෙ සමඤ්ඤොචාසි. සන්තිමානි ආසනානි පුරෙ[2] පඤ්ඤත්තානි, තත්ථාහං නිසීදිස්සාමීති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ඵග්ගුණං එතදවොච:

"කච්චි තෙ ඵග්ගුණ ඛමනීයං, කච්චි යාපනීයං, කච්චි දුක්ඛා[3] වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති.

1 සමධොසි - මජසං, සමඤ්ඤොචාපි. සීමු. සතං.
2. පරෙහි - මජසං. 3. කච්චි තෙ දුක්ඛා - මජසං.

වහන්ස, එ පරිදි ම මෙසේ විදර්ශනාප්‍රතිපත්-ඵලසමාපත්වශයෙන් මොනොවට විමුක්ත සිත් ඇති භික්ෂුහුගේ ආපාථයට බලවත් වූ ද චක්ෂුර්-විඥෙය රූපාලම්බනයෝ එත් නම්, ඔහුගේ සිත නො ම ගණිත් ඔහුගේ සිත අමිශ්‍රීකෘත වූයේ ම (ක්ලේශාලම්බන හා මිශ්‍ර නො වූයේ ම) පිහිටියේ අචලප්‍රාප්ත වූයේ කම්පා නො වූයේ වෙයි. ඒ චිත්තයාගේ උදයව්‍යය ද දක්නේ ය. බලවත් වූ ද ශ්‍රොත්‍රවිඥෙය වූ ශබ්දාලම්බනයෝ ... ඝ්‍රාණ විඥෙය වූ ගන්ධාලම්බනයෝ ... ජිහ්වා විඥෙය වූ රසාලම්බනයෝ ... කායවිඥෙ වූ ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෝ ... මනෝවිඥෙය වූ ධර්මාලම්බනයෝ සිතට ආපාථගත වෙත් නම්, ඔහුගේ සිත නො ම ගණිත් ඔහුගේ සිත අමිශ්‍රීකෘත වූයේ ම ස්ථිත වූයේ ම අචලප්‍රාප්ත වෙයි. එ චිත්තයාගේ උදයව්‍යය ද දක්නේ ය යි.

61. නෛෂ්ක්‍රම්‍ය සඞ්ඛ්‍යාත අභිනික්ඛමය ද, චිත්තප්‍රවිවේකය ද පිළිවිද සිටි, අව්‍යාබාධාධිමුක්ත වූ උපාදානක්‍ෂය පිළිවිද සිටියා වූ,

62. තෘෂ්ණාක්‍ෂයාධිමුක්ත වූ චිත්තයාගේ අසම්මෝහය පිළිවිද සිටි රහත්හුගේ චිත්තය ආයතනයන්ගේ උත්පාදය දැක මනා කොට මිදේ.

63. මොනොවට මිදුනු ශාන්ත වූ සිත් ඇති එ භික්ෂුහට කළදය පෙරළා වැඩුමෙක් නැත. කටයුතු ද නැත.

64-65 ඒකඝන ශෛලපර්වතයෙක් යම්සේ සුළඟින් නො සැලේ ද, එ සෙයින් රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද හැම ධර්මයෝ තාදීහුගේ සිත නො සලත්. ඔහුගේ ස්ථිත වූ සිත විමුක්ත වේ. එ චිත්තයාගේ උදයව්‍යය ද දක්නේ යි.

### 6. 2. 1. 2.

### [ඵග්ගුණ සූත්‍රය.]

[සැවැත්නිදාන යි]

2. එ සමයෙහි ආයුෂ්මත් ඵග්ගුණ තෙරහු හටගත් ආබාධ ඇතියාහු දුකට පැමිණියාහු දැඩි ගිලන්බව ඇතියාහු වෙති. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍ය-වතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළකළහ:

''වහන්ස, ආයුෂ්මත් ඵග්ගුණ තෙරහු උපන් ආබාධ ඇතියාහු දුකට පැමිණියාහු දැඩි ගිලන්බව ඇතියහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඵග්ගුණ තෙරුන් කරා අනුකම්පා කොට වඩනාසේක් නම් මැනැවැ''යි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසාවදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස්වරුවෙහි පිළිසලතින් නැගී සිටිසේක් ආයුෂ්මත් ඵග්ගුණ තෙරුන් කරා වැඩියහ. ආයුෂ්මත් ඵග්ගුණ තෙරණුවෝ වඩනා භාග්‍යවතුන් වහන්සේ දුරදී ම දුටහ. දැක හැඳෙහි නැගිසිටුනා අයුරක් දක් වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඵග්ගුණ තෙරුන්ට තෙල වදාළහ: ''ඵග්ගුණයෙනි, කම් නැත, තෝ හැඳෙන් නො නැගෙව. පලමු පනවනලද මේ අසුන් ඇත. එහි මම හිඳිනෙමි''යි. භාග්‍යවතුන් වහන්සේ පනවනලද අස්නෙහි වැඩහුන්සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඵග්ගුණ තෙරුන්හට තෙල වදාළහ:

''ඵග්ගුණයෙනි, කිම, තැහිය හේ ද, කිම, යැපිය හේ ද, කිම, දුක් වෙදනා සන්හිඳුමට යේ ද, වැඩුමට නො යේ ද, සන්හිඳුමෙක් පැණේ ද, වැඩුමෙක් නො පැණේ ද''යි.

න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි භන්තෙ, බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධානං[1] අභිමත්ථෙය්‍ය[2] එවමෙව ඛො මෙ භන්තෙ අධිමත්තා වාතා මුද්ධානං ඌහනන්ති. න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි භන්තෙ බලවා පුරිසො දළ්හෙන වරත්තබන්ධෙන[3] සීසෙ සීසවෙඨනං දදෙය්‍ය, එවමෙව ඛො මෙ භන්තෙ, අධිමත්තා සීසෙ සීසවෙදනා, න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි භන්තෙ, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය, එවමෙව ඛො මෙ භන්තෙ, අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමොති.

සෙය්‍යථාපි භන්තෙ, බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානා බාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං. පරිතාපෙය්‍යුං[4] එවමෙව ඛො මෙ භන්තෙ අධිමත්තො කායස්මිං ඩාහො. න මෙ භන්තෙ, ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමොති.

අථ ඛො භගවා ආයස්මන්තං ඵග්ගුණං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

අථ ඛො ආයස්මා ඵග්ගුණො අචිරපක්කන්තස්ස භගවතො කාලමකාසි. තම්හි ච සමයෙ මරණකාලෙ ඉන්ද්‍රියානි විප්පසීදිංසු.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "ආයස්මා භන්තෙ ඵග්ගුණො අචිරපක්කන්තස්ස භගවතො කාලමකාසි. තම්හි ච සමයෙ මරණකාලෙ ඉන්ද්‍රියානි විප්පසීදිංසූති.

කිං හානන්ද ඵග්ගුණස්ස භික්ඛුනො ඉන්ද්‍රියානි නප්පසීදිස්සන්ති, ඵග්ගුණස්ස ආනන්ද භික්ඛුනො පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජනෙහි චිත්තං අවිමුත්තං අහොසි. තස්ස තං ධම්මදෙසනං සුත්වා පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජනෙහි චිත්තං විමුත්තං.

1. මුද්ධනි - මජසං.
2. අභිමත්ථෙය්‍ය - මජසං, සිමු.
3. වරත්තක්ඛණ්ඩෙන - මජසං.
4. සංපරිතාපෙය්‍යුං - මජසං.

වහන්ස, මා විසින් නො සැහිය හෙයි. නො යැපිය හෙයි. මාගේ දුඃඛවෙදනාවෝ වැඩෙත්, නො සන්හිඳෙත්, වැඩුමෙක් පැණේ, සන්හිඳුමෙක් නො පැණේ යයි.

වහන්ස, යම් පරිදි බලවත් පුරුෂයෙක් තියුණු කඩුසිළින් මුදුන මඩනේ ද, වහන්ස, එ පරිදි ම අධිමාත්‍රවාතයෝ මා මුදුන පෙළත්. වහන්ස, මා විසින් ඉවැසිය නො හෙයි. යැපිය නො හෙයි. මාගේ දුඃඛවේදනාවෝ දැඩි වූවාහු වැඩෙත්, නො සන්හිඳෙත්, වැඩුමෙක් පැණෙයි, සන්හිඳුමෙක් නො පැණේ ය යි.

වහන්ස, බලවත් පුරුෂයෙක් දැඩි වරපටින් හිස්හි හිස්වෙළුම් දෙන්නේ යම්සේ වේ ද, වහන්ස, එ පරිදි ම මාගේ හිසෙහි ශීර්ෂවේදනාවෝ වෙති. වහන්ස, මා විසින් සැහිය හෙන්නේ නො වෙයි. යාපනීය නො වෙයි. මාගේ දුඃඛවේදනාවෝ දැඩි ව නැඟී එති. බැස නො යෙති. නැඟ ඒම් අවසන පෙණෙයි. බැසීම් අවසන නො පෙණෙයි.

වහන්ස, දක්‍ෂගෝඝාතකයෙක් වේවයි, ගෝඝාතකාන්තේවාසිකයෙක් වේවයි තියුණු ගෙරිකපන සැතින් කුස සිඳින්නේ යම්සේ වේ ද, වහන්ස, එපරිදි ම අධිමාත්‍ර වාතයෝ මාගේ කුස සිඳිත්. වහන්ස, මා විසින් සැහිය හෙන්නේ නො වෙයි. යාපනීය නො වෙයි. මාගේ දුඃඛ-වෙදනාවෝ දැඩි ව නැඟ එත්, බැස නො යෙත්, නැඟ ඒම් අවසන පෙණෙයි, බැසීම් අවසන නො පෙණෙයි.

වහන්ස, යම් පරිදි බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුබල් පුරුෂයකු අත්හි වෙන වෙන ගෙණ අඟුරුවළෙක ලා දවන්නාහු වෙසෙසින් දවන්නාහු නම්, වහන්ස, එ පරිදි ම මාගේ කයෙහි අධිමාත්‍ර දාහය වෙයි. වහන්ස, මා විසින් ඉවසිය නො හේ. යැපිය නො හේ. මාගේ ගාඪ-වේදනාවෝ නැඟ එති. බැස නො යෙත්. නැඟ ඒම පැණෙයි, බැස යාමෙක් නො පැණෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථායෙන් ආයුෂ්මත් ඵග්ගුණ තෙරුන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා පහන් කරවා හුනස්නෙන් නැඟී වැඩි සේක.

ඉක්බිති ආයුෂ්මත් ඵග්ගුණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වඩනාගා ම කලුරිය කළහ. මැරෙණ කල්හි උන්වහන්සේගේ ඉඳුරෝ වෙසෙසින් පහන් වූහ.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ නමස්කා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ. "වහන්ස, ආයුෂ්මත් ඵග්ගුණ තෙරහු භාග්‍යවතුන් වහන්සේ නික්මවැඩි නො බෝකල් ඇතිවත් ම, කලුරිය කළහ. ඔහුගේ ඒ මැරෙණ මොහොතෙහි ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන් වූහ යි.

ආනන්දයෙනි, කවර හෙයින් ඵග්ගුණ භික්‍ෂුහුගේ ඉන්ද්‍රියයෝ පහන් නො වෙත් ද? ආනන්දයෙනි, ඵග්ගුණ භික්‍ෂුහුගේ සිත පඤ්ච ඔරම්භාගිය සංයොජනයෙන් අවිමුක්ත විය. එ දහම් දෙසුම් අසා ඔහුගේ සිත පඤ්ච ඔරම්භාගියසංයොජනයෙන් විමුක්ත විය.



Free Distribution www.aathaapi.org

ඡයිමෙ ආනන්ද ආනිසංසා කාලෙන ධම්මසවණෙ, කාලෙන අත්ථුප-පරික්ඛාය. කතමෙ ඡ:

(1) ඉධානන්ද භික්ඛුනො පඤ්චහි ඔරම්භාගියෙහි සඤ්ඤොජනෙහි චිත්තං අවිමුත්තං හොති. සො තම්හි සමයෙ මරණකාලෙ ලභති තථාගතං දස්සනාය. තස්ස තථාගතො ධම්මං දෙසෙති: ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසෙති. තස්ස තං ධම්මදෙසනං සුත්වා පඤ්චහි ඔරම්භාගි-යෙහි සඤ්ඤොජනෙහි චිත්තං විමුච්චති. අයං ආනන්ද පඨමො ආනිසංසො කාලෙන ධම්මසවණෙ.

(2) පුන ච පරං ආනන්ද භික්ඛුනො පඤ්චහි ඔරම්භාගියෙහි සඤ්ඤොජ-නෙහි චිත්තං අවිමුත්තං හොති. සො තම්හි සමයෙ මරණකාලෙ න හෙව ඛො ලභති තථාගතං දස්සනාය, අපි ච ඛො තථාගතසාවකං ලභති දස්සනාය. තස්ස තථාගතසාවකො ධම්මං දෙසෙති: ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසෙති. තස්ස තං ධම්මදෙසනං සුත්වා පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජනෙහි චිත්තං විමුච්චති. අයං ආනන්ද දුතියො ආනිසංසො කාලෙන ධම්මසවණෙ.

(3) පුන ච පරං ආනන්ද භික්ඛුනො පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජ-නෙහි චිත්තං අවිමුත්තං හොති. සො තම්හි සමයෙ මරණකාලෙ න හෙව ඛො ලභති තථාගතං දස්සනාය, නපි තථාගතසාවකං ලභති දස්සනාය. අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති, අනුවිචාරෙති, මනසානුපෙක්ඛති. තස්ස යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනු-විතක්කයතො අනුවිචාරයතො මනසානුපෙක්ඛතො පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජනෙහි චිත්තං විමුච්චති. අයං ආනන්ද තතියො ආනිසංසො කාලෙන ධම්මසවණෙ කාලෙන අත්ථුපපරික්ඛාය.

(4) ඉධානන්ද භික්ඛුනො පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජනෙහි චිත්තං විමුත්තං හොති, අනුත්තරෙ ච ඛො උපධිසඞ්ඛයෙ චිත්තං අවිමුත්තං හොති. සො තම්හි සමයෙ මරණකාලෙ ලභති තථාගතං දස්සනාය, තස්ස තථාගතො ධම්මං දෙසෙති: ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. තස්ස තං ධම්මදෙසනං සුත්වා අනුත්තරෙ ඛො උපධිසඞ්ඛයෙ චිත්තං විමුච්චති. අයං ආනන්ද චතුත්ථො ආනිසංසො කාලෙන ධම්මසවණෙ.

(5) පුන ච පරං ආනන්ද භික්ඛුනො පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජ-නෙහි චිත්තං විමුත්තං හොති. අනුත්තරෙ ච ඛො උපධිසඞ්ඛයෙ චිත්තං අවිමුත්තං හොති. සො තම්හි සමයෙ මරණකාලෙ න හෙව ඛො ලභති තථා-ගතං දස්සනාය, අපි ච ඛො තථාගතසාවකං ලභති දස්සනාය. තස්ස තථාගත සාවකො ධම්මං දෙසෙති: ආදිකල්‍යාණං -පෙ- පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. තස්ස තං ධම්මදෙසනං සුත්වා අනුත්තරෙ උපධිසඞ්ඛයෙ චිත්තං විමුච්චති. අයං ආනන්ද පඤ්චමො ආනිසංසො කාලෙන ධම්මසවණෙ.

ආනන්දයෙනි, තිසි කල්හි ධර්මශ්‍රවණයෙහි, තිසි කල්හි අර්ථොපපරීක්ෂායෙහි මෙ අනුසස් සයෙක. කවර සයෙක යත්:

(1) ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණහුගේ චිත්තය පඤ්චොරම්භාගිය සංයෝජනයෙන් අවිමුක්ත වෙයි. හේ ඒ මරණසමයෙහි තථාගතයන් දක්නට ලබන්නේ ය. ඔහට තථාගතයෝ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පරියොසාන කල්‍යාණ කොට අර්ථ සහිත කොට ව්‍යඤ්ජන සහිත කොට කෙවලපරිපූර්ණ කොට පිරිසිදු කොට දහම් දෙසති, බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරති. එ දහම් දෙසුම් අසා පඤ්චඔරම්භාගිය සංයොජනයන්ගෙන් ඔහුගේ සිත මිදෙයි. ආනන්දයෙනි, තිසි කල්හි ධර්මශ්‍රවණයෙහි මෙ පලමු අනුසසි.

(2) ආනන්දයෙනි, වැලිත් මහණහුගේ චිත්තය පඤ්චඔරම්භාගිය සංයොජනයෙන් අවිමුක්ත වෙයි. හේ ඒ මරණකාලයෙහි තථාගතයන් දක්නට නො ම ලබනුයේ වෙයි. යළිදු තථාගතශ්‍රාවකයකු දක්නට ලබනුයේ වෙයි. ඔහට තථාගතශ්‍රාවක ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍ය්‍යවසානකල්‍යාණ කොට සාර්ථ කොට සව්‍යඤ්ජන කොට කේවලපරිපූර්ණ කොට පරිශුද්ධ කොට දම් දෙසයි, බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙයි. ඒ දම් දෙසුම් අසා ඔහුගේ සිත පඤ්චොරම්භාගිය සංයෝජනයෙන් මිදෙයි. ආනන්දයෙනි සුදුසු කල්හි ධර්මශ්‍රවණයෙහි මෙ දෙවැනි අනුසසි.

(3) තවද, ආනන්දයෙනි, මහණහුගේ සිත පඤ්ච ඔරම්භාගිය සංයෝජනයෙන් අවිමුක්ත වෙයි. හේ ඒ මරණ කාලයෙහි තථාගතයන් දක්නට නො ම ලබන්නේ ය. තථාගත ශ්‍රාවකයකු ද දක්නට නො ම ලබන්නේ ය. වැලිදු ඇසූ පරිදි පර්‍ය්‍යාප්ත පරිදි ධර්මය සිතින් අනුවිතර්කණ කෙරෙයි. අනුවිචාර කෙරෙයි. සිතින් විමසා බලයි. ඇසූ පරිදි පුගුණ කළ පරිදි ධර්මය සිතින් අනුවිතර්කණය කරණ අනුවිචාර කරණ සිතින් විමසා බලන ඔහුගේ සිත පඤ්චොරම්භාගිය සංයෝජනයෙන් මිදෙයි. ආනන්දයෙනි, තිසි කල්හි දහම් ඇසුම්හි තිසි කල්හි අර්ථොපපරීක්ෂායෙහි මෙ තෙවැනි අනුසසි.

(4) ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණහුගේ සිත පඤ්චඔරම්භාගිය සංයෝජනයෙන් විමුක්ත වෙයි. අනුත්තර නිර්වාණයෙහි චිත්තය අවිමුක්ත වෙයි. හේ ඒ මරණ කාලයෙහි තථාගතයන් දක්නට ලබන්නේ ය. ඔහට තථාගතයෝ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට ... දහම් දෙසත්, බ්‍රහ්මචර්‍ය්‍යය පවසත්. ඔහුගේ සිත එ දම් දෙසුම් අසා උපධිසඞ්ඛය සඞ්ඛ්‍යාත අනුත්තර නිර්වාණය නිමිති කොටගෙන මිදෙයි. ආනන්දයෙනි, තිසි කල්හි ධර්මශ්‍රවණයෙහි මෙ සිවුවැනි අනුසසි.

(5) තවද ආනන්දයෙනි, මහණහුගේ සිත පඤ්චඔරම්භාගිය සංයෝජනයෙන් විමුක්ත වෙයි. අනුත්තර උපධිසඞ්ඛයෙහි චිත්තය අවිමුක්ත වෙයි. හේ ඒ මරණ සමයෙහි තථාගතයන් දක්නට නො ම ලබන්නේය. වැලිත් තථාගත ශ්‍රාවකයකු දක්නා ලබන්නේ ය. ඔහට තථාගත ශ්‍රාවක ආදි කල්‍යාණ කොට ... පිරිසිදු කොට ධර්මදේශනා කෙරෙයි, බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙයි. එ දම් දෙසුම් අසා ඔහුගේ සිත අනුත්තර නිර්වාණයෙහි මිදෙයි. ආනන්දයෙනි, තිසි කල්හි ධර්මශ්‍රවණයෙහි මෙ පස්වන අනුසසි.

(6) පුන ච පරං ආනන්ද භික්ඛුනො පඤ්චහි ඔරම්භාගියෙහි සංයොජනෙහි චිත්තං විමුත්තං හොති. අනුත්තරෙ ච ඛො උපධිසඞ්ඛයෙ චිත්තං අවිමුත්තං හොති. සො තම්හි සමයෙ මරණකාලෙ න හෙව ඛො ලභති තථාගතං දස්සනාය, නපි තථාගතසාවකං ලභති දස්සනාය. අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. තස්ස යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කයතො අනුවිචාරයතො මනසානුපෙක්ඛතො අනුත්තරෙ උපධිසඞ්ඛයෙ චිත්තං විමුච්චති. අයං ආනන්ද ඡට්ඨො ආනිසංසො කාලෙන ධම්මස්සවණෙ කාලෙන අත්ථුපපරික්ඛාය.

ඉමෙ ඛො ආනන්ද ඡ ආනිසංසා කාලෙන ධම්මස්සවණෙ කාලෙන අත්ථුපපරික්ඛායාති.

6. 2. 1. 3

[ඡළාභිජාති සුත්තං]

3. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

පූරණෙන භන්තෙ කස්සපෙන ඡළාභිජාතියො[1] පඤ්ඤත්තා: කණ්හාභිජාති පඤ්ඤත්තා, නීලාභිජාති පඤ්ඤත්තා, ලොහිතාභිජාති පඤ්ඤත්තා, හලිද්දාභිජාති පඤ්ඤත්තා, සුක්කාභිජාති පඤ්ඤත්තා, පරමසුක්කාභිජාති පඤ්ඤත්තා.

(1) තත්‍රිදං භන්තෙ පූරණෙන කස්සපෙන කණ්හාභිජාති පඤ්ඤත්තා: ඔරබ්භිකා සූකරිකා සාකුණිකා මාගවිකා ලුද්දා මච්ඡඝාතකා චොරා චොරඝාතකා බන්ධනාගාරිකා, යෙ වා පනඤ්ඤෙපි කෙචි කුරූරකම්මන්තා.

(2) තත්‍රිදං භන්තෙ පූරණෙන කස්සපෙන නීලාභිජාති පඤ්ඤත්තා: භික්ඛූ කණ්ටකවුත්තිකා, යෙ වා පනඤ්ඤෙපි කෙචි කම්මවාදා කිරියවාදා.

(3) තත්‍රිදං භන්තෙ පූරණෙන කස්සපෙන ලොහිතාභිජාති පඤ්ඤත්තා: නිගණ්ඨා එකසාටකා.

(4) තත්‍රිදං භන්තෙ පූරණෙන කස්සපෙන හලිද්දාභිජාති පඤ්ඤත්තා: ගිහී ඔදාතවසනා අචෙලකසාවකා.

(5) තත්‍රිදං භන්තෙ පූරණෙන කස්සපෙන සුක්කාභිජාති පඤ්ඤත්තා: ආජීවකා ආජීවකිනියො.[2]

(6) තත්‍රිදං භන්තෙ පූරණෙන කස්සපෙන පරමසුක්කාභිජාති පඤ්ඤත්තා: නන්දො වච්ඡො කිසො සංකිච්චො මක්ඛලිගොසාලො.

පූරණෙන භන්තෙ කස්සපෙන ඉමා ඡළාභිජාතියො පඤ්ඤත්තාති.

කිම්පන ආනන්ද පූරණස්ස කස්සපස්ස සබ්බො ලොකො එතදබ්භනුජානාති ඉමා ඡළාභිජාතියො පඤ්ඤපෙතුන්ති?

නො හෙතං භන්තෙ.

---

1 ඡළභිජාතියො - මජ්සං,
2 ආජීවිකිනියො - මජ්සං,

(6) තවද ආනන්දයෙනි, භික්ෂුහුගේ චිත්තය පඤ්චොරම්භාගිය සංයෝජනයෙන් මිදුනේ වෙයි. අනුත්තර උපධිසඞ්ඛයෙහි සිත අවිමුක්ත වෙයි. හේ ඒ මරණකාලයෙහි තථාගතයන් දක්නා නො ලබන්නේ ම ය. තථාගත ශ්‍රාවකයකුදු දක්නා නො ලබන්නේ ය. වැලිදු යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය සිතින් අනුවිතර්කණ කෙරෙයි, අනුවිචාර කෙරෙයි, සිතින් විමසා බලයි. යථාශ්‍රැත යථාපර්‍ය්‍යාප්ත ධර්මය සිතින් අනුවිතර්කණය කරණ අනුවිචාර කරණ සිතින් විමසාබලන ඔහුගේ සිත අනුත්තර උපධිසඞ්ඛයෙහි මිදෙයි. ආනන්දයෙනි, නිසි කල්හි ධර්මශ්‍රවණයෙහි නිසි කල්හි අර්ථොපපරීක්ෂායෙහි මේ සවන අනුසස්‍ය යි.

ආනන්දයෙනි, නිසි කල්හි ධර්මශ්‍රවණයෙහි නිසි කල්හි අර්ථොපපරීක්ෂායෙහි මේ ආනිසංස සය යි.

6. 2. 6. 3.

[ඡළාභිජාති සූත්‍රය]

3. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූළපර්වතයෙහි වැඩවසනසේක. එ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුමෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කරුණ සැලකළහ:

වහන්ස, පූරණකාශ්‍යප විසින් අභිජාති (ජාතිවිශෙෂ) සයෙක් පණවන ලදඃ කෘෂ්ණාභිජාති පණවනලදු. නීලාභිජාති පණවනලදු. ලොහිතාභිජාති පණවනලදු. හරිද්‍රාභිජාති පණවනලදු, ශුක්ලාභිජාති පණවනලදු. පරම-ශුක්ලාභිජාති පණවනලදු.

(1) වහන්ස, එහි ලා පූරණකාශ්‍යප විසින් රුදුරු එළුවැදිහ ඌරුවැදිහ ලිහිණිවැදිහ මුවවැදිහ මත්ස්‍යඝාතකයහ සොරහ චොරඝාතකයහ බන්ධනාගාරිකයහ, අනිකුදු සැහැරුකම් ඇති යම් කෙනෙක් වෙත් නම්, ඔහුද කෘෂ්ණාභිජාති කොට පණවන ලදහ.

(2) වහන්ස, එහි ලා පූරණකාශ්‍යප විසින් කණ්ටකවුත්තික භික්ෂුහු ද, අන්‍ය වූත් කර්මවාදී ක්‍රියාවාදීහු නීලාභිජාතිකයහයි පණවනලදහ.

(3) වහන්ස, එහි ලා පූරණකාශ්‍යප විසින් එකසාටක නිගණ්ඨයෝ ලොහිතාභිජාතිකයහ යි පණවනලදහ.

(4) වහන්ස, පූරණකාශ්‍යප විසින් ගිහි සුදුවත් හඳනා අචෙලකශ්‍රාවකයෝ හරිද්‍රාභිජාතිකයහ යි පණවනලදහ.

(5) වහන්ස, පූරණකාශ්‍යප විසින් ආජීවකයෝ ද ආජීවිකාවෝ ද ශුක්ලාභිජාතිකයහ යි පණවනලදහ.

(6) වහන්ස, එහි ලා නන්ද ය, වච්ඡ ය, කිස ය, සඞ්කිච්ච ය, මක්ඛලී-ගොසාල ය යන මොහු පූරණකාශ්‍යප විසින් පරමශුක්ලාභිජාතිකයහ යි පණවනලදහ.

වහන්ස, පූරණකාශ්‍යප විසින් මෙ ෂඩ්අභිජාතීහු පණවනලදහ'යි.

කිමෙක ආනන්දයෙනි, හැම ලෝවැස්සෝ පූරණකාශ්‍යපයාගේ මෙල පැණවීම - මෙ ඡළාභිජාතීන් පැණවීම අනුදන්නාහු දැ'යි.

වහන්ස, මෙල නො වේ මැ යි.

සෙය්‍යථාපි ආනන්ද පුරිසො දලිද්දො අස්සකො අනාළ්හියො,[1] තස්ස අකාමකස්ස බිලං ඔලග්ගෙය්‍යුං "ඉදං තෙ අම්භො පුරිස මංසං ච ඛාදිතබ්බං මූලඤ්ච අනුප්පදාතබ්බන්ති".

එවමෙව ඛො ආනන්ද පූරණෙන කස්සපෙන අප්පටිඤ්ඤාය එතෙසං සමණබ්‍රාහ්මණානං ඉමා ඡළාභිජාතියො පඤ්ඤත්තා යථා තං බාලෙන අබ්‍යත්තෙන අඛෙත්තඤ්ඤුනා අකුසලෙන.

අහං ඛො පනානන්ද ඡළාභිජාතියො පඤ්ඤපෙමි. තං සුණාහි සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති.

'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.' භගවා එතදවොච:

කතමා චානන්ද ඡළාභිජාතියො:

ඉධානන්ද එකච්චො කණ්හාභිජාතියො සමානො කණ්හං ධම්මං අභිජායති. ඉධ පනානන්ද එකච්චො කණ්හාභිජාතියො සමානො සුක්කං ධම්මං අභිජායති. ඉධ පනානන්ද එකච්චො කණ්හාභිජාතියො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති. ඉධ පනානන්ද එකච්චො සුක්කාභිජාතියො සමානො කණ්හං ධම්මං අභිජායති. ඉධ පනානන්ද එකච්චො සුක්කාභිජාතියො සමානො සුක්කං ධම්මං අභිජායති. ඉධ පනානන්ද එකච්චො සුක්කාභිජාතියො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති.

(1) කථං චානන්ද කණ්හාභිජාතියො සමානො කණ්හං ධම්මං අභිජායති: ඉධ පනානන්ද එකච්චො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා නෙසාදකුලෙ වා වෙණකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා, දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති. සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො, බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා, න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති. වාචාය දුච්චරිතං චරති. මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. එවං ඛො ආනන්ද කණ්හාභිජාතියො සමානො කණ්හං ධම්මං අභිජායති.

(2) කථං චානන්ද කණ්හාභිජාතියො සමානො සුක්කං ධම්මං අභිජායති. ඉධානන්ද එකච්චො නීචෙ කුලෙ පච්චාජාතො හොති -පෙ- සො ච හොති දුබ්බණ්ණො [-පෙ-] න ලාභී [-පෙ-] සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති වාචාය සුචරිතං චරති. මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං ඛො ආනන්ද කණ්හාභිජාතියො සමානො සුක්කං ධම්මං අභිජායති.

1 අනාළ්හිකො - සීමු.

ආනන්දයෙනි, යම්සේ දිළිඳු නිර්ධන ආඪ්‍ය නො වූ පුරුෂයෙක් වේ නම්, නො කැමැත්තාවූ ම ඔහුගේ අත්හි “එම්බා පුරුෂය, මෙ මස් තා විසින් කෑයුතු ය. මිල ද දියයුතු ය”යි මළ ගොණකුගේ මස් කොටසක් බලාත්කාරයෙන් අත තබත් නම්,

ආනන්දයෙනි, එ සෙයින් ම පූරණකාශ්‍යප විසින් තෙල මහණ බමුණන්ගේ අප්‍රතිඥයෙන් ම අව්‍යක්ත වූ ක්ෂේත්‍රඥ නො වූ (අභිජාති ප්‍රඥප්තිවිෂය නො දන්නා වූ) අදක්ෂ වූ බාලයකු විසින් කරණු ලබන්නක් සේ මේ ෂඩභිජාතිහු පණවනලදහ.

ආනන්දයෙනි, මම මේ අභිජාතීන් සදෙනකු පණවමි. එ අසව, මනා කොට මෙනෙහි කරව, කියන්නෙමි’යි.

වහන්ස, එසේ යයි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

ආනන්දයෙනි, ෂඩභිජාතිහු කවරහ:

ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුරුෂයෙක් කෘෂ්ණාභිජාති ඇතියේ ම කෘෂ්ණස්වභාව ඇති ව ම උපදනේ ය. ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුරුෂයෙක් කෘෂ්ණාභිජාති ඇති ව ම ශුක්ලස්වභාව ඇති ව උපදනේ ය. ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් කෘෂ්ණාභිජාති ඇතියේ ම අකෘෂ්ණ වූ අශුක්ල වූ නිර්වාණයට පැමිණෙයි. (ආයතිභූමි සඞ්ඛ්‍යාත නිර්වාණ ජාතියෙහි උපදනේ ය.) ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් ශුක්ලාභිජාති ඇතියේ ම කෘෂ්ණස්වභාව ඇති ව උපදනේ ය. ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් ශුක්ලාභිජාති ඇතියේ ම ශුක්ලස්වභාව ඇති ව උපදනේ ය. ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් ශුක්ලාභිජාති ඇතියේ ම අකෘෂ්ණ වූ අශුක්ල වූ නිර්වාණයට පැමිණෙයි.

(1) ආනන්දයෙනි, කෙසේ නම් කෘෂ්ණාභිජාති ඇතියේ ම කෘෂ්ණාභිජාතියෙහි උපදනේ ද: ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් සැඩොල්කුලයෙහි වේවයි, වැදිකුලයෙහි වේවයි, කුළුපොතු කුලයෙහි වේවයි, සොම්මර කුලයෙහි වේවයි, පුක්කුසකුලයෙහි වේවයි දිළිඳු අල්ප පානභෝජන ඇති, දුකසේ දිවිවැටුම් ඇති, යම් කුලයෙක දුකසේ ආහාර පාන වස්ත්‍ර ලැබේ නම් එබඳු නිචකුලයෙක උපදනේ ය. හෙ ද දුර්වර්ණ ඇතියේ නපුරු දැකුම් ඇතියේ ලකුණ්ටක වූයේ බොහෝ ආබාධ ඇතියේ කාණෙක් වේවයි කොරෙක් වේවයි පිලෙක් වේවයි පක්ෂහතයෙක් වේවයි අහර පැන් වස්ත්‍ර යානමල්ගඳවිලෙවුන්ශය්‍යා ආවසථ ප්‍රදීපොපකරණ නො ලබනසුලුයේ වෙයි. හේ කයින් දුසිරිත් පුරයි. වචනයෙන් දුසිරිත් පුරයි. මනසින් දුසිරිත් පුරයි. හේ කයින් දුසිරිත් පුරා වචනයෙන් දුසිරිත් පුරා මනසින් දුසිරිත් පුරා කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙයි. ආනන්දයෙනි, මෙසේ කෘෂ්ණාභිජාති ඇතියේ ම කෘෂ්ණස්වභාව ඇති ව උපදනේ ය.

(2) ආනන්දයෙනි, කෙසේ නම් කෘෂ්ණාභිජාති ඇතියේ ම ශුක්ල ස්වභාව ඇති ව උපදනේ ය යත්. ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් හීන කුලයෙක උපදනේ ය ... හෙ ද දුර්වර්ණ ඇතියේ ශය්‍යාවසථප්‍රදීපොපකරණ නො ලබනසුලුලේ වෙයි. හෙ කයින් සුසිරිත් පුරයි, වචනයෙන් සුසිරිත් පුරයි, මනසින් සුසිරිත් පුරයි. හෙ කයින් සුසිරිත් පුරා, වචනයෙන් සුසිරිත් පුරා, මනසින් සුසිරිත් පුරා කාබුන් මරණින් මතු සුගති ස්වර්ගලොකයෙහි උපදනේ ය. ආනන්දයෙනි, මෙසේ කෘෂ්ණාභිජාති ඇතියේ ම ශුක්ලස්වභාව ඇති ව උපදනේ ය.

(3) කථං චානන්ද කණ්හාභිජාතියො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති. ඉධානන්ද එකච්චො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා -පෙ- දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො -පෙ- සො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතූසු සතිපට්ඨානෙසු සුපතිට්ඨිතචිත්තො සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති. එවං ඛො ආනන්ද කණ්හාභිජාතියො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති.

(4) කථඤ්චානන්ද සුක්කාභිජාතියො සමානො කණ්හං ධම්මං අභිජායති: ඉධානන්ද එකච්චො උච්චෙ කුලෙ පච්චාජාතො හොති: ඛත්තියමහාසාරකුලෙ වා බ්‍රාහ්මණමහාසාරකුලෙ වා ගහපතිමහාසාරකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. එවං ඛො ආනන්ද සුක්කාභිජාතියො සමානො කණ්හං ධම්මං අභිජායති.

(5) කථඤ්චානන්ද සුක්කාභිජාතියො සමානො සුක්කං ධම්මං අභිජායති: ඉධානන්ද එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති. ඛත්තියමහාසාරකුලෙ වා -පෙ- ලාභී [-පෙ-] සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා, වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං ඛො ආනන්ද සුක්කාභිජාතියො සමානො සුක්කං ධම්මං අභිජායති.

(6) කථං චානන්ද සුක්කාභිජාතියො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති: ඉධානන්ද එකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති: ඛත්තිය මහාසාරකුලෙ වා බ්‍රාහ්මණමහාසාර කුලෙ වා ගහපතිමහාසාරකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතූසු සතිපට්ඨානෙසු සුපතිට්ඨිතචිත්තො සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා, අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති. එවං ඛො ආනන්ද සුක්කාභිජාතියො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති.

ඉමා ඛො ආනන්ද ඡළාභිජාතියොති

(3) ආනන්දයෙනි, කිසෙයින් කෘෂ්ණාභිජාති ඇතියේ ම අකෘෂ්ණ අශුක්ල නිර්වාණයට පැමිණේ ය යත්: ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් සැඩොල් කුලෙහි වේවයි ... දුර්වර්ණ වූයේ' කපුරු දකුම් ඇතියේ ලකුණ්ටක වූයේ ... නීචකුලයෙහි උපදනේ වෙයි. හෙ කෙස් රවුළු බහා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිද්දට වදනේ ය. හෙ මෙසේ පැවිදි වූයේ ම චිත්තයට උපක්ලේශ වූ ප්‍රඥාව දුර්වල කරණ පසඟව නීවරණයන් දුරු කොට සිව්සිවටන්හි සුපිහිටි සිතැතියේ සප්තබොධ්‍යඞ්ගයන් තත් වූ පරිදි වඩා අකෘෂ්ණ අශුක්ල නිර්වාණයට පැමිණෙයි. ආනන්දයෙනි, මෙසේ කෘෂ්ණාභි-ජාති ඇතියේ ම අකෘෂ්ණ අශුක්ල නිර්වාණයට පැමිණෙයි.

(4) ආනන්දයෙනි, කිසෙයින් ශුක්ලාභිජාති ඇතියේ ම කෘෂ්ණ ස්වභාව ඇති ව උපදනේ ය යත්: ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් ක්ෂත්‍රියමහා-සාරකුලයෙහි වේවයි, බ්‍රාහ්මණමහාසාරකුලයෙහි වේවයි, ගෘහපතිමහාසාර-සාරකුලයෙහි වේවයි ආඪ්‍ය වූ මහත් ධන ඇති මහා භෝග ඇති බොහෝ රන් රිදී ඇති ප්‍රචුර විත්තූපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති උසස් කුලයෙහි උපන්නේ වෙයි. හෙ ද අභිරූප වූයේ දර්ශනීය වූයේ ප්‍රසාදගුණ ඇතියේ උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්නාගත වූයේ ආහාර පාන වස්ත්‍ර යාන මාලා-ගන්ධවිලෙපන ශය්‍යාවසථප්‍රදීපොපකරණ ලබනසුල්ලේ වෙයි. හෙ කයින් දුසිරිත් පුරයි. වචනයෙන් දුසිරිත් පුරයි. මනසින් දුසිරිත් පුරයි. හේ කයින් දුසිරිත් පුරා වචනයෙන් දුසිරිත් පුරා, මනසින් දුසිරිත් පුරා කාබුන් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි. ආනන්දයෙනි, මෙසේ ශුක්ලාභිජාති ඇතියේ ම කෘෂ්ණ ස්වභාව ඇති ව උපදනේ ය.

(5) ආනන්දයෙනි, කිසෙයින් ශුක්ලාභිජාති ඇතියේ ම ශුක්ලස්වභාව ඇති ව උපදනේ ය යත්: ආනන්දයෙනි, මෙ ලොව්හි, ඇතැම් පුග්ගලෙක් ක්ෂත්‍රිය මහාසාරකුලයෙහි වේවයි ... උපන්නේ වෙයි ... ශය්‍යාවසථප්‍රදීපොපකරණ ලබන්නේ වෙයි. හේ කයින් සුසිරිත් පුරයි, වචනයෙන් සුසිරිත් පුරයි, මනසින් සුසිරිත් පුරයි. හේ කයින් සුසිරිත් පුරා වචනයෙන් සුසිරිත් පුරා මනසින් සුසිරිත් පුරා කාබුන් මරණින් මතු සුගති ස්වර්ගලෝකයෙහි උපදනේ ය. ආනන්දයෙනි, මෙ සෙයින් ශුක්ලාභිජාති ඇතියේ ම ශුක්ල ස්වභාව ඇති ව උපදනේ ය.

(6) ආනන්දයෙනි. කිසෙයින් ශුක්ලාභිජාති ඇතියේ ම අකෘෂ්ණ අශුක්ල නිර්වාණයට පැමිණේ ය යත්: ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගල-යෙක් ක්ෂත්‍රියමහාසාරකුලයෙහි වේවයි, බ්‍රාහ්මණ මහාසාරකුලයෙහි වේවයි, ගෘහපතිමහාසාර කුලයෙහි වේවයි ආඪ්‍ය වූ මහත් ධන ඇති මහා භෝග ඇති බොහෝ රන්රිදී ඇති ප්‍රචුරවිත්තූපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති උසස් කුලයෙහි උපන්නේ වේ. හෙ ද මනා රූ ඇතියේ දකුම්කලු වූයේ ප්‍රසාදජනක වූයේ උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්නාගත වූයේ ආහාර පාන වස්ත්‍ර යාන මාලාගන්ධවිලෙපන ශය්‍යාවසථප්‍රදීපොපකරණ ලබනසුල්ලේ වෙයි. හෙ කෙස්රවුළු බහා කාෂායවස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි. හේ මෙසේ පැවිදි වූයේ ම චිත්තොපක්ලේශ වූ ප්‍රඥාව දුර්වල කරණ පඤ්චනීවරණයන් දුරු කොට සතර සතිපට්ඨානයෙහි මොනොවට පිහිටි සිතැතියේ සප්තබොධ්‍යඞ්ගයන් යථාවයෙන් වඩා අකෘෂ්ණ අශුක්ල නිර්වාණයට පැමිණෙයි. ආනන්දයෙනි, මෙ සෙයින් ශුක්ලාභිජාති ඇතියේ ම අකෘෂ්ණ අශුක්ල නිර්වාණයට පැමිණෙයි.

ආනන්දයෙනි, මොහු අභිජාතීහු සදෙන වෙති යි.

6. 2. 1. 4.

[ආසවසුත්තං]

[සාවත්ථිනිදානං]

4 ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි ඡහි?

ඉධ භික්ඛවෙ භික්ඛුනො යෙ ආසවා සංවරා පහාතබ්බා, තෙ ආසවා සංවරෙන පහීනා හොන්ති. යෙ ආසවා පටිසෙවනා පහාතබ්බා, තෙ ආසවා පටිසෙවනාය පහීනා හොන්ති. යෙ ආසවා අධිවාසනා පහාතබ්බා, තෙ ආසවා අධිවාසනාය පහීනා හොන්ති. යෙ ආසවා පරිවජ්ජනා පහාතබ්බා, තෙ ආසවා පරිවජ්ජනාය පහීනා හොන්ති. යෙ ආසවා විනොදනා පහාතබ්බා, තෙ ආසවා විනොදනාය පහීනා හොන්ති. යෙ ආසවා භාවනා පහාතබ්බා, තෙ ආසවා භාවනාය පහීනා හොන්ති.

(1) කතමෙ ච භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා යෙ සංවරෙන පහීනා හොන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො චක්ඛුන්ද්‍රියසංවරසංවුතො විහරති. යං හිස්ස භික්ඛවෙ චක්ඛුන්ද්‍රියසංවරං අසංවුතස්ස විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, චක්ඛුන්ද්‍රියසංවර[1] සංවුතස්ස විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. පටිසඞ්ඛා යොනිසො සොතින්ද්‍රිය -පෙ- ඝානින්ද්‍රිය -පෙ- ජිව්හින්ද්‍රිය -පෙ- කායින්ද්‍රිය -පෙ- මනින්ද්‍රිය සංවරසංවුතො විහරති. යං හිස්ස භික්ඛවෙ මනින්ද්‍රියසංවරං අසංවුතස්ස විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, මනින්ද්‍රියසංවරසංවුතස්ස විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. යං හිස්ස භික්ඛවෙ සංවරං අසංවුතස්ස විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, සංවරං සංවුතස්ස විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා යෙ සංවරෙන පහීනා හොන්ති.

(2) කතමෙ ච භික්ඛවෙ ආසවා පටිසෙවනා පහාතබ්බා යෙ පටිසෙවනාය පහීනා හොන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති: යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං[2] පටිඝාතාය, යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං.

1. චක්ඛුන්ද්‍රිය සංවරං - මජ්සං
2. සරීසපසම්ඵස්සානං - මජ්සං.

## 6. 2. 1. 4.

## [ආසව සූත්‍රය]

[සැවැත්නිදාන යි]

4· මහණෙනි, දහම් සයෙකින් සමන්නාගත මහණ ආහුනෙය්‍ය හෝ පාහුනෙය්‍ය හෝ දක්ඛිණෙය්‍ය හෝ අඤ්ජලිකරණීය හෝ ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර සයකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ යම් ආස්‍රව කෙනෙක් සංවරයෙන් ප්‍රහාතව්‍ය වෙත් නම් එ ආස්‍රවයෝ සංවරයෙන් ප්‍රහීණ වෙත්. යම් ආස්‍රව කෙනෙක් ප්‍රතිසේවනායෙන් ප්‍රහාතව්‍ය වෙත් නම්, එ ආස්‍රවයෝ ප්‍රතිසෙවනායෙන් ප්‍රහීණ වෙත්. යම් ආස්‍රව කෙනෙක් අධිවාසනායෙන් ප්‍රහාතව්‍ය වෙත් නම්, එ ආස්‍රවයෝ අධිවාසනායෙන් ප්‍රහීණ වෙත්. යම් ආස්‍රව කෙනෙක් පරිවර්ජනායෙන් ප්‍රහාතව්‍ය වෙත් නම්, එ ආස්‍රවයෝ පරිවර්ජනායෙන් ප්‍රහීණ වෙත්. යම් ආස්‍රව කෙනෙක් විනෝදනායෙන් ප්‍රහාතව්‍ය වෙත් නම්, එ ආස්‍රවයෝ විනෝදනායෙන් ප්‍රහීණ වෙත්. යම් ආස්‍රව කෙනෙක් භාවනායෙන් ප්‍රහාතව්‍ය වෙත් නම්, එ ආස්‍රවයෝ භාවනායෙන් ප්‍රහීණ වෙත්.

(1) මහණෙනි, යම් ආස්‍රව කෙනෙක් සංවරයෙන් ප්‍රහීණ වෙත් නම්, එ සංවරයෙන් ප්‍රහාතව්‍ය ආස්‍රවයෝ කවරහ: මහණෙනි, මෙ සස්නෙහි මහණ නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට චක්ෂුරින්ද්‍රිය සංවරයෙන් සංවෘත ව වාස කරයි. මහණෙනි, යම් හෙයෙකින් චක්ෂුරින්ද්‍රිය සංවරයෙන් අසංවෘත ව වාස කරණ ඔහට දුඃඛපරිදාහකර ආස්‍රව කෙනෙක් උපදනාහු නම්, චක්ෂුරින්ද්‍රිය සංවරයෙන් සංවෘතව වාස කරණ ඔහට එ විඝාතපරිදාහකර (දුක්-දැවිලි කරණ) ආස්‍රවයෝ නො මැ වෙත්. නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට ශ්‍රොත්‍රෙන්ද්‍රිය ... ඝ්‍රාණෙන්ද්‍රිය ... ජිහ්වෙන්ද්‍රිය ... කායෙන්ද්‍රිය ... මනින්ද්‍රිය සංවරයෙන් සංවෘත වූයේ වාස කෙරෙයි. යම් හෙයෙකින් මනින්ද්‍රිය සංවරයෙන් අසංවෘත ව වසන ඔහුට විඝාතපරිදාහකර ආස්‍රවයෝ උපදනාහු නම්, මනින්ද්‍රියසංවරයෙන් සංවෘත ව වසන ඔහට ඒ විඝාතපරිදාහකර ආස්‍රවයෝ නො වෙත්. මහණෙනි, යම් හෙයෙකින් සංවරයෙන් අසංවෘත ව වසන ඔහට විඝාතපරිදාහකර ආස්‍රමයෝ උපදනාහු නම්, සංවරයෙන් සංවෘතව වාස කරන ඔහට ඒ විඝාතපරිදාහකර ආස්‍රවයෝ නො වෙත්. මහණෙනි, යම් ආස්‍රව කෙනෙක් සංවරයෙන් ප්‍රහීණ වෙත් නම්, මොහු සංවරයෙන් ප්‍රහාතව්‍ය ආස්‍රව යි කියනු ලැබෙත්.

(2) මහණෙනි, යම් ආස්‍රව කෙනෙක් ප්‍රතිසේවනායෙන් ප්‍රහීණ වෙත් නම්, ප්‍රතිසේවනායෙන් ප්‍රහාතව්‍ය එ ආස්‍රවයෝ කවරහ යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට යම්තාක් ශීතයාගේ නැස්ම පිණිස ම උෂ්ණයාගේ නැස්ම පිණිස ම මැසි-මදුරු-වා-අව් - සපියන්ගේ පහස නැස්ම පිණිස ම ලජ්ජාස්ථාන පිළිසන් කරණු පිණිස ම සිවුරු සෙවිතේ ය.

පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවති: නෙව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති.

පටිසඞ්ඛා යොනිසො සෙනාසනං පටිසෙවති: යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං.

පටිසඞ්ඛා යොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති: යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣපරමතායාති.

යං හිස්ස භික්ඛවෙ අප්පටිසෙවතො[1] උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාත පරිළාහා, පටිසෙවතො[2] එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති.

ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා පටිසෙවනා පහාතබ්බා යෙ පටිසෙවනාය පහීනා හොන්ති.

(3) කතමෙ ච භික්ඛවෙ ආසවා අධිවාසනා පහාතබ්බා යෙ අධිවාසනා පහීනා හොන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං, දුරුත්තානං දුරාගතානං වචනපථානං, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං[3] ඛරානං කටුකානං අසාතානං අමනාපානං, පාණහරානං අධිවාසකජාතිකො හොති. යං හිස්ස භික්ඛවෙ අනධිවාසයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, අධිවාසයතො[4] එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා අධිවාසනා පහාතබ්බා යෙ අධිවාසනාය[5] පහීනා හොන්ති.

(4) කතමෙ ච භික්ඛවෙ ආසවා පරිවජ්ජනා පහාතබ්බා යෙ පරිවජ්ජනාය පහීනා හොන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො චණ්ඩං හත්ථිං පරිවජ්ජෙති. චණ්ඩං අස්සං පරිවජ්ජෙති. චණ්ඩං ගොණං පරිවජ්ජෙති. චණ්ඩං කුක්කුරං පරිවජ්ජෙති අහිං ඛාණුං කණ්ටකාධානං[6] සොබ්භං පපාතං චන්දනිකං ඔලිගල්ලං. යථාරූපෙ අනාසනෙ නිසින්නං, යථාරූපෙ අගොචරෙ චරන්තං, යථාරූපෙ පාපකෙ මිත්තෙ භජන්තං, විඤ්ඤූ සබ්‍රහ්මචාරී පාපකෙසු ඨානෙසු ඔකප්පෙය්‍යුං, සො තං චෙව අනාසනං තං ච[7] අගොචරං තෙ ච පාපකෙ මිත්තෙ පටිසඞ්ඛා යොනිසො පරිවජ්ජෙති. යං හිස්ස භික්ඛවෙ අපරිවජ්ජයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, පරිවජ්ජයතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා පරිවජ්ජනා පහාතබ්බා, යෙ පරිවජ්ජනාය පහීනා හොන්ති.

---

1 අප්පටිසෙවයතො - සීමු. 2. පටිසෙවයතො - සීමු.
3. තිබ්බානං - මජ්ඣං 4 අධිවාසයතො - මජ්ඣං. 5. අධිවාසනා - සබ්බත්ථ.
6. කණ්ටකට්ඨානං - මජ්ඣං සං. කණ්ටකධානං. 7. සො තං ච අනාසනං - මජ්ඣං

නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට පිඬුවා සෙවුනේ ය: නො ම දව පිණිස ය, නො ම මද පිණිස ය, නො ම උනුහැන් පුරනු පිණිස ය, නො ම හැරසුම් පිණිස ය, මෙ සිරුරෙහි පැවැත්ම සඳහා ම ය, යැපීම සඳහා ම ය, සාදුක් නසනු සඳහා ම ය. බ්‍රහ්මචර්යානුග්‍රහ සඳහා ම ය. මෙ සෙයින් (මේ පිඬු බොජුනෙන්) පැරණි සාදුක් වේදනාත් නසමි. නව වේදනාත් නො ම උපදවන්නෙමි. (මෙයින්) මාගේ ජීවනයාත්‍රාව ද අනවද්‍යතාව ද ඵාසුවිහරණය ද වන්නේ ය යි.

නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට සීතයාගේ නැස්ම පිණිස ම උෂ්ණයාගේ නැස්ම පිණිස ම මැසි මදුරු වා අව් සපියන්ගේ පහස් නැස්ම පිණිස ම ඍතුපීඩා විනෝදනය (පහකිරීම) පිණිස ම පිළිසලෙනෙහි ඇල්ම පිණිස ම සෙනසුන් සෙවිනේ ය.

නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට උපන් ව්‍යාබාධකර වේදනාවන් නස්නා සඳහා ම අව්‍යාබාධපරමතාව (නීරෝග බව) සඳහා ම බෙහෙත් පිරිකර සෙවිනේ ය.

මහණෙනි, යම් හෙයෙකින් ප්‍රතිසේවනා නො කරණුවහට දුඃඛපරිදාහකර ආශ්‍රවයෝ උපදිත් නම්, ප්‍රතිසේවනා කරණුවහට මෙසේ ඒ විඝාතපරිදාහකර ආශ්‍රවයෝ නො වෙත්.

මහණෙනි, යම් ආශ්‍රව කෙනෙක් ප්‍රතිසේවනායෙන් ප්‍රහීණ වෙත් නම්, මොහු ප්‍රතිසේවනායෙන් ප්‍රහාතව්‍ය ආශ්‍රවයෝ ය යි කියනු ලැබෙත්.

(3) මහණෙනි, යම් ආශ්‍රව කෙනෙක් අධිවාසනායෙන් ප්‍රහීණ වෙත් ද, අධිවාසනායෙන් ප්‍රහාතව්‍ය ඒ ආශ්‍රවයෝ කවරහ යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට ශීතය උෂ්ණය ක්ෂුධාව පිපාසාව මැසි-මදුරුවාතාතප සරීසෘපසංස්පර්ශය සහනය කෙරෙයි. නපුරු කොට කියනලද නපුරු කොට (තමන් වෙත) පැමිණි වාක්පථ සහනය කෙරෙයි. උපන් දුක් වූ තීව්‍ර වූ ඛර වූ කටුක වූ අමධුර වූ අමනාප වූ ප්‍රාණහර වූ ශාරීරික වේදනා ඉවසන සැහැවි ඇතියේ වෙයි. යම් හෙයෙකින් නො ඉවසන ඔහට විඝාතපරිදාහකර ආශ්‍රවයෝ උපදනාහු නම්, ඉවසන ඔහට මෙසේ ඒ විඝාතපරිදාහකර ආශ්‍රවයෝ නො වෙත්. යම් ආශ්‍රව කෙනෙක් අධිවාසනායෙන් ප්‍රහීණ වෙත් නම්, මෙ ආශ්‍රවයෝ අධිවාසනායෙන් ප්‍රහාතව්‍ය යි කියනු ලැබෙත්.

(4) මහණෙනි, යම් ආශ්‍රව කෙනෙක් පරිවර්ජනායෙන් (වැළකීමෙන්) ප්‍රහීණ වෙත් නම්, පරිවර්ජනායෙන් ප්‍රහාතව්‍ය ඒ ආශ්‍රවයෝ කවරහ යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට නැඩ ඇත් වළහයි. නැඩ අස් වළහයි. නැඩ ගොන් වළහයි නැඩ කුකුරු වළහයි. අහි ය කණු ය, කටුලැහැබ් ය. කුඩා ඇඩිදිය හෙබ් ය, ප්‍රපාත ය, ස්‍යන්දනිකා ය ගවරවළ ය යන මෙ හැම වළහයි. යම්බඳු නො මනා අස්නෙක හුන්නහු, යම්බඳු අගොචරයෙක්හි හරනහු, යම්බඳු ලමු මිතුරන් සෙවිනහු, විඥ සබ්‍රහ්මචාරීහු ලමු තන්හි ලා අවමන් කොට කල්පනා කෙරෙත් නම්, හේ ඒ බඳු නොමනා සෙනසුන් ද, ඒ අගොචරස්ථාන ද, ඒ ලමු මිතුරන් ද නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට වළහයි. මහණෙනි, යම් හෙයෙකින් පරිවර්ජනා නො කරණ ඔහට විඝාතපරිදාහකර ආශ්‍රව කෙනෙක් උපදනාහු නම්, පරිවර්ජනා කරණ ඔහට මෙසේ විඝාතපරිදාහකර ආශ්‍රවයෝ නො වෙත්. මහණෙනි, යම් ආශ්‍රව කෙනෙක් පරිවර්ජනායෙන් ප්‍රහීණ වෙත් නම්, මෙ ආශ්‍රවයෝ පරිවර්ජනායෙන් ප්‍රහාතව්‍ය යි කියනු ලැබෙත්.

(5) කතමෙ ච භික්ඛවෙ ආසවා විනොදනා පහාතබ්බා, යෙ විනොදනාය පහීනා හොන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො උප්පන්නං කාමවිතක්කං, නාධිවාසෙති, පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. පටිසඞ්ඛා යොනිසො උප්පන්නං බ්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසාවිතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. යං හිස්ස භික්ඛවෙ අවිනොදයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා විනොදයතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා විනොදනා පහාතබ්බා යෙ විනොදනාය පහීනා හොන්ති.

(6) කතමෙ ච භික්ඛවෙ ආසවා භාවනා පහාතබ්බා යෙ භාවනාය පහීනා හොන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. පටිසඞ්ඛා යොනිසො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. යං හිස්ස භික්ඛවෙ අභාවයතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා භාවයතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා භාවනා පහාතබ්බා යෙ භාවනාය පහීනා හොන්ති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 6. 2 1. 5

## [දාරුකම්මික සුත්තං]

5. එවං මෙ සුතං: එකං සමයං භගවා නාදිකෙ විහරති ගිඤ්ජකාවසථෙ. අථ ඛො දාරුකම්මිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො දාරුකම්මිකං ගහපතිං භගවා එතදවොච: අපි නු තෙ ගහපති කුලෙ දානං දීයතීති. දීයති මෙ භන්තෙ කුලෙ දානං. තං ච ඛො යෙ තෙ භික්ඛූ ආරඤ්ඤකා පිණ්ඩපාතිකා පංසුකූලිකා අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. තථාරූපෙසු මෙ භන්තෙ භික්ඛූසු දානං දීයතීති

මහණෙනි, යමෙක් විනෝදනායෙන් (හැරලීමෙන්) ප්‍රහීණ වේත් නම්, විනෝදනායෙන් ප්‍රහාතව්‍ය එ ආශ්‍රවයෝ කවරහ යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ නුවණින් ප්‍රත්‍යවේක්‍ෂා කොට උපන් කාමවිතර්ක සිත්හි නො රඳවත්තේ ය, දුරලත්තේ ය, පහකරත්තේ ය, විගතාන්ත (අවසන්) කරත්තේ ය, ක්‍රමයෙන් අභාවයට යවත්තේ ය. නුවණින් ප්‍රත්‍යවේක්‍ෂා කොට උපන් ව්‍යාපාද විතර්ක ... උපන් විහිංසා විතර්ක ... උපනුපන් ලමු අකුසල් දහම් නො ඉවසෙත්තේ ය දුරලත්තේ ය, පහකරත්තේ ය. විගතාන්ත කරත්තේ ය, අනභාවයට යවත්තේ ය. මහණෙනි, යම් හෙයෙකින් විනෝදනා නො කරණ ඔහට විඝාතපරිදාහකර ආශ්‍රව කෙනෙක් උපදනාහු නම්, විනෝදනා කරණ ඔහට විඝාතපරිදාහකර එ ආශ්‍රවයෝ නො වෙත්. මහණෙනි, යම් ආශ්‍රව කෙනෙක් විනොදනායෙන් ප්‍රහීණ වෙත් නම්, මෙ ආශ්‍රවයෝ විනෝදනායෙන් ප්‍රහාතව්‍යහයි කියනු ලැබෙත්.

මහණෙනි, යම් ආශ්‍රව කෙනෙක් භාවනායෙන් ප්‍රහීණ වෙත් නම්, භාවනායෙන් ප්‍රහාතව්‍ය එ ආශ්‍රවයෝ කවරහ යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නුවණින් ප්‍රත්‍යවේක්‍ෂා කොට විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ ව්‍යවසර්ගයට (නිවනට) නැමෙන සුළු සති-සම්බොජ්ඣඞ්ගය වඩයි. නුවණින් ප්‍රත්‍යවේක්‍ෂා කොට ... ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගය වඩයි .. විරියසම්බොජ්ඣඞ්ගය වඩයි .. පීතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩයි ... සමාධිසම්බොජ්ඣඞ්ගය වඩයි ... විවේකනිඃශ්‍රිත විරාගනිඃශ්‍රිත නිරෝධනිඃශ්‍රිත ව්‍යවසර්ගයට නැමෙනසුළු උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, නො වඩනා ඔහට යම් හෙයකින් විඝාතපරිදාහකර ආශ්‍රවයෝ උපදනාහු නම්, වඩනා ඔහට මෙසේ විඝාතපරිදාහකර ආශ්‍රවයෝ නො වෙත්. මහණෙනි, යම් ආශ්‍රව කෙනෙක් භාවනායෙන් ප්‍රහීණ වේත් නම්, මෙ ආශ්‍රවයෝ භාවනායෙන් ප්‍රහාතව්‍යයහයි කියනු ලැබෙත්

මහණෙනි, මෙ දහම් සයින් සමන්‍වාගත මහණ ආහුනෙය්‍ය ද පාහුනෙය්‍ය ද දක්ඛිණෙය්‍ය ද අඤ්ජලිකරණීය ද ලොවට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර ද වේ ය යි

### 6. 2. 1. 5.

### [දාරුකම්මික සූත්‍රය]

5 මා විසින් මෙසේ අසන ලදි: එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ නාදික නම් ගමෙහි ගිඤ්ජකාවසථයෙහි වැඩ වසනසේක. එකල්හි දාරුකම්මික ගෘහපති භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් දාරුකම්මික ගැහැවිහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක: ගැහැවිය, තාගේ කුලයෙහි දන් දෙනු ලැබේ දැයි. වහන්ස, මාගේ කුලයෙහි දන් දෙනු ලැබේ. යම් ඒ මහණෙක් ආරණ්‍යක වෙත් නම්, පිණ්ඩපාතික වෙත් නම්, පාංසුකූලික වෙත් නම්, රහත්හු හෝ රහත්මඟට පිළිපන්නාහු හෝ වෙත් නම්, වහන්ස, එබඳු මහණුන් කෙරෙහි මවිසින් දන් දෙනු ලැබේ යයි.

දුජ්ජානං ඛො එතං ගහපති තයා ගිහිනා කාමභොගිනා පුත්තසම්බාධ-සයනං අජ්ඣාවසන්තෙන කාසිකචන්දනං පච්චනුභොන්තෙන මාලාගන්ධ-විලෙපනං ධාරයන්තෙන ජාතරූපරජතං සාදියන්තෙන "ඉමෙ වා අරහන්තො, ඉමෙ වා අරහත්තමග්ගං සමාපන්නා"ති.

(1) ආරඤ්ඤකො චෙපි ගහපති භික්ඛු හොති උද්ධතො උන්නළො චපලො මුඛරො විකිණ්ණවාචො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො, එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. ආරඤ්ඤකො[1] චෙපි ගහපති භික්ඛු හොති අනුද්ධතො අනුන්නළො අචපලො අමුඛරො අවිකිණ්ණවාචො උපට්ඨිතසති සම්පජානො, සමාහිතො එකග්ගචිත්තො සංවුතින්ද්‍රියො, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

(2) ගාමන්තවිහාරී චෙපි ගහපති භික්ඛු හොති උද්ධතො -පෙ- [පාකතින්ද්‍රියො], එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. ගාමන්තවිහාරී චෙපි ගහපති භික්ඛු හොති අනුද්ධතො -පෙ- [සංවුතින්ද්‍රියො], එවං සො තෙනඞ්ගෙන පාසංසො.

(3) පිණ්ඩපාතිකො චෙපි ගහපති භික්ඛු හොති උද්ධතො -පෙ- පාකතින්ද්‍රියො. එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. පිණ්ඩපාතිකො චෙපි ගහපති භික්ඛු හොති අනුද්ධතො -පෙ-[සංවුතින්ද්‍රියො], එවං සො තෙනඞ්ගෙන පාසංසො.

(4) නෙමන්තනිකො චෙපි ගහපති භික්ඛු හොති උද්ධතො -පෙ- [පාකතින්ද්‍රියො], එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. නෙමන්තනිකො චෙපි ගහපති භික්ඛු හොති අනුද්ධතො-පෙ-සංවුතින්ද්‍රියො, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

(5) පංසුකූලිකො චෙපි ගහපති භික්ඛු හොති උද්ධතො -පෙ- [පාකතින්ද්‍රියො], එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. පංසුකූලිකො චෙපි ගහපති භික්ඛු හොති අනුද්ධතො -පෙ- සංවුතින්ද්‍රියො, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

(6) ගහපති චීවරධරො චෙපි ගහපති භික්ඛු හොති උද්ධතො උන්නළො චපලො මුඛරො විකිණ්ණවාචො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො, එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. ගහපති චීවරධරො චෙපි ගහපති භික්ඛු හොති අනුද්ධතො අනුන්නළො අචපලො අමුඛරො අවිකිණ්ණවාචො උපට්ඨිතසති[2] සම්පජානො සමාහිතො එකග්ගචිත්තො සංවුතින්ද්‍රියො, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

ඉඞ්ඝ ත්වං ගහපති සඞ්ඝෙ දානං දෙහි. සඞ්ඝෙ තෙ දානං දදතො චිත්තං පසීදිස්සති. සො ත්වං පසන්නචිත්තො කායස්ස භෙදා පරම්මරණා සුගති සග්ගං ලොකං උපපජ්ජිස්සසීති.

එසාහං භන්තෙ අජ්ජතග්ගෙ සඞ්ඝෙ දානං දස්සාමීති.

1 ආරඤ්ඤිකො - මජසං   2 උපට්ඨිතස්සති - මජසං

ගැහැවිය, කාමභෝගී වූ පුත්‍ර සම්බාධ සයනයෙහි වෙසෙන ගිහි වූ කසී සඳුන් වළඳ කරණ මල්ගඳවිලෙවුන් දරණ රන් රිදී ඉවසන තා විසින් 'මොහු රහත්හ කියා හෝ මොහු රහත්මඟට පිළිපන්හ'යි කියා හෝ තෙල කරුණ දත නො හැකි වේ.

(1) ගෘහපතිය, ආරණ්‍යක වූ ද මහණ උඬතු වූයේ නැගී මානනළ ඇතියේ චපල වූයේ දෙඩමලු වූයේ විසිරගිය තෙපුල් ඇතියේ නට සිහි ඇතියේ සම්‍යක්ප්‍රඥ නැතියේ සමාහිත නො වූයේ භ්‍රාන්ත සිත් ඇතියේ ප්‍රාකෘතික (ස්වාභාවික නොදැමුනු) ඉන්ද්‍රිය ඇත්තේ වෙයි ද, මෙසේ හෙ තෙම එ කරුණෙන් ගැරහිය යුත්තේ ය. ගෘහපතිය, මහණ ආරණ්‍යක වූයේ ද උඬත නො වූයේ නැගී මානනළ නැතියේ අචපල වූයේ දෙඩමලු නො වූයේ නො විසුරුණු වදන් ඇතියේ එළඹ සිටි සිහි ඇතියේ සම්‍යක් ප්‍රඥ ඇතියේ සමාහිත වූයේ එකඟ සිත් ඇතියේ ආවුරු ඉඳුරන් ඇතියේ වේ ද, මෙසේ හෙතෙම එ කරුණින් පැසසිය යුත්තේ ය.

(2) ගෘහපතිය, ග්‍රාමාන්තවිහාරී (ගම්වැසි) නමුදු මහණ උඬතු වූයේ ... මෙසේ හේ එ කරුණින් ගැරහිය යුතු වෙයි. ගෘහපතිය ග්‍රාමාන්තවිහාරී නමුදු මහණ උඬත නො වූයේ ... මෙසේ හෙතෙම එ කරුණින් පැසසිය යුත්තේ ය.

(3) ගෘහපතිය, පිණ්ඩපාතික වූ ද මහණ උඬත වූයේ ... මෙසේ හෙතෙම එ කරුණින් ගැරහියයුතු වෙයි. ගෘහපතිය, පිණ්ඩපාතික වූ ද මහණ අනුඬත වූයේ ... මෙසේ හේ එ කරුණින් ප්‍රශංසාහී වෙයි.

(4) ගෘහපතිය, නිමන්ත්‍රණ ඉවසන්නා වූ ද මහණ උඬත වූයේ ...මෙසේ හේ එ කරුණින් ගැරහිය යුතු වෙයි. ගෘහපතිය, නිමන්ත්‍රණ ඉවසන සුලු වූ ද මහණ අනුඬත වූයේ .. මෙසේ එ කරුණින් හෙතෙම ප්‍රශංසාහී වෙයි.

(5) ගෘහපතිය, පාංශුකූලික වූ ද මහණ උඬත වූයේ ... මෙසේ හෙතෙම එ කරුණින් ගැරහියයුතු වෙයි. ගෘහපතිය, පාංශුකූලික වූ ද මහණ අනුඬත වූයේ ... මෙසේ හේ එකරුණින් ප්‍රශංසාහී වෙයි.

(6) ගෘහපතිය, ගිහියන් දෙන චීවරධර වූ ද මහණ උඬත වූයේ උද්ගත මානනළ ඇතියේ චපල වූයේ දෙඩමලු වූයේ විසිරුණු වදන් ඇතියේ නට සිහි ඇතියේ මනා නුවණ නැතියේ සමාහිත නො වූයේ විභ්‍රාන්ත සිත් ඇතියේ ප්‍රාකෘතික වූ ඉන්ද්‍රියයන් ඇතියේ වේ ද, මෙසේ හේ එ කරුණින් ගැරහිය යුතු වෙයි. ගෘහපතිය, ගෘහපතිචීවරධර වූ ද මහණ අනුඬත වූයේ උද්ගත මානනළ නැතියේ චපල නො වූයේ දෙඩමලු නො වූයේ නො විසිරුණු වදන් ඇතියේ එළඹසිටි සිහි ඇතියේ මනා නුවණ ඇතියේ සමාහිත වූයේ එකඟසිත් ඇතියේ සංවෘත ඉන්ද්‍රියයන් ඇති යේ වේ ද, මෙසේ හේ එ කරුණින් ප්‍රශංසාහී වෙයි.

ගෘහපතිය, එහෙයින් ම තෝ සඟුන් කෙරෙහි දන් දෙව. සඟුන් කෙරෙහි දන් දෙන තාගේ සිත පහන් වන්නේ ය. එබඳු තෝ පහන් සිත් ඇතියේ සුගති සංඛ්‍යාත ස්වර්ග ලෝකයට පැමිණෙන්නෙහි යි.

'වහන්ස, තෙල මම අද පටන් කොට සඞ්ඝයා කෙරෙහි දන් දෙන්නෙමි'යි.

## 6. 2. 1. 6

## [හත්ථිසාරිපුත්ත සුත්තං]

**6.** එවං මෙ සුතං එකං සමයං භගවා **බාරාණසියං** විහරති **ඉසිපතනෙ මිගදායෙ.** තෙන ඛො පන සමයෙන සම්බහුලා ථෙරා භික්ඛූ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා මණ්ඩලමාළෙ සන්නිසින්නා සන්නිපතිතා අභිධම්මකථං කථෙන්ති.

තත්‍රසුදං ආයස්මා **චිත්තො** හත්ථිසාරිපුත්තො ථෙරානං භික්ඛූනං අභිධම්මකථං කථෙන්තානං අන්තරන්තරා කථං ඔපාතෙති. අථ ඛො ආයස්මා **මහාකොට්ඨිතො** ආයස්මන්තං චිත්තං හත්ථිසාරිපුත්තං එතදවොච: "මා ආයස්මා චිත්තො හත්ථිසාරිපුත්තො ථෙරානං භික්ඛූනං අභිධම්මකථං කථෙන්තානං අන්තරන්තරා කථං ඔපාතෙසි. කථාපරියොසානං[1] ආයස්මා චිත්තො ආගමෙතූ"ති.

එවං වුත්තෙ ආයස්මතො චිත්තස්ස හත්ථිසාරිපුත්තස්ස සහායකා භික්ඛූ ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොචුං: "මා ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං චිත්තං හත්ථිසාරිපුත්තං අපසාදෙසි. පණ්ඩිතො ආයස්මා චිත්තො හත්ථිසාරිපුත්තො. පහොති චායස්මා චිත්තො හත්ථිසාරිපුත්තො ථෙරානං භික්ඛූනං අභිධම්මකථං කථෙතු"න්ති.

දුජ්ජානං ඛො එතං ආවුසො පරස්ස චෙතොපරියායං අජානන්තෙහි.

(1) ඉධාවුසො එකච්චො පුග්ගලො තාවදෙව සොරතසොරතො[2] හොති, නිවාතනිවාතො හොති, උපසන්තූපසන්තො හොති යාව සත්ථාරං උපනිස්සාය විහරති අඤ්ඤතරං වා ගරුට්ඨානීයං සබ්‍රහ්මචාරිං. යතො ච ඛො සො වපකස්සතෙව සත්ථාරා, වපකස්සති ගරුට්ඨානීයෙහි සබ්‍රහ්මචාරීහි. සො සංසට්ඨො විහරති භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි[3] රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. තස්ස සංසට්ඨස්ස විස්සට්ඨස්ස පාකතස්ස භස්සමනුයුත්තස්ස විහරතො රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසෙන චිත්තෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි ආවුසො ගොණො කිට්ඨාදො දාමෙන වා බද්ධො වජෙ වා ඔරුද්ධො, යො නු ඛො ආවුසො එවං වදෙය්‍ය: "න දානායං ගොණො කිට්ඨාදො පුනදෙව කිට්ඨං ඔතරිස්සතී"ති සම්මා නු ඛො සො ආවුසො වදමානො වදෙය්‍යාති? නො හිදං ආවුසො, ඨානං හෙතං ආවුසො විජ්ජති යං සො ගොණො කිට්ඨාදො දාමං වා ඡෙත්වා වජං වා භින්දිත්වා පුනදෙව කිට්ඨං ඔතරෙය්‍යාති. එවමෙව ඛො ආවුසො ඉධෙකච්චො පුග්ගලො තාවදෙව සොරතසොරතො හොති නිවාතනිවාතො හොති උපසන්තූපසන්තො හොති යාව සත්ථාරං උපනිස්සාය විහරති අඤ්ඤතරං වා ගරුට්ඨානීයං සබ්‍රහ්මචාරිං. යතො ච ඛො සො වපකස්සතෙව සත්ථාරා, වපකස්සති ගරුට්ඨානීයෙහි සබ්‍රහ්මචාරීහි. සො සංසට්ඨො විහරති භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. තස්ස සංසට්ඨස්ස විස්සට්ඨස්ස පාකතස්ස භස්සමනුයුත්තස්ස විහරතො රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසෙන චිත්තෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

---

1 යාව කථාපරියොසානා - මජසං. 2 සූරතසූරතො - සාළුවි. 3 රඤ්ඤෙහි - මජසං

## 6. 2. 1. 6.

## [හත්ථිසාරිපුත්ත සූත්‍රය]

6. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස්නුවර සමීපයෙහි ඉසිපතන නම් මිගදායෙහි වැඩවසනසේක. එ සමයෙහි බොහෝ තෙර මහණහු පසුබත්හි පිඬුවායෙන් පෙරළා පැමිණියාහු මණ්ඩලමාළයෙහි රැස්ව හුන්නාහු අභිධම්මිශ්‍ර කථා කෙරෙත්.

එහි හත්ථිසාරිපුත්‍ර ආයුෂ්මත් චිත්ත තෙරහු තෙර මහණුන් අභිධම්කථා කරත් ම අතරින් අතර කථා හෙළත්. එකල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ඇත්සැරියුත් ආයුෂ්මත් චිත්ත තෙරුන්ට තෙල කීහ: “ආයුෂ්මත් හත්ථිසාරිපුත්‍ර චිත්ත තෙරහු තෙරමහණුන් අභිධම්කථා කරත් ම අතරින් අතර නහමක් කථා හෙළත්වා. ආයුෂ්මත් චිත්ත තෙරණුවෝ-කථාපර්‍ය්‍යවසානය ඉවසත්වා”යි.

මෙසේ කී කල්හි ආයුෂ්මත් චිත්ත හත්ථිසාරිපුත්ත තෙරණුවන්ගේ සබඳ මහණහු ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන්හට තෙල කීහ: “ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් චිත්ත හත්ථිසාරිපුත්‍ර නහමක් ගටත්වා. ආයුෂ්මත් චිත්ත හත්ථිසාරිපුත්‍රයෝ පණ්ඩිතයහ. ආයුෂ්මත් චිත්ත හත්ථිසාරිපුත්ත තෙරහු තෙරමහණුන් හට අභිධම්කථා කියන්නට ද පොහොසත්හ”යි.

ඇවැත්නි, මෙරමාගේ චිත්තාචාරය නො දන්නවුන් විසින් තෙල නො දත හැක්ක.

(1) ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුඟුලෙක් යම්තාක් කල් ශාස්තෲන් වහන්සේ හෝ අන්‍යතර ගුරුස්ථානීය වූ සබ්‍රහ්මචාරියකු හෝ ඇසුරු කොට වෙසේ නම් එතෙක් කල් සුරතාකාර නිවාතාකාර වෙයි. උපශාන්තාකාර වෙයි. යම් මැ කලෙක හේ ශාස්තෲහු කෙරෙන් බැහැර වේ නම්, හේ ගුරුස්ථානීය සබ්‍රහ්මචාරීන් කෙරෙන් බැහැර වේ නම්, හේ මහණුන් හා සමඟ මෙහෙණින් හා සමඟ උපසුවන් හා සමඟ උවැසියන් හා සමඟ රජුන් හා සමඟ රජමහ ඇමැතියන් හා සමඟ තීර්ථක-යන් හා සමඟ තීර්ථක ශ්‍රාවකයන් හා සමඟ සංසෘෂ්ට ව වෙසෙයි. සංසෘෂ්ට ව ව්‍යපකෘෂ්ට ව ප්‍රාකෘතික ඉන්ද්‍රියයන් ඇති ව භාෂ්‍යකථායෙහි නියැලී වසන ඔහුගේ සිත රාගය ධ්වංස කෙරෙයි (සමාධියෙන් දුරලයි.) හේ රාගයා විසින් ධර්ෂිත (මැඩුණු) සිතින් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීන (ගිහි) භාවයට යෙයි.

ඇවැත්නි, යම් පරිදි වැඩෙන ශස්‍ය බුදින ගොණෙක් දම්න් හෝ බඳනාලද්දේ, ගොවදෙහි හෝ අවුරණලද්දේ වේ නම්, ඇවැත්නි, “සස් බුදිනා මේ ගොන් යළිදු ශස්‍යයට නො බස්නේ ය”යි යමෙක් මෙසේ කියා නම්, ඇවැත්නි, ඒ කියනුයේ මැනවින් කියන්නේ දැයි ඇවැත්නි, නැත් මැ යි. ඇවැත්නි, යම් හෙයෙකින් සස් බුදිනා එ ගොන් දමය හෝ සිඳ ගොවුද හෝ බිඳැ වැලිදු ශස්‍යයට බස්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. ඇවැත්නි, එපරිදි ම මෙ සස්නෙහි ඇතැම් පුඟුලෙක් යම්තාක් ශාස්තෲන් වහන්සේ හෝ අන්‍යතර ගුරුස්ථානීය සබ්‍රහ්මචාරියකු හෝ ඇසුරු කොට වෙසේ ද, ඒ තාක් සුරතයකු සෙයින් සුරත වෙයි, නිවාතයකු සෙයින් නිවාත වෙයි, උපශාන්තයකු සෙයින් උපශාන්ත වෙයි. යම් කලෙක හෙ ශාස්තෲන් වහන්සේ කෙරෙන් බැහැර වේ ද, ගුරුස්ථානීය වූ සබ්‍රහ්මචාරීන් කෙරෙන් බැහැර වේ ද, හෙ භික්ෂූන් හා භික්ෂුණීන් හා උපසුවන් හා උවැසියන් හා රජුන් හා රජමහඇමැතියන් හා තීර්ථකයන් හා තීර්ථකශ්‍රාවකයන් හා සංසෘෂ්ට ව වෙසෙයි. සංසෘෂ්ට වූ හුදු කමටහන් ඇති ව ප්‍රාකෘතික ඉන්ද්‍රියයන් ඇති ව භාෂ්‍යකථායෙහි අනුයුක්ත ව වසන ඔහුගේ සිත රාගය හෙණ සිටුයේ වෙයි. රාගයා විසින් ගත් සිතින් හෙ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීන භාවයට වැටෙයි.

(2) ඉධ පනාවුසො එකච්චො පුග්ගලො විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ලාභිම්හි පඨමස්ස ඣානස්සාති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි ආවුසො චාතුම්මහාපථෙ[1] ථුල්ලඵුසිතකො දෙවො වස්සන්තො රජං අන්තරධාපෙය්‍ය, චික්ඛල්ලං පාතුකරෙය්‍ය, යො නු ඛො ආවුසො එවං වදෙය්‍ය: "න දානාමුස්මිං චාතුම්මහාපථෙ පුනදෙව රජො පාතු භවිස්සතී"ති. සම්මා නු ඛො සො ආවුසො වදමානො වදෙය්‍යාති. නො හිදං ආවුසො. ඨානං හෙතං ආවුසො විජ්ජති යං අමුස්මිං චාතුම්මහාපථෙ මනුස්සා වා අතික්කමෙය්‍යුං, ගොපසූ වා අතික්කමෙය්‍යුං, වාතාතපො වා සෙනහගතං පරියාදියෙය්‍ය. අථ පුනදෙව රජො පාතුභවෙය්‍යාති. එවමෙව ඛො ආවුසො ඉධෙකච්චො පුග්ගලො විවිච්චෙව කාමෙහි [විවිච්ච අකුසලෙහි ධම්මෙහි] -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ලාභිම්හි පඨමස්ස ඣානස්සාති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

(3) ඉධ පනාවුසො එකච්චො පුග්ගලො විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ලාභිම්හි දුතියස්ස ඣානස්සාති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි ආවුසො ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ මහන්තං තළාකං, තත්‍ර ථුල්ලඵුසිතකො දෙවො වස්සන්තො සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි අන්තරධාපෙය්‍ය, යො නු ඛො ආවුසො එවං වදෙය්‍ය: න දානාමුස්මිං තළාකෙ පුනදෙව සිප්පිසම්බුකා වා සක්ඛරකඨලා වා පාතුභවිස්සන්තීති. සම්මා නු ඛො සො ආවුසො වදමානො වදෙය්‍යාති. නො හිදං ආවුසො. ඨානං හෙතං ආවුසො විජ්ජති යං අමුස්මිං තළාකෙ මනුස්සා වා පිවෙය්‍යුං, ගොපසූ වා පිවෙය්‍යුං, වාතාතපො වා සෙනහගතං පරියාදියෙය්‍ය, අථ පුනදෙව සිප්පිසම්බුකාපි සක්ඛරකඨලාපි පාතුභවෙය්‍යුන්ති. එවමෙව ඛො ආවුසො ඉධෙකච්චො පුග්ගලො විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ලාභිම්හි දුතියස්ස ඣානස්සාති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

(4) ඉධ පනාවුසො එකච්චො පුග්ගලො පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සො ලාභිම්හි තතියස්ස ඣානස්සාති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි ආවුසො පුරිසං පණීතභොජනං භුත්තාවිං ආභිදොසිකං[3] භොජනං නච්ඡාදෙය්‍ය, යො නු ඛො ආවුසො එවං වදෙය්‍ය "න දානාමුං පුරිසං පුනදෙව භොජනං ඡාදෙස්සතී"ති. සම්මා නු ඛො සො ආවුසො වදමානො වදෙය්‍යාති. නො හිදං ආවුසො, "ඨානං හෙතං ආවුසො විජ්ජති අමුං හාවුසො පුරිසං පණීතභොජනං භුත්තාවිං යාවස්ස සා ඔජා කායෙ ඨස්සති තාව න අඤ්ඤං භොජනං ඡාදෙස්සති. යතො ච ඛවස්ස සා ඔජා අන්තරධායිස්සති, අථ පුනදෙව තං භොජනං ඡාදෙය්‍යාති. එවමෙව ඛො ආවුසො ඉධෙකච්චො පුග්ගලො පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සො "ලාභිම්හි තතියස්ස ඣානස්සා"ති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

---

1 චාතුමහාපථෙ - මජසං. 2 වුට්ඨො - මජසං. 3. ආභිදොසිකං - සීමු.

(2) ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලෙක් කාමයන්ගෙන් වෙන් ව ම [අකුසල ධර්මයන්ගෙන් වෙන්වම] ... ප්‍රථමධ්‍යානයට එළඹ වෙසෙයි. හෙ ප්‍රථමධ්‍යානලාභීයෙමි යි භික්ෂූන් හා ... සංසෘෂ්ට වූයේ වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට වැටෙයි.

ඇවැත්නි, යම්පරිදි සතරමංසන්ධියෙහි දළ පොද ඇති මෙඝය වස්නේ රජස් අතුරුදන් කෙරේ ද, මඩ පාළු කෙරේ ද, ඇවැත්නි, "මෙ සතරමංසන්ධියෙහි යළිත් රජස් පාළු නො වන්නේ ය"යි යමෙක් මෙසේ කියා නම් ඇවැත්නි, එ කියනුයේ මනා කොට කියන්නේ වේ දැයි. ඇවැත්නි, මෙය නො වේ ම ය. ඇවැත්නි, යම් හෙයෙකින් අසෝ මහාපථයෙහි මනුෂ්‍යයෝ හෝ ඉක්මයෙති, ගවපසුහු හෝ ඉක්මයෙති, අව්සුළං හෝ තෙතමන සිඳ ගන්නේ ය. ඉක්බිති රජස් පාළු වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. ඇවැත්නි, එ පරිදි ම මෙසස්නෙහි ඇතැම් පුද්ගලෙක් කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට එළඹ වෙසෙයි. හෙ ප්‍රථමධ්‍යානලාභීයෙමි'යි භික්ෂූන් හා හැනී වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට හීනභාවයට යෙයි.

(3) ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලෙක් විතර්කවිචාරයන්ගේ ව්‍යපශමයෙන් ... ද්විතීයධ්‍යානයට එළඹ වෙසෙයි. 'හෙ ද්විතීයධ්‍යානලාභීයෙමි'යි භික්ෂූන් හා ... හැනී වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට වැටෙයි.

ඇවැත්නි, යම් පරිදි ගමකට වේවයි, නියම්ගමකට වේවයි, නුදුරෙහි මහදහතළාවෙක් වේ නම්, එහි මහත් පොද ඇති මේඝය වස්නේ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන් හා කැටකැබිලිති හා අතුරුදන් කරවයි. ඇවැත්නි, යමෙක් "දැන් මෙ දහතළාවෙහි වැලිදූ සිප්පිබෙලි සක්බෙලි කැටකැබිලිති පාළු නො වේ ය"යි කියන්නේ නම්, ඇවැත්නි, හේ මොනොවට කියන්නේ දැයි? ඇවැත්නි, මෙය නො වේ මැයි. ඇවැත්නි, යම් හෙයෙකින් ඒ තළාවෙහි මිනිස්සු හෝ පානය කරන්නාහ. ගවපසුහු හෝ පානය කරන්නාහ. අව්සුළං හෝ තෙත්ගතිය ගෙනගන්නේය. වැලිදූ සිප්පිබෙලි සක්බෙලි කැට කැබිලිති පාළු වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. ඇවැත්නි, එ පරිදි ම මෙ සස්නෙහි ඇතැම් පුද්ගලෙක් විතර්කවිචාරව්‍යපශමයෙන් ... ද්විතීයධ්‍යානයට එළඹ වෙසෙයි. හේ ද්විතීයධ්‍යානලාභියෙමි'යි භික්ෂූන් හා ... හැනී වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට වැටෙයි.

(4) ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලෙක් ප්‍රීති විරාගයෙනුදු ... තෘතීයධ්‍යානයට එළඹ වෙසෙයි. හෙ තෘතීයධ්‍යානලාභීයෙමි'යි භික්ෂූන් හා ... හැනී වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට වැටෙයි.

ඇවැත්නි, යම් පරිදි පිණිබොජුන් වළඳනා පුරුෂයකු හට ප්‍රකට දෙෂ ඇති, කුද්‍රසක භෝජනය නුරුස්නේ ද, "දැන් මෙ පුරිස්හට නැවත බොජුන් නො රුස්නේ ය"යි යමෙක් කියා නම්, ඇවැත්නි, එ කියනුයේ මනා කොට කියන්නේ දැයි. ඇවැත්නි, මෙ නො වේ මැ යි. "ඇවැත්නි, පිණිබොජුන් වැළඳූ තෙල පුරිස්හට යම්තාක් කයෙහි එ ඕජාව සිටුනේ ද, ඒතාක් අන් බොජුනක් නො ම රුස්නේය. යම් කලෙක ඔහුගේ ඒ ඕජාව අතුරුදන් වේ නම්, එකල නැවතත් එ බොජුන රුස්නේ ය" යන තෙල කරුණ විද්‍යමාන වේ. ඇවැත්නි, එපරිදි ම මෙ සස්නෙහි ඇතැම් පුද්ගලෙක් ප්‍රීති විරාගයෙන් ... තෘතීයධ්‍යානයට එළඹ වෙසෙයි. හෙ තෘතීයධ්‍යානලාභියෙමියි භික්ෂූන් හා ... හැනී වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට පෙරළා වැටෙයි.

(5) ඉධ පනාවුසො එකච්චො පුග්ගලො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, සො "ලාභිම්හි චතුත්ථස්ස ඣානස්සා"ති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි ආවුසො පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො නිවාතො විගතූමිකො, යො නු ඛො ආවුසො එවං වදෙය්‍ය: "න දානිමස්මිං උදකරහදෙ පුනදෙව ඌමී පාතුභවිස්සතී"ති. සම්මා නු ඛො සො ආවුසො වදමානො වදෙය්‍යාති. නො හිදං ආවුසො. ඨානං හෙතං ආවුසො විජ්ජති යා පුරත්ථිමාය දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි සා තස්මිං උදකරහදෙ ඌමිං ජනෙය්‍ය, යා පච්ඡිමාය දිසාය ආගච්ඡෙය්‍ය -පෙ- යා උත්තරාය දිසාය ආගච්ඡෙය්‍ය -පෙ- යා දක්ඛිණාය දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි සා තස්මිං උදකරහදෙ ඌමිං ජනෙය්‍යාති. එවමෙව ඛො ආවුසො ඉධෙකච්චො පුග්ගලො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො "ලාභිම්හි චතුත්ථස්ස ඣානස්සා"ති සංසට්ඨො විහරති භික්ඛූහි -පෙ- සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

(6) ඉධ පනාවුසො එකච්චො පුග්ගලො සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, සො "ලාභිම්හි අනිමිත්තස්ස චෙතොසමාධිස්සා"ති සංසට්ඨො විහරති භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි[1] රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි, තස්ස සංසට්ඨස්ස විස්සට්ඨස්ස පාකතස්ස භස්සමනුයුත්තස්ස විහරතො රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසිතෙන[2] චිත්තෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති.

සෙය්‍යථාපි ආවුසො රාජා වා රාජමහාමත්තො වා චතුරඞ්ගිනියා සෙනාය අද්ධානමග්ගප්පටිපන්නො අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ එකරත්තිවාසං උපගච්ඡෙය්‍ය, තත්ථ[3] හත්ථිසද්දෙන අස්සසද්දෙන රථසද්දෙන පත්තිසද්දෙන භෙරිපණවසඞ්ඛතිණවනින්නාදසද්දෙන චීරිළිකසද්දො අන්තරධායෙය්‍ය, යො නු ඛො ආවුසො එවං වදෙය්‍ය: "න දානිමස්මිං වනසණ්ඩෙ පුනදෙව චීරිළිකසද්දො[4] පාතුභවිස්සතී"ති, සම්මා නු ඛො සො ආවුසො වදමානො වදෙය්‍යාති. නො හිදං ආවුසො. ඨානං හෙතං ආවුසො විජ්ජති යං සො රාජා වා රාජමහාමත්තො වා තම්හා වනසණ්ඩා පක්කමෙය්‍ය, අථ පුනදෙව චීරිළිකසද්දො[4] පාතුභවෙය්‍යාති. එවමෙව ඛො ආවුසො ඉධෙකච්චො පුග්ගලො සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. සො "ලාභිම්හි අනිමිත්තස්ස චෙතොසමාධිස්සා"ති සංසට්ඨො විහරති භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි, තස්ස සංසට්ඨස්ස විස්සට්ඨස්ස පාකතස්ස භස්සමනුයුත්තස්ස විහරතො රාගො චිත්තං අනුද්ධංසෙති. සො රාගානුද්ධංසිතෙන චිත්තෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තතී'ති.

1. රඤ්ඤෙ මජ්ඣං. 2 රාගානුද්ධංසෙන සීමු, 3. තත්‍ර - මජ්ඣං
4 චිරීක සද්දෙ - මජ්ඣං චිරීළිකාසද්දෙ - සීමු,

(5) ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුගුලෙක් සුඛයාගේත් ප්‍රහාණයෙන් දුඃඛයාගේත් ප්‍රහාණයෙන් ... චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. හේ චතුර්ථධ්‍යානලාභියෙමි'යි භික්ෂූන් හා ... හැනී වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට පෙරළා වැටෙයි.

ඇවැත්නි, යම් පරිදි කඳුනැම්මෙක වාපහස නො ලත් නො නැඟි රළ ඇති දියවිලෙක් වේ නම්, ඇවැත්නි, යමෙක් තෙල දියවිල්හි යළිදු රළ පාළ නොවන්නේ ය'යි මෙසේ කියා නම්, ඇවැත්නි, කියන හේ මොනොවට කියන්නේ වේ දැයි. ඇවැත්නි, මෙ නො වේ මැයි. ඇවැත්නි, පැදුම්දිගින් යම්බඳු මහවැසිසුළඟෙක් හමා නම්, එසුළඟ එ දියවිල්හි රළ දනවා නම්, පැලදිගින් යම් මහවැසිසුළඟෙක් හමා නම් ... උතුරුදිගින් යම් මහවැසි සුළඟෙක් හමා නම් ... දකුණු දිගින් යම් මහ වැසිසුළඟෙක් හමා නම්, එ සුළඟ එ දියවිල්හි රළ දනවා නම්, තෙල කරුණ විද්‍යමාන මැ වේ. ඇවැත්නි, එ පරිද්දෙම මෙ සස්නෙහි ඇතැම් පුගුලෙක් සුඛයාගේ ප්‍රහාණයෙන් ද දුඃඛයාගේ ප්‍රහාණයෙන් ද ... චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. හෙ (මම්) චතුර්ථධ්‍යානලාභියෙමියි භික්ෂූන් හා ... හැනී වෙසෙයි ... ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට පෙරළා වැටෙයි.

(6) ඇවැත්නි, මෙ සස්නෙහි ඇතැම් පුගුලෙක් (නිත්‍ය ආදි) හැම නිමිත්තයන් මෙනෙහි නො කිරීමෙන් (බලවත් විදර්ශනා සමාධි සඞ්ඛ්‍යාත) අනිමිත්ත චිත්තසමාධියට එළඹ වෙසෙයි. හෙ අනිමිත්ත චිත්තසමාධිලාභියෙමියි භික්ෂූන් හා භික්ෂුණීන් හා උපාසකයන් හා උපාසිකාවන් හා රජුන් හා රාජමහාමාත්‍යයන් හා තීර්ථකයන් හා තීර්ථශ්‍රාවකයන් හා සමඟ හැනී වෙසෙයි. සංසෘෂ්ට ව වුහුටු වැර ඇති ව ප්‍රාකෘතික ඉන්ද්‍රියයන් ඇතිව භාෂ්‍යකථායෙහි නියැලී වාස කරණ ඔහුගේ සිත රාගය තෙමේ සටයි. හේ රාගයෙන් සැටුනු සිතින් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට පෙරළා වැටෙයි.

ඇවැත්නි, යම් පරිදි රජෙක් වේවයි, රජමහඇමැතියෙක් වේවයි, සිවුරඟ සෙන් සමඟ අදන්මඟට පිළිපන්නේ අන්‍යතර වන ලැහැබෙක්හි එක් රැයක් විසීමට එළඹේ නම් එහි හස්තිශබ්දයෙන් අශ්වශබ්දයෙන් රථශබ්දයෙන් පත්තිශබ්දයෙන් බෙර පණාබෙර සක් ගැටබෙර නිනාද හඬින් සීරුත්ගේ හඬ අතුරුදන් වන්නේ ද, ඇවැත්නි, මෙ වන ලැහැබෙහි වැලිදු සීරුත්ගේ හඬ පාළ නො වන්නේ ය'යි යමෙක් මෙසේ කියා නම්, ඇවැත්නි, කියන හේ මනා කොට කියන්නේ දැයි? ඇවැත්නි, මෙ නො වේ මැ යි. ඇවැත්නි, යම් හෙයෙකින් එ රජ වේවයි, රජමහඇමැති වේවයි, එ වනලැහැබින් නික්ම ගේ නම් එකල්හි නැවතත් සීරුත්ගේ ශබ්දය පාළ වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. ඇවැත්නි, එපරිද්දෙම මෙ සස්නෙහි ඇතැම් පුගුලෙක් හැම නිමිති නො මෙනෙහි කිරීමෙන් අනිමිත්ත චිත්තසමාධියට එළඹ වාස කෙරෙයි. හේ මම් 'අනිමිත්තචේතොසමාධිලාභියෙමි'යි භික්ෂූන් හා භික්ෂුණීන් හා උපාසකයන් හා උපාසිකාවන් හා රජුන් හා රජමහඇමැතින් හා තීර්ථකයන් හා තීර්ථකශ්‍රාවකයන් හා සමඟ හැනී වෙසෙයි. සසට ව වුහුටු කමටහන් ඇති ව පියෙවි ඉඳුරන් ඇති ව භාෂ්‍යකථාහි නියුතු ව වසන ඔහුගේ සිත රාගය තෙමේ සටයි. රාගයෙන් සැටුනු සිතින් යුත් හෙ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාවයට පෙරළා වැටෙයි.

අථ ඛො ආයස්මා චිත්තො හත්ථිසාරිපුත්තො අපරෙන සමයෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්ති[1]. අථ ඛො චිත්තස්ස හත්ථිසාරිපුත්තස්ස සහායකා භික්ඛූ යෙනායස්මා කොට්ඨිතො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොචුං: කින්නු ඛො ආයස්මතා මහා-කොට්ඨිතෙන චිත්තො හත්ථිසාරිපුත්තො චෙතසා චෙතො පරිච්ච විදිතො: ඉමාසං ච ඉමාසං ච විහාරසමාපත්තීනං චිත්තො හත්ථිසාරිපුත්තො ලාභී, අථ ච පන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සතීති. උදාහු දෙවතා එතමත්ථං ආරොචෙසුං චිත්තො භන්තෙ හත්ථිසාරිපුත්තො ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාසමාපත්තීනං ලාභී, අථ ච පන සික්ඛා පච්චක්ඛාය හීනායාවත්තිස්සතී'ති.

චෙතසා චෙතො පරිච්ච විදිතො මෙ ආවුසො චිත්තො හත්ථිසාරි-පුත්තො ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාපත්තීනං ලාභී, අථ ච පන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සතී'ති. දෙවතාපි මෙ එතමත්ථං ආරොචෙසුං "චිත්තො භන්තෙ හත්ථිසාරිපුත්තො ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාපත්තීනං ලාභී, අථ ච පන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සතී"ති.

අථ ඛො චිත්තස්ස හත්ථිසාරිපුත්තස්ස සහායකා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: චිත්තො භන්තෙ හත්ථිසාරිපුත්තො ඉමාසඤ්ච ඉමාසඤ්ච විහාරසමාපත්තීනං ලාභී, අථ ච පන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො'ති.

න භික්ඛවෙ චිත්තො චිරං සරිස්සති නෙක්ඛම්මස්සා'ති.

අථ ඛො චිත්තො හත්ථිසාරිපුත්තො න චිරස්සෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. අථ ඛො ආයස්මා චිත්තො හත්ථිසාරිපුත්තො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනාගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා චිත්තො හත්ථිසාරිපුත්තො අරහතං අහොසී'ති.

1. හීනායාවත්තති - මජසං.

ඉක්බිති ආයුෂ්මත් හත්ථිසාරිපුත්ත නම් චිත්ත තෙරණුවෝ පසු කල්හි ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට (ගිහි බවට) පෙරළා වැටුනාහ. එකල්හි හත්ථිසාරිපුත්ත චිත්ත තෙරණුවන්ගේ යහළු මහණහු ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරුන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන්ට තෙල සැලකළහ: "කිමෙක් ද, ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන් විසින් චිත්ත හත්ථිසාරිපුත්ත තෙර "මේ මේ විහාරසමාපත්ති ලාභියෙක, වැලිදු ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට පෙරළා වැටෙන්නේ ය"යි තමන් සිතින් ඔහු සිත පිරිසිඳ දැනගන්නා ලද්දේ වේ දැයි? නො එසේ වුව වහන්ස, චිත්ත හත්ථිසාරිපුත්ත තෙමේ මේ මේ විහාරසමාපත්තිලාභියෙක, වැලිදු ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට පෙරළා වැටෙන්නේ යයි දේවතාවෝ එ පවත් සැලකළාහු දැ"යි.

ඇවැත්නි, "චිත්ත හත්ථිසාරිපුත්ත තෙමේ මෙ මෙ විහාරසමාපත්ති-ලාභියෙක, වැලිදු ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට පෙරළා වැටෙන්නේ ය"යි මාගේ සිතින් ඔහු සිත පිරිසිඳ මා විසින් දන්නා ලද්දේ යැ. ඇවැත්නි, චිත්ත හත්ථිසාරිපුත්ත තෙමේ මේ මේ විහාරසමාත්තිලාභියෙක, එහෙතුදු වුව ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට පෙරළා වැටෙන්නේ ය යන තෙල පුවත දෙවියෝ ද මට සැළ කළහ' යි.

එකල්හි චිත්තහත්ථිසාරිපුත්‍රයන්ගේ යහළු මහණ හු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එහි එළඹියාහ. එළඹ භාග්‍යවතුන් සකසා වැද එකත්-පසෙක හුන්හ. එකත්පසෙක හුන් එ මහණහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ. "වහන්ස, චිත්තහත්ථිසාරිපුත්ත තෙමේ මේ මේ විහාරසමා-පත්තිලාභියෙක, එසේ වුව ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිභාවයට පෙරළා වැටිනැ"යි.

මහණෙනි, චිත්ත තෙමේ නොබෝ කල්හි නෛෂ්ක්‍රම්‍ය ගුණ සිහිපත් කරන්නේ ය යි.

ඉක්බිති චිත්තහත්ථිසාරිපුත්ත තෙමේ නො බෝ කලෙකින් ම කෙස්-රවුළු බහා කසාවත් හැද පෙරෙව ගිහිගෙන් නික්ම සස්නට වන. ඉක්බිති ආයුෂ්මත් චිත්තහත්ථිසාරිපුත්ත තෙර එකලා වූයේ ගණසඞ්ග-ණිකායෙන් වෙන් වූයේ අප්‍රමත්ත වූයේ කෙලෙස් තවනා වැර ඇතියේ ප්‍රහිතාත්ම ව වාස කරන්නේ නොබෝ කලෙකින් ම ආචාරකුලපුත්‍රයෝ මනාකොට ගෙන් නික්ම යම් අර්ථයක් පිණිස ශාසනයට පැමිණෙති නම්, එ අනුත්තර බ්‍රහ්මචර්‍ය්‍යපර්‍ය්‍යවසානය ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ට-ඥානයෙන් දැන පසක් කොට එයට එළඹ විසී. ජාතිය ක්ෂීණ විය. බඹසර වැස නිමවනලද, මනාකටයුතු කරණලද, මෙ කෙලශක්ෂය පිණිස කටයුතු අනෙකෙක් නැතැයි මනා කොට දැනැගත්තේ ය, ආයුෂ්මත් චිත්ත හත්ථිසාරිපුත්ත තෙරණුවෝ රහතුන් අතුරෙහි අන්‍යතර වූහ යි.

## 6. 2. 1. 7.

## [මජ්ඣසුත්තං]

**7.** එවං මෙ සුතං එකං සමයං භගවා **බාරාණසියං** විහරති **ඉසිපතනෙ මිගදායෙ.** තෙන ඛො පන සමයෙන සම්බහුලානං ථෙරානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාත පටික්කන්තානං මණ්ඩලමාලෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: "වුත්තමිදං ආවුසො භගවතා පාරායනෙ මෙත්තෙය්‍යපඤ්හෙ:

"සො[1] උභන්තෙ විදිත්වාන[2] - මජ්ඣෙ මන්තා න ලිප්පති[3]
තං බ්‍රෑමි මහාපුරිසොති සො'ධ සිබ්බනිමච්චගා"

කතමො නු ඛො ආවුසො එකො අන්තො කතමො දුතියො අන්තො, කිං මජ්ඣෙ, කා සිබ්බනීති.

(1) එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරෙ භික්ඛූ එතදවොච: "ඵස්සො ඛො ආවුසො එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො, ඵස්සනිරොධො මජ්ඣෙ, තණ්හා සිබ්බනී. තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා. එත්තාවතා ඛො ආවුසො භික්ඛු අභිඤ්ඤෙය්‍යං අභිජානාති, පරිඤ්ඤෙය්‍යං පරිජානාති. අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්ස අන්තකරො හොතී'ති.

(2) එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරෙ භික්ඛූ එතදවොච. "අතීතං ඛො ආවුසො එකො අන්තො, අනාගතං දුතියො අන්තො, පච්චුප්පන්නං මජ්ඣෙ, තණ්හා සිබ්බනී. තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා. එත්තාවතා ඛො ආවුසො භික්ඛු අභිඤ්ඤෙය්‍යං අභිජානාති පරිඤ්ඤෙය්‍යං පරිජානාති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොතී"ති.

(3) එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරෙ භික්ඛූ එතදවොච: "සුඛා ඛො ආවුසො වෙදනා එකො අන්තො, දුක්ඛා වෙදනා දුතියො අන්තො, අදුක්ඛමසුඛා වෙදනා මජ්ඣෙ, තණ්හා සිබ්බනී. තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා. එත්තාවතා ඛො ආවුසො භික්ඛු අභිඤ්ඤෙය්‍යං අභිජානාති -පෙ- දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්ස අන්තකරො හොතී"ති.

(4) එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරෙ භික්ඛූ එතදවොච: "නාමං ඛො ආවුසො එකො අන්තො, රූපං දුතියො අන්තො, විඤ්ඤාණං මජ්ඣෙ, තණ්හා සිබ්බනී. තණ්හා හි නං සිබ්බති -පෙ- දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්ස අන්තකරො හොතී"ති.

---

1. යො - සීමු. මජසං. 2. උභන්තමභිඤ්ඤාය - සුත්තනිපාතපාළි. සයා උභො අන්තෙ විදිත්වාන - මජසං PTS. 3. ලිම්පති - මජසං, සයා

## 6. 2. 1. 7.

## [මජ්ඣෙ සූත්‍රය]

7. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **බරණැස්හි ඉසිපතන** නම් **මිගදායෙහි** වැඩ වසන සේක. එ සමයෙහි පසුබත්හි පිඬුවායෙන් පෙරළා, පැමිණි, මණ්ඩලමාලයෙහි රැස්ව හුන් බොහෝ තෙරමහණුන් අතර මෙ අතුරු කථාව පහළ විය: ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් **පාරායන** සමාගමයෙහි **තිස්ස මෙත්තෙය්‍ය** මාණවකයාගේ ප්‍රශ්නයෙහි දී:

එ (රහත් භික්ෂුතෙම "උභයාන්තය ප්‍රඥයෙන් දැන මධ්‍යයෙහි නො තැවරේ නම් ඔහු මහාපුරුෂය යි කියමි. හේ මේ පස්සදෙහි සිබ්බනිසඞ්ඛ්‍යාත **තෘෂ්ණාව ඉක්ම** ගියේ ය"යි (මෙය වදාරණලදී.)

ඇවැත්නි, එක් අන්තය කවරේ යැ, දෙවන අන්තය කවරේ යැ, මධ්‍යය කවරේ යැ, සිබ්බනි කවර යැයි.

(1) මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් තෙර මහණුන්හට තෙල කීය: "ඇවැත්නි, (ස්පර්ශවශයෙන් උපන් හෙයින් වර්තමාන ආත්මභාව සඞ්ඛ්‍යාත) ස්පර්ශය එක් අන්තයෙක (අනාගතාත්මභාව සඞ්ඛ්‍යාත) ඵස්සසමුදය දෙවන අන්ත ය, (නිර්වාණ සඞ්ඛ්‍යාත) ස්පර්ශ නිරෝධය මධ්‍යය වෙයි. තෘෂ්ණාව සිබ්බනි යැ. තෘෂ්ණාව ම එ (ආත්මභාවද්වය සඞ්ඛ්‍යාත) ඵස්සය හා ඵස්සසමුදය ඒ ඒ භවයාගේ අභිනිර්වෘත්තිය සඳහා සිවන්නේ ය. ඇවැත්නි, මෙතෙකින් මහණ (චතුස්සත්‍යධර්ම සඞ්ඛ්‍යාත) අභිඥෙයය මනා කොට දන්නේ ය. (ලෞකික සත්‍යද්වය සඞ්ඛ්‍යාත) පරිඥෙය පිරිසිඳ දන්නේ ය. අභිඥෙයය අභිජානන කරණුයේ පරිඥෙයය පරිජානන කරණුයේ ඉහාත්ම-භාවයෙහි ම වෘත්ත දුඃඛය කෙළවර කරන්නේ ය යි.

(2) මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් තෙර මහණුන්හට මෙය කී ය: "ඇවැත්නි, අතීතාත්මභාවය එක අන්තයෙක, අනාගතාත්මභාවය දෙවන අන්තය යි. ප්‍රත්‍යුත්පන්නාත්මභාවය මධ්‍යය යි. තෘෂ්ණාව සිබ්බනිය යි. තෘෂ්ණාව ම ඒ ඒ භවයාගේ ඉපැත්ම සඳහා එය (අතීතානාගතපච්චුප්පන්න ඛන්ධ) සිවනේ ය. ඇවැත්නි, මෙතෙකින් මහණ අභිඥෙයය අභිජානනය කෙරෙයි. පරිඥෙයය පරිජානනය කෙරෙයි. අභිඥෙයය මනා කොට දන්නේ පරිඥෙයය පිරිසඳ දන්නේ ඉහාත්මභාවයෙහි ම දුක් කෙළවර කරන්නේ ය"යි.

(3) මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් තෙර මහණුන්ට තෙල කරුණ කී ය: "ඇවැත්නි, සුඛ වේදනා එක් අන්ත යැ, දුක්ඛවේදනාව දෙවන අන්ත යැ. අදුක්ඛමසුඛ වේදනාව මධ්‍යය යි. තෘෂ්ණාව සිබ්බනි යි. තෘෂ්ණාව ම එ එ භවයාගේ අභිනිර්වෘත්තිය සඳහා එය සිවන්නේය. ඇවැත්නි, මෙතෙකින් මහණ අභිඥෙයය අභිඥාත වෙයි, ... ඉහාත්ම-යෙහි ම දුක් කෙළවර කරන්නේ වේ යයි"

(4) මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් තෙර මහණුන්ට තෙල කරුණ කී ය: "ඇවැත්නි, නාමය එක් අන්ත යැ, රූපය දෙවන අන්තය වෙ යි. ප්‍රතිසන්ධි විඥානය මධ්‍ය යි. තෘෂ්ණාව සිබ්බනි යි. තෘෂ්ණාව එය මසයි .. ඉහාත්මභාවයෙහි ම දුක් අන්ත කරන්නේ වේ යයි

(5) එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරෙ භික්ඛූ එතදවොච: "ඡ ඛො ආවුසො අජ්ඣත්තිකානි ආයතනානි එකො අන්තො, ඡ බාහිරානි ආයතනානි දුතියො අන්තො, විඤ්ඤාණං මජ්ඣෙ, තණ්හා සිබ්බිනී. තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා. එත්තාවතා ඛො ආවුසො භික්ඛු අභිඤ්ඤෙය්‍යං අභිජානාති -පෙ- දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්ස අන්තකරො හොතී"ති.

(6) එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරෙ භික්ඛූ එතදවොච: "සක්කායො ඛො ආවුසො එකො අන්තො, සක්කායසමුදයො දුතියො අන්තො, සක්කායනිරොධො මජ්ඣෙ, තණ්හා සිබ්බිනී. තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා. එත්තාවතා ඛො ආවුසො භික්ඛු අභිඤ්ඤෙය්‍යං අභිජානාති, පරිඤ්ඤෙය්‍යං පරිජානාති. අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්ස අන්තකරො හොතී"ති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු ථෙරෙ භික්ඛූ එතදවොච: "බ්‍යාකතං ඛො ආවුසො අම්හෙහි සබ්බෙහෙව යථාසකං පටිභානං. ආයාමාවුසො, යෙන භගවා තෙනුපසඞ්කමිස්සාම, උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙස්සාම, යථා නො භගවා ව්‍යාකරිස්සති, තථා නං ධාරෙස්සාමා"ති. එවමාවුසො'ති ඛො ථෙරා භික්ඛූ තස්ස භික්ඛුනො පච්චස්සොසුං.

අථ ඛො ථෙරා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො ථෙරා භික්ඛූ යාවතකො අහොසි සබ්බෙහෙව සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසුං: කස්ස නු ඛො භන්තෙ සුභාසිත'න්ති.

සබ්බෙසං වො භික්ඛවෙ සුභාසිතං පරියායෙන, අපි ච යං මයා සන්ධාය භාසිතං පාරායනෙ මෙත්තෙය්‍යපඤ්හෙ:

"යො[1] උභන්තෙ විදිත්වාන[2] මජ්ඣෙ මන්තා න ලිප්පති,[3] තං බ්‍රූමි මහාපුරිසොති සො'ධ සිබ්බිනිමච්චගා"ති - තං සුණාථ සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

ඵස්සො ඛො භික්ඛවෙ එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො. ඵස්සනිරොධො මජ්ඣෙ. තණ්හා සිබ්බිනී. තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා එත්තාවතා ඛො භික්ඛවෙ භික්ඛු අභිඤ්ඤෙය්‍යං අභිජානාති, පරිඤ්ඤෙය්‍යං පරිජානාති. අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්ස අන්තකරො හොතී'ති.

---

1 යො - සිමු මජසං සතා
2 උභන්ත මභිඤ්ඤාය – සුත්තනිපාතපාළි. ඡෙ උභො අන්තෙ විදිත්වා - මජසං, PTS.
3. ලිම්පති - මජසං සතා

(5) මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් තෙර මහණුන්ට තෙල කී ය: "ඇවැත්නි, ෂට්ආධ්‍යාත්මිකායතන එක අන්ත යැ. ෂට්බාහ්‍යආයතන දෙවන අන්ත යි. සාම්විඥානය මධ්‍ය යි. තෘෂ්ණාව සිබ්බනී යි. තෘෂ්ණාව ම එ එ භවයාගේ ඉපැත්ම පිණිස එය හිවයි. ඇවැත්නි, මෙතෙකින් මහණ අභිඥෙයය අභිඥත වෙයි. ... ඉහාත්මයෙහි දුක් (අන්තකරන්නේ වේ ය"යි).

(6) මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් තෙර මහණුන්ට තෙල කී ය: "ඇවැත්නි, (ත්‍රෛභූමක වර්ත්‍ත සඞ්ඛ්‍යාත) සත්කාය එක අන්ත යැ, (සමුදයසත්‍ය සඞ්ඛ්‍යාත) සත්කායසමුදය දෙවන අන්ත යි, (නිරෝධසත්‍ය සඞ්ඛ්‍යාත) සත්කාය නිරෝධය මධ්‍ය යි. තෘෂ්ණාව සිබ්බනී යි. තෘෂ්ණාව ම එ එ භාවයාගේ ඉපැත්ම පිණිස එය හිවන්නේය. ඇවැත්නි, මෙතෙකින් මහණ අභිඥෙය අභිඥත වෙයි, පරිඥෙයය පරිඥත වෙයි, අභිඥෙයය අභිඥත කොරෙමින් පරිඥෙයය පරිඥත කෙරෙමින් ඉහාත්මභාවයෙහි ම දුක් අන්තකරන්නේ වේ ය"යි.

මෙසේ කී කල්හි අන්‍යතර මහණෙක් තෙර මහණුන්ට තෙල කාරුණ කී ය: "ඇවැත්නි, අප හැම දෙන විසින් ම සවකීය ප්‍රතිභානය ප්‍රකාශ කරණ ලදී. ඇවැත්නි, යම්හ, භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙම්හ, එළඹ භාග්‍යවතුන් වහන්සේට තෙල කාරුණ සැලකරම්හ, අපහට යම් පරිදි භාග්‍යවතුන් වහන්සේ විවරණ කෙරෙත් නම් එපරිදි එය ධරම්හ"යි. ඇවැත්නි, එසේ ය'යි තෙර මහණහු එ මහණහට පිළිවදත් ඇස්වූහ.

එක්බිති තෙර මහණහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් තෙර මහණහු හැම දෙනා හා සමඟ යම් ප්‍රමාණ කථාසංලාපයෙක් ඇති වී නම්, එ හැම භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. වහන්ස, කවුරුන්ගේ (භාෂිතය) සුභාෂිත වේ දැ?"යි.

"මහණෙනි, පයඅීායයෙන් (ඒ ඒ කාරුණින්) තොප හැමගේ කථා සුභාෂිත ය. වැලිදු මා විසින් පාරායනයෙහි 'මෙත්තෙය්‍ය පඤ්හ'යෙහි යමක් සඳහා:

"එ (රහත් මහණ) ප්‍රඥාවෙන් උභයාන්තය දැන මධ්‍යයෙහි නො තැවරේ නම්, ඔහු මහාපුරුෂ යයි ද, හේ මෙලොව සිබ්බනී සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ඉක්මගියේ යි කියම්"යි - වදාරන ලද නම්, එය මනා කොට අසව මෙනෙහි කරව, කියන්නෙමි"යි.

'වහන්ස, එසේ ය'යි එ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදත් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කාරුණ වදාළහ:

මහණෙනි, වර්‍තමාන ආත්මභාව (සඞ්ඛ්‍යාත) ස්පර්ශය එක් අන්තයක, (අනාගතාත්මභාව සඞ්ඛ්‍යාත) ස්පර්ශසමුදය දෙවන අන්තය වෙයි. ස්පර්ශ-නිරෝධය මධ්‍යය වෙයි. තෘෂ්ණාව සිබ්බනිය යි. තෘෂ්ණාව ම ඒ ඒ ආත්ම-භාවයාගේ අභිනිර්‍වෘත්තිය සඳහා එය හිවන්නේ ය. මහණෙනි, මෙ පමණෙකින් මහණ අභිඥෙයය අභිජානන කරෙයි. පරිඥෙයය පරිජානන කෙරෙයි. අභිඥෙය විශිෂ්ටඥානයෙන් දන්මින් පරිඥෙයය පිරිසිඳ දන්මින් ඉහාත්මයෙහි දුඃඛය අවසන් කරන්නේ වේ යයි.

## 6. 2. 1. 8

## [පුරිසින්ද්‍රියඤාණ සුත්තං]

8. එවං මෙ සුතං එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන දණ්ඩකප්පකං නාම කොසලානං නිගමො තදවසරි. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. තෙ ච භික්ඛූ දණ්ඩකප්පකං පවිසිංසු ආවසථං පරියෙසිතුං.

අථ ඛො ආයස්මා ආනන්දො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං යෙන අචිරවතී නදී තෙනුපසඞ්කමි ගත්තානි පරිසිඤ්චිතුං. අචිරවතියා නදියා ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසි ගත්තානි පුබ්බාපයමානො.

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච:

"කිං නු ඛො ආවුසො ආනන්ද සබ්බං චෙතසො සමන්නාහරිත්වා නු ඛො දෙවදත්තො භගවතා බ්‍යාකතො 'ආපායිකො දෙවදත්තො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො'ති, උදාහු කෙනචිදෙව පරියායෙනා"ති.

'එවං ඛො පනෙතං ආවුසො භගවතා බ්‍යාකත'න්ති.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

ඉධාහං භන්තෙ සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං යෙන අචිරවතී නදී තෙනුපසඞ්කමිං ගත්තානි පරිසිඤ්චිතුං. අචිරවතියා නදියා ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසිං ගත්තානි පුබ්බාපයමානො. අථ ඛො භන්තෙ අඤ්ඤතරො භික්ඛු යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං එතදවොච:

"කිං නු ඛො ආවුසො ආනන්ද සබ්බං චෙතසො සමන්නාහරිත්වා නු ඛො දෙවදත්තො භගවතා බ්‍යාකතො "අපායිකො දෙවදත්තො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො'ති, උදාහු කෙනචිදෙව පරියායෙනා"ති. එවං වුත්තෙ අහං භන්තෙ තං භික්ඛුං එතදවොචං: "එවං ඛො පනෙතං ආවුසො භගවතා බ්‍යාකත"න්ති.

## 6. 2. 1. 8.

## [පුරිසින්ද්‍රියඥාණ සූත්‍රය]

8. මා විසින් මෙසේයි අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **කෝශල** ජනපදයෙහි මහභික්ෂූන් හා සමග සැරිසරණසේක් **දණ්ඩකප්පක** නම් කෝශලයන්ගේ නියම්ගමට වත්සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත් ව අන්‍යතර වෘක්ෂමූලයෙක්හි පණවනලද අස්නෙහි වැඩහුන් සේක. ඒ භික්ෂූහු ද ආවාස සොයන්නට දණ්ඩකප්පකයට වත්හ.

එක්බිති ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ බොහෝ මහණුන් හා කැටිවලා ගාත්‍ර පරිෂේකය සඳහා **අචිරවතී** නදිය වෙත එළඹියහ. අචිරවතී නදියෙහි ගාත්‍රපරිෂේක (ස්නාන) කොට නදියෙන් නැගී එක්සිවුරු ඇතියාහු අඟපසඟ තෙත් සිඳුවමින් හිටියහ.

එකල්හි (දෙවදත්තපාක්ෂික) අන්‍යතර මහණෙක් ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා පැමිණියේ ය. පැමිණ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කරුණ කී:

"ඇවැත් ආනන්දයෙනි, කිම, භාග්‍යවතුන් වහන්සේ විසින් හැම තතු සිතින් ආවර්ජනා කොටගෙන 'දෙව්දත් අපායෙහි උපදනෙක, නිරයගාමී යෑ, (නිරයෙහි) කපක් සිටුනේ වන්නෙ යෑ, පිළියම් නො කළ හෙන්නේ යෑ'යි වදරණ ලදුයේ ද, නොහොත් කිසියම් පර්‍යායයෙකින් වදරණ ලදුයේ දැ''යි.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල කරුණ එලෙසින් ම ව්‍යාකෘත ය'යි.

එක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කළහ:

වහන්ස, මෙ (නියම්ගම්) හි බට මම බොහෝ මහණුන් හා ශරීර පරිෂේකය සඳහා අචිරවතී නදිය කරා එළැඹියෙමි. අචිරවතී නදියෙහි සිරුර සනහා ගොඩනැගී සිරුරු තෙත් සිඳුවමින් ඒකචීවර වැ සිටියෙමි. වහන්ස, එකල්හි අන්‍යතර (දෙවදත්තපාක්ෂික) මහණෙක් මා කරා පැමිණියේ ය. පැමිණ මට තෙල පවත් කී:

"ඇවැත් ආනන්දයෙනි, කිමෙක භාග්‍යවතුන් වහන්සේ විසින් හැම තතු සිතින් ආවර්ජනා කොට ගෙන 'දේවදත්ත ආපායික යෑ, නිරයගාමී යෑ, කපක් සිටුනේ වන්නේ යෑ, පිළියම් නො කළ හෙන්නෙ ය'යි වදරණලද ද? නොහොත් කිසියම් පර්‍යායයෙකින් ව්‍යාකෘත වේ දැයි. වහන්ස, මෙසේ කී කල්හි මම 'ඇවැත්නි, තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ සෙයින් ව්‍යාකෘත ය' යි එ මහණහට කීමි යි.

සො වා ඛො ආනන්ද භික්ඛු නචෙව භවිස්සති අචිරපබ්බජිතො, ථෙරො වා පන බාලො අබ්‍යත්තො. කථං හි නාම යං මයා එකංසෙන බ්‍යාකතං, තත්‍ථ ද්වෙජ්ඣං ආපජ්ජිස්සති? නාහං ආනන්ද අඤ්ඤං එකපුග්ගලම්පි සමනුපස්සාමි, යො එවං මයා සබ්බං චෙතසා සමන්නාහරිත්වා බ්‍යාකතො යථයිදං දෙවදත්තො. යාවකීවඤ්චාහං ආනන්ද දෙවදත්තස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තම්පි සුක්කං ධම්මං අද්දසං, නෙව තාවාහං දෙවදත්තං බ්‍යාකාසිං 'ආපායිකො දෙවදත්තො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො'ති. යතො ච ඛො අහං ආනන්ද දෙවදත්තස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තම්පි සුක්කං ධම්මං න අද්දසං, අථාහං දෙවදත්තං බ්‍යාකාසිං 'ආපායිකො දෙවදත්තො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො'ති.

සෙය්‍යථාපි ආනන්ද ගූථකූපො සාධිකපොරිසො පූරො ගූථස්ස සමතිත්තිකො, තත්‍ථ පුරිසො සසීසකො නිමුග්ගො අස්ස, තස්ස කොචිදෙව පුරිසො උප්පජ්ජෙය්‍ය අත්‍ථකාමො හිතකාමො යොගක්ඛෙමකාමො තම්හා ගූථකූපා උද්ධරිතුකාමො. සො තං ගූථකූපං සමන්තා අනුපරිගච්ඡන්තො න පස්සෙය්‍ය තස්ස පුරිසස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තම්පි ගූථෙන අමක්ඛිතං යත්‍ථ තං ගහෙත්වා උද්ධරෙය්‍ය. එවමෙව ඛො අහං ආනන්ද යතො දෙවදත්තස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තම්පි සුක්කං ධම්මං න අද්දසං, අථාහං දෙවදත්තං බ්‍යාකාසිං "ආපායිකො දෙවදත්තො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො"ති.

සචෙ තුම්හෙ ආනන්ද සුණෙය්‍යාථ තථාගතස්ස පුරිසින්ද්‍රියඤාණානි විභජන්තස්සාති. එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා පුරිසින්ද්‍රියඤාණානි විභජෙය්‍ය. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී'ති. තෙනහානන්ද, සුණාහි සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

(1) ඉධාහං ආනන්ද එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි "ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මාති." තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස කුසලා ධම්මා අන්තරහිතා, අකුසලා ධම්මා සම්මුඛීභූතා. අත්‍ථි ච ඛ්වාස්ස කුසලමූලං අසමුච්ඡින්නං, තම්හා තස්ස කුසලමූලා[1] කුසලං පාතුභවිස්සති. එවමයං පුග්ගලො ආයතිං අපරිහානධම්මො භවිස්සතී"ති.

සෙය්‍යථාපි ආනන්ද, බීජානි අඛණ්ඩානි අපූතීනි අවාතාතපහතානි සාරදානි සුඛසයිතානි සුඛෙත්තෙ සුපරිකම්මකතාය භූමියා නික්ඛිත්තානි, ජානෙය්‍යාසි ත්වං ආනන්ද 'ඉමානි බීජානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්තී'ති. එවං භන්තෙ.

1. කුසලා - සීමු මජ්ඣ'.

ආනන්දයෙනි, මේ පැවිදි ව නො බෝකල් ඇති නවක මහණෙක් හෝ අව්‍යක්ත බාල ස්ථවිර මහණෙක් හෝ වියහෙයි. යමක් මා විසින් ඒකාන්තයෙන් ව්‍යාකෘත නම්, එහි කිසෙයින් ද්විධාභාවයෙක් වේ ද? ආනන්දයෙනි, දේවදත්ත බඳු යම් මැ පුද්ගලයෙක් මා විසින් සියල්ල සිතින් ආවර්ජනා කොට ව්‍යාකෘත වේ නම්, මම එබඳු අන් එ කද පුගුලකු බුදු-ඇසින් නො මැ දක්මි. ආනන්දයෙනි, යම්තාක් මම දේවදත්තයාගේ අස්ලොම් අගක් වදනා තැන් පමණ වූ කුශලධර්මයක් නො දිටිම් ද, ඒතාක් මම "දෙව්දත්හු අපායෙහි උපදනට නිසි කම් ඇතියෙක, නිරැහි උපදනේ යැ, ප්‍රතිකර්ම රහිත වූයේ යැ, කල්පස්ථායී වන්නෙ යැ යි දෙව්දතු ව්‍යාකෘත නො කෙළෙම් ම ය. ආනන්දයෙනි, යම් කාලෙක මම දේවදත්තගේ අස්ලොම් අග වදනා තැන් පමණකුදු කුශලධර්මයක් නො දිටිම් ද, එකල්හි මම "දේවදත්ත ආපායික යැ, නේරයික යැ, කල්පස්ථායී යැ, අතෙකිච්ඡ යයි දෙව්දතු විවරණ කෙළෙම්"යි.

ආනන්දයෙනි, යම් සේ පුරුෂප්‍රමාණයෙන් අධික වූ ගූථයෙන් මුව විට තෙක් පිරී සිටි ගූථකූපයෙක් වේද, එහි ශීර්ෂක ව (හිසතෙක්) නිමග්න වූ පුරුෂයෙක් වේ ද, ඔහට අර්ථ කැමැති හිත කැමැති යොගක්ෂෙම (නිර්භය) කැමැති ඒ ගූථ කූපයෙන් උදුරණු කැමැති කිසි පුරුෂයෙක් උපදනේ ය, හේ ඒ ගූථකූපය වටා ඇවිදිනුයේ යම් තැනෙක්හි ගෙණ (ඔහු) උදුරාලන්නේ නම් අස්ලොම් අගක් බැහියහැකි පමණකුදු ගූථයෙන් නො මැකී තැනක් නො දක්නේ ය. ආනන්දයෙනි, එපරිද්දෙන් ම යම් කලෙක සිට මම දෙව්දත්හුගේ අස්ලොම් අගක් වදනා තැන් තරම් වූ ද කුශලධර්මයක් නො දිටිම් ද, එකල්හි මම "දෙවදත්ත ආපායික ය, නෙරයික ය, කල්පස්ථ ය, අතෙකිච්ඡ යයි" දෙව්දතු විවරණ කෙළෙම්.

ආනන්දයෙනි, ඉදින් තෙපි පුරුෂෙන්ද්‍රියඥාන විභාග කරණ තථාගතයන්ගේ භාෂිතය අසවු ද'යි. භාග්‍යවතුන් වහන්ස, තෙල භාෂිතයට මේ කලී, සුගතයන් වහන්ස, යම් සෙයකින් භාග්‍යවතුන් වහන්සේ පුරුෂෙන්ද්‍රියඥාන විභාග කරණ සේක් නම්, මේ තෙල භාෂිතයට කලී. භාග්‍යවතුන් වහන්සේගේ බස් අසා භික්ෂූහු එ දරන්නාහ යි. ආනන්දයෙනි, එසේ වී නම් මනා කොට අසව, මෙනෙහි කරව, වදාරමි යි. වහන්ස, එසේයි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කාරණ වදාළ සේක:

(1) ආනන්දයෙනි, මෙ ලොව්හි මම 'මෙ පුගුල්හට කුසල්දහම්හු ද අකුසල් දහම්හු ද විද්‍යමානයහ'යි මෙසෙයින් තමන් සිතින් ඔහු සිත පිරිසිඳ දත්මි. අපරභාගයෙහි "මෙ පුගුල්හුගේ කුශලධර්මයෝ අතුරුදන් වූහ, අකුශලධර්මයෝ සම්මුඛීභූතයහ. මොහුට ප්‍රහීණ නො වූ කුශලමූල ද ඇත. ඒ කුශලමූලයෙන් මොහුට කුසල් පළ වන්නේ ය. මෙසේ වත් ම මේ පුගුල් මත්තෙහි නො පිරිහෙන සැහැවි ඇති වන්නේ ය"යි මෙසේ තමන් සිතින් ඔහු සිත පිරිසිඳ දත්මි.

ආනන්දයෙනි යම් පරිදි නො කඩ වූ කුණු නො වූ වාඅව්වෙන් නො නට සාරය ගත් මෙනොවට රැක් (යහන්) කරණලද මනාකොත්හි මනාසේ පිරියම් කළ බිම්හි වපුළ බීජයෝ වෙත් නම්, ආනන්දයෙනි, මෙ බිජුවටහු වැඩියට විරූඪියට විපුලභාවයට පැමිණෙත් යයි නො දන්හි දැයි. වහන්ස, එසේ ය.



Free Distribution www.aathaapi.org

එවමෙව ඛො අහං ආනන්ද, ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා"ති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස කුසලා ධම්මා අන්තරහිතා, අකුසලා ධම්මා සම්මුඛීභූතා. අත්ථි ච ඛ්වස්ස කුසලමූලං අසමුච්ඡින්නං, තම්හා තස්ස කුසලමූලා කුසලං පාතුභවිස්සති, එවමයං පුග්ගලො ආයතිං අපරිහානධම්මො භවිස්සතී"ති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසපුග්ගලො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසින්ද්‍රියඤාණං චෙතසා චෙතො පරිච්ච විදිතං හොති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස ආයතිං ධම්මසමුප්පාදො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

(2) ඉධ පනාහං ආනන්ද, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි. "ඉමස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මාති"ති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස අකුසලා ධම්මා අන්තරහිතා, කුසලා ධම්මා සම්මුඛීභූතා, අත්ථි ච ඛ්වස්ස අකුසලමූලං අසමුච්ඡින්නං. තම්හා තස්ස අකුසලමූලා අකුසලං පාතුභවිස්සති. එවමයං පුග්ගලො ආයතිං පරිහානධම්මො භවිස්සතී"ති.

සෙය්‍යථාපි ආනන්ද බීජානි අඛණ්ඩානි අපූතීනි අවාතාතපහතානි සාරදානි සුඛසයිතානි පුථුසිලාය නික්ඛිත්තානි, ජානෙය්‍යාසි ත්වං ආනන්ද නයිමානි බීජානි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්තීති. එවං භන්තෙ.

එවමෙව ඛො අහං ආනන්ද ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා"ති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස අකුසලා ධම්මා අන්තරහිතා, කුසලා ධම්මා සම්මුඛීතා. අත්ථි ච ඛ්වස්ස අකුසලමූලං අසමුච්ඡින්නං. තම්හා තස්ස අකුසලමූලා අකුසලං පාතුභවිස්සති. එවමයං පුග්ගලො ආයතිං පරිහානධම්මො භවිස්සතී'ති එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසපුග්ගලො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසින්ද්‍රියඤාණං චෙතසා චෙතො පරිච්ච විදිතො හොති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස ආයතිං ධම්මසමුප්පාදො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

(3) ඉධ පනාහං ආනන්ද එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා"ති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "නත්ථි ඉමස්ස පුග්ගලස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තොපි සුක්කො ධම්මො. සමන්නාගතොයං පුග්ගලො එකන්තකාළකෙහි අකුසලෙහි ධම්මෙහි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සතී"ති.

සෙය්‍යථාපි ආනන්ද බීජානි ඛණ්ඩානි පූතීනි වාතාතපහතානි සුඛෙත්තෙ සුපරිකම්මකතාය භූමියා නික්ඛිත්තානි, ජානෙය්‍යාසි ත්වං ආනන්ද, නයිමානි බීජානි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්තී'ති. එවම්භන්තෙ.

ආනන්දයෙනි, එ පරිදි ම මම "මෙ පුඟුල්හට කුශලධර්මයෝ ද අකුශල-ධර්මයෝ ද විද්‍යමානයහ"යි මෙසේ මාගේ සිතින් ඔහු සිත පිරිසිඳ දනිමි. අපරභාගයෙහි මෙ පුඟුල්හුගේ කුශලධර්මයෝ අතුරුදන් වූහ. අකුශලධර්මයෝ සම්මුඛීභූත වූහ. මොහුට සමුච්ඡින්න නො වූ කුශලමූල ද ඇත, ඔහුට ඒ කුශලමූලයෙන් කුසල් පාල වන්නේය. මෙසේ ඇතිවත් ම මෙ පුඟුල් මතුයෙහි නො පිරිහෙන සැහැවි ඇති වන්නේ ය"යි මෙසේ එ පුඟුල්හු මාගේ සිතින් ඔහු සිත පිරිසිඳ දැන ගණිමි. ආනන්දයෙනි, මෙසේත් තථාගතයන් විසින් පුරුෂ පුද්ගල සිතින් සිත පිරිසිඳ විදිත වෙයි.

ආනන්දයෙනි, තථාගතයන් විසින් පුරුෂෙන්‍ද්‍රිය (පරොපරියත්ත) ඥානය මෙසේත් සිතින් සිත පරිසිඳ දන්නාලද වෙයි. ආනන්දයෙනි, මෙසේත් තථාගතයන් විසින් මතුයෙහි ධර්මසමුත්පාදය තමන් සිතින් උහු සිත පිරිසිඳ දන්නා ලදුයේ වෙයි.

(2) ආනන්දයෙනි, මෙ ලොව්හි මම ඇතැම් පුඟුලකු "මෙ පුඟුල් හට කුශලධර්මයෝ ද අකුශලධර්මයෝ ද විද්‍යමානයහ"යි මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. අපරභාගයෙහි "මෙ පුඟුල්හුගේ අකුශලධර්මයෝ අතුරුදන් වූහ, කුශලධර්මයෝ සම්මුඛීභූතයහ. මොහුට අසමුච්ඡින්න වූ අකුශලමූල ද ඇත. ඒ අකුශලමූලයෙන් අකුශල පාලවන්නේ ය. මෙසේ වත් ම, මෙ පුඟුල් මතුයෙහි පරිහානධර්ම ඇතියේ වන්නේ ය"යි, මෙසේ මාගේ සිතින් ඔහු සිත පිරිසිඳ දනිමි.

ආනන්දයෙනි, යම් පරිදි අඛණ්ඩ වූ ඇඟ නො වූ අව්සුලඟින් නො නට සාරදසී වූ සුඛසයිත වූ බිජුවටහු අතලගලෙක නික්ෂිප්ත වෙත් ද, ආනන්ද-යෙනි, මෙ බිජුවටහු වැඩියට විරූඪියට විපුලභාවයට නො පැමිණෙත් ය යි තෙපි දන්වයි? වහන්ස, එසේ ය'යි.

ආනන්දයෙනි, එ පරිදි ම මම මෙ ලොව්හි ඇතැම් පුඟුලකු "මෙ පුඟුල්හට කුශලධර්මයෝ ද අකුශලධර්මයෝ ද විද්‍යමානය"යි මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. අපරභාගයෙහි "මෙ පුඟුල්හට අකුශලධර්මයෝ අතුරුදන්හ, කුශල-ධර්මයෝ සම්මුඛීභූතයහ, මොහුට අකුශලමූල ද නුසුන් ව ඇත. ඔහුට ඒ අකුශල මූලින් අකුශල පාලවන්නේ ය. මෙසේ වත් ම මෙ පුඟුල් මතුයෙහි පරිහානධර්ම වන්නේ ය"යි සිතින් සිත පිරිසිඳ ඔහු දනිමි.

ආනන්දයෙනි, මෙසේත් තථාගතයන් විසින් පුරුෂපුද්ගල සිතින් සිත පිරිසිඳ දන්නාලද්දේ වෙයි. ආනන්දයෙනි, මෙසේත් තථාගතයන් විසින් පුරුෂෙන්‍ද්‍රිය ඥානය සිතින් සිත පිරිසිඳ දන්නාලද වෙයි. ආනන්දයෙනි, මෙසේත් තථාගතයන් විසින් මතුයෙහි (ඔහුගේ) ධර්මසමුත්පාදය සිතින් සිත පිරිසිඳ දන්නාලද්දේ වෙයි.

(3) ආනන්දයෙනි, මෙ ලොව්හි මම ඇතැම් පුඟුලකු "මෙ පුද්ගලහට කුශලධර්මයෝ ද අකුශලධර්මයෝ ද විද්‍යමානයහ"යි මෙසේ සිතින් සිත පිරිසිඳ දනිමි. පසු කල්හි "මෙ පුඟුල් හට වලගඅගවදනා නැත් පමණකුදු ශුක්ලධර්මයෙක් නැත, මෙ පුඟුල් ඒකාන්ත කෘෂ්ණ අකුශලධර්මයෙන් සමන්වා-ගත වූයේ කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගීති වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙන්නේය"යි මෙසේ සිතින් සිත පිරිසිඳ ඔහු දනිමි.

ආනන්දයෙනි, යම් පරිදි කඩ වූ කුණු වූ අව්සුලඟින් පහල බිජයෝ මනා කෙතෙක්හී සුපිරියම්කල බිමෙක නික්ෂිප්ත වූවාහු වෙද්ද, ආනන්දයෙනි, තෙපි "මේ බීජයෝ වැඩියට විරූඪියට විපුලභාවයට නොපැමිණෙන්නාහ"යි දන්වයි? වහන්ස, එසේ ය.

එවමෙව ඛො අහං ආනන්ද ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා"ති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "නත්ථි ඉමස්ස පුග්ගලස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තොපි සුක්කො ධම්මො, සමන්නාගතොයං පුග්ගලො එකන්තකාළකෙහි අකුසලෙහි ධම්මෙහි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සතී"ති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසපුග්ගලො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසින්ද්‍රියඤාණං චෙතසා චෙතො පරිච්ච විදිතං හොති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස ආයතිං ධම්මසමුප්පාදෙ චෙතසා චෙතො පරිච්ච විදිතො හොතී'ති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: සක්කා නු ඛො භන්තෙ ඉමෙසං තිණ්ණං පුග්ගලානං අපරෙපි තයො පුග්ගලා සප්පටිභාගා පඤ්ඤපෙතුන්ති. සක්කා ආනන්දාති භගවා අවොච.

(4) ඉධාහං ආනන්ද එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මාති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස කුසලා ධම්මා අන්තරහිතා අකුසලා ධම්මා සම්මුඛීභූතා, අත්ථි ච ඛ්වාස්ස කුසලමූලං අසමුච්ඡින්නං, තම්පි සබ්බෙන සබ්බං සමුග්ඝාතං ගච්ඡති. එවමයං පුග්ගලො ආයතිං පරිහානධම්මො භවිස්සතී' ති.

සෙය්‍යථාපි ආනන්ද අඞ්ගාරානි ආදිත්තානි සම්පජ්ජලිතානි සජොතිභූතානි සුද්ධසිලාය නික්ඛිත්තානි, ජානෙය්‍යාසි ත්වං ආනන්ද, නයිමානි අඞ්ගාරානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්තීති. එවම්භන්තෙ.

සෙය්‍යථාපි වා පනානන්ද සායන්හසමයං සූරියෙ ඔගච්ඡන්තෙ ජානෙය්‍යාසි ත්වං ආනන්ද ආලොකො අන්තරධායිස්සති අන්ධකාරො පාතුභවිස්සතී'ති. එවම්භන්තෙ.

සෙය්‍යථාපි වා පනානන්ද අභිදො අඩ්ඪරත්තං[1] භත්තකාලසමයෙ, ජානෙය්‍යාසි ත්වං ආනන්ද ආලොකො අන්තරහිතො අන්ධකාරො පාතුභූතොති. එවම්භන්තෙ.

එවමෙව ඛො අහං ආනන්ද ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලා'පි ධම්මාති" තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමස්ස ඛො පුග්ගලස්ස කුසලා ධම්මා අන්තරහිතා, අකුසලා ධම්මා සම්මුඛීභූතා. අත්ථි ච ඛ්වාස්ස කුසලමූලං අසමුච්ඡින්නං, තම්පි සබ්බෙන සබ්බං සමුග්ඝාතං ගච්ඡති. එවමයං පුග්ගලො ආයතිං පරිහානධම්මො භවිස්සතී"ති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසපුග්ගලො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසින්ද්‍රියඤාණං චෙතසා චෙතො පරිච්ච විදිතං හොති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස ආයතිං ධම්මසමුප්පාදෙ චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

1 අභිදො අඩ්ඪරත්තං - සී. මු.

ආනන්දයෙනි, එපරිද්දෙන් ම මම මේ ලොව්හි ඇතැම් පුහුලකු "මේ පුහුල් හට කුසල් දම්හු ද අකුසල් දම්හු ද විද්‍යමානයහ"යි මෙසේ සිතින් සිත පිරිසිඳ දත්මි. පසු කලෙක "මේ පුහුල්හට වලග කෙළ වදනා තැන් පමණකුදු ශුක්ලධර්මයෙක් නැත. ඒකාන්තයෙන් කෘෂ්ණ වූ අකුශල ධර්ම-යෙන් මේ පුහුල් සමන්වාගත වූයේ කාබුත් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට උපත් විසින් එළඹෙන්නේය"යි. මෙසේ සිතින් සිත පිරිසිඳ ඔහු දත්මි. ආනන්දයෙනි, මෙසේ ද තථාගතයන් විසින් පුරුෂ පුද්ගල සිය සිතින් ඔහු සිත පිරිසිඳ දන්නා ලදුයේ වෙයි.

ආනන්දයෙනි, මෙසේ ද තථාගතයන් විසින් පුරුෂයාගේ ඉන්ද්‍රිය-පරාවරතාඥනය සිතින් සිත පිරිසිඳ දන්නාලද වෙයි. ආනන්දයෙනි, මෙසේ ද තථාගතයන් විසින් පුරුෂයාගේ මතුයෙහි ධර්මසමුත්පාදය සිතින් සිත පිරිසිඳ දන්නාලදුයේ වේ යයි.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන්-වහන්සේට මෙල සැලකළහ: "වහන්ස, මේ පුහුලන් තුන්දෙනාහට තුල්‍ය වූ අන්‍ය තුන් පුහුල් කෙනෙක් පැණවිය හැකි වෙත් දැ"යි. 'ආනන්දයෙනි, හැක්කැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

(4) ආනන්දයෙනි, මේ ලොව්හි මම ඇතැම් පුහුලකු, 'මේ පුහුල් හට කුශලධර්මයෝ ද අකුශල ධර්මයෝ ද විද්‍යමානයහ'යි මෙසේ සිතින් සිත පිරිසිඳ දත්මි. පසුකල්හි 'මේ පුහුල්හුගේ කුශලධර්මයෝ අතුරුදන් වූහ. අකුශලධර්මයෝ සම්මුඛීභූත වූහ. මොහුට නො සුන් කුසල්මුල් ද ඇත. එ ද සර්වාකාරයෙන් නැස්මට යේ. මේ පුහුල් මතුයෙහි පරිහානධර්ම ඇති වන්නේ ය' යි. මෙ සේ සිතින් සිත පිරිසිඳ ඔහු දත්මි.

ආනන්දයෙනි, යම්පරිද්දි ඇවිළගත් දිලෙන අඟාරයෝ අතලගලෙක බහාලනලද්දාහු වෙද්ද, ආනන්දයෙනි, මේ අඟුරු වෘද්ධියට විරූඪියට විපුල-භාවයට නො පැමිණේ ය'යි තෙපි දන්නෙහි. වහන්ස, එසේ ය.

ආනන්දයෙනි, යම් සේ සවස් කල්හි හිරු බැසයත් ම ආලෝකය අතුරුදන් වන්නේය. අන්ධකාරය පහළවන්නේය'යි තෙපි දන්නෙහි. වහන්ස, එසේ ය.

තවද ආනන්දයෙනි, තෙපි යම්සේ අඩරාත්‍රිය ආසන්නවත් ම භක්තකාල සමයෙහි රජකුලයන්ගේ බත්හල්හි "ආලෝකය අතුරුදන් විය, අන්ධකාරය පහළවිය'යි දන්නෙහි. වහන්ස, එසේ ය.

ආනන්දයෙනි, එපරිද්දි ම මම මෙලොව්හි ඇතැම් පුහුලකු 'මේ පුහුල් හට කුශලධර්මයෝ ද අකුශලධර්මයෝ ද විද්‍යමානයහ'යි මෙසේ සිතින් සිත පිරිසිඳ දත්මි. පසුකල්හි "මේ පුහුල්හුගේ කුශලධර්මයෝ අතුරුදන් වූහ. අකුශලධර්මයෝ සම්මුඛීභූතයහ, මොහුට අසමුච්ඡින්න වූ කුශලමූලය ද ඇත, එ ද සර්වාකාරයෙන් සමුද්ඝාතයට යන්නේ ය. මෙසේ මේ පුහුල් මතුයෙහි පරිහානධර්ම ඇතියේ වන්නේ"යයි සිතින් සිත පිරිසිඳ මෙසේ ඔහු දතිමි. ආනන්දයෙනි, මෙසේයිනුදු තථාගතයන් වහන්සේ විසින් පුරුෂපුද්ගල සිතින් සිත පිරිසිඳ දන්නාලද්දේ වෙයි.

ආනන්දයෙනි, මෙ සේ ද තථාගතයන් වහන්සේ විසින් පුරුෂයාගේ ඉන්ද්‍රියපරාවරතාඥනය සිතින් සිත පිරිසිඳ දන්නාලද වෙයි. ආනන්දයෙනි. තථාගතයන් වහන්සේ විසින් මතුයෙහි ධර්මසමුත්පාදය සිතින් සිත පිරිසිඳ දන්නාලද්දේය.

(5) ඉධ පනාහං ආනන්ද එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: “ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා”ති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: “ඉමස්ස ඛො පුග්ගලස්ස අකුසලා ධම්මා අන්තරහිතා කුසලා ධම්මා සම්මුඛීභූතා. අත්ථි ච ඛ්වාස්ස අකුසලමූලං අසමුච්ඡින්නං. තම්පි සබ්බෙන සබ්බං සමුග්ඝාතං ගච්ඡති. එවමයං පුග්ගලො ආයතිං අපරිහාන ධම්මො භවිස්සතී”ති.

සෙය්‍යථාපි ආනන්ද අඞ්ගාරානි ආදිත්තානි සම්පජ්ජලිතානි සජොතිභූතානි සුක්ඛෙ තිණපුඤ්ජෙ වා කට්ඨපුඤ්ජෙ වා නික්ඛිත්තානි, ජානෙය්‍යාසි ත්වං ආනන්ද ඉමානි අඞ්ගාරානි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්තීති. එවම්භන්තෙ.

සෙය්‍යථාපි වා පනානන්ද රත්තියා පච්චූසසමයං සූරියෙ උග්ගච්ඡන්තෙ ජානෙය්‍යාසි ත්වං ආනන්ද අන්ධකාරෙ අන්තරධායිස්සති ආලොකො පාතුභවිස්සතී’ති. එවම්භන්තෙ.

සෙය්‍යථාපි වා පනානන්ද අභිදො මජ්ඣන්තිකෙ භත්තකාලසමයෙ, ජානෙය්‍යාසි ත්වං ආනන්ද අන්ධකාරෙ අන්තරහිතො ආලොකො පාතුභූතොති. එවම්භන්තෙ.

එවමෙව ඛො අහං ආනන්ද ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා”ති, තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: “ඉමස්ස ඛො පුග්ගලස්ස අකුසලා ධම්මා අන්තරහිතා කුසලා ධම්මා සම්මුඛීභූතා, අත්ථි ච ඛ්වාස්ස අකුසලමූලං අසමුච්ඡින්නං. තම්පි සබ්බෙන සබ්බං සමුග්ඝාතං ගච්ඡති. එවමයං පුග්ගලො ආයතිං අපරිහානධම්මො භවිස්සතීති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසපුග්ගලො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසින්ද්‍රියඤාණං චෙතසා චෙතො පරිච්ච විදිතං හොති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස ආයතිං ධම්මසමුප්පාදො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

(6) ඉධ පනාහං ආනන්ද එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: “ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා”ති තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: “නත්ථි ඉමස්ස පුග්ගලස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තොපි අකුසලො ධම්මො. සමන්නාගතොයං පුග්ගලො එකන්තසුක්කෙහි අනවජ්ජෙහි ධම්මෙහි දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායිස්සතී”ති.

සෙය්‍යථාපි ආනන්ද අඞ්ගරානි සීතානි නිබ්බුතානි සුක්ඛෙ තිණපුඤ්ජෙ වා කට්ඨපුඤ්ජෙ වා නික්ඛිත්තානි, ජානෙය්‍යාසි ත්වං ආනන්ද නයිමානි අඞ්ගාරානි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්තීති, එවම්භන්තෙ.

එවමෙව ඛො අහං ආනන්ද ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: ඉමස්ස ඛො පුග්ගලස්ස විජ්ජමානා කුසලාපි ධම්මා අකුසලාපි ධම්මා”ති. තමෙනං අපරෙන සමයෙන එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: “නත්ථි ඉමස්ස පුග්ගලස්ස වාලග්ගකොටිනිත්තුදනමත්තොපි අකුසලො ධම්මො. සමන්නාගතොයං පුග්ගලො එකන්තසුක්කෙහි අනවජ්ජෙහි ධම්මෙහි දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායිස්සතී”ති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසපුග්ගලො චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

(5) ආනන්දයෙනි, 'මෙ ලොව්හි මම ඇතැම් පුගුලකු මෙ පුගුල් හට කුසල් දම්හුදු අකුසල් දම්හුදු විද්‍යමානයහයි'යි මෙසේ සිතින් සිත පිරිසිඳ දත්මි. පසුකාලයෙහි 'මෙ පුගුල්හුගේ අකුශලධර්මයෝ අතුරුදන් වූහ, කුශලධර්මයෝ සම්මුඛීභූතයහ. මොහුට නොසුන් අකුශල මූලය ද ඇත, එ ද සර්වප්‍රකාරයෙන් සමුද්ඝාතයට යන්නේය. මෙ සේ මෙ පුගුල් මතුයෙහි අපරිහානධර්මී ඇතියේ වන්නේය'යි මෙසේ සිතින් සිත පිරිසිඳ ඔහු දත්මි.

ආනන්දයෙනි, යම් පරිදි ඇවිලගත් දල්වුනු ගිනිසිළු සහිත වූ අඟුරු වියළි තණපිඩෙක්හි වේවයි කැටපිඩෙක්හි වේවයි බහනලදුයේ නම්, ආනන්දයෙනි, තෙපි මෙ අඟුරු වෘද්ධියට විරූඪියට විපුලභාවයට පැමිණේ-ය''යි දන්ව. වහන්ස, එසේ ය.

තව්ද ආනන්දයෙනි, රාත්‍රි ප්‍රත්‍යූෂයෙහි හිරු නැගෙත් ම ආනන්දයෙනි, තෙපි "අන්ධකාරය අතුරුදන් වන්නේ ය, ආලොකය පාලවන්නේය''යි දන්ව'යි. වහන්ස, එසේ ය.

තව්ද ආනන්දයෙනි, මධ්‍යමසමයාසන්නවත් ම භක්ත කාලසමයෙහි "අන්ධකාරය අපගත විය, ආලොකය ප්‍රාදුර්භූත වී යයි තෙපි දන්ව''යි. වහන්ස එසේ ය.

ආනන්දයෙනි, එපරිදි ම මම මෙලොව්හි ඇතැම් පුගුලකු "මෙ පුගුල්-හට කුශලධර්මයෝ ද අකුශලධර්මයෝ ද පවත්නාහ''යි මෙසේ සිතින් සිත පිරිසිඳ දත්මි. පසුකල්හි "මෙ පුගුල්හුගේ අකුශලධර්මයෝ අතුරුදන් වූහ. කුශලධර්මයෝ එළඹ සිටියහ. මොහුට අසමුච්ඡින්න වූ අකුශලමූලය ද ඇත. එ ද සර්වාකාරයෙන් සමුද්ඝාතයට යෙයි, මෙසේ මෙ පුගුල් මතු අපරිහාන ධර්ම වන්නේ ය''යි මෙසේ සිතින් සිත පිරිසිඳ ඔහු දත්මි. ආනන්දයෙනි, මෙසෙයිනුදු තථාගතයන් වහන්සේ විසින් පුරුෂපුද්ගලයා සිතින් සිත පිරිසිඳ විදිත වෙයි.

ආනන්දයෙනි, මෙසෙයිනුදු තථාගතයන් වහන්සේ විසින් පුරුෂෙන්ද්‍රිය-ඥානය සිතින් සිත පිරිසිඳ දන්නාලද වෙයි. ආනන්දයෙනි, මෙසෙයිනුදු තථාගතයන් වහන්සේ විසින් මතුයෙහි ධර්මසමුත්පාදය සිතින් සිත පිරිසිඳ දන්නාලද වෙයි.

(6) ආනන්දයෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයකු "මෙ පුගුල්හට කුශල-ධර්මයෝ ද අකුශල ධර්මයෝ ද විද්‍යමානයහ.''යි මම සිතින් සිත පිරිසිඳ දත්මි. පසුකල්හි "මෙ පුගුල්හට වලහකෙළ වදනා තැන් පමණකුදු අකුශලධර්මයෙක් නැත. මෙ පුද්ගල ඒකාන්තයෙන් අනවද්‍ය ශුක්ලධර්මයෙන් සමන්වාගත වූයේ ඉහාත්මභාවයෙහි ම පිරිනිවෙන්නේ යයි මෙසේ සිතින සිත පිරිසිඳ ඔහු දත්මි

ආනන්දයෙනි, යම්පරිදි සිහිල් වූ නිවුනු අඟුරු වියළිතණපිඩෙක්හි වේවයි, වියළිදරරැසෙක වේවයි බහනලද වේ නම්, ආනන්දයෙනි, තෝ මෙ අඟුරු වෘද්ධියට විරූඪියට විපුලභාවයට නො පැමිණේ යයි දන්හි දැයි. වහන්ස, එසේ ය.

ආනන්දයෙනි, එපරිද්දෙන් ම මම මෙ ලොව්හි ඇතැම් පුද්ගලයකු "මෙ පුද්ගලයාහට කුශලධර්මයෝ ද අකුශලධර්මයෝ ද විද්‍යමානයහ''යි මෙසේ සිතින් සිත පිරිසිඳ දත්මි. අපරභාගයෙහි "මෙ පුද්ගලයාට වලහකෙළ වදනා තැන් පමණකුදු අකුශලධර්මයෙක් නැත. ඒකාන්තයෙන් අනවද්‍ය වූ ශුක්ලධර්මයෙන් සමන්වාගත වූ මෙ පුද්ගලයා ඉහාත්මයෙහි ම පිරිනිවෙන්-නේය''යි මෙසේ සිතින් සිත පිරිසිඳ ඔහු දත්මි. ආනන්දයෙනි, මෙසෙයි-නුදු තථාගතයන් වහන්සේ විසින් පුරුෂපුද්ගලයා සිතින් සිත පිරිසිඳ දන්නාලද්දේ වෙයි.

එවම්පි ඛො ආනන්ද තථාගතස්ස පුරිසින්ද්‍රියඤාණං චෙතසා චෙතො පරිච්ච විදිතං හොති. එවම්පි ඛො ආනන්ද තථාගතස්ස ආයතිං ධම්මසමුප්පාදෙ චෙතසා චෙතො පරිච්ච විදිතො හොති.

තත්‍ර ආනන්ද යෙ තෙ පුරිමා තයො පුග්ගලා, තෙසං තිණ්ණං පුග්ගලානං එකො අපරිහානධම්මො, එකො පරිහානධම්මො, එකො අපායිකො නෙරයිකො. තත්‍ර ආනන්ද යෙ මෙ පච්ඡිමා තයො පුග්ගලා, ඉමෙසං තිණ්ණං පුග්ගලානං එකො පරිහානධම්මො, එකො අපරිහානධම්මො, එකො පරිනිබ්බානධම්මොති.

6. 2. 1. 9.

[නිබ්බෙධික සුත්තං]

[සාවත්ථිනිදානං]

9. නිබ්බෙධිකපරියායං වො භික්ඛවෙ ධම්මපරියායං දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමො ච සො භික්ඛවෙ නිබ්බෙධිකපරියායො ධම්මපරියායො:

කාමා භික්ඛවෙ වෙදිතබ්බා, කාමානං නිදානසම්භවො වෙදිතබ්බො, කාමානං වෙමත්තතා වෙදිතබ්බා, කාමානං විපාකො වෙදිතබ්බො, කාමනිරොධො වෙදිතබ්බො, කාමනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා.

වෙදනා භික්ඛවෙ වෙදිතබ්බා, වෙදනානං නිදානසම්භවො වෙදිතබ්බො, වෙදනානං වෙමත්තතා වෙදිතබ්බා, වෙදනානං විපාකො වෙදිතබ්බො, වෙදනානිරොධො වෙදිතබ්බො, වෙදනානිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා.

සඤ්ඤා භික්ඛවෙ වෙදිතබ්බා, සඤ්ඤානං නිදානසම්භවො වෙදිතබ්බො, සඤ්ඤානං වෙමත්තතා වෙදිතබ්බා, සඤ්ඤානං විපාකො වෙදිතබ්බො, සඤ්ඤානිරොධො වෙදිතබ්බො, සඤ්ඤානිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා.

ආසවා භික්ඛවෙ වෙදිතබ්බා, ආසවානං නිදානසම්භවො වෙදිතබ්බො, ආසවානං වෙමත්තතා වෙදිතබ්බා, ආසවානං විපාකො වෙදිතබ්බො, ආසවනිරොධො වෙදිතබ්බො, ආසවනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා.

කම්මං භික්ඛවෙ වෙදිතබ්බං, කම්මානං නිදානසම්භවො වෙදිතබ්බො, කම්මානං වෙමත්තතා වෙදිබ්බා, කම්මානං විපාකො වෙදිතබ්බො, කම්මනිරොධො වෙදිතබ්බො, කම්මනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා.

ආනන්දයෙනි, මෙසෙයිනුදු තථාගතයන් වහන්සේ විසින් පුරුෂෙන්ද්‍රිය-ඥානය සිතින් සිත පිරිසිඳ දත්තාලද වෙයි. ආනන්දයෙනි, මෙසෙයිනුදු තථාගතයන් වහන්සේ විසින් මත්තෙහි ධර්මසමුත්පාදය සිතින් සිත පිරිසිඳ දත්තාලද වෙයි.

ආනන්දයෙනි, මේ පුද්ගලයන් අතුරෙහි යම් ඒ පළමු තුන් පුඟුල් කෙනෙක් වෙත් නම්, ඒ තුන් පුඟුලන් අතුරින් එකෙක් අපරිහානධර්ම ඇතියේ ය. එකෙක් පිරිහෙන සැහැවි ඇතියේ ය. එකෙක් ආපායික ය, නෛරයික ය. ආනන්දයෙනි, මේ පුද්ගලයන් අතුරෙහි යම් ඒ පශ්චිම තුන් පුද්ගල කෙනෙක් වෙත් නම්, මෙ තුන්දෙන අතුරින් එකෙක් පරිහානධර්ම ඇතියේ ය. එකෙක් අපරිහානධර්ම ඇතියේ ය. එකෙක් පිරිනිවන සැහැවි ඇතියේය යි.

## 6. 2. 1. 9

## [නිබ්බේධික සූත්‍රය]

### [සැවැත්නිදන යි]

9. මහණෙනි, තොපට 'නිබ්බේධික පරියාය' නම් ධර්මපර්‍ය්‍යාය දෙසමි. එ අසව, මනාකොට මෙනෙහි කරව, කියම්හයි. වහන්ස එසේ යයි එ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙතෙල කරුණ වදාළහ:

මහණෙනි, නිබ්බේධිකපරියාය නම් ධර්මපර්‍ය්‍යාය කවරේය යත්:

මහණෙනි, කාමයෝ දතයුතු වෙත්. කාමයන්ගේ නිදානසම්භවය දතයුතු වෙයි. කාමයන්ගේ වෙමත්තතා සඞ්ඛ්‍යාත නානාකරණය දතයුතු වෙයි. කාමයන්ගේ විපාකය දතයුතු වෙයි. කාමනිරෝධය දතයුතු වෙයි. කාමනිරෝධගාමිනීප්‍රතිපද් දතයුතු වේ.

මහණෙනි, වේදනා දතයුතුය. වේදනාවන්ගේ නිදානසම්භවය දතයුතුය. වේදනාවන්ගේ වේමත්තතා සඞ්ඛ්‍යාත නානාකරණය දතයුතු ය. වේදනාවන්ගේ විපාකය දතයුතු ය. වේදනානිරෝධය දතයුතු ය. වේදනානිරෝධගාමිනීප්‍රතිපද් දතයුතු යි.

මහණෙනි, සංඥා දතයුතු ය. සංඥාවන්ගේ නිදානසම්භවය දතයුතු ය. සංඥාවන්ගේ වෙමත්තතාව දතයුතු ය. සංඥාවන්ගේ විපාකය දතයුතු ය. සංඥානිරෝධය දතයුතු ය. සංඥානිරෝධගාමිනීප්‍රතිපද් දතයුතු යි.

මහණෙනි, ආස්‍රවයෝ දතයුත්තාහ. ආස්‍රවයන්ගේ නිදානසම්භවය දතයුතු වෙයි. ආස්‍රවයන්ගේ වෙමත්තතාව දතයුතු ය. ආස්‍රවයන්ගේ විපාක දතයුතු ය. ආස්‍රවනිරෝධය දතයුතු ය. ආස්‍රවනිරෝධගාමිනී පතිපද් දතයුතු යි.

මහණෙනි, කර්මය දතයුතු ය. කර්මයන්ගේ නිදානසම්භවය දතයුතු ය. කර්මයන්ගේ වෙමත්තතාව දතයුතු ය. කර්මවිපාකය දතයුතු ය. කර්මනිරෝධය දතයුතු ය. කර්මනිරෝධගාමිනීප්‍රතිපද් දතයුතු යි.

දුක්ඛං භික්ඛවෙ වෙදිතබ්බං. දුක්ඛස්ස නිදානසම්භවො වෙදිතබ්බො. දුක්ඛස්ස වෙමත්තතා වෙදිතබ්බා. දුක්ඛස්ස විපාකො වෙදිතබ්බො. දුක්ඛනිරොධො වෙදිතබ්බො. දුක්ඛනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බාති.

(1) "කාමා භික්ඛවෙ වෙදිතබ්බා, කාමානං නිදානසම්භවො වෙදිතබ්බො, කාමානං වෙමත්තතා වෙදිතබ්බා, කාමානං විපාකො වෙදිතබ්බො, කාමනිරොධො වෙදිතබ්බො, කාමනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බාති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං.

පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. අපිච ඛො භික්ඛවෙ නෙතෙ කාමා, කාමගුණා නාමෙතෙ අරියස්ස විනයෙ වුච්චන්ති.

66. සඞ්කප්පරාගො පුරිසස්ස කාමො
නෙතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ,
සඞ්කප්පරාගො පුරිසස්ස කාමො
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ,
අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දන්ති.

කතමො ච භික්ඛවෙ කාමානං නිදානසම්භවො: ඵස්සො භික්ඛවෙ කාමානං නිදානසම්භවො.

කතමා ච භික්ඛවෙ කාමානං වෙමත්තතා: අඤ්ඤො භික්ඛවෙ කාමො රූපෙසු, අඤ්ඤො කාමො සද්දෙසු, අඤ්ඤො කාමො ගන්ධෙසු, අඤ්ඤො කාමො රසෙසු, අඤ්ඤො කාමො ඵොට්ඨබ්බෙසු. අයං වුච්චති භික්ඛවෙ කාමානං වෙමත්තතා.

කතමො ච භික්ඛවෙ කාමානං විපාකො: යං ඛො භික්ඛවෙ කාමයමානො තජ්ජං තජ්ජං අත්තභාවං අභිනිබ්බත්තෙති පුඤ්ඤභාගියං වා අපුඤ්ඤභාගියං වා, අයං වුච්චති භික්ඛවෙ කාමානං විපාකො.

කතමො ච භික්ඛවෙ කාමනිරොධො: ඵස්සනිරොධො භික්ඛවෙ කාමනිරොධො.

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො කාමනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

යතො ච ඛො භික්ඛවෙ අරියසාවකො එවං කාමෙ පජානාති, එවං කාමානං නිදානසම්භවං පජානාති, එවං කාමානං වෙමත්තතං පජානාති, එවං කාමානං විපාකං පජානාති, එවං කාමානං නිරොධං[1] පජානාති, එවං කාමානං නිරොධගාමිනිං[2] පටිපදං පජානාති, සො ඉමං නිබ්බෙධිකං බ්‍රහ්මචරියං පජානාති කාමනිරොධං.

"කාමා භික්ඛවෙ වෙදිතබ්බා -පෙ- කාමනිරොධගාමිනිපටිපදා වෙදිතබ්බා"ති ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

1. කාමනිරොධං - මජ්සං
2. කාමනිරොධගාමිනිං - මජ්සං, කාමානං නිරොධගාමිනී - සිමු.

මහණෙනි, දුඃඛය දතයුතු ය. දුඃඛයාගේ නිදානසම්භවය දතයුතු ය. දුඃඛයාගේ වෙමත්තතාව දතයුතු ය. දුඃඛයාගේ විපාකය දතයුතු ය. දුඃඛ- නිරොධය දතයුතු ය. දුඃඛනිරොධගාමිනීප්‍රතිපද් දතයුතු යි.

(1) ''මහණෙනි, කාමයෝ දතයුත්තාහ. කාමයන්ගේ නිදානසම්භවය දතයුතු. කාමයන්ගේ වෙමත්තතාව දතයුතු. කාමයන්ගේ විපාක ය දතයුතු. කාමනිරොධය දතයුතු. කාමනිරොධගාමිනීප්‍රතිපද් දතයුතු ය''යි තෙල යමක් කියනලද නම්, තෙල කුමක් ඇරැබ කියනලද යැ යත්:

මහණෙනි, ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන ප්‍රියරූප වූ කාමොපසංහිත වූ රජනීය වූ චක්ෂුර් විඥෙය රූපයෝය... ශ්‍රොත්‍රවිඥෙය ශබ්ද යෝ ය ... ඝ්‍රාණ- විඥෙයගන්ධයෝ ය. ජිව්හා විඥෙය රසයෝය ... ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමෝපසංහිත වූ රජනීය වූ කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයෝ ය යි මෙ කාමගුණ පසෙක මහණෙනි, වැලිත් මොහු කාමයෝ නො වෙති මොහු ආර්‍ය්‍යයන්ගේ විනයෙහි කාමගුණ නම්හයි කියනු ලැබෙත්

66. ලොවුහි පුරුෂයක් හට සඞ්කල්ප විසින් උපන් රාගය, කාම වෙයි. යම් බඳු විසිතුරු ආලම්බනයෝ වෙත් නම් තුලුහු කාම නො වෙත්. පුරුෂයාගේ සඞ්කල්පරාගය ම කාම වෙයි. ලොව්හි විසිතුරු වස්තූහු එලෙසින් ම සිටුනාහ. වැලිත් එ අරමුණු කෙරේ උපන් ඡන්දරාගය ධීරයෝ විනයනය කරත්.

මහණෙනි, කාමයන්ගේ නිදාන සම්භවය (උපපත්ති කාරණ) කවරේය යත්: මහණෙනි, ස්පර්ශය කාමයන්ගේ නිදානසම්භවය යි.

මහණෙනි, කාමයන්ගේ වෙමත්තතා සඞ්ඛ්‍යාත නානාකාරණය කවරේ ය යත්: මහණෙනි, රූපාලම්බනයෙහි කාමය අනෙකෙකි. ශබ්දාලම්බනයෙහි කාමය අනෙකෙකි. ගන්ධාලම්බනයෙහි කාමය අනෙකෙකි. රසාලම්බන- යෙහි කාමය අනෙකෙකි. ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි කාමය අනෙකෙකි. මහණෙනි, මේ කාමයන්හි වෙමත්තතා යි කියනු ලැබේ.

මහණෙනි, කාමයන්ගේ විපාක කවරේ ය යත්: යම් ආත්මභාවයක් කැමැති වනුයේ එයිනෙයින් උපන් පුණ්‍යභාගිය වූ හෝ අපුණ්‍යභාගිය වූ හෝ ආත්මභාවයක් උපදවා නම්, මහණෙනි, කාමයන්ගේ මේ විපාක යි කියනු ලැබේ.

මහණෙනි, කාමනිරොධය කවරේය යත්: මහණෙනි, ස්පර්ශනිරොධය කාමනිරොධය යි.

මෙ අරිඅටඟි මග ම කාමනිරොධගාමිනීප්‍රතිපදා යි. එ නම්: සම්මාදිට්ඨි ය, සම්මාසඞ්කප්ප ය, සම්මාවාචා ය, සම්මාකම්මන්ත ය, සම්මාආජීව ය, සම්මාවායාම ය, සම්මාසතිය, සම්මාසමාධි යි.

මහණෙනි, යම් කලෙක පටන් අරිසවු මෙසෙයින් කාමයන් දන්නේ ද, මෙසෙයින් කාමයන් ගේ නිදානසම්භවය දන්නේ ද, මෙ සෙයින් කාමයන්ගේ වෙමත්තතා දන්නේ ද, මෙසෙයින් කාමයන්ගේ විපාක දන්නේ ද, මෙසෙයින් කාමයන්ගේ නිරොධය දන්නේ ද, මෙසෙයින් කාමයන්ගේ නිරොධගාමිනීප්‍රතිපදා දන්නේ ද, හෙ මෙ නිර්වේධික බ්‍රහ්මචාර්‍ය්‍යය වූ කාම නිරොධය දන්නේ ය.

''මහණෙනි, කාමයෝ දතයුත්තාහ... කාමරොධගාමිනීපටිපදා දතයුතු ය''යි මෙසෙයින් තෙල යමක් කියනලද නම්, තෙල කරුණ මෙ සඳහා කියනලද.

(2) "වෙදනා භික්ඛවෙ වෙදිතබ්බා -පෙ- වෙදනානිරොධගාමිනීපටිපදා වෙදිතබ්බා''ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං.

තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා, සුඛා වෙදනා දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා.

කතමො ච භික්ඛවෙ වෙදනානං නිදානසම්භවො: ඵස්සො භික්ඛවෙ වෙදනානං නිදානසම්භවො.

කතමා ච භික්ඛවෙ වෙදනානං වෙමත්තතා: අත්ථි භික්ඛවෙ සාමිසා සුඛා වෙදනා, අත්ථි නිරාමිසා සුඛා වෙදනා, අත්ථි සාමිසා දුක්ඛා වෙදනා, අත්ථි නිරාමිසා දුක්ඛා වෙදනා, අත්ථි සාමිසා අදුක්ඛමසුඛා වෙදනා, අත්ථි නිරාමිසා අදුක්ඛමසුඛා වෙදනා, අයං වුච්චති භික්ඛවෙ වෙදනානං වෙමත්තතා.

කතමො ච භික්ඛවෙ වෙදනානං විපාකො: යං භික්ඛවෙ වෙදියමානො තජ්ජං තජ්ජං අත්තභාවං අභිනිබ්බත්තෙති පුඤ්ඤභාගියං වා අපුඤ්ඤභාගියං වා, අයං වුච්චති භික්ඛවෙ වෙදනානං විපාකො.

කතමො ච භික්ඛවෙ වෙදනානිරොධො: ඵස්සනිරොධො භික්ඛවෙ වෙදනානිරොධො

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො වෙදනා නිරොධගාමිනී පටිපදා. සෙය්‍යථිදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ච ඛො භික්ඛවෙ අරියසාවකො එවං වෙදනං පජානාති, එවං වෙදනා නිදානසම්භවං පජානාති, එවං වෙදනානං වෙමත්තතං පජානාති, එවං වෙදනානං විපාකං පජානාති, එවං වෙදනානං නිරොධං[1] පජානාති, එවං වෙදනානිරොධගාමිනිං පටිපදං පජානාති, සො ඉමං නිබ්බෙධිකං බ්‍රහ්මචරියං පජානාති වෙදනානිරොධං.

"වෙදනා භික්ඛවෙ වෙදිතබ්බා -පෙ- වෙදනානිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා''ති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(3) "සඤ්ඤා භික්ඛවෙ වෙදිතබ්බා -පෙ- සඤ්ඤානිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා''ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

ඡයිමා භික්ඛවෙ සඤ්ඤා: රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ධම්මසඤ්ඤා.

කතමො ච භික්ඛවෙ සඤ්ඤානං නිදානසම්භවො, ඵස්සො භික්ඛවෙ සඤ්ඤානං නිදානසම්භවො.

කතමා ච භික්ඛවෙ සඤ්ඤානං වෙමත්තතා; අඤ්ඤා භික්ඛවෙ සඤ්ඤා රූපෙසු, අඤ්ඤා සඤ්ඤා සද්දෙසු, අඤ්ඤා සඤ්ඤා ගන්ධෙසු, අඤ්ඤා සඤ්ඤා රසෙසු, අඤ්ඤා සඤ්ඤා ඵොට්ඨබ්බෙසු, අඤ්ඤා සඤ්ඤා ධම්මෙසු. අයං වුච්චති භික්ඛවෙ සඤ්ඤානං වෙමත්තතා.

1. වෙදනානිරොධං - සීඡසං.

(2) "මහණෙනි, වේදනා දතයුතු ය ... වේදනා නිරෝධගාමිනීපටිපදා දතයුතු" යයි මෙසේ තෙල යමක් කියනලද නම්, තෙල කාරණ කවර හෙයින් කියනලදදැ යත්:

මහණෙනි, සුඛවේදනා ය, දුක්ඛවේදනා ය, අදුක්ඛමසුඛවේදනා ය යි මේ වේදනා තුනෙක.

මහණෙනි, වේදනාවන්ගේ නිදානසම්භවය කවරේ ය යත්: මහණෙනි, ස්පර්ශය වේදනාවන්ගේ නිදානසම්භව යි.

මහණෙනි, වේදනාවන්ගේ වේමත්තතාව කවර යත්: මහණෙනි, සාමිසසුඛවේදනාවෙක් ඇත. නිරාමිස සුඛවේදනාවෙක් ඇත. සාමිසදුක්ඛ-වේදනාවෙක් ඇත. නිරාමිස දුක්ඛවේදනාවෙක් ඇත. සාමිස අදුක්ඛමසුඛ-වේදනාවෙක් ඇත. නිරාමිස අදුක්ඛමසුඛ වේදනාවෙක් ඇත. මහණෙනි, වේදනාවන්ගේ මේ වෙමත්තතා යි කියනු ලැබේ.

මහණෙනි, වේදනාවන්ගේ විපාකය කවරේ ය යත්: මහණෙනි, යම් ආත්මභාවයක් කැමැති වනුයෙ එයිනෙයින් උපන් පුණ්‍යභාගිය වූ හෝ අපුණ්‍යභාගිය වූ හෝ ආත්මභාවයක් උපදවා නම්, මහණෙනි, මේ වේදනාවන්ගේ විපාක යි කියනු ලැබේ.

මහණෙනි, වේදනානිරෝධය කවරේ ය යත්. මහණෙනි, ස්පර්ශ නිරෝධය වේදනා නිරෝධ යි.

මේ අරීඅටඟි මඟ ම වේදනානිරෝධ ගාමිනීපටිපදා වෙයි. එ නම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධි යි.

මහණෙනි, යම් කලෙක පටන් අරීසවූ මෙසේ වේදනාවන් දන්නේ ද, මෙසේ වේදනානිදානසම්භවය දන්නේ ද, මෙසේ වේදනාවන්ගේ වේමත්ත-තාව දන්නේ ද, මෙසේ වේදනාවන්ගේ විපාක දන්නේ ද, මෙසේ වේදනා-වන්ගේ නිරෝධය දන්නේ ද, මෙසේ වේදනා නිරෝධගාමිනීපටිපදා දන්නේ ද, හෙ මේ නිබ්බේධකබ්‍රහ්මචර්‍ය්‍යය වූ වේදනානිරෝධය දන්නේ ය.

"මහණෙනි, වේදනා දතයුතු ය ... වේදනානිරෝධගාමිනීපටිපදා දත-යුතු ය"යි මෙසෙයින් යමක් කියන ලද නම්, තෙල කාරණ මේ පිණිස කියන ලදි.

(3) "මහණෙනි, සංඥා දතයුතුය ... සංඥානිරෝධගාමිනීප්‍රතිපත් දතයුතු ය යි මෙසෙයින් යමක් කියන ලද නම්, තෙල කාරණ කුමක් පිණිස කියන ලද ය යත්:

මහණෙනි, මෙ සංඥා සයෙක: රූපසංඥා ශබ්දසංඥා ගන්ධසංඥා රස-සංඥා ස්ප්‍රෂ්ටව්‍යසංඥා ධර්මසංඥා යි.

මහණෙනි, සංඥාවන්ගේ නිදාන සම්භවය කවරේ ය යත්: මහණෙනි, ස්පර්ශය සංඥාවන්ගේ නිදාන සම්භවය යි.

මහණෙනි, සංඥාවන්ගේ වෙමත්තතා කවර යත්: මහණෙනි, රූපයෙහි අන් සංඥාවෙක, ශබ්දයෙහි අන් සංඥාවෙක, ගන්ධයෙහි අන් සංඥාවෙක, රසයෙහි අන් සංඥාවෙක, ස්ප්‍රෂ්ටව්‍යයෙහි අන් සංඥාවෙක, ධර්මයෙහි අන් සංඥාවෙක, මහණෙනි, මේ සංඥාවන්ගේ වෙමත්තතා යි

කතමො ච භික්ඛවෙ සඤ්ඤානං විපාකො: වොහාරවෙපක්කාහං භික්ඛවෙ සඤ්ඤං වදාමි, යථා යථා නං සඤ්ජානාති, තථා තථා වොහරති එවං සඤ්ඤී අහොසින්ති. අයං වුච්චති භික්ඛවෙ සඤ්ඤානං විපාකො.

කතමො ච භික්ඛවෙ සඤ්ඤානිරොධො: ඵස්සනිරොධො භික්ඛවෙ සඤ්ඤානිරොධො.

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඤ්ඤානිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මා දිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ච ඛො භික්ඛවෙ අරියසාවකො එවං සඤ්ඤං පජානාති, එවං සඤ්ඤානං නිදානසම්භවං පජානාති, එවං සඤ්ඤානං වෙමත්තතං පජානාති, එවං සඤ්ඤානං විපාකං පජානාති, එවං සඤ්ඤානිරොධං පජානාති, එවං සඤ්ඤානිරොධගාමිනිං පටිපදං පජානාති, සො ඉමං නිබ්බෙධිකං බ්‍රහ්මචරියං පජානාති සඤ්ඤානිරොධං.

“සඤ්ඤා භික්ඛවෙ වෙදිතබ්බා -පෙ- සඤ්ඤානිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා”ති. ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(4) “ආසවා භික්ඛවෙ වෙදිතබ්බා -පෙ- ආසවනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා”ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

තයො මෙ භික්ඛවෙ ආසවා: කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො.

කතමො ච භික්ඛවෙ ආසවානං නිදාන සම්භවො: අවිජ්ජා භික්ඛවෙ ආසවානං නිදානසම්භවො.

කතමා ච භික්ඛවෙ ආසවානං වෙමත්තතා: අත්ථි භික්ඛවෙ ආසවා නිරයගාමිනියා, අත්ථි භික්ඛවෙ ආසවා තිරච්ඡානයොනිගාමිනියා, අත්ථි භික්ඛවෙ[1] ආසවා පෙත්තිවිසයගාමිනියා, අත්ථි භික්ඛවෙ[1] ආසවා මනුස්සලොකගාමිනියා, අත්ථි භික්ඛවෙ[1] ආසවා දෙවලොකගාමිනියා, අයං වුච්චති භික්ඛවෙ ආසවානං වෙමත්තතා.

කතමො ච භික්ඛවෙ ආසවානං විපාකො: යං ඛො භික්ඛවෙ අවිජ්ජාගතො තජ්ජං තජ්ජං අත්තභාවං අභිනිබ්බත්තෙති පුඤ්ඤභාගියං වා අපුඤ්ඤභාගියං වා, අයං වුච්චති භික්ඛවෙ ආසවානං විපාකො.

කතමො ච භික්ඛවෙ ආසවනිරොධො: අවිජ්ජානිරොධො භික්ඛවෙ ආසවනිරොධො.

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො ආසවනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ච ඛො භික්ඛවෙ අරියසාවකො එවං ආසවෙ පජානාති, එවං ආසවනිදානසම්භවං[2] පජානාති, එවං අසවානං වෙමත්තතං පජානාති, එවං එවං ආසවානං වෙමත්තතං පජානාති, එවං ආසවානං විපාකං පජානාති, එවං ආසවනිරොධං පජානාති, එවං ආසවනිරොධගාමිනිං[3] පටිපදං පජානාති, සො ඉමං නිබ්බෙධිකං බ්‍රහ්මචරියං පජානාති ආසවනිරොධං.

“ආසවා භික්ඛවෙ වෙදිතබ්බා -පෙ- ආසවනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බාති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. භික්ඛවෙ - මරම්මපොත්ථකෙ නත්ථි
2. ආසවානං නිදානසම්භවං - මජසං.
3. ආසවානං නිරොධගාමිනිං - මජසං

මහණෙනි, සංඥාවන්ගේ විපාක කවරේ ය: මහණෙනි, මම (කථා) ව්‍යවහාර සඞ්ඛ්‍යාත විපාකහේතුයෙන් සංඥාව කියමි. යම් යම් හැටියෙකින් හඳුනාගන්නේ ද, (මෙ බඳු සංඥා ඇතියෙම් වීම් යි) එ එ හැටියෙන් ව්‍යවහාර කෙරෙයි. මහණෙනි, මේ සංඥාවන්ගේ විපාක යයි කියනු ලැබේ.

මහණෙනි, සංඥානිරොධ කවරේ ය: මහණෙනි, ස්පර්ශනිරොධය සංඥානිරොධ වෙයි.

මේ අරිඅටඟිමඟ ම සංඥානිරොධගාමිනීප්‍රතිපත් වෙයි. හේ කිසේ ය: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි

මහණෙනි, යම් තැනෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සංඥාව දන්නේ වේ ද, මෙසේ සංඥාවන්ගේ නිදානසම්භවය දන්නේ වේ ද, මෙසේ සංඥාවන්ගේ වෙමත්තතාව දන්නේ වේ ද, මෙසේ සංඥාවන්ගේ විපාක දන්නේ වේ ද, මෙසේ සංඥානිරොධය දන්නේ වේ ද, මෙසේ සංඥානිරොධගාමිනීප්‍රතිපත් දන්නේ වේ ද, හේ මේ නිර්වේධික බ්‍රහ්මචර්‍ය්‍යය වූ සංඥානිරොධය දන්නේ වෙයි.

මහණෙනි, "සංඥා දතයුතු ය...සංඥානිරොධගාමිනීප්‍රතිපත් දතයුතු ය" යි මෙසේ යම් එ බසෙක් කියනලද ද, මේ බස් තෙල පිණිස කියන ලදී.

(4) මහණෙනි, ආශ්‍රවයෝ දතයුත්තාහ ... ආශ්‍රවනිරොධගාමිනීප්‍රතිපත් දතයුතු ය යි යමක් කියනලද නම් තෙල කරුණ කුමක් පිණිස කියන ලද ය යත්:

මහණෙනි, මේ ආශ්‍රවයෝ තුන්දෙනෙකි: කාමාශ්‍රව ය, භවාශ්‍රව ය, අවිද්‍යාශ්‍රව යි.

මහණෙනි, ආශ්‍රවයන්ගේ නිදාන සම්භවය කවරේ ය යත්: මහණෙනි, අවිද්‍යාව ආශ්‍රවයන්ගේ නිදානසම්භව වෙයි.

මහණෙනි, ආශ්‍රවයන්ගේ වෙමත්තතා කවර: මහණෙනි, නිරයගමනට ප්‍රත්‍යය වූ ආශ්‍රවකෙනෙක් ඇත. මහණෙනි, තිරිශ්චීනයෝනි ගමනට හිත වූ ආශ්‍රව කෙනෙක් ඇත. මහණෙනි, ප්‍රෙතවිෂය ගමනට හිත වූ ආශ්‍රව කෙනෙක් ඇත. මහණෙනි, මිනිස්ලෝ ගමනට හිත වූ ආශ්‍රව කෙනෙක් ඇත. මහණෙනි, දෙව්ලෝ ගමනට හිත වූ ආශ්‍රව කෙනෙක් ඇත. මහණෙනි මේ ආශ්‍රවයන්ගේ වෙමත්තතා යි කියනු ලැබේ.

මහණෙනි, ආශ්‍රවයන්ගේ විපාක කවරේය යත්: මහණෙනි, යම් හෙයකින් අවිද්‍යාගත සත්ත්ව තෙමේ එයින් එයින් හටගත් පුණ්‍යභාගිය වේවයි, අපුණ්‍යභාගිය වේවයි අත්බවක් දනවා ද, මහණෙනි, මේ ආශ්‍රවයන්ගේ විපාකය යි කියමි.

මහණෙනි, ආශ්‍රවනිරොධ කවරේ ය: මහණෙනි, අවිද්‍යානිරොධය ආශ්‍රවනිරොධ වෙයි.

මෙ අරිඅටැඟි මඟ ම ආශ්‍රවනිරොධගාමිනීප්‍රතිපත් වෙයි. හෙ කිසේ ය: සම්මාදිට්ඨි ය .. සම්මාසමාධි යි.

මහණෙනි, යම් තැනෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ ආශ්‍රව දන්නේ වේද, මෙසේ ආශ්‍රව නිදානසම්භව දන්නේ වේ ද, මෙසේ ආශ්‍රවයන්ගේ වෙමත්තතා දන්නේ වේ ද, මෙසේ ආශ්‍රවයන්ගේ විපාක දන්නේ වේ ද, මෙසේ ආශ්‍රවනිරොධය දන්නේ වේ ද, මෙසේ ආශ්‍රවනිරොධගාමිනීප්‍රතිපත් දන්නේ වේ ද, හේ මෙ නිර්වේධකබ්‍රහ්මචර්‍ය්‍යය වූ ආශ්‍රවනිරොධය දන්නේ වෙයි.

මහණෙනි, "ආශ්‍රව දතයුතු ය ... ආශ්‍රවනිරොධගාමිනීප්‍රතිපත් දතයුතු ය"යි මෙසේ යම් එ බසෙක් කියනලද ද, මේ බස් තෙල පිණිස කියන ලදී.

(5) "කම්මං භික්ඛවෙ වෙදිතබ්බං -පෙ- කම්මනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා"ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා,

කතමො ච භික්ඛවෙ කම්මානං නිදානසම්භවො: ඵස්සො භික්ඛවෙ කම්මානං නිදානසම්භවො.

කතමා ච භික්ඛවෙ කම්මානං වෙමත්තතා: අත්ථි භික්ඛවෙ කම්මං නිරයවෙදනියං, අත්ථි කම්මං තිරච්ඡානයොනිවෙදනියං, අත්ථි කම්මං පෙත්තිවිසයවෙදනියං, අත්ථි කම්මං මනුස්සලොකවෙදනියං, අත්ථි කම්මං දෙවලොකවෙදනියං. අයං වුච්චති භික්ඛවෙ කම්මානං වෙමත්තතා.

කතමො ච භික්ඛවෙ කම්මානං විපාකො: තිවිධාහං භික්ඛවෙ කම්මානං විපාකං වදාමි: දිට්ඨෙව ධම්මෙ, උපපජ්ජෙ වා, අපරෙ වා පරියායෙ. අයං වුච්චති භික්ඛවෙ කම්මානං විපාකො.

කතමො ච භික්ඛවෙ කම්මනිරොධො: ඵස්සනිරොධො භික්ඛවෙ කම්මනිරොධො.

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො කම්මනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ච ඛො භික්ඛවෙ අරියසාවකො එවං කම්මං පජානාති, එවං කම්මානං නිදානසම්භවං පජානාති, එවං කම්මානං වෙමත්තතං පජානාති, එවං කම්මානං විපාකං පජානාති, එවං කම්මනිරොධං පජානාති, එවං කම්මනිරොධගාමිනිං පටිපදං පජානාති. සො ඉමං නිබ්බෙධිකං බ්‍රහ්මචරියං පජානාති කම්මනිරොධං.

"කම්මං භික්ඛවෙ වෙදිතබ්බං -පෙ- කම්මනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා"ති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(6) "දුක්ඛං භික්ඛවෙ වෙදිතබ්බං, දුක්ඛස්ස නිදානසම්භවො වෙදිතබ්බො, දුක්ඛස්ස වෙමත්තතා වෙදිතබ්බා, දුක්ඛස්ස විපාකො වෙදිතබ්බො, දුක්ඛස්ස නිරොධො[1] වෙදිතබ්බො, දුක්ඛස්ස නිරොධගාමිනී[2] පටිපදා වෙදිතබ්බා"ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං.

ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

කතමො ච භික්ඛවෙ දුක්ඛස්ස නිදානසම්භවො: තණ්හා භික්ඛවෙ දුක්ඛස්ස නිදානසම්භවො.

කතමා ච භික්ඛවෙ දුක්ඛස්ස වෙමත්තතා: අත්ථි භික්ඛවෙ දුක්ඛං අධිමත්තං, අත්ථි පරිත්තං, අත්ථි දන්ධවිරාගී[3] අත්ථි ඛිප්පවිරාගී. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛස්ස වෙමත්තතා.

---

1 දුක්ඛනිරොධො මජ්ඣං. 2. දුක්ඛනිරොධගාමිනී - මජ්ඣං.

3 දන්ධවිරාගං - කත්ථචි. 4 ඛිප්පවිරාගං - කත්ථචි.

Free Distribution www.aathaapi.org

(5) "මහණෙනි, කර්මය දතයුතු ය ... කර්මනිරොධගාමිනී ප්‍රතිපත් දතයුතුය යි මෙසෙයින් යමක් කියන ලද නම්, තෙල කරුණ කුමක් පිණිස කියනලද ය යත්:

මහණෙනි, (චිධාන) චේතනාව කර්මය ය යි මම කියමි. (ද්වාරප්‍රවෘත්ත-චේතනායෙන්) සිතා කයින් වචසින් මනසින් කම් කෙරෙයි.

මහණෙනි, කර්මයන්ගේ නිදානසම්භවය කවරේ ය: මහණෙනි, ස්පර්ශය කර්මයන්ගේ නිදානසම්භව යි.

මහණෙනි, කර්මයන්ගේ වෙමත්තතා කවර: මහණෙනි, නිරයෙහි විපාක-දෙන කර්මයෙක් ඇත. තිරිසන්යොනිහි විපාක දෙන කර්මයෙක් ඇත. ප්‍රෙතවිෂයෙහි විපාක දෙන කර්මයෙක් ඇත. මනුෂ්‍යලොකයෙහි විපාක දෙන කර්මයෙක් ඇත. දෙවලොකයෙහි විපාක දෙන කර්මයෙක් ඇත. මහණෙනි මෙ කර්මයන්ගේ වෙමත්තතා යි කියනු ලැබේ.

මහණෙනි, කර්මයන්ගේ විපාක කවරේ ය යත්. මහණෙනි, දිට්ඨධම්මයෙහි හෝ අනතුරු අත්බව්හි හෝ අනෙක් අත්බවෙක හෝ යි මම කර්මයන්ගේ විපාකය ත්‍රිවිධ කොට කියමි. මහණෙනි, මෙ කර්මයන්ගේ විපාක ය යි කියනු ලැබේ.

මහණෙනි කර්මනිරොධය කවරේ ය යත්: මහණෙනි, ස්පර්ශනිරොධය කර්මනිරොධයි.

මෙ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය ම කර්මනිරොධගාමිනී ප්‍රතිපදා යි. එ නම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධි යි.

මහණෙනි, යම් කලෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ කම් දන්නේ ද, මෙසේ කර්මයන්ගේ නිදානසම්භවය දන්නේ ද, මෙසේ කර්මයන්ගේ වෙමත්තතා දන්නේ ද, මෙසේ කර්මයන්ගේ විපාක දන්නේ ද, මෙසේ කර්මනිරොධය දන්නේ ද, මෙසේ කර්මනිරොධගාමිනීපටිපදා දන්නේ ද, හෙ කර්මනිරොධ නම් වූ මෙ නිර්වේධකබ්‍රහ්මචර්‍ය්‍යය දන්නේ ය.

මහණෙනි, කර්මය දතයුතු ය ... කම් නිරොධගාමිනීප්‍රතිපදාව දතයුතු ය" යි මෙසේ තෙල යමක් කියනලද නම්, තෙල කරුණ මෙ සඳහා කියන ලදී.

(6) මහණෙනි, දුඃඛය දතයුතු ය. දුඃඛයාගේ නිදානසම්භවය දතයුතු ය. දුඃඛයාගේ වෙමත්තතා දතයුතු ය. දුඃඛයාගේ විපාක දතයුතු ය. දුඃඛයාගේ නිරොධය දතයුතු ය. දුඃඛයාගේ නිරොධගාමිනීප්‍රතිපදාව දතයුතු ය යි මෙ සේ තෙල යමක් කියනලද නම් තෙල කරුණ කුමක් පිණිස කියනලද ය යත්:

ජාතිය ද දුකෙක, ජරාව ද දුකෙක, ව්‍යාධිය ද දුකෙක, මරණය ද දුකෙක, ශෝක, පරිදේව, දුඃඛ, දෞර්මනස්‍ය, උපායාසයෝ ද දුක්හ. යමක් කැමැති වනුයේත් නොලබා නම් එ ද දුකෙක, සැකෙවින් පඤ්චො-පාදානස්කන්ධයෝ දුක්හ.

මහණෙනි, දුඃඛයාගේ නිදානසම්භවය කවරේ ය යත්: මහණෙනි, තෘෂ්ණාව දුඃඛයාගේ නිදානසම්භවය යි.

මහණෙනි, දුඃඛයාගේ වෙමත්තතා කවර: මහණෙනි, අධිමාත්‍ර බලවත් දුඃඛයෙක් ඇත. අල්පමාත්‍ර දුඃඛයෙක් ඇත. දන්ධවිරාගී දුඃඛයෙක් ඇත, ක්ෂිප්‍රවිරාගී දුඃඛයෙක් ඇත. මහණෙනි, මෙ දුඃඛයාගේ වෙමත්තතා යි.

කතමො ච භික්ඛවෙ දුක්ඛස්ස විපාකො: ඉධ භික්ඛවෙ එකච්චො යෙන දුක්ඛෙන අභිභූතො පරියාදින්නචිත්තො සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. යෙන වා පන දුක්ඛෙන අභිභූතො පරියාදින්න චිත්තො බහිද්ධා පරියෙට්ඨිං ආපජ්ජති "කො එකපදං ද්විපදං පජානාති ඉමස්ස දුක්ඛස්ස නිරොධායා"ති. සම්මොහවෙපක්කං වාහං භික්ඛවෙ දුක්ඛං වදාමි පරියෙට්ඨිවෙපක්කං වා.

කතමො ච භික්ඛවෙ දුක්ඛනිරොධො: තණ්හානිරොධො භික්ඛවෙ දුක්ඛනිරොධො.

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො දුක්ඛනිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යතො ච ඛො භික්ඛවෙ අරියසාවකො එවං දුක්ඛං පජානාති, එවං දුක්ඛස්ස නිදානසම්භවං පජානාති, එවං දුක්ඛස්ස වෙමත්තතං පජානාති, එවං දුක්ඛස්ස විපාකං පජානාති, එවං දුක්ඛනිරොධං පජානාති, එවං දුක්ඛනිරොධගාමිනිං පටිපදං පජානාති, සො ඉමං නිබ්බෙධිකං බ්‍රහ්මචරියං පජානාති දුක්ඛනිරොධං.

"දුක්ඛං භික්ඛවෙ වෙදිතබ්බං, දුක්ඛස්ස නිදානසම්භවො වෙදිතබ්බො, දුක්ඛස්ස වෙමත්තතා වෙදිතබ්බා, දුක්ඛස්ස විපාකො වෙදිතබ්බො, දුක්ඛනිරොධො වෙදිතබ්බො, දුක්ඛනිරොධගාමිනී පටිපදා වෙදිතබ්බා"ති" ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

අයං සො භික්ඛවෙ නිබ්බෙධිකපරියායො ධම්මපරියායොති.

### 6. 2. 1 10.

### [සීහනාද සුත්තං]

[සාවත්ථි නිදානං]

**10.** ඡයිමානි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලානි යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති. කතමානි ඡ:

(1) ඉධ භික්ඛවෙ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

(2) පුන ච පරං භික්ඛවෙ තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

මහණෙනි, දුඃඛයාගේ විපාක කවරේ ය: මහණෙනි, මේ ලොව්හි ඇතැමෙක් යම් දුකෙකින් මඩනා ලදුයේ වැළඳගත් සිත් ඇතියේ ශෝක කෙරෙයි. වෙහෙසෙයි. වැළපෙයි. ළෙහි අත් පැහැර හඬයි. මූළාවට පැමිණෙයි. යම් හෝ දුකෙකින් මඩනා ලදුයේ වැළඳගත් සිත් ඇතියේ 'මේ දුක නිරුද්ධ කිරීම පිණිස කවරෙක් එක් පදමතුරක් දෙ පදමතුරක් දනී දැ'යි පිටත්හි සෙවීමට පැමිණෙයි. මහණෙනි, මම දුක සම්මෝහ-විපාක ඇතියක් කොට ද පර්යේෂණ විපාක ඇතියක් හෝ කොට ද කියමි.

මහණෙනි, දුඃඛනිරෝධය කවරේ ය යත්: මහණෙනි, තණ්හානිරොධය දුඃඛනිරොධ යි.

මේ අරිඅටඟිමග ම දුඃඛනිරොධගාමිනිප්‍රතිපදා යි. එ නම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධි යි.

මහණෙනි, යම් තැනෙක පටන් අරිසවු මෙසේ දුඃඛය දන්නේ ද මෙසේ දුඃඛයාගේ නිදානසම්භවය දන්නේ ද, මෙසේ දුඃඛයාගේ නානාකාරණය දන්නේ ද, මෙසේ දුඃඛයාගේ විපාක දන්නේ ද, මෙසේ දුඃඛයාගේ නිරොධය දන්නේ ද, මෙසේ දුඃඛනිරොධගාමිනිප්‍රතිපදා දන්නේ ද, හෙ දුඃඛනිරොධය වූ මේ නිර්වේධකබ්‍රහ්මචරියාව දන්නේය.

මහණෙනි, දුඃඛය දතයුතු ය, දුඃඛයාගේ නිදානසම්භවය දතයුතු ය, දුඃඛයාගේ නානාකාරණය දතයුතු ය, දුඃඛයාගේ විපාක දතයුතු ය, දුඃඛනිරෝධය දතයුතු ය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා දතයුතු ය"යි මෙසේ යමක් කියනලද නම් තෙල කරුණ මෙ පිණිස කියන ලදි.

මහණෙනි, මේ ඒ නිබ්බෙධිකපරියාය වූ ධම්මපරියා යි.

### 6. 2. 1. 10.

### [සීහනාද සූත්‍රය]

[සැවැත්නිදන යි]

**10.** මහණෙනි, යම් බලයෙකින් සමන්වාගත තථාගතයෝ ශ්‍රෙෂ්ඨ ස්ථානය ප්‍රතිජානන කෙරෙත් නම්, පිරිස්හි සිංහනාද කෙරෙත් නම්, ශ්‍රෙෂ්ඨ ඥානචක්‍ර සඞ්ඛ්‍යාත බ්‍රහ්මචක්‍රය පවත්වත් නම්, තථාගතයන්ගේ මේ එ බඳු තථාගතබල සයෙක. කවර සයෙක යත්:

(1) මහණෙනි, මේ ලොව්හි තථාගතයෝ ස්ථාන ස්ථාන (හෙතු) විසින් ද, අස්ථාන අස්ථාන (අහෙතු) විසින් ද, යථාභූතය දන්නාහ. මහණෙනි, තථාගතයෝ යම් හෙයෙකින් ස්ථානය ස්ථාන විසින් ද, අස්ථානය අස්ථාන විසින් ද දන්නාහු ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨ ස්ථානය පිළිදන්නාහු පිරිස්හි අභීතනාද කෙරෙත් ද, ශ්‍රෙෂ්ඨඥානචක්‍රය පවත්වත් ද, මෙ තථාගතයන්ගේ එ තථාගතබල වෙයි.

(2) තවද මහණෙනි, තථාගතයෝ ස්ථාන විසින් හේතු විසින් අතීත අනාගත ප්‍රත්‍යුත්පන්නකර්මසමාදානයන්ගේ විපාකය යථාභූත කොට දන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් තථාගයෝ ස්ථාන විසින් හෙතු විසින් අතීත අනාගත ප්‍රත්‍යුත්පන්නකර්මසමාදානයන්ගේ විපාකය යථාභූත කොට දනිත් ද, මහණෙනි, තථාගතයෝ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨ-ස්ථානය පිළිදන්නාහු නම්, පිරිස්හි අභීතනාද කෙරෙත් නම්, බ්‍රහ්මචක්‍රය පවත්වත් නම්, තථාගතයන්ගේ මෙ එ තථාගතබලය වෙයි.

(3) පුන ච පරං භික්ඛවෙ තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

(4) පුන ච පරං භික්ඛවෙ තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. යම්පි භික්ඛවෙ තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

(5) පුන ච පරං භික්ඛවෙ තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

(6) පුන ච පරං භික්ඛවෙ තථාගතො ආසවානං ඛයා -පෙ- අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. යම්පි භික්ඛවෙ තථාගතො ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

ඉමානි ඛො භික්ඛවෙ ඡ තථාගතස්ස තථාගතබලානි, යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණෙන උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති, යථා යථා භික්ඛවෙ තථාගතස්ස ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණං විදිතං, තථා තථා තෙසං තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණෙන පඤ්හං පුට්ඨො බ්‍යාකරොති.

Free Distribution www.aathaapi.org

(3) තවද මහණෙනි, තථාගතයෝ ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංක්ලේශය ව්‍යවදානය ව්‍යුත්ථානය යථාභූතයෙන් දන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් තථාගතයෝ ධ්‍යාන විමොක්ෂ සමාධිසමාපත්තීන්ගේ සංක්ලේශය ව්‍යවදානය ව්‍යුත්ථානය යථාභූතයෙන් දන්නාහු ද, මහණෙනි තථාගතයෝ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිදන්නාහු නම් පිරිස්හි සිහනද කෙරෙත් නම් බඹසක් පවත්වත් නම් මෙ ද තථාගතයන්ගේ ඒ තථාගතබල වෙයි.

(4) තවද මහණෙනි, තථාගතයෝ අනෙකවිධ පූර්වේනිවාස සිහිකෙරෙති. හෙ කිසේය යත්: එක් ජාතියකුදු සිහිකෙරෙත්, ජාති දෙකකුදු ... මෙසෙ ආකාර සහිත ව උද්දෙස සහිත ව අනෙකවිධ පූර්වේනිවාස සිහි කරත්. මහණෙනි, යම්හෙයෙකින් තථාගතයෝ අනෙකවිධ පූර්වේනිවාසය සිහිකෙරෙත් ද, එ කිසේය යත්: එක් ජාතියකුදු ජාති දෙකකුදු ... මෙසේ ආකාර ඇති උද්දෙස ඇති අනෙකවිධ පූර්වේනිවාසය සිහිකෙරෙත් ද, මහණෙනි, තථාගතයෝ යම්බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිණ කෙරෙත් නම් පිරිස්හි සිංහනාද කෙරෙත් නම් බඹසක්පවත්වත් නම් මෙ ද තථාගතයන්ගේ ඒ තථාගතබල වෙයි.

(5) තවද මහණෙනි, තථාගතයෝ විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය ... දිවැසින් කම් වූ පරිදි මියයන සත්ත්වයන් දන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් තථාගතයෝ විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිවැසින් ... යථා කර්මොපගසත්ත්වයන් දන්නාහු ද, මහණෙනි, යම් බලයකට පැමිණි තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිදන්නාහු ද, අටපිරිස්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වන්නාහු ද, මෙ ද තථාගතයන්ගේ ඒ තථාගතබල යි.

(6) තවද මහණෙනි, තථාගතයන් වහන්සේ ආශ්‍රවක්ෂයයෙන්...විශිෂ්ට-ඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වාස කරත්. මහණෙනි, යම්හෙයෙකින් තථාගතයන් වහන්සේ ආශ්‍රවක්ෂයයෙන් ... සාක්ෂාත් කොට එළඹ වෙසෙත් ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිත කෙරෙත් ද, පිරිස්හි ශ්‍රෙෂ්ඨනාද කෙරෙත් ද, බඹසක් පවත්වන්නාහු ද, මෙ ද තථාගතයන්ගේ ඒ තථාගත බල යි.

මහණෙනි, යම් බලයෙකින් සමන්වාගත තථාගතයන් වහන්සේ ශ්‍රේෂ්ඨස්ථානය පිළිණ කෙරෙත් ද, පිරිස්හි අභීතනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වන්නාහු ද තථාගතයන් වහන්සේගේ මේ ඒ ෂඩ්තථාගත බල යි.

මහණෙනි, එහිලා ඉදින් අන්‍යයෝ තථාගතයන් කරා පැමිණ කාරණය කාරණ විසින් ද අකාරණය අකාරණ විසින් ද තත් වූ පරිදි නැණින් පැන පුළුවුස්නාහු ද, මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් යම් යම් පරිදි කාරණය කාරණ විසිනුත් අකාරණය අකාරණ විසිනුත් යථාභූතය දන්නාලද්දේද, ඒ ඒ පරිදි තථාගතයන් වහන්සේ ඔවුනට ස්ථානය ස්ථානය වශයෙනුත් අස්ථානය අස්ථාන වශයෙනුත් තත්වූපරිදි ඤාණයෙන් පැන පුළුවුස්නාලද සේක් විවරණ කරන්නාහ.

තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං ඤාණෙන උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති, යථා යථා භික්ඛවෙ තථාගතස්ස අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං ඤාණං විදිතං, තථා තථා තෙසං තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං ඤාණෙන පඤ්හං පුට්ඨො බ්‍යාකරොති.

තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණෙන උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති, යථා යථා භික්ඛවෙ තථාගතස්ස ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණං විදිතං, තථා තථා තෙසං තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණෙන පඤ්හං පුට්ඨො බ්‍යාකරොති.

තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං පුබ්බෙනිවාසානුස්සතිං යථාභූතං ඤාණෙන උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති, යථා යථා භික්ඛවෙ තථාගතස්ස පුබ්බෙනිවාසානුස්සතිං යථාභූතං ඤාණෙන විදිතං, තථා තථා තෙසං තථාගතො පුබ්බෙනිවාසානුස්සතිං යථාභූතං ඤාණෙන පඤ්හං පුට්ඨො ව්‍යාකරොති.

තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං සත්තානං චුතූපපාතං යථාභූතං ඤාණෙන උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති, යථා යථා භික්ඛවෙ තථාගතස්ස සත්තානං චුතූපපාතං යථාභූතං ඤාණං විදිතං, තථා තථා තෙසං තථාගතො සත්තානං චුතූපපාතං යථාභූතං ඤාණෙන පඤ්හං පුට්ඨො බ්‍යාකරොති.

තත්‍ර චෙ භික්ඛවෙ පරෙ තථාගතං ආසවානං ඛයං යථාභූතං ඤාණෙන උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති, යථා යථා භික්ඛවෙ තථාගතස්ස ආසවානං ඛයං යථාභූතං ඤාණං විදිතං, තථා තථා තෙසං තථාගතො ආසවානං ඛයං යථාභූතං ඤාණෙන පඤ්හං පුට්ඨො බ්‍යාකරොති.

තත්‍ර භික්ඛවෙ යම්පිදං ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං ඤාණං, තම්පි සමාහිතස්ස වදාමි, නො අසමාහිතස්ස.

මහණෙනි, එහිලා ඉදින් අන්‍යයෝ අතීත අනාගත ප්‍රත්‍යුත්පන්නකර්මසමාදානයන්ගේ කරුණු විසින් හේතු විසින් විපාක වූ යථාභූතය පිළිබඳ නුවණින් තථාගතයන් වහන්සේ කරා එළැඹ පැන පුළුවුස්නාහු ද, මහණෙනි, යම් යම් පරිදි තථාගතයන් වහන්සේ විසින් අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න කර්මසමාදානයන්ගේ විපාක කරුණු හේතු විසින් යථාභූතකොට විදිත වේ නම්, තථාගතයන් වහන්සේ ඒ ඒ පරිදි අතීත අනාගත ප්‍රත්‍යුත්පන්නකර්මසමාදානයන්ගේ ස්ථානවශයෙන් හේතුවශයෙන් විපාකය පිළිබඳ යථාභූතඥානයෙන් පුළුවුස්නා ලද සේක් විවරණ කරත්.

මහණෙනි, එහි ලා ඉදින් අන්‍යයෝ තථාගතයන් වහන්සේ කරා එළඹ ධ්‍යාන විමෝක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංක්ලේශය, ව්‍යවදානය, ව්‍යුත්ථානය යථාභූත වශයෙන් දැනීමෙන් පැන පුළුවුස්නාහු නම්, මහණෙනි, යම් යම් පරිදි තථාගතයන් වහන්සේ විසින් ධ්‍යාන විමෝක්ෂසමාධි සමාපත්තීන්ගේ සංක්ලේශව්‍යවදාන ව්‍යුත්ථානය පිළිබඳ ඥානය යථාභූත කොට විදිත වේ ද, ඒ ඒ පරිදි ධ්‍යාන විමෝක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංක්ලේශ ව්‍යවදාන ව්‍යුත්ථානයන් පිළිබඳ යථාභූතඥානයෙන් ඔවුන් විසින් පැන පුළුවුස්නා ලද තථාගතයන් වහන්සේ විවරණ කරත්නාහ.

මහණෙනි, එහි ලා ඉදින් අන්‍යයෝ තථාගතයන් කරා පැමිණ පූර්වේනිවාසානුස්මෘතිය ඇරැබ තත් වූ පරිදි පැන පුළුවුස්නාහු නම්, මහණෙනි, යම් යම් පරිදි තථාගතයන් වහන්සේ විසින් පූර්වේනිවාසානුස්මෘතිය ඇරැබ ඥානය යථාභූත කොට විදිත වේ ද, ඒ ඒ පරිදි තථාගතයන් වහන්සේ පූර්වේනිවාසානුස්මෘතිය ඇරැබ යථාභූත වූ නුවණින් ඔවුන් විසින් පැන විචාරණ ලද සේක් විවරණ කරත්නාහ.

මහණෙනි, ඉදින් එහි ලා අන්‍යයෝ තථාගතයන් වහන්සේ කරා එළැඹ සත්ත්වයන්ගේ ච්‍යුතිඋපපාතය පිළිබඳ යථාභූත ඥානයෙන් ප්‍රශ්න පුළුවුස්නාහු නම්, මහණෙනි, යම් යම් පරිද්දෙකින් තථාගතයන් වහන්සේ විසින් සත්ත්වයන්ගේ ච්‍යුතිඋපපාතය ඇරැබ යථාභූතඥානය විදිත වේ නම්, ඒ ඒ පරිද්දෙන් සත්ත්වයන්ගේ ච්‍යුතූපපාතය පිළිබඳ යථාභූත වූ නුවණින් ඔවුන් විසින් පැන විචාරණ ලද සේක් විවරණ කරත්නාහ.

මහණෙනි, ඉදින් එහි ලා අන්‍යයෝ තථාගතයන් වහන්සේ කරා එළැඹ යථාභූත කොට ආස්‍රවක්ෂය පිළිබඳ ඥානයෙන් ප්‍රශ්න විචාරත් නම්, මහණෙනි, යම් යම් පරිද්දෙකින් තථාගතයන් වහන්සේ විසින් ආස්‍රවක්ෂය පිළිබඳ යථාභූත ඥානය විදිත වේ නම්, ඒ ඒ පරිද්දෙන් තථාගතයන් වහන්සේ ආස්‍රවක්ෂය පිළිබඳ යථාභූත ඥානයෙන් ඔවුන් විසින් පැන පුළුවුස්නා ලද සේක් විවරණ කරත්නාහ.

මහණෙනි, ඔවුනතුරෙහි ස්ථාන ස්ථාන විසින් ද අස්ථාන අස්ථාන විසින් දැයි යම්බඳු මේ යථාභූතඥානයෙක් වේ නම්, එ ද සමාහිතයාහට (වේයයි) කියමි. අසමාහිතයාහට නො වේ (යයි කියමි).

යම්පිදං අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං ඤාණං, තම්පි සමාහිතස්ස වදාමි, නො අසමාහිතස්ස.

යම්පිදං ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං ඤාණං, තම්පි සමාහිතස්ස වදාමි, නො අසමාහිතස්ස.

යම්පිදං පුබ්බෙනිවාසානුස්සතිං යථාභූතං ඤාණං, තම්පි සමාහිතස්ස වදාමි, නො අසමාහිතස්ස.

යම්පිදං සත්තානං චුතූපපාතං යථාභූතං ඤාණං, තම්පි සමාහිතස්ස වදාමි, නො අසමාහිතස්ස.

යම්පිදං ආසවානං ඛයා යථාභූතං ඤාණං, තම්පි සමාහිතස්ස වදාමි, නො අසමාහිතස්ස.

ඉති ඛො භික්ඛවෙ සමාධි මග්ගො, අසමාධි කුම්මග්ගොති.

මහාවග්ගො පඨමො.*

තස්සුද්දානං:

සොණො ඵග්ගුණං ඡළාභිජාතියො ආසවා දරුකම්මහත්ථිමජ්ඣං
පස්ස විත්තපරායනං උදකං නිබ්බෙධිකසීහනාදෙන වග්ගොති - සීමු.

සොණො ඵග්ගුණොභිජාති ආසවා දරුහත්ථි ච
මජ්ඣෙ ඤාණං නිබ්බෙධිකං සීහනාදෙති තෙ දසාති - මජසං

* මහාවග්ගො ඡට්ඨො - පාළියංයෙව, අට්ඨකථායංයෙව, මජසං පොත්ථකෙ ච දිස්සතෙ.

අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න කර්මයන්ගේ ස්ථාන වශයෙන් හේතු වශයෙන් විපාක පිළිබඳ යම් බඳු මේ යථාභූතඥානයෙක් වේ නම්, එ ද සමාහිතයාහට වේ යයි කියමි. අසමාහිතයාහට නො වේ (යයි කියමි).

ධ්‍යාන විමොක්ෂ සමාධිසමාපත්තීන්ගේ සංක්ලේශ ව්‍යවදාන ව්‍යුත්ථාන පිළිබඳ යම් බඳු මේ යථාභූතඥානයෙක් වේ නම්, එ ද සමාහිතයාහට වේ යයි කියමි. අසමාහිතයාහට නො වේ (යයි කියමි).

පූර්වේනිවාසානුස්මෘතිය පිළිබඳ යම් බඳු මේ යථාභූතඥානයෙක් වේ නම්, එ ද සමාහිතයාහට වේ යයි කියමි. අසමාහිතයාහට නො වේ (යයි කියමි).

සත්ත්වයන්ගේ චුත්‍යුපපාතය පිළිබඳ යම්බඳු මේ යථාභූතඥානයෙක් වේ නම්, එ ද සමාහිතයාහට වේ යයි කියමි. අසමාහිතයාහට නො වේ (යයි කියමි).

ආශ්‍රවක්ෂයයෙහි යම්බඳු මෙ යථාභූතඥානයෙක් වේ නම්, එද සමාහිතයාහට ම වේ යයි කියමි. අසමාහිතයාහට නො වේ (යයි කියමි).

මහණෙනි, මෙසෙයින් (චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත) සමාධිය (ඥානාධිගමෝපාය සඞ්ඛ්‍යාත) මාර්ගය වෙයි. අසමාධිය කුමග (මිථ්‍යාමාර්ග) වේ යයි.

මහාවග්ගය පළමු වැනි යි.

එහි උද්දානය:

සෝණ සූත්‍රය, ඵග්ගුණ සූත්‍රය, ඡළාභිජාති සූත්‍රය, ආසව සූත්‍රය, දාරුකම්මික සූත්‍රය, හත්ථිසාරිපුත්ත සූත්‍රය, මජ්ඣෙ සූත්‍රය, පුරිසින්ද්‍රියඥාණ සූත්‍රය, නිබ්බේධික සූත්‍රය, සීහනාද සූත්‍රය දැයි දශසූත්‍ර කෙනෙක් වෙත්.

## 2. අනාගාමි වග්ගො

### 6. 2. 2. 1

### [අනාගාමිඵල සුත්තං]

[සාවත්ථිනිදානං]

11. ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අනාගාමිඵලං සච්ඡිකාතුං. කතමෙ ඡ:

අස්සද්ධියං, අහිරිකං, අනොත්තප්පං, කොසජ්ජං, මුට්ඨසච්චං,[1] දුප්පඤ්ඤතං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අප්පහාය අභබ්බො අනාගාමිඵලං සච්ඡිකාතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අනාගාමිඵලං සච්ඡිකාතුං. කතමෙ ඡ:

අස්සද්ධියං, අහිරිකං, අනොත්තප්පං, කොසජ්ජං, මුට්ඨසච්චං, දුප්පඤ්ඤතං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො අනාගාමිඵලං සච්ඡිකාතුන්ති.

### 6. 2. 2. 2

### [අරහත්තඵල සුත්තං]

[සාවත්ථිනිදානං]

12. ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං. කතමෙ ඡ:

ථිනං,[2] මිද්ධං, උද්ධච්චං, කුක්කුච්චං, අස්සද්ධියං, පමාදං.

ඉමෙ ඛො ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුං. කතමෙ ඡ:

ථිනං[2] මිද්ධං, උද්ධච්චං, කුක්කුච්චං, අස්සද්ධියං, පමාදං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුන්ති.

### 6. 2. 2. 3

### [මිත්ත සුත්තං]

[සාවත්ථිනිදානං]

13. සො වත භික්ඛවෙ භික්ඛු පාපමිත්තො පාපසහායො පාපසම්පවඞ්කො, පාපමිත්තෙ සෙවමානො භජමානො පයිරුපාසමානො, තෙසඤ්ච දිට්ඨානුගතිං ආපජ්ජමානො, ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති. ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා සෙඛං ධම්මං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සෙඛං ධම්මං අපරිපූරෙත්වා සීලානි පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සීලානි අපරිපූරෙත්වා කාමරාගං වා රූපරාගං වා අරූපරාගං වා පජහිස්සතීති නෙතං ඨානං විජ්ජති.

---

1. මුට්ඨස්සච්චං - මජසං, 2 ථීනං - මජසං

## 2. අනාගාමි වර්ගය

### 6. 2. 2. 1.

### [අනාගාමිඵල සූත්‍රය

[සැවැත්නිදාන යි]

**11**. මහණෙනි, දහම් සදෙනකුත් නො පහා අනාගාමිඵල සාක්ෂාත් කරන්නට නො හිසි වෙති. කවර සයෙක යත්:

අස්සද්ධිය (ශ්‍රද්ධා නැතිබව) අහිරික ය (පවට ලජ්ජා නැතිබව), අනොත්තප්ප ය (පවට භය නැතිබව), කොසජ්ජ ය (කුසීත බව), මුට්ඨස්සච්ච ය (සිහි නැතිබව), දුප්පඤ්ඤතා (ප්‍රඥා නැතිබව) යි.

මහණෙනි, මෙ ධර්ම සය නො පහා අනාගාමිඵලය සාක්ෂාත් කරන්නට අභව්‍ය වෙති.

මහණෙනි, ධර්ම සයක් පහා අනාගාමිඵලය සාක්ෂාත් කරන්නට හිසි වෙසි. කවර සයෙක යත්:

අස්සද්ධිය ය අහිරික ය අනොත්තප්ප ය කොසජ්ජ ය මුට්ඨස්සච්ච ය දුප්පඤ්ඤතා ය යි.

මහණෙනි, මෙ දහම් සය පහා අනාගැමිපල පසක්කරන්නට හිසි වේ ය යි.

### 6. 2. 2. 2.

### [අරහත්තඵල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**12.** මහණෙනි, ධර්ම සයක් නො පහා අර්හත්වය සාක්ෂාත් කරන්නට අභව්‍ය වෙති. කවර සයෙක යත්.

ථීන ය, මිද්ධ ය, උද්ධච්ච ය, කුක්කුච්ච ය, අස්සද්ධිය ය, පමාද යි.

මහණෙනි, මෙ ධර්ම සය නො පහා අර්හත්වය සාක්ෂාත් කරන්නට අභව්‍ය වෙති.

මහණෙනි, දහම් සයක් පහා අර්හත්වය පසක් කරන්නට හිසි වෙයි. කවර සයෙක යත්:

ථීන ය, මිද්ධ ය, උද්ධච්ච ය, කුක්කුච්ච ය, අස්සද්ධිය ය, පමාද ය යි.

මහණෙනි, මෙ දහම් සය පහා අර්හත්වය සාක්ෂාත් කරන්නට හිසි වේ ය යි.

### 6. 2. 2. 3.

### [මිත්ත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**13**. මහණෙනි, පවිටු මිතුරන් ඇති පවිටු යහළුවන් ඇති පාපයනට නැඹුරු වූ, පාපමිත්‍රයන් සෙවුනා භජනය කරණ පර්‍ය්‍යුපාසනා කරන, ඔවුන්ගේ දෘෂ්ටානුගතියට පැමිණෙන ඒ බදු මහණෙක් (වත් පිළිවෙත් ප්‍රඥප්ත ශීල සඞ්ඛ්‍යාත) ආභිසමාචාරික ධර්මය සම්පූර්ණ කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ආභිසමාචාරික ශීලය නො පුරා (ශෛක්‍ෂප්‍රඥප්ත ශීල සඞ්ඛ්‍යාත) ශෛක්‍ෂධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ශෛක්‍ෂධර්මය නො පුරා සතර මහසිල් පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. සතර මහසිල් නො පුරා කාමරාගය වේවයි රූපරාගය වේවයි අරූපරාගය වේවයි දුරුකරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

සො වත භික්ඛවෙ භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො, කල්‍යාණමිත්තෙ සෙවමානො භජමානො පයිරුපාසමානො, තෙසඤ්ච දිට්ඨානුගතිං ආපජ්ජමානො, ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙස්සතීති ඨානමෙතං විජ්ජති. ආභිසමාචාරිකං ධම්මං පරිපූරෙත්වා සෙඛං ධම්මං පරිපූරෙස්සතීති ඨානමෙතං විජ්ජති. සෙඛං ධම්මං පරිපූරෙත්වා සීලානි පරිපූරෙස්සතීති ඨානමෙතං විජ්ජති. සීලානි පරිපූරෙත්වා කාමරාගං වා රූපරාගං වා අරූපරාගං වා පජහිස්සතීති ඨානමෙතං විජ්ජති.

## 6. 2. 2. 4

## [සඞ්ගණිකාරාම සුත්තං]

[සාවත්ථිනිදානං]

**14**. සො වත භික්ඛවෙ භික්ඛු සඞ්ගණිකාරාමො සඞ්ගණිකාරතො[1] සඞ්ගණිකාරාමතං අනුයුත්තො, ගණාරාමො ගණරතො ගණාරාමතං අනුයුත්තො එකො පවිවෙකෙ අභිරමිස්සතීති නෙතං ඨානං විජ්ජති. එකො පවිවෙකෙ අනභිරමන්තො චිත්තස්ස නිමිත්තං ගණ්හිස්සතීති[2] නෙතං ඨානං විජ්ජති. චිත්තස්ස නිමිත්තං අගණ්හන්තො සම්මාදිට්ඨිං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සම්මාදිට්ඨිං අපරිපූරෙත්වා සම්මාසමාධිං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සම්මාසමාධිං අපරිපූරෙත්වා සඤ්ඤොජනානි[3] පජහිස්සතීති නෙතං ඨානං විජ්ජති. සඤ්ඤොජනානි අප්පහාය නිබ්බානං සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු න සඞ්ගණිකාරාමො න සඞ්ගණිකාරතො න සඞ්ගණිකාරාමතං අනුයුත්තො, න ගණාරාමො න ගණරතො න ගණාරාමතං අනුයුත්තො, එකො පවිවෙකෙ අභිරමිස්සතීති ඨානමෙතං විජ්ජති. එකො පවිවෙකෙ අභිරමන්තො චිත්තස්ස නිමිත්තං ගණ්හිස්සතීති[2] ඨානමෙතං විජ්ජති. චිත්තස්ස නිමිත්තං ගණ්හන්තො සම්මාදිට්ඨිං පරිපූරෙස්සතීති ඨානමෙතං විජ්ජති. සම්මාදිට්ඨිං පරිපූරෙත්වා සම්මාසමාධිං පරිපූරෙස්සතීති ඨානමෙතං විජ්ජති. සම්මාසමාධිං පරිපූරෙත්වා සඤ්ඤොජනානි[3] පජහිස්සතීති ඨානමෙතං විජ්ජති. සඤ්ඤොජනානි පහාය නිබ්බානං සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජතී'ති.

## 6. 2. 2. 5.

## [දෙවතා සුත්තං]

[සාවත්ථිනිදානං]

**15**. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච:

---

* ඉමස්මිං සුත්තෙ "ඨානමෙතං නවිජ්ජති" "ඨානමෙතං විජ්ජති" වසෙන චත්තාරි චත්තාරි කාරණානි දිස්සන්ති.

1. සඞ්ගණිකාරතො - මජසං, 2. ගහෙස්සතීති - මජසං, 3. සංයොජනානි - මජසං

මහණෙනි, කලණමිතුරන් ඇති කලණ සගයන් ඇති කලණ පුගුලන් කෙරෙහි සම්ප්‍රවඞ්ක වූ, කල්‍යාණ මිත්‍රයන් සෙවුනා භජනය කරණ කල්‍යාණයන් පයුර්පාසන කරණ, ඔවුන්ගේ දෘෂ්ටානුගතියට පැමිණෙන එබඳු මහණ ආභිසමාචාරිකශීල සඞ්ඛ්‍යාත ධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. ආභිසමාචාරිකධර්මය පුරා ශෛක්‍ෂධර්මය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. ශෛක්‍ෂධර්මය පුරා මහසිල් පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. මහසිල් පුරා කාමරාගය වේවයි රූපරාගය වේවයි අරූපරාගය වේවයි දුරුකරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ ය යි.

## 6. 2. 2. 4.

## [සඞ්ගණිකාරාම සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**14.** මහණෙනි, ගණසඞ්ගණිකායෙහි ඇලුම් ඇති, ගණසඞ්ගණිකායෙහි (ඔවුනොවුන් හා සසග ව විසීමෙහි) තියැලි, ගණසඞ්ගණිකාරාමතායෙහි අනුයුක්ත වූ, ගෙණෙහි ඇලෙන සුලු ගෙණෙහි රැඳුනු ගණාරාමතායෙහි නියුක්ත, එබඳු මහණ එකාකී වූයේ ප්‍රවිවෙකයෙහි සිත් අලවා වෙසේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. එකලා වූයේ ප්‍රවිවෙකයෙහි අභිරමණය නො කරණුයේ (සමාධිවිපස්සනා) චිත්තයාගේ නිමිත්ත ගන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. චිත්තයාගේ නිමිත්ත නො ගන්නේ සම්‍යග්දෘෂ්ටිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නොවේ. සම්‍යග්දෘෂ්ටිය නො පුරා සම්‍යක් (මාර්ග) සමාධිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. සම්‍යක්සමාධිය නො පුරා සංයෝජනයන් දුරු කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. සංයෝජනයන් නො පහා නිර්වාණය සාක්‍ෂාත් කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

මහණෙනි, ගණසඞ්ගණිකාරාම නො වූ ගණසඞ්ගණිකායෙහි නො ඇලුනු සඞ්ගණිකාරාමතායෙහි අනුයුක්ත නො වූ, ගෙණෙහි ඇලුම් නැති ගෙණෙහි නො තියැලි ගණාරාමතායෙහි අනුයුක්ත නො වූ, එබඳු මහණ ඒකාන්තයෙන් එකලා වූයේ ප්‍රවිවෙකයෙහි අභිරමණය කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. එකලා වූයේ ප්‍රවිවෙකයෙහි අභිරමණය කරණුයේ සමාධිවිපස්සනාචිත්තයාගේ නිමිත්ත ගන්නේ ය යන තෙල-කරුණ විද්‍යමාන වේ. චිත්තයාගේ නිමිත්ත ගන්නේ සම්‍යග්දෘෂ්ටිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. සම්‍යග්දෘෂ්ටිය පුරා සම්‍යක් සමාධිය පුරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. සම්‍යක්සමාධිය පුරා සංයොජනයන් දුරුකරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ. සංයොජනයන් පහා නිර්වාණය සාක්‍ෂාත් කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ යයි.

## 6. 2. 2. 5.

## [දේවතා සූත්‍රය]

**[සැවැත්නිදාන යි]**

**15.** එකල්හි එක්තරා දෙවියෙක් රූ පෙරයම ඉක්මැ ගිය කල්හි අභික්‍රාන්ත වර්ණ ඇතියේ හැම දෙව්රම බබුළුවා, භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි එ දෙව් භාග්‍යවතුන් වහන්සේට තෙල සැලු කෙළේ ය:

ඡයිමෙ භන්තෙ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ ඡ:

සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සොවචස්සතා, කල්‍යාණමිත්තතා.

ඉමෙ ඛො භන්තෙ ඡ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති. ඉදමවොච සා දෙවතා. සමනුඤ්ඤො සත්ථා අහොසි.

අථ ඛො සා දෙවතා සමනුඤ්ඤො මෙ සත්ථා'ති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ සා දෙවතා මං එතදවොච:

ඡයිමෙ භන්තෙ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ ඡ:

සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සොවචස්සතා, කල්‍යාණමිත්තතා.

ඉමෙ ඛො භන්තෙ ඡ ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තී'ති.

ඉදමවොච භික්ඛවෙ සා දෙවතා. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

එවං වුත්තෙ ආයස්මා **සාරිපුත්තො** භගවන්තං එතදවොච:

“ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි: ඉධ භන්තෙ භික්ඛු අත්තනා ච සත්ථුගාරවො හොති සත්ථුගාරවතාය ච වණ්ණවාදී, යෙ චඤ්ඤෙ භික්ඛූ න සත්ථුගාරවා තෙ ච සත්ථුගාරවතාය සමාදපෙති, යෙ චඤ්ඤෙ භික්ඛූ සත්ථුගාරවා තෙසඤ්ච වණ්ණං භාසති[1] භූතං තච්ඡං කාලෙන. අත්තනා ච ධම්මගාරවො හොති -පෙ- සඞ්ඝගාරවො හොති -පෙ- සික්ඛාගාරවො හොති -පෙ- සුවචො හොති -පෙ- කල්‍යාණමිත්තො හොති කල්‍යාණමිත්තතාය ච වණ්ණවාදී, යෙ චඤ්ඤෙ භික්ඛූ න කල්‍යාණමිත්තා තෙ ච කල්‍යාණමිත්තතාය සමාදපෙති, යෙ චඤ්ඤෙ භික්ඛූ කල්‍යාණමිත්තා තෙසඤ්ච වණ්ණං භාසති[1] භූතං තච්ඡං කාලෙන.

ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථ ආජානාමී”ති.

1. භණාති - මජසං

වහන්ස, භික්ෂුහුගේ අපරිහානිය පිණිස මේ ධර්මයෝ සදෙනෙක් පවත්නාහ. කවර සදෙනෙක යත්:

සත්ථුගාරවතා ය ධම්මගාරවතා ය සඞ්ඝගාරව තා ය සික්ඛාගාරවතා ය සොවචස්සතා ය කල්‍යාණමිත්තතා යි.

වහන්ස, මේ කරුණු සදෙන භික්ෂුහුගේ අපරිහානිය පිණිස වැටෙති යි. ඒ දෙව් මේ කීය. ශාස්තෘහු අනුදත්හ.

ඉක්බිති ඒ දෙවි ශාස්තෘහු ම බස් අනුදත්හයි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ රෑ ඇවෑමෙන් මහණුන් ඇමතූහ: මහණෙනි, මේ රෑ අන්‍යතර දෙවියෙක් අභික්‍රාන්ත වර්ණ ඇතියේ රෑ පෙරයම ඉක්මැගිය කල්හි හැම දෙව්රම බබුළුවා, මා කරා එළඹියේ ය. එළඹ මා සකසා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි එ දෙවි මට මෙල කරුණ කීය:

"වහන්ස, මේ සකාරණයෝ මහණහුගේ අපරිහානිය පිණිස වැටෙති. කවර සයෙක යත්:

සත්ථුගාරවතා ය, ධම්මගාරවතා ය, සඞ්ඝගාරවතා ය, සික්ඛාගාරවතා ය, සොවචස්සතා ය, කල්‍යාණමිත්තතා යි.

වහන්ස, මේ සදහම්හු භික්ෂුහුගේ අපරිහානිය පිණිස වැටෙතියි."

මහණෙනි, එ දෙවි මෙ කීය. මේ කියා මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් වී ය යි.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළකළහ:

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාළ මේ දහම්හුගේ අර්ථය මෙසේ විතර විසින් දනිමි: වහන්ස, මේ සස්නෙහි මහණ තෙමේ ද ශාස්තෘන් කෙරෙහි ගෞරව ඇතියේ වෙයි, ශාස්තෘගෞරවයෙහි ගුණ බණනා සුලුද වෙයි. ශාස්තෘගෞරව නැති යම් කිසි අන්‍ය මහණහු වෙත් නම් ඔවුනුදු ශාස්තෘගෞරවයෙහි සමාදන් කර වයි. ශාස්තෘගෞරව ඇති යම්කිසි අන්‍ය මහණහු වෙත් නම්, ඔවුන්ගේ භූත වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි කියයි. තෙමේත් ධර්මගෞරව ඇතියේ වෙයි ... සඞ්ඝගෞරව ඇතියේ වෙයි ... ශික්ෂාගෞරව ඇතියේ වෙයි ... සුවච වෙයි ... කල්‍යාණමිත්‍රයන් ඇතියේ වෙයි. කලණමිතුරන් ඇතිබව්හි ගුණ බණනා සුලුද වෙයි. කලණමිතුරන් නැති යම් අන් මහණහු වෙත් නම් ඔවුනුදු කලණමිතුරන් ඇති බව්හි සමාදන් කරවයි. කලණ මිතුරන් ඇති යම් අන් මහණහු වෙත් නම්, ඔවුන්ගේ ද භූත වූ තථ්‍ය වූ ගුණ තිසි කල්හි කියයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාළ මේ ධර්මයාගේ අර්ථය මෙසෙයින් මම විතර විසින් දනිමි'යි.

සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාසි.

ඉධ සාරිපුත්ත භික්ඛු අත්තනා ච සත්ථුගාරවො හොති, සත්ථුගාරවතාය ච වණ්ණවාදී, යෙ චඤ්ඤෙ භික්ඛූ න සත්ථුගාරවා, තෙ ච සත්ථුගාරවතාය සමාදපෙති. යෙ චඤ්ඤෙ භික්ඛූ සත්ථුගාරවා, තෙසඤ්ච වණ්ණං භාසති භූතං තච්ඡං කාලෙන. අත්තනා ච ධම්මගාරවො හොති -පෙ- සඞ්ඝගාරවො හොති -පෙ- සික්ඛාගාරවො හොති -පෙ- සුවචො හොති -පෙ- කල්‍යාණමිත්තො හොති කල්‍යාණමිත්තතාය ච වණ්ණවාදී, යෙ චඤ්ඤෙ භික්ඛූ න කල්‍යාණමිත්තා, තෙ ච කල්‍යාණමිත්තතාය සමාදපෙති, යෙ චඤ්ඤෙ භික්ඛූ කල්‍යාණමිත්තා තෙසඤ්ච වණ්ණං භණති භූතං තච්ඡං කාලෙන.

ඉමස්ස ඛො සාරිපුත්ත මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

## 6. 2. 2. 6.

## [සමාධිසුත්තං]

[සාවත්ථිනිදානං]

**10.** සො වත භික්ඛවෙ භික්ඛු න සන්තෙන සමාධිනා න පණීතෙන න පටිප්පස්සද්ධිලද්ධෙන න එකොදිභාවාධිගතෙන-

අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවිස්සති: එකොපි හුත්වා බහුධා භවිස්සති, බහුධාපි හුත්වා එකො භවිස්සති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙස්සතීති[1] නෙතං ඨානං විජ්ජති.

දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණිස්සති, දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ චාති, නෙතං ඨානං විජ්ජති.

පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානිස්සති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානිස්සති -පෙ- අවිමුත්තං වා චිත්තං[2] අවිමුත්තං[3] චිත්තන්ති පජානිස්සතීති නෙතං ඨානං විජ්ජති.

අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරිස්සති[4] සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සිස්සති -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානිස්සතීති නෙතං ඨානං විජ්ජති.

ආසවානං ඛයා [අනාසවං චෙතොවිමුත්තිං]-පෙ-සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති නෙතං ඨානං විජ්ජතීති.

---

1. වත්තිස්සතීති - සීමු.
2. විමුත්තං වා චිත්තං - මජ්සං.
3. විමුත්තං - මජ්සං.
4. අනුස්සරති - සීමු.

ශාරිපුත්‍රය, මැනැවැ මැනැවැ, ශාරිපුත්‍රය, තෝ මා විසින් සංක්ෂේපයෙන් දෙසනලද මේ භාෂිතයාගේ අර්ථය මෙසේ විතර විසින් මැනැවින් ම දන්හි.

ශාරිපුත්‍රය, මේ සස්නෙහි මහණ තෙමේත් ශාස්තෘගෞරව ඇත්තේ වෙයි. ශාස්තෘගෞරවයෙහි ගුණ කියන්නේ වෙයි. ශාස්තෘගෞරව රහිත අනෙක් යම් භික්ෂු කෙනෙක් වෙත් නම්, ඔහුදු ශාස්තෘගෞරවතායෙහි සමාදන් කරවයි. ශාස්තෘගෞරව සහිත අනෙක් යම් භික්ෂු කෙනෙකුත් ඇත් නම් ඔවුන්ගේත් භූත වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි කියයි. තෙමේත් ධර්මගෞරව ඇත්තේ වෙයි ... සඞ්ඝගෞරව ඇත්තේ වෙයි ... ශික්ෂාගෞරව ඇත්තේ වෙයි .. සුවච වෙයි ... කලණමිතුරන් ඇත්තේ වෙයි. කල්‍යාණ-මිත්‍රතායෙහි ගුණ බණනසුලු වෙයි. කල්‍යාණමිත්‍රතා රහිත අනෙක් යම් භික්ෂු කෙනෙක් ඇත් නම් ඔහුත් කල්‍යාණමිත්‍රතායෙහි සමාදන් කරවයි. කලණමිතුරන් ඇති අනෙක් යම් භික්ෂු කෙනෙක් ඇත්නම් ඔවුන්ගේත් භූත වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි කියයි.

ශාරිපුත්‍රය, මා විසින් සංක්ෂේපයෙන් දෙසනලද මේ භාෂිතයාගේ අර්ථය මෙසේ විතරවිසින් දතයුතුය යි.

### 6. 2 2 6.

### [සමාධි සූත්‍රය]

[සැවැත්නිදාන යි]

16. මහණෙනි, ''එ මහණ තෙමේ ශාන්ත නො වූ ප්‍රණීත නො වූ සංසිඳීමෙන් නො ලත් එකඟ බැවින් නො ලත් සමාධියෙන්-

බහුප්‍රකාර වූ ඍද්ධිවිධඥාන ය ලබයි: එකෙක් වූයේ ම බහුප්‍රකාර වෙයි. බහුප්‍රකාර වූයේ ම එකෙක් වෙයි ... බඹලොව තෙක් කයින් වශය පවත්වා ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

විශුද්ධ වූ මිනිස් කණ ඉක්මගිය දිව්‍යශ්‍රෝත්‍රයින් දිව්‍ය වූ ද මනුෂ්‍ය වූ ද දුර වූ ද ලඟ වූ දැයි ද්විවිධ ශබ්ද අසා ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත ඔහු සිතින් පිරිසිඳ දැනගණී: සරාග වූ හෝ සිත සරාග සිතැයි දැන ගණී ... අවිමුක්ත වූ හෝ සිත අවිමුක්ත සිතැයි දැනගණී යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

බහුප්‍රකාර පූර්වේනිවාසය සිහි කෙරේ යි. කිසෙයින යත්: එක් ජාතියක් ද ජාති දෙකක් ද ... මෙසේ ආකාර සහිත උද්දෙශ සහිත බහුප්‍රකාර පූර්වේනිවාසය සිහි කෙරේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මිනිස්ඇස ඉක්මගිය විශුද්ධ වූ දිවැසින් සත්ත්වයන් දක්නේ ය ... කම් වූ පරිදි ගිය සත්ත්වයන් දනී යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

ආස්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය .. සාක්ෂාත් කොට ඊට පැමිණ වෙසේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ ය යි.

8

සො වත භික්ඛවෙ භික්ඛු සන්තෙන සමාධිනා පණීතෙන පටිප්පස්සද්ධිලද්ධෙන එකොදිභාවාධිගතෙන-

අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවිස්සති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙස්සතීති[1] ඨානමෙතං විජ්ජති -පෙ-

දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණිස්සති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ චාති ඨානමෙතං විජ්ජති -පෙ-

පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානිස්සති -පෙ- සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානිස්සති -පෙ- අවිමුත්තං[2] වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානිස්සතීති ඨානමෙතං විජ්ජති -පෙ-

අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරිස්සති සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරිස්සතීති ඨානමෙතං විජ්ජති -පෙ-

දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සිස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානිස්සතීති ඨානමෙතං විජ්ජති -පෙ-

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

6. 2. 2. 7.

[සක්ඛිභබ්බ සුත්තං]

[සාවත්ථිනිදානං]

17. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිතුං සති සති ආයතනෙ. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු "ඉමෙ හානභාගියා ධම්මාති යථාභූතං නප්පජානාති, ඉමෙ ඨිතිභාගියා ධම්මාති යථාභූතං නප්පජානාති, ඉමෙ-විසෙසභාගියා ධම්මාති යථාභූතං නප්පජානාති, ඉමෙ නිබ්බෙධභාගියා ධම්මාති යථාභූතං නප්පජානාති", අසක්කච්චකාරී ච හොති අසප්පාය-කාරී ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිතුං සති සති ආයතනෙ.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිතුං සති සති ආයතනෙ. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු "ඉමෙ හානභාගියා ධම්මාති යථාභූතං පජානාති, ඉමෙ ඨිතිභාගියා ධම්මාති යථාභූතං පජානාති, ඉමෙ විසෙසභාගියා ධම්මාති යථාභූතං පජානාති, ඉමෙ නිබ්බෙධභාගියා ධම්මාති යථාභූතං පජානාති", සක්කච්චකාරී ච හොති සප්පායකාරී ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිතුං සති සති ආයතනෙති.

1. වත්තිස්සතීති - සීමු, 2. විමුත්තං - මජසං.

මහණෙනි, ඒ මහණ ශාන්ත ප්‍රණීත ප්‍රතිප්‍රශ්‍රබ්ධියෙන් ලත් එකෝදි-භාවාධිගත සමාධියෙන්-

බහුප්‍රකාර ඍද්ධිවිධය ලබයි: එකෙක් වූයේ ම බහුප්‍රකාර වෙයි. බහුප්‍රකාර වූයේ ම එකෙක් වෙයි .. බඹලොව තෙක් කයින් වශය පවත්වා යන තෙල කරුණ විද්‍යමාන වෙයි ...

විශුද්ධ වූ මිනිස්කණ ඉක්මගිය දිව්‍යශෝත්‍රධාතුයෙන් දිව්‍ය වූ ද මානුෂ වූ ද දුර වූ ද ළඟ වූ දැයි දෙවිධ ශබ්ද අසා යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි ..

පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත ඔහු සිතින් පිරිසිඳ දැනගණී. සරාග වූ හෝ සිත සරාග සිතැයි දැනගණී .. අවිමුක්ත වූ හෝ සිත අවිමුක්ත සිතැයි දැනගණී යන තෙල කරුණ විද්‍යමාන වෙයි ...

නන්වැදෑරුම් පූර්වනිවාසය සිහි කෙරෙයි. එ නම්: එක් දෑයකුදු දෑ දෙකකුදු .. මෙසේ ආකාර සහිත උද්දෙස සහිත අනෙකවිධ පූර්වනිවාස සිහිකරන්නේ ය යන තෙල කරුණ ඇතැ ...

විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිවැසින් චැවෙයන උපදනා හීන ප්‍රණීත මනා පැහැ ඇති නො මනා පැහැ ඇති මනා ගති ඇති නපුරු ගති ඇති සත්ත්වයන් දක්නේ ය. කම් වූ පරිදි මියැයන සත්ත්වයන් දක්නේ ය යන තෙල කරුණ ඇත ...

ආස්‍රවයන්ගේ ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය .. සාක්‍ෂාත් කොට එළඹ වාසය කරන්නේ ය යන තෙල කරුණ ඇතැ යි.

## 6. 2. 2. 7.

## [සක්ඛිභබ්බ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

17. මහණෙනි, දගම් සයෙකින් සමන්වාගත මහණ කරුණු ඇතිවත් ම ඒ ඒ වෙසෙස් ගුණෙහි ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණෙන්නට අභව්‍ය වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි, මහණ 'මොහු හානභාගිය ධර්මයහ'යි තත් වූ පරිදි නො දන්නේ ය. 'මොහු ස්ථිතිභාගිය ධර්මය හ'යි යථාභූත ව නො දන්නේ ය. 'මොහු විශෙෂභාගිය ධර්මයහ'යි යථාභූත ව නො දන්නේ ය. 'මොහු නිර්වෙධභාගිය ධර්මයහ'යි යථාභූත ව නො දන්නේ ය. නො සකස් කොට කරණසුලු ද වෙයි. අපථ්‍යකරුණු කරණසුලු ද වෙයි.

මහණෙනි, මෙ සදහමින් සමන්වාගත මහණ කරුණු ඇතිවත් ම ඒ ඒ වෙසෙස් ගුණෙහි ප්‍රත්‍යක්‍ෂ භාවයට පත්වීමට අභව්‍ය වේ යයි

මහණෙනි, ධර්ම සයෙකින් යුත් මහණ කරුණු ඇතිවත් ම ඒ ඒ විශෙෂ ගුණයෙහි ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණීමට භව්‍ය වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ 'මොහු හානභාගිය ධර්මයහ'යි යථා-භූත ව දන්නේ ය. 'මොහු ස්ථිතිභාගිය ධර්මයහ'යි යථාභූත ව දන්නේ ය. 'මොහු විශෙෂභාගිය ධර්මයහ'යි යථාභූත ව දන්නේ ය. 'මොහු නිර්වෙධභාගිය ධර්මයහ'යි යථාභූත ව දන්නේ ය. සකසා කරණ සුලුයේත් වෙයි. සතප්‍රාය කාරීත් වේ.

මහණෙනි, මෙ දහම් සයෙන් සමන්වාගත මහණ විශේෂාධිගමයට උපනිඃශ්‍රය කරුණු ඇතිවත් ම ඒ ඒ විශෙෂගුණයෙහි ප්‍රත්‍යක්‍ෂභාවයට පැමිණීමට භව්‍ය වේ යයි.

6. 2. 2. 8.

## [බල සුත්තං]

[සාවත්ථිනිදානං]

18. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො සමාධිස්මිං බලතං පාපුණිතුං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු න සමාධිස්ස සමාපත්තිකුසලො හොති, න සමාධිස්ස ඨිතිකුසලො හොති, න සමාධිස්ස වුට්ඨානකුසලො හොති, අසක්කච්චකාරී ච හොති, අසාතච්චකාරී ච, අසප්පායකාරී ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො සමාධිස්මිං බලතං පාපුණිතුං.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො සමාධිස්මිං බලතං පාපුණිතුං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සමාධිස්ස සමාපත්තිකුසලො හොති, සමාධිස්ස ඨිතිකුසලො හොති, සමාධිස්ස වුට්ඨානකුසලො හොති, සක්කච්චකාරී ච හොති, සාතච්චකාරී ච, සප්පායකාරී ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො සමාධිස්මිං බලතං පාපුණිතුන්ති.

6. 2. 2. 9.

## [පඨමජ්ඣාන සුත්තං]

[සාවත්ථිනිදානං]

19. ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ ඡ:

කාමච්ඡන්දං, ව්‍යාපාදං, ථිනමිද්ධං, උද්ධච්චකුක්කුච්චං, විචිකිච්ඡං, කාමෙසු ඛො පනස්ස ආදීනවො න යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨො හොති, ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. කතමෙ ඡ:

කාමච්ඡන්දං, ව්‍යාපාදං, ථිනමිද්ධං, උද්ධච්චකුක්කුච්චං, විචිකිච්ඡං, කාමෙසු ඛො පනස්ස ආදීනවො යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුන්ති.

[බල සූත්‍රය]

6. 2. 2. 8.

[සැවැත්නිදාන යි]

18. මහණෙනි, කරුණු සයෙකින් සමන්නාගත භික්ෂු සමාධියෙහි බලවද්භාවයට පැමිණීමට සුදුසු නො වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සමාධි සමවැදීමෙහි දක්‍ෂ නො වෙයි. සමාධි සිටීරකිරීමෙහි දක්‍ෂ නො වේ. සමාධියෙන් නැගිටීමෙහි දක්‍ෂ නො වේ. සත්කාර කරන්නේ ද නො වෙයි. නිතර භාවිත කරන්නේ ද නො වේ. අපත්‍ය ක්‍රියා කරන්නේ ද වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්නාගත මහණ සමාධියෙහි බලවත්භාවයට පැමිණීමට අභව්‍ය වෙයි

මහණෙනි, කරුණු සයෙකින් සමන්නාගත මහණ සමාධියෙහි බලවද්-භාවයට පැමිණීමට භව්‍ය වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සමාධි සමාපත්ති කුශල වෙයි. සමාධි ස්ථිති කුශල වෙයි. සමාධි ව්‍යුත්ථාන කුශල වෙයි. සත්කාර කරණසුලු වෙයි. සතතභාවයෙන් කරණ සුලු වෙයි. සත්‍යප්‍රායකාරී වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් යුත් මහණ සමාධියෙහි බලවද්-භාවයට පැමිණීමට භව්‍ය වේ ය යි

6. 2. 2. 9

[ප්‍රථමධ්‍යාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

19 මහණෙනි, කරුණු සයක් නො පියා ප්‍රථමධ්‍යානයට එළඹ වසන්නට නො නිසි වෙයි. කවර සයෙක යත්:

කාමච්ඡන්ද ය, ව්‍යාපාද ය, ථිනමිද්ධ ය, උද්ධච්චකුක්කුච්ච ය, විචිකිච්ඡා ය, ඔහු විසින් ධ්‍යානප්‍රඥයෙන් කාමයන්හි ආදීනව යථාභූතයෙන් නො දක්නා ලද්දේ වෙයි.

මහණෙනි, මෙ කරුණු සය නො පියා ප්‍රථමධ්‍යානයට එළඹ වසන්නට අභව්‍ය වෙයි

මහණෙනි, කරුණු සයක් ප්‍රහීණ කොට ප්‍රථමධ්‍යානයට එළඹ වසන්-නට භව්‍ය වෙයි කවර සයෙක යත්:

කාමච්ඡන්ද ය, ව්‍යාපාද ය, ථිනමිද්ධ ය, උද්ධච්චකුක්කුච්ච ය, විචිකිච්ඡා ය ඔහු විසින් සම්‍යක්ප්‍රඥයෙන් කාමයන්හි ආදීනව යථාභූතයෙන් දක්නා ලද්දේ වෙයි. මහණෙනි මෙ කරුණු සය ප්‍රහීණ කොට ප්‍රථමධ්‍යානයට එළඹ වසන්නට භව්‍ය වේ යයි.

6. 2. 7. 10.

[දුතිය පඨමජ්ඣාන සුත්තං]

[සාවත්ථිනිදානං]

20 ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උප-සම්පජ්ජ විහරිතුං. කතමෙ ඡ:

කාමවිතක්කං, ව්‍යාපාදවිතක්කං, විහිංසාවිතක්කං, කාමසඤ්ඤං ව්‍යාපාදසඤ්ඤං, විහිංසාසඤ්ඤං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අප්පහාය අභබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං කතමෙ ඡ:

කාමවිතක්කං, ව්‍යාපාදවිතක්කං, විහිංසාවිතක්කං, කාමසඤ්ඤං ව්‍යාපාදසඤ්ඤං, විහිංසාසඤ්ඤං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුන්ති.

අනාගාමි වග්ගො දුතියො *

තස්සුද්දානං:

අනාගාමි අරහං මිත්තා සඞ්ගණිකාරාමදෙවතා
සමාධිසක්ඛිභබ්බං බලං තජ්ඣානා අපරෙ දුවෙති.[1]

* දෙවතාවග්ගො සත්තමො - මජසං, සීමු, අට්ඨකථා

1 අනාගාමී අරහං ච මිත්තා දෙවතා සතා ච ත
සක්ඛි බලතං ඣානං ච අපරෙ දුවෙපි වුත්ති - සීමු

## 6. 2 2. 10.

## [දුතිය පඨමජ්ඣාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

20 මහණෙනි, කරුණු සයක් ප්‍රහීණ නො කොට ප්‍රථමධ්‍යානයට පැමිණ වසන්නට අභව්‍ය වෙයි. කවර සයෙක යත්:

කාමවිතක්ක ය ව්‍යාපාදවිතක්ක ය විහිංසාවිතක්ක ය කාමසඤ්ඤ ය ව්‍යාපාදසඤ්ඤ ය විහිංසාසඤ්ඤ යි.

මහණෙනි, මේ කරුණු සය ප්‍රහීණ නොකොට ප්‍රථමධ්‍යානයට එළඹ වසන්නට අභව්‍ය වෙයි.

මහණෙනි, කරුණු සයක් ප්‍රහීණ කොට ප්‍රථමධ්‍යානයට එළඹ වසන් නට භව්‍ය වෙයි. කවර සයෙක යත්:

කාමවිතක්ක ය ව්‍යාපාදවිතක්ක ය විහිංසාවිතක්ක ය කාමසඤ්ඤ ය ව්‍යාපාදසඤ්ඤ ය විහිංසා සඤ්ඤ යි.

මහණෙනි, මේ කරුණු සය ප්‍රහීණ කොට ප්‍රථමධ්‍යානයට එළඹ වසන්නට භව්‍ය වේ යයි

අනාගාමි වර්ගය දෙ වැනි යි.

**එහි උද්දානය:**

අනාගාමිඵල සූත්‍රය, අරහත්තඵල සූත්‍රය, මිත්ත සූත්‍රය, සංගණිකාරාම සූත්‍රය, දෙවතා සූත්‍රය, සමාධි සූත්‍රය, සක්ඛිභබ්බ සූත්‍රය, බල සූත්‍රය, පඨමජ්ඣාන සූත්‍රය, දුතියපඨමජ්ඣාන සූත්‍රය යි, සූත්‍ර දශයෙකි.

Free Distribution www.aathaapi.org

# 3. අරහත්ත වග්ගො.

## 6. 2. 3. 1.

### [දුක්ඛ සුත්තං]

[සාවත්ථි නිදානං]

**21** ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සඋපායාසං සපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා. කතමෙහි ඡහි:

කාමවිතක්කෙන, ව්‍යාපාදවිතක්කෙන, විහිංසාවිතක්කෙන, කාමසඤ්ඤාය, ව්‍යාපාදසඤ්ඤාය, විහිංසාසඤ්ඤාය

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සඋපායාසං සපරිළාහං, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා. කතමෙහි ඡහි:

නෙක්ඛම්මවිතක්කෙන, අව්‍යාපාදවිතක්කෙන, අවිහිංසාවිතක්කෙන, නෙක්ඛම්මසඤ්ඤාය, අව්‍යාපාදසඤ්ඤාය, අවිහිංසාසඤ්ඤාය.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං, කායස්ස භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛාති.

## 6. 2. 3. 2.

### [අරහත්ත සුත්තං]

[සාවත්ථි නිදානං]

**22**. ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං. කතමෙ ඡ:

මානං, ඔමානං, අතිමානං, අධිමානං, ථම්භං, අතිනිපාත .

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුං, කතමෙ ඡ.

මාන , ඔමානං, අතිමානං, අධිමානං, ථම්භං, අතිනිපාතං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුන්ති.

# 3. අරහත්ත වර්ගය

## 6. 2. 3. 1

### [දුක්ඛ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

21. මහණෙනි, කරුණු සයෙකින් සමන්විත මහණ ඉහාත්මයෙහි ම පීඩා සහිත, උපායාස සහිත, පරිදාහ සහිත දුකෙන් වෙසෙයි. කාබුත් මරණින් මතුයෙහි දුගතිය කැමැති විය යුතු. කවර සයෙකින යත්:

කාමවිතර්කයෙන, ව්‍යාපාදවිතර්කයෙන, විහිංසාවිතර්කයෙන, කාමසංඥායෙන, ව්‍යාපාදසංඥයෙන, විහිංසාසංඥයෙනැ යි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්විත මහණ ඉහාත්මයෙහි විඝාත (උපද්‍රව) සහිත, උපායාස (දැඩි ආයාස) සහිත, පරිදාහ (කායික මානසික දැවිලි) සහිත දුඃඛයෙන් වෙසෙයි. කාබුත් මරණින් මත්තෙහි දුර්ගතිය කැමැති විය යුතු.

මහණෙනි, කරුණු සයෙකින් සමන්විත මහණ ඉහාත්මයෙහි ම පීඩා රහිත, උපායාස රහිත, පරිදාහ රහිත සුඛයෙන් වෙසෙයි. කාබුත් මරණින් මත්තෙහි සුගතිය කැමැති විය යුතු. කවර සයෙකින යත්:

නෛෂ්ක්‍රම්‍යවිතර්කයෙන, අව්‍යාපාදවිතර්කයෙන, අවිහිංසාවිතර්කයෙන, නෛෂ්ක්‍රම්‍යසංඥයෙන, අව්‍යාපාදසංඥයෙන, අවිහිංසාසංඥයෙනැ යි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්විත මහණ ඉහාත්මයෙහි ම විඝාත රහිත, උපායාස රහිත, පරිදාහ රහිත සුඛයෙන් වාසය කරයි. කාබුත් මරණින් මතුයෙහි සුගතිය කැමැති විය යුතු ය යි.

## 6. 2. 3. 2

### [අරහත්ත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

22. මහණෙනි, කරුණු සයක් නො පහා අර්හත්වය සාක්ෂාත් කරන්නට අභව්‍ය වෙයි. කවර සයක යත්:

මාන ය (ජාති ආදීන් හගින මානය), ඕමාන ය (මම හීනවෙමියි යන මානය), අතිමාන ය (ඉතා උසස් මානය), අධිමාන ය (අනධිගතය අධිගතය යන මානය), ථම්භ (ක්‍රෝධ මාන දෙකින් තදබව) ය, අතිනිපාත ය (හීනයාටත් හීනවෙමි යන මාන) යි.

මහණෙනි, මෙ කරුණු සය නො පහා අර්හත්වය සාක්ෂාත් කරන්නට නො හිසි වේ.

මහණෙනි, ධර්ම සයක් ප්‍රහීණ කොට අර්හත්වය සාක්ෂාත් කරන්නට භව්‍ය වෙයි. කවර සයෙක යත්:

මාන ය ඕමාන ය අතිමාන ය අධිමාන ය ථම්භ ය අතිනිපාත ය යි.

මහණෙනි, මෙ ධර්ම සය ප්‍රහීණ කොට අර්හත්වය සාක්ෂාත් කරන්නට භව්‍ය වෙයි.

6. 2. 3. 3.

## [උත්තරිමනුස්සධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

23. ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො උත්තරිමනුස්සධම්මා[1] අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකාතුං. කතමෙ ඡ:

මුට්ඨස්සච්චං,[2] අසම්පජඤ්ඤං, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතං, භොජනෙ අමත්තඤ්ඤුතං, කුහනං, ලපනං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අප්පහාය අභබ්බො උත්තරිමනුස්සධම්මා[1] අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකාතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො උත්තරිමනුස්සධම්මා[1] අලමරිය-ඤාණදස්සනවිසෙසං සච්ඡිකාතුං. කතමෙ ඡ:

මුට්ඨස්සච්චං,[2] අසම්පජඤ්ඤං, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතං, භොජනෙ අමත්තඤ්ඤුතං, කුහනං, ලපනං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො උත්තරිමනුස්සධම්මා[1] අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකාතුන්ති.

6. 2. 3. 4.

## [සුඛසොමනස්ස සුත්තං]

[සාවත්ථිනිදානං]

24. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්සබහුලො විහරති, යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයාය. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මාරාමො හොති, භාවනාරාමො හොති, පහානාරාමො හොති, පවිවෙකාරාමො හොති, අබ්‍යාපජ්ඣාරාමො හොති, නිප්පපඤ්චාරාමො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්සබහුලො විහරති, යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයායා'ති.

6. 2. 3. 5.

## [අධිගම සුත්තං]

[සාවත්ථිනිදානං]

25. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනධි-ගතං වා කුසලං ධම්මං අධිගන්තුං, අධිගතං වා කුසලං ධම්මං ඵාතිකාතුං. කතමෙහි ඡහි:

---

1 උත්තරි මනුස්ස ධම්මං - මජසං, 2 මුට්ඨස්සච්චං - මජසං

### 6. 2. 3. 3

### [උත්තරිමනුස්සධම්ම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

23. මහණෙනි, ධර්ම සයක් ප්‍රහීණ නො කොට මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්‍යයභාවය ගෙණදීමට සමත් ඥානදර්ශන විශෙෂය පසක් කරන්නට අභව්‍ය වෙයි. කවර සයක යත්:

මුලාසිහි ඇති බව ය, විමසුම් නුවණ නැති බව ය, ඉඳුරන්හි නො පියූ දොර ඇති බව ය, බොජුන්හි පමණ නො දන්නා බව ය, කොහොන් වත් ය, (සිවුපස සඳහා අනුන් උස් හෝ පාත් හෝ කොට කරණ කථා නමැති) ලපනා යි.

මහණෙනි, ධර්ම සයක් ප්‍රහීණ කොට උත්තරිමනුෂ්‍යධර්මයෙන් ආර්‍යය-භාවකරණයට සමත් ඥානදර්ශනවිශෙෂය පසක් කරන්නට භව්‍ය වෙයි. කවර සයෙක යත්:

මුලාසිහි ඇති බව ය විමසුම් නුවණ නැති බව ය ඉඳුරන්හි පියූ දොර ඇති බව ය භොජනයෙහි පමණ නොදන්න බව ය කුහනා ය ලපනා යි

මහණෙනි, මෙ දහම් සය පහා මිනිස්දමින් මතුයෙහි ආර්‍යයභාව-කරණයට සමත් ඥානදර්ශන විශෙෂය පසක් කිරීමට භව්‍ය වේ ය යි.

### 6. 2. 3. 4

### [සුඛසොමනස්ස සූත්‍රය]

[සැවැත්නිදාන යි]

24. මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ දිට්ඨධර්මයෙහි ම සුවසොම්නස් බහුල කොට ඇති ව වෙසෙයි. ඔහු විසින් ආස්‍රවයන්ගේ ක්‍ෂයය සඳහා කාරණය ද (පරිපූර්ණ කොට) අරබනලද වේ ය යි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ධර්මාරාම (ධර්මයෙහි ඇලුනේ) වෙයි. භාවනාරාම (භාවනායෙහි ඇලුනේ) වෙයි. ප්‍රහාණාරාම (කෙලෙස් පහකිරීමෙහි ඇලුනේ) වෙයි. ප්‍රවිවෙකාරාම (කායචිත්තඋපධි විවෙකයෙහි ඇලුනේ) වෙයි. අව්‍යාපජ්ඣාරාම වෙයි. නිෂ්ප්‍රපඤ්චාරාම (නිවනෙහි ඇලුනේ) වෙයි.

මහණෙනි, මෙ දම් සයෙන් යුත් මහණ දිට්ඨධර්මයෙහි ම සුව සොම්නස් බිහිලි කොට වෙසෙයි. ආස්‍රවක්‍ෂයය පිණිස කාරණය ද (පරිපූර්ණ කොට) අරබන ලද වේ ය යි.

### 6. 2. 3. 5

### [අධිගම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

25. මහණෙනි, කරුණු සයෙකින් යුත් මහණ නො ලද අධිකුශල ධර්මය ලබන්නට හෝ ලද කුශලධර්මය වඩන්නට හෝ අභව්‍ය වෙයි. කවර සයෙකින යත්:

ඉධ භික්ඛවෙ භික්ඛු න ආයකුසලො හොති, න අපායකුසලො හොති, න උපායකුසලො හොති, අනධිගතානං කුසලානං ධම්මානං අධිගමාය න ඡන්දං ජනෙති, අධිගතෙ කුසලෙ ධම්මෙ න සාරක්ඛති,[1] සාතච්චකිරියාය න සම්පාදෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං අධිගතං වා කුසලං ධම්මං ඵාතිකත්තුං.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං, අධිගතං වා කුසලං ධම්මං ඵාතිකත්තුං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ආයකුසලො ච හොති, අපායකුසලො ච හොති, උපායකුසලො ච හොති, අනධිගතානං කුසලානං ධම්මානං අධිගමාය ඡන්දං ජනෙති, අධිගතෙ කුසලෙ ධම්මෙ සාරක්ඛති[2], සාතච්චකිරියාය සම්පාදෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං, අධිගතං වා කුසලං ධම්මං ඵාතිකත්තුන්ති.

6. 2. 3. 6.

[මහන්තත්ත සුත්තං]

[සාවත්ථිනිදාන ]

26. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති ධම්මෙසු. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ආලොකබහුලො ච හොති, යොගබහුලො ච හොති, වෙදබහුලො ච හොති, අසන්තුට්ඨිබහුලො ච හොති, අනික්ඛිත්තධුරො ච කුසලෙසු ධම්මෙසු, උත්තරිඤ්ච[3] පතාරෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති ධම්මෙසූ'ති.

6. 2. 3. 7.

[පඨමනිරය සුත්තං]

[සාවත්ථිනිදානං]

27. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි ඡහි:

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පාපිච්ඡො ච, මිච්ඡාදිට්ඨි ච.

1. න ආරක්ඛති - මජසං. 2. ආරක්ඛති - මජසං. 3. උත්තරිංච - මජසං.

මහණෙනි, මේ සස්නෙහි මහණ ආගමන (අයෙහි) කුශල නො වෙයි. අපගමන (වැයෙහි) කුශල නො වෙයි, උපායකුශල නො වෙයි. නො ලත් කුසල්දහම්හුන්ගේ අධිගමය (ලැබීම) පිණිස සාතච්චකාමතාකුසලච්ඡන්දය නො උපදවයි. අධිගත කුශල ධර්මයන් නො රක්නේ වෙයි. සාතත්‍ය (නිරන්තර) ක්‍රියායෙන් කුසල් දහම් නො සපයන්නේ වෙයි.

මහණෙනි, මේ ධර්ම සයෙන් සමන්‍වාගත මහණ නො ලත් කුශලධර්මය ලබන්නට හෝ ලද කුශලධර්මය වඩන්නට හෝ අභව්‍ය වෙයි.

මහණෙනි, කරුණු සයෙකින් සමන්‍වාගත මහණ නො ලද කුශලධර්මය ලබන්නට හෝ ලද කුශලධර්මය වඩන්නට හෝ භව්‍ය වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මේ සස්නෙහි මහණ ආයකුශල ද වෙයි, අපායකුශල ද වෙයි, උපායකුශල ද වෙයි, අනධිගත කුශලධර්මයන්ගේ අධිගමය සඳහා ඡන්දය උපදවයි, අධිගත කුශල ධර්මයන් රක්නේ වෙයි, සාතත්‍යක්‍රියායෙන් සපයන්නේ වෙයි.

මහණෙනි, මේ ධර්ම සයෙන් සමන්‍වාගත මහණ නො ලත් කුසල්දහම් ලබන්නට ද ලත් කුසල්දහම් වඩන්නට ද භව්‍ය වන්නේ ය යි.

## 6. 2. 3. 6

## [මහන්තත්ත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

26. මහණෙනි, කරුණු සයෙකින් සමන්‍වාගත මහණ නො බෝකලෙ-කින් ම ධර්මයන්හි මහද්භාවයට විපුලභාවයට පැමිණේ. කවර සයෙකින යත්:

මහණෙනි, මේ සස්නෙහි මහණ ඥානාලෝක බහුල කොට ඇතියේ වෙයි, භාවනානුයොග බහුල කොට ඇතියේ වෙයි, ප්‍රීතිප්‍රාමෝද්‍ය බහුල කොට ඇතියේ වෙයි, කුශලධර්මයන්හි අසන්තුෂ්ටි (නො සෑහීම) බහුල කොට ඇතියේ වෙයි, කුශලධර්මයන්හි නො බහාතැබූ (අත් නො හළ) වීර්‍ය්‍යය ඇතියේ වෙයි, දුනුදු මතුයෙහිද වීර්‍ය්‍යය කෙරේ මැ ය.

මහණෙනි, මේ දහම් සයෙන් සමන්‍වාගත මහණ නො බෝකලෙකින් ම ධර්මයන්හි මහත්වයට විපුලත්වයට පැමිණේ ය යි

## 6. 2. 3 7

## [පඨම නිරය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

27. මහණෙනි, කරුණු සයෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබුවක් යම්සේ නම් එ සේයින් නිරයෙහි (උපදනේ) වෙයි. කවර සයෙකින යත්:

පණිවා කරණුයේ වෙයි, අයිනාදන් ඇතියේ වෙයි, කාමයෙහි මිසහසර ඇතියේ වෙයි, මුසවා කියන සුලුයේ වෙයි, ලමු ආසා ඇතියේ වෙයි, මිසදිටු ඇතියේ වෙයි.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි ඡහි:

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, අප්පිච්ඡො ච සම්මාදිට්ඨි ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.

### 6. 2. 3. 8.

### [දුතියනිරය සුත්තං]

[සාවත්ථිනිදානං]

28. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි ඡහි:

මුසාවාදී හොති, පිසුණවාචො හොති, ඵරුසාවාචො හොති, සම්ඵප්පලාපී හොති, ලුද්ධො ච පගබ්භො ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ'ති.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ, කතමෙහි ඡහි:

මුසාවාදා පටිවිරතො හොති පිසුණාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අලුද්ධො ච අප්පගබ්භො ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

### 6. 2. 3. 9

### [අග්ගධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

29. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අග්ගං ධම්මං අරහත්තං සච්ඡිකාතුං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තාපී[1] හොති, කුසීතො හොති, දුප්පඤ්ඤො හොති, කායෙ ච ජීවිතෙ ච සාපෙක්ඛො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අග්ගං ධම්මං අරහත්තං සච්ඡිකාතුං.

1 අනොත්තප්පී - මජසං

මහණෙනි, මේ සකරුණෙන් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ නම් එ සෙයින් නිරයෙහි උපදනේ වෙයි.

මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහාතැබූයේ යම්සේ නම් එසෙයින් ස්වර්ගයෙහි පිහිටියේ වෙයි. කවර සයෙකින යත්:

ප්‍රාණිවධයෙන් වැළැකියේ වෙයි, අයිනාදනින් වැළැකියේ වෙයි, කාමයෙහි මිසහසරින් වැළැකියේ වෙයි, මුසාවාදයෙන් වැළැකියේ වෙයි, අල්පෙච්ඡ වෙයි, සම්‍යග්දෘෂ්ටි ඇතියේ වෙයි.

මහණෙනි, මේ කරුණු සයෙන් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ නම් එසෙයින් ස්වර්ගයෙහි පිහිටියේ වේ යයි.

6. 2. 3. 8

[දුතිය නිරය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

28. මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තබනලද්දේ යම්සේ නම් එසේ නිරයෙහි වෙයි. කවර සයෙකින යත්:

මුසාවා බණනුයේ වෙයි, පිසුනුබස් ඇතියේ වෙයි, පරොස්බස් ඇතියේ වෙයි, පලප් බණනුයේ වෙයි, ලුබ්ධ (ලොභී) වෙයි, ප්‍රගල්භ (අවිනීත) ද වේ යි.

මහණෙනි, මේ කරුණු සයෙන් සමන්වාගත වූයේ ගෙණෙන ලද්දක් බහාතැබූ සෙයින් නිරයෙහි වේ යයි.

මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ නම්, එසෙයින් ස්වර්ගයෙහි පිහිටියේ වෙයි කවර සයෙකින යත්:

මුසාවායෙන් වැළකියේ වෙයි, පිසුනුබසින් වැළැකියේ වෙයි, පරොස්-බසින් වැළැකියේ වෙයි, සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි, අලුබ්ධ වෙයි, ප්‍රගල්භ නො වෙයි.

මහණෙනි, මේ කරුණු සයින් සමන්වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ නම් එසෙයින් ස්වර්ගයෙහි වේ යයි.

6. 2. 3. 9.

[අග්ගධම්ම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

29. මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ අග්‍රධර්මය වන අර්හත්වය පසක් කරන්නට අභව්‍ය වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මේ සස්නෙහි මහණ සැදැහැ නැතියේ වෙයි, හිරි නැතියේ වෙයි, ඔතප් නැතියේ වෙයි, කුසීත වෙයි, දුෂ්ප්‍රාඥ (ප්‍රඥ නැතියේ) වෙයි, කයෙහි ද දිවියෙහි ද සාපෙක්ෂ (ආසා ඇතියේ) වෙයි.

මහණෙනි, මේ කරුණු සයෙන් යුක්ත මහණ අග්‍රධර්ම සඞ්ඛ්‍යාත අර්හත්වය පසක් කරන්නට අභව්‍ය වෙයි.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අග්ගං ධම්මං අරහත්තං සච්ඡිකාතුං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති, හිරිමා හොති, ඔත්තාපී[1] හොති, ආරද්ධවිරියො හොති, පඤ්ඤවා හොති, කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛො[2] හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අග්ගං ධම්මං අරහත්තං සච්ඡිකාතුන්ති.

6. 2. 3. 10.

[රත්තිදිවස සුත්තං]

[සාවත්ථිනිදානං]

80. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු මහිච්ඡො හොති විඝාතවා අසන්තුට්ඨො ඉතරීතර-චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, අස්සද්ධො හොති, දුස්සීලො හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො පරිහානි. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු න මහිච්ඡො හොති න විඝාතවා සන්තුට්ඨො ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, සද්ධො හොති, සීලවා හොති, ආරද්ධවිරියො හොති, සතිමා හොති, පඤ්ඤවා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො පරිහානී'ති.

අරහත්තවග්ගො තතියො.*

තස්සුද්දානං:

දුක්ඛං අරහත්තං උත්තරිඤ්ච සුඛං අධිගමෙන ච
මහන්තත්තං ද්වයනිරයෙ අග්ගධම්මඤ්ච රත්තියො'ති.[1]

---

1 ඔත්තප්පී - මජසං. 2 අනපෙක්ඛො - මජසං.

* අරහත්තවග්ගො අට්ඨමො - පාලි, අට්ඨකථා, මජසං.

1 දුක්ඛං අරහත්තං උත්තරී ච සුඛං අධිගමෙන ච
මහත්තත්තං ද්වයං නිරයෙ අග්ගධම්මඤ්ච රත්තියො'ති - මජසං.

මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ අග්‍රධර්ම සංඛ්‍යාත අර්හත්වය සාක්ෂාත් කරන්නට භව්‍ය වෙයි. කවර සයෙකින ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සැදැහැ ඇතියේ වෙයි, හිරි ඇතියේ වෙයි, ඔතප් ඇතියේ වෙයි, රුකුළු වැර ඇතියේ වෙයි, ප්‍රඥා ඇතියේ වෙයි. කයෙහිදු දිවියෙහිදු අපෙක්ෂා නැතියේ වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්වාගත මහණ අග්‍රධර්ම සංඛ්‍යාත අර්හත්වය සාක්ෂාත් කරන්නට භව්‍ය වේ යයි.

### 6. 2. 3. 10

### [රත්තිදිවස සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**80.** මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත භික්ෂුහට යම් මැ රාත්‍රියක් වේවයි දවසෙක් වේවයි පැමිණේ නම් කුශලධර්මයන්හි හානියක් මැ මුත් වෘද්ධියෙක් කැමැති නො විය යුතු ය. කවර සයෙකින ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඉතරේතර (ලදදේ යම්කිසි) චීවර-පිණ්ඩපාතශයනාසනගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙන් නො සතුටු වූයේ මහෙච්ඡ වූයේ (මහෙච්ඡාවෙන් උපන් ලොභයෙන්) දුඃඛිත වෙයි, ශ්‍රද්ධා නැතියේ වෙයි, දුශ්ශීල වෙයි, කුසීත වෙයි, නට සිහි ඇතියේ වෙයි, දුෂ්ප්‍රාඥ වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්වාගත මහණහට යම් මැ රාත්‍රියක් වේවයි දවසෙක් වේවයි පැමිණේ නම් කුශලධර්මයන්හි හානියෙක් මැ කැමැති විය යුතු යි. වෘද්ධියෙක් නො වේ.

මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණහට යම් මැ රාත්‍රියක් වේවයි දවසෙක් වේවයි පැමිණේ නම් කුශලධර්මයන්හි වෘද්ධියක් මැ මුත් හානියෙක් නො කැමැති වියයුතු. කවර සයෙකින ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ මහෙච්ඡ නො වූයේ ඉතරේතරචීවර-පිණ්ඩපාතශයනාසනගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙන් සන්තුෂ්ට වූයේ දුඃඛිත නො වෙයි, සැදැහැතියේ වෙයි, සිල්වත් වෙයි, රුකුළු වැර ඇතියේ වෙයි, සමෘති ඇතියේ වෙයි, ප්‍රඥාවත් වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්වාගත මහණහට යම් මැ රාත්‍රියක් වේවයි, දවසෙක් වේවයි පැමිණේ නම්, කුශලධර්මයන්හි හානියෙක් නො වෙයි, වෘද්ධියෙක් මැ වේ.

අරහත්තවර්ගය තෙවැනි යි.

එහි උද්දානය:

දුක්ඛ සූත්‍රය, අරහත්ත සූත්‍රය, උත්තරිමනුස්සධම්ම සූත්‍රය, සුඛසෝමනස්ස සූත්‍රය, අධිගම සූත්‍රය, මහන්තත්ත සූත්‍රය, නිරය සූත්‍ර දෙක ය, අග්ගධම්ම සූත්‍රය, රත්තිදිවස සූත්‍රය දැයි දශයෙකි.

## 4. සීති වග්ගො

### 6. 2. 4. 1

### [සීතිභාව සුත්තං]

[සාවත්ථිනිදානං]

**81**. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනුත්තරං සීතිභාවං සච්ඡිකාතුං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං, තස්මිං සමයෙ චිත්තං න නිග්ගණ්හාති. යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං, තස්මිං සමයෙ චිත්තං න පග්ගණ්හාති. යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං, තස්මිං සමයෙ චිත්තං න සම්පහංසති, යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං, තස්මිං සමයෙ චිත්තං න අජ්ඣුපෙක්ඛති. හීනාධිමුත්තිකො ච හොති සක්කායාභිරතො ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනුත්තරං සීතිභාවං සච්ඡිකාතුං.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනුත්තරං සීතිභාවං සච්ඡිකාතුං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං, තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හාති. යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං, තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති. යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං, තස්මිං සමයෙ චිත්තං සම්පහංසති. යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං, තස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛති. පණීතාධිමුත්තිකො ච හොති නිබ්බානාභිරතො ච

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනුත්තරං සීතිභාවං සච්ඡිකාතුන්ති.

### 6. 2. 4. 2

### [ආවරණ සුත්තං]

[සාවත්ථිනිදානං]

**82** ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි ඡහි:

කම්මාවරණතාය සමන්නාගතො හොති, කිලෙසාවරණතාය සමන්නාගතො හොති, විපාකාවරණතාය සමන්නාගතො හොති, අස්සද්ධො ච හොති අච්ඡන්දිකො ච දුප්පඤ්ඤො ච.

# 4. සීති වර්ගය

## 6. 2. 4. 1.

## සීතිභාව සූත්‍රය

[සැවැත්නිදාන යි]

**81.** මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ අනුත්තර ශීතලභාවය (නිවණ හෝ ක්ලේශජාතව්‍යුපශමය) ප්‍රත්‍යක්ෂ කරන්නට නො පොහොසත් වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ, යම්කලෙක්හි සිත නිග්‍රහ කළ (සමාධියෙන් දැමිය) යුතු වේ නම් ඒකාලයෙහි සිත නො නිගන්නේ ය. යම් කලෙක්හි සිත ප්‍රග්‍රහ (වීර්‍ය්‍යයෙන් උත්සාහවත්) කටයුතු වේ නම්, එ සමයෙහි සිත නංවා නො ගන්නේ ය. යම් සමයෙක්හි සිත මොනොවට (සමාධියෙන්) පහන් කටයුතු වේ නම් එ සමයෙහි සිත සම්ප්‍රහර්ෂණ නො කරන්නේ ය යම් සමයෙක්හි සිත අධ්‍යුපෙක්ෂණය (උපේක්ෂාවෙන් මධ්‍යස්ථ) කටයුතු වේ නම් එ සමයෙහි සිත අධ්‍යුපේක්ෂණ නො කරන්නේ ය. හීනාධිමුක්ති (ලාමු අදහස්) ඇතියේ ද වෙයි. සත්කායදෘෂ්ටියෙහි අභිරත වූයේ ද වෙයි.

මහණෙනි, මෙ සකරුණෙන් සමන්වාගත මහණ අනුත්තර සීතිභාවය සාක්ෂාත් කරන්නට අභව්‍ය වෙයි.

මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත මහණ අනුත්තර සීතිභාවය සාක්ෂාත් කරන්නට නිසි වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ යම් කලෙක්හි චිත්තය නිග්‍රහ කටයුතු වේ නම්, එසමයෙහි චිත්තය නිග්‍රහ කෙරෙයි. යම්කලෙක්හි චිත්තය ප්‍රග්‍රහිතව්‍ය වේ නම්, එසමයෙහි චිත්තය ප්‍රග්‍රහ කෙරෙයි. යම් කලෙක්හි චිත්තය සම්ප්‍රහර්ෂයට නිසි වේ නම්, එ සමයෙහි චිත්තය සම්ප්‍රහර්ෂ කෙරෙයි. යම් කලෙක්හි චිත්තය අධ්‍යුපෙක්ෂණීය වේ නම් එ සමයෙහි චිත්තය අධ්‍යුපෙක්ෂා කෙරෙයි, ප්‍රණීතාධිමුක්ති (උතුම් අදහස්) ඇතියේ ද වෙයි. නිර්වාණයෙහි අභිරත ද වේ.

මහණෙනි, මෙ සකරුණෙන් සමන්වාගත මහණ අනුත්තර සීතිභාවය සාක්ෂාත් කරන්නට භව්‍ය වෙයි.

## 6. 2. 4. 2.

## [ආවරණ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**82.** මහණෙනි, සකරුණෙකින් සමන්වාගත වූයේ සද්ධර්මය අසනුයේ කුශලධර්මයන්හි සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත නියාමයට (මාර්ගයට) බස්නට අභව්‍ය වෙයි. කවර සකරුණෙන යත්:

(පඤ්චානන්තර්‍ය්‍යකර්‍ම සඞ්ඛ්‍යාත) කර්‍මාවරණතාවයෙන් සමන්වාගත වෙයි, (නියතමිථ්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත) ක්ලේශාවරණයෙන් සමන්වාගත වෙයි (අකුසලවිපාකපටිසන්ධි හෝ කුසලවිපාකාහෙතුක ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත) විපාකාවරණයෙන් සමන්වාගත වෙයි, ශ්‍රද්ධා නැතියේත් වෙයි, කත්තුකාමතාකුසලච්ඡන්ද නැතියේ ද වෙයි, දුෂ්ප්‍රාඥ ද වෙයි.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි ඡහි:

න කම්මාවරණතාය සමන්නාගතො හොති, න කිලෙසාවරණතාය සමන්නාගතො හොති, න විපාකාවරණතාය සමන්නාගතො හොති, සද්ධො ච හොති, ඡන්දිකො ච පඤ්ඤවා ච.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

### 6. 2. 4. 3

### [වොරොපිත සුත්තං]

[සාවත්ථිනිදානං]

**88.** ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි ඡහි:

මාතා ජීවිතා වොරොපිතා හොති, පිතා ජීවිතා වොරොපිතො හොති අරහං ජීවිතා වොරොපිතො හොති, තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදිතං හොති, සඞ්ඝො භින්නො හොති, දුප්පඤ්ඤො හොති ජළො එළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි ඡහි:

න මාතා ජීවිතා වොරොපිතා හොති, න පිතා ජීවිතා වොරොපිතො හොති, න අරහං ජීවිතා වොරොපිතො හොති, න තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදිතං හොති, න සඞ්ඝො භින්නො හොති, පඤ්ඤවා හොති අජළො අනෙළමූගො.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තන්ති.

මහණෙනි, මේ සකරුණෙන් සමන්වාගත වූයේ සදහම් අසන්නේ නමුදු කුශලධර්මයන්හි සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත මාර්ග නියාමයට බස්නට අභව්‍ය වෙයි.

මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත වූයේ සද්ධර්මය අසන්නේ මැ කුශලධර්මයන්හි සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත මාර්ගනියාමයට බස්නට භව්‍ය වෙයි. කවර සයෙකින යත්.

කර්මාවරණතායෙන් සමන්වාගත නො වෙයි, ක්ලෙශාවරණතායෙන් සමන්වාගත නො වෙයි, විපාකාවරණතායෙන් සමන්වාගත නො වෙයි, ශ්‍රද්ධා ඇතියේ වෙයි, කත්තුකාමතාකුසලච්ඡන්දයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥා ඇතියේ වෙයි.

මහණෙනි, මෙ සකරුණින් සමන්වාගත වූයේ සද්ධර්මය අසන්නේ මැ කුශලධර්මයන්හි සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත මාර්ග නියාමයට බස්නට භව්‍ය වෙයි.

## 6. 2. 4. 3

## [වොරොපිත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

88. මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත වූයේ සදහම් අසන්නේ නමුදු කුශලධර්මයන්හි සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට අභව්‍ය වෙයි. කවර සයෙකින යත්:

මව දිවියෙන් ගැලවූයේ වෙයි, පියා දිවියෙන් ගැලවූයේ වෙයි, රහතුන් දිවියෙන් ගැලවූයේ වෙයි, දුෂ්ටචිත්තයෙන් තථාගතයන්ගේ ශරීරයෙහි ලෙහෙ උපදවනලද වෙයි, සඟහු බිඳුවනලද වෙත්, ජඩ වූයේ කෙලතොලු වූයේ දුෂ්ප්‍රාඥ වෙයි.

මහණෙනි, මෙ කරුණු සයෙන් සමන්වාගත වූයේ සදහම් අසනුයේ ද කුශලධර්මයන්හි සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට නො නිසියේ වේ.

මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත වූයේ සද්ධර්මය අසනුයේ මැ කුශලධර්මයන්හි සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත නියාමයට බස්නට භව්‍ය වෙයි. කවර සයෙකින යත්:

මව දිවියෙන් නො ගැලවූයේ වෙයි, පියා දිවියෙන් නො ගැලවූයේ වෙයි, රහතුන් දිවියෙන් නො ගැලවූයේ වෙයි, දුෂ්ටචිත්තයෙන් තථාගත-යන්ගේ ලෝහිත නො උපදවනලද වෙයි, සඟහු නො බිඳුවනලද වෙති, ජඩ නො වූයේ කෙලතොලු නො වූයේ ප්‍රඥවත් වේ.

මහණෙනි, මෙ කරුණු සයින් සමන්වාගත වූයේ සදහම් අසන්නේ මැ කුශලධර්මයන්හි සම්‍යක්ත්වය සඞ්ඛ්‍යාත නියාමයට බස්නට භව්‍ය වේ ය යි.

## 6. 2. 4. 4.

### [සුස්සූසති සුත්තං]

[සාවත්ථිනිදානං]

34. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි ඡහි

තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ න සුස්සූසති, න සොතං ඔදහති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති,[1] අනත්ථං ගණ්හාති, අත්ථං රිඤ්චති, අනනුලොමිකාය ඛන්තියා සමන්නාගතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං අභබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. කතමෙහි ඡහි:

තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ සුස්සූසති, සොතං ඔදහති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙති,[1] අත්ථං ගණ්හාති, අනත්ථං රිඤ්චති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො සුණන්තොපි සද්ධම්මං භබ්බො නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තන්ති.

## 6. 2. 4. 5.

### [අප්පහාය සුත්තං]

[සාවත්ථිනිදානං]

35. ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො දිට්ඨිසම්පදං සච්ඡිකාතුං. කතමෙ ඡ:

සක්කාය දිට්ඨිං, විචිකිච්ඡං, සීලබ්බතපරාමාසං, අපායගමනීයං රාගං, අපායගමනීයං දොසං, අපායගමනීයං මොහං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අප්පහාය අභබ්බො දිට්ඨිසම්පදං සච්ඡිකාතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො දිට්ඨිසම්පදං සච්ඡිකාතුං. කතමෙ ඡ:

සක්කායදිට්ඨිං, විචිකිච්ඡං, සීලබ්බතපරාමාසං, අපායගාමනීයං රාගං, අපායගමනීයං දොසං, අපායගමනීයං මොහං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො දිට්ඨිසම්පදං සච්ඡිකාතුන්ති.

---

1 උපට්ඨාපෙති - මජසං

## 6. 2. 4. 4.

## [සුස්සූසති සූත්‍රය]

[සැවැත්නිදාන යි]

84. මහණෙනි, ධර්‍ම සයෙකින් සමන්‍වාගත වූයේ සද්ධර්‍මය අසන්නේ නමුදු කුශලධර්‍මයන්හි සම්‍යක්ත්‍ව සංඛ්‍යාත නියාමයට බස්නට අභව්‍ය වෙයි. කවර සයෙකින යත්:

තථාගතයන් විසින් ප්‍රවේදිත වූ ධර්‍මය දෙසනුලබන් මැ නො අසනු කැමැතියේ වෙයි, කන් යොමු නො කෙරෙයි, දැනගැණුමට සිත නො එළවයි, අනර්‍ථය ගන්නේ ය, අර්‍ථය බැහැර ලන්නේ ය, ශාසනයට අනනුලොම ක්‍ෂාන්තියෙන් (ධර්‍මවිනාශයෙන්) සමන්‍වාගත වෙයි.

මහණෙනි, මෙ සකරුණෙන් සමන්‍වාගත වූයේ සද්ධර්‍මය අසන්නේ නමුදු කුශලධර්‍මයන්හි සම්‍යක්ත්‍ව නැමැති නියාමයට බස්නට නො නිසි වෙයි.

මහණෙනි, සකරුණෙකින් සමන්‍වාගත වූයේ සද්ධර්‍මය අසන්නේ මැ කුශලධර්‍මයන්හි සම්‍යක්ත්‍ව නැමැති නියාමයට බස්නට නිසි වෙයි. කවර සයෙකින යත්:

තථාගතයන් විසින් ප්‍රවේදිත වූ ධර්‍මවිනය දෙසනු ලබන් මැ අසනු කැමැති වෙයි, ඇසීමට කන් යොමු කෙරෙයි, දැනගැණීමට සිත් එළවයි, අර්‍ථය ගන්නේ ය, අනර්‍ථය හරණේය, ශාසනයට අනුලොම් වූ ක්‍ෂාන්තියෙන් සමන්‍වාගත වෙයි.

මහණෙනි, මෙ කරුණු සයින් සමන්‍වාගත වූයේ සදහම් අසන්නේ මැ කුශලධර්‍මයන්හි සම්‍යක්ත්‍ව නැමැති නියාමයට භව්‍ය වේ යයි.

## 6. 2. 4. 5.

## [අප්පහාය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

85 මහණෙනි, කරුණු සයක් නො දුරලා, දෘෂ්ටිසම්පත් (සොවන්මග) පසක් කරන්නට නො නිසි වෙයි. කවර සයෙක යත්:

සක්කායදිට්ඨි ය, විචිකිච්ඡා ය, සීලබ්බත පරාමාස ය, අපායගමනීය රාගය, අපායගමනීය දෙ‍ෂ ය, අපායගමනීය මොහයි.

මහණෙනි, මෙ කරුණු සය නො දුරලා දෘෂ්ටිසම්පත් සාක්‍ෂාත් කරන්නට නො නිසි වෙයි.

මහණෙනි, ධර්‍ම සයක් දුරු කොට දිට්ඨිසම්පදා පසක් කරන්නට නිසි වෙයි. කවර සයෙක යත්:

සක්කායදිට්ඨි ය, විචිකිච්ඡා ය, සීලබ්බතපරාමාස ය, අපායගමනීය රාග ය, අපායගමනීය දෙ‍ෂ ය, අපායගමනීය මොහ ය යි.

මහණෙනි, මෙ කරුණු සය දුරු කොට දෘෂ්ටිසම්පත් සාක්‍ෂාත් කරන්නට නිසි වේ යයි.

## 6. 2. 4. 6

### [පහීණ සුත්තං]

[සාවත්ථිනිදානං]

36. ඡයිමෙ භික්ඛවෙ ධම්මා දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීණා. කතමෙ ඡ:

සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො, අපායගමනීයො රාගො, අපායගමනීයො දොසො, අපායගමනීයො මොහො.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මා දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීණාති.

## 6. 2. 4. 7

### [අභබ්බ සුත්තං]

[සාවත්ථිනිදානං]

37. ඡ භික්ඛවෙ ධම්මෙ අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො උප්පාදෙතුං. කතමෙ ඡ:

සක්කායදිට්ඨිං, විචිකිච්ඡං, සීලබ්බතපරාමාසං, අපායගමනීයං රාගං, අපායගමනීයං දොසං, අපායගමනීයං මොහං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො උප්පාදෙතුන්ති.

## 6. 2. 4. 8

### [අභබ්බට්ඨාන සුත්තං]

[සාවත්ථිනිදානං]

38. ඡයිමානි භික්ඛවෙ අභබ්බට්ඨානානි, කතමානි ඡ:

අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සත්ථරි අගාරවො විහරිතුං අප්පතිස්සො, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො ධම්මෙ අගාරවො විහරිතුං අප්පතිස්සො, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සඞ්ඝෙ අගාරවො විහරිතුං අප්පතිස්සො, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සික්ඛාය අගාරවො විහරිතුං අප්පතිස්සො, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අනාගමනීයං වත්ථුං පච්චාගන්තුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අට්ඨමං භවං නිබ්බත්තෙතුං.

ඉමානි ඛො භික්ඛවෙ ඡ අභබ්බට්ඨානානීති.

## 6. 2. 4. 9

### [දුතිය අභබ්බට්ඨාන සුත්තං]

[සාවත්ථිනිදානං]

39. ඡයිමානි භික්ඛවෙ අභබ්බට්ඨානානි. කතමානි ඡ:

අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගන්තුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං සුඛතො උපගන්තුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි ධම්මං අත්තතො උපගන්තුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො ආනන්තරියකම්මං කාතුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො කොතුහලමඞ්ගලෙන සුද්ධිං පච්චාගන්තුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො ඉතො බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසිතුං.

ඉමානි ඛො භික්ඛවෙ ඡ අභබ්බට්ඨානානීති.

## 6. 2. 4. 6.

### [පහීණ සූත්‍රය]

[සැවැත් නිදාන යි]

86. මහණෙනි, දිට්ඨිසම්පන්න (සෝවාන්) පුද්ගලයා ගේ මේ දහම් සය ප්‍රහීණ ය. කවර සයෙක යත්:

සක්කායදිට්ඨි ය, විචිකිච්ඡා ය, සීලබ්බතපරාමාස ය, අපායගමනීය රාග ය, අපායගමනීය දෙස ය, අපායගමනීය මොහ යි.

මහණෙනි, මේ දහම් සය දිට්ඨිසම්පන්න පුහුල්හට ප්‍රහීණ යි.

## 6. 2. 4. 7.

### [අභබ්බ සූත්‍රය]

[සැවැත් නිදාන යි]

87. මහණෙනි, දිට්ඨිසපන් පුහුල් (සෝවාන් පුද්ගල) කරුණු සයක් උපදවන්නට අභව්‍ය වෙයි. කවර සයෙක යත්:

සක්කාය දිට්ඨි ය, විචිකිච්ඡා ය, සීලබ්බතපරාමාස ය, අපායගමනීය-රාග ය, අපායගමනීය දෙස ය, අපායගාමනීය මොහ ය යි.

මහණෙනි, දිට්ඨිසපන් පුහුල් මේ කරුණු සය උපදවන්නට නො-පොහොසත් වේ ය යි

## 6. 2. 4. 8.

### [අභබ්බට්ඨාන සූත්‍රය]

[සැවැත් නිදාන යි]

88. මහණෙනි, මේ අභව්‍යස්ථාන සයෙකි. කවර සයෙක යත්:

දෘෂ්ටිසම්පන්න පුද්ගල ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල ධර්මය කෙරෙහි අගෞරව ඇති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටි-සම්පන්න පුද්ගල සඟුන් කෙරෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල ශික්ෂායෙහි ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වසන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල අනාගමනීය (පඤ්චවෛර-ආසටඨිදිට්ඨි යන) කරුණට ප්‍රත්‍යාගමන (ආපසු පැමිණීම) කරන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල (කාමාවචර භූමියෙහි) අෂ්ටම භවයක් උපදවන්නට නො තිසි වෙයි.

මහණෙනි, මේ අභව්‍යස්ථාන සය යි.

## 6. 2. 4. 9

### [දුතිය අභබ්බට්ඨාන සූත්‍රය]

[සැවැත් නිදාන යි]

89. මහණෙනි, මේ අභව්‍යස්ථාන සයෙකි. කවර සයෙක යත්:

දෘෂ්ටිසම්පන්න පුද්ගල කිසි සංස්කාරයක් නිත්‍ය වසයින් පිළිගන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල කිසි සංස්කාරයක් සුඛ වසයින් පිළිගන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල කිසි ධර්මයක් ආත්ම වසයින් ගන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල ආනන්තර්‍ය්‍යකර්ම කරන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල (දිට්ඨ සුත මුත සඞ්ඛ්‍යාත) කෞතුහල-මඞ්ගලයෙන් ශුද්ධිය කරා හැරීමට (පිරිසුදුබව පිළිගැනීමට) අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල මේ සස්නෙන් බැහැර දක්ෂිණාර්හයකු සොයන්නට අභව්‍ය වෙයි.

මහණෙනි, මේ අභව්‍යස්ථාන සය යි.

## 6. 2. 4. 10

### [තතිය අභබ්බට්ඨාන සුත්තං]

[සාවත්ථිනිදානං]

**40.** ඡයිමානි භික්ඛවෙ අභබ්බට්ඨානානි. කතමානි ඡ:

අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො මාතරං ජීවිතා වොරොපෙතුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො පිතරං ජීවිතා වොරොපෙතුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අරහන්තං ජීවිතා වොරොපෙතුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදෙතුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සඞ්ඝං භින්දිතුං, අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අඤ්ඤං සත්ථාරං උද්දිසිතුං.

ඉමානි ඛො භික්ඛවෙ ඡ අභබ්බට්ඨානානීති

## 6. 2. 4. 11

### [චතුත්ථ අභබ්බට්ඨාන සුත්තං*]

[සාවත්ථිනිදානං]

**41.** ඡයිමානි භික්ඛවෙ අභබ්බට්ඨානානි. කතමානි ඡ:

අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සයංකතං සුඛදුක්ඛං පච්චාගන්තුං. අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො පරංකතං සුඛදුක්ඛං පච්චාගන්තුං. අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සයංකතඤ්ච පරංකතඤ්ච සුඛදුක්ඛං පච්චාගන්තුං. අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අසයංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පච්චාගන්තුං. අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පච්චාගන්තුං. අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අසයංකාරඤ්ච අපරංකාරඤ්ච අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං පච්චාගන්තුං. තං කිස්ස හෙතු:

තථා හිස්ස භික්ඛවෙ දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස හෙතු ච සුදිට්ඨො, හෙතුසමුප්පන්නා ච ධම්මා.

ඉමානි ඛො භික්ඛවෙ ඡ අභබ්බට්ඨානානීති.

**සීතිවග්ගො චතුත්ථො.[1]**

**තස්සුද්දානං:**

සීතිභාවං ආවරණං වොරොපිතා සුස්සූසති
අප්පහාය පහීණ'භබ්බො තිට්ඨානා චතුරොපි චාති

---

* අට්ඨකථායං පන ඉදං දසමසුත්තවසෙන දිස්සතෙ

1 සීතිවග්ගො සමත්තො - පාළි, අට්ඨකථා, ඡජං.

1. සීතිභබ්බා ආවරණතා සුස්සූසා පවුච්චති
පහාතබ්බං පහීණා ච උප්පාදෙතබ්බං සත්ථරි
සක්කච්චසංඛාරං මාතරි සයංකතෙන වග්ගොති. සී මු

## 6. 2. 4. 10.

## [තතිය අභබ්බට්ඨාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

40. මහණෙනි, මේ අභව්‍යස්ථාන සයෙකි. කවර සයෙක යත්:

දෘෂ්ටිසම්පන්න පුද්ගල මව දිවියෙන් ගළවන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල පියා දිවියෙන් ගළවන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල රහතුන් දිවියෙන් ගළවන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල දුෂ්ටචිත්තයෙන් තථාගතයන්ගේ ශරීරයෙන් ලෙහෙ උපදවන්නට අභව්‍ය වෙයි, දෘෂ්ටිසම්පන්න පුද්ගල සඞ්ඝයා බිඳුවන්නට අභව්‍ය වෙයි

මහණෙනි, මේ අභව්‍යස්ථාන සය යි.

## 6. 2. 4. 11.

## [චතුත්ථ අභබ්බට්ඨාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

41. මහණෙනි, මේ අභව්‍යස්ථාන සයෙකි. කවර සයෙක යත්:

"දෘෂ්ටිසම්පන්න (සොවන්) පුද්ගල තෙම ස්වයංකෘත (තමා විසින් කරණ ලදැයි ආත්මවාදීන් කියන) සුඛදුඃඛ (නිත්‍ය ශුභ ආත්ම විසින් පිළිගන්නට අභව්‍ය වෙයි.) දෘෂ්ටිසම්පන්න පුද්ගල පරකෘත (පරා විසින් කරණ ලදැයි කියන) සුඛ දුඃඛ පිළිගන්නට අභව්‍ය වෙයි. දෘෂ්ටිසම්පන්න පුද්ගල ස්වයංකෘත වූත් පරකෘත වූත් සුඛදුඃඛ පිළිගන්නට අභව්‍ය වෙයි. දෘෂ්ටිසම්පන්න පුද්ගල අස්වයංකාර වූ අධිත්‍යසමුත්පන්න (හෙතු රහිතව උපන්) සුඛදුඃඛ පිළිගන්නට අභව්‍ය වෙයි. දෘෂ්ටිසම්පන්න පුද්ගල අපරංකාර වූ අධිත්‍යසමුත්පන්න සුඛදුඃඛ පිළිගන්නට අභව්‍ය වෙයි. දෘෂ්ටිසම්පන්න පුද්ගල අස්වයංකාර වූ ද අපරංකාර වූ ද අධිත්‍යසමුත්පන්න සුඛදුඃඛ පිළිගන්නට අභව්‍ය වෙයි.

එ කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයෙකින් එ දෘෂ්ටිසම්පන්න පුද්ගලයා විසින් හෙතුව ද හෙතුසමුත්පන්න ධර්මයෝ ද මොනොවට දක්නා ලද්දාහු ද, එහෙයිනි.

මහණෙනි, මේ අභව්‍යස්ථාන සය යි.

**සීතිවර්ගය සතර වැනි යි.**

**එහි උද්දානය:**

සීතිභාව සූත්‍රය, ආවරණ සූත්‍රය, වොරොපිත සූත්‍රය, සුස්සූසති සූත්‍රය, අප්පහාය සූත්‍රය, පහීණ සූත්‍රය, අභබ්බ සූත්‍රය, පඨම, දුතිය, තතිය, චතුත්ථ අභබ්බට්ඨාන සූත්‍රයෝ දැයි සූත්‍ර එකොළොසෙකි.

# 5. ආනිසංස වග්ගො

### 6. 2. 5. 1

### [පාතුභාව සුත්තං]

[සාවත්ථි නිදානං]

**42**. ඡන්නං භික්ඛවෙ පාතුභාවො දුල්ලභො ලොකස්මිං, කතමෙසං ඡන්නං:

තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං, තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසෙතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං, අරියායතනෙ පච්චාජාති දුල්ලභා[1] ලොකස්මිං, ඉන්ද්‍රියානං අවෙකල්ලතා දුල්ලභා ලොකස්මිං, අජළතා අනෙළමූගතා දුල්ලභා ලොකස්මිං, කුසලධම්මච්ඡන්දො[2] දුල්ලභො ලොකස්මිං.

ඉමෙසං ඛො භික්ඛවෙ ඡන්නං පාතුභාවො දුල්ලභො ලොකස්මින්ති.

### 6. 2. 5. 2

### [ආනිසංස සුත්තං]

[සාවත්ථි නිදානං]

**43**. ඡයිමෙ භික්ඛවෙ ආනිසංසා සොතාපත්තිඵලසච්ඡිකිරියාය. කතමෙ ඡ:

සද්ධම්මනියතො හොති, අපරිහානධම්මො හොති, පරියන්තකතස්ස දුක්ඛං න හොති,[3] අසාධාරණෙන ඤාණෙන සමන්නාගතො හොති, හෙතු චස්ස සුදිට්ඨො, හෙතුසමුප්පන්නා ච ධම්මා.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ආනිසංසා සොතාපත්තිඵලසච්ඡිකිරියායා'ති.

### 6 2. 5. 3

### [අනිච්ච සුත්තං]

[සාවත්ථි නිදානං]

**44**. සො වත භික්ඛවෙ භික්ඛු කඤ්චි සඞ්ඛාරං නිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතී'ති නෙතං ඨානං විජ්ජති. අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතී'ති නෙතං ඨානං විජ්ජති. සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු සබ්බසඞ්ඛාරං[4] අනිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතී'ති ඨානමෙතං විජ්ජති. අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති. සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

---

1 පච්චාජාතො දුල්ලභො - සයා 2 කුසලධම්මච්ඡන්දො - මජසං

3 පරියන්තකතස්ස දුක්ඛං හොති - මජසං. 4 සබ්බසඞ්ඛාරෙ - මජසං

## 5. ආනිසංස වර්ගය

### 6. 2. 5. 1.

### [පාතුභාව සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**42.** මහණෙනි, සදෙනකුන්ගේ පහළවීම ලොව්හි දුර්ලභ වෙයි. කවර සදෙනකුන්ගේ ය යත්:

තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන්ගේ පහළවීම ලොව්හි දුර්ලභ වෙයි, තථාගතප්‍රවේදිත ධර්ම විනය දෙසන පුද්ගල ලොව්හි දුර්ලභ වෙයි, ආර්යාය-තනයෙහි (මධ්‍යමදේශයෙහි) ඉපැද්ම ලොව්හි දුර්ලභ වෙයි, ලොව්හි ඉන්ද්‍රියයන්ගේ අවිකලභාවය දුර්ලභ වෙයි, ලොව්හි අජඩතා හා අනෙලමූ-ගත්ව දුර්ලභ වෙයි, ලොව්හි කුශලධර්මච්ඡන්දය දුර්ලභ වෙයි.

මහණෙනි, මේ සදෙනාගේ පහළවීම දුර්ලභ වෙයි.

### 6. 2. 5. 2.

[සැවැත්නිදාන යි]

**43.** මහණෙනි, ස්‍රොතාපත්තිඵල සාක්ෂාත්ක්‍රියායෙහි මේ අනුසස් සයෙකි. කවර සයෙක ය යත්:

ශාසන සද්ධර්මයෙහි නියත වෙයි, නො පිරිහෙන සැහැවි ඇති යේ වෙයි. කෙළවර කරණලද කෙලෙස් පිළිබඳ දුක් (නැවැත) නො වෙයි, (පුහුදුන් හා) අසාධාරණඥානයෙන් සමන්වාගත වෙයි, ඔහු විසින් හෙතු ද මොනොවට දක්නාලද්දේ වේ, හේතු සමුත්පන්නධර්මයෝ ද මොනොවට දක්නාලදහ.

මහණෙනි, ස්‍රොතාපත්තිඵල සාක්ෂාත්ක්‍රියායෙහි මේ අනුසස් සය යි.

### 6. 2. 5. 3

### [අනිච්ච සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**44** මහණෙනි, ඒ මහණ කිසිදු සංස්කාරයක් නිත්‍යවශයෙන් බලන්නේ අනුලොමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ ය’’ යන තෙල කරුණ විද්‍යමාන නො වේ. අනුලොමික ක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ සම්‍යක්ත්ව නියාමයට නො බස්නේ සෝවාන්ඵල වේවයි සෙදගැමිඵල වේවයි අනාගැමිඵල වේවයි රහත්ඵල වේවයි පසක් කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

මහණෙනි, ඒ මහණ එකැතින් සර්වසංස්කාරයන් අනිත්‍ය විසින් දක්නේ, අනුලොමික ක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි, අනුලොමික ක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්ව නියාමයට බස්නේය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝතාපත්තිඵලය හෝ සකෘදාගාමිඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ පසක් කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ යයි.

## 6. 2. 5. 4

### [දුක්ඛ සුත්තං]

[සාවත්ථිනිදානං]

45. සො වත භික්ඛවෙ භික්ඛු කඤ්චි සඞ්ඛාරං සුඛතො සමනුපස්සන්තො -පෙ- නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු සබ්බසඞ්ඛාරං දුක්ඛතො සමනුපස්සන්තො -පෙ- ඨානමෙතං විජ්ජති.

## 6. 2. 5. 5

### [අනත්ත සුත්තං]

[සාවත්ථිනිදානං]

46. සො වත භික්ඛවෙ භික්ඛු කඤ්චි ධම්මං අත්තතො සමනුපස්සන්තො -පෙ- නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු සබ්බධම්මං[1] අනත්තතො සමනුපස්සන්තො -පෙ- ඨානමෙතං විජ්ජති.

## 6. 2. 10. 6

### [නිබ්බාන සුත්තං]

[සාවත්ථිනිදානං]

47. සො වත භික්ඛවෙ භික්ඛු නිබ්බානං දුක්ඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතී'ති නෙතං ඨානං විජ්ජති. අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති. සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු නිබ්බානං සුඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති. අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතී'ති ඨානමෙතං විජ්ජති. සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතී'ති ඨානමෙතං විජ්ජතීති.

## 6. 2. 5. 7

### [අනවත්ථිත සුත්තං]

[සාවත්ථිනිදානං]

48. ඡ භික්ඛවෙ ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනිච්චසඤ්ඤං උපට්ඨාපෙතුං. කතමෙ ඡ:

සබ්බසඞ්ඛාරා ච මෙ අනවට්ඨිතතො[2] ඛායිස්සන්ති, සබ්බලොකෙ ච මෙ මනො නාභිරමිස්සති, සබ්බලොකා ච මෙ මනො වුට්ඨහිස්සති, නිබ්බානපොණං ච මෙ මානසං භවිස්සති, සංයොජනා ච මෙ පහානං ගච්ඡන්ති[3], පරමෙන ච සාමඤ්ඤෙන සමන්නාගතො භවිස්සතීති.[4]

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනිච්චසඤ්ඤං උපට්ඨාපෙතුන්ති.

1 සබ්බධම්මෙ - මජසං. 2 අනවත්ථිතා - මජසං. 3 ගච්ඡිස්සන්ති - මජසං.
4 භවිස්සාමීති - මජසං.

6. 2. 5. 4.

[දුක්ඛ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

45. මහණෙනි, ඒ මහණ එකැතින් කිසි සංස්කාරයක් සුඛ විසින් දක්නේ .. තෙල කරුණ විද්‍යමාන නො වේ.

ඒ මහණ එකැතින් සව් සංස්කාරයන් දුඃඛ විසින් දක්නේ ... තෙල කරුණ විද්‍යමාන වේ යයි.

6. 2. 5. 5.

[අනාත්ම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

46. මහණෙනි, ඒ මහණ එකැතින් කිසි ධර්මයක් ආත්මවශයෙන් දක්නේ ... තෙල කරුණ විද්‍යමාන නො වේ.

ඒ මහණ එකැතින් සව් ධර්මයන් අනාත්ම විසින් දක්නේ ... තෙල කරුණ විද්‍යමාන වේ යයි.

6. 2. 5. 6.

[නිබ්බාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

47. මහණෙනි, එකැතින් ඒ මහණ නිර්වාණය දුඃඛ විසින් දක්මින් අනුලෝමිකක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. අනුලෝමිකක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාමයට බසනේය යන තෙල කරුණ විද්‍යමාන නොවේ. සම්‍යක්ත්වනියාමයට නො බස්මින් සෝතාපත්තිඵලය වේවයි සකෘදාගාමි-ඵලය වේවයි අනාගාමි ඵලය වේවයි අර්හත්ඵලය වේවයි සාක්ෂාත් කරන්-නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

මහණෙනි, ඒ මහණ එකැතින් නිර්වාණය සුඛ විසින් දක්නේ අනු-ලෝමිකක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. අනුලෝමිකක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ ය යන තෙලකරුණ විද්‍යමාන වෙයි. සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝතා-පත්තිඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත්ඵලය හෝ සාක්ෂාත් කරන්නේය යන තෙල කරුණ විද්‍යමාන වේ ය යි.

6. 2. 5. 7.

[අනවත්ථිත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

48. මහණෙනි, අනුසස් සයක් මොනොවට දක්නා මහණහු විසින් සර්වසංස්කාරයන්හි මර්‍යාදා (කොටස්) රහිත කොට අනිත්‍යසංඥාව සිත්හි එළවා ගන්නට නිසි වේ මැ යි. කවර සයෙක යත්:

හැම සංස්කාරයෝ අනවස්ථිත (ස්ථාන භෙද රහිත ව බිඳෙනසුලු) සෙයින් මට වැටහෙත්, (ස්කන්ධ සංඛ්‍යාත) හැම ලොව්හිදු මාගේ සිත නො ඇලෙන්-නේ ය, මාගේ සිත සකල ත්‍රෛධාතුක ලෝකයෙන් ද නැඟ සිටුනේ ය, මාගේ චිත්තය නිර්වාණයට නැඹුරු වන්නේ ය, මාගේ සංයොජනයෝ ද ප්‍රහාණයට යන්නාහ, උත්තම ශ්‍රමණභාවයෙන් (ආර්‍ය මාර්ගයෙන්) සමන්වාගත ද වන්නේ ය.

මහණෙනි, මේ අනුසස් සය මැනැවින් දක්නා මහණහු විසින් හැම සංස්කාරයන්හි මර්‍යාදා රහිත කොට අනිත්‍යසංඥාව එළවන්නට සුදුසු ය යි.

### 6. 2. 5. 8

### [උක්ඛිත්තාසික සුත්තං]

[සාවත්ථිනිදානං]

**49.** ඡ භික්ඛවෙ ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා දුක්ඛසඤ්ඤං උපට්ඨාපෙතුං. කතමෙ ඡ.

සබ්බසඞ්ඛාරෙසු ච මෙ නිබ්බිදසඤ්ඤා[1] පච්චුපට්ඨිතා භවිස්සති සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ. සබ්බලොකා ච මෙ මනො වුට්ඨහිස්සති. නිබ්බාණෙ ච සන්තදස්සාවී භවිස්සාමි. අනුසයා ච මෙ සමුග්ඝාතං ගච්ඡන්ති. කිච්චකාරී ච භවිස්සාමි. සත්ථා ච මෙ පරිචිණ්ණො භවිස්සති මෙත්තාවතායාති.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා දුක්ඛසඤ්ඤං උපට්ඨාපෙතුන්ති.

### 6. 2. 5. 9

### [අතම්මය සුත්තං]

[සාවත්ථිනිදානං]

**50.** ඡ භික්ඛවෙ ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු[2] අනොධිං කරිත්වා අනත්තසඤ්ඤං උපට්ඨාපෙතුං කතමෙ ඡ:

සබ්බලොකෙ ච අතම්මයො භවිස්සාමි. අහඞ්කාරා[3] ච මෙ උපරුජ්ඣිස්සන්ති. මමඞ්කාරා[4] ච මෙ උපරුජ්ඣිස්සන්ති. අසාධාරණෙන ච ඤාණෙන සමන්නාගතො භවිස්සාමි. හෙතු ච මෙ සුදිට්ඨො භවිස්සති, හෙතුසමුප්පන්නා ච ධම්මා.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනත්තසඤ්ඤං උපට්ඨාපෙතුන්ති.

### 6. 2. 5. 10

### [භව සුත්තං]

[සාවත්ථිනිදානං]

**51.** තයො මෙ භික්ඛවෙ භවා පහාතබ්බා. තීසු සික්ඛාසු සික්ඛිතබ්බං. කතමෙ තයො භවා පහාතබ්බා:

කාමභවො, රූපභවො, අරූපභවො, ඉමෙ තයො භවා පහාතබ්බා.

කතමාසු තීසු සික්ඛාසු සික්ඛිතබ්බං:

අධිසීලසික්ඛාය, අධිචිත්තසික්ඛාය, අධිපඤ්ඤාසික්ඛාය, ඉමාසු තීසු සික්ඛාසු සික්ඛිතබ්බං.

1 නිබ්බානසඤ්ඤා - සීමු 2 සබ්බධම්මෙසු - මජ්ඣං 3 අහඞ්කාරා - සනව
4 මමඞ්කාරා - සනව

## 6. 2. 5. 8.

## [උක්ඛිත්තාසික සූත්‍රය]

[සැවැත් නිදාන යි]

49. මහණෙනි, අනුසස් සයක් මැනැවින් දක්නා මහණහු විසින් සර්වසංස්කාරයන්හි මර්‍යාද රහිත කොට දුඃඛසංඥාව එළවන්නට නිසි මැ යි. කවර සයෙක යත්:

ඔසොවාගත් අසිපත් ඇති වධකයා කෙරෙහි මෙන් සර්වසංස්කාරයන්හිදු මගේ නිර්වේදසංඥාව එළඹ සිටියේ වෙයි, සකල ත්‍රෛධාතුක ලෝකයෙන් මාගේ සිත ද නැඟ සිටුනේ ය, නිර්වාණයෙහි මැ ශාන්තභාවය දක්නෙම් වන්නෙමි, මාගේ අනුශයයෝ ද මුලුසුන් බවට යෙති, සිවුමඟ කරණී කරණ සුලු වන්නෙමි, ශාස්තෘහු ද මා විසින් මෛත්‍රීසහගිය පරිවරණයෙන් (වතින්) අරියකාලද්දහු වෙතියි.

මහණෙනි, මේ අනුසස් සය දක්නා මහණහු විසින් සර්වසංස්කාරයන්හි කොටස් විසින නො බෙද දුඃඛසංඥාව එළවන්නට වටනේ ය යි.

## 6. 2. 5. 9.

## [අතම්මය සූත්‍රය]

[සැවැත් නිදාන යි]

50. මහණෙනි, අනුසස් සයක් දක්නා මහණහු විසින් සර්වසංස්කාරයන්හි මර්‍යාද රහිත කොට අනාත්මසංඥාව එළවන්නට වටනේ ය. කවර සයෙකින යත්:

සර්වලෝකයෙහිදු (තෘෂ්ණා-දිට්ඨි සඞ්ඛ්‍යාත) තම්මය නැතියෙම් වන්නෙමි. මගේ (මාන සඞ්ඛ්‍යාත) අහඞ්කාරදෘෂ්ටීහු ද උපරෝධයට (ආවරණයට) යන්නාහ. මාගේ මමඞ්කාර සඞ්ඛ්‍යාත තෘෂ්ණාවෝ ද උපරුද්ධ වන්නාහ. අසාධාරණ වූ (පුහුදුන් හා සාධාරණ නො වූ) ඥානයෙනුදු සමන්වාගත වන්නෙමි. හෙතුව ද මා විසින් මොනොවට දක්නා ලද වෙයි හේතුයෙන් උපන් එලධර්මයෝ ද මොනොවට දක්නාලදහු වෙති.

මහණෙනි, මේ අනුසස් සය මැනැවින් දක්නා මහණහු විසින් සර්වසංස්කාරයෙහි සීමා නො කොට අනාත්මසංඥාව එළවන්නට නිසි වේ යයි.

## 6. 2. 5. 10.

## [භව සූත්‍රය]

[සැවැත් නිදාන යි]

51. මහණෙනි, මේ භවයෝ තිදෙනෙක් ප්‍රහාතව්‍ය වෙත්. ශික්ෂා-ත්‍රයෙක්හි හික්මියයුතු වෙයි.

කවර තුන් භවයෝ පැහිය යුතු වෙත් දැ යත්:

කාමභවය, රූපභවය, අරූපභව යි. මේ තුන් භවයෝ පැහියයුතු වෙත්.

කවර ශික්ෂාත්‍රයෙක හික්මිය යුතු ද යත්:

අධිශීලශික්ෂායෙහි ය, අධිචිත්තශික්ෂායෙහි ය, අධිප්‍රඥශික්ෂායෙහි යි. මේ ශික්ෂාත්‍රයෙහි හික්මිය යුතු යි.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛුනො ඉමෙ තයො භවා පහීනා හොන්ති, ඉමාසු ච තීසු සික්ඛාසු සික්ඛිතසික්ඛො හොති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි[1] සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

6. 2. 5. 11

[තණ්හා සුත්තං]

[සංවණ්ණිතිදානං]

52. තිස්සො ඉමා භික්ඛවෙ තණ්හා පහාතබ්බා, තයො ච මානා.

කතමා තිස්සො තණ්හා පහාතබ්බා:

කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා, ඉමා තිස්සො තණ්හා පහාතබ්බා.

කතමෙ තයො මානා පහාතබ්බා:

මානො, ඔමානො, අතිමානො. ඉමෙ තයො මානා පහාතබ්බා.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛුනො ඉමා තිස්සො තණ්හා පහීනා හොන්ති, ඉමෙ ච තයො මානා, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

ආනිසංස වග්ගො පඤ්චමො.*

තස්සුද්දානං:

පාතුභාවො ආනිසංසො අනිච්ච දුක්ඛ අනත්තතො
නිබ්බානං අනවත්ථි උක්ඛිත්තාසි අතම්මයො
භවා තණ්හායෙනා දසාති. (මජ්සං.)

දුතියො පණ්ණාසකො සමත්තො

1 විවත්තයි - මජ්සං, සීමු.
* ආනිසංසවග්ගො දසමො - පාලි, අට්ඨකථා, මජ්සං, පණ්ණාසකාසඞ්ගහිතො වග්ගො - සීමු.
පාතුභාවො ආනිසංසො අනිච්චං දුක්ඛං අනත්තතො
නිබ්බානං තයො අනොධිසංවුත්තා භවතණ්හායෙ තෙ දසාති - සීමු.

මහණෙනි, යම් කලෙක මහණහුගේ මේ තුන් භවයෝ ප්‍රහීණ වෙත් නම්, (මහණ) මේ තුන් ශික්ෂායෙහි ශික්ෂිතශික්ෂ වේ නම්, මහණෙනි, එකල මේ මහණ තෘෂ්ණා සිඳී ය, සංයෝජන උපුටා හළේ ය, මනාකොට මානප්‍රහාණයෙන් (අභිසමාවබෝධයෙන්) වෘතතදුඃඛය අන්ත කෙළේ ය යි කියනු ලැබේ.

6. 2. 5. 11.

[තණ්හා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

62 මහණෙනි, මේ තෘෂ්ණාවෝ තිදෙනක් ද මානයෝ තිදෙනෙක් ද ප්‍රහාතව්‍ය වෙත්.

කවර තෘෂ්ණාවෝ තිදෙනෙක් ප්‍රහාතව්‍යයෝ වෙති යත්:

කාමතෘෂ්ණා ය, භවතෘෂ්ණා ය, විභවතෘෂ්ණා යි. මේ තුන්-තෘෂ්ණාවෝ පැහියයුතු වෙත්.

කවර මානයෝ තිදෙනෙක් ප්‍රහාතව්‍ය වෙති යත්:

මාන ය, අවමාන ය, අතිමාන යි. මේ තුන් මානයෝ ප්‍රහාතව්‍ය වෙත්.

මහණෙනි, යම් කලෙක භික්ෂුහුගේ මේ තෘෂ්ණාවෝ තුන්දෙන ප්‍රහීණ වෙත් ද, මේ මානයෝ තුන්දෙන ප්‍රහීණ වෙත් ද, මහණෙනි, එකල මේ මහණ තෘෂ්ණාව සිඳලී ය, සංයොජන උපුළේ ය, මනා කොට මානාභිසමයෙන් (අභිසමාවබොධයෙන්) වෘතතදුඃඛය කෙළවර කෙළේ යයි කියනු ලැබේ.

ආනිසංසවර්ගය පස්වැනි යි.

එහි උද්දානය:

පාතුභාව සූත්‍රය, ආනිසංස සූත්‍රය, අනිච්ච සූත්‍රය, දුක්ඛ සූත්‍රය, අනත්ත සූත්‍රය, නිබ්බාන සූත්‍රය, අනවත්‍ථිත සූත්‍රය, උක්ඛිත්තාසික සූත්‍රය, අතම්මය සූත්‍රය, භව සූත්‍රය, තණ්හා සූත්‍රය දැයි එකොළොසෙකි.

දෙවන පණ්ණාසකය නිමි.

# පණ්ණාසකාතිරෙක වග්ගො

## 1. තික වග්ගො

### 6. 1. 1

### [රාග සුත්තං]

[සාවත්ථි නිදානං]

1. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

රාගො, දොසො, මොහො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

රාගස්ස පහානාය අසුභා භාවෙතබ්බා. දොසස්ස පහානාය මෙත්තා භාවෙතබ්බා. මොහස්ස පහානාය පඤ්ඤා භාවෙතබ්බා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

### 6. 1. 2

### [දුච්චරිත සුත්තං]

[සාවත්ථි නිදානං]

2. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

කායදුච්චරිතස්ස පහානාය කායසුචරිතං භාවෙතබ්බං. වචීදුච්චරිතස්ස පහානාය වචීසුචරිතං භාවෙතබ්බං. මනොදුච්චරිතස්ස පහානාය මනොසුචරිතං භාවෙතබ්බං.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

### 6. 1. 3

### [විතක්ක සුත්තං]

[සාවත්ථි නිදානං]

3. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

කාමවිතක්කො, ව්‍යාපාදවිතක්කො, විහිංසාවිතක්කො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

# පණ්ණාසකාතිරේක වග්ගො

## 1. තික වර්ගය.

### 6. 1. 1.

### [රාග සූත්‍රය]

[සැවැත්නිදාන යි]

1. මහණෙනි, මේ ධර්මයෝ තිදෙනෙකි, කවර තිදෙනෙක යත්:

රාගය හා ද්වේෂය හා මෝහය හා යි. මහණෙනි, මේ ධර්මයෝ තිදෙන යි.

මහණෙනි, මේ තුන් දහමුන්ගේ ප්‍රහාණය සඳහා ධර්මයෝ තිදෙනෙක් වැඩියයුතු වෙත්. කවර තුන් දෙනෙක යත්:

රාගයාගේ ප්‍රහාණය පිණිස අශුභය වැඩියයුතු යැ, ද්වේෂයාගේ ප්‍රහාණය පිණිස මෛත්‍රිය වැඩිය යුතුයැ, මෝහයාගේ ප්‍රහාණය පිණිස ප්‍රඥව වැඩිය යුතු යි.

මහණෙනි, මේ තුන් දහමුන්ගේ ප්‍රහාණය පිණිස මෙතුන් දහම් වැඩිය යුතු යි.

### 6. 1. 2.

### [දුච්චරිත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

2. මහණෙනි, මේ ධර්මයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක යත්:

කායදුශ්චරිත ය, වචීදුශ්චරිතය, මනොදුශ්චරිතයි. මහණෙනි, මොහු තුන්ධර්මයෝ යි.

මහණෙනි, මේ ත්‍රිවිධ ධර්මයන්ගේ ප්‍රහාණය සඳහා ධර්මයෝ තිදෙනෙක් වැඩියයුතු වෙත්. කවර තිදෙනෙක යත්:

මහණෙනි, කායදුශ්චරිතයාගේ ප්‍රහාණය සඳහා කායසුචරිතය වැඩිය යුතු යැ, වාග්දුශ්චරිතයාගේ ප්‍රහාණය සඳහා වාක්සුචරිතය වැඩිය යුතු යැ, මනෝදුශ්චරිතයාගේ ප්‍රහාණය සඳහා මනෝසුචරිතය වැඩිය යුතු යි.

මහණෙනි, මේ තුන් දහමුන්ගේ ප්‍රහාණය සඳහා මේ තුන් ධර්මයෝ වැඩිය යුතු වෙත් යයි.

### 6. 1. 3.

### [විතක්ක සූත්‍රය]

[සැවැත්නිදාන යි]

3. මහණෙනි, මේ දහම්හු තුන්දෙනෙකි. කවර තුන්දෙනෙක යත්:

කාමවිතර්කය හා ව්‍යාපාදවිතර්කය හා විහිංසාවිතර්කය යි. මහණෙනි, මොහු තුන් ධර්මයෝ ය.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

කාමවිතක්කස්ස පහානාය නෙක්ඛම්මවිතක්කො භාවෙතබ්බො. ව්‍යාපාද-විතක්කස්ස පහානාය අව්‍යාපාදවිතක්කො භාවෙතබ්බො විහිංසාවිතක්කස්ස පහානාය අවිහිංසාවිතක්කො භාවෙතබ්බො.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

### 6. 1. 4

### [සඤ්ඤා සුත්තං]

[සාවත්ථිනිදානං]

4. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

කාමසඤ්ඤා, ව්‍යාපාදසඤ්ඤා, විහිංසාසඤ්ඤා. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

කාමසඤ්ඤාය පහානාය නෙක්ඛම්මසඤ්ඤා භාවෙතබ්බා ව්‍යාපාද-සඤ්ඤාය පහානාය අව්‍යාපාදසඤ්ඤා භාවෙතබ්බා විහිංසාසඤ්ඤාය පහානාය අවිහිංසාසඤ්ඤා භාවෙතබ්බා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

### 6. 1. 5

### [ධාතු සුත්තං]

[සාවත්ථිනිදානං]

5. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

කාමධාතු, ව්‍යාපාදධාතු, විහිංසාධාතු. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

කාමධාතුයා පහානාය නෙක්ඛම්මධාතු භාවෙතබ්බා. ව්‍යාපාදධාතුයා පහානාය අව්‍යාපාදධාතු භාවෙතබ්බා. විහිංසාධාතුයා පහානාය අවිහිංසාධාතු භාවෙතබ්බා

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

මහණෙනි, මේ තුන් දහම් පැහීමට තුන් දහමෙක් වැඩිය යුතුය. කවර තුනෙක යත්:

කාමවිතර්කයාගේ ප්‍රහාණය සඳහා නෛෂ්ක්‍රම්‍ය විතර්කය වැඩියයුතු, ව්‍යාපාද විතර්කයාගේ ප්‍රහාණය සඳහා අව්‍යාපාදවිතර්කය වැඩිය යුතු, විහිංසාවිතර්කයාගේ ප්‍රහාණය සඳහා අවිහි සාවිතර්කය වැඩිය යුතු යි

මහණෙනි, මෙ ත්‍රිවිධ ධර්ම ප්‍රහීණ කිරීමට මේ ධර්මත්‍රය වැඩිය යුතු යයි.

## 6. 1. 4.

## [සඤ්ඤා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

4. මහණෙනි, මෙ දහම් තුනෙකි. කවර තුනෙක යත්:

කාමසංඥා, ව්‍යාපාදසංඥා, විහිංසාසංඥා යි. මහණෙනි, මෙ දහම් තුන යි.

මහණෙනි, මෙ තුන් දහම් ප්‍රහීණ කිරීම් සඳහා ධර්ම තුනෙක් වැඩිය යුතු. කවර තුනෙක යත්:

කාමසංඥාවගේ ප්‍රහාණය සඳහා නෛෂ්ක්‍රම්‍යසංඥා වැඩියයුතු, ව්‍යාපාද-සංඥාවගේ ප්‍රහාණය සඳහා අව්‍යාපාද සංඥා වැඩිය යුතු, විහිංසාසංඥාවගේ ප්‍රහාණය සඳහා අවිහිංසාසංඥාව වැඩිය යුතු යි.

මහණෙනි, මෙ ධර්මයන් තුන්දෙනා ගේ ප්‍රහාණය සඳහා මේ තුන් දහම් වැඩියයුතු යයි.

## 6. 1. 5.

## [ධාතු සූත්‍රය]

[සැවැත්නිදාන යි]

5. මහණෙනි, මෙ ධර්මයෝ තුන්දෙනෙකි. කවර තුන්දෙනෙක යත්:

කාමධාතු හා ව්‍යාපාදධාතු හා විහිංසාධාතු යි. මහණෙනි, මෙ ධර්මයෝ තුන්දෙන යි.

මහණෙනි, මේ තුන්දහමුන්ගේ ප්‍රහාණය සඳහා දහම් තිදෙනෙක් වැඩිය යුතු ය. කවර තිදෙනෙක යත්:

කාමධාතුහුගේ ප්‍රහාණය සඳහා නෙක්ඛම්මධාතුව වැඩියයුතු යැ, ව්‍යාපාදධාතුහුගේ ප්‍රහාණය සඳහා අව්‍යාපාදධාතුව වැඩිය යුතු යැ, විහිංසාධාතුහුගේ ප්‍රහාණය සඳහා අවිහිංසාධාතුව වැඩිය යුතුයි.

මහණෙනි, මෙ දහම් තිදෙනාගේ ප්‍රහාණය සඳහා මේ දහම් තිදෙන වැඩිය යුත්තාහ යි,

## 6. 1. 6.

### [අස්සාද සුත්තං]

[සාවත්ථිනිදානං]

6. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

අස්සාදදිට්ඨි, අත්තානුදිට්ඨි, මිච්ඡාදිට්ඨි, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

අස්සාදදිට්ඨියා පහානාය අනිච්චසඤ්ඤා භාවෙතබ්බා. අත්තානුදිට්ඨියා පහානාය අනත්තසඤ්ඤා භාවෙතබ්බා. මිච්ඡාදිට්ඨියා පහානාය සම්මාදිට්ඨි භාවෙතබ්බා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

## 6. 1. 7.

### [අරති සුත්තං]

[සාවත්ථිනිදානං]

7. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

අරති, විහිංසා, අධම්මචරියා, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

අරතියා පහානාය මුදිතා භාවෙතබ්බා, විහිංසාය[1] පහානාය අවිහිංසා භාවෙතබ්බා. අධම්මචරියාය පහානාය ධම්මචරියා භාවෙතබ්බා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

## 6. 1. 8.

### [අසන්තුට්ඨි සුත්තං][2]

[සාවත්ථිනිදානං]

8. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

අසන්තුට්ඨිතා, අසම්පජඤ්ඤං, මහිච්ඡතා, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

අසන්තුට්ඨිතාය පහානාය සන්තුට්ඨිතා භාවෙතබ්බා. අසම්පජඤ්ඤස්ස පහානාය සම්පජඤ්ඤං භාවෙතබ්බං. මහිච්ඡතාය පහානාය අප්පිච්ඡතා භාවෙතබ්බා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

---

1. විහෙසාය - මජසං. 2. සන්තුට්ඨිසුත්තං - මජසං.

## 6. 1. 6

## [අස්සාද සූත්‍රය]

[සැවැත්නිදාන යි]

6. මහණෙනි, මේ දහම්හු තිදෙනෙකි. කවර තිදෙනෙක යත්:

ආස්වාද (ශාශ්වත) දෘෂ්ටිය හා ආත්මානු (සත්කාය) දෘෂ්ටිය හා මිථ්‍යාදෘෂ්ටි (දෙසැටමිසදිටු) යි. මහණෙනි, මේ දහම් තිදෙන ය.

මේ ධර්මයන් තිදෙන ප්‍රහීණ කරණු සඳහා ධර්මයෝ තිදෙනෙක් වැඩිය යුතු. කවර තිදෙනෙක යත්:

ආස්වාදදෘෂ්ටිහුගේ ප්‍රහාණය සඳහා අනිත්‍යසංඥා වැඩිය යුතු ය. ආත්මානුදෘෂ්ටිහුගේ ප්‍රහාණය සඳහා අනාත්මසංඥා වැඩිය යුතු යැ. මිථ්‍යාදෘෂ්ටිහුගේ ප්‍රහාණය සඳහා මාර්ග සම්‍යග්දෘෂ්ටිය වැඩිය යුතු යි.

මහණෙනි, මේ තුන් දහමුන්ගේ ප්‍රහාණය සඳහා මේ තුන් දහම්හු වැඩිය යුත්තාහ යි.

## 6. 1. 7.

## [අරති සූත්‍රය]

[සැවැත්නිදාන යි]

7. මහණෙනි, මේ දහම්හු තිදෙනෙකි. කවර තිදෙනෙක යත්:

අරති හා විහිංසා හා අධම්මචරියා යි. මහණෙනි, මේ දහම් තිදෙන ය.

මහණෙනි, මේ දහම් තුණ ප්‍රහීණ කිරීමට දහම් තුණක් වැඩිය යුතු. කවර තුණෙක යත්:

අරතිහුගේ ප්‍රහාණය සඳහා මුදිතා වැඩිය යුතු ය. විහිංසාවගේ ප්‍රහාණය සඳහා අවිහිංසාව වැඩිය යුතු ය අධර්මචර්‍ය්‍යාවගේ ප්‍රහාණය සඳහා ධර්මචර්‍ය්‍යාව වැඩියයුතු.

මහණෙනි, මේ දහම් තිදෙනගේ ප්‍රහාණය සඳහා මේ දහම් තිදෙන වැඩිය යුත්තාහ යි.

## 6. 1. 8.

## [අසන්තුට්ඨිතා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

8. මහණෙනි, මේ ධර්මයෝ තිදෙනෙකි කවර තිදෙනෙක යත්:

අසන්තුට්ඨිතා ය, අසම්පජඤ්ඤ ය, මහිච්ඡතා යි. මහණෙනි, මේ ධර්මයෝ තුන්දෙනා යි.

මහණෙනි, මේ දහම් තිදෙනාගේ ප්‍රහාණය සඳහා දහම් තිදෙනෙක් වැඩියයුත්තාහ. කවර තිදෙනෙක යත්:

අසන්තුෂ්ටියගේ ප්‍රහාණය පිණිස සන්තුෂ්ටිතාව වැඩියයුතු, අසම්ප්‍රජන්‍යයාගේ ප්‍රහාණය පිණිස සම්ප්‍රජන්‍යය වැඩියයුතු, මහෙච්ඡතාවගේ ප්‍රහාණය පිණිස අල්පෙච්ඡතාව (ඉච්ඡා නැතිබව) වැඩියයුතු.

මහණෙනි, මේ තුන් ධර්මයන් ප්‍රහීණ කිරීමට මේ තුන් ධර්මයෝ වැඩිය යුත්තාහ.

## 6. 1. 9.

### [දොවචස්සතා සුත්තං]

[සාවත්ථිනිදානං]

9. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

දොවචස්සතා, පාපමිත්තතා, චෙතසො වික්ඛෙපො, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

දොවචස්සතාය පහානාය සොවචස්සතා භාවෙතබ්බා පාපමිත්තතාය පහානාය කල්‍යාණමිත්තතා භාවෙතබ්බා, චෙතසො වික්ඛෙපස්ස පහානාය ආනාපානසති භාවෙතබ්බා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

## 6. 1. 10.

### [උද්ධච්ච සුත්තං]

[සාවත්ථිනිදානං]

10. තයො මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ තයො:

උද්ධච්චං, අසංවරො, පමාදො, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය තයො ධම්මා භාවෙතබ්බා. කතමෙ තයො:

උද්ධච්චස්ස පහානාය සමථො භාවෙතබ්බො. අසංවරස්ස පහානාය සංවරො භාවෙතබ්බො. පමාදස්ස පහානාය අප්පමාදො භාවෙතබ්බො.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං ධම්මානං පහානාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

**තික වග්ගො.**

තස්සුද්දානං:

රාගදුච්චරිත විතක්කසඤ්ඤා ධාතූති වුච්චති,
අස්සාද අරතිතුට්ඨි දොව ච උද්ධච්චෙන වග්ගො'ති[1]

---

1. දුච්ච උද්ධාවජ්ජන වග්ගොති - මජසං.

## 6. 1. 9.

## [දොවචස්සතා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

9. මහණෙනි, මෙ දහම් තුණෙකි. කවර තුණෙක යත්:

දොවචස්සතා ය, පාපමිත්‍රතා ය, චිත්තයාගේ විකෙෂප ය යි මහණෙනි, මෙ දහම් තුණ යි.

මහණෙනි, මෙ දහම් තුණ පහනු සඳහා දහම් තුණෙක් වැඩියයුතු කවර තුණෙක යත්:

දුර්වචභාවය දුරු කරණු සඳහා සුවචභාවය වැඩියයුතු, පවිටු මිතුරන් ඇතිබව ප්‍රහීණ කරණු සඳහා කල්‍යාණමිතුරන් ඇතිබව වැඩියයුතු, චිත්තයාගේ විකෙෂපය දුරලනු සඳහා ආනාපානසතිය වැඩිය යුතු.

මහණෙනි, මෙ තුන්දහමුන්ගේ ප්‍රහාණය සඳහා මෙ තුන්දම් වැඩිය යුතුය යි.

## 6. 1. 10.

## [උද්ධච්ච සූත්‍රය]

[සැවැත්නිදාන යි]

10. මහණෙනි, මෙ දහම් තුණෙකි. කවර තුණෙක යත්:

උද්ධච්චය හා අසංවරය හා පමාද යි. මහණෙනි, මෙ දහම් තුණ යි.

මහණෙනි, මෙ තුන් දහම් දුරු කරණු සඳහා දහම් තුණෙක් වැඩිය යුතු ය. කවර තුණෙක යත්:

උද්ධච්චයාගේ ප්‍රහාණය පිණිස සමථය වැඩිය යුතු. අසංවරයාගේ ප්‍රහාණය සඳහා සංවරය වැඩිය යුතු. ප්‍රමාදයාගේ ප්‍රහාණය පිණිස අප්‍රමාදය වැඩිය යුතු යි.

මහණෙනි, මෙ තුන්දහම් ප්‍රහීණ කරණු සඳහා මෙ ධර්ම තුණ වැඩිය යුතු යයි.

## තික වග්ගය

එහි උද්දානය:

රාග සූත්‍රය, දුච්චරිත සූත්‍රය, විතක්ක සූත්‍රය, සඤ්ඤා සූත්‍රය, ධාතු සූත්‍රය, අස්සාද සූත්‍රය, අරති සූත්‍රය, අසන්තුට්ඨිතා සූත්‍රය, දොවචස්ස සූත්‍රය, උද්ධච්ච සූත්‍රය දැයි දසයෙකි.

# 2 සාමඤ්ඤවග්ගො.

## 6. 2. 1.

### [කායානුපස්සී සුත්තං]

[සාවත්ථිනිදානං]

1. ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො කායෙ කායානුපස්සී විහරිතුං. කතමෙ ඡ:

කම්මාරාමතං, භස්සාරාමතං, නිද්දාරාමතං, සඞ්ගණිකාරාමතං, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතං, භොජනෙ අමත්තඤ්ඤුතං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ අප්පහාය අභබ්බො කායෙ කායානුපස්සී විහරිතුං.

ඡ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො කායෙ කායානුපස්සී විහරිතුං. කතමෙ ඡ:

කම්මාරාමතං, භස්සාරාමතං, නිද්දාරාමතං, සඞ්ගණිකාරාමතං, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතං, භොජනෙ අමත්තඤ්ඤුතං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො කායෙ කායානුපස්සී විහරිතුන්ති.

## 6. 2. 2-15.

### [අජ්ඣත්තකායානුපස්සී ආදි පඤ්චදස සුත්තානි]

[සාවත්ථිනිදානං]

2-15 ඡ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අජ්ඣත්තං කායෙ [කායානුපස්සී විහරිතුං] -පෙ- බහිද්ධා කායෙ -පෙ- අජ්ඣත්තබහිද්ධා කායෙ -පෙ- වෙදනාසු -පෙ- අජ්ඣත්තං වෙදනාසු -පෙ- බහිද්ධා වෙදනාසු -පෙ- අජ්ඣත්තබහිද්ධා වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- අජ්ඣත්තං චිත්තෙ -පෙ- බහිද්ධා චිත්තෙ -පෙ- අජ්ඣත්තබහිද්ධා චිත්තෙ -පෙ- ධම්මෙසු -පෙ- අජ්ඣත්තං ධම්මෙසු -පෙ- බහිද්ධා ධම්මෙසු -පෙ- අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරිතුං. කතමෙ ඡ:

කම්මාරාමතං, භස්සාරාමතං, නිද්දාරාමතං, සඞ්ගණිකාරාමතං, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතං, භොජනෙ අමත්තඤ්ඤුතං.

ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරිතුන්ති.

Free Distribution www.aathaapi.org

# 2. සාමඤ්ඤ වර්ගය.

## 6. 2. 1.

### [කායානුපස්සී සූත්‍රය]

[සැවැත්නිදාන යි]

1. මහණෙනි, කරුණු සයක් නො පහා කයෙහි කායානුදර්ශී ව (කය පිළිකුල් ආදීන් බලමින්) වාස කරන්නට අභව්‍ය වෙයි. කවර සයෙක යත්:

කම්මාරාමතා ය, භස්සාරාමතා ය, නිද්දාරාමතා ය, සඞ්ගණිකාරාමතා ය, ඉඳුරන්හි පියු දොර නැතිබව ය, භෝජනයෙහි පමණ නොදන්නා බව යි.

මහණෙනි, මෙ කරුණු සය නො දුරලා කයෙහි කායානුදර්ශී ව වසන්නට අභ්‍යව්‍ය වේ ය යි.

මහණෙනි, කරුණු සයක් දුරු කොට කයෙහි කායානුදර්ශී ව වසන්නට භව්‍ය වෙයි කවර සයෙක යත්:

කම්මාරාමතා ය, භස්සාරාමතා ය, නිද්දාරාමතා ය, සඞ්ගණිකාරාමතා ය, ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාරතා ය, භෝජනයෙහි අමාත්‍රඥතා යි.

මහණෙනි, මෙ කරුණු සය දුරු කොට කයෙහි කායානුදර්ශී ව වසන්නට භව්‍ය වේ යයි.

## 6. 2. 2 - 15.

### [අජ්ඣත්තකායානුපස්සී ආදී සූත්‍ර පසළොස]

[සැවැත්නිදාන යි]

2 15 මහණෙනි, කරුණු සයක් දුරු නො කොට අධ්‍යාත්මකායයෙහි කායානුදර්ශී ව වසන්නට ... බාහිරකායයෙහි ... අධ්‍යාත්මබාහිරකායයෙහි ... වේදනාවන්හි .. අධ්‍යාත්මවේදනාවන්හි ... බාහිරවේදනාවන්හි ... අධ්‍යාත්මබාහිරවේදනාවන්හි ... චිත්තයෙහි ... අධ්‍යාත්මචිත්තයෙහි ... බාහිරචිත්තයෙහි ... අධ්‍යාත්මබාහිරචිත්තයෙහි ... ධර්මයන්හි ... අධ්‍යාත්ම-ධර්මයන්හි ... බාහිරධර්මයන්හි ... අධ්‍යාත්මබාහිරධර්මයන්හි ධර්මානුදර්ශී ව වසන්නට භව්‍ය වෙයි. කවර සයෙක යත්:

කම්මාරාමතා ය, භස්සාරාමතා ය, නිද්දාරාමතා ය, සඞ්ගණිකාරාමතා ය, ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාරතා ය, භෝජනයෙහි අමාත්‍රඥතා යි.

මහණෙනි, මෙ දහම් සය දුරු කොට අධ්‍යාත්මබාහිරධර්මයන්හි ධර්මානුදර්ශී ව වසන්නට භව්‍ය වේ යයි.

### 6. 2. 16

### [තපුස්ස සුත්තං]

[සාවත්ථිනිදානං]

**16** ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො **තපුස්සො**,[1] ගහපති තථාගතෙ නිට්ඨංගතො අමතද්දසො අමතං සච්ඡිකත්වා ඉරියති. කතමෙහි ඡහි:

බුද්ධෙ අවෙච්චප්පසාදෙන, ධම්මෙ අවෙච්චප්පසාදෙන, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන, අරියෙන සීලෙන, අරියෙන ඤාණෙන, අරියාය විමුත්තියා.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො තපුස්සො ගහපති තථාගතෙ නිට්ඨංගතො අමතද්දසො අමතං සච්ඡිකත්වා ඉරියතීති.

### 6. 2. 17 - 36.

### [භල්ලිකාදි වීසති සුත්තානි]

සාවත්ථිනිදානානි]

**17-36**. ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො **භල්ලිකො** ගහපති -පෙ- **සුදත්තො** ගහපති අනාථපිණ්ඩිකො -පෙ- **චිත්තො** ගහපති මච්ඡිකාසණ්ඩිකො -පෙ- **හත්ථකො** ආළවකො -පෙ- **මහානාමො** සක්කො -පෙ- **උග්ගො** ගහපති වෙසාලිකො -පෙ- **උග්ගතො** ගහපති -පෙ- **සූරො** අම්බට්ඨො -පෙ- **ජීවකො** කොමාරභච්චො -පෙ- **නකුලපිතා** ගහපති -පෙ- **තවකණ්ණිකො** ගහපති -පෙ- **පූරණො** ගහපති -පෙ- **ඉසිදත්තො** ගහපති -පෙ- **සන්ධානො** ගහපති -පෙ- **විජයො** ගහපති[2] -පෙ- **වජ්ජියමහිතො** ගහපති[3] -පෙ- **මෙණ්ඩකො** ගහපති -පෙ- **වාසෙට්ඨො** උපාසකො -පෙ- **අරිට්ඨො** උපාසකො -පෙ- **සාරග්ගො**[4] උපාසකො තථාගතෙ නිට්ඨංගතො අමතද්දසො අමතං සච්ඡිකත්වා ඉරියති. කතමෙහි ඡහි.

බුද්ධෙ අවෙච්චප්පසාදෙන, ධම්මෙ අවෙච්චප්පසාදෙන, සංඝෙ අවෙච්චප්පසාදෙන, අරියෙන සීලෙන, අරියෙන ඤාණෙන, අරියාය විමුත්තියා.

ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො සාරග්ගො උපාසකො තථාගතෙ නිට්ඨංගතො අමතද්දසො අමතං සච්ඡිකත්වා ඉරියතීති.

සාමඤ්ඤ වග්ගො.

1 තපස්සො - PTS. 2 විචයො ගහපති - සීමු. 3 විජයමාහිතො - මජසං.
4 සාදත්තො - සතු

## 6. 2. 16.

## [තපුස්ස සූත්‍රය]

[සැවැත්නිදාන යි]

මහණෙනි, ධර්ම සයෙකින් සමන්වාගත තපුස්ස (දෙවාචික උපාසක) ගෘහපති තථාගතයන් වහන්සේ කෙරෙහි නිෂ්ඨාගත (බුද්ධගුණයෙහි නිසැක) වූයේ පහත් සිතැත්තේ අමෘත (නිර්වාණ) දර්ශන ඇතියේ අමෘතය ප්‍රත්‍යක්ෂ කොට වෙසෙසි කවර සයෙකින යත්:

බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් (ගුණ දැන පැහැදීමෙන්), (නවලෝකෝත්තර) ධර්මයෙහි අවෙත්‍යප්‍රසාදයෙන්, අෂ්ටාර්යපුද්ගලසංඝයා කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන්, ආර්යශීලයෙන්, ආර්ය (ප්‍රත්‍යවේක්ෂා) ඥානයෙන්, ආර්ය (ශෛක්ෂඵල) විමුක්තියෙන් යන සයෙනි.

මහණෙනි, මේ ධර්ම සයෙන් සමන්වාගත තපුස්සගෘහපති තථාගතයන් කෙරෙහි නිෂ්ඨාගත වූයේ අමෘත දර්ශන ඇතියේ අමෘතය සාක්ෂාත් කොට වෙසේ යයි.

## 6. 2. 17 - 36.

## [භල්ලිකාදිවිංශති සූත්‍ර]

[සැවැත්නිදාන යි]

**17-36** මහණෙනි, කරුණු සයෙකින් සමන්වාගත **භල්ලික** (දෙවාචික) ගෘහපති ... අනාථපිණ්ඩික සුදත්ත ගෘහපති ... **මච්ඡිකාසණ්ඩිකචිත්ත** ගෘහපති ... **හත්ථක** ආලවක ... මහානාම ශාක්‍ය .. වෛශාලික **උග්ග** ගෘහපති .. **උග්ගත** ගෘහපති ... **සූරඅම්බට්ඨ** ... **ජීවකකෝමාරභච්ච** ... **නකුලපිතු** ගෘහපති .. **තවකණ්ණික** ගෘහපති . **පූරණ** ගෘහපති ... **ඉසිදත්ත** ගෘහපති .. **සන්ධාන** ගෘහපති ... **විජය** ගෘහපති .. **වජ්ජියමහිත** ගෘහපති .. **මෙණ්ඩක** ගෘහපති... **වාසෙට්ඨ** උපාසක .. **අරිට්ඨ** උපාසක ... **සාරග්ග** උපාසක තථාගතයන් කෙරෙහි නිෂ්ඨාවට ගියේ අමෘතදර්ශන ඇතියේ අමෘතය සාක්ෂාත් කොට වෙසේ යයි. කවර සයෙකින යත්:

බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන, ධර්මය කෙරෙහි අවෙත්‍ය ප්‍රසාදයෙන, සංඝයා කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන, ආර්යශීලයෙන, ආර්යඥානයෙන, ආර්යවිමුක්තියෙනැයි.

මහණෙනි, මේ කරුණු සයින් සමන්වාගත සාරග්ග උපාසක තථාගතයන් කෙරෙහි සැදැහැයෙන් නිෂ්ඨාවට ගියේ දුටු නිවන් ඇතියේ අමෘතය සාක්ෂාත් කොට වෙසේ යයි.

**සාමඤ්ඤ වග්ගය**

# ඡක්කනිපාතෙ රාගාදිපෙය්‍යාල සුත්තානි.

[සාවත්ථිනිදානං]

1. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඡ ධම්මා භාවෙතබ්බා. කතමෙ ඡ:

දස්සනානුත්තරියං, සවනානුත්තරියං, ලාභානුත්තරියං, සික්ඛානුත්තරියං, පාරිචරියානුත්තරියං, අනුස්සතානුත්තරියං.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බාති.

[සාවත්ථිනිදානං]

2. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඡ ධම්මා භාවෙතබ්බා. කතමෙ ඡ:

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බාති.

[සාවත්ථිනිදානං]

3. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඡ ධම්මා භාවෙතබ්බා. කතමෙ ඡ:

අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බාති.

[සාවත්ථිනිදානං]

4-30. රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය [ඡ ධම්මා භාවෙතබ්බා -පෙ- රාගස්ස භික්ඛවෙ] පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බා'ති.

31-60. දොසස්ස [භික්ඛවෙ අභිඤ්ඤාය ඡ ධම්මා භාවෙතබ්බා -පෙ- දොසස්ස භික්ඛවෙ] පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බා'ති.

61-90. මොහස්ස භික්ඛවෙ -පෙ-

91-120. කොධස්ස භික්ඛවෙ -පෙ-

121-150. උපනාහස්ස භික්ඛවෙ -පෙ-

151-180. මක්ඛස්ස භික්ඛවෙ -පෙ-

# ඡක්කනිපාතයෙහි රාගාදිපෙය්‍යාල සූත්‍ර

[සැවැත් නිදාන යි]

1. මහණෙනි, රාගයාගේ අභිඥානය සඳහා කරුණු සයෙක් වැඩිය යුතු ය. කවර සයෙක යත්:

දර්ශනානුත්තරිය ය, ශ්‍රවණානුත්තරිය, ලාභානුත්තරිය ය, ශික්ෂානුත්තරිය ය, පරිචර්යානුත්තරිය ය, අනුස්මෘත්‍යානුත්තරිය යි.

මහණෙනි, රාගයාගේ අභිඥානය සඳහා මෙ කරුණු සය වැඩියයුතු ය යි.

[සැවැත් නිදාන යි]

2. මහණෙනි, රාගයාගේ අභිඥානය සඳහා කරුණු සයෙක් වැඩිය-යුතු ය. කවර සයෙක යත්:

බුද්ධානුස්මෘති ය, ධර්මානුස්මෘති ය, සඞ්ඝානුස්මෘති ය, ශීලානුස්මෘති ය, ත්‍යාගානුස්මෘති ය, දේවතානුස්මෘති ය යි.

මහණෙනි, රාගයාගේ අභිඥානය සඳහා මේ කරුණු සය වැඩියයුතු යයි.

[සැවැත් නිදාන යි]

3. මහණෙනි, රාගයාගේ අභිඥානය සඳහා කරුණු සයෙක් වැඩිය යුතු යි. කවර සයෙක යත්:

අනිත්‍යසංඥ ය, අනිත්‍යයෙහි දුඃඛසංඥ ය, දුඃඛයෙහි අනාත්ම-සංඥ ය, ප්‍රහාණ සංඥ ය, විරාගසංඥ ය, නිරෝධ සංඥ යි.

මහණෙනි, රාගයාගේ අභිඥානය සඳහා මෙ කරුණු සය වැඩිය යුතු යයි.

[සැවැත් නිදාන යි]

4 30. මහණෙනි, රාගයාගේ පරිඥානය සඳහා .... පරික්ෂය සඳහා ... ප්‍රහාණය සඳහා ... ක්ෂය සඳහා ... ව්‍යය සඳහා ... විරාගය සඳහා ... නිරෝධය සඳහා ... ත්‍යාගය සඳහා ... ප්‍රතිනිඃසර්ගය සඳහා මේ කරුණු සය වැඩිය යුතු ය.

31 60. මහණෙනි, ද්වේෂයාගේ අභිඥාන ය සඳහමෙක් වැඩියයුතු ය ... මහණෙනි, ද්වේෂයාගේ පරිඥානය සඳහා ... පරික්ෂය සඳහා ... ප්‍රහාණය සඳහා ... ක්ෂය සඳහා .. ව්‍යය සඳහා ... විරාගය සඳහා ... නිරෝධය සඳහා ... ත්‍යාගය සඳහා ... ප්‍රතිනිඃසර්ගය සඳහා මෙ සදහම් වැඩිය යුතු ය යි.

61- 90. මහණෙනි, මෝහයාගේ ...

91-120. මහණෙනි, ක්‍රෝධයාගේ ...

121-150. මහණෙනි, උපනාහයාගේ ...

151-180. මහණෙනි, මක්ඛයාගේ ...

**181-210.** පලාසස්ස භික්ඛවෙ -පෙ-

**211-240.** ඉස්සාය භික්ඛවෙ -පෙ-

**241-270.** මච්ඡරියස්ස භික්ඛවෙ -පෙ-

**271-300.** මායාය භික්ඛවෙ -පෙ-

**301-330.** සාඨෙය්‍යස්ස භික්ඛවෙ -පෙ-

**331-360.** ථම්භස්ස භික්ඛවෙ -පෙ-

**361-390.** සාරම්භස්ස භික්ඛවෙ -පෙ-

**391-420.** මානස්ස භික්ඛවෙ -පෙ-

**421-450.** අතිමානස්ස භික්ඛවෙ -පෙ-

**451-480.** මදස්ස භික්ඛවෙ -පෙ-

**481-510.** පමාදස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරෝධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඡ ධම්මා භාවෙතබ්බා. කතමෙ ඡ: දස්සනානුත්තරියං -පෙ- අනුස්සතානුත්තරියං -පෙ- කතමෙ ඡ බුද්ධානුස්සති -පෙ- කතමෙ ඡ අනිච්චසඤ්ඤා -පෙ- පමාදස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරෝධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බා'ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**රාගාදිපෙය්‍යාලො නිට්ඨිතො.**

## ඡක්කනිපාතො සමත්තො.

* රාගපදතො පට්ඨාය පඤ්චදසපදපරියන්තෙසු සත්තරසසු පෙය්‍යාලෙසු එකමෙකං අභිඤ්ඤාදි දසහි පදෙහි යොජෙත්වා "ඡ ධම්මා භාවෙතබ්බා"ති නිද්දිට්ඨ අනුත්තරිය-අනුස්සති-සඤ්ඤාහි පච්චෙකං ඝටිතානි සබ්බසුත්තානි දසාධික පඤ්චසතානි හොන්ති.

**181-210.** මහණෙනි, පලාසයාගේ ...

**211-240.** මහණෙනි, ඊර්ෂ්‍යාවගේ ...

**241-270.** මහණෙනි, මාත්සර්‍ය්‍යයාගේ ...

**271-300.** මහණෙනි, මායාවගේ ...

**301-330.** මහණෙනි, සාඨෙය්‍යයාගේ ...

**331-360.** මහණෙනි, ථම්භයාගේ ...

**361-390.** මහණෙනි, සාරම්භයාගේ ...

**391-420.** මහණෙනි, මානයාගේ ...

**421-450.** මහණෙනි, අතිමානයාගේ ...

**451-480.** මහණෙනි, මදයාගේ ...

**481-510.** මහණෙනි, ප්‍රමාදයාගේ අභිඥානය සඳහා ... පරිඥානය සඳහා ... පරික්‍ෂය සඳහා ... ප්‍රහාණය සඳහා .. ක්‍ෂය සඳහා ... ව්‍යය සඳහා ... විරාගය සඳහා ... නිරොධය සඳහා ... ත්‍යාගය සඳහා ... ප්‍රතිනිඃසර්ගය සඳහා කරුණු සයක් වැඩිය යුතු ය ... කවර සයෙක යත්: දර්ශනානුත්තරිය ... අනුස්මෘත්‍යානුත්තරිය යි ... කවර සයෙක යත්: බුද්ධානුස්මෘතිය ... කවර සයෙක යත්: අනිත්‍යසංඥාය ... මහණෙනි, ප්‍රමාදයාගේ අභිඥානය සඳහා ... පරිඥානය සඳහා ... පරික්‍ෂය සඳහා ... ප්‍රහාණය සඳහා ... ක්‍ෂය සඳහා ... ව්‍යය සඳහා ... විරාගය සඳහා ... නිරොධය සඳහා ... ත්‍යාගය සඳහා ... ප්‍රතිනිඃසර්ගය සඳහා මේ කරුණු සය වැඩිය යුතු ය යි.

භාග්‍යවතුන් වහන්සේ මෙ වදාළසේක. ආප්තමන එ භික්‍ෂූහු භාග්‍ය-වතුන්ගේ භාෂිතය සතුටින් පිළිගත්හයි.

### රාගාදිපෙයියාලය* නිමි.

## ඡක්කනිපාතය සමාප්ත යි.

* මෙහි රාගපදය වටත් ප්‍රමාද පදය අවසන් කොට ඇති සතළොස් පෙයියාලයෙහි එක් එක් පදය "අභිඥානය සඳහා" ආදි දශ පදයන් හා යොදා "ධර්මයෝ සඳෙහොත් වැඩිය යුත්තාහ"යි කී සැටියට අනුත්තරිය, අනුස්සති, සංඥා යන මොවුන් සමග සම්බන්ධ කරගත් කල්හි සියලු සූත්‍රයෝ ගණනින් දසයක් අධික කොට ඇති පන්සීයයක් වෙති [රාගාදි එක් එක් පෙයියාලයෙහි සූත්‍රයෝ තිස් දෙනෙකි.]

Free Distribution www.aathaapi.org

# අඞ්ගුත්තරනිකායො

## 2. චතුත්ථො භාගො

## සත්තකනිපාතො

# අඞ්ගුත්තරනිකායො

## සත්තකනිපාතො

### 1. පඨමො පණ්ණාසකො

### 1. ධන වග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

**7. 1. 1. 1**

**[පඨම පියභික්ඛු සුත්තං]**

1 ඒවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු ලාභකාමො ච හොති, සක්කාරකාමො ච,[1] අනවඤ්ඤත්තිකාමො ච, අහිරිකො ච, අනොත්තප්පී ච, පාපිච්ඡො ච, මිච්ඡාදිට්ඨි ච.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච.

සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු න ලාභකාමො ච හොති, න සක්කාරකාමො ච, න අනවඤ්ඤත්තිකාමො ච, හිරිමා ච, ඔත්තප්පී ච, අප්පිච්ඡො ච, සම්මාදිට්ඨි ච.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චාති.

---

1 හොති - මජසං.

# අඞ්ගුත්තරනිකාය

## සත්තකනිපාතය

### 1. ප්‍රථම පණ්ණාසකය

### 1. ධන වර්ගය

**ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

**7. 1. 1. 1**

**[පළමුවන පියභික්ඛු සූත්‍රය]**

1 **මා** විසින් මෙසේ අසන ලදී: එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම්හි වාසය කරණ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්ස'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළ සේක:

මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය අමනාප අගරු අභාවනීය වෙයි. කවර සතෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ලාභ කැමැතියේ ද, සත්කාර කැමැතියේ ද, යශස් කැමැතියේ ද, හිරි නැතියේ ද, ඔතප් නැතියේ ද, ලමූ ඉච්ඡා ඇතියේ ද, මිසදිටු ඇතියේ ද වෙයි.

මහණෙනි, මෙ සත් කරුණින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය අමනාප අගරු අභාවනීය වෙයි.

මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට ප්‍රිය මනාප ගරු භාවනීය වෙයි. කවර සතෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ලාභ කැමැතියේත් නො වෙයි, සත්කාර කැමැතියේත් නො වෙයි, යශස් කැමැතියේත් නො වෙයි, හිරි ඇතියේත් වෙයි, ඔතප් ඇතියේත් වෙයි, අල්පෙච්ඡ ද වෙයි, සම්දිටු ඇතියේත් වෙයි.

මහණෙනි, මෙ සත් කරුණින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට ප්‍රිය ද වෙයි, මනාප ද වෙයි, ගරු ද වෙයි, භාවනීය ද වේ.

## 7. 1. 1. 2

## [දුතිය පියභික්ඛු සුත්තං]

[සාවත්ථිනිදානං]

2. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු ලාභකාමො ච හොති, සක්කාරකාමො ච, අනවඤ්ඤත්තිකාමො ච, අහිරිකො ච, අනොත්තප්පී ච, ඉස්සුකී ච, මච්ඡරී ච.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච.

සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි සත්තහි?

ඉධ භික්ඛවෙ භික්ඛු න ලාභකාමො ච හොති, න සක්කාරකාමො ච, න අනවඤ්ඤත්තිකාමො ච, හිරිමා ච, ඔත්තප්පී ච, අනුස්සුකී ච, අමච්ඡරී ච.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො චාති.

## 7. 1. 1. 3

## [සඞ්ඛිත්ත සත්තබල සුත්තං]

[සාවත්ථිනිදානං]

3. සත්තිමානි භික්ඛවෙ, බලානි. කතමානි සත්ත:

සද්ධාබලං, විරියබලං, හිරිබලං, ඔත්තප්පබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ සත්තබලානි.

1. සද්ධාබලං විරියබලං හිරිඔත්තප්පියං බලං[1]
සතිබලං සමාධි ච පඤ්ඤා චෙ සත්තමං බලං.
එතෙහි බලවා භික්ඛු සුඛං ජීවති පණ්ඩිතො.

2. යොනිසො විචිනෙ ධම්මං පඤ්ඤායත්ථං විපස්සති.
පජ්ජොතස්සෙව නිබ්බානං විමොක්ඛො හොති චෙතසො'ති.

---
1 සද්ධාබලං විරියඤ්ච හිරි ඔත්තප්පියං බලං - මජසං

7. 1. 1. 2.

[දෙවැනි පියසිකඛු සූත්‍රය]

[සැවැත්නිදාන යි]

2. මහණෙනි, සත් කරුණෙකින් සමන්විත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය හා අමනාප හා අගරු හා අභාවනීය හා වෙයි. කවර සතෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ලාභ කැමැතියේ ද, සත්කාර කැමැතියේ ද, ප්‍රසිද්ධිය කැමැතියේ ද, හිරි නැතියේ ද, ඔතප් නැතියේ ද, ඊර්‍ෂ්‍යා ඇතියේ ද, මසුරු වූයේ ද වෙයි.

මහණෙනි, මෙ සත් කරුණින් සමන්විත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය හා අමනාප හා අගරු හා අභාවනීය හා වෙයි.

මහණෙනි, දහම් සතෙකින් සමන්විත මහණ සබ්‍රම්සරුනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි. කවර සතෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ලාභ කැමැත්තේ නො වෙයි, සත්කාර කැමැත්තේ ද නො වෙයි, යශස් කැමැත්තේ ද නො වෙයි, හිරි ඇත්තේ ද, ඔතප් ඇත්තේ ද, ඊර්‍ෂ්‍යා නැත්තේ ද, මසුරු නො වූයේ ද වෙයි.

මහණෙනි, මෙ දහම් සතින් සමන්විත මහණ සබ්‍රම්සරුනට ප්‍රිය ද මනාප ද ගරු ද භාවනීය ද වෙයි.

7. 1. 1. 3.

[සඞ්ඛිත්තසත්තබල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

3. මහණෙනි, මෙ බලසතෙකි. කවර සතෙක යත්:

සද්ධාබලය, විරියබලය, හිරිබලය, ඔත්තප්පබලය, සතිබලය, සමාධි-බලය, පඤ්ඤාබල යි. මහණෙනි, මේ සත් බල යි.

1. සද්ධාබල විරියබල හිරිබල ඔතප්බල සතිබල සමාධිබල හා සත් වැනි වූ ම පඤ්ඤාබලය යි බල සතෙකි. මෙ බල සතින් යුත් පණ්ඩිත මහණ සුවසේ වෙසේ.

2. හේ උපායමනසිකාරයෙන් සිවුසස් දහම් විමසන්නේය. විවසුන් සහගිය මග නැණින් එහි ඇරුත් දක්නේ ය. පහන නිවුනු සෙයින් (චරිමක) විඤ්ඤාණයාගේ විමොක්ෂය (වස්තු ආලම්බනයන්ගෙන් මිදීම) වන්නේ යි.

## 7. 1. 1. 4

## [විත්ථතසත්තබල සුත්තං]

### [සංඛිත්තනිද්දෙසං]

4. සත්තිමානි භික්ඛවෙ, බලානි. කතමානි සත්ත:

සද්ධාබලං, විරියබලං, හිරිබලං, ඔත්තප්පබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

(1) කතමඤ්ච භික්ඛවෙ, සද්ධාබලං:

ඉධ භික්ඛවෙ අරියසාවකො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ඉදං වුච්චති භික්ඛවෙ සද්ධාබලං.

(2) කතමඤ්ච භික්ඛවෙ, විරියබලං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො ආරද්ධවිරියො විහරති: අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. ඉදං වුච්චති භික්ඛවෙ, විරියබලං.

(3) කතමඤ්ච භික්ඛවෙ, හිරිබලං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො හිරිමා හොති, හිරීයති කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති භික්ඛවෙ, හිරිබලං.

(4) කතමඤ්ච භික්ඛවෙ, ඔත්තප්පබලං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො ඔත්තප්පී හොති, ඔත්තප්පති කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති භික්ඛවෙ, ඔත්තප්පබලං.

(5) කතමඤ්ච භික්ඛවෙ, සතිබලං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. ඉදං වුච්චති භික්ඛවෙ, සතිබලං.

(6) කතමඤ්ච භික්ඛවෙ, සමාධිබලං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති භික්ඛවෙ, සමාධිබලං.

## 7. 1. 1. 4.

## [විත්ථතසත්තබල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

4. මහණෙනි, මේ බල සතෙකි. කවර සතෙක යත්:

සද්ධාබලය, විරියබලය, හිරිබලය, ඔත්තප්පබලය, සතිබලය, සමාධිබල හා පඤ්ඤාබල යි.

(1) මහණෙනි, සද්ධාබල කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි අරිසවු සැදැහැතියේ වෙයි: "මේ කරුණෙන් ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යායෙන් හා චරණයෙන් සම්පන්නහ, සුගත්හ, ලොකවිද්හ, අනුත්තර වූ පුරුෂදම්‍යසාරථිහ, දෙව් මිනිස්නට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ"යි තථාගතයන් වහන්සේගේ බොධිය (බුදුගුණ) හදහයි. මහණෙනි, මේ සද්ධාබල යි කියනු ලැබේ.

(2) මහණෙනි, විරියබල කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක අකුශලධර්මයන්ගේ ප්‍රහාණය සඳහා කුශලධර්මයන්ගේ ප්‍රතිලාභය සඳහා වීර්‍ය්‍ය ඇතියේ දළ පැරකුම් ඇතියේ කුශලධර්මයන්හි නො හළ වීර්‍ය්‍යධුර ඇතියේ රැකුළු වැර ඇතියේ වෙසෙයි මහණෙනි, මේ විරිය බල යි කියනු ලැබේ.

(3) මහණෙනි, හිරිබල කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි අරිසවු හිරි ඇතියේ වෙයි. කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් ලජ්ජිත වෙයි. ලාමක අකුශලධර්ම-සමාපත්තියෙන් ලජ්ජිත වෙයි. මහණෙනි මේ හිරිබල යි කියනු ලැබේ.

(4) මහණෙනි, ඔත්තප්පබල කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක ඔතප් ඇතියේ වෙයි. කාය-දුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් බාහේ වෙයි. ලාමක අකුශල ධර්මසමාපත්තියෙන් බියපත් වෙයි. මහණෙනි, මේ ඔත්තප්පබල යි කියනු ලැබේ.

(5) මහණෙනි, සතිබල කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි අරි සවු සිහි ඇතියේ වෙයි, පරම සතියෙන් හා නිපක භාවයෙන් (නුවණින්) සමන්‍වාගත වූයේ කල විරූ දෑ හා කිණූ විරූ දෑ සිහිපත් කරණුයේ පුනපුනා සිහිපත් කරණුයේ වෙයි. මහණෙනි, මේ සතිබල යි කියනු ලැබේ.

(6) මහණෙනි, සමාධිබල කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි අරිසවු කාමයන් කෙරෙන් වෙන් ව ම ... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මහණෙනි, මේ සමාධිබල යි කියනු ලැබේ.

(7) කතමඤ්ච භික්ඛවෙ, පඤ්ඤාබලං:

ඉධ භික්ඛවෙ අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ, පඤ්ඤාබලං.

ඉමානි ඛො භික්ඛවෙ, සත්තබලානි.

3. සද්ධාබලං විරියබලං[1] හිරිඔත්තප්පියං බලං
සතිබලං සමාධි ච පඤ්ඤා වෙ සත්තමං බලං.
එතෙහි බලවා භික්ඛු සුඛං ජීවති පණ්ඩිතො.

4. යොනිසො විචිනෙ ධම්මං පඤ්ඤායත්ථං විපස්සති
පජ්ජොතස්සෙව නිබ්බානං විමොක්ඛො හොති චෙතසො'ති

7. 1. 1. 5

[සඞ්ඛිත්ත ධනසුත්තං]

[සාවත්ථිනිදානං]

5. සත්තිමානි භික්ඛවෙ, ධනානි. කතමානි සත්ත:

සද්ධාධනං, සීලධනං, හිරිධනං, ඔත්තප්පධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනං.

ඉමානි ඛො භික්ඛවෙ, සත්ත ධනානී'ති.

5. සද්ධාධනං සීලධනං හිරි ඔත්තප්පියං ධනං
සුතධනඤ්ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං.

6. යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා
අදලිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

7. තස්මා සද්ධඤ්ච සීලඤ්ච, පසාදං ධම්මදස්සනං
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනං'ති

7. 1. 1. 6

[විත්ථතධන සුත්තං]

[සාවත්ථිනිදානං]

6. සත්තිමානි භික්ඛවෙ, ධනානි, කතමානි සත්ත:

සද්ධාධනං, සීලධනං, හිරිධනං, ඔත්තප්පධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනං.

(1) කතමඤ්ච භික්ඛවෙ, සද්ධාධනං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො සද්ධො හොති. සද්දහති තථාගතස්ස බොධිං: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො -පෙ- බුද්ධො භගවාති. ඉදං වුච්චති භික්ඛවෙ, සද්ධාධනං.

1. සද්ධාබලං විරියඤ්ච - මජසං

(7) මහණෙනි, පඤ්ඤාබල කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි අරීසවූ මොහොවට දුක් ක්‍ෂයවීමට යන, නිර්වේදය (කෙලෙස් විදලීම) ඇසුරු කොට පවත්නා සත්ත්වයන්ගේ උදව්‍යය පිළිවිදීමට සමත් ආර්යප්‍රඥායෙන් සමන්වාගත වූයේ ප්‍රඥාවත් වෙයි. මහණෙනි, මේ පඤ්ඤාබල යි කියනු ලැබේ.

මහණෙනි, මේ බල සත යි.

3. සද්ධාබල විරියබල හිරිබල ඔත්තප්පියබල සතිබල සමාධිබල සත්වැනි පඤ්ඤාබල යි. මේ බල සතින් යුත් නැණැති මහණ සුවසේ වෙසේ.

4. හේ යෝනිසොමනසිකාරයෙන් චතුසත්‍යධර්මය විමසන්නේ ය. විදර්ශනාමාර්ගප්‍රඥායෙන් අර්ථය වෙසෙසා දන්නේ ය. පහනක් නිවෙනු සෙයින් ඔහුගේ චිත්තයාගේ විමොක්ෂය වේ ය යි.

7. 1. 1. 5.

[සඞ්ඛිත්තධන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

5. මහණෙනි, මේ ධන සතෙකි. කවර සතෙක යත්:

සද්ධාධන සීලධන හිරිධන ඔත්තප්පධන සුතධන චාගධන පඤ්ඤා-ධන යි. මහණෙනි, මේ ධන සත යි.

5. සද්ධාධන ය, සීලධන ය, හිරිධන ය, ඔත්තප්පධන ය, සුතධන ය, චාගධන ය, සත්වැනි වූ ම පඤ්ඤාධන ය යි (ධන) සතෙකි.

6. යම් ස්ත්‍රියකට වේවයි පුරුෂයකුට වේවයි මේ ධන ඇත් නම් හේ 'නො දිළිඳු ය'යි ද ඔහුගේ ජීවිතය නො සිස් ය යි ද කීහ.

7. එහෙයින් ප්‍රඥ ඇත්තේ බුද්ධශාසනය මෙනෙහි කරමින් ශ්‍රද්ධා ද, සීල ද, ප්‍රසාදය ද, ධර්මදර්ශනය ද යන මෙහි පුනපුනා යෙදෙන්නේ යි.

7. 1. 1. 6.

[විත්ථතධන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

6. මහණෙනි, මේ ධන සතෙකි. කවර සතෙක යත්:

සද්ධාධන ය, සීලධන ය, හිරිධන ය, ඔත්තප්පධනය, සුතධන ය, චාගධන ය, පඤ්ඤාධන ය යි.

(1) මහණෙනි, සද්ධාධන කවරේය යත්:

මහණෙනි, මේ සස්නෙහි ආර්යශ්‍රාවක සැදැහැත්තේ වෙයි. "මේ කාරුණිකවූ ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් වන සේක, සම්‍යක් සම්බුද්ධ වන සේක ... බුද්ධ වන සේක, භගවත් වන සේකැ"යි තථාගතයන් වහන්සේගේ බෝධිය අදහයි. මහණෙනි, මේ සද්ධාධන යි කියනු ලැබේ.

(2) කතමඤ්ච භික්ඛවෙ, සීලධනං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ, සීලධනං.

(3) කතමඤ්ච භික්ඛවෙ, හිරිධනං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො හිරිමා හොති. හිරීයති කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති භික්ඛවෙ, හිරිධනං.

(4) කතමඤ්ච භික්ඛවෙ, ඔත්තප්පධනං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො ඔත්තප්පී හොති. ඔත්තප්පති කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන, ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති භික්ඛවෙ, ඔත්තප්පධනං.

(5) කතමඤ්ච භික්ඛවෙ, සුතධනං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති, ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, ඉදං වුච්චති භික්ඛවෙ, සුතධනං.

(6) කතමඤ්ච භික්ඛවෙ, චාගධනං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති, මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. ඉදං වුච්චති භික්ඛවෙ, චාගධනං.

(7) කතමඤ්ච භික්ඛවෙ, පඤ්ඤාධනං:

ඉධ භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤවා හොති -පෙ- සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ, පඤ්ඤාධනං.

ඉමානි ඛො භික්ඛවෙ, සත්ත ධනානී’ති.

8. සද්ධාධනං සීලධනං හිරි ඔත්තප්පියං ධනං
සුතධනං ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං.

9. යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා
අදලිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

10. තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනන්ති.

(2) මහණෙනි, සීලධන කවරේ ද යත්:

මහණෙනි, මේ සස්නෙහි අරිසවු පණිවායෙන් වැළැක්කියේ වෙයි ... මද්‍යපානය දෙකට කරුණු වූ රහමෙරින් වැළැක්කියේ වෙයි. මහණෙනි මේ සීලධන යි කියනු ලැබේ.

(3) මහණෙනි හිරිධන කවරේ ද යත්:

මහණෙනි, මේ සස්නෙහි අරිසවු හිරි ඇතියේ වෙයි. කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් ලජ්ජිත වෙයි. ලාමක, අකුශලධර්ම-සමාපත්තියෙන් ලජ්ජිත වෙයි. මහණෙනි, මේ හිරිධන යි කියනු ලැබේ.

(4) මහණෙනි, ඔත්තප්පධන කවරේ ද යත්:

මහණෙනි, මේ සස්නෙහි ආර්‍යශ්‍රාවක ඔත්තප්ප ඇතියේ වෙයි. කාය-දුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් ඔතප් ඇතියේ වෙයි. ලමු අකුසල්දහම් කිරීමෙහි ඔතප් ඇතියේ වෙයි. මහණෙනි, මේ ඔත්තප්ප-ධන ය යි කියනු ලැබේ.

(5) මහණෙනි, සුතධන කවරේ ද යත්:

මහණෙනි, මේ සස්නෙහි ආර්‍යශ්‍රාවක ශ්‍රැතධර වූයේ ශ්‍රැතසන්නිචය ඇතියේ බහුශ්‍රැත වෙයි. ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසාන කල්‍යාණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ කෙවල පරිපූර්ණ වූ පරිශුද්ධ වූ යම් ඒ ධර්මකෙනෙක් මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය පාළ කරත් නම්, එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද වෙත්, ධරණ ලද වෙත්, වචනයෙන් පරිචිත වෙත්, සිතින් විමසන ලද වෙත්, ප්‍රඥදෘෂ්ටියෙන් මොනොවට පිළිවිදියාහු වෙත්. මහණෙනි, මේ සුතධන යයි කියනු ලැබේ.

(6) මහණෙනි, චාගධනය කවරේ ද යත්:

මහණෙනි, මේ සස්නෙහි අරිසවු දුරු වූ මසුරුමල ඇති සිතින් මිදූ ත්‍යාග ඇත්තේ, දෙනුවට දෙවි අත් ඇතියේ, පිදීමෙහි ඇලුනේ, යදනට නිසි වූයේ, දානයෙහිත් සංවිභාගයෙහිත් ඇලුනේ ගිහිගෙහි වෙසෙයි. මහණෙනි, මේ චාගධන යි කියනු ලැබේ.

(7) මහණෙනි, පඤ්ඤාධන කවරේ ද යත්:

මහණෙනි, මේ සස්නෙහි ආර්‍යශ්‍රාවක ... මැනැවින් දුක් ගෙවීමට යන ප්‍රඥයෙන් සමන්‍වාගත වූයේ ප්‍රඥවත් වෙයි. මහණෙනි, මේ පඤ්ඤා-ධන යි කියනු ලැබේ.

මහණෙනි, මේ ධන සත යි.

8. සද්ධාධන ය, සීලධන ය, හිරිධන ය, ඔත්තප්පධන ය, සුතධන ය, චාගධන ය, සත්වැනි වූ ම පඤ්ඤාධන යයි.

9. යම් ස්ත්‍රියකට වේවයි පුරුෂයකුට වේවයි මෙල ධන ඇත් නම් හෙ නොදිළිඳුය යි ද ඔහුගේ දිවි නො සිස් යයි ද කීහු.

10. එහෙයින් නුවණැතියේ බුදුසස්න සමරමින් ශ්‍රද්ධා හා ශීල හා ප්‍රසාද හා ධර්මදර්ශනය යන මෙහි පුනපුනා යෙදෙන්නේ යයි.

## 7. 1. 1. 7

## [උග්ගමහාමත්තසුත්තං]

[සාවත්ථිනිදානං]

7. අථ ඛො උග්ගො රාජමහාමත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උග්ගො රාජමහාමත්තො භගවන්තං එතදවොච:

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාව අඩ්ඪො වායං භන්තෙ, මිගාරො රොහණෙය්‍යො යාව මහද්ධනො යාව මහාභොගොති.

කීව අඩ්ඪො පනුග්ග, මිගාරො රොහණෙය්‍යො කීව මහද්ධනො කීව මහාභොගොති.

සතං භන්තෙ, සහස්සානං හිරඤ්ඤස්ස, කො පන වාදො රූපියස්සාති?

අත්ථි ඛො[1] එතං උග්ග ධනං, නෙතං නත්ථීති වදාමි. තඤ්ච ඛො එතං උග්ග, ධනං සාධාරණං අග්ගිනා උදකෙන රාජූහි චොරෙහි අප්පියෙහි දායාදෙහි.

සත්ත ඛො ඉමානි උග්ග, ධනානි අසාධාරණානි අග්ගිනා උදකෙන රාජූහි චොරෙහි අප්පියෙහි දායාදෙහි. කතමානි සත්ත:

සද්ධාධනං, සීලධනං, හිරිධනං, ඔත්තප්පධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනං. ඉමානි ඛො උග්ග, සත්ත ධනානි අසාධාරණානි අග්ගිනා උදකෙන රාජූහි චොරෙහි අප්පියෙහි දායාදෙහී'ති.

11. සද්ධාධනං සීලධනං හිරි ඔත්තප්පියං ධනං
සුතධනං ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං.

12. යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා
සවෙ මහද්ධනො ලොකෙ අජෙය්‍යො දෙවමානුසෙ.

13. තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනන්ති.

## 7. 1. 1. 8

## [සත්තසඤ්ඤොජන සුත්තං]

[සාවත්ථිනිදානං]

8. සත්තිමානි භික්ඛවෙ, සඤ්ඤොජනානි. කතමානි සත්ත:

අනුනයසඤ්ඤොජනං, පටිඝසඤ්ඤොජනං, දිට්ඨිසඤ්ඤොජනං, විචිකිච්ඡා-සඤ්ඤොජනං, මානසඤ්ඤොජනං, භවරාගසඤ්ඤොජනං, අවිජ්ජාසඤ්ඤොජනං.

ඉමානි ඛො භික්ඛවෙ සත්ත සඤ්ඤොජනානීති.

---

1 අත්ථිකො - සිමු.

## 7. 1. 1. 7.

## [උග්ගමහාමාත්‍ය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

7. එකල්හි උග්ග නම් රාජමහාමාත්‍ය භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් උග්ග රාජමහාමාත්‍ය භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේ ය:

වහන්ස, ආශ්චර්ය්‍ය ය, වහන්ස, අද්භූත ය. වහන්ස, මේ රොහණ සිටුහුගේ මුනුපුරු මිගාර සිටු ආඪ්‍ය වූයේ ම, මහාධන ඇතියේ ම, මහා-භෝග ඇතියේ ම වේ යයි.

උග්ගයෙනි, රොහණෙය්‍ය මිගාර සිටු කොතෙක් ආඪ්‍ය වේ ද? කොතෙක් මහද්ධන වේ ද, කොතෙක් මහාභොග වේ දැ යි.

වහන්ස, හිරණ්‍ය පිළිබඳ ශතසහස්‍රයෙකි. රජත පිළිබඳ කවර කථා-යෙක් දැයි.

උග්ගයෙනි, තෙල ධනය ඇත් මැයි, තෙල ධන නැතැයි නො කියමි. උග්ගයෙනි, තෙල ධනය ගිනි හා දිය හා රජුන් හා සොරුන් හා අප්‍රිය දායාදයන් හා සාධාරණ මැයි.

උග්ගයෙනි, ගින්න හා දිය හා රජුන් හා සොරුන් හා අප්‍රිය දායාද-යන් හා අසාධාරණ වූ මෙ ධන සතෙකි. කවර සතෙක යත්:

සද්ධාධන, සීලධන, හිරිධන, ඔත්තප්පධන, සුතධන, චාගධන, පඤ්ඤාධන යි. උග්ගයෙනි, ගින්න හා දිය හා රජුන් හා සොරුන් හා අප්‍රියදායාදයන් හා අසාධාරණ වූ මෙ ධන සත යි.

11. සද්ධාධන ය, සීලධන ය, හිරිධන ය, ඔත්තප්පධන ය, සුතධන ය, චාගධන ය, සත්වැනි වූ ම පඤ්ඤාධන ය යි ධන සතෙකි.

12 යම් ස්ත්‍රියකට වේවයි පුරුෂයකුට වේවයි මෙ ධන ඇත් නම් හෙ එකැහිත් දෙවිමිනිසුන්ගෙන් යුත් ලෙව්හි මහද්ධන වෙයි.

13 එහෙයින් මේධාවී තෙම බුද්ධශාසනය සිහිකරමින් ශ්‍රද්ධා ශීල ප්‍රසාද ධර්මදර්ශන යන මෙහි යෙදෙන්නේ යි.

## 7. 1. 1. 8.

## [සත්තසංයොජන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

8. මහණෙනි, මෙ සංයෝජන සතෙකි. කවර සතෙක යත්:

අනුනය (කාමරාග) සංයොජන, පටිඝසංයොජන, දිට්ඨි සංයොජන, විචිකිච්ඡාසංයොජන, මානසංයොජන, භවරාගසංයොජන, අවිජ්ජා-සංයොජන යි.

මහණෙනි, මෙ සංයොජන සත යි.



Free Distribution www.aathaapi.org

## 7. 1. 1. 9

### [සංයොජනපහාන සුත්තං]

[සාවත්ථිනිදානං]

9. සත්තන්නං භික්ඛවෙ, සංයොජනානං පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති. කතමෙසං සත්තන්නං:

අනුනයසංයොජනස්ස පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති. පටිඝසංයොජනස්ස -පෙ- දිට්ඨිසංයොජනස්ස -පෙ- විචිකිච්ඡාසංයොජනස්ස -පෙ- මානසංයොජනස්ස -පෙ- භවරාගසංයොජනස්ස -පෙ- අවිජ්ජාසංයොජනස්ස පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති.

ඉමෙසං ඛො භික්ඛවෙ, සත්තන්නං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛුනො අනුනය සංයොජනං පහීනං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං -පෙ- පටිඝසංයොජනං -පෙ- දිට්ඨිසංයොජනං -පෙ- විචිකිච්ඡාසංයොජනං -පෙ- මානසංයොජනං -පෙ- භවරාගසංයොජනං -පෙ- අවිජ්ජාසංයොජනං පහීනං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං, අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

## 7. 1. 1. 10

### [මච්ඡරියසංයොජන සුත්තං]

[සාවත්ථිනිදානං]

10. සත්තිමානි භික්ඛවෙ, සංයොජනානි: කතමානි සත්ත:

අනුනයසංයොජනං, පටිඝසංයොජනං, දිට්ඨිසංයොජනං, විචිකිච්ඡාසංයොජනං, මානසංයොජනං, ඉස්සාසංයොජනං, මච්ඡරියසංයොජනං.

ඉමානි ඛො භික්ඛවෙ, සත්ත සංයොජනානීති.

ධනවග්ගො පඨමො.

තස්සුද්දානං:

දොපියාහි බලංධනං, සඞ්ඛිත්තංචෙව විත්ථතං
උග්ගංසංයොජනංචෙව පහානං මච්ඡරියෙනචා'ති.[1]

1 ද්වෙ පියද්වෙ බල ධනං අසඞ්ඛෙද්දි මෙ සඞ්ඛිත්තසෙවච විත්ථතං.
උග්ගසංයොජනං චෙව පහානමච්ඡරියෙන චා'ති - සීමු.

### 7. 1. 1. 9.

### [සඤ්ඤොජනපහාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

9. මහණෙනි, සංයෝජන සතක්හුගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බඹසර වසනු ලැබේ. කවර සතක්හුගේ ද යත්:

අනුනය සංයොජනයාගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බඹසර වසනු ලැබේ. ප්‍රතිඝසංයොජනයාගේ ප්‍රහාණය සඳහා ... දෘෂ්ටිසංයොජනයාගේ ... විචිකිච්ඡාසංයොජනයාගේ ... මානසංයොජනයාගේ ... භවරාගසංයොජනයාගේ ... අවිද්‍යාසංයොජනයාගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බඹසර වැසේ.

මහණෙනි, මේ සංයෝජන සත ප්‍රහාණය කරණු සඳහා සමුච්ඡේදය සඳහා බ්‍රහ්මචර්යය වසනු ලැබේ.

මහණෙනි, යම් හෙයෙකින් භික්ෂුහුගේ අනුනය සංයොජනය ප්‍රහීණ වේ ද, උසුත්මුල් ඇතියේ වේ ද, තාලාවස්තුකෘත ද, අනභාවකෘත ද, මත්තෙහි නූපදනා සැහැවි ඇතියේ ද ... ප්‍රතිඝසංයොජනය ... දෘෂ්ටිසංයොජනය ... විචිකිත්සාසංයොජනය ... මානසංයොජනය ... භවරාගසංයොජනය ... අවිද්‍යාසංයොජනය ප්‍රහීණ ද උසුත්මුල් ඇතියේ ද, තාලාවස්තුකෘත ද අනභාවකෘත ද, මත්තෙහි නූපදනා සැහැවි ඇතියේ ද, මහණෙනි, එහෙයින් මේ මහණ තෘෂ්ණාව සිඳලී යයි ද, සංයෝජන පෙරළාලී යයි ද, මොනොවට මානප්‍රහාණයෙන් සසරදුක් අවසන් කෙළේ ය යි ද කියනු ලැබේ.

### 7. 1. 1. 10.

### [මච්ඡරියසංයෝජන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

10. මහණෙනි, මේ සංයෝජන සතෙකි. කවර සතෙක යත්:

අනුනයසංයොජන ය, පටිඝසංයොජන ය, දිට්ඨිසංයොජන ය, විචිකිච්ඡාසංයොජන ය, මානසංයොජන ය, ඉස්සාසංයොජන ය, මච්ඡරියසංයොජන යි.

මහණෙනි, මේ සත් සංයොජන යි.

ධන වර්ගය පළමු වැනි යි.

එහි උද්දානය:

පිය සූත්‍ර දෙක ය, බල සූත්‍ර දෙක ය, සඞ්ඛිත්තධන සූත්‍ර ය, විත්ථතධනසූත්‍ර ය, උග්ග සූත්‍ර ය, සඤ්ඤොජන සූත්‍ර ය, සඤ්ඤොජනප්පහාන සූත්‍ර ය, මච්ඡරියසඤ්ඤොජන සූත්‍ර ය යි දසයෙකි.

## 2. අනුසයවග්ගො

### 7. 1. 2. 1

### [අනුසය සුත්තං]

[සාවත්ථි නිදානං]

11. සත්තිමෙ භික්ඛවෙ, අනුසයා. කතමෙ සත්ත:

කාමරාගානුසයො, පටිඝානුසයො, දිට්ඨානුසයො, විචිකිච්ඡානුසයො, මානානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත අනුසයාති.

### 7. 1. 2. 2

### [අනුසයපහාන සුත්තං]

[සාවත්ථි නිදානං]

12. සත්තන්නං භික්ඛවෙ අනුසයානං පහානාය[1] සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති. කතමෙසං සත්තන්නං:

කාමරාගානුසයස්ස පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති. පටිඝානුසයස්ස -පෙ- දිට්ඨානුසයස්ස -පෙ- විචිකිච්ඡානුසයස්ස -පෙ- මානානුසයස්ස -පෙ- භවරාගානුසයස්ස -පෙ- අවිජ්ජානුසයස්ස පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති.

ඉමෙසං ඛො භික්ඛවෙ, සත්තන්නං අනුසයානං පහානාය සමුච්ඡෙදාය බ්‍රහ්මචරියං වුස්සති.

යතො ච ඛො භික්ඛවෙ, භික්ඛුනො කාමරාගානුසයො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො[2] ආයතිං අනුප්පාදධම්මො, පටිඝානුසයො -පෙ- දිට්ඨානුසයො -පෙ- විචිකිච්ඡානුසයො -පෙ- මානානුසයො -පෙ- භවරාගානුසයො -පෙ- අවිජ්ජානුසයො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු නිරනුසයො[3] අච්ඡෙච්ඡි තණ්හං වාවත්තයි[4] සඤ්ඤොජනං සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

### 7. 1. 2. 3

### [කුලූපගමන සුත්තං]*

[සාවත්ථි නිදානං]

13. සත්තහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා නාලං උපගන්තුං, උපගන්ත්වා වා නාලං උපනිසීදිතුං. කතමෙහි සත්තහි:

න මනාපෙන පච්චුට්ඨෙන්ති. න මනාපෙන අභිවාදෙන්ති. න මනාපෙන ආසනං දෙන්ති. සන්තමස්ස පරිගුහන්ති. බහුකම්පි ථොකං දෙන්ති. පණීතම්පි ලූඛං දෙන්ති. අසක්කච්චං දෙන්ති නො සක්කච්චං.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි අඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා නාලං උපගන්තුං, උපගන්ත්වා වා නාලං උපනිසීදිතුං.

1 'සමුග්ඝාතාය' - ඉතිච, සීමු. 2. අනභාවංකතො - මජසං.
3. නිරනුසයො - මජසං, කදිස්සතෙ 4. විවත්තයි - මජසං.
* කුලසුත්තං - මජසං.

# 2. අනුසය වර්ගය

7. 1. 2. 1.

[අනුසය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

11. මහණෙනි, මේ අනුශය සතෙකි. කවර සතෙක යත්:

කාමරාගානුසය, පටිඝානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යි.

මහණෙනි, මේ අනුසය සත යි.

7. 1. 2. 2.

[අනුසයප්පහාන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

12. මහණෙනි, සප්තානුශයයන්ගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බඹසර වසනු ලැබේ. කවර සතක්හුගේය යත්:

කාමරාගානුසයාගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බ්‍රහ්මචර වසනු ලැබේ. පටිඝානුසයයාගේ ... දිට්ඨානුසයයාගේ ... විචිකිච්ඡානුසයයාගේ ... මානානුසයයාගේ .. භවරාගානුසයයාගේ ... අවිජ්ජානුසයයාගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බ්‍රහ්මචර්‍ය්‍යය වසනු ලැබේ.

මහණෙනි, මේ සප්තානුශයයන්ගේ ප්‍රහාණය සඳහා සමුච්ඡේදය සඳහා බ්‍රහ්මචර්‍ය්‍යය වසනු ලැබේ.

මහණෙනි, යම් හෙයෙකින් භික්ෂුහුගේ කාමරාගානුසය ප්‍රහීණ වේ නම් උදුරුත්මුල් ඇති වේ නම්, තාලාවස්තුකෘත වේ නම්, අභාවකෘත වේ නම් මතුයෙහි නූපදනා සැභැවි ඇතියේ නම්, ප්‍රතිඝානුශය .. දෘෂ්ට්‍යනුශය ... විචිකිත්සානුශය ... මානානුශය . භවරාගානුශය ... අවිද්‍යානුශය ප්‍රහීණ වේ නම් උදුරුත්මුල් ඇතියේ වේ නම් තාලාවස්තුකෘත වේ නම් අභාවකෘත වේ නම් මතුයෙහි නූපදනා සැභැවි ඇතියේ වේ නම්, මහණෙනි, අනුශය රහිත මහණ තෘෂ්ණාව සිඳලීය සංයොජන පෙරළාලී ය මැනැවින් අභිසමයාව-බොධයෙන් වත්දුඃඛය අවසන් කෙළේ යයි කියනු ලැබේ.

7. 1. 2. 3.

[කුලූපගමන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

13. මහණෙනි, අඞ්ග සතෙකින් සමන්විත කුලයට පළමු නො එළැඹ එළඹෙන්නට වේවයි එළැඹ හිඳිනට වේවයි නො නිසි වේ. කවර සතෙකින යත්:

මනාපාකාරයෙන් දැක හුනස්නෙන් නො නැඟ සිටුනාහ. මනාප අයුරින් අභිවාදන නො කරත්. මනාපයෙන් හිඳිනට ආසන නො දෙන්නාහ. විද්‍යමාන ද්‍රව්‍යධර්මය ඔහට පිළිසන් කරන්නාහ. බොහෝ ඇත ද ස්වල්ප විසින් දෙත්. ප්‍රණීත ද ඇත ද රූක්ෂ ද දෙන්නාහ. සකසා නොව නො සකසා ම දෙන්නාහ.

මහණෙනි, මේ සත් කරුණින් සමන්විත කුලය පළමු නො එළැඹ එළඹෙන්නට හෝ, එළැඹ හිඳිනට හෝ නො නිසි වේ,

සත්තහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා අලං උපගන්තුං, උපගන්ත්වා වා අලං උපනිසීදිතුං. කතමෙහි සත්තහි:

මනාපෙන පච්චුට්ඨෙන්ති, මනාපෙන අභිවාදෙන්ති, මනාපෙන ආසනං දෙන්ති, සන්තම්පස්ස න පරිගුහන්ති, බහුකම්පි බහුකං දෙන්ති, පණීතම්පි පණීතං දෙන්ති, සක්කච්චං දෙන්ති නො අසක්කච්චං.

ඉමෙහි ඛො භික්ඛවෙ සත්තහි අඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා අලං උපගන්තුං, උපගන්ත්වා වා අලං උපනිසීදිතුන්ති.

### 7. 1. 2. 4

### [ආහුනෙය්‍යපුග්ගල සුත්තං]

[සාවත්ථිනිදානං]

**14.** සත්තිමෙ භික්ඛවෙ පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ සත්ත:

උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛි, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී.

ඉමෙ ඛො භික්ඛවෙ සත්ත පුග්ගලා ආහුනෙය්‍යා, පාහුනෙය්‍යා, දක්ඛිණෙය්‍යා, අඤ්ජලිකරණීයා, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

### 7. 2. 9. 5

### [උදකූපමපුග්ගල සුත්තං]

[සාවත්ථිනිදානං]

**15.** සත්තිමෙ භික්ඛවෙ උදකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ සත්ත:

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සකිං නිමුග්ගො නිමුග්ගොව හොති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජිත්වා නිමුජ්ජති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජිත්වා ඨිතො හොති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජිත්වා විපස්සති, විලොකෙති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජිත්වා පතරති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජිත්වා පතිගාධප්පත්තො හොති. ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජිත්වා තිණ්ණො හොති පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

(1) කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සකිං නිමුග්ගො නිමුග්ගොව හොති: ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සමන්නාගතො හොති එකන්තකාළකෙහි අකුසලෙහි ධම්මෙහි. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සකිං නිමුග්ගො නිමුග්ගොව හොති.

මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත කුලය පළමු නො එළැඹ එළඹෙන්නට හෝ එළැඹ හිඳිනට හෝ නිසි වේ. කවර සත් කරුණෙකින යත්:

මනාපාකාරයෙන් දැක හුනස්නෙන් නැඟ සිටුනාහ. මනාපඅයුරින් වඳනා කරන්නාහ. මැනැවින් හිඳිනට අසුන් දෙන්නාහ. විද්‍යමාන දෙය-ධර්මය ඔහට පිළිසන් නො කරන්නාහ. බොහෝ ඇති වත් ම බොහෝ කොට දෙන්නාහ. ප්‍රණීත වස්තු ප්‍රණීත කොට ම දෙන්නාහ. නො සකස් කොට නො ව, සකස් කොට ම දෙන්නාහ.

මහණෙනි, මෙ කරුණු සතින් සමන්වාගත කුලය පළමු නො එළැඹ එළැඹෙන්නට හෝ එළැඹ හිඳිනට හෝ නිසි වේ යයි.

### 7. 1. 3. 4.

### [ආහුනෙය්‍ය පුග්ගල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**14**. මහණෙනි, ආහුනෙය්‍ය වූ පාහුනෙය්‍ය වූ දක්ඛිණෙය්‍ය වූ අඤ්ජලි-කරණීය වූ ලෝකයාහට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ මේ පුද්ගලයෝ සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

උභතොභාග විමුක්ත ය, ප්‍රඥා විමුක්ත ය, කායසාක්ෂි ය, දෘෂ්ටිප්‍රාප්ත ය, ශ්‍රද්ධාවිමුක්ත ය, ධර්මානුසාරී ය, ශ්‍රද්ධානුසාරී ය යි.

මහණෙනි, ආහුනභාගී වූ ප්‍රාහුණභාගී වූ දක්ෂිණාගී වූ අඤ්ජලීකරණයට නිසි වූ ලෝකයාට අනුත්තරපුණ්‍යක්ෂෙත්‍ර වූ මේ සත් පුද්ගල්හු යි.

(අට්ඨකථාවෙන් හා විශුද්ධිමාර්ගයෙන් විස්තර දත යුතු.)

### 7. 1. 3. 5

### [උදකූපමපුග්ගල සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**15**. මහණෙනි, ලෝකයෙහි විද්‍යමානවන්නා වූ ම මේ උදකොපම පුද්ගලයෝ සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් වරක් නිමග්න වූයේ (කිඳුනේ) නිමග්න (කිඳුනේ) ම වෙයි. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් ඉපිල යිපියේ (මතුවූයේ) වෙයි. මහණෙනි, මෙලොව්හි ඇතැම් පුද්ගලයෙක් ඉපිල වට බලයි, අනුවිලොකන කරයි. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් ඉපිල යායුතු මංබලා තරණය කෙරෙයි. මහණෙනි, මෙ ලොව්හි ඇතම් පුද්ගලයෙක් ඉපිල ප්‍රතිගාධයට (ප්‍රතිෂ්ඨාවට) පැමිණියේ වෙයි. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් ඉපිල තරණය කොළේ පරතෙර පැමිණ බ්‍රාහමණ වූයේ තලයෙහි (නිවනෙහි) සිටුනේ වෙයි.

(1) මහණෙනි, පුද්ගල එක් වරක් නිමග්න වූයේ කෙසේ නිමග්න ම වේ ය යත්: මහණෙනි, මෙ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඒකාන්තයෙන් කෘෂ්ණ වූ අකුශලධර්මයෙන් (නියත මිථ්‍යාදෘෂ්ටියෙන්) සමන්වාගත වෙයි. මහණෙනි, මෙසෙයින් පුද්ගල වරක් නිමග්න වූයේ නිමග්න ම වෙයි.

(2) කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා නිමුජ්ජති: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජති "සාධු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාධු හිරි -පෙ- සාධු ඔත්තප්පං -පෙ- සාධු විරියං -පෙ- සාධු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූ"ති. තස්ස සා සද්ධා නෙව තිට්ඨති, නො වඩ්ඪති, හායතෙව. තස්ස සා හිරි -පෙ- තස්ස තං ඔත්තප්පං -පෙ- තස්ස තං විරියං -පෙ- තස්ස සා පඤ්ඤා නෙව තිට්ඨති, නො වඩ්ඪති, හායතෙව. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා නිමුජ්ජති.

(3) කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා ඨිතො හොති: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජති "සාධු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාධු හිරි -පෙ- සාධු ඔත්තප්පං -පෙ- සාධු විරියං -පෙ- සාධු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූ"ති. තස්ස සා සද්ධා නෙව හායති, නො වඩ්ඪති, ඨිතා හොති. තස්ස සා හිරි -පෙ- තස්ස තං ඔත්තප්පං -පෙ- තස්ස තං විරියං -පෙ- තස්ස සා පඤ්ඤා නෙව හායති, නො වඩ්ඪති, ඨිතා හොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා ඨිතො හොති.

(4) කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා විපස්සති, විලොකෙති: ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජති "සාධු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාධු හිරි -පෙ- සාධු ඔත්තප්පං -පෙ- සාධු විරියං -පෙ- සාධු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූ"ති. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා විපස්සති, විලොකෙති.

(5) කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා පතරති: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජති "සාධු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාධු හිරි -පෙ- සාධු ඔත්තප්පං -පෙ- සාධු විරියං -පෙ- සාධු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූ"ති. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති. සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා පතරති.

(6) කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා පතිගාධප්පත්තො හොති: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජති "සාධු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාධු හිරී -පෙ- සාධු ඔත්තප්පං -පෙ- සාධු විරියං -පෙ- සාධු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූ"ති. සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා පතිගාධප්පත්තො හොති.

(7) කථඤ්ච භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා තිණ්ණො හොති පාරඞ්ගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජති "සාධු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාධු හිරි -පෙ- සාධු ඔත්තප්පං -පෙ- සාධු විරියං -පෙ- සාධු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූ"ති. සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ පුග්ගලො උම්මුජ්ජිත්වා තිණ්ණො හොති පාරඞ්ගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

ඉමෙ ඛො භික්ඛවෙ සත්ත උදකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

(2) මහණෙනි, කෙසේ නම් පුද්ගල ඉපිල කිඳුනේ වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් කුසල්දහම්හි ශ්‍රද්ධාව මැනැව, හිරි මැනැව, ඔතප් මැනැව, වැර මැනැව, කුශලධර්මයන්හි ප්‍රඥාව මැනැවැයි ඉල්පෙයි. ඔහුගේ ඒ ශ්‍රද්ධාව නො සිටුනේ ය, නො වැඩෙයි, පිරිහේ ම ය. ඔහුගේ ඒ ශ්‍රිය ... ඔහුගේ ඒ ඔත්තප්පය ... ඔහුගේ ඒ වීර්‍ය්‍යය .. ඔහුගේ ඒ ප්‍රඥාව නො මැ සිටුනේ ය, නො මැ වැඩෙයි, පිරිහේ මැ යි. මහණෙනි, මෙ සෙයින් පුද්ගල ඉල්ප කිඳුනේ වේ.

(3) මහණෙනි, කිසෙයින් පුද්ගල ඉල්පී සිටියේ වේ ය යත්. මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් "කුශලධර්මයන්හි පිහිටි ශ්‍රද්ධාව මනා ය, හිරිය මනා ය, ඔත්තප්පය මනා ය, වීර්‍ය්‍යය මනා ය, කුශලධර්මයන්හි පිහිටි ප්‍රඥාව මනා ය යි ඉල්ප සිටිනේ ය. ඔහුගේ ඒ සැදැහැ නො ම පිරිහෙයි, නො ද වැඩෙයි, සිටියා ම වෙයි. ඔහුගේ ඒ හිරිය ... ඔහුගේ ඒ ඔත්තප්පය ... ඔහුගේ ඒ වීර්‍ය්‍යය ... ඔහුගේ ඒ ප්‍රඥාව නො ම පිරිහෙයි, නො ද වැඩෙයි, සිටියා ම වෙ යි මහණෙනි, මෙසෙයින් පුද්ගල ඉපිල සිටියේ වෙයි.

(4) මහණෙනි, කිසෙයින් පුද්ගල ඉපිල වටා බලන්නේ ය, අනුවිලොකන කරන්නේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් "කුශලධර්මයන්හි ශ්‍රද්ධා මනා ය, හිරිය මනා ය, ඔතප් මනා ය, වැර මනා ය, කුශල ධර්මයන්හි පිහිටි ප්‍රඥා මනා ය"යි ඉල්පෙයි. හේ තුන් සංයෝජනයන්ගේ පරික්‍ෂයෙන් අවිනිපාතස්වභාව ඇතියේ නියත වූ සම්බෝධිපරායණ වූයේ සෝවන් වෙයි. මහණෙනි, මෙසේ පුගුල් ඉල්ප යායුතු දිග් බලයි, නගමයි.

(5) මහණෙනි, කිසේ නම් පුගුල් ඉල්ප තරණය කෙරේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුගුලෙක් "කුශලධර්මයන්හි ශ්‍රද්ධා මනා ම ය, හිරි මනා ම ය, ඔතප් මනා ම ය, වීර්‍ය්‍යය මනා ම ය, ප්‍රඥා මනා ම ය"යි ඉල්පෙයි. හෙ තුන් සංයොජනයන්ගේ පරික්‍ෂයෙන් රාගද්වෙෂමෝහයන්ගේ තනුභාවයෙන් සකෘදාගාමී වෙයි. එක් වරක් ම මෙ ලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. මහණෙනි, මෙසේ පුගුල් ඉල්ප තරණය කෙරෙයි.

(6) මහණෙනි, කිසේ නම් පුගුල් ඉල්ප ප්‍රතිෂ්ඨා ප්‍රාප්ත වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුගුලෙක් "කුසල් දහම්හි ශ්‍රද්ධා මනා ම ය, හිරි මනා ම ය, ඔතප් මනා ම ය, වීර්‍ය්‍ය මනා ම ය, ප්‍රඥා මනා ම ය"යි ඉල්පෙයි. හෙ පඤ්චඔරම්භාගිය සංයෝජන පරික්‍ෂයෙන් එහි ම පිරිනිවෙන සුලු ඒ සුද්දවැසි බඹ ලොවින් පෙරළා නො එන සැහැවි ඇතියේ ඕපපාතික වෙයි. මහණෙනි, මෙසේ පුගුල් ඉල්ප ප්‍රතිෂ්ඨාප්‍රාප්ත වෙයි.

(7) මහණෙනි, කිසේ නම් පුගුල් ඉල්ප තරණය කළේ වෙයි, පරතෙර ගියේ වෙයි, බාහිත පාපී බ්‍රාහ්මණ (නිවන්) තෙලෙහි සිටියේ වේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුගුලෙක් "කුශලධර්මයන්හි ශ්‍රද්ධා මනා ය, හිරි මනා ය, ඔතප් මනා ය, වැර මනා ය, ප්‍රඥා මනා ය"යි ඉල්පෙයි. හෙ ආස්‍රවක්‍ෂයයෙන් ආස්‍රව රහිත වූ චේතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මභාවයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්‍ෂාත් කොට එයට එළඹ වෙසෙයි. මහණෙනි, මෙසේ පුගුල් ඉල්ප තරණය කළේ පරතෙර ගියේ බාහිතපාපී බ්‍රාහ්මණ (නිවන්) තෙලෙහි සිටුනේ ය.

මහණෙනි, ලොව්හි විද්‍යමාන වන මේ උදකෝපම පුද්ගලයෝ සත් දෙන යි.

## 7. 1. 2. 6

## [අනිච්චානුපස්සී සුත්තං]

[සාවත්ථිනිදානං]

**16**. සත්තිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ සත්ත:

(1) ඉධ භික්ඛවෙ, එකච්චො පුග්ගලො සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරති අනිච්චසඤ්ඤී අනිච්චපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. සො ආසවානං ඛයා [අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං] -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං භික්ඛවෙ, පඨමො පුග්ගලො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

(2) පුන ච පරං භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරති අනිච්චසඤ්ඤී අනිච්චපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො, තස්ස අපුබ්බං අචරිමං ආසවපරියාදානඤ්ච හොති ජීවිතපරියාදානඤ්ච. අයං භික්ඛවෙ, දුතියො පුග්ගලො ආහුනෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

(3) පුන ච පරං භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරති අනිච්චසඤ්ඤී අනිච්චපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති. [අයං තතියො පුග්ගලො.] (4) -පෙ- උපහච්චපරිනිබ්බායී හොති. [අයං චතුත්ථො පුග්ගලො.] (5) -පෙ- අසඞ්ඛාරපරිනිබ්බායී හොති. [අයං පඤ්චමො පුග්ගලො.] (6) -පෙ- සසංඛාරපරිනිබ්බායී හොති. [අයං ඡට්ඨමො පුග්ගලො.] (7) -පෙ- උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. අයං භික්ඛවෙ, සත්තමො පුග්ගලො ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 7. 1. 2. 7

## [දුක්ඛානුපස්සී සුත්තං]

[සාවත්ථිනිදානං]

**17**. සත්තිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුනෙය්‍යා -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ සත්ත:

ඉධ භික්ඛවෙ, එකච්චො පුග්ගලො සබ්බසඞ්ඛාරෙසු දුක්ඛානුපස්සී විහරති -පෙ- ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත පුග්ගලා ආහුනෙය්‍යා -පෙ- ලොකස්සාති.

## 7. 1. 2. 6

### [අනිච්චානුපස්සී සූත්‍රය]

[සැවත්නිදාන යි]

16. මහණෙනි, ආහුනෙය්‍ය වූ ප්‍රාහුණෙය්‍ය වූ දක්ෂිණෙය්‍ය වූ අඤ්ජලිකරණයට හිසි වූ ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වූ මේ පුගුල්හු සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

(1) සර්වසංස්කාරයන්හි අනිත්‍යානුදර්ශී වූයේ, අනිත්‍යසංඥා ඇතියේ, අනිත්‍යප්‍රතිසංවේද ඇතියේ, හැම කල්හි (පූර්වාපර සම්බන්ධ සිත් ඇතියේ) නිරතුරු (අත් සිතකින්) නොමුසු සේ සිතින් සනිටුහන් කරනුයේ, විවසුන් නැණින් පයර්‍යවගාහ කරමින් (බැස ගනිමින්) වෙසෙයි. හේ ආශ්‍රවක්ෂයෙන් ... (ආශ්‍රව රහිත චෙතොවිමුක්ති - ප්‍රඥාවිමුක්ති) සාක්ෂාත් කොට එයට එළඹ වාසය කෙරෙයි. මහණෙනි, මේ ආහුනෙය්‍ය වූ ප්‍රාහුණෙය්‍ය වූ දක්ෂිණෙය්‍ය වූ අඤ්ජලිකරණයට යෝග්‍ය වූ ලෝකයාට අනුත්තරපුණ්‍යක්ෂේත්‍ර වූ ප්‍රථම පුද්ගල යි.

(2) තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුගුලෙක් සර්වසංස්කාරයන්හි අනිත්‍යානුදර්ශී වූයේ, අනිත්‍යසංඥා ඇතියේ, අනිත්‍යප්‍රතිසංවිද් ඇතියේ, හැමකල් නිරතුරු අමිශ්‍ර සේ සිතින් සනිටුහන් කරණුයේ, ප්‍රඥයෙන් පර්‍යවගාහ කරණුයේ වාසය කෙරෙයි. ඔහට නො පෙර පසුව ආශ්‍රවසිඳීයෑම ද ජීවිතය සිඳීයෑම ද වෙයි. මහණෙනි, මෙ ආහුනෙය්‍ය වූ ... ලොකයට අනුත්තරපුණ්‍යක්ෂේත්‍ර වූ ද්විතීය (ජීවිත සමසීසී) පුද්ගල යි.

(3) තවද මහණෙනි, මෙලොව්හි ඇතැම් පුගුලෙක් සර්වසංස්කාරයන්හි අනිත්‍යානුදර්ශී වූයේ, අනිත්‍යසංඥා ඇතියේ, අනිත්‍යප්‍රතිසංවිද් ඇතියේ හැමවිට නිරතුරු අසම්මිශ්‍ර කොට සිතින් අධිමොක්ෂ කරමින්, ප්‍රඥයෙන් පර්‍යවගාහ කරමින් වෙසේ. හෙ පඤ්චොරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයෙන් අන්තරාපරිනිබ්බායී (ශුද්ධාවාසයෙහි උපන් කෙණෙහි හෝ මදක් පසුව පිරිනිවෙන්නේ) වෙයි. (4) ... උපහච්චපරිනිබ්බායී (ආයු මැද පිරිනිවෙන්නේ) වෙයි. (5) ... අසඞ්ඛාරපරිනිබ්බායී (උත්සාහ රහිතව පිරිනිවෙන්නේ) වෙයි. (6) ... සසඞ්ඛාරපරිනිබ්බායී (උත්සාහ සහිතව පිරිනිවෙන්නෙ) වෙයි. (7) ... අකනිට්ඨගාමී උද්ධංසොත (අකනිට්ඨබ්‍රහ්මලෝකයක් යන තුරුව පිරිනිවෙන්නෙ) වෙයි. මහණෙනි, ආහුනෙය්‍ය වූ ප්‍රාහුණෙය්‍ය වූ දක්ෂිණෙය්‍ය වූ අඤ්ජලිකරණීය වූ ලෝකයට අනුත්තරපුණ්‍යක්ෂේත්‍ර වූ මේ සත්වන පුද්ගල යි.

මහණෙනි, ආහුනෙය්‍ය වූ ප්‍රාහුණෙය්‍ය වූ ... ලෝකයට අනුත්තරපුණ්‍යක්ෂේත්‍ර වූ මෙ සත්පුගුල්හු වෙති.

## 7. 1. 2. 7

### [දුක්ඛානුපස්සී සූත්‍රය]

සැවත්නිදාන යි]

17. මහණෙනි, ආහුනෙය්‍ය වූ ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වූ මෙ පුගුල්හු සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුගුලෙක් සර්වසංස්කාරයන්හි දුඃඛානුදර්ශී වූයේ වෙසෙයි ... මහණෙනි, ආහුනෙය්‍ය වූ ... ලොවට [අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වූ] මේ පුගුල්හු සත් දෙන වෙත්.

## 7. 1. 2. 8

### [අනත්තානුපස්සී සුත්තං]

[සාවත්ථිනිදානං]

18. සත්තිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුනෙය්‍යා -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ සත්ත:

ඉධ භික්ඛවෙ, එකච්චො පුග්ගලො සබ්බධම්මෙසු අනත්තානුපස්සී විහරති -පෙ- ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත පුග්ගලා ආහුනෙය්‍යා -පෙ- [අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං] ලොකස්සාති.

## 7. 1. 2. 9

### [සුඛානුපස්සී සුත්තං]

[සාවත්ථිනිදානං]

19. සත්තිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුනෙය්‍යා -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ සත්ත:

ඉධ භික්ඛවෙ, එකච්චො පුග්ගලො නිබ්බානෙ සුඛානුපස්සී විහරති සුඛසඤ්ඤී සුඛපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. සො ආසවානං ඛයා [අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං] -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං භික්ඛවෙ, පඨමො පුග්ගලො ආහුනෙය්‍යො පෙ-[අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං] ලොකස්ස.

පුන ච පරං භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො නිබ්බානෙ සුඛානුපස්සී විහරති සුඛසඤ්ඤී සුඛපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. තස්ස අපුබ්බං අචරිමං ආසවපරියාදානඤ්ච හොති ජීවිතපරියාදානඤ්ච. අයං භික්ඛවෙ, දුතියො පුග්ගලො ආහුනෙය්‍යො -පෙ- [අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං] ලොකස්ස.

පුන ච පරං භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො නිබ්බානෙ සුඛානුපස්සී විහරති සුඛසඤ්ඤී සුඛපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති -පෙ- උපහච්චපරිනිබ්බායී හොති -පෙ- අසඞ්ඛාරපරිනිබ්බායී හොති -පෙ- සසඞ්ඛාරපරිනිබ්බායී හොති -පෙ- උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. අයං භික්ඛවෙ, සත්තමො පුග්ගලො ආහුනෙය්‍යො -පෙ- ලොකස්ස.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 7. 1. 2. 8

### [අනත්තානුපස්සී සූත්‍රය]

[සැවැත් නිදාන යි]

**18.** මහණෙනි, ආහුනනාගී වූ ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ මේ පුහුල්හු සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් සර්වධර්මයන්හි අනාත්මානුදර්ශී වූයේ වෙසෙයි ... මහණෙනි, ආහුනනාගී වූ ... ලොවට [අනුත්තරපුණ්‍යක්ෂෙත්‍ර වූ] මේ සත් පුහුල්හු වෙති.

## 7. 1. 2. 9

### [සුඛානුපස්සී සූත්‍රය]

[සැවැත් නිදාන යි]

**19.** මහණෙනි, ආහුනනාගී වූ ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ මේ පුහුල්හු සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් නිවනෙහි සුඛානුදර්ශී වූයේ සුඛසංඥ ඇතියේ සුඛප්‍රතිසංවිද් ඇතියේ හැම කල්හි නිරතුරු ව්‍යතිමිශ්‍ර නො කොට සිතින් සතිටුහන් කරමින් ප්‍රඥයෙන් වැදගන්මින් වෙසෙයි. හේ ආස්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥව ... සාක්ෂාත් කොට එළඹ වෙසෙයි. මහණෙනි, ආහුනනාගී වූ ... ලොවට [පුණ්‍යක්ෂෙත්‍ර වූ] මේ ප්‍රථම පුද්ගල යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් නිර්වාණයෙහි සුඛානුදර්ශී වූයේ සුඛසංඥ ඇතියේ සුඛප්‍රතිසංවිද් ඇතියේ හැමවිට නිරතුරු අසම්මිශ්‍ර කොට සිතින් අධිමොක්ෂ කරණුයේ ප්‍රඥයෙන් පර්‍යවගාහ කරනුයේ වෙසෙයි. ඔහට නො පෙරපසු ව ආස්‍රවපරික්ෂය ද ජීවිතපරික්ෂය ද වෙයි. මහණෙනි, ආහුනනාගී වූ .. ලොවට [පුණ්‍යක්ෂෙත්‍ර වූ] මේ ද්විතීය පුද්ගල යි.

තවද මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුහුලෙක් නිවන්හි සුව අනුව දක්මින් දුඛසංඥ ඇතියේ සුව පිළිවිදිනාසුලු වූයේ හැමකල් නිරතුරු ව්‍යතිමිශ්‍ර නො කොට සිතින් සතිටුහන් කරමින් ප්‍රඥයෙන් වැදගන්මින් වෙසෙයි. හෙ පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අන්තරා පරිනිබ්බායී වෙයි ... උපහච්චපරිනිබ්බායී වෙයි ... අසඞ්ඛාරපරිනිබ්බායී වෙයි ... සසඞ්ඛාරපරිනිබ්බායී වෙයි .. අකනිට්ඨගාමීඋද්ධංසොත වෙයි. මහණෙනි, මේ ආහුනෙය්‍ය වූ ... ලොවට [පුණ්‍යක්ෂෙත්‍ර වූ] සප්තම පුද්ගල යි.

මහණෙනි, අහුනෙය්‍ය වූ පාහුනෙය්‍ය වූ දක්ෂිණෙය්‍ය වූ අඤ්ජලී කරණීය වූ ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ මෙ සත් පුහුල් හු යි.

## 7. 1. 2. 10.

## [නිද්දසවත්ථුසුත්තං]

[සාවත්ථිනිදානං]

20. සත්තිමානි භික්ඛවෙ, නිද්දසවත්ථූනි, කතමානි සත්ත.

ඉධ භික්ඛවෙ, භික්ඛු සික්ඛාසමාදානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සික්ඛාසමාදානෙ අවිගතපෙමො. ධම්මනිසන්තියා තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච ධම්මනිසන්තියා අවිගතපෙමො. ඉච්ඡාවිනයෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච ඉච්ඡාවිනයෙ අවිගතපෙමො. පටිසල්ලානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච පටිසල්ලානෙ අවිගතපෙමො. විරියාරම්භෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච විරියාරම්භෙ අවිගත පෙමො. සතිනෙපක්කෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සතිනෙපක්කෙ අවිගතපෙමො. දිට්ඨිපටිවෙධෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච දිට්ඨිපටිවෙධෙ අවිගතපෙමො.

ඉමානි ඛො භික්ඛවෙ, සත්ත නිද්දසවත්ථූනීති.

අනුසයවග්ගො දුතියො.

තස්සුද්දානං:

ද්වෙ අනුසයා කුලං පුග්ගලං උදකූපමඤ්ච පඤ්චමං,
අනිච්චං දුක්ඛං අනත්තා ච සුඛ නිද්දස වත්ථූනි තෙ දසාති,

## 7. 1. 2. 10

## [නිද්දසවත්ථු සූත්‍රය]

[සැවැත්නිදාන යි]

20. මහණෙනි, මේ නිර්දශවස්තු සතෙකි. කවර සතෙක යත්:

මහණෙනි, මේ සස්නෙහි මහණ ශික්ෂාසමාදානයෙහි තීව්‍ර ඡන්ද ඇතියේ මත්තෙහි ද ශික්ෂාසමාදානයෙහි අවිගත ප්‍රේම ඇතියේ වෙයි. ධම්මනිසන්තියෙහි (විදර්ශනායෙහි) තීව්‍ර ඡන්ද ඇතියේ මත්තෙහි ද ධම්මනිසන්තියෙහි අවිගත ප්‍රේම ඇතියේ වෙයි. ඉච්ඡාවිනයෙහි (තෘෂ්ණාවිනයෙහි) තීව්‍ර ඡන්ද ඇතියේ මත්තෙහි ද ඉච්ඡාවිනයෙහි අවිගත ප්‍රේම ඇතියේ වෙයි. පිළිසලනෙහි (එකීභාවයෙහි) තීව්‍ර ඡන්ද ඇතියේ මත්තෙහි ද පිළිසලනෙහි අවිගත ප්‍රේම ඇතියේ වෙයි. වීර්‍ය්‍යාරම්භයෙහි තීව්‍ර ඡන්ද ඇතියේ මත්තෙහි ද වීර්‍ය්‍යාරම්භයෙහි අවිගතප්‍රේම ඇතියේ වෙයි. සමෘති නිපකභාවයෙහි (සිහි හා සථානොචිත ප්‍රඥාහි) තීව්‍ර ඡන්ද ඇතියේ මතුයෙහි ද සමෘති නිපකභාවයෙහි අවිගත ප්‍රේම ඇතියේ වෙයි. (මාර්ගදර්ශනසඞ්ඛ්‍යාත) දෘෂ්ටිප්‍රතිවෙධයෙහි තීව්‍ර ඡන්ද ඇතියේ මතුයෙහි ද දෘෂ්ටිප්‍රතිවෙධයෙහි අවිගත ප්‍රේම ඇතියේ වෙයි.

මහණෙනි, මේ නිර්දශවස්තු (රහතුන් පිළිබඳ "දසවස්හි පිරිනිවියහු නැවත දසවස් නොවෙති" ආදි කථා කරුණු) සත යි.

[සූත්‍රයෙහි අදහස අර්ථකථාවෙන් දතයුතු.]

අනුශයවර්ගය දෙවෙනි යි.

එහි උද්දානය:

අනුසය සූත්‍ර දෙක ය, කුලසූත්‍රය, පුග්ගලසූත්‍රය, උදකූපම්සූත්‍ර ය, අනිච්චසූත්‍ර ය, දුක්ඛසූත්‍ර ය, අනත්තසූත්‍ර ය, සුඛසූත්‍ර ය, නිද්දසවත්ථුසූත්‍ර ය දැයි දසයෙකි.

## 3. වජ්ජිසත්තක වග්ගො.

### 7. 1. 3. 1.

### [සාරන්දද සුත්තං]

21. එවං මෙ සුතං එකං සමයං භගවා වෙසාලියං විහරති සාරන්දදෙ චෙතියෙ.

අථ ඛො සම්බහුලා ලිච්ඡවී යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ ලිච්ඡවී භගවා එතදවොච:

සත්ත වො ලිච්ඡවී, අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ ලිච්ඡවී භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමෙ ච ලිච්ඡවී සත්ත අපරිහානියා ධම්මා:

(1) යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී අභිණ්හං සන්නිපාතා, භවිස්සන්ති සන්නිපාතබහුලා, වුද්ධියෙව ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(2) යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී සමග්ගා සන්නිපතිස්සන්ති, සමග්ගා වුට්ඨහිස්සන්ති, සමග්ගා වජ්ජිකරණීයානි කරිස්සන්ති වුද්ධියෙව ලිච්ඡවී වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(3) යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී අපඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථා පඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තිස්සන්ති, වුද්ධියෙව ලිච්ඡවී වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(4) යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා, තෙ සක්කරිස්සන්ති, ගරුකරිස්සන්ති, මානෙස්සන්ති, පූජෙස්සන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුද්ධියෙව ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(5) යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො, තා න ඔක්කස්ස[1] පසය්හ වාසෙස්සන්ති, වුද්ධියෙව ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(6) යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජිචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච, තානි සක්කරිස්සන්ති, ගරුකරිස්සන්ති, මානෙස්සන්ති, පූජෙස්සන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙස්සන්ති, වුද්ධියෙව ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

---

1. ඔක්කස්ස - සයා

# 3. වජ්ජිසත්තක වග්ගය

## 7. 1. 3. 1

### [සාරන්දද සූත්‍රය]

21. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෛශාලී නගරයෙහි සාරන්දද චෛත්‍ය නම් වෙහෙරෙහි වැඩ වසනසේක

එක්බිති බොහෝ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ ලිච්ඡවීනට භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණු වදාළහ:

"ලිච්ඡවියෙනි, තොපට සප්තඅපරිහානීය ධර්මයන් දෙසමි. ඒ අසව්. මනාකොට මෙනෙහි කරව්. කියමි"යි. 'එසේ ය වහන්සැ'යි ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක.

ලිච්ඡවියෙනි, අපරිහානීයධර්ම සත කවර යත්:

(1) ලිච්ඡවියෙනි, වෘජීහු යම්තාක්කල් නිතර රැස්වන්නාහු රැස්වීම් බහුල කොට ඇත්තාහු නම්, ලිච්ඡවියෙනි, වෘජීන්හට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු.

(2) ලිච්ඡවියෙනි, යම් තාක් කල් වෘජීහු සමඟ ව රැස් වෙත් නම්, සමඟ ව නැඟ සිටුනාහු නම්, සමඟ ව වෘජීනට අයත් කරණී කෙරෙත් නම්, ලිච්ඡවියෙනි, වෘජීනට වෘද්ධිය මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු.

(3) ලිච්ඡවියෙනි, යම් තාක් කල් වෘජීහු අප්‍රඥප්තයක් (පෙර රජුන් විසින් නො පනවනලද ව්‍යවස්ථා)නො පණවත් නම්, ප්‍රඥප්තය (පැණවූ ව්‍යවස්ථා)නො සිඳලත් නම්, යථාප්‍රඥප්ත වූ පැරණි වෘජිධර්මයෙහි සමාදන් කොටගෙණ වැටෙත් නම්, ලිච්ඡවියෙනි, වෘජීනට වෘද්ධිය මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු.

(4) ලිච්ඡවියෙනි, යම් තාක් කල් වෘජීහු යම් බඳු මහලු වෘජීහු වෙත් නම්, ඔවුනට සත්කාර කරන්නාහු, ගරුකරන්නාහු, බුහුමන් කරන්නාහු, පූජා කරන්නාහු නම්, ඔවුන්ගේ ද අවවාද කථා ඇසියයුතු කොට හඟනාහු නම්, ලිච්ඡවියෙනි, වෘජීනට වෘද්ධිය මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු.

(5) ලිච්ඡවියෙනි, යම් තාක් කල් වෘජීහු යම් බඳු කුලස්ත්‍රීහු කුලකුමාරිහු වෙත් නම්, ඔවුන් ගැදගෙණ බලාත්කාරයෙන් මැඩගෙණ නො වස්වන්නාහු නම්, ලිච්ඡවියෙනි, වෘජීන්හට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු.

(6) ලිච්ඡවියෙනි, යම් තාක් කල් වැදූරට වැසියෝ වෘජීන්ගේ ඇතුළුනුවර පිහිටි හෝ බිහිනුවර පිහිටි හෝ යම් බඳු වෘජිචෛත්‍යස්ථානයෝ වෙත් නම්, ඒ හැමට සත්කාරකරන්නාහු, ගරු කරන්නාහු, බුහුමන් කරන්නාහු, පුදන්නාහු නම්, ඔවුනට (රජමහ ඇමති ආදීන් විසින්) දුන්විරූ, කළවිරූ දැහැමි බලි නො පිරිහෙළන්නාහු නම්, ලිච්ඡවියෙනි, වෘජීන්හට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැතිවිය යුතු.

(7) යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා භවිස්සති 'කින්ති අනාගතා ච අරහන්තො විජිතං ආගච්ඡෙය්‍යුං, ආගතා ච අරහන්තො විජිතෙ ඵාසුං විහරෙය්‍යුන්ති' වුද්ධියෙව ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච ලිච්ඡවී, ඉමෙ සත්ත අපරිහානියා ධම්මා වජ්ජීසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු වජ්ජී සන්දිස්සන්ති, වුද්ධියෙව ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානීති.

### 7. 1. 3. 2.

### [වස්සකාරසුත්තං]

22. එවමෙම සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති, ගිජ්ඣකූටෙ පබ්බතෙ, තෙන ඛො පන සමයෙන රාජා මාගධො අජාතසත්තු වෙදෙහි පුත්තො වජ්ජී අභියාතුකාමො හොති.

සො එවමාහ: අහං ඉමෙ වජ්ජී එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ උච්ඡෙච්ඡාමි[1] වජ්ජී විනාසෙස්සාමි වජ්ජී අනයබ්‍යසනං ආපාදෙස්සාමීති.

අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහි පුත්තො වස්සකාරං බ්‍රාහ්මණං මගධමහාමත්තං[2] ආමන්තෙසි: එහි ත්වං බ්‍රාහ්මණ, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්ද, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ:

“රාජා භන්තෙ මාගධො අජාතසත්තු වෙදෙහි පුත්තො භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී’ති. එවඤ්ච වදෙහි: රාජා භන්තෙ මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වජ්ජී අභියාතුකාමො, සො එවමාහ: අහං ඉමෙ වජ්ජී එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ උච්ඡෙච්ඡාමි[1] වජ්ජී විනාසෙස්සාමි වජ්ජී අනයබ්‍යසනං ආපාදෙස්සාමී’ති. යථා[3] 'භගවා ව්‍යාකරොති තං සාධුකං උග්ගහෙත්වා මම ආරොචෙය්‍යාසි, න හි තථාගතා විතථං භණන්ති’’ති.

එවං භොති ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො[4] රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස පටිස්සුත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො[4] භගවන්තං එතදවොච:

රාජා භො ගොතම, මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති.

---

1 උච්ඡෙජ්ජිස්සාමි සතා. 2. මාගධමහාමත්තං, - මජසං.
3. යථා තෙ - මජසං 4. මාගධමහාමත්තො - මජසං

ලිච්ඡවීයෙනි, යම් තාක් කල් වජ්ජීන් විසින් රහතුන් (පැවිද්දන්) කෙරෙහි "කෙසේ නො පැමිණි රහත්හු විජිතයට එන්නාහු ද, පැමිණියාහු ද පහසු සෙයින් වෙසෙත් ව"යි දැහැමි රැකවරණ හා ගෝපන මොනොවට කරනලද වේ නම්, ලිච්ඡවීයෙනි, වජ්ජීනට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු.

ලිච්ඡවීයෙනි, යම් තාක් කල් වජ්ජීන් කෙරෙහි මේ සප්ත අපරිහානීය-ධර්මයෝ පවත්නාහු නම්, මේ සප්ත අපරිහානීය ධර්මයන්හිද වජ්ජීහු පෑණෙත් නම්, ලිච්ඡවීයෙනි, වජ්ජීනට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු යයි.

7. 1. 3. 2.

[වස්සකාර සූත්‍රය]

**22** මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වසන සේක. එ සමයෙහි මාගධරාජ වූ වෛදේහී පුත්‍ර වූ අජාතසත්තු තෙම වැදූරජ්ජින් මඩනට යනු කැමැතියේ වෙයි.

හේ මෙසේ කියයි: මම මෙසෙයින්, මහර්ධි ඇති මෙසෙසින් මහානුභාව ඇති මේ වජ්ජිරජ්ජින් සිඳ ලන්නෙමි, වජ්ජිරජ්ජින් වනසන්නෙමි, වජ්ජිරාජයන් අනයව්‍යසනයට පමුණුවන්නෙමියි.

ඉක්බිති මාගධරාජ වූ වෛදේහී පුත්‍ර අජාතසත්තු රජ මගධ මහාමාත්‍ර වූ වස්සකාර බ්‍රාහ්මණයා ඇමැතී ය: බ්‍රාහ්මණය, එව තෝ භාග්‍යවතුන් වහන්සේ කරා යව. ගොස් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳුව. අල්පාබාධ අල්පාතඞ්ක සැහැල්ලු පැවැතුම් සිරිරුබල පහසු-විහරණ පුළුවුස්ව:

"වහන්ස, වෛදේහීපුත්‍ර අජාතසත්තු මාගධරාජ භාග්‍යවතුන් වහන්සේගේ පා වඳනේ ය. අල්පාබාධ අල්පාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසුවිහරණ විචාරන්නේ ය. වහන්ස, වෛදේහී පුත්‍ර අජාතසත්තු මගධරජ වැදූමහරජ්ජින් මඩනට යනු කැමැත්තේ ය. හේ මෙසේ කියයි: "මම මෙබඳු මහර්ධි ඇති මෙ බඳු මහානුභාව ඇති මේ වැදූරජ්ජින් උපුත් කරන්නෙමි. මේ වැදූරජ්ජින් වනසාලන්නෙමි. මේ වජ්ජීන් මම අනය ව්‍යසනයට පමුණුවන්නෙමි"යි. එ භාග්‍යවතුන් වහන්සේ යම් පරිදි පාල කරණසේක් නම් එය මනාකොට උගෙණ මට සැල කරව. තථාගතයෝ අසත්‍යයක් නො වදරන්නාහ"යි.

එසේ ය භවත්නි'යි මගධමහාමාත්‍ර වූ වස්සකාර බ්‍රාහ්මණ වෛදෙහී පුත්‍ර වූ අජාතසත්තු මගධමහරජහට පිළිවදන් අස්වා හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ කරා ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ හා සමඟ සතුටු වීය. සතුටු විය යුතු සිහිපත්කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හින. එකත්පසෙක හුන් වස්සකාර මගධමහාමාත්‍ර බ්‍රහමණයා භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේ ය:

භවත් ගෞතමයන් වහන්ස, වෛදේහීපුත්‍ර මගධරාජ අජාතසත්තු තෙම භවත් ගෞතමයන්ගේ පා සිරසින් වඳනේ අල්පාබාධ, අල්පාතඞ්ක, සැහැල්ලු පැවැතුම, බලය, එසුවිහාර ද පුළුවුස්නේ ය.

රාජා භො ගොතම, මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වජ්ජී අභියාතුකාමො. සො එවමාහ: අහං ඉමෙ වජ්ජී එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ උච්ඡෙච්ඡාමි, වජ්ජී විනාසෙස්සාමි, වජ්ජී අනයබ්‍යසනං ආපාදෙස්සාමීති.

තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො, භගවතො පිට්ඨිතො[1] හොති භගවන්තං බීජයමානො. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි:

(1) කින්ති තෙ ආනන්ද සුතං වජ්ජී අභිණ්හං සන්නිපාතා සන්නිපාතබහුලාති?

සුතං මෙ තං භන්තෙ, වජ්ජී අභිණ්හා සන්නිපාතා සන්නිපාතබහුලාති.

යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී අභිණ්හා සන්නිපාතා භවිස්සන්ති, සන්නිපාතබහුලා, වුද්ධියෙව ආනන්ද, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(2) කින්ති තෙ ආනන්ද, සුතං, වජ්ජී සමග්ගා සන්නිපතන්ති සමග්ගා වුට්ඨහන්ති සමග්ගා වජ්ජිකරණීයානි කරොන්තීති?

සුතං මෙ තං භන්තෙ, වජ්ජී සමග්ගා සන්නිපතන්ති, සමග්ගා වුට්ඨහන්ති, සමග්ගා වජ්ජිකරණීයානි කරොන්තීති.

යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී සමග්ගා සන්නිපතිස්සන්ති, සමග්ගා වුට්ඨහිස්සන්ති සමග්ගා වජ්ජිකරණීයානි කරිස්සන්ති, වුද්ධියෙව ආනන්ද, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(3) කින්ති තෙ ආනන්ද, සුතං වජ්ජී අපඤ්ඤත්තං න පඤ්ඤපෙන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දන්ති. යථාපඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තන්තීති?

සුතං මෙතං භන්තෙ, වජ්ජී අපඤ්ඤත්තං න පඤ්ඤපෙන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දන්ති, යථාපඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තන්තීති.

යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී පඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථාපඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තිස්සන්ති, වුද්ධියෙව ආනන්ද, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(4) කින්ති තෙ ආනන්ද, සුතං වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජී මහල්ලකා, තෙ සක්කරොන්ති ගරුකරොන්ති[1] මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤන්තීති?

සුතං මෙතං භන්තෙ, වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා, තෙ සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤන්තීති.

1. පිට්ඨිතො ඨිතො - මජසං. 1. ගරුංකරොන්ති - මජසං,

භවත් ගෞතමයන් වහන්ස, වෛදේහිපුත්‍ර වූ අජාතශත්‍රු මගධාධිපති - රජ වැදූරජුන් මඩනට යනු කැමැතියේ ය. "හේ මේ සේ ද කියයි: මෙබඳු මහර්ධි ඇති, මෙබඳු මහානුභාව ඇති මේ වජ්ජීන් මම සිඳ පියන්නෙමි, වජ්ජීන් වනසාලන්නෙමි, වජ්ජීන් අනයව්‍යසනයට පමුණුවන්නෙමි"යි

එසමයෙහි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ පිටුපස්හි භාග්‍යවතුන් වහන්සේට පවන් සලන්නාහු වෙත්. එක්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමැතූසේක:

(1) ආනන්දයෙනි, වජ්ජීහු නිතර රැස්වන්නාහු සන්නිපාත බහුල වූවාහු ය යන තෙල පුවත කිම තොප විසින් අසනලද දැයි.

වහන්ස, වජ්ජීහු නිතර රැස්වන්නාහු සන්නිපාතබහුලයහයි මා විසින් අසනලදූයි.

ආනන්දයෙනි, වජ්ජීහු යම් තාක් කල් නිතර රැස්වන්නාහු සන්නිපාතබහුල වූවාහු වෙත් ද, ආනන්දයෙනි, වජ්ජීන්හට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු.

(2) ආනන්දයෙනි, කිම, වජ්ජීහු සමඟ ව රැස්වන්නාහු සමඟ ව නැගසිටුනාහ, සමඟ ව වජ්ජිකරණී කෙරෙති යි තොප විසින් අසන ලද දූ යි.

වහන්ස, වජ්ජීහු සමඟ ව රැස්වන්නාහ, සමඟ ව නැග සිටුනාහ, සමඟ ව වජ්ජිකරණී කරණාහයි මා විසින් අසනලදූයි.

ආනන්දයෙනි, යම් තාක් කල් වජ්ජීහු සමඟ ව රැස් වන්නාහු සමඟ ව නැගසිටිනාහු සමඟ ව වජ්ජිකරණී (රජයේ කටයුතු) කරන්නාහු ද, ආනන්දයෙනි, වජ්ජීන්හට වෘද්ධිය ම මුත් පරිහානියෙක් කැමැති නො විය යුතු.

(3) ආනන්දයෙනි, කිම, වජ්ජීහු අප්‍රඥප්තය නො පණවන්නාහ, ප්‍රඥප්තය නො සිඳපියන්නාහ, යථාප්‍රඥප්ත වූ පැරණි වජ්ජිධර්මයෙහි සමාදන් කොට ගෙණ වැටෙතියි තොප විසින් අසන ලද දූයි.

වහන්ස, වජ්ජීහු නො පණවන ලද්දක් නොපණවත්, පණවනලද්ද නො සිඳ පියත්, යථාප්‍රඥප්ත පෞරාණික වජ්ජිධර්මයෙහි සමාදන් කොට-ගෙණ වැටෙන්නාහ යන තෙල කරුණ මා විසින් අසනලදූයි.

ආනන්දයෙනි, යම් තාක් කල් වජ්ජීහු අප්‍රඥප්තය නො පණවත්ද, ප්‍රඥප්තය නො සිඳපියත් ද, යථාප්‍රඥප්ත පෞරාණික වජ්ජිධර්මයෙහි සමාදන් කොටගෙණ වැටෙත් ද, ආනන්දයෙනි, වජ්ජීන්ට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු.

(4) ආනන්දයෙනි, කිම, වජ්ජීහු වජ්ජීන්ගේ යම් බඳු මහලු වජ්ජීහු වෙත් ද, ඔවුනට සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පුදත්, ඔවුන්ගේ කථා ද ඇසියයුතු කොට සිතත් යන තෙල කරුණ තොප විසින් අසන ලද දූයි.

වහන්ස, වජ්ජීන්ගේ මහලු යම් බඳු වජ්ජීහු වෙත් නම් වජ්ජීහු ඔවුන්ට සත්කාර කරත්, ගරුකරත්, බුහුමන් කරත්, පුදත්, ඔවුන්ගේ බස් ඇසියයුතු කොට හඟිත් යන තෙල කරුණ ම විසින් අසනලදූයි

යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජි මහල්ලකා තෙ සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුද්ධියෙව ආනන්ද, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(5) කින්ති තෙ ආනන්ද, සුතං වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්ස පසය්හ වාසෙන්තීති?

සුතං මෙතං භන්තෙ, වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්ස පසය්හ වාසෙන්තීති.

යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්ස[1] පසය්හ වාසෙස්සන්ති, වුද්ධියෙව ආනන්ද, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(6) කින්ති තෙ ආනන්ද, සුතං වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජිචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච තානි සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙන්තීති?

සුතං මෙතං භන්තෙ, වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජිචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච තානි සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙන්තීති.

යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජිචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච තානි සක්කරිස්සන්ති, ගරුකරිස්සන්ති, මානෙස්සන්ති, පූජෙස්සන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙස්සන්ති, වුද්ධියෙව ආනන්ද, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

(7) කින්ති තෙ ආනන්ද, සුතං වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා, 'කින්ති අනාගතා ච අරහන්තො විජිතං ආගච්ඡෙය්‍යුං, ආගතා ච අරහන්තො විජිතෙ ඵාසුං විහරෙය්‍යු'න්ති.

සුතං මෙතං භන්තෙ වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා භවිස්සති 'කින්ති අනාගතා ච අරහන්තො විජිතං ආගච්ඡෙය්‍යුං, ආගතා ච අරහන්තො විජිතෙ ඵාසුං විහරෙය්‍යු'න්ති.

යාවකීවඤ්ච ආනන්ද, වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා භවිස්සති 'කින්ති අනාගතා ච අරහන්තො විජිතං ආගච්ඡෙය්‍යුං, ආගතා ච අරහන්තො විජිතෙ ඵාසුං විහරෙය්‍යුන්ති' වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානීති.

---

1. ඔක්කාස්ස - සං

ආනන්දයෙනි, යම් තාක් කල් වජ්ජීන්ගේ යම් බදු මහලු වජ්ජීහු වෙත් ද, වජ්ජීහු ඔවුන්ට සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පුදත්, ඔවුන්ගේ කථාත් ඇසියයුතු සේ හගිත් නම්, ආනන්දයෙනි, වජ්ජීනට වෘද්ධිය මුත් පරිහානිය නො කැමැති වියයුතු.

(5) ආනන්දයෙනි, කිම, යම් බදු කුලස්ත්‍රීහු කුලකුමාරිහු වෙත් නම්, වජ්ජීහු ඔවුන් බලාත්කාරයෙන් ගැද මැඩගෙණ නො වස්වති යන තෙල කරුණ තොප විසින් අසන ලද දැයි.

වහන්ස, යම් බදු කුලස්ත්‍රීහු කුලකුමාරිහු වෙත් නම්, වජ්ජීහු ඔවුන් බලාත්කාරයෙන් ගැද මැඩගෙණ නො වස්වති යන තෙල කරුණ මා විසින් අසන ලදැයි.

ආනන්දයෙනි, යම් තාක් වජ්ජීහු යම් බදු කුලස්ත්‍රීහු කුල කුමාරිහු වෙත් නම්, ඔවුන් බලාත්කාරයෙන් ගැද මැඩගෙණ නො වස්වත් ද, ආනන්දයෙනි, වජ්ජීනට අභිවෘද්ධිය ම මුත් පරිහානිය නො කැමැති වියයුතු.

(6) ආනන්දයෙනි, කිම, වජ්ජීන්ගේ යම් බදු අභ්‍යන්තර වූත් බාහිර වූත් චෛත්‍යස්ථානයෝ වෙත් නම්, එ හැමට වජ්ජීහු සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පුදත්, ඔවුන්ට දුන්විරූ කලවිරූ දැහැමි බලිපුද නො පිරිහෙලත් යන තෙල කරුණ තොප විසින් අසනලද දැයි.

වහන්ස, වජ්ජීහු අභ්‍යන්තර වූත් බාහිර වූත් යම් ඒ වජ්ජීන්ගේ චෛත්‍යස්ථානයෝ වෙත් නම්, එ හැමට සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පුදත්, ඔවුනට දුන්විරූ කලවිරූ දැහැමි බලිපුද නො පිරිහෙලත් යන තෙල කරුණ මා විසින් අසනලදැයි.

ආනන්දයෙනි, යම් තාක් වජ්ජීහු වජ්ජීන්ගේ යම් බදු අභ්‍යන්තර වූ ද බාහිර වූ ද චෛත්‍යස්ථානයෝ වෙත් නම්, ඔවුන්ට සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පුදත්, ඔවුන්ට දුන්විරූ කලවිරූ දැහැමි බලිපුද නො පිරිහෙලත් නම්; ආනන්දයෙනි වජ්ජීනට අභිවෘද්ධිය ම මුත් පරිහානි-යෙක් නො කැමැති වියයුතු.

(7) ආනන්දයෙනි, කිම, වජ්ජීන් විසින් 'කිසෙයින් නො පැමිණි රහත්හු විජිතයට එන්නාහු ද, පැමිණියාවූත් රහත්හු විජිතයෙහි පහසුයෙන් වෙසෙත්වා'යි රහතුන් කෙරෙහි දැහැමි රැකවරණ ගොපනය මොනොවට සංවිහිත කරණලදැයි යන තෙල කරුණ තොප විසින් අසන ලද දැයි.

වහන්ස, වජ්ජීන් විසින් 'කිසෙයින් නො පැමිණි රහත්හු විජිතයට එන්නාහු ද, පැමිණියා වූ රහත්හු විජිතයෙහි පහසුයෙන් වෙසෙත්වා'යි රහතුන් කෙරෙහි ධාර්මික රක්‍ෂාවරණ ගෝපනය මැනැවින් කරණ ලද ය යන තෙල කරුණ මා විසින් අසන ලදැයි.

ආනන්දයෙනි, යම්තාක් වජ්ජීන් විසින්'කිසෙයින් නො පැමිණි රහත්හු විජිතයට යම් කවර සෙයකින් පැමිණෙන්නාහු ද, පැමිණියා වූත් රහත්හු විජිතයෙහි පහසුයෙන් වෙසෙත්වා'යි රහතුන් කෙරෙහි ධාර්මික රක්‍ෂාවරණ ගුප්තිය මොනොවට කරණලද නම්, ආනන්දයෙනි, වජ්ජීනට වෘද්ධිය මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු යයි.

අථ ඛො භගවා වස්සකාරං බ්‍රාහ්මණං මගධමහාමත්තං ආමන්තෙසි: එකමිදාහං බ්‍රාහ්මණ, සමයං වෙසාලියං විහරාමි සාරන්දදෙ චෙතියෙ. තත්‍රාහං බ්‍රාහ්මණ වජ්ජීනං ඉමෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙසිං. යාවකීවඤ්ච බ්‍රාහ්මණ, ඉමෙ සත්ත අපරිහානියා ධම්මා වජ්ජීසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු වජ්ජී සන්දිස්සන්ති, වුද්ධියෙව බ්‍රාහ්මණ, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානීති.

එවං වුත්තෙ වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවන්තං එතදවොච: එකමෙකෙනාපි භො ගොතම, අපරිහානියෙන ධම්මෙන සමන්නාගතානං වජ්ජීනං වුද්ධියෙව පාටිකඞ්ඛා නො පරිහානි, කො පන වාදො සත්තහි අපරිහානියෙහි ධම්මෙහි? අකරණීයා ච භො ගොතම, වජ්ජී රඤ්ඤා මාගධෙන අජාතසත්තුනා වෙදෙහිපුත්තෙන යදිදං යුද්ධස්ස අඤ්ඤත්‍ර උපලාපනා[1] අඤ්ඤත්‍ර මිථුභෙදා.

හන්දදානි මයං භො ගොතම, ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි ත්වං බ්‍රාහ්මණ, කාලං මඤ්ඤසීති.

අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමීති.

## 7. 1. 3. 3

## [භික්ඛු අපරිහානිය සුත්තං]

23. එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති. ගිජ්ඣකූටෙ පබ්බතෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සත්ත වො භික්ඛවෙ අපරිහානියෙ ධම්මෙ දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමෙ ච භික්ඛවෙ සත්ත අපරිහානියා ධම්මා:

(1) යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අභිණ්හං සන්නිපාතා භවිස්සන්ති සන්නිපාතබහුලා, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.

(2) යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ සමග්ගා සන්නිපතිස්සන්ති, සමග්ගා වුට්ඨහිස්සන්ති, සමග්ගා සඞ්ඝකරණීයානි කරිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

(3) යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අප්පඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

(4) යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ-චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා,[2] තෙ සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

---

1 උපලාපනාය - මජසං    2. සඞ්ඝපරිනායිකා - සීමු

එක්බිති, භාග්‍යවතුන් වහන්සේ වස්සකාර මගධමහාමාත්‍යයා ඇමතූහ: බමුණ, මම එක් සමයෙක්හි මේ විසාල්පුරයෙහි සාරන්දද චෛත්‍යයෙහි වසමි. බමුණ එහි දී මම වජ්ජීනට මේ සප්ත අපරිහානිය ධර්මය දෙසීමි. බමුණ යම් තාක් මේ සප්ත අපරිහානියධර්මයෝ වජ්ජීන් කෙරෙහි සිටුන් නම්, මේ සප්ත අපරිහානියධර්මයන්හි වජ්ජීහු ද පෑණෙත් නම්, බ්‍රාහ්මණය, වජ්ජීනට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු ය යි.

මෙසේ වදාළ කල්හි වස්සකාර මගධමහාමාත්‍ය භාග්‍යවතුන් වහන්සේට මෙසේ කරුණු සැලකෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, එක් අපරිහානියධර්මයෙකිනුදු සමන්වාගත වජ්ජීනට වෘද්ධිය මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු. සප්තාපරිහානියධර්මයෙන් සමන්වාගත නම් කවර කථායෙක් ද, භවත් ගෞතමයන් වහන්ස, කැලැඹීම් වචනයෙන් විනා, පරස්පරභේදයෙන් විනා වෛදේහිපුත්‍ර වූ මගධපති අජාතශත්‍රු රජහු විසින් වජ්ජීහු යුද්ධයෙන් දිනා නො ගත හැකියාහු ම වෙති යි.

භවත් ගෞතමයන් වහන්ස, දැන් වනාහි අපි යම්හ. අපි බොහෝ කිස ඇතියම්හ. බොහෝ කරණී ඇතියම්හයි. බ්‍රාහ්මණය, එයට දැන් කල් දනුවයි.

එක්බිති වස්සකාර මගධමහාමාත්‍ය භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන් ව හුනස්නෙන් නැගී නික්මගියේ ය.

7. 1. 3. 3.

[භික්ඛුඅපරිහානිය සූත්‍රය]

23. මා විසින් මෙසේ අසනලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකුළු පව්යෙහි වැඩ වසනසේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමැතූහ: "මහණෙනි, තොපට සප්තඅපරිහානියධර්මයන් දෙසමි. එ අසව, මොනොවට මෙනෙහි කරව, දෙසම්යි. වහන්ස, එසේ යයි එ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ:

මහණෙනි, සප්තාපරිහානියධර්මයෝ කවරහ යත්:

(1) මහණෙනි, යම්තාක් භික්ෂූහු නිතර රැස්වීම් ඇත්තාහු සන්නිපාත බහුල වෙත් නම් මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු.

(2) මහණෙනි, යම්තාක් භික්ෂූහු සමග ව නිතර රැස් වන්නාහු නම්, සමග ව නැගීසිටුනාහු නම්, සමග ව සඞ්ඝකෘත්‍ය කෙරෙත් නම් මහණෙනි, භික්ෂූනට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති වියයුතු.

(3) මහණෙනි, යම්තාක් භික්ෂූහු අප්‍රඥප්තයක් නො පනවත් ද, ප්‍රඥප්තය නො සිඳපියන්නාහු ද, යථාප්‍රඥප්ත ශික්ෂාපදයන්හි සමාදන් කොට ගෙණ වැටෙත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු.

(4) මහණෙනි, යම්තාක් භික්ෂූහු පැවිදියෙන් බොහෝ කල් ඇති සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිනායක වූ චිරරාත්‍රඥ වූ යම් බඳු ස්ථවිර භික්ෂූහු වෙත් ද, ඔවුනට සත්කාර කරත් ද, ගරු කරත් ද, බුහුමන් කරත් ද, පුදත් ද, ඔවුන්ගේ ද කථා ඇසියයුතු කොට හගිත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මුත් පරිහානියෙක් නො කැමැති විය යුතු.

(5) යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ උප්පන්නාය තණ්හාය පොනොභවිකාය න වසං ගච්ඡිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.

(6) යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අරඤ්ඤකෙසු[1] සෙනාසනෙසු සාපෙක්ඛා භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

(7) යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ පච්චත්තංයෙව සතිං උපට්ඨපෙස්සන්ති: කින්ති අනාගතා ච පෙසලා සබ්‍රහ්මචාරී ආගච්ඡෙය්‍යුං, ආගතා ච පෙසලා සබ්‍රහ්මචාරී ඵාසුං විහරෙය්‍යුන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ, ඉමෙ සත්ත අපරිහානීයා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානීයෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානීති.

## 7. 1. 3. 4

### [දුතියභික්ඛු අපරිහානීය සුත්තං]

[සාවත්ථිනිදානං]

24. සත්ත වො භික්ඛවෙ, අපරිහානීයෙ ධම්මෙ දෙසිස්සාමි. තං සුණාථ. -පෙ- කතමෙ ච භික්ඛවෙ, සත්ත අපරිහානීයා ධම්මා:

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න කම්මාරාමා භවිස්සන්ති, න කම්මාරාමතං අනුයුත්තා, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න භස්සාරාමා භවිස්සන්ති -පෙ- න නිද්දාරාමා භවිස්සන්ති -පෙ- න සඞ්ගණිකාරාමා භවිස්සන්ති -පෙ- න පාපිච්ඡා භවිස්සන්ති න පාපිකානං ඉච්ඡානං වසං ගතා -පෙ- න පාපමිත්තා භවිස්සන්ති න පාපසහායා න පාපසම්පවඞ්කා -පෙ- න ඕරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරාවොසානං ආපජ්ජිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ, ඉමෙ සත්ත අපරිහානීයා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානීයෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානීති.

## 7. 1. 3. 5

### [තතියභික්ඛු අපරිහානීය සුත්තං]

[සාවත්ථිනිදානං]

25. සත්ත වො භික්ඛවෙ, අපරිහානීයෙ ධම්මෙ දෙසිස්සාමි, තං සුණාථ -පෙ- කතමෙ ච භික්ඛවෙ, සත්ත අපරිහානීයා ධම්මා.

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ සද්ධා භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

---

1. ආරඤ්ඤකෙසු - මජසං.

(5) මහණෙනි, යම් තාක් භික්ෂූහු පුනර්භවය සඳහා වැටෙන උපන් තෘෂ්ණාවගේ වශයට නොයෙත් නම් මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම විනා පරිහානියෙක් නො කැමැති වියයුතු.

(6) මහණෙනි, යම්තාක් භික්ෂූහු අරණ්‍ය සෙනසුන්හි අපේක්‍ෂා සහිත වෙත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම විනා පරිහානියෙක් නො කැමැති වියයුතු.

(7) මහණෙනි, යම් තාක් භික්ෂූහු 'කිම, නො පැමිණි ප්‍රියශීල සබ්‍රම්සරහු පැමිණෙන්නාහු ද, පැමිණි ප්‍රියශීල සබ්‍රම්සරහු පහසුයෙන් වසන්නාහු දැයි' තමා කෙරෙහි ම සිහි එළවන්නාහු නම්, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම විනා පරිහානියෙක් නො කැමැති වියයුතු.

මහණෙනි, යම්තාක් මෙ සප්ත අපරිහානීය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි සිටිත් නම්, මෙ සප්ත අපරිහානීය ධර්මයන්හි භික්ෂූහු පැණෙත් නම්, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම විනා පරිහානියෙක් නො කැමැති යුතු යයි.

## 7. 1. 3. 4.

## [දෙවැනි භික්ඛු අපරිහානීය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

24 මහණෙනි, තොපට සප්ත අපරිහානීය ධර්ම දෙසමි. එය අසවු ... මහණෙනි, සප්ත අපරිහානීය ධර්මයෝ කවරහ යත්:

මහණෙනි, යම්තාක් භික්ෂූහු කර්මාරාම නො වෙත් ද, කර්මාරාමතායෙහි අනුයුක්ත නො වෙත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම විනා පරිහානි-යෙක් නො කැමැති වියයුතු.

මහණෙනි, යම් තාක් භික්ෂූහු භාෂ්‍යාරාම නො වෙත් ද, භාෂ්‍යාරාමතා-යෙහි අනුයුක්ත නො වෙත් ද ... නිද්‍රාරාම නො වෙත් ද ... සඞ්ගණිකාරාම නො වෙත් ද ... පාපෙච්ඡ නො වෙත් ද, ලාමක ඉච්ඡාවන්ගේ වශයට නො යෙත් ද ... පාපමිත්‍ර නො වෙත් ද පාපසහාය පාපසම්ප්‍රවඞ්ක නො වෙත් ද ... ස්වල්පමාත්‍ර විශෙෂාධිගමයෙන් අතුරෙහි පරිනිෂ්ඨිත භාවයට නො පැමිණෙත් ද, මහණෙනි, භික්ෂූනට වෘද්ධිය ම විනා පරිහානියෙක් නො කැමැති වියයුතු යි.

මහණෙනි, යම්තාක් මෙ සප්තඅපරිහානීය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි සිටිත් නම්, මෙ සප්ත අපරිහානීය ධර්මයන්හි භික්ෂූහු පැණෙත් නම්, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධියම විනා පරිහානියෙක් නො කැමැති විය යුතුයයි.

## 7. 1. 3. 5.

## [තෙවැනි භික්ඛු අපරිහානීය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

25. මහණෙනි, තොපට සප්ත අපරිහානීය ධර්මයන් දෙසන්නෙම්. එ අසවු .. මහණෙනි, සප්ත අපරිහානීය ධර්මයෝ කවරහ යත්:

මහණෙනි, යම් තාක් භික්ෂූහු ශ්‍රද්ධා ඇතියාහු වෙත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම විනා පරිහානියෙක් නො කැමැති වියයුතු.

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ හිරිමා[1] භවිස්සන්ති -පෙ- ඔත්තාපිනො භවිස්සන්ති -පෙ- බහුස්සුතා භවිස්සන්ති -පෙ- ආරද්ධවිරියා භවිස්සන්ති -පෙ- සතිමා[2] භවිස්සන්ති -පෙ- පඤ්ඤවන්තො භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ, ඉමෙ සත්ත අපරිහානීයා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානීයෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානීති.

## 7. 1. 3. 6

## [වතුත්ථභික්ඛු අපරිහානිය සුත්තං]

[සාවත්ථිනිදානං]

**26.** සත්ත වො, භික්ඛවෙ, අපරිහානීයෙ ධම්මෙ දෙසිස්සාමි. තං සුණාථ -පෙ- කතමෙ ච භික්ඛවෙ, සත්ත අපරිහානීයා ධම්මා:

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ සතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ, ඉමෙ සත්ත අපරිහානීයා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානීයෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානීති.

## 7. 1. 3. 7

## [පඤ්චම භික්ඛු අපරිහානිය සුත්තං]

[සාවත්ථිනිදානං]

**27.** සත්ත වො භික්ඛවෙ, අපරිහානීයෙ ධම්මෙ දෙසිස්සාමි. තං සුණාථ -පෙ- කතමෙ ච භික්ඛවෙ, සත්ත අපරිහානීයා ධම්මා:

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අනිච්චසඤ්ඤං භාවෙස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානීති.

යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අනත්තසඤ්ඤං භාවෙස්සන්ති, -පෙ- අසුභසඤ්ඤං භාවෙස්සන්ති -පෙ- ආදීනවසඤ්ඤං භාවෙස්සන්ති -පෙ- පහානසඤ්ඤං භාවෙස්සන්ති -පෙ- විරාගසඤ්ඤං භාවෙස්සන්ති -පෙ, නිරොධසඤ්ඤං භාවෙස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ, ඉමෙ සත්ත අපරිහානීයා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානීයෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානීති.

---

1 හිරිමන්තො - මජ්සං. 2 සතිමන්තො - මජ්සං

මහණෙනි, යම් තාක් භික්ෂූහු හිරි ඇතියාහු වෙත් ද ... ඔතප් ඇතියාහු වෙත් ද බහුශ්‍රැත වෙත් ද ... රූකුළුවැර ඇති වෙත් ද ... සමාහිමත් වෙත් ද ... ප්‍රඥාවත් වෙත් ද, මහණෙනි, භික්ෂූනට වෘද්ධිය ම විනා පරිහානියෙක් නො කැමැති විය යුතු.

මහණෙනි, යම් තාක් මෙ සප්ත අපරිහානීය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි සිටුනාහු ද, භික්ෂූහු ද මෙ සප්තාපරිහානීය ධර්මයන්හි පැණෙත් ද මහණෙනි, භික්ෂූන්හට වෘද්ධිය ම මිස පරිහානියෙක් නො කැමැති විය යුතු යි.

## 7. 1. 3. 6.

## [සිවුවැනි භික්ඛු අපරිහානීය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**26**. මහණෙනි, තොපට සප්ත අපරිහානීය ධර්මයන් දෙසන්නෙමි. එ අසවු ... මහණෙනි, සප්ත අපරිහානීය ධර්මයෝ කවරහ යත්:

මහණෙනි, යම් තාක් භික්ෂූහු සතිසම්බොජ්ඣඞ්ගය වඩත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මිස පරිහානියෙක් නො කැමැති විය යුතු.

මහණෙනි, යම් තාක් භික්ෂූහු ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය වඩත් ද ... විරිය සම්බොජ්ඣඞ්ගය වඩත් ද .. පීතිසම්බොජ්ඣඞ්ගය වඩත් ද ... පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය වඩත් ද ... සමාධිසම්බොජ්ඣඞ්ගය වඩත් ද ... උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වඩත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මිස පරිහානි-යෙක් නො කැමැති විය යුතු යයි.

මහණෙනි, යම් තාක් මෙ සප්ත අපරිහානීය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පවත්නාහු නම්, භික්ෂූහු ද මෙ සප්ත අපරිහානීය ධර්මයන් කෙරෙහි පැණෙත් නම්, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මිස පරිහානියෙක් නො කැමැති වියයුතු යයි.

## 7. 1. 3. 7.

## [පස්වැනි භික්ඛු අපරිහානීය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**27**. මහණෙනි, තොපට සප්ත අපරිහානීය ධර්මයන් දෙසන්නෙමි, එ අසව ... මහණෙනි, සප්ත අපරිහානීය ධර්මයෝ කවරහ යත්:

මහණෙනි, යම් තාක් භික්ෂූහු අනිත්‍ය සංඥාව වඩත් ද, මහණෙනි, භික්ෂූනට වෘද්ධිය ම මිස පරිහානියෙක් නො කැමැති විය යුතු.

මහණෙනි, යම් තාක් භික්ෂූහු අනාත්මසංඥාව වඩත් නම්... අශුභසංඥාව වඩත් නම් ... ආදීනව සංඥාව වඩත් නම් ... ප්‍රහාණසංඥා වඩත් නම් .. විරාග සංඥා වඩත් නම් ... නිරොධසංඥා වඩත් නම් ... මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මිස පරිහානියෙක් නො කැමැති වියයුතු.

මහණෙනි, යම් තාක් මෙ සප්ත අපරිහානීය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි වැටෙත් ද, භික්ෂූහු ද මෙ සප්ත අපරිහානීය ධර්මයන්හි පැණෙත් ද, මහණෙනි, භික්ෂූන්ට වෘද්ධිය ම මිස පරිහානියෙක් නො කැමැති විය යුතු යි.

## 7. 1. 3. 8

### [සෙඛ අපරිහානිය සුත්තං]

සාවත්ථිනිදානං]

28. සත්තිමෙ භික්ඛවෙ, ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා, සඞ්ගණිකාරාමතා, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා, භොජනෙ අමත්තඤ්ඤුතා, - සන්ති ඛො පන සඞ්ඝෙ සඞ්ඝකරණීයානි, තත්‍ර සෙඛො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: "සන්ති ඛො පන සඞ්ඝෙ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා භාරවාහිනො තෙ තෙන පඤ්ඤායිස්සන්තී"ති අත්තනා වොයොගං[1] ආපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

සත්තිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

න කම්මාරාමතා, න නිද්දාරාමතා, න භස්සාරාමතා, න සඞ්ගණිකාරාමතා, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා,-සන්ති ඛො පන සඞ්ඝෙ සඞ්ඝකරණීයානි, තත්‍ර සෙඛො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: "සන්ති ඛො පන සඞ්ඝෙ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා භාරවාහිනො තෙ තෙන පඤ්ඤායිස්සන්තී"ති අත්තනා න වොයොගං ආපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති.

## 7. 1. 3. 9

### [උපාසක අපරිහානිය සුත්තං]

[සාවත්ථිනිදානං]

සත්තිමෙ භික්ඛවෙ, ධම්මා උපාසකස්ස පරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

භික්ඛු දස්සනං හාපෙති, සද්ධම්මසවණං පමජ්ජති, අධිසීලෙ න සික්ඛති, අප්පසාදබහුලො හොති භික්ඛූසු ථෙරෙසු චෙව නවෙසු ච මජ්ඣිමෙසු ච, උපාරම්භචිත්තො ධම්මං සුණාති රන්ධගවෙසී, ඉතො ච බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති, තත්ථ ච පුබ්බකාරං කරොති.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත ධම්මා උපාසකස්ස පරිහානාය සංවත්තන්ති.

1. න තෙසු යොගං - මජසං

### 7. 1. 3. 8.

### [සේඛ අපරිහානිය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

28 මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂුහුගේ පරිහානිය සඳහා මෙ සප්තධර්ම කෙනෙක් වැටෙත්. කවර සතෙක යත්:

කර්මාරාමතා ය, භස්සාරාමතා ය, නිද්‍රාරාමතා ය, සඞ්ගණිකාරාමතා ය, ඉන්ද්‍රියයන්හි අගුප්තද්වාරතා ය, භොජනයෙහි අමාත්‍රඥතා ය,-සඞ්ඝයා කෙරෙහි සඞ්ඝකරණීයයෝ විද්‍යමාන වෙත් ද, එහි ලා ශෛක්‍ෂ භික්‍ෂු මෙසේ සලකයි: "සඞ්ඝයා කෙරෙහි චිරරාත්‍රඥ වූ චිරප්‍රව්‍රජිත වූ සඞ්ඝකෘත්‍ය භාරවහනය කරණ ථෙර මහණහු ඇත් මැ යි. ඔහු එයින් පැණෙති"යි (මෙසේ සිතා) තෙමේ (එ කිසෙහි) වියොගයට පැමිණෙයි. නො යෙදෙයි.

මහණෙනි, මෙ සප්ත ධර්මයෝ ශෛක්‍ෂ භික්‍ෂුහුගේ පරිහානියට වැටෙතියි.

මහණෙනි, මෙ සප්තධර්ම කෙනෙක් ශෛක්‍ෂ භික්‍ෂුහුගේ අපරිහානිය සඳහා වැටෙත්. කවර සතෙක යත්:

කර්මයන්හි නො ඇලෙන බව, භාෂ්‍යයෙහි නො ඇලෙන බව, නිද්‍රායෙහි නො ඇලෙනබව, ගණයෙහි නො ඇලෙන බව, ඉඳුරන්හි ගුප්තද්වාරතාව, භෝජනයෙහි මාත්‍රඥතාව, සඟුන් අතුරෙහි සඞ්ඝකරණීයයෝ ඇද් ද, එහි ලා ශෛක්‍ෂ මහණ මෙසේ සිතයි: "සඞ්ඝයා අතුරෙහි චිරප්‍රව්‍රජිත වූ චිරරාත්‍රඥ වූ සඞ්ඝකෘත්‍ය භාරවාහී වූ ස්ථවිර භික්‍ෂුහු ඇත් මැ යි, උහු එ කිසෙහි පළට වන්නාහ"යි (මෙසේ සිතා) තෙමේ (එහි) වියොගයට නො පැමිණෙයි.

මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂුහුගේ අපරිහානිය සඳහා මෙ සප්ත ධර්මයෝ වැටෙති යි.

### 7. 1. 3. 9.

### [උපාසකපරිහානිය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

29. මහණෙනි, මේ සප්තධර්ම කෙනෙක් උපාසකයාගේ පරිහානියට වැටෙති. කවර සතෙක යත්:

සඟුන්ගේ දර්ශනය පිරිහෙළයි. සද්ධර්මශ්‍රවණය පමා කෙරෙයි. අධිශීල-යෙහි නො හික්මෙයි. ස්ථවිර මධ්‍යම නවක යන භික්‍ෂූන් කෙරෙහි අප්‍රසාද බහුල වෙයි. දොස් දක්නා සිතින් සිදුරු සොයන සුලුයේ දහම් අසයි. මේ බුදුසස්නෙන් බැහැරි තස්නෙහි ද දක්ෂිණාර්හයන් සොයයි. එහි ද පූර්වකාර කෙරෙයි.

මහණෙනි, මේ සත් කරුණුහු උපාසකයාගේ පරිහානියට වැටෙති.

සත්තිමෙ භික්ඛවෙ, ධම්මා උපාසකස්ස අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

භික්ඛුදස්සනං න හාපෙති. සද්ධම්මසවණං නප්පමජ්ජති. අධිසීලෙ සික්ඛති. පසාදබහුලො හොති භික්ඛූසු ථෙරෙසු චෙව නවෙසු ච මජ්ඣිමෙසු ච. අනුපාරම්භචිත්තො ධම්මං සුණාති න රන්ධගවෙසී. න ඉතො බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති. ඉධ ච පුබ්බකාරං කරොති.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත ධම්මා උපාසකස්ස අපරිහානාය සංවත්තන්තීති.[1]

14. දස්සනං භාවිතත්තානං යො හාපෙති උපාසකො,
සවණං ච අරියධම්මානං අධිසීලෙ න සික්ඛති.

15. අප්පසාදො ච භික්ඛූසු භිය්‍යො භිය්‍යො පවඩ්ඪති,
උපාරම්භචිත්තො ච සද්ධම්මං සොතු මිච්ඡති.

16. ඉතො ච බහිද්ධා අඤ්ඤං දක්ඛිණෙය්‍යං ගවෙසති,
තත්ථෙව ච පුබ්බකාරං යො කරොති උපාසකො,

17. එතෙ ඛො පරිහානීයෙ සත්ත ධම්මෙ සුදෙසිතෙ,
උපාසකො සෙවමානො සද්ධම්මා පරිහායති.

18. දස්සනං භාවිතත්තානං යො න හාපෙති උපාසකො,
සවණං ච අරියධම්මානං අධිසීලෙ ච සික්ඛති.

19. පසාදො යස්ස භික්ඛූසු භිය්‍යො භිය්‍යො පවඩ්ඪති,
අනුපාරම්භචිත්තො ච සද්ධම්මං සොතුමිච්ඡති.

20. නයිතො බහිද්ධා අඤ්ඤං දක්ඛිණෙය්‍යං ගවෙසති,
ඉධෙව ච පුබ්බකාරං යො කරොති උපාසකො.

21. එතෙ ඛො අපරිහානීයෙ සත්ත ධම්මෙ සුදෙසිතෙ,
උපාසකො සෙවමානො සද්ධම්මා න පරිහායති.

## 7. 1. 3. 10

## [උපාසක විපත්ති සුත්තං]

[සංඛිත්තනිදානං]

80. සත්තිමා භික්ඛවෙ, උපාසකස්ස විපත්තියො -පෙ-
සත්තිමා භික්ඛවෙ, උපාසකස්ස සම්පත්තියො -පෙ-

1. ඉදමවොච භගවා ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා. - මජසං

මහණෙනි, මෙ සප්තධර්ම කෙනෙක් උපාසකයාගේ අපරිහානියට වැටෙති. කවර සතෙක යත්:

භික්ෂූන්ගේ දර්ශනය නො පිරිහෙළයි. සද්ධර්මශ්‍රවණය පමා නො කෙරෙයි. අධිශීලයෙහි හික්මෙයි. ස්ථවිර මධ්‍යම නවක භික්ෂූන් කෙරෙහි ප්‍රසාදබහුල වෙයි. දොස් නො දක්නා සිත් ඇතියේ රන්ධ්‍රගවෙෂී නො වූයේ දහම් අසයි. මේ බුදුසස්නෙන් බැහැර දක්ෂිණාර්හයන් නො සොයයි. එහි ද පූර්වකාර නො කෙරෙයි.

මහණෙනි, මෙ සප්ත ධර්මයෝ උවසුහුගේ අපරිහානිය සඳහා වැටෙති යි.

14. යම් උපාසකයෙක් භාවිතාත්ම භික්ෂූන්ගේ දර්ශනය හා ආර්යධර්ම-යන්ගේ ශ්‍රවණය පිරිහෙළා ද, අධිශීලයෙහි නො හික්මේ ද,

15. සඟුන් කෙරෙහි අප්‍රසාදය වැඩි වැඩියෙන් වඩා ද, දොස් සොයන සිතැති ව සදහම් ඇසීමට කැමැති වේ ද,

16. මෙ සස්නෙන් බැහැරෙහි ද අන්‍යදක්ෂිණාර්හයකු සොයා ද, යම් උවසුයෙක් එ බැහැරි සස්නෙහි ම පූර්වකාර (ආගමික ක්‍රියා) කෙරේ ද,

17. මනාකොට දෙසනලද මෙ සප්ත පරිහානීය ධර්මයන් සේවන කරණ උවසු තෙමේ සද්ධර්මයෙන් පිරිහෙයි.

18. යම් උපාසකයෙක් භාවිතාත්ම භික්ෂූන්ගේ දර්ශනය නො පිරිහෙළා ද, ආර්ය ධර්මයන්ගේ ශ්‍රවණය නො පිරිහෙළා ද, අධිශීලයෙහි හික්මේ ද,

19. භික්ෂූන් කෙරෙහි ඔහුගේ ප්‍රසාදය වැඩි වැඩියෙන් වඩා ද, උපාරම්භසිත් නැති ව සදහම් අසන්නට කැමැති වේ ද,

20. මෙ සස්නෙන් බැහැර අන්‍ය දක්ෂිණාර්හයන් නො සොයනේ ද, යම් උවසුයෙක් මෙසස්නෙහි ම පූර්වකාර කෙරේ ද,

21. මොනොවට දෙසනලද මේ සප්ත අපරිහානීය ධර්මයන් සෙවුනා උපාසක සද්ධර්මයෙන් නො පිරිහේ.

### 7. 1. 3. 10.

### [උපාසක විපත්ති සූත්‍රය]

[ සැවැත්නිදාන යි]

30 මහණෙනි උපාසකහට මේ විපත් සතෙකි ... මහණෙනි, උපාසකහට මෙ සම්පත් සතෙකි ...



Free Distribution www.aathaapi.org

### 7. 1. 3. 11

### [උපාසක පරාභව සුත්තං]

[සාවත්ථිනිදානං]

21. සත්තිමෙ භික්ඛවෙ, උපාසකස්ස පරාභවා -පෙ-

සත්තිමෙ භික්ඛවෙ, උපාසකස්ස සම්භවා.[1] කතමෙ සත්ත:

භික්ඛුදස්සනං න හාපෙති. සද්ධම්මසවණං නප්පමජ්ජති. අධිසීලෙ සික්ඛති. පසාදබහුලො හොති භික්ඛූසු ථෙරෙසු ච නවෙසු ච මජ්ඣිමෙසු ච. අනුපාරම්භචිත්තො ධම්මං සුණාති න රන්ධගවෙසී. න ඉතො බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති. ඉධ ච පුබ්බකාරං කරොති.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත උපාසකස්ස සම්භවාති.

22. දස්සනං භාවිතත්තානං යො හාපෙති උපාසකො,
සවණඤ්ච අරියධම්මානං අධිසීලෙ න සික්ඛති.

-පෙ- [උපාසකො සෙවමානො] සද්ධම්මා පරිහායතී''ති [-පෙ-]

[29. එතෙ ඛො අපරිහානීයෙ සත්තධම්මෙ සුදෙසිතෙ,
උපාසකො සෙවමානො සද්ධම්මා න පරිහායතී'ති.]

### වජ්ජිසත්තකවග්ගො තතියො*

තස්සුද්දානං-

සාරන්දදෙ වස්සකාරො අපරිහානීය පඤ්චකං[2]
සෙඛො ච පරිහානි ච විපත්ති ච පරාභවො චාති.

---

1. සත්තිමා භික්ඛවෙ, උපාසකස්ස සම්පදා - මජසං
2. සාරන්දවස්සකාරෙ ච තිස්සත්තකානි භික්ඛුකා
බොධිපක්ඛියා දෙව ච හානි විපත්ති ච පරාභවො''ති - මජසං
සාරන්දදෙ වස්සකාරෙ භික්ඛුකානි ච සඤ්ඤා.
බොධිපක්ඛියා. සෙඛො ච පරිහානි විපත්තිපරාභවො චාති - සිමු.

* වජ්ජිවග්ගො - සිමු, සතා

## 7. 1. 3. 11.

## [උපාසක පරාභව සූත්‍රය]

[සැවැත් නිදාන යි]

21. මහණෙනි, උපාසකහට මේ පරාභව සතෙකි ...

මහණෙනි, උපාසකහට මේ සම්භව සතකි. කවර සතෙක යත්:

භික්ෂුදර්ශනය නො පිරිහෙළයි. සද්ධර්මශ්‍රවණයට පමා නො වෙයි. අධිශීලයෙහි හික්මෙයි. ස්ථවිර මධ්‍යම නවක භික්ෂූන් කෙරෙහි ප්‍රසාද බහුල වෙයි. උපාරම්භ සිත් නැති ව රන්ධ්‍රගවේෂී නො ව ධර්මය අසයි. මේ සස්නෙන් බැහැර දක්ෂිණාර්හයන් නො සොයයි. මෙහි ම පූර්වකාර කෙරෙයි. මහණෙනි, උවසුහුගේ මේ සම්භව සත යි.

22. යම් උවසුවෙක් භාවිත සිත් ඇති මහණුන්ගේ දර්ශනය හා ආර්යධර්මයන්ගේ ශ්‍රවණය පිරිහෙළා ද, අධිශීලයෙහි නො හික්මේ ද,

පරිහානීයධර්ම සේවන කරණ උපාසක තෙම සද්ධර්මයෙන් පිරිහේ ය යි ...

[29- මේ ව්‍යාඛ්‍යාත වූ සත් අපරිහානීය ධර්ම සේවනය කරණ උපාසක තෙම සද්ධර්මයෙන් නො පිරිහේ යයි.]

වජ්ජිසත්තක වර්ගය තුන්වැනි යි.

එහි උද්දානය:

සාරන්දද සූත්‍රය, වස්සකාර සූත්‍ර ය, භික්ෂු අපරිහානීය සූත්‍ර පස ය, සෙඛ පරිහානි සූත්‍රය, උපාසක පරිහානි සූත්‍රය, විපත්ති සූත්‍රය, පරාභව සූත්‍රය දැයි එකොළොසෙකි.

# 4. දෙවතා වග්ගො.

## 7. 1. 4. 1

### [අප්පමාදගාරව සුත්තං]

[සාවත්ථිනිදානං]

32. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච:

සත්තිමෙ භන්තෙ, ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සමාධිගාරවතා, අප්පමාදගාරවතා, පටිසන්ථාරගාරවතා. ඉමෙ ඛො භන්තෙ, සත්ත ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තී'ති.

ඉදමවොච සා දෙවතා, සමනුඤ්ඤො අහොසි සත්ථා.

අථ ඛො සා දෙවතා සමනුඤ්ඤො මෙ සත්ථාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ, රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ සා දෙවතා මං එතදවොච:

සත්තිමෙ භන්තෙ, ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සමාධිගාරවතා, අප්පමාදගාරවතා, පටිසන්ථාරගාරවතා. ඉමෙ ඛො භන්තෙ, සත්ත ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තී'ති.

ඉදමවොච භික්ඛවෙ සා දෙවතා. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායී'ති.

30 සත්ථුගරු ධම්මගරු සඞ්ඝෙ ච තිබ්බගාරවො,
සමාධිගරු ආතාපී සික්ඛාය තිබ්බගාරවො.

31 අප්පමාදගරු භික්ඛු පටිසන්ථාරගාරවො,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ'ති.

# 4. දේවතා වර්ගය

## 7. 1. 4. 1.

## [අප්පමාදගාරව සූත්‍රය]

[සැවැත්නිදන යි]

29. එකල එක්තරා දෙවියෙක් රෑ පළමු යම ඉක්මගිය කල්හි මනා වර්ණයෙන් යුක්ත ව මුළු දෙව්රම බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හකහා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළා ය:

වහන්ස, මේ ධර්මයෝ සත් දෙනෙක් භික්ෂූහුගේ නො පිරිහීම පිණිස පවතිත්. කවර සතෙක යත්:

ශාස්තෘහු කෙරෙහි ගෞරව ඇති බව, දහම්හි ගෞරව ඇති බව, සඟුන් කෙරෙහි ගෞරව ඇති බව, ශික්ෂාහි ගෞරව ඇති බව, සමාධියෙහි ගෞරව ඇති බව, අප්‍රමාදයෙහි ගෞරව ඇති බව, පටිසන්ථාරයෙහි ගෞරව ඇති බව ය. වහන්ස, මේ සත් දහම්හු මහණහුගේ නො පිරිහීම පිණිස පවත්නාහ යි.

ඒ දේවතාවා මෙය කීවු ය. භාග්‍යවතුන් වහන්සේ එ අනුදත් සේක

එක්බිති ඒ දෙවි, මබන ශාස්තෘහු අනුදත්හයි බුදුන් වැඳ පැදකුණු කොට එහි මැ අතුරුදහන් කෙළේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රෑ ඇවෑමෙන් මහණුන් ඇමැතූ සේක: මහණෙනි, මේ රාත්‍රියෙහි අභික්‍රාන්තරාත්‍රියෙහි මනා සිරුරු-පැහැයෙන් යුත් අන්‍යතර දෙවියෙක් හැම ජේතවනය බබුළුවා මා කරා එළැඹියේ ය. එළැඹ මා සකසා වැඳ එකත්පසෙක්හි සිටියේ ය. එකත්-පසෙක සිටි ඒ දෙවි මට මෙල සැලකෙළේ ය:

වහන්ස, මේ සත් කරුණුහු භික්ෂූහුගේ අපරිහානිය පිණිස වැටෙත්. කවර සතෙක යත්:

සත්ථුගාරවතා ය, ධම්මගාරවතා ය, සඞ්ඝගාරවතා ය, සික්ඛාගාරවතා ය, සමාධිගාරවතා ය, අප්පමාදගාරවතා ය. පටිසන්ථාරගාරවතා යි. වහන්ස, මේ සත්දහම්හු භික්ෂූහුගේ අපරිහානියට වැටෙත්නාහ යි.

මහණෙනි, ඒ දෙවි මෙය කී ය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වී ය යි.

30. ශාස්තෘහු කෙරෙහි ගෞරව ඇතියේ ධර්මය කෙරෙහි ගෞරව ඇතියේ සඟුන් කෙරෙහි ද තීව්‍රගෞරව ඇතියේ සමාධියෙහි ගෞරව ඇතියේ කෙලෙස් තවන වැර ඇතියේ ශික්ෂායෙහි තීව්‍රගෞරව ඇතියේ,

31. අප්‍රමාදයෙහි ගෞරව ඇතියේ පිළිසඳරෙහි ගෞරව ඇතියේ පරිහානියට අභව්‍ය වෙයි. එබඳු මහණ නිවන් සමීපයෙහි ම වේ ය ධ

## 7. 1. 4. 2

## [හිරිගාරව සුත්තං]

[සාවත්ථිනිදානං]

**33**. ඉමං භික්ඛවෙ, රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ, සා දෙවතා මං එතදවොච:

සත්තිමෙ භන්තෙ, ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සමාධිගාරවතා, හිරිගාරවතා, ඔත්තප්පගාරවතා. ඉමෙ ඛො භන්තෙ, සත්ත ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති'ති.

ඉදමවොච භික්ඛවෙ, සා දෙවතා. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායී'ති.

32. සත්ථුගරු ධම්මගරු සඞ්ඝෙ ච තිබ්බගාරවො,
සමාධිගරු ආතාපී සික්ඛාය තිබ්බගාරවො.

33. හිරොත්තප්පසම්පන්නො සප්පතිස්සො සගාරවො,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ''ති.

## 7. 1. 4. 3

## [පඨම සොවචස්සතා සුත්තං]

[සාවත්ථිනිදානං]

**34**. ඉමං භික්ඛවෙ, රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ, සා දෙවතා මං එතදවොච:

සත්තිමෙ භන්තෙ, ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සමාධිගාරවතා, සොවචස්සතා, කල්‍යාණමිත්තතා. ඉමෙ ඛො භන්තෙ, සත්ත ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති.

ඉදමවොච භික්ඛවෙ, සා දෙවතා. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

34. සත්ථුගරු ධම්මගරු සඞ්ඝෙ ච තිබ්බගාරවො,
සමාධිගරු ආතාපී සික්ඛාය තිබ්බගාරවො.

35. කල්‍යාණමිත්තො සුවචො සප්පතිස්සො සගාරවො,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙති.

7. 1. 4. 2.

[හිරිගාරව සූත්‍රය]

[සැවැත්නිදාන යි]

31. මහණෙනි, මේ රාත්‍රියෙහි රෑය බෙහෙවින් ඉක්මයත් ම මනා සිරුරු පැහැ ඇති අන්‍යතර දෙවියෙක් මුළු ජේතවනය බබුළුවා මා කරා එළැඹියේ ය. එළැඹ මා සකසා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දෙවි මට මෙතෙල කරුණ සැල කෙළේ ය:

වහන්ස, මෙ සත් කරුණු මහණුන්ගේ අපරිහානිය සඳහා වැටෙත්. කවර සතෙක යත්:

ශාස්තෘගෞරව ඇති බව, ධර්මගෞරව ඇති බව, සඞ්ඝගෞරව ඇති බව, ශික්ෂාගෞරව ඇති බව, සමාධිගෞරව ඇති බව, හ්‍රීගෞරව ඇති බව, ඔත්තප්හි ගෞරව ඇති බව යි. වහන්ස, මෙ සත් කරුණු භික්ෂූන්ගේ නො පිරිහීමට වැටෙති යි.

මහණෙනි, ඒ දෙවි මෙය කී ය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වී ය යි.

32. මහණ ශාස්තෘගෞරව ඇතියේ ධර්මගෞරව ඇතියේ සඞ්ඝයා කෙරෙහි තීව්‍රගෞරව ඇතියේ සමාධිගෞරව ඇතියේ කෙලෙස් තවන වැර ඇතියේ ශික්ෂාහි ගෞරව ඇතියේ,

33. හ්‍රීයෙන් හා ඔතප් ගුණෙන් සමන්‍වාගත වූයේ ප්‍රතිශ්‍රය ඇතියේ ගෞරව සහිත වූයේ පරිහානියට අභව්‍ය වූයේ නිවන් ගමූයෙහි ම වේ ය යි.

7. 1. 4. 3.

[පළමුවන සොවචස්සතා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

34. මහණෙනි, මෙ රෑහි අභික්‍රාන්තවර්ණ ඇති එක්තරා දෙවියෙක් බෙහෙවින් ඉක්මගිය රාත්‍රියෙහි මුළු ජේතවනය බබුළුවා මා කරා එළැඹි-යේ ය. එළැඹ මා සකසා වැඳ එකත්පස්හි සිටියේ ය. එකත්පස්හි සිද ඒ දෙවි මට මෙතෙල කරුණ පැවැසී ය:

වහන්ස, මෙ සත් කාරණයෝ භික්ෂූන්ගේ නො පිරිහීම සඳහා වැටෙති. කවර සතෙක යත්:

සත්‍ථුගාරවතා හා ධම්මගාරවතා හා සඞ්ඝගාරවතා හා සික්ඛාගාරවතා හා සමාධිගාරවතා හා සොවචස්සතා හා කල්‍යාණමිත්තතා යි. වහන්ස, මෙ සත් කාරණයෝ මහණුන්ගේ අපරිහානිය සඳහා වැටෙති යි.

මහණෙනි, ඒ දෙවි මෙය කී ය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වී ය යි.

34 ශාස්තෘගෞරව ඇතියේ ධර්මගෞරව ඇතියේ සඟුන් කෙරෙහි දෘඪගෞරව ඇතියේ සමාධිගෞරව ඇතියේ ආතාප ඇතියේ ශික්ෂාහි දෘඪගෞරව ඇතියේ,

35. කලණ මිතුරන් ඇතියේ අවවාදක්‍ෂම වූයේ ප්‍රතිශ්‍රය (ගුරුගෞරව) ඇති ගෞරව සහිත වූයේ පරිහානියට අභව්‍ය වෙයි. නිර්වාණ සමීපයෙහි ම වේ යයි.

## 7. 1. 4. 4

## [දුතිය සොවචස්සතා සුත්තං]

[සාවත්ථිනිදානං]

35. ඉමං භික්ඛවෙ, රත්තිං අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ සා දෙවතා මං එතදවොච:

සත්තිමෙ භන්තෙ, ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත:

සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සමාධිගාරවතා, සොවචස්සතා, කල්‍යාණමිත්තතා. ඉමෙ ඛො භන්තෙ, සත්ත ධම්මා භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති.

ඉදමවොච භික්ඛවෙ, සා දෙවතා. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: ඉමස්ස ඛො අහං භන්තෙ, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි:

ඉධ භන්තෙ, භික්ඛු අත්තනා ච සත්ථුගාරවො හොති සත්ථුගාරවතාය ච වණ්ණවාදී. යෙ චඤ්ඤෙ භික්ඛූ න සත්ථුගාරවා, තෙ ච සත්ථුගාරවතාය සමාදපෙති. යෙ චඤ්ඤෙ භික්ඛූ සත්ථුගාරවා තෙසං ච වණ්ණං භණති භූතං තච්ඡං කාලෙන. අත්තනා ච ධම්මගාරවො හොති -පෙ- සඞ්ඝගාරවො හොති -පෙ- සික්ඛාගාරවො හොති -පෙ- සමාධිගාරවො හොති -පෙ- සුවචො හොති -පෙ- කල්‍යාණමිත්තො හොති කල්‍යාණමිත්තතාය ච වණ්ණවාදී. යෙ චඤ්ඤෙ භික්ඛූ න කල්‍යාණමිත්තා, තෙ ච කල්‍යාණමිත්තතාය සමාදපෙති. යෙ චඤ්ඤෙ භික්ඛූ කල්‍යාණමිත්තා, තෙසඤ්ච වණ්ණං භණති භූතං තච්ඡං කාලෙනා'ති.

ඉදමස්ස[1] ඛො අහං භන්තෙ, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත, ඉමස්ස මයා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං අජානාසි.

---

1 ඉධස්ස - මජසං.

7. 1. 4. 4.

[දෙවෙනි සොවචස්සතා සූත්‍රය]

[සෑවැත්නිදන යි]

35. මහණෙනි, මේ රාත්‍රියෙහි අභික්‍රාන්ත වර්ණයෙන් යුත් අන්‍යතර දෙවියෙක් මුළු දෙව්රම් වෙහෙර මැදියම් රැහි එකලු කොට මා වෙත එළැඹියේ ය. එළැඹ මා සකසා වැඳ එකත්පස්හි සිටියේ ය. එකත්පස්හි සිටි ඒ දෙවි මට තෙල කරුණ සැල කෙළේ ය:

වහන්ස, භික්ෂුහුගේ අපරිහානිය සඳහා මෙ කරුණු සතක් වැටෙ. කවර සතෙක යත්:

ශාස්තෘගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, සමාධි-ගාරවතා, සොවචස්සතා, කල්‍යාණමිත්තතා යි. වහන්ස, මෙ සත් කාරණයෝ භික්ෂුහුගේ අපරිහානියට වැටෙති යි.

මහණෙනි, ඒ දෙවි මේ කී ය. මෙය කියා මා සකසා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් වී ය යි.

මෙසේ වදල කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකල හ. වහන්ස, භාග්‍යවතුන් විසින් සැකෙවින් වදරණලද විස්තාරයෙන් විභාග නො කල තෙල භාෂිතයාගේ අර්ථය විස්තර විසින් මම මෙසේ දන්මි:

වහන්ස, මේ සස්නෙහි මහණ තෙමේ ද ශාස්තෘගෞරව ඇතියේ ශාස්තෘගෞරවතායෙහි ගුණ වණනුයේ ද වෙයි. ශාස්තෘගෞරව නැති යම්බඳු අන්‍ය මහණහු වෙත් නම්, ඔවුහුදු ශාස්තෘගෞරවතායෙහි සමාදන් කරවයි. ශාස්තෘගෞරව ඇති අන්‍ය යම් බඳු මහණහු වෙත් නම් භූත විසින් යථාවයෙන් තිසි කල්හි ඔවුන්ගේ ද ගුණ බෙණෙයි. තෙමේ ද ධර්මගෞරව ඇතියේ වෙයි ... සඞ්ඝගෞරව ඇතියේ වෙයි ... ශික්ෂාගෞරව ඇතියේ වෙයි .. සමාධිගෞරව ඇතියේ වෙයි .. අවවාදක්ෂම වෙයි ... තෙමේද කලණ මිතුරන් ඇතියේ කල්‍යාණමිත්‍රතායෙහි වර්ණවාදී ද වෙයි. යම්බඳු අන්‍ය වූ ද කල්‍යාණ මිත්‍රයන් නැති භික්ෂුහු වෙත් නම්, ඔවුහුදු කල්‍යාණ-මිත්‍රතායෙහි සමාදන් කරවයි. යම්බඳු අන්‍ය වූ ද කල්‍යාණමිත්‍රයන් ඇති භික්ෂුහු වෙත් නම් ඔවුන්ගේ ද භූත වූ ගුණ තථ්‍ය කොට තිසි කල්හි කියන්නේ ය.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරණලද මෙ භාෂිතයාගේ අර්ථය මෙසේ විතර විසින් දන්මි යි.

ශාරිපුත්‍රයෙනි, මැනැව, මැනැව. ශාරිපුත්‍රයෙනි, තෝ මා විසින් සැකෙවින් දෙසනලද මෙ භාෂිතයාගේ අර්ථය මෙ පරිද්දෙන් විතර විසින් දක්හි නම් මැනැව.

ඉධ සාරිපුත්ත, භික්ඛු අත්තනා ච සත්ථුගාරවො හොති සත්ථුගාරවතාය ච වණ්ණවාදී. යෙ චඤ්ඤෙ භික්ඛූ න සත්ථුගාරවා තෙ ච සත්ථුගාරවතාය සමාදපෙති. යෙ චඤ්ඤෙ භික්ඛූ සත්ථුගාරවා තෙසඤ්ච වණ්ණං භණති භූතං තච්ඡං කාලෙන. අත්තනා ච ධම්මගාරවො හොති -පෙ- සඞ්ඝගාරවො හොති -පෙ- සික්ඛාගාරවො හොති -පෙ- සමාධිගාරවො හොති -පෙ- සුවචො හොති -පෙ- කල්‍යාණමිත්තො හොති කල්‍යාණමිත්තතාය ච වණ්ණවාදී. යෙ චඤ්ඤෙ භික්ඛූ න කල්‍යාණමිත්තා, තෙ ච කල්‍යාණමිත්තතාය සමාදපෙති. යෙ චඤ්ඤෙ භික්ඛූ කල්‍යාණමිත්තා, තෙසඤ්ච වණ්ණං භණති භූතං තච්ඡං කාලෙනා'ති.

ඉමස්ස ඛො සාරිපුත්ත, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

## 7. 1. 4. 5

## [මිත්ත සුත්තං]

[සාවත්ථිනිදානං]

86. සත්තහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො මිත්තො සෙවිතබ්බො. කතමෙහි සත්තහි:

දුද්දදං දදාති, දුක්කරං කරොති, දුක්ඛමං ඛමති, ගුය්හමස්ස ආවිකරොති, ගුය්හං අස්ස පරිගුහති, ආපදාසු න ජහති, ඛීණෙන නාතිමඤ්ඤති. ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහඞ්ගෙහි සමන්නාගතො මිත්තො සෙවිතබ්බොති.

36. දුද්දදං දදාති මිත්තො[1] දුක්කරං චාපි කුබ්බති,
අථොපිස්ස දුරුත්තානි ඛමති දුක්ඛමානිපි.

37. ගුය්හං චස්ස[2] අක්ඛාති ගුය්හස්ස පරිගූහති,
ආපදාසු න ජහාති ඛීණෙන නාතිමඤ්ඤති.

38. යස්මිං එතානි ඨානානි සංවිජ්ජන්තීධ පුග්ගලෙ,
සො මිත්තො මිත්තකාමෙන භජිතබ්බො තථාවිධොති.

## 7. 1. 4. 6

## [භික්ඛුමිත්ත සුත්තං]

[සාවත්ථිනිදානං]

87. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛුමිත්තො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො අපි පනුජ්ජමානෙනපි. කතමෙහි සත්තහි:

පියො ච හොති මනාපො ච, ගරු ච, භාවනීයො ච, වත්තා ච, වචනක්ඛමො ච, ගම්භීරඤ්ච කථං කත්තා හොති, නො ච අට්ඨානෙ නියොජෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛුමිත්තො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො අපි පනුජ්ජමානෙනපීති.

1 දුද්දදංදදති මිත්තො - මජසං 2 ගුය්හඤ්ච තස්ස - මජසං

ශාරිපුත්‍රයෙනි, මේ තත්හෙහි මහණ තෙමේත් ශාස්තෘගෞරව ඇතියේ ශාස්තෘගෞරව ඇති බව්හි ගුණ කියනසුලුයේත් වෙයි. යම් අන්‍ය භික්ෂූහු ද ශාස්තෘගෞරව ඇත්තාහු නො වෙත් නම් ඔවුනුදු ශාස්තෘගෞරවතායෙහි සමාදන් කරවයි. යම් බඳු අන්‍ය භික්ෂූහු ශාස්තෘගෞරව ඇතියාහු වෙත් නම්, ඔවුන්ගේත් ගුණ භූත කොට තථ්‍යභාවයෙන් තිසි කල්හි බෙණෙයි. තෙමෙ ද ධර්මයෙහි ගෞරව ඇතියේ වෙයි .. සඝයා කෙරෙහි ගෞරව ඇතියේ වෙයි ... ශික්ෂායෙහි ගෞරව ඇතියේ වෙයි ... සමාධියෙහි ගෞරව ඇතියේ වෙයි ... සුවච වෙයි ... තෙමේ ද කල්‍යාණමිත්‍රයන් ඇතියේ කල්‍යාණමිත්‍රතායෙහි වර්ණවාදීත් වෙයි. යම්බඳු අන්‍ය භික්ෂූහු කල්‍යාණ-මිත්‍රයන් ඇතියාහු නො වෙත් නම් ඔවුනුදු කල්‍යාණමිත්‍රතායෙහි සමාදන් කරවයි. යම් බඳු අන්‍ය කල්‍යාණමිත්‍ර භික්ෂූහු වෙත් නම් ඔවුන්ගේ ද ගුණය භූත කොට තථ්‍ය කොට තිසි කල්හි කියයි.

ශාරිපුත්‍රයෙනි, මා විසින් සැකෙවින් දෙසනලද මේ භාෂිතයාගේ අර්ථය මෙ පරිද්දෙන් විස්තර විසින් දතයුතු වේ ය යි.

7. 1. 4. 5.

[මිත්‍ර සූත්‍රය]

[සැවැත් නිදාන යි]

35. මහණෙනි, සත් කරුණෙකින් සමන්වාගත මිත්‍ර සේවන කටයුත්-තේ ය. කවර සතෙකින ද යත්:

දෙනුවට දුෂ්කර වූ ද දෙයි. දුෂ්කර ද කෙරෙයි. නො ඉවසිය හැකි ද ඉවසයි. තමාගේ රහස් මිතුරුහට පළ කරයි. ඒ මිතුරුහුගේ රහස් සඟවයි. ආපද්හි මිතුරා නො හරියි. ධනක්ෂීණයෙන් ඔහට අවමන් නො කෙරෙයි. මහණෙනි, මේ කරුණු සතින් සමන්වාගත මිත්‍ර සෙවිය යුත්තේ යි.

36. දීමට දුෂ්කර ධනය ද දෙයි. දුෂ්කර දෙය මිතුරුහට කෙරෙයි. වැලිත් ඔහුගේ දුරුක්ත වූ ඉවසිය නො හෙන බසුත් ඉවසයි.

37. ඔහට සිය රහස් ද කියයි. ඔහුගේ රහස් සඟවයි. විපත්හි දී නො හරි යි. ක්ෂීණ (පිරිහුණු) හෙයින් අවමන් නො කෙරෙයි.

38. මේ ලොව්හි යම් පුද්ගලකු කෙරෙහි මේ කරුණු විද්‍යමාන වෙත් ද, මිතුරන් පතනහු විසින් එබඳු ඒ මිත්‍ර තෙමේ භජනය කටයුතු වේ ය යි.

7. 1. 4. 6.

[භික්ෂුමිත්‍ර සූත්‍රය]

[සැවැත් නිදාන යි]

37. මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත භික්ෂුමිත්‍රයා නෙරණු-ලබන්නහු විසිනුදු සෙවිය යුත්තේ ය, භජනය කළයුත්තේ ය, පර්යුපාසන කටයුත්තේ ය. කවර සතෙකින ද යත්:

ප්‍රිය ද මනාප ද වෙයි. ගුරු ද වෙයි. බුහුමනට තිසි ද වෙයි. වක්තෘ ද වෙයි. වචනක්ෂම (ඇදහිය හැකි වචන ඇත්තේ) ද වෙයි. ගම්භීරකථා කරන්නේ ද වෙයි. අස්ථානයෙහි (නොමඟ) ද නො යොදවයි.

මහණෙනි, මේ කරුණු සතින් සමන්වාගත භික්ෂුමිත්‍ර නෙරණුලබන්-නහු විසිනුදු සෙවියයුත්තේ ය, භජනය කටයුත්තේ ය, පයර්‍යුපාසනා කටයුත්තේ ය.

39. පියො ච ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො,
ගම්භීරඤ්ච කථං කත්තා නො චට්ඨානෙ නියොජයෙ.

40. යස්මිං එතානි ඨානානි සංවිජ්ජන්තීධ පුග්ගලෙ,
සො මිත්තො මිත්තකාමෙන අත්ථකාමානුකම්පකො,
අපි නාසියමානෙන භජිතබ්බො තථාවිධොති.

### 7. 1. 4 7

### [පඨමපටිසම්භිදා සුත්තං]

[සාවත්ථිනිදානං]

38. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව චතස්සො පටිසම්භිදා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු ඉදං මෙ චෙතසො ලීනත්තන්ති යථාභූතං පජානාති. අජ්ඣත්තං සඞ්ඛිත්තං වා චිත්තං අජ්ඣත්තං මෙ සඞ්ඛිත්තං චිත්තන්ති යථාභූතං පජානාති. බහිද්ධා වික්ඛිත්තං වා චිත්තං බහිද්ධා මෙ වික්ඛිත්තං චිත්තන්ති යථාභූතං පජානාති. තස්ස විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සප්පායාසප්පායෙසු ඛො පනස්ස ධම්මෙසු හීනප්පණීතෙසු කණ්හසුක්කසප්පටිභාගෙසු නිමිත්තං සුග්ගහිතං හොති සුමනසිකතං සූපධාරිතං සුප්පටිවිදිතං පඤ්ඤාය.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව චතස්සො පටිසම්භිදා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා''ති.

### 7. 1. 4. 8

### [දුතියපටිසම්භිදා සුත්තං]

සාවත්ථිනිදානං]

39. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො චතස්සො පටිසම්භිදා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, සාරිපුත්තො ඉදං මෙ චෙතසො ලීනත්තන්ති යථාභූතං පජානාති. අජ්ඣත්තං සඞ්ඛිත්තං වා චිත්තං අජ්ඣත්තං මෙ සඞ්ඛිත්තං චිත්තන්ති යථාභූතං පජානාති. බහිද්ධා වික්ඛිත්තං වා චිත්තං බහිද්ධා මෙ වික්ඛිත්තං චිත්තන්ති යථාභූතං පජානාති. තස්ස විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

39 ප්‍රිය වූයේ වේ ද, ගුරු වූයේ වේ ද, භාවනීය වේ ද, වක්තෘ (කථාවෙහි දක්ෂ) වේ ද, වචනක්ෂම වේ ද, ගැඹුරුතෙපුල් කියන්නේත් වේ ද, අස්ථානයෙහිත් නො යොදන්නේ ද.

40. මෙ ලොවීහි යම් පුඟුලකු කෙරෙහි මෙල සත් කරුණු විද්‍යමාන වෙත් නම් අර්ථකාමයාහට අනුකම්පා කරණ එබඳු මිත්‍රතෙම මිත්‍රයෙක් පතන්නහු විසින් තෙරණු ලැබුව ද භජනය කටයුත්තේ ය යි.

## 7. 1. 4. 7.

## [ප්‍රථමපටිසම්භිදා සූත්‍රය]

[සැවැත් නිදාන යි]

38 මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත මහණ නො බෝකලෙකින් ම සිවුපිළිසිඹියා නැණ තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වාසය කරන්නේ ය. කවර සතෙකින ය ත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ 'මාගේ චිත්තයාගේ මෙ ලීනභාවය' යි යථාවයෙන් (ඇතිසැටියෙන්) දන්නේ ය. (ථීනමිද්ධානුගත වීමෙන්) සංක්ෂිප්ත වූ චිත්තය 'මාගේ අධ්‍යාත්මයෙහි චිත්තය සංක්ෂිප්ත ය'යි යථාවයෙන් දන්නේ ය. බාහ්‍යාලම්බනයෙහි වික්ෂිප්ත චිත්තය 'මාගේ චිත්තය බාහ්‍යාලම්බනයෙහි වික්ෂිප්තය' යි යථාවයෙන් දන්නේ ය. ඔහට වේදනාවෝ විදිත වූවාහු ම උපදනාහ, විදිත ව ම එළඹෙත්, විදිත ව ම අස්තයට යෙත්. සංඥාවෝ විදිත වූවාහු ම උපදනාහ, විදිත ව ම එළඹෙත්, විදිත ව ම අස්තයට යෙත්. විතර්කයෝ විදිත ව ම උපදනාහ, විදිත ව ම එළඹ සිටුනාහ, විදිත ව ම අස්තයට යෙත්. ඔහු විසින් සප්‍රාය අසප්‍රාය වූ ද හීනප්‍රණීත වූ ද කෘෂ්ණශුක්ල සප්‍රතිභාග වූ ද ධර්මයන්හි නිමිත්ත (කාරණ) ය මොනොවට ගත්තාලද වෙයි, මොනොවට මෙනෙහි කරණලද වෙයි, මොනොවට උපධාරණ කරණ ලද වෙයි, ප්‍රඥායෙන් මොනොවට පිළිවිදිනලද වෙයි

මහණෙනි, මෙ කරුණු සතින් සමන්වාගත මහණ නො බෝකලෙකින් ම සිවුපිළිසිඹියා නුවණ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට එළඹ වසන්නේ ය යි.

## 7. 1. 4. 8.

## [දෙවෙනි පටිසම්භිදා සූත්‍රය]

[සැවැත් නිදාන යි]

39. මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත සාරිපුත්තයෝ සිවුපිළිසිඹියා නුවණ තුමූ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වෙසෙත්. කවර සතෙකින ය ත්:

මහණෙනි, මෙ සස්නෙහි සැරියුත් තෙරණුවෝ 'මාගේ මෙ චිත්තයාගේ ලීනභාවය ඇතැ'යි යථාවයෙන් දන්නාහ. අධ්‍යාත්මයෙහි සංක්ෂිප්ත (හැකුළුනා) වූ හෝ සිත 'අධ්‍යාත්මයෙහි මාගේ චිත්තය සංක්ෂිප්ත ය'යි යථාවයෙන් දන්නාහ. බාහ්‍යයෙහි වික්ෂිප්ත (විසිරගියා) වූ හෝ චිත්තය 'මාගේ චිත්තය බාහ්‍යයෙහි වික්ෂිප්ත ය'යි යථාවයෙන් දන්නාහ. ඔහට වේදනාවෝ විදිත ව ම උපදනාහ, විදිත ව ම එළැඹ සිටුනාහ, විදිත ව ම අස්තයට යන්නාහ.

විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සප්පායාසප්පායෙසු ඛො පනස්ස ධම්මෙසු හීනප්පණීතෙසු කණ්හසුක්ක-සප්පටිභාගෙසු නිමිත්තං සුග්ගහිතං හොති සුමනසිකතං සූපධාරිතං සුප්පටිවිද්ධං පඤ්ඤාය.

ඉමෙහි ඛො භික්ඛවෙ සත්තහි ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො චතස්සො පටිසම්භිදා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී''ති.

## 7. 1. 4. 9

## [පඨම චිත්තවසවත්තන සුත්තං]

[සාවත්ථිනිදානං]

**40**. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු චිත්තං වසෙ වත්තෙති, නො ච භික්ඛු චිත්තස්ස වසෙන වත්තති. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු සමාධිකුසලො හොති, සමාධිස්ස සමාපත්තිකුසලො හොති, සමාධිස්ස ඨිතිකුසලො හොති, සමාධිස්ස වුට්ඨානකුසලො හොති සමාධිස්ස කල්ලිතකුසලො[1] හොති, සමාධිස්ස ගොචරකුසලො හොති, සමාධිස්ස අභිනීහාරකුසලො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු චිත්තං වසෙ වත්තෙති, නො ච භික්ඛු චිත්තස්ස වසෙන වත්තති.

## 7. 1. 4. 10

## [දුතිය චිත්තවසවත්තන සුත්තං]

[සාවත්ථිනිදානං]

**41** සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො චිත්තං වසෙ වත්තෙති, නො ච සාරිපුත්තො චිත්තස්ස වසෙන වත්තති. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, සාරිපුත්තො සමාධිකුසලො හොති, සමාධිස්ස සමාපත්ති-කුසලො, සමාධිස්ස ඨිතිකුසලො, සමාධිස්ස වුට්ඨානකුසලො, සමාධිස්ස කල්ලිතකුසලො,[1] සමාධිස්ස ගොචරකුසලො, සමාධිස්ස අභිනීහාරකුසලො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො චිත්තං වසෙ වත්තෙති, නො ච සාරිපුත්තො චිත්තස්ස වසෙන වත්තති''ති

1 කල්ලාණකුසලො - මජසං

සංඥාවෝ විදිත වම උපදනාහ, විදිත වම එලඹ සිටුනාහ, විදිත වම අස්තයට යන්නාහ. විතර්කයෝ විදිත වම උපදනාහ, විදිත වම එලඹ සිටුනාහ, විදිත වම අස්තයට යන්නාහ. උපකාරී අනුපකාරී වූ ද හීනප්‍රණීත වූ ද කෘෂ්ණශුක්ල සප්‍රතිභාග වූ ද ධර්මයන්හි නිමිත්ත ඔහු විසින් මොනොවට ගන්නාලද වෙයි. මොනොවට මෙනෙහි කරණලද වෙයි. මොනොවට උපධාරණ කරණලද වෙයි. ප්‍රඥායෙන් මැනැවින් පිළිවිදිනාලද වෙයි.

මහණෙනි, මෙ කරුණු සතින් සමන්‍වාගත සැරියුත්හු තුමූ සිවුපිළිසිඹියා විශේෂාවබෝධයෙන් දූන පසක් කොට එලඹ වාසය කරන්නාහ යි.

## 7. 1. 4. 9.

## [ප්‍රථම චිත්තවශවත්තන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**40**. මහණෙනි, කරුණු සතෙකින් සමන්‍වාගත මහණ සිත වශයෙහි පවත්වයි. මහණ ද චිත්තයාගේ වශයෙන් නො වැටෙයි. කවර සතෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සමාධිකුශල වෙයි. සමාධි සමාපත්තියෙහි කුශල වෙයි. සමාධිස්ථිතියෙහි කුශල වෙයි. සමාධිව්‍යුත්ථානයෙහි කුශල වෙයි. සමාධිකල්‍යභාවයෙහි කුශල වෙයි. සමාධිගොචරයෙහි කුශල වෙයි. සමාධිඅභිනීහාරයෙහි කුශල වෙයි.

මහණෙනි, මෙ කරුණු සතින් සමන්‍වාගත මහණ චිත්තය වශයෙහි පවත්වයි. මහණ ද චිත්තයාගේ වශයෙන් නො වැටේ යයි.

## 7. 1. 4 10

## [දෙවෙනි චිත්තවශවත්තන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**41** මහණෙනි, කරුණු සතෙකින් සමන්‍වාගත සාරිපුත්තයෝ චිත්තය සවවශයෙහි පවත්වන්නාහ. සාරිපුත්තයෝ ද චිත්තයාගේ වශයෙන් නො පවත්නාහ. කවර සතෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි සැරියුත්හු සමාධියෙහි කුශල වෙති සමාධි-සමාපත්ති කුශල වෙති. සමාධිස්ථිති කුශල වෙති. සමාධිව්‍යුත්ථාන කුශල වෙති. සමාධිකල්‍ය (දක්‍ෂභාවයෙහි) කුශල වෙත්. සමාධි ගොචරයෙහි කුශල වෙත්. සමාධි අභිනීහාරයෙහි (එලවා ගැණීමෙහි) කුශල වෙති

මහණෙනි, මෙ සත් කරුණින් සමන්‍වාගත සාරිපුත්තයෝ චිත්තය වශයෙහි පවත්වත්. සැරියුත්හු චිත්තයාගේ වශයෙන් නො පවති ත්.

## 7. 1. 4. 11

### [පඨම නිද්දසවත්ථු සුත්තං]

42. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි.

අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජ-කානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමි. උප-සඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදි. සම්මො-දනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

තෙන ඛො පන සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: යො හි කොචි ආවුසො, ද්වාදසවස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, 'නිද්දසො භික්ඛූ'ති අලං වචනායාති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දි, න පටික්කොසි. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කාමි 'භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමී'ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච:

ඉධාහං භන්තෙ, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසිං. තස්ස මය්හං භන්තෙ, එතදහොසි: අතිප්ප-ගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛ්වාහං භන්තෙ, යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. තෙන ඛො පන භන්තෙ, සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: යො හි කොචි ආවුසො, ද්වාදසවස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, 'නිද්දසො භික්ඛූ'ති අලං වචනායා'ති. අථ ඛ්වාහං භන්තෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිං, න පටික්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කාමිං 'භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමී'ති.

සක්කා නු ඛො භන්තෙ, ඉමස්මිං ධම්මවිනයෙ කෙවලං වස්සගණන-මත්තෙන නිද්දසො භික්ඛූති පඤ්ඤාපෙතුන්ති.

න ඛො සාරිපුත්ත, සක්කා ඉමස්මිං ධම්මවිනයෙ කෙවලං වස්සගණන-මත්තෙන නිද්දසො භික්ඛූති පඤ්ඤාපෙතුං.

සත්ත ඛො ඉමානි සාරිපුත්ත, නිද්දසවත්ථූනි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි සත්ත:

## 7. 1. 4 11.

## [ප්‍රථම නිද්දස වත්ථු සූත්‍රය]

42. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු මහසිටුහුගේ **ජේතවන** නම් අරම්හි වැඩ වෙසෙත්. එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ සැවැත්හි පිඬු පිණිස පිවිසියහ.

එක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන්ට තෙලෙ සිත විය: "තව ම සැවැත්හි පිඬු පිණිස සැරිසරණට බොහෝ අලුයම් වෙයි. මම අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ ආසපුවට එළැඹෙම් නම් මැනැවැ"යි. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරහු අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ අසපුව කරා වැඩියහ. වැඩ ඒ අන්තොටූ පිරිවැජියන් හා සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස්හි වැඩ හුන්හ.

එ සමයෙහි රැස් ව හුන් ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයන් අතුරෙහි මේ අතුරු කථායෙක් පළ විය: "ඇවැත්නි, යම් පුද්ගලයෙක් දෙළොස් වසක් පිරිපුන් පිරිසිදු බඹසර වෙසේ නම් හෙ 'නිද්දස (දසවස්කථා ඉක්ම වූ) මහණ' යි කීමට නිසි වෙ යි.

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරහු ඒ අන්තොටූ පිරිවැජියන්ගේ භාෂිතය නො ම පිළිගත්හ, නො ද පිළිකෙව් කළහ. නො පිළිගෙණ ප්‍රතික්ෂෙප නො කොට "භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි තෙල භාෂිතයාගේ අරුත් දනුම්හ"යි හුනස්නෙන් නැඟ වැඩියහ.

එක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ සැවැත්හි පිඬු පිණිස හැරැ පසුබත් වේලෙහි පිඬුවායෙන් පෙරළා පැමිණියාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි හුන්හ. එකත්පස්හි හුන් ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කාරුණ සැලකළහ:

වහන්ස, මෙහි මම පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු රැගෙණ සවැත්හි පිඬු සඳහා පිවිසියෙමි. වහන්ස, එ මට තෙලෙ සිත් විය: සැවැත්හි පිඬු සඳහා වදනට තව බොහෝ අලුයම් වෙයි. මම අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ අසපුව කරා යෙම් නම් මැනැවැයි. වහන්ස, ඉක්බිති මම අන්තොටූ පිරිවැජියන්ගේ අසපුව කරා එළැඹියෙමි. එළැඹ එ අන්තොටූ පිරිවැජියන් සමග සතුටු වීමි. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්-පසෙක්හි හිතිමි. වහන්ස, එ සමයෙහි එ රැස් ව හුන් අන්තොටූ පිරි-වැජියන් අතුරෙහි මේ අතුරුකථාව උපන: "ඇවැත්නි යම් පුද්ගලයෙක් දෙළොස්වසක් පිරිපුන් පිරිසිදු බ්‍රහමචර්යය පෙරේ නම්, 'නිද්දස මහණ'යි කියනට නිසි වේ"ය යි. වහන්ස, එක්බිති මම එ අන්තොටූ පිරිවැජ්ජන්ගේ භාෂිතය නො ම පිළිගතිමි, නො ම ප්‍රතික්ෂෙප කෙළෙමි. නො පිළිගෙණ නො පිළිකෙව් කොට "භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මේ භාෂිතයාගේ අර්ථය දැනගන්මි"යි හුනස්නෙන් නැඟී නික්මගියෙමි.

වහන්ස, මෙ ධම්විනයෙහි හුදු වස් ගණන් පමණෙකින් 'නිද්දස මහණෙකැ'යි පැනැවිය හැකි දැ යි.

ශාරීපුත්‍රයෙනි, හුදු වස්ගණන් පමණෙකින් මෙ ධම්විනයෙහි (පුහුලකු) 'නිද්දස මහණෙකැ'යි පැනැවිය නො හැක්ක.

ශාරීපුත්‍රයෙනි, මෙ නිද්දසවත්ථු සත්දෙනෙක් මා විසින් තමා ම විශිෂ්ට ඥානයෙන් දැන සාක්‍ෂාත් කොට දත්නාලදහ. කවර සතෙක යත්:

ඉධ සාරිපුත්ත, භික්ඛු සික්ඛාසමාදානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සික්ඛාසමාදානෙ අවිගතපෙමො. ධම්මනිසන්තියා[1] තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච ධම්මනිසන්තියා අවිගතපෙමො. ඉච්ඡාවිනයෙ තිබ්බච්ඡන්දො හොති, ආයතිඤ්ච ඉච්ඡාවිනයෙ අවිගතපෙමො. පටිසල්ලානෙ තිබ්බච්ඡන්දො හොති, ආයතිඤ්ච පටිසල්ලානෙ අවිගතපෙමො. විරියාරම්භෙ තිබ්බච්ඡන්දො හොති, ආයතිඤ්ච විරියාරම්භෙ අවිගතපෙමො. සතිනෙපක්කෙ තිබ්බච්ඡන්දො හොති, ආයතිඤ්ච සතිනෙපක්කෙ අවිගතපෙමො. දිට්ඨිපටිවෙධෙ තිබ්බච්ඡන්දො හොති, ආයතිඤ්ච දිට්ඨිපටිවෙධෙ අවිගතපෙමො.

ඉමානි ඛො සාරිපුත්ත, සත්ත නිද්දසවත්ථූනි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි.

ඉමෙහි ඛො සාරිපුත්ත, සත්තහි නිද්දසවත්ථූහි, සමන්නාගතො භික්ඛු ද්වාදස චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනාය. චතුවීසතිං චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනාය. ඡත්තිංසති චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනාය. අට්ඨචත්තාරීසඤ්චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනායාති.

## 7. 1. 4. 12

## [දුතිය නිද්දසවත්ථු සුත්තං]

**43.** එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ**. අථ ඛො ආයස්මා **ආනන්දො** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය කොසම්බියං පිණ්ඩාය පාවිසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: අතිප්පගො ඛො තාව කොසම්බියං පිණ්ඩාය චරිතුං, යන්නූනා’හං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යන්ති.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

තෙන ඛො පන සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: යො හි කොචි ආවුසො, ද්වාදසවස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, ‘නිද්දසො භික්ඛූ’ති අලං වචනායාති.

අථ ඛො ආයස්මා ආනන්දො තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දි, න පටික්කොසි. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කාමි ‘භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමී’ති.

අථ ඛො ආයස්මා ආනන්දො කොසම්බියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

1. ධම්මනිසන්තියා - සිමු

ශාරීපුත්‍රයෙනි, මේ සස්නෙහි මහණ ශික්‍ෂාසමාදානයෙහි තීව්‍රඡන්ද ඇතියේ වෙයි, මත්තෙහි ද ශික්‍ෂාසමාදානයෙහි පහ නො වූ ප්‍රේම ඇතියේ වෙයි. ධර්මෝපධාරණයෙහි (විදර්ශනාවෙහි) දෘඪච්ඡන්ද ඇතියේ වෙයි, මතුයෙහි ද ධර්මෝපධාරණයෙහි පහ නො වූ ප්‍රේම ඇතියේ වෙයි. ඉච්ඡා විනයෙහි තීව්‍රඡන්ද ඇතියේ මත්තෙහි ද ඉච්ඡා විනයෙහි පහ නො වූ ප්‍රේම ඇතියේ වෙයි. පිළිසලෙනෙහි දළඡන්ද ඇතියේ මතුයෙහි ද පිළිසලෙනෙහි පහ නො වූ ප්‍රේම ඇතියේ වෙයි. වීර්‍ය්‍යාරම්භයෙහි තීව්‍රඡන්ද ඇතියේ මතුයෙහි ද වීර්‍ය්‍යාරම්භයෙහි පහ නො වූ ප්‍රේම ඇතියේ වෙයි. ස්මෘති-නිපකභාවයෙහි (ප්‍රඥයෙහි) තීව්‍රඡන්දය ඇතියේ මතුයෙහි ද ස්මෘති - නිපකභාවයෙහි පහ නො වූ ප්‍රේම ඇතියේ වෙයි. දෘෂ්ටි (මාර්ග) ප්‍රතිවේධයෙහි තීව්‍රඡන්ද ඇතියේ මතුයෙහි ද දෘෂ්ටිප්‍රතිවේධයෙහි පහ නො වූ ප්‍රේම ඇතියේ වෙයි.

ශාරීපුත්‍රයෙනි, මෙ සත් නිද්දසවත්ථූහු මා විසින් තමා ම විශිෂ්ට ඥාන-යෙන් දැන සාක්‍ෂාත් කොට ප්‍රවිදිතයහ.

ශාරීපුත්‍රයෙනි, මෙ නිද්දසවත්ථු සතින් සමන්වාගත මහණ දොළොස් වසකුදු පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය රක්නේ නම් 'නිද්දස මහණ'යි කීමට නිසි වෙයි. සුවිසිවසක් නමුදු පිරිපුන් පිරිසිදු බඹසර වෙසේ නම් 'නිද්දස මහණ'යි කීමට නිසි වේ. සතිස්වසකුදු පිරිපුන් පිරිසිදු බඹසර වෙසේ නම් 'නිද්දස මහණ'යි කීමට නිසි වෙයි. අට සාළිස්වසකුදු පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය වෙසේ නම් 'නිද්දසමහණ'යි කීමට සුදුසු වේ යයි.

## 7. 1. 4. 12

## [දෙවැනි නිද්දසවත්ථු සූත්‍රය]

48. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාම යෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ කොසම්බියෙහි පිඬු සඳහා පිවිසියහ. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරුන්හට තෙලෙ සිත් විය: "තව ම කොසඹෑහි පිණ්ඩපාතය සඳහා වදනට අලුයම බොහෝ වෙයි. මම කොසම්බියෙහි අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ අසපුව කරා යෙමි නම් මැනැවැ"යි.

එක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ අසපුව කරා වැඩියහ. වැඩ ඒ අන්‍යතොටු පිරිවැජියන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්හ.

එ සමයෙහි රැස් ව හුන් ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයන් අතුරෙහි මෙ අතුරු කථාව උපන: "ඇවැත්නි, යම් ම කිසිවෙක් දොළොස්වසක් පරිපූර්ණ කොට පිරිසිදු බඹසර වෙසේ නම්, 'හෙ නිද්දස මහණ'යි කීමට නිසි වේ ය"යි.

එක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ එ අන්‍යතොටු පිරිවැජියන්ගේ භාෂිතය නො ම පිළිගත්හ, නො පිළිකෙව් කළහ. නො පිළිගෙන නො පිළිකෙව් කොට 'භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි තෙල භාෂිතයාගේ අර්ථය දනුම්හ'යි හුනස්නෙන් නැඟ නික්මගියහ.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ කොසඹෑයෙහි පිඬු පිණිස හැසිර පස්වරුයෙහි පිණ්ඩපාතයෙන් පෙරළා වැඩියාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පස්හි හුන්හ. එකත් පස්හි හුන් ආයුෂ්මත් ආනන්ද තෙරහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ:

ඉධාහං භන්තෙ, පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය කොසම්බියං පිණ්ඩාය පාවිසිං. තස්ස මය්හං භන්තෙ, එතදහොසි: අතිප්පගො ඛො තාව කොසම්බියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යන්ති.

අථ ඛ්වාහං භන්තෙ, යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං.

තෙන ඛො පන භන්තෙ, සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි:

යො හි කොචි ආවුසො, ද්වාදසවස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනායාති.

අථ ඛ්වාහං භන්තෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිං, න පටික්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිං 'භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමී'ති.

සක්කා නු ඛො භන්තෙ, ඉමස්මිං ධම්මවිනයෙ කෙවලං වස්සගණනමත්තෙන නිද්දසො භික්ඛූති[1] පඤ්ඤාපෙතුන්ති.

න ඛො ආනන්ද සක්කා ඉමස්මිං ධම්මවිනයෙ කෙවලං වස්සගණනමත්තෙන නිද්දසො භික්ඛූති[1] පඤ්ඤාපෙතුන්ති.

සත්ත ඛො ඉමානි ආනන්ද නිද්දසවත්ථූනි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි සත්ත:

ඉධානන්ද, භික්ඛු සද්ධො හොති. හිරිමා හොති. ඔත්තප්පී හොති. බහුස්සුතො හොති. ආරද්ධවිරියො හොති. සතිමා හොති. පඤ්ඤවා හොති.

ඉමානි ඛො ආනන්ද සත්ත නිද්දසවත්ථූනි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි.

ඉමෙහි ඛො ආනන්ද සත්තහි නිද්දසවත්ථූහි සමන්නාගතො භික්ඛු ද්වාදස චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනායාති. චතුවීසතිඤ්චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනාය. ඡත්තිංසති චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනාය. අට්ඨචත්තාරීසඤ්චෙපි වස්සානි පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, නිද්දසො භික්ඛූති අලං වචනායාති.

**දෙවතාවග්ගො චතුත්ථො.**

**තස්සුද්දානං**

අප්පමාදෙ හිරී චෙව ද්වෙ ද්වෙ සුවචා මිත්තා,
ද්වෙ පටිසම්භිදා ද්වෙ වසා ද්වෙ නිද්දසවත්ථුනාති.[2]

---

1. නිද්දසො භික්ඛු - සීමු.
2. අප්පමාදෙ හිරිමා ච දෙවි සුතවා ද්වෙ බලං. ද්වෙ පටිසම්භිදා ච නිද්දසවත්ථු පරෙ ද්වෙති - සීමු

ස්වාමීනි, මම පෙරවරු වේලෙහි හැඳපොරොවා පාසිවුරු ගෙණ මේ කොසඹෑහි පිඬු පිණිස පිවිසියෙමි. ස්වාමීනි, ඒ මට මෙසේ සිත විය: කොසඹෑහි පිඬු සඳහා හැසිරෙණුට තව බොහෝ අලුයම වෙයි. මම අන්‍යතොටු පිරිවැජියන්ගේ අසපුව කරා එළැඹෙම් නම් මැනැවැ'යි.

ස්වාමීනි, ඉක්බිති මම අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ගේ ආරාමය කරා එළැඹියෙමි. එළැඹ ඒ අන්‍යතොටු පිරිවැජියන් හා සමඟ සතුටුවීමි. සතුටු වියයුතු සිහිකටයුතු කථා කොට තමවා එකත්පස්හි හිඳිමි.

ස්වාමීනි, එසමයෙහි රැස් ව හුන් ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයන් අතුරෙහි මේ අතුරු කථාව පහළ විය:

ඇවැත්නි, යම් ම කිසිවෙක් දොළොස්වසක් පිරිපුන් පිරිසිදු බඹසර වෙසේ නම්, 'නිද්දස මහණෙකැ'යි කියනට නිස්සේ යයි.

ස්වාමීනි, ඉක්බිති මම ඒ අන්‍යතොටු පිරිවැජියන්ගේ භාෂිතය නො පිළිගත්මි, නො බැහැර කෙළෙමි. නො පිළිගෙණ නො බැහැර කොට "භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මෙහි භාෂිතයාගේ අරුත් දැනගණිමැ"යි හුනස්නෙන් නැඟ නික්මගියෙමියි.

ස්වාමීනි, මේ ධර්මවිනයෙහි හුදෙක් වර්ෂගණනාමාත්‍රයෙන් 'නිද්දස මහණෙකැ'යි පැණවිය හැකි දැ? යි.

ආනන්දයෙනි, මේ ධර්මවිනයෙහි හුදෙක් වස්ගිණුම් මතුයෙකින් 'නිද්දස මහණෙකැ'යි පැණැවිය නො හැකැයි.

ආනන්දයෙනි, මා විසින් ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පවසනලද මේ නිද්දසවත්හු සතෙක. කවර සතෙක යත්:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ සැදැහැතියේ වෙයි. හිරි ඇතියේ වෙයි. ඔතප් ඇතියේ වෙයි. බොහෝ අසුපිරූ තැන් ඇතියේ වෙයි. රුකුළුවැර ඇතියේ වෙයි. සමෘති ඇතියේ වෙයි. විවසුත් පැණ ඇතියේ වෙයි.

ආනන්දයෙනි, මේ නිද්දසවත්හු සත්දෙන මා විසින් ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට පවසනලදහ

ආනන්දයෙනි, මෙ නිද්දසවත්හු සතින් සමන්වාගත මහණ දොළොස්වසක් මේවයි පිරිපුන් පිරිසිදු මහබඹසර වෙසේ නම, 'නිද්දස මහණ'යි කීමට නිසියේ වෙයි. සුවිසිවසක් මේවයි පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය රක්නේ නම්, 'නිද්දස මහණ'යි කීමට සුදුසු වෙයි. සතිස්වසක් මේවයි පිරිපුන් පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යය රක්නේ නම්, 'නිද්දස මහණ'යි කීමට සුදුසු වෙයි අටසාලිස්වසක් මේවයි පිරිපුන් පිරිසිදු මහබඹසර රක්නේ නම්, 'නිද්දස මහණ'යි කීමට සුදුසු වේ යයි.

**දේවතා වර්ගය සතරවැනි යි.**

**එහි උද්දානය:**

අප්පමාද සූත්‍රය, හිරි සූත්‍රය, සොවචස්සතා සූත්‍ර දෙක ය, මිත්ත සූත්‍ර දෙක ය, පටිසම්භිදා සූත්‍ර දෙක ය, විසාවචස සූත්‍ර දෙක ය, නිද්දස සූත්‍ර දෙක යයි සූත්‍ර දොළොසෙකි.

# 5. මහායඤ්ඤ වග්ගො

## 7. 1. 5. 1

## [විඤ්ඤාණට්ඨිති සුත්තං]

[සාවත්ථිනිදානං]

**44.** සත්තිමා භික්ඛවෙ විඤ්ඤාණට්ඨිතියො. කතමා සත්ත:

1. සන්ති භික්ඛවෙ, සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො: සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං පඨමා විඤ්ඤාණට්ඨිති.

2. සන්ති භික්ඛවෙ, සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො: සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා. අයං දුතියා විඤ්ඤාණට්ඨිති.

3. සන්ති භික්ඛවෙ, සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො: සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියා විඤ්ඤාණට්ඨිති.

4. සන්ති භික්ඛවෙ, සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො: සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. අයං චතුත්ථා විඤ්ඤාණට්ඨිති.

5. සන්ති භික්ඛවෙ, සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනූපගා. අයං පඤ්චමා විඤ්ඤාණට්ඨිති.

6. සන්ති භික්ඛවෙ, සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගා. අයං ඡට්ඨා විඤ්ඤාණට්ඨිති.

7. සන්ති භික්ඛවෙ, සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගා. අයං සත්තමා විඤ්ඤාණට්ඨිති.

ඉමා ඛො භික්ඛවෙ, සත්ත විඤ්ඤාණට්ඨිතියොති.

## 7. 1. 5. 2

## [සමාධිපරික්ඛාර සුත්තං]

[සාවත්ථිනිදානං]

**45.** සත්තිමෙ භික්ඛවෙ, සමාධිපරික්ඛාරා. කතමෙ සත්ත:

සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති.

යා ඛො භික්ඛවෙ, ඉමෙහි සත්තහඞ්ගෙහි චිත්තස්සෙකග්ගතා පරික්ඛතා, අයං වුච්චති භික්ඛවෙ අරියො සම්මාසමාධි "සඋපනිසො" ඉතිපි "සපරික්ඛාරො" ඉතිපී'ති.

# 5. මහායඤ්ඤ වර්ගය

## 7. 1. 5. 1

## [විඤ්ඤාණට්ඨිති සූත්‍රය]

[සැවැත් නිදාන යි]

**44.** මහණෙනි, මේ (ප්‍රතිසන්ධි) විඥානස්ථිතිහු (විඥාන පවත්නා තැන්) සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

1. මහණෙනි, නානාත්වකාය නානාත්වසංඥ ඇති සත්ත්වයෝ ඇත. ඔහු නම් මනුෂ්‍යයෝ ද, ඇතැම් දෙවියෝ ද, ඇතැම් වෛමානික ප්‍රේතයෝ ද වෙත්. මේ ප්‍රථම විඥානස්ථිති ය යි.

2. මහණෙනි, නානාත්වකාය හා එකත්වසංඥ ඇති සත්ත්වයෝ ඇත. ඔහු නම් ප්‍රථමධ්‍යානයෙන් උපන් බ්‍රහ්මකායික දෙවියෝ ය. මේ ද්විතීය විඥානස්ථිති යි.

3. මහණෙනි, ඒකත්වකාය හා නානාත්වසංඥ ඇති සත්ත්වයෝ ඇත. ඔහු නම් ආභාස්වර දෙවියන් බන්දග. මේ තෘතීය විඥානස්ථිති ය යි.

4. මහණෙනි, ඒකත්වකාය හා ඒකත්වසංඥ ඇති සත්ත්වයෝ ඇත. සුභකිණ්ණ බඳු දෙවියෝ ය. මේ චතුර්ථ විඥානස්ථිති ය යි.

5. මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමයෙන් (රූපභය ඉක්මවූ) ප්‍රතිඝ (ගැටීම්) සංඥාවන්ගේ අස්තගමයෙන් (අස්තයට යැමෙන්) නානාත්වසංඥාවන්ගේ (රූපධ්‍යානාරම්මණ) අමනසිකාරයෙන් 'කසිණුග්ඝාටිතාකාශය කිසුණු ඉගුලූ අහස) 'අනන්තය'යි) ආකාසානඤ්චායතනූපග සත්ත්වයෝ ඇත. මේ පඤ්චම විඥානස්ථිති ය යි.

6. මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය සමතික්‍රම කොට 'විඥානය අනන්තය'යි විඤ්ඤාණඤ්චායතනූපග (දෙවන අරූපතලෙහි උපන්) සත්ත්වයෝ ඇත. මේ ෂෂ්ඨ විඥානස්ථිති ය යි.

7. මහණෙනි, හැම පරිද්දෙන් විඤ්ඤාණඤ්චායතනය සමතික්‍රම කොට 'නත්ථි කිඤ්චි'යි ආකිඤ්චඤ්ඤායතනූපග (තෙවන අරූපතලෙහි උපන්) සත්ත්වයෝ ඇත. මේ සප්තම විඥානස්ථිති ය යි.

මහණෙනි, මොහු සප්තවිඥානස්ථිතිහු යි.

## 7. 1. 5. 2

## [සමාධිපරික්ඛාර සූත්‍රය]

[සැවැත් නිදාන යි]

**45.** මහණෙනි, සමාධිපරිෂ්කාරයෝ (මාර්ගසමාධියට සම්භාරයෝ) සතෙකි. කවර සතෙක යත්:

සම්මාදිට්ඨි ය, සම්මාසංකප්ප ය, සම්මාවාචා ය, සම්මාකම්මන්ත ය, සම්මාආජීව ය, සම්මාවායාම ය, සම්මාසති යි.

මහණෙනි, මේ සත් කරුණින් පරිෂ්කෘත (පෝෂිත) වූ චිත්තයාගේ යම් බඳු ඒකාග්‍රතායෙක් වේ නම්, මහණෙනි, මේ ආර්‍ය සම්‍යක්සමාධිය 'සඋපනිස' ය යි ද 'සපරික්ඛාර' ය යි ද කියනු ලැබේ යි.

7. 1. 5. 3

[පඨම අග්ගි සුත්තං]

[සාවත්ථිනිදානං]

46. සත්තිමෙ භික්ඛවෙ, අග්ගී. කතමෙ සත්ත:

රාගග්ගි, දොසග්ගි, මොහග්ගි, ආහුණෙය්‍යග්ගි, ගහපතග්ගි, දක්ඛිණෙය්‍යග්ගි, කට්ඨග්ගි. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත අග්ගී'ති.

7. 1. 5. 4

[මහායඤ්ඤ සුත්තං]

47. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.* තෙන ඛො පන සමයෙන උග්ගතසරීරස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤො උපක්ඛටො[1] හොති. පඤ්ච උසභසතානි ථූණූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය. පඤ්ච වච්ඡතරසතානි ථූණූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය. පඤ්ච වච්ඡතරිසතානි ථූණූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය. පඤ්ච අජසතානි ථූණූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය. පඤ්ච උරබ්භසතානි ථූණූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය.

අථ ඛො උග්ගතසරීරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උග්ගතසරීරො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

සුතං මෙතං භො ගොතම, අග්ගිස්ස ආදානං[2] යූපස්ස උස්සාපනං මහප්ඵලං හොති මහානිසංසන්ති.

මයාපි ඛො එතං බ්‍රාහ්මණ, සුතං අග්ගිස්ස ආදානං යූපස්ස උස්සාපනං මහප්ඵලං හොති මහානිසංසන්ති.

දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො උග්ගතසරීරො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "සුතං මෙතං භො ගොතම, අග්ගිස්ස ආදානං යූපස්ස උස්සාපනං මහප්ඵලං හොති මහානිසංසන්ති. මයාපි ඛො එතං බ්‍රාහ්මණ, සුතං අග්ගිස්ස ආදානං යූපස්ස උස්සාපනං මහප්ඵලං හොති මහානිසංසන්ති", තයිදං භො ගොතම, සමෙති භොතො චෙව ගොතමස්ස අම්හාකඤ්ච යදිදං සබ්බෙන සබ්බන්ති.

---

* අයං පාඨො මරම්ම පොත්ථකෙ න දිස්සතෙ.

1 උපක්ඛතො - මජසං - උපක්ඛටො - අට්ඨකථා

2 ආධානං - සයා.

## 7. 1. 5. 3

## [අග්ගි සූත්‍රය]

[සැවැත්නිදාන යි]

46. මහණෙනි, මේ අග්නි සතෙකි. කවර සතෙක යත්:

රාගාග්නි ය, ද්වේෂාග්නි ය, මෝහාග්නි ය, ආහුනෙය්‍යාග්නි (මවුපියාදී පුදුස්සන්ට සත්කාර නොකිරීමෙන් නිරයාදියෙහි වන දුක්දහ) ය, ගෘහපත්‍යග්නි (ගෙහිමි නොහැකීමෙන් ගෙඅඹුවට වන දුක්දහ) ය, දක්ෂිණාග්නි (දක්ෂිණාහී භික්ෂු සඞ්ඝයාට නීචපරිභව කිරීමෙන් වන දුක්දහ) ය, කාෂ්ඨාග්නිය (දරගිනි) යි. මහණෙනි, මේ (දහනාර්ථ ඇති) අග්නි සත යි.

## 7. 1. 5. 4

## [මහායඤ්ඤ සූත්‍රය]

47. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර ජේතවන** යෙහි අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වාසය කරණසේක. එ සමයෙහි **උග්ගතසරීර** බ්‍රාහ්මණයාගේ මහායඥය (යාගයක්) එළැඹියේ ය. යඥය සඳහා පන්සියක් වෘෂභයෝ යඥයූපය (යාගස්තම්භය) වෙත එළවනලද වෙත්. යඥය සඳහා පන්සියක් වත්සතරයෝ (වස්සෝ) යඥයූපය වෙත එළවනලද වෙත්. යඥය සඳහා පන්සියක් වත්සතරීහු (වැස්සියෝ) යඥයූපය කරා එළවනලද වෙත්. යඥය සඳහා පන්සියක් එළුවෝ යඥයූපය කරා එළවනලද වෙත්. යඥය සඳහා පන්සියක් තිරෙළුවෝ යඥයූපය කරා එළවනලද වෙත්.

එකල්හි උග්ගතසරීර බ්‍රාහ්මණ භාග්‍යවතුන් කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස්හි හිඳ. එකත්පසෙක හුන් උග්ගතසරීර බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකෙළේ ය:

"භවද් ගෞතමයන් වහන්ස, (යඥ සඳහා) මඞ්ගලාග්නිය ගැණුම (මගුල් ගිනි දල්වීම) ද යාගස්තම්භය නැංවීම ද මහත්ඵල වෙයි, මහඅනුසස් ඇති වෙයි යන මෙල කරුණ මා විසින් අසනලදී"යි.

බ්‍රාහ්මණය, මා විසිනුදු "යාගාග්නිය ගැණුම ද යාගස්තම්භය නැංවීම ද මහත්ඵල ඇතියේ ය, මහඅනුසස් ඇතියේ ය" යන මෙල කරුණ අසන ලදුයි වදාළහ.

දෙවන වට දු ... තෙවන වට දු උග්ගතසරීර බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකෙළේ ය: "භවද් ගෞතමයන් වහන්ස, යාගාග්නිය ගැණුම යඥස්තම්භය නැංවීම මහත්ඵල මහානිසංස වේ" යි මෙල කරුණ මා විසින් අසනලදී යි. "බ්‍රාහ්මණය, යාගාග්නිය ගැණුම යඥයූපය නැංවීම මහත්ඵල මහානිසංස වේ" යි. මෙල කරුණ මා විසින් ද අසන ලදී යි වදාළහ. භවත් ගෞතමයන් වහන්ස, භවත් ගෞතමයන් වහන්සේගේ යම් මේ ශ්‍රැතයෙක් වේ ද අපගේ යම් මේ ශ්‍රැතයෙක් වේ ද මෙ හැම ගැමලෙසින් සම වේ යයි.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො උග්ගතසරීරං බ්‍රාහ්මණං එතදවොච: න ඛො බ්‍රාහ්මණ, තථාගතා එවං පුච්ඡිතබ්බා: සුතමෙතං භො ගොතම, අග්ගිස්ස ආදානං යූපස්ස උස්සාපනං මහප්ඵලං හොති මහානිසංසන්ති.

එවඤ්ච ඛො බ්‍රාහ්මණ, තථාගතා පුච්ඡිතබ්බා: අහං හි භන්තෙ, අග්ගිං ආදාතුකාමො, යූපං උස්සාපෙතුකාමො. ඔවදතු මං භන්තෙ භගවා, අනුසාසතු මං භන්තෙ භගවා, යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

අථ ඛො උග්ගතසරීරො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අහං හි භො ගොතම, අග්ගිං ආදාතුකාමො, යූපං උස්සාපෙතුකාමො. ඔවදතු මං භවං ගොතමො, අනුසාසතු මං භවං ගොතමො, යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

අග්ගිං බ්‍රාහ්මණ, ආදෙන්තො[1] යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා තීණි සත්ථානි උස්සාපෙති අකුසලානි දුක්ඛුද්‍රයානි[2] දුක්ඛවිපාකානි. කතමානි තීණි:

කායසත්ථං, වචීසත්ථං, මනොසත්ථං.

අග්ගිං බ්‍රාහ්මණ, ආදෙන්තො යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා එවං චිත්තං උප්පාදෙති: එත්තකා උසභා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරියො හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා අජා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා උරබ්භා හඤ්ඤන්තු යඤ්ඤත්ථායාති. සො පුඤ්ඤං කරොමීති අපුඤ්ඤං කරොති. කුසලං කරොමීති අකුසලං කරොති. සුගතිමග්ගං[3] පරියෙසාමීති දුග්ගතිමග්ගං[4] පරියෙසති. අග්ගිං බ්‍රාහ්මණ, ආදෙන්තො යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා ඉදං පඨමං මනොසත්ථං උස්සාපෙති අකුසලං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකං.

පුන ච පරං බ්‍රාහ්මණ, අග්ගිං ආදෙන්තො යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා එවං වාචං භාසති: එත්තකා උසභා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරියො හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා අජා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා උරබ්භා හඤ්ඤන්තු යඤ්ඤත්ථායාති. සො පුඤ්ඤං කරොමීති අපුඤ්ඤං කරොති. කුසලං කරොමීති අකුසලං කරොති. සුගතිමග්ගං[3] පරියෙසාමීති දුග්ගතිමග්ගං[4] පරියෙසති. අග්ගිං බ්‍රාහ්මණ, ආදෙන්තො යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා ඉදං දුතියං වචීසත්ථං උස්සාපෙති අකුසලං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකං.

පුන ච පරං බ්‍රාහ්මණ, අග්ගිං ආදෙන්තො යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා සයං පඨමං සමාරම්භති[5] උසභෙ හන්තුං[6] යඤ්ඤත්ථාය. සයං පඨමං සමාරම්භති වච්ඡතරෙ හන්තුං යඤ්ඤත්ථාය. සයං පඨමං සමාරම්භති වච්ඡතරී හන්තුං යඤ්ඤත්ථාය. සයං පඨමං සමාරම්භති අජෙ හන්තුං යඤ්ඤත්ථාය. සයං පඨමං සමාරම්භති උරබ්භෙ හන්තුං යඤ්ඤත්ථායාති.

---

1 ආධෙන්තො - සයා. 2 දුක්ඛුද්දයානි - සීමු 3 සුගතියා මග්ගං - මජ්සං
4 දුග්ගතියා මග්ගං - මජ්සං 5 සමාරභති - සයා, සමාරම්භති - සීමු
6 හඤ්ඤන්තු - සීමු

මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ උග්ගතශරීර බමුණුහට තෙල කීහ: බ්‍රාහ්මණය, ''භවත් ගෞතමයන් වහන්ස, යඥගිනිය ගැණුම ද යඥයූප නැංවීම ද මහත්ඵල වේ, මහානිසංස වේ යන තෙල මා විසින් අසනලද්දී''යි මෙසෙයින් තථාගතයන් වහන්සේ පිළිවිසිය යුතු නො වෙති.

බ්‍රාහ්මණය, තථාගතයන් වහන්සේ මෙසේ පිළිවිසිය යුතු වෙති: ''වහන්ස, මම යඥ පිණිස ගිනි දල්වනු කැමැතියෙමි, යඥස්තම්භ නංවනු කැමැතියෙමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට ඔවදන් කරණ සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට අනුශාසනා කරණ සේක්වා. යම් හෙයෙකින් එ මට දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වේ නම්, එසෙයිනැ''යි.

එකල්හි උග්ගතශරීරබ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල-කෙළේ ය: ''භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි යඥගිනිය දල්වනු කැමැතියෙමි, යඥස්තම්භ ඔසවනු කැමතියෙමි. භවත් ගෞතමයන් වහන්සේ මට යමක් දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වන්නේ නම් එපරිදි මට අවවාද කරණසේක්වා, භවත් ගෞතමයන් වහන්සේ මට අනුශාසනා කරණ සේක්වා''යි.

බ්‍රාහ්මණය, යඥ සඳහා අග්නිය දල්වනුයේ යඥ සඳහා ටැම් ඔසවනුයේ යඥයට පලමු ම අකුසල් වූ දුක් උපදවන්නා වූ දුක්විපාක ඇති ශස්ත්‍ර තුණක් ඔසවන්නේ ය. කවර තුණෙක යත්:

කායශස්ත්‍රය, වාක්ශස්ත්‍රය, මනඃශස්ත්‍රය යි.

බ්‍රාහ්මණය, යඥයට අග්නිය දල්වනුයේ යඥයට යූප ඔසවනුයේ යඥයට පලමු ම ''යඥ පිණිස මෙතෙක් වෘෂභයෝ නසනු ලබත්වා, යඥ පිණිස මෙතෙක් වත්සතරයෝ නසනු ලබත්වා, යඥ පිණිස මෙතක් වත්සතරීහු නසනු ලබත්වා, යඥ පිණිස මෙතෙක් එළුවෝ නසනු ලබත්වා, යඥ පිණිස මෙතෙක් තිරෙළුවෝ නසනු ලබත්වා''යි මෙසේ සිත උපදවන්නේ ය. හෙ 'පුණ්‍ය කරමැ'යි අපුණ්‍ය කරයි. 'කුශල් කරමැ'යි අකුශල් කරයි. 'සුගති මාර්ග සොයමි'යි දුර්ගති මාර්ග සොයයි. බ්‍රාහ්මණය, යඥයට අගනි දල්වන්නේ යඥයට ටැම් ඔසවන්නේ යඥයෙන් පූර්වයෙහි ම මෙ අකුශල වූ දුක් උපදවන දුඃඛවිපාක ඇති ප්‍රථම මනඃශස්ත්‍රය ඔසවන්නේ ය.

තවද බ්‍රාහ්මණය, යඥයට අගනි දල්වනුයේ යඥයට ටැම් ඔසවනුයේ යඥයට පූර්වයෙහි ම මෙබඳු බස් කියන්නේ ය: ''යඥයට මෙතෙක් වෘෂභයෝ නසනු ලබත්වා, යඥයට මෙතෙක් වත්සතරයෝ නසනු ලබත්වා, යඥයට මෙතෙක් වත්සතරීහු නසනු ලබත්වා. යඥයට මෙතෙක් එළුවෝ නසනු ලබත්වා, යඥයට මෙතෙක් තිරෙළුවෝ නසනු ලබත්වා''යි. හෙ 'පුණ්‍ය කරමි'යි අපුණ්‍ය කරයි. 'කුසල් කරමි'යි අකුසල් කරයි. 'සුගතිමග සොයමි'යි දුගතිමග ම සොයයි. බ්‍රහ්මණය, යාගය සඳහා අගනි දල්වනුයේ යාගය සඳහා ටැම් ඔසවනුයේ යඥයෙන් පූර්වයෙහි ම අකුසල් වූ දුක් උපදවන දුක් විපාක ඇති මෙ දෙවන වාක්ශස්ත්‍රය ඔසවන්නේ ය.

තවද බමුණ, යාග පිණිස ගිනි එලවනුයේ යාගස්තම්භ නඟනුයේ යාගයට පෙර ම තෙමේ පලමු කොට යාග පිණිස වෘෂභයන් නසන්නට අරඹයි. තෙමේ පලමු කොට යාග පිණිස වත්සන් නසන්නට අරඹයි. තෙමේ පලමු කොට යාග පිණිස වැස්සන් නසන්නට අරඹයි. තෙමේ පලමු කොට යාග පිණිස එළුවන් නසන්නට අරඹයි. තෙමේ පලමු කොට යාග පිණිස තිරෙළුවන් නසන්නට අරඹා යයි.

සො පුඤ්ඤං කරොමීති අපුඤ්ඤං කරොති. කුසලං කරොමීති අකුසලං කරොති. සුගතිමග්ගං පරියෙසාමීති දුග්ගතිමග්ගං පරියෙසති. අග්ගිං බ්‍රාහ්මණ, ආදෙන්තො යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා ඉදං තතියං කායසත්ථං උස්සාපෙති අකුසලං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකං.

අග්ගිං බ්‍රාහ්මණ, ආදෙන්තො යූපං උස්සාපෙන්තො පුබ්බෙව යඤ්ඤා ඉමානි තීණි සත්ථානි උස්සාපෙති අකුසලානි දුක්ඛුද්‍රයානි දුක්ඛවිපාකානි.

තයො මෙ බ්‍රාහ්මණ, අග්ගී පහාතබ්බා පරිවජ්ජෙතබ්බා න සෙවිතබ්බා. කතමෙ තයො.

රාගග්ගි, දොසග්ගි, මොහග්ගි.

කස්මා චායං බ්‍රාහ්මණ, රාගග්ගි පහාතබ්බො පරිවජ්ජෙතබ්බො න සෙවිතබ්බො?

රත්තො ඛො බ්‍රාහ්මණ, රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. තස්මායං රාගග්ගි පහාතබ්බො පරිවජ්ජෙතබ්බො න සෙවිතබ්බො.

කස්මා චායං බ්‍රාහ්මණ, දොසග්ගි -පෙ- මොහග්ගි පහාතබ්බො පරිවජ්ජෙ-තබ්බො න සෙවිතබ්බො? මූළ්හො ඛො බ්‍රාහ්මණ, මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. තස්මායං මොහග්ගි පහාතබ්බො පරිවජ්ජෙ-තබ්බො න සෙවිතබ්බො.

ඉමෙ ඛො බ්‍රාහ්මණ, තයො අග්ගී පහාතබ්බා, පරිවජ්ජෙතබ්බා න සෙවිතබ්බා.

තයො ඛො බ්‍රාහ්මණ, අග්ගී සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා සම්මා සුඛං පරිහාතබ්බා. කතමෙ තයො:

ආහුනෙය්‍යග්ගි, ගහපතග්ගි, දක්ඛිණෙය්‍යග්ගි.

කතමො ච බ්‍රාහ්මණ ආහුනෙය්‍යග්ගි? ඉධ බ්‍රාහ්මණ, යස්ස තෙ හොන්ති මාතාති වා පිතාති වා, අයං වුච්චති බ්‍රාහ්මණ ආහුනෙය්‍යග්ගි. තං කිස්ස හෙතු: අතොහයං[1] බ්‍රාහ්මණ, ආහුතො සම්භූතො. තස්මායං ආහුනෙය්‍යග්ගි සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා සම්මා සුඛං පරිහාතබ්බො.

කතමො ච බ්‍රාහ්මණ, ගහපතග්ගි. ඉධ බ්‍රාහ්මණ, යස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා. අයං වුච්චති බ්‍රාහ්මණ, ගහපතග්ගි. තස්මායං ගහපතග්ගි සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා සම්මා සුඛං පරිහාතබ්බො.

---

1 අතොයං - සීමු·

යේ 'පුණ්‍ය කරමැ'යි අපුණ්‍ය කරයි. 'කුසල් කරමි'යි අකුසල් කරයි. 'සුගති මාර්ගය සොයමි'යි දුගතිමාර්ගය සොයයි. බමුණ, යඥයට ගිනි එළ-වන්නේ ඒ මේ ඔහු ඔසොවන්නේ යඥයට පූර්වයෙහි ම අකුශල වූ දුක් උපදවන දුඃඛ විපාක ඇති මෙ තෙවන කායශස්ත්‍රය ඔසොවයි.

බ්‍රාහමණය, යඥයට අගනිය එළවන්නේ, තමහ ඔසොවනුයේ යඥයට පූර්වයෙහි ම අකුසල වූ දුක් උපදවන්නා වූ දුඃඛ විපාක ඇති මෙ තුන් ශස්ත්‍ර ඔසොවයි.

බ්‍රාහමණය, මෙ තුන්ගිනි හල යුතු ය, දුරලියයුතු ය, නො සෙවිය යුතු ය. කවර තුනෙක යත්:

රාගාගනිය, ද්වෙෂාගනිය, මොහාගනිය යි.

බ්‍රාහමණය, කවර හෙයින් රාගාගනිය හලයුතු ය, දුරලියයුතු ය, නො සෙවිය යුතු ය යත්:

බ්‍රාහමණය, රාගයෙන් රක්ත වූයේ මැඩුනේ රාගයෙන් වටා ගත්නාලද සිත් ඇතියේ කයින් දුශචරිත කරයි. වචනයෙන් දුශචරිත කරයි. මනසින් දුශචරිත කරයි. හෙ කයින් දුශචරිත කොට වචනයෙන් දුශචරිත කොට මනසින් දුශචරිත කොට කාබුන් මරණින් මතු අපාය නම් වූ නුපුරු ගති ඇති, විවශ ව පතිත වන නිරයට පැමිණෙයි. එ හෙයින් මෙ රාගාගනිය හල යුතු, දුරලිය යුතු, නො සෙවිය යුතු.

බ්‍රාහමණය, කවර හෙයින් ද්වෙෂාගනිය ... මෝහාගනිය හල යුතු ය. දුරලියයුතු ය, නො සෙවිය යුතු ය යත්: බ්‍රාහමණය, මොහයෙන් මූළා වූයේ අභිභූත වූයේ වටා ගණු ලැබූ සිත් ඇතියේ කයින් දුශචරිත කරයි. වචන-යෙන් දුශචරිත කරයි. මනසින් දුශචරිත කරයි. හෙ කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට, මනසින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙයි. එහෙයින් මෙ මොහාගනිය හල යුතු ය, දුරලිය යුතු ය, නොසෙවිය යුතු ය.

බ්‍රාහමණය, මෙ තුන් ගිනි පැහිය යුතු, දුරලිය යුතු, නො සෙවිය යුතු යි.

බ්‍රාහමණය, මෙ තුන් ගිනි සත්කාර කොට ගුරු කොට, බුහුමන් කොට පූජා කොට මැනැවින් සුවසේ පරිහරණය කට යුතු ය. කවර තුනෙක යත්:

ආහුනෙය්‍යාගනි ය, ගහපතාගනි ය, දක්ඛිණෙය්‍යාගනි යි.

බ්‍රාහමණය, ආහුනෙය්‍යාගනි කවරේ ය යත්: බ්‍රාහමණය, මෙ ලොව්හි යමකුට මව යි හෝ පියා යි හෝ යම් එ කෙනෙක් වෙත් නම්, බ්‍රාහමණය, මෙ ආහුනෙය්‍යාගනි ය යි කියනු ලැබේ. ඒ කවර හෙයින යත්: බ්‍රාහමණය, මෙ පුග්ගල මෙ දෙමාපියන් ගෙන් ආයේ ය, උපන්නේ ය. එහෙයින් මෙ ආහුනෙය්‍යාගනිය සත්කාර කොට, ගුරු කොට, බුහුමන් කොට, පූජා කොට මැනැවින් සුවසේ පරිහරණය කට යුතු යි.

බ්‍රාහමණය, ගෘහපති අගනිය කවරේ ය යත්: බ්‍රාහමණය, මෙ ලොව්හි යම් පුහුලකුගේ 'පුත්‍රයහ'යි හෝ 'අඹුහ'යි හෝ 'දාසයහ'යි හෝ 'ප්‍රෙෂ්‍යයහ'යි හෝ 'කර්මකරයහ'යි හෝ එබඳු යම් කෙනෙක් වෙත් නම්, බ්‍රාහමණය, මෙ ගෘහපති අගනි යි කියනු ලැබේ. එහෙයින් මෙ ගෘහපතිඅගනිය සත්කාර කොට ගුරු කොට, බුහුමන් කොට පුද මැනැවින් සුවයෙන් පරිහරණ කටයුත්තේ ය.

කතමො ච බ්‍රාහ්මණ, දක්ඛිණෙය්‍යග්ගි: ඉධ බ්‍රාහ්මණ, යෙ තෙ සමණ-බ්‍රාහ්මණා මදප්පමාදා[2] පටිවිරතා ඛන්තිසොරච්චෙ නිවිට්ඨා එකමත්තානං දමෙන්ති, එකමත්තානං සමෙන්ති, එකමත්තානං පරිනිබ්බාපෙන්ති. අයං වුච්චති බ්‍රාහ්මණ දක්ඛිණෙය්‍යග්ගි. තස්මායං දක්ඛිණෙය්‍යග්ගි සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා සම්මා සුඛං පරිහාතබ්බො.

ඉමෙ ඛො බ්‍රාහ්මණ, තයො අග්ගී සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා සම්මා සුඛං පරිහාතබ්බා.

අයං ඛො පන බ්‍රාහ්මණ, කට්ඨග්ගි කාලෙන කාලං උජ්ජලෙතබ්බො, කාලෙන කාලං අජ්ඣුපෙක්ඛිතබ්බො, කාලෙන කාලං නිබ්බාපෙතබ්බො, කාලෙන කාලං නික්ඛිපිතබ්බොති.

එවං වුත්තෙ උග්ගතසරීරො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, උපාසකං මං භවං ගොතමො ධාරෙතු, අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං.

එසාහං භො ගොතම, පඤ්ච උසභසතානි මුඤ්චාමි ජීවිතං විතරොමි,[1] පඤ්ච වච්ඡතරසතානි මුඤ්චාමි ජීවිතං විතරොමි, පඤ්ච වච්ඡතරීසතානි මුඤ්චාමි ජීවිතං විතරොමි, පඤ්ච අජසතානි මුඤ්චාමි ජීවිතං විතරොමි, පඤ්ච උරබ්භසතානි මුඤ්චාමි ජීවිතං විතරොමි, හරිතානි චෙව තිණානි ඛාදන්තු, සීතානි ච පානීයානි පිවන්තු, සීතො ච නෙසං වාතො වායතූති.[2]

## 7. 1. 5. 5.

## [සඞ්ඛිත්තසත්තසඤ්ඤා සුත්තං]

[සාවත්ථිනිදානං]

48. සත්තිමා භික්ඛවෙ, සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. කතමා සත්ත:

අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටික්කූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා.

ඉමා ඛො භික්ඛවෙ, සත්තසඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා'ති.

## 7. 1. 5. 6.

## [විත්ථතසත්තසඤ්ඤා සුත්තං]

[සාවත්ථිනිදානං]

49. සත්තිමා භික්ඛවෙ, සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. කතමා සත්ත:

අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටික්කූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා.

---

1. ජීවිතං දෙමි - මජසං, 2. සීතො ච නෙසං වාතො උපවායතං - මජසං

බ්‍රාහ්මණය, දක්ෂිණාග්නි කවරේ ද යත්: බ්‍රාහ්මණය, මේ ලොව්හි මදපමා දෙකින් ප්‍රතිවිරත වූ ක්ෂාන්තියෙහි හා සුරතභාවයෙහි වැදගත් යම් කෙනෙක් ඒකමාත්‍රවිත්තය දමනය කෙරෙත් ද, ඒකමාත්‍රවිත්තය ශමනය කරත් ද, ඒකමාත්‍රවිත්තය පිරිනිවත් ද, බ්‍රාහ්මණය, මේ දක්ෂිණාග්නි යි කියනු ලැබේ. එහෙයින් මේ දක්ෂිණාග්නිය සත්කාර කොට ගුරුකාර කොට බුහුමන් කොට පුද කොට මනාසුඛයෙන් පරිහරණ කටයුත්තේ ය.

බ්‍රාහ්මණය, මේ අග්නි තුන සත්කාර කොට, ගුරු කොට, බුහුමන් කොට පුද කොට මනාලෙස සුවසේ පරිහරණය කටයුතු ය.

බ්‍රාහ්මණය, මේ කාෂ්ඨාග්නිය කලින් කල දල්විය යුතු ය. කලින් කල අධ්‍යුපෙක්ෂා කටයුතු ය. කලින් කල නිවාපණ කට යුතු ය. කලින් කල නික්ෂෙප කටයුතු ය යි.

මෙසේ වදාළ කල්හි උග්ගතශරීරබ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට කෙල කී ය: භවද් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත වෙයි, භවද් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත වෙයි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිම් කොට සරණගිය උවසුවකු කොට මා ධරණ සේක්වා යි.

භවත් ගෞතමයන් වහන්ස, මම ඒ තෙල පන්සියක් වෘෂභයන් මුදමි, ජීවිතය දෙමි. පන්සියක් වත්සතරයන් මුදමි, දිවි දෙමි. පන්සියක් වත්ස-තරින් මුදමි, දිවි දෙමි. පන්සියක් එළුවන් මුදමි, දිවි දෙමි. පන්සියක් තිරෙළුවන් මුදමි, දිවිදෙමි. ඔහු නිල් තණ ද කත්වා, සිහිල් පැන් ද බොත්වා, ඔවුනට සිහිල් වාතය ද හමාවා යි.

7. 1. 5. 5.

(සඞ්ඛිත්තසත්තසඤ්ඤා සූත්‍රය]

[සැවැත්නිදාන යි]

48. මහණෙනි, මේ සත් සංඥාවෝ භාවිත වූවාහු බහුලීකෘත වූවාහු මහත්ඵල ඇත්තාහු මහානිශංස ඇත්තාහු වෙති. නිවණට බැසගත්තාහු නිවණ පර්‍යවසාන කොට ඇතියාහු වෙත්. කවර සත් දෙනෙක යත්:

අසුභසඤ්ඤා ය, මරණසඤ්ඤා ය, ආහාරයෙහි පටිකූලසඤ්ඤා ය, සර්වලොකයෙහි අනභිරතසඤ්ඤා ය, අනිච්චසඤ්ඤා ය, අනිත්‍යයෙහි දුක්ඛ සඤ්ඤා ය, දුක්ඛයෙහි අනත්තසඤ්ඤා යි.

මහණෙනි, භාවිත බහුලීකෘත මේ සත් සංඥාවෝ මහත්ඵල ඇත්තාහු මහානිශංස ඇත්තාහු අමෘතාවගධ අමෘතපර්‍යවසාන වෙත් යි.

7. 1. 5. 6.

[විත්ථතසත්තසඤ්ඤා සූත්‍රය]

49. මහණෙනි, මේ සත් සංඥාවෝ භාවිත බහුලීකෘත වූවාහු මහත්ඵල මහානිශංස ඇත්තාහු අමෘතාවගාහ වූවාහු අමෘතය පර්‍යවසාන කොට ඇතියාහු වෙත්. කවර සත් දෙනෙක යත්:

අසුභසඤ්ඤා ය, මරණසඤ්ඤා ය, ආහාරයෙහි පටිකූලසඤ්ඤා ය, සබ්බලොකයෙහි අනභිරතසඤ්ඤා ය, අනිච්චසඤ්ඤා ය, අනිච්චයෙහි දුක්ඛසඤ්ඤා ය, දුක්ඛයෙහි අනත්තසඤ්ඤා යි.

ඉමා ඛො භික්ඛවෙ, සත්ත සඤ්ඤා, භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා'ති.

(1) අසුභසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

අසුභසඤ්ඤා පරිචිතෙන භික්ඛවෙ, භික්ඛුනො චෙතසා බහුලං විහරතො මෙථුනධම්මසමාපත්තියා චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති. උපෙක්ඛා[1] වා පටික්කූල්‍යතා වා[2] සණ්ඨාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටපත්තං වා නහාරුදද්දුලං වා[3] අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අසුභසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො මෙථුනධම්මසමාපත්තියා චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති. උපෙක්ඛා වා පටික්කූල්‍යතා වා[2] සණ්ඨාති.

සචෙ භික්ඛවෙ, භික්ඛුනො අසුභසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො මෙථුනධම්මසමාපත්තියා චිත්තං අනුසන්දති[4] අප්පටිකූල්‍යතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා 'අභාවිතා මෙ අසුභසඤ්ඤා' නත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, අප්පත්තං මෙ භාවනාඵලන්ති[5] ඉතිහ තත්ථ සම්පජානො හොති.

සචෙ පන භික්ඛවෙ භික්ඛුනො අසුභසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො මෙථුනධම්මසමාපත්තියා චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති[6] න සම්පසාරියති උපෙක්ඛා වා පටික්කූල්‍යතා වා[2] සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා භාවිතා[7] මෙ අසුභසඤ්ඤා, අත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, පත්තං මෙ භාවනාඵලන්ති[5] ඉතිහ තත්ථ සම්පජානො හොති.

අසුභසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(2) මරණසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

මරණසඤ්ඤා පරිචිතෙන භික්ඛවෙ, භික්ඛුනො චෙතසා බහුලං විහරතො ජීවිතනිකන්තියා චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති[6] න සම්පසාරියති. උපෙක්ඛා වා පටික්කූල්‍යතා වා[2] සණ්ඨාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටපත්තං වා නහාරුදද්දුලං වා[3] අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො මරණසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො ජීවිතනිකන්තියා චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති. උපෙක්ඛා වා[1] පටික්කූල්‍යතා වා සණ්ඨාති.

1. උපෙඛා - සීමු. 2 පාටිකුල්‍යතා වා - මජ්ඣං. 3. නහාරුදද්දුලං - මජ්ඣං.
4. අනුසණ්ඨාති - සීමු. 5 භාවනාබලන්ති - මජ්ඣං. 6. පතිවත්තති - මජ්ඣං.
7. සුභාවිතා - මජ්ඣං.

මහණෙනි, මේ සප්ත සංඥාවෝ භාවිත බහුලීකෘත වූවාහු, මහත්ඵල මහානිශංස ඇතියාහු අමෘතාවගාඪ වූවාහු අමෘතපර්‍යවසාන වූවාහු වෙත්‍යි.

(1) මහණෙනි, 'අසුභසංඥා භාවිත වූවා, බහුලීකෘත වූවා මහත්ඵල වෙයි, මහානිශංස වෙයි, අමෘතාවගාඪ (අමෘතයට පිහිට) වෙයි, අමෘතපර්‍යවසාන වෙයි' යන යමක් කියනලද නම් තෙලෙ කරුණ කුමක් පිණිස කියනලද ය යත්:

මහණෙනි, අශුභසංඥායෙහි පරිචිත (පුරුදු) චිත්තයෙන් බහුල කොට වෙසෙන භික්ෂුහුගේ චිත්තය මෛථුන්දම් සමවතින් හැකෙවෙයි, හැකිලෙයි, පෙරළෙයි, ඉදු ව නො යෙයි. උපෙක්ෂාව හෝ පිළිකුල් බව හෝ පිහිටයි.

මහණෙනි, කුකුළුපියාපතක් හෝ නහරකඩක් හෝ ගින්නෙහි බහාලන ලදුයේ යම් සෙයින් හැකෙවේ ද, හැකිළේ ද, පෙරළේ ද, සෘජු ව නො යේ ද, මහණෙනි, එසෙයින් ම අශුභයෙහි පරිචිත වූ චිත්තයෙන් බහුල කොට වාස කරණ මහණහුගේ චිත්තය මෛථුනධර්ම සමාපත්තියෙන් හැකෙවෙයි, හැකිලෙයි, පෙරළෙයි, ඉදු ව නො යෙයි. උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ පිහිටනේ ය.

මහණෙනි, ඉදින් අශුභ සංඥායෙහි පරිචිත චිත්තයෙන් බහුල කොට වෙසෙන මහණහුගේ චිත්තය මෛථුනසමාපත්තියෙහි අනුගතව පවතී නම්, ප්‍රතිකූලතාව හෝ නො සිටුනේ නම්, මහණෙනි, "මා විසින් අශුභසංඥා නො වඩනාලදු, පෙර නොවැඩූ කල්හි සෙයින් අශුභසංඥා වැඩූ පසුකල්හිදු විශෙෂ (ලාභ) යෙක් මට නැත. මා විසින් භාවනාඵලය නො ලබනලදැ"යි එ භික්ෂුහු විසින් තෙල කරුණ දත යුතුයි. මෙසෙයින් එ කරුණෙහි ලා (හේ) මනා පැණැතියේ වන්නේ ය.

මහණෙනි, ඉදින් අශුභසංඥායෙහි පරිචිත චිත්තයෙන් බහුල කොට වෙසෙන මහණහුගේ චිත්තය මෛථුනධර්ම සමාපත්තියෙන් හැකෙවේ නම් හැකිළේ නම්, පෙරළේ නම්, ඉදු ව නො යේ නම්, උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ සිටුනේ නම්, මහණෙනි, "මා විසින් අශුභසංඥා වඩනා ලදු, මට පෙරැට (භාවනා නො වැඩූ කලට) වැඩි විශෙෂයෙක් වැඩූ පසුකල්හි ඇත, මට භාවනාවෙහි ඵල ඇතැ"යි එ භික්ෂුහු විසින් දත යුතු යි. මෙසේ එ කරුණෙහි ලා මනාකොට දත්තේ වෙයි.

මහණෙනි, "භාවිත වූ බහුලීකෘත වූ අශුභසංඥා මහත්ඵල වේ, මහනිශංස වේ, අමෘතොගාඪ අමෘතපර්‍යවසාන වේ" යැයි යමක් කියන ලද නම්, තෙල මේ සඳහා කියන ලදි.

(2) මහණෙනි, 'භාවිත වූ බහුලීකෘත වූ මරණසංඥා මහත්ඵල මහානිශංස වෙයි, අමෘතොගාඪ අමෘතපර්‍යවසාන වේ' යයි මෙසේ යමක් කියනලද නම්, තෙල කරුණ කවර කරුණක් පිණිස කියනලද ය යත්:

මහණෙනි, මරණසංඥායෙහි පරිචිත සිතින් බහුල කොට වෙසෙන මහණහුගේ චිත්තය ජීවිතනිකාන්තියෙන් හැකෙවෙයි, හැකිලෙයි, පෙරළෙයි, ඉදු ව නො යෙයි. උපෙක්ෂාව හෝ ප්‍රතිකූලභාවය හෝ සිටුනේ ය.

මහණෙනි, කුකුළු පියාපතක් හෝ නහරකැබැල්ලක් හෝ ගින්නෙහි බහනලදුයේ යම් පරිදි හැකෙවේ ද, හැකිළේ ද, පෙරළී යේ ද, ඉදු ව නො යේ ද, මහණෙනි, එ පරිදි ම මරණසංඥායෙහි පරිචිත චිත්තයෙන් බහුල කොට වෙසෙන මහණහුගේ සිත ජීවිතනිකාන්තියෙන් හැකෙවෙයි, හැකිලෙයි, පෙරළී යෙයි, ඉදු ව නො යෙයි. උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ පිහිටනේ ය.



Free Distribution www.aathaapi.org

සචෙ භික්ඛවෙ, භික්ඛුනො මරණසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො ජීවිතනිකන්තියා චිත්තං අනුසන්දති,[1] අප්පටිකූලතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා 'අභාවිතා මෙ මරණසඤ්ඤා, නත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, අප්පත්තං මෙ භාවනාඵලන්ති'[2] ඉතිහ තත්ථ සම්පජානො හොති.

සචෙ පන භික්ඛවෙ, භික්ඛුනො මරණසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො ජීවිතනිකන්තියා චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරීයති, උපෙක්ඛා වා[3] පටිකූලතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා 'භාවිතා මෙ මරණසඤ්ඤා, අත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, පත්තං මෙ භාවනාඵලන්ති' ඉතිහ තත්ථ සම්පජානො හොති.

මරණසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(3) ආහාරෙ පටික්කූලසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

ආහාරෙ පටික්කූලසඤ්ඤාපරිචිතෙන භික්ඛවෙ, භික්ඛුනො චෙතසා බහුලං විහරතො රසතණ්හාය චිත්තං පතිලීයති -පෙ- උපෙක්ඛා[3] වා පටික්කූලතා වා සණ්ඨාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටපත්තං වා න්හාරුදද්දුලං වා[4] අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරීයති, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො ආහාරෙ පටික්කූලසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො රසතණ්හාය චිත්තං පතිලීයති -පෙ උපෙක්ඛා වා පටික්කූලතා වා සණ්ඨාති.

සචෙ භික්ඛවෙ, භික්ඛුනො ආහාරෙ පටික්කූලසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො රසතණ්හාය චිත්තං අනුසන්දති, අප්පටික්කූලතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනො 'අභාවිතා මෙ ආහාරෙ පටික්කූලසඤ්ඤා, නත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, අප්පත්තං මෙ භාවනාඵලන්ති' ඉතිහ තත්ථ සම්පජානො හොති.

සචෙ පන භික්ඛවෙ, භික්ඛුනො ආහාරෙ පටික්කූලසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො රසතණ්හාය චිත්තං පතිලීයති -පෙ- උපෙක්ඛා වා පටික්කූලතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා 'භාවිතා[5] මෙ ආහාරෙ පටික්කූලසඤ්ඤා, අත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, පත්තං මෙ භාවනාඵලන්ති' ඉතිහ තත්ථ සම්පජානො හොති.

ආහාරෙ පටික්කූලසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. අනුසණ්ඨාති. - සීමු    2 භාවනාබලන්ති - මජ්ඣං.    3 උපෙඛා වා - සීමු
4. න්හාරුද ලං වා - මජ්ඣං    5 සුභාවිතා - මජ්ඣං

මහණෙනි, ඉදින් මරණසංඥායෙහි පරිචිත චිත්තයෙන් බහුල කොට වෙසෙන මහණහුගේ චිත්තය ජීවිතනිකාන්තියෙහි (ජීවිතාශාවෙහි) අනුගතව පවත්නේ නම්, අප්‍රතිකූලතාව හෝ පිහිටන්නේ නම්, මහණෙනි, "මා විසින් මරණසංඥා නො වඩනලද්දී, මට පෙරට වැඩි අපරකාලයෙහි වූ විශේෂයෙක් නැත. මා විසින් භාවනාඵලය නො ලබනලද්දී"යි යන තෙල කරුණ ඒ මහණහු විසින් දතයුතු මෙසෙයින් එහි ලා සම්‍යක්ප්‍රඥා ඇතියේ වෙයි.

මහණෙනි, ඉදින් මරණසංඥායෙහි පරිචිත චිත්තයෙන් බහුල කොට වෙසෙන මහණහුගේ චිත්තය ජීවිතනිකාන්තියෙන් සැහෙවේ නම්, හැකිළේ නම්, පෙරළේ නම්, ඉදු ව නො යේ නම්, උපෙක්ෂාව හෝ පිළිකුල්බව හෝ පිහිටා නම්, මහණෙනි, "මා විසින් මරණසංඥා වඩනලද්දී, පෙර අභාවිත කාලයට වැඩි වූ විශෙෂයෙක් භාවිත වූ අපරකාලයෙහි මට ඇත. මට භාවනාඵලය ඇතැ"යි යන තෙල කරුණ භික්ෂූහු විසින් දත යුතුයි. මෙසෙයින් හෙ මෙ කරුණෙහි ලා මනාකොට දත්තේ වෙයි.

මහණෙනි, භාවිත බහුලීකෘත මරණසංඥා මහත්ඵල මහානිශංස, අමෘතොගධ අමෘතපරියොසාන වේ යයි යමක් මෙසේ කියනලද නම් තෙල කරුණ මෙ පිණිස කියන ලදී.

(3) මහණෙනි, "ආහාරයෙහි ප්‍රතිකූලසංඥා භාවිත වූවා බහුලීකෘත වූවා මහත්ඵල වෙයි. මහානිශංස වෙයි. අමෘතාවගධ අමෘත පර්‍යවසාන කොට ඇතැ"යි මෙසේ යමක් කියන ලද නම් තෙල කරුණ කවර හෙයින් කියන ලද ය යත්:

මහණෙනි, ආහාරයෙහි ප්‍රතිකූලසංඥායෙහි පරිචිත සිතින් බහුල කොට වෙසෙන මහණහුගේ රසතෘෂ්ණායෙන් චිත්තය සැහැවෙයි ... උපෙක්ෂාව හෝ ප්‍රතිකූලතාව හෝ සිටුනේ ය.

මහණෙනි, යම්සේ කුකුළුපියාපතෙක් වේවයි නහරකඩෙක් වේවයි ගින්නෙහි බහන ලදුයේ ප්‍රතිලීන වේ ද, හැකිළේ ද, පෙරළේ ද, ඉදු ව නො යේ ද, එ පරිදි ම මහණෙනි, ආහාරයෙහි ප්‍රතිකූලසංඥායෙන් පරිචිත වූ සිතින් බොහෝ සෙයින් වෙසෙන මහණහුගේ සිත රසතෘෂ්ණායෙන් ප්‍රතිලීන වෙයි ... උපේක්ෂාව හෝ පිළිකුල්බව පිහිටයි.

මහණෙනි, ඉදින් ආහාරයෙහි ප්‍රතිකූල සංඥායෙන් පරිචිත වූ සිතින් බොහෝ සෙයින් වෙසෙන මහණහුගේ සිත රසතෘෂ්ණායෙහි වැටේ ද, නො පිළිකුල්බව හෝ පිහිටා ද, මහණෙනි, "මා විසින් වඩනාලද ආහාරයෙහි ප්‍රතිකූලසංඥාව අභාවිත යයි ද, මට පෙරට වැඩි වෙසෙසෙක් පසුව නැතැයි ද, මා විසින් භාවනාඵලය නො ලබනලදැයි ද" යන තෙල කරුණ ඒ භික්ෂු විසින් දතයුතු යි. මෙසේ එහි ලා හේ සම්‍යක්ප්‍රඥා ඇත්තේ වෙයි.

මහණෙනි, ඉදින් ආහාරයෙහි ප්‍රතිකූලසංඥායෙන් පරිචිත වූ සිතින් බහුල කොට වෙසෙන මහණහුගේ සිත රසතෘෂ්ණායෙන් ප්‍රතිලීන වේ ද ... උපෙක්ෂාව හෝ ප්‍රතිකූල්‍යතාව හෝ පිහිටා ද, මහණෙනි, ඒ භික්ෂූහු විසින් "ආහාරයෙහි ප්‍රතිකූලසංඥාව මා විසින් බවනලදැයි ද, මට පෙරට වැඩි වෙසෙසක් දුන් ඇතැයි ද, මා විසින් භාවනාඵලය ලබනලදැයි ද යන තෙල කරුණ දතයුතු යි. මෙසේ එහි ලා සම්‍යක්ප්‍රඥා ඇතියේ වෙයි.

මහණෙනි, ආහාරයෙහි ප්‍රතිකූලසංඥා භාවිත වූවා බහුලීකෘත වූවා, මහත්ඵල වෙයි. මහානිසංස ඇත්තී ය. අමෘතය පිහිට කොට ඇත්තීය, අමෘතය පර්‍යවසාන කොට ඇත්තී යයි මෙසේ යමක් කියන ලද නම් තෙල කරුණ මේ පිණිස කියන ලදී.

(4) සබ්බලොකෙ අනභිරතසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

සබ්බලොකෙ අනභිරතසඤ්ඤාපරිචිතෙන භික්ඛවෙ, භික්ඛුනො චෙතසා බහුලං විහරතො ලොකචිත්තෙසු චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති. උපෙක්ඛා වා පටිකූල්‍යතා වා සණ්ඨාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටපත්තං වා නහාරුදද්දුලං වා අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති. පතිවට්ටති න සම්පසාරියති, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො සබ්බලොකෙ අනභිරතසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො ලොකචිත්තෙසු[1] චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති. උපෙක්ඛා[2] වා පටිකූල්‍යතා වා සණ්ඨාති.

සචෙ පන භික්ඛවෙ, භික්ඛුනො සබ්බලොකෙ අනභිරතසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො ලොකචිත්තෙසු[1] චිත්තං අනුසන්දති, අප්පටිකූල්‍යතා[3] වා සණ්ඨාති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා "අභාවිතා මෙ සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, නත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, අප්පත්තං මෙ භාවනාඵලන්ති" ඉතිහ තත්ථ සම්පජානො හොති.

සචෙ පන භික්ඛවෙ, භික්ඛුනො සබ්බලොකෙ අනභිරතසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො ලොකචිත්තෙසු[1] චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති, උපෙක්ඛා[2] වා පටිකූල්‍යතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා "භාවිතා මෙ සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, පත්තං මෙ භාවනාඵලන්ති"[4] ඉතිහ තත්ථ සම්පජානො හොති.

සබ්බලොකෙ අනභිරතසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(5) අනිච්චසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

අනිච්චසඤ්ඤාපරිචිතෙන භික්ඛවෙ, භික්ඛුනො චෙතසා බහුලං විහරතො ලාභසක්කාරසිලොකෙ චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති, උපෙක්ඛා[2] වා පටිකූල්‍යතා වා සණ්ඨාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටපත්තං වා නහාරුදද්දුලං වා අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරියති, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො අනිච්චසඤ්ඤාපරිචිතෙන චෙතසා බහුලං විහරතො ලාභසක්කාරසිලොකෙ චිත්තං පතිලීයති, පතිකුටති පතිවට්ටති න සම්පසාරියති. උපෙක්ඛා වා පටිකූල්‍යතා වා සණ්ඨාති.

1 ලොකචිත්‍රෙසු - මජ්ඣං 2 උපෙඛා - සිමු
3. අප්පටිකූලතා - මජ්ඣං 4. භාවනාඵලන්ති - මජ්ඣං

Free Distribution www.aathaapi.org

(4) මහණෙනි, සර්වලෝකයෙහි අනභිරතසංඥාව වඩනලද්දී බහුල වශයෙන් පුරුදු කරනලද්දී මහත්ඵල වෙයි, මහානිසංස වෙයි. නිවන පිහිට කොට ඇත්තී ය. නිවන් අවසන් කොට ඇත්තී යයි, මෙසේ යමක් කියනලද නම් එය කවර කරුණක් පිණිස කියනලද ද:

මහණෙනි, සර්වලෝකයෙහි අනභිරතසංඥායෙන් පරිචිත වූ සිතින් බහුල වශයෙන් වෙසෙන මහණහුගේ සිත ලෝකචිත්‍රයන්හි ප්‍රතිලීන වෙයි, හැකිළෙයි, පෙරළෙයි, ඉදුව නො යෙයි, උපෙක්‍ෂාව හෝ ප්‍රතිකූලතාව හෝ පිහිටයි.

මහණෙනි, යම් සේ කුකුළුපියාපතෙක් වේවයි නහරවැලෙක් වේවයි ගින්නෙහි බහන ලද්දේ ප්‍රතිලීන වේ ද, හැකිළේ ද, පෙරළේ ද, ඉදුව නො යේ ද, එ පරිද්දෙන් ම මහණෙනි, සර්වලෝකයෙහි අනභිරතසංඥායෙන් පරිචිත වූ සිතින් බොහෝ සෙයින් වෙසෙන මහණහුගේ සිත (තෛධාතුක-ලෝකසන්නිවාසසඞ්ඛ්‍යාත) ලෞකික චිත්‍රයන්හි ප්‍රතිලීන වෙයි, හැකිළෙයි, පෙරළෙයි, ඉදුව නො යෙයි. උපෙක්‍ෂාව හෝ පිළිකුල් බව හෝ පිහිටයි.

මහණෙනි, ඉදින් සර්වලෝකයෙහි අනභිරතසංඥායෙන් පරිචිත වූ සිතින් බොහෝ සෙයින් වෙසෙන මහණහුගේ සිත ලෞකික චිත්‍රයන්හි පවතී ද, නො පිළිකුල් බව හෝ පිහිටා ද, මහණෙනි, "මා විසින් වඩනලද සර්වලෝකයෙහි අනභිරතසංඥාව අභාවිතය යි ද, මට පෙරට වැඩි අත් වෙසෙසෙක් නැතැයි ද, මා විසින් භාවනාඵලය නො ලබන ලදැයි ද" යන මෙකරුණ ඒ භික්‍ෂු විසින් දත යුතු යි. මෙසේ එහි ලා සම්‍යක් ප්‍රඥා ඇත්තේ වෙයි.

මහණෙනි, ඉදින් සර්වලෝකයෙහි අනභිරතසංඥායෙන් පරිචිත වූ සිතින් බහුල වශයෙන් වෙසෙන මහණහුගේ සිත ලෞකිකචිත්‍රයන්හි ප්‍රතිලීන වේ ද, හැකිළේ ද, පෙරළේ ද, ඉදුව නො යේ ද, උපෙක්‍ෂාව හෝ පිළිකුල් බව හෝ පිහිටා ද, මහණෙනි, එ මහණ විසින් "සර්වලෝකයෙහි අනභිරත-සංඥාව මා විසින් වඩනලදැයි ද, මට පෙරට වැඩි වෙසෙසක් පසුව ඇතැයි ද, මා විසින් භාවනාඵලය ලබනලදැයි ද" යන මෙකරුණ දත යුතු යි. මෙසේ එහි ලා සම්‍යක් ප්‍රඥා ඇතියේ වෙයි.

මහණෙනි, සර්වලෝකයෙහි අනභිරතසංඥා භාවිත වූවා බහුලීකෘත වූවා මහත්ඵල වෙයි. මහානිසංස ඇත්තී ය. අමෘතය පිහිට කොට ඇත්තී ය. අමෘතය පර්‍යවසාන කොට ඇත්තීය යි මෙසේ යමක් කියනලද නම් මෙකරුණ මේ පිණිස කියනලදි.

(5) මහණෙනි, අනිත්‍යසංඥා වඩනලද්දී බහුල වශයෙන් පුරුදු කරණලද්දී මහත්ඵල වෙයි. මහානිසංස වෙයි. නිවන පිහිට කොට ඇත්තී ය, නිවන අවසන් කොට ඇත්තී යයි මෙසේ යමක් කියනලද නම් මෙකරුණ කුමක් පිණිස කියනලද ද:

මහණෙනි, අනිත්‍යසංඥායෙන් පරිචිත වූ සිතින් බහුල වශයෙන් වෙසෙන මහණහුගේ සිත ලාභසත්කාරකීර්තිප්‍රශංසාහි ප්‍රතිලීන වෙයි, හැකිළෙයි, පෙරළෙයි, ඉදුව නො යෙයි. උපෙක්‍ෂාව හෝ ප්‍රතිකූලතාව හෝ පිහිටයි

මහණෙනි, යම්සේ කුකුළුපියාපතෙක් වේවයි නහරවැලෙක් වේවයි ගින්නෙහි බහන ලද්දේ ප්‍රතිලීන වේ ද, හැකිළේ ද, පෙරළේ ද, ඉදුව නො යේ ද, එපරිද්දෙන් ම මහණෙනි, අනිත්‍යසංඥායෙන් පරිචිත වූ සිතින් බොහෝ සෙයින් වෙසෙන මහණහුගේ සිත ලාභසත්කාරකීර්තිප්‍රශංසාහි ප්‍රතිලීන වෙයි, හැකිළෙයි, පෙරළෙයි, ඉදුව නො යෙයි, උපෙක්‍ෂාව හෝ පිළිකුල් බව බව හෝ පිහිටයි.

සචෙ භික්ඛවෙ, භික්ඛුනො අනිච්චසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො ලාභසක්කාරසිලොකෙ චිත්තං අනුසන්දති, අප්පටිකූල්‍යතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා අභාවිතා මෙ අනිච්ච-සඤ්ඤා, නත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, අප්පත්තං මෙ භාවනා ඵලන්ති ඉතිහ තත්ථ සම්පජානො හොති.

සචෙ පන භික්ඛවෙ, භික්ඛුනො අනිච්චසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො ලාභසක්කාරසිලොකෙ චිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරීයති, උපෙක්ඛා වා පටිකූල්‍යතා වා සණ්ඨාති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා භාවිතා මෙ අනිච්චසඤ්ඤා, අත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, පත්තං මෙ භාවනා ඵලන්ති, ඉතිහ තත්ථ සම්ප-ජානො හොති.

අනිච්චසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(6) අනිච්චෙ දුක්ඛසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

අනිච්චෙ දුක්ඛසඤ්ඤාපරිචිතෙන භික්ඛවෙ, භික්ඛුනො චෙතසා බහුලං විහරතො ආලස්‍යෙ කොසජ්ජෙ විස්සට්ඨියෙ පමාදෙ අනනුයොගෙ අපච්චවෙක්ඛනාය තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ.

සචෙ භික්ඛවෙ, භික්ඛුනො අනිච්චෙ දුක්ඛසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො ආලස්‍යෙ කොසජ්ජෙ විස්සට්ඨියෙ පමාදෙ අනනුයොගෙ අපච්චවෙක්ඛනාය තිබ්බා භයසඤ්ඤා න පච්චුපට්ඨිතා හොති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා අභාවිතා මෙ අනිච්චෙ දුක්ඛසඤ්ඤා, නත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, අප්පත්තං මෙ භාවනා ඵලන්ති, ඉතිහ තත්ථ සම්පජානො හොති.

සචෙ පන භික්ඛවෙ, භික්ඛුනො අනිච්චෙ දුක්ඛසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො ආලස්‍යෙ කොසජ්ජෙ විස්සට්ඨියෙ පමාදෙ අනනුයොගෙ අපච්චවෙක්ඛනාය තිබ්බා භයසඤ්ඤා, පච්චුපට්ඨිතා හොති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා සුභාවිතා මෙ අනිච්චෙ දුක්ඛසඤ්ඤා, අත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, පත්තං මෙ භාවනාඵලන්ති ඉතිහ තත්ථ සම්පජානො හොති.

මහණෙනි, ඉදින් අනිත්‍යසංඥා පරිචිත සිතින් බහුල වශයෙන් වෙසෙන මහණහුගේ සිත ලාභසත්කාර කීර්තිප්‍රශංසාහි පවතී ද, නො පිළිකුල් බව හෝ පිහිටා ද, මහණෙනි, ඒ මහණ ''මා විසින් අනිත්‍යසංඥාව නො වඩනාලද, මට පෙරට වැඩි අන් විශේෂයෙක් පසුව නැත, මා විසින් භාවනාඵලය නො ලබනලදැයි'' යන තෙල කරුණ දත යුතු යි. මෙසේ එහි ලා සම්‍යක් ප්‍රඥ ඇත්තේ වෙයි.

මහණෙනි, ඉදින් අනිත්‍යසංඥායෙන් පරිචිත සිතින් බහුල වශයෙන් වෙසෙන මහණහුගේ සිත ලාභසත්කාරකීර්තිප්‍රශංසායෙහි ප්‍රතිලීන වේ ද, හැකිළේ ද, පෙරළේ ද, ඉදුව නො ඒ ද, උපෙක්‍ෂාව හෝ පිළිකුල් බව හෝ පිහිටා ද, මහණෙනි, ඒ මහණ ''මා විසින් අනිත්‍යසංඥාව වඩනලද. මට පෙරට වැඩි අන් විශේෂයක් දූන් ඇත. මා විසින් භාවනාඵලය ලබනලදැයි'' යන තෙල කරුණ දතයුතු යි. මෙසේ එහි ලා සම්‍යක් ප්‍රඥ ඇත්තේ වෙයි.

මහණෙනි, අනිත්‍යසංඥා වඩනලද්දී බහුල වශයෙන් පුරුදු කරණලද්දී මහත්ඵල වෙයි. මහානිසංස වෙයි. නිවන පිහිට කොට ඇත්තී ය. නිවන් අවසන් කොට ඇත්තී යයි මෙසේ යමක් කියනලද. නම් තෙල කරුණ මේ පිණිස කියනලදී.

(6) මහණෙනි, අනිත්‍යයෙහි දුක්‍ඛ ය යන හැඟිම වඩනලද්දී බහුල වශයෙන් කරණලද්දී මහත්ඵල ඇත්තී මහත් අනුසස් ඇත්තී නිවනට බැසගත්තී නිවන අවසන් කොට ඇත්තී යයි මෙසේ යම්ක් වදරණලද නම් තෙල කරුණ කුමක් සඳහා වදරණලද ද:

මහණෙනි, අනිත්‍යයෙහි දුක්‍ඛසංඥා පුරුදු කරණලද සිතින් බහුල වශයෙන් වසන මහණහට අලස බවෙහි කුසීත බවෙහි (නිවන්) වුහුටුබැව්හි ප්‍රමාදයෙහි කුශලධර්මයන්හි (භාවනාවෙහි) නො යෙදීමෙහි ප්‍රත්‍යවේක්‍ෂා නො කිරීමෙහි තීව්‍රවූ භයසංඥාව එළඹ සිටියා වෙයි. අමෝරාගත් කඩුඇති වධකයකු කෙරෙහි මෙනි

මහණෙනි, ඉදින් අනිත්‍යයෙහි දුක්‍ඛසංඥාවෙන් පරිචිත වූ සිතින් බහුල කොට වෙසෙන මහණහුගේ අලසබැව්හි කුසීතබවෙහි නිවන් වුහුටු බැව්හි ප්‍රමාදයෙහි කුශලධර්මයන්හි නො යෙදීමෙහි ප්‍රත්‍යවේක්‍ෂා නො කිරීමෙහි තීව්‍රභයසංඥාව අමෝරාගත් කඩු ඇති වධකයකු කෙරෙහි මෙන් එළඹ නො සිටියා වෙයි ද, මහණෙනි, එ මහණහු විසින් ''මා විසින් අනිත්‍යයෙහි දුඃඛසංඥනො වඩනලද, මට පෙරට වැඩි විශේෂයෙක් අපරභාගයෙහි (ඇති වී)නැත. මා විසින් භාවනාඵලය නො ලබනලදැයි'' යන තෙල කරුණ දතයුතු යි. මෙසේ මෙ කරුණෙහි ලා සම්‍යක්ප්‍රඥ ඇතියේ වෙයි.

මහණෙනි, ඉදින් අනිත්‍යයෙහි දුඃඛසංඥායෙන් පරිචිත චිත්තයෙන් බහුල වශයෙන් වසන භික්‍ෂුහුගේ අලසබව්හි කුසීතභාවයෙහි වුහුටුබව්හි පමාදයෙහි කුශලධර්මයෙහි නො යෙදීමෙහි ප්‍රත්‍යවේක්‍ෂා නො කිරීමෙහි තීව්‍ර භයසංඥ අමෝරාගත් කඩු ඇති වධකයකු කෙරෙහි මෙන් එළඹිසිටියා වෙයි ද, මහණෙනි, භික්‍ෂුහු විසින් ''අනිත්‍යයෙහි දුඃඛසංඥ මා විසින් වඩනාලදු,පෙරට වැඩි විශේෂයෙක් පසුකාලයෙහි මට ඇත, මා විසින් භාවනාඵලයලබනලදැයි'' යන තෙල කරුණ දතයුතු ය. මෙසේ මෙ කරුණෙහි ලා සම්‍යක්ප්‍රඥ ඇතියේ වෙයි.

අනිච්චෙ දුක්ඛසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

(7) දුක්ඛෙ අනත්තසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

දුක්ඛෙ අනත්තසඤ්ඤා පරිචිතෙන භික්ඛවෙ, භික්ඛුනො චෙතසා බහුලං විහරතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානාපගතං මානසං හොති විධා සමතික්කන්තං සන්තං සුවිමුත්තං.

සචෙ භික්ඛවෙ, භික්ඛුනො දුක්ඛෙ අනත්තසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානාපගතං මානසං න හොති විධාසමතික්කන්තං සන්තං සුවිමුත්තං, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා අභාවිතා මෙ දුක්ඛෙ අනත්තසඤ්ඤා, නත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, අප්පත්තං මෙ භාවනාඵලන්ති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

සචෙ පන භික්ඛවෙ, භික්ඛුනො දුක්ඛෙ අනත්තසඤ්ඤා පරිචිතෙන චෙතසා බහුලං විහරතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානාපගතං මානසං හොති විධා-සමතික්කන්තං සන්තං සුවිමුත්තං, වෙදිතබ්බමෙතං භික්ඛවෙ, භික්ඛුනා සුභාවිතා මෙ දුක්ඛෙ අනත්තසඤ්ඤා, අත්ථි මෙ පුබ්බෙනාපරං විසෙසො, පත්තං මෙ භාවනාඵලන්ති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

දුක්ඛෙ අනත්තසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති, මහානිසංසා අමතොගධා අමතපරියොසානාති, ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමා ඛො භික්ඛවෙ සත්ත සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති.

මහණෙනි, අනිත්‍යයෙහි දුඃඛසංඥා වඩනාලද්දී බහුල කරණලද්දී මහත්ඵල වෙයි. මහානිශංස වෙයි. අමෘතය පිහිට කොට ඇත්තී අමෘතය පර්‍යවසාන කොට ඇත්තී යයි මෙසේ යමක් කියනලද නම් ඒ කාරණ මේ පිණිස කියනලදී.

(7) මහණෙනි, දුඃඛයෙහි අනාත්ම සංඥා වඩනාලද්දී බහුලකරණලද්දී මහත්ඵල වෙයි, මහානිශංසවෙයි. අමෘතය පිහිට කොට ඇත්තී අමෘතය පර්‍යවසාන කොට ඇත්තී යයි මෙසේ යමක් කියනලද නම් ඒ කාරණ කුමක් පිණිස කියනලද ය යත්:

මහණෙනි, දුඃඛයෙහි අනාත්මසංඥායෙන් පරිචිත සිතින් බහුල වශයෙන් වසන මහණහුට මේ සවිඥානක කරජකායයෙහි ද බාහිර සියලු නිමිති කෙරෙහි ද පහවගිය අහංකාරමමංකාරමාන (මම යන දෘෂ්ටි, මාගේ යන තෘෂ්ණාව) ඇති ඉක්ම වූ ත්‍රිවිධ විධා (මාන) ඇති, ශාන්ත වූ මොනොවට මිදුන සිත වෙයි.

මහණෙනි, ඉදින් දුඃඛයෙහි අනාත්ම සංඥායෙන් පරිචිත වූ සිතින් බහුල වශයෙන් වසන මහණහුට මෙ සවිඥානකකායයෙහි ද බාහිර හැම නිමිති කෙරෙහි ද අහංකාරමමංකාර මානානුශයෙන් පහවූ, ඉක්ම වූ ත්‍රිවිධ විධා ඇති, ශාන්ත වූ මොනොවට මිදුනු සිත නො වේ නම්, මහණෙනි, "මා විසින් දුකෙහි අනාත්මසංඥා නො වඩනාලදූ, මට පෙරට වැඩි වෙසෙසෙක් නැත, මා විසින් භාවනාඵලය නො ලදූයි" මහණහු විසින් දතයුතු ය. මෙසේ එහි ලා සම්‍යක්ප්‍රඥා ඇතියේ වෙයි.

මහණෙනි, ඉදින් දුඃඛයෙහි අනාත්ම සංඥායෙන් පරිචිත වූ සිතින් බහුල කොට වෙසෙන මහණහුට මේ සවිඥානක කායයෙහි ද බාහිර සර්‍ව නිමිත්තයන්හි ද අහංකාරමමංකාරමානයෙන් පහ වූ, විධාසමතික්‍රමණය කළ, ශාන්ත වූ සුවිමුක්ත වූ චිත්තය වේ නම්, මහණෙනි, "මා විසින් දුඃඛයෙහි අනාත්ම සංඥාව මොනොවට වඩනාලදූ, මට පෙරට වැඩි වෙසෙසෙක් ඇත. මා විසින් භාවනාඵලය ලබනලදූයි" යන ඒ කාරණ මහණහු විසින් දතයුතු ය. මෙසේ මේ කාරණෙහි ලා සම්‍යක්ප්‍රඥා ඇති වෙයි.

මහණෙනි, දුඃඛයෙහි අනාත්මසංඥා වඩන ලද්දී බහුල කරණලද්දී මහත්ඵල හා මහානිශංස වූවා අමෘතය පිහිට කොට ඇත්තී අමෘතය පර්‍යවසාන කොට ඇත්තී යයි මෙසේ යමක් කියනලද නම් ඒ කාරණ මේ සඳහා කියනලදී.

මහණෙනි, මේ සප්තසංඥා භාවිත බහුලීකෘත වූවාහු මහත්ඵල මහානිශංස ඇත්තාහු අමෘතය පිහිට කොට ඇත්තාහු අමෘතය පර්‍යවසාන කොට ඇත්තාහු වෙත් ය යි.

## 7. 1. 5. 7

## [මෙථුන සුත්තං]

### [සාවත්ථිනිදානං]

**50.** අථ ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි· උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි -පෙ- [භගවන්තං] එතදවොච:

භවම්පි නො සමණො ගොතමො බ්‍රහ්මචාරී පටිජානාතීති.

“යං හි තං බ්‍රාහ්මණ, සම්මා වදමානො වදෙය්‍ය: අඛණ්ඩං අච්ඡිද්දං අසබලං අකම්මාසං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරතීති, මමෙවෙතං බ්‍රාහ්මණ, සම්මා වදමානො වදෙය්‍ය”. අහං හි බ්‍රාහ්මණ, අඛණ්ඩං අච්ඡිද්දං අසබලං අකම්මාසං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරාමීති.

කිම්පන භො ගොතම, බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පීති.

(1) ඉධ බ්‍රාහ්මණ, එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානො න හෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයංද්වයසමාපත්තිං සමාපජ්ජති, අපි ච ඛො මාතුගාමස්ස උච්ඡාදනපරිමද්දනන්හාපනසම්බාහනං සාදියති, සො තදස්සාදෙති, තං නිකාමෙති. තෙන ච විත්තිං ආපජ්ජති. ඉදම්පි ඛො බ්‍රාහ්මණ, බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි.

අයං වුච්චති බ්‍රාහ්මණ, අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති සංයුත්තො මෙථුනෙන සංයොගෙන, න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

(2) පුන ච පරං බ්‍රාහ්මණ, ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානො න හෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයංද්වයසමාපත්තිං සමාපජ්ජති, නපි මාතුගාමස්ස උච්ඡාදනපරිමද්දනන්හාපනසම්බාහනං සාදියති. අපි ච ඛො මාතුගාමෙන සද්ධිං සඤ්ජග්ඝති සංකීළති සංකෙළායති -පෙ-

(3) නපි මාතුගාමෙන සද්ධිං සඤ්ජග්ඝති සංකීළති සංකෙළායති, අපි ච ඛො මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති පෙක්ඛති -පෙ-

(4) නපි මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති පෙක්ඛති, අපි ච ඛො මාතුගාමස්ස සද්දං සුණාති, තිරොකුඩ්ඩං වා තිරොපාකාරං වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා -පෙ-

(5) නපි මාතුගාමස්ස සද්දං සුණාති, තිරොකුඩ්ඩං වා තිරොපාකාරං වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා, අපි ච ඛො යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිතලපිතකීළිතානි තානි අනුස්සරති -පෙ-

## 7. 1. 5. 7

## [සත්තමෙථුන සූත්‍රය]

### [සැවැත්නිදාන යි]

**50.** එකල්හි **ජාණුස්සෝණි** බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය ... භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ කී ය:

ශ්‍රමණ භවද් ගෞතමයන් වහන්සේත් 'බ්‍රහ්මචාරියෙක්මි'යි ප්‍රතිඥා කරන්නාහු ද?යි.

බ්‍රාහ්මණය, යම් මැ පුද්ගලකු ගෙණ මනාකොට කියනුයෙක් ''අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යය පුරන්-නේ ය''යි කියන්නේ නම් බ්‍රාහ්මණය, මනාකොට කියනුයේ තෙල කාරණය මා ගෙණ ම කියන්නේ ය. බ්‍රාහ්මණය මම මැ නොකඩ වූ නො සිදුරු වූ අශබල වූ අකල්මාෂ වූ පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යය පුරම් යි.

භවද් ගෞතමයන් වහන්ස, බ්‍රහ්මචර්‍ය්‍යයාගේ ඛණ්ඩ ඡිද්‍ර ශබල (කබර) කල්මාෂ (පුල්ලි) කවරේ ද?යි.

(1) බ්‍රාහ්මණය, මෙ ලොව්හි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ 'මනාකොට බ්‍රහ්මචාරීයෙමි'යි පිළිණ කරන්නේ මාගමක් හා සමග ද්වයංද්වයසමාපත්තියට නො ම පැමිණෙන්නේ ය. වැලිදු මාගමක විසින් ඇඟඉලුම් පිරිමැදුම් නැහැවීම් සම්බාහන ඉවසන්නේ ය. හේ එය ආස්වාද කරන්නේ ය. එය කැමැති වන්නේ ය. එයින් ද සතුටට පත් වන්නේ ය.

බ්‍රහ්මණය, මෙ ද බ්‍රහ්මචර්‍ය්‍යයාගේ ඛණ්ඩ ඡිද්‍ර ශබල කල්මාෂ වෙයි. බ්‍රාහ්මණය, මෙ තෙම මෛථුනසංයොගයෙන් සංයුක්ත වූයේ අපිරිසිදු බඹසර පුරන්නේ යයි ද ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙව-යෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් නො මිදේ ය යි ද සසරදුකින් නො මිදේ යයි ද කියනුලැබේ.

(2) නැවද බ්‍රාහ්මණය, මෙ ලොව්හි ඇතැම් මහණෙක් වේවයි බමුණෙක් වේවයි 'මනාකොට බ්‍රහ්මචාරීමි'යි ප්‍රතිඥා කරන්නේ මාගමක හා සමග ද්වයංද්වයසමාපත්තියට නො ම සම්වදනේ ය. මාගමක විසින් සිරිරු ඉලීම් පිරිමැදුම් නැහැවීම් සම්බාහන නො ද ඉවසන්නේ ය. වැලිදු මාගමක හා සමග සිනා කථායෙන් සෙයි, ක්‍රීඩා කෙරෙයි. මහසිනා කෙරෙයි ...

(3) මාගමක හා සමග නො ද සිනාබසින් සෙයි, ක්‍රීඩා නො කෙරෙයි, මහා හසිතයෙන් නො සෙයි. වැලිදු සියැසින් මාගම්හුගේ ඇස පිළිවිද දක්නේ ය, බලන්නේ ය ...

(4) මාගම්හුගේ ඇස තම ඇසින් නො ද පිළිවිද දක්නේ ය. නො බලන්නේ ය. වැලින් කිතින් පිටත්හි වේවයි පවුරින් පිටත්හි වේවයි සෙන්නා වූ හෝ බණන්නා වූ හෝ ගයන්නා වූ හෝ හඬන්නා වූ හෝ මාගමගේ ශබ්දය අසයි ...

(5) කිතින් මුවාහෙහි වේවයි පවුරින් මුවායෙහි වේවයි සෙන්නා වූ හෝ බණන්නා වූ හෝ ගයන්නා වූ හෝ හඬන්නා වූ හෝ මාගමගේ ශබ්දය නො ද අසයි. වැලින් මාගමක හා සමඟ ඔහු විසින් පෙර කල යම් හසිත ලපිත කීළිතයෝ වෙත් නම් එ හැම අනුස්මරණ කෙරෙයි ...

(6) නපි යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිතලපිතකීළිතානි තානි අනුස්සරති. අපි ච ඛො පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගිභූතං පරිචාරියමානං[1] -පෙ-

(7) නපි පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගිභූතං පරිචාරියමානං. අපි ච ඛො අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති. සො තදස්සාදෙති,[2] තං නිකාමෙති, තෙන ච විත්තිං ආපජ්ජති.

ඉදම්පි ඛො බ්‍රාහ්මණ, බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි.

අයං වුච්චති බ්‍රාහ්මණ, අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, සංයුත්තො මෙථුනෙන සංයොගෙන න පරිමුච්චති, ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

යාවකීවඤ්චාහං බ්‍රාහ්මණ ඉමෙසං සත්තන්නං මෙථුනසංයොගානං අඤ්ඤතරඤ්ඤතරං[3] මෙථුනසංයොගං අත්තනි අප්පහීනං සමනුපස්සිං, නෙව තාවාහං බ්‍රාහ්මණ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං.

යතො ච ඛො අහං බ්‍රාහ්මණ, ඉමෙසං සත්තන්නං මෙථුනසංයොගානං න අඤ්ඤතරඤ්ඤතරං මෙථුනසංයොගං අත්තනි අප්පහීනං සමනුපස්සිං, අථාහං බ්‍රාහ්මණ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං.

ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති.

එවං වුත්තෙ ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච -පෙ- [උපාසකං මං භවං ගොතමො ධාරෙතු] අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 7. 1. 5. 8

## [සංයොගවිසංයොග ධම්මපරියාය සුත්තං]

[සාවත්ථිනිදානං]

51. සංයොගවිසංයොගං වො භික්ඛවෙ, ධම්මපරියායං දෙසිස්සාමි. තං සුණාථ -පෙ-

කතමො ච සො භික්ඛවෙ සංයොගවිසංයොගො ධම්මපරියායො:

ඉත්ථී භික්ඛවෙ අජ්ඣත්තං ඉත්ථින්ද්‍රියං මනසිකරොති ඉත්ථිකුත්තං ඉත්ථාකප්පං ඉත්ථිවිධං ඉත්ථිච්ඡන්දං ඉත්ථිස්සරං ඉත්ථාලඞ්කාරං. සා තත්ථ රජ්ජති, තත්‍රාභිරමති. සා තත්ථ රත්තා තත්‍රාභිරතා බහිද්ධා පුරිසින්ද්‍රියං මනසිකරොති පුරිසකුත්තං පුරිසාකප්පං පුරිසවිධං පුරිසච්ඡන්දං පුරිසස්සරං පුරිසාලඞ්කාරං. සා තත්ථ රජ්ජති, තත්‍රාභිරමති. සා තත්ථ රත්තා තත්‍රාභිරතා බහිද්ධා සංයොගං ආකඞ්ඛති. යඤ්චස්සා සංයොගපච්චයා උප්පජ්ජති සුඛං සොමනස්සං, තඤ්ච ආකඞ්ඛති. ඉත්ථත්තෙ භික්ඛවෙ, අභිරතා සත්තා පුරිසෙසු සංයොගං ගතා. එවං ඛො භික්ඛවෙ, ඉත්ථී ඉත්ථත්තං නාතිවත්තති.

1 පරිචාරයමානං - මජ්ඣං. 2 තං අස්සාදෙති - මජ්ඣං. 3 අඤ්ඤතරං - සීමු.

(6) ඔහු විසින් පෙර මාගම්හු හා සමග කළ යම් හසිත - ලපිත - කීළිතයෝ වෙත් නම් ඔවුන් නො ද අනුස්මරණ කෙරෙයි. වැලිත් පස්කම් ගුණෙන් සමර්පිත වූ සමඞ්ගීභූත වූ පරිචරණය කරණුලබන ගැහැවියකු හෝ ගැහැවිපුතකු හෝ දක්නේ ය ...

(7) පස්කම් ගුණෙන් සමර්පිත වූ සමඞ්ගීභූත වූ පරිචරණය කරණු ලබන ගැහැවියකු හෝ ගැහැවිපුතකු හෝ නො ද දක්නේ ය. නො ලබන්නේ ය. වැලිත් "මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තවුස්දමින් හෝ බඹසරින් ප්‍රකට දෙවියෙකිම් හෝ අප්‍රකට දෙවියෙකිම් හෝ වෙමි"යි අන්‍යතර දේවනිකායක් පතා බ්‍රහ්මචර්‍ය්‍යය පුරයි. හෙ එය ආස්වාද විසින් විඳියි. එය පතයි. එයින් ම සැහීමට පැමිණෙයි.

බ්‍රාහ්මණය, මේ ද බ්‍රහ්මචර්‍ය්‍යයාගේ ඛණ්ඩ ද, ඡිද්‍ර ද සබල ද, කල්මාෂ ද වෙයි.

බ්‍රාහ්මණය මෙතෙම අපරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පුරන්නේ යයි ද මෛථුන - සංයොගයෙන් සංයුක්ත යයි ද ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් නො මිදේ යයි කියනු ලැබේ. වර්තදුක්ඛයෙන් නො මිදේ යයි කියමි.

බ්‍රාහ්මණය, මම යම් තාක් මේ සප්ත මෛථුන සංයොගයන් කෙරෙහි තමන් තුළ අප්‍රහීණ යම් ම මෛථුන සංයොගයක් නුවණින් දිටිම් ද, බ්‍රාහ්මණය, එතාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොවෙහි, මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව කෙරෙහි "අනුත්තර සම්‍යක්සම්බොධිය අවබොධ කෙළෙමි"යි ප්‍රතිඥා නො ම කෙළෙමි.

බ්‍රාහ්මණය, යම් කලෙක මම මේ සප්තමෛථුනසංයොගයන් කෙරෙහි තමන් තුළ අප්‍රහීණ යම් මෑ මෛථුනසංයෝගයක් නො ම දිටිම් ද, බ්‍රාහ්මණය, එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි, මහණ-බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව කෙරෙහි "අනුත්තර සම්‍යක් සම්බොධිය අවබොධ කෙළෙමි"යි පිළිණ කෙළෙමි.

මාගේ චිත්තවිමුක්තිය අකොප්‍ය ය, මේ අන්තිම ජාතිය යි. දැන් පුනර්-භවයෙක් නැතැ යි මට ඥානදර්ශනය ද උපනැ යි.

මෙසේ වදාළ කල්හි ජාණුස්සොණි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල කී ය මා අද පටන් කොට දිවි හිම්යෙන් සරණ ගිය උවසු කොට ධරණසේක්වා යි.

## 7. 1. 5. 8.

## [සංයොගවිසංයොග ධම්මපරියාය සූත්‍රය]

[ සැවැත්නිදන යි]

51. මහණෙනි, තොපට සංයොගවිසංයොග සාධක වූ ධර්මපර්‍ය්‍යාය දෙසන්නෙමි. එය අසවූ ...

මහණෙනි, ඒ සංයොගවිසංයොගධර්මපර්‍ය්‍යාය කවරේ ය යත්:

මහණෙනි, ස්ත්‍රිය ආධ්‍යාත්මික ස්ත්‍රීන්ද්‍රිය ස්ත්‍රීක්‍රියාව ස්ත්‍රිය පිළිබඳ ආකල්පය ස්ත්‍රියගේ මානවිධාව ස්ත්‍රියගේ ඡන්දය ස්ත්‍රීස්වරය ස්ත්‍රී අලඞ්කාරය මෙනෙහි කරයි. හී එහි රැඳෙයි. එහි අභිරමණය කරයි. එහි රැඳුනු එහි අභිරත වූ හි බැහැරි පුරුෂෙන්ද්‍රිය පුරුෂක්‍රියා පුරුෂාකල්ප පුරුෂවිධා පුරුෂ ඡන්ද පුරුෂස්වර පුරුෂාලඞ්කාර මෙනෙහි කරයි හී එහි රැඳෙයි. එහි අභිරමණය කෙරෙයි. එහි රැඳුනු එහි අභිරත වූ හි බැහැරි පිරිමි සංයොග කැමැති වෙයි. සංයොගප්‍රත්‍යයෙන් ඇයට යම්බඳු සුවසොම්නසෙකුත් වේ නම්, එය ද කැමැති වෙයි. මහණෙනි, ස්ත්‍රීභාවයෙහි අභිරත වූ සත්ත්වයෝ පුරුෂයන් කෙරෙහි සංයොගයට ගියානු නම් වෙති. මහණෙනි, මෙසේ ස්ත්‍රිය ස්ත්‍රී භාවය නො ඉක්මවයි.

පුරිසො භික්ඛවෙ, අජ්ඣත්තං පුරිසින්ද්‍රියං මනසිකරොති පුරිසකුත්තං පුරිසාකප්පං පුරිසවිධං පුරිසච්ඡන්දං පුරිසස්සරං පුරිසාලඞ්කාරං. සො තත්ථ රජ්ජති තත්‍රාභිරමති. සො තත්ථ රත්තො තත්‍රාභිරතො බහිද්ධා ඉත්ථින්ද්‍රියං මනසිකරොති ඉත්ථිකුත්තං ඉත්ථාකප්පං ඉත්ථිවිධං ඉත්ථිච්ඡන්දං ඉත්ථිස්සරං ඉත්ථාලඞ්කාරං. සො තත්ථ රජ්ජති, තත්‍රාභිරමති. සො තත්ථ රත්තො තත්‍රාභිරතො බහිද්ධා සංයොගං ආකඞ්ඛති. යඤ්චස්ස සංයොගපච්චයා උප්පජ්ජති සුඛං සොමනස්සං, තඤ්ච ආකඞ්ඛති. පුරිසත්තෙන භික්ඛවෙ, අභිරතා සත්තා ඉත්ථීසු සංයොගං ගතා. එවං ඛො භික්ඛවෙ, පුරිසො පුරිසත්තං නාතිවත්තති.

එවං ඛො භික්ඛවෙ, සංයොගො හොති.

කථඤ්ච භික්ඛවෙ, විසංයොගො හොති:

ඉත්ථී භික්ඛවෙ, අජ්ඣත්තං ඉත්ථින්ද්‍රියං න මනසිකරොති ඉත්ථිකුත්තං ඉත්ථාකප්පං ඉත්ථිවිධං ඉත්ථිච්ඡන්දං ඉත්ථිස්සරං ඉත්ථාලඞ්කාරං. සා තත්ථ න රජ්ජති. තත්ථ නාභිරමති. සා තත්ථ අරත්තා තත්‍ර අනභිරතා බහිද්ධා පුරිසින්ද්‍රියං න මනසිකරොති පුරිසකුත්තං පුරිසාකප්පං පුරිසවිධං පුරිසච්ඡන්දං පුරිසස්සරං පුරිසාලඞ්කාරං. සා තත්ථ න රජ්ජති, තත්ථ නාභිරමති. සා තත්ථ අරත්තා තත්‍ර අනභිරතා බහිද්ධා සංයොගං නාකඞ්ඛති. යං චස්සා සංයොගපච්චයා උප්පජ්ජති සුඛං සොමනස්සං, තඤ්ච නාකඞ්ඛති. ඉත්ථත්තෙන ඛො භික්ඛවෙ, අනභිරතා සත්තා පුරිසෙසු විසංයොගං ගතා. එවං ඛො භික්ඛවෙ, ඉත්ථී ඉත්ථත්තං අතිවත්තති.

පුරිසො භික්ඛවෙ අජ්ඣත්තං පුරිසින්ද්‍රියං න මනසිකරොති පුරිසකුත්තං පුරිසාකප්පං පුරිසවිධං පුරිසච්ඡන්දං පුරිසස්සරං පුරිසාලඞ්කාරං. සො තත්ථ න රජ්ජති, තත්‍ර නාභිරමති. සො තත්ථ අරත්තො තත්‍ර අනභිරතො[1] බහිද්ධා ඉත්ථින්ද්‍රියං න මනසිකරොති ඉත්ථිකුත්තං ඉත්ථාකප්පං ඉත්ථිවිධං ඉත්ථිච්ඡන්දං ඉත්ථිස්සරං ඉත්ථාලඞ්කාරං. සො තත්ථ න රජ්ජති, තත්‍ර නාභිරමති. සො තත්ථ අරත්තො තත්‍ර අනභිරතො බහිද්ධා සංයොගං නාකඞ්ඛති. යඤ්චස්ස සංයොගපච්චයා උප්පජ්ජති සුඛං සොමනස්සං, තඤ්ච නාකඞ්ඛති. පුරිසත්තෙන භික්ඛවෙ, අනභිරතා සත්තා ඉත්ථීසු විසංයොගං ගතා. එවං ඛො භික්ඛවෙ, පුරිසො පුරිසත්තං අතිවත්තති.

එවං ඛො භික්ඛවෙ, විසංයොගො හොති.

අයං ඛො භික්ඛවෙ, සංයොග විසංයොගො ධම්මපරියායොති.

1. නාභිරතො - සීමු.

මහණෙනි, පුරුෂයා ආධ්‍යාත්මික පුරුෂෙන්ද්‍රිය, පුරුෂක්‍රියාව, පුරුෂාකල්පය, පුරුෂමානාවිධාව, පුරුෂාධ්‍යාශයච්ඡන්දය, පුරුෂස්වරය (ශබ්දය), පුරුෂාලඞ්කාරය මෙනෙහි කරයි. හේ එහි රැදෙයි. එහි අභිරමණය කරයි හේ එහි රැඳුනේ එහි අභිරත වූයේ බාහිර ස්ත්‍රීන්ද්‍රිය, ස්ත්‍රීක්‍රියා, ස්ත්‍රී ආකල්පය, ස්ත්‍රීවිධාව, ස්ත්‍රීච්ඡන්දය, ස්ත්‍රී ස්වරය, ස්ත්‍රී අලඞ්කාරය මෙනෙහි කරයි හේ එහි රැදෙයි. එහි අභිරමණය කරයි. හේ එහි රක්ත වූයේ එහි අභිරත වූයේ බාහිර (ස්ත්‍රී සංයොගය කැමැති වෙයි. සංයෝගප්‍රත්‍යයයෙන් ඔහට යම්බඳු සුවසොම්නසෙක් වේ නම්, එ ද කැමැති වෙයි. මහණෙනි පුරුෂභාවයෙහි අභිරත වූ, සත්ත්වයෝ ස්ත්‍රීන් කෙරෙහි සංයොගයට ගියාහු නම් වෙත්. මහණෙනි, මෙසේ පුරුෂ පුරුෂභාවය නො ඉක්මවයි.

මහණෙනි, මෙසෙයින් සංයෝගය වෙයි.

මහණෙනි, කෙසේ නම් විසංයෝගය වේ ය යත්:

මහණෙනි, ස්ත්‍රිය ආධ්‍යාත්මික ස්ත්‍රීන්ද්‍රිය ස්ත්‍රීක්‍රියා ස්ත්‍රී ආකල්පය ස්ත්‍රී විධාව ස්ත්‍රීච්ඡන්දය ස්ත්‍රී ස්වරය ස්ත්‍රී අලඞ්කාර මෙනෙහි නො කරයි ඕ එහි නො රැදෙයි. එහි අභිරමණ නො කරයි. ඕ එහි රක්ත නො වූවා එහි අභිරත නො වූවා බැහැරි පුරුෂෙන්ද්‍රිය පුරුෂක්‍රියා පුරුෂාකල්පය පුරුෂවිධාව පුරුෂච්ඡන්දය පුරුෂශබ්දය පුරුෂාලඞ්කාරය මෙනෙහි නො කරයි. ඕ එහි නො රැදෙයි. එහි අභිරමණය නො කරයි. ඕ එහි නො රැඳුනී එහි අනභිරත වූවා බාහිර සංයොගය නො කැමැති වෙයි. සංයොගප්‍රත්‍යයයෙන් ඈයට යම්බඳු සුවසොම්නසෙක් වේ නම් එය ද නො පතයි. මහණෙනි, ස්ත්‍රීභාවයෙහි අනභිරත වූ සත්ත්වයෝ පුරුෂයන් කෙරෙහි විසංයෝගයට ගියහ. මහණෙනි, මෙ සෙයින් ස්ත්‍රී ස්ත්‍රී භාවය ඉක්මවයි.

මහණෙනි, පුරුෂයා ආධ්‍යාත්මික පුරුෂෙන්ද්‍රිය පුරුෂක්‍රියා පුරුෂාකල්පය පුරුෂවිධාව පුරුෂච්ඡන්දය පුරුෂස්වරය පුරුෂාලඞ්කාරය මෙනෙහි නො කරයි. හෙ එහි නො රැදෙයි. එහි අභිරමණ නො කරයි. හෙ එහි නො රැඳියේ එහි අභිරත නො වූයේ ස්ත්‍රීන්ද්‍රිය ස්ත්‍රීක්‍රියා ස්ත්‍රී ආකල්පය ස්ත්‍රී විධාව ස්ත්‍රීච්ඡන්දය ස්ත්‍රීස්වරය ස්ත්‍රී අලඞ්කාරය මෙනෙහි නො කරයි. හෙ එහි නො රැදෙයි. එහි අභිරමණ නො කෙරෙයි. හෙ එහි නො රැඳියේ එහි අනභිරත වූයේ බාහිර සංයොගය නො පතයි. මහණෙනි, පුරුෂභාවයෙහි අනභිරත වූ සත්ත්වයෝ ස්ත්‍රීන් කෙරෙහි විසංයෝගයට ගියහ. මහණෙනි, මෙසෙයින් පුරුෂයා පුරුෂත්වය ඉක්මයෙයි.

මහණෙනි, මෙසෙයින් විසංයෝගය වෙයි.

මහණෙනි, මෙ සංයෝගවිසංයෝග නම් ධම්මපර්‍යාය යි.

## 7. 1. 5. 9

## [දානමහප්ඵල සුත්තං]

52. එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. අථ ඛො සම්බහුලා චම්පෙය්‍යකා උපාසකා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො චම්පෙය්‍යකා උපාසකා ආයස්මන්තං සාරිපුත්තං එතදවොචුං:

චිරස්සුතා නො භන්ත සාරිපුත්ත, භගවතො සම්මුඛා ධම්මීකථා. සාධු මයං භන්තෙ, ලභෙය්‍යාම භගවතො සන්තිකා ධම්මිං කථං සවණායාති.

තෙන හාවුසො තදහුපොසථෙ ආගච්ඡෙය්‍යාථ අප්පෙවනාම ලභෙය්‍යාථ භගවතො සම්මුඛා ධම්මිං කථං[1] සවණායාති. එවං භන්තෙති ඛො තෙ චම්පෙය්‍යකා උපාසකා ආයස්මතො සාරිපුත්තස්ස පටිස්සුත්වා උට්ඨායාසනා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

අථ ඛො තෙ චම්පෙය්‍යකා උපාසකා තදහුපොසථෙ යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු.

අථ ඛො ආයස්මා සාරිපුත්තො තෙහි චම්පෙය්‍යකෙහි උපාසකෙහි සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච:

සියා නු ඛො භන්තෙ, ඉධෙකච්චස්ස තාදිසංයෙව දානං දින්නං න මහප්ඵලං[2] න මහානිසංසං. සියා පන භන්තෙ, ඉධෙකච්චස්ස තාදිසංයෙව දානං දින්නං මහප්ඵලං[3] මහානිසංසන්ති.

සියා සාරිපුත්ත, ඉධෙකච්චස්ස තාදිසංයෙව දානං දින්නං න මහප්ඵලං[2] න මහානිසංසං. සියා පන සාරිපුත්ත, ඉධෙකච්චස්ස තාදිසංයෙව දානං දින්නං මහප්ඵලං[3] මහානිසංසන්ති.

කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙන ඉධෙකච්චස්ස තාදිසංයෙව දානං දින්නං න මහප්ඵලං හොති, න මහානිසංසං. කො පන භන්තෙ[4] හෙතු කො පච්චයො යෙන ඉධෙකච්චස්ස තාදිසංයෙව දානං දින්නං මහප්ඵලං හොති මහානිසංසන්ති?

1. භගවතො ධම්මිං කථං - සයා
2. න මහප්ඵලං හොති - මජ්ඣං
3. මහප්ඵලං හොති - මජ්ඣං.
4. කො නු ඛො භන්තෙ - මජ්ඣං.

7. 1. 5. 9.

[දානමහප්ඵල සූත්‍රය]

52. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ චම්පා නගරයෙහි ගග්ගරා නම් පොකුණු තෙර වාස කරන්නාහ. එකල්හි බොහෝ චම්පා නගර වැසි උපාසකයෝ ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවන් කරා පැමිණියහ. පැමිණ ආයුෂ්මත් සැරියුත් තෙරුන් වැඳ එකත්පස්හි හුන්හ. එකත්-පස්හි හුන් චම්පා නගරවාසී උපාසකයෝ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මෙය කීහ:

“වහන්ස, ශාරීපුත්‍රයෙනි, අප විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් දැහැමි කථායෙක් ඇසූ බොහෝ කලි. වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි දැහැමි කථාවක් අසන්නට ලබමෝ නම් මැනැවැ”යි

ඇවැත්නි, එකරුණෙන් පොහෝලත් ඒ දවස්හි එව, භාග්‍යවතුන් වහන්සේ හමුවෙන් දැහැමි කථාවක් අසන්නට ලබන්නාහු නම් මැනැවැයි. වහන්ස, එසේ යැයි ඒ චම්පෙය්‍යක උපාසකයෝ ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරුන්ට පිළිවදන් අස්වා හුනස්නෙන් නැගී ආයුෂ්මත් සැරියුත් තෙරුන් වැඳ පැදකුණු කොට නික්ම ගියහ.

එකල්හි ඒ චම්පා නගරවැසි උපාසකයෝ පොහෝලත් ඒ දවස්හි ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා පැමිණියහ. පැමිණ ආයුෂ්මත් සාරිපුත්ත තෙරුන් සකසා වැඳ එකත්පස් ව සිටගත්හ.

එක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ඒ චම්පා නගරවැසි උවසුවන් හා සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කාරුණ සැල කළහ:

වහන්ස, මෙ ලොව්හි ඇතැමකු විසින් දෙනලද මහත්ඵල නො වන මහානිසංස නො වන එබඳු (එක් සමාන) දානයෙක් වන්නේ ද, වහන්ස, මෙ ලොව්හි ඇතැමකු විසින් දෙනලද මහත්ඵල වන මහානිසංස වන එබඳු දානයෙක් ඇත් දැයි.

ශාරීපුත්‍රයෙනි, මෙ ලොව්හි ඇතැම් පුගුලකු විසින් දෙනලද මහත්-ඵල නොවන මහානිසංස නො වන එබඳු දානයෙක් ඇත. ශාරීපුත්‍රයෙනි, මේ ලොව්හි, ඇතැම් පුගුලකු විසින් දෙනලද මහත්ඵල වන මහානිසංස වන එබඳු දානයෙක් ද ඇතැයි.

වහන්ස, මේ ලොව්හි ඇතැම් පුගුලකු විසින් දෙනලද එබඳු දානයෙක් යම් හෙයකින් මහත්ඵල මහනිසංස නො වන්නේ නම්, ඒ හේතු කවරේ ද, ඒ ප්‍රත්‍යය කවරේ ද? වහන්ස, මේ ලොව්හි ඇතැම් පුගුලකු විසින් දෙන ලද එබඳු දානය යම් හෙයෙකින් මහත්ඵල මහානිසංස වේ නම්, ඒ හේතු කවරේ ද, ඒ ප්‍රත්‍යය කවරේ දැ?යි.

(1) ඉධ සාරිපුත්ත, එකච්චො සාපෙක්ඛො[1] දානං දෙති, පටිබද්ධචිත්තො දානං දෙති, සන්නිධිපෙක්ඛො දානං දෙති, ඉමං පෙච්ච පරිභුඤ්ජිස්සාමීති දානං දෙති. සො තං දානං දෙති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා, අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාසථපදීපෙය්‍යං.

තං කිං මඤ්ඤසි සාරිපුත්ත, දදෙය්‍ය ඉධෙකච්චො එවරූපං දානන්ති. එවං භන්තෙ.

තත්‍ර සාරිපුත්ත, ය්වායං සාපෙක්ඛො[1] දානං දෙති, පටිබද්ධචිත්තො දානං දෙති, සන්නිධිපෙක්ඛො දානං දෙති, ඉමං පෙච්ච පරිභුඤ්ජිස්සාමීති දානං දෙති. සො තං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. සො තං කම්මං ඛෙපෙත්වා තං ඉද්ධිං තං යසං තං ආධිපතෙය්‍යං[2] ආගාමී හොති ආගන්තා ඉත්ථත්තං.

(2) ඉධ පන සාරිපුත්ත, එකච්චො න හෙව ඛො සාපෙක්ඛො දානං දෙති, න පටිබද්ධචිත්තො දානං දෙති, න සන්නිධිපෙක්ඛො දානං දෙති, න ඉමං පෙච්ච පරිභුඤ්ජිස්සාමීති දානං දෙති. අපි ච ඛො සාහු දානන්ති දානං දෙති -පෙ-

(3) නපි සාහු දානන්ති දානං දෙති -පෙ- අපි ච ඛො දින්නපුබ්බං කතපුබ්බං පිතුපිතාමහෙහි, නාරහාමි පොරාණංකුලවංසං හාපෙතුන්ති දානං දෙති -පෙ-

(4) නපි දින්නපුබ්බං කතපුබ්බං පිතුපිතාමහෙහි, නාරහාමි පොරාණං කුලවංසං හාපෙතුන්ති දානං දෙති. අපි ච ඛො අහං පචාමි, න ඉමෙ පචන්ති, නාරහාමි පචන්තො අපචන්තානං අදාතුන්ති දානං දෙති පෙ-

(5) නපි අහං පචාමි ඉමෙ න පචන්ති, නාරහාමි පචන්තො අපචන්තානං දානං අදාතුන්ති දානං දෙති -පෙ- අපි ච ඛො යථා තෙසං පුබ්බකානං ඉසීනං තානි මහායඤ්ඤානි අහෙසුං, සෙය්‍යථීදං: අට්ඨකස්ස වාමකස්ස වාමදෙවස්ස වෙස්සාමිත්තස්ස යමතග්ගිනො අඞ්ගීරසස්ස භාරද්වාජස්ස වාසෙට්ඨස්ස කස්සපස්ස භගුනො, එවං මෙ අයං දානසංවිභාගො භවිස්සතීති දානං දෙති -පෙ-

(6) නපි යථා තෙසං පුබ්බකානං ඉසීනං තානි මහායඤ්ඤානි අහෙසුං, සෙය්‍යථීදං: අට්ඨකස්ස වාමකස්ස වාමදෙවස්ස වෙස්සාමිත්තස්ස යමතග්ගිනො අඞ්ගීරසස්ස භාරද්වාජස්ස වාසෙට්ඨස්ස කස්සපස්ස භගුනො, එවං මෙ අයං දානසංවිභාගො භවිස්සතීති දානං දෙති. අපි ච ඛො ඉමං මෙ දානං දදතො චිත්තං පසීදති, අත්තමනතා සොමනස්සං උපජායතීති[3] දානං දෙති -පෙ-

(7) නපි ඉමං මෙ දානං දදතො චිත්තං පසීදති, අත්තමනතා සොමනස්සං උපජායතීති දානං දෙති, අපි ච ඛො චිත්තාලංකාරං චිත්තපරික්ඛාරත්ථං දානං දෙති. සො තං දානං දෙති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා, අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං.

තං කිං මඤ්ඤසි සාරිපුත්ත, දදෙය්‍ය ඉධෙකච්චො එවරූපං දානන්ති: එවං භන්තෙ.

---

1 සාපෙක්ඛා - සං. 2 ආධිපච්චං - මජ්ඣං. 3 උපපාදියති - සීමු

(1) ශාරිපුත්‍රයෙනි, මෙ ලොව්හි ඇතැමෙක් සාපෙක්‍ෂ (තෘෂ්ණා සහිත) වූයේ දන් දෙයි. විපාකයෙහි පිළිබැඳියේ දන් දෙයි සන්නිධිය පතනුයේ (නිධන් කරණ අදහස් ඇතියේ) දන් දෙයි. 'මෙය පරලොව්හි දී පරිභොග කරන්නෙමි' යි දන් දෙයි. හෙ ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයකුට හෝ අන්න, පාන, වස්ත්‍ර, යාන, මාලාගන්ධවිලෙපන, සයන, ආවස හා ප්‍රදීපොපකරණ යන එබඳු දනක් දෙයි.

සාරිපුත්තයෙනි, එ කිමැයි හඟිව්හු ද, මෙලොව ඇතැම් පුගුලෙක් මෙ බඳු දන් දෙන්නේ දැ? යි. වහන්ස, එසේ යි.

ශාරීපුත්‍රයෙනි, එහි යම් මෙ පුගුලෙක් සාපෙක්‍ෂ ව දන් දේ නම්, පිළිබඳ සිතැතියේ දන් දේ නම් සන්නිධිය පතනුයේ දන් දේ නම්, 'මෙය පරලොව්හි පරිභොග කරමි'යි දන් දේ නම්, හෙ එදන් දී කාබුත් මරණින් මතු සිවුම්හරද වැසියන්ගේ සහභාවයට පැමිණෙයි. හෙ එ කම් (විපාකය) එ සෘද්ධිය එ යශස් එ අධිපතිබව් ගෙවා මේ මිනිසත් බවට එන සුලු වූයේ ආගාමී (හීන) වෙයි.

(2) ශාරිපුත්‍රයෙනි, මෙ ලෙව්හි ඇතැම් පුගුලෙක් සාපෙක්‍ෂ වූයේ දන් නො ම දෙයි. පිළිබඳ සිතැත්තේ දන් නො ම දෙයි. සන්නිධි අපෙක්‍ෂා ඇතියේ දන් නො ම දෙයි. 'මෙය පරලොව්හි දී පරිභොග කරමි' දන් නො ම දෙයි. වැලිත් 'දනය මනා ය'යි දන් දෙයි ...

(3) "දනය මැනැවයි නො ද දන් දෙයි ... වැලිත් මාතා පිතෘන් විසින් ද පිතාමහයන් විසින් ද දෙනලදව්රැ ය. කරණලදව්රැ ය, පැරැණි කුලවංශයට අයත් සිරිත පිරිහෙළන්නට නො සුදුස්සෙමි"යි දන් දෙයි ...

(4) "පිය, මුතුන් විසින් දෙනලදව්රැ ය, කළව්රැ ය, කුලවත් සිඳුනට නො නිස්සෙමි" දන් නො ද දෙයි. වැලිත් "මම අහර පිසමි. මොහු අහර නො පිසත්. පිසනුයෙම් නො පිසනුවනට නො දෙන්නට නො නිසියෙම්"යි දන් දෙයි ...

(5) "මම පිසමි, මොහු නො පිසත්නාහ. පිසනුයෙම් නො පිසනුවනට නො දෙන්නට නො නිස්සෙමි"යි ද දන් නො දෙයි. වැලිත් අට්ටක ය, වාමක ය, වාමදෙව ය, වෙස්සාමිත්ත ය, යමතග්ගි ය, අඞ්ගීරස ය, භාරද්වාජ ය, වාසෙට්ඨ ය, කස්සප ය, භගු ය, යන එ ප්‍රසිද්ධ පූර්වකාලීන සෘෂීන්ගේ මහායඥයෝ යම් පරිදි වූහු නම් එ පරිද්දෙන් මාගේ මෙ දනය ද දානසං-විභාගයෙක් වන්නේ ය යි දන් දෙයි ...

(6) "යම් පරිදි අට්ටක ය, වාමක ය, වාමදෙව ය, වෙස්සාමිත්ත ය, යමතග්ගි ය, අඞ්ගීරස ය, භාරද්වාජ ය, වාසෙට්ඨ ය, කස්සප ය, භගු ය, යන මෙ බඳු පූර්වක වූ එ ප්‍රසිද්ධ සෘෂීන්ගේ මහායඥයෝ වූහු නම්, මාගේ මෙ දානසංවිභාගය ද එබඳු වන්නේ ය'යි දන් නො දෙයි. වැලිදු "මෙ දනය දෙන මාගේ චිත්තය ප්‍රසන්න වන්නේ ය, අත්තමනතායෙන් ප්‍රීති-සෞමනස්‍යය ලබන්නේ යයි දන් දෙයි ...

(7) "මෙ දන් දෙන මාගේ චිත්තය පහන් වන්නේ ය, අත්තමනතා-යෙන් සොම්නස් උපදනේ"යයි දන් නො දෙයි. 'වැලිත් (සමථ-විපස්සනා චිත්තයට)චිත්තාලඞ්කාරයෙකැයි ද චිත්ත පරිෂ්කාරයෙකැ'යි ද දන් දෙයි. හෙ මහණකුට වේවයි බමුණකුට වේවයි අන්න ය, පාන ය, වස්ත්‍ර ය, යාන ය, මාලාගන්ධවිලෙපන ය, ශයනාවසථ ය ප්‍රදීපොපකරණ යන එ දන් දෙයි.

ශාරිපුත්‍රය, එ කිමැයි හඟිව්හු ද? මෙලොව්හි ඇතැමෙක් මෙබඳු දන් දෙන්නේ දැ? යි. වහන්ස, එසේ ය.

තත්‍ර සාරිපුත්ත, යවායං න හෙව ඛො සාපෙක්ඛො දානං දෙති - න පටිබද්ධචිත්තො දානං දෙති - න සන්නිධිපෙක්ඛො දානං දෙති - න ඉමං පෙච්ච පරිභුඤ්ජිස්සාමීති දානං දෙති - නපි සාධු දානන්ති දානං දෙති - නපි දින්නපුබ්බං කතපුබ්බං පිතුපිතාමහෙහි, නාරහාමි පොරාණං කුලවංසං හාපෙතුන්ති දානං දෙති - අහං පචාමි ඉමෙ න පචන්ති නාරහාමි පචන්තො අපචන්තානං දානං අදාතුන්ති දානං දෙති - නපි යථා තෙසං පුබ්බකානං ඉසීනං තානි මහායඤ්ඤානි අහෙසුං, සෙය්‍යථීදං: අට්ඨකස්ස වාමකස්ස වාමදෙවස්ස වෙස්සාමිත්තස්ස යමතග්ගිනො අඞ්ගීරසස්ස භාරද්වාජස්ස වාසෙට්ඨස්ස කස්සපස්ස භගුනො, එවං මෙ අයං දානසංවිභාගො භවිස්සතීති දානං දෙති - නපි ඉමං මෙ දානං දදතො චිත්තං පසීදති, අත්තමනතා සොමනස්සං උපජායතීති[1] දානං දෙති -

අපි ච ඛො චිත්තාලංකාරං චිත්තපරික්ඛාරන්ති[2] දානං දෙති. සො තං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. සො තං කම්මං ඛෙපෙත්වා තං ඉද්ධිං තං යසං තං ආධිපතෙය්‍යං අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං.

අයං ඛො සාරිපුත්ත හෙතු අයං පච්චයො, යෙන මිධෙකච්චස්ස තාදිසංයෙව දානං දින්නං න මහප්ඵලං හොති, න මහානිසංසං.

අයං පන සාරිපුත්ත, හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චස්ස තාදිසං-යෙව දානං දින්නං මහප්ඵලං හොති මහානිසංසන්ති.

### 7. 1 5. 10.

### [නන්දමාතු සුත්තං]

53. එවමෙම සුතං: එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාමොග්ගල්ලානො දක්ඛිණාගිරිස්මිං චාරිකං චරන්ති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. තෙන ඛො පන සමයෙන වෙළුකණ්ටකී නන්දමාතා උපාසිකා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය පාරායණං සරෙන භාසති.

තෙන ඛො පන සමයෙන වෙස්සවණො මහාරාජා උත්තරාය දිසාය[3] දක්ඛිණං දිසං ගච්ඡති කෙනචිදෙව කරණීයෙන. අස්සොසි ඛො වෙස්සවණො මහාරාජා නන්දමාතාය උපාසිකාය පාරායණං සරෙන භාසන්තියා. සුත්වා කථාපරියොසානං ආගමයමානො අට්ඨාසි. අථ ඛො නන්දමාතා උපාසිකා පාරායණං සරෙන භාසිත්වා තුණ්හී අහොසි.

අථ ඛො වෙස්සවණො මහාරාජා නන්දමාතාය උපාසිකාය කථා-පරියොසානං විදිත්වා අබ්භනුමොදි: සාධු භගිනි, සාධු භගිනීති.

කො පනෙස භද්‍රමුඛාති.

අහං තෙ භගිනී භාතා වෙස්සවණො මහාරාජාති.

සාධු භද්‍රමුඛ, තෙන හි යො මෙ අයං ධම්මපරියායො භණිතො, ඉදන්තෙ හොතු ආතිථෙය්‍යන්ති.

සාධු භගිනි, එතං චෙව මෙ හොතු ආතිථෙය්‍යං: සෙව ච සාරිපුත්ත මොග්ගල්ලානපමුඛො භික්ඛුසඞ්ඝො අකතපාතරාසො වෙළුකණ්ඩකං ආගමිස්සති. තඤ්ච භික්ඛුසඞ්ඝං පරිවිසිත්වා මම දක්ඛිණං ආදිසෙය්‍යාසි. එවඤ්ච මෙ භවිස්සති ආතිථෙය්‍යන්ති.

---

1 උපජායතීති - මජ්ඣං, උපපාදියතීති-සිමු. 2 චිත්තාලංකාරචිත්තපරික්ඛාරං - මජ්ඣං
3 උත්තරදිසාය - සිමු

ශාරිපුත්‍රයෙනි, ඔවුනතුරෙහි යම් මේ පුද්ගලයෙක් සාපෙක්‍ෂ වූයේ දන් නො ම දේ ද - පිළිබද්ධ සිත් ඇතියේ දන් නො දේ ද - සන්නිධියෙහි අපෙක්‍ෂා ඇතියේ දන් නො දේ ද - මෙය පරලොව්හි පිරිබෙමි කරමි'යි දන් නො දේ ද - දානය සාධු යැයි දන් නො දේ ද - පියමුතුන් විසින් දෙනලදවිරූ ය, කළවිරූ ය, පැරණි කුලවංශය නසන්නට නො නිස්සෙමියි දන් නො දේ ද - මම පිසමි මොහු නො පිසත්, පිසනුයෙම් නො පිසනුවනට නො දෙන්නට නො නිස්සෙමියි ද දන් නො දේ ද - අට්ටක ය, වාමක ය, වාමදේව ය, වෙස්සාමිත්‍ර ය, යමතග්ගි ය, අංගීරස ය, භාරද්වාජ ය, වාසෙට්ඨ ය, කස්සප ය, භගු ය, යන මේ පූර්වක ඍෂීන්ගේ යම්බඳු මහායාගයෝ වූහු නම්, මාගේ මේ දානය ද එබඳු සංවිභාගයෙක් වන්නේ යයි ද දන් නො දේ ද - මේ දන් දෙන මාගේ චිත්තය ප්‍රසන්න වන්නේ ය, තුටුසිත සොම්නස උපදනේ යයි ද දන් නො දේ ද -

එතෙකුදු වුව (සමථවිපස්සනා) චිත්තයට අලංකාර යයි ද චිත්ත-පරිෂ්කාරයයි ද කියා දන් දේ ද, හෙ එසේ දන් දී කාබුන් මරණින් මතු බ්‍රහ්මකායික දෙවියන්ගේ සහභාවයට යෙයි. හෙ එ කම්, එ සෘද්ධි, එ යශස්, එ ආධිපත්‍ය ය ගෙවා මේ මිනිසත් බවට නො එනසුලු වූයේ අනාගාමී වෙයි.

ශාරිපුත්‍රයෙනි, යම් හෙයකින් මෙලොව්හි ඇතැම්කු විසින් දෙනලද එබඳු දානයෙක් මහත්ඵල මහානිසංස නොවේ නම්, මේ එයට හේතු ය මේ ප්‍රත්‍යය යි.

ශාරිපුත්‍රයෙනි, යම්හෙයකින් මෙලොව්හි ඇතැම්කු විසින් දෙනලද එබඳු දානයෙක් මහත්ඵල වේ නම්, මහානිසංස වේ නම්, මේ එයට හේතු ය, මේ ප්‍රත්‍යය යි.

## 7. 1. 5. 10.

## [නන්දමාතු සූත්‍රය]

60. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ ද ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ද මහ භික්ෂුසඞ්ඝයා හා සමග දක්ෂිණාගිරියෙහි හැසිරෙත්නාහ. එසමයෙහි වේළුකණ්ටකී නන්දමාතා උපාසිකාවෝ රාත්‍රියෙහි පැසිම්යමෙහි නැගී 'පාරායණධර්ම'ය (නිර්වාණගාමිමාර්ග ධර්මය) මධුර ස්වරයෙන් කියන්නාහ.

එසමයෙහි වෙස්සවණ මහරජ කිසියම් කිසෙකින් උතුරුදිගින් දකුණු-දිගට යෙයි. වෙස්සවණ මහරජ නන්දමාතා උවැසිය විසින් මධුරස්වරයෙන පාරායණධර්මය කියනු ඇසී ය. අසා ධර්මකථාපර්යවසානය බලමින් සිටියේ ය. එක්බිති නන්දමාතා උපාසිකාව පාරායණධර්මය ස්වරයෙන් කියා තුෂ්ණීම්භූත වූ ය.

එකල්හි වෙසවුණු මහරජ නන්දමාතා උපාසිකාවගේ කථාපර්යව-සානය දැන 'මැනැව් බුහුන, මැනැව් බුහුනැ'යි සතුටින් අනුමෝදන් විය.

භද්‍රමුඛයෙනි, තෙලෙ කවරෙක් දැයි?

''බුහුන, මම තොප බෑ වෙස්සවණමහරජ වෙමි'යි.

''භද්‍රමුඛයෙනි, එකරුණින් ම මා විසින් යම්බඳු මේ ධර්මපර්යායෙක් කියනලද නම්, මෙය තොපට අතිථි (අගනුග) පඬුරක් වේවා'යි.

''බුහුනනියෙනි, මැනැවැ, තෙල පිඟ ද මට අතිථිපඬුර වේවා: සෙටදවස ප්‍රාතරාස නො කළ සැරියුත්මුගලන් පාමොක් භික්ෂුසඞ්ඝයා වේළුකණ්ටකයට වඩනාහ. එ භික්ෂුසඞ්ඝයා ද වළඳවා මට දක්ෂිණා (පින්) දෙව මේ සේද මට අතිථිපඬුර වන්නේය යි.

අථ ඛො නන්දමාතා උපාසිකා තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙසි. අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛො භික්ඛුසඞ්ඝො අකතපාතරාසො යෙන වෙළුකණ්ඩකො තදවසරි.

අථ ඛො නන්දමාතා උපාසිකා අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: එහි ත්වං අම්භො පුරිස, ආරාමං ගන්ත්වා භික්ඛුසඞ්ඝස්ස කාලං ආරොචෙහි: 'කාලො භන්තෙ, අය්‍යාය නන්දමාතුයා නිවෙසනෙ නිට්ඨිතං භත්ත'න්ති. එවං අය්‍යෙ'ති ඛො සො පුරිසො නන්දමාතාය උපාසිකාය පටිස්සුත්වා ආරාමං ගන්ත්වා භික්ඛුසඞ්ඝස්ස කාලං ආරොචෙසි: 'කාලො භන්තෙ, අය්‍යාය නන්දමාතුයා නිවෙසනෙ නිට්ඨිතං භත්ත'න්ති'.

අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛො භික්ඛුසඞ්ඝො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන නන්දමාතුයා උපාසිකාය නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තාසනෙ නිසීදි.

අථ ඛො නන්දමාතා උපාසිකා සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො නන්දමාතා උපාසිකා ආයස්මන්තං සාරිපුත්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො නන්දමාතරං උපාසිකං ආයස්මා සාරිපුත්තො එතදවොච:

කො පන තෙ නන්දමාතෙ, භික්ඛුසඞ්ඝස්ස අබ්භාගමනං ආරොචෙසීති.

ඉධාහං භන්තෙ, රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය පාරායණං සරෙන භාසිත්වා තුණ්හී අහොසිං. අථ ඛො භන්තෙ, වෙස්සවණො මහාරාජා මම කථාපරියොසානං විදිත්වා අබ්භානුමොදි 'සාධු භගිනී, සාධු භගිනී'ති.

කො පනෙසො භද්දමුඛාති. අහං තෙ භගිනි, භාතා වෙස්සවණො මහාරාජා.

සාධු භද්දමුඛ, තෙන හි යො මෙ අයං ධම්මපරියායො භණිතො, ඉදං තෙ හොතු ආතිථෙය්‍යන්ති. සාධු භගිනි, එතඤ්චෙව මෙ හොතු ආතිථෙය්‍යං: ස්වෙ ච සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛො භික්ඛුසඞ්ඝො අකතපාතරාසො වෙළුකණ්ඩකං ආගමිස්සති. තඤ්ච භික්ඛුසඞ්ඝං පරිවිසිත්වා මම දක්ඛිණං ආදිසෙය්‍යාසි. එතඤ්ච මෙ භවිස්සති ආතිථෙය්‍යන්ති. යදිදං භන්තෙ, දානෙ පුඤ්ඤං හි තං[1] වෙස්සවණස්ස මහාරාජස්ස සුඛාය හොතූති.

(1) අච්ඡරියං නන්දමාතෙ, අබ්භුතං නන්දමාතෙ, යත්‍ර හි නාම වෙස්සවණෙන මහාරාජෙන එවං මහිද්ධිකෙන එවං මහෙසක්ඛෙන දෙවපුත්තෙන සම්මුඛා සල්ලපිස්සසීති.

(2) න ඛො මෙ භන්තෙ, එසොව අච්ඡරියො අබ්භුතො ධම්මො. අත්ථි මෙ අඤ්ඤොපි අච්ඡරියො අබ්භුතො ධම්මො:

ඉධ මෙ භන්තෙ නන්දො නාම[2] එකො පුත්තකො පියො මනාපො. තං රාජානො කිස්මිඤ්චිදෙව පකරණෙ ඔක්කස්ස පසය්හ ජීවිතා වොරොපෙසුං. තස්මිං ඛො පනාහං භන්තෙ, දාරකෙ ගහිතෙ වා ගය්හමානෙ වා බද්ධෙ වා වජ්ඣමානෙ වා හතෙ වා හඤ්ඤමානෙ වා නාභිජානාමි චිත්තස්ස අඤ්ඤථත්තන්ති.

---

1 පුඤ්ඤං පුඤ්ඤමහිතං - මජසං, පුඤ්ඤමහං -PTS. පුඤ්ඤමහිතං - සයා.
2 නන්දකො නාම - සිමු.

Free Distribution www.aathaapi.org

එකල්හි නන්දමාතා උපාසිකාවෝ එරැය ඇවෑමෙන් සිය නිවෙස්හෙහි ප්‍රණීත ඛාදනීය හා භෝජනීය පිළියෙල කරවූ ය. එක්බිති උදෑසන බත නො වැළඳූ සැරියුත්මුගලන්පාමොක් භික්සඟහු වෙළුකණ්ටක නගරයට වැඩියහ.

එකල්හි නන්දමාතා උවැසි එක්තරා පුරුෂයකු ඇමතූ ය: එම්බා පුරුෂය එව, තෝ අරමට ගොස් "වහන්ස, ආර්‍ය්‍යා නන්දමාතාවගේ නිවෙස්හෙහි බත් නිමවනලදැ"යි භික්සඟනට කල් දන්වාල යි. එ පුරිස් "එසේය, ආර්‍ය්‍යාවෙනි" යි නන්දමාතා උවැසියට පිළිවදන් අස්වා ආරාමයට ගොස් "වහන්ස ආර්‍ය්‍යා නන්දමාතාවගේ නිවෙස්හෙහි බත නිමවනලදැයි" භික්‍ෂුසඞ්ඝයාට කල් දැන්වී ය.

එකල්හි ශාරිපුත්‍රමෞද්ගල්‍යායන ප්‍රමුඛ භික්සඟහු පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ නන්දමාතා උපාසිකාවගේ නිවෙස්නට වැඩියහ. වැඩ පනවනලදඅස්හෙහි හුන්හ.

එකල්හි නන්දමාතා උවැසි සැරියුත්මුගලන්පාමොක් භික්සඟුන් ප්‍රණීත ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් සෑතැප්වූ ය, පැවැරූ ය. එක්බිති නන්දමාතා උපාසිකා දන් වළඳා පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති ආයුෂ්මත් සැරියුත් තෙරුන් වෙත එකත්පස්හි හුන්නා. එකත්පස්හි හුන් නන්දමාතා උවැසියට ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල වදාළහ:

නන්දමාතාවෙනි, තට භික්සඟුන්ගේ ආගමනය කවරෙක් දැන්වී ද යි.

වහන්ස, මෙහි මම රෑ පැසිමියම යහනින් නැගී පාරායණසූත්‍රධර්මය මධුරස්වරයෙන් කියා තුෂ්ණීම්භූත වීමි. වහන්ස, එකල්හි වෙසවුණු මහරජ මාගේ ධර්මකථා පර්‍ය්‍යවසානය දැන, බුහුන, මැනැවි, බුහුන, මැනැවි'යි සතුටින් අනුමෝදන් විය.

'භද්‍රමුඛයෙනි, තෙලෙ කවරෙක් දැ'යි. 'බුහුනනියෙනි, මම තීගේ භ්‍රාතෘ වූ වෛශ්‍රවණ මහරජ වෙමි'.

භද්‍රමුඛයෙනි, මැනැව, එකරුණින් ම මා විසින් යම් මේ ධර්මපර්‍ය්‍යායෙක් කියනලද නම්, මෙය තොපට අතිථිපඬුර වේවයි. බුහුනනියෙනි මැනැව, තෙල ද මට අතිථිපඬුර වේවා: සෙට දවස සැරියුත් මුගලන් පාමොක් භික්සඟහු නො කල උදෑසන බොජුන් ඇතියාහු වෙළුකණ්ටකයට වඩනාහ. එ භික්සඟුනුදු වළඳවා මට දක්ෂිණා (පින්) දෙව, තෙල ද මට අතිථිපඬුර වන්නේ ය යි. වහන්ස, "මේ දන්හි යම් පුණ්‍යයෙක් වේ නම් එ ම වෙසවුණු මහරජුට සුව පිණිස වේවා" යි.

(1) නන්දමාතාවෙනි, ආශ්චර්‍ය්‍ය යි. නන්දමාතාවෙනි, අද්භූත යි. යම් හෙයෙකින් මෙ බඳු මහත් සෘද්ධි ඇති, මෙ බඳු මහේශාක්‍ය වූ දෙව්පුත්වන වෙසවුණු මහරජු සමඟත් හමුයෙහි සංලාප කෙරෙති යන මෙය අද්භූත යි.

(2) වහන්ස, තෙල කරුණ ම මාගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙක් නො වේ. මාගේ අනෙකුදු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙක් ඇත:

වහන්ස, මෙහි මට ප්‍රිය වූ මනවඩන්නා වූ නන්ද නම් වූ එක ම පුතෙක් විය. රජහු කිසියම් කරුණක් නිමිති කොට ඔහු බලහත්කාරයෙන් හැඳ මැඩ දිවියෙන් තොර කළහ. වහන්ස, එ දරු අල්ලාගත් කල්හි හෝ අල්ලා ගණුලබන කල්හි හෝ දඟගෙහි බඳනාලද කල්හි හෝ වධයට පත් කරණු ලබන කල්හි හෝ නසනලද කල්හි හෝ නසනුලබන කල්හි හෝ මාගේ චිත්තයාගේ අන්‍යථාත්වයෙක් (වෙනසක් වූ බවක්) නො ම දනිමි යි.

අච්ඡරියං නන්දමාතෙ, අබ්භුතං නන්දමාතෙ, යත්‍ර හි නාම චිත්තුප්පාදම්පි පරිසොධෙස්සතීති.

(3) න ඛො මෙ භන්තෙ, එසොව අච්ඡරියො අබ්භුතො ධම්මො. අත්ථි මෙ අඤ්ඤොපි අච්ඡරියො අබ්භුතො ධම්මො:

ඉධ මෙ භන්තෙ, සාමිකො කාලකතො අඤ්ඤතරං යක්ඛයොනිං උපපන්නො.[1] සො මෙ තෙනෙව පුරිමෙන අත්තභාවෙන උද්දස්සෙසි. න ඛො පනාහං භන්තෙ, අභිජානාමි තතො නිදානං චිත්තස්ස අඤ්ඤථත්තන්ති.

අච්ඡරියං නන්දමාතෙ, අබ්භුතං නන්දමාතෙ, යත්‍ර හි නාම චිත්තුප්පාදම්පි පරිසොධෙස්සතීති.

(4) න ඛො මෙ භන්තෙ, එසොව අච්ඡරියො අබ්භුතො ධම්මො. අත්ථි මෙ අඤ්ඤොපි අච්ඡරියො අබ්භුතො ධම්මො:

යතොහං භන්තෙ, සාමිකස්ස දහරස්සෙව දහරා ආනීතා, නාභිජානාමි සාමිකං මනසාපි අතිචරිතා, කුතො පන කායෙනාති.

අච්ඡරියං නන්දමාතෙ, අබ්භුතං නන්දමාතෙ, යත්‍ර හි නාම චිත්තුප්පාදමත්තම්පි පරිසොධෙස්සතීති.

(5) න ඛො මෙ භන්තෙ, එසොව අච්ඡරියො අබ්භුතො ධම්මො. අත්ථි මෙ අඤ්ඤොපි අච්ඡරියො අබ්භුතො ධම්මො:

යදාහං භන්තෙ, උපාසිකා පටිදෙසිතා, නාභිජානාමි කිඤ්චි සික්ඛාපදං සඤ්චිච්ච වීතික්කමිතාති.

අච්ඡරියං නන්දමාතෙ, අබ්භුතං නන්දමාතෙති.

(6) න ඛො මෙ භන්තෙ, එසොව අච්ඡරියො අබ්භුතො ධම්මො. අත්ථි මෙ අඤ්ඤොපි අච්ඡරියො අබ්භුතො ධම්මො:

ඉධාහං භන්තෙ, යාවදෙව[2] ආකඞ්ඛාමි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං[3] පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. පීතියා ච විරාගා උපෙක්ඛකා ච විහරාමි, සතා ච සම්පජානා සුඛඤ්ච කායෙන පටිසංවෙදෙමි. යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි.

1. යක්ඛයොනියං උපපන්නො - සීමු. 2. යාවදෙ - මජසං.
3. විවෙකජං - මජසං.

නන්දමාතාවෙනි, ආශ්චර්‍ය්‍ය යි. නන්දමාතාවෙනි, අද්භූත යි. නන්දමාතාවෙනි, යම් කරුණෙක්හි චිත්තෝත්පාදය ද පිරිසිදු කරන්නේ ය යන මේය අද්භූත යි

(3) වහන්ස, මෙතෙක් ම මාගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය නො වේ. මාගේ අනෙකුදු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙක් ඇත:

වහන්ස, මෙහි මාගේ හිමි කළුරිය කෙළේ අන්‍යතර යක්‍ෂයෝනියෙක්හි උපන. හෙ එ පලමු අත් බැව්හි (ස්වරූපයෙන්) ම මට තමා දක්වන්නේ ය. වහන්ස, එ හෙතුයෙන් මම චිත්තයාගේ අන්‍යථාත්වයක් නො ම දන්මි යි.

නන්දමාතාවෙනි, ආශ්චර්‍ය්‍ය යි. නන්දමාතාවෙනි, අද්භූත යි. නන්දමාතාවෙනි යම් කරුණෙක්හි චිත්තෝත්පාදය ද පිරිසිදු කරන්නේ ය යන මේය අද්භූත යි.

(4) වහන්ස, මාගේ මේ මතු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය නො වේ. මාගේ අනෙකුදු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙක් ඇත:

වහන්ස, ළදරු වූ ම හිමිහු විසින් යම් කලෙක ළදරු වූ ම මා ආවාහ විවාහයෙන් ගෙණ එතැන්හි සිට මා සැමියා ඉක්ම අනෙකකු පැතුවා නො දන්මි, කයින් වනාහි කවර නම් කථාවෙක් දැයි.

නන්දමාතාවෙනි, ආශ්චර්‍ය්‍ය ය නන්දමාතාවෙනි, අද්භූත ය නන්දමාතාවෙනි, යම්කරුණෙක්හි චිත්තෝත්පාදමාත්‍රය පවා පිරිසිදු කරන්නේ ය යන මේය අද්භූත යි.

(5) වහන්ස, මාගේ මෙතෙක් මතු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය නො ම වෙයි. මාගේ අනෙකුදු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙක් ඇත:

වහන්ස, මම යම්කලෙක පිළිගත් කල උපාසිකා වූම් නම් කිසිදු ශික්‍ෂාපදයක් දැන දැන මැඩුවා නො ම දන්මි යි.

නන්දමාතාවෙනි, ආශ්චර්‍ය්‍ය යි නන්දමාතාවෙනි, අද්භූත යි.

(6) වහන්ස, මේ මතු මාගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය නො වේ මැ යි. අනෙකුදු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙක් ඇත:

වහන්ස, මම මෙ බුදුසස්නෙහි කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම යම්තාක් කැමැති වෙම් නම් (එතාක්) සවිතර්ක වූ සවිචාර වූ විවේකයෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ප්‍රථමධ්‍යානයට එළඹ වෙසෙමි. විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම ඇති, චිත්තයාගේ එකඟබව ඇති විතර්ක රහිත විචාර රහිත ප්‍රථමධ්‍යානයෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ද්විතීය ධ්‍යානයට එළඹ වෙසෙමි. ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්‍ෂා ඇති ව සමෘති ඇති ව සම්‍යක් ප්‍රඥ ඇති ව වසමි. සුඛය ද නාමකායෙන් විඳිමි. යම්කු ගෙණ ආර්‍ය්‍යයෝ උපෙක්‍ෂා ඇතියේ ස්මෘතිමත් වූයේ සුඛවිහාර ඇතියේ යයි කියත් නම් එ තෘතීය ධ්‍යානයට එළඹ වසමි. සුඛයාගේත් ප්‍රහාණයෙන් දුඃඛයාගේත් ප්‍රහාණයෙන් පූර්වයෙහි ම සොම්නස් දොම්නසුන්ගේ අස්තගමයෙන් දුක් නො වූ සැප නො වූ උපෙක්‍ෂායෙන් උපන් සමෘති පාරිශුද්ධි ඇති චතුර්ථ ධ්‍යානයට එළඹ වෙසෙමි.

අච්ඡරියං නන්දමාතෙ අබ්භුතං නන්දමාතෙති.

(7) න ඛො මෙ භන්තෙ එසොව[1] අච්ඡරියො අබ්භුතො ධම්මො. අත්ථි මෙ අඤ්ඤොපි අච්ඡරියො අබ්භුතො ධම්මො:

යානිමානි භන්තෙ, භගවතා දෙසිතානි පඤ්චොරම්භාගියානි සංයොජනානි, නාහං තෙසං කිඤ්චි අත්තනි අප්පහීනං සමනුපස්සාමි.

අච්ඡරියං නන්දමාතෙ, අබ්භුතං නන්දමාතෙති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො නන්දමාතරං උපාසිකං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමීති.

නන්දමාතුසුත්තං දසමං

මහායඤ්ඤවග්ගො[2] පඤ්චමො.

තස්සුද්දානං:

ඨිති පරික්ඛාරමග්ගි[3] යඤ්ඤං සඤ්ඤා පරා දුවෙ[4]
මෙථුනා සංයොගො දානං[5] නන්දමාතෙන තෙ දසා'ති.

පඨමො පණ්ණාසකො නිට්ඨිතො.[6]

1. එසෙව - මජසං, 2. මහාපුඤ්ඤවග්ගො - PTS.
3. චිත්තපරික්ඛාරං දෙව අග්ගි - සීමු. 4 අග්ගිසඤ්ඤා, ච ද්වෙ පරා - මජසං. අග්ගිසඤ්ඤා අපරා දුවෙ - සීමු. 5. මෙථුනා ච සංයොගො දානං - සීමු.
6 පණ්ණාසකො සමත්තො - මජසං.

නන්දමාතාවෙනි, ආශ්චර්යී යි, නන්දමාතාවෙනි, අද්භූත යි.

(7) ස්වාමීනි, මාගේ ආශ්චර්යී අද්භූත ධර්මය මෙපමණ පමණක් නො වේ. මාගේ අනෙකුදු ආශ්චර්යී අද්භූත ධර්මයෙක් ඇත:

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද යම්බඳු මේ පඤ්චාවරම්භාගිය සංයෝජන කෙනෙක් වෙත් නම්, මම ඔවුන්ගෙන් තමා තුල අප්‍රහීණ වූ කිසිදු සංයෝජනයක් නො දක්මි යි.

නන්දමාතාවෙනි, ආශ්චර්යී යි, නන්දමාතාවෙනි, අද්භූත යි.

එක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ නන්දමාතා උපාසිකාව ධාර්මික කථායෙන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා මොනොවට පහන් කරවා හුනස්නෙන් නැගී වැඩියහ යි.

නන්දමාතු සූත්‍රය දසවැනි යි.

මහායඤ්ඤවර්ගය පස්වැනි යි.

එහි උද්දානය:

විඤ්ඤාණට්ඨිති සූත්‍රය, සමාධිපරික්ඛාර සූත්‍රය, අග්ගිසූත්‍රය, මහායඤ්ඤ සූත්‍රය, සඤ්ඤා සූත්‍ර දෙක ය, මේථුන සූත්‍රය, සංයෝග සූත්‍රය, දානමහප්ඵල සූත්‍රය, නන්දමාතු සූත්‍රය දැයි සූත්‍ර දශයෙකි.

ප්‍රථම පණ්ණාසකය නිමි.

# 2 දුතියො පණ්ණාසකො

## 1. අබ්‍යාකත වග්ගො

### 7. 2. 1. 1

### [අබ්‍යාකතවත්ථු සුත්තං]

[සාවත්ථිනිදානං]

1. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙන සුතවතො අරියසාවකස්ස විචිකිච්ඡා නුප්පජ්ජති අබ්‍යාකතවත්ථූසූ.[1]

දිට්ඨිනිරොධා ඛො භික්ඛු, සුතවතො අරියසාවකස්ස විචිකිච්ඡා නුප්පජ්ජති අබ්‍යාකතවත්ථූසු.

"හොති තථාගතො පරම්මරණා"ති, ඛො භික්ඛු, දිට්ඨිගතමෙතං. "න හොති තථාගතො පරම්මරණා"ති ඛො භික්ඛු දිට්ඨිගතමෙතං. "හොති ච න හොති ච තථාගතො පරම්මරණා"ති ඛො භික්ඛු, දිට්ඨිගතමෙතං. "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා" ති ඛො භික්ඛු දිට්ඨිගතමෙතං.

අස්සුතවා භික්ඛු, පුථුජ්ජනො දිට්ඨිං නප්පජානාති, දිට්ඨිසමුදයං නප්පජානාති, දිට්ඨිනිරොධං නප්පජානාති, දිට්ඨිනිරොධගාමිනිං පටිපදං නප්පජානාති. තස්ස සා දිට්ඨි පවඩ්ඪති. සො න පරිමුච්චති ජාතියා ජරාමරණෙන[2] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

සුතවා ච ඛො භික්ඛු, අරියසාවකො දිට්ඨිං පජානාති, දිට්ඨිසමුදයං පජානාති, දිට්ඨිනිරොධං පජානාති, දිට්ඨිනිරොධගාමිනිං පටිපදං පජානාති. තස්ස සා දිට්ඨි නිරුජ්ඣති. සො පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

එවං ජානං ඛො භික්ඛු, සුතවා අරියසාවකො එවං පස්සං "හොති තථාගතො පරම්මරණා"ති'පි න ව්‍යාකරොති. "න හොති තථාගතො පරම්මරණා"ති'පි න ව්‍යාකරොති. "හොති ච න හොති ච තථාගතො පරම්මරණා"ති'පි න ව්‍යාකරොති. "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති',පි න ව්‍යාකරොති. එවං ජානං ඛො භික්ඛු, සුතවා අරියසාවකො එවං පස්සං එවං අව්‍යාකරණධම්මො හොති අව්‍යාකතවත්ථූසු.

එවං ජානං ඛො භික්ඛු, සුතවා අරියසාවකො එවං පස්සං න ඡම්භති, න කම්පති, න චලති, න වෙධති,[3] න සන්තාසං ආපජ්ජති අව්‍යාකතවත්ථූසු.

---

1 වත්ථූසූති - මජසං. 2 ජරාය මරණෙන - සීමජසං.
3 න චලති - උභතො - සීමජසං.

# දෙවැනි පණ්ණාසකය

## 1. අව්‍යාකත වර්ගය

### 7. 2. 1. 1.

### [අව්‍යාකතවත්ථු සූත්‍රය]

[සැවැත්නිදාන යි]

1. එකල්හි අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් කරා පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි හිඳ. එකත්පස්හි හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල කාරණ කී ය:

වහන්ස, යම් කරුණෙකින් (එකාංශව්‍යාකරණාදි විසින්) අව්‍යාකෘත වස්තූන් කෙරෙහි ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකහට විචිකිත්සා නූපදනේ නම්, එයට හෙතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ දැයි.

මහණ, දෘෂ්ටිනිරොධහෙතුයෙන් ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක හට අව්‍යාකෘත වස්තූන් කෙරෙහි විචිකිත්සා නූපදනේ ය.

මහණ, මරණින් මතු තථාගත (සත්ත්ව) වන්නේ ය යන තෙල කාරණ මිථ්‍යාදෘෂ්ටිමාත්‍රයෙක. මහණ මරණින් මතු තථාගත (සත්ත්ව උපත් විසින්) නොවන්නේ ය යන තෙල කාරණ මිථ්‍යාදෘෂ්ටිමාත්‍රයෙක. මහණ, මරණින් මතු තථාගත වෙයි, නො වෙ යි යන තෙල කාරණ දෘෂ්ටිගතයෙකි. මහණ, මරණින් මතු තථාගත නො මැ වෙයි, නො වන්නේ නො වෙයි යන තෙල කාරණ මිථ්‍යාදෘෂ්ටිමාත්‍රයෙකි.

මහණ, අශ්‍රැතවත් පෘථග්ජන දෘෂ්ටිය නො ම දන්නේ ය. දෘෂ්ටිසමුදය නො ම දන්නේය. දෘෂ්ටිනිරොධය නොම දන්නේ ය. දෘෂ්ටිනිරොධගාමිනී ප්‍රතිපද් නො ම දන්නේ ය. ඔහුගේ එ දෘෂ්ටිය ප්‍රකර්ෂයෙන් වැඩෙයි. හෙ ජාතියෙනුදු ජරාමරණිනුදු ශොකයෙනුදු පරිදෙවයෙනුදු දුකිනුදු උපායාසයෙනුදු නො මිදෙයි. වෑතනදුඃඛයෙන් නො මිදේ ය යි කියමි.

මහණ, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක දෘෂ්ටිය දන්නේ ය, දෘෂ්ටිසමුදය දන්නේ ය, දෘෂ්ටිනිරොධය දන්නේ ය, දෘෂ්ටිනිරොධගාමිනීප්‍රතිපද් දන්නේ ය. ඔහුගේ එ දෘෂ්ටිය නිරුද්ධ වෙයි. හෙ ජාතියෙනුදු ජරාමරණිනුදු ශොකයෙනුදු පරිදෙවයෙනුදු දුකිනුදු දොම්නසිනුදු උපායාසයෙනුදු මිදෙයි. වෑතනදුඃඛයෙන් මිදේ ය යි කියමි.

මහණ, මෙසෙයින් දන්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ දක්නේ "තථාගත මරණින් මතු උපත් විසින් වන්නේ" ය යි ද නො පවසන්නේ ය. "තථාගත මරණින් මතු නොවන්නේ" ය යි ද නො පවසන්නේ ය. "තථාගත මරණින් මතු වන්නේ ය, නො ද වන්නේය"යි ද ප්‍රකාශ නො කෙරෙයි. "තථාගත මරණින් මතු නො මැ වන්නේ ය, නො වන්නේ නො වේ" ය යි ද ප්‍රකාශ නො කෙරෙයි. මහණ, මෙ සෙයින් අරිසවු දන්නේ මෙසේ දක්නේ අව්‍යාකෘත වස්තූන් කෙරෙහි අව්‍යාකරණ ස්වභාව ඇතියේ වෙයි.

මහණ, මෙසෙයින් දන්නේ ශ්‍රැතවත් අරිසවු මෙසේ දක්නේ අව්‍යාකෘත වස්තූන්හි නො තැතිගන්නේ ය, කම්පිත නො වන්නේ ය, නො සැලෙන්නේ ය, නො වෙවුලන්නේ ය. සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ ය.

“හොති තථාගතො පරම්මරණා”ති ඛො භික්ඛු, තණ්හාගතමෙතං,[1] සඤ්ඤාගතමෙතං,[2] මඤ්ඤිතමෙතං,[3] පපඤ්චිතමෙතං,[4] උපාදානගතමෙතං,[5] විප්පටිසාරො එසො.

“න හොති තථාගතො පරම්මරණා”ති ඛො භික්ඛු -පෙ- විප්පටිසාරො එසො. “හොති ච න හොති ච තථාගතො පරම්මරණා”ති ඛො භික්ඛු -පෙ- විප්පටිසාරො එසො “නෙව හොති න න හොති තථාගතො පරම්මරණා”ති ඛො භික්ඛු -පෙ- විප්පටිසාරො එසො.

අස්සුතවා භික්ඛු, පුථුජ්ජනො විප්පටිසාරං නප්පජානාති. විප්පටිසාරසමුදයං නප්පජානාති, විප්පටිසාරනිරොධං නප්පජානාති, විප්පටිසාරනිරොධගාමිනිං පටිපදං නප්පජානාති. තස්ස සො විප්පටිසාරො පවඩ්ඪති. සො න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

සුතවා ච ඛො භික්ඛු, අරියසාවකො විප්පටිසාරං පජානාති, විප්පටිසාරසමුදයං පජානාති, විප්පටිසාරනිරොධං පජානාති, විප්පටිසාරනිරොධගාමිනිං පටිපදං පජානාති. තස්ස සො විප්පටිසාරො නිරුජ්ඣති. සො පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

එවං ජානං ඛො භික්ඛු, සුතවා අරියසාවකො එවං පස්සං “හොති තථාගතො පරම්මරණා”තිපි න ව්‍යාකරොති, “න හොති තථාගතො පරම්මරණා”තිපි න ව්‍යාකරොති, “හොති ච න හොති ච තථාගතො පරම්මරණා”තිපි න ව්‍යාකරොති, “නෙව හොති න න හොති තථාගතො පරම්මරණා”තිපි න ව්‍යාකරොති.

එවං ජානං ඛො භික්ඛු, සුතවා අරියසාවකො එවං පස්සං එවං අව්‍යාකරණධම්මො හොති අව්‍යාකතවත්ථූසු.

එවං ජානං ඛො භික්ඛු, සුතවා අරියසාවකො එවං පස්සං න ඡම්භති, න කම්පති න චලති, න වෙධති, න සන්තාසං ආපජ්ජති අව්‍යාකතවත්ථූසු.

අයං ඛො භික්ඛු, හෙතු, අයං පච්චයො යෙන සුතවතො අරියසාවකස්ස විචිකිච්ඡා නුප්පජ්ජති අව්‍යාකතවත්ථූසූති.

## 7. 2. 1. 2

## [පුරිසගති සුත්තං]

[සාවත්ථි නිදානං]

**2.** සත්ත ච භික්ඛවෙ[6] පුරිසගතියො දෙසිස්සාමි අනුපාදා ච පරිනිබ්බානං. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

1 තණ්හාගතමෙතං -පෙ- මජසං. 2 සඤ්ඤාගතමෙතං -පෙ- මජසං.
3 මඤ්ඤිතමෙතං -පෙ- මජසං, සීමු. 4 පපඤ්චිතමෙතං -පෙ- මජසං.
5 උපාදානගතමෙතං -පෙ- මජසං. 6 සත්ත භික්ඛවෙ - සීමු.

Free Distribution www.aathaapi.org

මහණෙනි, තථාගත මරණින් මතු වන්නේ ය යන මෙය දෘෂ්ටි තෘෂ්ණා-යෙකි, මෙය දෘෂ්ටි සංඥායෙකි, මෙය දෘෂ්ටි මන්‍යනායෙකි, මෙය දෘෂ්ටි ප්‍රපඤ්චිතයෙකි, මෙය දෘෂ්ටි උපාදානගතයෙකි, මෙය විප්‍රතිසාරයෙකි.

මහණෙනි, මරණින් මතු තථාගත නො වෙයි යන ... මෙය විප්‍රතිසාරයෙකි. මහණෙනි, තථාගත මරණින් මතු වෙයි නො ද වෙයි යන ... මෙය විප්‍රතිසාරයෙකි. මහණෙනි, තථාගත මරණින් මතු නො ම වන්නේ ය නො වන්නේ නො වේ ය යන ... මෙය විප්‍රතිසාරයෙකි.

මහණෙනි අශ්‍රැතවත් පෘථග්ජන විප්‍රතිසාරය, නො දන්නේ ය. විප්‍රතිසාර-සමුදය නො දන්නේ ය, විප්‍රතිසාර නිරොධය නො දන්නේ ය, විප්‍රතිසාර-නිරොධගාමිනීප්‍රතිපද් නො දන්නේ ය. ඔහුගේ එ විප්‍රතිසාරය වැඩෙයි. හෙ ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුකෙන් දොම්නසින් දැඩි ආයාසයෙන් නො මිදේ, සසරදුකින් නොමිදේ යයි කියමි.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක විප්‍රතිසාරය දන්නේ ය. විප්‍රතිසාර සමුදය දන්නේ ය. විප්‍රතිසාරනිරොධය දන්නේ ය, විප්‍රතිසාරනිරොධ-ගාමිනීප්‍රතිපද් දන්නේ ය. ඔහුගේ එ විප්‍රතිසාරය නිරුද්ධ වෙයි. හෙ ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුකෙන් දොම්නසින් දැඩිආයාසයෙන් මිදෙයි, සසරදුකින් මිදේයයි කියමි.

මහණෙනි, මෙසේ දන්නා මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක 'තථාගත මරණින් මතු වන්නේ ය'යි ද ප්‍රකාශ නො කරයි. 'තථාගත මරණින් මතු නො වන්නේ ය'යි ද ප්‍රකාශ නො කරයි. 'තථාගත මරණින් මතු වන්නේ ය'යි ද නො වන්නේ ය'යි ද ප්‍රකාශ නො කරයි. තථාගත මරණින් මතු නො මැ වන්නේ ය, නො ද නො වන්නේ ය'යි ද ප්‍රකාශ නො කරයි.

මහණෙනි ශ්‍රැතවත් අරිසවු මෙසේ දන්නේ මෙසේ දක්නේ අව්‍යාකෘත-වස්තූන්හි මෙසේ අව්‍යාකරණ ස්වභාව ඇති වෙයි

මහණෙනි, මෙසේ දන්නේ මෙසේ දක්නේ ශ්‍රැතවත් අරිසවු අව්‍යාකෘත-වස්තූන්හි භය නැති ගන්නේ ය, කම්පිත නො වන්නේ ය, නො සැලෙන්නේ ය, නො වෙවුලන්නේ ය, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ ය.

මහණෙනි, යම් හෙයෙකින් ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක හට අව්‍යාකෘතවස්තූන්හි විචිකිත්සා නූපදනේ නම්, මේ එයට හෙතු වෙයි, මේ ප්‍රත්‍යය වෙයි.

7. 2. 1. 2

[පුරිසගති සූත්‍රය]

[සැවැත්නිදාන යි]

2 මහණෙනි, සප්ත පුරුෂ (පුරුෂයාගේ ඥාන) ගති හා අප්‍රත්‍යය-නිර්වාණය හා දෙසන්නෙමි. එ අසව්, මනා කොට මෙනෙහි කරව්, කියන්නෙමි'යි. වහන්ස, එසේ ය යි එ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනාව වදාළහ.

කතමා ච භික්ඛවෙ, සත්ත පුරිසගතියො:

(1) ඉධ භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා. න භවිස්සති, න ච මෙ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමීති උපෙක්ඛං පටිලභති. සො භවෙ න රජ්ජති, සම්භවෙ න රජ්ජති. අත්ථුත්තරිං පදං[1] සන්තං සම්මප්පඤ්ඤාය පස්සති. තඤ්ච ඛ්වාස්ස පදං න සබ්බෙන සබ්බං සච්ඡිකතං හොති. තස්ස න සබ්බෙන සබ්බං මානානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං භවරාගානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං අවිජ්ජානුසයො පහීනො හොති. සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායී හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, දිවසසන්තත්තෙ අයොකපාලෙ හඤ්ඤමානෙ පපටිකා නිබ්බත්තිත්වා නිබ්බායෙය්‍ය,

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස නො ච මෙ සියා. න භවිස්සති න මෙ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමීති උපෙක්ඛං පටිලභති. සො භවෙ න රජ්ජති. සම්භවෙ න රජ්ජති. අත්ථුත්තරිං පදං[1] සන්තං සම්මප්පඤ්ඤාය පස්සති. තඤ්ච ඛ්වාස්ස පදං න සබ්බෙන සබ්බං සච්ඡිකතං හොති. තස්ස න සබ්බෙන සබ්බං මානානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං භවරාගානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං අවිජ්ජානුසයො පහීනො හොති. සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරා-පරිනිබ්බායී හොති.

(2) ඉධ පන භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස නො ච මෙ සියා. න භවිස්සති න මේ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමීති උපෙක්ඛං පටිලභති. සො භවෙ න රජ්ජති. සම්භවෙ න රජ්ජති. අත්ථුත්තරිං පදං[1] සන්තං සම්මප්පඤ්ඤාය පස්සති. තඤ්ච ඛ්වාස්ස පදං න සබ්බෙන සබ්බං සච්ඡිකතං හොති. තස්ස න සබ්බෙන සබ්බං මානානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං භවරාගානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං අවිජ්ජානුසයො පහීනො හොති. සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායී හොති.

1. අත්ථුත්තරිපදං - මජසං, සහ

මහණෙනි, පුරුෂයාගේ සප්ත ඥානගතීහු කවරහ යත්:

(1) මහණෙනි, මේ සස්නෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මට අතීතභවයෙහි නිර්මිත කර්මයෙක් නොවී නම්, මට වර්තමානයෙහි මේ අත්බැව නො වන්නේ ය. මේ අත්බැව්හි දු මට අනාගත භවනිර්මිත කර්ම නො වන්නේ නම් අනාගතයෙහිදු මට ආත්මභාවයෙක් නො වන්නේ ය. යමෙක් ඇත් ද, යමෙක් පාලූ වී ද, එ ප්‍රත්‍යුත්පන්නස්කන්ධය (ඡන්දරාගප්‍රහාණයෙන්) හැරලමි'යි විදර්ශනොපෙක්ෂාව ලබයි. හෙ අතීත පඤ්චස්කන්ධභවයෙහි (තෘෂ්ණාදෘෂ්ටි විසින්) නො ඇලෙයි. අනාගත පඤ්චස්කන්ධභවයෙහි දු නො ඇලෙයි. මත්තෙහි ශාන්ත නිර්වාණපදය ඇතැ'යි විදර්ශනා සහිත මාර්ගප්‍රඥයෙන් මනාකොට දක්නේ ය. (ඇතැම් කෙලෙසුන් නො පැහු බැවින්) ඔහුගේ එ හැම නිවන් පිය ද සර්වාකාරයෙන් ම සාක්ෂාත්කෘත නො වේ. ඔහුගේ මානානුසය ද සර්වාකාරයෙන් ම ප්‍රහීණ නො වේ. සර්වාකාරයෙන් ම භවරාගානුසය ප්‍රහීණ නො වේ. සර්වාකාරයෙන් ම අවිද්‍යානුශය ප්‍රහීණ නො වෙයි. හෙ පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි.

මහණෙනි, යම්පරිදි දවසක් මුළුල්ලෙහි හැවුනු යකබලක් තලනුලබත් ම පතුරු උපදවා නිවෙන්නේ යම්සේ ද, -

මහණෙනි, එපරිද්දෙන් ම මහණ මෙසෙයින් පිළිපන්නේ වෙයි: අතීතභවයෙහි උපන් කර්මයෙක් නොවී නම්, දැන් මාගේ මේ ආත්මභාවය නො වන්නේ ය. මෙකල්හි මාගේ කර්මයෙක් නො වේ නම්, අනාගතාත්මභාවයෙක් නො වන්නේ ය. යම් ප්‍රත්‍යුත්පන්න පඤ්චස්කන්ධයෙක් ඇත් නම්, යම් වර්තමාන පඤ්චස්කන්ධයෙක් පාලූවී නම්, එය (ඡන්දරාගප්‍රහාණයෙන්) දුරලමි යි විදර්ශනොපෙක්ෂාව ලබයි. හෙ අතීතපඤ්චස්කන්ධයෙහි නො ඇලෙයි, අනාගතපඤ්චස්කන්ධයෙහි දු නො ඇලෙයි. මත්තෙහි ශාන්ත වූ නිර්වාණපදය ඇතැයි විදර්ශනා සහිත මාර්ගප්‍රඥයෙන් මොනොවට දක්නේ ය. ඔහු විසින් එ ශාන්ත නිර්වාණපදයත් සර්වාකාරයෙන් ම සාක්ෂාත්කෘත නො වෙයි. ඔහුට සර්වප්‍රකාරයෙන් ම මානානුශය ප්‍රහීණ නො වේ. සර්වප්‍රකාරයෙන් ම භවරාගානුශය ප්‍රහීණ නො වෙයි. 'සර්වප්‍රකාරයෙන් ම අවිද්‍යානුශය ප්‍රහීණ නො වෙයි. හෙ පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි.

(2) තවද මහණෙනි, මේ සස්නෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මාගේ අතීත කර්මභවය නො වී නම්, වර්තමාන පඤ්චස්කන්ධය නො වන්නේ ය. මේ කල්හි මට අනාගතකර්මභවයෙක් නො වේ නම්, මාගේ අනාගත පඤ්චස්කන්ධ සංඛ්‍යාත විපාකභවය නො වන්නේ ය. යම් වර්තමානස්කන්ධපඤ්චකයෙක් ඇත් ද, යම් වර්තමානස්කන්ධපඤ්චකයෙක් පාලූ වී ද, එය (ඡන්දරාගප්‍රහාණයෙන්) දුරලමි යි විදර්ශනා උපෙක්ෂාව ලබයි. හෙ අතීත කර්ම භවයෙහි නො ඇලෙයි. අනාගත භවයෙහි දු නො ඇලෙයි. මතුයෙහි ශාන්ත වූ නිර්වාණපදය ඇතැයි සම්‍යක් ප්‍රඥයෙන් දක්නේ ය. ඔහු විසින් එ ශාන්තනිර්වාණපදය සර්වප්‍රකාරයෙන් ම සාක්ෂාත් නො කෙළේ වෙයි. සර්වප්‍රකාරයෙන් ම ඔහුගේ මානානුශය අප්‍රහීණ වෙයි. ඔහුගේ භවරාගානුශය සර්වාකාරයෙන් ම අප්‍රහීණ වෙයි. ඔහුගේ අවිද්‍යානුශය සර්වප්‍රකාරයෙන් ම අප්‍රහීණ වෙයි. හෙ පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ, දිවසසන්තත්තෙ අයොකපාලෙ හඤ්ඤමානෙ පපටිකා නිබ්බත්තිත්වා උප්පතිත්වා නිබ්බායෙය්‍ය, -

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති.

(3) ඉධ පන භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, දිවසසන්තත්තෙ අයොකපාලෙ හඤ්ඤමානෙ පපටිකා නිබ්බත්තිත්වා උප්පතිත්වා අනුපහච්ච තලං නිබ්බායෙය්‍ය, -

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති.

(4) ඉධ පන භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා උපහච්චපරිනිබ්බායී හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, දිවසසන්තත්තෙ අයොකපාලෙ හඤ්ඤමානෙ පපටිකා නිබ්බත්තිත්වා උප්පතිත්වා උපහච්ච තලං නිබ්බායෙය්‍ය, -

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා උපහච්ච පරිනිබ්බායී හොති.

(5) ඉධ පන භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අසඞ්ඛාරපරිනිබ්බායී හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, දිවසසන්තත්තෙ අයොකපාලෙ හඤ්ඤමානෙ පපටිකා නිබ්බත්තිත්වා උප්පතිත්වා පරිත්තෙ තිණපුඤ්ජෙ වා කට්ඨපුඤ්ජෙ වා නිපතෙය්‍ය, සා තත්ථ අග්ගිම්පි ජනෙය්‍ය, ධූමම්පි ජනෙය්‍ය, අග්ගිම්පි ජනෙත්වා ධූමම්පි ජනෙත්වා තමෙව පරිත්තං තිණපුඤ්ජං වා කට්ඨපුඤ්ජං වා පරියාදියිත්වා අනාහාරා නිබ්බායෙය්‍ය, -

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අසඞ්ඛාරපරිනිබ්බායී හොති.

(6) ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං පටිපන්නො හොති -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා සසඞ්ඛාර පරිනිබ්බායී හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, දිවසසන්තත්තෙ අයොකපාලෙ හඤ්ඤමානෙ පපටිකා නිබ්බත්තිත්වා උප්පතිත්වා විපුලෙ තිණපුඤ්ජෙ වා කට්ඨපුඤ්ජෙ වා නිපතෙය්‍ය, සා තත්ථ අග්ගිම්පි ජනෙය්‍ය, ධූමම්පි ජනෙය්‍ය, අග්ගිම්පි ජනෙත්වා ධූමම්පි ජනෙත්වා තමෙව විපුලං තිණපුඤ්ජං වා කට්ඨපුඤ්ජං වා පරියාදියිත්වා අනාහාරා නිබ්බායෙය්‍ය, -

මහණෙනි, යම් පරිදි දවසක් මුළුල්ලෙහි තැවුනු යකඩල තලනු ලබන කල්හි පතුරු ඉපද නැඟී නිවී යේ ද, -

එපරිදි ම මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මට අතීත කර්මභවයෙක් නො වී නම්, මට මේ වර්තමාන පඤ්චස්කන්ධය නො වන්නේය ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි.

(3) මහණෙනි, මේ සත්හෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මාගේ අතීත කර්මභවයෙක් නො වී නම්, මෙ වර්තමාන පන්තද නො වන්නේය හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි.

මහණෙනි, යම් පරිදි දවසක් තැවුනු යකඩල තලනුලබත් ම පතුරු ඉපද නැඟී පොළෝතලය නො ඇස්ම නිවේ ද, -

මහණෙනි, එ පරිදි ම මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මාගේ අතීත කර්මභවය නො වී නම්, මෙ පඤ්චස්කන්ධ ආත්මභාවය නො වන්නේ ය ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි.

(4) තවද මහණෙනි, මෙ සත්හෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මට අතීත කර්මභවයෙක් නො වී නම්, වර්තමාන මෙ පඤ්චස්කන්ධාත්මභාවය නො වන්නේ ය ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් උපහච්චපරිනිබ්බායී වෙයි.

මහණෙනි, යම්සේ දවසක් තැවුනු යකඩල තලනුලබත් ම පතුරු ඉපද අහසට නැඟ පොළෝතල ඇස්ම නිවේ නම්, -

මහණෙනි, එ සෙයින් ම මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මට අතීත කර්මභවයෙක් නො වී නම්, වර්තමාන මෙ පඤ්චස්කන්ධාත්මභාවය නො වන්නේ ය ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් උපහච්චපරිනිබ්බායී වෙයි.

(5) තවද මහණෙනි, මෙ සත්හෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මට අතීත කර්මභවයෙක් නො වී නම්, වර්තමාන මෙ පඤ්චස්කන්ධාත්මභාවය නො වන්නේ ය ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අසඞ්ඛාරපරිනිබ්බායී වෙයි.

මහණෙනි, යම්පරිදි දවසක් තැවුනු යකඩල තලනුලබත් ම පතුරු ඉපිද අහසට නැඟී කුඩා තණපිඩෙක වැටෙයි, දූවිපිඩෙක වැටෙයි හෙයි. එ එහි ගිනි ද දනවන්නේ ය, දුම් ද දනවන්නේ ය, ගිනිත් දනවා දුමත් දනවා එ මැ කුඩා තණපිඩ හෝ දූවිපිඩ ඇවිළගෙණ අනාහාරව නිවීයේ නම්, -

මහණෙනි, එ සෙයින් ම මහණ මෙසේ පිළිපන්නේ වෙයි ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අසඞ්ඛාරපරිනිබ්බායී වෙයි.

(6) තවද මහණෙනි, මෙ සත්හෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් සසඞ්ඛාරපරිනිබ්බායී වෙයි.

මහණෙනි, යම් පරිදි දවසක් තැවුනු යකඩලක් තලනුලබත් ම පතුරු ඉපිද අහසට නැඟී මහතණරොදෙක හෝ දූවිපිඩෙක හෝ හේ නම්, ඒ එහි ගිනි ද දනවයි, දුම් ද දනවයි, ගිනිත් දනවා දුමත් දනවා ඒ මහතණපිඩ හෝ දූවිපිඩ හෝ දවා අනාහාරව නිවීයෙයි, -

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති; නො චස්ස නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා සසඞ්ඛාරපරිනිබ්බායී හොති.

(7) ඉධ පන භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස නො ච මෙ සියා. න භවිස්සති, න මෙ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමීති උපෙක්ඛං පටිලභති. සො භවෙ න රජ්ජති, සම්භවෙ න රජ්ජති. අත්ථුත්තරිං පදං සන්තං සම්මප්පඤ්ඤාය පස්සති. තඤ්ච ඛ්වාස්ස පදං න සබ්බෙන සබ්බං සච්ඡිකතං හොති. තස්ස න සබ්බෙන සබ්බං මානානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං භවරාගානුසයො පහීනො හොති. න සබ්බෙන සබ්බං අවිජ්ජානුසයො පහීනො හොති. සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා උද්ධංසොතො හොති අකනිට්ඨගාමී.

සෙය්‍යථාපි භික්ඛවෙ දිවසසන්තත්තෙන අයොකපාලෙ හඤ්ඤමානෙ පපටිකා නිබ්බත්තිත්වා උප්පතිත්වා මහන්තෙ තිණපුඤ්ජෙ වා කට්ඨපුඤ්ජෙ වා නිපතෙය්‍ය, සා තත්ථ අග්ගිම්පි ජනෙය්‍ය ධූමම්පි ජනෙය්‍ය, අග්ගිම්පි ජනෙත්වා ධූමම්පි ජනෙත්වා තමෙව මහන්තං තිණපුඤ්ජං වා කට්ඨපුඤ්ජං වා පරියාදියිත්වා කච්ඡම්පි[1] දහෙය්‍ය, දායම්පි දහෙය්‍ය, කච්ඡම්පි දහිත්වා දායම්පි දහිත්වා හරිතන්තං වා පන්ථන්තං[2] වා සෙලන්තං වා උදකන්තං වා රමණීයං වා භූමිභාගං ආගම්ම අනාහාරා නිබ්බායෙය්‍ය, -

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා උද්ධංසොතො හොති අකනිට්ඨගාමී.

ඉමා ඛො භික්ඛවෙ, සත්ත පුරිසගතියො.

කතමඤ්ච භික්ඛවෙ, අනුපාදාපරිනිබ්බානං:

ඉධ භික්ඛවෙ, භික්ඛු එවං පටිපන්නො හොති: නො චස්ස, නො ච මෙ සියා. න භවිස්සති, න මෙ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමීති උපෙක්ඛං පටිලභති. සො භවෙ න රජ්ජති, සම්භවෙ න රජ්ජති අත්ථුත්තරිං පදං සන්තං සම්මප්පඤ්ඤාය පස්සති. තඤ්ච ඛ්වාස්ස පදං සබ්බෙන සබ්බං සච්ඡිකතං හොති. තස්ස සබ්බෙන සබ්බං මානානුසයො පහීනො හොති. සබ්බෙන සබ්බං භවරාගානුසයො පහීනො හොති, සබ්බෙන සබ්බං අවිජ්ජානුසයො පහීනො හොති. සො ආසවානං ඛයා -පෙ- [චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං] සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉදං වුච්චති භික්ඛවෙ අනුපාදාපරිනිබ්බානං.

ඉමා ඛො භික්ඛවෙ, සත්තපුරිසගතියො අනුපාදා ච පරිනිබ්බානන්ති.

---

1. ගච්ඡම්පි දහෙය්‍ය - මජසං   2. පථන්තං - මජසං

මහණෙනි, එ පරිදි ම මහණ මෙසේ පිළිපදනේ වෙයි: මට අතීත කර්මභවය නො වී නම්, වර්තමාන පඤ්චස්කන්ධය නො වන්නේ ය ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් සසඞ්ඛාරපරිනිබ්බායී වෙයි.

(7) තවද මහණෙනි, මෙ සස්නෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මාගේ අතීත කර්මභවය නො වී නම්, මට වර්තමාන පඤ්චස්කන්ධය නො වන්නේ ය. මට දැන් කර්මභවයෙක් නො වන්නේ නම්, අනාගත විපාක භවයෙක් නො වන්නේ ය. යම් වර්තමාන ස්කන්ධපඤ්චකයෙක් ඇත් ද, යම් වර්තමාන ස්කන්ධපඤ්චකයෙක් පාළු වී ද, එ හැරලම්යි විදර්ශනෝපෙක්ෂාව ලබයි. හෙ අතීතභවයෙහි නො ඇලෙයි, අනාගතභවයෙහි ද නො ඇලෙයි. මෙයින් මත්තෙහි ශාන්ත නිර්වාණපදය ඇතැයි සම්‍යක්ප්‍රඥයෙන් දක්නේ ය. එ ද ඔහු විසින් සර්වප්‍රකාරයෙන් සාක්ෂාත්කෘත නො වෙයි. සර්වප්‍රකාරයෙන් ම ඔහුගේ මානානුශය ප්‍රහීණ නො වෙයි. භවරාගානුශය සර්වප්‍රකාරයෙන් ම ප්‍රහීණ නො වේ. අවිද්‍යානුශය සර්වප්‍රකාරයෙන් ම ප්‍රහීණ නො වේ. හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අකනිට්ඨගාමී උද්ධං-සොත වෙයි.

මහණෙනි, යම් පරිදි දවසක් තැවුනු යකබල තවනුලබත් ම පතුරු ඉපිද අහසට නැගී මහතණපිඩෙක හෝ දැවපිඩෙක හේ නම්, එ එහි ගිනි ද උපදවන්නේ ය, දුම ද උපදවන්නේ ය, ගිනිත් උපදවා දුමත් උපදවා ඒ තණපිඩ හෝ දැවපිඩ දවා (නො රැකී) වල ද දවන්නේ ය, උයන්ලැව් ද දවන්නේ ය, (නො රැකී) වල ද දවා උයන්ලැව් ද දවා නිල් තණපිටියකට හෝ පන්ථයකට හෝ ශෛලාන්තයකට හෝ උදකාන්තයකට හෝ රමණී බිම්භාගයකට හෝ පැමිණ අනාහාර ව නිවීයෙයි ද, –

මහණෙනි, එ පරිද්දෙන් ම මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මට අතීත කර්මභවය නො වී නම්. වර්තමාන විපාකභවය නො වන්නේ ය ... හෙ පඤ්චෝරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් උද්ධංසොත අකනිට්ඨගාමී වෙයි.

මහණෙනි, මෙ පුරිසගති සත යි.

මහණෙනි, අනුපාදපරිනිබ්බානය කවරේ ය යත්:

මහණෙනි, මහණ මෙසේ පිළිපන්නේ වෙයි: මාගේ අතීත කර්මභවය නො වී නම්, වර්තමාන විපාකභවය නො වන්නේ ය. අනාගත කර්මභවය ද නො වන්නේ නම්, අනාගත විපාකභවය ද නො වන්නේ ය. යම් වර්තමාන ස්කන්ධපඤ්චකයෙක් ඇත් ද, යම් වර්තමාන ස්කන්ධපඤ්චයෙක් පාළු වී නම්, එය දුරලම්’යි උපෙක්ෂාව ලබන්නේ ය. හෙ අතීතභවයෙහි නො ඇලෙයි. අනාගත භවයෙහි නො ඇලෙයි. මත්තෙහි ශාන්ත නිර්වාණපදය ඇතැයි සම්‍යක් ප්‍රඥයෙන් දක්නේ ය එ නිර්වාණපදයත් සර්වප්‍රකාරයෙන් ම සාක්ෂාත් කරණලද්දේ වෙයි. සර්වප්‍රකාරයෙන් ම ඔහුගේ මානානුශය ද ප්‍රහීණ වෙයි. සර්වප්‍රකාරයෙන් ම භවරාගානුශය ප්‍රහීණ වෙයි සර්වප්‍රකාරයෙන් ම අවිද්‍යානු-ශය ප්‍රහීණ වෙයි. හෙ ආස්‍රවක්ෂයෙන් ... [චිත්තවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද] සාක්ෂාත් කොට එළඹ වෙසෙයි.

මහණෙනි, මෙ අනුපාදපරිනිබ්බාන යි කියනු ලැබේ

මහණෙනි, මෙ සප්ත පුරුෂගති හා අනුපාදපරිනිර්වාණ යි.

## 7. 2. 1. 3.

## [තිස්සබ්‍රහ්ම සුත්තං]

3. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. අථ ඛො ද්වෙ දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවන්තං එතදවොච:

එතා භන්තෙ භික්ඛුනියො විමුත්තාති. අපරා දෙවතා භගවන්තං එතදවොච එතා භන්තෙ භික්ඛුනියො අනුපාදිසෙසා සුවිමුත්තාති. ඉදමවොචුං තා දෙවතා. සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො තා දෙවතා සමනුඤ්ඤො සත්ථාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ, රත්තිං ද්වෙ දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ එකා දෙවතා මං එතදවොච:

එතා භන්තෙ, භික්ඛුනියො විමුත්තාති. අපරා දෙවතා මං එතදවොච: එතා භන්තෙ, භික්ඛුනියො අනුපාදිසෙසා සුවිමුත්තාති. ඉදමවොචුං භික්ඛවෙ, තා දෙවතා. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු'ති.

තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාමොග්ගල්ලානො** භගවතො අවිදූරෙ නිසින්නො හොති. අථ ඛො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස එතදහොසි:

කතමෙසානං ඛො දෙවානං එවං ඤාණං හොති සවුපාදිසෙසෙ වා සවුපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

තෙන ඛො පන සමයෙන **තිස්සො** නාම භික්ඛු අධුනා කාලකතො අඤ්ඤතරං බ්‍රහ්මලොකං උපපන්නො හොති. තත්‍රාපි නං එවං ජානන්ති: "තිස්සො බ්‍රහ්මා මහිද්ධිකො මහානුභාවො"ති.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එවමෙවං ගිජ්ඣකූටෙ පබ්බතෙ අන්තරහිතො තස්මිං බ්‍රහ්මලොකෙ පාතුරහොසි. අද්දසා ඛො තිස්සො බ්‍රහ්මා ආයස්මන්තං මහාමොග්ගල්ලානං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච:

## 7. 2. 1. 8

## [තිස්සබ්‍රහ්ම සූත්‍රය]

8. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩවසනසේක. එකල්හි දෙවියෝ දෙදෙනෙක් රාත්‍රිය බෙහෙවින් ඉක්මගිය කල්හි හැම ගිජ්ඣකූළපව් පියෙස බබුළුවා, මනහර වණී ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි සිටගත්හ. එකත්පස්හි සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල සැළකෙළේය:

''වහන්ස, තෙල (මහාප්‍රජාපතී ප්‍රමුඛ) භික්ෂුණීහු පඤ්ඤාවිමුක්තියෙන් මිදුනාහ''යි. අනෙක් දෙවි භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේ ය: ''වහන්ස, තෙල මෙහෙණහු ශෙෂොපාදන රහිත ව මිදුනහ''යි. එ දෙවිහු මෙය කීහ. ශාස්තෘන් වහන්සේ සමනුඥ වූසේක. එක්බිති එ දෙවියෝ දෙදෙන ''භාග්‍යවතුන් වහන්සේ සමනුඥයහ''යි භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට එහි ම නො පැණී ගියහ.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ එ රෑ ඇවෑමෙන් භික්ෂූන් ඇමැතූ සේක: ''මහණෙනි, මෙ ඉකුත් රැහි මනහර රූ ඇති දෙවතාවෝ දෙදෙනෙක් හැම ගිජ්ඣකුළුපව් පියෙස එකලුකොට බබුළුවා මා කරා එළැඹියහ. එළැඹ මා සකසා වැඳ එකත්පස්හි සිටියහ. මහණෙනි, එකත්පස්හි සිටි එක් දෙවියෙක් මට තෙල කී ය:

''වහන්ස, තෙල භික්ෂුණීහු පඤ්ඤාවිමුක්තියෙන් මිදුනාහ''යි. අනෙක් දෙවි ද මට තෙල සැලකෙළේ ය: ''වහන්ස, තෙල මෙහෙණහු අනුපාදිශෙෂ වූවාහු පඤ්ඤාවිමුක්තියෙන් මිදුනාහ''යි. මහණෙනි, එ දෙවිහු මෙය සැලකලහ. මෙ සැලකොට මා වැඳ එහි ම අතුරුදන් ව ගියහයි.

එ සමයෙහි ආයුෂ්මත් මහමුගලන් තෙරහු භාග්‍යවතුන් වහන්සේ-ගේ නුදුරෙහි හුන්නාහු වෙති. එක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ට තෙල සිත විය

''කවර නම් දෙවි කෙනකුන්ට සොපාදිසෙස පුඟුල් කෙරෙහි හෝ සොපාදිසෙස පුඟුලැයි ද, අනුපාදිසෙස පුඟුල්කෙරෙහි හෝ අනුපාදිසෙස පුඟුලැයි ද මෙබඳු ඥානයෙක් වේ ද''යි.

එසමයෙහි තිස්ස නම් මහණ කළුරිය කළ නොබෝකල් ඇතියේ එක්තරා බ්‍රහ්මකායෙක්හි උපන්නේ වෙයි. එහි දු ඔහු (සෙසු දෙවියෝ) මෙසෙයින් දනිත්: ''තිස්ස බ්‍රහ්ම තෙම මහත් සෘද්ධී ඇතියේ ය. මහානුභාව ඇතියේ ය''යි.

එක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ යම්සේ බලවත් මැදුම් පිරිමියෙක් හැකුළු අතක් දිගුකරන්නේ හෝ දිගුකළ අතක් හකුළුවන්නේ හෝ නම් එසෙයින් ගිජ්ඣකූටපර්වතයෙහි අතුරුදන් වූසේක් එ බඹලොවෙහි පැණීගියහ. තිස්ස බ්‍රහ්ම දුරදී මැ එන ආයුෂ්මත් මහමුගලන් තෙරුන් දුට, දැක ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ට තෙල කී ය:

එහි ඛො මාරිස මොග්ගල්ලාන, ස්වාගතං මාරිස මොග්ගල්ලාන, චිරස්සං ඛො මාරිස මොග්ගල්ලාන, ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීද මාරිස මොග්ගල්ලාන, ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො පඤ්ඤත්තෙ ආසනෙ. තිස්සොපි ඛො බ්‍රහ්මා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තිස්සං බ්‍රහ්මානං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

කතමෙසානං ඛො තිස්ස, දෙවානං එවං ඤාණං හොති සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති?

බ්‍රහ්මකායිකානං ඛො මාරිස මොග්ගල්ලාන, දෙවානං එවං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

සබ්බෙසංයෙව නු ඛො[1] තිස්ස, බ්‍රහ්මකායිකානං දෙවානං එවං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

න ඛො මාරිස මොග්ගල්ලාන, සබ්බෙසං බ්‍රහ්මකායිකානං දෙවානං එවං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති. යෙ ඛො තෙ මාරිස මොග්ගල්ලාන, බ්‍රහ්මකායිකා දෙවා බ්‍රහ්මෙන ආයුනා සන්තුට්ඨා, බ්‍රහ්මෙන වණ්ණෙන බ්‍රහ්මෙන සුඛෙන බ්‍රහ්මෙන යසෙන බ්‍රහ්මෙන ආධිපතෙය්‍යෙන සන්තුට්ඨා, තස්ස ච උත්තරිං[2] නිස්සරණං යථාභූතං නප්පජානන්ති, තෙසං න එවං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

යෙ ච ඛො තෙ මාරිස මොග්ගල්ලාන, බ්‍රහ්මකායිකා දෙවා බ්‍රහ්මෙන ආයුනා අසන්තුට්ඨා, බ්‍රහ්මෙන වණ්ණෙන බ්‍රහ්මෙන සුඛෙන බ්‍රහ්මෙන යසෙන බ්‍රහ්මෙන ආධිපතෙය්‍යෙන අසන්තුට්ඨා, තස්ස ච උත්තරිං[2] නිස්සරණං යථාභූතං පජානන්ති, තෙසං එවං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

ඉධ මාරිස මොග්ගල්ලාන භික්ඛු උභතොභාගවිමුත්තො හොති තමෙනං දෙවා[1] එවං ජානන්ති: අයං ඛො ආයස්මා උභතොභාගවිමුත්තො, යාවස්ස කායො ඨස්සති තාව නං දක්ඛින්ති දෙවමනුස්සා, කායස්ස භෙදා න නං දක්ඛින්ති දෙවමනුස්සාති. එවම්පි ඛො මාරිස මොග්ගල්ලාන, තෙසං දෙවානං එවං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති

1 සබ්බෙසඤ්ඤෙව ඛො - මජසං
තෙ උත්තරිං - මජසං

මාරිස මෞද්ගල්‍යායනයෙනි, මෙහි වඩිනු මැනවි, නිදුකාණෙනි මෞද්ගල්‍යායනයෙනි, (තුඹට) ස්වාගත යැ. නිදුකාණෙනි, මෞද්ගල්‍යායනයෙනි, මෙහි වඩිනු සඳහා යම්බඳු මේ ආකාරයෙක් වී නම්, මේ පර්‍යායය බොහෝ කලෙකින් කළහ. මාරිස මෞද්ගල්‍යායනයෙනි, මේ අස්න පනවන ලද, වැඩහිඳිනු මැනවැ’යි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ පනවන ලද අස්නෙහි වැඩහුන්හ. තිස්ස බ්‍රහ්ම ද ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වැඳ එකත්පසෙක සිටි. එකත්පසෙක හුන් තිස්ස බ්‍රහ්මහට ආයුෂ්මත් මහමුගලන් තෙරහු මෙසේ කරුණු වදාළහ:

තිස්සයෙනි, කවර නම් දෙවියනට සඋපාදිසේසයා කෙරෙහි සඋපාදිසේස යයි ද, අනුපාදිසේසයා කෙරෙහි අනුපාදිසේස යයි කියා ද මෙබඳු ඥානය වන්නේ දැ’යි.

නිදුක මෞද්ගල්‍යායනයෙනි, බ්‍රහ්මකායික දෙවියනට සඋපාදිසේසයා (පඤ්චස්කන්ධය තිබියදී කෙලෙසුන් කෙරෙන් පිරිනිවියහු) කෙරෙහි සඋපාදිසේස යයි ද, අනුපාදිසේසයා (ස්කන්ධපරිනිර්වාණයෙන් පිරිනිවියහු) කෙරෙහි අනුපාදිසේස යයි ද යන මෙබඳු ඥානය වන්නේ ය.

තිස්සයෙනි, හැම බ්‍රහ්මකායික දෙවියනට සඋපාදිසේස පුද්ගලයා කෙරෙහි සඋපාදිසේස යයි ද අනුපාදිසේස පුද්ගලයා කෙරෙහි අනුපාදිසේස යයි ද මෙබඳු ඥානය වන්නේ දැ’යි.

නිදුක මෞද්ගල්‍යායනයෙනි, හැම බ්‍රහ්මකායික දෙවියනට සඋපාදිසේස පුද්ගලයා කෙරෙහි සඋපාදිසේස යයි ද අනුපාදිසේස පුද්ගලයා කෙරෙහි අනුපාදිසේස යයි ද මෙබඳු ඥානය නො මැ වන්නේ ය. නිදුක මුගලන යම් බ්‍රහ්මකායික දෙවිකෙනෙක් බ්‍රහ්මයන් සතු ආයුසින් සතුටුව වෙත් නම්, බ්‍රහ්මවර්ණයෙන් සතුටුව වෙත් නම්, බ්‍රහ්මසුඛයෙන් සතුටුව වෙත් නම්, බ්‍රහ්මයශසින් සතුටුවූවෙත් නම්, බ්‍රහ්ම ආධිපත්‍යයෙන් සතුටුවූවෙත් නම්, මත්තෙහි දු නිඃසරණය යථාභූතයෙන් නො දන්නාහු නම්, ඔවුනට සඋපාදිසේස පුද්ගලයා කෙරෙහි සඋපාදිසේස යයි ද අනුපාදිසේස පුද්ගලයා කෙරෙහි අනුපාදිසේස යයි ද මෙබඳු ඥානය නො වන්නේ ය.

නිදුක මුගලන, යම් බ්‍රහ්මකායික දෙවිකෙනෙක් බ්‍රහ්මආයුෂයෙන් අසතුටුව වෙත් නම්, බ්‍රහ්මවර්ණයෙන් අසතුටුව වෙත් නම්, බ්‍රහ්මසුඛයෙන් අසතුටුව වෙත් නම්, බ්‍රහ්මයශසින් අසතුටුව වෙත් නම්, බ්‍රහ්මආධිපත්‍යයෙන් අසතුටුව වෙත් නම් එයට මත්තෙහි දු ඇති නිඃසරණය යථා භූත කොට දන්නාහු ද, එ දෙවියනට සඋපාදිසේසයා කෙරෙහි සඋපාදිසේස යි ද අනුපාදිසේසයා කෙරෙහි අනුපාදිසේස යයි ද මෙබඳු ඥානය වන්නේ යයි.

නිදුක මුගලන මෙ සපුන්හි මහණෙක් උභතොභාගවිමුක්ත වෙයි. දෙවියෝ එබඳු වූ ඔහු මෙසේ හඳුනති: “මෙ ආයුෂ්මත් උභතොභාගවිමුක්ත වෙයි. යම්තාක් ඔහුගේ කය සිටුනේ ද එතාක් දෙවිමිනිස්සු ඔහු දක්නාහ. කායයාගේ භේදයෙන් දෙවිමිනිස්හු ඔහු නො දක්නාහ’’යි. නිදුක මුගලන, මෙසේත් සඋපාදිසේස පුහුල් නිමිති කොට සඋපාදිසේස පුහුලැයි ද අනුපාදිසේස පුහුල් නිමිති කොට අනුපාදිසේස පුහුලැයි ද දෙවියනට මෙබඳු ඥානය වෙයි.

ඉධ පන මාරිස මොග්ගල්ලාන, භික්ඛු පඤ්ඤාවිමුත්තො හොති. තමේනං තෙ දෙවා එවං ජානන්ති: අයං ඛො ආයස්මා පඤ්ඤාවිමුත්තො, යාවස්ස කායො ඨස්සති තාව නං දක්ඛින්ති දෙවමනුස්සා, කායස්ස භෙදා න නං දක්ඛින්ති දෙවමනුස්සාති. එවම්පි ඛො මාරිස මොග්ගල්ලාන, තෙසං දෙවානං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

ඉධ පන මාරිස මොග්ගල්ලාන භික්ඛු කායසක්ඛී හොති. තමේනං තෙ දෙවා එවං ජානන්ති: අයං ඛො ආයස්මා කායසක්ඛී, අප්පෙව නාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො, යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති. එවම්පි ඛො මාරිස මොග්ගල්ලාන, තෙසං දෙවානං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

ඉධ පන මාරිස මොග්ගල්ලාන, භික්ඛු දිට්ඨිප්පත්තො[1] හොති -පෙ- සද්ධාවිමුත්තො හොති -පෙ- ධම්මානුසාරී හොති. තමේනං තෙ දෙවා එවං ජානන්ති: අයං ඛො ආයස්මා ධම්මානුසාරී අප්පෙව නාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො, යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති. එවම්පි ඛො මාරිස මොග්ගල්ලාන, තෙසං දෙවානං එවං ඤාණං හොති. සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තිස්සස්ස බ්‍රහ්මුනො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො ගිජ්ඣකූටෙ පාතුරහොසි.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාමොග්ගල්ලානො යාවතකො අහොසි තිස්සෙන බ්‍රහ්මුනා සද්ධිං කථාසල්ලාපො තං සබ්බං භගවතො ආරොචෙසි.

නහි පන තෙ මොග්ගල්ලාන තිස්සො බ්‍රහ්මා සත්තමං අනිමිත්තවිහාරිං පුග්ගලං දෙසෙසීති.

එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා සත්තමං අනිමිත්තවිහාරිං පුග්ගලං දෙසෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති

තිස්ස මුගලන මෙහි මහණෙක් ප්‍රඥාවිමුක්ත වෙයි. දෙවියෝ එබඳු වූ ඔහු මෙසේ හඳුනති: "මේ ආයුෂ්මත් ප්‍රඥා විමුක්තයෙකි. යම්තාක් ඔහුගේ කය පවත්තේ ද, ඒතාක් දේවමනුෂ්‍යයෝ ඔහු දක්නාහ. කාය භේදයෙන් දෙව්මනුෂ්‍යයෝ ඔහු නො දක්නාහ"යි. තිස්ස මුගලන, සඋපාදිසෙස පුද්ගල් කෙරෙහි සඋපාදිසෙස යයි ද අනුපාදිසෙස පුද්ගල් කෙරෙහි අනුපාදිසෙස යයි ද එ දෙවියනට මෙසේත් ඥානය වෙයි

තිස්ස මුගලන මෙහි මහණෙක් කායසක්ඛි වෙයි දෙවියෝ එබඳු වූ ඔහු මෙසේ හඳුණත්: "මේ ආයුෂ්මත් කායසක්ඛියෙක, මෙ ආයුෂ්මත් අනුලෝම් වූ සෙනසුන් සෙවන කරන්නේ කල්‍යාණ මිතුරන් භජනය කරන්නේ සද්ධාදි ඉන්ද්‍රියයන් සමත්වයෙහි තබන්නේ, යමක් සඳහා කුලපුත්හු මනාසේ ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයට පැමිණෙත් නම්, බ්‍රහ්මචර්‍ය්‍යය පර්‍ය්‍යවසාන කොට ඇති එ අනුත්තර නිර්වාණය දිට්ඨධම්මයෙහි ම තෙමෙ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට එළැඹ වෙසෙන්නේය"යි. තිස්ස මුගලන, මෙසේත් සඋපාදි-සෙසයා කෙරෙහි සඋපාදිසෙස යයි ද, අනුපාදිසෙසයා කෙරෙහි අනුපාදිසෙස යයි ද එ දෙවියනට ඥානය වන්නේ යයි.

තිස්ස මෞද්ගල්‍යායනයෙනි, මෙහි මහණෙක් **දිට්ඨිප්පත්ත** වෙයි ... **සද්ධාවිමුක්ත** වෙයි ... **ධම්මානුසාරී** වෙයි. ඒ දෙවියෝ ඔහු මෙසේ හඳුනත්: "මේ ආයුෂ්මත් වනාහි ධම්මානුසාරී වෙයි, මේ ආයුෂ්මත් අනුලෝම් වූ සෙනසුන් සේවනය කෙරෙමින් කල්‍යාණමිතුරන් ඇසුරු කෙරෙමින් ඉන්ද්‍රිය-යන් සමභාවයෙහි තබමින් යම් නිවණක් සඳහා කුලපුත්හු මනාකොට ගිහි ගෙන් නික්ම අනගාරිය සංඛ්‍යාත ශාසනයට වදනාහු නම්, මග බඹසර අවසන් කොට ඇති ඒ අනුත්තර නිර්වාණය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වසන්නේ නම් මැනැවැ"යි. තිස්ස මෞද්ගල්‍යායනයෙනි, මෙසේත් සඋපාදිසෙසයා කෙරෙහි සඋපාදිසෙස යයි ද, අනුපාදිසෙසයා කෙරෙහි අනුපාදිසෙස යයි ද දෙවියනට ඥානය වන්නේ යයි.

එක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන තෙරණුවෝ තිස්ස බ්‍රහ්මයාගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන් ව යම්සේ බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දිගුකරන්නේ හෝ දිගුකළ අතක් වක් කරන්නේ නම්, එසෙයින් බඹලොවිනි අතුරුදහන් වූයේක් ගිජ්ඣකූටයෙහි පැණීගියහ.

ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකාස වැද එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ තිස්ස බ්‍රහ්ම හා සමග යම් පමණ කථාසල්ලාපයෙක් වී නම්, එ හැම භාග්‍යවතුන් වහන්සේට සැළකළහ.

මුගලන තිස්ස බ්‍රහ්ම තෙමේ සත්වන අනිමිත්තවිහාරී (සද්ධානුසාරී) පුද්ගල නො දෙසී යයි.

භාග්‍යවතුන් වහන්ස, තෙල කරුණ පිළිබඳ කාලය වෙයි. සුගතයන් වහන්ස, යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ සත්වන අනිමිත්තවිහාරී පුද්ගලයා දෙසනසේක් නම් තෙල කරුණට කාලය වෙයි. භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු ධරන්නාහයි.

තෙන හි මොග්ගල්ලාන සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

ඉධ මොග්ගල්ලාන, භික්ඛු සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. තමෙනං තෙ දෙවා එවං ජානන්ති: අයං ඛො ආයස්මා සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. අප්පෙව නාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති.

එවං ඛො මොග්ගල්ලාන, තෙසං දෙවානං ඤාණං හොති: සඋපාදිසෙසෙ වා සඋපාදිසෙසොති, අනුපාදිසෙසෙ වා අනුපාදිසෙසොති.

### 7. 2. 1. 4.

### [සීහසෙනාපති සුත්තං]

4 එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො සීහො සෙනාපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සීහො සෙනාපති භගවන්තං එතදවොච:

සක්කා නු ඛො භන්තෙ සන්දිට්ඨිකං දානඵලං පඤ්ඤාපෙතුන්ති.

තෙනහි සීහ, තංයෙව තත්ථ[1] පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි.

(1) තං කිං මඤ්ඤසි සීහ, ඉධස්සු ද්වෙ පුරිසා[2] එකො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, එකො පුරිසො සද්ධො දානපති අනුප්පදානරතො. තං කිං මඤ්ඤසි සීහ කං නු ඛො අරහන්තො පඨමං අනුකම්පන්තා අනුකම්පෙය්‍යුං. යො වා සො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, යො වා පුරිසො සද්ධො දානපති අනුප්පදානරතොති?

යො සො භන්තෙ, පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, කින්තං අරහන්තො පඨමං අනුකම්පන්තා අනුකම්පෙස්සන්ති.[3] යො ච ඛො සො භන්තෙ, පුරිසො සද්ධො දානපති අනුප්පදානරතො, තංයෙව අරහන්තො පඨමං අනුකම්පන්තා අනුකම්පෙය්‍යුං.

1. තංයෙවෙත්ථ - මජසං
2. ඉධ ද්වෙ පුරිසා - මජසං
3. අනුකම්පිස්සන්ති - මජසං,

මුගලන, එ හෙයින් අසව, මැනැවින් මෙනෙහිකරව, කියන්නෙමි'යි, වහන්ස, එසේ යයි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළසේක:

මුගලන, මේ සස්නෙහි මහණ සර්වනිමිත්තයන්ගේ අමනසිකාරයෙන් අනිමිත්ත (බලවත් විදර්ශනා) චිත්තසමාධියට එළැඹ වෙසෙයි. එ දෙවියෝ ඔහු මෙසේ හඳුනත්: මේ ආයුෂ්මත් හැම නිමිති මෙනෙහි නො කිරීමෙන් අනිමිත්තචිත්තසමාධියට පැමිණ වෙසෙයි. මේ ආයුෂ්මත් අනුලොම් වූ සෙනසුන් ඇසුරු කෙරෙමින් කල්‍යාණමිත්‍රයන් භජනය කෙරෙමින් ඉඳුරන් සමබවට පමුණුවමින් යම් නිවණක් සඳහා කුලපුත්හු මනාකොට ගිහිගෙන් නික්ම අනගාරිය සංඛ්‍යාත ශාසනයට වදනාහු නම්, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය පර්‍ය්‍යවසාන කොට ඇති ඒ අනුත්තර නිර්වාණය විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරන්නේ නම් මැනැවැයි.

මුගලන, මෙසේ සඋපාදිශේෂ පුද්ගල කෙරෙහි හෝ සඋපාදිශේෂ පුද්ගල යයි ද, අනුපාදිශේෂ පුද්ගල කෙරෙහි හෝ අනුපාදිශේෂ පුද්ගල යයි ද එ දෙවියනට ඥානය වන්නේ යයි.

## 7. 2. 1. 4

## [සීහසෙනාපති සූත්‍රය]

4 එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෛශාලි නගර සමීපයෙහි වූ මහාවනයෙහි කූටාගාරශාලායෙහි වැඩවසනසේක. එකල්හි සීහසේනාපති භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි හිඳ. එකත්පස්හි හුන් සීහසේනාපති භාග්‍යවතුන් වහන්සේට තෙල කාරණය සැලකෙළේ ය:

"වහන්ස, සාන්දෘෂ්ටික වූ (තමන් ම දක්නා) දානඵල පැනැවිය හැකි දැ"යි?

(1) "සීහය, එකරුණින් එහි ලා සා ම පුළුවුයෙමි, යම් පරිද්දෙකින් තට වැටැහේ නම්, එපරිද්දෙන් එ විසඳුව"යි.

සීහය, එ කිමැ'යි හඟිහි ද? මෙ ලොව්හි පුරුෂයෝ දෙදෙනෙක් වන්නාහ: එක් පුරුෂයෙක් ශ්‍රද්ධා නැතියේ මසුරුමල ඇතියේ, තදමසුරුබව ඇතියේ පරිභාෂික (අනුනට ගරහන්නේ) වෙයි. එක් පුරුෂයෙක් සැදැහැතියේ දානපති වූයේ දන්දීමෙහි ඇලුනේ වෙයි. සීහය, එ කිමැයි හඟනාව, ශ්‍රද්ධා රහිත වූ මසුරු වූ තදමසුරු වූ පරිභව කොට බෙණෙන යම් පුරුෂයෙක් හෝ වේ ද, ශ්‍රද්ධා ඇති දානපති වූ පුනපුනා දීමෙහි ඇලුනු යම් පුරුෂයෙක් හෝ වේ ද, (සිතින්) අනුකම්පා කරණ රහත්හු (ඔවුනතුරෙන්) කවරක්හට පළමුකොට අනුකම්පා කරන්නාහු දැයි?

වහන්ස, යම් පුරුෂයෙක් සැදැහැ නැතියේ මසුරු වූයේ තදමසුරු-වූයේ පරිභාෂක වේ නම්, අනුකම්පා කරණ රහත්හු ඔහුට කවර හෙයින් පළමු කොට අනුකම්පා කරන්නාහු ද, වහන්ස, යම් පුරුෂයෙක් ශ්‍රද්ධා ඇතියේ දානපති වූයේ පුනපුනා දානයෙහි ඇලුනේ නම්, අනුකම්පා කරණ රහත්හු ඔහුට ම පළමු අනුකම්පා කරන්නාහ යි.

(2) තං කිං මඤ්ඤසි සීහ, කං නු ඛො අරහන්තො පඨමං උපසඞ්කමන්තා උපසඞ්කමෙය්‍යුං: යො වා සො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, යො වා සො පුරිසො සද්ධො දානපති අනුප්පදානරතොති?

යො සො භන්තෙ, පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, කිං තං අරහන්තො පඨමං උපසඞ්කමන්තා උපසඞ්කමිස්සන්ති යො ච ඛො සො භන්තෙ, පුරිසො සද්ධො දානපති අනුප්පදානරතො, තංයෙව අරහන්තො පඨමං උපසඞ්කමන්තා උපසඞ්කමෙය්‍යුං.

(3) තං කිං මඤ්ඤසි සීහ, කස්ස නු ඛො අරහන්තො පඨමං පටිග්ගණ්හන්තා පටිග්ගණ්හෙය්‍යුං: යො වා සො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, යො වා සො පුරිසො සද්ධො දානපති අනුප්පදානරතොති?

යො සො භන්තෙ, පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, කිං තස්ස[1] අරහන්තො පඨමං පටිග්ගණ්හන්තා පටිග්ගණ්හිස්සන්ති. යො ච ඛො සො භන්තෙ, පුරිසො සද්ධො දානපති අනුප්පදානරතො, තස්සෙව අරහන්තො පඨමං පටිග්ගණ්හන්තා පටිග්ගණ්හෙය්‍යුං:

(4) තං කිං මඤ්ඤසි සීහ, කස්ස නු ඛො අරහන්තො පඨමං ධම්මං දෙසෙන්තා දෙසෙය්‍යුං, යො වා සො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, යො වා සො පුරිසො සද්ධො දානපති අනුප්පදානරතොති?

යො සො භන්තෙ, පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, කිං තස්ස[1] අරහන්තො පඨමං ධම්මං දෙසෙන්තා දෙසිස්සන්ති, යො ච ඛො සො භන්තෙ, පුරිසො සද්ධො දානපති අනුප්පදානරතො, තස්සෙව අරහන්තො පඨමං ධම්මං දෙසෙන්තා දෙසෙය්‍යුං.

(5) තං කිං මඤ්ඤසි සීහ, කස්ස නු ඛො කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡෙය්‍ය යො වා සො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, යො වා සො පුරිසො සද්ධො දානපති අනුප්පදානරතොති?

යො සො භන්තෙ, පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො කිං තස්ස[1] කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡිස්සති, යො ච ඛො සො භන්තෙ, පුරිසො සද්ධො දානපති අනුප්පදානරතො, තස්සෙව කල්‍යාණො කිත්ති සද්දො අබ්භුග්ගච්ඡෙය්‍ය.

(6) තං කිං මඤ්ඤසි සීහ, කො නු ඛො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමෙය්‍ය යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමෙය්‍ය අමඞ්කුභූතො, යො වා සො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, යො වා සො පුරිසො සද්ධො දානපති අනුප්පදානරතොති?

1. කිං තං තස්ස - මජසං,

(2) සීහය, එ කිමැයි හඟනාව, යම් පුරුෂයෙක් ශ්‍රද්ධා නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිභාෂක වේ නම්, යම් පුරුෂයෙකුත් ශ්‍රද්ධා ඇතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි ඇලුනේ වේ නම්, වෙත පැමිණෙන රහත්හු (ඔවුනතුරෙන්) කවරකු වෙත ප්‍රථමයෙන් එළැඹෙන්නාහු දැයි.

වහන්ස, යම් පුරුෂයෙක් ශ්‍රද්ධා නැතියේ මසුරු වූයේ තද මසුරු වූයේ පරිභාෂක වේ නම්, පළමු එළඹෙන රහත්හු කවර හෙයින් ඔහු කරා එළැඹෙන්නාහු ද, වහන්ස, යම් පුරුෂයෙකුත් ශ්‍රද්ධා ඇතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි නියැලුනේ වේ නම්, වෙත එළැඹෙන රහත්හු ඔහු කරා ම පළමු එළැඹෙන්නාහ.

(3) සීහය, එ කිමැයි හඟනාම, යම් පුරුෂයෙක් ශ්‍රාද්ධ නොවූයේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිභාෂක හෝ වේ නම්, යම් පුරුෂයෙක් ශ්‍රාද්ධ වූයේ දානපති වූයේ අනුප්‍රදානයෙහි අලුනේ වේ නම්, දන් පිළිගන්නා රහත්හු (ඔවුනතුරෙන්) කාවරකුගේ දන් පළමු පිළිගන්නාහු දැයි.

වහන්ස, යම් පුරුෂයෙක් ශ්‍රද්ධා නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිභාෂක වේ නම්, දන් පිළිගන්නා රහත්හු කවර හෙයින් ඔහුගේ දන් පළමු පිළිගණිත් ද, වහන්ස, යම් පුරුෂයෙක් සැදැහැතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි ඇලුනේ වේ නම්, දන් පිළිගන්නා රහත්හු පළමු කොට ඔහුගේ ම දන් පිළිගන්නාහ.

(4) සීහය, එ කිමැයි හඟනාව, යම් පුරුෂයෙක් ශ්‍රද්ධා නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිභාෂක හෝ වේ නම්, යම් පුරුෂයෙකුත් ශ්‍රද්ධා ඇතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි ඇලුනේ වේ නම්, ධර්මදේශනා කරණ රහත්හු උන්ගෙන් කවරකුහට ප්‍රථමයෙන් ධර්මය දෙසන්නාහු දැයි.

ස්වාමීනි, යම් පුරුෂයෙක් සැදැ නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ නිගන්නේ වේ ද, දහම් දෙසන රහත්හු කවර හෙයින් ඔහුට පළමු දම් දෙසත් ද, ස්වාමීනි, සැදැහැති දානපති වූ අනුප්‍රදානයෙහි ඇලුනු යම් පුරුෂයෙක් වේ නම්, දහම් දෙසන රහත්හු ඔහට මැ පළමු කොට දහම් දෙසත්.

(5) සීහය, ඒ කිමෙකැයි හඟනාව, යම් පුරුෂයෙකුත් සැදැහැ නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ නිගන්නේ වේ ද, යම් පුරුෂයෙකුත් සැදැහැතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි නියැලුනේ වේ ද, (ඔවුනතුරින්) කාවරක්හුගේ කලණ කිත් ගොස උස් ව නැගේ ද?

ස්වාමීනි, යම් පුරුෂයෙක් සැදැහැ නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ නිගන්නේ නම්, කවර හෙයින් ඔහුගේ කලණ කිත් ගොස උස්ව නැගේ ද, ස්වාමීනි, යම් පුරුෂයෙක් සැදැහැතියේ දානපති වූයේ අනුප්‍රදාන-යෙහි නියැලීයේ වේ නම්, ඔහුගේ ම කලණ කිත්ගොස උස් ව නැඟෙයි.

(6) සීහය, එ කිමැයි හඟනාව, යම් පුරුෂයෙක් සැදැහැ නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිභාෂක වේ ද, යම් පුරුෂයෙක් සැදැහැතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි නියැලීයේ වේ ද, (ඔවුනතුරෙහි) කැත් පිරිසකට වේවයි බමුණු පිරිසකට වේවයි ගැහැවිපිරිසකට වේවයි මහණ-පිරිසකට වේවයි යම් මැ පිරිසකට එළැඹේ නම් කවරෙක් අමඩකු වූයේ විශාරද ව එළඹේ ද?

යො සො භන්තෙ, පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, කිං සො යඤ්ඤදෙව[1] පරිසං උපසඞ්කමිස්සති, යදි ඛත්තිය-පරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, විසාරදෙ උපසඞ්කමති අමඞ්කුභූතො, යො ච ඛො සො භන්තෙ, පුරිසො සද්ධො දානපති අනුප්පදානරතො, සො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමෙය්‍ය යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණ පරිසං විසාරදෙ උපසඞ්කමති අමඞ්කුභූතො.

(7) තං කිං මඤ්ඤසි සීහ, කො නු ඛො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති, යො ච ඛො සො පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, යො වා සො පුරිසො සද්ධො දානපති අනුප්පදානරතොති?

යො සො භන්තෙ පුරිසො අස්සද්ධො මච්ඡරී කදරියො පරිභාසකො, කිං සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති, යො ච ඛො සො භන්තෙ, පුරිසො දානපති අනුප්පදානරතො, සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය.

යානිමානි භන්තෙ, භගවතා ජ සන්දිට්ඨිකානි දානඵලානි අක්ඛාතානි, නාහං එත්ථ භගවතො සද්ධාය ගච්ඡාමි. අහමෙතානි ජානාමි.

අහං භන්තෙ, දායකො දානපති. මං අරහන්තො පඨමං අනුකම්පන්තා අනුකම්පන්ති. අහං භන්තෙ, දායකො දානපති. මං අරහන්තො පඨමං උපසඞ්කමන්තා උපසඞ්කමන්ති අහං භන්තෙ, දායකො දානපති. මය්හං අරහන්තො පඨමං පතිගණ්හන්තා පතිගණ්හන්ති. අහං භන්තෙ, දායකො දානපති. මය්හං අරහන්තො පඨමං ධම්මං දෙසෙන්තා දෙසෙන්ති. අහං භන්තෙ, දායකො දානපති. මය්හං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'සීහො සෙනාපති දායකො කාරකො සඞ්ඝුපට්ඨාකො'ති. අහං භන්තෙ, දායකො දානපති. යඤ්ඤදෙව පරිසං උපසඞ්කමාමි යදි ඛත්තියපරිසං, යදි බ්‍රාහ්මණපරිසං, යදි ගහපතිපරිසං යදි සමණපරිසං, විසාරදෙ උපසඞ්කමාමි අමඞ්කුභූතො.

යානිමානි භන්තෙ, භගවතා ජ සන්දිට්ඨිකානි දානඵලානි, අක්ඛාතානි, නාහං එත්ථ භගවතො සද්ධාය ගච්ඡාමි. අහමෙතානි ජානාමි.

යං ච ඛො මං භන්තෙ, භගවා එවමාහ: 'දායකො සීහ, දානපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතී'ති. එතාහං න ජානාමි. එත්ථ ච පනාහං භගවතො සද්ධාය ගච්ඡාමි.

එවමෙතං සීහ, එවමෙතං සීහ, දායකො සීහ, දානපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

1. යං යදෙව පරිසං - මජසං

ස්වාමීනි, යම් පුරුෂයෙක් සැදැ නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිභව බණන්නේ වේ නම්, කැත්පිරිසට වේවයි බමුණු පිරිසට වේවයි ගැහැවි පිරිසට වේවයි මහණපිරිසට වේවයි කිම හේ යම් මැ පිරිසක් වෙත මඞ්කු වූයේ විශාරද නො වූයේ එළැඹෙන්නේ ද, ස්වාමීනි, යම් පුරුෂයෙක් ශ්‍රද්ධා ඇතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි ඇලුනේ වේ ද, හේ කැත්-පිරිසට වේවයි බමුණුපිරිසට වේවයි ගැහැවිපිරිසට වේවයි මහණපිරිසට වේවයි යම් මැ පිරිසකට එළැඹේ නම් අමඞ්කු වූයේ විශාරද වූයේ මැ එළැඹෙයි.

(7) සීහය, ඒ කිමෙකැයි හඟනාව, යම් පුරුෂයෙක් සැදැහැ නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිහාණක වූයේ නම්, යම් පුරුෂයෙක් සැදැහැතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි නියැලියේ වේ නම්, (ඔවුන්ගෙන්) කවරෙක් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට පැමිණේ ද?

ස්වාමීනි, යම් පුරුෂයෙක් සැදැ නැතියේ මසුරු වූයේ තදමසුරු වූයේ පරිහාණක වූයේ නම්, හේ කවර හෙයෙකින් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට එළැඹේ ද, ස්වාමීනි, යම් පුරුෂයෙකුත් සැදැහැතියේ දානපති වූයේ අනුප්‍රදානයෙහි ඇලුනේ වේ නම්, හේ කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට එළැඹෙයි.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම්බඳු මේ සාංදෘෂ්ටික වූ දානඵලයෝ සදෙනෙක් වදාරණලදහු නම්, එහි ලා මම භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ සැදැහැයෙන් නො එළඹෙමි. මම ද තෙල (දන්පල) දනිමි.

ස්වාමීනි, මම දානපති වූ දායකයෙක්මි. අනුකම්පා කරණ රහත්හු මට ම පළමු අනුකම්පා කරති. ස්වාමීනි, මම දානපති වූ දායකයෙක්මි. වෙත එළඹෙන රහත්හු මා වෙත ම පළමු එති. ස්වාමීනි, මම දානපති වූ දායකයෙක්මි. (දන්) පිළිගන්නා රහත්හු මාගේ ම (දන්) පළමු පිළිගණිත්. ස්වාමීනි, මම දානපති වූ දායකයෙක්මි. දහම් දෙසන්නා වූ රහත්හු මට ම පළමු දහම් දෙසති. ස්වාමීනි, මම දානපති වූ දායකයෙක්මි. මාගේ කලණ කිත්ගොස උස්ව නැඟුනේ වෙයි: 'සීහසෙනෙවි දායකයෙක කාරකයෙක සඞ්ඝොපස්ථායකයෙකැ' (කියා) යි. ස්වාමීනි, මම දානපති වූ දායකයෙක්මි. කැත් පිරිසට වේවයි, බමුණු පිරිසට වේවයි, ගැහැවි පිරිසට වේවයි, මහණ පිරිසට වේවයි, යම් මැ පිරිසකට එළැඹෙම් නම්, මම අමඞ්කුවූ (දීන නො වූ) යෙම්, විශාරද (නිර්භීත) වූයෙම් එළැඹෙමි.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම්බඳු වූ මේ සාංදෘෂ්ටික දානඵල සදෙනෙක් දෙසනලදහු නම් මම එහි ලා භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ සැදැහැයෙන් නො යමි. මම ද තෙල (දන්පල) දනිමි.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ "සීහය, දානපති වූ දායකයා කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට එළැඹෙයි" යන යමක් දෙසූසේක් නම් තෙල (කරුණ) මම නො දනිමි. එහි ලා මම භාග්‍යවතුන්වහන්සේ පිළිබඳ සැදැහැයෙන් යමි. (බුද්ධිප්‍රත්‍යයෙන් නො එළැඹෙමි)

සීහය, තෙල (කරුණ) එසේ මැ යි, සීහය, තෙල (කරුණ) එසේ මැ යි. සීහය, දානපති වූ දායක තෙමේ කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට පැමිණේ යයි.

## 7. 2. 1. 5

## [අරක්ඛෙය්‍ය සුත්තං]

[සාවත්ථිනිදානං]

5. චත්තාරිමානි භික්ඛවෙ, තථාගතස්ස අරක්ඛෙය්‍යානි. තීහි ච අනුපවජ්ජො.

කතමානි චත්තාරි තථාගතස්ස අරක්ඛෙය්‍යානි:

(1) පරිසුද්ධකායසමාචාරො භික්ඛවෙ, තථාගතො නත්ථි තථාගතස්ස කායදුච්චරිතං, යං තථාගතො රක්ඛෙය්‍ය "මා මෙ ඉදං පරො අඤ්ඤාසී"ති. (2) පරිසුද්ධවචීසමාචාරො භික්ඛවෙ, තථාගතො. නත්ථි තථාගතස්ස වචීදුච්චරිතං, යං තථාගතො රක්ඛෙය්‍ය "මා මෙ ඉදං පරො අඤ්ඤාසී"ති. (3) පරිසුද්ධමනොසමාචාරො භික්ඛවෙ, තථාගතො. නත්ථි තථාගතස්ස මනොදුච්චරිතං, යං තථාගතො රක්ඛෙය්‍ය "මා මෙ ඉදං පරො අඤ්ඤාසී"ති. (4) පරිසුද්ධාජීවො භික්ඛවෙ, තථාගතො. නත්ථි තථාගතස්ස මිච්ඡාජීවො,[1] යං තථාගතො රක්ඛෙය්‍ය "මා මෙ ඉදං පරො අඤ්ඤාසී"ති.

ඉමානි චත්තාරි තථාගතස්ස අරක්ඛෙය්‍යානි

කතමෙහි තීහි අනුපවජ්ජො

(1) ස්වාක්ඛාතධම්මො භික්ඛවෙ, තථාගතො. තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සති "ඉතිපි ත්වං න[2] ස්වාක්ඛාතධම්මො"ති. නිමිත්තමෙතං භික්ඛවෙ, න සමනුපස්සාමි. එතමහං[3] භික්ඛවෙ, නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

(2) සුපඤ්ඤත්තා ඛො පන මෙ භික්ඛවෙ, සාවකානං නිබ්බානගාමිනී පටිපදා යථාපටිපන්නා මම සාවකා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සති "ඉතිපි තෙ න සුපඤ්ඤත්තා සාවකානං නිබ්බානගාමිනී පටිපදා යථා පටිපන්නා තථාගතසාවකා[4] ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති"ති. නිමිත්තමෙතං භික්ඛවෙ න සමනුපස්සාමි. එතමහං[3] භික්ඛවෙ, නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

---

1. මිච්ඡාආජීවො, - මජසං
2. ඉතිපි තෙ න - සීමු.
3. එතමහං - මජසං
4. තවසාවකා - මජසං.

## 7. 2. 1. 6.

## [අරක්ඛෙය්‍ය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

මහණෙනි, තථාගතයන් වහන්සේගේ මේ අරක්ෂණීය (නොරැක්කයුතු) ධර්ම සතරෙකි. තුන් කරුණෙකිනුදු තථාගතයෝ අනුපවජ්ජයෝ (වැරදි නො කියයුත්තෝ) වෙත්.

තථාගතයන් වහන්සේගේ අරක්ෂණීය කරුණු සතර කවරේ ද යත්:

(1) මහණෙනි, තථාගතයෝ පරිශුද්ධ කායසමාචාර ඇතියහ. ''මාගේ මේ කාදුසිරිත අන්‍යයා නො දනීවා''යි යම් කාදුසිරිතක් තථාගතයෝ රක්නාහු නම්, එබඳු කායදුශ්චරිතයෙක් තථාගතයනට නැත. (2) මහණෙනි, තථාගතයෝ පරිශුද්ධවාක්සමාචාර ඇතියහ. ''මාගේ මේ (වාග්දුශ්චරිතය) අන්‍යයා නහමක් දනීව''යි යම් වාග්දුශ්චරිතයක් තථාගතයෝ රක්නාහු නම්, එබඳු වාග්දුශ්චරිතයෙක් තථාගතයනට නැත. (3) මහණෙනි, තථාගතයෝ පරිශුද්ධ මනොසමාචාර ඇතියහ. 'මාගේ මේ මනොදුශ්චරිතය අන්‍යයා නහමක් දනීව'යි යම් මනොදුශ්චරිතයක් තථාගතයෝ රක්නාහු නම්, එබඳු මනොදුශ්චරිතයෙක් තථාගතයනට නැත. (4) මහණෙනි, තථාගතයෝ පරිශුද්ධාජීව ඇතියහ. ''මාගේ මේ මිථ්‍යාජීවය අන්‍යයා නහමක් දනීවා''යි යම් මිථ්‍යාජීවයක් තථාගයෝ රක්නාහු නම්, එබඳු මිථ්‍යාජීවයෙක් තථාගතයනට නැත.

මේ තථාගතයන් වහන්සේගේ අරක්ෂණීය කරුණු සතර වෙත්.

කවර කරුණු තුනෙකින් අනුපවජ්ජයෝ වෙති යත්:

(1) මහණෙනි, තථාගතයෝ ස්වාඛ්‍යාතධර්ම ඇත්තෝ වෙති. මහණෙනි, එහි ලා ''මේ කරුණෙනිදු මුඹ ස්වාඛ්‍යාතධර්ම ඇතියහු නො වෙති''යි ශ්‍රමණයෙක් වේවයි බ්‍රාහ්මණයෙක් වේවයි දෙවියෙක් වේවයි මාරයෙක් වේවයි බ්‍රහ්මයෙක් වේවයි ලොව්හි අන් කිසිවෙක් වේවයි සකාරණ ව එකැතින් පෙරළා මට චෝදනා කරන්නේ ය යන තෙල නිමිත්ත (කරුණ), මහණෙනි, මම බුදුඇසින් නො දක්මි. මහණෙනි, තෙල නිමිත්ත නො දක්නෙම් ක්ෂෙමප්‍රාප්තයෙම් අභයප්‍රාප්තයෙම් විශාරදභාවයට පැමිණියෙම් වෙසෙමි.

(2) මහණෙනි, යම් පරිදි පිළිපන් මාගේ සව්වෝ ආස්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වෙසෙත් නම්, මා විසින් සව්වනට නිර්වාණගාමිනීප්‍රතිපද් එබඳු කොට මැනැවින් පණවනලදු. එහි ලා එකැතින් මහණෙක් වේවයි, බමුණෙක් වේවයි, දෙවියෙක් වේව යි, මරෙක් වේව යි, බඹෙක් වේව යි, ලොව්හි අන් කිසිවෙක් වේව යි මට සහධාර්මික කොට පෙරළා චෝදනා කරන්නේ ''යම් පරිද්දෙකින් පිළිපන් තථාගතශ්‍රාවකයෝ ආස්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වෙසෙත් නම්, එපරිදි මුඹ විසින් ශ්‍රාවකයනට නිර්වාණගාමිනීප්‍රතිපද් මෙ කරුණින් ද මනා කොට නො පණවන ලද්ද ය''යි කියන්නෙත් නම්, මහණෙනි, තෙල නිමිත්ත මම බුදුඇසින් නො දක්මි. මහණෙනි, ඒ නිමිත්ත ද නො දක්නෙම් මම ක්ෂෙමප්‍රාප්තයෙම් අභයප්‍රාප්තයෙම් වෛශාරද්‍යප්‍රාප්තයෙම් වෙසෙමි.

(3) අනෙකසතා ඛො පන මෙ භික්ඛවෙ, සාවකපරිසා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචො-දෙස්සති "ඉතිපි තෙ න අනෙකසතා සාවකපරිසා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තී"ති. නිමිත්තමෙතං භික්ඛවෙ, න සමනුපස්සාමි. එතමහං භික්ඛවෙ, නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

ඉමෙහි තීහි අනුපවජ්ජො.

ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි තථාගතස්ස අරක්ඛෙය්‍යානි. ඉමෙහි තීහි අනුපවජ්ජොති.

## 7. 2. 1. 6

## [කිම්බිල සුත්තං]

6. එවං මෙ සුතං: එකං සමයං භගවා කිම්බිලායං විහරති වෙළුවනෙ.[1] අථ ඛො ආයස්මා කිම්බිලො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා කිම්බිලො භගවන්තං එතදවොච:

"කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොතී"ති.

ඉධ කිම්බිල, තථාගතෙ පරිනිබ්බුතෙ භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො සත්ථරි අගාරවා විහරන්ති අප්පතිස්සා, ධම්මෙ අගාරවා විහරන්ති අප්පතිස්සා, සඞ්ඝෙ අගාරවා විහරන්ති අප්පතිස්සා, සික්ඛාය අගාරවා විහරන්ති අප්පතිස්සා, සමාධිස්මිං අගාරවා විහරන්ති අප්ප-තිස්සා, අප්පමාදෙ අගාරවා විහරන්ති අප්පතිස්සා, පටිසන්ථාරෙ අගාරවා විහරන්ති අප්පතිස්සා.

අයං ඛො කිම්බිල හෙතු අයං පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොතීති.

කො පන භන්තෙ, හෙතු, කො පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතී'ති.

1. නිචුලවනෙ - මජ්ඣං.

මහණෙනි, මාගේ අනේකශතශ්‍රාවක පිරිස්හු ඉහාත්මයෙහි ම ආශ්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්ති හා ප්‍රඥාවිමුක්ති තුමූ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වෙසෙත්. එහි ලා "මෙ කරුණෙහුදු බුදුන්ගේ අනේකශත ශ්‍රාවක පිරිස්හු ආශ්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය තුමූ ඉහාත්මයෙහි ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට පැමිණ නො වෙසෙත්" යයි එකාන්තයෙන් මට මහණෙක් වේවයි බමුණෙක් වේවයි දෙවියෙක් වේවයි මරෙක් වේවයි බඹෙක් වේවයි ලොව්හි අන් කිසිවෙක් වේවයි කරුණු සහිතව ප්‍රතිචෝදනා කරන්නේ ය යන තෙල නිමිත්ත මම නො දක්මි. මහණෙනි, තෙල නිමිත්ත නො දක්නෙම් මම ක්ෂේමප්‍රාප්තයෙම් අභයප්‍රාප්තයෙම් වෛශාරද්‍යප්‍රාප්තයෙම් වාසය කරමි.

මෙ කරුණු තුනෙන් තථාගතයෝ අනුපවද්‍යයෝ වෙත්.

මහණෙනි, තථාගතයන්ගේ මේ අරක්ෂණීය කරුණු සතර යි. මෙ කරුණු තුනෙන් තථාගතයෝ අනුපවද්‍ය වෙති යි.

7. 2. 1. 6.

## [කිම්බිල සූත්‍රය]

මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **කිම්බිලා** නගරාසන්නයෙහි **වේළුවනයෙහි** වැඩ වසනසේක. එකල්හි ආයුෂ්මත් **කිම්බිල** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්හි හුන්හ. එකත්පස්හි හුන් ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ:

වහන්ස, යම් කරුණෙකින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වේ නම් ඒ හේතු කවරේ ද, එ ප්‍රත්‍යය කවරේ දැ?යි.

කිම්බිලයෙනි, මෙ සස්නෙහි භික්ෂුහු භික්ෂුණීහු උපාසකයෝ උපාසිකාවෝ තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තාහු ප්‍රතිශ්‍රය (ගුරු කොට සැලකුම්) නැත්තාහු වාස කරති. ධර්මය කෙරෙහි ගෞරව නැත්තාහු ප්‍රතිශ්‍රය නැත්තාහු වාස කරත්. සඟුන් කෙරෙහි ගෞරව නැත්තාහු ප්‍රතිශ්‍රය රහිත වූවාහු වෙසෙත්. ශික්ෂායෙහි ගෞරව නැත්තාහු ප්‍රතිශ්‍රය නැත්තාහු වසත්. සමාධියෙහි ගෞරව නැත්තාහු ප්‍රතිශ්‍රය නැත්තාහු වාස කරති. අප්‍රමාදයෙහි ගෞරව නැත්තාහු ප්‍රතිශ්‍රය නැත්තාහු වාස කරත්. පිළිසඳරෙහි ගෞරව නැත්තාහු ප්‍රතිශ්‍රය නැත්තාහු වාස කරති.

කිම්බිලයෙනි, යම් කරුණෙකින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වේ නම්, මේ එයට හේතු ය, මෙ එයට ප්‍රත්‍යය යි.

වහන්ස, යම් කරුණෙකින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ නම්, ඒ හේතු කවරේ ද, එ ප්‍රත්‍යය කවරේ දැයි.

ඉධ කිම්බිල තථාගතෙ පරිනිබ්බුතෙ භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො සත්ථරි සගාරවා විහරන්ති සප්පතිස්සා, ධම්මෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සඞ්ඝෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, සික්ඛාය සගාරවා විහරන්ති සප්පතිස්සා, සමාධිස්මිං සගාරවා විහරන්ති සප්පතිස්සා, අප්පමාදෙ සගාරවා විහරන්ති සප්පතිස්සා, පටිසන්ථාරෙ සගාරවා විහරන්ති සප්පතිස්සා.

අයං ඛො කිම්බිල හෙතු, අයං පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතී'ති.

## 7. 2. 1. 7.

## [සත්තධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

7. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධො හොති. සීලවා හොති. බහුස්සුතො හොති පටිසල්ලීනො හොති. ආරද්ධවිරියො හොති. සතිමා හොති. පඤ්ඤවා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති.

## 7. 1. 2. 8.

## [පචලායන සුත්තං]

8. එවං මෙ සුතං: එකං සමයං භගවා භග්ගෙසු විහරති **සුංසුමාරගිරෙ භෙසකලාවනෙ** මිගදායෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාමොග්ගල්ලානො** මගධෙසු **කල්ලවාලමුත්තගාමෙ**[1] පචලායමානො නිසින්නො හොති. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ආයස්මන්තං මහාමොග්ගල්ලානං මගධෙසු කල්ලවාලමුත්තගාමෙ පචලායමානං නිසින්නං. දිස්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[2] වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව භග්ගෙසු සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ අන්තරහිතො මගධෙසු කල්ලවාලමුත්තගාමෙ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පමුඛෙ පාතුරහොසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච.

1. කල්ලවාලපුත්තගාමෙ - මජසං 2. සමිඤ්ජිතං - මජසං

කිම්බිලයෙනි, තථාගතයන් පිරිනිව් කල්හි මෙ සස්නෙහි මහණ මෙහෙණ උවසු උවැසියෝ ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව ව සප්‍රතිශ්‍රය ව වාසය කරන්නාහ. ධර්මයෙහි සගෞරව ව සප්‍රතිශ්‍රය ව වාසය කරන්නාහ. සඟුන්කෙරෙහි සගෞරව ව සප්‍රතිශ්‍රය ව වාසය කරන්නාහ. ශික්ෂායෙහි සගෞරව ව සප්‍රතිශ්‍රය ව වාසය කරන්නාහ. සමාධියෙහි සගෞරව ව සප්‍රතිශ්‍රය ව වාසය කරන්නාහ. අප්‍රමාදයෙහි සගෞරව ව සප්‍රතිශ්‍රය ව වාසය කරන්නාහ. ප්‍රතිසන්ථාරයෙහි සගෞරව ව සප්‍රතිශ්‍රය ව වාසය කරන්නාහ.

කිම්බිලයෙනි, යම් කරුණෙකින් තථාගතයන් වහන්සේ පිරිනිව් කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ නම්, මෙ එ හෙතු යි, මෙ එ ප්‍රත්‍යය යි.

## 7. 2. 1. 7.

## [සත්තධම්ම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

7. මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත මහණ නො බෝ කලෙකින් ම ඉහාත්මයෙහි ම ආශ්‍රවක්ෂයෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට එළඹ වෙසෙන්නේ ය. කවර සතෙකින ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධා ඇතියේ වෙයි, සිල්වත් වෙයි, බහුශ්‍රැත වෙයි, ප්‍රතිසංලීන වෙයි, රැකුළු වැර ඇතියේ වෙයි, ස්මෘතිමත් වෙයි, ප්‍රඥාවත් වෙයි.

මහණෙනි, මෙ කරුණු සතින් සමන්වාගත මහණ නොබෝකලෙකින් ම ආශ්‍රවක්ෂයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට එළඹ වාසය කරන්නේ ය යි.

## 7. 2. 1. 8.

## [පචලායන සූත්‍රය]

8. මා විසින් මෙසේ අසනලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ භග්ග ජනපදයෙහි සුංසුමාරගිර සමීපයෙහි වූ මාගදාව නම් භේසකලාවනයෙහි වැඩවසනසේක. එ සමයෙහි ආයුෂ්මත් මහාමුගලන්තෙරණුවෝ මගධ ජනපදයෙහි කල්ලවාලමුත්ත නම් ගම්හි නිදිබර වැ හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම පවත්නා දිවැස්නැණින් මගධජනපදයෙහි කල්ලවාලමුත්ත නම් ගම්හි නිදිබර වැහුන් ආයුෂ්මත් මහමුගලන් තෙරුන් දුටුසේක් ම ය. දැන බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දික්කරන්නේ හෝ දික්කළ අතක් වක්කරන්නේ යම්සේ නම්, එසෙයින් ම භග්ගජනපදයෙහි සුංසුමාරගිර සමීපයෙහි භෙසකලාවන නම් මුවවෙනෙහි අතුරුදන්වූසේක් මගධජනපදයෙහි කල්ලවාලමුත්ත නම් ගම්හි ආයුෂ්මත් මහමුගලන් තෙරුන් හමුයෙහි පැණිගියසේක. භාග්‍යවතුන් වහන්සේ පැනවූ අස්නෙහි වැඩහුන්සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ට තෙල කරුණ වදාළසේක:

පචලායසි නො ත්වං මොග්ගල්ලාන, පචලායසි නො ත්වං මොග්ගල්ලානාති. එවං භන්තෙති.

(1) තස්මාතිහ ත්වං මොග්ගල්ලාන යථා සඤ්ඤිනො[1] තෙ විහරතො තං මිද්ධං ඔක්කමති, තං සඤ්ඤං මා මනසාකාසි,[2] තං සඤ්ඤං මා බහුලමකාසි.[3] ඨානං ඛො පනෙතං මොග්ගල්ලාන විජ්ජති යං තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ.

(2) නො චෙ තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ. තතො ත්වං මොග්ගල්ලාන යථා සුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙය්‍යාසි, අනුවිචාරෙය්‍යාසි, මනසානුපෙක්ඛෙය්‍යාසි.[4] ඨානං ඛො පනෙතං විජ්ජති, යං තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ.

(3) නො චෙ තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ, තතො ත්වං මොග්ගල්ලාන, යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරෙය්‍යාසි. ඨානං ඛො පනෙතං විජ්ජති යං තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ.

(4) නො චෙ තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ, තතො ත්වං මොග්ගල්ලාන, උභො කණ්ණසොතානි ආවිඤ්ඡෙය්‍යාසි[5] පාණිනා ගත්තානි අනුමජ්ජෙය්‍යාසි. ඨානං ඛො පනෙතං විජ්ජති යං තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ.

(5) නො චෙ තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ, තතො ත්වං මොග්ගල්ලාන, උට්ඨායාසනා උදකෙන අක්ඛීනි අනුමජ්ජිත්වා[6] දිසා අනුවිලොකෙය්‍යාසි. නක්ඛත්තානි තාරකරූපානි උල්ලොකෙය්‍යාසි. ඨානං ඛො පනෙතං විජ්ජති යං තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ.

(6) නො චෙ තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ, තතො ත්වං මොග්ගල්ලාන, ආලොකසඤ්ඤං මනසිකරෙය්‍යාසි, දිවාසඤ්ඤං අධිට්ඨෙය්‍යාසි. යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා, ඉති විවටෙන[7] චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙය්‍යාසි. ඨානං ඛො පනෙතං විජ්ජති යං තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ.

(7) නො චෙ තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ, තතො ත්වං මොග්ගල්ලාන, පච්ඡාපුරෙසඤ්ඤී චඞ්කමං අධිට්ඨෙය්‍යාසි අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි අබහිගතෙන මානසෙන. ඨානං ඛො පනෙතං විජ්ජති යං තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ.

නො චෙ තෙ එවං විහරතො තං මිද්ධං පහීයෙථ, තතො ත්වං මොග්ගල්ලාන දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙය්‍යාසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා. පටිබුද්ධෙනච[8] තෙ මොග්ගල්ලාන, ඛිප්පංයෙව පච්චුට්ඨාතබ්බං: න සෙය්‍යසුඛං න පස්සසුඛං න මිද්ධසුඛං අනුයුත්තො විහරිස්සාමීති. එවං හි තෙ මොග්ගල්ලාන, සික්ඛිතබ්බං

---

1. සඤ්ඤිස්ස - මජ්සං. 2 මනසිකරෙය්‍යාසි - සයා
3. තං සඤ්ඤං මා බහුලං කරෙය්‍යාසි - සයා. 4. අනුපෙක්ඛෙය්‍යාසි - මජ්සං.
5. ආවිඤ්ජෙය්‍යාසි - මජ්සං. 6. අපනිජ්ජිත්වා - අට්ඨකථායං, පරිමජ්ජිත්වා - මජ්සං, සයා.
7. විවටෙන - සයා. 8 පටිබුද්ධෙනව - මජ්සං.

Free Distribution www.aathaapi.org

මුගලන, තෝ නිදිබරින් සැලෙහි නොයි. මුගලන, තෝ නිදන්නෙහි නො සි. වහන්ස, එසේ ය යි.

(1) එහෙයින් මුගලන, තෝ මෙහි ලා යම් යම් සංඥා ඇති ව වසන තොපට ඒ මිද්ධය බැසගනී නම්, ඒ සංඥාව නොහමක් මෙනෙහි කරව, ඒ සංඥාව නොහමක් බහුල කරව. මුගලන, මෙසේ වාසය කරණ තොපට ඒ මිද්ධය ප්‍රහීණ වන්නේ ය යන මෙ කරුණ විද්‍යමාන වෙයි.

(2) ඉදින් මෙසේ වසන තොපගේ එ මිද්ධය ප්‍රහීණ නොවේ නම්, මුගලන, තෝ ඉක්බිති යථාශ්‍රැත වූ යථාපර්‍ය්‍යාප්ත වූ ධර්මය සිතින් අනුවිතර්කණය කරව, අනුවිචාරණය කරව, මනසින් අනුප්‍රෙක්‍ෂණ කරව. මෙසේ වසන තොපගේ එ මිද්ධය ප්‍රහීණ වන්නේය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

(3) ඉදින් මෙසේ වසන තොපගේ එ මිද්ධය ප්‍රහීණ නො වේ නම්, මුගලන, එක්බිති තෝ යථාශ්‍රැත වූ යථාපර්‍ය්‍යාප්ත වූ ධර්මය විස්තර විසින් ස්වාධ්‍යාය (මැනවින් ශබ්ද) කරව. මේසේ වාසය කරණ තොපගේ එ මිද්ධය ප්‍රහීණ වන්නේ ය යන තෙල කරුණ ඇත.

(4) මෙසේ වාසය කරණ තාගේ ඒ මිද්ධය ඉදින් ප්‍රහීණ නො වේ නම්, මෞද්ගල්‍යායනයෙනි, එක්බිති තෝ දෙකන් සිදුරු හා ගාත්‍ර අත්ලෙන් පිරිමදුව. මෙසේ වාසය කරණ තොපගේ එ මිද්ධය ප්‍රහීණ වන්නේ ය යන මෙ කරුණ ඇත.

(5) මෙසේ වාසය කරණ තොපගේ එ මිද්ධය ඉදින් ප්‍රහීණ නො වේ නම්, මෞද්ගල්‍යායනයෙනි, එක්බිති තෝ හුනස්නෙන් නැගී දියෙන් ඇස් පිරිමැද දිගුන් අනුවිලොකන කරව, නැකැත් හා තාරකරූපයන් බලව. මෙසේ වාසය කරණ තාගේ එ මිද්ධය ප්‍රහීණ වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

(6) මෙසේ වාසය කරණ තාගේ එ මිද්ධය ඉදින් ප්‍රහීණ නො වේ නම්, මෞද්ගල්‍යායනයෙනි, එක්බිති තෝ ආලොකසංඥාව මෙනෙහි කරව දිවාසංඥාව ඉටව, දහවල යම්පරිදි වේ ද, රාත්‍රිය ද එපරිදි ය, රාත්‍රිය යම් පරිදි වේ නම් දහවල ද එපරිදි වේ යයි මෙසේ විවෘත වූ කෙලෙසුන්ගෙන් නො වෙළුනු සිතින් සප්‍රභාෂ චිත්තය වඩව. මෙ ලෙසින් වාසය කරණ තොපගේ එ මිද්ධය ප්‍රහීණ වන්නේය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

(7) මුගලන, මෙසේ වසන තොපගේ එ මිද්ධය ඉදින් ප්‍රහීණ නො වේ නම් තෝ පෙර පසු හැඟුම් ඇතියෙහි අභ්‍යන්තරඉන්ද්‍රියයන්ගෙන් උපලක්‍ෂිත වූයෙහි බැහැර නොගිය සිතින් චංක්‍රමණය ඉටන්නෙහි ය. යම් හෙයෙකින් මෙසේ වසන තොපගේ එ මිද්ධය ප්‍රහීණ වේ නම් එ කරුණ විද්‍යමානය.

ඉදින් මෙසේ වසන තොපට එ මිද්ධය ප්‍රහීණ නො වේ නම්, මුගලන ඉක්බිති තෝ දකුණු පාදයෙහි වම් පය මදක් හැද තබා සමෘතිමත් ව සම්ප්‍රජන්‍ය ඇත්තෙහි උත්ථානසංඥ මෙනෙහි කොට දකුණැලයෙන් ශය්‍යා කරව. මුගලන, ප්‍රබුද්ධ වූ ද තා විසින් වහා නැගිසිටිය යුතු: ශය්‍යාසුඛයෙහි, ස්පර්ශසුඛයෙහි, මිද්ධසුඛයෙහි අනුයුක්තයෙම් නො වෙසෙම්'යි. මෞද්ගල්‍යායනයෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු යි.

තස්මාතිහ මොග්ගල්ලාන එවං සික්ඛිතබ්බං: න උච්චාසොණ්ඩං පග්ගහෙත්වා කුලානි උපසඞ්කමිස්සාමීති. එවං හි තෙ මොග්ගල්ලාන, සික්ඛිතබ්බං.

සචෙ මොග්ගල්ලාන, භික්ඛු උච්චාසොණ්ඩං පග්ගහෙත්වා කුලානි උපසඞ්කමති, සන්ති හි මොග්ගල්ලාන, කුලෙසු කිච්චකරණීයානි යෙන[1] මනුස්සා ආගතං භික්ඛුං න මනසිකරොන්ති. තත්‍ර භික්ඛුස්ස එවං හොති: කො සුදානි[2] මං ඉමස්මිං කුලෙ පරිභින්දි. විරත්තරූපාදානි මෙ මනුස්සාති.[3] ඉතිස්ස අලාභෙන මඞ්කුභාවො. මඞ්කුභූතස්ස උද්ධච්චං. උද්ධතස්ස අසංවරො. අසංවුතස්ස ආරා චිත්තං සමාධිම්හා.

තස්මාතිහ මොග්ගල්ලාන, එවං සික්ඛිතබ්බං: න විග්ගාහිකකථං කථෙස්සාමීති. එවං හි තෙ මොග්ගල්ලාන, සික්ඛිතබ්බං. විග්ගාහිකාය මොග්ගල්ලාන කථාය සති කථාබාහුල්ලං පාටිකඞ්ඛං. කථාබාහුල්ලෙ සති උද්ධච්චං. උද්ධතස්ස අසංවරො. අසංවුතස්ස ආරා චිත්තා සමාධිම්හා.

නාහං මොග්ගල්ලාන, සබ්බෙහෙව සංසග්ගං වණ්ණයාමි. න පනාහං මොග්ගල්ලාන සබ්බෙහෙව සංසග්ගං න වණ්ණයාමි. සගහට්ඨපබ්බජිතෙහි ඛො අහං මොග්ගල්ලාන සංසග්ගං න වණ්ණයාමි. යානි ච ඛො තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි, තථාරූපෙහි සෙනාසනෙහි සංසග්ගං වණ්ණයාමීති.

එවං වුත්තෙ- ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං එතදවොච: කිත්තාවතා නු ඛො භන්තෙ, භික්ඛු සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති?

ඉධ මොග්ගල්ලාන, භික්ඛුනො සුතං හොති සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති. එවං චෙතං මොග්ගල්ලාන, භික්ඛුනො සුතං හොති සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති.

සො සබ්බං ධම්මං අභිජානාති. සො සබ්බං ධම්මං අභිඤ්ඤාය සබ්බං ධම්මං පරිජානාති. සබ්බං ධම්මං පරිඤ්ඤාය යං කිඤ්චි වෙදනං වෙදියති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති. සො තාසු වෙදනාසු අනිච්චානුපස්සී විහරන්තො, විරාගානුපස්සී විහරන්තො, නිරොධානුපස්සී විහරන්තො, පටිනිස්සග්ගානුපස්සී විහරන්තො න ච කිඤ්චි ලොකෙ උපාදියති. අනුපාදියං න පරිතස්සති. අපරිතස්සං පච්චත්තංයෙව පරිනිබ්බායති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

---

1. යෙහි - මජසං 2. කොසුනාමිදානි - මජසං.
3. විරත්තරූපාදානි මෙ මයි මනුස්සා - මජසං

මුගලන, එකරුණින් මෙහි ලා මාන නැමැති සොඬ දැඩි ව ගෙණ කුලයන් කරා නො එළැඹෙමි'යි මෙසේ තොප විසින් හික්මියයුතු යි. මුගලන, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

මුගලන ඉදින් මහණ උස් වූ මාන නැමැති සොඬ දැඩි ව ගෙණ කුලයන් වෙත එළැඹේ නම්, මෞද්ගල්‍යායනයෙනි, යම්හෙයෙකින් මනුෂ්‍යයෝ පැමිණි මහණ මෙනෙහි නො කෙරෙත් නම්, කුලයන්හි එබඳු කුදුමහත් කරණී වෙති. එහි ලා මහණහට මෙබඳු සිතෙක් වෙයි: "කවරෙක් නම් මා මෙකුලෙහි දැන් බිඳුවා ද, දැන් මෙ මිනිස්සු මා කෙරෙහි නො ඇලෙන සැහැවි ඇත්තාහ"යි මෙසේ ඔහට අලාභයෙන් මකුබව වෙයි. මකු වූවහුට නො සන්හුන්බව වෙයි. නොසන්සුන් සිත් ඇතියාහට අසංවර වෙයි. අසංවෘතයාගේ චිත්තය සමාධියෙන් දුරු වෙයි.

මෞද්ගල්‍යායනයෙනි, මෙහි ලා මෙසේ හික්මිය යුතු යි: විග්‍රාහික කථා (කලහයට හෙතුකථා) නො කරන්නෙමි යි. මුගලන, තොප විසින් මෙසේ ම හික්මියයුතු යි. මුගලන, විග්‍රාහික කථා ඇති වත් ම කථාබාහුල්‍යය කැමැති වියයුතු. කථා බාහුල්‍යය ඇති වත් ම උද්ධතභාවය වෙයි. උද්ධතයාහට අසංවරය වෙයි. අසංවෘත වූවහුගේ චිත්තය සමාධියෙන් දුරු වේ.

මෞද්ගල්‍යායනයෙනි, මම හැම කෙනකුන් හා සමඟ ම සංසර්ගය නො පසසමි. මෞද්ගල්‍යායනයෙනි, මම හැම දෙනෙකුන් හා සමඟ ම සසග නො පසසන්නෙමි නො වෙමි. මෞද්ගල්‍යායනයෙනි, ගැහැවියන් හා පැවිද්දන් හා ම සංසර්ගය මම නො වණමි. අල්පශබ්ද ඇති, ඝොෂා රහිත, ජනවාතයෙන් තොර වූ මිනිසුන්ගේ රහස්‍ය ක්‍රියාවට යොග්‍ය වූ පිළිසලනට සරුප් වූ යම් සෙනසුන් වෙත් නම්, එබඳු සෙනසුන් හා සසග මම පසසමියි.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් මුගලන් තෙරණුවෝ භාග්‍යවතුන්වහන්සේට මෙය ස්ග: වහන්ස, මහණ කෙතෙක් කරුණින් අත්‍යන්තනිෂ්ඨා ඇතියේ, අත්‍යන්තයොගක්ෂෙමී වූයේ, අත්‍යන්ත බ්‍රහ්මචාරී වූයේ, අත්‍යන්ත පර්‍ය්‍යවසාන ඇතියේ, දෙව්මිනිස්නට ශ්‍රෙෂ්ඨ වූයේ සැකෙවින් තෘෂ්ණාසංක්‍ෂය සඞ්ඛ්‍යාත නිර්‍වාණයෙහි මිදුනේ වේ දැයි.

මුගලන, මෙ සස්නෙහි මහණහු විසින් පඤ්චස්කන්ධාදි සර්‍වධර්‍මයෝ තෘෂ්ණාදෘෂ්ට්‍යාදි විසින් අභිනිවෙශයට නො නිසිහ'යි අසනලද වෙයි. මුගලන, මෙසේත් සර්‍වධර්‍මයෝ අභිනිවේශයට නො නිසිහ යන මෙල කරුණ භික්‍ෂු විසින් අසනලද වෙයි.

හෙ හැම ධර්‍ම (අනිත්‍යාදි විසින් ඥාතපරිඥයෙන්) මොනොවට දනියි. හෙ හැම ධර්‍ම (අනිත්‍යාදි විසින් විශෙෂාඥානයෙන්) දැන හැම ධර්‍මය (තීරණපරිඥයෙන්) පරිජානනය කෙරෙයි. හැම ධර්‍ම පරිජානනය කොට සුඛවෙදනා වේවයි, දුඃඛවෙදනා වේවයි අදුඃඛ අසුඛ වෙදනා (උපෙක්‍ෂාවෙදනා) වේවයි යම් කිසි වේදනාවක් විඳි නම්, එ වෙදනාවන්හි අනිත්‍යානුදර්ශී ව වාසය කරයි. (අවිචිඛ) විරාගානුදර්ශී ව වාසය කරයි. නිරොධානුදර්ශී ව වාසය කරයි. (අවිචිඛ) ප්‍රතිනිඃසර්ගානුදර්ශී ව වාසය කෙරෙයි. හේ එ වේදනාවන්හි අනිත්‍යානුදර්ශී ව වසන්නේ, විරාගානුදර්ශී ව වසන්නේ නිරොධානුදර්ශී ව වසන්නේ ප්‍රතිනිඃසර්ගානුදර්ශීව වසන්නේ ලොකයෙහි කිසිදු සංස්කාරගතයක් (තෘෂ්ණා විසින්) දැඩි ව නො ගන්නේ ය. දැඩි කොට නො ගන්නේ නො තැවෙයි. නො තැවෙනුයේ ප්‍රත්‍යාත්මයෙහි ම ක්ලෙශපරිනිර්‍වාණය කරයි. "ජාතිය ක්‍ෂීණ විය, බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවනලදී, සිවුමඟ කරණී කරණ ලදී. මෙ බව පිණිස කටයුතු අනෙකෙක් නැතැ"යි දනී.

එත්තාවතා ඛො මොග්ගල්ලාන, භික්ඛු සඞ්ඛිත්තෙන තණ්හාසඞ්ඛයවිමුත්තො හොති අච්චන්තනිට්ඨො අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො, සෙට්ඨො දෙවමනුස්සානන්ති.

### 7. 2. 1. 9.

### [මා පුඤ්ඤභායි සුත්තං]

**[සාවත්ථිනිදානං]**

9. මා භික්ඛවෙ, පුඤ්ඤානං භායිත්ථ. සුඛස්සෙතං භික්ඛවෙ, අධිවචනං යදිදං පුඤ්ඤානි.[1]

අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ, දීඝරත්තං කතානං පුඤ්ඤානං දීඝරත්තං ඉට්ඨං කන්තං මනාපං විපාකං පච්චනුභූතං. සත්තවස්සානි මෙත්තං චිත්තං[2] භාවෙසිං. සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙත්වා සත්තසංවට්ටවිවට්ටකප්පෙ[3] නයිමං ලොකං පුනරාගමාසිං. සංවට්ටමානස්සුදාහං[4] භික්ඛවෙ, ලොකෙ ආභස්සරූපගො හොමි. විවට්ටමානෙ ලොකෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි. තත්‍ර සුදං භික්ඛවෙ, [සත්තක්ඛත්තුං] බ්‍රහ්මා හොමි මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්තී. ඡත්තිංසක්ඛත්තුං ඛො පනාහං භික්ඛවෙ සක්කො අහොසිං දෙවානමින්දො. අනෙකසතක්ඛත්තුං රාජා අහොසිං චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්ස මය්හං භික්ඛවෙ, ඉමානි සත්තරතනානි අහෙසුං. සෙය්‍යථීදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිණායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පන මෙ භික්ඛවෙ, පුත්තා අහෙසුං සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සොහං ඉමං පඨවිං[5] සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසින්ති.[6]

41. පස්ස පුඤ්ඤානං විපාකං කුසලානං සුඛෙසිනො[7]
මෙත්තං චිත්තං විභාවෙත්වා සත්තවස්සානි භික්ඛවෙ,
සත්ත සංවට්ට-විවට්ටකප්පෙ නයිමං ලොකං පුනාගමං.

42. සංවට්ටමානෙ ලොකම්හි හොමි ආභස්සරූපගො,
විවට්ටමානෙ ලොකම්හි සුඤ්ඤං බ්‍රහ්මූපගො[8] අහුං.

43. සත්තක්ඛත්තුං මහාබ්‍රහ්මා වසවත්ති තදා අහුං.
ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං

44. චක්කවත්ති අහුං රාජා ජම්බුදීපස්ස ඉස්සරො
මුද්ධාවසිත්තො ඛත්තියො මනුස්සාධිපති අහුං.

45. අදණ්ඩෙන අසත්ථෙන විජෙය්‍ය පඨවිං ඉමං
අසාහසෙන ධම්මෙන සමෙන අනුසාසියං.[9]

46. ධම්මෙන, රජ්ජං කාරෙත්වා අස්මිං පඨවිමණ්ඩලෙ[10]
මහද්ධනෙ මහාභොගෙ අඩ්ඪෙ අජායිසං[11] කුලෙ

---

1. පුඤ්ඤානන්ති - මජසං. 2. මෙත්තචිත්තං - සයා. 3. සත්තසංවට්ටකප්පෙ - සීමු. 4. සංවට්ටමානෙ සුදාහං - සයා. 5 සො ඉමං පඨවිං - සීමු. 6. අජ්ඣාවසන්ති - සීමු. 7 සුඛෙසිනං - සීමු. 8. සුඤ්ඤබ්‍රහ්මූපගො - මජසං, සයා. 9. මනුසාසිසං - මජසං, සයා; මනුසාසිං - PTS. මනුසාසියං - සංවි. 10. පුථවිමණ්ඩලෙ - සීමු. 11 අජායිසං - මජසං.

මුගලන, මෙ තෙක් කරුණින් මහණ සැකෙවින් අත්‍යන්තනිෂ්ඨා ඇතියේ අත්‍යන්තයොගක්ෂෙමී වූයේ අත්‍යන්තබ්‍රහ්මචාරී වූයේ අත්‍යන්තපර්‍යවසාන ඇතියේ තෘෂ්ණාසංක්ෂයෙ විමුක්ත වූයේ දෙව්මිනිස්නට ශ්‍රෙෂ්ඨ වේ ය යි.

## 7. 2. 1. 9.

## [මාපුඤ්ඤභායි සූත්‍රය]

[සැවැත් නිදාන යි]

9. මහණෙනි, පුණ්‍යයනට නහමක් බිය වවු. මහණෙනි, යම් මේ 'පුණ්‍ය' යන ශබ්දයෙක් වේ නම් තෙල සුඛයට නමෙකි. මහණෙනි, මම දීර්ඝරාත්‍රයෙහි කරණලද පුණ්‍යකර්මයන්ගේ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ දීර්ඝරාත්‍රයෙහි පුනපුනා විඳිනාලද විපාක මොනොවට දත්මි. සත්වසක් (ධ්‍යානගත) මෙත්සිත් වැඩීමි. සත්වසක් මෙත්සිත් වඩා නස්නා වූ ද වැඩෙන්නා වූ ද කප්සතක් යළි මේ ලොවට උපත් විසින් නො පැමිණියෙමි. මහණෙනි, ලොව නස්නා කල්හි මම ආභාස්වර බඹලොවට පැමිණියෙමි. ලොව වඩනා කල්පයෙහි ශූන්‍ය බ්‍රහ්මවිමානයෙහි උපදිමි. මහණෙනි, එහි ද මම බ්‍රහ්ම වූයෙමි සෙසු බඹුන් මඩනාසුල්ලෙමි, අභිභූත නො වූයෙමි, එකාන්තයෙන් දක්නා සුලුයෙමි, මෙරමා වශයෙහි පවත්වනසුල්ලෙම් වෙමි. මහණෙනි, මම සතිස්වරක් දෙවියනට ඉන්ද්‍ර වූයෙමි ශක්‍ර වීමි. නොයෙක්වර ධාර්මික වූ ධර්මරාජ වූයෙම් සිවුසයුර හිම් කොට ඇති මිහිපල් වූයෙම් දිනූ සංග්‍රාම ඇත්තෙම්, ජනපදයන්හි ස්ථාවරභාවයට පැමිණියෙම් සත්රුවනින් සමන්වාගත වූයෙම් සක්විතිරජවීමි. මහණෙනි, සත්රුවන් නම්: සක්රුවන ඇත්රුවන අස්රුවන මිණිරුවන ඉතිරිරුවන ගැහැවිරුවන සෙනෙවිරද්රුවන යි. මහණෙනි, එබඳු මට මෙ සත්රුවන්හු වූහ. මහණෙනි, මට සූර වූ වීරාඞ්ගස්වරූප වූ සතුරුසෙන් මඩනා දහසකට වැඩි පුත්‍රයෝ වූහ. එබඳු මම සයුරු හිම් කොට ඇති පොලොව අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් ධර්මයෙන් දිනාගෙණ විසීමි යි.

41. සුවකැමැතියෙනි, කුශල සඞ්ඛ්‍යාත පුණ්‍යයන්ගේ විපාකය නහමවු. මහණෙනි, සත්වසක් මෙත්සිත් වඩා මම සප්තසංවර්ත විවර්ත-කල්පයක් මෙ මිනිස්ලොවට පෙරලා නො පැමිණියෙමි.

42. ලොකය නස්නා කල්හි මම ආභාස්වරොපග වෙමි. ලොකය වැඩෙන කල්හි ශූන්‍ය වූ බ්‍රහ්මවිමානොපගවීමි.

43. එකල්හි මම සත් වරක් වසවත් මහබඹ වීමි. සතිස් වරක් දෙවෙන්ද්‍ර වූයෙම් දෙව්රජය කරවීමි.

44. මම ජම්බුද්වීපෙශ්වර වූයෙම් සක්විති රජ වීමි. මූර්ධාභිෂික්තව ක්ෂත්‍රිය මනුෂ්‍යයනට අධිපති වීමි.

45. අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් මෙ පොළොව දිනා නො සැහැසිකමින් දැහැමින් සෙමෙන් රාජ්‍යානුශාසන කෙළෙමි.

46. මෙ පොළෝමඩුලුයෙහි දැහැමින් රජය කොට මහද්ධන ඇති මහාභොග ඇති ආඪ්‍ය වූ කුලයෙහි උපන්මි.

47. සබ්බකාමෙහි සම්පන්නො, රතනෙහි ච සත්තහි,
බුද්ධා සඞ්ගාහකා ලොකෙ තෙහි එතං[1] සුදෙසිතං.

48. එස[2] හෙතුමහන්තස්ස පඨව්‍යා[3] යෙන වුච්චති.
පහූතවිත්තූපකරණො රාජා හොමි[4] පතාපවා.

49. ඉද්ධිමා යසවා හොමි ජම්බුසණ්ඩස්ස ඉස්සරො.
කො සුත්වා නප්පසීදෙය්‍ය අපි කණ්හාභිජාතියො.

50. තස්මා හි අත්ථකාමෙන[5] මහත්තමභිකඞ්ඛතා[6]
සද්ධම්මො ගරුකාතබ්බො සරං බුද්ධාන සාසනං.

## 7. 2. 1. 10

## [සත්තභරියා සුත්තං]

**10.** එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.* අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

තෙන ඛො පන සමයෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනෙ මනුස්සා උච්චාසද්දා මහාසද්දා හොන්ති. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

කින්නු තෙ ගහපති නිවෙසනෙ මනුස්සා උච්චාසද්දා මහාසද්දා, කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙති? අයං භන්තෙ, සුජාතා ඝරසුණ්හා, අඩ්ඪා අඩ්ඪකුලා ආනීතා. සා නෙව සස්සුං ආදියති. න සසුරං ආදියති. න සාමිකං ආදියති. භගවන්තම්පි න සක්කරොති, න ගරුකරොති, න මානෙති, න පූජෙතීති.

අථ ඛො භගවා සුජාතං ඝරසුණ්හං ආමන්තෙසි එහි සුජාතෙති. එවම්භන්තෙති ඛො සුජාතා ඝරසුණ්හා භගවතො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සුජාතං ඝරසුණ්හං භගවා එතදවොච:

සත්ත ඛො ඉමා සුජාතෙ, පුරිසස්ස භරියායො. කතමා සත්ත:

වධකසමා, චොරිසමා, අය්‍යසමා, මාතුසමා, භගිනිසමා, සඛීසමා, දාසීසමා, ඉමා ඛො සුජාතෙ, සත්ත පුරිසස්ස භරියායො.

තාසං ත්වං කතමාති.

න ඛො අහං භන්තෙ, ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි.

1. තෙහෙතං - සාළුවි. 2. එසො - මජසං. 3. පුථව්‍යා සීමු
4. හොති - මජසං 5. අත්තකාමෙන - සීමු. 6 මහත්තමභිකඞ්ඛතා - සීමු.
* අයං පාඨො මරම්මපොත්ථකෙ නදිස්සතෙ.

47. හැම කාමවස්තුයෙන් හා සප්තරත්නයෙන් සපත් වීමි. ලොව්හි බුදුවරු සංග්‍රාහක වෙති. උන්වහන්සේ විසින් තෙල කරුණ මොනොවට දෙසනලදි.

48. යම් හෙයෙකින් පෘථිවීශ්වරයෙම් බොහෝ සම්පත් හා උපකරණ ඇතියෙම් ප්‍රතාපවත් රජ වෙම්'යි කියනුලැබේ නම් මහත්වයට තෙල හේතු වෙයි.

49. ජම්බුද්වීපෙශ්වර වූයෙම් සෘද්ධිමත් ද යශස්වී ද වෙමි. කෘෂ්ණාභි-ජාතික වූ ද (පාපකර්ම විපාකයෙන් උපන්නා වූ ද) කවරෙක් නම් එය අසා නො පහදනේ ද?

50. එහෙයින් ම අර්ථය කැමැති මහත්ත්වය පතන්නහු විසින් බුදුන්ගේ ශාසනය සිහි කරමින් සද්ධර්මය ගුරු කටයුත්තේ ය යි.

## 7. 2. 1. 10.

## [භාර්‍යා සූත්‍රය]

10. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පූර්වාහ්ණ සමයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ අනාථපිණ්ඩික ගෘහපතිහුගේ නිවෙස්නට වැඩිසේක. වැඩ පැනවූ අස්නෙහි වැඩහුන්සේක.

එ වෙලාවෙහි අනේපිඬුසිටුහුගේ නිවෙස්හි මිනිස්සු උස්හඬ ඇත්තාහු මහහඬ ඇත්තාහු වෙති. එක්බිති අනේපිඬු ගැහැවි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳ. එකත්පස්හි හුන් අනේපිඬුගැහැවි හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

ගෘහපතියෙනි, කවර හෙයින් තාගේ ගෙහි මිනිස්සු කෙවුලන් මසුන් පැස තැබූ කැන් සෙයින් උස්හඬ ඇත්තාහු මහහඬ ඇත්තාහු වෙත් දැයි.

වහන්ස, සුජාතා නම් වූ මෙ ආඪ්‍ය වූ කුල දුවක් ආඪ්‍ය කුලයෙකින් ගෙණෙනලදු. (මෞ මාගේ) නැදි යයි කියා හෝ නො ම ගන්නී ය. (මෙ මාගේ) මයිල් යයි කියා හෝ නො ගණී. (මෙ මා) හිමි යි හෝ නොගන්නී ය. භාග්‍යවතුන් වහන්සේට හෝ සත්කාර නො කරයි. ගුරුකාර නො කරයි. බුහුමන් නො කරයි. නො පුදයි.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ සුජාතාකුලදුව ඇමතූසේක. සුජාතා-වනි, මෙහි එව'යි. වහන්ස, එසේ ය යි සුජාතාකුලදූ භාග්‍යවතුන් වහසේට පිළිවදන් අස්වා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියා ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්හි හුනු. එකත්පස්හි හුන් සුජාතා කුලදුවට භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළසේක:

සුජාතාවෙනි, පුරුෂයකුට මේ භාර්‍යාහු සත් දෙනෙක් වෙති. කවර සත් දෙනෙක යත්:

වධකසමා ය, චෞරීසමා ය, අයාසිසමා ය, මාතුසමා ය, භගිනීසමා ය, සඛීසමා ය, දාසීසමා ය යි. සුජාතාවෙනි පුරුෂයාට මෙ සත්බිරියෝ වෙත්.

ඔවුනතුරෙන් නී කවරක් වෙහි දැයි?

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාළ තෙල භාෂිතයාගේ අර්ථය විස්තර විසින් මම නො දනිම් මැයි.

සාධු මෙ භන්තෙ, භගවා තථා ධම්මං දෙසෙතු, යථා අහං ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති.

තෙන හි සුජාතෙ, සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො සුජාතා ඝරසුණ්හා භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

51. පදුට්ඨචිත්තා අහිතානුකම්පිනී
අඤ්ඤෙසු රත්තා අතිමඤ්ඤතෙ පතිං,
ධනෙන කීතස්ස වධාය උස්සුකා,
යා එවරූපා පුරිසස්ස භරියා
වධකා ච භරියාති ච සා පවුච්චති

52. යං ඉත්ථියා වින්දති සාමිකො ධනං
සිප්පං වණිජ්ජඤ්ච කසිං අධිට්ඨහං,
අප්පම්පි තස්සා[1] අපහාතුමිච්ඡති,
යා එවරූපා පුරිසස්ස භරියා
චොරී ච භරියාති ච සා පවුච්චති.

53. අකම්මකාමා අලසා මහග්ඝසා
ඵරුසා ච චණ්ඩී ච දුරුත්තවාදිනී,
උට්ඨායකානං අභිභුය්‍ය වත්තති,
යා එවරූපා පුරිසස්ස භරියා
අය්‍යා ච භරියාති ච සා පවුච්චති.

54. යා සබ්බදා හොති හිතානුකම්පිනී
මාතාව පුත්තං අනුරක්ඛතෙ පතිං,
තතො ධනං සම්භතමස්ස රක්ඛති,
යා එවරූපා පුරිසස්ස භරියා
මාතා ච භරියාති ච සා පවුච්චති.

55. යථාපි ජෙට්ඨා[2] භගිනී කනිට්ඨා
සගාරවා හොති සකම්හි සාමිකෙ,
හිරීමනා[3] භත්තුවසානුවත්තිනී,
යා එවරූපා පුරිසස්ස භරියා
භගිනී ච භරියාති ච සා පවුච්චති.

56. යා චීධ දිස්වාන පතිං පමොදති
සඛී සඛාරංව චිරස්සමාගතං,
කොලෙය්‍යකා සීලවතී පතිබ්බතා,
යා එව රූපා පුරිසස්ස භරියා
සඛී ච භරියාති ච සා පවුච්චති.

57. අක්කුද්ධසන්තා[4] වධදණ්ඩතජ්ජිතා
අදුට්ඨචිත්තා පතිනො තිතික්ඛති,
අක්කොධනා භත්තුවසානුවත්තිනී,
යා එවරූපා පුරිසස්ස භරියා
දාසී ච භරියාති ච සා පවුච්චති.

1. අප්පම්පි තස්ස - මජසං, අප්පම්පිස්ස—සආවි. 2. ජෙට්ඨා—සිමු.
3. හිරිමනා—සිමු. 4. අක්කුට්ඨවධභයා—ජාතක අට්ඨකථා.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් වදාළ මේ භාෂිතයාගේ අර්ථය යම් පරිද්දෙකින් විස්තර විසින් දැන ගන්නෙම් නම් මට එපරිද්දෙන් ධර්මය දෙසන සේක්වා යි.

සුජාතාවෙනි, එසේ හෙයින් අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමි යි. වහන්ස එසේ යයි සුජාතා කුල දූ තොමෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූ ය. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

51. යම් බිරියක් ප්‍රදුෂ්ට සිත් ඇත්තී ද, හිතානුකම්පා නැත්තී ද, පරපුරුෂයන් කෙරෙහි ඇලුනී ද, සිය සැමියා ඉක්ම සිතා ද, ධනයෙන් විකොට ගන්නා ලද්දී වධ කිරීමට උත්සුක වේ ද, පුරුෂයකුගේ මෙබඳු යම් බිරියක් වත්තී නම් ඕ වධක වැනි ය යි ද භාර්‍ය්‍යා යි ද කියනු ලබා.

52. ස්ත්‍රියගේ හිමි තෙම ශිල්පය වෙළඳහම් ගොවිකම් කරමින් යම් ධනයක් ලබා ද, ස්ත්‍රී ඒ ධනයෙන් අල්පයකුදු පැහැරගනු කැමැති වේ ද, පුරුෂයාගේ මෙබඳු යම් බිරියක් වී නම්, ඕ සොරිය යි ද බිරිය යි ද කියනු ලබා.

53. (යම් බිරියක්) කටයුතු නො රුස්නී අලස වූවා බොහෝ කොට අනුභව කරන්නී රළු වූවා සැඩ වූවා කැකුළු තෙපුල කියන්නී හිමිහුගේ උත්ථානසම්පදාව මැඩගෙණ වැටෙන්නී වී ද, පුරුෂයාගේ මෙබඳු ඒ බිරිය ආර්‍ය්‍යා ය යි ද භාර්‍ය්‍යා ය යි ද කියනු ලබයි.

54. යම් බිරියක් හැම විට හිතානුකම්පා ඇත්තී මවක් පුතකු සෙයින් හිමියා රක්නී ද, වැලිදු ඔහු විසින් උපයනලද ධනයත් රක්නී ද, පුරුෂයාගේ මෙබඳු යම් බිරියක් වී නම් ඕ මාතෘ යයි ද භාර්‍ය්‍යා යයි ද කියනු ලබා.

55. දෙටු බෑණා කෙරෙහි කණිටු බුහුන යම්සේ පවත්නී ද, එසෙයින් සිය හිමිහු කෙරෙහි ගෞරව සහිත වේ ද, ලජ්ජාසිත් ඇත්තී ද, හිමිහුගේ වශය අනුව වැටෙන්නී ද, පුරුෂයාගේ මෙබඳු යම් බිරියක් වී නම් ඕ භගිනී යයි ද භාර්‍ය්‍යා යයි ද කියනු ලබා.

56. මෙ ලොව්හි යම් බිරියක් බොහෝ කලෙකින් පැමිණි යහළුවකු දැක තුටු වන යෙහෙළියක සෙයින් සිය හිමිහු දැක ප්‍රමුදිත වී නම්, කුලසපන් වූවා සිල්වත් වූවා පතිව්‍රත ඇත්තී ද, පුරුෂයාගේ මෙ බඳු යම් බිරියක් වී නම් ඕ යෙහෙළියක් යයි ද බිරිය යයි ද කියනු ලබා.

57. (හිමියා විසින්) දඬු ගෙණ වධයෙන් තර්ජනය කරණලද්දී නො කිපුනී ම දුෂ්ටචිත්ත නැත්තී හිමිහට ක්‍ෂමා කරන්නී ද, නො-කිපෙනසුලු වූවා හිමියාගේ වශයෙහි වැටෙන්නී ද, පුරුෂයාගේ මෙ බඳු යම් බිරියක් වී නම්, ඕ දාසී යයි ද භාර්‍ය්‍යා යයි ද කියනු ලබා.

14

58. යා චීධ භරියා වධකාති වුච්චති
චොරී ච අය්‍යාති ච යා පවුච්චති,
දුස්සීලරූපා ඵරුසා අනාදරා
කායස්ස භෙදා නිරයං වජන්ති තා.

59. යා චීධ මාතා භගිනී සඛී ච
දාසී ච භරියාති ච යා පවුච්චති,
සීලෙ ඨිතත්තා චිරරත්තසංවුතා
කායස්ස භෙදා සුගතිං වජන්ති තා.

ඉමා ඛො සුජාතෙ සත්ත පුරිසස්ස භරියායො. තාසං ත්වං කතමාති? අජ්ජතග්ගෙ මං භන්තෙ, භගවා දාසී සමං සාමිකස්ස භරියං ධාරෙතූති.

7. 2. 1. 11

[කොධන සුත්තං]

[සාවත්ථිනිදානං]

11. සත්තිමෙ භික්ඛවෙ, ධම්මා සපත්තකන්තා සපත්තකරණා කොධනං ආගච්ඡන්ති ඉත්ථිං වා පුරිසං වා. කතමෙ සත්ත:

(1) ඉධ භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං දුබ්බණ්ණො අස්සාති. තං කිස්ස හෙතු: න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස වණ්ණවතාය නන්දති. කොධනොයං භික්ඛවෙ පුරිසපුග්ගලො කොධාභිභූතො කොධපරෙතො. කිඤ්චාපි සො හොති සුනහාතො සුවිලිත්තො කප්පිතකෙසමස්සු ඔදාතවත්ථවසනො, අථ ඛො සො දුබ්බණ්ණොව හොති කොධාභිභූතො. අයං භික්ඛවෙ, පඨමො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

(2) පුනචපරං භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං දුක්ඛං සයෙය්‍යාති. තං කිස්ස හෙතු? න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස සුඛසෙය්‍යාය නන්දති. කොධනොයං භික්ඛවෙ, පුරිසපුග්ගලො කොධාභිභූතො කොධපරෙතො. කිඤ්චාපි සො පල්ලඞ්කෙ සෙති ගොනකත්ථතෙ පටිකත්ථතෙ පටලිකත්ථතෙ කාදලිමිගපවරපච්චත්ථරණෙ සඋත්තරච්ඡදෙ උභතො ලොහිතකූපධානෙ, අථ ඛො සො දුක්ඛංයෙව සෙති කොධාභිභූතො. අයං භික්ඛවෙ දුතියො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

58. මෙ ලොව්හි යම් බිරියක් වධකා ය යි කියනු ලබා නම්, යම් බිරියක් චොරී ය යි ද අය්‍යා යි ද කියනු ලබා නම්, දුඃශීලස්වභාව ඇති රළු වූ ආදර නැති ඔහු කාබූත් මරණින් මතු නිරයට පිළිසඳ විසිත් යෙති.

59. මෙ ලොව්හි යම් බිරියක් මාතෘභාර්‍ය්‍යා යයි ද භගිනීභාර්‍ය්‍යා යයි ද සඛීභාර්‍ය්‍යා යයි ද දාසීභාර්‍ය්‍යා යයි ද කියනු ලබා නම්, ශීලයෙහි පිහිටි සිත් ඇති චිරරාත්‍රයෙහි සංවෘත වූ ඔහු කාබූත් මරණින් මතු සුගතියට යෙත්.

සුජාතාවෙනි, මොහු සත්දෙන පුරුෂයාහට භාර්‍ය්‍යාවෝ වෙති. උන් අතුරෙහි තෝ කවරක් වෙහි දැයි. භාග්‍යවතුන් වහන්ස, අද පටන් කොට මා සැමියාගේ දැසියක සම වූ බිරිය කොට ධරණයේක්වයි.

## 7. 2. 1. 11.

## [කෝධන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**11.** මහණෙනි, වෛරීන්ට කාන්ත වූ වෛරීන්ට අර්ථකරණ මෙ සත් දහම් කෙනෙක් කිපෙනසුලු මාගම කරා හෝ පුරුෂයා කරා හෝ පෙරලා එති. කවර සතෙක යත්:

(1) මහණෙනි, මෙ ලොව්හි සතුරා (තමාගේ) සතුරාහට මෙසේ කැමැති වෙයි: ''මේ තෙම දුර්වර්ණ වන්නේ නම් මැනැවැ''යි. එ කවර හෙයින යත්: මහණෙනි, සතුරා සතුරාගේ වර්ණවද්භාවයෙන් සතුටු නො වෙයි. මහණෙනි, මේ පුරුෂ කිපෙනසුලු ක්‍රොධයෙන් මඩනාලද ක්‍රොධානුගත වූයේ වෙයි. හේ මැනැවින් නහා කෙලේ මැනැවින් ගැල්වූ අලෙව් ඇතියේ අත්දම් තැබූ කෙහෙමස් ඇතියේ හඳනාලද හෙළපිළී ඇතියේ වී නමුදු, වැලි හේ ක්‍රොධයෙන් අභිභූත වූයේ දුර්වර්ණ මැ වෙයි. මහණෙනි, සපත්නකාන්ත වූ සපත්නකරණ වූ මෙ පළමු කරුණ කිපෙනසුලු ස්ත්‍රිය හෝ පුරුෂයා හෝ කරා පැමිණෙයි.

(2) තවද මහණෙනි, සතුරෙක් (සිය) සතුරුහට මෙසේ කැමැති වෙයි, 'මේ තෙම දුකසේ හෝන්නේ වේ නම් මැනැවැ'යි. එ කවර හෙයින යත්: මහණෙනි, සතුරු තෙම සතුරාගේ සුඛශය්‍යායෙන් සතුටු නො වෙයි. මහණෙනි, මේ පුරුෂ තෙම කිපෙනසුලු වූයේ ක්‍රොධයෙන් අභිභූත වූයේ ක්‍රොධවශයට පැමිණියේ වෙයි. හෙ වැළිත් කොඳුපලස් අතුල මොළොක් සුදුඑළලොම් ඇතිරි අතුල ඝනපුප්ලොම් ඇතිරි අතුල උතුම් කෙසෙල්මුව-සමින් කළ ඇතිරි අතුල උඩුවියන් සහිත දෙපස්හි තැබූ රත්කන්වයින් ඇති පලඟෙක්හි හෝනේ නමුදු හෙ ක්‍රොධයෙන් මැඩුනේ දුකසේ ම හෝනේ වෙයි. මහණෙනි, සපත්නකාන්ත වූ සපත්නකරණ වූ මෙ දෙවන කරුණ කිපෙනසුලු ස්ත්‍රිය හෝ පුරුෂයා හෝ කරා පැමිණෙයි.

(3) පුනචපරං භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං න පචුරත්ථො අස්සාති. තං කිස්ස හෙතු? න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස පචුරත්ථතාය නන්දති. කොධනොයං භික්ඛවෙ, පුරිසපුග්ගලො කොධාභිභූතො කොධපරෙතො. අනත්ථම්පි ගහෙත්වා අත්ථො මෙ ගහිතොති මඤ්ඤති. අත්ථම්පි ගහෙත්වා අනත්ථො මෙ ගහිතොති මඤ්ඤති. තස්සිමෙ ධම්මා අඤ්ඤමඤ්ඤං විපච්චනීකා ගහිතා දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තන්ති කොධාභිභූතස්ස. අයං ඛො භික්ඛවෙ, තතියො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

(4) පුනචපරං භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං න භොගවා අස්සාති. තං කිස්ස හෙතු? න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස භොගවතාය නන්දති. කොධනස්ස භික්ඛවෙ, පුරිසපුග්ගලස්ස කොධාභිභූතස්ස කොධපරෙතස්ස යෙපිස්ස තෙ හොන්ති භොගා උට්ඨාන-විරියාධිගතා බාහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා, තෙපි රාජානො රාජකොසං පවෙසෙන්ති කොධාභිභූතස්ස. අයං භික්ඛවෙ, චතුත්ථො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

(5) පුනචපරං භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං න යසවා අස්සාති. තං කිස්ස හෙතු? න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස යසවතාය නන්දති. කොධනොයං භික්ඛවෙ, පුරිසපුග්ගලො කොධාභිභූතො කොධපරෙතො. යොපිස්ස සො හොති යසො අප්පමාදාධිගතො තම්හාපි ධංසති කොධාභිභූතො. අයං භික්ඛවෙ, පඤ්චමො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

(6) පුනචපරං භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං න මිත්තවා අස්සාති. තං කිස්ස හෙතු? න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස මිත්තවතාය නන්දති. කොධනොයං භික්ඛවෙ, පුරිසපුග්ගලො කොධාභිභූතො කොධපරෙතො. යෙපිස්ස තෙ හොන්ති මිත්තාමච්චා ඤාතිසාලොහිතා, තෙපි ආරකා තං පරිවජ්ජෙන්ති කොධාභිභූතං. අයං භික්ඛවෙ, ඡට්ඨො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

(7) පුනචපරං භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති: අහො වතායං කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යාති. තං කිස්ස හෙතු? න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස සුගතිගමනෙන නන්දති. කොධනොයං භික්ඛවෙ, පුරිසපුග්ගලො කොධාභිභූතො කොධපරෙතො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා -පෙ- කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කොධාභිභූතො. අයං භික්ඛවෙ, සත්තමො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.

Free Distribution www.aathaapi.org

(3) තවද මහණෙනි, සතුරා සතුරකුහට මෙසේ කැමැති වෙයි: 'මේ තෙම බොහෝ ධන ඇතියේ නො වේ නම් මැනැවැ'යි. එ කවර හෙයින යත්: මහණෙනි, සතුරා සතුරකුගේ ප්‍රචුරාර්ථභාවයෙන් සතුටු නො වෙයි. මහණෙනි, මේ පුරුෂපුද්ගල ක්‍රෝධයෙන් අභිභූත වූයේ ක්‍රෝධවශයට පැමිණියේ අනර්ථය ද ගෙණ 'මා විසින් අර්ථය ගන්නාලද්දැ'යි හඟනේ ය. අර්ථය ද ගෙණ 'මා විසින් අනර්ථය ගන්නා ලද්දැ'යි හඟනේ ය. ක්‍රෝධාභිභූත වූ ඔහු විසින් පරස්පර ප්‍රත්‍යනීක වූ ගන්නාලද මේ ධර්මයෝ දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වැටෙත්නාහ. මහණෙනි, සතුරාට කාන්ත වූ සතුරුකරණවූ මේ තෙවන කරුණ කිපෙනසුලු ස්ත්‍රියට වේවයි පුරුෂයාට වේවයි පැමිණෙයි.

(4) තවද මහණෙනි, සතුරෙක් සතුරකුහට මෙසේ කැමැති වෙයි: 'මේ තෙම භොග ඇතියේ නො වේ නම් මැනැවැ'යි එ කවර හෙයින යත්: මහණෙනි, සතුරුතෙම සතුරාගේ භොගවත්භාවයෙන් නො සතුටු වෙයි. මහණෙනි, කිපෙනසුලු ක්‍රෝධයෙන් මැඩුනු ක්‍රෝධවශයට ගිය පුරුෂ-පුද්ගලයාගේ යම් එ භොගයෝ වෙත් නම් උත්ථානවීර්‍ය්‍යයෙන් අධිගත වූවාහු බාහුබලයෙන් රැස් කරණලද්දාහු ඩහදියෙන් වගුරුවා උපයාලූවාහු දැහැමි වූවාහු දැහැමින් ලද්දාහු වෙත් නම්, ක්‍රෝධාභිභූත වූ ඔහුගේ එයද රජහු රාජභාණ්ඩා-ගාරයට පමුණුවත්. මහණෙනි, සපත්නකාන්ත වූ සපත්නකරණ වූ මේ සතරවන කරුණ ක්‍රෝධකරණසුලු ස්ත්‍රියට හෝ පුරුෂයාට හෝ පැමිණේ.

(5) තවද මහණෙනි, සතුරෙක් සතුරකුහට මෙසේ කැමැති වෙයි: 'මේතෙම යශස් ඇතියේ නො වන්නේ නම් මැනැවැ'යි. එ කවර හෙයින යත්: මහණෙනි, සතුරෙක් සතුරකුගේ යශොවද්භාවයෙන් නො සතුටු වෙයි. මහණෙනි, මේ පුරුෂපුද්ගල කිපෙනසුලු වූයේ ක්‍රෝධයෙන් අභිභූත වූයේ ක්‍රෝධවශයට පැමිණියේ වෙයි. අප්‍රමාදයෙන් ඔහු විසින් ලැබගත් යම් යශසෙක් වේ නම් ක්‍රෝධාභිභූත වූ හෙ එයිනුදු පිරිහෙයි. මහණෙනි, සපත්න කාන්ත වූ සපත්න කරුණවූ මේ පස්වන කරුණ ක්‍රෝධයෙන් යුත් ස්ත්‍රියට වේවයි පුරුෂයාට වේවයි පැමිණේ.

(6) තවද මහණෙනි, සතුරෙක් සතුරකුට මෙසේ කැමැති වෙයි: 'මෙතෙම මිතුරන් ඇතියේ නො වන්නේ නම් මැනැවැ'යි. එ කවර හෙයින යත්: මහණෙනි, සතුරෙක් සතුරකුගේ මිත්‍රවද්භාවයෙන් සතුටු නො වේ. මහණෙනි, මේ පුරුෂපුද්ගල කිපෙනසුල්ලේ ක්‍රෝධයෙන් මැඩුනේ ක්‍රෝධ-වශයට ගියේ වෙයි. ඔහුට යම් ඒ මිත්‍රාමාත්‍ය කෙනෙක් ඤාලේ නෑ කෙනෙක් වෙත් නම් ඔහු ද, ක්‍රෝධයෙන් මැඩුනු ඔහු දුරින් ම හැරලත්. මහණෙනි, සපත්නකාන්ත වූ සපත්නකරණ වූ මේ සවන කරුණ ක්‍රෝධකරණසුලු ස්ත්‍රියකට වේවයි පුරුෂයකුට වේවයි පැමිණේ.

(7) තවද මහණෙනි, සතුරෙක් සතුරකුට මෙසේ කැමැති වෙයි. 'මෙතෙම කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණේවා'යි. එ කවර හෙයින යත්: මහණෙනි, සතුරෙක් සතුරකුගේ සුගති ගමනින් සතුටු නො වෙයි. මහණෙනි, මේ පුරුෂපුද්ගල කිපෙනසුල්ලේ ක්‍රෝධයෙන් මැඩුනේ ක්‍රෝධවශයට පැමිණියේ කයින් දුසිරිත් කෙරෙයි, වචනයෙන් දුසිරිත් කෙරෙයි, මනසින් දුසිරිත් කෙරෙයි. හෙ ක්‍රෝධාභි-භූත ව කයින් දුශ්චරිත කොට වචනයෙන් දුශ්චරිත කොට මනසින් දුශ්චරිත කොට කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණේ. මහණෙනි, සපත්නකාන්ත වූ සපත්නකරණ වූ මේ සත්වන කරුණ ක්‍රෝධකරණසුලු ස්ත්‍රියට හෝ පුරුෂයාට පැමිණෙයි.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත ධම්මා සපත්තකන්තා සපත්තකරණා කොධනං ආගච්ඡන්ති ඉත්ථිං වා පුරිසං වාති.

60. කොධනො දුබ්බණ්ණො හොති අථො දුක්ඛම්පි සෙති සො
අථො අත්ථං ගහෙත්වාන අනත්ථං අධිපජ්ජති.[1]

61. තතො කායෙන වාචාය වධං[2] කත්වාන කොධනො,
කොධාභිභූතො පුරිසො ධනජානිං නිගච්ඡති.

62. කොධසම්මදසම්මත්තො ආයසක්‍යං නිගච්ඡති
ඤාතිමිත්තා සුහජ්ජා ච පරිවජ්ජෙන්ති කොධනං.

63. අනත්ථජනනො කොධො කොධො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

64. කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං කොධො සහතෙ නරං.

65. යං කුද්ධො උපරොධෙති සුකරං විය දුක්කරං,
පච්ඡා සො විගතෙ කොධෙ අග්ගිදඩ්ඪොව තප්පති.

66. දුම්මඞ්කුයං පදසෙති ධූමග්ගි විය පාවකො[3]
යතො පතායති කොධො යෙන කුජ්ඣන්ති මානවා.

67. නාස්ස හිරි න ඔත්තප්පං න වාචො හොති ගාරවො,
කොධෙන අභිභූතස්ස න දීපං හොති කිඤ්චනං.

68. තපනීයානි කම්මානි යානි ධම්මෙහි ආරකා,
තානි ආරොචයිස්සාමි තං සුණාථ යථා තථං:

69. කුද්ධොහි පිතරං හන්ති කුද්ධො හන්ති සමාතරං,
කුද්ධො හි බ්‍රාහ්මණං හන්ති හන්ති කුද්ධො පුථුජ්ජනං.

70. යාය මාතු භතො පොසො ඉමං ලොකං අවෙක්ඛති,
තම්පි පාණදදිං සන්තිං හන්ති කුද්ධො පුථුජ්ජනො.

71. අත්තූපමාය[4] තෙ සත්තා අත්තා හි පරමං[5] පියො,
හන්ති කුද්ධො පුථුත්තානං නානාරූපෙසු මුච්ඡිතො.

72. අසිනා හන්ති අත්තානං විසං ඛාදන්ති මුච්ඡිතා,
රජ්ජුයා[6] බජ්ඣ මීයන්ති පබ්බතාමපි කන්දරෙ.

73. භූනහච්චානි කම්මානි අත්තමාරණියානි ච,
කරොන්තා නාවබුජ්ඣන්ති කොධජාතො පරාභවො.

74. ඉතා'යං කොධරූපෙන මච්චුපාසො ගුහාසයො[7]
තං දමෙන සමුච්ඡින්දෙ පඤ්ඤා විරියෙන දිට්ඨියා.

1. අධිගච්ඡති - සීමු. පටිපජ්ජති - මජසං, ස්‍යා. 2 වණං - PTS.
3. දුම්මඞ්කුයං පදංසෙති ධූමං ධූමිව පාවකො - මජසං
4 අත්තූපමානි - මජසං 5. පරමො - මජසං 6 රජ්ජුබද්ධා - සීමු.
7 ගුහාසමො - සීමු.

මහණෙනි, සපත්තකාන්ත වූ සපත්තකරණ වූ මේ සප්ත ධර්මයෝ කිපෙනසුලු, ස්ත්‍රිය හෝ පුරුෂයා හෝ කරා පැමිණෙත් යයි.

60. කිපෙනසුලු වූයේ දුර්වර්ණ වෙයි. වැලි යේ දුකසේත් හෝනේ ය. වැලිඳු අර්ථය ගෙණ (මා විසින් ලබනලද්දේ) අනර්ථ යැයි වරදවා සිතයි.

61. එක්බිති කිපෙනසුලු ක්‍රෝධයෙන් අභිභූත වූ පුරුෂ කයින් වචසින් වධ කොට ධනහානියට යෙයි.

62. ක්‍රෝධ මදයෙන් දැඩි ව මත් වූයේ අයශසකභාවයට (නින්දාවට) යෙයි. ඥාතිමිත්‍රසුහෘද්හු ද කිපෙනසුලු ඔහු හැරදමිත්.

63. ක්‍රෝධය අනර්ථය දනවන්නේ ය. ක්‍රෝධය චිත්තප්‍රකොප කරන්නේ ය. බිය අභ්‍යන්තරයෙහි උපන්නේ වෙයි. ජනතෙමේ එය නො දන්නේ ය

64. කිපියේ අර්ථය (වැඩිය) නො දන්නේ ය. කිපියේ ධර්මය (ශමථ-විදර්ශනා) නො දක්නේ ය. ක්‍රෝධය යම් මිනිසකු මැඩගන්නේ නම් එකල්හි එබඳු ගනඅඳුරුබව කරණ මොහතමස වෙයි.

65. ක්‍රෝධයට පැමිණියේ සුකරයක් සෙයින් යම් දුෂ්කරයක් කෙරේ නම්, පසුව එ ක්‍රෝධය පහව යත් ම හෙතෙම ගින්නෙන් දැවුනකු සෙයින් තැවෙයි.

66. යම් විටෙක ක්‍රෝධය උපදනේ ද යම් ක්‍රෝධයෙකින් මානවයෝ කිපෙත් නම් එය, ගින්න දුම් හා ගිනි දළු දක්වන්නා සේ, දුර්මුඛ භාවය (නියාළුබව) දක්වන්නේ ය.

67. ඔහට ලජ්ජා නො ද වෙයි. අපත්‍රපා (බිය) ද නො වෙයි. ගෞර-වාන්විත වචන ද නැත. ක්‍රෝධයෙන් මැඩුනහුට කිසිදු පිහිටෙක් නො වේ.

68 දැහැමින් දුරු වූ තැවීමට කරුණු වූ යම් කම් කෙනෙක් ඇත් නම් (කිපියේ එය කරයි.) ඔවුන් ආරෝචනය කරමි. තත් වූ පරිදි එය අසවු:

69. කිපියේ පියා නසයි. කිපියේ මව නසයි. කිපියේ රහතුන් නසයි. කිපියේ ම පුහුදුන්හු නසයි.

70. යම් මවක විසින් පුස්නාලද පුරුෂ තෙමේ මෙලොව දක්නේ ද, එ කිපි පුහුදුන් තෙමේ (තමාගේ) ප්‍රාණදායිකා වූ ම ඇය ද නසයි.

71. එ සත්හු ආත්මොපමායෙන් යුතු වෙති. තෙමේ ම තමාට අතිශයින් ප්‍රිය වෙයි. නානා රූපයන්හි (අරමුණෙහි) මුසපත් වූ කිපි තැනැත්තේ නන් කරුණින් තමාද නසයි.

72. මූලාවට පත් වූවෝ අසිපත්හුදු තමා නසත්. විෂ ද කති. ගෙල රැහැනින් බැඳ මියෙත්. ගල්කඳුරෙහි ද පැන මියෙත්.

73. අභිවැඩිහුගේ නැස්මට කරුණු වූ ද ආත්මවධය පිණිස පවත්නා වූ ද කර්මයන් කරන්නාහු "හටගත් ක්‍රෝධ ඇතියේ පිරිහේ" යයි නො දනිත්.

74. මෙසේ මේ මාරපාශය ක්‍රෝධරූපයෙන් හෘදයගුහායෙහි හෝනේ වෙයි. එය ආත්මදමනයෙන් හා ප්‍රඥායෙන් හා (විදර්ශනාසහගත) වීර්යයෙන් හා මාර්ගසම්‍යග්දෘෂ්ටියෙන් මැනැවින් සිඳිනේ ය.

75. එකමෙතං අකුසලං සමුච්ඡෙදථ පණ්ඩිතො,
තථෙව ධම්මෙ සික්ඛෙථ මා නො දුම්මඞ්කුයං අහු.

76. වීතකොධා අනායාසා වීතමොහා අනුස්සුකා,
දන්තා කොධං පහත්වාන පරිනිබ්බන්ති අනාසවාති.

අබ්‍යාකත වග්ගො නිට්ඨිතො.

තස්සුද්දානං:

අබ්‍යාකතො පුරිසගති තිස්සසීහාරක්ඛෙය්‍යා[1] කිම්බිලො
සත්තපචලායන මාපුඤ්ඤ - භරියාකොධනෙනාදසා'ති.[2]

1. සීහරක්ඛිතපකුච්ඡං - සිමු, මජසං 2. තත්‍ර වග 9ං තිම්බිලො සත්ත භරියාය කොධනා - සිමු. කිම්බිලං සත්ත පචලා මෙත්තා භරියා කොධෙනාදසාති - මජසං

75. නැණැතියේ තෙල එක ම (ක්‍රෝධ) අකුශලය සිඳලන්නේ ය. එසේ ම ධර්මයෙහි හික්මෙන්නේ ය: "අපට දුමකුබව නහමක් වේවා" යි.

76. පැහූ ක්‍රෝධ ඇතියාහු දැඩි ආයාස නැතියාහු බැහැරලූ ලෝභය ඇතියාහු දුසිරිතෙහි අනුතැපුන වූවාහු දැමුනාහු ක්‍රෝධය දුරලා අනාශ්‍රව වූවාහු පිරිනිවෙති යි.

අව්‍යාකත වර්ගය පළමු වැනි යි.

එහි උද්දානය:

අව්‍යාකත සූත්‍රය, පුරිසගති සූත්‍රය, තිස්සබ්‍රහ්ම සූත්‍රය, සීහසේනාපති සූත්‍රය, අරක්ඛෙය්‍ය සූත්‍රය, කිම්බිල සූත්‍රය, සත්තධම්ම සූත්‍රය, පචලායන සූත්‍රය, මාපුඤ්ඤභායී සූත්‍රය, සත්තභරියා සූත්‍රය, කෝධන සූත්‍රය දැයි එකොළොසෙක.

# 2. මහාවග්ගො

## 7. 2. 2. 1

## [හිරොත්තප්ප සුත්තං]

[සාවත්ථිනිදානං]

12. හිරොත්තප්පෙ භික්ඛවෙ, අසති හිරොත්තප්පවිපන්නස්ස හතූපනිසො හොති ඉන්ද්‍රියසංවරො. ඉන්ද්‍රියසංවරෙ අසති ඉන්ද්‍රියසංවරවිපන්නස්ස හතූපනිසං හොති සීලං. සීලෙ අසති[1] සීලවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ අසති නිබ්බිදාවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ, රුක්ඛො සාඛාපලාසවිපන්නො, තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි න පාරිපූරිං ගච්ඡති, එවමෙව ඛො භික්ඛවෙ, හිරොත්තප්පෙ අසති, හිරොත්තප්පවිපන්නස්ස හතූපනිසො හොති -පෙ- විමුත්තිඤාණදස්සනං.

හිරොත්තප්පෙ භික්ඛවෙ සති හිරොත්තප්පසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති ඉන්ද්‍රියසංවරො, ඉන්ද්‍රියසංවරෙ සති ඉන්ද්‍රියසංවරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සීලං, සීලෙ සති සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි, සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං, යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති නිබ්බිදාවිරාගො, නිබ්බිදාවිරාගෙ සති නිබ්බිදාවිරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ, රුක්ඛො සාඛාපලාසසම්පන්නො, තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි පාරිපූරිං ගච්ඡති, එවමෙව ඛො භික්ඛවෙ, හිරොත්තප්පෙ සති හිරොත්තප්පසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති ඉන්ද්‍රියසංවරො -පෙ- උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනන්ති.

## 7. 2. 2. 2

## [සත්තසූරියුග්ගමන සුත්තං]

13. එකං සමයං භගවා වෙසාලියං විහරති අම්බපාලිවනෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

---

1 සීලෙසු අසති - සිමු

# 2. මහාවග්ගය

## 7. 2. 2. 1.

## [හිරෝත්තප්ප සූත්‍රය]

[සාවත්ථිනිදාන යි]

**12.** මහණෙනි, හිරිඔතප් නැතිවත් ම නට හිරිඔතප් ඇතියහුගේ ඉන්ද්‍රියසංවරය නට උපනිශ්‍රය ඇතියේ වෙයි ඉන්ද්‍රියසංවරය නැති වත් ම නට ඉන්ද්‍රියසංවර ඇතියහුගේ ශීලය හතොපනිශ්‍රය වෙයි. ශීලය නැති වත් ම විපතට පත් සිල් ඇතියහුගේ සම්මාසමාධිය හතොපනිශ්‍රය වෙයි. සම්මාසමාධි නැති වත් ම විපතට පත් සම්‍යක් සමාධි ඇතියහුගේ යථාභූතඥානදර්ශනය හතොපනිශ්‍රය වෙයි. යථාභූතඥානදර්ශනය නැති වත් ම විපතට පත් යථාභූතඥානදර්ශන ඇතියහුගේ නිබ්බිදාවිරාගය හතොපනිශ්‍රය වෙයි. නිබ්බිදාවිරාගය නැති වත් ම නට නිබ්බිදාවිරාග ඇතියහුගේ විමුක්තිඥාන-දර්ශනය (අර්හත්ඵලය) හතොපනිශ්‍රය (ප්‍රත්‍යය රහිත) වෙයි.

මහණෙනි, යම් පරිදි වෘක්ෂයෙක් නට ශාඛා පලාස ඇතියේ නම් එහි පිට පොතුදු පිරිපුන් බවට නො යෙයි, සිවි දු බොරු දු හර දු පිරිපුන් බවට නො යෙයි, මහණෙනි, එ පරිදි ම හිරිඔතප් නැති වත් ම විපත් හිරිඔතප් ඇතියහුගේ ඉන්ද්‍රියසංවරය හතොපනිශ්‍රය වෙයි... විමුක්ති-ඥානදර්ශනය හතොපනිශ්‍රය වෙයි.

මහණෙනි, හිරිඔතප් ඇති වත් ම හිරිඔතප්සපත්හුගේ ඉන්ද්‍රිය-සංවරය උපනිශ්‍රය සම්පන්න වෙයි. ඉන්ද්‍රියසංවරය ඇති වත් ම ඉන්ද්‍රියසංවරසපත්හුගේ ශීලය උපනිශ්‍රයසම්පන්න වෙයි. ශීලය ඇති වත් ම සිල්සපත්හුගේ සම්‍යක්සමාධිය උපනිශ්‍රයසම්පන්න වෙයි. සම්‍යක්-සමාධිය ඇති වත් ම සම්‍යක්සමාධිසම්පන්නයාගේ යථාභූතඥානදර්ශනය උපනිශ්‍රයසම්පන්න වෙයි. යථාභූතඥානදර්ශනය ඇති වත් ම යථාභූතඥාන-දර්ශනසම්පන්නයාගේ නිබ්බිදාවිරාගය උපනිශ්‍රයසම්පන්න වෙයි. නිබ්බිදා-විරාගය ඇති වත් ම නිබ්බිදාවිරාගසම්පන්නයාගේ විමුක්තිඥානදර්ශනය උපනිශ්‍රයසම්පන්න වෙයි.

මහණෙනි, යම් පරිදි ශාඛා - පලාසසම්පන්නවෘක්ෂයෙක් වේ නම් එහි පිටපොතු ද පිරිපුන් බවට යෙයි, සිවි ද බොරු ද හර ද පිරිපුන් බවට යෙයි, මහණෙනි, එපරිදි ම හිරි-ඔතප් ඇති වත් ම හිරි-ඔතප්සපත්-හුගේ ඉන්ද්‍රියසංවරය උපනිශ්‍රය සම්පන්න වෙයි ... විමුක්තිඥානදර්ශනය උපනිශ්‍රයසම්පන්න වේ යයි.

## 7. 2. 2. 2.

## [සත්තසූරියුග්ගමන සූත්‍රය]

**13.** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **විසාල්නුවර අම්බපාලි වනයෙහි** වැඩ වෙසෙනසේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ **'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ'යි එ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇත්තූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළහ:**

අනිච්චා භික්ඛවෙ, සඞ්ඛාරා, අද්ධුවා භික්ඛවෙ, සඞ්ඛාරා, අනස්සාසිකා භික්ඛවෙ, සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

සිනෙරු භික්ඛවෙ, පබ්බතරාජා චතුරාසීති යොජනසහස්සානි ආයාමෙන, චතුරාසීතියොජනසහස්සානි විත්ථාරෙන, චතුරාසීතියොජනසහස්සානි මහාසමුද්දෙ අජ්ඣොගාළ්හො, චතුරාසීතියොජනසහස්සානි මහාසමුද්දා අච්චුග්ගතො.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි දෙවො න වස්සති. දෙවෙ ඛො පන භික්ඛවෙ, අවස්සන්තෙ යෙ කෙචිමෙ බීජගාමභූතගාමා ඔසධිතිණවනප්පතයො[1] තෙ උස්සුස්සන්ති විසුස්සන්ති න භවන්ති.

එවං අනිච්චා භික්ඛවෙ, සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ, සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ, සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බ සඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන දුතියො සුරියො පාතුභවති. දුතියස්ස භික්ඛවෙ, සුරියස්ස පාතුභාවා යා තා කුන්නදියො[2] කුසොබ්භා[3] තා උස්සුස්සන්ති, විසුස්සන්ති, න භවන්ති.

එවං අනිච්චා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බ සඞ්ඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං. අලං විමුච්චිතුං.

හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තතියො සුරියො පාතුභවති. තතියස්ස භික්ඛවෙ සුරියස්ස පාතුභාවා යා කාචි මහානදියො සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී, තා උස්සුස්සන්ති විසුස්සන්ති න භවන්ති.

එවං අනිච්චා භික්ඛවෙ, සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ, සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන චතුත්ථො සුරියො පාතුභවති. චතුත්ථස්ස භික්ඛවෙ, සුරියස්ස පාතුභාවා යෙ තෙ මහාසරා යතො ඉමා මහානදියො සම්භවන්ති[4], සෙය්‍යථීදං: අනොතත්තං, සීහපපාතං, රථකාරං, කණ්ණමුණ්ඩං, කුණාලං, ඡද්දන්තං මන්දාකිනී.[5] තා උස්සුස්සන්ති විසුස්සන්ති. න භවන්ති.

එවං අනිච්චා භික්ඛවෙ සඞ්ඛාරා -පෙ- අලං විමුච්චිතුං.

---

1. ඔසධිතිණවනප්පතයො - මජසං
2. යා කාචි කුන්නදියො - මජසං  3. කුසොබ්භා - මජසං
4. පවත්තන්ති - මජසං  5 මන්දාකිනියො - මජසං.

මහණෙනි, සංස්කාරයෝ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ අධ්‍රැවයහ (අස්ථිරහ). මහණෙනි, සංස්කාරයෝ අනාශ්වාසිකයහ (අනාශ්වාසිතයහ). මහණෙනි, සර්වසංස්කාරයන්හි නිර්වේදය දැනැවීමට මෙ කරුණ පමණ වේ මැයි. විරාග දැනැවීමට පමණ වේ මැ යි. මිදුමට පමණ වේ මැ යි.

මහණෙනි, සුනෙරුපර්වරද අයමින් සුවාසූදහසෙක් යොදුන. විතරින් සුවාසූදහසෙක් යොදුන. සුවාසූදහසක් යොදුන් මහසයුරෙහි ගැලී සිටියේ ය. සුවාසූදහසක් යොදුන් මහමුහුදින් මතුයෙහි නැඟී සිටියේ ය.

මහණෙනි, යම් හෙයකින් බොහෝ වර්ෂයක් බොහෝ වර්ෂදහසක් බොහෝ වර්ෂසියදහසක් වැසි නො කෙරේ නම් එබඳු සමයෙක් ඇත. මහණෙනි, මෙඝය නො වටුත් ම යම්කිසි බීජගාම භූතගාම ඔෂධී තෘණ වනස්පතිහු වෙත් නම් උහු වියලෙත්. වෙසෙසින් වියලෙත්. ගලී නො වැඩෙත්.

මහණෙනි, මෙසේ සංස්කාරයෝ අනිත්‍යයහ. මහණෙනි, මෙසේ සංස්කාරයෝ අස්ථිරයහ. මහණෙනි, මෙසේ සංස්කාරයෝ ආශ්වාස රහිතයහ. මහණෙනි, සර්වසංස්කාරයන්හි නිර්වේදයට(කළකිරීමට මේ පමණ මැ යි. විරාගයට (නො ඇලීමට) මෙ පමණ මැ යි. මිදෙන්නට මෙ පමණ මැ යි.

මහණෙනි, යම් හෙයෙකින් දිගුකල් ඇවෑමෙන් කිසියම් ම කලෙක දෙවන සූර්යයෙක් පාල වන්නේ ය. මහණෙනි, දෙවන හිරුහුගේ පාල වීමෙන් යම් ඒ කුඩා නදීහු ද කුඩා දියවිල්හු ද වෙත් නම්, උහු වියැලෙත්, වෙසෙසින් වියැලෙත්, නො වැඩෙත්.

මහණෙනි, මෙසෙයින් සංස්කාරයෝ අනිත්‍යයහ. මෙසෙයින් සංස්කාරයෝ නො ථිරයහ. මෙසෙයින් සංස්කාරයෝ අනාශ්වාසිකයහ. මහණෙනි, සර්වසංස්කාරයන්හි නිර්වේදයට මෙය ම ප්‍රමාණ වෙයි. විරාගයට මෙමැ පමණ වෙයි. විමොක්ෂයට මෙ මැ ප්‍රමාණ වෙයි.

මහණෙනි, දීර්ඝරාත්‍රයක්හුගේ ඇවෑමෙන් කිසියම් ම කලෙක්හි යම් හෙයකින් තෙවන සූර්යයෙක් පහළ වේ නම් එබඳු සමයෙක් වෙයි. මහණෙනි, තෙවන හිරුහුගේ පාල වීමෙන් ගඞ්ගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය, යන යම් එ මහානදීහු වෙත් නම්, උහු වියැලෙත්, වෙසෙසින් වියැලෙත්, නො වැඩෙත්.

මහණෙනි, සංස්කාරයෝ වෙසෙසින් අනිත්‍යයහ. මෙසේ සංස්කාරයෝ නො ථිරයහ. මෙසෙයින් සංස්කාරයෝ අස්වැසුම් රහිතයහ. මහණෙනි, සර්වසංස්කාරයන්හි නිර්වේදයට මෙ මැ පමණ වෙයි. විරාගයට මෙ පමණ වෙයි. විමොක්ෂයට මෙ මැ පමණ වෙයි.

මහණෙනි, දීර්ඝරාත්‍රයක්හුගේ ඇවෑමෙන් කිසිකලෙක්හි යම් හෙයකින් සතරවන සූර්යයෙක් පාල වේ නම්, එබඳු සමයෙක් වෙයි. මහණෙනි, සතරවන හිරුහුගේ ප්‍රාදුර්භාවයෙන් යම් තැනෙකින් මේ මහානදීහු උපදනාහු නම් එ මහවිල්හු ද. එනම්: අනවතප්ත ය, සිංහප්‍රපාත ය, රථකාර ය, කර්ණමුණ්ඩ ය, ඡද්දන්ත ය, මන්දාකිනී ය යන එ මහවිල්හු වියැලෙත්, වෙසෙසින් වියැලෙත්, නො වැඩෙත්.

මහණෙනි, මෙසෙයින් සංස්කාරයෝ අනිත්‍යයහ ... මිදෙන්නට මෙ පමණ මැ යි.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන පඤ්චමො සුරියො පාතුභවති. පඤ්චමස්ස භික්ඛවෙ, සුරියස්ස පාතුභාවා යොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, ද්වියොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, තියොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, -පෙ- සත්තයොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, සත්තතාලම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති, ඡතාලම්පි පඤ්චතාලම්පි චතුතාලම්පි තිතාලම්පි ද්විතාලම්පි තාලමත්තම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති, සත්තපොරිසම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති, ඡපොරිසම්පි -පෙ- පඤ්චපොරිසම්පි -පෙ- චතුපොරිසම්පි -පෙ- තිපොරිසම්පි -පෙ- ද්විපොරිසම්පි -පෙ- පොරිසම්පි -පෙ- අඩ්ඪපොරිසමත්තම්පි -පෙ- කටිමත්තම්පි -පෙ- ජණ්ණුකාමත්තම්පි -පෙ- ගොප්ඵකමත්තම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, සරදසමයෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ තත්ථ තත්ථ ගොපදෙසු උදකානි ඨිතානි හොන්ති, එවමෙව ඛො භික්ඛවෙ, තත්ථ තත්ථ ගොපදමත්තානි මහාසමුද්දෙ උදකානි ඨිතානි හොන්ති. පඤ්චමස්ස භික්ඛවෙ, සුරියස්ස පාතුභාවා අඞ්ගුලපබ්බතෙමනමත්තම්පි[1] මහාසමුද්දෙ උදකං න හොති.

එවං අනිච්චා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ සඞ්ඛාරා, යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන ඡට්ඨො සුරියො පාතුභවති. ඡට්ඨස්ස භික්ඛවෙ සුරියස්ස පාතුභාවා අයඤ්ච මහාපඨවී සිනෙරු ච පබ්බතරාජා ධූපායන්ති සන්ධූපායන්ති සම්පධූපායන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ, කුම්භකාරපාකො ආලිම්පිතො[2] පඨමං ධූපෙති සන්ධූපෙති සම්පධූපෙති.[3] එවමෙව ඛො භික්ඛවෙ, ඡට්ඨස්ස සුරියස්ස පාතුභාවා අයඤ්ච මහාපඨවි සිනෙරු ච පබ්බතරාජා ධූපායන්ති සන්ධූපායන්ති[4] සම්පධූපායන්ති.

එවං අනිච්චා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ සඞ්ඛාරා, යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන සත්තමො සුරියො පාතුභවති. සත්තමස්ස භික්ඛවෙ, සුරියස්ස පාතුභාවා අයඤ්ච මහාපඨවි සිනෙරු ච පබ්බතරාජා ආදිප්පන්ති, පජ්ජලන්ති, එකජාලා භවන්ති. ඉමිස්සා ච භික්ඛවෙ, මහාපඨවියා සිනෙරුස්ස ච පබ්බතරාජස්ස ඣායමානානං ඩය්හමානානං අච්චි වාතෙන ඛිත්තා යාව බ්‍රහ්මලොකාපි ගච්ඡන්ති.[5]

1. අඞ්ගුලිපබ්බතෙමනමත්තම්පි - මජසං. 2. ආලෙපිතො - මජසං.
3. ධූමෙති. සන්ධූමෙති, සම්පධූමෙති - මජසං.
4. ධූමායන්ති, සන්ධූමායන්ති, සම්පධූමායන්ති - මජසං. 5. ගච්ඡති - මජසං.

මහණෙනි, දීර්ඝරාත්‍රයක්හුගේ ඇවෑමෙන් කිසියම් කලෙක්හි යම් හෙයකින් පස්වන සූර්‍ය්‍යයෙක් ප්‍රාදුර්භූත වේ නම්, එබඳු සමයෙක් ඇත. මහණෙනි, පස්වන හිරු හුගේ පාලවීමෙන් මහා සමුද්‍රයෙහි සියක් යොදුනෙහි වූ දිය ද පහල බස්නේ ය. මහා සමුද්‍රයෙහි දෙසියක්යොදු-නෙහි වූ දිය ද පහල බස්නේ ය. මහසයුරෙහි තුන්සියක් යොදුනෙහි වූ දිය ද පහල බස්නේ ය ... මහසයුරෙහි සත්සියක් යොදුනෙහි වූ දිය ද පහල බස්නේ ය. මහසයුරෙහි සත්තලක් පොහොනා පමණ වූ ද දිය සිටුනේ ය. සතලක් පොහොනා වූ ද ... පස්තලක් පොහොනා වූ ද ... සිවුතලක් පොහොනා වූ ද ... තුන්තලක් පොහොනා වූ ද ... දෙතල්ක් පොහොනා වූ ද ... තලක් පොහොනා මතු වූ ද දිය මහමුහුදෙහි සිටුනේ ය. මහාසමුද්‍රයෙහි සපත පුරුෂ ප්‍රමාණ වූ ද දිය (ශෙෂව) සිටුනේ ය. ෂඩ්පුරුෂප්‍රමාණ වූ ද ... පඤ්චපුරුෂප්‍රමාණ වූ ද ... චතුෂ්පුරුෂ ප්‍රමාණ වූ ද ... ත්‍රිපුරුෂ ප්‍රමාණ වූ ද ... ද්විපුරුෂ ප්‍රමාණ වූ ද පුරුෂ ප්‍රමාණ වූ ද ... අර්ධපුරුෂ ප්‍රමාණ වූ ද ... කටිමාත්‍ර වූ ද ... දණිස් මතු වූ ද ... ගොප් ඇට මතු වූ ද, දිය මහාසමුද්‍රයෙහි ශෙෂ ව සිටුනේ ය.

මහණෙනි, යම් පරිදි සරාකල්හි මහදිය පොද ඇති වැසිවස්නා කල්හි එ එ තන්හි ගොපදයන්හි දිය සිටියේ වේ නම්, මහණෙනි, එ පරිදි ම එ එ තන්හි ගොපද මාත්‍ර වූ දිය මහ සයුරෙහි ශෙෂ ව සිටියේ වෙයි. මහණෙනි, පස්වන හිරුහුගේ පාල වීමෙන් ඇඟිලිපුරුක් තෙමන මතු වූ ද දිය මහසයුරෙහි නො වන්නේ ය.

මහණෙනි, සංස්කාරයෝ මෙසෙසින් අනිත වෙත් මහණෙනි, සංස්කා-රයෝ මෙසෙසින් අධ්‍රැව වෙත්. මහණෙනි, සංස්කාරයෝ මෙසෙසින් අනාශ්වාසික (අශාශ්වත හෙයින් ආශ්වාද රහිත) වෙත්. මහණෙනි, සර්ව-සංස්කාරයන්හි නිර්වේදයට මෙ ම පමණ වෙයි. විරාගයට මෙ ම පමණ වේ. මිදෙන්නට මෙ ම පමණ වෙයි.

මහණෙනි, දිගුකල් ඇවෑමෙන් කිසියම් කලෙක්හි යම් හෙයෙකින් සවන සූර්‍ය්‍යයෙක් පාල වේ නම්, එබඳු කලෙක් වෙයි. මහණෙනි, සවන හිරුහුගේ පාල වීමෙන් මෙ මහපොළෝ හා සුනෙර පව්රද දුමන්නේ ය. වෙසෙසින් දුමන්නේ ය. අත්‍යුත්කර්ෂයෙන් දුමන්නේ ය. මහණෙනි, යම් පරිදි කුඹල්කරු උදුනෙක් ගිනි දල්වනලදුයේ පලමු පලමු යම්සේ දුමා ද, වෙසෙසින් දුමා ද, අත්‍යුත්කර්ෂයෙන් දුමා ද, මහණෙනි, එසෙසින් ම මෙ මහපොළෝ හා සුනෙරුපර්වතරාජයා සවන හිරුහුගේ ප්‍රාදුර්භාවයෙන් දුමන්නේ ය. වෙසෙසින් දුමන්නේ ය. අත්‍යුත්කර්ෂයෙන් දුමන්නේ ය.

මහණෙනි, සංස්කාරයෝ මෙසෙසින් අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසෙසින් අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසෙසින් අනාශ්වාසිකයහ. මහණෙනි, සර්වසංස්කාරයන්හි නිර්වේදයට මෙ ම පමණ වෙයි. විරාගයට මෙම පමණ වෙයි. මිදෙන්නට මෙ ම පමණ වෙයි.

මහණෙනි, යම් හෙයෙකින් දීර්ඝරාත්‍රයක්හුගේ ඇවෑමෙන් කිසි කලෙක්හි සත්වන සූර්‍ය්‍යයෙක් පාල වේ නම්, එබඳු සමයෙක් ඇත. මහණෙනි, සත්වන හිරුහුගේ පාල වීමෙන් මේ මහපොළොව ද සුනෙරපව්රද ද ගිනිගෙණ ඇවිලෙයි, දිලිහෙයි, එක ම ගිනිදල් වෙයි. මහණෙනි, මෙ මහපොළොවත් සුනෙරපව්රදත් දැවෙත් දැවෙත් ම වාතයෙන් ක්ෂිප්ත වූ ගිනිහු බඹලෝ තෙක් කොට යෙති.

සිනෙරුස්ස ච භික්ඛවෙ, පබ්බතරාජස්ස ඣායමානස්ස ඩය්හමානස්ස විනස්සමානස්ස මහතා තෙජොඛන්ධෙන අභිභූතස්ස යොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති, ද්වියොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති, තියොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති, චතුයොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති, පඤ්චයොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති.

ඉමිස්සා ච භික්ඛවෙ, මහාපථවියා සිනෙරුස්ස ච පබ්බතරාජස්ස ඣායමානානං ඩය්හමානානං නෙව ඡාරිකා පඤ්ඤායති[1] න මසි. සෙය්‍යථාපි භික්ඛවෙ, සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස ඩය්හමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායති න මසි, එවමෙව ඛො භික්ඛවෙ, ඉමිස්සා ච මහාපථවියා සිනෙරුස්ස ච පබ්බතරාජස්ස ඣායමානානං ඩය්හමානානං නෙව ඡාරිකා පඤ්ඤායති න මසි.

එවං අනිච්චා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා, එවං අනස්සාසිකා භික්ඛවෙ, සඞ්ඛාරා. යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

තත්‍ර භික්ඛවෙ, කො මන්තා, කො සද්ධාතා අයඤ්ච මහාපථවි සිනෙරු ච පබ්බතරාජා ඩය්හිස්සන්ති, විනස්සිස්සන්ති, න භවිස්සන්තීති අඤ්ඤත්‍ර දිට්ඨපදෙහි.

භූතපුබ්බං භික්ඛවෙ, සුනෙත්තො නාම සත්ථා අහොසි තිත්ථකරො කාමෙසු වීතරාගො. සුනෙත්තස්ස ඛො පන භික්ඛවෙ, සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං. සුනෙත්තො භික්ඛවෙ සත්ථා සාවකානං බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙති. යෙ ඛො පන භික්ඛවෙ, සුනෙත්තස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස සබ්බෙන සබ්බං සාසනං ආජානිංසු, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං බ්‍රහ්මලොකං උපපජ්ජිංසු.[2] යෙ න සබ්බෙන සබ්බං සාසනං ආජානිංසු. තෙ කායස්ස භෙදා පරම්මරණා අප්පෙකච්චෙ පරනිම්මිතවසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු.[2] අප්පෙකච්චෙ නිම්මානරතීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු.[2] අප්පෙකච්චෙ තුසිතානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු. අප්පෙකච්චෙ යාමානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු. අප්පෙකච්චෙ තාවතිංසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු අප්පෙකච්චෙ ඛත්තියමහාසාලානං සහබ්‍යතං උපපජ්ජිංසු. අප්පෙකච්චෙ බ්‍රාහ්මණමහාසාලානං සහබ්‍යතං උපපජ්ජිංසු. අප්පෙකච්චෙ ගහපතිමහාසාලානං සහබ්‍යතං උපපජ්ජිංසු.

අථ ඛො භික්ඛවෙ සුනෙත්තස්ස සත්ථුනො එතදහොසි. න ඛො පනෙතං පතිරූපං යොහං සාවකානං සමසමගතියො[3] අස්සං අභිසම්පරායං. යන්නූනාහං උත්තරිං මෙත්තං[4] භාවෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ, සුනෙත්තො සත්ථා සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙසි. සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙත්වා සත්තසංවට්ටවිවට්ටකප්පෙ නයිමං ලොකං පුනරාගමාසි. සංවට්ටමානෙ සුදං භික්ඛවෙ, ලොකෙ ආභස්සරූපගො හොති, විවට්ටමානෙ ලොකෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජති.

---

1 පඤ්ඤායන්ති - සිමු 2. උපපජ්ජිංසු - සිමු.

3 සමගතිකො - කත්ථචි 4. උත්තරිමෙත්තං - මජසං, සතා

මහණෙනි, ඇවිලගත් දුවෙන වැනසෙන මහගිනිකඳින් මැඩුනු සිනෙරුපර්වතරාජයාගේ සියක්යොදුන් උසැති කූටයෝ ද බිඳ වැටෙත්. දෙසියක් යොදුන් උසැති කූටයෝ ද බිඳ වැටෙත්. තුන්සියක් යොදුන් උසැති කූටයෝ ද බිඳ වැටෙත්. සාරසියක් යොදුන් උසැති කුළුහු ද සිඳී වැටෙත්. පන්සියක් යොදුන් උසැති කුළුහු ද සිඳී වැටෙත්.

මහණෙනි, ඇවිලගත්, දුවෙන මේ මහපොළොවෙහි ද සිනෙරු-පර්වතරාජයාගේ ද හළු හා දැලි නො හැණේ ම ය. මහණෙනි, ඇවිලගෙණ දුවෙන සර්පිෂ්හුගේ (ගිතෙල්හි) හෝ තෙලයක්හුගේ හළු හෝ දැලි නො මැ පැණෙන්නේ යම්සේ ද, මහණෙනි, එසෙයින් ම ඇවිලැගෙණ දුවෙන මේ මහපොළොවෙහි හා සිනෙරුපර්වතරාජයාගේ ද හළු හා දැලි නො පැණෙයි.

මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනාශ්වාසිකයහ. මහණෙනි, සර්වසංස්කාරයන්හි නිර්වේදයට නිසි මැ යි. විරාගයට නිසි මැ යි. මිදෙන්නට නිසි මැයි.

මහණෙනි, "මේ මහපොළොව හා මේ සිනෙරුපර්වතරාජයා ගින්නෙන් දැවෙන්නාහ, වැනසෙන්නාහ, නො පවත්නාහ"යි දෘෂ්ටපදයන් හෙවත් සෝතාපන්නයන් හැර මෙන කවරෙක් මන්ත්‍රණයට සමත් වේ ද? කවරෙක් හදහන්නේ ද?

මහණෙනි, භූතපූර්වයෙහි. තීර්ථංකර වූ කාමයන්හි (විෂ්කම්භන වශයෙන්) පහ කළ රාගය ඇති සුනෙත්‍ර නම් ශාස්තෘවරයෙක් වී ය. මහණෙනි, සුනෙත්‍ර ශාස්තෘහට අනේකශත ශ්‍රාවකයෝ වූහ. මහණෙනි, සුනෙත්‍ර ශාස්තෘතෙම බ්‍රහ්මලෝකසහභාවය සඳහා සව්වනට දහම් දෙසයි. මහණෙනි, බ්‍රහ්මලෝකසහභාවය සඳහා දහම් දෙසන සුනෙත්‍ර ශාස්තෘහුගේ අනුශාසනය යම් කෙනෙක් සම්ප්‍රකාරයෙන් දැනගත්තාහු ද, ඔහු කාබුත් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත බ්‍රහ්මලෝකයට (උපත් විසින්) පැමිණියහ. යමෙක් සම්ප්‍රකාරයෙන් අනුශාසනය (පිළිපැදීම්) විසින් නො දත්හු ද, ඔහු ඇතැමෙක් කාබුත් මරණින් මතු පරනිර්මිතවශවර්ති දෙවියන්ගේ සහභාවයට පැමිණියහ. ඇතැම්හු නිර්මාණරති දෙවියන්ගේ සහභාවයට පැමිණියහ. ඇතැම් කෙනෙක් තුසිතදෙවියන්ගේ සහවාසයට පැමිණියහ ඇතැම්හු යාමදෙවියන්ගේ සහවාසයට (ප්‍රතිසන්ධිවශයෙන්) එළැඹියහ. ඇතැම්හු තාවතිංසදෙවයන්ගේ සහභාවයට එළැඹියහ. ඇතැම්හු චාතුමමහාරාජික දෙවයන්ගේ සහභාවයට එළැඹියහ. ඇතැම්හු ක්ෂත්‍රිය-මහාසාරයන්ගේ සහභාවයට එළැඹියහ. ඇතැම්හු බ්‍රාහ්මණමහාසාරයන්ගේ සහභාවයට එළැඹියහ ඇතැම්හු ගෘහපතිමහාසාරයන්ගේ සහභාවයට එළැඹියහ.

මහණෙනි, එක්බිති සුනෙත්‍ර ශාස්තෘහට මෙබඳු සිතෙක් විය. "යම් හෙයකින් මම පරලොව්හි ශ්‍රාවකයනට සමසම ගති ඇතියෙම් වෙම් නම්, තෙල මට අනුරූ නො වේ මැ යි. මම් මතුයෙහි දු මෛත්‍රීධ්‍යානය වඩන්නෙම් නම් මැනැවැ"යි මහණෙනි, එක්බිති සුනෙත්‍ර ශාස්තෘ සත්වසක් මෙත්සිත් වැඩී ය සත්වසක් මෙත් සිත් වඩා සත්ත සංවර්ත-විවර්ත කල්පයක්, පිළිසඳ විසින් මේ මිනිස්ලොවට නො පැමිණියේ ය.- මහණෙනි, ලොව නස්නා කල්හි හෙ ආභාස්වරෝපග වෙයි. ලොව විවර්ත වන කල්හි ශූන්‍යබ්‍රහ්මවිමානයට (උත්පත්ති විසින්) එළැඹෙයි.

තත්‍ර සුදං භික්ඛවෙ, බ්‍රහ්මා හොති මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්ති. ඡත්තිංසක්ඛත්තුං ඛො පන භික්ඛවෙ, සක්කො අහොසි දෙවානමින්දො. අනෙකසතක්ඛත්තුං රාජා අහොසි චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. පරොසහස්සං ඛො පනස්ස පුත්තා අහෙසුං සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පථවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසි.

සො හි නාම භික්ඛවෙ, සුනෙත්තො සත්ථා එවං දීඝායුකො සමානො එවං චිරට්ඨිතිකො අපරිමුත්තො අහොසි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. අපරිමුත්තො දුක්ඛස්මාති වදාමි.

තං කිස්ස හෙතු. චතුන්නං ධම්මානං අනනුබොධා අප්පටිවෙධා. කතමෙසං චතුන්නං: අරියස්ස සීලස්ස අනනුබොධා අප්පටිවෙධා, අරියස්ස සමාධිස්ස, අරියාය පඤ්ඤාය, අරියාය විමුත්තියා අනනුබොධා අප්පටිවෙධා.

තයිදං භික්ඛවෙ අරියං සීලං අනුබුද්ධං පටිවිද්ධං, අරියො සමාධි අනුබුද්ධො පටිවිද්ධො, අරියා පඤ්ඤා අනුබුද්ධා පටිවිද්ධා,[1] අරියා විමුත්ති අනුබුද්ධා[2] පටිවිද්ධා, උච්ඡින්නා භවතණ්හා, ඛීණා භවනෙත්ති, නත්ථිදානි පුනබ්භවොති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

77. සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා,
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා.

78. ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං,
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො.

### 7. 2. 2. 3.

### [නගරූපම සුත්තං]

[සංඛිත්තනිද්දෙසං]

**14.** යතො ඛො භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමං නගරං සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛතං[3] හොති, චතුන්නඤ්ච ආහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ඉදං වුච්චති භික්ඛවෙ රඤ්ඤො පච්චන්තිමං නගරං අකරණීයං බාහිරෙහි පච්චත්ථිකෙහි පච්චාමිත්තෙහි.

1. අරියස්ස සමාධිස්ස අනනුබොධා අප්පටිවෙධා අරියාය පඤ්ඤාය අනනුබොධා අප්පටිවෙධා - මජසං 2. අනුබොධා - මජසං.
3. සුපරික්ඛිත්තං - සආවි, පරික්ඛිත්තං - අට්ඨකථා, සුපරිඛතං - සීමු.

මහණෙනි, බඹ තෙමේ එහි හැම බලූත් මැඩ වෙසෙන සුලුයේ (කිසිවකු විසිනුදු) නො මඩනාලද්දයේ එකාන්තයෙන් සියල්ල දක්නේ වශවර්ති වූයේ මහාබ්‍රහ්ම වෙමි. මහණෙනි, සතිස්වරක් ශක්‍ර දෙවේන්ද්‍ර වීය. අනේක-ශතවාරයක් සක්විති රජ වූයේ ධාර්මික ධර්මරාජ වූයේ සිව්සයුරු හිමි කොට ඇති පොළො ඇතියේ සතුරන් දිනන සුලුයේ ජනපදයන්හි ස්ථාවරභාවයට පැමිණියේ සත්රුවනින් සපන් වීය. මහට සූර වූ වීරාඞ්ග වූ සතුරුසෙන් මඩනා දහසින් වැඩි පුත්‍රයෝ වූහ. මම සයුරු පිරියත් මෙ පොළොව අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් දැහැමින් දිනා ඉසුරුමත් ව විසී ය.

මහණෙනි, ඒ සුනෙත්ත ශාස්තෘ තෙම මෙසේ දීර්ඝායුෂ්ක වූයේ ම මෙසේ චිරස්ථිතික වූයේ ම ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් නොමිදුනේ ම වීය. වෘත්තදුඃඛයෙන් අපරිමුක්ත යයි කියමි.

ඒ කවර හෙයින ය යත්: දහම් සතරක්හුගේ අනනුබෝධයෙන, අප්‍රති-වේධයෙන. කවර සතරක්හුගේය යත්: ආර්ය්‍යශීලයාගේ අනනුබෝධයෙන් අප්‍රතිවේධයෙන. ආර්ය්‍යසමාධිහුගේ ... ආර්ය්‍යප්‍රඥාවගේ ... ආර්ය්‍යවිමුක්තිහුගේ අනනුබෝධයෙන් හා අප්‍රතිවේධයෙන.

මහණෙනි, ඒ ම ආර්ය්‍යශීලය (මා විසින්) අනුබුද්ධ ය, ප්‍රතිවිද්ධ ය. ආර්ය්‍යසමාධිය අනුබුද්ධ ය, ප්‍රතිවිද්ධ ය. ආර්ය්‍යප්‍රඥාව අනුබුද්ධ ය, ප්‍රතිවිද්ධ ය. ආර්ය්‍යවිමුක්තිය අනුබුද්ධ ය, ප්‍රතිවිද්ධ ය. භවතෘෂ්ණාව උපුත් කරණ ලදී. භවරජ්ජුව ක්ෂීණ වීය. දැන් පුනර්භවයෙක් නැතැයි. භාග්‍යවතුන් වහන්සේ මේය වදාළසේක. මෙය වදාරා සුගතශාස්තෲන් වහන්සේ යළි අනෙකක් ද වදාළසේක:

1. යශස්වී ගෞතමයන් වහන්සේ විසින් අනුත්තරශීලය, අනුත්තර-සමාධිය, අනුත්තරප්‍රඥාව, අනුත්තරවිමුක්තිය යන මේ ධර්මයෝ අවබෝධ කරණලදහ.

2. මෙසේ බුදුහු විශිෂ්ටඥානයෙන් දැන භික්ෂූන්ට දහම් වදාළහ. වෘත්තදුඃඛය අන්ත කරණ පසැස් ඇති ශාස්තෲන් වහන්සේ (කෙලශ-පරිනිර්වාණයෙන්) පිරිනිවියහ යි.

## 7. 2. 2. 8.

## [නගරූපම සූත්‍රය]

[සැබෑ ස්නිදන සි]

14. මහණෙනි, යම් කලෙක රජුගේ පසල් නුවර සප්ත නගරා-ලඞ්කාරයෙන් මොනොවට පිරිකෙවූ කරණලද්දේ වේ ද, සතර අහර ද කැමැති සේ ලබනුයේත් නිදුකින් ලබනුයේත් විපුල කොට ලබනුයේත් වේ ද, මහණෙනි, රජහුගේ මේ ප්‍රත්‍යන්ත නගරය බැහැරි පසමිතුරු වූ සතුරන් විසින් සාධාගත (දිනාගත) නො හැකැයි කියනු ලැබේ.

කතමෙහි සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛතං හොති:

(1) ඉධ භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ එසිකා හොති ගම්භීර-නෙමා සුනිඛාතා අචලා අසම්පවෙධී. ඉමිනා පඨමෙන නගරපරික්ඛාරෙන සුපරික්ඛතං හොති රඤ්ඤො පච්චන්තිමං නගරං අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය.

(2) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ පරිඛා ඛතා හොති ගම්භීරා චෙව විත්ථතා ච. ඉමිනා දුතියෙන නගර පරික්ඛාරෙන සුපරික්ඛතං හොති රඤ්ඤො පච්චන්තිමං නගරං අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය.

(3) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ අනුපරියාය පථො හොති උච්චො චෙව විත්ථතො ච. ඉමිනා තතියෙන නගර පරික්ඛාරෙන සුපරික්ඛතං හොති රඤ්ඤො පච්චන්තිමං නගරං අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය.

(4) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං ආවුධං සන්නිචිතං හොති සලාකං චෙව ජෙවනියඤ්ච.[1] ඉමිනා චතුත්ථෙන නගර-පරික්ඛාරෙන සුපරික්ඛතං හොති රඤ්ඤො පච්චන්තිමං නගරං අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය.

(5) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහු බල-කායො පටිවසති - සෙය්‍යථීදං: හත්ථාරොහා අස්සාරොහා රථිකා ධනුග්ගහා චෙලකා චලකා පිණ්ඩදායිකා උග්ගා රාජපුත්තා පක්ඛන්දිනො මහානාගා සූරා පපළාලිකා. චම්මයොධිනො දාසකපුත්තා. ඉමිනා පඤ්චමෙන නගර-පරික්ඛාරෙන සුපරික්ඛතං හොති රඤ්ඤො පච්චන්තිමං නගරං අබ්භන්තරා-නං ගුත්තියා බාහිරානං පටිඝාතාය.

(6) පුනච පරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ දොවාරිකො හොති පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී අඤ්ඤාතානං නිවාරෙතා ඤාතානං පවෙසෙතා. ඉමිනා ඡට්ඨෙන නගරපරික්ඛාරෙන සුපරික්ඛතං හොති රඤ්ඤො පච්චන්තිමං නගරං අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය.

(7) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ පාකාරො හොති උච්චො චෙව විත්ථතො ච වාසනලෙපනසම්පන්නො ච. ඉමිනා සත්ත-මෙන නගරපරික්ඛාරෙන සුපරික්ඛතං හොති රඤ්ඤො පච්චන්තිමං නගරං අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය.

ඉමෙහි සත්තහි නගර-පරික්ඛාරෙහි සුපරික්ඛතං හොති.

කතමෙසං චතුන්නං ආහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී:

(1) ඉධ භික්ඛවෙ රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං තිණකට්ඨොදකං සන්නිචිතං හොති අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය, බාහිරානං පටිඝාතාය.

---

1. ජෙවනිකඤ්ච - සීමු. - මජසං.

කවර සප්ත නගරාලඞ්කාරයෙකින් මනාකොට පරික්ෂිප්ත වේද යත්:

(1) මහණෙනි, මෙහි රජුගේ පසල්රට නුවරෙහි ගැඹුරු වළ ඇති මොනොවට කැණ සිටුවනලද, නොසැලෙන නො වෙව්ලන එෂිකාස්තම්භය වෙයි. මේ පළමු නගර පරිෂ්කාරයෙන් රජහුගේ ප්‍රත්‍යන්ත නගරය අභ්‍යන්තරවාසීන්ගේ ගොපනය සඳහා බාහිර ශත්‍රූන්ගේ නිවාරණය සඳහා මොනොවට පරික්ෂිප්ත වෙයි.

(2) තවද, මහණෙනි, රජුගේ පසල්නුවරෙහි ගම්භීර වූත් විස්තෘත වූත් පරිඛාවෙක් කණනලද වෙයි. මේ දෙවන නගරපරිෂ්කාරයෙන් රජුගේ ප්‍රත්‍යන්ත නගරය ආභ්‍යන්තරයන්ගේ ගුප්තිය සඳහා බාහිර ශත්‍රූන්ගේ නිවාරණය සඳහා මොනොවට පරික්ෂිප්ත වෙයි.

(3) තවද මහණෙනි, රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි උස් වූ ද පුළුල් වූ ද අනුපරියායපථය (පවුරු ඇතුළත වටා ඇවිදුනා මාවත) වෙයි. රජුගේ ප්‍රත්‍යන්ත නගරය අභ්‍යන්තරවාසීන්ගේ ගුප්තිය සඳහා බාහිරයන් වළහනු සඳහා මේ තෙවන නගරපරිෂ්කාරයෙන් පරික්ෂිප්ත වෙයි.

(4) තවද මහණෙනි, රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි (සත්ති තොමරාදී) සලාක නම් වූ ද, (එකතොධාරාදි) ජේවනිය නම් වූ ද බොහෝ අවි රැස් කරණලද වෙයි. රජුගේ ප්‍රත්‍යන්ත නගරය මේ සතරවන පරිෂ්කාර-යෙන් ආභ්‍යන්තරයන්ගේ ගොපනය සඳහා බාහිරයන්ගේ වාරණය සඳහා සුපරිෂ්කෘත වෙයි.

(5) තවද මහණෙනි, රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි හස්ත්‍යාරෝහ ය, අශ්වාරෝහ ය, රථාරෝහ ය, ධවජගෙණයනුවෝ ය, (සේනාව්‍යූහකාරී) චලක ය, (සාහසිකම්හාගොඩවූ) පිණ්ඩදායක ය, (සඞ්ග්‍රාමාවචර) උග්‍රරාජපුත්‍ර ය, (සතුරන් මත කඩාපනනා) ප්‍රස්කන්දීහු ය, (මහ ඇත් සමාන) මහානාග ය, අසහාය සූර ය, (සම්සැට්ට ඇඟැලූ) චර්මයොධී ය, (ගෙහි දාසයන් සමාන) දාසක පුත්‍ර ය දැයි බොහෝ බලකාය වෙසෙයි. රජුගේ ප්‍රත්‍යන්ත නගරය මෙ පස්වන නගරපරිෂ්කාරයෙන් අභ්‍යන්තරවාසීන්ගේ ගොපනය සඳහා බාහිරයන්ගේ නිවාරණය සඳහා සුපරික්ෂිප්ත වෙයි.

(6) තවද මහණෙනි, රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි පණ්ඩිත වූ ව්‍යක්ත වූමෙධාවී වූ නො හඳුනන්නවුන් වළහනා, හඳුනන්නවුන් ප්‍රවිෂ්ට කරවනද්වාරපාලයෙක් වෙයි. රජුගේ ප්‍රත්‍යන්ත නගරය ආභ්‍යන්තරයන්ගේ ගුප්තිය සඳහා බාහිරයන්ගේ නිවාරණය සඳහා මේ සවන නගර-පරිෂ්කාරයෙන් සුපරික්ෂිප්ත වෙයි.

(7) තවද මහණෙනි, රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි වාසනයෙන් (සිදුරු වැසීමෙන්) ලේපනයෙන් (සුණුපිරියම්න්) සම්පන්න වූ උස් වූ ද පුළුල් වූ ද මහපවුරෙක් වෙයි. රජුගේ ප්‍රත්‍යන්ත නගරය මේ සත්වන නගරපරිෂ්කාර-යෙන් ආභ්‍යන්තරයන් රක්නා සඳහා බැහැරියන් වළහනු සඳහා සුපරික්ෂිප්ත වෙයි.

මේ සත් නගර පරිස්කාරයෙන් මනා කොට පරික්ෂිප්ත වෙයි.

කවර අහර සතරක් කැමැති සේ ලබන්නේ නිදුකින් ලබන්නේ විපුල සේ ලබන්නේ වේ ද යත්:

(1) මහණෙනි, මෙලොව්හි රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි ආභ්‍යන්තර ජනයාගේ රතිය සඳහාත් ත්‍රාසයට නො වදනු සඳහාත් පසසු විහරණ සඳහාත් බැහැරියන් නවතනු සඳහාත් බොහෝ තෘණකාෂ්ට හා ජලය රැස් කොට තබනලද වෙයි.

(2) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං සාලියවකං සන්නිචිතං හොති අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය බාහිරානං පටිඝාතාය.

(3) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං තිලමාස-මුග්ගාපරන්නං සන්නිචිතං හොති අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය, බාහිරානං පටිඝාතාය.

(4) පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං භෙසජ්ජං සන්නිචිතං හොති සෙය්‍යථීදං: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං ලොණං අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය, බාහිරානං පටිඝාතාය.

ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ආහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

යතො ඛො භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමං නගරං ඉමෙහි සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛතං හොති, ඉමෙසං චතුන්නං ආහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ඉදං වුච්චති භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමං නගරං අකරණීයං බාහිරෙහි පච්චත්ථිකෙහි පච්චාමිත්තෙහි.

එවමෙව ඛො භික්ඛවෙ, යතො අරියසාවකො සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති, චතුන්නඤ්ච ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්ම-සුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො අකරණීයො මාරස්ස අකරණීයො පාපිමතො.

කතමෙහි සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො:

(1) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ එසිකා හොති ගම්භීරනෙමා සුනිඛාතා අචලා අසම්පවෙධී අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං- ඉතිපි සො භගවා අරහං සම්මා-සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. සද්ධෙසිකො භික්ඛවෙ, අරියසාවකො අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉමිනා පඨමෙන සද්ධම්මෙන සමන්නාගතො හොති.

(2) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ පරිඛා හොති ගම්භීරා චෙව විත්ථතා ච අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො හිරිමා හොති, හිරීයති කාය-දුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. හිරිපරිඛො[1] භික්ඛවෙ, අරිය-සාවකො අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉමිනා දුතියෙන සද්ධම්මෙන සමන්නාගතො හොති.

1 හිරීපරික්ඛා ඛො - මජසං.

Free Distribution www.aathaapi.org

(2) තවද මහණෙනි, රජුගේ පසල්නුවරෙහි ආභ්‍යන්තරිකයන්ගේ රතියපිණිස, පරිත්‍රාස නො වනු පිණිස, පහසු විහරණය පිණිස, බැහැරි-යන් නවතනු පිණිස බොහෝ හාල් හා යව රැස් කොට තබනලද වෙයි.

(3) තවද මහණෙනි, රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි අබතුරු දනන්ගේ රතිය පිණිස අපරිත්‍රාසය පිණිස පහසු විහරණය පිණිස බැහැරියන් වළහනු පිණිස බොහෝ තල මෑ මුං හා සෙසු අපරාන්න රැස් කොට තබනලද වෙයි.

(4) තවද මහණෙනි, රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි අබතුරු දනන්ගේ අභිරතිය පිණිය අපරිත්‍රාසය පිණිස පහසු විහරණය පිණිස බැහැරියන් වළහනු පිණිස ගී, වෙඬරු, තෙල්, මීහි, සකුරු, ලුණු යන බොහෝ බෙහෙත් රැස් කොට තබනලද වෙයි.

මහණෙනි, මෙ සතර අහර කැමැති සේ ලබන්නේ ද නිදුකින් ලබන්නේ ද විපුල සේ ලබන්නේ ද වෙයි.

මහණෙනි, යම් කලෙක රජුගේ ප්‍රත්‍යන්ත නගරය මෙ සප්ත නගරපරිෂ්කාරයෙන් පරිෂ්කෘත වේ ද, මෙ සතර අහර ද කැමැති සේ ලබන්නේ නිදුකින් ලබන්නේ විපුල සේ ලබන්නේ වේ ද, මහණෙනි, රජුගේ මෙ ප්‍රත්‍යන්ත නගරය බැහැරි පසමිතුරන් සතුරන් විසින් සාධාගත නො හැකැයි කියනු ලැබේ.

මහණෙනි, එ පරිද්දෙන් ම යම් කලෙක අරීසවු කරුණු සතෙකින් සමන්‍වාගත වූයේ ආභිචෛතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සතර ධ්‍යානයන් ද කැමැති සේ ලබන්නේ නිදුකින් ලබන්නේ, විපුල සෙ ලබන්නේත් වේ ද, මහණෙනි, මෙ අරීසවු පාපී වූ මාරයා විසින් සාධාගත නො හැක්කේ යයි කියනු ලැබේ.

කවර සත් කරුණෙකින් සමන්‍වාගත වේ ද යත්:

(1) මහණෙනි, යම් පරිද්දෙකින් රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි ගැඹුරුවල ඇති, මොනොවට සිටුවනලද නො සැලෙන නො වෙවුලන එෂිකාස්තම්භය, අභ්‍යන්තරයන්ගේ ගෝපනය සඳහා බැහැරියන් වළහනු සඳහා වේ ද, එ පරිද්දෙන් ම මහණෙනි, ආර්‍යශ්‍රාවක ශ්‍රද්ධා ඇතියේ වෙයි, තථාගතයන් වහන්සේගේ බෝධිය – මෙ කරුණෙනුදු එ භගවත්හු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තර පුරුෂදම්‍යසාරථිහ, දෙව්මිනිස්නට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ'යි හදහයි. මහණෙනි, ශ්‍රද්ධාවත් ආර්‍යශ්‍රාවක ම අකුසල් දුරලයි. කුසල් වඩයි. සාවද්‍යය දුරලයි. අනවද්‍යය වඩයි. ශුද්ධාත්මය පරිහරණ කරන්නේ ය. මෙ පළමු සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

(2) මහණෙනි, යම් පරිද්දෙකින් රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි ගැඹුරු වූ ද පුළුල් වූ ද දියඅගල ආභ්‍යන්තරයන්ගේ ගුප්තිය සඳහාත් බාහිරයන් වළහනු සඳහාත් වේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම අරීසවු හිරි ඇතියේ වෙයි. කායදුශ්චරිතයෙන්, වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් ලජ්ජිත වෙයි. ලාමු අකුසල් දහම්හි යෙදීමෙන් ලජ්ජිත වෙයි. මහණෙනි, දියඅගල බඳු හිරියෙන් යුක් අරීසවු අකුසල් දුරලයි, කුසල් වඩයි. සාවද්‍යය දුරලයි, අනවද්‍යය වඩයි. ශුද්ධ ආත්මය පරිහරණ කෙරෙයි. මෙ දෙවන සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

(3) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ අනුපරියායපථො හොති උච්චො චෙව විත්ථතො ච, අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො ඔත්තප්පී හොති. ඔත්තප්පති කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන, ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඔත්තප්පපරියායපථො භික්ඛවෙ අරියසාවකො අකුසලං පජහති කුසලං භාවෙති. සාවජ්ජං පජහති. අනවජ්ජං භාවෙති. සුද්ධං අත්තානං පරිහරති. ඉමිනා තතියෙන සද්ධම්මෙන සමන්නාගතො හොති.

(4) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං ආවුධං සන්නිචිතං හොති, සලාකං චෙව ජෙවනියඤ්ච අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සුතාවුධො භික්ඛවෙ, අරියසාවකො අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉමිනා චතුත්ථෙන සද්ධම්මෙන සමන්නාගතො හොති.

(5) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහු බලකායො පටිවසති, සෙය්‍යථීදං: හත්ථාරොහා අස්සාරොහා රථිකා ධනුග්ගහා චෙලකා චලකා පිණ්ඩදායිකා උග්ගා රාජපුත්තා පක්ඛන්දිනො මහානාගා සූරා චම්මයොධිනො දාසකපුත්තා අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. විරියබලකායො භික්ඛවෙ, අරියසාවකො අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉමිනා පඤ්චමෙන සද්ධම්මෙන සමන්නාගතො හොති.

(6) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ දොවාරිකො හොති පණ්ඩිතො වියත්තො මෙධාවී අඤ්ඤාතානං නිවාරෙතා ඤාතානං පවෙසෙතා අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. සති දොවාරිකො භික්ඛවෙ, අරියසාවකො අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉමිනා ඡට්ඨෙන සද්ධම්මෙන සමන්නාගතො හොති.

(7) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ පාකාරො හොති උච්චො චෙව විත්ථතො ච වාසනලෙපනසම්පන්නො ච අබ්භන්තරානං ගුත්තියා බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. පඤ්ඤාවාසනලෙපනසම්පන්නො භික්ඛවෙ, අරියසාවකො අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉමිනා සත්තමෙන සද්ධම්මෙන සමන්නාගතො හොති.

ඉමෙහි සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති.

(3) මහණෙනි, යම් පරිද්දෙකින් රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි උස් වූත් පුළුල් වූත් අනුපරියායපථය අබතුරුදනත් රැක්ම සඳහාත් බැහැරියන් වළගනු සඳහාත් වේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම අරිසවූ ඔතප් ඇතියේ වෙයි. කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් බිය දනවයි. ලාමක අකුශලධර්ම සමාපත්තියෙන් බිය දනවයි. මහණෙනි, ඔත්තප්පපරිඛායපථය ඇති ආර්‍යශ්‍රාවක අකුශලය දුරලයි. කුශලය වඩයි. සාවද්‍යය දුරලයි. අනවද්‍යය වඩයි. ශුද්ධ වූ ආත්මය පරිහරණ කරයි. මෙ තෙවන සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

(4) මහණෙනි, යම් පරිද්දෙකින් රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි අභ්‍යන්තරජනයා රැක්ම සඳහාත් බැහැරියන් වළගනු සඳහාත් ශලාකා හා ජෙවනීය යයි බොහෝ ආයුධ රැස් කරණලද වේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම ආර්‍යශ්‍රාවක බහුශ්‍රැත වූයේ ශ්‍රැතධර වූයේ ශ්‍රැතසන්නිචය ඇතියේ වෙයි. යම් ඒ ධර්ම කෙනෙක් ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍යවසානකල්‍යාණ ඇති සාර්‍ථ වූවාහු සව්‍යඤ්ජන වූවාහු කෙවලපරිපූර්ණ වූවාහු පරිශුද්ධ බ්‍රහ්මචර්‍යය පවසත් නම්, එබඳු ධර්මයෝ ඔහු විසින් බහුශ්‍රැත වෙත් ධරණලද වෙත්. වචනයෙන් පුරුදු කරණලද වෙත්. මනසින් අනුප්‍රෙක්‍ෂිත වෙත්. ප්‍රඥාදෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ වෙත්. මහණෙනි, ශ්‍රැතය අවි කොට ඇති ආර්‍යශ්‍රාවක අකුශලය දුරලයි. කුශලය වඩයි. සාවද්‍යය දුරලයි. අනවද්‍යය වඩයි. පිරිසිදු ආත්මයක් පරිහරණ කරයි. මෙ සතරවන සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

(5) මහණෙනි, යම් පරිදි රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි හස්ත්‍යාරොහ ය අශ්වාරොහ ය, රථික ය, ධනුර්ධර ය, චේලක ය, චලක ය, පිණ්ඩදායක ය, උග්‍රරාජපුත්‍ර ය, ප්‍රස්කන්දිහු ය, මහානාග ය, සූර අසහාය ය, චර්මයොධි ය, දාසකපුත්‍ර ය යන බලකාය අභ්‍යන්තරයන්ගේ ගුප්තිය සඳහාත් බාහිරයන් නවතනු සඳහාත් වේ ද, මහණෙනි, එපරිද්දෙන් ම අරිසවූ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය සඳහා කුශලධර්මයන්ගේ උපසම්පත් සඳහා කුශලධර්මයන්හි ස්ථාම ඇතියේ දළපැරකුම් ඇතියේ නො හළ වැරබුර ඇතියේ රුකුළුවැර ඇතියේ වෙසෙයි. මහණෙනි, වීර්‍ය සඞ්ඛ්‍යාත බලකාය ඇති ආර්‍යශ්‍රාවක අකුසල් දුරලයි. කුසල් වඩයි. සාවද්‍යය දුරලයි. අනවද්‍යය වඩයි. ශුද්ධ ආත්මය පරිහරණ කරයි. මෙ පස්වන සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

(6) මහණෙනි, යම් පරිදි රජුගේ පසල් නුවරෙහි පණ්ඩිත, ව්‍යක්ත, මෙධාවී වූ අඥතයන් වළහන, ඥතයන් පිවිස්වන ද්වාරපාලයා අභ්‍යන්තර ජනයාගේ රැක්ම සඳහා බාහිර සතුරන් වළහනු සඳහා වේ ද, මහණෙනි, එපරිදි අරිසවූ උත්තම ස්මෘතියෙන් හා නිපකභාවයෙන් සමන්‍වාගත වූ, බොහෝ පෙර කළ දෑ හා බොහෝ පෙර කී දෑ සිහි කරන්නේ පුනපුනා සිහි කරන්නේ ස්මෘති ඇතියේ වෙයි. මහණෙනි, සිහිය දෙරටුපල් කොට ඇති අරිසවූ අකුසල් දුරලන්නේ ය, කුසල් වඩන්නේ ය, සාවද්‍යය දුරලන්නේ ය, අනවද්‍යය වඩන්නේ ය, පිරිසිදු ආත්මය පරිහරණ කරන්නේය. මෙ සවන සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

(7) මහණෙනි, යම් පරිදි රජුගේ පසල් දනවූ නුවර වාසනාලෙපනයෙන් සම්පූර්ණ වූ උස් වූත් පුළුල් වූත් පවුර අභ්‍යන්තරිකයන්ගේ ගොපනය සඳහාත් බාහිරයන්ගේ නිවාරණය සඳහාත් වන්නේ ද, මහණෙනි, එ පරිදි ම ආර්‍යශ්‍රාවක උදයව්‍යයගාමිනී වූ ආර්‍ය වූ නිර්වේදය ඇසුරු කළ මනාසේ දුඃඛක්‍ෂයට යන විදර්ශනා ප්‍රඥායෙන් සමන්‍වාගත වූයේ ප්‍රඥාවත් වෙයි. මහණෙනි, ප්‍රඥාවාසනාලෙපනයෙන් සපන් අරිසවූ අකුසලය දුරලයි, කුසලය වඩයි, සාවද්‍යය දුරලයි, අනවද්‍යය වඩයි. පිරිසිදු ආත්මය පරිහරණ කරන්නේ ය. මෙ සත්වන සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

මෙ සප්ත සද්ධර්මයෙන් සමන්‍වාගත වෙයි.

කතමෙසං චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛ-විහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී:

(1) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං තිණ-කට්ඨොදකං සන්නිචිතං හොති අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසු-විහාරාය බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, අත්තනො රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය, ඔක්කමනාය නිබ්බානස්ස.

(2) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං සාලිය-වකං සන්නිචිතං හොති අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය, බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො විතක්ක-විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති අත්තනො රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය, ඔක්කමනාය නිබ්බානස්ස.

(3) සෙය්‍යථාපි භික්ඛවෙ රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං තිලමුග්ග-මාසාපරණ්ණං සන්නිචිතං හොති අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති, සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරති අත්තනො රතියා අපරි-තස්සාය ඵාසුවිහාරාය, ඔක්කමනාය නිබ්බානස්ස.

(4) සෙය්‍යථාපි භික්ඛවෙ, රඤ්ඤො පච්චන්තිමෙ නගරෙ බහුං භෙසජ්ජං සන්නිචිතං හොති සෙය්‍යථීදං: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං ලොණං අබ්භන්තරානං රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය බාහිරානං පටිඝාතාය, එවමෙව ඛො භික්ඛවෙ, අරියසාවකො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති අත්තනො රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය, ඔක්කමනාය නිබ්බානස්ස.

ඉමෙසං චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

යතො ච ඛො භික්ඛවෙ, අරියසාවකො ඉමෙහි සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති, ඉමෙසං චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨ-ධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී

අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො අකරණීයො මාරස්ස අකර-ණීයො පාපිමතොති.

ආභිචේතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ කවර ධ්‍යාන සතරක් කැමැති සේ ලබන්නේත් නිදුකින් ලබන්නේත් විපුලභාවයෙන් ලබන්නේත් වේ ද යත්:

(1) මහණෙනි, යම් පරිද්දි රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි ආභ්‍යන්තරයන්ගේ රතිය සඳහා අපරිත්‍රාසය සඳහා පහසුවිහරණ සඳහා බාහිරයන් වළහනු සඳහා බොහෝ තෘණ, කාෂ්ට, උදක රැස් කොට තබනලද වේ ද, මහණෙනි, එසෙයින් ආර්‍යශ්‍රාවක කාමයෙන් වෙන් ව ම අකුශල ධර්මයෙන් වියුක්ත ව ම තමාගේ අභිරතිය සඳහා අපරිත්‍රාසය සඳහා පහසු විහරණ සඳහා නිර්වාණයට වැදගනු සඳහා සවිතර්ක වූ සවිචාර වූ විවේකජ වූ ප්‍රීති හා සුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි.

(2) මහණෙනි, යම් පරිදි රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි ආභ්‍යන්තරිකයන්ගේ අභිරතිය පිණිස අපරිත්‍රාසය පිණිස, පහසු විහරණය පිණිස, බැහැරි සතුරන් වළහනු පිණිස, බොහෝ ශාලි යව රැස් කොට තබන ලද වේ ද, මහණෙනි, එපරිද්දෙන් ම ආර්‍යශ්‍රාවක විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම් ඇති චිත්තයාගේ එකාග්‍රභාවයෙන් යුත් අවිතර්ක අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ද්විතීය ධ්‍යානයට තමාගේ රතිය පිණිස ද පරිත්‍රාස නො වන පිණිස ද පහසු විහරණ පිණිස ද නිවනට වැදගන්නා පිණිස ද එළැඹ වෙසෙයි.

(3) මහණෙනි, යම් පරිදි රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි ආභ්‍යන්තරයන්ගේ රතිය සඳහා අපරිත්‍රාසය සඳහා පහසුවිහරණ සඳහා බැහැරි සතුරන් වළහනු සඳහා බොහෝ තල, මෑ, මුං අපරාන්න රැස් කොට තබන ලද වේ ද, මහණෙනි, එ පරිදි ම අරිසව් ප්‍රීතියගේත් විරාගයෙන්, සිහි ද ඇතියේ සම්‍යක්ප්‍රඥා ඇතියේ උපෙක්‍ෂක ව වෙසෙයි. සුඛය ද නාමකයින් විඳුනේ ය. ආර්‍යයෝ යම් පුහුලෙක් උපෙක්‍ෂා ඇතියේ සමෘතිවත් වූයේ සුඛවිහාරී යයි කියත් නම් තමාගේ රතිය සඳහා අපරිත්‍රාසය සඳහා පහසුවිහරණ සඳහා නිවනට වැදගනු සඳහා එබඳු තෘතීය ධ්‍යානයට පැමිණ වෙසෙයි.

(4) මහණෙනි, යම් පරිදි රජුගේ ප්‍රත්‍යන්ත නගරයෙහි ආභ්‍යන්තරිකයන්ගේ අභිරතිය සඳහා, අපරිත්‍රාසය සඳහා, පහසුවිහරණය සඳහා බාහිරයන්ගේ නිවාරණය සඳහා සපි ය, නවනීත ය, මධු ය, ඵාණිත ය, ලවණ ය යන බොහෝ භෛෂජ්‍ය රැස් කරණලද වේ ද, මහණෙනි, එ පරිදි ම ආර්‍යශ්‍රාවක තෙම තමාගේ අභිරතිය සඳහා අපරිත්‍රාසය සඳහා පහසුවිහරණ සඳහා නිවනට වැදගනු සඳහා සුඛයාගේත් ප්‍රහාණයෙන් දුඃඛයාගේත් ප්‍රහාණයෙන් පළමු ම සොම්නස් දොම්නසුන්ගේ අස්තගමයෙන් අදුක්ඛ වූ අසුඛ වූ උපෙක්‍ෂා සමෘති දෙකින් පිරිසිදු වූ චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි.

මෙ ආභිචේතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ ධ්‍යාන සතර කැමතිසේ ලබන්නේත්, නිදුකින් ලබන්නේත්, විපුලසේ ලබන්නේත් වෙයි.

මහණෙනි, යම් කලෙක අරිසවු මෙ සප්ත සද්ධර්මයෙන් සමන්නාගත වේ ද, මෙ ආභිචේතසික වූ ද දිට්ඨධම්මසුඛවිහාර වූ සතර ධ්‍යානයන් කැමතිසේ ලබන්නේ ද, නිදුකින් ලබන්නේ ද, විපුලසේ ලබන්නේත් වේ ද.

මහණෙනි, මෙ අරිසවු මාරයා විසින් අකරණීය වේ. පාපිමත්හු විසින් අකරණීය වේ ය යි කියනු ලැබේ.

7. 2. 2. 4.

## [ධම්මඤ්ඤූ සුත්තං]

### [සංඛිත්තනිද්දෙසං]

**16.** සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මඤ්ඤූ ච හොති අත්ථඤ්ඤූ ච අත්තඤ්ඤූ ච මත්තඤ්ඤූ ච කාලඤ්ඤූ ච පරිසඤ්ඤූ ච පුග්ගලපරොපරඤ්ඤූ[1] ච.

(1) කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මඤ්ඤූ හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. නො චෙ භික්ඛවෙ, භික්ඛු ධම්මං ජානෙය්‍ය සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං නයිධ ධම්මඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං -පෙ- අබ්භුතධම්මං වෙදල්ලං, තස්මා භික්ඛු ධම්මඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ.

(2) අත්ථඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානාති "අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථො"ති. නො චෙ භික්ඛවෙ, භික්ඛු තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානෙය්‍ය "අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථොති" නයිධ අත්ථඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානාති "අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථො"ති. තස්මා අත්ථඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ.

(3) අත්තඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු අත්තානං ජානාති එත්තකොම්හි සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙනාති. නො චෙ භික්ඛවෙ, භික්ඛු අත්තානං ජානෙය්‍ය එත්තකොම්හි සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙනාති, නයිධ අත්තඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු අත්තානං ජානාති එත්තකොම්හි සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙනාති. තස්මා අත්තඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ අත්තඤ්ඤූ.

(4) මත්තඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු මත්තං ජානාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං පටිග්ගහණාය. නො චෙ භික්ඛවෙ, භික්ඛු මත්තං ජානෙය්‍ය චීවරපිණ්ඩපාතසෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං පටිග්ගහණාය, නයිධ මත්තඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු මත්තං ජානාති චීවරපිණ්ඩ-පාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං පටිග්ගහණාය, තස්මා මත්තඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ, අත්තඤ්ඤූ මත්තඤ්ඤූ.

---

1 පුග්ගල පරොපරඤ්ඤූ - මජ්සං

## 7. 2. 2. 4.

## [ධම්මඤ්ඤ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**15**. මහණෙනි, කරුණු සතෙකින් සමන්විතවූ මහණ ආහුනෙය්‍ය වෙයි ... ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි. කවර සතෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ධම්මඤ්ඤ ද වෙයි. අත්ථඤ්ඤ ද වෙයි. ආත්මඤ්ඤ ද වෙයි. මාත්‍රඤ්ඤ ද වෙයි. කාලඤ්ඤ ද වෙයි. පරිෂද්ඥ ද වෙයි. පුද්ගලපරාපරඥ ද වෙයි.

(1) මහණෙනි, මහණ කෙසේ ධම්මඤ්ඤ වේ ද යත්: මහණෙනි මෙ සස්නෙහි මහණ සූත්‍ර ය, ගෙය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අද්භූතධර්ම ය, වෙදල්ල ය, යන ධර්මය දන්නේ ය. මහණෙනි ඉදින් මහණ සූත්‍ර ය, ගෙය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අද්භූතධර්ම ය, වෙදල්ල ය, යන ධර්මය නොදන්නේ නම්, මෙ සස්නෙහි ධම්මඤ්ඤයෙකැයි කියනු නො ලබන්නේ ය. මහණෙනි, යම් හෙයෙකින් මහණ සූත්‍ර ය, ගෙය ය, ... අද්භූතධර්ම ය, වෙදල්ල ය යන ධර්මය දන්නේ ද, මහණෙනි, එහෙයින් මහණ ධම්මඤ්ඤ යයි කියනු ලැබේ. මෙසෙයින් ධම්මඤ්ඤ වෙයි.

(2) අත්ථඤ්ඤ කෙසේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ මෙ මෙ භාෂිතයාගේ අර්ථ ය, මෙ මෙ භාෂිතයාගේ අර්ථය'යි එ එ භාෂිතයාගේ අර්ථය දන්නේ ය. මහණෙනි, ඉදින් මහණ, මෙ මෙ භාෂිතයාගේ අර්ථය, මෙ මෙ භාෂිතයාගේ අර්ථය'යි එ එ භාෂිතයාගේ අර්ථය නො දන්නේ නම්, මෙ සස්නෙහි අත්ථඤ්ඤයෙකැයි නො කියනු ලබනේ ය. මහණෙනි, යම් හෙයකින් මහණ එ එ භාෂිතයාගේ ම අර්ථය මෙ මෙ භාෂිතයාගේ අර්ථය යි දන්නේ නම් එ හෙයින් ම අත්ථඤ්ඤ ය යි කියනුලබනේ ය. මෙසෙයින් ධම්මඤ්ඤ ද අත්ථඤ්ඤ ද වෙයි.

(3) ආත්මඤ්ඤ කෙසේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ "ශ්‍රද්ධායෙන් ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥයෙන් ප්‍රතිභාණයෙන් මෙ පමණයෙමි"යි තමා දන්නේ ය. මහණෙනි, ඉදින් මහණ "ශ්‍රද්ධායෙන්, ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥයෙන්, ප්‍රතිභාණයෙන් මෙතෙක් වෙමි'යි තමා නොදන්නේ නම් මෙ සස්නෙහි ආත්මඤ්ඤ යයි නො කියනුලබන්නේ ය. මහණෙනි, යම් හෙයකින් මහණ ශ්‍රද්ධායෙන්, ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥයෙන්, ප්‍රතිභාණයෙන් මෙතෙක් වෙමි"යි තමා හඳුනන්නේ ද, එහෙයින් ම 'ආත්මඤ්ඤ'ය යි කියනු ලබන්නේ ය. මෙසේ ධම්මඤ්ඤ, අත්ථඤ්ඤ, ආත්මඤ්ඤ වෙයි.

(4) මාත්‍රඤ්ඤ කෙසේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ සිවුරු, පිඬුවා, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්පිරිකර පිළිගැණුමට මාත්‍රය දන්නේ ය. මහණෙනි, ඉදින් මහණ චීවර, පිණ්ඩපාත, ශයනාසන, ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයන් පිළිගැණුමට පමණ නො දන්නේ ද, මෙ සස්නෙහි 'මාත්‍රඤ්ඤ'ය යි කියනු නො ලබන්නේ ය. මහණෙනි, යම් හෙයකින් මහණ චීවර, පිණ්ඩපාත, ශයනාසන, ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍ය-පරිෂ්කාරයන් ප්‍රතිග්‍රහණයට මාත්‍රය දන්නේ ද, එහෙයින් 'මාත්‍රඤ්ඤ'යයි කියනු ලබන්නේ ය. මෙසේ ධම්මඤ්ඤ අත්ථඤ්ඤ ආත්මඤ්ඤ මාත්‍රඤ්ඤ වෙයි.

Free Distribution www.aathaapi.org

(5) කාලඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු කාලං ජානාති: අයං කාලො උද්දෙසස්ස, අයං කාලො පරිපුච්ඡාය, අයං කාලො යොගස්ස, අයං කාලො පටිසල්ලානායාති.[1] නො චෙ භික්ඛවෙ, භික්ඛු කාලං ජානෙය්‍ය, අයං කාලො උද්දෙසස්ස, අයං කාලො පරිපුච්ඡාය, අයං කාලො යොගස්ස, අයං කාලො පටිසල්ලානායාති[1] නයිධ කාලඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු කාලං ජානාති: අයං කාලො උද්දෙසස්ස, අයං කාලො පරිපුච්ඡාය, අයං කාලො යොගස්ස, අයං කාලො පටිසල්ලානායා'ති[1] තස්මා කාලඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ අත්තඤ්ඤූ මත්තඤ්ඤූ කාලඤ්ඤූ.

(6) පරිසඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ භික්ඛු පරිසං ජානාති: අයං ඛත්තිය පරිසා, අයං බ්‍රාහ්මණ පරිසා, අයං ගහපතිපරිසා, අයං සමණ-පරිසා, තත්ථ එවං උපසඞ්කමිතබ්බං, එවං ඨාතබ්බං, එවං කත්තබ්බං, එවං නිසීදිතබ්බං, එවං භාසිතබ්බං, එවං තුණ්හීභවිතබ්බන්ති. නො චෙ භික්ඛවෙ, භික්ඛු පරිසං ජානෙය්‍ය: අයං ඛත්තියපරිසා, අයං බ්‍රාහ්මණපරිසා, අයං ගහපති පරිසා, අයං සමණපරිසා, තත්ථ එවං උපසඞ්කමිතබ්බං, එවං ඨාතබ්බං, එවං කත්තබ්බං, එවං නිසීදිතබ්බං, එවං භාසිතබ්බං, එවං තුණ්හීභවිතබ්බන්ති, නයිධ පරිසඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු පරිසං ජානාති: අයං ඛත්තිය පරිසා, අයං බ්‍රාහ්මණපරිසා අයං ගහපතිපරිසා, අයං සමණපරිසා, තත්ථ එවං උපසඞ්කමිතබ්බං, එවං ඨාතබ්බං, එවං කත්තබ්බං, එවං නිසීදිතබ්බං, එවං භාසිතබ්බං, එවං තුණ්හීභවිතබ්බන්ති. තස්මා පරිසඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ අත්තඤ්ඤූ මත්තඤ්ඤූ කාලඤ්ඤූ පරිසඤ්ඤූ.

(7) පුග්ගලපරොපරඤ්ඤූ ච[2] කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛුනො ද්වෙයෙන පුග්ගලා විදිතා හොන්ති. ද්වෙ පුග්ගලා: එකො අරියානං දස්සන-කාමො, එකො අරියානං න දස්සනකාමො. ය්වායං පුග්ගලො අරියානං න දස්සනකාමො එවං සො තෙන ඞ්ගෙන[3] ගාරය්හො. ය්වායං පුග්ගලො අරියානං දස්සනකාමො එවං සො තෙන ඞ්ගෙන[3] පාසංසො.

ද්වෙ පුග්ගලා අරියානං දස්සනකාමා: එකො සද්ධම්මං සොතුකාමො, එකො සද්ධම්මං න සොතුකාමො. ය්වායං පුග්ගලො සද්ධම්මං න සොතුකාමො, එවං සො තෙන ඞ්ගෙන[3] ගාරය්හො. ය්වායං පුග්ගලො සද්ධම්මං සොතුකාමො, එවං සො තෙන ඞ්ගෙන[3] පාසංසො.

ද්වෙ පුග්ගලා සද්ධම්මං සොතුකාමා: එකො ඔහිතසොතො ධම්මං සුණාති, එකො අනොහිතසොතො ධම්මං සුණාති. ය්වායං පුග්ගලො අනොහිතසොතො ධම්මං සුණාති, එවං සො තෙනඞ්ගෙන ගාරය්හො, ය්වායං පුග්ගලො ඔහිතසොතො ධම්මං සුණාති, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

---

1. පටිසල්ලානකාලොති - මජසං. 2 පුග්ගලපරොපරඤ්ඤූ ච - මජසං.
3. තෙන තෙන - සිමු.

(5) කාලඥ කෙසේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ "මෙ උද්දෙශයට කලි, මෙ පරිපෘච්ඡාවට කලි, මෙ යොගයට කලි, මෙ පිළිසලනට කලැ"යි කල් දන්නේ ය. මහණෙනි, ඉදින් මහණ "මෙ උදෙසුමට කලි, මෙ පිළිවිසුමට කලි, මෙ යොගයට කලි, මෙ පිළිසලනට කලැ"යි කල් නො දන්නේ නම්, මෙ සස්නෙහි කාලඥ යයි කියනු නො ලබන්නේ ය. මහණෙනි, යම් හෙයෙකින් මහණ 'මෙ උද්දෙශයට කලි, මෙ පුළුවුස්නට කලි, මෙ යොගයට කලි, මෙ පිළිසලනට කලැ'යි කල් දන්නේ ද, එහෙයින් කාලඥයයි කියනු ලැබේ. මෙසේ ධර්මඥ අර්ථඥ ආත්මඥ මාත්‍රඥ කාලඥ වෙයි.

(6) පර්ෂද්ඥ කෙසේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ, 'මෙ ක්ෂත්‍රියපර්ෂද් ය, මෙ බ්‍රාහ්මණපර්ෂද් ය, මෙ ගෘහපතිපර්ෂද් ය, මෙ ශ්‍රමණ පර්ෂද් ය, එහි මෙසෙයින් එළැඹිය යුතු, මෙ සෙයින් සිටිය මනා ය, මෙ සෙයින් කළමනා ය, මෙසෙයින් හිඳිය මනා ය, මෙසෙයින් කියනුව මනාය, මෙසෙයින් තුෂ්ණීම්භූත වූවමනායයි පිරිස් දන්නේ ය. මහණෙනි, ඉදින් මහණ මෙ කැත්පිරිස, මෙ බමුණුපිරිස, මෙ ගැහැවි පිරිස, මෙ මහණ පිරිසැ. එහි මෙසෙයින් එළැඹිය මනා ය, මෙසෙයින් සිටිය මනා ය, මෙසෙයින් කළමනා ය, මෙසෙයින් හිඳිය මනා ය, මෙසෙයින් කියනුව මනා ය, මෙසෙයින් නිහඬ වූවමනායයි පිරිස් නො දන්නේ නම්, මෙ සස්නෙහි (මහණ) පර්ෂද්ඥ යි නො කියනු ලබන්නේ ය. මහණෙනි, යම් හෙයකින් මහණ 'මෙ කැත්පිරිස් ය, මෙ බමුණු පිරිස් ය, මෙ ගැහැවිපිරිස් ය, මෙ මහණ පිරිස් ය, එහි මෙ සෙයින් එළැඹිය මනා ය, මෙසෙයින් සිටිය මනා ය, මෙසෙයින් කළමනා ය, මෙසෙයින් හිඳිය මනාය, මෙසෙයින් කියනුවමනා ය, මෙසෙයින් නිහඬ වූවමනා යයි පිරිස් දන්නේ ද, එහෙයින් පර්ෂද්ඥ යි කියනු ලබන්නේ ය. මෙසේ ධර්මඥ අර්ථඥ ආත්මඥ මාත්‍රඥ කාලඥ පර්ෂද්ඥ වෙයි.

(7) පුද්ගලපරාවරඥ කෙසේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහු විසින් දෙ පරිද්දියෙකින් පුඟුල්හු විදිත වෙත්. පුඟුල්හු දෙ දෙනෙකි. එකෙක් ආර්‍ය්‍යයන් දක්නට කැමතියේ ය. එකෙක් ආර්‍ය්‍යයන් දක්නට නොකැමතියේ ය. යම් මෙ පුඟුලෙක් ආර්‍ය්‍යයන් දක්නට නො කැමැත්තේ නම්, මෙසේ හෙ එ කරුණින් ගැරැහිය යුතුවේ. යම් මෙ පුඟුලෙක් ආර්‍ය්‍යයන් දක්නට කැමැත්තේ නම්, මෙ සෙයින් හෙ එකරුණින් පැසැසියයුතු වන්නේ ය.

පුද්ගලයෝ දෙදෙනෙක් ආර්‍ය්‍යයන් දක්නා කැමැත්තාහ: එකෙක් සදහම් අසනට කැමතියේ වෙයි. එකෙක් සදහම් අසනු නො කැමතියේ වෙයි. යම් මෙ පුඟුලෙක් සද්ධර්මය නො අසනු කැමතියේ නම් මෙසේ හෙ එ කරුණින් ගැරැහියයුතු වන්නේ ය. යම් මෙ පුඟුලෙක් සද්ධර්මය අසනු කැමැතියේ නම්, මෙසේ හෙ එ කරුණින් පැසැසිය යුතු වන්නේ ය.

සදහම් අසනු කැමැති මෙ පුඟුල්හු දෙදෙනෙකි: එකෙක් යොමුකළ කන් ඇතියේ ධර්මය අසයි. එකෙක් යොමු නො කළ කන් ඇතියේ දහම් අසයි. යම් මෙ පුඟුලෙක් යොමු නො කළ ශ්‍රොත්‍ර ඇතියේ ධර්මය අසා නම්, මෙසේ හෙ එ කරුණින් ගැරැහිය යුතු වෙයි. යම් මෙ පුඟුලෙක් යොමු කළ කන් ඇතියේ ධර්මය අසා නම් මෙසේ හෙ එ කරුණෙන් පැසැසිය යුතු වෙයි.

ද්වෙ පුග්ගලා ඔහිතසොතා ධම්මං සුණන්ති: එකො සුත්වා ධම්මං ධාරෙති, එකො සුත්වා ධම්මං න ධාරෙති. ය්වායං පුග්ගලො සුත්වා ධම්මං න ධාරෙති, එවං සො තෙනඞ්ගෙන[1] ගාරය්හො, ය්වායං පුග්ගලො සුත්වා ධම්මං ධාරෙති, එවං සො තෙනඞ්ගෙන[1] පාසංසො.

ද්වෙ පුග්ගලා සුත්වා ධම්මං ධාරෙන්ති: එකො ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, එකො ධතානං ධම්මානං අත්ථං න උපපරික්ඛති. ය්වායං පුග්ගලො ධතානං ධම්මානං අත්ථං න උපපරික්ඛති, එවං සො තෙනඞ්ගෙන[1] ගාරය්හො. ය්වායං පුග්ගලො ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, එවං සො තෙනඞ්ගෙන[1] පාසංසො.

ද්වෙ පුග්ගලා ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛන්ති: එකො අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො, එකො න අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො. ය්වායං පුග්ගලො න අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො, එවං සො තෙනඞ්ගෙන[1] ගාරය්හො. ය්වායං පුග්ගලො අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො, එවං සො තෙනඞ්ගෙන[1] පාසංසො.

ද්වෙ පුග්ගලා අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නා: එකො අත්තහිතාය පටිපන්නො නො පරහිතාය. එකො අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච. ය්වායං පුග්ගලො අත්තහිතාය පටිපන්නො නො පරහිතාය, එවං සො තෙනඞ්ගෙන[1] ගාරය්හො, ය්වායං පුග්ගලො අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච, එවං සො තෙනඞ්ගෙන[1] පාසංසො.

එවං ඛො භික්ඛවෙ, භික්ඛුනො ද්වයෙන පුග්ගලා විදිතා හොන්ති. එවං ඛො, භික්ඛවෙ භික්ඛු පුග්ගලපරොවරඤ්ඤූ හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති.

7. 2. 2. 5.

[පාරිච්ඡත්තක සුත්තං]

[සංඛෙපනිද්දෙසං]

16. යස්මිං භික්ඛවෙ සමයෙ දෙවානං තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො පණ්ඩුපලාසො හොති. අත්තමනා භික්ඛවෙ දෙවා තාවතිංසා තස්මිං සමයෙ හොන්ති: 'පණ්ඩුපලාසොදානි පාරිච්ඡත්තකො කොවිළාරො, න චිරස්සෙව දානි සන්නපලාසො[2] භවිස්සතී'ති.

යස්මිං භික්ඛවෙ, සමයෙ දෙවානං තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො සන්නපලාසො හොති, අත්තමනා භික්ඛවෙ දෙවා තාවතිංසා තස්මිං සමයෙ හොන්ති: සන්නපලාසොදානි පාරිච්ඡත්තකො කොවිළාරො න චිරස්සෙවදානි ජාලකජාතො භවිස්සතී'ති.

---

1 තෙන තෙන - මජසං. 2. පන්නපලාසො - මජසං.

මේ පුග්ගල්හු දෙදෙනෙක් අවහිත ශ්‍රොත්‍ර ඇතියාහු ධර්මය අසත්. එකෙක් අසා ධර්මය ධරයි. එකෙක් අසා ධර්මය නො ධරයි. යම් මේ පුග්ගලෙක් අසා ධර්මය නො ධරා නම්, මෙතෙයින් හෙ එ කරුණින් ගැරැහිය යුතු වෙයි. යම් මේ පුග්ගලෙක් ධර්මය අසා ධරා නම්, මෙතෙයින් හෙ එ කරුණින් පැසැසිය යුත්තේ ය.

මේ පුද්ගලයෝ දෙදෙනෙක් අසා ධර්මය ධරත්. එකෙක් ධරණලද ධර්මයාගේ අර්ථය පිරික්සයි. එකෙක් ධරණලද ධර්මයාගේ අර්ථය නො පිරික්සයි. යම් මේ පුද්ගලයෙක් ධරණලද ධර්මයාගේ අර්ථය නො පිරික්සා නම්, මෙසේ හෙ එ කරුණින් ගැරැහිය යුතු වෙයි. යම් මේ පුග්ගලෙක් ධරණලද ධර්මයන්ගේ අර්ථය පිරික්සා නම්, මෙසේ හෙ එ කරුණින් පැසැසිය යුතු වෙයි.

මේ පුද්ගලයෝ දෙදෙනෙක් ධරණලද ධර්මයන්ගේ අර්ථය පිරික්සත්: එකෙක් අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මයට පිළිපන්නේ වෙයි. එකෙක් අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මයට නො පිළිපන්නේ වෙයි. යම් මේ පුග්ගලෙක් අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මප්‍රතිපන්න නො වේ නම්, මෙසේ හෙ එකරුණෙන් ගැරැහිය යුතු වෙයි. යම් මේ පුග්ගලෙක් අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මප්‍රතිපන්න වේ නම්, මෙතෙයින් හෙ එකරුණෙන් පැසැසියයුතු වෙයි.

මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙනෙක් අර්ථය දැන ධර්මය දැන ධර්මානු-ධර්මප්‍රතිපන්න වෙති: එකෙක් ආත්මහිත සඳහා පිළිපන්නේ ය. පරහිත සඳහා නො පිළිපන්නේ ය. එකෙක් ආත්මහිත සඳහා ද පරහිත සඳහා ද පිළිපන්නේ ය. යම් මේ පුද්ගලයෙක් ආත්මහිත සඳහා පිළිපන්නේ පරහිත සඳහා නො පිළිපන්නේ වේ නම්, මෙතෙයින් හෙ එකරුණෙන් ගැරැහියයුතු වෙයි. යම් මේ පුග්ගලෙක් ආත්මහිත සඳහාත් පරහිත සඳහාත් පිළිපන්නේ වේ නම්, මෙසේ හෙ එකරුණෙන් පැසැසියයුතු වෙයි.

මහණෙනි, මෙසේ භික්ෂූහු විසින් දෙකරුණින් පුද්ගලයෝ දන්නා-ලද වෙත්. මහණෙනි, මෙසේ මහණ පුද්ගල පරාවරඥ වෙයි.

මහණෙනි, මේ සප්තධර්මයෙන් සමන්විත මහණ ආහුනෙය්‍ය වෙයි ... ලොකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වේ.

7. 2. 2. 5.

[පාරිච්ඡත්තක සූත්‍රය]

[සැවැත්නිදාන යි]

16. මහණෙනි, යම් කලෙක්හි තාවතිංස දෙවියන්ගේ කොවිදාර නම් පරසතුරුක පඬුවන් පත් ඇති වේ ද, මහණෙනි, තාවතිංස දෙවියෝ එකල්හි "දැන් කොවිදාර පරසතුරුක පඬුවන් පත්‍ර ඇතියේ ය. නව නොබෝ කලෙකින් ම ගිලිහුනු පත් ඇති වන්නේ යයි සතුටු සිත් ඇති වන්නාහ.

මහණෙනි, යම් කලෙක්හි තාවතිංස දෙවියන්ගේ කොවිදාර නම් පරසතුරුක පතිතපත්‍ර ඇතියේ වේ ද, මහණෙනි, එසමයෙහි තාවතිංස දෙවියෝ "දැන් කොවිදාර පාරිච්ඡත්‍රකවෘක්‍ෂය ගිලිහුනු පත් ඇතියේ ය. නොබෝ කලෙකින් ම හටගත් කොළමල් දළු ඇති වන්නේ යයි සතුටු සිතැති වෙත්.



Free Distribution www.aathaapi.org

යස්මිං භික්ඛවෙ සමයෙ දෙවානං තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො ජාලකජාතො හොති, අත්තමනා භික්ඛවෙ, දෙවා තාවතිංසා තස්මිං සමයෙ හොන්ති ජාලකජාතොදානි පාරිච්ඡත්තකො කොවිළාරො, න චිරස්සෙවදානි ඛාරකජාතො භවිස්සතීති.

යස්මිං භික්ඛවෙ, සමයෙ දෙවානං තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො ඛාරකජාතො හොති, අත්තමනා භික්ඛවෙ, දෙවා තාවතිංසා තස්මිං සමයෙ හොන්ති ඛාරකජාතොදානි පාරිච්ඡත්තකො කොවිළාරො, න චිරස්සෙවදානි කුඩුමලකජාතො[1] භවිස්සතීති.

යස්මිං භික්ඛවෙ, සමයෙ දෙවානං තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො කුඩුමලකජාතො[1] හොති, අත්තමනා භික්ඛවෙ, දෙවා තාවතිංසා තස්මිං සමයෙ හොන්ති, කුඩුමලකජාතොදානි පාරිච්ඡත්තකො කොවිළාරො, න චිරස්සෙවදානි කොකාසකජාතො[2] භවිස්සතී'ති.

යස්මිං භික්ඛවෙ, සමයෙ දෙවානං තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො කොකාසකජාතො හොති, අත්තමනා භික්ඛවෙ, දෙවා තාවතිංසා හොන්ති කොකාසකජාතොදානි පාරිච්ඡත්තකො කොවිළාරො, න චිරස්සෙවදානි සබ්බපාලිඵුල්ලො[3] භවිස්සතීති.

යස්මිං භික්ඛවෙ, සමයෙ දෙවානං තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො සබ්බපාලිඵුල්ලො හොති, අත්තමනා භික්ඛවෙ දෙවා තාවතිංසා පාරිච්ඡත්තකස්ස කොවිළාරස්ස මූලෙ දිබ්බෙ චත්තාරො මාසෙ පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙන්ති. සබ්බපාලිඵුල්ලස්ස භික්ඛවෙ, පාරිච්ඡත්තකස්ස කොවිළාරස්ස සමන්තා පඤ්ඤාස යොජනානි ආභාය ඵුටං හොති, අනුවාතං යොජනසතං ගන්ධො ගච්ඡති. අයමනුභාවො පාරිච්ඡත්තකස්ස කොවිළාරස්ස.

(1) එවමෙව ඛො භික්ඛවෙ, යස්මිං සමයෙ අරියසාවකො අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය චෙතෙති, පණ්ඩුපලාසො භික්ඛවෙ, අරියසාවකො තස්මිං සමයෙ හොති දෙවානංව තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො.

(2) යස්මිං භික්ඛවෙ, සමයෙ අරියසාවකො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සන්නපලාසො භික්ඛවෙ තස්මිං සමයෙ අරියසාවකො හොති දෙවානංව තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො.

(3) යස්මිං භික්ඛවෙ, සමයෙ අරියසාවකො විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, ජාලකජාතො භික්ඛවෙ, අරියසාවකො තස්මිං සමයෙ හොති දෙවානංව තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො.

(4) යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, ඛාරකජාතො භික්ඛවෙ, අරියසාවකො තස්මිං සමයෙ හොති දෙවානංව තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො.

1. කුඩුමලකා - ජං. - මජසං. 2. කොරකජාතො - මජසං.
3. දළ්හ පාලිඵුල්ලො - මජසං.

මහණෙනි, යම් සමයෙක්හි තාවතිංස දෙවියන්ගේ කෝවිදාර නම් පාරිච්ඡත්‍රකවෘක්ෂය හටගත් පලුමල්කැත් ඇති වේ නම්, මහණෙනි, එසමයෙහි තාවතිංස දෙවියෝ "දැන් කෝවිදාර පරසතුරුක හටගත් පලුමල්කැත් ඇතියේ නොබෝ කලෙකින් ම වෙන් වෙන් ව බෙදුනු පලුමල්කැත් ඇති වන්නේ ය"යි තුටුසිත් ඇති වෙත්.

මහණෙනි, යම් සමයෙක්හි තාවතිංස දෙවියන්ගේ කෝවිළාර නම් පරසතුරුක වෙන් වෙන් ව බෙදුනු පලු මල් කැත් ඇති වේ ද, මහණෙනි, එසමයෙහි තාවතිංස දෙවියෝ සතුටුසිත් ඇති වෙත්: "දැන් කෝවිළාර නම් පරසතුරුක ඛාරකජාත (බෙදීගිය පලුමල් කැත් ඇති) විය, නොබෝ කලෙකින් ම හටගත් කුඩ්මල ඇති වේ යයි.

මහණෙනි, යම් කලෙක්හි තාවතිංස දෙවියන්ගේ කෝවිදාර නම් පාරිච්ඡත්‍රක වෘක්ෂය හටගත් කුඩ්මල ඇතියේ වේ ද, මහණෙනි, එසමයෙහි තාවතිංස දෙවියෝ "කෝවිදාර පරසතුරුක දැන් හටගත් කුඩ්මල ඇතියේ නොබෝ දවසෙකින් ම මිණිබුත් මලින් පුහුවේ යයි සතුටු වන්නාහ.

මහණෙනි, යම් කලෙක තවුතිසාවැසි දෙවියන්ගේ කෝවිදාර පරසතුරුක මිණිබුතුවන මල් ඇතිවන්නේ ද, මහණෙනි, තවුතිසාවැසි දෙවියෝ එකල්හි "දැන් කෝවිදාර පරසතුරුක මිණිබුතුවන මල් ඇතියේ ය, නොබෝ දවසෙකින් ම හැමයේ මොනවට පිපියේ වන්නේ ය'යි තුටු වෙත්.

මහණෙනි, යම් කලෙක තාවතිංස දෙවියන්ගේ කෝවිදාර පරසතුරුක සර්වප්‍රකාරයෙන් පාලිපුල්ල වේ ද, මහණෙනි, (එසමයෙහි) තාවතිංස දෙවියෝ කෝවිදාර පරසතුරුක්හුගේ මුල දිව්‍යවර්ෂගණනයෙන් සාරමසක් (මනුෂ්‍ය වර්ෂ ගණනයෙන් දොළොස් දහසක් අවුරුදු) පස්කම් ගුණෙන් සමන්විත වූවාහු සමර්පිත වූවාහු අභිරමණය කරත්. ක්‍රීඩා කරත්. මහණෙනි, සර්වප්‍රකාරයෙන් පාලිපුල්ල වූ කෝවිදාර පරසතුරුක්හු වටා පණස් යොදුනක් ආලෝකයෙන් පැතිරගියේ වෙයි. ගන්ධය යොදුන් සියක් අනුවාතයෙහි හමයි. කෝවිදාර පාරිච්ඡත්‍රකයාගේ මේ අනුභාව වෙයි.

(1) මහණෙනි, එපරිද්දෙන් ම යම් කලෙක්හි අරියසවු ගෙයින් නික් ම පැවිද්ද සඳහා සිතා ද, මහණෙනි, එසමයෙහි අරියසවු තව්තිසා වැසි දෙවියන්ගේ කෝවිදාර පාරිච්ඡත්‍රකය සෙයින් පණ්ඩුපලාශ වෙයි.

(2) මහණෙනි, යම් සමයෙක්හි අරියසවු කෙහෙරවුළු බහා කසාවත් හැඳ ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, මහණෙනි, එසමයෙහි අරියසවු තව්තිසා වැසි දෙවියන්ගේ කෝවිදාර පාරිච්ඡත්‍රකය සෙයින් ශුළපත් (වැටුන කොළ) ඇතියේ වෙයි.

(3) මහණෙනි, යම් සමයෙක්හි ආර්යශ්‍රාවක කාමයෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට එළැඹ වෙසේ ද, මහණෙනි, එසමයෙහි ආර්යශ්‍රාවක තාවතිංස දෙවියන්ගේ කෝවිදාර පාරිච්ඡත්‍රක රුක සෙයින් ජාලක ජාත වෙයි.

(4) මහණෙනි, යම් කලෙක්හි ආර්යශ්‍රාවක විතර්ක විචාරයන්ගේ ව්‍යපශමයෙන් ... ද්විතීයධ්‍යානයට එළඹ වෙසේ නම්, මහණෙනි, එසමයෙහි ආර්යශ්‍රාවක තාවතිංස දෙවියන්ගේ කෝවිදාර පරසතුරුක සෙයින් ඛාරකජාත වෙයි.

(5) යස්මිං භික්ඛවෙ, සමයෙ අරියසාවකො පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති, කුඩුමලකජාතො භික්ඛවෙ, අරියසාවකො තස්මිං සමයෙ හොති දෙවානංව තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො.

(6) යස්මිං භික්ඛවෙ, සමයෙ අරියසාවකො සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, කොකාසකජාතො භික්ඛවෙ අරියසාවකො තස්මිං සමයෙ හොති දෙවානංව තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො.

(7) යස්මිං භික්ඛවෙ, සමයෙ අරියසාවකො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, සබ්බපාලිඵුල්ලො භික්ඛවෙ, අරියසාවකො තස්මිං සමයෙ හොති දෙවානංව තාවතිංසානං පාරිච්ඡත්තකො කොවිළාරො.

තස්මිං භික්ඛවෙ, සමයෙ භුම්මා දෙවා සද්දමනුස්සාවෙන්ති "එසො ඉත්ථන්නාමො ආයස්මා ඉත්ථන්නාමස්ස ආයස්මතො සද්ධිවිහාරිකො අමුකම්හා ගාමා වා නිගමා වා අගාරස්මා අනගාරියං පබ්බජිතො, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දෙවා සද්දමනුස්සාවෙන්ති.

එසො ඉත්ථන්නාමො ආයස්මා ඉත්ථන්නාමස්ස ආයස්මතො සද්ධිවිහාරිකො අමුකම්හා ගාමා වා නිගමා වා අගාරස්මා අනගාරියං පබ්බජිතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා තාවතිංසා දෙවා -පෙ- යාමා දෙවා -පෙ- තුසිතා දෙවා -පෙ- නිම්මානරතී දෙවා -පෙ- පරනිම්මිතවසවත්තී දෙවා -පෙ- බ්‍රහ්මකායිකා දෙවා සද්දමනුස්සාවෙන්ති: එසො ඉත්ථන්නාමො ආයස්මා ඉත්ථන්නාමස්ස ආයස්මතො සද්ධිවිහාරිකො අමුකම්හා ගාමා වා නිගමා වා අගාරස්මා අනගාරියං පබ්බජිතො ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො[1] අබ්භුග්ගච්ඡති. අයමනුභාවො ඛීණාසවස්ස භික්ඛුනොති.

### 7. 2. 2. 6.

### [සක්කාරගරුකාර සුත්තං]

[සාවත්ථිනිදානං]

**17.** අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: කිංනු ඛො භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො අකුසලං පජහෙය්‍ය කුසලං භාවෙය්‍යා'ති.

1. සාධුකාරසද්දො - අට්ඨකථා.

(5) මහණෙනි, යම් සමයෙක්හි ආර්‍යශ්‍රාවක ප්‍රීතියගේ විරාගයෙන් ... තෘතීයධ්‍යානයට එළැඹ වෙසේ ද, මහණෙනි, එසමයෙහි අරිසවූ තාවතිංස දෙවියන්ගේ කොවිදර පාරිච්ඡත්‍රකය සෙයින් කුඩ්මල හටගත්තේ වෙයි.

(6) මහණෙනි, යම් සමයෙක්හි අරිසවූ සුඛප්‍රහාණයෙන්ද ... චතුර්ථ-ධ්‍යානයට එළැඹ වෙසේ ද, මහණෙනි, එසමයෙහි අරිසවූ තාවතිංස දෙවියන්ගේ කොවිදර නම් පාරිච්ඡත්‍රකවෘක්ෂය සෙයින් කොකාසකජාත වෙයි.

(7) මහණෙනි, යම් සමයෙක්හි අරිසවූ ආස්‍රවයන්ගේ ක්‍ෂයෙන් අනාස්‍රව චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය තමා විසින් විශිෂ්ටඥානයෙන් ඉහාත්මයෙහි ම දැන සාක්‍ෂාත් කොට එයට එළැඹ වෙසේ ද, මහණෙනි, එසමයෙහි අරිසවූ තාවතිංස දෙවියන්ගේ කොවිදර නම් පාරිච්ඡත්‍රකය සෙයින් හැමසේ පාලිපුල්ල (පිපුනේ) වෙයි.

මහණෙනි, එසමයෙහි භූමාටු දෙවියෝ "තෙල මෙබඳු නම් ඇති ආයුෂ්මත්හුගේ සද්ධිවිහාරික වූ මෙබඳු නම් ඇති ආයුෂ්මත් අසෝ ගමින් හෝ නියම්ගමින් හෝ ගෙන් නික්මියේ පැවිද්දට පැමිණියේ අනාස්‍රව චේතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ට ඥානයෙන් දැන සාක්‍ෂාත් කොට එළැඹ වෙසේ ය'යි ශබ්දය අනුශ්‍රාවණය කරත්. භූමාටු දෙවයන්ගේ ශබ්දය අසා චාතුම්මහාරාජික දෙවයෝ ශබ්දානුශ්‍රාවණය කරත්.

තෙල මෙබඳු නම් ඇති ආයුෂ්මත්හුගේ මෙබඳු නම් ඇති සද්ධි-විහාරික වූ ආයුෂ්මත් අසෝ ගමින් වේවයි, නියම්ගමින් වේවයි ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ ආස්‍රවක්‍ෂයෙන් අනාස්‍රව වූ චේතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තමා විසින් ... සාක්‍ෂාත් කොට එයට එළැඹ වාස කෙරේ ය'යි. චාතුම්මහාරාජික දෙවියන්ගේ ශබ්දය අසා තාවතිංස දෙවයෝ ... යාම දෙවයෝ ... තුෂිත දෙවයෝ .. නිම්මාණරතී දෙවයෝ ... පරනිම්මිතවසවත්ති දෙවයෝ ... බ්‍රහ්මකායික දෙවයෝ ශබ්දය අස්වත්: "තෙල මෙබඳු නම් ඇති ආයුෂ්මත්හුගේ මෙබඳු නම් ඇති සද්ධිවිහාරික වූ ආයුෂ්මත් අසෝ ගමින් හෝ නියම්ගමින් හෝ ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ ආස්‍රවක්‍ෂයෙන් ... සාක්‍ෂාත් කොට එළඹ වෙසේ යයි.

මෙසේ එකෙණෙහි, එමොහොතෙහි බඹලොව හිම් කොට ශබ්දය උස් ව නැඟෙයි. මෙ ක්‍ෂීණාස්‍රව මහණහුගේ අනුභාවය යි.

7. 2. 2. 6.

[සත්කාරගරුකාර සූත්‍රය]

[සැවැත්නිදානයි]

17. එකල්හි රහසිගත වූ පිළිසලෙනෙහි ඇලුනු ආයුෂ්මත් සාරිපුත්ත තෙරුන්හට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන: "සත්කාර කොට, ගුරු-කාර කොට කවරකු ඇසුරු කොට වෙසෙන මහණ අකුසල් දුරු කරන්නේ වේ ද, කුසල් වඩන්නේ වේ දැ යි.

අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: "සත්ථාරං ඛො භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො අකුසලං පජහෙය්‍ය, කුසලං භාවෙය්‍ය. ධම්මං ඛො භික්ඛු -පෙ- සඞ්ඝං ඛො භික්ඛු -පෙ- සික්ඛං ඛො භික්ඛු -පෙ- සමාධිං ඛො භික්ඛු -පෙ- අප්පමාදං ඛො භික්ඛු -පෙ- පටිසන්ථාරං ඛො භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො අකුසලං පජහෙය්‍ය, කුසලං භාවෙය්‍යාති.

අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: "ඉමෙ ඛො මෙ ධම්මා පරිසුද්ධා පරියොදාතා, යන්නූනාහං ඉමෙ ධම්මෙ ගන්ත්වා භගවතො ආරොචෙය්‍යං, එවමෙව ඉමෙ ධම්මා පරිසුද්ධා චෙව භවිස්සන්ති පරිසුද්ධසඞ්ඛාතතරා ච." සෙය්‍යථාපි නාම පුරිසො සුවණ්ණනික්ඛං අධිගච්ඡෙය්‍ය පරිසුද්ධං පරියොදාතං, තස්ස එවමස්ස: අයං ඛො මෙ සුවණ්ණනික්ඛො පරිසුද්ධො පරියොදාතො, යන්නූනාහං ඉමං සුවණ්ණනික්ඛං ගන්ත්වා කම්මාරානං දස්සෙය්‍යං, එවමෙව අයං සුවණ්ණනික්ඛො කම්මාරගතො පරිසුද්ධො චෙව භවිස්සති පරිසුද්ධසඞ්ඛාතතරො චාති, එවමෙව ඉමෙ ධම්මා පරිසුද්ධා පරියොදාතා, යන්නූනාහං ඉමෙ ධම්මෙ ගන්ත්වා භගවතො ආරොචෙය්‍යං, එවමෙව ඉමෙ ධම්මා පරිසුද්ධා චෙව භවිස්සන්ති පරිසුද්ධසඞ්ඛාතතරා චාති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච:

ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "කින්නු ඛො භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො, අකුසලං පජහෙය්‍ය, කුසලං භාවෙය්‍යා"ති. තස්ස මය්හං භන්තෙ එතදහොසි:

"සත්ථාරං ඛො භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො අකුසලං පජහෙය්‍ය කුසලං භාවෙය්‍ය, ධම්මං ඛො භික්ඛු -පෙ- සඞ්ඝං ඛො භික්ඛු -පෙ- සික්ඛං ඛො භික්ඛු -පෙ- සමාධිං ඛො භික්ඛු -පෙ- අප්පමාදං ඛො භික්ඛු -පෙ- පටිසන්ථාරං ඛො භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො අකුසලං පජහෙය්‍ය කුසලං භාවෙය්‍යාති.

තස්ස මය්හං භන්තෙ, එතදහොසි. "ඉමෙ ඛො මෙ ධම්මා පරිසුද්ධා පරියොදාතා, යන්නූනාහං ඉමෙ ධම්මෙ ගන්ත්වා භගවතො ආරොචෙය්‍යං, එවමෙව ඉමෙ ධම්මා පරිසුද්ධා චෙව භවිස්සන්ති පරිසුද්ධසඞ්ඛාතතරා ච."

සෙය්‍යථාපි නාම පුරිසො සුවණ්ණනික්ඛං අධිගච්ඡෙය්‍ය, පරිසුද්ධං පරියොදාතං, තස්ස එවමස්ස: අයං ඛො මෙ සුවණ්ණනික්ඛො, පරිසුද්ධො පරියොදාතො, යන්නූනාහං ඉමං සුවණ්ණනික්ඛං ගන්ත්වා, කම්මාරානං දස්සෙය්‍යං එවමෙව අයං සුවණ්ණනික්ඛො කම්මාරගතො පරිසුද්ධො චෙව භවිස්සති පරිසුද්ධසඞ්ඛාතතරො චාති, එවමෙව ඉමෙ ධම්මා, පරිසුද්ධා පරියොදාතා, යන්නූනාහං ඉමෙ ධම්මෙ ගන්ත්වා භගවතො ආරොචෙය්‍යං, එවමෙව ඉමෙ ධම්මා, පරිසුද්ධා චෙව භවිස්සන්ති පරිසුද්ධසඞ්ඛාතතරා චාති.

එක්බිති ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවන්හට මෙසේ සිත් වී: "මහණෙක් ශාස්තෘන් වහන්සේට සත්කාර කොට ගුරුකාර කොට ඇසුරු කොට වාස කරන්නේ අකුසල් දුරු කරන්නේ ය. කුසල් වඩන්නේ ය. මහණෙක් ධර්මය ... මහණෙක් සඞ්ඝයා ... මහණෙක් ශික්ෂාව .. මහණෙක් සමාධිය .... මහණෙක් අප්‍රමාදය ... මහණෙක් පටිසන්ථාරය සත්කාර කොට ගුරුකාර කොට ඇසුරු කොට වාසය කරන්නේ අකුසල් දුරු කරන්නේ ය, කුසල් වඩන්නේ ය"යි.

එක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරුන්හට මෙබඳු සිතෙක් විය: මේ දහම්හු පරිශුද්ධයහ. පර්‍යවදාතයහ. ඉදින් මම් ගොස් මේ දහම් භාග්‍යවතුන් වහන්සේට සැලකරන්නෙම් නම්, එසේ වත් ම මාගේ මේ ධර්මයෝ පරිශුද්ධ ද වන්නාහ. පරිශුද්ධ සංඛ්‍යාතතර (ඉතා පිරිසුදුව සකස් කරණ ලද) ද වන්නාහ. යම් පරිදි පුරුෂයෙක් පිරිසිදු වූ පර්‍යවදාත වූ රන් ආභරණයක් ලබා නම්' ඔහට මෙබඳු සිතෙක් වෙයි: මාගේ මේ සවර්ණ නිෂ්කය පරිශුද්ධ ය, පර්‍යවදාත ය. ඉදින් මම මේ නිෂ්කය ගෙන ගොස් කම්බුරනට දක්වන්නෙම් නම් මැනැව. එසේ වත් ම මාගේ මේ සුවර්ණ නිෂ්කය කම්බුරන් අතට ගියේ ඉතා පිරිසිදු හා පරිශුද්ධ සංඛ්‍යාතතර ද වන්නේ ය. එපරිදි ම මාගේ මේ දහම්හු පරිශුද්ධ වූවාහු පර්‍යවදාත වූවාහු වෙති. ඉදින් මම මේ දහම් ගෙන ගොස් භාග්‍යවතුන් වහන්සේට දක්වම් නම්, එසේවත් ම මාගේ මේ දහම්හු ඉතා නිර්මල ද අතිශයින් පරිශුද්ධ සංඛ්‍යාතතර (ඉතා පිරිසුදුසේ සකස් කරණ ලද) ද වන්නේ යයි.

ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ සවස්වරුයෙහි පිළිසලෙනෙන් නැගී සිටියාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි හුන්හ. එකත්පස්හි හුන් ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කරුණු සැලකළහ:

"වහන්ස, මෙහි රහසිගත වූ පිළිසලනට ගිය මට මෙබඳු සිතෙක් පහළ විය. "මහණ කවරකු සත්කාර කොට ගුරුකාර කොට ඇසුරු කොට වසන්නේ අකුශලය ප්‍රහාණ කරන්නේ ද? කුසලය වඩන්නේ දැ"යි. වහන්ස, එ මට මෙබඳු සිතෙක් පහළ විය:

"මහණෙක්, ශාස්තෘන් වහන්සේට සත්කාර කොට ගුරුකාර කොට ඇසුරු කොට වසන්නේ අකුශලය ප්‍රහීණ කරන්නේ ය කුශලය වඩන්නේ ය. මහණෙක් ධර්මය ... මහණෙක් සඟුන් ... මහණෙක් ශික්ෂාව ... මහණෙක් සමාධිය ... මහණෙක් අප්‍රමාදය ... මහණෙක් පටිසන්ථාරයට සත්කාර කොට ගුරුකාර කොට ඇසුරු කොට වාස කරන්නේ අකුශලය දුරලන්නේ ය. කුසලය වඩන්නේ ය"යි.

වහන්ස, එ මට මෙසිත විය: මාගේ මේ දහම්හු පරිශුද්ධයහ. පර්‍යවදාතයහ. ඉදින් මම් මේ දහම් ගෙණ ගොස් භාග්‍යවතුන් වහන්සේට සැල කෙරෙම් නම්, එසේ ඇතිවත් ම මාගේ මේ ධර්මයෝ ඉතා පිරිසිදු හා පරිශුද්ධ සංඛ්‍යාතතර වන්නාහ"යි.

යම් පරිදි පුරුෂයෙක් පිරිසිදු පර්‍යවදාත රත්නිකක් ලබා නම්, ඔහට මෙබඳු සිතෙක් වන්නේ ය. මාගේ මේ සවර්ණනිෂ්කය පරිශුද්ධ ය, පර්‍යවදාත ය. ඉදින් මම මේ සුවර්ණනිෂ්කය කම්බුරනට දක්වම් නම්, මැනැව. එසේ වත් එ මාගේ මේ සුවර්ණනිෂ්කය කම්බුරන් අත පත්වූයේ ඉතා පිරිසිදු හා පරිශුද්ධසංඛ්‍යාතතර හා වන්නේ ය"යි. එසේ ම මාගේ මේ ධර්මයෝ පරිශුද්ධ පර්‍යවදාත වෙති. ඉදින් මම මෙදහම් ගෙණ ගොස් භාග්‍යවතුන් වහන්සේට සැලකරම් නම්, එසේ වත් ම මෙදහම්හු ඉතා පිරිසිදු හා පරිශුද්ධසංඛ්‍යාතතර වන්නාහ යි.

සාධු සාරිපුත්ත, සත්ථාරං ඛො සාරිපුත්ත, භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො අකුසලං පජහෙය්‍ය කුසලං භාවෙය්‍ය, ධම්මං ඛො සාරිපුත්ත, භික්ඛු -පෙ- සඞ්ඝං ඛො සාරිපුත්ත භික්ඛු -පෙ- සික්ඛං ඛො සාරිපුත්ත, භික්ඛු -පෙ- සමාධිං ඛො සාරිපුත්ත භික්ඛු -පෙ- අප්පමාදං ඛො සාරිපුත්ත, භික්ඛු -පෙ- පටිසන්ථාරං ඛො සාරිපුත්ත, භික්ඛු සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තො අකුසලං පජහෙය්‍ය කුසලං භාවෙය්‍යාති.

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි:

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙපි සො අගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො භන්තෙ භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙපි සො අගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යො සො භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ, අගාරවො සික්ඛායපි සො අගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො සමාධිස්මිං සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යො සො භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො සමාධිස්මිම්පි සො අගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො සමාධිස්මිං අගාරවො අප්පමාදෙ සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

Free Distribution www.aathaapi.org

සැරියුත, මැනැවි සැරියුත, මහණෙක් ශාස්තෲන්හට සත්කාර කොට ගුරු කොට ශාස්තෲන් ඇසුරු කරමින් වාස කරන්නේ අකුසල් දුරු-කරන්නේ ය. කුසල් වඩන්නේ ය. සැරියුත, මහණෙක් ධර්මය ... සැරියුත, මහණෙක් සඟුන් ... සැරියුත, මහණෙක් ශික්ෂාව ... සැරියුත, මහණෙක් සමාධිය ... සැරියුත, මහණෙක් අප්‍රමාදය ... සැරියුත, මහණෙක් පටිසන්ථා-රයට සත්කාර කොට ගුරු කොට ඇසුරු කොට වසනුයේ අකුසල් දුරු කරන්නේ ය. කුසල් වඩන්නේ සැයි.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ භාග්‍යවතුන් වහන්-සේට මෙසේ කීහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් වදාරන ලද මේ භාෂිතයාගේ අර්ථය මෙසෙයින් විස්තර වශයෙන් දනිමි.

වහන්ස, එකාන්තයෙන් ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මය කෙරෙහි ගෞරව සහිත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇතියේ වේ නම් ඒ මහණ එකාන්තයෙන් ධර්මයෙහි ද අගෞරව ඇතියේ වෙයි.

වහන්ස, ඒ මහණ එකාන්තයෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි ගෞරව නැතියේ සංඝයා කෙරෙහි ගෞරව සහිත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ, ධර්මයෙහි ගෞරව නැතියේ නම් හෙ සඞ්ඝයා කෙරෙහිදු අගෞරව ඇතියේ ය.

වහන්ස, ඒ මහණ එකාන්තයෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇතියේ, ධර්මයෙහි අගෞරව ඇතියේ, සඞ්ඝයා කෙරෙහි අගෞරව ඇතියේ, ශික්ෂායෙහි සගෞරව වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි අගෞරව ඇතියේ සඞ්ඝයා කෙරෙහි ගෞරව නැතියේ නම්, හෙ ශික්ෂායෙහි ද ගෞරව නැතියේ ය.

වහන්ස, එකාන්තයෙන් ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි ගෞරව නැතියේ සඟුන් කෙරෙහි ගෞරව නැතියේ ශික්ෂායෙහි ගෞරව නැතියේ සමාධියෙහි සගෞරව වන්නේ ය යන තෙල කරුණ නො වේ.

වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇතියේ ධර්මයෙහි අගෞරව ඇතියේ සඟුන් කෙරෙහි අගෞරව ඇතියේ ශික්ෂායෙහි ගෞරව නැතියේ නම්, හෙ සමාධියෙහි ද අගෞරව ඇතියේ වෙයි.

වහන්ස, එකාන්තයෙන් ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව ඇතියේ ධර්මයෙහි අගෞරව ඇතියේ සඞ්ඝයා කෙරෙහි අගෞරව ඇතියේ ශික්ෂායෙහි අගෞරව ඇතියේ, සමාධියෙහි අගෞරව ඇතියේ අප්‍රමාදයෙහි ගෞරව සහිත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

යො සො භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො සමාධිස්මිං අගාරවො අප්පමාදෙපි සො අගාරවො.

සො වත භන්තෙ භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො සමාධිස්මිං අගාරවො අප්පමාදෙ අගාරවො පටිසන්ථාරෙ සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යො සො භන්තෙ, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො සමාධිස්මිං අගාරවො අප්පමාදෙ අගාරවො පටිසන්ථාරෙපි සො අගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙපි සො සගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො සඞ්ඝෙ අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො, ධම්මෙ සගාරවො, සඞ්ඝෙපි සො සගාරවො.

සො වත භන්තෙ භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛාය අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛායපි සො සගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛාය සගාරවො සමාධිස්මිං අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛාය සගාරවො සමාධිස්මිංපි සො සගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො. ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛාය සගාරවො සමාධිස්මිං සගාරවො අප්පමාදෙ අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි ගෞරව නැතියේ සඞ්ඝයා කෙරෙහි ගෞරව නැතියේ ශික්ෂායෙහි ගෞරව නැතියේ සමාධියෙහි ගෞරව නැතියේ වේ නම්, අප්‍රමාදයෙහි ද හෙ ගෞරව නැතියේ වෙයි.

වහන්ස, එකාන්තයෙන් ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි ගෞරව නැතියේ සඞ්ඝයා කෙරෙහි ගෞරව නැතියේ ශික්ෂායෙහි ගෞරව නැතියේ සමාධියෙහි ගෞරව නැතියේ අප්‍රමාදයෙහි ගෞරව නැතියේ පිළිසඳරෙහි ගෞරව සහිත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි ගෞරව නැතියේ සඞ්ඝයා කෙරෙහි ගෞරව නැතියේ ශික්ෂායෙහි ගෞරව නැතියේ සමාධියෙහි ගෞරව නැතියේ අප්‍රමාදයෙහි ගෞරව නැතියේ වේ නම්, පටිසන්ථාරයෙහි ද හෙ අගෞරව ඇතියේ වෙයි.

වහන්ස, ඒ මහණ එකාන්තයෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත වූයේ ධර්මයෙහි අගෞරව ඇතියේ වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වේ නම්, හෙ ධර්මයෙහි ද සගෞරව වෙයි.

වහන්ස, ඒ මහණ එකැතියෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඞ්ඝයා කෙරෙහි ගෞරව නැතියේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත වූයේ ධර්මයෙහි ගෞරව සහිත වූයේ නම්, හෙ සඟුන් කෙරෙහි ද සගෞරව වෙයි.

වහන්ස, එකැතියෙන් ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඟුන් කෙරෙහි සගෞරව වූයේ ශික්ෂායෙහි අගෞරව ඇතියේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් කෙරෙහි ගෞරව සහිත වූයේ ධර්මයෙහි ගෞරව සහිත වූයේ සඟුන් කෙරෙහි ගෞරව සහිත වූයේ නම්, හෙ ශික්ෂායෙහි ද සගෞරව වෙයි.

වහන්ස, ඒ මහණ එකාන්තයෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඟුන් කෙරෙහි සගෞරව වූයේ ශික්ෂායෙහි සගෞරව වූයේ සමාධියෙහි අගෞරව ඇතියේ වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඟුන් කෙරෙහි සගෞරව වූයේ ශික්ෂායෙහි සගෞරව වූයේ නම්, හෙ සමාධියෙහි ද සගෞරව වේ.

වහන්ස, ඒ මහණ එකැතියෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඞ්ඝයා කෙරෙහි සගෞරව වූයේ ශික්ෂායෙහි සගෞරව වූයේ සමාධියෙහි සගෞරව වූයේ අප්‍රමාදයෙහි අගෞරව ඇතියේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

යො සො භන්තෙ භික්ඛු සත්ථරි සගාරවො, ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛාය සගාරවො, සමාධිස්මිං සගාරවො අප්පමාදෙපි සො සගාරවො.

සො වත භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛාය සගාරවො සමාධිස්මිං සගාරවො අප්පමාදෙ සගාරවො පටිසන්ථාරෙ අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යො සො භන්තෙ, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො සඞ්ඝෙ සගාරවො සික්ඛාය සගාරවො සමාධිස්මිං සගාරවො අප්පමාදෙ සගාරවො පටිසන්ථාරෙපි සො සගාරවොති.

ඉමස්ස ඛො අහං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි. සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත, ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාසි.

සො වත සාරිපුත්ත, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො සාරිපුත්ත, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙපි සො අගාරවො.

සො වත සාරිපුත්ත භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො -පෙ- සඞ්ඝෙ අගාරවො -පෙ- සික්ඛාය අගාරවො -පෙ- සමාධිස්මිං අගාරවො -පෙ- අප්පමාදෙ අගාරවො පටිසන්ථාරෙ සගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො සාරිපුත්ත, භික්ඛු සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො, සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො, සමාධිස්මිං අගාරවො අප්පමාදෙ අගාරවො පටිසන්ථාරෙපි සො අගාරවො.

සො වත සාරිපුත්ත, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො සාරිපුත්ත, භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙපි සො සගාරවො.

සො වත සාරිපුත්ත භික්ඛු සත්ථරි සගාරවො ධම්මෙ සගාරවො -පෙ- සඞ්ඝෙ සගාරවො -පෙ- සික්ඛාය සගාරවො -පෙ- සමාධිස්මිං සගාරවො -පෙ- අප්පමාදෙ සගාරවො පටිසන්ථාරෙ අගාරවො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යො සො සාරිපුත්ත, භික්ඛු සත්ථරි සගාරවො -පෙ- පටිසන්ථාරෙපි සො සගාරවො.

ඉමස්ස ඛො සාරිපුත්ත, සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඟුන් කෙරෙහි සගෞරව වූයේ ශික්ෂායෙහි සගෞරව වූයේ සමාධියෙහි සගෞරව වූයේ අප්‍රමාදයෙහි ද සගෞරව වෙයි.

වහන්ස, ඒ මහණ එකාන්තයෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඞ්ඝයා කෙරෙහි සගෞරව වූයේ ශික්ෂායෙහි සගෞරව වූයේ සමාධියෙහි සගෞරව වූයේ අප්‍රමාදයෙහි සගෞරව වූයේ පටිසන්ථාරයෙහි අගෞරව ඇති වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

වහන්ස, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි සගෞරව වූයේ සඞ්ඝයා කෙරෙහි සගෞරව වූයේ ශික්ෂායෙහි සගෞරව වූයේ සමාධියෙහි සගෞරව වූයේ අප්‍රමාදයෙහි සගෞරව වූයේ නම්, හෙ පටිසන්ථාරයෙහි ද සගෞරව වෙයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාළ මේ භාෂිතයාගේ අර්ථය මම විස්තර විසින් මෙසේයින් දනිමි යි. ශාරිපුත්‍රයෙනි, මැනැවි, මැනැවි, ශාරිපුත්‍රය, මා විසින් සැකෙවින් දෙසන ලද මේ භාෂිතයාගේ අර්ථය තො මෙලෙසින් විස්තර විසින් දන්හි නම් මනා ය.

සැරියුත, ඒ මහණ එකැතියෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි සගෞරව වේ ය යන තෙල කරුණ අවිද්‍යමාන ය. සැරියුත, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ ද, ධර්මයෙහි ද හෙ ගෞරව නැතියේ ය.

ශාරිපුත්‍රයෙනි, ඒ මහණ එකාන්තයෙන් ශාස්තෲන් වහනසේ කෙරෙහි ගෞරව නැතියේ ධර්මයෙහි ගෞරව නැතියේ ... සඟුන් කෙරෙහි ගෞරව නැතියේ ... ශික්ෂායෙහි ගෞරව නැතියේ ... සමාධියෙහි ගෞරව නැතියේ ... අප්‍රමාදයෙහි ගෞරව නැතියේ පටිසන්ථාරයෙහි ගෞරව සහිත වන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ශාරිපුත්‍රය, යම් ඒ මහණෙක් ස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතියේ, ධර්මයෙහි ගෞරව නැතියේ, සඞ්ඝයා කෙරෙහි ගෞරව නැතියේ ශික්ෂායෙහි ගෞරව නැතියේ සමාධියෙහි ගෞරව නැතියේ අප්‍රමාදයෙහි ගෞරව නැතියේ වේ ද, හෙ පිළිසඳරෙහි ද ගෞරව නැතියේ ය.

ශාරිපුත්‍රයෙනි, එකාන්තයෙන් ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වූයේ ධර්මයෙහි අගෞරව ඇතියේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ශාරිපුත්‍රය, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වේ ද සැරියුත, ඒ මහණ එකැතියෙන් ධර්මයෙහි ද සගෞරව වෙයි.

ශාරිපුත්‍රයෙනි, ඒ මහණ එකාන්තයෙන් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත වේ ද ... ධර්මයෙහි සගෞරව වේ ද ... සඞ්ඝයා කෙරෙහි සගෞරව වේ ද ... ශික්ෂායෙහි සගෞරව වේ ද ... සමාධියෙහි සගෞරව වේ ද ... අප්‍රමාදයෙහි සගෞරව වේ ද ... පටිසන්ථාරයෙහි අගෞරව ඇතියේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. සැරියුත, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සගෞරව වේ ද ... පිළිසඳරෙහි ද හෙ සගෞරව වෙයි.

සැරියුත, මා විසින් සැකෙවින් දෙසන ලද මේ භාෂිතයාගේ අර්ථය මෙසේයින් විතර විසින් දක්කයුත්තේ ය යි.

## 7. 2. 2. 7.

## [භාවනානුයුත්ත සුත්තං]

[භාවනපීනිදනං]

18. භාවනං අනනුයුත්තස්ස භික්ඛවෙ භික්ඛුනො විහරතො කිඤ්චාපි එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යා’ති. අථ ඛ්වස්ස නෙව අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. තං කිස්ස හෙතු: අභාවිතත්තාතිස්ස වචනීයං. කිස්ස අභාවිතත්තා: චතුන්නං සතිපට්ඨානානං, චතුන්නං සම්මප්පධානානං, චතුන්නං ඉද්ධි-පාදානං, පඤ්චන්නං ඉන්ද්‍රියානං, පඤ්චන්නං බලානං, සත්තන්නං බොජ්ඣඞ්ගානං, අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා, තානස්සු කුක්කුටියා න සම්මා අධිසයිතානි න සම්මා පරිසෙදිතානි න සම්මා පරිභාවිතානි. කිඤ්චාපි තස්සා කුක්කුටියා එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: “අහො වත මෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජෙය්‍යුන්ති.”

අථ ඛො අභබ්බාව තෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩ-කෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජිතුං. තං කිස්ස හෙතු: තථා හි භික්ඛවෙ කුක්කුටියා අණ්ඩානි න සම්මා අධිසයිතානි න සම්මා පරිසෙදිතානි, න සම්මා පරිභාවිතානි, එවමෙව ඛො, භික්ඛවෙ, භාවනං අනනුයුත්තස්ස භික්ඛුනො විහරතො කිඤ්චාපි එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යාති. අථ ඛ්වස්ස නෙව අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. තං කිස්ස හෙතු: අභාවිතත්තාතිස්ස වචනීයං. කිස්ස අභාවිතත්තා: චතුන්නං සතිපට්ඨානානං -පෙ- අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

භාවනං අනුයුත්තස්ස භික්ඛවෙ, භික්ඛුනො විහරතො කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යාති, අථ ඛ්වස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. තං කිස්ස හෙතු: භාවිතත්තාතිස්ස වචනීයං. කිස්ස භාවිතත්තා: චතුන්නං සතිපට්ඨා-නානං -පෙ- අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා, තානස්සු කුක්කුටියා සම්මා අධිසයිතානි සම්මා පරිසෙදිතානි සම්මා පරිභාවිතානි. කිඤ්චාපි තස්සා කුක්කුටියා න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වත මෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජෙය්‍යුන්ති. අථ ඛො භබ්බාව තෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා, මුඛතුණ්ඩකෙන වා, අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජිතුං. තං කිස්ස හෙතු: තථා හි භික්ඛවෙ, කුක්කුටියා අණ්ඩානි සම්මා අධිසයිතානි සම්මා පරිසෙදිතානි සම්මා පරිභාවිතානි

## 7. 2. 2. 7.

## [භාවනානුයුත්ත සූත්‍රය]

### [සැවැත්නිදාන යි]

18. මහණෙනි, භාවනායෙහි යුක්තප්‍රයුක්ත නො වී වාසය කරණ මහණහට, "අහෝ මාගේ සිත (එකාන්තයෙන් කිසි සංස්කාරයක්) උපාදාන විසින් නො ගෙන ආශ්‍රවයන්ගෙන් මිදේව"යි යන මෙබඳු ඉච්ඡායෙක් උපදනේ නමුදු, වැලිත් ඔහුගේ චිත්තය උපාදාන විසින් නො ගෙණ ආශ්‍රවයන්ගෙන් නො මැ මිදෙන්නේ ය. එ කවර හෙයින යත්: 'අභාවිත වන හෙයිනැ'යි කියයුතු වන්නේ ය. කවරක්හුගේ අභාවිතභාවයෙන යත්: සතරසතිපට්ඨාන සතරසම්‍යක්ප්‍රධන්වීර්‍යය සතර-ඉද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය පඤ්චබල සප්තබොධ්‍යඞ්ගය ආර්‍යයඅෂ්ටාඞ්ගිකමාර්ගය යන ධර්ම අභාවිත වන හෙයිනි.

මහණෙනි, යම් පරිද්දි කිකිළියකහට බිජුවට අටෙක් හෝ දසයෙක් හෝ දොළොසෙක් වේ නම්, එ හැම කිකිළිය විසින් මොනොවට අධිශයිත නො වේත්. මොනවට හුණුසුම් ගන්වනලද නො වෙත්. මොනොවට පරිභාවිත නො වෙත්. එ කිකිළියට "අහො, මාගේ කුකුළුපැටව් පාතියසිළින් හෝ මුවතුඩින් හෝ අණ්ඩකෝෂය පලා සුවසේ නික්මෙත්වා" යන මෙබඳු ඉච්ඡාවක් උපදනේ ය. වැලිත් එ කුකුළුපැටව් පාතියසිළින් හෝ මුවතුඩින් හෝ අණ්ඩකොෂය පලා සුවසේ නික්මෙන්නට අභව්‍ය ම වෙත්. එ කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයෙකින් කිකිළිය විසින් බිජුවටහු මොනොවට අධිශයිත නො වෙත් ද, හුණුසුම්ගන්වන ලද නො වෙත් ද, මොනොවට පරිභාවිත නො වෙත් ද, එහෙයිනි.

මහණෙනි, එපරිද්දෙන් ම භාවනායෙහි යුක්තප්‍රයුක්ත නො වී වෙසෙන මහණහට "අහො, එකාන්තයෙන් මාගේ චිත්තය උපාදානයන් විසින් නො ගෙණ ආශ්‍රවයන්ගෙන් මිදේවා" යන මෙබඳු ඉච්ඡාවක් උපදනේ නමුදු වැලිත් අනුපාදාන විසින් ඔහුගේ චිත්තය ආශ්‍රවයන්ගෙන් නොමිදේ මැයි. එ කවර හෙයින යත්: අභාවිතභාවයෙනැයි කිවයුතු වන්නේ ය. කවරක් නොවැඩූ බැවින යත්: සතරසතිපට්ඨාන ... ආර්‍යයඅෂ්ටාඞ්ගිකමාර්ගය අභාවිත හෙයිනි:

මහණෙනි, භාවනායෙහි යුක්තප්‍රයුක්ත ව වාසය කරණ මහණහට "අහො එකාන්තයෙන් අනුපාදාන විසින් මාගේ චිත්තය ආශ්‍රවයන්-ගෙන් මිදේවා" යන මෙබඳු ඉච්ඡාවක් නූපදනේ නමුදු වැලිත් ඔහුගේ චිත්තය උපාදාන විසින් නො ගෙණ ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේ ය. එ කවර හෙයින යත්: භාවිතභාවයෙනැයි කිවයුතු වන්නේ ය. කවරක්-හුගේ භාවිත භාවයෙන යත්: සතරසතිපට්ඨානයන්ගේ හා ... ආර්‍යය-අෂ්ටාඞ්ගිකමාර්ගයාගේ (භාවිතභාවයෙනි).

මහණෙනි, යම්පරිද්දි කිකිළියට බිජුවට අටෙක් හෝ දසයෙක් හෝ දොළොසෙක් හෝ වේ නම්, එහැම කිකිළිය විසින් මනා කොට අධිශයිත වෙත්. මැනැවින් පරිසෙදිත වෙත්. මනාලෙස පරිභාවිත වෙත්. එකිකිළියට "අහො, එකාන්තයෙන් මාගේ කුකුළුපැටවු පාතියසිළින් වේවයි, මුවතුඩින් වේවයි අණ්ඩකොෂය පලා සුවසේ නික්මෙත්ව"යි මෙබඳු ඉච්ඡාවක් නූපදනේ නමුදු වැලිත් එ කුකුළුපැටවු පාතියසිළින් වේවයි මුවතුඩින් වේවයි අණ්ඩකොෂය බිඳ සුවසේ නික්මෙන්නට භව්‍ය ම වෙත්. එ කවර හෙයින යත්: මහණෙනි, යම්හෙයෙකින් කිකිළිය විසින් බිජුවටහු මනාලෙස අධිශයිත වෙත් නම්, මැනැවින් පරිසෙදිත වෙත් නම්, මැනැවින් පරිභාවිත වෙත් නම්, එහෙයිනි.

එවමෙව ඛො භික්ඛවෙ, භාවනං අනුයුත්තස්ස භික්ඛුනො විහරතො කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යාති. අථ ඛ්වස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. තං කිස්ස හෙතු: භාවිතත්තාතිස්ස වචනීයං. කිස්ස භාවිතත්තා: චතුන්නං සතිපට්ඨානානං -පෙ- අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

සෙය්‍යථාපි භික්ඛවෙ, පලගණ්ඩස්ස[1] වා, පලගණ්ඩන්තෙවාසිකස්ස[2] වා දිස්සන්තෙව වාසිජටෙ අඞ්ගුලිපදානි දිස්සති අඞ්ගුට්ඨපදං.[3] නො ච ඛ්වාස්ස එවං ඤාණං හොති: එත්තකං වා මෙ අජ්ජ වාසිජටස්ස ඛීණං, එත්තකං හිය්‍යො, එත්තකං පරෙති. අථ ඛ්වාස්ස ඛීණෙ ඛීණන්තෙව ඤාණං හොති. එවමෙව ඛො භික්ඛවෙ, භාවනං අනුයුත්තස්ස භික්ඛුනො විහරතො කිඤ්චාපි න එවං ඤාණං හොති: එත්තකං වා මෙ අජ්ජ ආසවානං ඛීණං, එත්තකං වා හිය්‍යො, එත්තකං වා පරෙති. අථ ඛ්වාස්ස ඛීණෙ ඛීණන්තෙව ඤාණං හොති.

සෙය්‍යථාපි භික්ඛවෙ, සාමුද්දිකාය නාවාය වෙත්තබන්ධනබද්ධාය ඡම්මාසානි උදකෙ පරියාදාය හෙමන්තිකෙන ථලෙ උක්ඛිත්තාය වාතාතපපරෙතානි බන්ධනානි තානි පාවුස්සකෙන මෙඝෙන අභිප්පවට්ටානි අප්පකසිරෙනෙව පටිප්පස්සම්භන්ති පූතිකානි භවන්ති, එවමෙව ඛො භික්ඛවෙ, භාවනං අනුයුත්තස්ස භික්ඛුනො විහරතො අප්පකසිරෙනෙව සංයොජනානි පටිප්පස්සම්භන්ති පූතිකානි භවන්තීති.

## 7. 2. 2. 8.

## [අග්ගික්ඛන්ධොපම සුත්තං]

**19.** එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. අද්දසා ඛො භගවා අද්ධානමග්ගපටිපන්නො අඤ්ඤතරස්මිං පදෙසෙ මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං. දිස්වාන මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තාසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතන්ති. එවං භන්තෙ.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො වරං යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා, යං වා ඛත්තියකඤ්ඤං වා බ්‍රාහ්මණකඤ්ඤං වා, ගහපතිකඤ්ඤං වා මුදුතලුණහත්ථපාදිං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වාති. එතදෙව භන්තෙ, වරං යං ඛත්තියකඤ්ඤං වා බ්‍රාහ්මණකඤ්ඤං වා ගහපතිකඤ්ඤං වා මුදුතලුණහත්ථපාදිං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා. දුක්ඛං හෙතං භන්තෙ, යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වාති.

---

1. ඵලගණ්ඩස්ස - මජ්ඣං., සිමු.
2. ඵලගණ්ඩන්තෙවාසිකස්ස - මජ්ඣං., සිමු.
3. දිස්සන්තෙව වාසිජටෙ දිස්සන්ති අඞ්ගුලිපදානි - සිමු

Free Distribution www.aathaapi.org

මහණෙනි, එ පරිද්දෙන් ම භාවනායෙහි අනුයුක්ත ව වසන මහණ හට "අහෝ මාගේ චිත්තය උපාදාන විසින් නො ගෙණ ආශ්‍රවයන්ගෙන් මිදේවා" යන මෙබඳු ඉච්ඡාවක් නූපදනේ නමුදු වැලිත් ඔහුගේ චිත්තය උපාදාන විසින් නො ගෙණ ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේ ය. එ කවර හෙයින යත්: භාවිතභාවයෙනැයි කිවයුතු වෙයි. කවරක්හුගේ භාවිතභාවයෙන යත්: සතර සතිපට්ඨානයන්ගේ ද ... ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයාගේ ද භාවනායෙනි.

මහණෙනි, දූවච්ඩුවකුගේ හෝ දූවච්ඩුඅතැවැසියකු ගේ හෝ වෑමිටෙහි යම් පරිදි අඞ්ගුලිපදයෝ පැණෙත් ම නම්, අඞ්ගුෂ්ටපදය පැණේ ම නම්, ඔහට "අද මාගේ වෑමිටෙහි මෙතෙක් අංශුයෙක් ක්ෂීණ විය, ඊයේ දවස්හි මෙතෙක් අංශුයෙක් ක්ෂීණ විය, පෙරෙයිද මෙතෙක් අංශුයෙක් ක්ෂීණ විය" යන මෙබඳු ඥානයෙක් නො වේ මය. වැලිත් ඔහට ක්ෂීණ වූ අංශුයෙහි ක්ෂීණ ම විය' යන ඥානය වෙයි. මහණෙනි, එපරිද්දෙන් ම භාවනායෙහි යුක්තප්‍රයුක්ත ව වසන මහණහට "අද මාගේ ආශ්‍රවයන්-ගෙන් මෙතෙක් අංශයෙක් ක්ෂීණ විය. ඊයේ මෙතෙක් අංශයෙක් ක්ෂීණ විය, පෙරෙයිද මෙතෙක් අංශයෙක් ක්ෂීණ විය" යන මෙබඳු ඥානයක් නැති නමුදු, වැලිත් ඔහට ක්ෂීණ වූ ආශ්‍රව ක්ෂීණ ම ය" යන ඥානය වේ.

මහණෙනි, වේත්‍රබන්ධනයෙන් බඳනා ලදුව සමසක් දියෙහි පැවැති හිමෙත් කල්හි ඉවුරුතෙලෙහි ඔසොවාලන ලද සාමුද්‍රික නැවෙක බන්ධනයෝ වාතයෙන් හා හිරුඑලියෙන් මඩනා ලද්දාහු යම් පරිදි ප්‍රාවෘෂ්මෙඝයෙන් මොනොවට තෙමන ලද්දාහු පහසුවෙන් ම පිරිහීමට යෙත් නම්, සුණු වී යෙත් නම්, මහණෙනි, එපරිද්දෙන් ම භාවනායෙහි යුක්තප්‍රයුක්ත ව වසන මහණහට නිදුකින් ම සංයෝජනයෝ පිරිහෙත් පූතික වෙත් යයි.

7. 2. 2. 8

[අග්ගික්ඛන්ධොපම සූත්‍රය]

10. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහභික්සඟුන් කැටිව ලා ගෙණ කොසොල්දනව්වෙහි සැරිසරණ සේක. අද්ධාන මාර්ගයට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ අන්‍යතර ප්‍රදේශයෙක්හි ඇවිලගත් මොනොවට දිලියෙන ගිනිසිළු සහිත වූ මහාග්නිස්කන්ධයක් දුටු සේක. දැක වදරා මාර්ගයෙන් ඉවත් ව අන්‍යතර වෘක්ෂමූලයෙක්හි පනවන ලද අස්නෙක වැඩහුන් සේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා වදාළසේක: "මහණෙනි, තෙපි ඇවිලගත් මැනැවින් දිලියෙන ගිනිසිළු ඇති අසෝ මහගිනිකඳ දුටුවු දැ?"යි. වහන්ස, එසේයයි.

මහණෙනි, එ කිමැයි හඟිවු දැ? තෙල ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිර්භූත වූ මහා අග්නිස්කන්ධය වැළඳ ගෙණ හිඳිනේ හෝ හෝනේ හෝ යන යමකුත් වේ නම්, මොලොක් තුරුණු අත්පා ඇති ක්ෂත්‍රිය-කන්‍යාවක හෝ බ්‍රාහ්මණකන්‍යාවක හෝ ගෘහපතිකන්‍යාවක හෝ සිප වැළඳ ගෙණ හිඳුනේ හෝ හෝනේ හෝ යන යමකුත් වේ නම්, (එයින්) කවරක් උතුම් දැ?යි. වහන්ස, මොලොක් තුරුණු අත් පා ඇති ක්ෂත්‍රියකන්‍යාවක හෝ බ්‍රාහ්මණකන්‍යාවක හෝ ගෘහපතිකන්‍යාවක හෝ සිප වැළඳ ගෙණ හිඳිනේය හෝ හෝනේ ය යන යමෙක් වේ නම්, මෙය ම උතුම් වේ. වහන්ස, තෙල ඇවිලගත්. දිලියෙන, ගිනිසිළු ඇති යම් මහගිනිකඳක් සිප වැළඳ ගෙණ හිඳිනේ ය හෝ හෝනේ ය යන තෙල දුකෙක් මැයි.

ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ, යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචිසඞ්කස්සරසමාචාරස්ස පටිච්ඡන්න-කම්මන්තස්ස අස්සමණස්ස සමණපටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරි-පටිඤ්ඤස්ස අන්තොපූතිකස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසී-දෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා. තං කිස්ස හෙතු: තතො නිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය, මරණමත්තං වා දුක්ඛං. නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛො සො භික්ඛවෙ, දුස්සීලො පාපධම්මො අසුචි-සඞ්කස්සරසමාචාරො -පෙ- කසම්බුජාතො ඛත්තියකඤ්ඤං වා බ්‍රාහ්මණ-කඤ්ඤං වා ගහපතිකඤ්ඤං වා මුදුතලුණහත්ථපාදිං ආලිඞ්ගිත්වා උපනිසීදති වා උපනිපජ්ජති වා, තං හි තස්ස භික්ඛවෙ, හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො වරං යං බලවා පුරිසො දළ්හාය වාලරජ්ජුයා උභො ජඞ්ඝා වෙඨෙත්වා ඝංසෙය්‍ය, සා ඡවිං ඡින්දෙය්‍ය, ඡවිං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය, චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය, මංසං ඡෙත්වා න්හාරුං ඡින්දෙය්‍ය, න්හාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය, අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය, යං වා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍යාති. එතදෙව භන්තෙ, වරං යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපති-මහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍ය. දුක්ඛං හෙතං භන්තෙ, යං බලවා පුරිසො දළ්හාය වාලරජ්ජුයා, උභො ජඞ්ඝා වෙඨෙත්වා -පෙ- අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍යාති.

ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ, යථා එතදෙව තස්ස වරං, දුස්සීලස්ස -පෙ- කසම්බුජාතස්ස යං බලවා පුරිසො දළ්හාය වාලරජ්ජුයා උභො ජඞ්ඝා වෙඨෙත්වා -පෙ- අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය. තං කිස්ස හෙතු: තතො නිදානං හි සො භික්ඛවෙ, මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛො සො භික්ඛවෙ, දුස්සීලො -පෙ- කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසා-ලානං වා ගහපතිමහාසාලානං වා අභිවාදනං සාදියති, තං හි තස්ස භික්ඛවෙ, හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

මහණෙනි, තොපට අරෝචනය කරමි, මහණෙනි, තොපට කරුණු හඟවා කියමි: යම්සෙයෙකින් ලමුදම් ඇති, අපවිත්‍ර කායකර්මාදියෙන් අපරිශුද්ධ ව සැකයෙන් සිහිකටයුතු සමාචාර ඇති, පිළිසන්කටයුතු කම් ඇති, ශ්‍රමණ නොවූ, 'මහණෙක්මි' යන ප්‍රතිඥා ඇති, අබ්‍රහමචාරී වූ, බ්‍රහමචාරියෙක්මියි කරණ ප්‍රතිඥා ඇති, පූතිකර්මයෙන් (ශීලවිපත්තියෙන්) අනතාපූති වූ (සදෙරින් වැගෙන රාගාදි) කෙලෙසින් තෙත් වූ හටගත් රාගාදිකෙලෙස් කසළැති, එ දුඃශීලයාහට, තෙල ඇවිලගත්, දිලියෙන, ගිනිසිළු ඇති මහගිනිකඳ සිපවැලඳ ගෙණ හිඳිනේ ය හෝ හෝනේ ය හෝ යන යමක් වේ නම්, තෙල කරුණ ම උතුම් වන්නේ ය. එ කවර හෙයින යත්: මහණෙනි, එ කරුණෙන් එ දුසිල් මහණ මරණයට හෝ යන්නේ ය. මරණමාත්‍ර වූ දුකට හෝ යන්නේ ය. එ හෙතුයෙන් කාබුත් මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට නො පැමිණේමැයි. මහණෙනි, ලමුදම් ඇති අපරිශුද්ධකායකර්මාදියෙන් අපවිත්‍ර ව සංකායෙන් සිහි කටයුතු හැසිරීම් ඇති ... හටගත් කෙලෙස්කසට ඇති එ දුසිල් තෙම මොලොක් තරුණ අත්පා ඇති ක්‍ෂත්‍රිය කන්‍යාවක හෝ බ්‍රාහමණ කන්‍යාවක හෝ ගෘහපතිකන්‍යාවක හෝ සිප වැලඳ ගෙන හිඳිනේ ය හෝ හෝනේය හෝ යන යමෙක් වේ නම්, මහණෙනි, එය ඔහට දීර්ඝරත්‍රයෙහි අහිත පිණිස, දුක් පිණිස වෙයි. කාබුත් මරණින් මතු අපාය වූ දුගීති වූ විනිපාත වූ නිරයට පැමිණෙන්නේ ය.

මහණෙනි, එ කිමැයි හඟිවු ද? බලවත් පුරුෂයෙක් දෘඪවරපටෙකින් දෙ දඟඇට වෙළා සටනේ ය. එ වරපට සිවිය සිඳුනේ ය. සිවිය සිඳ සම් සිඳුනේ ය. සම් සිඳ මස් සිඳුනේ ය. මස් සිඳ නහර සිඳුනේ ය. නහර සිඳ ඇට සිඳුනේ ය. ඇට සිඳ ඇටමිදුලෙහි වැද සිටුනේ ය යන යමකුත් වේ නම් හෝ, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ වේවයි, බ්‍රාහමණමහාසාරයන්ගේ වේවයි, ගෘහපතිමහාසාරයන්ගේ වේවයි අභිවාදනය ඉවසනේ ය යන යමකුත් වේ නම්, (එදෙකින්) කවරෙක් උතුම් වේ ද?යි. වහන්ස, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ වේවයි, බ්‍රාහමණමහාසාරයන්ගේ වේවයි, ගෘහපති-මහාසාරයන්ගේ වේවයි යම් අභිවාදනයක් ඉවසා නම්, මෙය ම උතුම් වෙයි. වහන්ස, බලවත් පුරුෂයෙක් දළ වරපටෙකින් දෙ දග වෙළා ... ඇටමිදුළු තෙක් වැද සිටුනේය යන යමකුත් වේ නම්, තෙල දුකෙක්මය යි.

මහණෙනි, තොපට ආරොචනය කරමි. මහණෙනි, තොපට ප්‍රති-වෙදනය කරමි. යම් පරිද්දෙකින් බලවත් පුරුෂයෙක් දළ වරපටෙකින් දෙදඟ වෙළා ... ඇට මිදුළු තෙක් වැද සිටුනේ ය යන යමෙක් වේ නම්, දුශශීල වූ ... කෙලෙස්කසළ ඇති ඔහට මෙය ම උතුම් වේ. එ කවර හෙයින යත්: මහණෙනි, එ හෙතුකොට ගෙණ එතෙම මරණයට හෝ යන්නේ ය. මරණමාත්‍ර දුඃඛයට හෝ පැමිණෙන්නේ ය. එ හෙතු කොට ගෙණ කාබුත් මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට නො ම පැමිණෙන්නේ ය. මහණෙනි, දුශශීල වූ ... හටගත් කෙලෙස්කසළ ඇති එ මහණ ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ වේවයි, බ්‍රාහමණ-මහාසාරයන්ගේ වේවයි, ගෘහපතිමහාසාරයන්ගේ වේවයි, අභිවාදනය ඉවසන්නේ ය යන යමක් වේ නම්, එය ම ඔහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වෙයි. කාබුත් මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙන්නේ ය.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො වරං යං බලවා පුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍ය, යං වා ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අඤ්ජලි-කම්මං සාදියෙය්‍යාති. එතදෙව භන්තෙ වරං යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා අඤ්ජලිකම්මං සාදියෙය්‍ය. දුක්ඛං හෙතං භන්තෙ, යං බලවා පුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍යාති.

ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ, යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස -පෙ- කසම්බුජාතස්ස යං බලවා පුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍ය. තං කිස්ස හෙතු, තතො නිදානං හි සො භික්ඛවෙ, මරණං වා නිගච්ඡෙය්‍ය, මරණ මත්තං වා දුක්ඛං. නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යං ච ඛො සො භික්ඛවෙ, දුස්සීලො -පෙ- කසම්බු-ජාතො ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලනං වා අඤ්ජලිකම්මං සාදියති, තං හි තස්ස භික්ඛවෙ, හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො වරං යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍ය, යං වා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍යාති. එතදෙව භන්තෙ, වරං යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍ය, දුක්ඛං හෙතං භන්තෙ, යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙ න සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍යාති.

ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ, යථා එතදෙව තස්සවරං දුස්සීලස්ස -පෙ- කසම්බුජාතස්ස යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලි-වෙඨෙය්‍ය. තං කිස්ස හෙතු: තතො නිදානං හි සො භික්ඛවෙ, මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යං ච ඛො සො භික්ඛවෙ, දුස්සීලො -පෙ- කසම්බුජාතො යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජති. තං හි තස්ස භික්ඛවෙ, දීඝරත්තං අහිතාය හොති දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, එ කිමෙකැයි හඟිවු දැ? බලවත් පුරුෂයෙක් තෙලින් මුවහත් කළ තියුණු සැතෙකින් ලමැඩියෙහි පහරතේ ය යන යමක් වේ නම්, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ අඤ්ජලිකර්මය ඉවසන්නේ ය යන යමක් හෝ වේ නම්, (එදෙකින්) කවරෙක් උතුම් වේ දැ?යි. වහන්ස, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ අඤ්ජලිකර්මය ඉවසන්නේ ය යන යමක් වේ නම්, තෙල කරුණ ම උතුම් වේ. වහන්ස, බලවත් පුරුෂයෙක් තෙලින් දෝනා ලද තියුණු සැතෙකින් ලමැඩියෙහි පහරන්නේ ය යන යමෙක් වේ නම් තෙල දුක් ම වේ ය යි.

මහණෙනි, තොපට ආරෝචනය කරමි. මහණෙනි, තොපට ප්‍රතිවේදනය කරමි. මහණෙනි, යම් පරිද්දෙකින් බලවත් පුරුෂයෙක් තෙලෙන් මුවහත් කළ තියුණු සැතෙකින් ලමැඩියෙහි පහරන්නේ ය යන යමක් වේ නම්, දුශ්ශීල වූ ... හටගත් කෙලෙස්කසළ ඇති ඔහට තෙල කරුණ ම උතුම් වන්නේ ය. එ කවර හෙයින යත්: මහණෙනි, එ පුද්ගල් එ හෙතුයෙන් මරණයට හෝ යෙයි. මරණමාත්‍ර දුකට හෝ යන්නේ ය. එ හෙතුයෙන් කාබුන් මරණින් මතු අපාය වූ, දුර්ගති වූ විනිපාත වූ නිරයට නො එළැඹෙන්නේ ය. මහණෙනි, එ දුසිල් පුද්ගල් ... හටගත් කෙලෙස්කසළ ඇතියේ ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ අඤ්ජලිකර්ම ඉවසන්නේ ය යන යමක් වේ නම්, මහණෙනි, එය ම ඔහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස, දුක් පිණිස වෙයි. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට එළැඹෙන්නේ ය.

මහණෙනි, එ කිමැයි හඟිවු දැ? බලවත් පුරුෂයෙක් ගිනි ඇවිලගත් මහා කොට දිලියෙන ගිනිසිළු සහිත රත් යපටෙකින් කය මොනොවට වෙළන්නේ ය යන යමක් වේ නම්, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ සැදැහැයෙන් දෙන චීවරපරිභොග කරන්නේ ය යන යමකුත් වේ නම්, (එ දෙකින්) කවරෙක් උතුම් වේදැ?යි. වහන්ස, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ චීවරයි, බ්‍රාහ්මණමහාසාරයන්ගේ චීවරයි, ගෘහපතිමහාසාරයන්ගේ චීවරයි, සැදැහැයෙන් දෙන චීවර පරිභොග කරන්නේ ය යන යමක් වේ නම්, තෙල කරුණ ම උතුම් වෙයි. වහන්ස,බලවත් පුරුෂයෙක්.. රත් වූ යපටින් කය මොනොවට වෙළන්නේ ය යන තෙල යමක් වේ නම්, එය දුක් ම වේ ය යි.

මහණෙනි, තොපට ආරෝචනය කරමි. මහණෙනි, තොපට කරුණු ගන්වා දන්වමි. යම් පරිද්දෙකින් බලවත් පුරුෂයෙක් ඇවිලගත්, දිලියෙන ගිනිසිළු ඇති රත්යපටින් කය වෙළන්නේ ය යන යමක් වේ නම්, තෙල කරුණ ම එ ... හටගත් කෙලෙස්කසළ ඇති දුසිල්හට උතුම්. එ කවරහෙයින යත්: මහණෙනි, එ හෙතුයෙන් හෙ මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණමාත්‍ර දුකට හෝ පැමිණෙන්නේ ය. එ හෙතුයෙන් කාබුන් මරණින් මතු අපාය නම් වූ, දුර්ගති නම් වූ, විනිපාත නම් වූ නිරයට නො පැමිණේ මැ යි. මහණෙනි, හටගත් කෙලෙස්කසළ ඇති එ දුසිල්තෙම ... ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ ශ්‍රද්ධාදෙය චීවරපරිභොග කරන්නේ ය යන යමක් වේ නම්, එය ම ඔහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වෙයි. කාබුන් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමන්නු ඛො වරං: යං බලවා පුරිසො තත්තෙන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන මුඛං විවරිත්වා තත්තං ලොහගුලං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය, තං තස්ස ඔට්ඨම්පි දහෙය්‍ය, මුඛම්පි දහෙය්‍ය, ජිව්හම්පි දහෙය්‍ය, කණ්ඨම්පි[1] දහෙය්‍ය, උරම්පි දහෙය්‍ය, අන්තම්පි අන්තගුණම්පි ආදාය අධොභාගා නික්ඛමෙය්‍ය, යං වා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍යාති. එතදෙව භන්තෙ, වරං යං ඛත්තියමහා සාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍ය. දුක්ඛං හෙතං භන්තෙ, යං බලවා පුරිසො තත්තෙන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන මුඛං විවරිත්වා, තත්තං ලොහගුලං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය, තං තස්ස ඔට්ඨම්පි දහෙය්‍ය, මුඛම්පි දහෙය්‍ය, ජිව්හම්පි දහෙය්‍ය -පෙ- අධොභාගා නික්ඛමෙය්‍යාති.

ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ, යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස -පෙ- කසම්බුජාතස්ස යං බලවා පුරිසො තත්තෙන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන මුඛං විවරිත්වා තත්තං ලොහගුලං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය, තං තස්ස ඔට්ඨම්පි දහෙය්‍ය -පෙ- අන්තගුණං ආදාය අධොභාගා නික්ඛමෙය්‍ය. තං කිස්ස හෙතු: තතො නිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛො සො භික්ඛවෙ, දුස්සීලො -පෙ- කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජති, තං හි තස්ස භික්ඛවෙ, හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමන්නුඛො වරං යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා තත්තං අයොමඤ්චං වා අයොපීඨං වා ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අභිනිසීදාපෙය්‍ය වා අභිනිපජ්ජාපෙය්‍ය වා, යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජෙය්‍යාති. එතදෙව භන්තෙ, වරං යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජෙය්‍ය. දුක්ඛං හෙතං භන්තෙ, යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා -පෙ- අභිනිපජ්ජෙය්‍ය වා.

1. කණ්ණම්පි - මජසං

මහණෙනි, එ කිමැයි හඟිවූ දා? බලවත් පුරුෂයෙක් ඇවිලගත් මොහොවට දිලියෙන, ගිනිසිළු ඇති රත් යගඩුයෙන් මුව විවර කොට ඇවිලගත්, මනාලෙස දිලියෙන ගිනිසිළු ඇති ලොගොගුලක් මුවෙහි බහාලන්නේ ය. එය ඔහුගේ දිව ද දවන්නේ ය, මුව ද දවන්නේ ය, බොටුව ද දවන්නේ ය. ලය ද දවන්නේ ය. අතුනු ද අතුනුබහන් ද ගෙණ අධොභාගයෙන් නික්මෙන්නේ ය යන යමක් වේ නම්, ක්‍ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහමණමහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ ශ්‍රද්ධාදෙය පිණ්ඩපාත වළඳන්නේ ය යන යමක් වේ නම්, එ දෙකින් කවරෙක් උතුම් වේ දැයි? වහන්ස, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ වේවයි, බ්‍රාහමණමහාසාරයන්ගේ වේවයි, ගෘහපතිමහාසාරයන්ගේ වේවයි ශ්‍රද්ධාදෙය පිණ්ඩපාතය වළඳන්නේ ය යන යමක් වේ නම්, එය ම උතුම්. වහන්ස, බලවත් පුරුෂයෙක් ඇවිලගත් මොහොවට දිලියෙන, ගිනිසිළු ඇති යගඩුයෙන් මුව හයවා ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිර්භූත වූ රත්ලොහොගුලක් මුවෙහි බහන්නේ නම් එය ඔහුගේ තොල් ද දවන්නේය, මුව ද දවන්නේ ය ... දිව ද දවන්නේ ය ... අතුනු ද අතුනුබහන් ද අධොභාගයෙන් නික්මෙන්නේ ය යන යමෙක් වේ නම්, එය ඔහට දුක් ම වන්නේ ය යි.

මහණෙනි, තොපට ආරොචනය කරමි. මහණෙනි, තොපට කරුණු ගන්වා දන්වමි. ... හටගත් කෙලෙස්කසළ ඇති එ දුසිල්හට බලවත් පුරුෂයෙක් ඇවිලගත් ගිනි ගෙන දිලියෙන ගිනිසිළු සහිත රත්යගඩුයෙකින් මුව හයවා ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිර්භූත වූ රත්ලොහොගුලක් මුවෙහි බහාලන්නේ ය. එය ඔහුගේ තොල් ද දවන්නේ ය. මුව ද දවන්නේ ය ... අතුනු ද අතුනුබහන් ද ගෙණ අධොභාගයෙන් නික්මෙන්නේ ය යන යමක් හෝ වේ නම්, එයම උතුම්. එ කවර හෙයින යත්: මහණෙනි, එහෙයින් හෙ මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ යන්නේ ය. එ ප්‍රත්‍යයෙන් හෙ කාබුන් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට නො ම පැමිණෙන්නේ ය. මහණෙනි, ... හටගත් කෙලෙස්කසළ ඇති එ දුසිල් තෙම ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ හෝ බ්‍රාහමණ මහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ ශ්‍රද්ධාදෙය පිණ්ඩපාතය වළඳන්නේ ය යන යමක් වේ නම්, මහණෙනි, එය ම දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස, දුක් පිණිස, වන්නේ ය. කාබුන් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණෙන්නේ ය.

මහණෙනි, එ කිමැයි හඟිවූ දා? බලවත් පුරුෂයෙක් ගින්හි හෝ ගෙණ, කදෙහි හෝ ගෙණ තපන වූ දීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිර්භූත වූ යහැදෙක වේවයි, යපුටුවෙක වේවයි, හිඳුවන්නේ හෝ හොවන්නේ හෝ යි යන යමෙක් වේ නම්, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ වේවයි බ්‍රාහමණමහාසාරයන්ගේ වේවයි, ගෘහපතිමහාසාරයන්ගේ වේවයි, ශ්‍රද්ධාදෙය හැඳ පුටු පරිභෝග කරන්නේ ය යන යමෙක් හෝ වේ නම්, එ දෙකින් කවරක් උතුම් වේ දැයි? වහන්ස, කැත්මහසල්කුලන්ගේ වේවයි, බමුණු මහසල්කුලන්ගේ වේවයි, ගැහැවිමහසල්කුලන්ගේ වේවයි, සැදැහැයෙන් දෙන හැඳ පුටු වළඳ කරන්නේ ය යන තෙල කරුණ ම උතුම් වේ. වහන්ස, බලවත් පුරුෂයෙක් ගින්හි හෝ ගෙන කදෙහි හෝ ගෙණ ... හොවාලන්නේ හෝ යන යමෙක් වේ නම් තෙල දුකෙක් මැයි.

ආරොචයාමි වො භික්ඛවෙ -පෙ- කසම්බුජාතස්ස යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා -පෙ- අභිනිපජ්ජාපෙය්‍ය වා -පෙ- තං කිස්ස හෙතු: තතො නිදානං හි සො භික්ඛවෙ, මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො -පෙ- කසම්බුජාතො ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජති, තං හි තස්ස භික්ඛවෙ, හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමං නු ඛො වරං යං බලවා පුරිසො උද්ධපාදං අවංසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය, සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡෙය්‍ය සකිම්පි අධො ගච්ඡෙය්‍ය සකිම්පි තිරියං ගච්ඡෙය්‍ය. යං වා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා, ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජෙය්‍යාති. එතදෙව භන්තෙ, වරං යං ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජෙය්‍ය. දුක්ඛං හෙතං භන්තෙ, යං බලවා පුරිසො උද්ධපාදං අවංසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය, සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡෙය්‍ය, සකිම්පි අධො ගච්ඡෙය්‍ය, සකිම්පි තිරියං ගච්ඡෙය්‍යාති.

ආරොචයාමි වො භික්ඛවෙ, පටිවෙදයාමි වො භික්ඛවෙ, යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස -පෙ- කසම්බුජාතස්ස යං බලවා පුරිසො උද්ධපාදං අවංසිරං ගහෙත්වා -පෙ- සකිම්පි තිරියං ගච්ඡෙය්‍ය -පෙ- තං කිස්ස හෙතු: තතො නිදානං හි සො භික්ඛවෙ, මරණං වා නිගච්ඡෙය්‍ය, මරණමත්තං වා දුක්ඛං. න ත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. යඤ්ච ඛො සො භික්ඛවෙ, දුස්සීලො -පෙ- කසම්බුජාතො ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජති, තං හි තස්ස භික්ඛවෙ, හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

මහණෙනි, තොපට හඟවන්නෙමි. මහණෙනි, තොපට කරුණු ගන්වා දන්වන්නෙමි. බලවත් පුරුෂයෙක් හටගත් කෙලෙස් ඇති ... එ දුසිල්හුගේ හිස්හි හෝ ගෙණ ... හොවාලන්නේ ය ... එ කවර හෙයින යත්: මහණෙනි, එ ප්‍රත්‍යයෙන් හෙතෙම මරණයට හෝ මරණමාත්‍ර දුඃඛයට හෝ පැමිණෙන්නේ ය. එ හෙතුයෙන් කාබුන්මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට නො ම පැමිණෙන්නේ ය. මහණෙනි, එ දුසිල් තෙම ... හටගත් කෙලෙස්කසළ ඇතියේ ක්‍ෂත්‍ර්‍ය-මහසලුන්ගේ හෝ බමුණුමහසලුන්ගේ හෝ ගෘහපතිමහසලුන්ගේ හෝ සැදැහැයෙන් දෙන හැඳපුවූ පරිභෝග කරන්නේ ය යන යමක් වේ නම්, මහණෙනි, එය ම ඔහට දිගුකලෙක්හි අහිත පිණිස, දුක් පිණිස වෙයි. කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට (උපත් විසින්) එළැඹෙන්නේ ය.

මහණෙනි, එ කිමෙකැයි හඟිවු ද? බලවත් පුරුෂයෙක් පා උඩුකුරු කොට හිස යටිකොට ගෙණ ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිර්භූත වූ තප්ත වූ ලොහකුම්භියෙක්හි හෙලන්නේ ය. හෙ එහි පෙණ උතුරුවමින් පැසෙමින් වරෙක උඩට යෙයි, වරෙක යට බස්නේ ය, වරෙක සරස්හි යන්නේ ය යන යමෙක් වේ නම්, ක්‍ෂත්‍රියමහාසාරයන්ගේ වේවයි, බ්‍රාහ්මණ මහාසාරයන්ගේ වේවයි, ගෘහපතිමහාසාරයන්ගේ වේවයි, සැදැහෙන් දුන් වෙහෙර වලඳ කරන්නේ ය යන යමෙකුත් වේ නම්, එ දෙකින් කවරෙක් උතුම් වේ දැ යි? වහන්ස, ක්‍ෂත්‍රියමහසලුන්ගේ වේවයි, බමුණුමහසලුන්ගේ වේවයි, ගැහැවිමහසලුන්ගේ වේවයි සැදැයෙන් දුන් වෙහෙර වලඳ කෙරෙයි යන තෙල කරුණ ම උතුම් වන්නේ ය. වහන්ස, බලවත් පුරුෂයෙක් පා උඩුකුරු කොට හිස යට කොට ගෙණ ඇවිලගත්, ගිනිගෙන් දිලියෙන, ගිනිසිළු සහිත රත් ලොහොකුඹුයෙක්හි බහන්නේ නම් හෙ එහි පෙණ උතුරුවමින් පැසෙමින් වරෙක උඩට යෙයි, වරෙක යටට යෙයි, වරෙක සරසට යෙයි යන යමෙක් වේ නම්, තෙල දුක් ම වේ ය යි.

මහණෙනි, තොපට හඟවා කියමි. මහණෙනි, තොපට කරුණු ගන්වා දන්වමි. යම් පරිද්දෙක් ... බලවත් පුරුෂයෙක් හටගත් කෙලෙස්-කසළ ඇති එ දුසිල්හුගේ පා උඩුකුරු කොට හිස යටිකුරු කොට ගෙණ ... වරක් සරසට ද යන්නේ ය ... එ කවර හෙයින යත්: මහණෙනි, එ හෙතුයෙන් හෙ මරණයට හෝ මරණමාත්‍ර වූ දුකට හෝ යන්නේ ය. එ හෙතුයෙන් කාබුන්මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට නො පැමිණෙන්නේ ම ය. මහණෙනි ... හටගත් කසළ ඇති එ දුසිල් තෙම ක්‍ෂත්‍රියමහසලුන්ගේ වේව යි, බමුණුමහසලුන්ගේ වේවයි, ගැහැවිමහසලුන්ගේ වේවයි සැදැහෙන් දුන් වෙහෙර වලඳනේ ය යන යමෙක් වේ නම්, මහණෙනි, ඔහට එ දිගුකලෙක්හි අහිත පිණිස දුක් පිණිස වෙයි. කාබුන්මරණින් මතු අපාය වූ දුගීති වූ විනිපාත වූ නිරයට එළැඹෙන්නේ ය.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං තෙසං තෙ කාරා මහප්ඵලා භවිස්සන්ති, මහානිසංසා. අම්හාකං චෙවායං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා සඋද්‍රයාති එවංහි වො, භික්ඛවෙ, සික්ඛිතබ්බං. අත්තත්ථං වා භික්ඛවෙ, සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං, පරත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං. උභයත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුන්ති.

ඉදමවොච භගවා. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡි. සට්ඨි මත්තා භික්ඛූ සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිංසු දුක්කරං භගවා, සුදුක්කරං භගවාති. සට්ඨිමත්තානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

7. 2. 2. 9.

[සුනෙත්තසුත්තං]

[සාවජ්ජනිද්දෙසං]

20. භූතපුබ්බං භික්ඛවෙ, සුනෙත්තො නාම සත්ථා අහොසි තිත්ථකරො කාමෙසු වීතරාගො. සුනෙත්තස්ස ඛො පන භික්ඛවෙ, සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං. සුනෙත්තො නාම සත්ථා සාවකානං බ්‍රහ්මලොකසහබ්‍යතාය[1] ධම්මං දෙසෙසි. යෙ ඛො භික්ඛවෙ[2] සුනෙත්තස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය[1] ධම්මං දෙසෙන්තස්ස චිත්තානි නප්පසාදෙසුං[3], තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිංසු. යෙ ඛො පන භික්ඛවෙ සුනෙත්තස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස චිත්තානි පසාදෙසු, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිංසු.

භූතපුබ්බං භික්ඛවෙ මූගපක්ඛො නාම සත්ථා අහොසි [තිත්ථකරො කාමෙසු වීතරාගො] -පෙ- අරනෙමි නාම සත්ථා අහොසි -පෙ- කුද්දාලො නාම සත්ථා අහොසි -පෙ- හත්ථිපාලො නාම සත්ථා අහොසි -පෙ- ජොතිපාලො නාම සත්ථා අහොසි -පෙ- අරකො නාම සත්ථා අහොසි තිත්ථකරො කාමෙසු වීතරාගො. අරකස්ස ඛො පන භික්ඛවෙ, සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං. අරකො නාම සත්ථා සාවකානං බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙසි. යෙ ඛො භික්ඛවෙ අරකස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස චිත්තානි නප්පසාදෙසුං, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිංසු. යෙ ඛො පන භික්ඛවෙ, අරකස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස චිත්තානි පසාදෙසුං, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිංසු.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, යො ඉමෙ සත්ත සත්ථාරෙ තිත්ථකරෙ කාමෙසු වීතරාගෙ අනෙකසතපරිවාරෙ සසාවකසඞ්ඝෙ පදුට්ඨචිත්තො අක්කොසෙය්‍ය පරිභාසෙය්‍ය, බහුං සො අපුඤ්ඤං පසවෙය්‍යාති.

එවං භන්තෙ.

---

1. බ්‍රහ්මලොකසහබ්‍යතාය - මජසං. 2. යෙ ඛො පන භික්ඛවෙ - ඉජසං,
3. න පසාදෙසුං - සිමු.

මහණෙනි, එහෙයින් ම මේ කාරණයෙහි ලා මෙසේ හික්මිය යුතු: "යමෙකුන්ගේ චීවර, පිණ්ඩපාත, ශයනාසන, ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය-පරිෂ්කාරය අපි වළඳ කරමෝ නම්, ඔවුන්ගේ ඒ ප්‍රත්‍යයක්‍රියාවෝ මහත්ඵල ඇත්තාහු මහානිසංස ඇත්තාහු වන්නාහ. අපගේ මේ පැවිද්දත් නොවඳ වූයේ සඵල වූයේ වැඩීම් ඇතියේ වන්නේ ය"යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි. මහණෙනි, ආත්මාර්ථය හෝ දක්නාහු විසින් අප්‍රමාදයෙන් කුසල්දම් සපයනට නිසි වෙයි. මහණෙනි, පරාර්ථය හෝ දක්නාහු විසින් අප්‍රමාදයෙන් කුසල් දම් සපයනට නිසි ම වෙයි. මහණෙනි, උභයාර්ථය ම හෝ දක්නාහු විසින් අප්‍රමාදයෙන් කුසල් දම් සපයනට නිසි ම වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මේ ව්‍යාකරණය දෙසනු ලබත් ම සැටක් පමණ මහණුන්ගේ මුවින්, උණුලේ නැගිනි. සැටක් පමණ භික්ෂූහු "භාග්‍යවතුන් වහන්ස, දුෂ්කර ය, භාග්‍යවතුන් වහන්ස, ඉතා දුෂ්කර ය"යි ශික්ෂාපද ප්‍රත්‍යාඛ්‍යාන කොට හීනභාව සඞ්ඛ්‍යාත ගිහිබවට පෙරළුනාහ. සැටක් පමණ මහණුන්ගේ චිත්තයෝ ආශ්‍රවයන්ගෙන් උපාදාන රහිතව මිදුනාහ යි.

## 7. 2. 2. 9.

## [සුනෙත්ත සූත්‍රය]

[සැවැත්නිදාන යි]

20. මහණෙනි, පෙර වූවක් කියමි. සුනෙත්‍ර නම් තීර්ථකර වූ කාමයන්හි විතරාග වූ ශාස්තෘවරයෙක් විය. මහණෙනි, සුනෙත්‍ර ශාස්තෲහුගේ නොසියක් සව්වෝ වූහ. සුනෙත්‍ර නම් සත්ථර සව්වනට බ්‍රහ්මලොක සහභාවය සඳහා දම් දෙසී ය. මහණෙනි, බ්‍රහ්මලොක සහභාවය සඳහා ධර්ම දෙසනා කරණ සුනෙත්‍ර ශාස්තෘහට යම් කෙනෙක් සිත් නොපැහැදූහු නම්, උහු කාබුන් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට වන්හ. මහණෙනි, යම් කෙනෙක් බ්‍රහ්මලොක සහව්‍යතය සඳහා දම් දෙසනා සුනෙත් සත්ථරහට සිත් පැහැදූහු නම්, උහු කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට වන්හ.

මහණෙනි, පෙරවූවක් කියමි: මූගපක්ඛ නම් තීර්ථකර වූ කාමයන්හි විතරාග වූ ... ශාස්තෘවරයෙක් විය ... අරණෙමි නම් .. ශාස්තෘවරයෙක් විය ... උද්දාල නම් ... සත්ථරෙක් විය ... හත්ථිපාල නම් ... සත්ථරෙක් විය ... ජෝතිපාල නම් .. සත්ථරෙක් විය ... අරක නම් තීර්ථකර වූ කාමයන්හි විතරාග වූ ශාස්තෘවරයෙක් විය. මහණෙනි, අරක නම් වූ ශාස්තෘහට අනෙකශත ශ්‍රාවකයෝ වූහ. අරක නම් ශාස්තෘ ශ්‍රාවකයනට බ්‍රහ්මලොක සහව්‍යතය සඳහා දම් දෙසී ය. මහණෙනි, බ්‍රහ්මලොක සහව්‍යතය සඳහා ධර්මදෙශනා කරණ අරක සත්ථරහු කෙරෙහි යම් කෙනෙක් සිත් නොපැහැදුහු නම්, ඔහු කායභෙදයෙන් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට උපත් විසින් පැමිණියහ. මහණෙනි, බ්‍රහ්මලොක සහව්‍යතය සඳහා දම් දෙසන අරක සත්ථරහු කෙරෙහි යම් කෙනෙක් සිත් පැහැදුහු නම්, ඔහු කාබුන් මරණින් මතු සුගති ස්වර්ගලොකයට පැමිණියහ.

මහණෙනි, එ කිමකැයි හඟිවූ ද? යමෙක් අනෙකශත පරිවාර ඇති ශ්‍රාවකසඞ්ඝයා සහිත, තීර්ථකර වූ කාමයන්හි විතරාග වූ මේ සත් ශාස්තෘවරයනට ප්‍රදුෂ්ටචිත්ත ඇතියේ ආක්‍රොශ කෙරේ නම්, පරිභාෂා කෙරේ නම්, හෙ බොහෝ අපුණ්‍ය රැස් කෙරේ දැයි?

'වහන්ස, එසේ ය'යි.

යො ඛො භික්ඛවෙ, ඉමෙ සත්ත සත්ථාරෙ තිත්ථකරෙ කාමෙසු වීතරාගෙ අනෙක සතපරිවාරෙ සසාවකසඞ්ඝෙ පදුට්ඨචිත්තො අක්කොසෙය්‍ය පරිභාසෙය්‍ය, බහුං සො අපුඤ්ඤං පසවෙය්‍ය, යො එකං දිට්ඨිසම්පන්නං පුග්ගලං පදුට්ඨචිත්තො අක්කොසති පරිභාසති, අයං තතො බහුතරං අපුඤ්ඤං පසවති. තං කිස්ස හෙතු: නාහං භික්ඛවෙ, ඉතො බහිද්ධා එවරූපිං ඛන්තිං වදමි, යථා අම්හාකං සබ්‍රහ්මචාරිසු.[1]

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: නචෙව අම්හං සබ්‍රහ්මචාරිසු[2] චිත්තානි පදුට්ඨානි භවිස්සන්තීති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

7. 2. 2. 10.

[අරක සුත්තං]

[සාධජීණිදනං]

21. භූතපුබ්බං භික්ඛවෙ, අරකො නාම සත්ථා අහොසි, තිත්ථකරො කාමෙසු වීතරාගො: අරකස්ස ඛො පන භික්ඛවෙ, සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං. අරකො සත්ථා සාවකානං එවං ධම්මං දෙසෙති: අප්පකං බ්‍රාහ්මණා, ජීවිතං මනුස්සානං පරිත්තං ලහුකං බහුදුක්ඛං බහු-පායාසං මන්තාය[3] බොද්ධබ්බං[4] කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං. නත්ථි ජාතස්ස අමරණං.

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, තිණග්ගෙ උස්සාවබින්දු සුරියෙ උග්ගච්ඡන්තෙ ඛිප්පමෙව පටිවිගච්ඡති න චිරට්ඨිතිකං හොති, එවමෙව ඛො බ්‍රාහ්මණා, උස්සාවබින්දූපමං ජීවිතං මනුස්සානං පරිත්තං ලහුකං බහුදුක්ඛං බහුපායාසං, මන්තාය බොද්ධබ්බං, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං. නත්ථි ජාතස්ස අමරණං.

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ උදකබුබ්බුළං ඛිප්පමෙව පටිවිගච්ඡති න චිරට්ඨිතිකං හොති, එවමෙව ඛො බ්‍රාහ්මණා, උදකබුබ්බුළූපමං ජීවිතං මනුස්සානං පරිත්තං ලහුකං බහුදුක්ඛං බහුපායාසං, මන්තාය බොද්ධබ්බං.[5] කත්තබ්බං කුසලංචරිතබ්බං බ්‍රහ්මචරියං. නත්ථි ජාතස්ස අමරණං.

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, උදකෙ දණ්ඩරාජි ඛිප්පං යෙව පටිවිගච්ඡති, න චිරට්ඨිතිකා හොති, එවමෙව ඛො බ්‍රාහ්මණා, උදකෙ දණ්ඩ රාජූපමං ජීවිතං මනුස්සානං පරිත්තං -පෙ- නත්ථි ජාතස්ස අමරණං.

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, නදී පබ්බතෙය්‍යා දූරඞ්ගමා සීඝසොතා හාර-හාරිනී නත්ථි සො ඛණො වා ලයො වා මුහුත්තො වා යං සාථරති, අථ ඛො සා ගච්ඡතෙව වත්තතෙව සන්දතෙව, එවමෙව ඛො බ්‍රාහ්මණා, නදීපබ්බ-තෙය්‍යූපමං ජීවිතං මනුස්සානං -පෙ- නත්ථි ජාතස්ස අමරණං.

1. යථා ම. සබ්‍රහ්මචාරීසු - මජ්සං. 2. නනො සබ්‍රහ්මචාරීසු - මජ්සං
3. මන්තායං - මජ්සං 4. බොධබ්බං - සිමු.

මහණෙනි, යමෙක් ප්‍රදුෂ්ට වූ සිත් ඇතියේ, අනෙකශත පරිවාර ඇති තීර්ථකර වූ කාමයන්හි වීතරාග වූ ශ්‍රාවකසඞ්ඝයා සහිත මෙ සත් ශාස්තෘවරුන්ට ආක්‍රොශ කෙරේ ද, පරිභාෂා කෙරේ ද, හෙ බොහෝ අකුසල් රැස් කෙරේ. යමෙක් (එක් මාර්ගසම්‍යක්) දෘෂ්ටිසම්පන්න පුද්ගලයකු ප්‍රදුෂ්ට චිත්ත ඇතියේ ආක්‍රොශ කෙරේ නම්, පරිභව කෙරේ නම්, මෙ තෙම එයට බහුතර පව් රැස් කරන්නේ ය. එ කවර හෙයින යත්: මේ බුදුසස්නෙන් බැහැර අපගේ සබ්‍රම්සරුන් කෙරෙහි මෙන් මෙබඳු ක්ෂාන්තියක් ඇතැයි මම නො කියමි.

මහණෙනි, එබැවින් මෙහි ලා මෙසේ හික්මිය යුතු: අපගේ සබ්‍රම්සරුන් කෙරෙහි සිත් නගමක් ප්‍රදුෂ්ට වේවා යි. මහණෙනි, තොප විසින් මෙ සෙයින් ම හික්මිය යුතුයි.

7. 2. 2. 10.

[අරක සූත්‍රය]

[සැවැත්නිදාන යි]

21. මහණෙනි, පෙර වූවක් කියමි. තීර්ථකර වූ කාමයන්හි වීතරාග වූ අරක නම් ශාස්තෘවරයෙක් විය. මහණෙනි, අරක ශාස්තෘහට අනෙකශත ශ්‍රාවකයෝ වූහ. අරක ශාස්තෘ සව්වනට මෙසෙයින් දම් දෙසයි: බ්‍රාහ්මණයෙනි, මනුෂ්‍යයන්ගේ ජීවිතය ස්වල්ප ය පරිත්ත ය, ඉතා ලඝු ය. බොහෝ දුක් ඇතියේ ය, බොහෝ උපායාස ඇතියේ ය. ප්‍රඥායෙන් එ දත යුතු ය. කුශලය කටයුතු ය. බ්‍රහ්මචර්‍ය්‍යය හැසිරිය යුතු ය. උපන්නහුහට අමරණයෙක් නැත.

බ්‍රාහ්මණයෙනි, තණග පිනිබිඳ යම්සේ හිරු උදුවන්නම වහා නො පැණී යේ ද, චිරස්ථායී නො වේ ද, බ්‍රාහ්මණයෙනි, එපරිද්දෙන් ම තණග පිනිබිඳ උපමා කොට ඇති මිනිසුන්ගේ ජීවිතය පරිත්ත වෙයි. ලඝු වෙයි. බොහෝ දුක් ඇති වෙයි. බොහෝ දුඃඛ ආයාස ඇතියේ වෙයි. ප්‍රඥායෙන් දතයුතු ය. කුසල් කටයුතු ය. බඹසර හැරිය යුතු ය. උපන්නාහට අමරණයෙක් නැත.

බ්‍රාහ්මණයෙනි, දළපොද ඇති වැසි වස්නා කල්හි දියබුබුළු වහා නො පැණී යේ ද, චිරස්ථිතික නො වේ ද, බ්‍රාහ්මණයෙනි, එපරිද්දෙන් ම දියබුබුලක් බඳු මනුෂ්‍යයන්ගේ ජීවිතය පරිත්ත වෙයි. ලඝු වෙයි. බොහෝ දුක් ඇති වෙයි. බොහෝ ආයාස ඇති වෙයි. ප්‍රඥායෙන් දතයුතු ය. කුසල් කටයුතු ය. බඹසර හැරියයුතු ය. උපන්නාහට නො මැරීමෙක් නැත.

බ්‍රාහ්මණයෙනි, දියෙහි දඬින් ඇඳි ඉර යම්සේ වහා නො පැණී යේ ද, චිරස්ථිතික නො වේ ද, බ්‍රාහ්මණයෙනි, එසෙයින් ම දියෙහි දණ්ඩරාජිය බඳු මනුෂ්‍යයන්ගේ ජීවිතය ... උපන්නාහට නො මැරීමෙක් නැත.

බ්‍රාහ්මණයෙනි, පර්වතයෙහි හටගත් දුරඞ්ගම වූ සීඝ්‍ර ස්‍රොතස් ඇති හසු වූ හැම දෑ ගසාගෙණ යන නදිය යම්සේ ද, යම් හෙයකින් ඕ නවතී නම් එබඳු ක්ෂණයෙක් හෝ ලවයෙක් හෝ මුහුර්තයෙක් හෝ නැත. වැලිත් ඕ ගමන් කරන්නී ම වෙයි, පවත්නී ම වෙයි, ගලාබස්නී ම වෙයි. බ්‍රාහ්මණයෙනි, එපරිද්දෙන් ම පාර්වතීය නදියක් බඳු මනුෂ්‍යයන්ගේ ජීවිතය ජාතයාහට නො මැරීමෙක් නැත.

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, බලවා පුරිසො ජිව්හග්ගෙ ඛෙළපිණ්ඩං සඤ්ඤුහිත්වා අප්පකසිරෙනෙව වමෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණා ඛෙළපිණ්ඩූපමං ජීවිතං මනුස්සානං පරිත්තං -පෙ- නත්ථි ජාතස්ස අමරණං.

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, දිවසසන්තත්තෙ අයොකටාහෙ මංසපෙසි පක්ඛිත්තා ඛිප්පංයෙව පරික්ඛයං ගච්ඡති, න චිරට්ඨිතිකා හොති, එවමෙව ඛො බ්‍රාහ්මණා, මංසපෙසූපමං ජීවිතං මනුස්සානං -පෙ- නත්ථි ජාතස්ස අමරණං.

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, ගාවී වජ්ඣා ආඝාතනං නීයමානා යඤ්ඤදෙව පාදං උද්ධරති සන්තිකෙව හොති වධස්ස සන්තිකෙව මරණස්ස, එවමෙව ඛො බ්‍රාහ්මණා, ගාවී වජ්ඣූපමං ජීවිතං මනුස්සානං පරිත්තං ලහුකං බහුදුක්ඛං බහුපායාසං මන්තාය බොද්ධබ්බං. කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණන්ති.

තෙන ඛො පන භික්ඛවෙ සමයෙන මනුස්සානං සට්ඨිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. පඤ්චවස්සසතිකා කුමාරිකා අලම්පතෙය්‍යා අහොසි. තෙන ඛො පන භික්ඛවෙ, සමයෙන මනුස්සානං ඡළෙව ආබාධා අහෙසුං: සීතං, උණ්හං, ජිඝච්ඡා, පිපාසා, උච්චාරො, පස්සාවො. සො හි නාම භික්ඛවෙ, අරකො සත්ථා එවං දීඝායුකෙසු මනුස්සෙසු එවං චිරට්ඨිතිකෙසු එවං අප්පාබාධෙසු සාවකානං එවං ධම්මං දෙසෙස්සති:

"අප්පකං බ්‍රාහ්මණා, ජීවිතං මනුස්සානං පරිත්තං ලහුකං බහුදුක්ඛං බහුපායාසං මන්තාය බොද්ධබ්බං. කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණ"න්ති.

එතරහි ඛො තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය අප්පකං ජීවිතං මනුස්සානං පරිත්තං ලහුකං බහුදුක්ඛං බහුපායාසං මන්තාය බොද්ධබ්බං. කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං. නත්ථි ජාතස්ස අමරණන්ති. එතරහි ඛො භික්ඛවෙ, යො චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භීය්‍යො වා.

වස්සසතං ඛො පන භික්ඛවෙ, ජීවන්තො තීණියෙව උතුසතානි ජීවති: උතුසතං හෙමන්තානං, උතුසතං ගිම්හානං, උතුසතං වස්සානං. තීණි ඛො පන භික්ඛවෙ, උතුසතානි ජීවන්තො ද්වාදසයෙව මාසසතානි ජීවති: චත්තාරි මාසසතානි හෙමන්තානං, චත්තාරි මාසසතානි ගිම්හානං, චත්තාරි මාසසතානි වස්සානං. ද්වාදසං ඛො පන භික්ඛවෙ, මාසසතානි ජීවන්තො චතුවීසතිං එව අඩ්ඪමාස සතානි ජීවති: අට්ඨඩ්ඪමාසසතානි හෙමන්තානං, අට්ඨඩ්ඪමාස සතානි ගිම්හානං, අට්ඨඩ්ඪමාසසතානි වස්සානං.

1. සං. සා. අවත්තානි - මජ්ඣං. මරති - සත්ත.

බ්‍රාහ්මණයෙනි, යම්සේ බලවත් පුරුෂයෙක් දිවග කෙළපිඬක් රැස්කොට නිදුකින් ම වමාරා නම්, බ්‍රාහ්මණයෙනි, එ ලෙසින් ම කෙළපිඬක් බඳු මිනිසුන්ගේ ජීවිතය පරිත්ත වෙයි... ජාතයකුහට අමරණයෙක් නැත.

බ්‍රාහ්මණයෙනි, යම්සේ දවසක් තැවුනු යකඩලෙක්හි මස් පිඬක් බහන ලද්දේ වහා නො පැණී යේ නම්, චිරස්ථිතික නොවේ නම්, බ්‍රාහ්මණයෙනි, එසෙයින් ම මනුෂ්‍යයන්ගේ ජීවිතය මාංසපෙශියක් උපමා කොට ඇත ... ජාතයකුහට අමරණයෙක් නැත.

බ්‍රාහ්මණයෙනි, යම්සේ වධයට නියත වූ දෙනක් වධස්ථලය කරා ගෙණ යනු ලබන්නී යම් ම පාදයක් ඔසොවා නම්, වධයට ම සමීප වෙයි, මරණයට ළංවූවා ම වෙයි. බ්‍රාහ්මණයෙනි, එසෙයින් ම වධයට නියත දෙනක උපමා කොට ඇති මනුෂ්‍යයන්ගේ ජීවිතය පරිත්ත වෙයි. ඉතා ලුහු වෙයි. බොහෝ දුක් ඇති වෙයි. බොහෝ උපායාස ඇති වෙයි. ප්‍රඥ-යෙන් දතයුතු වෙයි. කුශලය කටයුතු ය, බඹසර හැරිය යුතු. ජාතයාහට අමරණයෙක් නැතැ යි.

මහණෙනි, එ සමයෙහි මිනිසුනට හවුරුදු සැටදහසක් ආයු ප්‍රමාණ විය. පන්සිය හවුරුදු වියපත් කුමරිය පතිකුල යැමට නිසි වූ ය. මහණෙනි, එසමයෙහි මිනිසුනට ආබාධයෝ සයක් පමණක් ම ඇති වූහ: ශීතය, උෂ්ණ ය, සා ය, පවස ය, මලාපහරණ ය, ප්‍රස්‍රාවාපහරණ යයි. මහණෙනි, එබඳු වූ ම අරක ශාස්තෘ මෙසේ දීර්ඝායුෂ්ක වූ මෙසේ චිරස්ථිතික වූ මෙසේ අල්පා-බාධ වූ මනුෂ්‍යයන් අතුරෙහි සව්වනට මෙසේ දම් දෙසී ය.

“බ්‍රාහ්මණයෙනි, මනුෂ්‍යයන්ගේ ජීවිතය ඉතා අල්ප වෙයි. ස්වල්ප වෙයි. ඉතා ලුහු වෙයි. බොහෝ දුක් ඇතියේ වේ. බොහෝ උපායාස ඇතියේය. ප්‍රඥයෙන් දතයුතු ය. කුශලය කටයුතු ය, බ්‍රහ්මචර්‍ය්‍යය හැරිය යුතුය. ජාතයාහට අමරණයෙක් නැතැයි.”

මහණෙනි, මෙ කල්හි මනා කොට කියනුයේ “මනුෂ්‍යයන්ගේ ජීවිතය අල්ප වෙයි. ස්වල්ප වෙයි. ඉතා ලුහු වෙයි. බොහෝ දුක් ඇති වෙයි. බොහෝ උපායාසය ඇති වෙයි. ප්‍රඥයෙන් දතයුතු ය. කුසල් කටයුතු ය; බඹසර හැරියයුතු ය. ජාතයාහට අමරණයෙක් නැත. මහණෙනි, මෙකල්හි යමෙක් බොහෝ කලක් ජීවත් වේ නම්, හෙ වර්ෂ ශතයක් හෝ ඉන් අල්පයක් වැඩිය හෝ ජීවත් වෙයි.

මහණෙනි, සියක් වස් දිවි වටනුයේ හෙමන්ත සෘතු සියක් හා ග්‍රීෂ්ම සෘතු සියක් හා වර්ෂා සෘතු සියක් හා සෘතු තුන්සියක් ම දිවි වටනේ ය. මහණෙනි, සෘතු තුන්සියක් දිවි වටනුයේ හෙමන්ත මාස සාරසියක් හා ග්‍රීෂ්ම මාස සාරසියක් හා වර්ෂා මාස සාරසියක් හා දොළොස් සියමසක් ම දිවි වටනේ ය මහණෙනි, දොළොස් සියමස් දිවි වටනුයේ අටසියක් හිමත් අඩමස් හා, අටසියක් ගිමත් අඩමස් හා, අටසියක් වැසි අඩමස් හා සුවිසි සියක් අඩමස් වසනේ ය.

චතුවීසතිං ඛො පන භික්ඛවෙ, අඩ්ඪමාසසතානි ජීවන්තො ඡත්තිංසංයෙව රත්තිසහස්සානි ජීවති: ද්වාදස රත්තිසහස්සානි හෙමන්තානං, ද්වාදසරත්තිසහස්සානි ගිම්හානං, ද්වාදසරත්තිසහස්සානි වස්සානං. ඡත්තිංසං ඛො පන භික්ඛවෙ, රත්තිසහස්සානි ජීවන්තො ද්වෙසත්තතිං එව භත්තසහස්සානි භුඤ්ජති: චතුවීසති භත්තසහස්සානි හෙමන්තානං, චතුවීසති භත්තසහස්සානි ගිම්හානං, චතුවීසති භත්තසහස්සානි වස්සානං සද්ධිං මාතුථඤ්ඤාය, සද්ධිං භත්තන්තරායා.[1] තත්‍රිමෙ භත්තන්තරායා: කුපිතොපි[2] භත්තං න භුඤ්ජති, දුක්ඛිතොපි භත්තං න භුඤ්ජති, ව්‍යාධිතොපි භත්තං න භුඤ්ජති, උපොසථිකොපි භත්තං න භුඤ්ජති, අලාභකෙනපි භත්තං න භුඤ්ජති.

ඉති ඛො භික්ඛවෙ, මයා වස්සසතායුකස්ස මනුස්සස්ස ආයුපි සඞ්ඛාතං, ආයුප්පමාණම්පි සඞ්ඛාතං, උතූපි සඞ්ඛාතා, සංවච්ඡරාපි සඞ්ඛාතා, මාසාපි සඞ්ඛාතා, අඩ්ඪමාසාපි සඞ්ඛාතා, රත්තීපි සඞ්ඛාතා, දිවාපි සඞ්ඛාතා, භත්තාපි සඞ්ඛාතා, භත්තන්තරායාපි සඞ්ඛාතා.

යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි භික්ඛවෙ, රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි. ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති.

මහාවග්ගො දුතියො.

තස්සුද්දානං:

හිරීසුරිය[3] නගරං උපමා ධම්මඤ්ඤුපාරිච්ඡත්තකං
සක්කච්චං භාවනා අග්ගි සුනෙත්තඅරකෙන තෙ දසාති.

---

1. භත්තන්තරායෙන - මජසං.
2. කුපිතෙදීඝාපි - මජසං.
3. හිරීසුරියං උපමා ධම්මඤ්ඤූපාරිච්ඡත්තකං.
සක්කච්චං භාවනා අග්ගි සුනෙත්තඅරකෙනචාති - මජසං.

මහණෙනි, සුවිසි අඩමස් සියක් දිවි වටනුයේ හිමන් රෑ දෙලොස් දහසක් හා, ගිමන් රෑ දෙලොස් දහසක් හා, වැසිකල් රෑ දෙලොස් දහසක් හා සතිස් රෑ දහසක් ජීවත් වන්නේ ය. මහණෙනි, සතිස් රෑ දහසක් දිවි වටනුයේ හිමන් බත් සුවිසිදහසක් හා, ගිමන් බත් සුවිසි දහසක් හා, වැසිකල් බත් සුවිසිදහසක් හා, මවුකිරි හා භක්ෂ්‍යාන්තරාය ද ගෙණ දෙසැත්තෑ බත් දහසක් දිවි වටනේ ය. එහි භක්ෂ්‍යාන්තරායයෝ නම් මොහු යැ: කිපියේ ද බත් නො බුදුනේ ය. දුකට පත්වූයේ ද බත් නො බුදුනේ ය රෝගී වූයේ ද බත් නො බුදුනේ ය. පෙහෙවස් ඇතියේ ද බත් නො බුදුනේ ය. අලාභයෙහිනුදු බත් නො බුදුනේ ය.

මහණෙනි, මෙ සෙයින් සියවස් ආයු ඇති මනුෂ්‍යයාගේ ආයුෂ ද මා විසින් පමණන ලදී. ආයු ප්‍රමාණය ද කියන ලදී. සෘතුහු ද පමණන ලදහ. හවුරුදුත් පමණන ලදී. මාසයෝ ද පමණන ලදහ. අඩමාසයෝ ද පමණන ලදහ. රාත්‍රිහු ද පමණන ලදහ. දහවල්හු ද පමණන ලදහ. බත්හු ද කියන ලදහ. භක්ෂ්‍යාන්තරායයෝ ද කියන ලදහ.

මහණෙනි, සවුවනට හිතෙසි වූ අනුකම්පා කරණ ශාස්තෘහු විසින් අනුකම්පා පිණිස යමක් කළයුතු නම්, එය මා විසින් තොපට කරණ ලදී. මහණෙනි, තෙල රුක්මුල්හු ඇත. තෙල ශූන්‍යාගාරයෝ ඇත. මහණෙනි, (ආලම්බනලක්ෂණෝපනිධ්‍යාන විසින් ශමථවිදර්ශනා) ධ්‍යාන කරවු. නහමක් පමාවවු. පසුකල්හි නහමක් විපිළිසර වවු. මේ තොපට අපගේ අනුශාසනා යි.

මහාවග්ගය දෙවැනි යි.

එහි උද්දානය:

හිරි (ඔත්තප්ප) සූත්‍රය, (සත්ත) සුරිය සූත්‍රය, නගරෝපම සූත්‍රය, ධම්මඤ්ඤු සූත්‍රය, පාරිච්ඡත්තක සූත්‍රය, සක්කච්ච (සක්කාරගරුකාර) සූත්‍රය, භාවනා සූත්‍රය, අග්ගික්ඛන්ධෝපම සූත්‍රය, සුනෙත්ත සූත්‍රය, අරක සූත්‍රය දැයි සූත්‍ර දශයෙකි.



Free Distribution www.aathaapi.org

# 3. විනය වග්ගො

### 7. 2. 3. 1.

### [පඨම විනයධර සුත්තං]

[සාවත්ථිනිදානං]

22. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොති. කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති. සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොතීති.

### 7. 2. 3. 2.

### [දුතිය විනයධර සුත්තං]

[සාවත්ථිනිදානං]

23. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොති. කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොතීති.

### 7. 2. 3. 3.

### [තතිය විනයධර සුත්තං]

[සාවත්ථිනිදානං]

24. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොති. කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති. විනයෙ ඛො පන ඨිතො හොති අසංහීරො. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොතීති.

# 3. විනය වර්ගය.

## 7. 2. 3. 1.

## [ප්‍රථම විනයධර සූත්‍රය]

[සැවැත්නිදාන යි]

22. මහණෙනි, ධර්ම සතෙකින් යුක්ත වූ මහණ විනයධර වෙයි. කවර සතෙකින යත්:

ආපත්තිය දන්නේ ය. අනාපත්තිය දන්නේ ය. ලහුකාපත්තිය දන්නේ ය. ගරුකාපත්තිය දන්නේ ය. පාමොක් සංවර සීලයෙන් සංවෘත වූයේ සිල්වත් වෙයි, ආචාරගොචරසම්පන්න වූයේ අණුමාත්‍ර වරදෙහි ද භය දක්නා සුලුයේ වාසය කරයි, සමාදන් කොට ශික්ෂාපදයෙහි හික්මෙයි. ආභිචෛතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සතර ධ්‍යානයන් නිදුකින් ලබන්නේ කැමති සේ ලබන්නේ පහසුවෙන ලබන්නේ වෙයි. ආස්‍රවක්‍ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එළැඹ වෙසෙයි.

මහණෙනි, මේ කරුණු සතින් සමන්වාගත මහණ විනයධර වේ යයි.

## 7. 2. 3. 2.

## [දෙවෙනි විනයධර සූත්‍රය]

[සැවැත්නිදාන යි]

23. මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත මහණ විනයධර වෙයි. කවර සතෙකින යත්:

ඇවැත් දන්නේ ය. අනාපත්ති දන්නේ ය. ලුහු ඇවැත දන්නේ ය. ගුරුඇවැත දන්නේ ය. උභය ප්‍රාතිමොක්‍ෂයෝ ඔහු විසින් විස්තර වසින් සුවිභක්ත වූවාහු මොනොවට පවත්නාහු සූත්‍ර විසිනිදු අනුව්‍යඤ්ජන (බන්ධන පරිවාර) විසිනුදු සුවිනිච්චිත වූවාහු ස්වාගත (ප්‍රගුණ) වෙත්. ආභිචෛතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සතර ධ්‍යානයන් නිදුකින් ලබන සුලුයේ කැමැතිසේ ලබනුයේ පහසුයෙන් ලබන සුලුයේ වෙයි. ආස්‍රවක්‍ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්‍ෂාත් කොට එයට පැමිණ වාසය කරන්නේ ය.

මහණෙනි, මේ කරුණු සතින් සමන්වාගත වූ මහණ විනයධර වේ ය යි.

## 7. 2. 3. 3.

## [තෙවෙනි විනයධර සූත්‍රය]

[සැවැත්නිදාන යි]

24. මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත මහණ විනයධර වෙයි. කවර සතෙකින යත්:

ආපත්තිය දන්නේ ය. අනාපත්තිය දන්නේ ය. ලහුකාපත්තිය දන්නේ ය. ගරුකාපත්තිය දන්නේ ය. විනයෙහි සිටියේ අසංහීර (ලබ්ධියෙහි ස්ථිර-නිසැක) වෙයි. ආභිචෛතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සතරධ්‍යානයන් නිදුකින් ලබන්නේ, කැමැතිසේ ලබන්නේ, සුවසේ ලබන්නේ වෙයි. ආස්‍රවක්‍ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට එළැඹ වාසය කරයි.

මහණෙනි, මේ කරුණු සතින් යුත් මහණ තෙම විනයධර වේ ය යි.

7. 2. 3. 4.

[චතුත්ථ විනයධර සුත්තං]

[සාවත්ථිනිදානං]

25. සත්තහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොති. කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති. අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං. අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොතීති.

7. 2. 3. 5.

[පඨම විනයධරසොභන සුත්තං]

[සාවත්ථිනිදානං]

26. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො සොභති. කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, චතුන්නං ඣානානං -පෙ- අකසිරලාභී, ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො සොභතීති.

7. 2. 3. 6.

[දුතිය විනයධරසොභන සුත්තං]

[සාවත්ථිනිදානං]

27. සත්තහි භික්ඛවෙ. ධම්මෙහි සමන්නාගතො භික්ඛු විනයධරො සොභති. කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, චතුන්නං ඣානානං -පෙ- අකසිරලාභී, ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො විනයධරො සොභතීති.

## 7. 2. 3. 4.

## [සිව්වන විනයධර සූත්‍රය]

[සැවැත් නිදාන යි]

25. මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත වූ මහණ විනයධර වේ. කවර සතෙකින යත්:

ආපත්තිය දන්නේ ය. අනාපත්තිය දන්නේ ය. ලහුකාපත්තිය දන්නේ ය. ගරුකාපත්තිය දන්නේ ය. අනෙකවිධ වූ පෙරවිසූ කඳපිළිවෙළ සමරන්නේ ය. එ කෙසේය යත්: එක්දූයකුදු, දෙ දූයකුදු ... මෙසේ ආකාරසහිත වූ උද්දෙස සහිත වූ අනෙකවිධ වූ පූර්වනිවාසය අනුස්මරණ කෙරෙයි. විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිව්‍යචක්ෂුසින් යථාකර්මෝපගසත්ත්ව-යන් දක්නේ ය. ආශ්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එළැඹ වෙසෙයි.

මහණෙනි, මේ සත් කරුණින් සමන්වාගත මහණ විනයධර වේ ය යි.

## 7. 2. 3. 5.

## [ප්‍රථම විනයධර සෝභන සූත්‍රය]

[සැවැත් නිදාන යි]

26. මහණෙනි, කරුණු සතෙකින සමන්වාගත මහණ විනයධර වූයේ සොබනේ ය කවර සතෙකින යත්:

ආපත්තිය දන්නේ ය. අනාපත්තිය දන්නේ ය. ලහුකාපත්තිය දන්නේ ය. ගරුකාපත්තිය දන්නේ ය ... සිල්වත් වෙයි ... ශික්ෂාපදයන්හි සමාදන් කොට ගෙණ හික්මෙයි. සතර ධ්‍යානයන් ... සුවසේ ලබනුයේ වෙයි. ආශ්‍රවක්ෂයයෙන් ... සාක්ෂාත් කොට ගෙණ එළැඹ වාසය කරයි.

මහණෙනි, මෙ ධර්ම සතින් සමන්වාගත මහණ විනයධර වූයේ සොබනේ ය.

## 7. 2. 3. 6.

## [දෙවෙනි විනයධර සෝභන සූත්‍රය]

[සැවැත් නිදාන යි]

27. මහණෙනි, ධර්ම සතෙකින් සමන්වාගත වූ මහණ විනයධර වූයේ සොබනේ ය. කවර සතෙකින යත්:

ආපත්තිය දන්නේ ය. අනාපත්තිය දන්නේ ය. ලහුකාපත්තිය දන්නේ ය. ගරුකාපත්තිය දන්නේ ය. උභය ප්‍රාතිමොක්ෂයෝ ඔහු විසින් විස්තර විසින් සුවිභක්ත වූවාහු මොනොවට පවත්නාහු සූත්‍ර වශයෙනුදු අනුව්‍යඤ්ජන වශයෙනුදු සුවිනිච්ඡිත වූවාහු ස්වාගත වෙත්. සතර ධ්‍යානයන් ... අකසිරලාභී වෙයි. ආශ්‍රවයන්ගේ ක්ෂයයෙන් ... සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරයි.

මහණෙනි, මේ ධර්ම සතින් සමන්වාගත මහණ විනයධර වූයේ සොබනේ ය යි.

7. 2. 3. 7.

[තතියවිනයධරසොභන සුත්තං]

[සාවත්ථිනිදානං]

28. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො විනයධරො සොභති. කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති විනයෙ ඛො පන ඨිතො හොති අසංහීරො. චතුන්නං ඣානානං -පෙ- අකසිරලාභී. ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි ධම්මෙහි සමන්නාගතො විනයධරො සොභතීති.

7. 2. 3. 8.

[චතුත්ථවිනයධරසොභන සුත්තං]

[සාවත්ථිනිදානං]

29. සත්තහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො විනයධරො සොභති කතමෙහි සත්තහි:

ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති. අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං. අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ සත්තහි ධම්මෙහි සමන්නාගතො විනයධරො සොභතීති.

7. 2. 3. 9.

[සත්ථුසාසන සුත්තං]

[සාවත්ථිනිදානං]

30. අථ ඛො ආයස්මා උපාලි, යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපාලි භගවන්තං එතදවොච:

සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යං අහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

7. 2. 3. 7.

[තෙවැනි විනයධර සොභන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

28 මහණෙනි, කරුණු සතෙකින් සමන්වාගත විනයධර ගොබනේ ය. කවර සතෙකින යත්:

ආපත්තිය දන්නේ ය. අනාපත්තිය දන්නේ ය. ලහුකාපත්තිය දන්නේ ය. ගරුකාපත්තිය දන්නේ ය. විනයෙහි සිටියේ අසංහීර වේයි. සතර ධ්‍යානයන් ... අකසිරයෙන් ලබනසුලුයේ වෙයි. ආස්‍රවක්‍ෂයයෙන් ... සාක්‍ෂාත් කොට එලැඹ වෙසෙයි.

මහණෙනි, මෙ කරුණු සතින් සමන්වාගත විනයධර ගොබනේ ය යි

7. 2. 3. 8.

[සිවුවන විනයධර සොභන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

29. මහණෙනි, ධර්ම සතෙකින් සමන්වාගත විනයධර ශොබනේ ය. කවර සතෙකින යත්:

ආපත්තිය දන්නේ ය. අනාපත්තිය දන්නේ ය. ලහුකාපත්තිය දන්නේ ය. ගරුකාපත්තිය දන්නේ ය. අනෙකවිධ පූර්වනිවාසය සිහි කෙරෙයි: එ කෙසේය යත්: එක් දුයකුදු, දෙ දුයකුදු ... මෙසේ සාකාර කොට උද්දෙස සහිත කොට අනෙකවිධ පූර්වනිවාසය සිහි කෙරෙයි. විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගියා වූ දිව්‍යජනැණින් ... යථාකර්මෝපග සත්ත්වයන් දන්නේ ය. ආස්‍රවක්‍ෂයයෙන් ... සාක්‍ෂාත් කොට එයට පැමිණ වෙසෙයි.

මහණෙනි, මෙ කරුණු සතින් සමන්වාගත විනයධර ශොබනේ ය යි.

7. 2. 3. 9.

[සත්‍ථුසාසන සූත්‍රය]

[සැවැත්නිදාන යි]

30. එක්කිති ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස්හි හුන්හ. එකත්පස්හි හුන් ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ:

වහන්ස, යම් හෙයෙකින් මම භාග්‍යවතුන් වහන්සේගේ දහම් අසා එකාකියෙම් ව්‍යපකෂ්ට ඇත්තේ අප්‍රමත්තයෙම්, කෙලෙස් තවනා වැර ඇති-යෙම්, ප්‍රහිතාත්මයෙම් වෙසෙම් යම්, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට එපරිද්දෙන් සැකෙවින් දහම් දෙසනසේක් නම් මැනැවි.

යෙ ඛො ත්වං උපාලි ධම්මෙ ජානෙය්‍යාසි “ඉමෙ ධම්මා න එකන්ත-නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තී”ති, එකංසෙනුපාලි ධාරෙය්‍යාසි: නෙසො ධම්මො, නෙසො විනයො, නෙතං සත්ථුසාසනන්ති. යෙ ච ඛො ත්වං උපාලි, ධම්මෙ ජානෙය්‍යාසි: “ඉමෙ ධම්මා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තී”ති, එකංසෙනුපාලි, ධාරෙය්‍යාසි: එසො ධම්මො, එසො විනයො, එතං සත්ථුසාසනන්ති.

## 7. 2. 3. 10.

## [අධිකරණසමථ සුත්තං]

[සාවත්ථිනිදානං]

**81**. සත්තිමෙ භික්ඛවෙ, අධිකරණසමථා ධම්මා උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය. කතමෙ සත්ත:

සම්මුඛා විනයො දාතබ්බො, සතිවිනයො දාතබ්බො, අමූළ්හවිනයො දාතබ්බො, පටිඤ්ඤාත කරණං දාතබ්බං, යෙභුය්‍යසිකා දාතබ්බා, තස්සපාපිය්‍යසිකා දාතබ්බා, තිණවත්ථාරකො දාතබ්බො.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත අධිකරණසමථා ධම්මා උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමායාති.

### විනයවග්ගො තතියො

තස්සුද්දානං:

චතුරො විනයධරා චතුරො විනයධරසොභනා හොන්ති
සාසනං තතියවග්ගෙ දසුපාලි අධිකරණසමථෙනාති.

උපාලියෙනි, "මේ ධර්මයෝ එකාන්ත නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, ක්ලේශව්‍යුපශමය පිණිස විශිෂ්ටඥානය පිණිස චතුර්මාර්ගඥානසම්බොධිය පිණිස නිර්වාණය පිණිස නො පවත්නාහ"යි තෝ යම් ධර්ම කෙනෙකුන් දනිහි නම්, උපාලියෙනි, තෙල ධර්ම නො වෙති, තෙල විනය නොවේ. තෙල ශාස්තෘශාසනය නොවේ යයි එකාන්තයෙන් දනුවව. උපාලියෙනි, මේ දහම්හු එකාන්ත නිර්වේදය සඳහා විරාගය සඳහා නිරෝධය සඳහා ක්ලේශව්‍යුපශමය සඳහා අභිඥානය සඳහා සම්බොධිය සඳහා නිර්වාණය සඳහා පවත්නාහයි තෝ යම් ධර්ම කෙනෙකුන් දනිහි නම්, උපාලියෙනි, තෙල ධර්මය වේ, තෙල විනය වේ, තෙල ශාස්තෘශාසනය වේ යයි එකාන්තයෙන් ධරවයි.

7. 2. 3. 10.

[අධිකරණසමථ සූත්‍රය]

[සැවැත්නිදාන යි]

81. මහණෙනි, උපනුපන් අධිකරණයන්ගේ ශමථය සඳහා ව්‍යුපශමය සඳහා මේ අධිකරණශමථධර්ම සතෙකි. කවර සතෙක යත්.

සම්මුඛාවිනය දියයුතු. සතිවිනය දියයුතු. අමූළ්හ විනය දියයුතු. පටිඥාත කරණය දියයුතු. යෙභුය්‍යසිකා දියයුතු. තස්සපාපිය්‍යසිකා දියයුතු. තිණවත්ථාරකය දියයුතු යි.

මහණෙනි, මේ අධිකරණසමථයෝ සත්දෙන උපනුපන් අධිකරණයන්ගේ ශමථය සඳහා ව්‍යුපශමය සඳහා වෙත් යයි.

විනය වර්ගය තුන් වැනි යි.

එහි උද්දානය:

විනයධර සූත්‍ර සතර ය, විනයධර සොභන සූත්‍ර සතර ය, ශාස්තෘශාසන සූත්‍රය, අධිකරණ සමථ සූත්‍රය දැයි තෙවන වර්ගයෙහි සූත්‍ර දසයෙකි.

# 4. සමණවග්ගො

7. 2. 4. 1.

## [භික්ඛුධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

82. සත්තන්නං භික්ඛවෙ ධම්මානං භින්නත්තා භික්ඛු හොති. කතමෙසං සත්තන්නං:

සක්කායදිට්ඨි භින්නා හොති, විචිකිච්ඡා භින්නා හොති, සීලබ්බතපරාමාසො භින්නො හොති, රාගො භින්නො හොති, දොසො භින්නො හොති, මොහො භින්නො හොති, මානො භින්නො හොති.

ඉමෙසං ඛො භික්ඛවෙ සත්තන්නං ධම්මානං භින්නත්තා භික්ඛු හොතීති.

7. 2. 4. 2.

## [සමණධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

83. [සත්තන්නං භික්ඛවෙ ධම්මානං] සමිතත්තා සමණො හොති -පෙ-

7. 2. 4. 3.

## [බ්‍රාහ්මණධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

84. [සත්තන්නං භික්ඛවෙ ධම්මානං] බාහිතත්තා බ්‍රාහ්මණො හොති -පෙ-

7. 2. 4. 4.

## [සොත්තියධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

85. [සත්තන්නං භික්ඛවෙ ධම්මානං] නිස්සුතත්තා සොත්තියො හොති -පෙ-

7. 2. 4. 5.

## [න්හාතකධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

86. [සත්තන්නං භික්ඛවෙ ධම්මානං] න්හාතත්තා න්හාතකො හොති -පෙ-

7. 2. 4. 6.

## [වෙදගූධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

87. [සත්තන්නං භික්ඛවෙ ධම්මානං] විදිතත්තා වෙදගූ හොති -පෙ-

# 4. සමණ වග්ගය

7. 2. 4. 1.

[භික්ඛුධම්ම සුත්‍රය]

[සැවැත්නිදාන සි]

82. මහණෙනි, සත් කරුණක් බිඳුන් හෙයින් 'භික්ඛු' නම් වෙයි. කවර සතෙක යත්:

සක්කායදිට්ඨිය භින්න වෙයි. විචිකිච්ඡාව භින්න වෙයි. සීලබ්බත-පරාමාසය භින්න වෙයි. රාගය භින්න වෙයි. ද්වේෂය භින්න වෙයි. මෝහය භින්න වෙයි. මානය භින්න වෙයි.

මහණෙනි, මේ කරුණු සත බිඳුන් හෙයින් භික්ඛු නම් වේ ය සි.

7. 2. 4. 2.

[සමණ ධම්ම සුත්‍රය]

[සැවැත්නිදාන සි]

83. [මහණෙනි, කරුණු සතක්] සන් හුන් හෙයින් 'සමණ' වෙයි ...

7. 2. 4. 3.

[බ්‍රාහ්මණධම්මසුත්‍රය]

[සැවැත්නිදාන සි]

84. [මහණෙනි, කරුණු සතක්] බැහැර ලූ හෙයින් 'බ්‍රාහ්මණ' වෙයි ..

7. 2. 4. 4.

[සොත්ථිය ධම්ම සුත්‍රය]

[සැවැත්නිදාන සි]

85. [මහණෙනි, කරුණු සතක්] නිඃහූත හෙයින් 'සොත්ථිය' නම් වෙයි...

[7. 2. 4. 5.

[න්හාතක ධම්ම සුත්‍රය]

[සැවැත්නිදාන සි]

86. [මහණෙනි, කරුණු සතක්] ස්නාත හෙයින් 'න්හාතක' නම් වෙයි ..

7. 2. 4. 6.

[වේදගු ධම්ම සුත්‍රය]

[සැවැත්නිදාන සි]

87. [මහණෙනි, කරුණු සතක්] විදිත හෙයින් 'වේදගු' නම් වෙයි

7. 2. 4. 7.

[අරියධම්ම සුත්තං]

[සාවත්ථිනිදානං]

38. [සත්තන්නං භික්ඛවෙ ධම්මානං] අරහත්තා අරියො හොති -පෙ-

7. 2. 4. 8.

[අරහත්ත ධම්මසුත්තං]

[සාවත්ථිනිදානං]

39. [සත්තන්නං භික්ඛවෙ ධම්මානං] ආරකත්තා අරහා හොති කතමෙසං සත්තන්නං:

සක්කායදිට්ඨි ආරකා හොති, විචිකිච්ඡා ආරකා හොති, සීලබ්බතපරාමාසො ආරකො හොති, රාගො ආරකො හොති, දොසො ආරකො හොති, මොහො ආරකො හොති, මානො ආරකො හොති.

ඉමෙසං ඛො භික්ඛවෙ, සත්තන්නං ධම්මානං ආරකත්තා අරහා හොතීති.

7. 2. 4. 9.

[අසද්ධම්මසුත්තං]

[සාවත්ථිනිදානං]

40. සත්තිමෙ භික්ඛවෙ, අසද්ධම්මා. කතමෙ සත්ත:

අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත අසද්ධම්මා.

7. 2. 4 10.

[සද්ධම්මසුත්තං]

41. සත්තිමෙ භික්ඛවෙ, සද්ධම්මා. කතමෙ සත්ත:

සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති. බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති සතිමා හොති. පඤ්ඤවා හොති.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත සද්ධම්මා.

සමණවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

භික්ඛු සමණබ්‍රාහ්මණ - සොත්තියො ච නහාතකො
වෙදගූ අරියො අරහා - ද්වෙ ච ධම්මාති තෙ දස*

* භික්ඛු සමණො බ්‍රාහ්මණො සොත්තියො චෙව නහාතකො
වෙදගූ අරියො අරහා අසද්ධම්මා ච සද්ධම්මාති, - මජ්සං

7. 2. 4. 7.

[අරියධම්ම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

38. [මහණෙනි, කරුණු සතක්] ඈත් බැවින් 'අරිය' නම් වෙයි ...

7. 2. 4. 8.

[අරහන්ත ධම්ම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

39. [මහණෙනි, කරුණු සතක්] දුරු වූ බැවින් 'අරහන්ත' නම් වෙයි... කවර සතෙක යත්:

සක්කාය දිට්ඨිය දුරුවෙයි. විචිකිච්ඡාව දුරුවෙයි. සීලබ්බත පරාමාසය දුරු වෙයි. රාගය දුරු වෙයි. දෙසය දුරු වෙයි. මොහය දුරු වෙයි. මානය දුරු වෙයි.

මහණෙනි, මේ සප්තධර්මයන්ගේ දුරු වීමෙන් අරහන්ත නම් වේ යයි.

7. 2. 4. 9.

[අසද්ධම්ම සූත්‍රය]

[සැවැත්නිදාන යි]

40. මහණෙනි, මේ අසද්ධර්මයෝ සත් දෙනෙකි: කවර සත් දෙනෙක යත්:

ශ්‍රද්ධා නැතියේ වෙයි. හිරි නැතියේ වෙයි. ඔතප් නැතියේ වෙයි. අල්පශ්‍රැත වෙයි. කුසීත වෙයි. නට සිහි ඇතියේ වෙයි දුෂ්ප්‍රාඥ වෙයි.

මහණෙනි, මේ සප්ත අසද්ධර්ම යි.

7. 2. 4. 10.

[සද්ධම්ම සූත්‍රය]

[සැවැත් නිදාන යි]

41. මහණෙනි, මේ සද්ධර්ම සතෙකි. කවර සතෙක යත්:

සැදැහැතියේ වෙයි. හිරිඇතියේ වෙයි. ඔතප් ඇතියේ වෙයි. බහුශ්‍රැත වෙයි. රැකුළුවැර ඇතියේ වෙයි. සමෘතිමත් වෙයි. ප්‍රඥාවත් වෙයි.

මහණෙනි, මේ සද්ධර්ම සත යි.

සමණවග්ගය සතර වැනි යි.

එහි උද්දානය:

භික්ඛුධම්ම සූත්‍රය, සමණධම්ම සූත්‍රය, බ්‍රාහ්මණධම්ම සූත්‍රය, සොත්‍ථිය-ධම්ම සූත්‍රය, නහාතකධම්ම සූත්‍රය, වෙදගුධම්ම සූත්‍රය, අරියධම්ම සූත්‍රය, අරහන්තධම්ම සූත්‍රය, අසද්ධම්ම සූත්‍රය, සද්ධම්ම සූත්‍ර දෙක දැයි දසයෙකි.

## 5. ආහුණෙය්‍යවග්ගො

### 7. 2. 5. 1.

### [චක්ඛු අනිච්චානුපස්සී සුත්තං]

[සාවත්ථිනිදානං]

1. සත්තිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුණෙය්‍යා පාහුණෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ සත්ත:

ඉධ භික්ඛවෙ, එකච්චො පුග්ගලො චක්ඛුස්මිං අනිච්චානුපස්සී විහරති, අනිච්චසඤ්ඤී අනිච්චපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං ඛො භික්ඛවෙ, පඨමො පුග්ගලො ආහුණෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

පුනචපරං භික්ඛවෙ එකච්චො පුග්ගලො චක්ඛුස්මිං අනිච්චානුපස්සී විහරති, අනිච්චසඤ්ඤී අනිච්චපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. තස්ස අපුබ්බං අචරිමං ආසවපරියාදානඤ්ච හොති ජීවිතපරියාදානඤ්ච. අයං භික්ඛවෙ, දුතියො පුග්ගලො ආහුණෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

පුනචපරං භික්ඛවෙ, ඉධෙකච්චො පුග්ගලො චක්ඛුස්මිං අනිච්චානුපස්සී විහරති අනිච්චසඤ්ඤී අනිච්චපටිසංවෙදී සතතං සමිතං අබ්බොකිණ්ණං චෙතසා අධිමුච්චමානො පඤ්ඤාය පරියොගාහමානො. සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති. අයං භික්ඛවෙ, තතියො පුග්ගලො ආහුණෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. -පෙ- උපහච්චපරිනිබ්බායී හොති. අයං භික්ඛවෙ, චතුත්ථො පුග්ගලො ආහුණෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. -පෙ- අසඞ්ඛාරපරිනිබ්බායී හොති. අයං භික්ඛවෙ, පඤ්චමො, පුග්ගලො ආහුණෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. -පෙ- සසඞ්ඛාරපරිනිබ්බායී හොති. අයං භික්ඛවෙ, ඡට්ඨො පුග්ගලො ආහුණෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. -පෙ- උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. අයං භික්ඛවෙ, සත්තමො පුග්ගලො ආහුණෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත පුග්ගලා ආහුණෙය්‍යා පාහුණෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

### 7. 2. 5. 2.

### [චක්ඛු දුක්ඛානුපස්සී සුත්තාදීනි]

සාවත්ථිනිදානානි]

2. සත්තිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුණෙය්‍යා -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ සත්ත:

ඉධ භික්ඛවෙ, එකච්චො පුග්ගලො චක්ඛුස්මිං දුක්ඛානුපස්සී විහරති -පෙ-

Free Distribution www.aathaapi.org

## 5. ආහුනෙය්‍ය වග්ගො

### 7. 2. 5. 1.

### [චක්ඛුඅනිච්චානුපස්සී සූත්‍රය]

[සැවැත්නිදාන යි]

42. මහණෙනි, ආහුනෙය්‍ය වූ පාහුනෙය්‍ය වූ දක්ඛිණෙය්‍ය වූ අඤ්ජලි-කරණීය වූ ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ මෙ පුද්ගලයෝ සත් දෙනෙකි. කවර සත්දෙනෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුගුලෙක් චක්ෂුස්හි අනිත්‍යානුදර්ශී ව වෙසෙයි. අනිත්‍යසංඥ ඇතියේ අනිත්‍යය පිළිවිද දත්නාසුල්ලේ සතත-යෙන් නිරතුරු (අන් සිතින්) අසම්මිශ්‍රව සිතින් සනිටුහන් කරමින් විවසුන් නුවණින් බැසගනිමින් වෙසෙයි. හෙ ආස්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඉහාත්මභාවයෙහි ම තෙමේ විශිෂ්ට-ඥානයෙන් පසක් කොට එළැඹ වෙසෙයි. මහණෙනි, මෙ ආහුනෙය්‍ය වූ ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ ප්‍රථම පුද්ගල වෙයි.

තවද මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුගුලෙක් චක්ෂුස්හි අනිත්‍යා-නුදර්ශී වූයේ අනිත්‍යසංඥ ඇතියේ අනිත්‍යය පිළිවිදිනසුලුයේ හැම කල්හි නිරතුරු අසම්මිශ්‍රව සිතින් සනිටුහන් කරමින් ප්‍රඥයෙන් (විදර්ශනා-ප්‍රඥයෙන්) අනුප්‍රවෙශ කරමින් වෙසෙයි. ඔහට නො පෙර නො පසුව ආස්‍රවපර්‍යවසානය හා ජීවිතපර්‍යවසානය හා වෙයි. මහණෙනි, මෙ ආහු-නෙය්‍ය වූ ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ දෙවන පුගුලි.

තවද මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුගුලෙක් චක්ෂුරායතනයෙහි අනිත්‍යානුදර්ශී වූයේ අනිත්‍යසංඥ ඇතියේ අනිත්‍යප්‍රතිසංවේදී වූයේ හැම කල්හි නිරතුරු අව්‍යවකීර්ණ සිතින් සනිටුහන් කරමින් ප්‍රඥයෙන් පර්‍යවගාහ කරමින් වෙසෙයි. හෙ පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි. මහණෙනි, මේ තුන්වන ආහුනෙය්‍ය පුද්ගල ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි ... උපහච්චපරිනිබ්බායී වෙයි. මහණෙනි, මේ සතරවන ආහුනෙය්‍ය පුද්ගල ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි ... අසඞ්ඛාර පරිනිබ්බායී වෙයි. මහණෙනි, මේ පස්වන ආහුනෙය්‍ය පුද්ගල ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි ... සසඞ්ඛාර පරිනිබ්බායී වෙයි. මහණෙනි, මේ සවන ආහුනෙය්‍ය පුද්ගල ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි .. උද්ධංසොත අකණිට්ඨගාමී වෙයි. මහණෙනි, මේ සත්වන ආහුනෙය්‍ය පුද්ගල ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙයි.

මහණෙනි, මොහු ආහුනෙය්‍ය වූ පාහුනෙය්‍ය වූ දක්ඛිණෙය්‍ය වූ අඤ්ජලී-කරණීය වූ ලොකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ පුද්ගලයෝ සත් දෙන යි.

### 7. 2. 5. 2.

### [චක්ඛුදුක්ඛානුපස්සී සුත්‍රාදිය]

[සැවැත්නිදාන යි]

2. මහණෙනි, මෙ ආහුනෙය්‍ය ... ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර පුද්ගලයෝ සත් දෙනෙකි. කවර සත් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් චක්ෂුස්හි දුඃඛානුදර්ශී වූයේ ... වෙසෙයි.

3. -පෙ- චක්ඛුස්මිං අනත්තානුපස්සී විහරති -පෙ-

4. -පෙ- චක්ඛුස්මිං ඛයානුපස්සී විහරති -පෙ-

5. -පෙ- චක්ඛුස්මිං වයානුපස්සී විහරති -පෙ-

6. -පෙ- චක්ඛුස්මිං විරාගානුපස්සී විහරති -පෙ-

7. -පෙ- චක්ඛුස්මිං නිරොධානුපස්සී විහරති -පෙ-

8. -පෙ- චක්ඛුස්මිං පටිනිස්සග්ගානුපස්සී විහරති -පෙ-

## 7. 2. 5. 9 – 520

## [සොතඅනිච්චානුපස්සී සුත්තාදීනි]

[සංඛිත්තිදානං]

9-96. සොතස්මිං -පෙ- ඝානස්මිං -පෙ- ජිව්හාය -පෙ- කායස්මිං -පෙ- මනස්මිං -පෙ- රූපෙසු -පෙ- සද්දෙසු -පෙ- ගන්ධෙසු -පෙ- රසෙසු -පෙ- ඵොට්ඨබ්බෙසු -පෙ- ධම්මෙසු -පෙ-

97-144. චක්ඛුවිඤ්ඤාණෙ -පෙ- සොතවිඤ්ඤාණෙ -පෙ- ඝානවිඤ්ඤාණෙ -පෙ- ජිව්හාවිඤ්ඤාණෙ -පෙ- කායවිඤ්ඤාණෙ -පෙ- මනොවිඤ්ඤාණෙ -පෙ-

145-192. චක්ඛුසම්ඵස්සෙ -පෙ- සොතසම්ඵස්සෙ -පෙ- ඝානසම්ඵස්සෙ -පෙ- ජිව්හාසම්ඵස්සෙ -පෙ- කායසම්ඵස්සෙ -පෙ- මනොසම්ඵස්සෙ -පෙ-

193-240. චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සොතසම්ඵස්සජාය වෙදනාය -පෙ- ඝානසම්ඵස්සජාය වෙදනාය -පෙ- ජිව්හාසම්ඵස්සජාය වෙදනාය -පෙ- කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- මනොසම්ඵස්සජාය වෙදනාය -පෙ-

241-288. රූපසඤ්ඤාය -පෙ- සද්දසඤ්ඤාය -පෙ- ගන්ධසඤ්ඤාය -පෙ- රසසඤ්ඤාය -පෙ- ඵොට්ඨබ්බසඤ්ඤාය -පෙ- ධම්මසඤ්ඤාය -පෙ-

289-336. රූපසඤ්චෙතනාය -පෙ- සද්දසඤ්චෙතනාය -පෙ- ගන්ධසඤ්චෙතනාය -පෙ- රසසඤ්චෙතනාය -පෙ- ඵොට්ඨබ්බසඤ්චෙතනාය -පෙ- ධම්මසඤ්චෙතනාය -පෙ-

337-384. රූපතණ්හාය -පෙ- සද්දතණ්හාය -පෙ- ගන්ධතණ්හාය -පෙ- රසතණ්හාය -පෙ- ඵොට්ඨබ්බතණ්හාය -පෙ- ධම්මතණ්හාය -පෙ-

385-432. රූපවිතක්කෙ -පෙ- සද්දවිතක්කෙ -පෙ- ගන්ධවිතක්කෙ -පෙ- රසවිතක්කෙ -පෙ- ඵොට්ඨබ්බවිතක්කෙ -පෙ- ධම්මවිතක්කෙ -පෙ-

433-480. රූපවිචාරෙ -පෙ- සද්දවිචාරෙ -පෙ- ගන්ධවිචාරෙ -පෙ- රසවිචාරෙ -පෙ- ඵොට්ඨබ්බවිචාරෙ -පෙ- ධම්මවිචාරෙ -පෙ-

3. ... චක්ෂුස්හි අනාත්මානුදර්ශී වූයේ ... වෙසෙයි.

4. ... චක්ෂුස්හි ක්ෂයානුදර්ශී වූයේ ... වෙසෙයි.

5. ... චක්ෂුස්හි ව්‍යයානුදර්ශී වූයේ ... වෙසෙයි.

6. ... චක්ෂුස්හි විරාගානුදර්ශී වූයේ ... වෙසෙයි.

7. ... චක්ෂුස්හි නිරෝධානුදර්ශී වූයේ ... වෙසෙයි.

8. ... චක්ෂුස්හි ප්‍රතිනිඃසර්ගානුදර්ශී වූයේ ... වෙසෙයි.

## 7. 2. 5. 9 – 520

## [සොතඅනිච්චානුපස්සි සුත්‍රාදිය]

[පැවැත්නිදන සි]

**9–96.** ශ්‍රොත්‍රයෙහි ... ඝ්‍රාණයෙහි ... ජිහ්වායෙහි ... කායයෙහි ... මනස්හි ... රූපයෙහි ... ශබ්දයෙහි ... ගන්ධයෙහි ... රසයෙහි ... පොට්ඨබ්බයෙහි ... ධර්මයෙහි ...

**97–144.** චක්ෂුර්විඥානයෙහි ... ශ්‍රොත්‍රවිඥානයෙහි ... ඝ්‍රාණවිඥානයෙහි ... ජිහ්වාවිඥානයෙහි ... කායවිඥානයෙහි ... මනොවිඥානයෙහි ...

**145–192.** චක්ෂුස්සංස්පර්ශයෙහි ... ශ්‍රොත්‍රසංස්පර්ශයෙහි . ඝ්‍රාණසංස්පර්ශයෙහි ... ජිහ්වාසංස්පර්ශයෙහි ... කායසංස්පර්ශයෙහි ... මනස්සංස්පර්ශයෙහි ...

**193–240.** චක්ෂුස්සංස්පර්ශජ වෙදනායෙහි ... ශ්‍රොත්‍රසංස්පර්ශජ වෙදනායෙහි ... ඝ්‍රාණසංස්පර්ශජ වෙදනායෙහි ... ජිහ්වාසංස්පර්ශජ වෙදනායෙහි ... කායසංස්පර්ශජ වෙදනායෙහි ... මනස්සංස්පර්ශජ වෙදනායෙහි ..

**241–288.** රූපසංඥයෙහි ... ශබ්දසංඥයෙහි ... ගන්ධසංඥයෙහි ... රසසංඥයෙහි ... ස්ප්‍රෂ්ටව්‍යසංඥයෙහි ... ධර්මසංඥයෙහි ...

**289–336.** රූපසඤ්චෙතනායෙහි ... ශබ්දසඤ්චෙතනායෙහි ... ගන්ධසඤ්චෙතනායෙහි . රසසඤ්චෙතනායෙහි ... ස්ප්‍රෂ්ටව්‍යසංචෙතනායෙහි ... ධර්මසඤ්චෙතනායෙහි ...

**337–384.** රූපතෘෂ්ණායෙහි .. ශබ්දතෘෂ්ණායෙහි ... ගන්ධතෘෂ්ණායෙහි ... රසතෘෂ්ණායෙහි ... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණායෙහි ... ධර්මතෘෂ්ණායෙහි ...

**385–432.** රූපවිතර්කයෙහි ... ශබ්දවිතර්කයෙහි .. ගන්ධවිතර්කයෙහි ... රසවිතර්කයෙහි ... ස්ප්‍රෂ්ටව්‍යවිතර්කයෙහි ... ධර්මවිතර්කයෙහි ...

**433–480.** රූපවිචාරයෙහි ... ශබ්දවිචාරයෙහි ... ගන්ධවිචාරයෙහි ... රසවිචාරයෙහි ... ස්ප්‍රෂ්ටව්‍යවිචාරයෙහි ... ධර්මවිචාරයෙහි ...

**481-520.** රූපක්ඛන්ධෙ -පෙ- වෙදනාක්ඛන්ධෙ -පෙ- සඤ්ඤාක්ඛන්ධෙ -පෙ- සඞ්ඛාරක්ඛන්ධෙ -පෙ- විඤ්ඤාණක්ඛන්ධෙ අනිච්චානුපස්සී විහරති -පෙ- දුක්ඛානුපස්සී විහරති -පෙ- අනත්තානුපස්සී විහරති -පෙ- ඛයානුපස්සී විහරති -පෙ- වයානුපස්සී විහරති -පෙ- විරාගානුපස්සී විහරති -පෙ- නිරොධානුපස්සී විහරති -පෙ- පටිනිස්සග්ගානුපස්සී -පෙ- විහරති.

ආහුනෙය්‍යවග්ගො *

* යථා 'චක්ඛුස්මිං අනිච්චානුපස්සී විහරති' ඉච්චාදිවසෙන 'චක්ඛුං' නිස්සාය අට්ඨසුත්තානි හොන්ති. තථෙව සොතාදි චතුවීසතිපදෙසු එකෙකං නිස්සායපි අනිච්ච - දුක්ඛ අනත්ත - ඛය - වය - විරාග-නිරොධ - පටිනිස්සග්ග අනුපස්සනා වසෙන අට්ඨට්ඨසුත්තානි ලබ්භන්ති තස්මා ඉමස්මිං වග්ගෙ විසත්‍යාධික පඤ්චසතසුත්තානි හොන්ති

**481-520.** රූපස්කන්ධයෙහි ... වේදනාස්කන්ධයෙහි ... සංඥාස්කන්ධයෙහි... සංස්කාරස්කන්ධයෙහි ... විඥානස්කන්ධයෙහි අනිත්‍යානුදර්ශී වූයේ ... වෙසෙයි. දුඃඛානුදර්ශී වූයේ ... වෙසෙයි. අනාත්මානුදර්ශී වූයේ ... වෙසෙයි. ක්ෂයානුදර්ශී වූයේ .. වෙසෙයි. ව්‍යයානුදර්ශී වූයේ .. වෙසෙයි. විරාගානුදර්ශී වූයේ ... වෙසෙයි. නිරෝධානුදර්ශී වූයේ ... වෙසෙයි. ප්‍රතිනිඃසර්ගානුදර්ශී වූයේ ... වෙසෙයි.

ආහුනෙය්‍යවර්ගය පස්වැනි යි.*

* 'චක්ඛුස්මිං අනිච්චානුපස්සී විහරති' යනු ආදි වශයෙන් 'චක්ඛු' යන්න ඇතුළු කොට සූත්‍ර අටක් වන්නා සේ 'සොත' ආදි සිවුසැට පදයන් අතුරෙහි එකක් එකක් නිසා අනිච්ච - දුක්ඛ - අනත්ත - ඛය - වය - විරාග - නිරොධ - පටිනිස්සග්ග අනුපස්සනා වශයෙන් අට අට සූත්‍ර බැගින් ලැබෙති. එහෙයින් මේ වර්ගයෙහි විස්සක් අධික කොට ඇති පන්සියයෙක් (520) සූත්‍රයෝ වෙති

# රාගාදිපෙය්‍යාලසුත්තානි

## 1 – 510.

[රාගාදිපෙය්‍යාල සුත්තානි]

[සාවත්ථිනිදානං]

1. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය සත්තධම්මා භාවෙතබ්බා. කතමෙ සත්ත:

සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ සත්තධම්මා භාවෙතබ්බා.

2. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය සත්තධම්මා භාවෙතබ්බා. කතමෙ සත්ත:

අනිච්චසඤ්ඤා, අනත්තසඤ්ඤා, අසුභසඤ්ඤා, ආදීනවසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ සත්තධම්මා භාවෙතබ්බා.

3. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය සත්තධම්මා භාවෙතබ්බා. කතමෙ සත්ත:

අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටිකූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා.

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ සත්තධම්මා භාවෙතබ්බා.

4–30. රාගස්ස භික්ඛවෙ, පරිඤ්ඤාය සත්තධම්මා භාවෙතබ්බා -පෙ- [රාගස්ස භික්ඛවෙ] පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ සත්තධම්මා භාවෙතබ්බා'ති.

31–60. දොසස්ස භික්ඛවෙ අභිඤ්ඤාය සත්තධම්මා භාවෙතබ්බා -පෙ- දොසස්ස භික්ඛවෙ පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ සත්තධම්මා භාවෙතබ්බා'ති.

61–90. මොහස්ස භික්ඛවෙ අභිඤ්ඤාය සත්තධම්මා භාවෙතබ්බා -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ සත්තධම්මා භාවෙතබ්බා'ති.

91–120. කොධස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

121–150. උපනාහස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

# රාගාදිපෙය්‍යාලසූත්‍ර යි.

## 1 - 510

## [රාගාදිපෙය්‍යාල සුත්ත]

[සැවැත්නිදාන යි]

1. මහණෙනි, රාගයාගේ අභිඥානය පිණිස සප්තධර්මයෙක් වැඩිය යුතුය. කවර සතෙක යත්:

සතිසම්බොජ්ඣඞ්ගය ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය යි.

මහණෙනි, රාගයාගේ අභිඥාව සඳහා මෙ කරුණු සත වැඩිය යුතු යි.

2. මහණෙනි, රාගයාගේ අභිඥානය සඳහා මෙ කරුණු සතෙක් වැඩිය යුතු. කවර සතෙක යත්:

අනිත්‍යසංඥ ය, අනාත්මසංඥ ය, අශුභසංඥ ය, ආදීනවසංඥ ය, ප්‍රහාණසංඥ ය, විරාගසංඥ ය, නිරොධසංඥ යි.

මහණෙනි, රාගයාගේ අභිජානනය සඳහා මෙ සත් කරුණු වැඩිය යුතුයි.

3. මහණෙනි, රාගයාගේ අභිඥාව සඳහා සත් කරුණෙක් වැඩිය යුතු. කවර සතෙක යත්:

අශුභසංඥ ය, මරණසංඥ ය, ආහාරයෙහි ප්‍රතිකූලසංඥ ය, සර්වලොක-යෙහි අනභිරතසංඥ ය, අනිත්‍යසංඥ ය, අනිත්‍යයෙහි දුඃඛසංඥ ය, දුඃඛයෙහි අනාත්මසංඥ යි.

මහණෙනි, රාගයාගේ අභිඥාව සඳහා මෙ සත් කරුණු වැඩිය යුතු යයි.

4-30. මහණෙනි, රාගයාගේ පරිඥාව සඳහා සප්තධර්මයෙක් වැඩිය යුතු ය ... මහණෙනි, රාගයාගේ පරික්ෂය සඳහා ... ප්‍රහාණය සඳහා ... ක්ෂය සඳහා ... ව්‍යය සඳහා ... විරාගය සඳහා ... නිරොධය සඳහා ... ත්‍යාගය සඳහා ... ප්‍රතිනිඃසර්ගය සඳහා මෙ කරුණු සත වැඩිය යුතුයි.

31-60. මහණෙනි, ද්වෙෂයාගේ අභිඥාව පිණිස සත් කරුණෙක් වැඩිය යුතු ය ... මහණෙනි, ද්වෙෂයාගේ පරිඥාව පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිඃසර්ගය පිණිස මෙ කරුණු සත වැඩිය යුතු.

61-90. මහණෙනි, මෝහයාගේ අභිඥාව පිණිස සත් කරුණෙක් වැඩිය යුතු ය ... පරිඥාව පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිඃසර්ගය පිණිස මෙ කරුණු සත වැඩිය යුතු.

91-120. මහණෙනි, ක්‍රෝධයාගේ අභිඥාව පිණිස ...

121-150. මහණෙනි, උපනාහයාගේ අභිඥාව පිණිස ...

**151-180.** මක්ඛස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**181-210.** පළාසස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**211-240.** ඉස්සාය භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**241-270.** මච්ඡරියස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**271-300.** මායාය භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**301-330.** සාඨෙය්‍යස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**331-360.** ථම්භස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**361-390.** සාරම්භස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**391-420.** මානස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**421-450.** අතිමානස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**451-480** මදස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ-

**481-510** පමාදස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරෝධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ සත්තධම්මා භාවෙතබ්බා'ති.

රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං*

## සත්තක නිපාතො සමත්තො.

* රාගපදතො පට්ඨාය පමාදපදපරියන්තෙසු සෙසකරණෙසු පදෙසු එකමෙකං අභිඤ්ඤායාදි-දසපදෙහි යොජෙත්වා සත්ත ධම්මා භාවෙතබ්බා'ති නිද්දිට්ඨෙසු තීණි සත්තබොජ්ඣඞ්ග - සත්ත අභිච්චසඤ්ඤාදි - සත්ත අනුසයසඤ්ඤාදි සුත්තානි පච්චෙකං සට්ඨානි සහස්සුත්තානි දසහි පණ්ණාසසතානි හොන්ති.

**161-180.** මහණෙනි, මක්ඛයාගේ ....

**181-210.** මහණෙනි, පලාසයාගේ ...

**211-240.** මහණෙනි, ඊර්ෂ්‍යාහුගේ ...

**241-270.** මහණෙනි, මාත්සර්‍ය්‍යයාගේ ...

**271-300.** මහණෙනි, මායාවගේ ...

**301-330.** මහණෙනි, ශාඨ්‍යයාගේ ...

**331-360.** මහණෙනි, ථම්භයාගේ ...

**361-390.** මහණෙනි, සාරම්භයාගේ ...

**391-420.** මහණෙනි, මානයාගේ ...

**421-450.** මහණෙනි, අතිමානයාගේ ...

**451-480.** මහණෙනි, මදයාගේ ...

**481-510.** මහණෙනි, ප්‍රමාදයාගේ අභිඥාව පිණිස ... පරිඥාව පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරෝධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිඃසර්ගය පිණිස, මේ කරුණු සත වැඩිය යුතු ය යි.

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දෙසූසේක. තුටුසිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ යි.

රාගාදිපෙය්‍යාලය නිමි.*

## සත්තකනිපාතය නිමි.

* 'රාග' පදය පටන් 'පමාද' පදය අවසන් කොට ඇති සතළොස් පදයන් අතුරෙහි එක් එක් පදය 'අභිඥාදය' යනාදි දසපදයන් සමඟ යොදා 'සත්දහම් කෙනෙක් වැඩිය යුතු' යයි දක්වන ලද සත්තසම්බොජ්ඣඞ්ග, සත්තඅනිච්චසඤ්ඤා, සත්තඅසුභසඤ්ඤා, සත සතක්සුතුර සමග වෙන වෙන ම යොදගත් කල්හි මුළු සූත්‍ර ගණනින් පන්සිය දසයෙහි (510) රාගාදි එක් එක් පෙය්‍යාලයෙහි සූත්‍රයෝ තිස් දෙනෙකි.

# අඞ්ගුත්තරනිකායො

## චතුත්ථො භාගො

# අනුක්කමණිකා

Free Distribution www.aathaapi.org

I ගාථාදිපාදානුක්කමණිකා 507 – 509

II සඤ්ඤානාමානුක්කමණිකා 510 – 511

III විසෙසපදානුක්කමණිකා 512 – 519

# I

## අඞ්ගුත්තරනිකායෙ ඡක්ක - සත්තක නිපාතෙසු

# ගාථාදිපාදානුක්කමණිකා


පිට්ඨඞ්කා

අ

අකම්මකාමා අලසා
මහග්ඝසා 416
අක්කුද්ධසන්තා-
වධදණ්ඩතජ්ජිතා 416
අත්තූපමාය තෙ සත්තා 422
අත්ථායාසං විසුද්ධපත්ති 110
අදස්සෙන්ත අසම්පන්න 418
අනත්ථජනනො කොධො 422
අප්පමාදගරු භික්ඛු 324
අප්පමාදෙ පමොදිතා 80
අප්පසාදෙ ච භික්ඛුසු 320
අවීතරාගො කාමෙසු 150
අසිනා හන්ති අත්තානං 422
අහෙසුං සාවකා තෙසං 150

ඉ

ඉධෙව ධම්මං අභිඤ්ඤා, ච 158
ඉත්ථායං කොධරූපෙන 422
ඉති බුද්ධා අභිඤ්ඤාය 434
ඉතො ච බහිද්ධා අඤ්ඤං 320
ඉද්ධිමා යසවා හොති 414

උ

උපට්ඨිතා පාරිචරියෙ 80
උප්පාදනෙ භයං දිස්වා 52

එ

එකමෙතං අකුසලං 426
එතං ඛො පරමං ඤාණං 122
එතෙ ඛො අපරිහානියෙ 320, 322
එතෙ ඛො පරිහානියෙ 320
එවං ඤත්වා යථාභූතං 122
එවං යජිත්වා මෙධාවී 44
එස හෙතු මහන්තස්ස 414
එසො ඛො අරියවිනයෙ 122

ක

කල්‍යාණමිත්තො සුවචො 326

කා

කායදුච්චරිතං කත්වා 120

පිට්ඨඞ්කා

කු

කුද්ධො අත්ථං න ජානාති 422
කුද්ධො හි පිතරං හන්ති 422

කො

කොධනො දුබ්බණ්ණො හොති 422
කොධසම්මදසම්මත්තා 422

ගු

ගුය්හං තස්ස අක්ඛාති 330

ච

චක්කවත්ති අහුං රාජා 412

ජො

ජොතිපාලො ච ගොවින්දො 148

ත

තණ්හක්ඛයාධිමුත්තස්ස 158
තතො අනුචරන්ති නං 120
තතො කායෙන වාචාය 422
තථෙව අරියවිනයෙ 120, 122
තථෙව ලොකෙ සුජාතො 110
තපනීයානි කම්මානි 422
තපො ච බ්‍රහ්මචරියං 108
තස්මා සද්ධං ච සීලං ච 284, 286, 288
තස්මා හි අත්තකාමෙන 414
තස්ස සම්මා විමුත්තස්ස 122, 158

තා

තාදිසං භික්ඛුමාසජ්ජ 150

තෙ

තෙ ඛෙමප්පත්තා සුඛිනො 22

ද

දස්සනං භාවිතත්තානං 320, 322

දා

දාලිද්දියං දුක්ඛං ලොකෙ- 120

දි

දිට්ඨධම්මහිතත්ථාය 122

පිට්ඨඞ්කා

දු
දුද්දදං දදති විතකං 330
දුම්මධනුයං සද්දෙසොති 422

ධ
ධම්මලද්ධෙහි භොගෙහි 122
ධම්මෙන රජ්ජං කාරෙන්තා 412

න
න ඉතො බහිද්ධා අඤ්ඤං 320
න උස්සෙසු න ඔමෙසු 130
න සාධුරූපං ආසීදෙ 150

නා
නාගං වො කිත්තයිස්සාමි 108
නාස්ස හිරි ඔත්තප්පං 422

නි
නිරාමගන්ධා කරුණෙ
විමුත්තා 148

නෙ
නෙක්ඛම්මං අධිමුත්තස්ස 158

ප
පඤ්ච නීවරණෙ හිත්වා 122
පදුට්ඨචිත්තා අහිතානුකම්පිනී 416
පදුට්ඨමනසඞ්කප්පා 150
පසාදෙ චස්ස භික්ඛුසු 320
පස්ස පුඤ්ඤකතං විපාකං 412

පි
පියො ච ගරු භාවනීයො 332

පු
පුබ්බෙව දානා සුමනො 94

බ
බහුං ච සො පසවති 150

භ
භයං දුක්ඛං ච රොගො ච 52

භු
භුඤ්ජති අනවජ්ජානි 110

භූ
භූතහච්චානි කම්මානි 422

පිට්ඨඞ්කා

ම
මනුස්සභූතං සම්බුද්ධං 108
මහග්ගිනි පජ්ජලිතො 110

ය
යථාපි උදකෙ ජාතං 110
යථාපි ජෙට්ඨභගිනී කනිට්ඨා 416
යස්මිං එතානි ඨානානි 330, 332
යස්ස එතෙ ධනා
අත්ථි 284, 484, 486, 488

යං
යං ඉත්ථියා වින්දති සාමිකො
ධනං 416
යං කුද්ධො උපරොධෙති 422
යං මනුස්සා නමස්සන්ති 108

යා
යා චීධ දිස්වාන පතිං පමොදති 416
යා චීධ භරියා වධකාති
වුච්චති 418
යා චීධ මාතා භගිනි සඛී ච 418
යාය මාතුභතො පොසො 422
යා සබ්බදා හොති
හිතානුකම්පිනී 416

යෙ
යෙ තෙ ඉසී බාහිරකෙ 150
යෙ දස්සනවරං ලද්ධා 80

යො
යො පපඤ්චමනුයුත්තො 26, 28
යො ච පපඤ්චං හිත්වාන 26, 28
යො ච රක්ඛති අත්තානං 150
යොනිසො විචිනෙ ධම්මං 280, 284

වී
වීතකොධා අනායාසා 424
වීතරාගා වීතදොසා 94, 110

ස
සඤ්ඤොජනං අණුං ථූලං 110
සතිගීවා සිරොපඤ්ඤො 108
සතො අනුවිචරන්ති නං 120
සඞ්කප්පරාගො පුරිසස්ස කාමො 202
සත්තක්ඛත්තුං මහාබ්‍රහ්මා 412

පිට්ඨඞ්කා

ස

සඞ්ඝගරු ධම්මගරු 84, 324, 326
සද්ධාධනං සීලධනං 284, 286, 288
සද්ධාබලං විරියබලං 280, 284
සබ්බකාමෙහි සම්පන්නා 414
සබ්බසඤ්ඤොජනාතීතං 108
සබ්බෙ අච්චරුචී නාගො 108
සයං ආචමයිත්වාන 94

සං

සංවට්ටමානෙ ලොකම්හි 412

සී

සීලං සමාධි පඤ්ඤා ච 434

පිට්ඨඞ්කා

සු

සුසෙනො මූගපක්ඛො ච 148

සෙ

සෙය්‍යං සමාහිතො නාගො 110
සෙලො යථා එකඝනො 158

සො

සො උභන්තෙ විදිත්වාන 186
සො ඣායී අසාතරතො 108
සො පාපකම්මො දුම්මෙධො 120, 122
සො සංසප්පති කායෙන 120

හි

හිරොත්තප්පසම්පන්නා 326

# II

## අඞ්ගුත්තරනිකායෙ ඡක්ක - සත්තක නිපාතෙසු

## සඤ්ඤානාමානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| **අ** | |
| අජාතසත්තු | 306 |
| අරකො සත්ථා | 470 |
| අරණෙමි | 148, 474 |
| අරිට්ඨො ගහපති | 270 |
| අනුරුද්ධො | 34 |
| අඤ්ජනවනස්මිං | 128 |
| **ආ** | |
| ආනන්දො | 34, 70, 338, 346 |
| **ඉ** | |
| ඉච්ඡානඞ්ගලං | 100 |
| ඉසිදත්තො | 110, 270 |
| ඉසිපතනෙ | 66 |
| **උ** | |
| උග්ගතසරීරස්ස බ්‍රාහ්මණස්ස | 344 |
| උග්ගතො ගහපති | 270 |
| උග්ගො ගහපති | 270 |
| උග්ගො රාජමහාමත්තො | 188 |
| උදායි | 68, 106 |
| උපාලි | 486 |
| **ක** | |
| කපිලවත්ථුස්මිං | 12 |
| කල්ලවාලමුත්තගාමෙ | 406 |
| **කි** | |
| කිම්බිලායං | 98 |
| කිම්බිලො | 98, 404 |
| **කු** | |
| කුද්දාලකො | 148, 474 |
| **කො** | |
| කොසම්බියං | 138 |
| කොසලෙසු | 88, 100, 464 |
| **ඛ** | |
| ඛෙමො | 128 |
| **ග** | |
| ගග්ගරාය | 368 |
| **ගි** | |
| ගිජ්ඣකූටෙ | 100 |
| ගිඤ්ජකාවසථෙ | 46,174 |
| **ඝො** | |
| ඝොසිතාරාමෙ | 138 |
| **ච** | |
| චම්පායං | 368 |
| **චි** | |
| චිත්තො ගහපති | 270 |
| චිත්තො හත්ථිසාරිපුත්තො | 178, 184, |
| චෙතීසු | 122 |
| **ජා** | |
| ජාණුස්සොණි | 134, 362 |
| ජාතිභූමියං | 140 |
| **ජී** | |
| ජීවකො කොමාරභච්චො | 270 |
| **ජො** | |
| ජොතිපාලො | 144, 474 |
| **ත** | |
| තපුස්සො ගහපති | 270 |
| තවකණ්ණිකො ගහපති | 270 |
| **ති** | |
| තිස්සො | 84 |
| තිස්සො නාම භික්ඛු | 390 |
| තිස්සො බ්‍රහ්මා | 86 |
| **ද** | |
| දක්ඛිණාගිරිස්මිං | 372 |
| දණ්ඩකප්පකං | 190 |
| **දා** | |
| දාරුකම්මිකො | 174 |
| **ධ** | |
| ධම්මිකො | 140 |

පිට්ඨඞ්කා

න
නකුලපිතා 28
නකුලමාතා 28

නා
නාගිතො 102
නාදිකො 46, 174

නි
නිග්‍රොධාරාමෙ 12

පු
පුබ්බාරාමෙ 106

පු
පුරාණො 110

පූ
පූරණො කස්සපො 164
පූරණො ගහපති 270

එ
...එගයුණො 158

භ
භග්ගෙසු 28, 406
භල්ලිකො ගහපති 270

භෙ
භෙසකලාවනෙ 406

ම
මහාකච්චානො 34, 58, 68
මහාකප්පිනො 34
මහාකස්සපො 34
මහාකොට්ඨිතො 34, 178
මහාමොග්ගල්ලානො 34, 372, 390
මහාචුන්දො 34, 122
මහානාමො සක්කො 270

මි
මහාවනෙ 369
මිගදායෙ 28
මිගසාලා 110
මිගාරො රොහණෙය්‍යො 288

මු
මුණ්ඩකො 148

මෙ
මෙණ්ඩකො ගහපති 270

පිට්ඨඞ්කා

මො
මොළියසීවකො 124

ර
රෙවතො 34

ව
වජ්ජියමහිතො ගහපති 270
වස්සකාරං බ්‍රාහ්මණං 306

වා
වාසෙට්ඨො ගහපති 270

වි
විජයො ගහපති 270

වෙ
වෙස්සවණො 372
වේසාලියං 396
වෙළුකණ්ටකී නන්දමාතා 92, 372

ස
සකෙතසු 50
සන්ධානො ගහපති 270
සහජාතියං 122,

සා
සාමගාමකෙ 50
සාරග්ගො උපාසකො 270
සාරිපුත්තො 24, 26, 31, 134, 222, 336, 372

සී
සීහවිනයම්ං 153
සීහො සෙනාපති 396

සු
සුජාතා 414
සුදත්තො ගහපති 270
සුනෙත්තො 148, 432, 474
සුප්පතිට්ඨො 144
සුම්භෙසු 128

සූ
සූරො අම්බට්ඨො 270

සො
සොණො 152

සුං
සුංසුමාරගිරි 406

හ
හත්ථකො ආළවකො 270
හත්ථිපාලො 148, 474

# III

## අඞ්ගුත්තරනිකායෙ ඡක්ක - සත්තක නිපාතෙසු

## විසෙසපදානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| **අ** | |
| අකාමකස්ස | 166 |
| අඛෙත්තඤ්ඤුනා | 166 |
| අග්ගි | 344 |
| අඞ්ගාරකාසුයා | 160 |
| අඞ්ගුට්ඨපදං | 464 |
| අඤ්ඤදත්ථුදසො | 412 |
| අඤ්ඤෙය්‍යො | 110 |
| අතික්කන්තමානුසකෙන | 224,226 |
| අත්තකාරො | 94 |
| අත්තානුදිට්ඨි | 264 |
| අත්ථවෙදං | 12 |
| අද්ධුවා | 428,430 |
| අධම්මචරියා | 264 |
| අධිමුච්චමානො | 298,300,494 |
| අධිමුත්තතො | 154 |
| අධිවචනං | 52 |
| අධිවාසකජාතිකො | 170 |
| අධිවාසනා | 170 |
| අධිසයිතානි | 412 |
| අනත්තසඤ්ඤා | 360 |
| අනභාවං | 174 |
| අනයව්‍යසනං | 306 |
| අනවඤ්ඤත්තිකාමො | 278,280 |
| අනස්සාසිකා | 428 |
| අනාළ්හියො | 118,166 |
| අනික්ඛිත්තධුරො | 282 |
| අනුත්තරියානි | 10,72 |
| අනුනයසංයොජනං | 288,290 |
| අනුපාදිසෙසො | 392,394 |
| අනුපාරම්භචිත්තො | 320,322 |
| අනුප්පත්තසදත්ථො | 154 |
| අනුප්පදානරතො | 40,396,398 |
| අනුස්සතානුත්තරියං | 272 |
| අනුස්සතිට්ඨානානි | 68,70,72 |
| අනුස්සරිතා | 282 |
| අපරිතස්සාය | 436,438,442 |
| අපුත්තීනි | 192,194 |
| අප්පටික්කුල්‍යතා | 354,356 |
| අප්පමෙය්‍යො | 92 |
| අබ්බොකිණ්ණං | 298,300,494 |
| අබ්‍රහ්මචාරී | 112 |
| අභාවනීයො | 278,280 |
| අභිඤ්ඤෙය්‍යං | 186,188 |
| අභිදෙ | 196,198 |
| අභිධම්මකථං | 178 |
| අභියාතුකාමො | 308 |
| අයොකපාලෙ | 384,386 |
| අමතද්දසො | 270 |
| අමතොගධා | 352,354,356,360 |
| අම්බකා | 116 |
| අවයුත්තස්ස | 466 |
| අවාතාතපගතානි | 192,194 |
| අවිජ්ජාසංයොජනං | 288 |
| අවිහිංසාධාතු | 262 |
| අවෙච්චප්පසාදෙන | 270 |
| අව්‍යාකතවත්ථුසු | 380,382 |
| අව්‍යාකරණධම්මො | 380 |
| අව්‍යාපාදධාතු | 362 |
| අසංහීරො | 486 |
| අස්සාදදිට්ඨි | 264 |
| අහි | 46 |
| අහංකාරමමංකාරමානාපගතං | 360 |
| **ආ** | |
| ආගතඵලො | 12,16 |
| ආතිථෙය්‍යං | 372,374 |
| ආදිත්තානි | 196,198 |
| ආනෙඤ්ජප්පත්තං | 156,158 |
| ආපායිකො | 190,192 |
| ආභිචෙතසිකානං | 442,482 |
| ආභිදොසිකං | 180 |
| ආරඤ්ඤකා | 174 |
| ආරම්භවත්තා | 94 |
| ආලස්‍ය | 358 |
| ආලොකසඤ්ඤං | 70 |
| ආලොකං | 42 |
| ආවි චෙව රහො ච | 18 |
| ආසභං | 210,212 |
| ආසවපරියාදානං | 298,300 |
| ආහුතො | 348 |
| ආහුනෙය්‍යග්ගි | 348 |
| ආහුනෙය්‍යො | 170,174 |

| | පිට්ඨඞ්කො |
|---|---|
| **ඉ** | |
| ඉත්ථත්තාය | 184 |
| ඉත්ථිකුත්තං | 364.366 |
| ඉත්ථිවිධං | 364,366 |
| ඉද්ධිමා | 100 |
| ඉද්ධිවිධං | 4 |
| ඉසීකං | 370 |
| **උ** | |
| උක්ඛිත්තාසිකො | 358 |
| උච්ඡින්නමූලං | 290 |
| උදකරහදෙ | 182 |
| උදයත්ථගාමිනියා | 284,440 |
| උද්දෙසතො | 446 |
| උද්ධුමාතකං | 70 |
| උන්නළො | 176 |
| උපක්කමච්ඡෙදනතා | 96 |
| උපක්ඛිට්ඨො | 344 |
| උපට්ඨාකො | 102 |
| උපධිසඞ්ඛයෙ | 162,164 |
| උපනිසසම්පන්නා | 426 |
| උපාදානක්ඛයාධිමුත්තො | 154,156 |
| උපාදානගතං | 382 |
| උපාරම්භචිත්තො | 318 |
| උපෙක්ඛාසතිපාරිසුද්ධිං | 376 |
| උපෙක්ඛකො | 2 |
| උභතොභාගවිමුත්තො | 294,392 |
| උභතො | 188 |
| උරත්තාළිං | 210 |
| උරබ්භසතානි | 344 |
| උස්සාහො | 46 |
| උස්සොළ්හි | 46 |
| **ඌ** | |
| ඌමි | 182 |
| **එ** | |
| එකසතනාළකොටි | 194,196 |
| එකන්තගතො | 74 |
| එකොදිභාවං | 376 |
| එකොදිභාවාධිගතෙන | 226 |
| එවංධම්මා | 70,72 |
| එවංභාවී | 70,72 |
| එසිකා | 436 |
| **ඔ** | |
| ඔකාසාධිගමො | 58 |
| ඔකොටිමකො | 166,168 |
| ඔගච්ඡනෙත | 196 |
| ඔත්තප්පධනං | 286 |
| ඔත්තප්පී | 122 |
| ඔදාතවසනා | 30 |
| ඔරුද්ධො | 178 |
| ඔලිගල්ලං | 172 |
| ඔහිතභාරො | 154 |
| **ක** | |
| කච්ඡං | 388 |
| කණ්ටකාධානං | 172 |
| කණ්හසුක්කසප්පටිභාගෙසු | 332,334 |
| කණ්හාභිජාති | 164,166 |
| කතකරණීයො | 156 |
| කදරියො | 396,398,400 |
| කපොතෙට්ඨා | 190,192 |
| කපිත්ථකොසම්බියසු | 418 |
| කම්මාරාමතං | 50,82 |
| කම්මාරාමතා | 268 |
| කම්මාරාමො | 24 |
| කල්‍යාණසම්පවඞ්කො | 220 |
| කල්ලිතසුඛල්ලො | 334 |
| කසිරවුත්තිකො | 166 |
| **කා** | |
| කාකවණ්ණානා | 34 |
| කාණො | 166 |
| කාදලිමිගපවරපච්චත්ථරණො | 418 |
| කාමගුණා | 202 |
| කාමනිරොධො | 202 |
| කායසක්ඛී | 294,394 |
| කායූපපන්නා | 106 |
| කාසිකචන්දනං | 176 |
| **කි** | |
| කිට්ඨාදෙ | 178 |
| කුක්කුරං | 172 |
| කුඩුම්ලකජාතො | 450,452 |
| කුඩ්ඩරාජානො | 138 |
| කුණී | 166 |
| කෙවලපරිපුණ්ණං | 286 |
| කෙසමස්සුං | 184 |
| කොකාසකජාතො | 450,452 |

පිට්ඨඞ්කා

ඛ
ඛජ්ජා 166
ඛත්තියමහාසාරකුලෙ 168
ඛන්තිසොරච්ච 350
ඛෙමො 8,10

ඛා
ඛාරකජාතො 450

ඛි
ඛිප්පවිරාගී 208

ග
ගණාරාමො 220
ගණ්ඩෙ 52
ගත්තානි 190
ගම්භීරනෙමො 438
ගරුකරණා 18,20
ගහපතිමහාසාරකුලෙ 168

ගෙ
ගෙධො 54,56

ගො
ගොඝාතකො 38,160
ගොචරකුසලො 54
ගොණකත්ථතෙ 418
ගොවිකත්තනතෙන 1 60

ඝ
ඝරසුණ්හා 414,416

ඝා
ඝාසච්ඡාදෙ 166

ච
චන්දනිකං 172
චම්මයොධිනො 436,440
චලකා 436,440

චා
චාගධනං 286
චාතුම්මහාපථෙ 180

චි
චික්ඛල්ලං 180
චිරිලියසද්දෙ 182

පිට්ඨඞ්කා

චු
චුතූපපාතං 214

චෙ
චෙතොවිමුත්තිං 6,36,300,402,404
චෙතොසමාධිං 336
චෙලකා 436,440

ඡ
ඡන්දරාගවිනිබන්ධො 52
ඡන්ද 46
ඡළාභිජාතියො 164,166

ජ
ජනපදත්ථාවරියප්පත්තො 412,434
ජවනසම්පන්නො 8

ජා
ජාලකජාතො 448,450

ජී
ජීවිතනිකන්තියා 354
ජීවිතපරියාදානං 298

ජෙ
ජෙවනියං 436

ඣා
ඣායී 108,122,124

ඨි
ඨිතිභාගියා 226

ත
තණ්හක්ඛයාධිමුත්තො 154,156
තණ්හාගතං 382
තණ්හාසඞ්ඛයවිමුත්තො 410,412
තථාගතබලානි 210,212
තපනීයඝරෙ 152

තා
තාලාවත්ථුකතං 290

ති
තිණ්හෙන 160
තිත්ථකරෙ 476


Free Distribution www.aathaapi.org

| | පිට්ඨඞ්කං |
|---|---|
| **ති** | |
| තිත්ථකරො | 148 |
| තිප්පානං | 172 |
| තිරච්ඡානයොනිවෙදනියං | 208 |
| තිරොකුඩ්ඩං | 362 |
| තිලම්බානමුග්ගානංපරත්තං | 438 |
| **තෙ** | |
| තෙජොබන්ධන | 432 |
| තෙලධොතාය | 468 |
| **ථා** | |
| ථාමවා | 282 |
| **ථු** | |
| ථුල්ලච්චසිනසෙ | 180,430 |
| ථූණූපනීතාති | 344 |
| **ද** | |
| දක්ඛිණා | 92 |
| දක්ඛවිරාගී | 208 |
| දස්සනානුත්තරියං | 72,76,272 |
| දළ්හෙ | 118 |
| **දා** | |
| දානසංවිභාගරතො | 60 |
| දාරුක්ඛන්ධං | 100 |
| දාසපුත්තා | 436 |
| දාළිද්දියං | 118 |
| **දි** | |
| දිට්ඨනිරොධං | 380 |
| දිට්ඨිට්ඨානප්පහායිනං | 150 |
| දිට්ඨිපවිවෙකෙ | 338 |
| දිට්ඨිසංයොජනං | 288,290 |
| **දු** | |
| දුක්ඛුද්‍රයාති | 346,348 |
| දුරාගතානං | 172 |
| දුරූපතානං | 172 |
| **දෙ** | |
| දෙවතානුස්සතිං | 16 |
| දෙවලොකවෙදනියං | 208 |
| **දො** | |
| දොවචස්සතා | 50 |
| දොසපරියුට්ඨිතං | 58 |
| දොසො | 96 |
| **ධො** | |
| ධොවනං | 192 |
| **ධ** | |
| ධනුග්ගහා | 436,440 |
| ධම්මගාරවො | 222 |
| ධම්මනිස්සතියා | 338 |
| ධම්මවෙදං | 12 |
| ධම්මානුසාරී | 294,394 |
| ධම්මානුස්සතිං | 12 |
| **න** | |
| නගරපරික්ඛාරෙහි | 436 |
| නහාරුදද්දුලං | 352,354 |
| **නා** | |
| නාගො | 106 |
| **නි** | |
| නිදානසම්භවො | 208 |
| නිදානං | 96 |
| නිද්දසවත්ථූනි | 336 |
| නිද්දසො | 336,340 |
| නිද්දාරාමතා | 50,82 |
| නිපකො | 80 |
| නිබ්බිදාවිරාගො | 130 |
| නිබ්බෙධභාගියා | 226 |
| නිබ්බෙධිකපරියායං | 200 |
| නිබ්බෙධිකං | 202,206 |
| නිබ්බෙධිකාය | 284 |
| නිරයවෙදනියං | 208 |
| නිරාමගන්ධා | 160 |
| නිවාතනිවාතො | 178 |
| නිවිට්ඨසද්ධො | 74 |
| නිස්සරණං | 62 |
| නිස්සාරණීයා | 20 |
| **නී** | |
| නීලාභිජාති | 166 |

පිට්ඨඞ්කා

නෙ
නෙක්ඛම්මධාතු 262
නෙක්ඛම්මාධිමුත්තො 154
නෙගමා 102
නෙරයිකො 190,192
නෙසාදකුලෙ 166

ප
පක්ඛන්දිනො 436,440
පක්ඛහතො 166
පක්ඛී සකුණො 4
පණ්ඩකා 52
පචුරජනො 420
පච්චොරස්මිං 468
පඤ්ඤාධනං 286
පඤ්ඤාවිමුත්තිං 6,36,296,300, 402,404
පඤ්ඤාවිමුත්තො 294,394
පටලිකත්ථතෙ 418
පටිකත්ථතෙ 418
පටික්කූල්‍යතං 354,356,358
පටිඝසඤ්ඤොජනං 288,290
පටිසන්ථාරගාරවතා 324
පඨවි 100
පතිගාධප්පත්තො 296
පතිසල්ලානො, 34
පපඤ්චිතං 382
පපටිකා 384,426
පඵාලිකා 436
පබ්බතසඞ්ඛෙපෙ 182
පබ්බාජිතො 142,144
පරකාරො 94
පරමසුක්කාභිජාති 164
පරික්ඛීණභවසඤ්ඤොජනො 130, 154
පරිසොදයං 186,188
පරිපුච්ඡාය 446
පරියෙට්ඨිං 210
පරියොගාහමානො 298
පරිසෙදිතාති 462
පලගණ්ඩස්ස 464
පස්සද්ධකායො 12,14
පණීතතො 154,184

පිට්ඨඞ්කා

පා
පාකතින්ද්‍රියො 176
පාපකම්මා 122
පාපමිත්තතා 50
පාපසම්පවඞ්කො 218
පාමුජ්ජං 12
පාරිචරියානුත්තරියං 272
පාරිච්ඡත්තකො 448,450
පාහුණෙය්‍යො 170,174

පි
පිණ්ඩදායිකා 436,440
පිණ්ඩපාතපටික්කන්තො 66
පිණ්ඩපාතිකා 174

පු
පුක්කුසකුලෙ 166
පුඤ්ඤාභිසන්දා 92
පුත්තසම්බාධසයනං 176
පුථුසිලාය 194,196
පුබ්බකොට්ඨකො 106
පුබ්බාපයමානො 190
පුබ්බෙනිවාසං 4,70
පුරිසකුත්තං 364,366
පුරිසගතියො 384
පුරිසවිධං 364,366
පුරිසින්ද්‍රියඤාණානි 192,194,196,200
පූගගාමණිකො 36

පෙ
පෙත්තනිකො 8
පෙත්තිවිසයවෙදනියං 208
පෙස්සා 348

ඵ
ඵස්සසුඛං 408

බ
බලවා 88
බලසම්පන්නො 8
බව්හාබාධො 166

බා
බාහාබලපරිචිතා 420
බාළ්හගිලානො 28,158

බි
බිලං 166

| | පිට්ඨඞ්කො |
|---|---|
| **බු** | |
| බුද්ධානුස්සතිං | 12 |
| **බ්‍ර** | |
| බ්‍රහ්මචක්කං | 212 |
| බ්‍රහ්මචාරී | 110,112 |
| බ්‍රහ්මලොකූපගො | 150 |
| බ්‍රාහ්මණමහාසාරකුලෙ | 168 |
| **භ** | |
| භත්තාභිහාරාය | 480 |
| භද්දකං | 24 |
| භරියායො | 414 |
| භවරාගසංයොජනං | 288,290 |
| භස්සමනුයුත්තස්ස | 178 |
| භස්සාරාමතා | 50,52,268 |
| **භා** | |
| භාරවාහිතො | 318 |
| භාවනීයො | 278,280 |
| **භූ** | |
| භූතා | 156,158 |
| **භො** | |
| භොගභොගී | 38 |
| **ම** | |
| මග්ගා | 26,28 |
| මච්ඡිකො | 38 |
| මඤ්ඤිතං | 382 |
| මණ්ඩලමාලෙ | 178,186 |
| මත්තඤ්ඤුතා | 82 |
| මනුස්සලොකවෙදනියං | 208 |
| මනොසම්භාවනීයො | 62,64,66 |
| මන්තාය | 978 |
| මරණස්සති | 40,46,48 |
| මහානාගා | 436,440 |
| මහානාගො | 108 |
| මහායඤ්ඤන්ති | 370,372 |
| මහායඤ්ඤො | 344 |
| මහිද්ධිකො | 84 |
| **මා** | |
| මානසංයොජනං | 288,290 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **මි** | |
| මිත්තභෙද | 312 |
| මිද්ධසුඛං | 408 |
| **මු** | |
| මුඛරො | 176 |
| මුද්ධාවසිත්තො | 36 |
| **මෙ** | |
| මෙත්තං කායකම්මං | 18 |
| මෙත්තාචෙතොවිමුත්ති | 20 |
| මෙථුනසංයොගං | 364 |
| **මො** | |
| මොහපරියුට්ඨිතං | 58 |
| මොඝා | 96 |
| **ය** | |
| යක්ඛයොනිං | 376 |
| යඤ්ඤවාටාය | 344,346 |
| යථාකම්මූපගෙ | 224,226 |
| යථාභූතඤාණදස්සනං | 426 |
| යථාවිහාරං | 34 |
| යාචයොගො | 60 |
| යානයායී | 38 |
| යාවජීවඤ්ච | 192 |
| යූපස්ස | 344 |
| **ර** | |
| රට්ඨිකො | 34 |
| රත්තිංදිවං | 42 |
| රථකාරකුලෙ | 166 |
| රථයායී | 38 |
| රථිකා | 436,440 |
| රන්ධගවෙසී | 318 |
| රාගපරියුට්ඨිතං | 58 |
| රාගානුද්ධංසිතෙන | 182 |
| රූපානං | 8,10 |
| **ල** | |
| ලාභසක්කාරසිලොකං | 156,356 |
| ලාභානුත්තරියං | 272 |
| **ලො** | |
| ලොභො | 96,98 |
| ලොහිතාභිජාති | 164 |


Free Distribution www.aathaapi.org

| | |
|---|---|
| | පිට්ඨඞ්කා |
| **ව** | |
| වචීසංඛාරා | 116 |
| වණ්ණපොක්ඛරතාය | 168 |
| වණ්ණසම්පන්නතා | 8 |
| වරත්තබන්ධනෙන | 160 |
| **වා** | |
| වාතවුට්ඨි | 156 |
| වායාමො | 46 |
| වාලග්ගකොටිනිතුදනමත්තං | 192 |
| වාසනලෙපනසම්පන්නතා | 436 |
| වාසිජටෙ | 464 |
| **වි** | |
| විඤ්ඤාණචාගො | 176 |
| විඝාතපරිළාහා | 170,174 |
| විචිකිච්ඡාසංයොජනං | 288,290 |
| විවෙකො | 46 |
| විඤ්ඤාණට්ඨිතියො | 342 |
| විඤ්ඤාණසොතො | 12,16 |
| විමුත්තිඤාණදස්සනං | 426 |
| විවට්ටකප්පෙ | 4 |
| විවාදමූලං | 90 |
| විසුද්ධිධම්මා | 58 |
| විසෙසගාමී | 114 |
| විසෙසභාගියා | 226 |
| විස්සට්ඨියෙ | 358 |
| විහාරසමාපත්තීනං | 184 |
| විහිංසූපරතියා | 172 |
| වීණාය | 152 |
| වීතරාගො | 110 |
| **වු** | |
| වුට්ඨානකුසලො | 228 |
| වුසිතවා | 128,130,154,156 |
| **වූ** | |
| වූපකට්ඨො | 164,184 |
| **වෙ** | |
| වෙණකුලෙ | 166 |
| වෙහාරජ්ජපත්තා | 402 |
| **වො** | |
| වොදානං | 214 |
| වොහාරවෙපක්කං | 206 |
| | පිට්ඨඞ්කා |
| **ස** | |
| සළෙද්දසං | 212,224,226 |
| සළපතිතො | 342 |
| සළපාදිසෙසො | 392,394 |
| සක්කච්චකාරී | 228 |
| සක්කායං | 26 |
| සක්ඛරකඨලං | 180 |
| සඞ්ගණිකාරාමතං | 268 |
| සඞ්ගණිකාරාමතා | 50,82 |
| සඞ්ගණිකාරාමො | 220 |
| සඞ්ඝො | 52 |
| සඞ්ඝගාරවො | 222,224 |
| සඞ්ඝුපට්ඨායකො | 400 |
| සච්චනාමො | 108 |
| සජොතිභූතානි | 196,198 |
| සඤ්ඤා | 350,352 |
| සඤ්ඤාගතං | 382 |
| සතපදී | 46 |
| සතිනෙපක්කෙන | 282,338 |
| සත්තරතනානි | 412 |
| සත්ථා වාතා | 46 |
| සත්ථුගාරවතා | 84 |
| සත්ථුගාරවො | 222.224 |
| සදාරසන්තුට්ඨො | 110,112 |
| සද්ධානුසාරී | 294 |
| සද්ධාවිමුත්තො | 294,394 |
| සද්ධෙසිකො | 438 |
| සන්දිට්ඨිකො | 124,126,128 |
| සන්තපලාසො | 448 |
| සන්නිධිපෙබො | 372 |
| සපත්තකන්තා | 418,420 |
| සපත්තකරණො | 418,420 |
| සප්පහාසං | 72 |
| සප්පායකාරී | 228 |
| සබ්බපාලිඵුල්ලො | 450 |
| සබ්‍රහ්මචාරී | 120 |
| සම්පන්නතා | 12 |
| සමාධිපරික්ඛාරා | 342 |
| සමාපත්තිකුසලො | 54,228 |
| සම්පජානො | 2 |
| සම්පජ්ජලිතානි | 196,198 |
| සම්මදඤ්ඤාවිමුත්තො | 164 |
| සරිතා | 282 |
| සලාකං | 436 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සවණානුත්තරියං | 272 |
| සහව්‍යතං | 370 |
| **සං** | |
| සංයොගවිසංයොගො | 364 |
| සංවට්ටකප්පෙ | 4 |
| **සා** | |
| සාකාරං | 212,224,226 |
| සාගතං | 84 |
| සාතච්චකාරී | 228 |
| සාධාරණභොගී | 18 |
| සාධිකපොරිසො | 192 |
| සාපෙක්ඛා | 28,30 |
| සාපෙඛො | 372 |
| සාරදනී | 192,194 |
| සාරාගං | 4 |
| සාරාණීයා | 18,20,94 |
| සාලියවකං | 438 |
| සාහු | 370,372 |
| **සි** | |
| සික්ඛාගාරවො | 222,224 |
| සික්ඛානුත්තරියං | 272 |
| සිඛරෙන | 160 |
| සිප්පිසම්බුකං | 180 |
| සිබ්බනී | 186,188 |
| සීලධනං | 286 |
| **සු** | |
| සුක්කාභිජාති | 164 |
| සුඛදුක්ඛපටිසංවෙදී | 4 |
| සුඛනිසිතානි | 192 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| සුඛසංවාසො | 114 |
| සුතධනං | 286 |
| සුතාවුධො | 440 |
| සුභාසිතං | 58,108 |
| සුමනො | 2,92,94,130 |
| සුවණ්ණතිලකා | 454 |
| සුසම්භාසිතො | 108 |
| සුපධාරිතං | 332 |
| **සෙ** | |
| සෙදවක්ඛිත්තා | 440 |
| සෙනාපතිකො | 36 |
| සෙය්‍යසුඛං | 408 |
| **සො** | |
| සොබ්භං | 172 |
| සොරතසොරතො | 178 |
| සොරතො | 114 |
| **ස්වා** | |
| ස්වාගතං | 392 |
| ස්වාගතානි | 484 |
| **හ** | |
| හතුපතිසො | 130,426 |
| හත්ථියාසී | 38 |
| හලිද්දාභිජාති | 164 |
| හසිතලපිතකීළිතානි | 362,364 |
| **හා** | |
| හානභාගී | 116 |
| හානභාගියා | 226 |
| **හි** | |
| හිරිධනං | 286 |
| හිරිපරිබො | 438 |


Free Distribution www.aathaapi.org